# යමක වාචනා මාර්ගය

A 8/2

පරිවර්තක

යූ. ඤාණින්ද සෙයාඩෝ මහා ස්ථවිර
නාඋයනේ අරියධම්ම මහා ස්ථවිර

ප්‍රකාශක

තිස්ස රණසිංහ
පාරින්ද රණසිංහ
මහේෂ් රණසිංහ

ශ්‍රී බු: ව: 2533
ක්‍රි : ව: 1989

පළමුවැනි මුද්‍රණය 1990

මුද්‍රණය:

SRIDEVI

ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
27, පැපිලියාන පාර,
නැදිමාල - දෙහිවල.

# පටුන

පළමුවන කාණ්ඩය:-


1. ප්‍රකාශක නිවේදනය, ... ... ... ...
2. හැඳින්වීම, ... ... ... ... ...
3. ස්තුතිය, ... ... ... ... ...
4. විඤ්ඤත්තිය, ... ... ... ... ...
5. විෂය මාතෘකා සූචි ... ... ... ... ...
6. මූල යමකය ... ... ... ... ... 1 - 41
7. ස්කන්ධ යමකය ... ... ... ... ... 42-100
8. ආයතන යමකය ... ... ... ... ... 101-211
9. ධාතු යමකය, ... ... ... ... ... 213 - 215
10. සච්ච යමකය, ... ... ... ... ... 216 - 322
11. සංස්කාර යමකය, ... ... ... ... ... 323 - 408


දෙවන කාණ්ඩය:-


12. විෂය මාතෘකා සූචි
13. අනුසය යමකය ... ... ... ... ... 1 - 60
14. චිත්ත යමකය ... ... ... ... ... 61 - 88
15. ධම්ම යමක ස්වරූපය ... ... ... ... 89 - 135
16. ඉන්ද්‍රිය යමකය ... ... ... ... ... 136 - 258
17. යමක ගැට පදය ... ... ... ... ... 259 - 319
18. අනුගණ්ඨිය. සහ ගණ්ඨි පද ශෝධනය ... ... 320 - 408

# ප්‍රකාශක නිවේදනය

අතිගරු පූජනීය රේරුකානේ චන්දවිමල මහානායක මාහිමියන් වහන්සේගෙන් සහ ආචාර්ය රේරුකානේ අරියඤාණ හිමිපාණන් වහන්සේගෙන් මෙයට වසර 50 කට පමණ පෙර අභිධර්ම සප්තප්‍රකරණය උගෙන ගත්තා වූ අපේ දයාබර නැන්දනිය වූ කොළඹ හැව්ලොක් ටවුන්හි ලෙයාර්ඩ් මාවතෙහි අංක 18 ශාන්ති නිවාසයෙහි විසූ සත්ගුණවත් සෝමාවති මුණසිංහ මැතිණිය විසින් වසර 36 කට පෙර රේරුකානේ චන්දවිමල මහානායක මාහිමියන් වහන්සේ විසින් සම්පාදිත ''පට්ඨාන මහා ප්‍රකරණ සන්නය'' මුද්‍රණය කරවා බෙද හරින ලද්දේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිසමය.

අභිධර්ම පිටකයේ ''යමක ප්‍රකරණ සන්නය''ද මුද්‍රණය කරවනු පිණිස ලියා දෙන ලෙස රේරුකානේ චන්දවිමල මහානායක මාහිමිපාණන් වහන්සේට ආරාධනා කරන ලද නමුත් අනවකාශතා හේතුවෙන් වසර බොහෝ ගණනක් ඉකුත් වූ අතර, බුරුම ජාතික අතිපූජ්‍ය යූ. ඤාණින්ද සෙයාඩෝ මාහිමිපාණන් වහන්සේ වෙත ඒ සඳහා ආරාධනා කරනු ලැබුවේ 1980 වසරේ දී පමණය, අතිපූජ්‍ය බුරුම ඤාණින්ද සෙයාඩෝ මාහිමියන් වහන්සේ සහ පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ විසින් බුරුම බසින් සිංහලට පරිවර්තනය කරන ලද මෙම ''යමක වාචනා මාර්ගය'' මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්කිරීමට ලැබීම අපේ දයාබර නැන්දනියගේ ශාසනික ප්‍රාර්ථනාව සඵල වීමකි.

ශාසන චිරස්ථිතිය පිණිස ධර්මය වෙනුවෙන් ධනය වැය කළ අපේ දයාබර නැන්දනිය වන සෝමාවති මුණසිංහ මැතිණිය ස්වකීය ආදරණීය බෑණා වරුන් වන යෝගියානේ සිංහගිරි නිවසෙහි තිස්ස රණසිංහ, පාරින්ද රණසිංහ, (ශ්‍රී ලංකාවේ අග්‍ර විනිශ්චයකාර) මහේෂ් රණසිංහ, යන අප සහෝදර තිදෙනාහට අන්තිම කැමති පත්‍රයකින් ස්වකීය සියලු මුදලය පවරා දී ඇත. එම මුදලයෙන් මේ ග්‍රන්ථය මුද්‍රණය කරවන ලද්දේ අපේ දයාබර නැන්දනියට ප්‍රාප්ති දානය පිණිසය, මේ ධර්ම ග්‍රන්ථය නොමිලේ ධර්ම දානය වශයෙන් බෙද දීමට මුලදී කල්පනා කළ නමුත් අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහානායක මාහිමිපාණන් වහන්සේගේ අනු-ශාසනා පරිදි, මෙයින් නිසි ප්‍රයෝජන ගනු කැමැති ධර්ම කාමීන් අතටම ලැබෙනු පිණිස මෙය සාධාරණ මුදලකට දීමට තීරණය කරන ලදී. මෙය මිල කිරීමෙන් ලැබෙන මුළු මුදල ශ්‍රී ලංකාවේ මහා භාරකාර තුමා යටතෙහි තැන්පත් කරනු ලැබේ. නැවතත් මෙවැනි ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කරනු පිණිස ඒ මුදල යොදනු ලැබේ.

අප ගේ කාරුණික ආරාධනය පිළිගෙන මේ ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කළ අතිපූජ්‍ය ශ්‍රී. ඤාණින්ද සෙයාඩෝ මාහිමිපාණන් වහන්සේට ද පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේට ද නිරෝග සුව දීර්ඝායුෂ පතමු. පොතෙහි මුද්‍රණය ආරම්භ කළ මරදානේ සංඛ මුද්‍රණාලය හිමි විජයවර්ධන මහතාට ද මුද්‍රණය නිමාවට පත් කළ දෙහිවල ශ්‍රීදේවී මුද්‍රණාලයාධිපති මහේන්ද්‍ර සේනානායක මහතා ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද අවංක ස්තුතිය පිරිනමමු.

සම්බුද්ධ ශාසනයාගේ චිරජීවනය සඳහා 'යමක වාචනා මාර්ගය'' නම් වූ මාහැඟි ග්‍රන්ථය මුද්‍රණය කරවීමෙන් අත් වූ ධර්මදානමය පුණ්‍ය සම්භාරය අපේ දයාබර නැන්දනිය වූ සත් ගුණවත් සෝමාවතී මුණසිංහ මැතිණියට ශාන්ත අමා මහ නිවන් සුව පිණිසම හේතු වාසනා වේවා.

මෙයට-ශාසනප්‍රීති කාමී,

**තිස්ස රණසිංහ,**
**පාරින්ද රණසිංහ,** (අග්‍ර විනිශ්චයකාර)
**මහේෂ් රණසිංහ,**
ප්‍රකාශක,

129, විජේරාම මාවත,
කොළඹ 07.

# හැඳින්වීම

විනය සූත්‍ර අභිධර්ම නම් වූ ත්‍රිපිටක ධර්මය අතුරෙන් අභිධර්මය ප්‍රකරණ සතකින් සමන්විතය. ධම්ම සංගණි - විභංග - ධාතුකථා - පුග්ගල පඤ්ඤත්ති - කථාවත්ථු යමක පට්ඨාන මහාප්‍රකරණය නම් වූ ඒ අභිධර්ම සප්ත ප්‍රකරණය අතුරෙන් සය-වැන්න යමක ප්‍රකරණයය.

අභිධර්මය හදාරණ ආභිධම්මිකයන් විසින් අනිවාර්ය යෙන් හැදෑරිය යුතු වූ ස්වරූප කථන අභිධර්ම ග්‍රන්ථ සතරක් ඇත. මාතෘකා ස්වරූපය - ධාතුකථා ස්වරූපය- යමක ස්වරූපය සහ පට්ඨාන ස්වරූපය යනු ඒ ග්‍රන්ථ සතරය.

ධම්මසංගණි ප්‍රකරණයෙහි ඇත්තා වූ තිකමාතෘකා 22, දුක මාතෘකා 100, සූත්‍රාන්ත මාතෘකා 42, යන මාතෘකා සියල්ල පිළිබඳ දේශනා පාළිය - පදාර්ථ සහ අභිධෙයාර්ථ නම් වූ ස්වරූප කථනය මාතෘකා ස්වරූප ග්‍රන්ථයට ඇතුලත් වේ.

ධාතුකථා ප්‍රකරණයෙහි වදාරා ඇත්තා වූ මාතෘකා පද 14 පිළිබඳව දේශනා පාළිය පදාර්ථ - සහ අභිධෙයාර්ථ නම් වූ ස්වරූප කථනය ධාතුකථා ස්වරූපය නමින් හැඳින් වේ.

යමක ප්‍රකරණයෙහි වදාරණ ලද්දවූ මූලයමක ඛන්ධයමක ආදී යමක දේශනා දශය පිළිබඳව දේශනා පාළිය - පදාර්ථ සහ අභිධෙයාර්ථ නම් වූ ස්වරූප කථනය වනාහි යමක ස්වරූප ග්‍රන්ථයය.

අනන්තනය සමන්ත පට්ඨාන මහා ප්‍රකරණයෙහි වදාරා ඇත්තා වූ සූවිසි ප්‍රත්‍යයන් සහ සූවිසි පට්ඨානයන් පිළිබඳ වූ දේශනා පාළිය. පදාර්ථ සහ අභිධෙයාර්ථ නම් වූ ස්වරූපකථනය පට්ඨාන ස්වරූප ග්‍රන්ථයට ඇතුලත්ය.

යථෝක්ත ස්වරූපකථන ග්‍රන්ථ සතර උද්ග්‍රහණය ධාරණය කොට අභිධර්මය හදාරන්නවුන්හට ම අභිධර්මය පිළිබඳව යථාවබෝධය ලැබේ. ඈත අතීතයෙහි පෞරාණික ආචාර්යයන් වහන්සේලා වනාහි ශිෂ්‍යයනට අභිධර්මය උගැන්වීමෙහි දී ස්වරූප කථන ග්‍රන්ථයන් සහිතවම අභිධර්මය උගන්වා ඇත්තේ ද එනිසාමය.

අභිධර්ම ස්වරූප ග්‍රන්ථ සතර වනාහි **අභිධර්ම වාචනා මාර්ගය** නමින් ද හැඳින් වෙති. ශ්‍රී ලංකාවේ බුද්ධශාසනය දියුණුවෙන් පැවති අතීතයේදී අභිධර්ම ස්වරූප කථන ග්‍රන්ථ සතරම හෙළ බසින් තිබෙන්නට ඇත. එහෙත් පසු කාලයේදී සිදු වූ ශාසන විලෝපයන්හි දී ඒ ඉපැරණි ග්‍රන්ථ අතුරුදන් වී ඇත. සීතාවක රාජසිංහ රජුගේ ශාසන විලෝපයෙන් අතුරුදන් වූ ලංකා සම්බුද්ධ ශාසනය නැවතත් සියම්රට බුරුමරට රාමඤ්ඤ දේශය ආදී බෞද්ධ රාජධානිවලින් ශ්‍රී ලංකාවට ගෙන එන ලදී.

ත්‍රිපිටක පාලි – අර්ථකථා – ටීකා – ප්‍රකරණ ව්‍යාකරණ ග්‍රන්ථ සහිත බුද්ධ ධර්මය නැවතත් ශ්‍රී ලංකාවේ බෞද්ධයන් ගේ අතට පත්වීම නිසා බුද්ධ ශාසනය නැවතත් බැබලෙන්නට වූයේ කලුවලා ඉවත් වූ අහසේ සඳහිරු මෙනි. සමහර අට්ඨකථාවන් පිළිබඳ ටීකා ග්‍රන්ථ තවම සිංහල අකුරෙන් මුද්‍රණය නොවී ඇති බව නැණවතුන්ගේ අවධානයට යොමුවිය යුතුය.

අභිධර්ම පිටකයේ ස්වරූප කරන ග්‍රන්ථ අතුරෙන් යමක ප්‍රකරණ ස්වරූප කථනය සිංහල බසට නොනැගීම බලවත් අඩුවක් බව දැනගත් අභිධර්මය පිළිබඳව මනා අවබෝධයක් ඇත්තා වූ පින්වත් **සෝමාවතී මුණසිංහ මැතිණිය** විසින් මෙයට අවුරුදු තිස් ගණනකටත් පෙර ඒ සඳහා කටයුතු සූදානම් කොට ඇත.

අතිපූජ්‍ය ආචාර්‍ය්‍ය **රේරුකානේ චන්දවිමල** මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් සම්පාදිත **පට්ඨාන මහා ප්‍රකරණ සන්නය** පින්වත් සෝමාවතී මුණසිංහ මහත්මාවන්ගේ ආරාධනයෙන් සහ ධනව්‍යයයෙන් මුද්‍රණය කරවන ලද්දකි පින්වත් සෝමාවතී මුණසිංහ මහත්මාව ගැන ආචාර්ය රේරුකානේ චන්දවිමල මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් පට්ඨාන මහා ප්‍රකරණ සන්නයෙහි හඳුන්වා ඇත්තේ මෙසේය :-

" කොළඹ හැව්ලොක් ටවුන්හි ලෙයාර්ඩ් මාවතෙහි ශාන්ති නිවාසයෙහි සත්ගුණවත් සිරිනාථ කුමාරදස මුණසිංහ මහතාගේ භාර්‍ය්‍යාව වූද යෝගියානේ කුලතිලක අර්ථනායක හේරත් රණසිංහ කෝර්නල් රාළහාමිගේ හා ඇස්. ජේ. ද සිල්වා හේරත් රණසිංහ හාමිනේගේ ද දුහිතෘ වූද, සෝමාවතී මුණසිංහ මැතිණිය ලක්දිව අභිධර්මය උගත් බෞද්ධ කාන්තාවකි. ඕ තොමෝ අපගෙන් පට්ඨාන ප්‍රකරණය උගත්තාය." යනුවෙනි.

පට්ඨාන මහාප්‍රකරණ සන්නය මුද්‍රණය කරවූ පින්වත් සෝමාවතී මුණසිංහ මැතිණිය යමකප්‍රකරණ ස්වරූප ග්‍රන්ථයද මුද්‍රණය කරවීමේ ප්‍රාර්ථනාවක් ඇතිව ඒ සඳහා ස්වකීය මුදලය ද අන්තිම **කැමති පත්‍රයකින් පවරා** දී බුරුම බසින් තිබෙන එම යමක ප්‍රකරණය සිංහලට පරිවර්තනය කිරීම පිණිස ස්වකීය බෑණනුවන් වන සත්ගුණවත් **පාරින්ද රණසිංහ** අග්‍රවිනිශ්චයකාර තුමාගේ සහායයෙන් බුරුම ජාතික ත්‍රිපිටකාචාර්‍ය්‍ය අතිපූජ්‍ය යූ. ඤාණින්ද සෙයාඩෝ ස්වාමීන්ද්‍රයන් වහන්සේට ආරාධනා කරන ලදී.

පශ්චිම වයසෙහි ගතකළ පින්වත් සෝමාවතී මුණසිංහ මහත්මාව ස්වර්ගස්ථ වූ බැවින් සත්ගුණවත් අග්‍රවිනිශ්චයකාර පාරින්ද රණසිංහ මැතිතුමා විසින් කොළඹ ලෙයාර්ඩ් මාවතෙහි පින්වත් සෝමාවතී මුණසිංහ මහත්මාවන්ගේ ශාන්ති නිවාසයෙහි අතිපූජ්‍ය යූ. ඤාණින්ද බුරුම ස්වාමීන්ද්‍රයන් වහන්සේ වස් වසවා 1984–ජූලි 17 වෙනි දින බුරුම යමක ස්වරූප ග්‍රන්ථය සිංහලයට පරිවර්තනය කරවීම ආරම්භ කරන ලදුව දින 22 න් කියවා නිමකරන ලදී. අප විසින් සිංහලයට නංවා ලියන ලද අත් පිටපත සංශෝධනය කිරීමෙන් අනතුරුව මුද්‍රණය සඳහා පිටපත් කරන ලද්දේ

පින්වත් **එස්.ඩී. නන්දසේන මහතා** පින්වත් **අසංග ගුණසේකර මහතා** සහ පින්වත් **අනුර භාරත පෙරේරා** මහතා ද විසිනි. පූජ්‍ය **මාතලේ ධම්මින්ද**, පූජ්‍ය **පරවාහැර ඉන්දවංස**, පූජ්‍ය **ගාල්ලේ සංඝසුභද්‍ර** යන **ප්‍රියසීලි සබ්‍රහ්ම චාරීන්** වහන්සේලාගේ සහායෙන් අත්පිටපත් සංශෝධනය කරන ලදුව සත්ගුණවත් පාරින්ද රණසිංහ අග්‍රවිනිශ්චය කාර තුමන් විසින් කොළඹ මරදානේ සංඝ මුද්‍රණාලයට භාරදෙන ලදි.

සංඝ මුද්‍රණ ශිල්පීන් විසින් පිටු 211 තෙක් මුද්‍රණය කරන ලද මෙම යමක ග්‍රන්ථයේ ඉතිරි කොටස නැදිමාලේ ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හිමි **මහේන්ද්‍ර සේනානායක මහත්මාණන්ට** භාරකරන ලද්දේ මුද්‍රණ වැඩ ඉක්මන් කරනු පිණිසය.

අතිපූජ්‍ය ආචාර්ය **රේරුකානේ චන්දවිමල** මහානායක මාහිමි පාණන් වහන්සේ වෙත මුද්‍රණයට ප්‍රථම මෙහි අත් පිටපත පිළිගන්වා අනුමත කරගත් බවද ගෞරවයෙන් සිහිපත් කරමු.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්ය අති පූජනීය රාජකීය පණ්ඩිත **මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ** සහ තත් සංස්ථා සමුත්පාදක ප්‍රධාන අනුශාසක අති පූජනීය රාජකීය **පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන අස්මදාචාර්ය** මාහිමි පාණන් වහන්සේ ද මේ ග්‍රන්ථය අනුමත කරමින් දක්වූ අනුග්‍රහය ගුරු ගෞරවයෙන් සඳහන් කරමු.

ඉතාමත් උද්‍යොගයෙන් මෙහි මුද්‍රණය සම්පූර්ණ කළ ශ්‍රීදේවි මුද්‍රණාලයාධිපති තුමන් ප්‍රධාන කාර්‍ය මණ්ඩලයට ද සෝදුපත් කලට වේලාවට සපයාදීමාදියෙන් බොහෝ උපකාර සැලසූ **සුමන කරුණාරත්න මහතාණන්ටද** දීර්ඝායු පතමු.

බුරුම බසින් සිංහලට පරිවර්තනය කරන ලද මෙම "යමක ප්‍රකරණ වාචනා මාර්ගය" හෙවත් යමක ස්වරූපය අභිධර්මය හදාරණ ආධුනිකයන්ට සහ ප්‍රවීණයන් හටත් ආලෝකයක් බවට පත් වේවා. ගැඹුරු ධර්ම ග්‍රන්ථයක් තවත් භාෂාවකට පරිවර්තනය කිරීමේදී ඇති වූ යම් සදෙස් තැනක් දක්නට ලැබේ නම් නැණවත් අය එය නිවැරදි කෙරෙත්වා. මේ සඳහා අකුරක් පාසා යෙදූ කුශල චේතනාව සම්බුද්ධ ශාසනයේ චිර ජීවනය පිණිසම වේවා ගම්භීර ධර්මය සුවසේ අවබෝධ කිරීමට හේතු වාසනාවේවා.

අවුරුදු සිය ගණනක් තිස්සේ අඛණ්ඩව අභිධර්ම වාචනා මාර්ගය ධාරණය කළාවූ ද ශ්‍රී ලංකාවට දයාද වශයෙන් ගෙන ආවාවූද බුරුමරට මහාස්ථවිර ස්වාමි පාදයන් වහන්සේලාට අපගේ නමස්කාරය වේවා. බුරුම බසින් සිංහලයට පරිවර්තනය කරන ලද මෙම යමක වාචනා මාර්ගය ග්‍රන්ථයට පාලි භාෂාවෙන් අගනා විඤ්ඤාපනයක් සැපයූ අතිපූජ්‍ය පණ්ඩිත බුරුම ජාතික **ඌ. නන්දමාලාභිවංස මහාස්ථවිර පාදයන් වහන්සේට** ද දීර්ඝායු ප්‍රාර්ථනය කරමු.

චිරං තිට්ඨතු සද්ධම්මෝ – ලෝකෝ හෝතු සුඛී සදා.

මෙයට සාසනස්ථිතිකාමී,

**ඌ. ඤාණින්ද සෙයාඩො මහාස්ථවිර**
**නාඋයනේ අරියධම්ම මහාස්ථවිර,**

ශ්‍රී ඥණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය
ගල්දුව, කහව
2533—1989. 07. 25.

# ස්තුතිය

සම්මා සම්බුද්ධ ශාසන චිරස්ථිතිය පිණිස මෙම ග්‍රන්ථය **සම්පාදන**යෙහි ලා ආරාධනා කොට විශාල ධනව්‍යයකින් මුද්‍රණයෙන් ප්‍රකාශයට පත්කළ අග්‍රවිනිශ්චයකාර පාරින්ද රණසිංහ මැතිතුමාට ද,

පිටපත් කිරීමෙහි සහාය වූ එස්. ඩී. නන්දසේන, අසංක ගුණසේකර, අනුර භාරත පෙරේරා මහතුන්ට ද,

අත් පිටපත් සංශෝධනයෙහි සහාය වූ පූජ්‍ය මාතලේ ධම්මින්ද, පූජ්‍ය පරවාහැර ඉන්දවංස, පූජ්‍ය ගාල්ලේ සංඝසුභද්‍ර, ස්වාමීන් වහන්සේලාට ද,

ප්‍රථම කාණ්ඩයෙහි පිටු 211 තෙක් මුද්‍රණය කළ සංඛ මුද්‍රණාලයාධිපති විජයවර්ධන මහතාට ද, සියල්ල මුද්‍රණයෙන් නිමාවට පත් කළ ශ්‍රීදේවි මුද්‍රණාලයාධිපති මහේන්ද්‍ර සේනානායක මහතා ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද,

සෝදුපත් කලට වේලාවට සපයා භාරදීමෙහි සහාය වූ සුමන කරුණාරත්න මහතාට ද,

පිටකවරය හා දම්සක් රූ තහඩු නොමිලයේ නිපැයූ කරුණාදස ඇඹුල්දෙනිය මහතාට ද, අවංක ස්තුතිය මෙයින් පිරිනැමේ.

විඥප්තිය සැපයූ පූජ්‍ය පණ්ඩිත නන්දමාලාභිවංස ස්ථවිර පාදයන් වහන්සේට ද, ගෞරවය පිරිනැමේ.

මෙම ග්‍රන්ථය පිළිගෙන අනුමත කොට වදාළ අතිපූජනීය රේරුකානේ චන්දවිමල මහානායක මාහිමි පාණන් වහන්සේට ද, අති පූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමි පාණන් වහන්සේට ද, අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මාහිමි පාණන් වහන්සේට ද නමස්කාර පූර්වක ගෞරවය පුද කරමු.

මෙයට, ශාසනස්ථිතිය පතන,

**පරිවර්තක හා සංස්කාරක ස්ථවිරවරු**

# විඤ්ඤත්ති

සිද්ධ මිද්ධෝ'ති ගම්හිරෝ –
අභිධම්ම මදේසයී,
දිවාලයේ සිලාධාරේ –
වසන්තෝ ජින පුංගවෝ.

ජිනං තං පණමෙ ධීරං –
අභිධම්ම පවත්තකං,
ඒසා'භිධම්ම පජ්ජෝතෝ –
ලෝකම්හි ජලතං චිරං,

ඉතෝ හි අතිරේක ඡබ්බීසති මත්ත සතක සංවච්ඡරාතීතේ කාලේ අම්හාකං සක්‍යමුනී භගවා විභාවී සෙබරෝ සම්මා සම්බුද්ධෝ ලෝකේ උදපාදි. තේන භගවතා අරහතා සම්මා සම්බුද්ධෙන දේසිතෝ සකලෝපි සද්ධම්මෝ විමුත්ති රසේන ඒකවිධෝපි පිටකවසෙන තිවිධෝ හෝති, විනය පිටකං සුත්තන්ත පිටකං අභිධම්ම පිටකඤ්චාති.

තේසු පන සුත්තන්ත පිටකං සබ්බපඨමං සමුප්පන්නං, කද සමුප්පන්නන්ති? අම්හාකං හි භගවා සබ්බඤ්ඤුතං පත්වා පඨම සංවච්ඡරේ යේව ආසාළ්හි පුණ්ණමී දිවසේ බාරාණසියං ඉසිපතනේ මිගදායේ පඤ්චවග්ගිය භික්ඛු පමුඛානං බහුන්නං දේව බ්‍රහ්මූ නං අමතරසං පායෙන්තෝ ධම්මචක්කප්පවත්තන සුත්තන්තං කථෙසි තතෝ පට්ඨාය හි සුත්තන්ත පිටකං සමුප්පන්නං හෝති, බහුන්නං දේවමනුස්සානං ධම්මචක්ඛුං සමුට්ඨාපෙන්තං.

තතෝ පරං පන විනය පිටකං සමුප්පන්නං, කද සමුප්පන්නන්ති ? යද හි අම්හාකං බුද්ධෙන භගවතා අරහතා ආණාරහේන මහාකාරුණිකේන පඨමා විනය පඤ්ඤත්ති පඤ්ඤාපිතා හොති, විනය සික්ඛාපදං පඤ්ඤත්තං, තතෝ පට්ඨායහි විනය පිටකං සමුප්පන්නං, සද්ධම්මට්ඨිතිං සාධෙන්තං,

තතෝ පච්ඡා අභිධම්මෝ සමුප්පන්නෝ හෝති, කද සමුප්පන්නෝති? අම්හාකං හි භගවා ධම්මරාජා සම්මා සම්බෝධිං පත්වා සත්තමේ සංවච්ඡරේ අඤ්ඤ තිත්ථිය මාන මද්දනාය සාවත්ථියං ගණ්ඩම්බ රුක්ඛමූලේ චතුපරිස මජ්ඣෙ ආකාස මබ්භුග්ගන්ත්වා අනඤ්ඤ සාධාරණං අතිව අච්ඡරියං යමක මහා පාටිහාරියං දස්සෙත්වා තාවදේව තාවතිංස භවන මාගමී. අභිධම්ම කථනත්ථාය.

තත්ථ පාරිච්ඡත්තක රුක්ඛ මූලේ සක්කස්ස දේවානමින්දස්ස වරාසන භූතේ පණ්ඩුකම්බල සිලාසනේ නිසීදි, පුණ්ණචන්දෝ විය සිරිසෝභග්ගේන විරොචමානො තං ඛණඤ්ඤෙව්ව, දස සහස්සේහි චක්කවාළේහි අනන්තාපරිමාණා දේව බ්‍රහ්මාණෝ ආගන්ත්වා භගවන්තං සංපරිවාරේසුං සද්ධම්ම සවණත්ථාය.

තද භගවා අත්තනෝ අභිමුඛෙ නිසින්නං මාතුපුබ්බ සන්තුසිතං දේවපුත්තං පමුඛං කත්වා සන්නිසින්නානං බහුන්නං දේවබ්‍රහ්මූනං අජ්ඣාසයං විදිත්වා අතිව ගම්භීරං පරමත්ථ දේසනා සංඛාතං අභිධම්ම පිටකං කථෙසි. අන්තෝ වස්සං නිරන්තරං තේමාසං දේසෙසියෙව දේවලෝකේ, මනුස්ස ලෝකේ පන දේවසිකං අනෝතත්ත දහ සමීපේ බුද්ධූපට්ඨානං ගතෝ ආයස්මා සාරිපුත්තෝ මාතිකා මත්තං අතිසංඛෙපේන අභිධම්මං සුත්වා අත්තනෝ අන්තේවාසිකානං පඤ්චන්නං භික්ඛු සතානං නාතිසංඛෙපවිත්ථාරං අභිධම්මං වාචෙසි. තතෝ පට්ඨායහි අභිධම්ම පිටකං සමුප්පන්නං, විඤ්ඤූනං ගම්භීරත්ථ රුචිකානං වීමංසක ජාතිකානං ඤාණවඩ්ඪනං සාධෙන්තං.

තත්ථ කේනත්ථේන පන අභිධම්මෝ නාමාති.? ධම්මාතිරේක ධම්ම විසේසත්ථේනාති ආචරිය බුද්ධඝොස මහා ථෙරෙන කථිතෝ, අයං හි අභිධම්මෝ සුත්තන්ත ධම්මතෝ අතිරේකෝ විසිට්ඨෝ ච හෝති. සුත්තන්තේසු පන යෙභුය්‍යෙන ලෝක සම්මුති වෝහාරෝ පයෝජිතෝ. අභිධම්මේ තතෝ විසිට්ඨෝ ගම්භීරෝ පණ්ඩිත වේදනීයෝ පරමත්ථ වෝහාරෝ යෙව යෙභුය්‍යෙන දස්සිතො.

කතිවිධං පනේතං අභිධම්ම පිටකන්ති චෙ ? අභිධම්මෝ හි පකරණ වසෙන සත්තවිධෝ, ධම්මසංගණී විභංගෝ ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති කථාවත්ථු යමකං පට්ඨාන මහා පකරණං චාති. සකලමෙව හි අභිධම්ම පිටකං ඨපෙත්වා පුග්ගල පඤ්ඤත්තිං අඤ්ඤෙසු ඡසු පකරණෙසු ගම්භීරත්ථ සූචකානං පරමත්ථ වොහාරානං යෙව පයුජ්ජිතත්තා දුද්දසං දුබ්බිඤ්ඤෙය්‍යං දුරනුබෝධං ගම්භීර බුද්ධිහිපිති තං හි අභිධම්ම පිටකං ගම්භීරං දුක්ඛෝගාළ්හං අලබ්භනෙය්‍ය පතිට්ඨඤ්ච, තස්මා තමෝ-ගාහණත්ථාය පෝරාණකත්ථෙරා අට්ඨකථා - ටීකා - අනු-මධු යෝජනා-ගණ්ඨිපද නිස්සයාදී අනේකේ ගන්ථෙ අකංසු. තානි නිස්සාය විඤ්ඤූ ආභිධම්මිකා අභිධම්මෙ ඔගාහිංසු. චෙව පතිට්ඨඤ්ච ලභිංසු.

තේසු හි ඡට්ඨමං යමකප්පකරණං දසවිධෙන විභජිත්වා දේසිතං. මූල - ඛන්ධ ආයතන - ධාතු - සච්ච - සංඛාර - අනුසය - චිත්ත - ධම්ම - ඉන්ද්‍රිය - යමකානං වසේන. ඉදං පන යුගල වසෙන දේසිතත්තා යමකං නාම ජාතං, තත්ථහි කුසලාදී ධම්මා අනුලෝම - පච්චනික යුගල වසෙන චෙව සන්නිට්ඨාන - සංසය, පුච්ඡා විස්සජ්ජන යුගල වසෙන ච දේසිතා. තස්මා යමකං නාම ජාතං.[4]

ඉදං හි යමකප්පකරණං පරමත්ථ නිස්සිතං ගම්භීරං, යස්මා ච ගම්භීරං තස්මා දුක්ඛෝගාහං දුරනුබෝධඤ්ච, අට්ඨකථා චරියා ච සංඛෙපේනේව තස්ස අත්ථො කථිතෝ, තස්මා දුක්ඛෝගාළ්හං, පුච්ඡා විස්සජ්ජනානං අභිධෙය්‍යත්ථං-සරූපත්ථං යථාතථං පරිපූණ්ණං ජානිතුං අතිවිය දුක්කරත්තා අලබ්භනෙය්‍ය පතිට්ඨඤ්ච ජාතං, තථාපි ආචරියාසභානං ආනුභාවං නිස්සාය මහුස්සාහේන පරියාපූණන්තේහි විඤ්ඤූහි ආභිධම්මික සිස්සේහි තස්සත්ථෝ යථාතථං පරිපූණ්ණං විඤ්ඤාතුං සක්කායේව.

මරම්මරට්ඨෙ හි පෝරාණකත්ථෙරා ඉමස්ස යමකප්පකරණස්ස අත්ථ විවරණ සංඛාතේ නිස්සය ගන්ථෙ අභිසංඛරිංසු, මරම්මිකානං ආභිධම්මිකානං අත්ථාය මරම්ම භාසාය. තේසු හි අයං නිස්සය ගන්ථෝ භදන්ත නන්දමේධෝ ඉති ලද්ධ නාමෙන "රාජගුරු" උපාධි ධාරිනා මහා ථෙරේන අභිසංඛතො, පෝරාණක නිස්සයගන්ථෙ නිස්සාය. සෝ හි මහා ථෙරෝ මරම්ම රට්ඨෙ උපරි පදේසේ චේතුත්තර නගරේ ජාතෝ, විඤ්ඤුප්පත්ත කාලේ සාසනෙ පබ්බජිතො ආචරියවරේ උපනිස්සාය සාට්ඨ කථං සකලං තෙපිටකං බුද්ධවචනං උග්ගණ්හි මහුස්සාහේන.

විසේසේන පන අනන්ත ධජ මහාරාජගුරු මහාථෙරපාදස්ස සන්තිකෙ සකලං අභිධම්ම පිටකං උග්ගණ්හිත්වා තත්ථ ඡෙක-පටුභාවඤ්ච සම්පාපුණි. සෝ හි. මහා ථෙරෝ රතනසිඛ නගරේ ඒකතාල ගාමේ "නන්දසීහ චෝයිං" ඉති නාමිකේන මහා අමච්චේන කාරිතේ බෝධි විහාරේ ආවසි, තස්මිං විහාරේ වසමානෝ ඉමං සරූපත්ථප්පකාසකං "යමෙ අයා කෞ" ඉති විස්සුතං යමක නිස්සයං අභිසංඛරි, ඉදං හි සභාවෙන දුබ්බෝධම්පි සමානං සුබෝධං කත්වාන මහා ථෙරේන විරචිතං තත්ථ හි පඨමං පාලි අනුසන්ධිං දස්සෙත්වා තතෝ අනන්තරං පාලියා අත්ථං, අභි ධෙය්‍යත්ථ ගණ්ඨපද විනිච්ඡය ඤ්ච යථාක්කමං සුපරිපුණ්ණං සුවි ඤ්ඤෙය්‍යං කත්වා විත්ථාරේන විරචිතං. තෙනේවච අයං ගන්ථෝ මරම්මරට්ඨෙ චිරාකාලතෝප්පට්ඨාය යාවජ්ජතන ආභිධම්මිකානං භික්ඛූනං සාමණේරානඤ්ච හදයේ සද පතිට්ඨිතෝ හෝති.

විසේසතෝ පන අයං ගන්ථෝ මරම්මරට්ඨෙ අනුවස්සං පවත්තියමානස්ස රාජකීය තිපිටක අජ්ඣයන පරික්ඛණස්ස නියමිත ගන්ථන්තරෙ අන්තොගතො, තස්මා එව බහු භික්ඛූ ච සාමණේරා ච සතතං සාදරෙන උග්ගණ්හන්ති. දිවා සමයේ පරිචයං වාචුග්ගතං කත්වා රත්ති සමයේ ආචරියානං සන්තිකේ ඕසාරෙන්ති. ආචරියා පාලි අත්ථං විත්ථාරේන කථෙත්වා සරූපත්ථං - අභිධෙය්‍යත්ථං විභජන්ති. උත්තානකං කරොන්ති. මාතිකා - ධාතුකථා - යමක - පට්ඨාන සංඛාතානි හි අභිධම්ම ගන්ථානි මරම්ම රට්ඨෙ යේභුය්‍යෙන රත්තියං යේව - සික්ඛාපනතෝ " රත්ති වාචනානීති" පාකටානි. සෝ පන " යමෙ අයා කෞ " ඉති විස්සුතෝ යමක සරූපත්ථ සූචකෝ මරම්ම භාසාය ඨිතෝ ගන්ථො සීහල භාසාය පරිවත්තිතො ලාංකිකානං අත්ථාය "යමක වාචනා මාර්ගය" ඉති නාමෙන අභිසංඛතෝ.

කේන අභිසංඛතෝති චෙ? මරම්ම ජාතිකෙන භදන්ත යූ. ඤාණින්ද සෙයාඩෝ මහාථෙරේන චේව සීහලිකෙන නාළයතෝ අරියධම්ම මහාථෙරේන චාති ද්වීහි අභිසංඛතෝ, තෙසු හි භදන්තාචරිය යූ. ඤාණින්ද සෙයාඩෝ මහාථෙරෝ මරම්ම-රට්ඨෙ ස්වේජෙන් නිකායන්තෝගධෝ, තස්මිං නිකායේ ආචරියාසභානං, සන්තිකෙ සාට්ඨකථං තේපිටකං පරියාපුණිත්වා, ඉතෝ සත්තතිංස සංවච්ඡරාතීතෙ ලංකාදීප මාගතෝ, දෙමටගොඩ මහා විසුද්ධාරාමාදීසු විස්සුතේසු විහාරෙසු වසන්තෝ සීහල භාසය ඡෙක පටුභාවඤ්ච පත්තෝ, ඉදානි ගාලුනගරස්ස සමීපේ වැකුණගොඩ ගාමාසන්නෙ " ධම්මායතන මිති විස්සුතේ මරම්මාරාම විහාරේ වසති. ලංකාදීපේ රජ්ජාමච්චාදීහිපි සක්කතො පූජිතෝ සෝ ඤාණින්ද මහාථෙරෝ සීහලිකානං සද්ධා පසන්නානං සීහල භාසාය ධම්මං දෙසෙන්තෝ කම්මට්ඨානං කථෙන්තෝ අතීව සාසනං ජොතේති.

තස්මිං ධම්මායතනෙ වසන්තො සො මහාථෙරො ඉදං ච '' යමක වාචානා මාර්ගය ''ඉති ගන්ථං අභිසංඛරි සද්ධිං නාළයනෙ අරියධම්මත්ථෙරේන ලංකාදීපෙ අග්ග විනිච්ඡයකාර ධුරන්ධරස්ස පාරින්ද රණසිංහ මහාසයස්ස ආරාධනේන. නාළයනෙ අරියධම්මත්ථෙරො පන සිරි ලංකා රාමඤ්ඤ මහා නිකායේ සිරිකල්‍යාණි යෝගස්සම සත්ථා නාම භික්ඛුවංසෙ, රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහොපජ්ඣාය මහාථෙරස්ස චෙව රාජකීය පණ්ඩිත කඩවැද්දුව ගාමෙ සිරි ජිනවංසාභිධාන මහාථෙරවරස්ස ච සිස්සපුත්තො යතිත්‍රජෝ, තේසං ආචරියාසභානං අනුග්ගහං නිස්සාය තේපිටකේ බුද්ධවචනෙ සාට්ඨකථා ටීකා ගන්ථන්තරෙසු ඡෙක පටුභාවංච පත්තො,

කොළඹ නගරේ දෙමටගොඩ මහාවිසුද්ධාරාම වාසිනො දෙව්නුවර ඤාණාවාසාභිධානස්ස චෙව, පොකුණුවිට විනයාලංකාරාමාධිපතිනො ආචරිය රේරුකානෙ චන්දවිමලාභිධානස්ස චාති ලංකා ස්වේජෙන් නිකායේ මහානායක ථෙරවරානං සන්තිකෙ අභිධම්ම පිටකෙ ච විඤ්ඤුතං පත්තො, ආචරිය යූ. ඤාණින් ද සෙයාඩෝ මහාථෙරං නිස්සාය මරම්ම භාසං ච උග්ගහිතො ඉදනි ජාතියා සමපණ්ණාස වස්සො සාසනේ උපසම්පදය සමතිංස වස්සො, එවං හි සො තෙසං ආචරිය වරානං සන්තිකේ උග්ගණ්හිත්වා පිටකේ ගන්ථන්තරේසු ච විඤ්ඤුතං පාපුණිත්වා අරඤ්ඤ වාසිනං සිස්සගණානංතේපිටකං සාට්ඨකථා ටීකං වාචෙන්තො ධම්ම ගන්ථෙ ච සම්පාදෙන්තො බුද්ධ සාසනං අතිව ජෝතේති

කාලෙනකාලං පන ආචරියවරස්ස ඤාණාරාමාභිධානස්ස මහාථෙරස්ස සන්තිකෙ කම්මට්ඨානං ගහෙත්වා සමථ විපස්සනා ධුරම්පි වහති. කොළඹ නගරේ ගාලු නගරේ ච මහා ජනස්ස සමථ විපස්සනා කම්මට්ඨානම් පි උග්ගණ්හාපනේ නියුත්තෝ සෝ නාළයනේ අරියධම්ම ථෙරෝ ඉදනි අම්බලන්ගොඩ නගර සමීපේ කහව - ගල්දූව - සිරි ගුණවර්ධන යෝගස්සමෙ වසන්තෝ සිරි කල්‍යාණි යෝගස්සම සංඝ සභායං සඞ්ඝාලෝචක ධුරං සමලේඛකධුරඤ්ච වහන්තෝ සද්ධම්මස්ස ච චිරට්ඨිතිං කරෝතීති ඉදමත්ථං පවේදේමි.

සුඛී අත්තානං පරිහරන්තු.

ඉත්ථමාවේදේති,
කොළඹ නගරේ , දෙමටගොඩ පදේසේ
මකුටාරාම වාසී, මරම්ම ජාතිකෝ
භදන්ත පණ්ඩිත යූ. නන්දමාලාභිවංසෝ මහාථෙරෝති.

බු: ව: 2533
ක්‍රි: ව: 1989-07-25

# විෂය මාතෘකා සූචි

**1 මූල යමකය** - කුශලත්‍රික උද්දේසය 1-2. ඒකමූල යමකය 3. **අඤ්ඤමඤ්ඤ** මූල යමකය 3-5. මූල මූලනය 5-6. මූලක නය–මූල මූලක නය – අකුසල පද වාරය– අව්‍යාකෘත පද වාරය, 6. නාමපද වාරය – හේතු වාරය 7. නිදන වාරය– සම්භව වාරය 8, පහව වාරය – සමුට්ඨාන වාරය ආහාර වාරය 9. ආරම්මණ වාරය– පච්චය වාරය 10. සමුදය වාරය 10–11. වේදනා ත්‍රිකය 11. දුක මාතිකා 11–13.

නිද්දේස මූලවාරය 14. කුසලපද මූලනය 14–16. ඒකමූලයමකය 16-17 කොටස් බෙදීම 17–18. **අඤ්ඤමඤ්ඤ** මූල යමකය 18–20. මූල මූලනය ආදිය– 20–21. අකුසල පද මූලනය–අකුසල පද වාරය 21.ඒකමූල යමකය 22. **අඤ්ඤමඤ්ඤ** මූල යමකය 22–23. මූලකනය 23-24. අව්‍යාකෘත පද මූලනය 24.ඒකමූල යමකය 25. **අඤ්ඤමඤ්ඤ** මූල යමකය 26. නාමපද මූලනය 27. ඒකමූල යමකය 27-28 නාමපද මූල මූලනය 29. හේතුවාරය නිදානවාර ආදිය 29. වේදනා ත්‍රිකය ඒකමූල නය 30. **අඤ්ඤමඤ්ඤ** මූල යමකය 31. විපාක ත්‍රිකය 31. ඒකමූල නය. **අඤ්ඤ මඤ්ඤ** මූලය 32–33.උපාදින්න ත්‍රිකය 33–35. සංකිලිට්ඨ ත්‍රිකය 35.36– විතර්ක ත්‍රිකය 36-38. සනිදස්සන සප්පටිඝත්‍රිකය 38–39. දුකමාතිකා – හේතු ගොච්ඡකය 39.40. ආසව ගොච්ඡකය 40–41. නිගමනය 41.

**2. ස්කන්ධ යමකය** - පණ්ණත්ති වාර උද්දේශය 42. 1. පදශෝධන වාරය 42-45 2. පදශෝධන මූලචක්‍රවාරය 45-46. 3. සුද්ධ ස්කන්ධ වාරය 47. සුද්ධ ස්කන්ධ මූල චක්‍ර වාරය 47-48. පණ්ණත්ති වාර නිර්දේශය. 48-51. වේදනා ස්කන්ධ යමකය - සංඥස්කන්ධ යමකය 51. සංස්කාරස්කන්ධ යමකය – විඥානස්කන්ධ යමකය 52. ප්‍රත්‍යනික වාරය 52–53. පදශෝධන මූල චක්‍ර වාරය – ප්‍රත්‍ය නිකය 54. සුද්ධ ස්කන්ධ වාරය 54–56. සුද්ධ ස්කන්ධ මූලචක්‍ර වාරය 56-59. වේදනා ස්කන්ධ මූලය 59-60. ඕකාශ වාර රූපස්කන්ධ මූලය 60-61. පුද්ගලෝකාශ වාරය 61-62. ප්‍රත්‍යනික පුද්ගල වාර රූපස්කන්ධ මූලය 62-63. ඕකාශ වාරය 63. පුද්ගලෝකාශ වාරය 64. අතීත වාරය 64. පුද්ගලෝකාශ වාරය 65. ප්‍රත්‍යනික පුද්ගල වාරය 65.66. අනාගත පුද්ගල වාරය 66-68. පුද්ගලෝකාශ වාරය ප්‍රතිලෝම අභිධෙය්‍ය 68.

ප්‍රත්‍යනික පුද්ගල වාරය - පුද්ගලෝකාශ වාරය 69. වර්තමාන පුද්ගල වාරය 70–. පුද්ගලෝකාශ වාරය 71–72. ප්‍රත්‍යනික පුද්ගල වාරය 73–75. පුද්ගලෝකාශ වාරය 76–77. ප්‍රත්‍යනික පුද්ගල වාරය 77-78. පුද්ගලෝකාශ වාරය 78-79. අතීතානාගත පුද්ගලෝකාශ වාරය 80. ප්‍රත්‍යනික පුද්ගල වාරය 81. පවත්ති –

නිරෝධ - වර්තමාන පුද්ගල වාරය 81-82. අනාගත පුද්ගල වාරය 82-84. වර්තමානාතීත වාරය 84-85. වර්තමානානාගත පුද්ගලවාරය 85 87. අතීතානාගත පුද්ගල වාරය 87-89.

ප්‍රවෘත්ති - උත්පාද නිරෝධ වර්තමාන වාරය 89-90. අනාගත පුද්ගල වාරය 90-92. වර්තමානානාගත පුද්ගල වාරය 92-93. ස්ථාන (27) සත්විස්ස 93. පරිඤ්ඤා වාර වර්තමාන 94-95. අතීත වාරය - අනාගත වාරය - වර්තමානාතීත වාරය 96. කොටස් බෙදීම 97. වර්තමානානාගත වාරය 97-98. අතීතානාගත වාරය 98-99. අධිප්‍රාය 99-100.

3. **ආයතන යමකය**- ප්‍රඥප්ති වාර උද්දේශය 101. 1 'පදශෝධන වාරය 101-102. 2 පදශෝධන මූලචක්‍ර වාරය 102-103. 3 ශුද්ධායතන වාරය - ශුද්ධායතන මූල චක්‍ර වාරය 104. ප්‍රඥප්ති වාර නිර්දේශය 104-109. පද ශෝධන මූල චක්‍ර වාරය- ප්‍රත්‍යනීකය 109 - ශුද්ධායතන වාරය 109-111. ශුද්ධායතන මූලචක්‍ර වාරය 111. ප්‍රවෘත්ති උත්පාද වර්තමාන වාරය චක්ඛායතන මූලය 111-118. සෝතායතන මූලය 118-120. ජිව්හායතන මූලය 120-123. ගන්ධායතන මූලාදිය - මනායතන මූලය 123-124. ඔකාශ වාරය 124. පුද්ගලෝකාශ වාරය 124-126. ප්‍රත්‍යනීක පුද්ගල වාරය 126-127. ඔකාශ වාරය 127-128.

අතීත වාරය - පුද්ගලෝකාශ වාරය 128-131. අනාගත පුද්ගල වාරය 131-133 පුද්ගලෝකාශ වාරය 134-138. වර්තමානාතීත වාරය 138-140. පුද්ගලෝකාශ වාරය චක්ඛායතනය මූලය 140-143. සෝතායතන මූලය 143-145. ජිව්හායතන මූලය 145-147. වර්තමානානාගත වාරය 147 - 154. පුද්ගලෝකාශ වාරය- චක්ඛායතන මූලය 154-158. සෝතායතන මූලය 158-160. රූපායතන මූලය 161. අතීතානාගත වාරය 162-163. පුද්ගලෝකාශ වාරය චක්ඛායතන මූලය 163-165. සෝතායතන මූලය 165-167. නිරෝධ වර්තමාන වාරය 167-168. අනාගත වාර චක්ඛායතන මූලය 169-170. සෝතායතන මූලය 170-171. මනායතන මූලය 172. පුද්ගලෝකාශ වාරය - චක්ඛායතන මූලය 172-175. වර්තමානාතීත පුද්ගල වාරය 176. පුද්ගලෝකාශ වාරය 176-177. වර්තමානානාගත පුද්ගල වාරය චක්ඛායතන මූලය 177-179. සෝතායතන මූලය 179-181. රූපායතන මූලය 181-182. මනායතන මූලය 182.

පුද්ගලෝකාශ වාරය - චක්ඛායතන මූලය 182-185. සෝතායතන මූලය 185-187. රූපායතන මූලය 187-188. මනායතන මූලය 188-189. අතීතානාගත පුද්ගල වාරය - චක්ඛායතන මූලය 189-190. පුද්ගලෝකාස වාරය - චක්ඛායතන මූලය 190-192. සෝතායතන මූලය 192-194. රූපායතන මූලය 194-195. උත්පාද නිරෝධ වර්තමාන වාරය 195-197. අනාගත වාර චක්ඛායතන මූලය 197-198. සෝතායතන මූලය 199-200. මනායතන මූලය 200. පුද්ගලෝකාශ වාරය - චක්ඛායතන මූලය 201-202. සෝතායතන මූලය 202-203. රූපායතන මූලය 203-204

මනායතන මූලය 204. වර්තමානානාගත වාරය - චක්ඛායතන මූලය 204-206. ඝානායතන මූලය 206-207. පුද්ගලෝකාශ වාරය චක්ඛායතන මූලය 207-208. ඝානායතන මූලය 208-210. රූපායතන මූලය 210. මනායතන මූලය 210-211. **පරිඥ්ඥා** වාරය 211.

4. **ධාතු යමකය**- ප්‍රඥප්ති වාර උද්දේශය 213. ප්‍රඥප්ති වාර නිද්දේශය 213-214. ප්‍රවෘත්ති වාරය 214. පරිඥ වාරය 215.

5 **සච්ච යමකය** - ප්‍රඥප්ති වාර උද්දේශය 216-217. ප්‍රඥප්ති වාර නිර්දේශය- පද ශෝධන වාරය - අනුලෝම 218-220. ප්‍රත්‍යනිකය 220-221. පදශෝධන මූල චක්‍ර වාරය – අනුලෝමය 222. ප්‍රත්‍යනිකය 222. ශුද්ධ සත්‍ය වාරය අනුලෝම 223. ප්‍රත්‍යනික 223-224. ප්‍රවෘත්ති වාර උත්පාද වර්තමාන වාරය – දුක්ඛ සත්‍ය මූලය 225-228. සමුදය සත්‍ය මූලය 228. කොටස් බෙද දැක්වීම 229. ඕකාශ වාරය 229-230. පුද්ගලෝකාශ වාරය දුක්ඛ සත්‍ය මූලය 230-231. අතීත පුද්ගල වාරය- දුක්ඛ සත්‍ය මූලය 232. පුද්ගලෝකාශ වාරය දුක්ඛ සත්‍ය මූලය 233-235.

අනාගත වාරය – දුක්ඛ සත්‍ය මූලය 236-238. සමුදය සත්‍ය මූලය 238-239 පුද්ගලෝකාශ වාරය – දුක්ඛ සත්‍ය මූලය 239-243. සමුදය සත්‍ය මූලය 244-247 වර්තමානාතීත වාරය - දුක්ඛ සත්‍ය මූලය - 247-249. සමුදය සත්‍ය මූලය 249-250 පුද්ගලෝකාශ වාරය දුක්ඛ සත්‍ය මූලය 250-257. වර්තමානානාගත පුද්ගල වාරය දුක්ඛ සත්‍ය මූලය 257-260. දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය 261-262. සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය 263-264. පුද්ගලෝකාශ වාරය දුක්ඛ සත්‍ය මූලය 264-268. දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය 268-271. සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය 272-274. අතීතානාගත පුද්ගල වාරය දුක්ඛ සත්‍ය මූලය 274. පුද්ගලෝකාශ වාරය – දුක්ඛ සත්‍ය මූලය 274-280. ප්‍රවෘත්ති නිරෝධ වර්තමාන වාරය 280. අනාගත පුද්ගල වාරය දුක්ඛ සත්‍ය මූලය 280-282. අනාගත පුද්ගල වාරය දුක්ඛ සත්‍ය මූලය 280-282. සමුදය සත්‍ය මූලය 282.

පුද්ගලෝකාශ වාරය - දුක්ඛ සත්‍ය මූලය 283-286. දුක්ඛ සමුදය මූල මාර්ග මූලි වාරය 286. සමුදය සත්‍ය මූලය 286-289. වර්තමානානාගත පුද්ගල වාරය- දුක්ඛ සත්‍ය මූලය 289-293. සමුදය සත්‍ය මූලය 293-294. පුද්ගලෝකාශ වාරය දුක්ඛ සත්‍ය මූලය 295-298. දුක්ඛ මූල මාර්ග මූලිය 298-301. සමුදය මූල මාර්ග මූලිය 301-303. අතීතානාගත පුද්ගල වාරය 303. පුද්ගලෝකාශ වාරය දුක්ඛ සත්‍ය මූලය 304-306. සමුදය සත්‍ය මූලය 306. උත්පාද නිරෝධ වර්තමාන වාරය 307-308. අනාගත පුද්ගල වාරය – දුක්ඛ සත්‍ය මූලය 308-309. පුද්ගලෝකාශ-වාරය දුක්ඛ සත්‍ය මූලය 310-311. සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය 311-313. වර්තමානානාගත පුද්ගල වාරය - දුක්ඛ සත්‍ය මූලය 313-316. සමුදය මූල මාර්ග මූලිය 316. පුද්ගලෝකාශ වාරය – දුක්ඛ සත්‍ය මූලය 317-321 පරිඥ වාරය 321-322..

6. **සංස්කාර යමකය** - ප්‍රඥප්ති වාර උද්දේශය 323-327. ප්‍රඥප්ති වාර නිර්දේශය පදශෝධන වාරය 327. කොටස් බෙද දක්වීම 328. ප්‍රත්‍යනීකය 328-330. පදශෝධන මූල චක්‍ර වාරය 330. ශුද්ධ සංස්කාර වාරය 331. ප්‍රවෘත්ති වාර උත්පාද වර්තමාන වාරය - පුද්ගල කායසංස්කාර මූලය 332-335. වචී සංස්කාර මූලය 335-336. ඕකාශ වාරය - කාය සංස්කාර මූලය 336. වචී සංස්කාර මූලය 337. පුද්ගලෝකාශ වාරය - කාය සංස්කාර මූලය 337-339. වචී සංස්කාර මූලය 339-340. අතීත පුද්ගල වාරය 340. පුද්ගලෝකාශ වාරය 340-343. අනාගත පුද්ගල වාරය 343 345 පුද්ගලෝකාශ වාරය 345-353.

වර්තමානාතීත පුද්ගල වාරය 353-354. පුද්ගලෝකාශ වාරය කාය සංස්කාර මූලය 355-357. වචී සංස්කාර මූලය 357. වර්තමානානාගත පුද්ගල වාරය - කාය සංස්කාර මූලය 357-359. පුද්ගලෝකාශ වාරය - කාය සංස්කාර මූලය 359-363. වචී සංස්කාර මූලය 364-367. අතීතානාගත පුද්ගල වාරය 367-368. පුද්ගලෝකාශ වාරය - කාය සංස්කාර මූලය 368-370. කාය මූල චිත්ත මූලිය 370-372. වචීමූල චිත්ත මූලිය 372-373. ප්‍රවෘත්ති වාර නිරෝධ වර්තමාන වාරය 374. අනාගත පුද්ගල වාරය - කාය සංස්කාර මූලය 374-375. වචීමූල චිත්ත මූලිය 375-376. පුද්ගලෝකාශ වාරය - කාය සංස්කාර මූලය 376-379. කාය මූල චිත්ත මූලිය 379-381. වචීමූල චිත්තමූලිය 381-383. වර්තමානානාගත පුද්ගල වාරය කාය සංස්කාර මූලය 384. කායමූල චිත්තමූලි 384-385. වචීමූල චිත්ත මූලිය 385-386. පුද්ගලෝකාශ වාරය කාය සංස්කාර මූලය 386-389.

කායමූල චිත්ත මූලිය 389-391. වචීමූල චිත්ත මූලිය 391-393. අතීතානාගත පුද්ගල වාරය - කාය සංස්කාර මූලය 393-394. පුද්ගලෝකාශ වාරය - කාය සංස්කාර මූලය 394-396. කායමූල චිත්ත මූලිය 396. වචීමූල චිත්ත මූලිය 397-398. උත්පාද නිරෝධ වර්තමාන පුද්ගල වාරය 398. පුද්ගලෝකාශ වාරය - කාය සංස්කාර මූලය 399. කාය මූල චිත්ත මූලිය 400. වචීමූල චිත්ත මූලිය 401. පුද්ගලෝකාශ වාරය - වචීමූල චිත්ත මූලිය 401-402. වර්තමානානාගත පුද්ගල වාරය කාය සංස්කාර මූලය 402- 403. කාය මූල චිත්ත මූලිය 403. වචී මූල චිත්ත මූලිය 404. පුද්ගලෝකාශ වාරය - කාය සංස්කාර මූලය 404-406. කාය මූල චිත්ත මූලිය 406. වචීමූල චිත්ත මූලිය 407. පරිඥ වාරය 408.

# අභිධර්ම පිටකයේ
# යමක ප්‍රකරණයේ වාචනා මාර්ගය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!**

## 1. මූල යමකය
## කුසලත්‍රික උද්දේසය.

ධර්ම **ස්වාමීවූ** දශබලධාරී සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ අභිධර්ම පිටකයේ කථාවස්තු ප්‍රකරණය දේශනාකොට වදරා ඉන් අනතුරුව යමක ප්‍රකරණය දේශනා කළසේක. ඒ යමක ප්‍රකරණයද වනාහි මූල යමක, ඛන්ධ යමක, ආයතන යමක ධාතු යමක, සච්ච යමක, සංඛාර යමක, අනුසය යමක, චිත්ත යමක, ධම්ම යමක, ඉන්ද්‍රිය යමක, වශයෙන් දශ වැදෑරුම් වන්නේය. ඒ දශය අතුරෙන් මූල යමකය පළමු කොට වදළ සේක.

ඒ මූලයමකය ද උද්දේස නිද්දේස වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේසය පළමු කොට වදළ සේක. ඒ උද්දේසය ද තිකමාතිකා උද්දේසය දුක මාතිකා උද්දේසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් තිකමාතිකා උද්දේසය පළමු කොට වදළ සේක. ඒ තිකමාතිකා උද්දේසයද කුසලත්‍රික වේදනාත්‍රික යනාදි වශයෙන් (22) දෙවිසි වැදෑරුම් වන්නේය.

ඒ (22) දෙවිස්ස අතුරෙන් කුසලත්‍රිකය පළමු කොට වදළ සේක. ඒ කුස-ලත්‍රිකය ද මූලවාර, හේතුවාර, නිදනවාර, සම්භව වාර, පභව වාර සමුට්ඨාන වාර, ආහාරවාර, ආරම්මණවාර, පච්චයවාර, සමුදයවාර, වශයෙන් දස (10) වැදෑරුම් වන්නේය. ඒ (10) දසය අතුරෙන් මූලවාරය පළමු කොට වදළ සේක. ඒ මූලවාරය ද කුසලපද, අකුසලපද, අව්‍යාකෘත පද, නාමපද වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් කුසල පදය පළමු කොට වදළ සේක. ඒ කුසල පදය ද මූලනය, මූල මූලනය, මූලකනය, මූලමූලකනය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් මූලනය පළමු කොට වදළ සේක.

ඒ මූලනය ද මූලයමක, ඒකමූලයමක, අඤ්ඤමඤ්ඤ මූලයමක වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් මූලයමකය පළමු කොට වදළ සේක. ඒ මූලයමකය ද අනුලෝම පුච්ඡා, පටිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට පදළ සේක.

ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවදෑරුම් වන්නේය· ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, **''යෙ කෙචි කුසලා ධම්මා''** යනුවෙනි. ඊට අනතුරුව සංසය වදළ සේක.

කෙසේ වදළ සේක් ද යත් "**සබ්බෙ තෙ කුසල මූලා**" යනුවෙනි. "**යෙ කෙචි** **කුසලා ධම්මා**" යනු සන්නිට්ඨානයයි. "**සබ්බෙ තෙ කුසල මූලා**" යනු සංසයයි. සන්නිට්ඨාන සංසය යන දෙපදයාගේ එකතුව අනුලෝම පුච්ඡාව නම් වන්නේය.

අනුලෝම පුච්ඡාව වදරා ඉන් අනතුරුව පටිලෝම පුච්ඡාව වදළ සේක. ඒ පටිලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නීය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් '**යෙ වා පන කුසල මූලා**" යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, "**සබ්බෙ තෙ ධම්මා කුසලා**" යනුවෙනි. ,'**යෙ වා පන කුසල මූලා**" යනු සන්නිට්ඨානයයි. "**සබ්බෙ තේ ධම්මා කුසලා**" යනු සංසයයි. සන්නිට්ඨාන සංසය යන දෙපදයාගේ එකතුව පටිලෝම පුච්ඡාව නම් වන්නේය. අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා යන දෙපදයාගේ එකතුව මූලන- යෙහි පළමු වැනි වූ මූලයමකය නම් වන්නේය.

["**යෙ කෙචි කුසලා ධම්මා**" යනු සන්නිට්ඨානයයි ද, **සබ්බෙ තෙ කුසල මූලා** යනු සංසයයි ද දක්වන ලද්දේ කවර හෙයින් ද යත්, නියම වශයෙන් දක්වන ලද අර්ථ ඇත්තේ සන්නිට්ඨාන නම් වේ. සැක සහිත අර්ථ දක්වන ලද බැවින් සංසය නම් වන්නේය. නියම වශයෙන් අර්ථය දක්වන ලද්දේ කවර හෙයින් ද, (අනියම්) සැක සහිත අර්ථ දක්වන ලද්දේ කවර හෙයින් ද යත් "යෙ කෙචි කුසලා ධම්මා" යන සන්නිට්ඨාන පදයෙහි කුසල් සිත් (21) එක් විස්සය හා සම්ප්‍රයුක්ත අටතිස් (38) චෛතසිකය යන මේ ධර්මයෝ කුසල් නම් වන්නාහු ද නොවන්නාහු දැයි සැකයෙක් නැත්තේය. ඒකාන්තයෙන්ම කුසල් නම් වන්නාහු යැයි නියම වශයෙන් අර්ථ දක්වන බැවින් "**යෙ කෙචි කුසලා ධම්මා**" යන මේ පදය සන්නිට්ඨාන නම් වන්නේය. "**සබ්බෙ තෙ කුසල මූලා**" යන්නෙහි කුසල මූල තුන (3) කුසල්ම වන්නාහු ද, නැතහොත් කුසල් නොවන්නාහු දැයි සැක සහිත අර්ථ ඇති බැවින් "**සබ්බෙ කුසල මූලා**" යන පදය සංසය නම් වන්නේය.

එනිසා අට්ඨකථාවෙහි "යෙ කෙචි කුසලා ධම්මාති කුසලෙසු කුසලානුබො- නතුබො කුසලාති සන්දෙහාභාවතො ඉමස්මිං පදෙ සන්නිට්ඨානත්ථො වෙදි- තබ්බො," යනාදීන් කියන ලදී.

මේ නයින් සියලු යමකයන්හි සන්නිට්ඨාන සංසය ලැබෙන අයුරු සැළකිය යුතුයි. තේරුම:- යෙ කෙචි කුසලා - යම් ඒ කුසල් නම් වූ; හෙවත් අනවද්‍ය ඉෂ්ඨ විපාක දීම ලක්ෂණ කොට ඇත්තා වූ; ධම්මා - ධර්ම කෙනෙක්; සන්ති - විද්‍යමාන වෙත් ද; සබ්බෙ තෙ ධම්මා - ඒ සියළු ධර්මයෝ; කුසලමූලා - කුසල මූල නම් වන්නාහු ද; යෙ වා පන කුසල මූලා - යම් ඒ කුසල මූල නම් වූ; ධම්මා - ධර්ම කෙනෙක්; සන්ති, - විද්‍යමාන වෙත් ද; සබ්බෙ තෙ ධම්මා,- ඒ සියළුම ධර්මයෝ; කුසලා, - කුසල් නම් වන්නාහු ද.]

## ඒක මූලයමකය

මූලයමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව ඒකමූලයමකය වදළ සේක. ඒකමූල යමකය ද අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – **"යෙ කෙචි කුසලා ධම්මා"** යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – **"සබ්බෙ තෙ කුසල මූලෙන එක මූලා"** යනුවෙනි. **"යෙ කෙචි කුසලා"** යනු සන්නිට්ඨානයයි. **සබ්බෙ තෙ කුසල මූලෙන එක මූලා"** – යනු සංසයයි.

සන්නිට්ඨාන – සංසය යන දෙකේ එකතුව අනුලෝම පුච්ඡාව නම් වන්නේය.

අනුලෝම පුච්ඡාව වදරා ඉන් අනතුරුව පටිලෝම පුච්ඡාව වදළ කසේ. ඒ පටිලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – **"යෙ වා පන කුසලමූලෙන එකමූලා"** යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – **"සබ්බෙ තෙ ධම්මා කුසලා"** යනුවෙනි. **"යෙ වා පන කුසල මූලෙන එකමූලා"** යනු සන්නිට්ඨානයයි. **"සබ්බෙ තෙ ධම්මා කුසලා"** – යනු සංසයයි. සන්නිට්ඨාන - සංසය යන දෙපදයේ එකතුවෙන් පටිලෝම පුච්ඡාව වන්නේය.

අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා දෙක එකතුවෙන් මූලනයෙහි දෙවැනි වූ ඒකමූල යමකය වන්නේය. යෙ කෙචි කුසලා, – යම් ඒ සියලු කුසල නම් වූ; ධම්මා, – ධර්ම කෙනෙක්; සන්ති; – ඇත්තාහු ද; සබ්බෙ තෙ ධම්මා; – ඒ සියලුම ධර්මයෝ; කුසලමූලෙන, – කුසල නම් වූ මූලය සමඟ – කුසල නම් වූ මූලය කරණ කොට ගෙන; එකමූලා, – සමාන මූල ඇත්තාහු ද; යෙ වා පන ධම්මා, – යම් ඒ ධර්මකෙනෙක් වනාහි; කුසල මූලෙන, – කුසල නම් වූ මූලය සමඟ හෙවත් කුසල මූලය කරණ කොට ගෙන; ඒක මූලා, – සමාන මූල ඇත්තාහු වෙත් ද; සබ්බෙ තෙ ධම්මා, – ඒ සියළු ධර්මයෝ; කුසලා, – කුසල් නම් වන්නාහු ද:

## අඤ්ඤමඤ්ඤ මූල යමකය

ඒක මූල යමකය වදරා ඉන් අනතුරුව අඤ්ඤමඤ්ඤ මූල යමකය වදළ සේක. ඒ අඤ්ඤමඤ්ඤ මූල යමකය ද අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් **"යෙ කෙචි කුසල මූලෙන එක මූලා ධම්මා"** යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – **"සබ්බෙ තෙ කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා"** යනුවෙනි. **"යෙ කෙචි කුසල මූලෙන**

**එක මූලා ධම්මා''** යනු සන්නිට්ඨානයයි. **''සබ්බෙ තෙ කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා''** යනු සංසයයි. සන්නිට්ඨාන සංසය දෙකෙහි එකතුවෙන් අනුලෝම පුච්ඡාව සම්පූර්ණ වන්නේය.

අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව පටිලෝම පුච්ඡාව දේශනා කොට වදාළ සේක. ඒ පටිලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, **''යෙ වා පන කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා''** යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත් **''සබ්බෙ තෙ ධම්මා කුසලා''** යනුවෙනි. **''යෙ වා පන කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා''** යනු සන්නිට්ඨානයයි. **''සබ්බෙ තෙ ධම්මා කුසලා''** යනු සංසයයි. සන්නිට්ඨාන සංසය යන දෙපදය එකතු වීමෙන් පටිලෝම පුච්ඡාව වන්නේය. අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා දෙක එකතු වීමෙන් මූලනයෙහි තුන්වැනි වූ අඤ්ඤමඤ්ඤ මූල යමකය සපිරෙන්නේය.

යෙ කෙචි – යම්තාක්, කුසල මූලෙන, – කුසල නම් මූලය සමඟ; එක මූලා, සමාන මූල ඇත්තා වූ; ධම්මා, – ධර්ම කෙනෙක්; සන්ති, – විද්‍යමාන වෙත් ද; සබ්බෙ තෙ ධම්මා, – සියලුම ඒ ධර්මයෝ; කුසල මූලෙන, – කුසල නම් වූ මූලය කරණකොට ගෙන; අඤ්ඤමඤ්ඤ මූලා, – එකක් අනෙකට මූල වන්නාහු ද, යෙ වා පන, – යම් ස්වභාව ධර්ම කෙනෙක් වනාහි; කුසල මූලෙන, – කුසල මූල නම් වූ මූලය කරණකොට ගෙන; අඤ්ඤමඤ්ඤ මූලා – එකක් අනෙකට මූල වන්නා වූ; ධම්මා, – ධර්ම කෙනෙක්; සන්ති, – විද්‍යමාන වන්නාහු ද; සබ්බෙ තෙ ධම්මා, – ඒ සියලු ධර්මයෝ; කුසලා, – කුසල් නම් වන්නාහු ද;

මෙසේ මූලනයෙහි යමකයෝ තිදෙනෙකි. පුච්ඡා සදෙනෙකි. අර්ථ දොළසෙකි. ඒක මූලයෙහි ඒක ශබ්දයාගේ අර්ථය වනාහි සංඛ්‍යා අර්ථයක් නොවන්නේය. සමාන අර්ථය වදරා ඇත්තේය. වචනාර්ථ විග්‍රහය වනාහි, – ''එකං මූලං යෙසං තෙ'ති එක මූලා'' යනුවෙන් විග්‍රහ කළ යුතුය. යෙසං, – යම් ධර්ම කෙනෙකුන්හට; එකං, සමානවූ; මූලං, – මූලයක්; අත්ථි, – ඇත්තේ ද; ඉති – තස්මා, – එසේ හෙයින්; තෙ ධම්මා, – ඒ ධර්මයෝ, එක මූලා, – ඒක මූල නම් වන්නාහ; බහුබ්බීහි අන්‍යාර්ථ සමාසයයි එ නිසා අර්ථකථාවෙහි; ''ගණනවසෙන එකමූලත්තං අගහෙත්වා සමානට්ඨෙන ගහෙතබ්බා'' යයි කියා ඇත්තේය. සමාන මූල ඇත්තේය යන්න වනාහි, ඵස්ස – වෙදනා සඤ්ඤා – චෙතනා යනාදි ධර්මයනට මූලය වන අලෝභ ආදි එක එක මූල ධර්මය මෙනි. එ නිසා අර්ථකථාවෙහි – ''යං ඵස්සස්ස මූලං, තදෙව වෙදනාදීනං'' යයි දක්වා ඇත්තේය. සමානාචරියක – සමානුපජ්ඣායක කියන්නාක් මෙන් ගත යුත්තේය.

තෙවැනි යමක පටිලෝම පුච්ඡාවෙහි, අනුලෝමය අනුව ''යෙ වා පන කුසලමූලෙන අඤ්ඤමඤ්ඤ මූලා, සබ්බෙ තෙ ධම්මා කුසල මූලෙන එක මූලා', යනුවෙන් නොවදරා කවර හේතුවකින්, ''සබ්බෙ තෙ ධම්මා කුසලා'' යැයි වදරණ ලද්දේ ද, යත්? ''අත්ථ විසෙසා භාවතො යයි අර්ථකථාවේ හේතු දක්වන ලදී. විශේෂාර්ථයක් නොමැති බැවින් යයි කියන ලද්දේ වේ. කවර හේතුවකින්

විශේෂාර්ථයක් නැතැයි කියනු ලැබේ ද; සබ්බෙ තෙ කුසල මූලෙන එකමූලා යයි පුච්ඡාව ඇති බැවින්; මූලානියානි එකතො උප්පජ්ජන්ති–යනාදී වශයෙන් පටිලෝම විස්සර්ජනයම පිළිතුරු වශයෙන් දක්විය යුතු වන්නේය. මෙසේ අනුලෝම පටිලෝම විස්සර්ජනය සමාන වන බැවින් ''සබ්බෙ තෙ ධම්මා කුසලා'' යැයි වදළ බව දත යුත්තේය.

අර්ථකථානය, – ඒක මූල අර්ථය සවිස්තරව ද අඤ්ඤමඤ්ඤ මූල අර්ථය කෙටි–යෙන් ද ඇති බැවින්, අඤ්ඤමඤ්ඤ මූලයට සන්නිට්ඨානය දක් වූ සේ ඒක මූල සංසය නොමැති බැවින් ද, සබ්බෙ තෙ කුසල මූලෙන එකමූලා යයි නොකියා, අඤ්ඤමඤ්ඤ මූල ඇත්තා වූ ධර්මයන්ගේ කුසල් බව ඉදින් විචාරන්නේ නම්, සබ්බෙ තෙ ධම්මා කුසලා යැයි පිළිතුරු දක්වා ඇත්තේය. ටීකා අර්ථය මෙසේය:– ''සබ්බෙ තෙ කුසල මූලෙන එක මූලා'' යනුවෙන් විචාරන්නේ නම්, ආමන්තා, එසේයයි ද, ''සබ්බෙ තෙ ධම්මා කුසලා'' යනුවෙන් විචාරන්නේ නම් ආමන්තා එසේ යයි ම පිළිතුරු වන්නේය. කුසල් මුල් තුන ගැන විසඳුමෙ වෙනසක් නොමැති බැවින් ''සබ්බෙ තෙ ධම්මා කුසලා'' යැයි වදරා ඇත්තේය. මේ වනාභි ආචාර්ය මතයයි.

## මූල මූල නය

මූල නය දේශනා කොට වදරා ඉන් අනතුරුව මූල මූල නය වදළ සේක. ඒ මූල මූල නය ද මූල මූල යමක, එක මූල මූල යමක, අඤ්ඤමඤ්ඤ මූල මූල යමක වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් මූල මූල යමකය පළමු කොට වදළ සේක. ඒ මූල මූල යමකය ද අනුලෝම පුච්ඡා – පටිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – ''**යෙ කෙචි කුසලා ධම්මා**'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – ''**සබ්බෙ තෙ කුසල මූල මූලා**'' – යනුවෙනි. ''**යෙ කෙචි කුසලා ධම්මා**'' – යනු සන්නිට්ඨාන යයි. ''සබ්බෙ තෙ කුසල මූල මූලා'' යනු සංසයයි. සන්නිට්ඨාන – සංසය දෙපදයාගේ එකතුව අනුලෝම පුච්ඡා නම වන්නේය.

අනුලෝම පුච්ඡාව වදරා ඉන් අනතුරුව පටිලෝම පුච්ඡාව වදළ සේක. එය ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරින් සන්නිට්ඨානය පළමු කොට වදළ සේ, කෙසේ වදළ සේක් ද යත්; ''**යෙ වා පන කුසල මූල මූලා**'' – යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, – ''**සබ්බෙ තෙ ධම්මා කුසලා**'' යනුවෙනි.; ''යෙ වා පන කුසල මූල මූලා'' – යනු සන්නිට්ඨානයයි. ''සබ්බෙ තේ ධම්මා කුසලා'' – යනු සංසයයි. සන්නිට්ඨාන- සංසය යන දෙපදයාගේ එකතුව පටිලෝම පුච්ඡාව නම වන්නේය. අනුලෝම පුච්ඡාව – පටිලෝම පුච්ඡාව එකතු වීමෙන් මූල මූල නයෙහි පළමුවැනි මූල මූල යමකය නම් වන්නේය.

කුසල මූල මූලා, – කුසල මූල නම් වූ මූලයෝ වන්නාහු ද, මෙය ද පෙර සේ මැයි. මූල නය අනුව අර් යෝජනාව ගත යුතුයි. ඉන් අනතුරුව ඒකමූල මූල යමකය වදළ සේක. පෙර සේ කියවනු. එක මූල මූලා; සමාන මූලයයි කියන ලද මූල ඇත්තාහු ද, මෙසේ අර් යොජනාව කළ යුතුයි. අඤ්ඤමඤ්ඤ මූල මූල යමකයෙහි ද, අඤ්ඤමඤ්ඤ මූල මූලා-එකක් අනෙකට මූල වන්නේ යයි කියන ලද මූලයෝ වන්නාහු ද; මෙසේ මූල මූල නයෙහි යමක (3) තුනකි පුච්ඡා (6) සයෙකි. අර් දෙළොසෙක් ද ලැබෙති.

## මූලක නය

මූල මූල නය දේශනා කොට වදරා ඉන් අනතුරුව මූලක නය වදළ සේක. ඒ මූලක නයද මූලක යමක ඒක මූලක යමක අඤ්ඤමඤ්ඤ මූලක යමක වශයෙන් තෙ වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් මූලක යමකය පළමු කොට වදළ සේක. කුසල මූලකා – කුසල නම් වූ මූල් ඇත්තාහු ද, ඒක මූලකා – සමාන මූල් ඇත්තාහු ද; අඤ්ඤමඤ්ඤ මූලකා – එකක් අනෙකට මූල වන මූල් ඇත්තාහු ද; මෙසේ මූලක නයෙහි යමක (3) තුනෙකි. පුච්ඡා (6) සයෙකි. අර් 12 දෙළොසෙක් ද වන්නාහ.

## මූල මූලක නය

මූලක නය දේශනා කොට වදරා ඉන් අනතුරුව මූල මූලක නය වදළ සේක. එය ද මූල මූලක යමක ඒක මූල මූලක යමක – අඤ්ඤමඤ්ඤ මූල මූලක වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ අතුරෙන් මූල මූලක යමකය පළමු කොට වදළ සේක. පෙර සේ කියනු කුසල මූල මූලකා, – කුසල මූල නම් වූ මූල් ඇත්තාහු ද; එක මූල මූලකා සමාන මූලයයි කියන ලද මූල් ඇත්තාහු ද; අඤ්ඤමඤ්ඤ මූල මූලකා, එකක් අනෙකට මූල වන්නාහු යයි කියන ලද මූල් ඇත්තාහු ද: මෙසේ වනාහි මූල මූලක නයෙහි යමක (3) තුනෙකි. පුච්ඡා (6) සයෙකි. අර් (12) දෙළොසෙක් ද වන්නාහ. මෙසේ කුසල පදයෙහි නය (4) සතරෙකි. යමක (12) දෙළොසෙකි. පුච්ඡා (24) සූ විස්සෙකි. අර් (48) අටසාළිසෙක් ද වන්නාහ.

## අකුසල පද වාරය

කුසල පද වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව අකුසල පද වාරය දේශනා කළ සේක. ඒ අකුසල පදය ද මූලනය මූල මූලනය – මූලක නය - මූල මූලකනය වශයෙන් සිව් වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් මූලනය පළමු කොට වදළ සේක. සෙස්ස පෙර කියන ලද කුසල පදය මෙන් බෙද කියනු, මෙසේ අකුසල පදයෙහි නය (4) සතරෙකි. යමක (12) දෙළොසෙකි පුච්ඡා (24) සූ විස්සෙකි. අර් (48) අටසාළිසෙක් ද වන්නාහ.

## අබ්‍යාකත පද වාරය

අකුසල පද වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව අව්‍යාකෘත පද වාරය වදළ සේක. කුසල පදය සේ බෙද කියනු. මෙසේ අව්‍යාකෘත පදයෙහි නය (4) සතරෙකි. යමක 12 කි. පුච්ඡා 24 කි. අර් (48) අටසාළිසෙක් ද වන්නාහ.

## නාමපද වාරය

අබ්‍යාකත පදය දේශනා කොට වදරා ඉන් අනතුරුව නාම පදය වදාළ සේක. ඒ නාම පදය ද මූලනය, මූල මූලනය, මූලක නය, මූල මූලක නය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් මූලනය පළමු කොට වදාළ සේක. ඒ මූලනය ද, සෙස්ස කුසල පදය මෙන් බෙද කියනු නාමමූලා – නාම නම් වූ මූලයෝ ද; මෙසේ නාම පදයෙහි නය (4) සතරෙකි. යමක 12 දොළසකි. පුච්ඡා 24 සූවිස්සකි. අර්‍ථ (48) සතලිස් අටක් ද ලැබෙති. මෙසේම මූලවාරයෙහි පද (4) සතරකි. නය (16) සොළසකි. යමක (48) සතලිස් අටකි. පුච්ඡා (96) සයානූවකි. අර්‍ථ (192) එකසිය දෙයානූවක් ද ලැබෙති.

කවර අර්‍ථයකින් මූල නම් වන්නේ ද: "මූලති පතිට්ඨාති ඵලං එත්ථාති මූලං" එත්ථ – කාරණෙ, - මෙ හේතුවෙහි; ඵලං, - ඵලය; මූලති පතිට්ඨාති, පිහිටන්නේ වේ ද: ඉති,-එනිසා; තං කාරණං,-ඒ හේතුව; මූලං, - මූල නම් වන්නේය· මූලං - යනු අධිකරණ සාධන කිතක පද විග්‍රහයයි. මූල ධාතුය, අ - ප්‍රත්‍යය, මූල ධාතු අර්‍ථයෙහි කර්තෘ අර්‍ථ ක්‍රියාව වනාහි ඵල - ප්‍රත්‍යයෝත්පන්න නම් වූ සම්ප්‍රයුක්ත ස්කන්ධ සහේතුක චිත්තජ රූප, සහේතුක චිත්තජ රූපයන්ගේ උත්පාදය ප්‍රධාන වශයෙන් ගනු ලැබේ. අධිකරණාර්‍ථ ක්‍රියාව වනාහි හේතු ධර්‍මයෝ සදෙන වෙති. සහජාත ආදි වශයෙන් ඇත්තා වූ ප්‍රත්‍යය ශක්තිය ඵලයය, අ-ප්‍රත්‍යයාගේ අර්‍ථය වනාහි ඒ ඵලෝපචාර වශයෙන් ගනු ලබන්නා වූ හේතු සය දෙන ගත යුතුයි. මෙසේ ඵල ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයන් ගේ පිහිටීමට උපකාර වන බැවින් මූල නම් වන්නාහ. ඒ මූල නාමයාගේ වශයෙන් වදරා ඇති බැවින් මූල වාරය නම් වන්නේය.

## හේතුවාරය

ඒ මූල වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව හේතුවාරය වදාළ සේක. ඒ හේතුවාරය ද වනාහි කුසල පද, අකුසල පද අබ්‍යාකත පද වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් කුසල පදය පළමු කොට වදාළ සේක. ඒ කුසල පදය ද හේතු නය, හේතු හේතු නය, හේතුක නය, හේතු හේතුක නය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් හේතු නය පළමු කොට වදාළ සේක. ඒ හේතු නය ද, හේතු යමක ඒක හේතු යමක, අඤ්ඤමඤ්ඤ හේතු යමක වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් හේතු යමකය පළමු කොට වදාළ සේක. පෙර සේ කියනු. කෙසේ වදාළ සේක් ද යත්; "යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ කුසල හෙතු; යෙ වා පන කුසල හෙතු සබ්බෙ තෙ ධම්මා කුසලා;" යනුවෙනි. ඒක මූලයෙහි දී කුසල හෙතුනා එක හේතු යැයි ද, අඤ්ඤමඤ්ඤ මූලයෙහි දී කුසල හෙතුනා අඤ්ඤමඤ්ඤ හෙතු යයි ද කිව යුතුයි. සෙස්ස මූල වාරය මෙන් බෙද කියනු. මේ අයුරෙන් හේතුවාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළසෙකි. යමක (48) අටසාලිසෙක් වෙති. පුච්ඡා (96) අනූභයෙකි. අර්‍ථ (192) එකසිය දෙයානූවෙක් වෙති. කවර හෙයකින් හේතු වාර නමැයි කියනු ලැබේ ද යත්; "**හිනොති පවත්තති ඵලං එතස්මාති හෙතු**" එතස්මා කාරණා, මේ කාරණයෙන්; ඵලං, – ඵලය; හිනොති පවත්තති, – පවත්නේ ද; ඉති එහෙයින්; තං කාරණං, – ඒ කාරණය; හේතු, - හේතු නම් වන්නේය, හෙතු - යනු අපාදන

සාධන කිතක පදයෙකි. හි-ධාතුවය, තු-ප්‍රත්‍යයයි. හි-ධාතුවෙහි ස්වරූපාර්ථය මූල ශබ්දයට සමාන මැයි. ඵල ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගේ උත්පාදයට හේතුවන බැවින් හේතු නම් වෙති. ඒ හේතු කරණකොටගෙන වදළ බැවින් හේතුවාර නම් වන්නේය.

## නිදානවාරය

හේතුවාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව නිදාන වාරය දේශනා කොට වදළ සේක. ඒ නිදාන වාරය ද කුසල පද ආදී වශයෙන් බෙද කියනු. නිදාන නය, නිදාන නිදාන නය, නිදානක නය, නිදාන නිදානක නය, වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. සෙස්ස මූල වාරය මෙන් බෙද කියනු.

මෙසේ නිදාන වාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළයෙකි. යමක (48) අටසාලියෙකි. පුච්ඡා (96) සයානුවෙකි. අර්ථ (192) එකසිය දෙයානුවක් ද වෙති. කවර හෙයකින් නිදාන වාර නම් වන්නේද යත්, -''අත්තනො ඵලං නිදෙතීති නිදානං'' යං කාරණං,-යම් කාරණයක්; අත්තනො ඵලං,–තමන් ගේ ඵලය; නිදෙති, –නිදහන් කරයි ද; ඉති, – ඒ නිසා; තං කාරණං, – ඒ කාරණය; නිදානං, – නිදාන නම් වන්නේය. නිදාන යනු කර්තෘ සාධන කිතක පදයෙකි. නි – පූර්ව ද – ධාතුයි. යු ප්‍රත්‍යයයි. නි පූර්ව ද ධාතුවෙන් නිපන් කර්තෘස්ථ ක්‍රියා පදයාගේ අභිධෙයාර්ථය වනාහි හේතු ධර්ම සදෙනාගේ හේතු – සහජාතාදි ප්‍රත්‍ය ශක්තිය නම් වන්නේය. යු - ප්‍රත්‍යයාගේ ස්වරූපාර්ථයෙන් ශක්තිමන්ත හේතු ධර්ම සදෙන ලැබෙති. තමන්ගේ ඵලය නිදහන් කරන බැවින් හේතු ධර්ම සදෙන නිදාන නම් වෙති. ඒ නිදානය කරණ කොට ගෙන වදළ වාරය බැවින් නිදාන වාරයයි කියනු ලැබේ.

## සම්භව වාරය

නිදාන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව සම්භව වාරය වදළ සේක. ඒ සම්භව වාරය ද කුසල පද යනාදී වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් කුසල පදය පළමු කොට වදළ සේක. ඒ කුසල පදයද සම්භවනය, සම්භව සම්භවනය, සම්භවකනය, සම්භව සම්භවකනය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. සෙස්ස මූලවාරය මෙන් බෙද කියනු. මෙසේ සම්භව වාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළසෙකි. යමක (48) අටසාලිසෙකි. පුච්ඡා (96) සයානුවෙකි. අර්ථ (192) එකසිය දෙයානුවෙකි.

කවර හෙයකින් සම්භව වාර නම් වන්නේ ද යත්; ''සම්භොති ඵලං එතස්මාති – සම්භවො;'' එතස්මා කාරණා, – මේ කාරණයෙන්; ඵලං, – ඵලය, – සම්භොති – මනාව හටගනී ද;, ඉති, – එනිසා; තං කාරණං, – ඒ හේතුව; සම්භවො, – සම්භව නම් වන්නේය. සම්භවො යනු අපාදාන සාධන කිතක පදයෙකි. සං – පූර්ව, භූ – ධාතුය, ණ – ප්‍රත්‍යය, අභිධෙයාර්ථය, හේතුවාරයට සමානය. ඵල – ප්‍රත්‍යයෝත්-පන්න ධර්මයන් මනාව උපදවන බැවින් සම්භව නම් වන්නේය. ඒ සම්භව පදය කරණ කොට ගෙන වදළ බැවින් මෙය සම්භව වාරය නම් වේ.

## පභව වාරය

සම්භව වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පභව වාරය දේශනා කොට වදළ සේක. ඒ පභව වාරය ද කුසල පද යනාදි වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. මූලවාරය මෙන් බෙදමින් කියනු. මෙසේ පභව වාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළසෙකි. යමක (48) අටසාලිසෙකි. පුච්ඡා (96) සයානුවෙකි. අර්‍ථ (192) එකසිය දෙඅනූවක් ද වන්නාහ.

කවර හෙයකින් පභව වාරයයි කියනු ලැබේ ද යත්, පභවති ඵලං එතස්මාති පභවො;'' එතස්මා කාරණා,–මේ කාරණයෙන්; ඵලං,–ඵලය,–පභවති,–අනේකා; කාරයෙන් උපදින්නේ නුයි; ඉති, – එනිසා; තං කාරණං; ඒ කාරණය; පභවො-පභව නම් වේ. පභවො යනු අපාදන සාධන කිතක පදයෙකි. ප–පූර්‍ව භූ–ධාතුය, ණ–ප්‍රත්‍යය, අභිධෙය්‍යාර්‍ථය හේතු වාරයට සමානය. ඵල ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයන් ගේ අනේකාකාරයෙන් ඉපදීමට හේතු වන බැවින් පභව නම් වන්නේය. ඒ පභව පදය කරණකොට ගෙන වදළ වාරය පභව වාරය නම් වන්නේය.

## සමුට්ඨාන වාරය

පභව වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව සමුට්ඨාන වාරය දේශනා කොට වදළ සේක. ඒ සමුට්ඨාන වාරය ද කුසල පද ආදි වශයෙන් බෙද දක්වනු. ''යෙ කෙචි කුසල ධම්මා, සබ්බෙ තෙ කුසල සමුට්ඨානා යෙ වා පන කුසල සමුට්ඨානා සබ්බෙ තෙ ධම්මා කුසලා'' ආදී නය ක්‍රමයට කියනු.

මෙසේ සමුට්ඨාන වාරයෙහි පද (4) සතරෙකි. නය 16 කි. යමක (48) අටසාලිසෙකි. පුච්ඡා (96) සයානුවෙකි. අර්‍ථ (192) එකසිය අනූ දෙකෙක් ද වෙති. කවර හෙයකින් සමුට්ඨාන වාරයයි කියනු ලැබේද යත් ''සමුට්ඨාති ඵලං එතෙනාති සමුට්ඨානං,'' එතෙන කාරණෙන, – මේ කාරණයෙන්; ඵලං,–ඵලය; සමුට්ඨාති,–ඉපදීම් වශයෙන් නැඟී සිටින්නේ නුයි; ඉති, – එනිසා; තං කාරණං, – ඒ හේතුව; සමුට්ඨානං, – සමුට්ඨාන නම් වේ. සමුට්ඨානං යනු කරණ සාධන කිතක පදයෙකි. සං – පූර්‍ව උ – පූර්‍ව ඨා – ධාතුවය, යු – ප්‍රත්‍යයයි. අභිධෙය්‍යාර්‍ථය හේතු - වාරයට සමානය, ඵල ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයන් උපදවන්නා වූ හේතුව බැවින් සමුට්ඨාන නම් වේ. ඒ සමුට්ඨානයාගේ වශයෙන් වදළ බැවින් සමුට්ඨාන වාරය නම් වේ.

## ආහාර වාරය

සමුට්ඨාන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ආහාර වාරය දේශනා කොට වදළ සේක. ඒ ආහාර වාරය ද පෙර සේ බෙදමින් කියනු. මෙසේ ආහාර වාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළසෙකි. යමක (48) අටසාලිසෙකි. පුච්ඡා (96) සයානුවෙකි. අර්‍ථ (192) එකසිය අනූදෙකක් ද වෙති.

කවර හෙයකින් ආහාරවාර නම් වන්නේ ද යත්; ''අත්තනො ඵලං ආහරතීති ආහාරො'' යංකාරණං – යම් හේතුවක්, – අත්තනො ඵලං, – තමන්ගේ ඵලය; ආහරති, – ගෙන එන්නේ ද ඉති, – එනිසා, තං කාරණං; ඒ හේතුව; ආහාරො

ආහාර නම් වේ. කර්තෘ සාධන කිතක විග්‍රහයයි. ආ - පූර් හර - ධාතුය, ණ - ප්‍රත්‍යය අභිධෙය්‍යාර්ථය නිදානවාරයට සමානය. ඵල ප්‍රත්‍යයෝත්පන්නයන් ගෙන එන බැවින් ආහාර නම්. ඒ ආහාරය කරණ කොට ගෙන වදාළ වාරය බැවින් ආහාර වාරය නම් වේ.

## ආරම්මණ වාරය

ආහාර වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ආරම්මණ වාරය දේශනා කළ සේක. පෙරසේම බෙදෙමින් කියනු මෙසේ ආරම්මණ වාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළයෙකි. යමක (48) අට සාලියෙකි. පුච්ඡා (96) සයානුවකි. අර්ථ (192) එකිසිය දෙඅනුවක් ද ලැබෙති.

කවර හෙයකින් ආරම්මණ වාර නම් වන්නේ ද යත්, "අත්තනො ඵලෙන ආලම්බීයතීති ආරම්මණං" යං කාරණං, - යම් හේතුවක්; අත්තනො ඵලෙන, - තමන්ගේ ඵල ධර්මය විසින් ආලම්බියති, - එල්බ ගනු ලැබේ ද; ඉති, - එනිසා; තං කාරණං, - ඒ හේතුව; ආරම්මණං, - අරම්මණ නම් වේ. ආරම්මණ යනු කර්ම සාධන කිතක පද විග්‍රහයෙකි. ආ - පූර්. ලම්බ - ධාතුය, යු - ප්‍රත්‍යයයි ආ පූර් ලම්බ ධාතුවෙහි කර්තෘස්ථ ක්‍රියාර්ථය වනාහි, ඵලය විසින් ප්‍රත්‍ය එල්බ ගැනීමේ ශක්තිය ප්‍රධාන වශයන් ගත යුතුය. කර්මාර්ථ ක්‍රියාවෙන් හේතුන්ගේ ප්‍රත්‍යය ආදන ශක්තිය ඵලය වශයෙන් කියැවේ. යු - ප්‍රත්‍යයාගේ අභිධෙය්‍ය වශයෙන් ඒ ඵලය විසින් අල්වා ගනු ලබන හේතු සදෙන ලැබෙති. ඵල ප්‍රත්‍යයෝත්පන්නයන් විසින් එල්බ ගනු ලබන බැවින් ආරම්මණ නම්. ඒ ආරම්මණ කරණ කොට ගෙන, වදාළ වාරය ආරම්මණ වාර නම් වේ.

## පච්චය වාරය

ආරම්මණ වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍ය වාරය වදාළ සේක. ඒ ප්‍රත්‍ය වාරය ද පෙර සේ බෙද කියනු. මෙසේ ප්‍රත්‍ය වාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළසෙකි. යමක (48) අට සාලිසෙකි. පුච්ඡා (96) සයනුවෙකි. අර්ථ (192) එකසිය දෙඅනුවක් ද වෙති.

කවර හෙයකින් ප්‍රත්‍යවාර නම් වේ ද යත්, - "පටිච්ච එති ඵලං එතස්මාති පච්චයො," - යං කාරණං පටිච්ච, - යම් හේතුවක් නිසා, එතස්මා කාරණා, - මේ කාරණයෙන්, ඵලං, - ඵලය; එති පවත්තති, - පවත්නේ ද; ඉති, - එනිසා; තං කාරණං; එම හේතුව; පච්චයෝ, - ප්‍රත්‍ය නම් වන්නේය. පච්චයො යනු අපාදන සාධන කිතක පදයෙකි. පති - පූර් ඉ - ධාතුය. ණ - ප්‍රත්‍යය අභිධෙය්‍යාර්ථය හේතුවාරයට සමානය. ඵල ධර්මයන්ගේ ඉපදීමට හේතුවන බැවින් ප්‍රත්‍යය නම් වේ. ඒ ප්‍රත්‍යයාගේ වශයෙන් වදාළ වාරය පච්චය වාරය නම් වන්නේය.

## සමුදය වාරය

පච්චය වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව සමුදය වාරය දේශනා කොට වදාළ සේක. පෙරසේ බෙද කියනු. මෙසේ සමුදය වාරයෙහි පද (4) සතරෙකි. නය (16) සොළසෙකි. යමක (48) අට සාලිසෙකි. පුච්ඡා (96) සයානුවෙකි. අර්ථ (192) එකසිය දෙඅනුවක් ද ලැබෙති.

තවද හෙයකින් සමුදය වාර නම් වේ ද යත්; "සමුදෙති ඵලං එතස්මාති සමුදයො" එතස්මා කාරණා, මේ හේතුවෙන්; ඵලං, – ඵලය; සමුදෙති, – උදවේ ද; ඉති, – එනිසා; තං කාරණං, – ඒ හේතුව, – සමුදයො, සමුදය නම් වේ. සමුදයො යනු අපාදන සාධන කිතක පද විග්‍රහයෙකි. සං – පූර්ව උ – පූර්ව ඉ – ධාතුය ණ – ප්‍රත්‍යය. අභිධෙයාර්ථ හේතුවාරයට සමානය. ඵල ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් උද කරවන බැවින් සමුදය නම් වේ. ඒ සමුදයාගේ වශයෙන් වදරා ඇති බැවින් මෙය සමුදය වාර නම් වන්නේය. මේ දශයක් වූ පදවාරයෝ වනාහි පද වශයෙන් පමණක් වෙනස් වෙති. අර්ථ වශයෙන් වෙනසෙක් නැත්තේය. මූල ශබ්දය අනුව දේශනා කිරීමෙන් අවබෝධ කර ගන්නා වූ වෛනෙය්‍ය පුද්ගලයන් උදෙසා මූලවාරය දේශනා කළ සේක. හේතු ආදී වාරයන් අනුව දේශනා කිරීමෙන් ධර්මාවබෝධය කරන්නා වූ වෛනෙය්‍ය පුද්ගලයන් පිණිස හේතුවාර ආදිය දේශනා කළ සේක. මෙසේ වෛනෙය්‍ය අධ්‍යාශයට අනුව වදරා ඇත්තාහ. මෙසේ මූලවාර – පෙ – සමුදය වාරයන් ගේ වශයෙන් වදළ දශ වාරය කුසලත්‍රික පදයාගේ උද්දේශය නම් වන්නේය. මෙසේ කුසල ත්‍රිකයෙහි වාර (10) දශයෙකි. පද (40) සතලිසෙකි. නය (160) එකසිය සැටෙකි. යමක (480) සාරසිය අසූවෙකි. පුච්ඡා (960) නවසිය සැටෙකි. අර්ථ (1920) එක්දහස් නවසිය විස්සෙක් ද වෙති.

## වේදනා ත්‍රිකය

කුසලත්‍රිකය දේශනා කොට වදරා ඉන් අනතුරුව වේදනා ත්‍රිකය දේශනා කළ සේක. සනිදස්සන සප්පටිඝත්‍රිකය තෙක් අනුපිළිවෙළින් දේශනා කළ සේක. ඒ වේදනා ත්‍රිකය ආදී ත්‍රිකයන්හි ද වාර (10) දශය බැගිනි. පද (40) සතලිස බැගිනි. නය (160) එකසිය සැට බැගිනි. යමක (480) සාරසිය අසූව බැගිනි. පුච්ඡා (960) නවසිය සැට බැගිනි. අර්ථ (1920) එක්දහස් නවසිය විස්ස බැගින් ද ලැබෙති.

මෙසේ ත්‍රික මාතෘකා උද්දේසයෙහි ත්‍රික (22) දෙවිස්සෙකි. වාර (220) දෙසිය විස්සෙකි. පද (880) අටසිය අසූවෙකි. නය (3520) තුන්දහස් පන්සිය විස්සෙකි. යමක (10560) දහ දහස් පන්සිය සැටෙකි. පුච්ඡා (21120) විසිඑක්දහස් එකසිය විස්සෙකි. අර්ථ (42240) සතලිස් දෙදහස් දෙසිය සතලියෙක් ද වෙති.

## දුක මාතිකා

ත්‍රික මාතෘකා උද්දේශය දේශනා කොට වදරා ඉන් අනතුරුව දුක මාතිකා උද්දේශය වදළ සේක. ඒ දුක මාතිකා උද්දේශය ද හේතු දුක උද්දේශය යනාදි වශයෙන් එක්සිය වැදෑරුම් වන්නේය. ඒ සියය අතුරෙන් හේතු දුක උද්දේශය පළමු කොට වදළ සේක. ඒ හේතු දුකය ද මූලවාර ආදීන්ගේ වශයෙන් (10) දශ වැදෑරුම් වන්නේය. ඒ (10) දශය අතුරෙන් මූලවාරය පළමු කොට වදළ සේක. ඒ මූල වාරය ද හේතු පද–නහේතු පද,–නාම පද වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් හේතු පදය පළමු කොට වදළ සේක. ඒ හේතු පදය ද මූලනය ආදී වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් මූලනය පළමු කොට වදළ සේක. ඒ මූලනය ද මූලයමක – ඒක මූලයමක – අඤ්ඤමඤ්ඤ

මූලයමක වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් මූලයමකය පළමු කොට වදාළ සේක. ඒ මූලයමකය ද අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා වශයෙන් දෙවදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදාළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්: ''යෙ කෙචි හෙතු ධම්මා'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්: ''සබ්බෙ තෙ හෙතු මූලා'' යනුවෙනි.

''යෙ කෙචි හෙතු ධම්මා'' යනු සන්නිට්ඨානයය. **''සබ්බෙ තෙ හෙතු මූලා''** යනු සංසයයි. සන්නිට්ඨාන සංසය දෙක එකතුවීමෙන් අනුලෝම පුච්ඡාව සපිරෙයි. අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව පටිලෝම පුච්ඡාව වදාළ සේක. ඒ පටිලෝම පුච්ඡාව ද පෙ – (පෙරසේ කියනු) අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා යන දෙකෙහි එකතුවෙන් මූලයෙහි පළමු වැනි වූ මූලයමකය සපිරේ.

මූලයමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව ඒක මූලයමකය දේශනා කොට වදාළ සේක. පෙර සේ කියනු. ඒකමූලයමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව අඤ්ඤමඤ්ඤ මූලයමකය දේශනා කොට වදාළ සේක. පෙර සේම කියනු. මේ අයුරෙන් මූලනයෙහි යමක (3) තුනෙකි. පුච්ඡා (6) සයෙකි. අර්‍ථ (12) දෙළොසෙක් ද වෙති. මූල මූලනයෙහි ද, මූලක නයෙහිද, මූල මූලක නයෙහිද නය ක්‍රමය සමානය. යමක (3) තුනෙක් ද පුච්ඡා (6) සයෙක් ද අර්‍ථ (12) දෙළසෙක් ද බැගින් ලැබෙති.

මේ ආකාරයෙන් හේතු පදයෙහි නය (4) සතරෙකි. යමක (12) දෙළසෙකි. පුච්ඡා (24) සුවිස්සෙකි. අර්‍ථ (48) අටසාලිසෙක් ද ලැබෙති.

හේතු පදය දේශනා කොට වදරා ඉන් අනතුරුව න හේතු පදය දේශනා කළ සේක. පෙර සේ බෙද කියනු. මෙසේ න හේතු පදයෙහි නය (4) සතරෙකි. යමක (12) දෙළසෙකි. පුච්ඡා (24) සුවිස්සෙකි. අර්‍ථ (48) අටසාලිසෙක් ද වෙති.

න හේතු පදය දේශනා කොට වදරා ඉන් අනතුරුව නාම පදය දේශනා කළ සේක. පෙර සේ බෙද කියනු. මෙසේ නාම පදයෙහි ද නය (4) කි. යමක (12) කි. පුච්ඡා (24) කි. අර්‍ථ (48) අටසාලිසෙක්ද වෙති. මෙසේ මූලවාරයෙහි පද (3) තුනෙකි. නය (12) දෙළසෙකි. යමක (36) සතිසෙකි. පුච්ඡා දෙසැත්තෑවෙකි. අර්‍ථ (144) එකසිද සුසාලිසෙක් ද ලැබෙති. හේතුවාර ආදි වූ වාර (9) නවයෙහි ද නය ක්‍රමය සමාන මැයි. මෙසේ හේතු දුකයෙහි වාර (10) දශයෙකි. පද (30) තිසෙකි. නය (120) එකසිය විස්සෙකි. යමක (360) තුන්සිය සැටෙකි. පුච්ඡා (770) සත්සිය සැත්තෑවෙකි. අර්‍ථ (1440) එක් දහස් සාරසිය සතලිසෙක් ද වෙති.

සහේතුක දුක ආදි වූ දුක (99) එකුන් සියයෙහි ද මේ නය ක්‍රමයට සමානවම ලැබෙන්නාහ. මෙසේ දුකමාතිකා උද්දේශයෙහි වාර (1000) දහසෙකි. පද (3000) තුන්දහසෙකි. නය (12000) දෙළොස් දහසෙකි. යමක (36000) සතිස්

දහසෙකි. පුච්ඡා (72000) දෙසැත්තෑ දහසෙකි. අට (1,44,000) එක්ලක්ෂ සුසාලිස් දහසෙක් වෙති. මේ ආකාරයෙන් තිකමාතිකා දුකමාතිකා රාශි දෙක එකතුවෙන් ලැබෙන්නාවූ වාර (1220) එක්දහස් දෙසිය විස්සෙකි. පද (3880) තුන්දහස් අටසිය අසූවෙකි. නය (15520) පසළොස් දහස් පන්සිය විස්සෙකි. යමක (46560) සතලිස් සයදහස් පන්සිය සැටෙකි. පුච්ඡා (93120) අනූතුන්දහස් එකසිය විස්සෙකි. අට (186240) එක්ලක්ෂ අසූහයදහස් දෙසිය සතලිසක් ද වෙති.

**තෙ නවුති සහස්සානි – වීසාධික සතම්පි ච**
**පුච්ඡා සම්පිණ්ඩිතා හොන්ති – උද්දෙසෙ මූලයමකෙ,**

මූලයමකෙ, – මූලයමකයෙහි; උද්දෙසෙ. – උද්දේශයෙහි; සම්පිණ්ඩිතා, – පිඩුකරන ලද්දවූ; පුච්ඡා, – පුච්ඡා වාරයෝ; තෙනවුති සහස්සානි, – අනූතුන් දහසෙක් ද වීසාධික සතම්පිච,–විස්සක් අධික කොට ඇති සියයෙක් ද; හොන්ති, – වෙති.

**මූලංහෙතු නිදානඤ්ච – සම්භවො පභවෙන ච**
**සමුට්ඨානා හාරාරම්මණං – පච්චයො සමුදයෙනවාති,**
**(මේ ගාථාවද කටපාඩම් කරනු.)**

උද්දේශය නිමි.

# නිද්දේස මූලවාරය

උද්දේශය දේශනා කොට වදරා අනතුරුව නිර්දේශය දේශනාකළ සේක. ඒ නිර්දේශය ද ත්‍රික මාතෘකා නිර්දේශය දුක මාතෘකා නිර්දේශය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් ත්‍රික මාතෘකා නිර්දේශය පළමුකොට වදළ සේක. ඒ ත්‍රික මාතෘකා නිර්දේශය ද කුශලත්‍රික – වේදනා ත්‍රිකාදි වශයෙන් (22) දෙවිසි වැදෑරුම් වන්නේය. ඒ (22) දෙවිස්ස අතුරෙන් කුසලත්‍රිකය පළමු කොට වදළ සේක. ඒ කුශලත්‍රිකය ද මූලවාර–පෙ – සමුදය වාර වශයෙන් (10) දශ වැදෑරුම් වන්නේය. ඒ දශය අතුරෙන් මූලවාරය පළමු කොට වදළ සේක. ඒ මූලවාරය ද කුසල පද, අකුසල පද, අව්‍යාකෘත පද, නාම පද වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් කුසල පදය පළමු කොට වදළ සේක. ඒ කුසල පදයද මූලනය – මූලමූලනය, මූලකනය, මූලමූලකනය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය.

## කුසල පද මූලනය

ඒ සතර අතුරෙන් මූලනය පළමු කොට වදළ සේක. ඒ මූලනය ද මූලයමක – එක මූලයමක – අඤ්ඤමඤ්ඤ මූල යමක වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් මූල යමකය පළමු කොට වදළ සේක.

ඒ මූලයමකය ද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද පුච්ඡා විස්සජ්ජනා වශයෙන් දෙවදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාව ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේ ද යත් ''යෙ කෙචි කුසලා ධම්මා'' යනුවෙනි. ඊට අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේ ද යත්, – ''සබ්බෙ තෙ කුසල මූලා'' යනුවෙනි.

පුච්ඡාව දේශනා කොට වදරා විස්සර්ජනය වදළ සේක. ඒ කෙසේ ද යත්, -''තීණෙව කුසල මූලානි, අවසෙසා කුසලා ධම්මා න කුසල මූලා,-'' යනුවෙනි. අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝමය දේශනා කළ සේක. ඒ ප්‍රතිලෝමය ද පුච්ඡා – විස්සර්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාව ද (පෙර සේ කියනු) කෙසේ වදළ සේක් ද යත්, – ''යෙ වා පන කුසල මූලා'' – යනුවෙනි. අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේ ද යත්, – ''සබ්බෙ තෙ ධම්මා කුසලා'' – යනුවෙනි. පුච්ඡාව දේශනා කොට වදරා අනතුරුව විස්සර්ජනාව වදළ සේක. ඒ කෙසේද යත්, – ''ආමන්තා'' – යනුවෙනි.

යෙ කෙචි කුසලා ධම්මා, – යම්තාක් කුසල නම් වූ ධර්ම කෙනෙක්; සන්ති, – ඇත්තාහු ද; සබ්බෙ තෙ ධම්මා, – ඒ සියලු කර්මයෝ; කුසලමූලා, – කුසල නම් වූ මූලයෝ ද; ඉති පුච්ඡාය‍ං – මෙ වැනි ප්‍රශ්නයක්; සති, – ඇති කල්හි; තීණෙව – තීණි+එව, – අලෝභ – අද්වේෂ – අමෝහයැයි කියන ලද කුසල මූල තුණම; කුසල මූලානි; – කුසල මූලයෝ වෙති. අවසෙසො, – කුසල මූල තුන හැර සෙසු; කුසලා

ධම්මා, – කුසල සිත් (21) එක්විස්සය, (35) පන්තිස් චෛතසිකය යන කුසල ධර්මයෝ; න කුසල මූලා, – කුසල මූලයෝ නම් නොවෙති. ඉති විස්සජ්ජනා හොති,–මෙසේ විසඳුම වෙයි. යෙ වා පන කුසලමූලා, – යම් ඒ කුසල මූල නම් වූ, ධම්මා –ධර්‍ම කෙනෙක්; සන්ති, – ඇත්තාහු ද; සබ්බෙ තෙ ධම්මා, – ඒ සියලු ධර්මයෝ; කුසලා, – කුසල් නම් වන්නාහු ද; ඉති පුච්ඡාය සති, – මෙසේ ප්‍රශ්න-යක් ඇති කල්හි, – ආමන්තා, – කුසල මූල නම් වූ ධර්මයෝ කුසල නම් වෙතියි; ඉති විස්සජ්ජනා හොති, – මෙසේ විසඳුම වෙයි.

''යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ කුසල මූලා'' – යනුවෙන් වදළ අනුලෝම ප්‍රශ්නයෙහි, යෙ කෙචි කුසලා ධම්මා යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය වනාහි – කුසල් සිත් (21) එක්විස්ස සහ කුසල් මුල් (3) තුන හැර ඉතිරි චෛතසික (35) පන්තිස ලැබෙති. කුසල් මුල් (3) තුනද ලැබෙති. සබ්බෙ තෙ කුසලමූලා ''යන සංසය පදයාගේ'' අභිධෙය්‍යාර්ථ වනාහි – කුසල මූල (3) තුන පමණක්ම ලැබෙති.

**කොටස් බෙදීම** එසේ ලැබෙන බැවින් කුසල නම්වූ සියලු ධර්මයෝ කුසල මූල නම් වන්නාහු දැයි සර්වඥයන් වහන්සේගේ සිතෙහි සැකයක් නැත්තේ නමුත්, වෛනෙය්‍යාද්ධ්‍යාශය අනුව ප්‍රශ්න කොට, ප්‍රශ්න සතර අතුරෙන් පූර්ව ප්‍රශ්න – පුච්ඡා ප්‍රශ්න දෙකෙහි ලක්ෂණයෙන් සපිරුණු පරිපූර්ණ ප්‍රශ්නයාගේ වශයෙන් වදළ පිළිතුරට අනුරූපව සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථයම දක්වා සංසය පදයාගේ අභිධෙය්‍ය නොකියා හැර, කුසල් සිත් (21) එක් විස්සය. කුසල් මුල් (3) තුන හැර ඉතිරි චෛතසික (35) පන්තිස යන පූර්ව කොට්ඨාශයම දක්වා සංසය පදය ප්‍රතිෂෙධ කරන ලදී.

සන්නිට්ඨාන සංසය දෙකම සමාන අභිධෙය්‍ය ඇති බැවින් කුසල මූල (3) තුන පශ්චිම කොට්ඨාශයෙහි ඇතුලත්කොට, කිවයුතු පිළිතුරු නොකියන ලද්දේ ''අවසෙසා'' යන පාඨයෙන් ඉතිරි පදය අවබෝධ කර ගැනීම පිණිසය. සන්නි-ට්ඨාන සංසය යන දෙපදයේම අභිධෙය්‍යාර්ථය වනුයේ කුසල මූල තුන පමණකි. ''තීණෙව කුසල මූලානි''යයි පළමු කොටසෙහි ඇතුලත් කොට සංසය පදය ප්‍රතිෂෙධ නොකොට, සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යම සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථ නොකොට කුසල් සිත් (21) එක් විස්ස ද, කුසල මූල (3) තුන හැර චෛතසික (35) පන්තිස ද අවසෙසා කුසලා ධම්මා, න කුසල මූලායයි පශ්චිම කොට්ඨාශයෙහි ඇතුලත්කොට සංසය පදය ප්‍රතිෂෙධ නොකොට කියන ලදී. පිළිතුරු පස අතුරෙන් පූර්වපශ්චිම කොට්ඨාශ දෙකටම සමාන අභිධෙය්‍යාර්ථ වශයෙන් සමාන විස්සර්ජනයෙන් පිළිතුරු දෙන ලද්දේ වේ.

යෙ වා පන කුසල මූලා සබ්බෙ තෙ ධම්මා කුසලා'' යයි වදළ ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි ''යෙ වා පන කුසල මූලා'' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙ-ය්‍යාර්ථයෝ නම්; කුසල් මුල් තුන ලැබෙති. ''සබ්බෙ තෙ ධම්මා කුසලා'' යන සංසය පදපාගේ අභිධෙය්‍යාර්ථයෝ ද කුසල මූල තුනම වෙති. එසේ ඒ දෙක සමානව ලැබෙන බැවින්, අනවද්‍ය ස්වභාව ඇති කුසල නම් වූ කුශල මූල ධර්මයෝ කුසල් නම් වෙත්දැයි සර්වඥයන් වහන්සේගේ සිතේ සැකයක් නැති නමුත්, වෛනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න කොට, සිවුවැදෑරුම් ප්‍රශ්න අතුරෙන්

පශ්චිම කොට්ඨාශයේ අභිධෙය්‍ය හා සමාන වූ පශ්චාත් ප්‍රශ්නයාගේ වශයෙන්, ප්‍රශ්නයට අනුරූපව, කුසල් නම් වූ කුසල මූලයෝ කුසල්ම වන බැවින් සන්නිට්ඨාන පදයට දුන් ප්‍රතිඥව අනුව පිළිතුරු පඤ්චකය අතුරෙන් ''ආමන්තා'' කියා විස්සර්ජනා පිළිතුරු සපයන ලද්දේ වෙයි.

## එක මූල යමකය

මූලයමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව එක මූල යමකය දේශනා කළ සේක. ඒ ඒක මූල යමකයද, අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමුකොට වදළ සේක. ඒ අනුලෝමයද පුච්ඡා විස්සජ්ජනා වශයෙන් දෙවදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාවද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේද යත්; ''යෙ කෙචි කුසලා ධම්මා'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්; ''සබ්බෙ තෙ කුසල මූලෙන එක මූලා'' - යනුවෙනි. පුච්ඡාව දේශනා කොට වදරා අනතුරුව විස්සජ්ජනාව වදළ සේක, ඒ කෙසේද යත්; ''ආමන්තා'' - යනුවෙනි.

අනුලෝම වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රතිලෝම වාරය වදළ සේක. ඒ ප්‍රතිලෝමයද පුච්ඡා පස්සජ්ජනා වශයෙන් දෙවදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාවද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේද යත්;- ''යෙ වා පන කුසල මූලෙන එක මූලා''- යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්; ''සබ්බෙ තෙ ධම්මා කුසලා''- යනුවෙනි. පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව, විස්සජ්ජනාව වදළ සේක. ඒ කෙසේද යත්; ''කුසල සමුට්ඨානං රූපං කුසල මූලෙන එක මූලං, න කුසලං කුසලං කුසල මූලෙන එක මූලඤ්චෙව කුසලඤ්ච;'' යනුවෙනි.

යෙ කෙචි;-යම්තාක්; කුසල;- කුසලා;- කුසල් නම් වූ; ධම්මා;- ධර්මයෝ; සන්ති;- ඇත්තාහුද; සබ්බෙ තෙ ධම්මා;- සියලු ඒ ධර්මයෝ; කුසල මූලෙන;- කුසල මූලය සමඟ, නොහොත්, කුශල මූලය කරණ කොට ගෙන; එක මූලා;- සමාන මුල් ඇත්තාහුද, ඉති පුච්ඡායං සති;- මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි; ආමන්තා;- එසේය – කුසල නම් වූ ධර්මයෝ කුසල මූල නම් වූ මූලයන් සමඟ – මූලයන් කරණ කොට ගෙන සමාන මුල් ඇත්තාහ. ඉති විස්සජ්ජනා හොති;– මෙසේ විස්සර්ජනාව වන්නේය. යෙ වා පන;- යම් ඒ වනාහි; කුසල මූලෙන;- කුසල මූලය සමඟ;- එක මූලා;- සමාන මුල් ඇත්තා වූ; ධම්මා;- යම් ධර්ම කෙනෙක්;- සන්ති;- විද්‍යමාන වෙත්ද; සබ්බෙ තෙ ධම්මා;- ඒ සියලු ධර්මයෝ; කුසලා;- කුසල් නම් වන්නාහු දැයි, ඉති පුච්ඡායං සති,- මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි;- කුසල සමුට්ඨානං:- කුසල් සිතින් උපදනා වූ; රූපං;- චිත්තජ රූප සතළොස;- කුසල මූලෙන;- කුසල මූලය සමඟ – කුශල මූලය කරණ කොට ගෙන; එකමූලං,- සමාන මුල් ඇත්තාහ. න කුසලං,- කුසල් නම් නොවෙති, කුසලං,- කුසලය, කුසල මූලෙන,- කුශල මූලය සමඟ – කරණ කොට ගෙන; එක මූලඤ්චෙව,- සමාන මුල්

ඇත්තේ ද වෙයි. කුසලඤ්ච, - කුසල් නම් ද වන්නේය. ඉති විස්සජ්ජනා හොති,- මෙසේ විස්සර්ජනාව වන්නේය.

"යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ කුසල මූලෙන එකමූලා" - යයි වදළ අනුලෝම පුච්ඡාවෙහි; "යෙ කෙචි කුසලා ධම්මා" යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය නම්, කුසල් සිත් (21) එක්විස්ස ද චෛතසික (38) අටතිසද වෙති. "සබ්බෙ තෙ කුසල මූලෙන එකමූලා" - යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථය ද කුසල් සිත් (21) එක්විස්ස, චෛතසික (38) අටතිස යන මේ ධර්මයෝම වෙති.

## කොටස් බෙදීම

එසේ ලැබෙන බැවින් සියලුම කුශල ධර්මයෝ කුසල මූලයන් සමඟ සමාන මුල් ඇත්තාහු දැයි සර්වඥයන් වහන්සේට සැකයක් නැත්තේ නමුත්, වෛනෙය්‍යාධ්‍යාශය කරණකොට ගෙන ප්‍රශ්න සතර අතුරෙන් පශ්චිම කොට්ඨාශයේ අර්ථයට සමාන වූ පශ්චාත් ප්‍රශ්නයාගේ වශයෙන් වදළ ප්‍රශ්නයට අනුව, කුසල ධර්මයෝ කුසල මූලයන් සමඟ සමාන වූ මුල් ඇත්තාහුම යයි ලැබෙන බැවින්, සන්නිට්ඨාන පදයට දෙන ලද ප්‍රතිඥවට අනුව, පිළිතුරු පස අතුරෙන් ආමන්තා යන ප්‍රතිවචන විස්සර්ජනයෙන් පිළිතුරු වදරණ ලදී.

"යෙ වා පන කුසල මූලෙන එක මූලා - සබ්බෙ තෙ ධම්මා කුසලා" - යයි වදල ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි; "යෙ වා පන කුසල මූලෙන ඒක මූලා" - යන **සන්නිට්**ඨාන පදයාගේ අභිධෙය්‍යාර් නම්, - පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි කුසල් සිත් (21) එක්විස්සය. චෛතසික (38) අටතිසය යන නාම ස්කන්ධයෝ ද සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූපයෝ ද ලැබෙති. කුසල් සිත් (21) එක්විස්ස හා චෛතසික (38) අටතිස ද ලැබෙති. "සබ්බෙ තෙ ධම්මා කුසලා" - යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථය නම්, කුසල් සිත් (21) එක්විස්ස හා චෛතසික (38) අටතිස පමණක් ලැබෙති.

කොටස් බෙදීම මෙසේ ලැබෙන බැවින් අනවද්‍ය ස්වභාව ඇත්තා වූ කුසලය සමඟ-කුශලය කරණකොට ගෙන සමාන මුල් ඇත්තාවූ ධර්මයෝ කුසල් නම් වන්නාහු දැයි, සර්වඥයන් වහන්සේට සැකයක් නැත්තේ නමුත්, වෛනෙය්‍යාධ්‍යාශය වශයෙන්, ප්‍රශ්න උපදවා ප්‍රශ්න සතර අතුරෙන් පූර්ව ප්‍රශ්න පශ්චාත් ප්‍රශ්න දෙකේ ලක්ෂණයෙන් පිරිපුන් වූ පරිපූර්ණ ප්‍රශ්න වශයෙන් වදල ප්‍රශනය අනුව සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය ගෙන සංසය පදයාගේ අභිධෙය්‍ය නොගෙන; පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි කුසල් සිත් (21) එක්විස්සය, චෛතසික (38) අටතිසය යන නාමස්කන්ධයෝ ය, සුදුසු පරිදි ලැබෙන චිත්තජ රූපයෝය, කුසල සමුට්ඨානං රූපං, - කුසල මූලෙන එක මූලං, න කුසලං,-යයි පූර්ව කොට්ඨාශයට ඇතුලත් කොට, සංසය ප්‍රතිෂේධ කොට, සන්නිට්ඨාන සංසය දෙපදයට සමානවූම කුසල් සිත් (21) එක්විස්සය, චෛතසික (38) අටතිසය; කුසලං කුසල මූලෙන එක මූලඤ්චෙව කුසලඤ්ච, - යන පශ්චිම කොට්ඨාශයෙහි



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

ඇතුලත් සංසය ද ප්‍රතිෂේධ නොකොට, විස්සර්ජනා පස අතුරෙන් පූර්‍ව-පශ්චිම කොට්ඨාශ දෙකෙහිම ස්වරූප දක්වීම වශයෙන්, ස්වරූප කථන විස්සර්ජනා වෙන් පිළිතුරු වදාළ සේක.

## අඤ්ඤමඤ්ඤ මූලයමකය

ඒකමූල යමකය වදරා අනතුරුව අඤ්ඤමඤ්ඤමූල යමකය වදාළ සේක. ඒ අඤ්ඤමඤ්ඤමූල යමකය ද අනුලෝම-ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදාළ සේක. ඒ අනුලෝමය ද පුච්ඡා විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. එ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදාළ සේක. ඒ පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමුකොට වදාළ සේක. ඒ කෙසේ ද යත්, – ''යෙ කෙචි කුසල මූලෙන එකමූලා ධම්මා'' – යනුවෙනි, පුච්ඡාව දේශනා කොට වදරා අනතුරුව විස්සජ්ජනාව වදාළ සේක. ඒ කෙසේ ද යත්– ''මූලානි යානි එකතො උප්පජ්ජන්ති කුසල මූලානි. එක මූලානි චෙව අඤ්ඤමඤ්ඤ මූලානි ච, අවසෙසා කුසලමූල සහජාතා ධම්මා කුසලමූලෙන එකමූලා, න අඤ්ඤමඤ්ඤමූලා'' යනුවෙනි.

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝමය දේශනාකළ සේක. ඒ ප්‍රතිලෝමය ද පුච්ඡා – විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදාළ සේක. ඒ පුච්ඡාව ද, සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදාළ සේක. ඒ කෙසේ ද යත්,–''යෙ වා පන කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා'' – යනුවෙනි. ඉන් අනතුරුව සංසය දේශනා කොට වදාළ සේක. ඒ කෙසේද යත්, – ''සබ්බෙ තෙ ධම්මා කුසලා,'' – යනුවෙනි.

පුච්ඡාව දේශනා කොට වදරා අනතුරුව විස්සජ්ජනාව වදාළ සේක. ඒ කෙසේ ද යත්,– ''ආමන්තා'' යනුවෙනි. .යෙ කෙචි,– යම්තාක්,– කුසල මූලෙන,– කුශල නම් වූ මූලය සමඟ – කුසල මූලය කරණ කොට ගෙන: එක මූලා,–සමාන මූල ඇත්තා වූ, ධම්මා සන්ති,– ධර්‍ම කෙනෙක් ඇත්තාහු ද; කුසල මූලෙන, – කුසල මූලය කරණ කොට ගෙන, අඤ්ඤමඤ්ඤ මූලා,– එකක් අනෙකට මූලයයි කියන ලද මුල් ඇත්තාහු ද; ඉති පුච්ඡායං සති, – මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි; කුසල මූලානි,– කුසල මූලයයි කියන ලද්ද වූ; යානි මූලානි,–යම් මූලයෙක්; එකතො උප්පජ්ජන්ති,– එකට උපදිද් ද; තානි මූලානි, – ඒ කුසල් මුල් තුන, – එකමූලානි චෙව,– සමානමුල් ඇත්තාහු ද වෙති; අඤ්ඤමඤ්ඤමූලානි ච,– එකක් අනෙකට මුල් වන්නාහු නම් ද වෙති. හෙවත් මුල් ඇත්තාහු නම් ද වෙති.

අවසෙසා – කුසල් මුල් තුන හැර සෙසු – කුසල මූල සහජාතා ධම්මා – කුසල් මුල් තුන සමඟ එකට උපදනා වූ කුසල් සිත් (21) එක්විස්සය, කුසල් මුල් තුන හැර චෛතසික (35) පන්තිසය, පඤ්ච වෝකාර භූමියෙහි උපදනා කල්හි කුසල් සිත් (21) එක් විස්සය; අටතිස් (38) චෛතසිකය යන නාමස්කන්ධයෝ ද, සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූපයෝ ද මේ ධර්‍මයෝ; කුසල මූලෙන,.– කුසල මූලය සමඟ – කුසල මූලය කරණකොට ගෙන; එකමූලා– සමාන මූල් ඇත්තාහු වෙති,

නව අඤ්ඤමඤ්ඤ මූලා,– එකක් අනෙකට මුල් වන්නාහු නම් නොවෙති හෙවත් එකක් අනෙකට මුල් ඇත්තාහු නම් නොවෙති: ඉති විස්සජ්ජනා – හොති,–මෙසේ විස්සර්ජනාව වන්නේය.

කුසල මූලෙන,– කුසල මූලය සමඟ – කුසල මූලය කරණ කොට ගෙන, අඤ්ඤමඤ්ඤ මූලා,- එකක් අනෙකට මූලය නම් වන්නාවූ හෙවත් එකක් අනෙකට මුල් ඇත්තා වූ; යෙ වා පන ධම්මා,– යම් ඒ ධර්ම කෙනෙක්; සන්ති,– ඇත්තාහු වෙත්ද, සබ්බෙ තෙ ධම්මා.– ඒ සියලු ධර්මයෝ; කුසලා,– කුසල් නම් වන්නාහු දැයි, ඉති පුච්ඡාය සති,– මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි,– ආමන්තා,– කුශල මූලයාගේ වශයෙන් එකක් අනෙකට මූල නම වන්නා වූ ධර්මයෝ කුසල් නම් වන්නාහු යයි, ඉති විස්සජ්ජනා හොති,– මෙසේ විසඳීම වන්නේය.

යෙ කෙචි කුසල මූලෙන එකමූලා ධම්මා සබ්බෙ තෙ කුසල මූලෙන අඤ්ඤ-මඤ්ඤ මූලා''-යයි වදළ අනුලෝම පුච්ඡාවෙහි – ''යෙ කෙචි කුසල මූලෙන එකමූලා ධම්මා'' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය නම්; කුසල් සිත් එක් විස්සය; කුසල් මුල් තුන හැර චෛතසික (35) පන්තිසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි කුසල් සිත් (21) එක් විස්සය, චෛතසික (38) අටතිසය යන නාමස්කන්ධයෝද, සුදුසු පරිදි උපදනාවූ චිත්තජ රූප (17)සතළොසද යන මෙ ධර්මයෝ ලැබෙති. කුසල් මුල් තුනද ලැබෙති. සබ්බෙ තෙ කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථය නම් කුසල් මුල් තුන පමණක් වෙති.

## කොටස් බෙදීම

එසේ ලැබෙන හෙයින්, කුසල මූල නම්වූ මූලයන් සමඟ සමාන මුල් ඇත්තා වූ යම්තාක් ධර්මයෝ වෙත්ද, ඔවුහු කුශල මූලයාගේ වශයෙන් එකක් අනෙකට වන්නාවූ මුල් ඇත්තාහු නම් වෙත් දැයි සර්වඥයන් වහන්සේට සැකයෙක් නැත්තේ නමුත්, වෛනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති සතර අතුරෙන් පුරෙපඤ්හ පච්ඡාපඤ්හ දෙක සමඟ යුක්තවූ පරිපූර්ණ ප්‍රශ්නයාගේ වශයෙන් දියයුතු වූ පිළිතුරට අනුව; සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය ගෙන, සංසය පදයාගේ අභිධෙය්‍ය නොගන්නා ලදී. කුසල් සිත් (21) එක් විස්සය කුසල් මුල් තුන හැර චෛතසික (35) පන්තිසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි කුසල් සිත් (21) එක් විස්සය, චෛතසික (38) අටතිසය යන නාමස්කන්ධ-යන් ද, සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූපයන් 17 සතළොස ද යන මේ ධර්මයෝ පූර්ව කොට්ඨාශයට ඇතුලත් කරන ලද්දහ.

සන්නිට්ඨාන–සංසය යන දෙපදයාගේම අභිධෙය්‍ය වූ කුශල් මුල් තුන පශ්චිම කොට්ඨාශයට ඇතුලත් කොට පිළිතුරු දක්වන ලදී. අවසෙසා–යන පාඨයෙන් සෙස්ස මනාව අවබෝධ වන්නේය. සන්නිට්ඨාන සංසය යන දෙපදයාගේම අභිධෙය්‍ය වූ කුශල් මුල් තුන වනාහි, ''මූලානි යානි එකතො උප්පජ්ජන්ති කුසල මූලානි එක මූලානි චෙව අඤ්ඤමඤ්ඤ මූලානිච''– යනුවෙන් පූර්ව කොට්ඨාශයෙහි ඇතුලත් කොට සංසය පදය ප්‍රතික්ෂේප නොකරණ ලදී. සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය ගෙන, සංසය පදයාගේ අභිධෙය්‍ය නොගන්නාවූ

කුශල් සිත් (21) එක් විස්ස, කුසල් මුල් තුන හැර චෛතසික (35) පන්තිස, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි කුසල් සිත් (21) එක් විස්ස අටතිස් (38) චෛතසික යන නාමස්කන්ධයන් ද, සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතලොසද, ''අවසෙසා කුසල මූල සහජාතා ධම්මා කුසල මූලෙන එක මූලා, නව අඤ්ඤමඤ්ඤ මූලා''–යයි පශ්චිම කොට්ඨාශයට ඇතුලත් කොට, සංසය ප්‍රතික්ෂෙප කොට විස්සර්ජනා පඤ්චකය අතුරෙන් පූර්ව – පශ්චිම 'කොට්ඨාශ දෙකෙහිම ස්වරූප දක්වීම වශයෙන් සමාන විසඳුම් වශයෙන් පිළිතුරු වදරණ ලද්දහ. ''යෙ වා පන කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා, සබ්බෙ තෙ ධම්මා කුසලා.–'' යනුවෙන් වදළ ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි, ''යෙ වා පන කුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා–'' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය නම් කුශල් මුල් තුන වෙති; ''සබ්බෙ තෙ ධම්මා කුසලා''– යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථය ද කුශල් මුල් තුනම වෙති.

## කොටස් බෙදීම

එසේ ලැබෙන බැවින් කුසල මූලයාගේ වශයෙන් එකක් අනෙකට මූල නම් වන්නා වූ ධර්මයෝ කුශල් නම් වන්නාහු දැයි සර්‍වඥයන් වහන්සේට සැකයෙක් නැතත් වෛනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා සිවුවැදෑරුම් ප්‍රශ්නයන් අතරින් පශ්චිම කොට්ඨාශයාගේ අභිධෙය්‍යට සමාන වූ පශ්වාත් ප්‍රශ්නයට අනුව මූලයාගේ වශයෙන් එකක් අනෙකට මුල් වන්නා වූ ධර්මයෝ කුශල්ම නම් වන බැවින් සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය තහවුරු කරමින් විසඳුම් පස අතුරෙන් ආමන්තා යයි ප්‍රති වචන විසඳීමෙන් පිළිතුරු වදළහ.

මූලනය නිමි.

---

# මූල මූලනය ආදිය

මූලනය දේශනා කොට වදරා අනතුරුව මූල මූලන නය දේශනා කොට වදළ සේක. – (මූලනය මෙන් කියනු) මූල මූලා – යනුවෙන් මූල ශබ්දයක් වැඩි බව පමණක්ම විශේෂයි. මූල මූල නය නිමි.

මූල මූලනය දේශනා කොට වදරා අනතුරුව මූලකනය වදළ සේක. ඒ මූලකනය ද මූලකයමක, ඒක මූලකයමක, අඤ්ඤමඤ්ඤ මූලක යමක වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් මූලකයමකය පළමුකොට වදළ සේක. ඒ මූලකයමකය ද අනුලෝම – ප්‍රතිලෝම–ප්‍රශ්න–විස්සර්ජනා – සන්නිට්ඨාන සංසය යන පදයන්ගේ වශයෙන් බෙදමින් පෙර සේ කියනු.

දේශනා කොට වදළේ කෙසේ ද යත්,– ''යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ කුසල මූලකාති, ආමන්තා; යෙ වා පන කුසල මූලකා – සබ්බෙ තෙ ධම්මා කුසලාති,– කුසල සමුට්ඨානං රූපං කුසල මූලකං න කුසලං, කුසලං කුසල මූලකඤ්චෙව කුසලඤ්ච;'' යනුවෙනි.

කුසල මූලකා,- කුසල නම් වූ මූලයක් ඇත්තාහු ද; යි අර්ථ යෝජනා කොට අභිධෙය්‍යාර්ථ එකමූල යමකය අනුව කියනු. එක මූලක යමකයෙහි ද - එක මූලකා - සමාන මුල් ඇත්තාහු ද; යනුවෙන් අර්ථ කියනු.

අඤ්ඤමඤ්ඤ මූලක යමකයෙහි-අඤ්ඤමඤ්ඤ මූලකා-එකක් අනෙකට මුල් වන්නාවූ මූල ඇත්තාහු ද, යනු අර්ථයයි. [''මූලං අස්ස අත්ථීති මූලකං''- අස්‍යාර්ථ තද්ධිතයි ''ඒකං මූලං යෙසංතෙති එකමූලකා'' ''අඤ්ඤමඤ්ඤස්ස මූලං යෙසන්තෙති අඤ්ඤමඤ්ඤ මූලකා'' අන්‍යාර්ථ සමාසයි.]

මූලකය ද එක මූලකයට සමානම යයි තේරුම් ගත යුතුයි. මූල මූලක නයද මූලකනය හා සමානය, මේ මූලයමකයෙහි ''සාමඤ්ඤ සභාවලක්ඛණ'' පොදු ස්වභාව ලක්ෂණ ඇත්තා වූ ලෝභ-දෙස-මොහ-අලොභ-අදෙස-අමොහ යන මේ හේතු ධර්ම සදෙන මූල නම් වෙති. සහේතුක සිත් (71) එක් සැත්තෑවය, මෝහමූල දෙසිතෙහි මොහය හැර චෛතසික (52) දෙපණසය සහේතුක චිත්තජ රූපයෝය. සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන මේ සියල්ල එකමූල - සමාන මුල් ඇති ධර්මයෝ වෙති. මෝහමූල දෙසිතෙහි මෝහය හැර හේතුධර්ම සය දෙන අඤ්ඤමඤ්ඤ මූල ඇති ධර්මයෝ නම් වෙති. මෙසේ පොදු ලක්ෂණය දැන-ගැනීමෙන් පදයක් පාසා ඇති විශේෂ ලක්ෂණ සුවසේ දැනගත හැකිය.

**කුසල පදය නිමි,**

---

## අකුසල පද මූලනය - අකුසල පද වාරය

කුසල පදය දේශනා කොට වදරා අනතුරුව අකුශල පදය වදළ සේක. ඒ අකුසල පදයද මූලනය ආදී වශයෙන් කුසල පදය සේම කියනු. කෙසේ වදළ සේක් ද යත්,- ''යෙ කෙචි අකුසලා ධම්මා, සබ්බෙ තෙ අකුසල මූලාති, තීණෙව අකුසල මූලානි, අවසෙසා අකුසලා ධම්මා න අකුසල මූලා, යෙ වා පන අකුසල මූලා, සබ්බෙ තෙ ධම්මා අකුසලාති, ආමන්තා යනුවෙනි.

යෙ කෙචි,- යම්තාක්; අකුසලා,- සාවද්‍ය අනිෂ්ට විපාක දීම ලක්ෂණ කොට ඇත්තා වූ අකුශල නම් වූ, ධම්මා, - නිස්සත්ව නිජ්ජීව ස්වභාව ධර්ම කෙනෙක්; සන්ති,- විද්‍යමාන වෙත්ද; (සෙස්ස කියනු)

''යෙ කෙචි අකුසලා ධම්මා''- යනාදී අනුලෝම පාඨයෙහි, ''යෙ කෙචි අකුසලා ධම්මා'' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය වශයෙන් අකුසල් සිත් (12) දෙළොසය, අකුසල මුල් (3) තුන හැර චෛතසික (24) සුවිස්සද වෙති. අකුසල් මුල් (3) තුනද ලැබෙති. සබ්බෙ තෙ අකුසල මූලා - යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථය වශයෙන් අකුසල මුල් (3) තුන පමණක් ලැබෙති, (එසේ ලැබෙන බැවින් කොටස් වෙන් කොට දක්වනු) පටිලෝම නයෙහි - යෙ වා පන - යනාදී සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය වශයෙන් අකුසල මුල් (3) තුන ලැබෙති. සංසය පදයෙහි ද අකුසල මුල් (3) තුනම ලැබෙති. (කොටස් වෙන් කොට දක්වනු).

## එක මූල යමකය

මූල යමකය දේශනා කොට වදරා අනතුරුව ඒකමූල යමකය දේශනා කළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදළ සේක් ද යත්,- යෙ කෙචි අකුසලා ධම්මා – සබ්බෙ තෙ අකුසල මූලෙන එක මූලාති – අහෙතුකං අකුසලං අකුසල මූලෙන න එක මූලං සහෙතුකං අකුසලං අකුසල මූලෙන එකමූලං, යෙ වා පන අකුසල මූලෙන ඒකමූලා – සබ්බෙ තෙ ධම්මා අකුසලාති,- අකුසල සමුට්ඨානං රූපං අකුසල මූලෙන එක මූලං; න අකුසලං – අකුසලං අකුසල මූලෙන එකමූලඤ්චෙව අකුසලඤ්ච;''

යෙ කෙචි අකුසලා ධම්මා – යම්කිසි අකුසල ධර්ම කෙනෙක්; සන්ති,- විද්‍යමාන වෙත්ද: සබ්බෙ තෙ; ඒ සියලු ධර්මයෝ; අකුසල මූලෙන – අකුසල මූලය සමඟ; එකමූලාති,- සමාන මුල් ඇත්තාහු ද; අහෙතුකං අකුසලං,- හේතුරහිත වූ අකුසලය; අකුසල මූලෙන,- අකුසල මූලය කරණ කොට ගෙන; න එක මූලං,- සමාන මූල් ඇත්තේ නොවේ. සහෙතුකං අකුසලං – හේතු රහිත වූ අකුසලය; අකුසල මූලෙන,- අකුසල මූලය සමඟ; එක මූලං,- සමාන මූල් ඇත්තේ වෙයි. යෙ වා පන,- යනාදී ප්‍රතිලෝමයෙහි කුසල පදය ඇසුරු කොට අර්ථයෝජනාව කළ යුතුය.

''යෙ කෙචි අකුසලා ධම්මා'' යනාදී අනුලෝම පුච්ඡායෙහි,- ''යෙ කෙචි අකුසලා ධම්මා'' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය නම්, මෝහ මූල සිත් දෙකෙහි මෝහය ලැබේ. නැවත අකුසල් සිත් (12) දෙළසද, මෝහ මූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (27) සත් විස්සද ලැබෙති.

''සබ්බෙ තෙ අකුසල මූලෙන එක මූලා''– යන සංසය පදයාගේ 'අභිධෙය්‍යාර්ථය නම්, අකුසල් සිත් (12) දෙළසද, මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (27) සත් විස්සද ලැබෙති. (කොටස් බෙද කියනු.)

ප්‍රතිලෝම පුච්ඡා වාරයෙහි, ''යෙ වා පන අකුසල මූලෙන එකමූලා සබ්බෙ තෙ ධම්මා අකුසලා''– යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය වශයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අකුසල් සිත් දෙළසය චෛතසික (27) සත් විස්සය යන මොවුන් නිසා හටගන්නා වූ චිත්තජ රූප (17) සතළොස ලැබෙති. අකුසල් සිත් (12) දෙළසද මෝහ මූල දෙසිතෙහි මෝහය හැර, චෛතසික (27) සත් විස්ස ද ලැබෙති.

''සබ්බෙ තෙ ධම්මා අකුසලා''– යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ, අකුසල් සිත් (12) දෙළස ද, මෝහ මූල දෙසිතෙහි මොහය හැර චෛතසික (27) සත්විස්ස ද වෙති. (කොටස් බෙද කියනු.)

## අඤ්ඤමඤ්ඤ මූල යමකය

ඒකමූල යමකය දේශනාකොට වදරා අනතුරුව අඤ්ඤමඤ්ඤ මූල යමකය වදළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදළ සේක් ද යත්; ''යෙ කෙචි අකුසල මූලෙන එක මූලා ධම්මා – සබ්බෙ තෙ අකුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලාති –

මූලානි යානි එකතො උප්පජ්ජන්ති අකුසල මූලානි – එක මූලානි චෙව අඤ්ඤ-මඤ්ඤ මූලානි ච – අවසෙසා අකුසල මූල සහජාතා ධම්මා අකුසල මූලෙන එක මූලා–නච අඤ්ඤමඤ්ඤ මූලා,– යෙ වා පන අකුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා– සබ්බෙ තෙ ධම්මා අකුසලාති,– ආමන්තා;''

යෙ කෙචි – පෙ – අනුලෝම පුච්ඡාවෙහි ''යෙ කෙචි අකුසල මූලෙන එක මූලා ධම්මා''– යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ වශයෙන් අකුසල සිත් (12) දොළසය, අකුසල් මූල් (3) තුන හැර චෛතසික (24) සුවිස්සය, පඤ්චවෝ-කාර භූමියෙහි උපදනා කල්හි අකුසල් සිත් (12) දොළසය, චෛතසික (27) සත්විස්සය යන නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතළොසය යන මේ ධර්මයෝ ලැබෙති. මෝහ මූල දෙසිතෙහි මෝහය හැර අකුසල මූල් (3) තුන ද ලැබෙති.

සබ්බෙ තෙ අකුසල මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා – යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ වනාහි මෝහමූල දෙසිතෙහි මෝහය හැර අකුසල් මූල් (3) පමණක් ලැබෙති. (කොටස් බෙද කියනු) ''යෙ වා පන අකුසල මූලෙන අඤ්ඤ-මඤ්ඤ මූලා'' යනාදි ප්‍රතිලෝම පුච්ඡාවෙහි ''යෙ වා පන'' – යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථ වශයෙන් මෝහ මූල දෙසිතෙහි මොහය හැර අකුශල මූලයෝ තිදෙන ලැබෙති. සංසය පදයාගේ අභිධෙය්‍ය ද මෝහමූල දෙසිතෙහි මෝහය හැර අකුශල මූලයෝ තිදෙනම ලැබෙති. (කොටස් බෙද කියනු)

**මූලනය නිමි.**

(මූල මූලනය ද මූලනය හා සමානය.)

---

# මූලක නය

මූල මූලනය දේශනා කොට වදරා අනතුරුව මූලකනය වදළ සේක. (පෙර සේ බෙද කියනු) කෙසේ වදළ සේක් ද යත්; ''යෙ කෙචි අකුසලා ධම්මා – සබ්බෙ තෙ අකුසල මූලකාති. අහෙතුකං අකුසලං න අකුසල මූලකං, සහෙතුකං අකුසලං අකුසල මූලකං, යෙ වා පන අකුසල මූලකා, සබ්බෙ තෙ ධම්මා අකුසලාති, අකුසල සමුට්ඨානං රූපං අකුසල මූලකං න අකුසලං, අකුසලං අකුසල මූල-කඤ්චෙව අකුසලඤ්ච;'' යනුවෙනි.

අනුලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය වනාහි මෝහමූල දෙසිතෙහි මෝහය ලැබේ. අකුසල සිත් (12) දොළසය, මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (27) සත්විස්සය යන මේ ධර්මයෝ ද ලැබෙති.

''සබ්බෙ තෙ අකුසල මූලකා''– යන සංසය පදයාගේ අභිධෙය්‍ය නම් අකුසල සිත් (12) දොළසය, මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (27) සත්විස්ස යන මේ ධර්මයෝ ලැබෙති.

ප්‍රතිලෝම පුච්ඡාවෙහි "යෙ වා පන" යනාදි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය නම් පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අකුසල් සිත් (12) දොළසය, චෛතසික (27) සත් විස්සය යන නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතළොස ලැබෙති. අකුසල් සිත් (12) දොළසය මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (27) සත් විස්සය යන මේ ධර්මයෝ ද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි. (කොටස් බෙද දක්වනු) ඒකමූලක යමකයේ නය ක්‍රමයට සමානය. අඤ්ඤමඤ්ඤ මූලකය ද මූලනය හා සමානය. මූල මූලක නය ද මූලක නයට සමානය.

**අකුසල පද වාරය නිමි.**

---

## අව්‍යාකෘත පද මූලනය

අකුසල පදය දේශනාකොට වදරා අනතුරුව අව්‍යාකෘත පදය වදළ සේක. ඒ අව්‍යාකෘත පදයද මූලනය – මූලමූලනය – මූලකනය – මූලමූලකනය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. (කුසල පදය අනුව කියනු.) කෙසේ වදළ සේක් ද යත්, "යෙ කෙචි අබ්‍යාකතා ධම්මා සබ්බෙ තෙ අබ්‍යාකත මූලාති. තීණෙව අබ්‍යාකත මූලානි, අවසෙසා අබ්‍යාකතා ධම්මා න අබ්‍යාකත මූලා; යෙ වා පන අබ්‍යාකත මූලා සබ්බෙ තෙ ධම්මා අබ්‍යාකතාති. ආමන්තා,"– යනුවෙනි.

යෙ කෙචි,– යම්තාක්; අබ්‍යාකතා ධම්මා,– කුසලා කුසල භාවයෙන් නොවදරා අන්‍යභාවයෙකින් වදරණ ලද්දවූ නිස්සත්ව නිජ්ජීව ස්වභාව ධර්මකෙනෙක්; සන්ති,– විද්‍යමාන වෙත් ද, සබ්බෙ තෙ අබ්‍යාකත මූලාති,– ඒ සියලු අව්‍යාකෘත ධර්මයෝ අව්‍යාකෘත මුල් ඇත්තාහු ද; ඉති පුච්ඡායංසති,– මෙසේ පැනයක් ඇති කල්හි; තීණෙව–තීණිඑව; අව්‍යාකෘත මූල නමින් ඇති ධර් තුන පමණක්ම, අබ්‍යාකත මූලා,– අව්‍යාකෘත මූල නම් වෙති; අවසෙසා,– අව්‍යාකෘත මූල තුන හැර ඉතිරි වූ; අබ්‍යාකතා ධම්මා;– විපාක සිත් (36) සතිසය, ක්‍රියා සිත් (20) විස්සය, අව්‍යාකෘත මුල් (3) තුන හැර චෛතසික (35) පන්තිසය, රූප (28) අට විස්සය, නිර්වාණය යන මේ ධර්මයෝ; න අබ්‍යාකත මූලා, අව්‍යකෘත මූලයෝ නම් නොවෙති. හෙවත් අවසෙසා –අව්‍යාකෘත මුල් තුන හැර අවශේෂ වූ විපාක (36) සතිසය, ක්‍රියා (20) විස්සය, චෛතසික (35) පන්තිසය රූප (28) අට විස්සය, නිර්වාණය යන මේ ධර්මයෝ, අබ්‍යාකතා ධම්මා,– අව්‍යාකෘත ධර්මයෝ නම් වෙති. න අබ්‍යාකත මූලා,– අව්‍යාකෘත මූලයෝ නම් නොවෙති. මෙසේ අට්ඨකථාවෙහි දෙපරිදිව අර්ථය දක්වා ඇත. මේ ක්‍රමයට සමානව කුසල පද ආදියෙහි ද අර්ථ යෝජනාව කළ යුතුයි.

"යෙ කෙචි අබ්‍යාකතා ධම්මා" යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් විපාක සිත් (36) සතිසය, ක්‍රියා සිත් (20) විස්සය, අව්‍යාකෘත මුල් (3) තුන හැර චෛතසික පන්තිසය, අටවිසි (28) රූපය, නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. අව්‍යාකෘත මුල් (3) තුන ද ලැබෙති. "සබ්බෙ තෙ අබ්‍යාකත මූලා"– යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් අව්‍යාකෘත මුල් (3) තුන පමණක් ලැබෙති. (කොටස් බෙද කියනු.) ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි 'යෙ වා පන" යනාදි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් අව්‍යාකෘත මුල් (3) තුන වෙති. සංසය පදයට ද ඒ තුනම ලැබෙත්. (කොටස් බෙද කියනු.)

## එක මූල යමකය

මූල යමකය දේශනා කොට වදරා අනතුරුව එක මූල යමකය වදළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදළ සේක් ද යත්; "යෙ කෙචි අබ්‍යාකතා ධම්මා සබ්බෙ තෙ අබ්‍යාකත මූලෙන එක මූලාති,- අහෙතුකං අබ්‍යාකතං අබ්‍යාකත මූලෙන න ඒක මූලං, සහෙතුකං අබ්‍යාකතං අබ්‍යාකත මූලෙන එක මූලං; යෙ වා පන අබ්‍යාකත මූලෙන එක මූලා, සබ්බෙ තෙ ධම්මා අබ්‍යාකතාති, ආමන්තා;" යනුවෙනි.

යෙ කෙචි,- යම්තාක්; අබ්‍යාකතා ධම්මා,- අව්‍යාකෘත නම් වූ ධර්ම කෙනෙක් විද්‍යමාන ද; සබ්බෙ තෙ,- ඒ සියලු ධර්මයෝ අබ්‍යාකත මූලෙන එක මූලාති;- අව්‍යාකෘත මූලය කරණ කොට ගෙන සමාන මුල් ඇත්තාහු ද; අහෙතුකං අව්‍යාකතං,- අහේතුක නම් වූ අව්‍යාකෘතය,- අබ්‍යාකත මූලෙන,- අව්‍යාකෘත මූලය කරණ කොට ගෙන,- න එක මූලං,- සමාන මුල් නැත්තේ වෙයි. සහෙතුකං අබ්‍යාකතං,- සහේතුක නම් වූ අව්‍යාකෘතය; අබ්‍යාකත මූලෙන,- අව්‍යාකෘත මූලය සමඟ – අව්‍යාකෘත මූලය කරණ කොට ගෙන; එක මූලං,- සමාන මුල් ඇත්තේය, (ප්‍රතිලෝමය පහසුයි.)

"යෙ කෙචි අබ්‍යාකතා ධම්මා සබ්බෙ තෙ අබ්‍යාකත මූලෙන එක මූලා"– යන අනුලෝම ප්‍රශ්නයෙහි "යෙ කෙචි අබ්‍යාකත ධම්මා" යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ වනාහි අහේතුක සිත් (18) අටළොසය, ඡන්දවර්ජිත අන්‍යසමාන චෛතසික (12) දොළසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය හැර කුශල–අකුශල–අහේතුක විපාක අහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ අහේතුක චිත්තජ රූපයෝය. අහේතුක ප්‍රතිසන්ධි (2) දෙක සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, අසඤ්ඤසත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය, නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. සහේතුක විපාක (21) එක් විස්සය, සහේතුක ක්‍රියා (17) සතළොසය, චෛතසික (38) අටතිසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කලහි අරූප විපාක සිත් (4) සතර අර්හත්චුති චිත්තයද හැර සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් ද නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක කර්මජ රූපයෝය යන මොවුහු ලැබෙති.

"සබ්බෙ තෙ අබ්‍යාකත මූලෙන එකමූලා"– යන සංසය පදයාගේ අභිධෙ–ය්‍යාර්ථයෝ පෙරසේම වෙති. (කොටස් බෙද කියනු) ප්‍රතිලෝමයද පෙර සංසය පදය මෙනි. [රූපය වනාහි අව්‍යාකෘතම බැවින් කුසල පදයට මෙන් අබ්‍යාකත සමුට්ඨාන රූප නොවදළ බැවින්, අමන්තා යන ප්‍රතිවචන විස්සර්ජනාවෙන් පිළිතුරු වදළහ. කුසල අකුසල සිත් නිසා උපදනා වූ චිත්තජ රූපයන්ට අව්‍යාකෘත හේතු නොමැති බැවින් අහෙතුකං අබ්‍යාකතං යන පදයට ඇතුලත් කොට ගත යුතුයි.]

4

## අඤ්ඤමඤ්ඤ මූල යමකය

එක මූල යමකය දේශනා කොට වදරා අනතුරුව අඤ්ඤමඤ්ඤ මූල යමකය වදළ සේක. (පෙර සේ පූර්වා කියනු) කෙසේ වදළ සේක්ද යත්; ''යෙ කෙචි අබ්‍යාකත මූලෙන එකමූලා ධම්මා – සබ්බෙ තෙ අබ්‍යාකත මූලෙන අඤ්ඤමඤ්ඤ මූලානි, මූලානි යානි එකතො උප්පජ්ජන්ති අබ්‍යාකත මූලානි එකමූලානි චෙව අඤ්ඤමඤ්ඤ මූලානිච, අවසෙසා අබ්‍යාකත මූල සහජාතා ධම්මා අබ්‍යාකත මූලෙන ඒක මූලා, නව අඤ්ඤමඤ්ඤ මූලා; යෙ වා පන අබ්‍යාකත මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා, සබ්බෙ තෙ ධම්මා අබ්‍යාකතාති, ආමන්තා;'' යනුවෙනි.

අබ්‍යාකත මූලානි යානි මූලානි,– අව්‍යාකෘත නම් වූ විපාක ක්‍රියා සිත්හි යෙදුනා වූ අලෝභ – අද්වේස – අමෝහ නම් වූ යම් අව්‍යාකෘත මූලයෝ – පෙ – අවසෙසා – අව්‍යාකෘත මුල් තුන හැර අවසේස වූ; අබ්‍යාකත මූල සහජාතා,– අව්‍යාකෘත මූලයන් හා සමඟ එකට උපදනා වූ; ධම්මා,– සහේතුක විපාක (21) එක් විස්ස, සහේතුක ක්‍රියා (17) සතලොස, චෛතසික (35) පන්තිස; පඤ්චවෝකාර භූමියෙහි, උපදනා කල්හි අරූප විපාක (4) සතර හා අර්හන්ත චුති චිත්තයද හැර සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝ ද, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ද යන මෙ ධර්මයෝ අවශේෂ ධර්ම නම් වෙති. සෙස්ස දත හැකිය.

''යෙ කෙචි අබ්‍යාකත මූලෙන එක මූලා ධම්මා'' යන අනුලෝම පැනයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථය නම් සහේතුක විපාක සිත් (21) එක් විස්ස සහේතුක ක්‍රියා සිත් (17) සතලොස, අව්‍යාකෘත මුල් (3) තුන හැර චෛතසික (35) පන්තිස, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) සතර හා අර්හන්ත චුතිචිත්තය ද හැර සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක කර්මජ රූපයෝ යන මෙ ධර්මයෝ ලැබෙති. අව්‍යාකෘත මුල් (3) තුන ද ලැබෙති. සබ්බෙ තෙ යනාදි සංසය පදයාගේ අභිධෙයාර්ථයෝ වනාහි අබ්‍යාකත මුල් (3) තුන පමණක් ලැබෙති. ප්‍රතිලෝමයෙහි වනාහි පෙර සංසය පදයට සමානව බෙද කියනු.

මූල නය නිමි·

---

## අව්‍යාකෘත පද මූල මූලනය

මූල මූලනය ද මූලනයට සමානය, මූලකනයෙහි ක්‍රමය පෙර සේ බෙද කියනු ,'යෙ කෙචි අබ්‍යාකතා ධම්මා – සබ්බෙ තෙ අබ්‍යාකත මූලකාති, අහෙතුකං අබ්‍යාකතං,– න අබ්‍යාකත මූලකං, සහෙතුකං අබ්‍යාකතං අබ්‍යාකත මූලකං, යෙ වා පන අබ්‍යාකත මූලකා – සබ්බෙ තෙ ධම්මා අබ්‍යාකතාති – ආමන්තා;''

[මූලනය ඒක මූලනයට අනුව ගනු, එක මූලකය ද මූලකනය හා සම වේ, අඤ්ඤමඤ්ඤ මූලකයද මූලනය, අඤ්ඤමඤ්ඤ මූල යමක හා සමානය, මූල මූලකනය ද මූලකනය හා සමානය.]

**අව්‍යාකෘත පදය නිමි.**

## නාම පද මූලනය

අව්‍යාකෘත පදය දේශනාකොට වදරා අනතුරුව නාමපදය වදාළ සේක. ඒ නාමපදය ද මූලනය, මූල මූලනය, මූලකනය, මූල මූලකනය. වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් මූලනය පළමු කොට වදාළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදාළ සේක් ද යත්,– ''යෙ කෙචි නාමා ධම්මා සබ්බෙ තෙ නාම මූලාති, නවෙව නාම මූලානි අවසෙසා නාමා ධම්මා න නාම මූලා, යෙ වා පන නාම මූලා, සබ්බෙ තෙ ධම්මා නාමාති, ආමන්තා,''– යනුවෙනි.

යෙ කෙචි නාමා ධම්මා,– යම්තාක් නාම ධර්මයෝ වෙත් ද සබ්බෙ තෙ නාම මූලාති,– ඒ සියලු නාම ධර්මයෝ නාම මූලයෝ නම් වෙත් දැයි,– මෙසේ පැනයෙක් ඇති කල්හි,– නවෙව – නව එව,– නවයක් පමණක්ම; නාම මූලානි,– නාම මූලයෝ නම් වෙති; අවසෙසා ධම්මා,– අවශේෂ වූ නාම මූලයන් හැර ඉතිරි සිත් (89) එකූන් අනූව, චෛතසික (46) සසාලිස, නිර්වාණය යන මේ ධර්මයෝ; නාමා,- නාමයෝ නම් වෙති. න නාම මූලා,– නාම මූලයෝ නම් නොවෙති; (සෙස්ස සුගමයි)

''යෙ කෙචි නාමා ධම්මා'' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් සිත් (89) එකූන් අනූව, නාමමූලයන් හැර චෛතසික (46) සසාලිසය, නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති, නාමමූල නවයද ලැබෙති. ''සබ්බෙ තෙ නාම මූලා''– යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථ නම්, නාම මූල නවදෙන පමණක් ම ලැබෙති. [කුසල මූල (3) තුනය, අකුසල මූල (3) තුනය. අව්‍යාකෘත මූල (3) තුනය යනු නාම මූලයෝ – (9) නවදෙන වෙති.

චිත්ත චෛතසික ධර්මයෝ වනාහි තම තමන් ද ආරම්මණයට අභිමුඛව නැමෙන බැවින් හා තමන් සමඟ අරමුණු ගන්නා වූ සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් නමාලන බැවින් ද නාම නම් වෙති. නිර්වාණය වනාහි මාර්ග ඵල ආදී අනවද්‍ය චිත්ත චෛතසික ධර්මයන් තමන් වෙත නම් වෙන බැවින් නාම නමි. ''ආරම්මණං නමන්තීති නාමං;'' චිත්ත චෛතසිකයෝ ලැබෙති; අත්තනි ආරම්මණික ධම්මෙ නාමෙතීති නාමං; චිත්ත චෛතසික ද නිර්වාණය ද ලැබෙති. මෙසේ වචනාර්ථ සිතිය යුතුය.]

### ඒක මූල යමකය

මූල යමකය දේශනා කොට වදරා අනතුරුව ඒකමූල යමකය වදාළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදාළ සේක් ද යත්; ''යෙ කෙචි නාමා ධම්මා සබ්බෙ තෙ නාමමූලෙන එක මූලාති, අහෙතුකං නාමං නාම මූලෙන න එකමූලං, සහෙතුකං නාමං නාම මූලෙන එක මූලං; යෙ වා පන නාම මූලෙන ඒක මූලා, සබ්බෙ තෙ ධම්මා නාමාති, නාම සමුට්ඨානං රූපං නාම මූලෙන එක මූලං, න නාමං, නාමං නාම මූලෙන එක මූලඤ්චෙ ව නාමඤ්ච;– යනුවෙනි.

යෙ කෙචි නාමා ධම්මා,– යම්තාක් නාම ධර්මයෝ සන්ති,– විද්‍යමාන වෙත් ද; සබ්බෙ තෙ; ඒ සියලු නාමයෝ; නාමමූලෙන එක මූලා,– නාම මූලය සමඟ හෝ කරණකොට ගෙන; සමාන මුල් ඇත්තාහු දැයි, මෙසේ පැනයෙක් ඇති කල්හි;

අහෙතුකං නාමං,– අහේතුක වූ නාමය; නාම මූලෙන න එක මූලං,– නාම මූලය කරණ කොට ගෙන සමාන මුල් ඇත්තේ නොවෙයි; සහෙතුකං නාමං,– සහේතුක නාමය; නාම මූලෙන එක මූලං,– නාම මූලය සමඟ සමාන මුල් ඇත්තේ වෙයි. (සෙස්ස කියනු.)

''යෙ කෙචි නාමා ධම්මා''– යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය නම අහේතුක සිත් (18) අටළොස, ඡන්ද වර්ජිත අන්‍ය සමාන චෛතසික (12) දොළස, මෝහ මූල දෙසිතෙහි මෝහය, නිර්වාණය යන මේ ධර්මයෝ වෙති. සහේතුක සිත් (71) එක් සැත්තෑවය, මෝහ මූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (52) දෙපණසය, යන මේ ධර්මයෝ ද ලැබෙති.

සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථ නම සහේතු සිත් (71) එක් සැත්තෑවය, මෝහ මූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (52) දෙපණසය යන මේ ධර්මයෝ ලැබෙති.

ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි ''යෙ වා පන'' යනාදි සන්නිට්ඨාන පදයාගේ අභි–ධෙය්‍යාර්ථ නම පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) සතරය, අර්හන්ත චුති චිත්තයද හැර කුසලා කුසල සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝය. සහේතුක ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක කර්මජ රූපයෝය. මේ ධර්මයෝ ලැබෙති. සහේතුක සිත් (71) එක් සැත්තෑවය, මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (52) දෙපණසය යන මොවුහු ද ලැබෙති. සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් සහේතුක සිත් (71) එක් සැත්තෑවය, මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (52) දෙපණසය යන මේ ධර්මයෝ වෙති (කොටස් බෙද කියනු)

## අඤ්ඤමඤ්ඤ මූල යමකය

ඒක මූල යමකය දේශනා කොට වදරා අනතුරුව අඤ්ඤමඤ්ඤ මූල යමකය වදළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදළ සේක් ද යත්; ''යෙ කෙචි නාම මූලෙන ඒකමූලා ධම්මා, සබ්බෙ තෙ නාම මූලෙන අඤ්ඤමඤ්ඤ මූලාති. මූලානි යානි එකතො උප්පජ්ජන්ති නාම මූලානි, එක මූලානි චෙව අඤ්ඤමඤ්ඤ මූලානි ච; අවසෙසා නාම මූල සහජාතා ධම්මා නාම මූලෙන එක මූලා, නව අඤ්ඤමඤ්ඤ මූලා, යෙ වා පන නාම මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා සබ්බෙ තෙ ධම්මා නාමාති, අමන්තා,– යනුවෙනි. (අර්ථ කියන්න.)

අනුලෝම නයෙහි ''යෙ කෙචි'' යනාදි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම සහේතුක සිත් (71) එක් සැත්තෑවය, නාමමූල (9) නවය හැර චෛතසික (46) සසාලිස, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) අර්හත් චුති චිත්තය ද හැර කුසල – අකුසල සහේතුක විපාක - සහේතුක ක්‍රියා නාමස්-කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතළොසය, පඤ්ච-වෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි ඒකට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන මේ ධර්මයෝ ලැබෙති. මෝහමූල දෙසිතෙහි මෝහය හැර නාම මූලයෝ (9) නව දෙන ද ලැබෙති. සංසය පදය ද පෙර සේමය. යෙ වා පන යනාදි ප්‍රතිලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම්, මෝහ මූල දෙසිතෙහි මෝහය හැර නාම මූලයෝ (9) නවදෙන ලැබෙති. සංසයට ද ඒ ධර්මයෝ මැයි.

**මූලනය නිමි.**

## නාමපද මූල මූල නය

මූල මූලනය ද මූලනය හා සමානය. මූලකනයෙහි පෙර සේම කියනු ''යෙ කෙචි නාමා ධම්මා සබ්බෙ තෙ නාම මූලකාති. අහෙතුකං නාමං න නාම මූලකං, සහෙතුකං නාමං නාම මූලකං; යෙ වා පන නාම මූලකා සබ්බෙ තෙ ධම්මා නාමාති. නාම සමුට්ඨානං රූපං නාම මූලකං, න නාමං, නාමං නාම මූලක ඤ්චෙව නාමඤ්ච; ''මූලකනයෙහි දැක් වූ එකමූල යමකයට අනුව ගත යුතුය. එක මූලය හා සමානයි. මූල මූලකය ද මූලකනය හා සමානයි.

**මූල වාරය නිමි.**

---

## හේතුවාරය

මූලවාරය දේශනා කොට වදරා අනතුරුව හේතුවාරය වදළ සේක. (පෙර සේ කියනු) ''යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ කුසල හෙතූති, තයො එව කුසල හෙතූ, අවසෙසා කුසලා ධම්මා න කුසල හෙතූ, යෙ වා පන කුසල හේතූ; සබ්බෙ තෙ ධම්මා කුසලාති ආමන්තා; යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ කුසල හෙතුනා එක හෙතුකාති ආමන්තා, යෙ වා පන කුසල හෙතුනා එක හෙතු සබ්බෙ තෙ ධම්මා කුසලාති, කුසල සමුට්ඨානං රූපං කුසල හෙතුනා එකහෙතු, න කුසලං කුසලං කුසලහෙතුනා එක හෙතු චෙව කුසලඤ්ච;'' (පෙර සේ අර් දක්වා කියනු කුසල හේතු ගෙන කියනු)

''යෙ කෙචි කුසල හෙතුනා එකහෙතු ධම්මා, සබ්බෙ තෙ කුසල හෙතුනා අඤ්ඤමඤ්ඤ හෙතූති, හෙතූ යෙ එකතො උප්පජ්ජන්ති කුසලහෙතු එකහෙතු චෙව අඤ්ඤමඤ්ඤ හෙතූ ච, අවසෙසා කුසල හෙතු සහජාතා ධම්මා කුසල හෙතුනා එක හේතු, නච අඤ්ඤමඤ්ඤ හෙතූ, යෙ වා පන කුසල හෙතුනා අඤ්ඤමඤ්ඤ හෙතූ, සබ්බෙ තෙ ධම්මා කුසලාති, ආමන්තා;'' (මේ නය ක්‍රමය ඇසුරු කොට හේතුවාරය අවසානය දක්වා කියනු).

**හේතු වාරය නිමි.**

---

## නිදන වාර ආදිය

[නිදන වාරය ද මූලවාරය මෙනි. ''තිණෙව නිදනානි''-යි නපුංසක නාම පදය වශයෙන් කියනු සම්භව වාරය, පභව වාරය, ආහාර වාරය, සමුදය වාරය, යන මේ වාර (5) පස හේතුවාරය මෙනි. ''තයො එව''-යි පුල්ලිඟු නාම පද වශයෙන් කියනු. සමුට්ඨාන වාරය සහ ආරම්මණ වාරය ද මූල වාරය මෙනි. තිණෙව-යි නපුංසක නාම පද වශයෙන් කියනු.]

**කුසල ත්‍රිකය නිමි.**

## වේදනා ත්‍රිකය

කුසල ත්‍රිකය දේශනා කොට වදරා අනතුරුව වේදනාත්‍රිකය වදළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදළ සේක් ද යත්; ''යෙ කෙචි සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා, සබ්බෙ තෙ සුඛාය වේදනාය සම්පයුත්ත මූලාති. පඤ්චෙව සුඛාය වේදනාය සම්පයුත්ත මූලානි, අවසෙසා සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා, න සුඛාය වේදනාය සම්පයුත්ත මූලා. යෙ වා පන සුඛාය වේදනාය සම්පයුත්ත මූලා, සබ්බෙ තෙ ධම්මා සුඛාය වේදනාය සම්පයුත්තාති. ආමන්තා,-'' යනුවෙනි.

අනුලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් සුඛ සහගත සිත් (63) තෙසැටය සුඛ වේදනාව හා එකෝත්පාදදි වශයෙන් මිශ්‍ර වූ මූලයන් (5) පස්දෙන වර්ජිත චෛතසික (41) එක්සාලිස, යන මේ ධර්මයෝ ලැබෙති. සුඛ වේදනා සම්ප්‍රයුක්ත මූලයන් පස්දෙන ද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි ප්‍රතිලෝම වාරයෙහි ද සංසය හා සමාන මැයි.

## එක මූලකය

යෙ කෙචි සුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා, සබ්බෙ තෙ සුඛාය වේදනාය සම්පයුත්ත මූලෙන එක මූලාති, අහෙතුකං සුඛාය වේදනාය සම්පයුත්තං සුඛාය වේදනාය සම්පයුත්ත මූලෙන න එකමූලං. සහෙතුකං සුඛාය වේදනාය සම්පයුත්තං සුඛාය වේදනාය සම්පයුත්ත මූලෙන එකමූලං, යෙ වා පන සුඛාය වෙදනාය සම්පයුත්ත මූලෙන එකමූලා, සබ්බෙ තෙ ධම්මා සුඛාය වේදනාය සම්පයුත්තාති, සුඛඤ්ච සුඛාය වේදනාය සම්පයුත්ත සමුට්ඨාන රූපඤ්ච සුඛාය වේදනාය සම්පයුත්ත මූලෙන එකමූලං, න සුඛාය වේදනාය සම්පයුත්තං, සුඛාය වේදනාය සම්පයුත්තං සුඛාය වේදනාය සම්පයුත්ත මූලෙන එක මූලඤ්චෙව සුඛාය වේදනාය සම්පයුත්තඤ්ච;

අනුලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් අහේතුක සුඛ සහගත සිත් (3) තුනය, ඡන්ද වේදනා වර්ජිත අඤ්ඤසමාන (11) එකොළොසද ලැබෙති. සහේතුක සුඛ සහගත සිත් (60) සම සැටය, වේදනා, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත චෛතසික (46) සසාලිස ද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි.

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් සහේතුක සුඛ සහගත සිත් (60) සම සැටය, පඤ්ච වෝකාර භූමියේ උපදනා කල්හි අර්හන්ත චුතිය හැර සහේතුක සුඛ සහගත නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූප (17) සතළොසය. සුඛ සහගත ප්‍රතිසන්ධි නාමස්කන්ධ (8) අට දෙන සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක කර්මජ රූපයෝ ලැබෙති. සහේතුක සුඛ සහගත සිත් (60) සම සැට ද, චෛතසික (46) සසාලිස ද ලැබෙති. සංසය වනාහි පෙර සේ බෙද කියනු.

## අඤ්ඤමඤ්ඤ මූල යමකය

ඒක මූල යමකය දේශනා කොට වදරා අනතුරුව අඤ්ඤමඤ්ඤ මූල යමකය වදළ සේක. (පෙර සේ කියනු.) කෙසේ වදළ සේක් ද යත්, "යෙ කෙචි සුඛාය වෙදනාය සම්පයුත්ත මූලෙන එකමූලා ධම්මා, සබ්බෙ තෙ සුඛාය වෙදනාය සම්පයුත්ත මූලෙන අඤ්ඤමඤ්ඤ මූලාති, මූලානි යානි එකතො උප්පජ්ජන්ති සුඛාය වෙදනාය සම්පයුත්ත මූලානි, එකමූලානි චෙව අඤ්ඤමඤ්ඤ මූලානි ච; අවසෙසා සුඛාය වෙදනාය සම්පයුත්ත මූල සහජාතා ධම්මා, සුඛාය වෙදනාය සම්පයුත්ත මූලෙන එක මූලා, නව අඤ්ඤමඤ්ඤ මූලා, යෙ වා පන සුඛාය වෙදනාය සම්පයුත්ත මූලෙන අඤ්ඤමඤ්ඤ මූලා, සබ්බෙ තෙ ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තාති, ආමන්තා;" යනුවෙනි.

අනුලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් සහේතුක සුඛ සහගත සිත් (60) සම සැටය. සුඛ වේදනාව හා සම්ප්‍රයුක්ත වූ මූලයෝ (5) පස් දෙනාය, ද්වේෂ, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා වර්ජිත චෛතසික (42) දෙසාලිසය පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අර්හන්ත චුතිය හැර සහේතුක සුඛ සහගත නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූප (17) සතලොසය, සුඛ සහගත ප්‍රතිසන්ධි (8) අට සමග සුදුසු පරිදි උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන මේ ධර්මයෝ ලැබෙති. සුඛ වේදනාව හා සම්ප්‍රයුක්ත මූලයෝ (5) පස් දෙන ද ලැබෙති. සංසය වනාහි පෙර සේම ගතයුතු, ප්‍රතිලෝමය ද පෙර සංසය හා සමානය. මේ නය ක්‍රමය ඇසුරු කොට වේදනා ත්‍රිකය අවසානය තෙක් කියනු.

දුක්ඛ මූල දෙකක් ම ගත යුතුය, අදුක්ඛමසුඛ මුල් (5) පසක්මය, නාමමුල් (12) දෙළසක් ඇතුලත් කර ගත යුතුය.

**වේදනාත්‍රිකය නිමි.**

---

## විපාක ත්‍රිකය

වේදනා ත්‍රිකය දේශනාකොට වදරා අනතුරුව විපාකත්‍රිකය වදළ සේක. (පෙර සේ බෙද කියනු) කෙසේ වදළ සේක් ද යත්; "යෙ කෙචි විපාකා ධම්මා සබ්බෙ තෙ විපාක මූලාති. තීණෙව විපාක මූලානි, අවසෙසා විපාකා ධම්මා න විපාක මූලා, යෙ වා පන විපාක මූලා, සබ්බෙ තෙ ධම්මා විපාකාති, ආමන්තා;" යනුවෙනි.

**අනු**ලෝම ප්‍රශ්නයෙහි සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ නම් විපාක සිත් (36) **සතිසය**, විපාක මුල් (3) තුන හැර චෛතසික (35) පන්තිස යන මොවුහු ලැබෙති. විපාක මූල (3) තුන ද ලැබෙති. සංසය වනාහි පෙර සේම බෙදනු. ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය පදය මෙන් දත යුතු.

## ඒක මූලනය

''යෙ කෙචි විපාකා ධම්මා සබ්බෙ තෙ විපාක මූලෙන ඒක මූලානි, අහෙතුකං විපාකං විපාක මූලෙන න ඒක මූලං, සහෙතුකං විපාකං විපාක මූලෙන ඒකමූලං;

''යෙ වා පන විපාක මූලෙන ඒක මූලා, සබ්බෙ තෙ ධම්මා විපාකාති, විපාක සමුට්ඨානං රූපං විපාක මූලෙන ඒක මූලං, න විපාකං, විපාකං විපාක මූලෙන ඒකමූලඤ්චෙව විපාකඤ්ච;''

අනුලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් අහේතුක විපාක සිත් (15) පසළොසය, ඡන්ද වීර්‍ය්‍ය වර්ජිත අන්‍ය සමාන චෛතසික (11) එකොළස වෙති. සහේතුක විපාක (21) එක් විස්ස චෛතසික (38) අටතිසද ලැබෙති. සංසය වනාහි පෙර සේ බෙදනු.

ප්‍රතිලෝම යෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් පඤ්චවෝකාර භූමියෙහි අරූප විපාක 4 අර්හන්තච්‍යුතිය හැර සහේතුක විපාක නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූප (17) සතළොසය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, යන මේ ධර්මයෝ ලැබෙති. සහේතුක විපාක සිත් (21) එක් විස්ස ද, චෛතසික (38) අටතිස ද ලැබෙති. සංසය වනාහි පෙර සේ බෙද කියනු.

## අඤ්ඤමඤ්ඤ මූලය

''යෙ කෙචි විපාක මූලෙන ඒක මූලා ධම්මා සබ්බෙ තෙ විපාක මූලෙන අඤ්ඤමඤ්ඤ මූලානි, මූලානි යානි ඒකතො උප්පජ්ජන්ති විපාක මූලානි, ඒක මූලානි චෙව අඤ්ඤමඤ්ඤ මූලානිච, අවසෙසා විපාක මූල සහජාතා ධම්මා විපාක මූලෙන ඒක මූලා නච අඤ්ඤමඤ්ඤ මූලා යෙවා පන – පෙ – ආමන්තා;''

අනුලෝම යෙහි සන්නිට්ඨාන පදයාගේ අභියෙධය්‍යාර්ථ නම සහේතුක විපාක සිත් (21) එක් විස්සය; විපාක මුල් තුන හැර චෛතසික (35) පන්තිසය; පඤ්ච-වෝකාර භූමියෙහි අරූප විපාක (4) සතර හා අර්හන්ත ච්‍යුතියද හැර සහේතුක විපාක නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝ (17) සතළොසය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහෙතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන මේ ධර්මයෝ ලැබෙති. විපාක මුල් තුන ද ලැබෙති.

ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය පදය මෙනි. [දෙවැනි පදයෙහි කුසල හේතු (3) තුනය, අකුසල හේතු (3) තුනය ''ඡළෙව විපාක ධම්ම මූලානි'' යනුවෙන් ඇතුලත් කළ යුතුය.]

ඒක මූලයෙහි ''අහෙතුකං විපාක ධම්මං'' කියා ඇතුලත් කළ යුතුයි. සන්-නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් මෝහමූල දෙසිතෙහි මෝහය ලැබේ. අකුසල් සිත් (12) දොළසය, කුසල් සිත් (21) එක් විස්සය, මෝහමූල ද්වයෙහි මෝහය

හැර චෛතසික (52) දෙපණසය යන මේ ධර්‍මයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේ බෙදනු, ප්‍රතිලෝමයෙහි කුසල් අකුසල් යන නාම ධර්‍මයන් නිසා උපදනා වූ චිත්තජ රූපයන් සන්නිට්ඨාන පදයෙහි අභිධෙය්‍ය වශයෙන් උදුරනු; අඤ්ඤමඤ්ඤ මූලයෙහි ද අභිධෙය්‍ය ඉදිරිම පහසුය.

තෘතිය පදයෙහි "තිණෙව නෙව විපාක න විපාක ධම්ම ධම්ම මූලානි"යි ඇතුලත් කරනු. සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් ක්‍රියාසිත් (20) විස්සය, ක්‍රියා මුල් තුන හැර චෛතසික (32) දෙතිසය, රූප (28) අට විස්සය, නිර්‍වාණය යන මේ ධර්‍මයෝ ලැබෙති. ක්‍රියා මුල් තුන ද ලැබෙති. සංසය වනාහි පෙර සේ බෙද කියනු.

ඒක මූලයෙහි, "අහෙතුකං නෙව විපාක න විපාක ධම්ම ධම්මං නෙව විපාක න විපාක ධම්ම ධම්ම මූලෙන න එකමූලං, සහෙතුකං නෙව විපාක න විපාක ධම්ම ධම්මං නෙව විපාක න විපාක ධම්ම ධම්ම මූලෙන එකමූලං; යෙ වා පන – පෙ – ආමන්තා;"

අනුලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ අහේතුක ක්‍රියා මූල (3) තුනය. ඡන්දවර්ජිත අන්‍ය සමාන (12) දොළසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) සතර දෙපස් විඤ්ඤාණ සිත් (10) දසය. අර්හත්ත චුතිය ද හැර කුසල අකුසල විපාක සිත් (22) දෙවිස්ස, අහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතළොසය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසළොස සමහ සුදුසු පරිදි එකට උපදනා වූ ප්‍රතිසන්ධි කර්‍මජ රූපයෝය, බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, අසඤ්ඤසත්ත්ව කර්‍මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්‍මජ රූපයෝය, නිර්‍වාණය යන මේ ධර්‍මයෝ ලැබෙති. සහේතුක ක්‍රියා සිත් (17) සතළොසය, චෛතසික (35) පන්තිසය, පඤ්චවෝකාර' භූමියෙහි උපදනා කල්හි සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝද ලැබෙත්. සංසය වනාහි පෙර සේම බෙද කියනු ප්‍රතිලෝමයද පෙර සංසය මෙනි·

අඤ්ඤමඤ්ඤයෙහි ද පෙර සංසය පදය මෙනි. මුල් (3) තුන වෙන් කොට දෙකට බෙද කියනු. නාම මූලයෙහි "ද්වාදසෙව නාම මූලානි" යනුවෙන් කියනු. කුසල ත්‍රිකය අනුව බෙද ගනු.

**විපාක ත්‍රිකය නිමි.**

## උපාදින්න ත්‍රිකය

උපාදින්න ත්‍රිකයෙහි, "යෙ කෙචි උපාදින්නුපාදනියා ධම්මා සබ්බෙ තෙ උපාදින්නුපාදනිය මූලානි, තිණෙව උපාදින්නුපාදනිය මූලානි, – පෙ – ආමන්තා;"

අනුලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් ලෞකික විපාක (32) දෙතිසය, උපාදින්නුපාදනිය මුල් (3) තුන හැර චෛතසික (32) දෙතිසය, කර්‍මජ රූප (20) විස්සය, යන මේ ධර්‍මයෝ ලැබෙති. මුල් තුන ද ලැබෙති. සංසය වනාහි පෙර සේ මය, ප්‍රතිලෝමය ද සංසය මෙනි.

5

ඒකමූලයෙහි, – ''අහේතුකං උපාදින්නුපාදනියං උපාදින්නුපාදනිය මූලෙන න ඒකමූලං, සහෙතුකං උපාදින්නුපාදනියං උපාදින්නුපාදනිය මූලෙන ඒකමූලං, යෙ වා පන – උපාදින්නුපාදනිය සමුට්ඨානං රූපං උපාදින්නුපාදනිය මූලෙන ඒකමූලං, උපාදින්නුපාදනියං – පෙ'' – අනුලෝම සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ නම් අහේතුක විපාක සිත් (15) පසළොස, ඡන්ද වීර්‍ය්‍ය හැර අන්‍ය සමාන චෛතසික (11) එකොළසය, අහේතුක ප්‍රතිසන්ධි දෙසිත සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ අහේතුක කර්මජ රූපයෝය, අසඤ්ඤසත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ලැබෙති. සහේතුක ලෞකික විපාක සිත් (17) සතළොස, චෛතසික (35) පන්තිසය සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, යන මේ ධර්මයෝ ද ලැබෙති. සංසය වනාහි පෙර සේ බෙදනු.

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම්, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක සිත් (4) සතර හා අර්හන්ත චුතිය ද හැර සහේතුක ලෞකික විපාක නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝ ලැබෙති. සහේතුක ලෞකික විපාක සිත් (17) සතළොසද, සහේතුක පඤ්චවෝකර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ද ලැබෙති.

අඤ්ඤමඤ්ඤ මූලයෙහි, පෙර සේ පාලිය කියවනු. අනුලෝමයෙහි සන්නි–ට්ඨාන පදයාගේ අභිධෙය්‍ය නම සහේතුක ලෞකික විපාක (17) සතළොස, මූල් (3) තුන හැර චෛතසික (32) දෙතිස, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) සතරය අර්හන්ත චුතිය ද හැර සහේතුක ලෞකික විපාක නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූප (17) සතළොසය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ද ලැබෙති. උපාදින්නුපාදනිය මූල් (3) තුනද ලැබෙති. සංසය වනාහි පෙර සේම බෙදනු, ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි ඉහත සංසය පදය මෙනි.

ද්විතීය පදයෙහි ''ඡලෙව අනුපාදින්නුපාදනිය මූලානි''යි ගත යුතු, සන්නි–ට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ වශයෙන් අකුසල් සිත් (12) දෙළසය, ලෞකික කුසල් සිත් (17) සතළොසය, ක්‍රියා සිත් (20) විස්සය, මූල් (6) සය හැර චෛතසික (46) සසාලිස, තිජරූප (17) සතළොසය, ජරතා රූපයද ඇතුලත් වේ. මේ ධර්මයෝ ලැබෙති. මූල් සය ද ලැබෙති. සංසය පෙර සේ බෙදනු.

ඒක මූලයෙහි, ''අහේතුකං අනුපාදින්නුපාදනියං අනුපාදින්නුපාදනිය මූලෙන න ඒකමූලං, සහෙතුකං අනුපාදින්නුපාදනියං – පෙ – යෙ වා පන–පෙ–ආමන්තා;'' සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් අහේතුක ක්‍රියා සිත් (3) තුනය, ඡන්ද වර්ජිත අඤ්ඤසමාන චෛතසික (12) දෙළසය, මෝහ මූල ද්වයෙහි මෝහය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) සතර හා දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය අර්හන්ත චුතිය ද හැර ලෞකික විපාක අහේතුක ක්‍රියා ලෝකොත්තර නාමස්කන්ධයන් ද නිසා සුදුසු පදිරි උපදනා වූ චිත්තජ රූප (17) සතළොස, බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, යන

මෙ ධර්මයෝ ලැබෙති. අකුසල සිත් (12) දොළසය, ලෞකික කුසල් සිත් (17) සතළොසය, සහේතුක ක්‍රියා සිත් (17) සතළොසය, මෝහ මූල දෙසිතෙහි මෝහය හැර චෛතසික (52) දෙපණසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි ලෞකික කුසල් අකුසල් සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් ද නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූප (17) සතළොසද යන මේ ධර්මයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේ බෙදනු. [අඤ්ඤමඤ්ඤ මූලයෙහි පෙර කියන ලද සංසය පදය මෙන්ම මුල් (6) සය වෙන්කොට දෙකට බෙද අභිධෙය්‍ය උදුරනු.]

තෘතිය පදයෙහි, ''තිණෙව අනුපාදින්න අනුපාදනිය මූලානි''යි කියනු. ඒක මූලයෙහි, අහෙතුකං අනුපාදින්න අනුපාදනියං – පෙ – සහෙතුකං අනුපාදින්න අනුපාදනියං – පෙ – යෙ වා පන – පෙ – අනුපාදින්න අනුපාදනිය සමුට්ඨානං රූපං – පෙ – එක මූලං – පෙ – අනුපාදින්න අනුපාදනියං – පෙ –''

අනුලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් නිර්වාණය ලැබේ. ලෝකුත්තර සිත් (8) අටද චෛතසික (36) සතිසද ලැබෙති. සංසය පදය පෙර සේ මය.

ප්‍රතිලොම යෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි ලෝකෝත්තර නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතළොස ලැබෙති. ලෝකොත්තර සිත් (8) අටද චෛතසික (36) සතිසද ලැබෙති. [අඤ්ඤමඤ්ඤ මූලයෙහි, එකමූල අභිධෙය්‍ය අතුරෙන් මුල් (3) තුන වෙන්කොට දෙකට බෙද අභිධෙය්‍ය උදුරනු. නාම පදයෙහි ''ද්වාදසෙව නාම මූලානි''යි කියනු.]

**උපාදින්නත්‍රිකය නිමි.**

---

## සංකිලිට්ඨත්‍රිකය

[සංකිලිට්ඨත්‍රිකයෙහි ප්‍රථම පදය අකුසල පදයට අනුව ස්වරූප උදුරනු. ද්විතීය පදයෙහි ''තිණෙව අසංකිලිට්ඨ සංකිලෙසික මූලානි''යි කියනු.] සන්නිට්ඨාන අභිධෙය්‍ය වනාහි ලෞකික කුසල් සිත් (17) සතළොස, ලෞකික විපාක සිත් (32) දෙතිස, ක්‍රියා සිත් (20) විස්ස, මුල් (3) තුන හැර චෛතසික (35) පන්තිස, රූප (28) අටවිස්ස යන මේ ධර්මයෝ ලැබෙති. මූල (3) තුන ද ලැබෙති. සංසය පදය වනාහි පෙර සේ මය.

ඒක මූලයෙහි ''අහේතුකං අසංකිලිට්ඨ සංකිලෙසිකං – පෙ – සහෙතුකං අසංකිලිට්ඨ සංකිලෙසිකං – පෙ – යෙ වා පන – පෙ – ආමන්තා;'' අනුලෝම සන්නිට්ඨාන පදයේ අභිධෙය්‍යාර්ථ නම් අහේතුක සිත් (18) අටළොසය, ඡන්ද වර්ජිත අන්‍ය සමාන චෛතසික (12) දොළසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි දෙපස් විඤ්ඤාණ (10) දසය හැර කුසලාකුසල අහේතුක විපාක අහේතුක ක්‍රියා ලෝකොත්තර නාමස්කන්ධයන් ද නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතළොසය, අහේතුක ප්‍රතිසන්ධි (2) දෙක සමඟ සුදුසු පරිදි එකට

උපදනා වූ අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, අසඤ්ඤ සත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය, යන මේ ධර්මයෝ ලැබෙති.

ලෞකික කුසල් සිත් (17) සතළොසය, සහේතුක ලෞකික විපාක සිත් (17) සතළොසය, සහේතුක ක්‍රියා සිත් (17) සතළොසය, චෛතසික (38) අටතිසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක සිත් (4) සතර හා අර්හන්ත චුති චිත්තය ද හැර ලෞකික කුසල් සහේතුක ලෞකික විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් ද නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූප (17) සතළොසය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන මේ ධර්මයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි

ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය වැනිය. [අඤ්ඤමඤ්ඤ මූලයෙහි ද පෙර සංසය මැයි. මුල් තුන වෙන් කොට දෙකට බෙදා උදුරනු. තෘතීය පදය ද උපාදින්න ත්‍රිකයෙහි තෘතීය පදයට සමානය. නාම පදය ද කුසලත්‍රික නාම පදය මෙනි.]

**සංකිලිට්ඨත්‍රිකය නිමි,**

---

# විතර්ක ත්‍රිකය

විතර්ක ත්‍රිකයෙහි, ''ඡළෙව සවිතක්ක සවිචාර මූලානි''යි කියනු. සන්නිට්ඨාන අභිධෙය්‍ය වනාහි සවිතක්ක සවිචාර සිත් (55) පස්පණසය, සහජාත මුල් (6) සයය, විතර්ක විචාර වර්ජිත චෛතසික (44) සුසාලිස ලැබෙති. මුල් (6) සය ද, ලැබෙති.

''යෙ කෙචි – පෙ – අහෙතුකං සවිතක්ක සවිචාරං සවිතක්ක සවිචාර මූලෙන න එකමූලං, සහෙතුකං – පෙ – යෙ වා පන – පෙ – විතක්ක විචාරඤ්ච සවිතක්ක සවිචාර සමුට්ඨාන රූපඤ්ච සවිතක්ක සවිචාර සහජාතං රූපං'' – යනාදි ක්‍රමයට කියනු.

අනුලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම, දෙපස් විඤ්ඤාණ (10) දසය හැර අහේතුක සිත් (8) අටදෙනය, ඡන්ද – විතර්ක – විචාර වර්ජිත අන්‍ය සමාන චෛතසික (10) දසය සහ මෝහ මූල දෙසිතෙහි මෝහය ද යන මෙ ධර්මයෝ ලැබෙති.

සහේතුක සවිතක්ක සවිචාර සිත් (47) සත්සාලිසය, මෝහමූල දෙසිතෙහි මෝහය, විතර්ක විචාර හැර චෛතසික (50) සම පණසද යන මේ ධර්මයෝ ලැබෙති. සංසය වනාහි පෙර සේම ලැබේ.

ප්‍රතිලෝමයෙහි සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථයෝ නම විතර්කය, විචාරය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අර්හන්ත චුතිය හැර සහේතුක සවිතර්ක සවිචාර නාමස්කන්ධයෝය. සුදුසු පරිදි උපදනා සහේතුක චිත්තජ

රූපයෝය. සහේතුක සවිතර්ක සවිචාර ප්‍රතිසන්ධි (9) නවය සමඟ සුදුසු පරිදි උපදනාවූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝද යන මෙ ධර්මයෝ ලැබෙති. සහේතුක සවිතක් සවිචාර සිත් (47) සත්සාලිසද මෝහ මූල ද්වයෙහි මෝහයද විතක් විචාර හැර චෛතසික (50) සමපණසද ලැබෙති සංඝය වනාහි පෙර සේම බෙදනු. [අඤ්ඤමඤ්ඤ මූලයෙහි, ඒක මූල අභිධෙය්‍ය අතුරෙන් මූල (6) සය වෙන් කොට දෙකට බෙද කියනු.]

ද්විතිය පදයෙහි ''තිණෙව අවිතක්ක විචාර මත්ත මූලානි''යි කියනු, සන්නිට්ඨාන අභිධෙය්‍ය වනාහි ද්විතීය ධ්‍යාන සිත් (11) එකොළස, මුල් තුනද විතර්ක විචාරද හැර චෛතසික (33) තෙතිසය, ප්‍රථම පදයෙහි අභිධෙය්‍ය අතුරෙන් සම්ප්‍රයුක්තවූ විතර්ක චෛතසික (55) පස්පණසය, යන මෙ ධර්මයෝ ලැබෙති. මූල (3) තුනද ලැබෙති. ඒක මූලයෙහි ''අහෙතුකං අවිතක්ක විචාර මත්තං – පෙ – සහෙතුකං – පෙ – යෙ වා පන – පෙ – විචාරඤ්ච අවිතක්ක විචාර මත්ත සමුට්ඨානඤ්ච රූපං – පෙ –''

අනුලොම සන්නිට්ඨානයෙහි අභිධෙය්‍ය වනාහි ප්‍රථම පදයාගේ ස්වරූප සමඟ සම්ප්‍රයුක්තවූ අහේතුක විතර්ක චෛතසික (8) අට ලැබෙති. ද්විතීය–ධ්‍යාන සිත් (11) එකොළසද විතර්ක විචාර හැර චෛතසික (36) සතිසද ලැබෙ. ප්‍රථම පදයාගේ ස්වරූප සමඟ සහේතුක විතර්ක චෛතසික (47) සතලිස් සතද ලැබෙති. සංඝය වනාහි පෙර සේ මැයි.

ප්‍රතිලෝම සන්නිට්ඨානයෙහි අභිධෙය්‍ය වනාහි ද්විතීය ධ්‍යාන සිත් (11) එකොළොස සමඟ සම්ප්‍රයුක්තවූ විචාර චෛතසික (11) එකොළොසය, පඤ්ච–වෝකාර භූමියෙහි උපදනා කල්හි ද්විතීය ධ්‍යාන නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනාවූ සහේතුක චිත්තජ රූපයෝය, ද්විතීය ධ්‍යාන ප්‍රතිසන්ධි නාමස්–කන්ධයන් හා සමඟ සුදුසු පරිදි උපදනාවූ සහේතුක කර්මජ රූපයෝය, මෙ ධර්මයෝ ලැබෙති. ද්විතීය ධ්‍යාන සිත් (11) එකොළසද, විතර්ක විචාර හැර චෛතසික (36) සතිසද, ලැබෙති. ප්‍රථම පදයාගේ ස්වරූප සමඟ සහේතුක විතර්ක චෛතසික (47) සතලිස්සතද ලැබෙති. සංඝය වනාහි පෙර සේ මැයි. [අඤ්ඤමඤ්ඤ මූලයෙහි වනාහි ඒකමූල ස්වරූප අතුරෙන් මූලයන් වෙන්කොට දෙකට බෙද කියනු.]

තෘතිය පදයෙහි ''තිණෙව අවිතක්ක අවිචාර මූලානි''යි කියනු සන්නිට්ඨාන අභිධෙය්‍ය වනාහි අවිතර්ක අවිචාර සිත් (55) පස් පණසය, විතර්ක විචාර හැර චෛතසික (33) තෙතිසය, ද්විතීය ධ්‍යාන (11) එකොළස සමඟ සම්ප්‍රයුක්ත විචාර චෛතසික (11) එකොළසය, රූප (28) අටවිස්සය, නිර්වාණය යන මෙ ධර්මයෝ ලැබෙති. මූල (3) තුනද ලැබෙති. සංඝය වනාහි පෙර සේ මැයි.

ඒක මූලයෙහි, '';අහෙතුකං අවිතක්ක අවිචාරං – පෙ – සහෙතුකං – පෙ – යෙ වා පන – පෙ – ආමන්තා;'' අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය වනාහි දෙපස් විඤ්ඤාණ (10) දසයය, සර්වචිත්ත සාධාරණ චෛතසික (7) සතය, ද්විතීය ධ්‍යාන සිත් (11) එකොළස සමඟ සම්ප්‍රයුක්තවූ විචාර චෛතසික (11) එකොළසය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අර්හන්ත චුතිය හැර සවිතක්ක සවිචාර

අවිතක්ක විචාරමත්ත නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූප (17) සතළොසය, සවිතර්ක සවිචාර ප්‍රතිසන්ධි (12) දෙළස හා සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ කර්මජ රූපයෝය. බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, අසඤ්ඤසත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය, නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. සහේතුක අවිතර්ක අවිචාර සිත් (45) පන්සාලිස ද විතර්ක විචාර හැර චෛතසික (36) සතිසද, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක සිත් (4) හා අර්හන්ත චුතිය ද හැර සහේතුක අවිතර්ක අවිචාර නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූප (17) සතළොස ද පඤ්චවෝකාර අවිතර්ක ප්‍රතිසන්ධි (3) තුන සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ සහේතුක කර්මජ රූපයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි. ප්‍රතිලෝමය ද පෙර සංසය අභිධෙය්‍ය මෙනි. **අඤ්ඤමඤ්ඤ** මූලයෙහිද පෙරකී සංසය අභිධෙය්‍ය අතුරෙන් මුල් (4) සතර වෙන් කොට දෙකට බෙද උදුරනු.

**විතර්ක ත්‍රිකය නිමි.**

---

[මේ නය ක්‍රමය ඇසුරුකොට ප්‍රීති ත්‍රිකය ආදි කොට
ඇති සියලු ත්‍රිකයන් බෙද කියනු.]

## සනිදස්සන සප්පටිඝ ත්‍රිකය

### අන්තිම සනිදර්ශන සප්‍රතිඝ ත්‍රිකය දක්වන්නෙමි.

"යෙ කෙචි සනිදස්සන සප්පටිඝා ධම්මා සබ්බෙ තෙ සනිදස්සන සප්පටිඝ මූලාති, නො; යෙ වාපන – නත්ථි; යෙ කෙචි සනිදස්සන සප්පටිඝා ධම්මා, සබ්බෙ තෙ සනිදස්සන සප්පටිඝ මූලෙන එක මූලාති, නත්ථි, යෙ වා **පන** නත්ථි;" **අඤ්ඤමඤ්ඤ** මූලයෙහිද – නත්ථි; ද්විතිය පදය ද මේ නයට සමානය.

"යෙ කෙචි අනිදස්සන අප්පටිඝා ධම්මා, සබ්බෙ තෙ අනිදස්සන අප්පටිඝ මූලාති, ජලෙව අනිදස්සන අප්පටිඝ මූලානි, යෙ වා පන – පෙ – ආමන්තා;"

සන්නිට්ඨාන අභිධෙය්‍ය වනාහි සිත් (89) එකුන් අනුවය මූලයන් (6) සය ද හැර චෛතසික (46) සසාලිසය, සූක්ෂම රූප(16)සොළසය නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. මුල් (6) සය ද ලැබෙති.

"යෙ කෙචි – පෙ – අහෙතුකං අනිදස්සන අප්පටිඝං – පෙ – සහේතුකං – පෙ – යෙ වා පන – පෙ – ආමන්තා;" සන්නිට්ඨාන අභිධෙය්‍ය නම් අහේතුක සිත් (18] අටළොසය, ඡන්ද වර්ජිත අන්‍ය සමාන චෛතසික (12) දෙළසය, මෝහ මූල ද්වයෙහි මෝහය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි දෙපස් විඤ්ඤාණ (10) දසය ද හැර ඉතිරි අහේතුක විපාක අහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ අහේතුක චිත්තජ සුඛුම රූපයෝය, අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙක සමඟ සුදුසු පරිදි එකට උපදනා වූ අහේතුක කර්මජ සූක්ෂම රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ සූක්ෂම රූපයෝය, නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. සහේතුක සිත් (71) එක් සැත්තෑව ද, මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික

(52) දෙපණසද පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක සිත් (4) හා අර්හත්ත චුති චිත්තයද හැර කුසල අකුසල සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ සූක්ෂම රූපයෝද සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස හා සමඟ සුදුසු පරිදි එකවිට උපදින්නා වූ ප්‍රතිසන්ධි කර්මජ සූක්ෂම රූපයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි

''යෙ වා පන'' යනාදි ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය නම් පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) සතර හා අර්හත්ත චුතියද හැර කුසලාකුසල සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ සහේතුක ඖදරික චිත්තජ රූපයෝය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකවිට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ ඖදරික රූපයෝය, යන මේ ධර්මයෝ ලැබෙති. සහේතුක සිත් (71) එක් සැත්තෑව ද; මෝහ මූල ද්වයෙහි මෝහය හැර චෛතසික (52) දෙපණසද ලැබෙති. අනුලෝමය වනාහි සංසය මෙනි.

අඤ්ඤමඤ්ඤ යමකයෙහි සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ නම් සහේතුක සිත් (71) එක් සැත්තෑවය, හේතු (6) සය වර්ජිත චෛතසික (46) සසාලිස, පඤ්ච-වෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක සිත් (4) සතර හා අර්හත්ත චුති චිත්තයද හැර කුසලා කුසල සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ චිත්තජ රූපයෝය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකවිට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, යන මේ ධර්මයෝ ලැබෙති. මෝහමූල ද්වයෙහි මෝහය හැර හේතු සදෙනද ලැබෙති, සංසය පෙර සේ මැයි. ප්‍රතිලෝමයෙහිද සමානය, නාම-පදයෙහිද ''ජළෙව''යි යොදනු.

**තික මාතිකා නිමි.**

---

## දුකමාතිකා – හේතුගොච්ඡකය

හේතුගොච්ඡකයෙහි ''යෙ කෙචි හෙතු ධම්මා, සබ්බෙ තෙ හෙතු මූලාති ආමන්තා, යෙ වා පන – ආමන්තා;'' හේතු ධර්ම සදෙන ලැබෙති. ඒක මූලයෙහි යෙ කෙචි හෙතු ධම්මා, සබ්බෙ තෙ හෙතු මූලෙන එකමූලාති, අහෙතුකං හෙතු හෙතු මූලෙන න එකමූලං, සහෙතුකං හෙතු හෙතුමූලෙන එකමූලං, යෙ වා පන හෙතුමූලෙන එකමූලා සබ්බෙ තෙ ධම්මා හෙතූති, හෙතු සහජාතා ධම්මා හෙතු මූලෙන එකමූලා, නහෙතූ, හෙතූ හෙතු මූලෙන එකමූලා චෙව හෙතූ ච,''

අනුලෝමයෙහි සන්නිට්ඨාන පද අභිධෙය්‍යාර්ථ නම් මෝහමූල දෙසිතෙහි මෝහය ලැබේ. මෝහ මූලද්වයෙහි මෝහය හැර හේතු ධර්ම සදෙනද ලැබෙති. සංසය වනාහි පෙ සේ මැයි, ප්‍රතිලොමයෙහි සන්නිට්ඨාන පද අභිධෙය්‍යාර්ථ නම් සහේතුක සිත් (71) එක් සැත්තෑවය, හේතු සය දෙන හැර චෛතසික (46) සසාලිස, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කල්හි අරූප විපාක (4) සතර හා

අර්හත්ත චුතිය ද හැර කුසල අකුසල සහේතුක විපාක සහේතුක ක්‍රියා සුදුසු පරිදි උපදනා වූ සහේතුක චිත්තජ රූපයෝය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (13) තෙළෙස සමඟ සුදුසු පරිදි එකවිට උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, යන මේ ධර්මයෝ ලැබෙති. මෝහමූල ද්වයෙහි මෝහය හැර හේතු සය දෙන ද ලැබෙති, සංසය වනාහි පෙර සේ මැයි. අඤ්ඤමඤ්ඤ මූලයෙහි ද, යට ප්‍රතිලෝමයට අනුවම වේ.

න හෙතු දුකයෙහි, "යෙ කෙචි න හෙතු ධම්මා. සබ්බෙ තෙ න හෙතු මූලානි, නො, යෙ වා පන – නත්ථි, – ඒකමූලයෙහි ද – නො – නත්ථි යන පිළිතුර මැයි. අඤ්ඤමඤ්ඤ මූලයෙහිද නත්ථි – යනු මැයි. න හෙතු පදයෙහි මූල් නැති බැවින් නොලැබේ. නාම පදයෙහි "ජළෙව" කියා යොදනු, අභිධෙය්‍යාර්ථ කුසලත්‍රිකයට අනුවම ලැබේ.

සහේතුක දුකයෙහි "ජළෙව සහෙතුක මූලානි"යි යොදනු, ඒකමූලයෙහි අනුලෝමයෙහි ආමන්තා; ප්‍රතිලෝමයෙහි "සහෙතුක සමුට්ඨානං රූපං – **පෙ**"–යි කියනු, ප්‍රතිලෝමයෙහි සහේතුක සමුට්ඨාන අභිධෙය්‍ය වශයෙන් සහේතුක චිත්තජ රූපයෝ ද සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝද ලැබෙති.

අහේතුක දුකයෙහි "යෙ කෙචි අහෙතුකා ධම්මා – පෙ – එකං යෙ ච අහෙතුක මූලං. අවසෙසා අහෙතුකා ධම්මා න අහෙතුක මූලා. යෙ වා පන – ආමන්තා;" අනුලෝම සන්නිට්ඨාන පද අභිධෙය්‍යාර්ථ නම් අහේතුක සිත් (18) අටළොස, ඡන්ද වර්ජිත අන්‍ය සමාන චෛතසික (12) දෙළොස, රූප (28) අටවිස්ස, නිර්වාණය යන මේ ධර්මයෝ ලැබෙති. මෝහමූල දෙසිතෙහි මෝහය ද ලැබේ.

ඒක මූලයෙහි අනුලෝමයට – නෝ – යනු ද, පටිලෝමයට **නත්ථි** යනු ද පිළිතුර වේ. අන්‍ය නය ක්‍රමයක් ද වේ. මෝහමූල දෙසිත නිසා උපදනා වූ චිත්තජ රූපය, අහේතුක – සහේතුක කොට ඒකමූල නම් වේ. ඉතිරි පදයන්ගේ ස්වරූපය අහේතුක අහේතුක නම් වේ.

ප්‍රතිලෝමයෙහි "අහෙතුක මූල සම්පයුත්තා ධම්මා," යොද කියනු. පශ්චිම කොට්ඨාශයෙහි අභිධෙය්‍යාර්ථය වනාහි "අහෙතුක මූල සම්පයුත්ත සමුට්ඨානං රූපං"යි යොද කියනු. ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ නම් මෝහ මූල ද්වයෙහි මෝහය හැර චෛතසික (15) පසළොස ලැබෙති. මෝහ මූල ද්වය නිසා උපදනා වූ චිත්තජ රූපයෝද ලැබෙති. අඤ්ඤමඤ්ඤ මූලයෙහි – නො – නත්ථි – යනු ම පිළිතුර වේ. [මේ නයක්‍රමය ඇසුරු කොට හේතු ගොච්ඡකය අවසානය තෙක් කියනු.]

## ආසව ගොච්ඡකය

"යෙ කෙචි ආසවා ධම්මා, සබ්බෙ තෙ ආසව මූලානි, ද්වෙයෙව ආසව මූලානි, අවසෙසා ආසවා ධම්මා න ආසව මූලා, යෙ වා පන–ආමන්තා;" අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථය දිට්ඨිය ලැබේ. ලෝභ – මෝහ මූලයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය මෙනි. ඒක මූලයෙහි "යෙ කෙචි ආසවා ධම්මා, සබ්බෙ තෙ ආසව මූලෙන එකමූලානි, අහෙතුකං

ආසවං ආසව මූලෙන න එකමූලං, සහෙතුකං ආසවං ආසව මූලෙන එකමූලං; යෙ වා පන – පෙ – ආසව මූල සහජාතා ධම්මා ආසව මූලෙන එකමූලා, න ආසවා, ආසවං ආසව මූලෙන එකමූලඤ්ච ච ආසවඤ්ච;''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථය නම් දෝස මූල මෝහ මූල දෙකෙහි මෝහය ලැබේ. දෝස මූල දෙසිතෙහි මෝහ මූල දෙසිතෙහි මෝහය හැර ආසව ධර්ම තුන ද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි.

ප්‍රතිලෝම සන්නිට්ඨාන පද අභිධෙය්‍යාර්ථ නම් අකුසල් සිත් (12) දොළසය, ආසව ධර්ම (3) තුන හැර චෛතසික (24) සුවිස්සය, අකුසල් නිසා උපදනා වූ චිත්තජ රූපයෝය යන මේ ධර්මයෝ ලැබෙති. දෙස මූල දෙසිතෙහි මෝහ මූල දෙසිතෙහි මෝහය හැර ආශ්‍රව ධර්ම (3) තුන්දෙන ද ලැබෙති. සංසය පදය පෙර සේ මැයි. අඤ්ඤමඤ්ඤ මූලයෙහි ද පෙර දක්වූ ප්‍රතිලෝම අභිධෙය්‍ය අතුරෙන් ආශ්‍රව මුල් (2) දෙක වෙන් කොට උදුරනු. දෙස මූල ද්වයෙහි හා මෝහ මූල ද්වයෙහි මෝහය හැර ආශ්‍රව මුල් දෙක සන්නිට්ඨාන සංසය දෙපදයෙහිම අභිධෙය්‍යාර්ථයෝ වෙති.

නො ආසව පදයෙහි ''චත්තාරෙව නො ආසව මූලානි''යි යොදනු ඒකමූලයෙහි ''අහෙතුකං නො ආසවං – පෙ – සහෙතුකං නො ආසවං – පෙ – යෙ වා පන – පෙ – ආසවං ආසව මූලෙන එකමූලං, න නො ආසවං, අවසේසා ආසව මූල සහජාතා ධම්මා ආසව මූලෙන එකමූලා චෙව නො ආසවාච,

අනුලෝමය සුගමයි, ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය වනාහි දෙස මූල දෙසිතෙහි ද මෝහමූල දෙසිතෙහි ද මෝහය හැර ආශ්‍රව ධර්ම තිදෙන ලැබෙති. සහේතුකසිත් (71) එක් සැත්තෑවද ආශ්‍රව ධර්ම (3) තුන හැර චෛතසික (49) එකුන් පණසද සහේතුක චිත්තජ රූපයෝද සහේතුක කර්මජ රූපයෝද ලැබෙති.

අඤ්ඤමඤ්ඤ මූලයෙහි ප්‍රතිලෝම ස්වරූප අතුරෙන් මුල් තුන වෙන්කොට දෙකට බෙද කියනු. [මේ නය ක්‍රමය ඇසුරෙන් වනාහි ඥනවන්තයාට සම්පූර්ණ මූල යමකය අවබෝධ කර ගැනීමට හැකි වන්නේය. ඒ නිසා මේ නය ක්‍රමය ඉතා හොඳින් වාචෝද්ගත කටයුතු වන්නේය.]

## නිගමනය

බුරුමරට රත්තපෙත් ප්‍රදේශයෙහි විසූ පූජ්‍ය **නන්දමෙධා** නම් මහා ස්ථවිරයන් වහන්සේගේ ආචාර්ය පරම්පරාවෙහි ධර්ම විනය හැදෑරූ **අනන්තධජ** මහා රාජගුරු මහා ස්ථවිරයන් වහන්සේ විසින් රචනා කරන ලද මූල යමක අභිධෙය්‍යාර්ථ වාචනා මාර්ගය නිමියේය. පශ්චිම ජනතාව ද මනා නුවණින් යුතුව උද්ග්‍රහණ ධාරණාදි වශයෙන් මනාව භාවිතා කෙරෙත්වා.

**මූල යමක අභිධෙය්‍යාර්ථ නිමි.**

# ස්කන්ධ යමක අභිධර්මය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!**

## පණ්ණත්ති වාර උද්දේසය

මූලයමකය දේශනාකොට වදරා ඉන් අනතුරුව ස්කන්ධ යමකය දේශනා කොට වදළ සේක. ඒ ස්කන්ධ යමකය ද පණ්ණත්ති වාර, පවත්ති වාර, පරිඤ්ඤ වාර වශයෙන් තෙවදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පණ්ණත්ති වාරය පළමු කොට වදළ සේක. ඒ පණ්ණත්ති වාරයද උද්දේශ නිර්දේශ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේශය පළමු කොට වදළ සේක. ඒ උද්දේශය ද පරිච්ඡේද වාරය; පරිච්ඡින්නුද්දෙස වාරය, විභාග වාරය වශයෙන් තෙවදෑම් වන්නේය. හෙවත්, ස්කන්ධ උද්දේශ, නාමව්‍යවස්ථාන නයවාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් ස්කන්ධෝද්දේශ වාරය පළමු කොට වදළ සේක.

කෙසේ වදළ සේක් ද යත්; ''පඤ්චක්ඛන්ධා'' – යනුවෙනි. ඉන් අනතුරුව නාම ව්‍යවස්ථානය වදළ සේක. කෙසේද යත්, ''රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො, සඤ්ඤක්ඛන්ධො, සංඛාරක්ඛන්ධො, විඤ්ඤණක්ඛන්ධො,'' යනුවෙනි. ඛන්ධා පඤ්ච; – ස්කන්ධයෝ පස්දෙන; ඛන්ධාහොන්ති; ස්කන්ධ නම් වෙති, රූපස්–කන්ධය, වෙදනාස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාර ස්කන්ධය, විඥනස්කන්ධය යන, ඉමෙපඤ්ච, මේ පස්දෙන; ඛන්ධාහොන්ති, – ස්කන්ධයෝ නම් වෙති.

## 1. පද සෝධන වාරය.

නාම ව්‍යවස්ථානය දේශනා කොට වදරා අනතුරුව නය වාරය වදළ සේක. ඒ නය වාරය ද පද සොධන වාරය, පදසොධන මූල චක්‍ර වාරය, සුද්ධ ස්කන්ධ වාරය, සුද්ධ ස්කන්ධ මූල චක්‍රවාරය වශයෙන් සිව් වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පදසෝධන වාරය පළමු කොට වදළ සේක. ඒ පදසෝධන වාරය ද අනුලෝම ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක.

[මෙහි ප්‍රධාන අභිප්‍රාය වචනාර්ථය වනාහි, ස්කන්ධයන්ගේ නාම ප්‍රඥප්තිය පැහැදිලිකිරීම් වශයෙන් දක්වෙන බැවින් පණ්ණත්ති වාර නම් වේ. ස්කන්ධ–යන්ගේ චුති – ප්‍රතිසන්ධි, මරණ – උත්පත්ති, උත්පාද – නිරෝධ, වශයෙන් ඇතිවීම් නැතිවීම් දෙක පැහැදිලි වශයෙන් දක්වෙන බැවින් පවත්තිවාර නම් වේ. ඒ සංක්ෂේප වශයෙන් ඇත්තාවූ ස්කන්ධයන් විස්තර වශයෙන් තුනකට පිරිසිඳ දක්වන බැවින් පරිඤ්ඤවාර නම් වේ. ස්කන්ධයන් මිශ්‍ර නොකොට වෙන්කරන බැවින් පරිච්ඡේද වාර නම් වේ. වෙන් කරන ලද්දවූ ස්කන්ධයන් විස්තර වශ–

යෙන් දක්වන බැවින් පරිච්ඡින්නුද්දෙස වාර නම් වේ. මේ නය සතර වශයෙන් බෙදු දක්වන බැවින් විභාගවාර නම් වේ. පද පැහැදිලි කිරීම් වශයෙන් දක්වෙන බැවින් පදසෝධන වාර නම් වේ.

පද සොධනය කරමින් එක එක මුල් කොට චක්‍ර වශයෙන් බැඳ දක්වන බැවින් පදසොධන මූල චක්‍ර වාරය නම් වෙයි. වෙන වෙන ම ස්කන්ධයන් වදළ බැවින් සුද්ධ ස්කන්ධ වාරය නම් වේ. වෙන වෙනම ඇති ස්කන්ධයන් එකට එකක් මුල් කොට චක්‍ර බඳනා බැවින් සුද්ධ ස්කන්ධ මූල චක්‍ර වාරය නම් වේ. මේ වනාහි ප්‍රධාන අභිප්‍රාය අර්ථ දක්වෙන වචනයයි.] ඒ අනුලෝමය ද රූපස්කන්ධ යමක ආදී වශයෙන් (5) පස් වැදෑරුම් වන්නේය. ඒ පස අතුරෙන් රූපස්කන්ධ යමකය පළමු කොට වදළ සේක. ඒ රූපස්කන්ධ යමකය ද අනුලෝම ප්‍රශ්නය ප්‍රතිලෝම ප්‍රශ්නය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම ප්‍රශ්නය පළමු කොට වදළ සේක. ඒ අනුලෝම ප්‍රශ්නය ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේ ද යත්; ''රූපං'' – යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේ ද යත්, ''රූපක්ඛන්ධො''–යනුවෙනි. රූපං – යනු සන්නිට්ඨානයයි. රූපක්ඛන්ධො – යනු සංසයයි, සන්නිට්ඨාන – සංසය දෙපදය එකතු වීමෙන් අනුලෝම පුච්ඡාව සැදේ.

අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝම පුච්ඡාව වදළ සේක. ඒ ප්‍රතිලෝම ප්‍රශ්නයද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේද යත්, ''රූපක්ඛන්ධො'' – යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්; ''රූපං'' – යනුවෙනි. රූපක්ඛන්ධො – යනු සන්නිට්ඨානයයි, රූපං – යනු සංසයයි. සන්නිට්ඨාන සංසය දෙ පදය එකතුවීමෙන් ප්‍රතිලෝම ප්‍රශ්නය සැදෙන්නේය. අනුලෝම ප්‍රශ්නය – ප්‍රතිලෝම ප්‍රශ්නය යන දෙක එකතු වීමෙන් පදසෝධන වාර අනුලෝමයෙහි පළමු වැනි වූ රූපස්කන්ධ යමකය වන්නේය. රූපං – රූපය යනු; රූපක්ඛන්ධො; – රූපස්කන්ධ නම් වන්නේ ද; රූපක්ඛන්ධො, – රූපස්කන්ධය යනු; රූපං – රූපය නම් වන්නේද, යන අර්ථයි.

රූපස්කන්ධ යමකය දේශනා කොට වදරා අනතුරුව වේදනාස්කන්ධ යමකය වදළ සේක. ඒ වේදනාස්කන්ධ යමකයද අනුලෝම – ප්‍රතිලෝම ප්‍රශ්න වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම ප්‍රශ්නය පළමු කොට වදළ සේක. ඒ අනුලෝම ප්‍රශ්නය ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේද යත්; ''වේදනා'' – යනුවෙනි, ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්; ''වේදනාක්ඛන්ධො'' – යනු වෙනි. වේදනා – යනු සන්නිට්ඨානයයි. වේදනාක්ඛන්ධො – යනු සංසයයි. සන්නිට්ඨාන – සංසය දෙපදය එකතුවීමෙන් අනුලෝම ප්‍රශ්නය සැදෙන්නේය.

අනුලෝම ප්‍රශ්නය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝම ප්‍රශ්නය වදළ සේක. ඒ ප්‍රතිලෝම ප්‍රශ්නයද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක, ඒ

කෙසේද යත්, ''වේදනාක්ඛන්ධො'' – යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේ ද යත්, ''වේදනා'' යනු වෙනි. වේදනාක්ඛන්ධො යනු සන්නිට්ඨානයි. වේදනා යනු සංසයයි. සන්නිට්ඨාන – සංසය දෙපදය එකතු–වෙන් ප්‍රතිලෝම ප්‍රශ්නය සැදෙන්නේය. අනුලෝම ප්‍රශ්න – ප්‍රතිලෝම ප්‍රශ්න දෙක එකතුවීමෙන් පදසෝධන වාර අනුලෝමයෙහි දෙවැනි වූ වේදනා ස්කන්ධ යමකය නම් වන්නේය. වේදනා–වේදනාව; වේදනාක්ඛන්ධො,–වේදනාස්කන්ධ නම් වන්නේද, වේදනාක්ඛන්ධො – වේදනාස්කන්ධය; වේදනා, – වේදනා නම් වන්නේද, යනු අර්ථයි.

වේදනාස්කන්ධ යමකය දේශනා කොට වදරා අනතුරුව සඤ්ඤාස්කන්ධ යමකය වදළ සේක. ඒ සංඥාස්කන්ධ යමකය ද (පෙර සේ බෙද කියනු.) අනුලෝම ප්‍රශ්නය – ප්‍රතිලෝම ප්‍රශ්නය යන දෙක එකතුවෙන් පදසෝධන වාර අනුලෝ–මයෙහි තුන් වැනි වූ සංඥාස්කන්ධ යමකය සැදෙන්නේය. සඤ්ඤා – සංඥාව; සඤ්ඤාක්ඛන්ධො, – සංඥාස්කන්ධ නම් වන්නේද, සඤ්ඤාක්ඛන්ධො, – සංඥාස්–කන්ධය; සඤ්ඤා, සංඥා නම් වන්නේද;

සංඥාස්කන්ධ යමකය දේශනා කොට වදරා අනතුරුව සංස්කාරස්කන්ධ යමකය වදළ සේක. (පෙර සේ බෙදමින් කියනු.) සංඛාරා, – සංස්කාරයෝ; සංඛාරක්ඛන්ධො, – සංස්කාරස්කන්ධ නම් වන්නාහු ද? සංඛාරක්ඛන්ධො,–සංස්කා-රස්කන්ධය; සංඛාරා, – සංස්කාර නම් වන්නේ ද?

සංස්කාරස්කන්ධ යමකය දේශනා කොට වදරා අනතුරුව විඥනස්කන්ධ යමකය වදළ සේක. (පෙර සේ බෙද කියනු) විඤ්ඤාණං, – විඥනය; විඤ්ඤාණ-ක්ඛන්ධො,–විඥනස්කන්ධ නම් වන්නේ ද, විඤ්ඤාණක්ඛන්ධො,–විඥනස්කන්ධය; විඤ්ඤාණං, – විඥන නම් වන්නේ ද: මෙසේ පද සෝධන වාර අනුලෝමයෙහි යමක (5) පසකි. පුච්ඡා (10) දසයකි. අර්ථ (20) විස්සක් ද වෙති.

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනික වාරය වදළ සේක. ඒ ප්‍රත්‍යනිකය ද න රූපස්කන්ධ යමක ආදී වශයෙන් (5) පස් වැදෑරුම් වන්නේය. ඒ පස අතුරෙන් න රූපස්කන්ධ යමකය පළමු කොට වදළ සේක. න රූපස්කන්ධ යමකය ද අනුලෝම ප්‍රශ්නය ප්‍රතිලෝම ප්‍රශ්නය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම ප්‍රශ්නය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමයද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේද, යත්; ''න රූපං''-යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේ ද යත්, ''න රූපක්ඛන්ධො'' – යනුවෙනි. න රූපං – යනු සන්නිට්ඨානයයි. න රූපක්ඛන්ධො යනු සංසයයි; සන්නිට්ඨාන සංසය දෙපදය එකතුවීමෙන් අනුලෝම ප්‍රශ්නය සැදෙන්නේය.

අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝම පුච්ඡාව වදළ සේක. ඒ ප්‍රතිලෝම ප්‍රශ්නය ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේ ද යත්, ''න රූපක්ඛන්ධො'' – යනුවෙනි, ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේ ද යත්; ''න රූපං'' – යනුවෙනි. (පෙර සේම කියනු.)

අනුලෝම ප්‍රශ්නය ප්‍රතිලෝම ප්‍රශ්නය යන දෙක එකතුවීමෙන් පදසෝධන ප්‍රත්‍යනිකයෙහි පළමු වැනි න රූපස්කන්ධ යමකය සැදෙන්නේය. න රූපං – නොම රූපය. – න රූපක්ඛන්ධො, – නොම රූපස්කන්ධ නම් වන්නේද; න රූපක්ඛන්ධො, – නොම රූපස්කන්ධය; න රූපං, – නොම රූප නම් වන්නේ ද; යනු අරියි.

න රූපස්කන්ධ යමකය දෙශනාකොට වදරා අනතුරුව න වේදනස්කන්ධ යමකය වදළ සේක. (පෙර සේම බෙදමින් කියනු) ''න වෙදනා න වෙදනාක්ඛන්ධො, න වෙදනාක්ඛන්ධො න වෙදනා, න සඤ්ඤ න සඤ්ඤක්ඛන්ධො න සඤ්ඤක්ඛන්ධො න සඤ්ඤ; න සංඛාරා න සංඛාරක්ඛන්ධො, න සංඛාරක්ඛන්ධො න සංඛාරා; න විඤ්ඤණං න විඤ්ඤණක්ඛන්ධො, න විඤ්ඤණක්ඛන්ධො න විඤ්ඤණං;''

මෙසේ පදසොධනවාර ප්‍රත්‍යනිකයෙහි යමක (5) පස් දෙනෙකි, ප්‍රශ්න (10) දසයෙකි, අරි (20) විස්සෙක් ද වෙති. අනුලෝම ප්‍රත්‍යනික දෙකෙහි එකතුවෙන් පදසෝධන වාරයෙහි නය දෙකෙකි. යමක (10) දසයෙකි. ප්‍රශ්න (20) විස්සෙකි. අරි (40) ක් ද ලැබෙති.

**පද සෝධන වාරය නිමි.**

---

## 2 පද සෝධන මූල චක්‍ර වාරය

පද සෝධන වාරය දේශනා කොට වදරා අනතුරුව පද සොධන මූලචක්‍ර වාරය වදළ සේක. ඒ පද සෝධන මූල චක්‍රවාරය ද අනුලෝම ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමයද රූපස්කන්ධ මූලය වේදනාස්කන්ධ මූලය යනාදි වශයෙන් (5) පස් වැදෑරුම් වන්නේය. ඒ පස අතුරෙන් රූපස්කන්ධ මූලය පළමු කොට වදළ සේක. ඒ රූපස්කන්ධ මූලයද වේදනාස්කන්ධ මූලි යනාදි වශයෙන් (4) සිවුවැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් වේදනාස්කන්ධ මූලි වාරය පළමු කොට වදළ සේක, ඒ වේදනාස්කන්ධ මූලි වාරය ද අනුලෝම ප්‍රශ්නය ප්‍රතිලෝම ප්‍රශ්නය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම ප්‍රශ්නය පළමු කොට වදළ සේක, ඒ අනුලෝම ප්‍රශ්නයද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ කෙසේද යත්; ''රූපං'' – යනුවෙනි, ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්; ''රූපක්ඛන්ධො,'' – යනුවෙනි.

රූපං – යනු සන්නිට්ඨානයයි, රූපක්ඛන්ධො – යනු සංසයයි. සන්නිට්ඨාන සංසය දෙපදය එකතුවෙන් අනුලෝම ප්‍රශ්නය සිද්ධ වන්නේය. අනුලෝම ප්‍රශ්නය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝම ප්‍රශ්නය වදළ සේක, ඒ ප්‍රතිලෝම ප්‍රශ්නයද (පෙර සේ බෙදමින් කියනු) කෙසේ වදළ සේක් ද යත්; ''ඛන්ධා වෙදනාක්ඛන්ධො'' – යනුවෙනි.

---

ඛන්ධා–යනු සන්නිට්ඨානයයි, වෙදනාක්ඛන්ධො–යනු සංසයයි. සන්නිට්ඨාන සංසය දෙකෙහි එකතුවෙන් ප්‍රතිලෝම ප්‍රශ්නය සිද්ධ වන්නේය. අනුලෝම – ප්‍රතිලෝම ප්‍රශ්න දෙකෙහි එකතුවෙන් පදසෝධන මූල චක්‍රවාර අනුලෝමයෙහි පළමු වැනි වූ වේදනාස්කන්ධ මූලී රූපස්කන්ධ යමකය සිද්ධ වන්නේය.

රූපං–රූපය; රූපක්ඛන්ධො-රූපස්කන්ධය නම් වන්නේද, ඛන්ධා-ස්කන්ධයෝ වෙදනාක්ඛන්ධො, – වේදනාස්කන්ධය නම් වන්නාහුද, යනු අර්ථයි; සංඥස්කන්ධ මූලී ආදියෙහිද මෙ නය ක්‍රමය අනුව බෙද කියනු. ද්වි මූලී තිමූලී චතුමූලී යනාදි වශයෙන් වෙසෙසා කියනු. මෙසේ රූපස්කන්ධ මූලයෙහි යමක (4) සතරෙකි. ප්‍රශ්න (8) අටෙකි. අර්ථ (16) සොළසෙක්ද ලැබෙති.

රූපස්කන්ධ මූලය වදරා අනතුරුව වේදනාස්කන්ධ මූලය වදළ සේක. ඒ වේදනාස්කන්ධ මූලයද රූපස්කන්ධ මූලී, සංඥස්කන්ධ මූලී ආදි වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් රූපස්කන්ධ මූලී වාරය පළමු කොට වදළ සේක, (පෙර සෙ බෙද කියනු) "වෙදනා – වෙදනාක්ඛන්ධො – ඛන්ධා - රූපක්ඛන්ධො – පෙ" – මෙසේ පද සෝධන මූල චක්‍ර වාර අනුලෝමයෙහි පළමු වැනි රූපස්කන්ධ මූලී වේදනාස්කන්ධ යමකය සිද්ධ වන්නේය.

ඉන් අනතුරුව සංඥස්කන්ධ මූලී වාරය වදළ සේක. – පෙ – විඥනස්කන්ධ මූලී වාරය වදළ සේක. මෙසේ වේදනාස්කන්ධ මූලයෙහි යමක (4) සතරෙකි, ප්‍රශ්න (8) අටෙකි. අර්ථ (16) සොළසෙක් ද වෙති. ඉන් අනතුරුව සංඥස්කන්ධ මූලය වදළ සේක.–පෙ–(මූලී සතර සිහි කරනු) ඉන් අනතුරුව සංස්කාරස්කන්ධ මූලය වදළ සේක. – පෙ – (මූලී සතර සිහි කරනු) ඉන් අනතුරුව විඥනස්කන්ධ මූලය වදළ සේක. – පෙ – (මූලී සතර සිහි කරනු) මෙසේ පදසෝධන මූල චක්‍ර වාර අනුලෝමයෙහි මූල වාර (5) පසෙකි. යමක (20) විස්සෙකි. ප්‍රශ්න (40) සතලිසෙකි. අර්ථ (80) අසූවෙක් ද වෙති.

## ප්‍රත්‍යනීක වාරය

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක. ඒ ප්‍රත්‍යනීකය ද, න රූපස්කන්ධ මූල යනාදි වශයෙන් (5) පස් වැදෑරුම් වන්නේය. ඒ පස අතුරෙන් න රූපස්කන්ධ මූලය පළමු කොට වදළ සේක. (අනුලෝම වාරයෙහි මෙන් මූලී 4 බැගින් ලැබෙන බව සිතනු.) මේ ක්‍රමයෙන් පදසෝධන මූල චක්‍ර වාර ප්‍රත්‍යනීකයෙහි මූල (5) පසෙකි. යමක (20) විස්සෙකි. ප්‍රශ්න (4) සතලිසෙකි. අර්ථ (80) අසූවෙක් ද සිද්ධ වෙති. අනුලෝම – ප්‍රත්‍යනීක වාර දෙකෙහි එකතුව, නය (2) දෙකෙකි, මූල (10) දසයෙකි. යමක (40) සතලි- සෙකි, ප්‍රශ්න (80) අසූවෙකි. අර්ථ (160) එකසිය සැටෙක් ද සිද්ධ වෙති.

**පද සෝධන මූල චක්‍ර වාරය නිමි.**

---

## 3 සුද්ධ ස්කන්ධ වාරය

පදසෝධන මූල චක්‍ර වාරය දේශනා කොට වදරා අනතුරුව සුද්ධ ස්කන්ධ වාරය වදළ සේක. ඒ සුද්ධ ස්කන්ධ වාරයද අනුලෝම - ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක.

ඒ අනුලෝමයද රූපස්කන්ධ යමක-පෙ-පස් වැදෑරුම් වන්නේය. (පදසෝධන වාරය අනුව බෙදනු.) :රූපං-ඛන්ධො; ඛන්ධා-රූපං;'' රූපං,-රූපය; ඛන්ධො,-ස්කන්ධ නම් වන්නේද; ඛන්ධා, - ස්කන්ධයෝ; රූපං, - රූපය නම් වන්නාහුද; මෙසේ සුද්ධ ස්කන්ධ වාර අනුලෝමයෙහි පළමු වැනි රූපස්කන්ධ යමකය සිද්ධ වන්නේය. (වේදනාස්කන්ධ යමක ආදියද බෙද කියනු.) මේ ක්‍රමයෙන් සුද්ධ ස්කන්ධ වාර අනුලෝමයෙහි යමක (5) පස් දෙනෙකි. ප්‍රශ්න (10) දසයෙකි. අර්‍ථ (20) විස්සෙක් ද සිද්ධ වන්නාහ.

ප්‍රත්‍යනීක නයද සමානය, ''නරූපං න ඛන්ධො; න ඛන්ධා-නරූපං;-පෙ-න විඤ්ඤාණං - න, ඛන්ධො න ඛන්ධා - න විඤ්ඤාණං'' මේ ක්‍රමයෙන් සුද්ධ ස්කන්ධ වාර ප්‍රත්‍යනීකයෙහි යමක (5) පසෙකි. ප්‍රශ්න (10) දසයෙකි. අර්‍ථ (20) විස්සෙක්ද ලැබෙති. අනුලෝම-ප්‍රත්‍යනීක දෙකෙහි එකතුව, වූ සුද්ධ ස්කන්ධ වාරයෙහි නය (2) දෙකෙකි. යමක (10) දසයෙකි. ප්‍රශ්න (20) විස්සෙකි. අර්‍ථ (40) සතළිසෙක් ද වෙති.

සුද්ධ ස්කන්ධ වාරය නිමි.

---

## 4 සුද්ධ ස්කන්ධ මූල චක්‍ර වාරය

(සුද්ධ ස්කන්ධ මූල චක්‍ර වාරයෙහි ද පදසෝධන මූල චක්‍ර වාරයෙහි මෙන් මූල මූලි දෙක මෙනෙහි කොට කියවනු. යමක සියල්ල සමාන මැයි.)

උද්දේශ වාරය නිමි.

---

[මේ උද්දේශ වාරයෙහි, ''රූපං ඛන්ධො-ඛන්ධා රූපං,'' යන පාළි පාඨයෙහි ඛන්ධා රූපක්ඛන්ධො,-යි අර්‍ථය ගත යුතුයි. එ නිසා අර්‍ථකථාවෙහි, ''ඛන්ධා රූපන්ති ආදිසු ඛන්ධා රූපක්ඛන්ධො, ඛන්ධා වෙදනාක්ඛන්ධො; ති අත්ථො ගහෙතබ්බො කස්මා නිද්දෙස වාරෙ එවං භාජිතත්තා,'' යනාදිය කියා ඇත.]

මේ ක්‍රමයෙන් ස්කන්ධ යමක පණ්ණත්ති වාරයාගේ උද්දේශයෙහි වාර (4) සතරෙකි. නය (8) අටකි. යමක (100) සියයෙකි, ප්‍රශ්න (200) දෙසීයෙකි. අර්‍ථ (400) සාරසියයෙක් ද වෙති.

සොධනෙ විස සුද්ධෙ ච - චක්කේ ස්වාසිති පිණ්ඩිතා
පුච්ඡා ඛන්ධ යමකස්ස - පණ්ණත්තිම්හි සතානිද්වෙ,

මෙ ස්කන්ධ යමකය කොතැන වදරා ඇත්තේද යත්; ස්කන්ධ විභංගයෙහි වදරා ඇත. කෙසේ වදළ සේක්ද යත්; භාග්‍යවතුන් වහන්සේ ස්කන්ධ විභංගයෙහි ස්කන්ධ (5) පස සූත්‍රාන්ත භාජනී–අභිධර්ම භාජනී, පඤ්හ පුච්ඡක යන නය තුනට අනුව වදළ සේක. ඒ ස්කන්ධයෝ පස් දෙන කාලවශයෙන්ද, භූමි පුද්ගල වශයෙන් ද පරිඥා වශයෙන් ද කෙසේ නම් අවබෝධ කළ හැකි වන්නාහු දැයි, මෙසේ විමති ඇත්තාවූ විනේදනන්ගේ සැකය නැසීම පිණිස මේ ස්කන්ධ යමකය වදළ සේක. නොහොත්, මූල යමකය වදළ භාග්‍යවතුන් වහන්සේට, මූල යමකයෙහි වදළ ධර්මයන් අතුරෙන් කුසල ධර්මයන්ට මූල නම වේත් ද නොවෙත්දැයි මේ ආදි සැකයෙක් නැත්තේමය. මේ මූල යමකයෙහි වදරණ ලද්දවූ කුසල් ආදීවූ ධර්මයන් ස්කන්ධ ආදි වශයෙන් බෙද අවබෝධ කර ගන්නෝ කෙසේ දැයි මෙසේ විමති ඇත්තාවූ වෛනෙය්‍ය පුද්ගලයන්ගේ විමති නැසීම පිණිස මෙ ස්කන්ධ යමකය වදරණ ලද්දේ යයි දත යුතු. [මේ වචනය වනාහි ''මූලයමකෙ දෙසිතෙ යෙව කුසලාදි ධම්මෙ'' යනාදී අටුවා පාඨය හා සමහ සංසන්දනය වෙයි.]

---

# පණ්ණත්ති වාර නිර්දේශය

## 1. පද සොංධන වාංරය

උද්දේශය දේශනා කොට වදරා ඉන් අනතුරුව නිර්දේශය වදළ සේක. ඒ නිර්දේශය ද පදසොධන වාර, පදසෝධන මූල චක්‍ර වාර, ශුද්ධ ස්කන්ධ වාර, ශුද්ධ ස්කන්ධ මූල චක්‍ර වාර වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පදසෝධන වාරය පළමු කොට වදළ සේක. ඒ පදසෝධන වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක; ඒ අනුලෝමය ද රූපස්කන්ධ යමක–පෙ–විඥානස්කන්ධ යමක වශයෙන් පස් වැදෑරුම් වන්නේය. ඒ පස අතුරෙන් රූපස්කන්ධ යමකය පළමු කොට වදළ සේක. ඒ රූපස්කන්ධ යමකයද අනුලෝම–ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද පුච්ඡා–විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාවද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්; ''රූපං''–යනුවෙනි.

ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්; ''රූපක්ඛන්ධො'' යනුවෙනි. පුච්ඡාව වදරා අනතුරුව විස්සජ්ජනාව වදළ සේක. ඒ කෙසේ ද යත්,–''පිය රූපං සාතරූපං, න රූපක්ඛන්ධො, රූපං, රූපක්ඛන්ධො රූපඤ්චෙ ව රූපක්ඛන්ධො ච,'' යනුවෙනි.

අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රතිලෝමය වදළ සේක. ඒ ප්‍රතිලෝමය ද පුච්ඡා විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාව ද, සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට

වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්; ''රූපක්ඛන්ධො'' - යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේ ද යත්; ''රූපං'' -යනුවෙනි. පුච්ඡාවට අනතුරුව විස්සජ්ජනාව වදළ සේක. ඒ කෙසේ ද යත්, ''ආමන්තා.'' යනුවෙනි. රූපං - රූපය තෙම; රූපක්ඛන්ධො - රූපස්කන්ධය නම් වේ ද, ඉති පුච්ඡායං සති. මෙසේ පැනයෙක් ඇති කල්හි, පිය රූපං - ප්‍රිය ස්වභාව ඇති දේද, සාත රූපං--මධුර ස්වභාව ඇති දේද, රූපං--රූප නම්. න රූපක්ඛන්ධො,--රූපස්කන්ධ නම් නොවන්නේය. රූපක්ඛන්ධො,--රූපස්කන්ධය තෙමේ; රූපඤ්චෙව රූප නම් ද වෙයි. රූපක්ඛන්ධො ච; රූපස්කන්ධ නම්ද වන්නේය. ඉති විස්සජ්ජනා හොති;-මෙසේ පිළිතුර වන්නේය. රූපක්ඛන්ධො,--රූපස්කන්ධය තෙමේ; රූපං--රූපය නම් වන්නේද, ඉති පුච්ඡායං සති, මෙසේ පැනයක් ඇති කල්හි ආමන්තා--රූපක්ඛන්ධය නම් වූ ධර්මය රූප නම් වන්නේය. යනු මෙසේ පිළිතුර වන්නේය.

රූපක්ඛන්ධොයයි වදළ අනුලෝම ප්‍රශ්නයෙහි රූපං යයි කියන ලද සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම්, තෘෂ්ණාවට අරමුණු වූ ප්‍රිය ස්වභාව මිහිරි ස්වභාව ඇත්තාවූ ලෞකික සිත් (81) එක් අසූවය, චෛතසික (52) දෙණසය, රූප (28) අටවිස්ස යයි කියන ලද ධර්ම සමූහය නම් වූ ප්‍රිය රූපය සාත රූපය ලැබෙන්නේය. රූප්පන ලක්ෂණය ඇත්තා වූ රූප (28) අටවිස්ස නම් වූ රූපස්කන්ධය ලැබෙන්නේය. හෙවත් - තෘෂ්ණාවට අරමුණු වූ ප්‍රිය ස්වභාව - මිහිරි ස්වභාව ඇත්තා වූ ලෞකික සිත් (81) එක් අසූවය, චෛතසික (52) දෙපණස යයි කියන ලද ප්‍රිය රූප සාත රූපය ලැබේ. රූප්පන ලක්ෂණය ඇත්තා වූ රූප (28) අටවිස්ස නම් වූ රූපස්කන්ධය ද ලැබේ.

[මෙ නය ක්‍රම දෙක අතුරෙන් පළමු නය ක්‍රමය හැර පසුව කී නය ක්‍රමය ම ප්‍රධාන වශයෙන් උද්ග්‍රහණය කරති. අත්හරින හේතුව පසුව කියන්නෙමි.]

රූපක්ඛන්ධො-යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථය නම් රූප්පන ලක්ෂණය ඇත්තා වූ රූප (28) අටවිස්ස නම් වූ රූප සමූහය ම ලැබෙන්යන්ය. රූපක්ඛන්ධො රූපං-යයි වදළ ප්‍රතිලෝම පුච්ඡාවෙහි රූපක්ඛන්ධො-යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් රූපස්කන්ධය ලැබේ. සංසය පදයට ද එසේම ලැබෙන්නේය.

[සමූහයක් වශයෙන් කියන ලද්දවූ පියරූපය - සාතරූපය වනාහි ''චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති'' යනාදී වශයෙන් වදළ බැවින් ලෞකික සිත් (81) එක් අසූවය, චෛතසික (52) දෙපණසය, රූප (28) අටවිස්ස යන මේ ලෞකික ස්කන්ධ (5) පස වෙති. මෙ ලෞකික ස්කන්ධ (5) පඤ්චකය වනාහි ප්‍රිය ස්වභාව මධුර ස්වභාව ඇති බැවින් ප්‍රියරූප - සාතරූප නම් වන්නේය. රූප්පන ස්වභාවයක් නොමැති බැවින් රූපස්කන්ධ නම් නොවන්නේය. රූප-නම් වූ සංඥ සාමාන්‍යම ලැබෙන්නේය. රූපක්ඛන්ධ - යන විශේෂ සංඥව නොලබන්නේය. ලෞකික ස්කන්ධයන්ට අයත් වූ රූප්පන ස්වභාව ඇත්තා වූ භූතරූප - උපාද රූප නම් වූ රූපස්කන්ධයෝ වනාහි ප්‍රියවූ ද මධුරවූ ද ස්වභාව ඇති බැවින් පියරූප - සාතරූප යයි කියන ලද්දවූ රූපය ද වන්නාහ. රූප්පන ස්වභාව ඇති බැවින් රූපස්කන්ධ නම් ද වන්නාහ. රූප - යන සාමාන්‍ය සංඥවද, රූපස්කන්ධ යන විශේෂ නාමය ද ලබන්නාහ.

7

මෙසේ ස්වරූප කථනය වනාහි, ''යං පඤ්චක්ඛන්ධ සමුදයභූතං පියරූපං සාතරූපං තං එක දෙසෙන රූපක්ඛන්ධො හොති.'' යනාදී මූලටීකා වචනය හා සංසන්දනය වේ. අනිත් නය ක්‍රමය ද, ලෞකික සිත් (81) එක් අසූවය. චෛතසික (52) දෙපණසය යන මොවුන් පමණක් පියරූපං යන්නට ඇතුලත් කර ස්වරූප උද්ධරති. රූප (28) අට විස්ස අභිධෙය්‍ය වශයෙන් නොගනිති. මේ ක්‍රම දෙක අතුරෙන් පළමු ක්‍රමය ''චක්ඛුං ලොකෙ පියරූපං සාතරූපං යනාදී පාළිය හා සමඟ ගැලපේ යයි ආචාර්‍ය්‍ය පාදයෝ කැමති වෙති. සාධක පාඨ ද ඉදිරිපත් කරති.

එසේ නමුත් ''රූපං ඛන්ධොති, ආමන්තා'' යන සුද්ධ ස්කන්ධවාර පාළියෙහි වදළ බැවින් ද, එම පාළිය පිළිබඳ සංවණ්ණා අට්ඨකථාවේ ද ''තත්ථ යස්මා පියරූපං සාතරූපං වා හොතු භූතුපාදය රූපං වා සබ්බං පඤ්චසු ඛන්ධෙසු සංගහං ගච්ඡතෙවා ති ආහ. රූපං ඛන්ධොති ආමන්තා'' යයි සංවණ්ණා කළ බැවින් ද ප්‍රිය රූප සාතරූපයෙහි ඇත්තාහු රූප (28) අටවිස්ස රූප ස්කන්ධ නම් වන්නෝ යයි, පියරූප සාතරූපයෙහි රූපස්කන්ධ වදරා ඇතත්, ''රූපක්-ඛන්ධො රූපඤ්චෙව රූපක්ඛන්ධො ච'' යයි රූපස්කන්ධය මතු කියන බැවින් ද පාරිසේස නය වශයෙන් මතු කියනු ලබන්නා වූ රූපස්කන්ධය හැර අවශේෂ වූ නාමස්කන්ධයන් පමණක් ම පියරූපං – සාතරූපං කියා ස්වරූප ඉදිරීම සුද්ධ ස්කන්ධ වාර පාළිය හා අට්ඨකථා හා සමඟ ඉතාමත් පැහැදිලිව සංසන්දනය වන්නේයයි සිතමි.

පියරූපං – සාතරූපං යන අභිධෙය්‍ය කෙරෙහි රූප (28) අටවිස්ස ඇතුළත් කොට ස්වරූප ගන්නේ නම් සුද්ධ ස්කන්ධවාර පාළි අට්ඨකථාවන් සමඟ නොගැලපේ. විමසත්වා.

තෘෂ්ණාවට අරමුණක් ලැබෙන කෙණෙහි තෘෂ්ණාවට අරමුණ වූ පියරූප සාතරූප විශේෂණ කොට අභිධෙය්‍ය ගන්නේ නම් තෘෂ්ණාවට අරමුණු නොවි විදර්‍ශනා කුසලාදියට අරමුණු වන්නා වූ ලෞකික ධර්‍මයන් ''න රූපං'' යන ප්‍රත්‍යනීකයෙහි ලැබෙන්නාක් මෙන් නොගත යුතුය. ලෝකෝත්තර ධර්‍ම ප්‍රඥප්ති ධර්‍ම පමණක් ම ලැබීමෙන් අනුලෝමය හා ප්‍රත්‍යනීකය ඔවුනොවුන් විරුද්ධ වන්නාහ. ඒ නිසා පියරූප සාතරූපයන් තෘෂ්ණාවට ආරම්මණ වෙත් යයි විශේෂණ දක්වා අභිධෙය්‍ය දක්වීම ඉතාමත් සුදුසු බව දත යුතුය.

තෘෂ්ණාවගේ අරමුණ වන්නේ යයි විශේෂණය දන්නේ නම් තෘෂ්ණාවට අරමුණු වේවා හෝ නොවේවා ලෞකික ධර්‍ම සියල්ලම පියරූප – සාතරූප යයි වදළ බැවින් ''න රූපං'' යන ප්‍රත්‍යනීකයෙහි ලෝකෝත්තර ධර්‍ම ප්‍රඥප්ති ධර්‍ම අභිධෙය්‍ය වශයෙන් ගනු ලැබෙති. අනුලෝම හා ප්‍රත්‍යනීකයන් අවිරුද්ධ වන බැවින් අඤ්ඤමඤ්ඤ විරෝධි නොවෙති. ඒ නිසා කියන ලද සියළු කථාව සති සම්පජඤ්ඤයෙන් කල්පනා කොට ගනිත්වා.

රූපක්ඛන්ධො – යන පදයෙහි ඇතැම් ආචාර්‍ය්‍යකෙනෙක් සත්ව සන්තානයෙහි ඇත්තා වූ රූපයෝම රූපස්කන්ධ නම් වේ නැයි ද ලී දඬු ආදියෙහි ඇත්තා වූ බාහිර රූපයෝ රූපස්කන්ධ නම් නොවෙත කියති. එසේ කීම නුසුදුසුය.

කවර හෙයින් ද යත්, ධාතුකථා පාලියෙහි "අබ්‍යාකතා ධම්මා අසංඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි සංගහිතා" යයි අව්‍යාකෘත ධර්‍මයන්ට නිර්වාණය ඇතුලත් කොට, පඤ්චස්කන්ධය වදරා ඇති බැවින් ද, පට්ඨාන පාලියෙහි ද "අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න හෙතු පච්චයා, බාහිරං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා" යනාදි වශයෙන් අබ්‍යාකතයෙහි බාහිර රූප වදරා ඇති බැවින් ද, පට්ඨාන අට්ඨකථා වෙහි ද "බාහිරන්ති පඨවි පාසාණාදිසු ඨිතං සන්ධාය වුත්තං" යයි පෘථිවි පාෂාණ ආදියෙහි පිහිටියා වූ සත්ව සන්තානයන්හි නැත්තා වූ රූපය බාහිර රූප යයි අර්ථ කියන ලද බැවින් ද, ඒ ඇතැම් ආචාර්‍ය්‍ය වචනය ඉහත දක්වූ පාලි අට්ඨකථාවන් හා සමඟ නොගැල පෙන බැවින් නුසුදුසු යයි හඟිමි. විමසත්වා.]

## වේදනාස්කන්ධ යමකය

රූපස්කන්ධ යමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව වේදනාස්කන්ධ යමකය වදළ සේක. (පෙරසේ බෙද කියනු) "වෙදනා වෙදනාක්ඛන්ධොති ආමන්තා වෙදනාක්ඛන්ධො – වේදනාස්කන්ධ නම් වේද; ඉති පුච්ඡායං සති; – මෙසේ පැනයෙක් ඇති කල්හි; ආමන්තා – එසේය වේදනා නම් වූ ධර්‍මය වේදනාස්කන්ධ නම් වන්නේ. ඉති විස්සජ්ජනා හොති; – මෙසේ විසඳුම වන්නේය. ප්‍රතිලෝමය ද කියනු.

වෙදනා වෙදනාක්ඛන්ධො – යනාදි අනුලෝම පාඨයෙහි වෙදනා යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්‍ථ නම් වේදනා චෛතසිකය ලැබෙන්නේය. වෙදනාක්ඛන්ධො යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම් වේදනා චෛතසිකයම ලැබෙන්නේය. ප්‍රතිලෝමයෙහි ද සන්නිට්ඨාන සංසය දෙපදයෙහිම වේදනාස්කන්ධය අභිධෙය්‍ය වශයෙන් ලැබෙන්නේය.

## සංඥාස්කන්ධ යමකය

"සඤ්ඤා සඤ්ඤාක්ඛන්ධොති, දිට්ඨි සඤ්ඤා සඤ්ඤා න සඤ්ඤාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො සඤ්ඤා චෙව සඤ්ඤාක්ඛන්ධො ච, සඤ්ඤාක්ඛන්ධො සඤ්ඤාති ආමන්තා;"

සඤ්ඤා, – සංඥාව; සඤ්ඤාක්ඛන්ධො, – සංඥාස්කන්ධ නම් වන්නී ද ඉති පුච්ඡායං සති; – මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි, දිට්ඨි සඤ්ඤා, – දිට්ඨි චෛතසිකය නම් වූ සඤ්ඤාව, සඤ්ඤා – සංඥා නම් වේ. න සඤ්ඤාක්ඛන්ධො, – සඤ්ඤාස්කන්ධ නම් නොවන්නීය. සඤ්ඤාක්ඛන්ධො, – සංඥාස්න්ධ තෙමේ, සඤ්ඤා චෙව, – සංඥා නම් ද වන්නේය. සඤ්ඤාක්ඛන්ධො ච; සංඥාස්කන්ධ නම් ද වන්නේය. ඉති විස්සජ්ජනා හොති; – මෙසේ විසඳුම වන්නේය. (ප්‍රතිලෝම වාරය පහසුය.)

සඤ්ඤා සඤ්ඤාක්ඛන්ධො – යනාදි අනුලෝම පාඨයෙහි සඤ්ඤා යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය නම් දිට්ඨි චෛතසිකය නම් වූ සඤ්ඤාව ලැබෙන්නේය. සඤ්ජානන ලක්ෂණ ඇත්තා වූ සඤ්ඤාව ද ලැබෙන්නේය. සංසය වනාහි පෙර සේ උදුරනු. ප්‍රතිලෝමයෙහි අභිධෙය්‍ය වශයෙන් සඤ්ඤාස්කන්ධය ලැබෙන්නේය; සංසය ද එසේ මැයි.

## සංස්කාරස්කන්ධ යමකය

''සංඛාරා සංඛාරක්ඛන්ධොති, සංඛාරක්ඛන්ධං ඨපෙත්වා අවසෙසා සංඛාරා න සංඛාරක්ඛන්ධො, සංඛාරා සංඛාරක්ඛන්ධො චෙව සංඛාරා ච, සංඛාරක්ඛන්ධො සංඛාරාති ආමන්තා,''

සංඛාරක්ඛන්ධං;-සංස්කාරස්කන්ධය; ඨපෙත්වා,-හැර; අවසෙසා;-අවශේෂ වූ; සංඛාරා, – සංස්කාරයෝ; න සංඛාරක්ඛන්ධො; – සංස්කාරස්කන්ධ නම් නොවෙති. නොහොත්, – අවසෙසා, – අවශිෂ්ඨ වූ සංඛාරා, – සංස්කාර නම් වූවෝ; සංඛාරක්ඛන්ධො – සංස්කාරස්කන්ධ නම් නොවෙති. (නය 2 කි.) අනුලෝමයෙහි අභිධෙය්‍යාර්ථ නම් සිත් (89) එකුන් අනූවය. වේදනා සඤ්ඤා දෙකය රූප (28) අටවිස්ස යන මේ ධර්මයෝ ලැබෙති. සංස්කාරස්කන්ධයට අයත් වූ සම පණස් (50) චෛතසිකයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේම උදරනු. [ස්වරූප දශන කොට්ඨාශය බලනු. අවසෙසා යයි කියන ලද තන්හි නැවත නොගත යුතු] ප්‍රතිලෝමයෙහි සංස්කාරස්කන්ධයට අයත් වූ සම්පණස් (50) චෛතසිකයෝ ලැබෙති. සංසය ද එසේමය.

## විඥානස්කන්ධ යමකය

''විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධොති, ආමන්තා විඤ්ඤාණක්ඛන්ධො විඤ්ඤාණන්ති, ආමන්තා;'' අනුලෝම අභිධෙය්‍ය වශයෙන් සිත් 89. නම් වූ විඥානස්කන්ධය ලැබේ, සංසයෙහි ද ප්‍රතිලෝමයෙහි ද එසේමය.

**පද සොධන වාර අනුලෝමය නිමි.**

---

# ප්‍රත්‍යනීක වාරය

ප්‍රත්‍යනිකයෙහි, න රූපං න රූපක්ඛන්ධොති, ආමන්තා: න රූපක්ඛන්ධො‍ෙනා, රූපන්ති, පියරූපං සාතරූපං න රූපක්ඛන්ධො, රූපං, රූපඤ්ච රූපක්ඛන්ධඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව රූපං නච රූපක්ඛන්ධො;

ප්‍රතිලෝමයෙහි, න රූපක්ඛන්ධො–නොම රූපස්කන්ධය තෙමෙ; න රූපං රූප නම් නොවන්නේ ද, පියරූපං; – ප්‍රිය ස්වභාවය සාතරූපං, – මධුර ස්වභාවය, න රූපක්ඛන්ධො – නොම රූපස්කන්ධ නම් වන්නේය, රූපං, – රූප නම් පමණක් වන්නේය. රූපඤ්ච, – රූප නම්වූ ද, රූපක්ඛන්ධඤ්ච ඨපෙත්වා, – රූපස්කන්ධ නම්වූ ද ධර්‍ම හැර, අවසෙසා, – සෙසු ධර්‍මයෝ, න චෙව රූපං, – නොම රූප නම් ද වන්නාහ. නච රූපක්ඛන්ධො, – නොම රූපස්කන්ධ නම් ද වන්නාහ.

**අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය වශයෙන් ලෝකෝත්තර සිත් (8) අටදෙනය, චෛතසික (36) සතිසය නිර්වාණය, ප්‍රඥප්තිය යන මේ ධර්‍මයෝ ලැබෙති, සංසය ද එසේම ලැබේ. ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය වශයෙන්**

තෘෂ්ණාවට අරමුණු වන්නාවූද ප්‍රියවූද මිහිරිවූද ලෞකික සිත් (81) එක් අසූවය, තත් සම්ප්‍රයුක්ත චෛතසික (52) දෙපණසය, රූප (28) අට විස්සද යන ප්‍රියරූප වූ සාතරූප වූ මේ ධර්ම සමූහය ලැබේ. අනෙක් ක්‍රමයෙකි. තෘෂ්ණාවට අරමුණු වන්නා වූ පියරූප සාතරූප ලෞකික සිත් (81) එක් අසූවය, චෛතසික (52) දෙපණසය යන මෙ ධර්මයෝ ලැබෙති. ලෝකෝත්තර සිත් (8) අටදෙනය චෛතසික (36) සතිසය, නිර්වාණය. ප්‍රඥප්තිය යන මෙ ධර්මයෝද ලැබෙති. සංසය වනාහි පෙර සේම කියනු.

''න වෙදනා න වෙදනාක්ඛන්ධොති, ආමන්තා, න වෙදනාක්ඛන්ධො න වෙදනාති ආමන්තා.'' අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය නම් වෙදනාස්කන්ධය හැර ඉතිරි ස්කන්ධ (4) සතරය නිර්වාණය හා ප්‍රඥප්තියද ලැබෙති. සංසයද එසේමය. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සංසය දෙකම සමානය.

''න සඤ්ඤා න සඤ්ඤාක්ඛන්ධොති ආමන්තා, න සඤ්ඤාක්ඛන්ධො න සඤ්ඤාති, දිට්ඨි සඤ්ඤා න සඤ්ඤාක්ඛන්ධො සඤ්ඤා, සඤ්ඤං ඤ්ච සඤ්ඤාක්ඛන්ධඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව සඤ්ඤා න ච සඤ්ඤාක්ඛන්ධො''

දිට්ඨි සඤ්ඤා – දෘෂ්ටි සංඛ්‍යාත සංඥව; න සඤ්ඤාක්ඛන්ධො, – නොහොත් සංඥස්කන්ධ නම් වේ. සඤ්ඤා, – සංඥ පමණක්ම වේ. (සෙස්ස සුගමයි, දිට්ඨි සඤ්ඤා, සඤ්ඤා න සඤ්ඤාක්ඛන්ධො කියා අනුලෝමයෙහි මෙන් නවත් පාඨයෙක් ඇත.)

---

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ නම් දිට්ඨි සඤ්ඤාවය, සංඥස්කන්ධය හැර ස්කන්ධ සතරය, නිර්වාණය ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ලැබෙති. සංසයද එසේමය. ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ නම් දිට්ඨි චෛතසිකය නම් වූ දිට්ඨි සඤ්ඤාව ලැබේ. සංඥස්කන්ධය හැර ස්කන්ධ (4) සතරද නිර්වාණයද ප්‍රඥප්තියද ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ උදුරනු.

''න සංඛාරා න සංඛාරක්ඛන්ධොති, ආමන්තා, න සංඛාරක්ඛන්ධො න සංඛාරාති, සංඛාරක්ඛන්ධං ඨපෙත්වා අවසෙසා න සංඛාරක්ඛන්ධො සංඛාරා, සංඛාරෙ ච සංඛාරක්ඛන්ධඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව සංඛාරක්ඛන්ධො, න ච සංඛාරා'' [මෙහිද ''අවසෙසා සංඛාරා න සංඛාරක්ඛන්ධො'' කියා නවත් පාඨයෙක් ඇත.]

අනුලෝම සන්නිට්ඨානයෙහි නිර්වාණය හා ප්‍රඥප්තිය ලැබේ. සංසයද එසේමැයි. **සංසය** වාරයෙහිද එසේමය, ප්‍රතිලෝමයෙහි සිත් (89) අසූනවයය, වෙදනාවය සඤ්ඤවය රූප (28) අට විස්සය නිර්වාණ සහ ප්‍රඥප්තියද ලැබෙති. සංසයාගේ අභිධෙය්‍ය වනාහි පෙර සේම උදුරා කියනු.

''න විඤ්ඤාණං න විඤ්ඤාණක්ඛන්ධොති ආමන්තා, න විඤ්ඤාණක්ඛන්ධො න විඤ්ඤාණන්ති ආමන්තා;

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ, විඥනස්කන්ධය හැර ස්කන්ධ (4) සතරද, නිර්වාණයද, ප්‍රඥප්තියද ලැබෙති. සංසයද එසේමය. ප්‍රතිලෝමයද එසේම ස්වරූප ඇත්තේ වේ.

**පද සොධන වාරය නිමි.**

## 2 පද සෝධන මූල චක්‍ර වාරය

පද සෝධන මූලචක්‍ර වාරයෙහි ''රූපං රූපක්ඛන්ධොති, පියරූපං සාතරූපං රූපං නරූපක්ඛන්ධො, රූපක්ඛන්ධො රූපඤ්චෙව රූපක්ඛන්ධො ච, ඛන්ධා වෙදනාක්ඛන්ධොති, වෙදනාක්ඛන්ධො ඛන්ධො චෙව වෙදනාක්ඛන්ධො ච, අවසෙසා ඛන්ධා න වෙදනාක්ඛන්ධො'' [අනුලෝම අභිධෙය්‍ය බෙද දක්වනු.]

ප්‍රතිලෝම අභිධෙය්‍යාර්, වේදනාස්කන්ධය හැර ඉතිරි ස්කන්ධ (4) සතර ලැබෙති. වේදනාස්කන්ධයද ලැබේ. [ඉතිරි සතරත් මේ අනුසාරයෙන් ඇතුලත් කොට කියනු.]

''වෙදනා වෙදනාක්ඛන්ධොති ආමන්තා, ඛන්ධා රූපක්ඛන්ධොති, රූපක්-ඛන්ධො ඛන්ධො චෙව රූපක්ඛන්ධො ච, අවසෙසා ඛන්ධා න රූප ක්ඛන්ධො;''

ප්‍රතිලෝමයෙහි අභිධෙය්‍යාර්, රූපස්කන්ධය හැර අවශේෂ ස්කන්ධ සතර ලැබෙති. රූපස්කන්ධයද ලැබේ. [කොටධාශ බෙදනු, සෙස්ස ඛභා ස්වරූප උදුරනු. ඉතිරි සංඥස්කන්ධ ආදියෙහි ද රූපස්කන්ධ ආදී වූ ස්කන්ධ ඛභා ස්වරූප කියනු.

**අනුලෝම චක්‍රය නිමි.**

---

## ප්‍රත්‍යනීකය

ප්‍රත්‍යනීකයෙහි, ''න රූපං න රූපක්ඛන්ධොති ආමන්තා, න ඛන්ධා න වෙදනාක්ඛන්ධොති ආමන්තා.'' (අනුලෝමයෙහි පද සෝධනයට අනුව ස්වරූප උදුරනු.)

ප්‍රතිලෝම අභිධෙය්‍යාර් නිර්වාණප්‍රඥප්ති ලැබෙති. සංසයට ද එසේමය, සියලුම ප්‍රතිලෝමයට නිර්වාණ ප්‍රඥප්ති පමණක්ම ලැබෙති. [අනුලෝමයෙහි ද පදසෝධනය අනුව ස්වරූප කියනු.]

**ප්‍රත්‍යනීකය නිමි.**
**පද සෝධන මූල චක්‍ර වාරය නිමි.**

---

## 3 සුද්ධ ස්කන්ධ වාර

''රූපං ඛන්ධොති ආමන්තා ඛන්ධා රූපක්ඛන්ධොති රූපක්ඛන්ධො ඛන්ධා චෙව රූපක්ඛන්ධො ච, අවසෙසා ඛන්ධා න රූපක්ඛන්ධො.''

අනුලෝම අභිධෙය්‍ය වශයෙන් තෘෂ්ණාවට අරමුණු වන්නාවූ ප්‍රියවූ ද මධුරවූ ද ලෞකික සිත් (81) එක් අසූවය, චෛතසික (52) දෙපණසය, රූප (28) අට විස්සය, යන මේ ධර්මයෝ ලැබෙති. සංසයට ද එසේමය. [තත්ථ යස්මා පියරූපං සාත

රූපං වා හොතු. භූතුපාදය රූපං වා, සබ්බං පඤ්චසු ඛන්ධෙසු සංගහං ගච්ඡතෙව,'' යනුවෙන් අට්ඨකථාවෙහි ආ බැවින් පියරූප සාතරූප සමහ රූප (28) අට විස්සම අභිධෙය්‍ය වශයෙන් ලැබෙති.] ප්‍රතිලෝම අභිධෙය්‍ය වනාහි රූපස්කන්ධය හැර සෙසු ස්කන්ධ සතර ලැබෙති: රූපස්කන්ධය ද ලැබේ. සංසය පෙර සේම බෙද දක්වනු.

''වෙදනා ඛන්ධොති ආමන්තා, ඛන්ධා වෙදනාක්ඛන්ධොති,'' අනුලෝම අභිධෙය්‍ය නම් වේදනාස්කන්ධය ලැබේ. සංසයට ද එසේමය, ප්‍රතිලෝම අභිධෙය්‍ය නම් වේදනාස්කන්ධය හැර සෙසු ස්කන්ධ (4) සතර වෙති. වේදනාස්කන්ධය ද ලැබේ. සංසය වනාහි පෙර සේම ලැබේ.

සංඥස්කන්ධ යමකයෙහි අනුලෝම ස්වරූප වශයෙන් දිට්ඨිසඤ්ඤාව ද සංඥස්කන්ධය ද ලැබේ. සංසයද එසේම ලැබේ. (ප්‍රතිලෝමය බෙද කියනු.)

සංස්කාරස්කන්ධ යමකයෙහි අලෝම ස්වරූප වශයෙන් සිත් (89) එකුන් අනූවය, චෛතසික (52) දෙපණසය, රූප (28) අට විස්සය යන මොවුහු ලැබෙති. සංසයට ද එසේමය, ප්‍රතිලෝමය ද මේ නයක්‍රමයට සමානව උදුරනු.

විඥනස්කන්ධ යමකයෙහි අනුලෝම අභිධෙය්‍ය නම් විඥනස්කන්ධය ලැබේ. සංසය ද එසේම ලැබේ. ප්‍රතිලෝම නය සමානයි,

**අනුලෝමය නිමි.**

---

## ප්‍රත්‍යනීක

ප්‍රත්‍යනීකයෙහි ''න රූපං ඛන්ධොති රූපං ඨපෙත්වා අවසෙසා ඛන්ධා න රූපං, ඛන්ධො, රූපඤ්ච ඛන්ධෙ ච ඨපෙත්වා අවසෙසා නචෙව රූපං නච ඛන්ධා න ඛන්ධා රූපක්ඛන්ධොති ආමන්තා,''

න රූපං, – නොම රූපය; න ඛන්ධො, – ස්කන්ධ නම් නොවන්නේ ද, රූපං ඨපෙත්වා; – රූපය හැර, අවසෙසා, – රූපයෙන් අන්‍ය වූ, ඛන්ධා, – ස්කන්ධයෝ; න රූපං; – රූප නම් නොවන්නාහ. ඛන්ධා, – ස්කන්ධ නම් වන්නාහුමය, අනුලෝම අභිධෙය්‍ය, ලෝකෝත්තර සිත් (8) අට දෙනය චෛතසික (36) සතිසය යන මේ ධර්මයෝ ලැබෙති. නිර්වාණය හා ප්‍රඥප්තිය ද ලැබෙති. සංසය වනාහි පෙරසේම ලැබෙති. ප්‍රතිලෝමයෙහි නිර්වාණප්‍රඥප්ති පමණක් ම ලැබෙති.

''න වෙදනා න ඛන්ධොති, වෙදනං ඨපෙත්වා අවසෙසා ඛන්ධා නවෙදනා ඛන්ධො, වෙදනඤ්ච ඛන්ධෙ ච ඨපෙත්වා අවසෙසා න චෙව වෙදනා නච ඛන්ධො, න ඛන්ධා න වෙදනාක්ඛන්ධොති, ආමන්තා;''

අනුලෝම ස්වරූපාර්‍ථ නම් වේදනාස්කන්ධය හැර සෙසු ස්කන්ධ (4) සතර වෙති. නිර්‍වාණ ප්‍රඥප්තිද ලැබෙති. සංසයාගේ අභිධෙය්‍ය පෙර සේම වෙති. ප්‍රතිලෝමයෙහිද එසේම ලැබෙති.

''න සඤ්ඤා න ඛන්ධොති, සඤ්ඤං ඨපෙත්වා – පෙ – ආමන්තා, අනුලෝම ස්වරූපාර්‍ථ නම් දිට්ඨි සඤ්ඤාවය, සඤ්ඤාස්කන්ධය හැර ඉතිරි ස්කන්ධ (4) සතරද ලැබෙති. නිර්‍වාණ – ප්‍රඥප්තිද ලැබෙති. සංසය ස්වරූපයෝ පෙර සේ ලැබෙති. ප්‍රතිලෝමය සංසයට සමානය.

''න සංඛාරා න ඛන්ධොති ආමන්තා, න ඛන්ධා න සංඛාරක්ඛන්ධොති ආමන්තා,'' අනුලෝම අභිධෙය්‍යාර්‍ථ වශයෙන් නිර්‍වාණ – ප්‍රඥප්තිය ලැබෙති. සංසයද එසේම ලැබෙති. ප්‍රතිලෝමයටද එසේමය. [මේ යමකයෙහි ඇතැම් විභංග පාලියක ආමන්තා කියා ඇත. ඇතැම් තැනෙක බෙදු දක්වා ඇත. ආමන්තා කියා ඇත්තාවූ පාලිය සුදුසු යැයි ආචාර්‍ය්‍ය වරයෝ කල්පනා කරති.]

''න විඤ්ඤාණං න ඛන්ධොති විඤ්ඤාණං ඨපෙත්වා–පෙ–ආමන්තා අනුලෝම අභිධෙය්‍යාර්‍ථ වශයෙන් විඥානස්කන්ධය හැර සෙසු ස්කන්ධ සතර ලැබෙති. නිර්‍වාණ ප්‍රඥප්තිද ලැබෙති. ප්‍රතිලෝමයෙහි නිර්‍වාණ ප්‍රඥප්ති ලැබෙති.

**සුද්ධ ස්කන්ධ වාර නිමි.**

---

# 4 සුද්ධ ස්කන්ධ මූල චක්‍ර වාරය

සුද්ධ ස්කන්ධ මූල චක්‍ර වාරයෙහි අභිධෙය්‍ය විශේෂත්වයක් නොමැත. සුද්ධ ස්කන්ධ වාරය ඇසුරු කොට ස්වරූප උදුරනු.

[මේ ප්‍රඥප්ති වාරයෙහි ස්ථාන වශයෙන් ස්ථාන (26) සවිස්සක් වන්නාහ. ඒ ස්ථාන (26) සවිස්ස නම් මෙසේය.

**ඡචත්තාරි ඡ ඡ චතු – ඨානානි කමතො සියුං**
**ඛන්ධෙසු ඉති ඡබ්බීස – ඛන්ධ පණ්ණත්ති වාරකෙ,**

යන ගාථාවට අනුව, රූපස්කන්ධ ස්ථාන (6) සයෙකි. වේදනාස්කන්ධ ස්ථාන (4) සතරෙකි. සංඥස්කන්ධ ස්ථාන (6) සයෙකි. සංස්කාරස්කන්ධ ස්ථාන (6) සයෙකි. විඥානස්කන්ධ ස්ථාන (4) සතරෙකි. මේ ක්‍රමයෙන් ස්ථාන (26) සවිස්ස ලැබෙති.

රූපස්කන්ධ ස්ථාන (6) සයෙක් යනු මෙසේය. පියරූපං සාතරූපං, යනුද එකෙකි. රූපක්ඛන්ධො, යනුද එකෙකි. රූපඤ්ච ඛන්ධෙ ච ඨපෙත්වා, යනු එකෙකි. රූපක්ඛන්ධො ඛන්ධො චෙව රූපක්ඛන්ධො ච, යනුද එකෙකි. අවසෙසා ඛන්ධා, යනුද එකෙකි. රූපං ඨපෙත්වා, යනුද එකෙකි. මෙසේ ස්ථාන සයෙක් වෙති.

වේදනාස්කන්ධ (4) සතරෙකි යනු, වෙදනාක්ඛන්ධො ඛන්ධො චෙව වෙදනාක්ඛන්ධො ච යනුද එකෙකි. අවසෙසා, යනුද එකෙකි. වෙදනං ඨපෙත්වා, යනුද එකෙකි. වෙදනඤ්ච ඛන්ධෙ ච ඨපෙත්වා යනුද එකෙකි. මේ ක්‍රමයෙන් (4) ස්ථාන සතර ලැබෙති.

සංඥාස්කන්ධ ස්ථාන (6) සයෙක් යනු මෙසේය. දිට්ඨි සඤ්ඤා, යනු එකෙකි. සඤ්ඤක්ඛන්ධො, යනුද එකෙකි. සඤ්ඤඤ්ච ඛන්ධෙච ඨපෙත්වා, යනුද එකෙකි. සඤ්ඤක්ඛන්ධො ඛන්ධො චෙව සඤ්ඤක්ඛන්ධො ච, යනුද එකෙකි. අවසේසා, යනුද එකෙකි. සඤ්ඤං ඨපෙත්වා, යනුද එකෙකි. මෙසේ ස්ථාන (6) සය වෙති.

සංස්කාරස්කන්ධ ස්ථාන (6) සයෙක් යනු, සංඛාරක්ඛන්ධං ඨපෙත්වා යනු එකෙකි. සංඛාරක්ඛන්ධො යනුද එකෙකි. සංඛාරෙච ඛන්ධෙච ඨපෙත්වා, යනුද එකෙකි. සංඛාරක්ඛන්ධො ඛන්ධො චෙව සංඛාරක්ඛන්ධො ච – යනු එකෙකි. අවසෙසා ඛන්ධා, යනු එකෙකි. සංඛාරෙ ඨපෙත්වා, යනු එකෙකි. මේ ක්‍රමයෙන් ස්ථාන (6) සයෙක් වෙති.

විඥානස්කන්ධ ස්ථාන (4) සතරෙක් යනු, විඤ්ඤාණක්ඛන්ධො ඛන්ධො චෙව විඤ්ඤාණක්ඛන්ධො ච, යනු එකෙකි. අවසෙසා, යනු එකෙකි. විඤ්ඤාණං ඨපෙත්වා, යනු එකෙකි. විඤ්ඤාණඤ්ච ඛන්ධෙ ච ඨපෙත්වා, යනු එකෙකි. මෙසේ ස්ථාන (4) සතර ලැබෙති.]

## ප්‍රවෘත්ති වාර උත්පාද පුද්ගල වාර රූපස්කන්ධ මූලය.

ප්‍රඥප්ති වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදළ සේක. ඒ ප්‍රවෘත්ති වාරය ද උත්පාද වාරය, නිරෝධ වාරය, උත්පාද නිරොධ වාරය වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් උත්පාද වාරය පළමු කොට වදළ සේක. ඒ උත්පාද වාරය ද ප්‍රත්‍යුත්පන්න වාරය, අතීත වාරය, අනාගත වාරය, ප්‍රත්‍යුත්පන්න අතීත වාරය, ප්‍රත්‍යුත්පන්න අනාගත වාරය, අතීතානාගත වාරය වශයෙන් (6) සවැදෑරුම් වන්නේය. ඒ වාර සය අතුරෙන් ප්‍රත්‍යුත්පන්න වාරය පළමු කොට වදළ සේක. ඒ ප්‍රත්‍යුත්පන්න වාරයද අනුලෝමප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමයද පුද්ගල වාර, ඕකාස වාර, පුද්ගලෝකාස වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක.

ඒ පුද්ගල වාරයෙහි ද රූපස්කන්ධ මූල, පෙ – සංස්කාරස්කන්ධ මූල වශයෙන් සතරෙක් ඇත්තාහ. ඒ සතර අතරෙන් රූපස්කන්ධ මූලය පළමු කොට වදළ සේක. ඒ රූපස්කන්ධ මූලය ද වේදනාස්කන්ධ මූලී යනාදී වශයෙන් සිවුවැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් වේදනාස්කන්ධ මූලී වාරය පළමු කොට වදළ සේක. ඒ වේදනාස්කන්ධ මූලී වාරය ද අනුලෝම – ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමුකොට වදළසේක, ඒ අනුලෝමය ද ප්‍රශ්න – විස්සර්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේ. ඒ දෙක අතුරෙන් ප්‍රශ්නය පළමුකොට වදළ සේක. ඒ ප්‍රශ්නය ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමුකොට වදළ සේක. ඒ කෙසේ ද යත්;

8

''යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්, ''තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති'' යනුවෙනි. ප්‍රශ්නය දේශනා කොට වදරා අනතුරුව විස්සජ්ජනාව වදළ සේක. ඒ කෙසේ වදළ සේක් ද යත්, ''අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං රූපක්ඛන්ධො උප්පජ්ජති, නොච තෙසං වෙදනාක්ඛන්ධො උප්පජ්ජති පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං රූපක්ඛන්ධො ච උප්පජ්ජති, වෙදනාක්ඛන්ධො ච උප්පජ්ජති', යනුවෙනි.

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝමය වදළ සේක. ඒ ප්‍රතිලෝමයද ප්‍රශ්න – විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. (පෙර සේ බෙද කියනු) ''යස්සවා පන වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස රූපක්ඛන්ධො උප්පජ්ජතීති'' අරූපං උපපජ්ජන්තානං – පෙ – පඤ්චවොකාරං උපපජ්ජාන්තානං තෙසං'' – පෙ –

යස්ස, – යම් පුද්ගලයකුට; රූපක්ඛන්ධො, – රූපස්කන්ධය; උප්පජ්ජති, – උපදිමින් පවතී ද, තස්ස, – ඒ රූපස්කන්ධය උපදිමින් පවන්නා වූ පුද්ගලයාට; වෙදනාක්ඛන්ධො – වේදනාස්කන්ධය; උප්පජ්ජති, – උපදිමින් පවන්නේදැයි; ඉති පුච්ඡායං සති; – මෙසේ ප්‍රශ්නයෙක් ඇති කල්හි; අසඤ්ඤසත්තං – අසඤ්ඤසත්ත භවේ, – අසංඥ සත්ව භූමියෙහි, උපපජ්ජන්තානං, – ප්‍රතිසන්ධි ගනිමින් සිටින්නාවූ තෙසං, – ඒ අසංඥ පුද්ගලයන්ට; රූපක්ඛන්ධො උප්පජ්ජති, – රූපස්කන්ධය උපදනේ වේ. තෙසං, – ඔවුනට; වෙදනාක්ඛන්ධො, – වේදනාස්කන්ධය, – නොම උප්පජ්ජති, – නොම උපදනේය; පඤ්චවොකාරං – පඤ්චවොකාර භවේ, – පඤ්චවෝකාර භූමියෙහි; උපපජ්ජන්තානං, – උපදිමින් සිටින්නා වූ; තෙසං; – ඒ පඤ්චවෝකාර භවික පුද්ගලයනට; රූපක්ඛන්ධො ච උප්පජ්ජති, – රූපස්කන්ධයද උපදනේය; වෙදනාක්ඛන්ධො ච උප්පජ්ජති; – වේදනාස්කන්ධයද උපදනේය. (ප්‍රතිලෝමයෙහි ද මෙයට සමානව නය ක්‍රමය උදුරනු. ''අරූපං – අරූපභවෙ'' යන්න පමණක්ම විශේෂයි.)

''යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති''යි වදළ අනුලෝම ප්‍රශ්නයෙහි ''යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති'' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථ නම්, ප්‍රථමයෙන් පහළවන ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගි නම් වූ අසංඥ සත්වයෙහි උපදිමින් සිටින සුගති අහේතුක පුද්ගලයා ගනු ලැබේ.

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසළොසය, චෛතසික (35) පන්තිසය කර්මජ රූප කලාප (3 – 7 – 4) බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි නම් වූ පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන (4) සතර දෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. යන මොවුහු ද ලැබෙති. [ගර්භ-සෙය්‍යකයන් පිණිස කර්මජ කලාප (3) සංසේදජ ඕපපාතිකයන් පිණිස 4 – 7 – ද රූපාවචරිකයන් උදෙසා] 4 ද කියන ලදහ. සංසය පෙර සේම බෙදනු

කොටස් බෙදීම, එසේ වුව ද යම් පුද්ගලයකුට රූපස්කන්ධය උපදිමින් පවතී ද ඔහුට වේදනාස්කන්ධය ඒ ක්ෂණයෙහි උපදිමින් පවත්නේ දෝ යයි භාග්‍යවතුන් වහන්සේට විමතියක් නැත. එහෙත් වෛනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න පහළ

කොට ප්‍රශ්න පඤ්චකය අතුරෙන් පුරේ පඤ්හ, පච්ඡා පඤ්හ දෙකෙහි **ලක්ෂණ**යෙන් යුක්ත වූ පරිපූර්ණ ප්‍රශ්නයාගේ වශයෙන් සන්නිට්ඨාන පදයාගේම අභිධෙය්‍ය ගෙන සංසය පදයාගේ අභිධෙය්‍ය නොම ගෙන ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උද්පාදක්ෂණ සමංගි වූ අසඤ්ඤ සත්තයෙහි උපදමින් සිටින්නාවූ සුගති අහේතුක පුද්ගලයාය. ''අසඤ්ඤ සත්තං උපපජ්ජන්තානං තෙසං රූපක්ඛන්ධො උප්පජ්ජති, නොච තෙසං වෙදනාක්ඛන්ධො උප්පජ්ජති''යි පූර්ව කොට්ඨාශය ඇසුරු කොට සංසය අතහැර, සන්නිට්ඨාන–සංසය දෙපදයාගේම අභිධෙය්‍ය වන්නාවූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසලොසය, චෛතසික (35) පන්තිසය. කර්මජ කලාප 3 බැගින් 7 බැගින් 4 බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි වූ පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින්නාවූ පෘථග්ජනයන් (4) සිවු දෙනාය යට ඵලස්ථයන් 3 තුන්දෙනාය ''පඤ්චවොකාරං උප්පජ්ජන්තානං තෙසං රූපක්ඛන්ධො උප්පජ්ජති. වෙදනාක්ඛන්ධො ච උප්පජ්ජති''යි පශ්චිම කොට්ඨාශය පිළිබඳවූ සංශය ද ඇසුරු නොකොට පිළිතුරු පස අතුරෙන් පූර්ව පශ්චිම දෙකොට්ඨාශයටම යොග්‍ය අයුරින් ස්වරූප කරන **විස්සර්ජනාවෙන්** පිළිතුරු වදරණ ලදි.

[ප්‍රශ්න 4 සතර නම මෙසේය. ''පුරෙපඤ්හො පච්ඡාපඤ්හො පරිපුණ්ණ පඤ්හො, මොඝ පඤ්හොති ඉමෙ චත්තාරො පඤ්හා'' යනුවෙන් අර්ථකථාවෙහි කියන ලදහ. මොඝ ප්‍රශ්නයෙහි ප්‍රතිශේධ විස්සර්ජනාව සහ ප්‍රතික්ෂෙප විස්සර්ජනාව යන දෙකම ලැබෙති. පුරේපඤ්හාවෙහි පාළිගතිය ද, පශ්චාත් ප්‍රශ්නයෙහි ප්‍රතිවචනයද, පරිපූර්ණ පඤ්හාවෙහි ස්වරූප කරනය ද දක්වන ලදි.

**පඤ්චවොකාරං** – යන්නෙහි වෝකාර ශබ්දයෙන් ස්කන්ධ සමූහය කියනු ලැබේ. චතුවෝකාර යන්නෙහි ද අර්ථය එසේමය, උත්තරපද ''භව'' ශබ්දයාට ලෝපයි.]

යස්ස වාපන වෙදනාක්ඛන්ධො උප්පජ්ජති – පෙ – ''ප්‍රතිලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ නම, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි වූ අරූප භවයෙහි උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට ඵලස්ථයන් තිදෙනාය යන මොවුහු ලැබෙති.

---

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසලොසය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප 3 – 7 – 4 බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී නම වූ පඤ්චවෝකාර භවයෙහි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන (4) සතර දෙනාය යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුහු ද ලැබෙති. සංසය පෙර සේමය. [කොටස් බෙදනු ඉන්පසු සංඥස්කන්ධ – සංස්කාරස්කන්ධ – විඥානස්කන්ධයන් ද අනුපිළිවෙලින් යොද වෙදනාස්කන්ධ මූලි වාරය මෙන් කියනු.]

## වේදනා ස්කන්ධ මූලය

රූපස්කන්ධ මූල වාරය දේශනා කොට වදරා අනතුරුව වෙදනාස්කන්ධ මූලය දේශනා කළ සේක. ඒ වේදනාස්කන්ධ මූලය ද සංඥස්කන්ධ, මූලි ආදි වශයෙන් තෙවැදෑම් වන්නේය, ඒ තුන අතුරෙන් සංඥස්කන්ධ මූලි වාරය

පළමුකොට වදළ සේක. ඒ සංඥස්කන්ධ මූලි වාරය ද අනුලෝම – ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමුකොට වදළ සේක. ඒ අනුලෝමයද පුච්ඡා–විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමුකොට වදළ සේක. ඒ පුච්ඡාව ද සන්නිට්ඨාන–සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේ. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්; ''යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. ඒ කෙසේද යත්; ''තස්ස සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජති'' යනුවෙනි, ඉන් අනතුරුව විස්සජ්ජනාව වදළ සේක. ඒ කෙසේ ද යත්, ''ආමන්තා'' – යනුවෙනි. ප්‍රතිලෝම නයක්‍රමයද මීට සමානය, බෙද කියනු.

අනුලෝම ප්‍රශ්නයෙහි ''යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති යනාදි සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාාර්ථයෝ නම් ප්‍රතිසන්ධි සිත් (19) එකුන්විස්සය, චෛතසික (35) පන්තිසය, කර්ම කලාප 3 – 7 – 4 බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ චතුවෝකාර පඤ්චවෝකාර භූමීන්හි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන (4) සිවුදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. යන මොවුහු ලැබෙති. සංසයට ද එසේම ලැබෙති.

කොටස් බෙදීම, එසේම ලැබෙන නමුත් යම් පුද්ගලයෙකුට වේදනාස්කන්ධය උපදිමින් පවත්නේ නම් ඔහුට සංඥස්කන්ධයත් උපදිමින් පවත්නේදැයි සර්වඥයන් වහන්සේට සැකයෙක් නැත්තේය. වෛනෙයාාධාාශය වශයෙන් ප්‍රශ්න උපදවන ලද්දේය. ප්‍රශ්න චතුෂ්කය අතුරෙන් පශ්චිම කොටඨාශයේ ස්වරූපයට සමානව, පශ්චාත් ප්‍රශ්නයට අනුව වේදනාස්කන්ධය උපදිමින් පවත්නා පුද්ගලයාට සංඥස්කන්ධය උපදිමින්ම පවතින්නා වූ බැවින් සන්නිට්ඨාන ස්වරූපය ඇතුලත් කරමින් පිළිතුරු පස අතුරෙන් ''ආමන්තා'' යන ප්‍රතිවචන විසඳුමෙන් පිළිතුරු වදළහ. ප්‍රතිලෝමයෙහි ද නය ක්‍රමය සමානය. [සංස්කාරස්කන්ධ – විඥනස්කන්ධ මූලි වාරද සමානව කියනු සංඥව මුල්කොට සංස්කාර – විඥන මූලි යමක දෙකද, සංස්කාර මුල්කොට විඥන මූලි යමක එකද වේදනා මූල වාරය සේ උදුරනු.]

**පුද්ගල වාරය නිමි.**

---

## ඕකාස වාර රූපස්කන්ධ මූලය

පුද්ගල වාරය දේශනාකොට වදරා අනතුරුව ඕකාස වාරය වදළ සේක. (පෙර සේ කියනු) ''යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජති තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජතීති, අසඤ්ඤසත්තෙ තත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජති නොච තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, පඤ්චවොකාරෙ තත්ථ රූපක්ඛන්ධො ච උප්පජ්ජති. වෙදනාක්ඛන්ධො ච උප්පජ්ජති. යත්ථ වා පන වෙදනාක්ඛන්ධො උප්පජ්ජති– පෙ – අරූපෙ තත්ථ – පෙ – පඤ්චවොකාරෙ තත්ථ – පෙ –''

යත්ථ – යම් භවයෙක; අසඤ්ඤසත්තෙ, – අසඤ්ඤසත්ත භවෙ, – අසඤ්ඤසත්ව භූමියෙහි; රූපක්ඛන්ධො උප්පජ්ජති,–රූපස්කන්ධය උපදිමින් පවත්නේය; තත්ථ,– ඒ භවයෙහි; වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, – වේදනාස්කන්ධය උපදී ද, නො උප්පජ්ජති,–නොම උපදී; පඤ්චවොකාරෙ,–පඤ්චවෝකාර භූමියෙහි, අර් සුගමයි.

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය නම්, රූපස්කන්ධය පමණක්ම උපදනා වූ අසඤ්ඤ සත්වය ගනු ලැබේ. ස්කන්ධ 5 පසම උපදනා වූ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස දෙවනුව ගනු ලැබෙති. සංසය පදයාගේ ස්වරූප පෙරසේ මැයි. ප්‍රතිලෝම සන්නිට්ඨාන පදයාගේ ස්වරූප වශයෙන් නාමස්කන්ධ සතර පමණක්ම උපදනා වූ අරූප භූමි (4) සතර ලැබෙවූ. ස්කන්ධ 5 පසම උපදනා වූ පඤ්චවෝකාර භූමි (26) සවිස්සද දෙවනුව ලැබෙති. සංසය පදය පෙරසේ මැයි [කොටස් බෙද කියනු. සංඥ – සංස්කාර – විඥාන ඇතුලත් කිරීමද සමාන මැයි.]

වේදනාස්කන්ධ මූලයෙහි "යත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජති තත්ථ සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජතීති. ආමන්තා; යත්ථ වා පන, ආමන්තා; අනුලෝම සන්නිට්ඨාන පදයේ අභිධෙය්‍ය වශයෙන් නාමස්කන්ධ (4) සතර පමණක් උපදනා වූ අරූප භූමි (4) සතරද, ස්කන්ධ (5) පස උපදනා වූ පඤ්චවෝකාර භූමි (26) සවිස්සද ලැබෙති. සංසයට ද එයම ලැබේ. ප්‍රතිලෝමයෙහි ද එසේය.

## පුද්ගලෝකාස වාරය

"යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජති තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජතීති, අසඤ්ඤ සත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ – පෙ – පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ – පෙ – යස්ස වා පන යත්ථ–පෙ – අරූපං උපපජ්ජන්තානං තෙසං තත්ථ – පෙ – පඤ්ච වොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ (අර්ථ සුගමයි.)

අනුලෝම සන්නිට්ඨාන පදයේ අභිධෙය්‍යාර්ථ වශයෙන් ප්‍රථමයෙන් උපදනාවූ ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගීවූ අසංඥසත්වයෙහි උපදිමින් සිටින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසංඥසත්ත්ව භවය ලැබේ. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප 3 – 7 – 4 බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පඤ්චවෝකාර භවයෙහි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන (4) සතර දෙනාය. යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ලැබෙති. සංසය පෙර සේ මැයි, (කොටස් බෙද කියනු.)

ප්‍රතිලෝමයෙහි අරූප ප්‍රතිසන්ධි (4) සතරය, චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ අරූප භූමියෙහි උපදිමින් සිටින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයා ය, යට ඵලස්ථ ආයර්‍යයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ අරූප භූමි (4) සතර ලැබෙති. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසද චෛතසික (35) පන්තිසද යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පඤ්චවෝකාර භූමියෙහි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන (4) සතර දෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය යන මේ අයගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්සද ලැබෙති. සංසය පෙර සේ මැයි, (කොටස් බෙද ස්වරූප උදුරනු.)

'යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජතීති ආමන්තා, යස්ස වා පන යත්ථ – පෙ – ආමන්තා,"

අනුලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ වශයෙන් වනාහි ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය කර්මජ කලාප 3 – 7 – 4 බැගින් යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ චතුවෝකාර පඤ්චවෝකාර භූමින්හි උපදිමින් සිටින්නාවූ (4) සිවුදෙනෙක්වූ පෘථග්ජනයෝය, (3) තිදෙනක්වූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය යන මේ අයගේ චතුවෝකාර භූමි (4) සතර සහ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ලැබෙති. සංසයද එසේමය. ප්‍රතිලෝමයද එසේමැයි.

**පුද්ගලෝකාශ වාරය නිමි.**

**අනුලෝමය නිමි.**

---

## ප්‍රත්‍යනීක පුද්ගල වාර රූපස්කන්ධ මූලය

අනුලෝම වාරය දේශනාකොට වදරා අනතුරුව ප්‍රතිලෝමය වදළ සේක. (පෙර සේ කියනු) ''යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජති තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජතීති. අරූපං උපපජ්ජතානං තෙසං – පෙ – සබ්බෙසං චවන්තානං තෙසං – පෙ – යස්ස වාපන – පෙ – අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං – පෙ – සබ්බෙසං චවන්තානං තෙසං – පෙ –''

අරූපං–අරූප භවෙ,–අරූප භූමියෙහි, උපපජ්ජන්තානං,–උපදමින් සිටින්නාවූ; තෙසං,–ඒ අරූපී සත්වයනට; රූපක්ඛන්ධො නුප්පජ්ජති,– රූපස්කන්ධය නොම උපදී; තෙසං, – ඒ අරූපී සත්හට; වෙදනාක්ඛන්ධො; – වේදනාස්කන්ධය; නොව නුප්පජ්ජති, උපදී, [''ද්වීපටිසෙධො පකත්‍යත්ථො'' - යන පරිභාෂා සූත්‍රයට අනුව ප්‍රතිශේධ දෙකක් ඇති බැවින් උප්පජ්ජති යන ප්‍රකෘති පදයාගේ අර්ථය ඇත්තේ වේ. නොහොත් - නුප්පජ්ජති, – නොම උපදින්නේ යන්න නො, – නොවන්නේය; උප්පජ්ජති එව; උපදින්නේම වේ යනු අර්ථයි. [ප්‍රතිශේධ දෙකක් ඇති තැන ''එව'' ශබ්දයා සමඟ පියෙව් අරුත ලැබිය යුතුය යනු ව්‍යාකරණඥ නිගමනායයි. ප්‍රතිලෝමයෙහි ද නය සමානව යොදනු.]

අනුලෝමයෙහි අභිධෙය්‍යාර්ථ නම අරූප ප්‍රතිසන්ධි (4) සතරය, චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ අරූප භූමියෙහි උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට ඵලස්ථ (3) තිදෙනාය, යන මොවුහු ලැබෙති.

චුති සිත් (49) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අවසාන කර්මජ කලාපයෝය, ජීවිත නවක කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ චුතවෙමින් සිටින සියලුම පෘථග්ජනයන් (4) සතර දෙනාද, ඵලස්ථයන් (4) සතර දෙනා ද ලැබෙති. සංසය පෙර සේ මැයි. ප්‍රතිලෝමයෙහි අභිධෙය්‍යාර්ථ වශයෙන් ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගීවූ අසඤ්ඤ සත්ත්වයෙහි උපදිමින් සිටින්නාවූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ලැබෙයි. චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප,

ජීවිත නවක කලාප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ චුතවෙමින් සිටින්නාවූ සියලු පෘථග්ජනයන් (4) සතර දෙනාද එලස්ථයන් (4) සතර දෙනාද ලැබෙති. සංසය පෙරසේ මැයි.

''යස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජති තස්ස සඤ්ඤක්ඛන්ධො නුප්පජ්ජතීති ආමන්තා; යස්සවා පන – පෙ – ආමන්තා,''

අනුලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙයයාර්ථ චුති සිත් (19) එකුන්විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප ජීවිත නවක රූප කලාප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ චුතවෙමින් සිටින සියලු පෘථග්ජන (4) සතර දෙනාද ඵලස්ථයන් (4) සතර දෙනාද, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගීවූ අසඤ්ඤසත්ත්ව භූමියෙහි උපදිමින් සිටින්නාවූ සුගති අහේතුක පෘථග්ජනයාද ලැබෙති. සංසයද එසේමය. ප්‍රතිලෝමයෙහිද එසේම ලැබෙති.

**පුද්ගල වාරය නිමි.**

---

# ඕකාස වාරය

ඕකාස වාරයෙහි ''යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජති. තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජතීති, උප්පජ්ජති. යත්ථ වා පන – පෙ – උප්පජ්ජති;

අනුලෝම සන්නිට්ඨාන අභිධෙයය, නාමස්කන්ධ සතර පමණක්ම උපදනාවූ අරූපභූමි (4) සතර ලැබෙති. ඒ අරූප භූමි සතරෙහි රූපස්කන්ධයාගේ පහළ-වීමක් නොමැත. වේදනාස්කන්ධය පහළ වන බැවින් ''තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජති'' යන සංසය පදයාගේ අභිධෙයයාර්ථයක් නොලැබේ.

එසේ සන්නිට්ඨාන පදයාගේම අභිධෙයය ලැබී සංසය පදයාගේ අභිධෙයය නොලැබෙන බැවින්, යම් භූමියක රූපස්කන්ධය නූපදී. ඒ රූපස්කන්ධය නූපදන භූමියෙහි වේදනාස්කන්ධයත් නූපදනේ දැයි සර්වඥයන් වහන්සේට විමතියක් නැත්තේය. එහෙත් වෛනෙයයාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න නංවා සිටු වැදෑරුම් ප්‍රශ්නයන් අතුරෙන් පූර්ව කොට්ඨාශය අනුව පූර්ව ප්‍රශ්නයාගේ වශයෙන් සන්නිට්ඨාන පදය ඇසුරු කොට නුප්පජ්ජති යන ප්‍රශ්න පාඨයේ ''න'' අකුර ලොප් කොට, අනුලෝම පාලියෙහි උප්පජ්ජති යන විස්සර්ජනාවෙන් පිළිතුරු සපයන ලදී.

ප්‍රතිලෝම සන්නිට්ඨානයෙහි රූපස්කන්ධය පමණක්ම උපදනාවූ අසඤ්ඤ-සත්ත්ව භූමිය ලැබේ. (කොටස් බෙද දක්වනු;)

වේදනාස්කන්ධ මූලයෙහි – ආමන්තා යනු පිළිතුරය, අභිධෙයය අසඤ්ඤ සත්ත්ව භූමිය ලැබේ.

**ඕකාශ වාරය නිමි**

## පුද්ගලෝකාස වාරය

"යස්ස යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජතීති, අරූපං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සබ්බෙසං චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සබ්බෙසං චවන්තානං තෙසං තත්ථ."

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (30) සමතිසය, මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අරූප භූමියෙහි උපදිමින් සිටින්නාවූ ත්‍රිහෙතුක පෘථග්ජනයාගේද සට ඵලස්ථ (3) තිදෙනාගේද අරූප භූමි (4) සතර ලැබෙති. චුතිසිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්ම්ජ රූපයෝය. ජීවිත නවක කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ චුතවෙමින් සිටින සියලුම පෘථග්ජන (4) සතර දෙනාගේද ඵලස්ථ සතර දෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ලැබෙති, සංසය පෙරසේමය.

ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, ප්‍රථම ජීවිත නවක කලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ සත්ව භූමියෙහි උපදිමින් සිටින්නාවූ සුගති අහේතුක පෘථග්ජනයාගේ අසංඥ සත්ව භූමිය ලැබේ. පෙර සංසය ද ලැබේ.

"යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජති. තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො නුප්පජ්ජතීති. ආමන්තා, යස්ස වා පන යත්ථ ආමන්තා;"

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, චුති සිත් (19) එකුන්විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්ම්ජ රූප, ජීවිත නවක කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ චුත වෙමින් සිටින සියලුම පෘථග්ජන (4) සිවුදෙනාගේද, ඵලස්ථ පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද චතුවෝකාර භූමි සතර හා පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද අසංඥ සත්ව භූමියෙහි ප්‍රථම ජීවිත නවක කලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ සත්වයෙහි උපදිමින් සිටින්නාවූ සුගති අහේතුක පුද්ගලයාගේ අසංඥ සත්ව භූමිය ලැබේ. සංසය පෙර සේ මැයි, ප්‍රතිලෝමයද එසේමය.

**වර්තමාන වාරය නිමි.**

---

## අතීත වාරය

වර්තමාන වාරය දේශනා කොට වදරා අනතුරුව අතීත වාරය වදළ සේක. (පෙර සේ බෙදු කියනු.) "යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජිත්ථ, තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජිත්ථාති ආමන්තා යස්සවා පන – ආමන්තා,"

අනුලෝම සන්නිට්ඨානයෙහි අභිධෙය්‍යාර් උපදින්නාවූ ද චුතවන්නාවූ ද සියලුම පෘථග්ජන සතර දෙනා ද ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් සතර දෙනා ද ගනු ලැබෙති. සංසයද එසේමය. ප්‍රතිලෝමය ද එසේමය, වෙදනාස්කන්ධ මූලයට සමානය.

**පුද්ගල වාරය නිමි.**

ඕකාස වාරය ද වර්තමාන වාරයට සමානය.

## පුද්ගල ඔකාස වාරය

''යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජිත්ථාති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, අරූපානං තෙසං තත්ථ.''

අසඤ්ඤසත්තානං; - අසංඥසත්ව භූමියෙහි උපදින්නා වූ, තෙසං; - ඒ අසංඥ සත්වයන්ට; පඤ්චවෝකාරානං; - පඤ්චවෝකාර භූමියෙහි උපදින්නා වූ; තෙසං, ඒ පඤ්චවෝකාර සත්ත්වයන්ට, යනු අර්ථයි.

අනුලෝම සන්නිට්ඨානයෙහි අභිධෙය්‍යාර්ථ, අසංඥතලයේ උපදිමින් සිටින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ව භූමිය ගනු ලැබේ.

පඤ්චවෝකාර භූමියෙහි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනාගේද ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේද සුද්ධාවාස භූමිය හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්සද ගනු ලැබෙති. සංසය ද එසේමය.

ප්‍රතිලෝම සන්නිට්ඨාන පදයේ අභිධෙය්‍යාර්ථ, අරූප භූමියෙහි උපදිමින් චුතවෙමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජනයාගේද ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේ ද අරූප භූමි (4) සතර සනු ලැබෙති. පඤ්චවෝකාර භූමි (21) එක් විස්සද ගනු ලැබෙති.

වේදනාස්කන්ධ මූලයෙහි ''ආමන්තා'' යන ප්‍රතිවචනය ලැබේ. සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ චතුවෝකාර - පඤ්චවෝකාර භූමින්හි උපදින්නාවූ ද චුතවන්නාවූද පෘථග්ජන (4) සතර දෙනාගේ හා ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ලැබෙති. සංසය ද එසේම ය.

(සුද්ධාවාස භූමි නොලැබෙති, අකනිට්ඨා භූමිය නොලැබෙන බව කියන ලදී. එනිසා සුද්ධාවාසය අතීත වාරයට නොගනු ලැබේ.)

**අනුලෝමය නිමි.**

---

## ප්‍රත්‍යනීක පුද්ගල වාරය

''යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජිත්ථ, තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථාති, නත්ථි, යස්ස වා පන - නත්ථි.''

යස්ස, - යම් පුද්ගලයකුට; රූපක්ඛන්ධො, - රූපස්කන්ධය තෙම; නුප්පජ්ජිත්ථ, - අතීතයෙහි නූපන්නේ වේද; - පෙ - නත්ථි, - රූපස්කන්ධය අතීතයෙහි නූපන් පුද්ගලයෙක් නොමැත.

අනුලෝම පුච්ඡාවෙහි – අතීත භවසංඛ්‍යායෙහි දී රූපස්කන්ධය නූපන්නා වූ පුද්ගලයෙක් නැත්තේය. රූපස්කන්ධය උපන්නා වූ ම පුද්ගලයන් ඇති බැවින් ''යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජිත්ථ'' – යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථයෙක් නො ලැබේ. එසේ සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථයෙක් නො ලැබෙන බැවින් ම ''තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථ'' යන සංසය පදයාගේද අභිධෙයාර්ථයෙක් නොමැත.

එසේ සන්නිට්ඨාන සංසය දෙපදයාගේම අභිධෙයාර්ථ නොමැති බැවින්, යම් පුද්ගලයෙකුට අතීතයෙහි රූපස්කන්ධ නූපන්නේ නම්, ඒ රූපස්කන්ධය නූපන්නාවූ පුද්ගලයාට වේදනාස්කන්ධයක් අතීතයේ නූපන්නේ දැයි සර්වඥයන් වහන්සේට විමතියෙක් නැත්තේ නමුත් වෙනෙය්‍ය පුද්ගලයන්ගේ අධ්‍යාශය වශයෙන් ප්‍රශ්න නංවා සිවු වැදෑරුම් ප්‍රශ්නයන් අතුරෙන් මෝඝ ප්‍රශ්න වශයෙන්ද පිළිතුරු පඤ්චකය අතුරෙන් ''නත්ථි'' යන ප්‍රතික්ෂෙප විසඳුමෙන් ද පිළිතුරු වදාරණ ලදී.

වේදනාස්කන්ධ මූලයෙහි ද නයක්‍රමය සමානය. ඔකාස වාරය ද වර්තමාන වාරයට සමානව කියනු.

පුද්ගල ඔකාස වාරයෙහි ''යස්ස යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජිත්ථ, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථාති, අරූපානං තෙසං තත්ථ, සුද්ධාවාසානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ – අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ''

අනුලෝම සන්නිට්ඨානයෙහි අභිධෙයාර්ථ – අරූප භූමියේ උපදින්නාවූද චුත වන්නාවූ ද ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් සතර දෙනාගේ ද අරූප භූමි (4) සතර ගනු ලැබෙති. සුද්ධාවාසයෙහි උපදින්නාවූද චුතවන්නාවූ ද අනාගාමි ඵලස්ථ අර්හත් ඵලස්ථ ආර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි පසද ගනු ලැබෙති. යථා ලාභ වශයෙන් එනාහි උපදින්නාවූ ද චුතවන්නාවූ ද අනාගාමි ඵලස්ථයාය, චුතවන්නාවූ අර්හත් ඵලස්ථයා දැයි බෙද කියනු.

ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ – අසංඥසත්වයෙහි උපදින්නාවූ ද චුතවන්නාවූ ද සුගති අහේතුක, පෘථග්ජනයන්ගේ අසංඥසත්ව භූමිය ගනු ලැබෙයි. සංසය පෙර සේම ලැබේ.

වේදනාස්කන්ධ මූලයෙහි – ආමන්තා – ප්‍රතිවචනය වේ. සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථ, සුද්ධාවාසයෙහි උපදින්නාවූ ද චුතවන්නාවූ ද අනාගාමි ඵලස්ථයන්ගේ සහ අර්හත් ඵලස්ථයන්ගේ ද සුද්ධාවාස භූමි (5) පසද අසංඥසත්වයෙහි උපදින චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසංඥසත්ව භූමිය ද ලැබේ.

**අතීත වාරය නිමි,**

---

## අනාගත පුද්ගල වාරය

''යස්ස රූපක්ඛන්ධො – උප්පජ්ජිස්සති, තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති, ආමන්තා; යස්සවාපන; – යෙ අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං; – ඉතරෙසං තෙසං;''

යෙ; – යම් පුද්ගල කෙනෙක්; අරූපං; – අරූප භවෙ; අරූප භූමියෙහි; නොහොත් අරූපං – අරූප භවං; – අරූප භූමියට; උපපජ්ජිත්වා; – උත්පත්ති වශයෙන් පැමිණ; පරිනිබ්බායිස්සන්ති; පිරි නිවෙන්නාහු ද; ඉතරෙසං; – අරූප භූමියෙහි ඉපද පිරිනිවෙන්නන් හැර සෙසු පුද්ගලයන්ට; යනු අර්ථයි.

අනුලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ; පඤ්චවෝකාර භූමියෙහි මතු උපදින්නාවූ ද චුතවන්නාවූ ද පෘථග්ජන පුද්ගලයන් 4 සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් 3 තිදෙනා ද; අසංඥසත්ව අරූප භූමියෙහි උපදින චුතවන සුගති අහේතුකයා සහ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාද යන මොවුහු ලැබෙති. සංසය ද එසේමය.

ප්‍රතිලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ කාමසුගති භූමි (7) සහෙහි සුභකිණ්හක දක්වා ඇති රූප භූමි (9) නවයෙහිදී යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ මතු පිරිනිවෙන්නාවූ, පඤ්චවෝකාරයෙහි උපදින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා ද උපදින චුතවන යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද, අරූප භූමින්හි ඔබ් නොබ ඉපද පිරිනිවෙන්නාවූ අරූපතලයෙහි උපදින චුතවන යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාද ලැබෙති.

නැවත පඤ්චවෝකාර භූමියෙහි මතු උපදින්නාවූ ද චුතවන්නාවූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය අසංඥසත්ව – අරූප භූමියෙහි උපදින චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යන මොවුහු ද ලැබෙති. සංසය පෙරසේ මැයි.

[“වෙහප්ඵලෙ අකනිට්ඨෙ – භවග්ගෙ ච පතිට්ඨිතා
න පුනාඤ්ඤත්‍ර ජායන්ති – සබ්බෙ අරිය පුග්ගලා
බ්‍රහ්මලොකගතාහෙට්ඨා – අරියා නොප පජ්ජරෙ,”

වෙහප්ඵලෙ, – වේහප්ඵල භූමියෙහි ද, අකනිට්ඨෙ, – අකනිට්ඨා භූමියෙ ද, භවග්ගෙච පතිට්ඨිතා, – නෙවසංඥ නාසංඥ භූමියෙහි ද පිහිටියාවූ, සබ්බෙ අරිය පුග්ගලා, සියලු ආර්‍ය්‍ය පුද්ගලයෝ, පුන; – නැවත; අඤ්ඤත්‍ර; – අන් භූමියෙක න ජායන්ති; නොම උපදිත්; බ්‍රහ්මලොක ගතා, – මතු මතු බඹතල යන්ට ගියාවූ; අරියා, – ආර්‍ය්‍යයෝ; හෙට්ඨා; – යට යට භූමින්හි; නොපපජ්ජරෙ; – නොම උපදින්නාහ.

මේ ගාථාවට අනුව සුභකිණ්හකය දක්වා ඇති රූපාවචර භූමි (9) නවයෙහි යයි කියන ලදී. උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදිමින් චුතවෙමින් සිටින්නාවූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන කථාව වනාහි මෙසේ දත යුතුය. උපදිමින් සිටින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා ප්‍රවෘත්ති කාලයෙහි මාර්ග ලැබ ආර්‍ය්‍යභාවයට පත්වී ඉන් චුතව අරූප ප්‍රතිසන්ධිය ගන්නකු සඳහා කියන ලදී. චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයා නොගනු ලැබේ. කුමක් හෙයින් නොගනු ලැබේද යත්, අරූප භූමියෙහි ත්‍රිහේතුක පුද්ගලයා පරතොඝොෂ ප්‍රත්‍යය නොලබන බැවින් මාර්ගයට පැමිණීමට අසමත් වේ. අරූප භූමියෙහි මගපල ලැබූ ආර්‍ය්‍යයෝ භවය අවසන් කරන්නාහ. භවය අවසන් විමද රූපස්කන්ධය මතු නූපදීමට කරුණෙකි.]

''යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සති, තස්ස සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති, ආමන්තා. යස්ස වා පන ආමන්තා;''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙයාර්ථ, පශ්චිම භවිකයන් හැර උපදින - චුතවන සියලුම පෘථග්ජන (4) සතර දෙනාද යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාද ලැබෙති. සංසයද එසේමය, ප්‍රතිලෝමයද එසේය.

**පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි)**

---

## පුද්ගලෝකාස වාරය

''යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජිස්සති. තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, පඤ්චවොකාරානං තෙසං තත්ථ. යස්ස වා පන යත්ථ, අරූපානං තෙසං තත්ථ.''

අනුලොම අභිධෙයාර්ථ, අසංඥසත්ව භූමියෙහි මතු උපදින්නාවූ උපදිමින් සිටින්නාවූ අසංඥ සත්ව සුගති අහේතුක පුද්ගලයාගේ අසංඥ සත්ව භූමිය ලැබේ. තමන්ගේ උත්පාද ක්ෂණයෙහි, මතු නැවත උපදින්නාවූ, පඤ්චවෝකාරයෙහි උපදිමින් චුත වෙමින් සිටින්නාවූ පෘථග්ජන (4) සතර දෙනාය යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ සුද්ධාවාසය හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ලැබෙති. සංසයද එසේය.

### ප්‍රතිලෝම අභිධෙයාර්ථ

තමන් උපදනා භූමියෙහි නැවත උපදින්නාවූ අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාගේද යට ඵලස්ථයන් තිදෙනාගේද අරූප භූමි සතර ලැබෙති.

අනුලෝම සංසයද එසේමය:– ''යස්ස යත්ථ වෙදනක්ඛන්ධො උප්පජ්ජිස්සති තස්ස තත්ථ සඤ්ඤක්ඛන්ධො උප්පජ්ජිස්සතීති. ආමන්තා, – යස්ස වා පන යත්ථ ආමන්තා''

අනුලොම අභිධෙයාර්ථ, තමන් උපදනා භූමියෙහි මතු උපදින්නාවූ චතුවෝකාර පඤ්චවෝකාර භූමින්හි උපදිමින් චුතවෙමින් සිටින්නාවූ පෘථග්ජනයන් සතර දෙනාගේද, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් තුන් දෙනාගේද. අරූප භූමි සතර සහ සුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ලැබෙති. සංසයද එසේය – පටිලෝමයද එසේමයි.

**අනුලෝම නිමි.**

---

# ප්‍රත්‍යනීක පුද්ගල වාරය

"යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජිස්සති, තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති. යෙ අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති - පච්ඡිම භවිකානං තෙසං - යස්ස වා පන ආමන්තා" අනුලෝම අභිධෙය්‍යාර්ථයෝ කාම සුගති භූමි සතය, සුභකිණ්ණක භූමිය තෙක් ඇති නව භූමින්හි යට මාර්ගයන් ලැබ අරූප භූමියේ ඉපද පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාර භූමින්හි උපදින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය උපදින චුතවන යට ඵලස්ථයන් තිදෙනාය, අරූප භූමියෙහි මතු මත්තෙහි ඉපද පිරිනිවෙන්නා වූ අරූපයෙහි උපදින චුතවන යට ඵලස්ථ පුද්ගලයන් තිදෙනාය යන මොවුහු ලැබෙති.

පශ්චිම භවික චතුවෝකාර පඤ්චවෝකාර භූමින්හි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාද යට ඵලස්ථ පුද්ගලයන් තිදෙනාද චුතවන්නා වූ රහතන් වහන්සේද ලැබෙති. සංසයද පෙර සේ මය. ප්‍රතිලෝමයද එසේ මැයි.

"යස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සති, තස්ස සඤ්ඤක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති ආමන්තා, යස්ස වා පන, ආමන්තා" අනුලොම අභිධෙය්‍යාර්ථ පෙර කියන ලද සංසයට සමානය.

ඔකාස වාරයද සුගමයි.

## පුද්ගලොකාස වාරය

"යස්ස යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජිස්සති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති, අරූපානං තෙසං තත්ථ, පච්ඡිම භවිකානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" අනුලෝම අභිධෙය්‍යාර්ථ තමන් උපදනා භූමියෙහි මතු නැවත උපදින්නා වූ, අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යට ඵලස්ථ ආයඬ් පුද්ගලයන් තිදෙනාය, යන මොවුන්ගේ අරූප භූමි සතර ලැබෙති. පශ්චිම භවික චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට ඵලස්ථ පුද්ගලයන් තිදෙනාය චුතවන රහතන් වහන්සේය. යන මොවුන්ගේ චතුවෝකාර භූමි සතරය අපාය භූමිය හැර පඤ්චවෝකාර භූමි විසිදෙකද, තමන් උපදනා භූමියෙහි අනාගතයෙහි උපදින්නා වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් සසර දෙනාය යට ඵලස්ථයන් තිදෙනාය යන මොවුන්ගේ චතුවොකාර භූමි සතරද, අකනිඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සද අසංඥසත්ව භූමියෙහි අනාගතයෙහි උපදින්නා වූ, උපදින චුතවන අසඤ්ඤ සත්ත සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසංඥසත්ව භවයද ලැබෙති. සංසය වනාහි පෙර සේ මැයි.

ප්‍රතිලොම අභිධෙය්‍යාර්ථ, අසංඥසත්ව භූමියෙහි අනාගතයෙහි උපදින්නා වූ, උපදින චුතවන අසංඥ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසඤ්ඤ භූමිය ලැබෙ. සංසය පෙර සේ කියා බෙදනු, සංසයද සමාන මැයි; [අනුලෝමයෙහි අසඤ්ඤ සත්තානං යන්න මතු උපදින්නා වූ අසඤ්ඤසත්වයා මැයි, අසඤ්ඤ

සත්වයෙහි නූපදින්නා වූ පුද්ගලයා පශ්චිම භවිකානං යන ස්වරූපයෙහි ඇතුලත් කරනු. පඤ්චවොකාරානං යන්නෙහි ද තමන්ගේ භූමියෙහි උපදින්නා වූ පඤ්චවොකාර පුද්ගලයා වේ. මතු නූපදින්නා වූ පඤ්චවොකාර පුද්ගලයා පශ්චිම භවිකානං යන ස්වරූපයෙහි ඇතුලත්කොට කියනු. අකනිඨා භූමියෙහි විශේෂයක් නොමැත. ඒකාන්ත පශ්චිම භවික මැයි, මේ වචනය තේරුම් ගත යුතුයි. අකනිඨාවෙහි උපදනා වූ අනාගාමි පුද්ගලයා තමන්ගේ භූමියෙහි ද මතු නූපදියි. අන් භූමියකට ද නොයයි. අකනිඨා භූමියෙහිම අර්හත්වයට පැමිණ පිරිනිවෙන්නේය. එහෙයින් ඒකාන්තයෙන් පශ්චිම භවිකයෙකි.

වෙහප්ඵලෙ අකනිට්ඨෙ; යනාදි ගාථාවද යට දක්වන ලද්දේ වෙයි. මෙ භූමි තුන වනාහි භූමි ශීර්ෂයෝය. මෙ තුන් භූමියෙහි උපදනා ආර්‍යයෝ අන් භූමියක නූපදනාහ. ඒ භූමි තුන අතුරෙන් අකනිඨාවෙහි ආර්‍යයෝම වෙති. පෘථග්ජනයෝ නොමැත්තාහ. ඒ ආර්‍යයෝ ද නැවත පටිසන්ධි නොගන්නාහ. අන් භූමියක ද නූපදනාහ. එහෙයින් ඒකාන්ත පශ්චිම භවිකයෝය. වෙනසෙක් නැත. වෙහෙප්ඵල, නෙවසඤ්ඤානාසඤ්ඤ යන භූමින්හි වනාහි ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා තමන්ගේ භූමියෙහි ද නැවත උපදනේය. අන් භූමියක ද උපදනේය. එ හෙයින් අනේකාන්තය.]

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සති, තස්ස තත්ථ සඤ්ඤක්ඛන්ධො නුප්පජ්ජිස්සතිති, ආමන්තා; සස්ස වා පන යත්ථ, ආමන්තා.''

අනුලෝම අභිධෙයාර්ථ, පශ්චිම භවික චතුවොකාර පඤ්චවොකාර භූමින්හි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාය. යට එලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන්නා වූ රහතන් වහන්සේය යන මේ අයගේ චතුවොකාර භූමි සතර ද, අපාය භූමි වර්ජිත පඤ්චවොකාර භූමි (22) දෙවිස්ස ද, තමතමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ චතුවොකාර පඤ්චවොකාර භූමින්හි උපදින - චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ සහ යට එලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ද, චතුවොකාර භූමි (4) සතර සහ අකනිට්ඨාව හැර පඤ්චවොකාර භූමි (25) පස් විස්ස ද ලැබෙති. මේ අනේකාන්ත විධියයි. අසංඥ සත්වයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ සත්වය ලැබේ. සංසය ද එසේය· ප්‍රතිලෝමයද සමානය.

**අනාගත වාරය නිමි.**

---

## වර්තමානාතීත පුද්ගල වාරය

අනාගත වාරය දේශනා කොට වදරා අනතුරුව වර්තමානාතීත වාරය වදළ සේක. (පෙර සේ බෙද කියනු) ''යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජිත්ථාති, ආමන්තා; යස්ස වා පන, සබ්බෙසං චවන්තානං අරූපං උපපජ්ජන්තානං තෙසං, පඤ්චවොකාරං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං.''

ප්‍රතිලෝම අභිධෙයාර්‍ථ, චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කම්ජ රූප, ජීවිත නවක රූප කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ චුතවන සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනාය, ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සතර දෙනාය, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (30) සමතිසය, යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ලැබෙති.

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, කම්ජ කලාප 3 – 7 – 4 බැගින් වූ මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටිනා වූ පෘථග්ජන (4) සිවු දෙනාය. යට ඵලස්ථයන් (3) තිදෙනාය, ප්‍රථම ජීවිත නවක කලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ සත්වයෙහි උපදිමින් සිටින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය යන මොවුහු ලැබෙති, සංසය ද එසේම ය.

යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජිත්ථාති; ආමන්තා යස්ස වා පන, – සබ්බෙසං චවන්තානං, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං, චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං," ප්‍රතිලෝම අභිධෙයාර්‍ථ, චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කම්ජ රූප, ජීවිත නවක කලාප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ චුතවන සියලු පෘථග්ජන (4) සතර දෙනාය, ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය. අසංඥ සත්වයෙහි උපදින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය. යන මොවුහු ලැබෙති. ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිසය, කම්ජ කලාප 3 – 7 – 4 – බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන (4) සිවු දෙනාය යට ඵලස්ථ (3) ආයර්‍යයන් තිදෙනාය යන මොවුහු ද ලැබෙති. සංසය පෙර සේමය;

**පුද්ගල වාරය නිමි. (ඔකාශ වාරය පහසුය)**

---

## පුද්ගලෝකාශ වාරය

"යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජිත්ථාති, සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤ සත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ; – ඉතරෙසං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ; යස්ස වා පන යත්ථ පඤ්චවොකාරා චවන්තානං අරූපානං තෙසං තත්ථ."

සුද්ධාවාසං – සුද්ධාවාස භවෙ – සුද්ධාවාස භූමියෙහි, උපපජ්ජන්තානං; – උපදින්නවුන්ට ද; අසඤ්ඤසත්තං – අසඤ්ඤසත්තභවෙ අසඤ්ඤසත්ත භූමියෙහි උපපජ්ජන්තානං, – උපදින්නවුන්ට ද, ඉතරෙසං, – සුද්ධාවාසයෙහි උපදින්නවුන් හැර, පඤ්චවොකාරං – පඤ්චවොකාරභවෙ, පඤ්චවෝකාර භූමියෙහි; උපපජ්ජන්තානං; – උපදින්නවුන්ට, යනු අර්‍ථය.

ප්‍රතිලෝමයෙහි. පඤ්චවොකාරා;- පඤ්චවෝකාර භවයෙන්, - චවන්තානං;- චුතවෙමින් සිටින්නාවූ පුද්ගලයන්ට ද; අරූපානං; - අරූපීනට ද.

අනුලෝම සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්, රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිතය, චෛතසික (30) සමතිසය, කර්මජ කලාප (4) සතර බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ ශුද්ධාවාසයෙහි උපදිමින් සිටින අනාගාමි ඵලස්ථ පුද්ගලයනට ලැබෙන ශුද්ධාවාස භූමි (5) පසය ප්‍රථම ජීවිත නවක කලාපයාගේ උත්පාදක්ෂණ සමංගිවූ අසඤ්ඤ සත්වයෙහි උපදිමින් සිටින සුගති අහේතුක පෘථග්ජනයාට ලැබෙන අසංඥ සත්ව භූමියද ලැබෙති. පඤ්ච වෝකාර ප්‍රතිසන්ධි (15) පසළොස ද චෛතසික (35) පන්තිස ද කර්මජ කලාප 3 – 7 – 4 – බැගින් ද යන මෙ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ පඤ්චවෝ-කාරයෙහි උපදිමින් සිටින්නාවූ පෘථග්ජන (4) සිවු දෙනාය යට ඵලස්ථ ආය්‍ර්‍යයන් (3) තිදෙනාය, යන මොවුනට අයත් වූ සුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ලැබෙති. සංසය පෙර සේ උදුරනු.

ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, පඤ්චවෝකාර චුති (15) පසළොස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප කලාප, මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ පඤ්චවෝකාරයෙන් චුතවෙමින් සිටින්නාවූ පෘථග්ජන (4) සිවුදෙනා-ගේ ද ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද සුද්ධාවාස භූමි හැර පඤ්ච වෝකාර භූමි (21) එක්විස්ස ලැබෙති. උපදිමින් චුතවෙමින් සිටින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයාගේ ද ඵලස්ථ ආය්‍ර්‍යයන් (4) සිවු දෙනාගේ ද අරූප භූමි සතර ලැබෙති. පෙර සේ සංසය ලැබේ.

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජිත්ථාති, සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, චතුවෝකාරා පඤ්චවොකාරා චවන්තානං – පෙ –''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිතය. චෛතසික (30) සමතිසය. කර්මජ කලාප (4) සතර බැගින්ය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ සුද්ධාවාසයෙහි උපදිමින් සිටින අනාගාමි ආය්‍ර්‍ය පුද්ගලයාගේ සුද්ධාවාස භූමි (5) පස ලැබෙති, ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප 3 – 7 – 4 බැගින්ය. යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ චතුවෝකාර පඤ්චවෝකාර භූමින්හි උපදමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ, යට ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද සුද්ධාවාස භූමිය හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ලැබෙති. සංසය පෙර සේ උදුරනු.

ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප කලාපය යන මොවුන් ගේ භංගක්ෂණ සමංගීවූ චතුවෝකාර පඤ්චවෝකාරයෙන් චුතවෙමින් සිටින්නාවූ පෘථග්ජනයින් (4) සිවුදෙනාගේ ද ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයින් (4) සිවු දෙනාගේ ද චතුවෝකාර භූමි හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ලැබෙති. සංසය පෙර සේම ලැබේ.

**අනුලෝම නිමි.**

---

# ප්‍රත්‍යනීක පුද්ගල වාරය

''යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථාති, උප්පජ්ජිත්ථ, යස්ස වා පන, නත්ථි;''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ, චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප ජීවිත නවක රූප කලාප, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ චුතවන සියලු පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ඵලස්ථ ආයෂ් පුද්ගලයන් (4) සිවුදෙනාය, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ අරූප භවයෙහි උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාද යට ඵලස්ථ ආයෂ් පුද්ගලයන් (3) තිදෙනාද ලැබෙති.

ඒ අරූපි පුද්ගලයාට එනාහි රූපස්කන්ධය නූපදී අතීතයෙහි වේදනාස්කන්ධය ඉපදී ඇති බැවින් ''තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජත්ථ'' යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථයක් නැත්තේය. එසේ සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය ඇතිව සංසය පදයාගේ අභිධෙය්‍ය නොලැබෙන බැවින්, යම් පුද්ගලයකුට රූපස්කන්ධය නූපදිද, ඒ රූපස්කධය නූපදින පුද්ගලයාට අතීතයෙහි වේදනාස්කන්ධය නූපන්නේ දැයි සර්වඥ සන්තානයෙහි සැකයෙක් නැත්තේ නමුත් වෙනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා, ප්‍රශ්න වර්ග (4) සතර අතුරෙන් පූර්ව කොට්ඨාශයට සමානවූ පුරේ ප්‍රශ්න වශයෙන් සන්නිට්ඨාන පදයාගේ අර්ථය ඇසුරු කොට ''නුප්පජ්ජිත්ථ'' යන පුච්ඡා පාළියෙහි ''න'' අකුර අතහැර අනුලෝම පාළියෙහි මෙන් පිළිතුරු (5) පස අතුරෙන් ''උප්පජ්ජිත්ථ'' යන පාලිගති විස්සර්ජනා-වෙන් පිළිතුරු වදරණ ලදී.

ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි අනවරාග්‍ර සංසාරයෙහිදී වේදනාස්කන්ධය නූපන්නාවූ පුද්ගලයෙක් නොමැත්තේය. උපන්නාවූම පුද්ගලයෝ ඇත්තාහ. එහෙයින් ''යස්ස වා පන වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථ'' යන සන්නිට්ඨාන පදයාගේ අර්ථයෙක් නැත්තේය. එහෙයින් ''නත්ථි'' යන ප්‍රතික්ෂෙප විස්සර්ජනයෙන් පිළිතුරු වදරණ ලද්දේය.

''යස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස සඤ්ඤක්ඛන්ධො නුප්පජ්ජි-ත්ථාති, උප්පජ්ජිත්ථ, ''යස්ස වා පන නත්ථි''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ, චුති සිත් (19) එකුන් විස්ස, චෛසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ චුත වෙමින් සිටිනා සියලු පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාද ඵලස්ථ ආයෂ් පුද්ගලයන් (4) සිවුදෙනාද, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගිවූ අසංඥ සත්වයෙහි උපදිමින් සිටින්නාවූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාද ලැබෙ. ඒ අසංඥ සත්වයෙහි උපදින පුද්ගලයාට වේදනාස්කන්ධය නූපදින නමුත් අතීත භවයෙහි සංඥස්කන්ධ ඉපදී ඇත, එහෙයින් ''තස්ස සඤ්ඤක්ඛන්ධො නුප්පජ්ජිත්ථ'' යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථයක් නැත්තේය. (ඉහත රූපස්කන්ධය මෙන් බෙද කියනු.) ඔකාස වාරය සුගමයි.

10

''යස්ස යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථාති පඤ්චවොකාරා චවන්තානං අරූපානං තෙසං තත්ථ, සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ, පඤ්චවෝකාර චුති සිත් (15) පසළොස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්‍ම රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ පඤ්චවෝකාරයෙන් චුත වෙමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්සද අරූප භූමියෙහි උපදිමින් චුතවෙමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ ද ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද අරූප භූමි (4) සතර ලැබෙති. රූපාවචර පඤ්චමධ්‍යාන චුති සිතය, චෛතසික (30) සමතිසය, අන්තිම කර්‍මජ රූප කලාපය. යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ ශුද්ධාවාසයෙහි චුතවන – පිරිනිවෙන අනාගාමී රහත් උතුමන්ගේ ශුද්ධාවාස භූමි (5) පසද, අන්තිම ජීවිත නවක රූප කලාපයාගේ භංගක්ෂණ සමංගිවූ අසංඥසත්ත්වයෙන් චුතවන අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසංඥසත්ත්ව භූමියද ලැබේ. සංසය පෙර සේ මැයි. ප්‍රතිලෝමය බෙද කියනු.

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො නුප්පජ්ජිත්ථාති, චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං තෙසං තත්ථ, සුද්ධා–වාසෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''

[අනුලෝම අභිධෙය්‍යාර්ථ, අනුලෝමය ප්‍රත්‍යනිකයෙහි ප්‍රතිලෝම වශයෙන්ද ප්‍රතිලෝමය අනුලෝම වශයෙන් මාරු කොට අභිධෙය්‍ය උදුරනු. සංසයෙහි ද සුද්ධාවාසයෙන් පිරිනිවෙන්නහු කියනු. අසඤ්ඤසත්තානං. යන්හෙි උපදින චුතවන සියලු දෙනා ගතයුතු, ශුද්ධාවාසයෙහි අනාගාමී ඵලස්ථයා හා පිරිනිවෙන රහතන් වහන්සේ අනේකාන්තව ගත යුතු.]

වර්‍තමානාතීත වාරය නිමි.

---

වර්‍තමානාතීත වාරය දේශනා කොට වදරා අනතුරුව වර්‍තමානානාගත වාරය වදාළ සේක. (පෙර සේ බෙද කියනු.)

''යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති, පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උප්පජ්ජන්තානං තෙසං, ඉතරෙසං පඤ්ච–වොකාරං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන, සබ්බෙසං චවන්තානං අරූපං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ, පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්ධි (9) නවයය, චෛතසික (35) පන්තිසය, කර්‍මජ කලාප 3 – 7 – 4 බැගින් යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී නමවූ පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි

උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා සහ යට ඵලස්ථ පුද්ගලයන් (3) තිදෙනාද ලැබෙති. පශ්චිම භවිකයා හැර පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් 15 චෛතසික 35 කර්මජ කලාප 3 – 7 – 4 බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින්නාවූ පෘථග්ජන (4) සිවු දෙනාද යට ඵලස්ථ (3) තිදෙනාද, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගිවූ අසඤ්ඤසත්තයෙහි උපදිමින් සිටින සුගති අහේතුක පෘථග්ජනයාද ලැබෙති සංසය පෙර සේ මැයි.

ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, චුති සිත් (19) එකුන් විස්ස චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප, ජීවිත නවක රූප කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ චුතවන සියලු පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාද යට ඵලස්ථ පුද්ගලයන් (3) තිදෙනා පශ්චිම භවිකයා හැර, අරූප ප්‍රතිසන්ධි (4) සතරය, චෛතසියක (30) සමතිසය, මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ අරූපයෙහි උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා යට ඵලස්ථ (3) තිදෙනා ලැබෙති. අනුලෝම සංසයද එසේමය.

"යස්ස වෙදනාක්ඛන්ධො උපපජ්ජති, තස්ස සඤ්ඤාක්ඛන්ධො උපපජ්ජිස්සතීති, පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං තෙසං ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන, සබ්බෙසං චවන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං, පච්ඡිම භවිකානං."

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප 3 – 7 – 4 බැගින් යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ චතුවෝකාර පඤ්චවෝකාර භවයන්හි පශ්චිම භවිකව උපදින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ලැබෙති. පශ්චිම භවිකයා හැර, ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය; කර්මජ රූප කලාප 3 – 7 – 4 බැගින් වූ චතුවෝකාර පඤ්චවෝකාර භවයන්හි උපදිමින් සිටියාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාද යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාද ලැබෙති. සංසය පෙර සේ මැයි.

ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප කලාප, ජීවිත නවක රූප කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ සියලුම චුත වෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාද, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාද, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගිවූ අසඤ්ඤ සත්වයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාද ලැබෙති අනුලෝම සංසයද එසේමය. (ඕකාශ වාරය සුගමයි.)

**පුද්ගල වාරය නිමි.**

---

# පුද්ගලෝකාශ වාරය

''යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති, පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පඤ්චවොකාරා චවන්තානං, අරූපානං''

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්ධි (9) නවය, චෛතසික (35) පන්තිස, කර්මජ රූප කලාප 3 – 7 – 4 බැගින් වූ මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි වූ පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ ද, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ ද අපාය භූමි හැර පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ලැබෙති, ඒකාන්ත වශයෙනි, අනේකාන්ත වශයෙන් වනාහි, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසලොස, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප 3 – 7 – 4 බැගින් මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි වූ පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද ට ඵලස්ථයන් (3) තිදෙනාගේ ද, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ලැබෙති.

ප්‍රථම ජීවිත නවක කලාපයාගේ උත්පාදක්ෂණ සමංගි වූ අසංඥ සත්වයෙහි උපදිමින් සිටින්නාවූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසඤ්ඤ භවය ලැබේ.

තම තමන් ඉපදී සිටින භූමියෙහි මතු උපදින්නාවූ, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසලොස, චෛතසික (35) පන්තිස, කර්මජ රූප කලාප 3 – 7 – 4 බැගින් වූ මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි වූ පඤ්චවෝකාර භූමියෙහි උපදිමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද යට ඵලස්ථයන් (3) තිදෙනාගේ ද සුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ලැබෙති. සංසය ද එසේය.

ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්, තමන් ඉපදී සිටින භූමියෙහි මතු උපදින්නාවූ, පඤ්චවෝකාර චුති සිත් (15) පසලොස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගි වූ පඤ්චවෝකාරයෙහි චුතවෙමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ ද ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද, තමා ඉපද සිටින භූමියෙහි මතු උපදින්නාවූ අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ ද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ ද අරූප භූමි (4) සතර ලැබෙති. අනුලෝම සංසය ද එසේමය.

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජති තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති,. පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං''

අනුලෝම සන්නිවයාන අභිධෙයාර්ථ, ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප 3 – 7 – 4 බැගින්ය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ පශ්චිම භවිකව චතුවෝකාර භූමියෙහි උපදිමින් සිටින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය භූමි හැර පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ලැබෙති. (මෙ ඒකාන්ත වශයෙනි.)

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසළොස, චෛතසික (35) පන්තිස, කර්මජ රූප කලාප 3 – 7 – 4 බැගින් යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ පශ්චිම භවිකව චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදිමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේද චතුවෝකාර භූමි (4) සතරද, අකනිට්ඨ හැර පඤ්චවෝකාර භූමි (35) පස් විස්සද ලැබෙති. (මෙ අනෛකාන්ත වශයෙනි.)

තමන් ඉපදී සිටින්නාවූ භූමියෙහි නැවත උපදින්නාවූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන්විස්ස, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප 3–7–4 බැගින් වූ මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි වූ චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදිමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්සද ලැබෙති. මෙ වනාහි ඉතරෙසං – යන්නෙහි අභිධෙයාර්ථය. සංසයද එසේමය.

ප්‍රතිලෝම සන්නිවයාන අභිධෙයාර්ථ, තමන් ඉපදී සිටින භූමියෙහි නැවත උපදින්නාවූ චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ චතුවෝකාර පඤ්චවෝකාරයෙන් චුත වන්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, යන අයගේ චතුවෝකාර භූමි (4) සතරය, ශුද්ධාවාස භූමි හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ලැබෙති. අනුලෝම සංසයද ලැබෙ.

**අනුලෝමය නිමි.**

---

## ප්‍රත්‍යනීක පුද්ගල වාරය

"යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති, සබ්බෙසං චවන්තානං අරූපං උපපජ්ජන්තානං තෙසං, පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිමභවිකානං තෙසං, යස්ස වා පන, පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං තෙසං"

අනුලෝම සන්නිවයාන අභිධෙයාර්ථ, අනුලෝමය ප්‍රතිලෝම සන්නිවයානය අනුව, චුතවන සියලු පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනාද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාද පශ්චිම භවිකයා හැර අරූප භූමියෙහි උපදින්නහුද ලැබෙති. විස්තර වශයෙන් කියනු.

පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති (9) නවය, චෛතසික (35) පන්තිස, අන්තිම කම්ජ රූප කලාප, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ රහතන් වහන්සේ ද, පශ්චිම භවිකව අරූප භූමියෙහි උපදින්නා වූ යට ඵලස්ථ ආයඞ්යන් (3) තිදෙනා ද, අරූපයෙහි පිරිනිවෙන රහතන් වහන්සේ ද ලැබෙති. සංසය පෙර සේ මැයි. ප්‍රතිලෝමය අනුලෝම අනුව උදුරනු.

''යස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජති තස්ස සඤ්ඤාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති, සබ්බෙසං චවන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං පරිනිබ්බන්තානං තෙසං, යස්ස වා පන, පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං''

අනුලෝම ප්‍රතිලෝම දෙක සන්නිට්ඨානයට අනුව ස්වරූප උදුරනු. ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය. චෛතසික (35) පන්තිසය. අන්තිම කම්ජ රූප කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ රහතන් වහන්සේ ද ලැබෙති. සංසය පෙර සේ මය.

ප්‍රතිලෝම සන්නිට්ඨානයෙහි වනාහි පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං, යනුවෙන් අභිධෙය්‍ය උදුරනු. පරිනිබ්බන්තානං යන්නෙහි අභිධෙය්‍යාර්ථ ද අනුලෝම අනුව උදුරනු.

**පුද්ගල වාරය නිමි.** (ඕකාශ වාරය පහසුය.)

---

## පුද්ගලෝකාශ වාරය

''යස්ස යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති; පඤ්චවොකාරා චවන්තානං අරූපානං තෙසං තත්ථ, පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං.''

අනුලෝම අභිධෙය්‍යාර්ථ, අනුලෝමය ප්‍රතිලෝමය අනුව කියනු පඤ්චවෝකාරයෙහි ත්‍රිහේතුක චුති සිත් (9) නවය, චෛතසික (35) පන්තිස අන්තිම කම්ජ රූප කලාපය, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ රහතන් වහන්සේගේ අපාය භූමි හැර පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ලැබෙති. මේ ඒකාන්ත වශයෙනි.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ පඤ්චවෝකාර චුති (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කම්ජ රූප කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි චුතවන්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද, යට පලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ ද අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ලැබෙති. මේ අනේකාන්ත වශයෙනි,

පශ්චිම භවිකව අරූප භූමියෙහි උපදින්නාවූ යට ඵලස්ථ ආයුෂ්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ද, එහිම පිරිනිවෙන්නාවූ රහතන් වහන්සේගේ ද අරූප භූමි (4) සතර ද, තමන් ඉපද සිටින්නාවූ භූමියෙහි නැවත නූපදින්නාවූ අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ ද යට ඵලස්ථ පුද්ගලයන් (3) තිදෙනාගේ ද අරූප භූමි (4) සතර ද ලැබෙති. මෙය ද අනේකාන්ත වශයෙනි.

අන්තිම ජීවිත නවක රූප කලාපයාගේ භංගක්ෂණ සමංගිවූ අසඤ්ඤ සත්වයෙන් චුතවන්නාවූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසඤ්ඤසත්ත භූමියද ලැබේ. සංසය ද එසේමය. ප්‍රතිලෝම අභිධෙය්‍යාර්ථ සියල්ල අනුලෝමයට අනුව කියනු. සංසය අභිධෙය්‍යාර්ථ ද අනුලෝමය අනුව උදුරනු.

"යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජති, තස්ස තත්ථ සඤ්ඤක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති, චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං තෙසං තත්ථ, පරිනිබ්බන්තානං අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං."

අනුලෝම අභිධෙය්‍යාර්ථ අනුලෝමය සන්නිට්ඨානයට අනුව උදුරනු. ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප කලාපය, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ රහතන් වහන්සේගේ අරූප භූමි (4) සතර හා අපාය භූමි හැර පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ලැබෙති. මේ ඒකාන්ත වශයෙනි.

තමන් ඉපද සිටින්නාවූ භූමියෙහි නැවත නූපදින්නාවූ චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප කලාපය, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගි නම්වූ චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙන් චුතවන්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද, යට ඵලස්ථ පුද්ගලයන් (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතර ද, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ද ලැබෙති. මේ අනේකාන්ත වශයෙනි.

අසඤ්ඤ සත්වයෙහි උපදින-චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසඤ්ඤසත්ත භූමිය ද ලැබේ. ප්‍රතිලෝමය බෙද කියනු.

වත්මාන අනාගත වාරය නිමි.

---

වත්මානානාගත වාරයට අනතුරුව අතීතානාගත වාරය වදාළ සේක. (පෙර සේ කියනු) "යස්ස රූපක්ඛන්ධො උපපජ්ජිත්ථ තස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති, පච්ඡිමභවිකානං තෙසං, ඉතරෙසං තෙසං; යස්ස වා පන, ආමන්තා,"

අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ, පශ්චිම භවිකව චතුවෝකාර පඤ්චවොකාරයන්හි උපදින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා යට ඵලස්ථ ආයුෂ්‍ය පුද්ගලයන් (3) තිදෙනා පිරිනිවෙන්නාවූ රහතන් වහන්සේ ලැබෙති. පශ්චිම භවිකයා හැර සියලු උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා ද යට ඵලස්ථ ආයුෂ්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ලැබෙති. සංසය පෙර සේ මය. වෙදනාස්කන්ධ මූලය ද රූපස්කන්ධ මූලය මෙන් බෙද උදුරනු (ඕකාස වාරය සුගමයි.)

## පුග්ගලොකාස වාරය

''යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජිත්ථ තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සතීති. පඤ්චවොකාරෙ පච්ඡිම භවිකානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ අරූපානං''

අනුලෝම අභිධෙය්‍යාර්, පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට එලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනාය, පිරිනිවෙමින් සිටින රහතන් වහන්සේ ද යන මොවුන්ගේ කාම සුගති භූමි (7) සත හා වෙහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශය, තමන් ඉපදී සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ පඤ්චවෝකාරයෙහි උපදමින් චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද යට එලස්ථ ආයඞීයන් (3) තිදෙනාගේ ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස අසංඥ සත්වයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජනයාගේ අසංඥසත්ව භූමිය ලැබේ. තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ පඤ්චවෝකාරයෙහි උපදිමින් චුතවෙමින් සිටින්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද යට එලස්ථ ආයඞීයන් (3) තිදෙනාගේ ද සුද්ධාවාස භූමි හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ලැබෙති. සංසය ද පෙර සේ මය.

ප්‍රතිලෝම අභිධෙය්‍යාර්, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ අරූප භූමියෙහි උපදිමින් චුතවෙමින් සිටින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයාගේ ද යට එලස්ථ ආයඞීයන් (3) තිදෙනාගේ ද අරූප භූමි සතර ලැබෙති. අනුලෝම සංසය ද එසේම ලැබෙති.

'යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ සඤ්ඤක්ඛන්ධො උප්පජ්ජිස්සතීති. පච්ඡිම භවිකානං තෙසං තත්ථ ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, ආමන්තා.''

අනුලෝම අභිධෙය්‍යාර්, පශ්චිමභවිකව චතුවෝකාර පඤ්චවෝකාරයන්හි උපදිමින් සිටින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ ද යට එලස්ථ ආයඞීයන් (3) තිදෙනාගේ ද, පිරිනිවෙන රහතන් වහන්සේගේ ද, චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් ඇති රූපාවචර භූමි (10) දශය, ඒකාන්ත වශයෙන් ද, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ චතුවෝකාර පඤ්චවෝකාරයන්හි උපදිමින් චුතවෙමින් සිටින්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට එලස්ථ ආයඞීයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද, ශුද්ධාවාසය හැර ඉතිරි පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ලැබෙත්. මේ අනේකාන්ත වශයෙනි. ශුද්ධාවාසය අතීත–අනාගත දෙවාරයන්හි ඇතුලත් නොවන්නේය.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ චතුවෝකාර පඤ්චවෝකාරයන්හි උපදිමින් චුතවෙමින් සිටින්නා වූ පෘථග්ජන (4) සිවුදෙනාගේ සහ යට එලස්ථ ආයඞීයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද, ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ලැබෙති, සංසය පෙර සේ මැයි. ප්‍රතිලෝමය ද පෙර සංසය මෙනි.

**අනුලෝමය නිමි:**

## ප්‍රත්‍යනීක පුද්ගල වාරය

''යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජිත්ථ, තස්ස වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති, නත්ථි, යස්ස වා පන, උපපජ්ජිත්ථ,'' වේදනාස්කන්ධ මූලයට සමානය (ඔකාස වාරය සුගමයි,)

''යස්ස යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජිත්ථ, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති, අරූපානං තෙසං තත්ථ, සුද්ධාවාසානං අරූපෙ පච්ඡිම භවිකානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ පඤ්චවොකාරෙ පච්ඡිම භවිකානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''

අනුලෝම අභිධෙය්‍යාර්, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ අරූප භූමියෙහි උපදිමින් චුතවෙමින් සිටින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයාගේ සහ යට ඵලස්ථ ආයඝියන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ලැබෙති.

ශුද්ධාවාසයෙහි උපදින චුතවන අනාගාමි අර්හත් ඵලස්ථයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසද ලැබෙති, පශ්චිමභවිකව අරූප භූමියෙහි උපදින–චුතවෙන යට ඵලස්ථ ආයඝියන් (3) තිදෙනාගේ පිරිනිවෙන්නාවූ රහතන් වහන්සේගේ අරූප භූමි (4) සතර තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදිනා වූ අරූප භවයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ යට ඵලස්ථ ආයඝියන් (3) තිදෙනාගේ අරූප භූමි (4] සතරද ලැබෙති, ප්‍රතිලෝමයෙහි අනුලෝමයට අනුව ස්වරූප උදුරනු සංසයද පෙර සේය.

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථ, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො නුප්පජ්ජිස්සතීති; ආමන්තා, යස්ස වා පන යත්ථ, පච්ඡිම භවිකානං තෙසං තත්ථ, සුද්ධාවාසානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,''

අනුලොම අභිධෙය්‍යාර්, ශුද්ධාවාසයෙහි උපදින චුතවන අනාගාමි අර්හත් ඵලස්ථයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස, අසංඥ සත්වයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසංඥ සත්ත්ව භූමිය ලැබේ. ප්‍රතිලෝමය අනුලෝමයට අනුව උදුරනු.

**අතීතානාගත වාරය නිමි. – උත්පාද වාරය නිමි.**

---

## පවත්ති–නිරෝධ–වර්තමාන පුද්ගල වාරය

**උත්පාද** වාරය දේශනා කොට වදරා අනතුරුව නිරෝධ වාරය වදළ සේක, [බෙද කියනු]

''යස්ස රූපක්ඛන්ධො නිරුජ්ඣති, තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣතීති, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං, පඤ්චවොකාරා චවන්තානං තෙසං, යස්ස වා පන, අරූපා චවන්තානං තෙසං,''

11

අසඤ්ඤසත්තා – අසංඥසත්ත්ව භූමියෙන්, චවන්තානං, – චුතවෙමින් සිටින්නා වූ, තෙසං, – ඔවුනට; සෙස්ස සුගමයි.

අනුලොම අභිධෙය්‍යාර්, අන්තිම ජීවිතනවක රූප කලාපයාගේ භංගක්ෂණ සමංගී වූ අසඤ්ඤ තලයෙන් චුතවන්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ලැබේ. පඤ්චවෝකාර චුති සිත් (15) පසළොස චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙන් චුතවන්නා වූ පෘථග්ජන (4) සතර වදනා ද එලස්ථ ආයර්‍යයෝ (4) සතර දෙනා ද ලැබෙති, සංසය වනාහි පෙර සේ මැයි.

ප්‍රතිලෝමයෙහි, අරූප චුති සිත් (4) සතරය, චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ අරූතලයෙහි චුතවන්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයා ද එලස්ථ ආයර්‍යයෝ (4) සතර දෙනා ද ලැබෙති. අනුලෝම සංසය ද එසේය. ප්‍රත්‍යනික සංසය වනාහි ''සබ්බෙසං උපපජ්ජන්තානං'' කියනු.

ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස කර්මජ කලාප 3 – 7 – 4 බැගින් ඇති මොවුන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ උපදිමින් සිටින්නා වූ සියලු පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා ද, යට එලස්ථ ආයර්‍යයන් (3) තිදෙනා ද ලැබෙති. සන්නිට්ඨානයෙහි අනුලෝම ප්‍රතිලෝම සියල්ල ද කියනු.

''යස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣති, තස්ස සඤ්ඤක්ඛන්ධො නිරුජ්ඣතීති, ආමන්තා, යස්ස වා පන ආමන්තා,''

සන්නිට්ඨාන අභිධෙය්‍ය, චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්ච වෝකාරයෙන් චුත වන්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා ද එලස්ථ ආයර්‍යයෝ (4) සිවු දෙනා ද ලැබෙති. සංසය ද එසේමය,

ප්‍රත්‍යනිකයෙහි ''ආමන්තා'' අභිධෙය්‍යාර්, සියලු උපදමින් සිටින්නා වූ අසංඥ තලයෙන් චුතවන්නා වූ, යනාදී ස්වරූප උද්ධරනු, අවකාශ වාරය සුගමයි. පුද්ගලෝකාශ වාරයෙහි වනාහි පුද්ගල වාරයට වඩා විශේෂයක් නොමැත. සංසය පමණක් විශේෂයි. ප්‍රත්‍යනික අභිධෙය්‍යාර් ද යට කියන ලදී. වර්තමාන වාරය නිමියේය. අතීත වාරය වනාහි උත්පාද අතීත වාරය හා සමනය.

## අනාගත පුද්ගල වාරය

''යස්ස රූපක්ඛන්ධො නිරුජ්ඣිස්සති, තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන, පච්ඡිම භවිකානං අරූපං උපපජ්ජන්තානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, චවන්තානං තෙසං, ඉතරෙසං තෙසං.''

අරූපං–අරූප භවෙ,–අරූප භූමියෙහි; උපපජ්ජන්තානං,–ප්‍රතිසන්ධි ගන්නා වූ, පච්ඡිම භවිකානං, – පශ්චිම භවිකයන්ට ද, යෙ ච, – යම් පුද්ගල කෙනෙක්; අරූපං–අරූපභවෙ, – අරූප භූමියෙහි, උප්පජ්ජිත්වා; ඉපද; පරිනිබ්බායිස්සන්ති, – පිරිනිවෙන්නාහු ද; තෙසං, – ඔවුනට ද; – චවන්තානං, – චුතවෙමින් සිටින්නා වූ; තෙසං; – ඔවුනට ද; අර්යි.

ප්‍රතිලෝම අභිධෙය්‍යාර්, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය. චෛතසික (30) සමතිසය, මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පශ්චිමභවිකව අරූප භවයෙහි උපදිමින් සිටින්නා වූ යට එලස්ථ ආයතියන් වහන්සේලා (3) තිදෙනා ද, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හ බඹතලය තෙක් රූපාවචර භූමි (9) නවය යන මෙයින් - අරූප භූමියෙහි ඉපිද පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවෙමින් සිටින්නා වූ යට එලස්ථ ආයතියන් වහන්සේලා (3) තිදෙනා ද, අරූප භූමියෙහි ත්‍රිහේතුක පෘථග්ජනයා සෝවාන් මාර්ගය නොලබන බැවින් ඔහු නොගන්නා ලදි. මතු භවයන්හි රූපස්කන්ධය නිරුද්ධ වන බැවින් උපදිමින් සිටින්නා නොගන්නා ලදි. අරූප භූමි එකින් එක ඉහළට ඉපිද පිරිනිවෙන්නා වූ අරූප භවයෙහි ඉපදෙමින් චුතවෙමින් සිටින්නා වූ යට එලස්ථ ආයතියන් (3) තිදෙන ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි අනාගතයෙහි නිරුද්ධ වන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජනයන් (4) සිවු දෙනා ද යට එලස්ථ ආයතියන් (3) තිදෙනා ද, අසංඥසත්ව, අරූප භූමියෙහි උපදින චුතවෙන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ලැබෙති. [අනාගතයෙහි නිරුද්ධවන-උපදින යන මේ දෙකෙහි වෙනස, නිරුද්ධ වන්නා වූ යන්නෙහි පශ්චිම භවිකව උපදිමින් සිටින්නහු ගනු ලැබේ. උපදින්නා වූ යන්නෙහි එසේ නොගනු ලැබේ. මේ වනාහි මෙහි විශේෂයයි.]

"යස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සති, තස්ස සඤ්ඤාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන, ආමන්තා,"

අනුලෝම අභිධෙය්‍ය, පිරිනිවන් යන රහතන් වහන්සේ හැර සෙසු සියලු උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනා ද යට එලස්ථ ආයතියන් (3) තිදෙනා ද ලැබෙති. සංසය ද එසේය. (ඕකාස වාරය සුගමයි.)

"යස්ස යත්ථ රූපක්ඛන්ධො නිරුජ්ඣිස්සති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, අරූපානං තෙසං තත්ථ"

අනුලෝම අභිධෙය්‍යාර්, අසංඥ සත්ව භූමියෙහි මතු අනාගතයෙහි නිරුද්ධ වන්නා වූ අසඤ්ඤසත්තයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත භූමිය ලැබේ. තමන් ඉපදී සිටින භවයෙහි අනාගතයෙහි නිරුද්ධ වන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින - චුතවන සියලු පෘථග්ජන (4) සිවු දෙනාගේ ද යට එලස්ථ ආයති පුද්ගලයින් (3) තිදෙනාගේ ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ලැබෙති. [ශුද්ධාවාසයෙහි උපදිමින් සිටින්නා ද මතු නිරුද්ධ වන බැවින් පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති. සංසය පෙර සේමය]

ප්‍රතිලෝම අභිධෙය්‍ය තමන් ඉපද සිටින භූමියෙහි මතු නිරුද්ධ වන්නා වූ අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාගේ ද යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ ද අරූප භූමි (4) සතර ලැබෙති. අනුලෝම සංසය ද ලැබෙයි,

"යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සති, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති. ආමන්තා, යස්ස වා පන යත්ථ, ආමන්තා,"

"අනුලෝම අභිධෙය්‍යාර්, තමන් ඉපද සිටින භූමියෙහි මතු අනාගතයෙහි නිරුද්ධ වන්නා වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින - චුතවන පෘථග්ජනයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආයඹියන් (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතර පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ලැබෙති. සංසය ද එසේමය,

## ප්‍රත්‍යනීක සංසය ස්වරූප

පුද්ගල වාරයෙහි, පරිනිබ්බන්තානං - පිරිනිවෙන්නා වූ, ත්‍රිහේතුක චුති (1) තෙළෙස, චෛතසික (35) පන්තිස, - පෙ - චතුවෝකාර පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ අර්හත් ඵලස්ථ ආයඹියන් වහන්සේ ලැබෙති. පුද්ගලෝකාශ වාර, රූපස්කන්ධ මූලයෙහි, පරිනිබ්බන්තානං, - පිරිනිවෙන්නා වූ, ප්‍රත්‍යනීකය, ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය; - පෙ - චතුවෝකාර පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ අර්හත් ඵලස්ථයාගේ චතුවෝකාර භූමි (4) සතරය අපාය හැර පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස තමන් ඉපදී සිටින භූමියෙහි - පෙ - පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්ස, අසඤ්ඤසත්ත භූමිය ද ලැබෙති. (වේදනාස්කන්ධ මූලයෙහි පිරිනිවෙන්නා - ඒකාන්ත වශයෙනි. අසඤ්ඤසත්තය සහිත සෙසු සියල්ල අනේකාන්ත වශයෙනි.)

අනාගත වාරය නිමි.

---

## වර්තමානාතීත වාරය

"යස්ස රූපක්ඛන්ධො නිරුජ්ඣති තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිත්ථාති, ආමන්තා, යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං අරූපා චවන්තානං තෙසං පඤ්චවොකාරා චවන්තානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං,"

[උත්පාද වාරය සමඟ වැඩි විශේෂයක් නොමැත උපපජ්ජන්තයට චවන්තයද චවන්තයට උපපජ්ජන්තය ද පමණක් වෙනසි.]

ඕකාස වාරය පහසුය

## පුද්ගලෝකාස වාරය

"යස්ස යත්ථ රූපක්ඛන්ධො නිරුජ්ඣති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිත්ථාති, සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවෝකාරා චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පඤ්චවොකාරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ,"

අනුලෝම අභිධෙය්‍ය, රූපාවචර පඤ්චමධ්‍යාන චුති සිත් (1) එකය – පෙ ශුද්ධාවාසයෙහි පිරිනිවෙන්නාවූ අනාගාමී ඵලස්ථ, අර්හත් ඵලස්ථයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසය, (අනාගාමී චවන්ත පරිනිබ්බන්තයයි බෙදේ.) අන්තිම ජීවිත නවක කලාපයාගේ භංගක්ෂණ සමංගිවූ අසංඥ තලයෙන් චුත වන්නාවූ සුගති අහේතුක පෘථග්ජනයාගේ අසංඥභවය ලැබේ.

පඤ්චවෝකාර චුති සිත් (15) පසළොස, චෛතසික (35) පන්තිස – පෙ – පඤ්චවෝකාරයෙහි චුතවන්නාවූ පෘථග්ජන (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආයර්‍යයන් (3) තිදෙනාගේද ශුද්ධාවාසය හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්සද ලැබෙති, සංසය පෙර සේම බෙද කියනු.

ප්‍රතිලෝමයෙහි පඤ්චවෝකාරයෙහි උපදින පුද්ගලයාට ශුද්ධවාස හැර අභිධෙය්‍ය උදරනු අරූප භූමි සියල්ලද ඇතුලත් කරනු ප්‍රත්‍යනිකයෙහි ඉතිරි සුද්ධාසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං'' කියනු (පෙර සේ බෙදනු)

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣති, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො නිරුජ්ඣිත්ථාති, සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරා පඤ්චවොකාරා චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

අනුලොමයෙහි, ශුද්ධාවාසයෙහි පිරිනිවෙන්නා උදුරනු සෙස්සන්ගේ ස්වරූපයද ශුද්ධාවාසය හැර චතුවෝකාර පඤ්චවෝකාරයෙන් චුතවන පුද්ගලයාගේ භූමිය කියනු. ප්‍රතිලෝමයෙහි ශුද්ධාවාස භූමිය හැර චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින්නහු ගත යතුය. ප්‍රත්‍යනිකයෙහි අවසේස චනුයේ ''සුද්ධාවාසං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං'' යන්නය.

වර්තමානාතීත වාරය නිමි.

---

# වර්‍තමානානාගත පුද්ගල වාරය

''යස්ස රූපක්ඛන්ධො නිරුජ්ඣති, තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං තෙසං, ඉතරෙසං පඤ්චවොකාරා චවන්තානං, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං; යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං අරූපා චවන්තානං තෙසං,''

අනුලෝම අභිධෙය්‍ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති (9) නවය – පෙ – පඤ්චවෝකාරයෙහි පරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථයා ලැබේ. පිරිනිවෙන රහතන් වහන්සේ හැර පඤ්චවෝකාර චුති (15) පසළොස – පෙ – පඤ්චවෝකාරයෙහි චුතවෙන පෘථග්ජන (4) සිවුදෙන, යට ඵලස්ථ ආයර්‍යයන් (3) තිදෙන, අන්තිම ජීවිත නවක කර්මජ කලාප – පෙ – අසංඥ සත්ත්වයෙන් චුතවන්නාවූ සුගති අහේතුක පුද්ගලයාද ලැබේ. සංසයද පෙර සේමය.

ප්‍රතිලොම අභිධෙයා, උපදිමින් සිටින සියලුම පෘථග්ජන (4) සිවු දෙනාය, යට එලස්ථ ආයාීයන් (3) තිදෙනාය, අරූප භූමියෙන් චුත වන්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයා යට එලස්ථ වූ පුද්ගලයන් (3) තිදෙනා අරූපයෙන් චුතවන්නා වූ ත්‍රිහේතුක පෘථග්ජනයන් යට එලස්ථ පුද්ගලයන් (3) තිදෙනාය මොවුහු ලැබෙති. ප්‍රත්‍යනිකයෙහි අවශේෂ වනාහි'' අරූපෙ පරිනිබ්බන්තය කියනු.

''යස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣති තස්ස පඤ්ඤක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, පරිනිබ්බන්තානං තෙසං, ඉතරෙසං චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං තෙසං; යස්ස වා පන, සබ්බෙසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං''

අනුලෝම අභිධෙයා, ත්‍රිහේතුක චුති සිත් (1) තෙළෙස, – පෙ – චතුවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ රහතන් වහන්සේ ලැබෙති, පිරිනිවෙන්නා වූ රහතන් වහන්සේ හැර චුති සිත් (19) එකුන් විස්ස, –පෙ–චතුවෝකාර පඤ්චවෝකාරයෙන් චුතවන්නා වූ පුහුදුන් (4) සිවු දෙනා ද යට එලස්ථ (3) තිදෙනා ද ලැබෙති. සංසය පෙර සේ කියනු,

ප්‍රතිලොමයෙහි උපදිමින් සිටින සියලු පුද්ගලයෝ ද අසංඥ සත්ත්වයෙන් චුත වන්නා වූ පුද්ගලයෝ ද ලැබෙති. අනුලෝම සංසය ද එසේම ලැබේ. ප්‍රත්‍යනිකයෙහි සංසය ඉතිරි නැත පාලිගති විසඳුම ඇත. (ඕකාස වාරය සුගමය)

## පුද්ගලෝකාශ වාරය

''යස්ස යත්ථ රූපක්ඛන්ධො නිරුජ්ඣති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරා චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පඤ්චවොකාරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ.''

අනුලෝම අභිධෙයා; පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති සිත් (9) නවය, – පෙ – පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ රහතන් වහන්සේගේ අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපදී සිටින භූමියෙහි නැවත නිරුද්ධ නොවන්නා වූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය – පෙ – පඤ්චවෝකාරයෙහි චුතවන පුද්ගලයන්ගේ අකනිට්ඨ වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්ස ද අසංඥ සත්ත්වයෙන් චුතවන්නවුන්ගේ අසංඥ භූමිය ද ලැබේ.

තමන් ඉපද සිටින භවයෙහි නැවත නිරුද්ධ වන්නා වූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, – පෙ – පඤ්චවෝකාරයෙහි චුතවන – පෙ – පුද්ගලයන්ගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ලැබෙති. සංසය පෙර සේ මය.

ප්‍රතිලෝම අභිධෙයා, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොස – පෙ – පඤ්චවෝකාරයෙහි උපදින – පෙ – පුද්ගලයන්ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද තමන් ඉපදී සිටින භූමියෙහි නැවත නිරුද්ධ වන්නා වූ අරූප තලයෙහි උපදින චුතවන – පෙ – පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර ලැබෙති. අනුලෝම සංසය ද එසේය.

ප්‍රත්‍යනීක සංසයෙහි අවශේෂය, ''අරූපෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං'' (කියනු) අරූප චුති (4) සතරය - පෙ - අරූ තලයෙහි පිරිනිවෙන්නා වූ අර්හත් ඵලස්ථයාගේ අරූප භූමි (4) සතර ඒකාන්ත වශයෙන් ද, තමන් ඉපදී සිටින භූමියෙහි පසුව නිරුද්ධ නොවන්නා වූ - පෙ - අරූප චුති (4) සතරය - පෙ - පුද්ගලයන්ගේ ද, අරූතලයෙන් චුතවන්නා වූ - පෙ - පුද්ගලයන්ගේ ද අරූප භූමි (4) සතරය, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ - පෙ - අසංඥසත්ත්වයෙහි උපදිමින් සිටින්නා වූ - පෙ - පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්තය ද ගනු ලැබේ.

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣති, තස්ස තත්ථ සඤ්ඤක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, පරිනිබ්බන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ,''

අනුලෝම අභිධෙය්‍ය, ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය,–පෙ–චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි පිරිනිවෙන්නා වූ රහතන් වහන්සේගේ චතුවෝකාර භූමි (4) සතර සහ අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ඒකාන්ත වශයෙන් ද, තමන් ඉපද සිටින භූමියෙහි පසුව නිරුද්ධ නොවන්නා වූ චුති සිත් (19) එකුන් විස්සය,–පෙ–චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙන් චුතවන්නාවූ – පෙ – පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර සහ අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්ස ලැබෙති. මේ අනේකාන්ත වශයෙනි.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නිරුද්ධවන්නා වූ චුති සිත් (19) එකුන් විස්ස - පෙ - චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙන් චුතවන්නා වූ - පෙ - පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම කියනු,

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය - පෙ - චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදින - පෙ - පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර සහ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති. [නිරුද්ධවන්නා වූ යයි අනාගත අර්ථය ගත් බැවින් චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින සියල්ලෝ ගැනෙති.] අනුලෝම සංසය ද එසේ ලැබෙයි. ප්‍රත්‍යනීක සංසය පිළිබඳ අවශේෂය වනාහි අසඤ්ඤසත්තානං'' යනුවෙන් කියනු. අසංඥසත්ත්ව තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසංඥ සත්ව භූමිය ගනු ලැබේ.

**වත්තමානානාගත වාරය නිමි.**

---

## අතීතානාගත පුද්ගල වාරය

**''යස්ස රූපක්ඛන්ධො නිරුජ්ඣිත්ථ, තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, පරිනිබ්බන්තානං තෙසං, ඉතරෙසං තෙසං යස්ස වා පන ආමන්තා,''**

අනුලෝම අභිධෙය්‍ය, ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය – පෙ – චතුවෝකාර පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථයා ගනු ලැබේ. පිරිනිවෙන්නා හැර සෙසු සියලු උපදින චුතවන පුහුදුන් (4) සිවුදෙනද යට ඵලස්ථ (3) තිදෙනාද ගනු ලැබෙති. සංසය පෙර සේ බෙදනු, ප්‍රතිලෝමයද පෙර සේමය, [වේදනාස්කන්ධ මූලයද සමානය ප්‍රත්‍යනිකයෙහි වෙසෙසක් නැත. අනුලෝමයෙහි ප්‍රතික්ෂෙපයද ප්‍රතිලෝමයෙහි පාළිගති විසඳුමද වේ.]

ඕකාස වාරය සුගමය.

## පුද්ගලෝකාස වාරය

“යස්ස යත්ථ රූපක්ඛන්ධො නිරුජ්ඣිත්ථ, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, පඤ්චවොකාරේ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ,”

අනුලෝම අභිධෙය්‍ය පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති (9) නවය, – පෙ – පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථයාගේ කාමාවචර භූමි (7) සතය වෙහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දසය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත චුත නොවන්නාවූ පඤ්චවෝකාර චුති (15) පසළොසය පඤ්චවෝකාරයෙහි චුතවන – පෙ – පුද්ගලයන්ගේ ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, අසඤ්ඤසත්ත්වයෙහි උපදින චුතවන – පෙ – පුද්ගලයන්ගේ අසංඥ සත්ත්ව භූමියද ගනු ලැබේ, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන – පෙ – පුද්ගලයන්ගේ ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සද ගනු ලැබෙති. සංසය පෙර සේමය.

පටිලෝම අභිධෙය්‍ය, රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිත් එකය – පෙ – ශුද්ධාවාසයෙහි උපදින අනාගාමී පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නිරුද්ධ වන්නාවූ උපදින – චුතවන – පෙ – පුද්ගලයන්ගේ අරූප භූමි සතර ගනු ලැබෙති. අනුලෝම සංසයද එසේය. [ප්‍රත්‍යනීක සංසය පිළිබඳ අවශේෂය,” සුද්ධාවාසේ පරිනිබ්බන්තානං අරූපෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ.]

රූපාවචර පඤ්චමධ්‍යාන (1) එකය, – පෙ – ශුද්ධාවාසයෙහි පිරිනිවෙන්නාවූ අනාගාමී අර්හත් ඵලස්ථයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසය, අරූප චුති (4) සතරය, – පෙ – අරූපයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථයාගේ අරූප භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නිරුද්ධ නොවන්නාවූ අරූප චුති (4) සතරය, – පෙ – අරූපයෙහි චුතවන – පෙ – පුද්ගලයන්ගේ අරූප භූමි සතර ගනු ලැබෙති.

“යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිත්ථ, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, පරිනිබ්බන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ. යස්ස වා පන යත්ථ සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ,”

අනුලෝම 'අභිධෙය්‍ය, ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චතුවෝකාර පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය දක්වා ඇති රූපාවචර භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නිරුද්ධ නොවන්නාවූ චුති සිත් (19) එකුන් විස්සය, චතුවෝකාර භූමි (4) සතරය, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය යන මේවා ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නිරුද්ධ වන්නාවූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින-චුතවන-පෙ-පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සද ගනු ලැබෙති. සංසය වනාහි පෙර සේමැයි,

ප්‍රතිලෝම අභිධෙය්‍ය; රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි, එකය-පෙ-ශුද්ධාවාසයෙහි උපදින අනාගාමී ඵලස්ථයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති. අනුලෝම සංසය ද එසේම ගනු ලැබේ. [ප්‍රත්‍යනික සංසයෙහි අවශේෂ "සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ] රූපාවචර පඤ්චමධ්‍යාන චුති සිත් එකය-පෙ-ශුද්ධාවාසයෙහි පිරිනිවෙන්නාවූ අනාගාමී-අර්හත් ඵලස්ථයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස ද, අසංඥසත්ත්වයෙහි උපදින-චුතවෙන-පෙ-පුද්ගලයන්ගේ අසංඥසත්ත්ව භූමිය ද ගනු ලැබේ.

**අතීතානාගත වාරය නිමි,**

---

## ප්‍රවෘත්ති-උත්පාදනිරෝධ-වර්තමාන වාරය

නිරෝධ වාරය දේශනා කොට වදරා අනතුරුව උත්පාද නිරෝධ වාරය වදළ සේක. [පෙර සේ කියනු] "යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣතීති, නො, යස්ස වා පන, නො,"

අනුලෝම අභිධෙය්‍ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසළොස-පෙ-පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා ද යට ඵලස්ථයන් (3) තිදෙනා ද ප්‍රථම ජීවිත නවක කලාපයාගේ-පෙ-අසඤ්ඤසත්වයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද ගනු ලැබේ.

### කොටස් බෙදීම

රූපස්කන්ධය පමණක් උපදිමින් ඇති පුද්ගලයාට වේදනාස්කන්ධ නිරෝධයක් නොවන බැවින්, "තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣති" යන සංසය පදයාගේ අර්ථයක් නැත්තේය, මෙසේ සන්නිට්ඨාන පදයාගේ පමණක් අභිධෙය්‍ය ඇතිව සංසයාගේ අභිධෙය්‍ය නැති බැවින්, යම් පුද්ගලයකුගේ රූපස්කන්ධය උපදිමින් පවත්නා කල්හි ඒ පුද්ගලයාට වේදනාස්කන්ධ නිරුද්ධ වන්නේදැයි සර්වඥයන් වහන්සේට විමතියෙක් නැත, එහෙත් වෙනෙය්‍යාධ්‍යාශ වශයෙන්

ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති හතර අතුරෙන් මෝඝ ප්‍රශ්නයෙන්, එම ප්‍රශ්නයට අනුරූපව රූපස්කන්ධය උපදින පුද්ගලයාගේ වේදනාස්කන්ධය නිරුද්ධවීමෙක් නොමැති බැවින් පිළිතුරු පස අතුරෙන් ''නො'' යන ප්‍රතිෂේධයෙන් පිළිතුරු වදළහ. ප්‍රතිලෝමයෙහි චතුවෝකාරයෙන් චුතවන්නවුන් අභියෙධ්‍ය වශයෙන් උද්ධරනු. [කොටස් සමානය;]

යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස සඤ්ඤක්ඛන්ධො නිරුජ්ඣතීති නො, යස්ස වා පන නො''

අනුලෝම අභිධෙය්‍ය, චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින – පෙ – ප්‍රතිලෝම අභිධෙය්‍ය, චතුවෝකාර පඤ්චවෝකාරයෙන් චුතවන – පෙ – [රූපස්කන්ධ මූලයෙහි ප්‍රත්‍යනික සංසය පිළිබඳ අවශේෂ ''අරූපං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං, වේදනාස්කන්ධ මූලයෙහි ''අසඤ්ඤසත්තානං තෙසං'']

**වර්තමාන වාරය නිමි. අතිත වාරය සමානය.**

---

## අනාගත පුද්ගල වාරය

''යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජිස්සති, තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, ආමන්තා යස්ස වා පන – පෙ – පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං යෙව අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය පශ්චිම භවිකව චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයා ද, යට ඵලස්ථයන් (3) තිදෙනා ද, කාමසුගති භූමි (7) සත සුභකිණ්හ තෙක් රූප භූමි (9) නවය යන මෙහි දී යට මාර්ග ලැබ අරූප භූමියෙහි ඉපදී පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින ත්‍රිහේතුකයා ද උපදින – චුතවන යට ඵලස්ථයන් (3) තිදෙනා ද, අරූප තලයෙහි මතු මත්තෙහි ඉපද පිරිනිවෙන්නා වූ අරූපයෙහි උපදින–චුතවන යට ඵලස්ථයන් (3) තිදෙනා ද ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි නැවත උපදින්නා වූ චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදින – චුතවන පෘථග්ජන (4) සතර දෙනා ද යට ඵලස්ථයන් (3) තිදෙනා ද අසංඥ සත්වයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද ගනු ලැබෙති. සංසය පෙර සේම බෙදනු, [ප්‍රත්‍යනික සංසයයෙහි අතිරේකය ''පරිනිබ්බන්තානං'' පමණි.]

''යස්ස වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සති, තස්ස පඤ්ඤක්ඛන්ධො නිරජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං තෙසං ඉතරෙසං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ත්‍රිහේතුක ප්‍රතිසන්ධි (13) තෙළෙස, – පෙ – පශ්චිම භවිකව චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයා ද යට ඵලස්ථයන් තිදෙනා ද ගනු ලැබෙති. පශ්චිම භවික හැර සියලුම උපදින

චුතවන පෘථග්ජනයන් ද යට ඵලස්ථයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසය පෙර සේ ම බෙදනු. [මේ වාරය පිළිබඳ ''උප්පජ්ජිස්සති'' යන්නෙහි පශ්චිම භවික නොලැබේ. නිරුජ්ඣිස්සති යන්නෙහි'' පශ්චිම භවික උපදින'' යන විශේෂය දැනගත යුතුය.]

ඕකාස වාරය සුගමයි.

## පුද්ගලෝකාංස වාරය

යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජිස්සති, තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පච්ඡිම භවිකානං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ,''

අනුලෝම අභිධෙය්‍ය අසංඥ සත්ව භූමියෙහි නැවත උපදින්නාවූ අසඤ්ඤ භවයෙහි උපදිමින් චුතවෙමින් සිටින – පෙ – පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ව භූමිය ගනු ලැබේ. තමන් ඉපදී සිටින භූමියෙහි නැවතත් උපදින්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන – පෙ – පුද්ගලයන්ගේ ශුද්ධාවාසය හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ගනු ලැබෙති. සංසය පෙර සේ මැයි, අනුලෝමය උප්පාද වාරය අනුවය.

ප්‍රතිලෝම අභිධෙය්‍ය පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්ධි (9) නවය – පෙ පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයාගේ සහ යට ඵලස්ථයන් (3) තිදෙනාගේ ද අපාය භූමි හැර පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ද තමන් ඉපදී සිටින භූමියෙහි නැවතත් නූපදින්නාවූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසළොස – පෙ – පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින – පෙ – පුද්ගලයන්ගේ අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්ස ද. තමන් ඉපද සිටින භූමියෙහි නැවතත් නූපදින්නාවූ අරූප තලයෙහි උපදින – චුතවන – පෙ – පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර ද ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ. ප්‍රත්‍යනීක සංසයේ අවශේෂය ''පරිනිබ්බන්තානං'' යනුයි. [පරිනිබ්බන්තානං ''ඒකාන්ත වශයෙන් හා චවන්තානං'' අනේකාන්ත වශයෙන් ද උදුරනු] අසංඥසත්වයෙහි නැවතත් නූපදින්නාවූ අසඤ්ඤ සත්වයෙහි උපදින–චුතවන – පෙ – පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ව භූමිය ද යනු ලැබේ.

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජිස්සති, තස්ස තත්ථ සඤ්ඤක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, ආමන්තා යස්ස වා පන යත්ථ, පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, පශ්චිම භවිකව උපදින ත්‍රිහේතුක පෘථග්ජනයාගේ, යට ඵලස්ථ ආයර්‍යයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ද, [ඒකාන්ත] තමන් ඉපද සිටින භූමියෙහි නැවතත් නූපදින්නාවූ පටිසන්ධි සිත් (19) එකුන් විස්ස, – පෙ –

චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදින - පෙ - පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද, අකනිට්ඨ වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ද ගනු ලැබෙති. [අනේකාන්ත]

තමන් ඉපද සිටින භූමියෙහි නැවතත් උපදින්නාවූ චතුවෝකාර භූමියෙහි උපදින - චුතවන - පෙ - පුද්ගලයන්ගේ ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබේ. ප්‍රත්‍යනීක සංසය අවශේෂ, ''පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං'' යනුයි. (පරිනිබ්බන්ත යනු [ඒකාන්ත] අසඤ්ඤසත්ත යනු [අනේකාන්ත] සියල්ල කියනු)

**අනාගත වාරය නිමි.**

(වර්තමාන අතීත වාරය, උත්පාද වර්තමානාතීත වාරය සමඟ සියල්ල සමානය)

---

# වර්තමානානාගත පුද්ගල වාරය

යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති, තස්ස වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති ආමන්තා, යස්ස වා පන සබ්බෙසං චවන්තානං අරූපං උපපජ්ජන්තානං තෙසං. පඤ්චවොකාරං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චුති සිත් (19) එකුන්විස්ස - පෙ - සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙන ද, යට පලස්ථ ආය්‍ය්‍යී පුද්ගලයන් (3) තිදෙනද අරූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පුහුදුන් පුද්ගලයා ද යට ඵලස්ථ ආය්‍ය්‍යීයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. පඤ්චවෝකාර භූමියෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා ද යට ඵලස්ථයන් (3) තිදෙනා ද අසඤ්ඤසත්ත්වයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද ගනු ලැබෙති, සංසය පෙරසේම උදුරනු ප්‍රත්‍යනීක සංසයෙහි ''පරිනිබ්බන්තානං'' යන්න අධිකය ත්‍රිහේතුක චුති (13) තෙළෙසය - පෙ - පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථ පුද්ගලයා ද ගනු ලැබේ.

''යස්ස වෙදනාක්ඛන්ධො උපපජ්ජති, තස්ස සඤ්ඤක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන සබ්බෙසං චවන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං, චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චුති සිත් (19) එකුන්විස්සය - පෙ - චුතවන සියලු පෘථග්ජන (4) සිවුදෙනා ද යට ඵලස්ථ ආය්‍ය්‍යීයන් (3) තිදෙනා ද, ප්‍රථම ජීවිත නවක කලාපයාගේ - පෙ - අසඤ්ඤතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද ගනු ලැබේ. ප්‍රතිසන්ධි සිත් (19) එකුන්විස්ස - පෙ - චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනා ද, යට ඵලස්ථ (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසය පෙරසේම බෙදනු. ප්‍රත්‍යනීකයෙහි ''පරිනිබ්බන්තානං'' යන්න අතිරේකයි. [බෙද කියනු] ඕකාස වාරය පහසුයි.

## පුද්ගලෝකාංස වාරය

''යස්ස යත්ථ රූපක්ඛන්ධො උප්පජ්ජති. තස්ස තත්ථ වෙදනාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, පඤ්චවෝකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පඤ්චවෝකාරා චවන්තානං අරූපානං තෙසං තත්ථ,

අනුලෝමයෙහි අභිධෙය්‍ය වර්තමාන වාරය අනුව කියනු. ප්‍රතිලෝම අභිධෙය්‍ය තමන් ඉපද සිටින භූමියෙහි නැවතත් චුතවන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොස, – පෙ – පෘථග්ජන (4) සිවු දෙනාගේ ද යට ඵලස්ථයන් (3) තිදෙනාගේ ද ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද, තමන් ඉපද සිටින භවයෙහි නැවතත් නිරුද්ධ වන්නාවූ අරූප භූමියෙහි උපදින – චුතවන – පෙ – පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරද, ගනු ලැබෙති. අනුලෝම සංසය ද එසේය, ප්‍රත්‍යනීක සංසයෙහි ''පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තා චවන්තානං'' යන්න අතිරේකයි, [පරිනිබ්බන්තානං යනු (ඒකාන්ත) අසඤ්ඤසත්තා චවන්තානං යනු (අනේකාන්ත) භූමි පුද්ගල ස්වරූප උදුරනු.]

''යස්ස යත්ථ වෙදනාක්ඛන්ධො උප්පජ්ජති, තස්ස තත්ථ සඤ්ඤාක්ඛන්ධො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන යත්ථ, චතුවෝකාරා පඤ්චවෝකාරා චවන්තානං තෙසං තත්ථ, චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින්නාවූ භූමියෙහි නැවතත් නිරුද්ධ වන්නාවූ චුති සිත් (19) එකුන් විස්ස – පෙ – චතුවෝකාර පඤ්චවෝකාරයෙහි චුතවන – පෙ – පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරද, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ගනු ලැබේ.

ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස – පෙ – චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින – පෙ – පුද්ගලයන්ගේ – පෙ – සංසය ද පෙර සේ මැයි ප්‍රත්‍යනීක සංසයේ ''පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං'' යනු අතිරේකයි [ස්වරූප උදුරනු]

**වර්තමානානාගත වාරය නිමි.**

[අතීතානාගත වාරය ද නිරෝධ අතීතානාගත වාරය අනුව ගතයුතු]

**ප්‍රවෘත්ති වාරය නිමි.**

---

## ස්ථාන (27) සත්විස්ස

[මේ ප්‍රවෘත්ති වාරයෙහි ස්ථාන (27) සත්විස්ස සිහිකළ යුතුය. (27) සත් විස්ස යනු මෙසේය. අසඤ්ඤසත්ත ස්ථාන (4) සතරෙකි. අරූප ස්ථාන (7) සතෙකි. පඤ්චවෝකාර ස්ථාන (6) සයෙකි. ශුද්ධාවාස ස්ථාන (4) සතරෙකි. සව් ස්ථාන (2) දෙකෙකි. සාධාරණ ස්ථාන (2) දෙකෙකි. චතුවෝකාර පඤ්චවෝකාර ස්ථාන (2) දෙකෙකි යනුයි.

ඒ ස්ථාන (27) විසිහත අතුරෙන් අසඤ්ඤසත්ත ස්ථාන (4) සතර යනු මෙසේය. (1) අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං, (2) අසඤ්ඤසත්තෙ තත්ථ, (3) අසඤ්ඤසත්තානං (4) අසඤ්ඤසත්තා චවන්තානං, මේ ස්ථාන සතරයි.

අරූප ස්ථාන (7) සත මෙසේය. (1) අරූපං උපපජ්ජන්තානං (2) අරූපෙ තත්ථ, (3) අරූපානං (4) අරූපා චවන්තානං (5) අරූපෙ පච්ඡිම භවිකානං (6) අරූපෙ පරිනිබ්බන්තානං, (7) යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, මේ ස්ථාන සතයි.

පඤ්චවෝකාර ස්ථාන (6) සය මෙසේය; (1) පඤ්චවෝකාරං උප්පජ්ජන්තානං (2) පඤ්චවොකාරෙ තත්ථ, (3) පඤ්චවොකාරානං (4) පඤ්චවෝකාරා චවන්තානං (5) පඤ්චවොකාරෙ පච්ඡිම භවිකානං (6) පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං මේ ස්ථාන සයයි. ශුද්ධාවාස ස්ථාන (4) සතර මෙසේය, (1) සුද්ධාවාසං උපපජ්ජන්තානං (2) සුද්ධාවාසේ තත්ථ, (3) සුද්ධාවාසානං (4) සුද්ධාවාසේ පරිනිබ්බාන්තානං යනු ඒ ස්ථාන සතරයි.

සර්ව ස්ථාන (2) දෙක මෙසේය;- (1) සබ්බෙසං උපපජ්ජන්තානං, (2) සබ්බෙසං චවන්තානං යන ස්ථාන දෙකය, සාධාරණ ස්ථාන (2) දෙක මෙසේය;- (1) පච්ඡිම භවිකානං, (2) පරිනිබ්බන්තානං යන ස්ථාන දෙකය, චතුවෝකාර පඤ්චවොකාර ස්ථාන (2) දෙක මසේය;- (2) චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං (2) චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං යන මේ ස්ථාන දෙකය.

මෙසෙ ස්ථාන සමූහය (27) සත්විස්සක් වෙති. මේ වනාහි අර්ථ කථාවෙහි ආ ස්ථානයෝය.]

## පරිඤ්ඤාවාර වර්තමාන

ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදරා අනතුරුව පරිඥ වාරය වදළ සේක. ඒ පරිඥ වාරය ද වර්තමාන වාරය, අතීතවාරය, අනාගත වාරය, වර්තමානාතීත වාරය, වර්තමානානාගත වාරය, අතීතානාගත වාරය වශයෙන් සවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් වර්තමාන වාරය පළමු කොට වදළ සේක. ඒ වර්තමාන වාරය ද අනුලෝම ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද රූපස්කන්ධ මූලය වේදනාස්කන්ධ මූලය ආදි වශයෙන් (4) සිවු වැදෑරුම් වන්නේය, ඒ සතර අතුරෙන් රූපස්කන්ධ මූලය පළමු කොට වදළ සේක. ඒ රූපස්කන්ධ මූලය ද වේදනාස්කන්ධ මූලී යනාදී වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් වේදනාස්කන්ධ මූලී වාරය පළමු කොට වදළ සේක. ඒ වේදනාස්කන්ධ මූලී වාරය ද අනුලෝම-ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක, ඒ අනුලෝමය ද ප්‍රශ්න විස්සර්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් ප්‍රශ්නය පළමු කොට වදළ සේක. ඒ ප්‍රශ්නය ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''යො රූපක්ඛන්ධං පරිජානාති'' යනුවෙනි,

ඉන් අනතුරුව සංසය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, ''සො වෙදනාක්ඛන්ධං පරිජානාති'' යනුවෙනි ප්‍රශ්නය දේශනා කොට වදරා ඉන් අනතුරුව විස්සජ්ජනාව වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත් ''ආමන්තා'' යනුවෙනි, අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝමය වදාළ සේක. (පෙර සේ කියනු) ''යො වා පන වෙදනාක්ඛන්ධං පරිජානාති, සො රූපක්ඛන්ධං පරිජානාතීති, ආමන්තා;

යො – යම් පුද්ගලයෙක්; රූපක්ඛන්ධං – රූපස්කන්ධය, පරිජානාති, – පිරිසිඳ අවබෝධ කෙරේද; සො, – ඒ රූපස්කන්ධය පිරිසිඳ අවබෝධ කරන පුද්ගල තෙමේ, වෙදනාක්ඛන්ධං, – වේදනාස්කන්ධය, පරිජානාති, – පිරිසිඳ අවබෝධ කරයි ද, ඉති පුච්ඡායං සති; මෙසේ ප්‍රශ්නයෙක් ඇති කල්හි; ආමන්තා;– රූපස්කන්ධය පිරිසිඳ අවබෝධ කරන පුද්ගල තෙමේ වේදනාස්කන්ධය පිරිසිඳ අවබොධ කෙරේ; ඉති විස්සජ්ජනා හොති,– මෙසේ පිළිතුර වේ.

අනුලෝම ප්‍රශ්නයෙහි ''යො රූපක්ඛන්ධං පරිජානාති'' යන සන්නිවිඨාන පදයාගේ අභිධෙයාථි, අර්හත් මාර්ගස්ථයා ගනු ලැබේ සංසය ද එසේය, ප්‍රතිලෝමය ද එසේය. [මෙසේ සංඥා – සංස්කාර – විඥාන – ඇතුළත් කොට කීමෙහි ද අර්ථ බෙද කියනු, වේදනාස්කන්ධ මූල ආදියෙහි ද ක්‍රමය සමානය.]

**අනුලෝම නිමි.**

---

## ප්‍රත්‍යනීකය

අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍යනීකය වදාළ සේක. (පෙර සේ බෙද කියනු) ''යො රූපක්ඛන්ධං න පරිජානාති, සො වෙදනාක්ඛන්ධං න පරිජානාතීති, ආමන්තා, යො වා පන, ආමන්තා,''

න පරිජානාති – පිරිසිඳ අවබොධ නොකෙරේ, අනුලෝම අභිධෙය්‍ය, පෘථග් ජනයා සහ අර්හත් මාර්ගස්ථයා හැර සෙසු ආය්‍ය්‍යයන් (7) සත් දෙනා ගනු ලැබෙති. සංසය ද එසේම ය, ප්‍රතිලෝමය ද එසේම ලැබේ. [වේදනාස්කන්ධ මූල යනාදිය ද සමාන මැයි]

[පිරිසිඳ දැනුම යනු භාවනාවෙන් ලබන අවබෝධයම බැවින් පරිජානාති යන තැන අර්හත් මාර්ගස්ථයාම ස්වරූප වශයෙන් ගනු ලැබේ. සොතාපත්ති – සකදගාමි – අනාගාමි මාර්ගස්ථයෝ වනාහි පිරිසිඳ අවබෝධ නොකරන්නෝ නොවෙති. අවබෝධ කරන්නාහුමය, එහෙත් අර්හත් මාර්ගස්ථයාම සඳහා මෙය කියන ලදී. එනිසා අර්ථකථාවේ ''අනුලෝම නයෙ පරිඤ්ඤා කිච්චස්ස මත්ථකප්පත්තං අග්ගමග්ග සමංගිං සන්ධාය ආමන්තාති වුත්තන්ති වෙදිතබ්බං''යයි කියන ලදී.]

**වත්මාන වාරය නිමි.**

---

## අතීත වාරය

වර්තමාන වාරය දේශනා කොට වදරා අතීත වාරය වදළ සේක. (පෙර සේ කියනු) ''යො රූපක්ඛන්ධං පරිජානිත්ථ සො වෙදනාක්ඛන්ධං පරිජානිත්ථාති, ආමන්තා, යො වා පන, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය, අර්හත් මාර්ගස්ථයා ගනු ලැබේ. සංසය ද, ප්‍රතිලෝමය ද එසේම ලැබෙයි. (වේදනාස්කන්ධ මූලය ද සමානය.)

''යො රූපක්ඛන්ධං න පරිජානිත්ථ, සො වෙදනාක්ඛන්ධං න පරිජානිත්ථාති, ආමන්තා, යො වා පන, ආමන්තා,'' අනුලෝම අභිධෙය්‍ය, පෘථග්ජනයා සහ අර්හත් ඵලස්ථයා හැර සෙසු ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත් දෙනා ගනු ලැබෙති. සංසයට ද, ප්‍රතිලෝමයට ද එසේ මැයි.

**අතීත වාරය නිමි.**

---

## අනාගත වාරය

අතීත වාරය දේශනා කොට වදරා අනතුරුව අනාගත වාරය වදළ සේක. (පෙර සේ කියනු) ''යො රූපක්ඛන්ධං පරිජානිස්සති, සො වෙදනාක්ඛන්ධං පරිජානිස්සතීති, ආමන්තා, යො වා පන, ආමන්තා,''

අනුලෝම අභිධෙය්‍ය, මාර්ගඵලාවබෝධයට භව්‍ය වූ පෘථග්ජනයා සහ මාර්ගස්ථ (3) තිදෙනා ද යට ඵලස්ථ (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසයට ද එසේය. ප්‍රතිලෝමයට ද එසේම ගනු ලැබෙති. (වේදනාස්කන්ධ මූලය ද සමානය.)

''යො රූපක්ඛන්ධං න පරිජානිස්සති, සො වෙදනාක්ඛන්ධං න පරිජානිස්සතීති, ආමන්තා, යො වා පන, ආමන්තා,''

අනුලෝම අභිධෙය්‍ය, මාර්ගඵලාවබෝධයට අභව්‍ය වූ පෘථග්ජනයා සහ අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. සංසයට ද එසේය, ප්‍රතිලෝමයට ද එසේය. (වේදනාස්කන්ධ මූලය ද සමාන මැයි)

**අනාගත වාරය නිමි.**

---

## වර්තමානාතීත වාරය

අනාගත වාරය දේශනා කොට වදරා අනතුරුව වර්තමානාතීත වාරය වදළ සේක. (පෙර සේ කියනු) ''යො රූපක්ඛන්ධං පරිජානාති, සො වෙදනාක්ඛන්ධං පරිජානිත්ථාති, නො, යො වා පන, නො,''

අනුලෝම අභිධෙය්‍ය, අර්හත් මාර්ගස්ථ පුද්ගලයා ගනු ලැබේ.

## කොටස් බෙදීම

ඒ අර්හත් මාර්ගස්ථයා වනාහි රූපස්කන්ධය පිරිසිඳ දැනගනිමින් සිටින්නේ වේ. හෙතෙම අතීතයේ වේදනාස්කන්ධය පිරිසිඳ අවබෝධ නොකළ බැවින් ''සො වෙදනාක්ඛන්ධං පරිජානිත්ථ'' යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථයක් නොලැබේ, මෙසේ සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය ලැබී සංසය පදයාගේ අභිධෙය්‍ය නොලැබෙන බැවින් ''යම් පුද්ගලයෙක් රූපස්කන්ධය පිරිසිඳ අවබෝධ කරගනිමින් සිටීද, ඒ රූපස්කන්ධය පිරිසිඳ අවබෝධ කරන පුද්ගලයා වේදනාස්කන්ධය ඉහත දී අවබෝධ කර ගත්තේ දැයි'' සර්වඥයන් වහන්සේට විමතියක් ඇත්තේම නැත. එහෙත් වේනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා, ප්‍රශ්න ජාති සතර අතුරෙන් මෝස ප්‍රශ්නයට අනුව, රූපස්කන්ධය පිරිසිඳ අවබෝධ කරන පුද්ගලයා වේදනාස්කන්ධය ඉහතදී අවබෝධ කර නැති බැවින් සංසය පදයාගේ අභිධෙය්‍ය ප්‍රතිෂේධ කරමින්, පිළිතුරු පස අතුරෙන් ''නො'' යන ප්‍රතිෂේධ විස්සජ්ජනාවෙන් පිළිතුරු වදළහ. ප්‍රතිලෝමයෙහි අර්ත් ඵලස්ථයා ගනු ලැබේ. [අනුලෝමය මේ නය ඇසුරු කොට කියනු, වේදනාස්කන්ධ මූලය ද සමානය.]

''යො රූපක්ඛන්ධං න පරිජානාති, සො වෙදනාක්ඛන්ධං න පරිජානිත්ථාති, අරහා රූපක්ඛන්ධං න පරිජානාති, නො ච වෙදනාක්ඛන්ධං න පරිජානිත්ථ, අග්ගමග්ග සමංගිඤ්ච අරහන්තඤ්ච ඨපෙවා අවසෙසා පුග්ගලා රූපක්ඛන්ධඤ්ච නපරිජානන්ති වෙදනාක්ඛන්ධඤ්ච න පරිජානිත්ථ,''

යො වා පන වෙදනාක්ඛන්ධං න පරිජානිත්ථ, සො රූපක්ඛන්ධං න පරිජානාතීති, අග්ගමග්ග සමංගි වෙදනාක්ඛන්ධං න පරිජානිත්ථ, නො ච රූපක්ඛන්ධං න පරිජානාති, අග්ගමග්ග සමංගිඤ්ච අරහන්තඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා වෙදනාක්ඛඤ්ච න පරිජානිත්ථ, රූපක්ඛන්ධඤ්ච න පරිජානන්ති,''

අනුලෝම අභිධෙය්‍ය, අර්හත් ඵලස්ථයා ගනු ලැබේ. පෘථග්ජනයා ද අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථයන් හැර සෙසු ආර්‍ය්‍ය පුද්ගලයෝ (6) සදෙන ද ගනු ලැබෙති. සංසය ද පෙර සේමය. ප්‍රතිලෝමයෙහි අර්හත් මාර්ගස්ථයා ගනු ලැබේ, සංසය ද ඉහත සඳහන් පරිදිමය (වේදනාස්කන්ධ මූලය ද සමානය.)

**වත්මානාතීත වාරය නිමි.**

---

# වර්තමානානාගත වාරය

''යො රූපක්ඛන්ධං පරිජානාති, සො වෙදනාක්ඛන්ධං පරිජානිස්සතීති, නො, යො වා පන වෙදනාක්ඛන්ධං පරිජානිස්සති සො රූපක්ඛන්ධං පරිජානාතීති, නො,''

අනුලෝමයෙහි අර්හත් මාර්ගස්ථයා ගනු ලැබේ. (කොටස් බෙද කියනු.) ප්‍රතිලෝමයෙහි, මාර්ග ඵලාවබෝධයට සුදුසුවූ භව්‍ය පෘථග්ජනයා සහ යට මාර්ගස්ථ තිදෙනාත්, යට ඵලස්ථ තිදෙනාත් ගනු ලැබෙති. (පෙර සේ කොටස් බෙද කියනු.)



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

''යො රූපක්ඛන්ධං න පරිජානාති සො වෙදනාක්ඛන්ධං න පරිජානිස්සතීති, යෙ මග්ගං පටිලභිස්සන්ති, තෙ රූපක්ඛන්ධං න පරිජානන්ති, නො ච වෙදනාක්ඛන්ධං න පරිජානිස්සන්ති, අරහා යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති, තෙ රූපක්ඛන්ධඤ්ච න පරිජානන්ති, වෙදනාක්ඛන්ධඤ්ච න පරිජානිස්සන්ති.

යො වා පන වෙදනාක්ඛන්ධං න පරිජානිස්සති, සො රූපක්ඛන්ධං න පරිජානාතීති, අග්ගමග්ග සමංගී වෙදනාක්ඛන්ධං න පරිජානිස්සති නො ච රූපක්ඛන්ධං න පරිජානාති අරහා යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති, තෙ වෙදනාක්ඛන්ධඤ්ච න පරිජානිස්සන්ති, රූපක්ඛන්ධඤ්ච න පරිජානන්ති,''

අනුලෝම සන්නිට්ඨානයෙහි, මාර්ගඵලාධිගමයෙහි භව්‍ය වූ පෘථග්ජනයා ද යට මාර්ගස්ථ තිදෙනා සහ යට ඵලස්ථ තිදෙනා ද ගනු ලැබෙති. මාර්ගඵලාවබෝධයෙහි අභව්‍ය වූ පෘථග්ජනයා සහ අර්හත් ඵලස්ථයා ද ගනු ලැබෙති. සංසයද පෙර සේමය, ප්‍රතිලෝමයෙහි අර්හත් මාර්ගස්ථයා ගනු ලැබේ, සංසය යට කියන ලද පරිදි ලැබේ.

(අභව්‍ය පෘථග්ජන පුද්ගලයා යනු වට්ටාභිරත වට්ටජ්ඣාසය, වට්ටයෙහිම ඇලුනු සිත් ඇත්තා වූ වට්ටයෙන් මිදීම නම් වූ නිවනෙහි ඇල්මක් නැත්තා වූ පෘථග්ජනයා යයි ආචාර්‍ය වරයෝ කියති. වෙදනාස්කන්ධ මූලය ද සමානය.)

**වත්මානානාගත වාරය නිමි.**

## අතීතානාගත වාරය

''යො රූපක්ඛන්ධං පරිජානිත්ථ, සො වෙදනාක්ඛන්ධං පරිජානිස්සතීති, නො, යො වා පන නො,''

අනුලෝම සන්නිට්ඨානයෙහි, අර්හත් ඵලස්ථයා ගනු ලැබේ. සංසයෙහි ස්වරූපාර්‍ථ නොමැත.

ප්‍රතිලෝමයෙහි, මාර්ගාධිගමනයෙහි භව්‍ය වූ පෘථග්ජනයා ද යට මාර්ගස්ථ තිදෙනා ද යට ඵලස්ථ තිදෙනා ද ගනු ලැබෙති, සංසයෙහි ස්වරූප අර්ථය නොමැති.

''යො රූපක්ඛන්ධං න පරිජානිත්ථ, සො වෙදනාක්ඛන්ධං න පරිජානිස්සතීති යෙ මග්ගං පටිලභිස්සන්ති, තෙ රූපක්ඛන්ධං න පරිජානිත්ථ, නො ච වෙදනාක්ඛන්ධං න පරිජානිස්සන්ති, අග්ගමග්ග සමංගී, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති, තෙ රූපක්ඛන්ධඤ්ච න පරිජානිත්ථ, වෙදනාක්ඛන්ධඤ්ච න පරිජානිස්සන්ති.

යො වා පන වෙදනාක්ඛන්ධං න පරිජානිස්සති, සො රූපක්ඛන්ධං න පරිජානිත්ථාති, අරහා වෙදනාක්ඛන්ධං න පරිජානිස්සති, නො ච රූපක්ඛන්ධං න පරිජානිත්ථ, අග්ගමග්ග සමංගිඤ්ච යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති, තෙ වෙදනාක්ඛන්ධඤ්ච න පරිජානිස්සන්ති, රූපක්ඛන්ධඤ්ච න පරිජානිත්ථ,''

අනුලෝම සන්නිට්ඨානයෙහි, මාර්ගාධිගමනයෙහි භව්‍ය පෘථග්ජනයා සහ යට ඵලස්ථ තිදෙනා ද ගනු ලැබෙති. මාර්ගාධිගමනයෙහි අභව්‍ය වූ පෘථග්ජනයා ද ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි අර්හත් ඵලස්ථයා ගනු ලැබේ. සංසය පෙර සේය. (වේදනාස්කන්ධ මූලය ද මීට සමානය)

**අතීතානාගත වාරය නිමි.**

---

## අභිප්‍රාය

[මේ පරිඤ්ඤ වාරයෙහි පුද්ගල වාරය, ඕකාස වාරය පුද්ගලෝකාස වාරයයි කියා වාර තුන නැත්තේ කුමක් හෙයින් ද පුද්ගල වාරය පමණක්ම ගන්නා ලද්දේ කවර හෙයකින් ද; ඉතිරි වාර දෙක නොලැබෙන බැවිනි, කුමක් හෙයින් ඉතිරි දෙක නොගන්නා ලද්දේ ද; සමානවූම පිළිතුරු ලැබෙන බැවිනි. කුමක් හෙයින් සමාන වූ පිළිතුරුම ලැබේ ද? "යො රූපක්ඛන්ධං පරිජානාති, සො වේදනාක්ඛන්ධං පරිජානාති" යන ප්‍රශ්නයට ද, "යත්ථ රූපක්ඛන්ධං පරිජානාති, තත්ථ වේදනාක්ඛන්ධං පරිජානාති," යන ප්‍රශ්නයට ද, "යස්ස යත්ථ රූපක්ඛන්ධං පරිජානාති, තස්ස තත්ථ වේදනාක්ඛන්ධං පරිජානාති" යන ප්‍රශ්නයට ද, ආමන්තා කියාම පිළිතුර වන්නේය. මෙසේ සමානම පිළිතුරු ඇති බැවින් අභිධෙය්‍ය නොලැබේ. තවද, පරිඥ කෘත්‍යය නම් පුද්ගලයාට ම ලැබෙන්නකි, ඕකාසයට නො ලැබේ. පුද්ගලයාම පිරිසිඳ අවබෝධ කරන්නේ වේ. ඕකාසය නොවේ. ඒ නිසා පුද්ගල වාරය පමණක් ගන්නා ලදී. ඕකාස වාරය නොගන්නා ලදී. එසේ ඕකාස වාරය නොගන්නා ලද බැවින්ම පුද්ගලෝකාස වාරය ලැබෙන නමුත් නොගන්නා ලදී.

මේ පරිඤ්ඤ වාරයෙහි වර්තමාන ආදි කාලය දැක්වීමේ දී ප්‍රවෘත්ති වාරයෙහි මෙන් චුති – ප්‍රතිසන්ධික්ෂණ වශයෙන් නොගන්නා ලදි. ප්‍රවෘත්ති කාලයෙහි චිත්තොද්පාදයාගේ වශයෙන්ම ගනු ලැබේ. කුමක් හෙයින් ද යත්, ස්කන්ධ පඤ්චකය පිරිසිඳ අවබෝධ කිරීම වනාහි මාර්ග ක්ෂණයෙහි සිදුවන්නේය, චුති ප්‍රතිසන්ධි ක්ෂණයෙහි නොවන්නේය. මාර්ගක්ෂණ අතුරෙන් ද පරිඥකෘත්‍යයේ සම්පූර්ණත්වයට යන්නා වූ අර්හත් මාර්ගක්ෂණයම ගනු ලැබේ. යට මාර්ගතුන පිළිබඳ මාර්ගක්ෂණය ගනු නොලැබේ.

මේ පරිඤ්ඤ වාරයෙහි කියන ලද පුද්ගලයෝ වනාහි දශ දෙනෙකි. දශ දෙනා යනු පෘථග්ජන දෙදෙනා ද ආය්‍ර්‍යයෝ අට දෙනා ද වෙති, පෘථග්ජන දෙදෙනා යනු පසුව මාර්ග ලබන්නා වූ, භව්‍ය පෘථග්ජනයා සහ පසුව මාර්ග නො ලබන්නා වූ අභව්‍ය පෘථග්ජනයා ද වෙති, ආය්‍ර්‍යයෝ අට දෙනා නම් මාර්ගස්ථ සතර දෙනා සහ ඵලස්ථ සතර දෙනාද වෙති.

මෙසේ අර් අභිධෙය්‍ය ගැනීමට හේතුව, "එත්ථ ච පුථුජ්ජනො අට්ඨ ච අරියාති නවපුග්ගලා, තෙසු පුථුජ්ජනො භබ්බාභබ්බ වසෙන දුවිධො" යන ඉන්ද්‍රිය යමක ටීකා පාඨය බලා තේරුම් ගත හැකිය, මේ ටීකාවෙහි භව්‍ය අභව්‍ය කියා දෙකට බෙද ඇත. විභංග පාලියෙහි භව්‍ය නිර්දේශයෙහි,

ඒ භවයෙහි මාර්ග ඵලාදි ගමනයෙහි සමර්ථ වූවහුම භව්‍ය නමින් වදරා ඇති බැවින් "යෙ මග්ගං න පටිලභිස්සන්ති" යි කී නමුත් මේ භවයෙහි මාර්ගයට පත්වීමෙහි අසමත් සියල්ලෝම කියන ලද්දහු වෙති.

ඒකාන්ත වශයෙන් සියල්ලෝම මාර්ග නොලබන්නෝ නොවෙති. නියත වශයෙන් සියල්ලෝම මාර්ග නොලබන්නාහු නොවෙත් යයි ආචාර්‍ය්‍ය වරයෝ කියති. ඒ කීම වනාහි විමසා බැලිය යුතුයි. කුමක් හෙයින් ද යත්, මේ යමක ප්‍රකරණයෙහි පුද්ගල වාරය අනාගත භවයාගේ වශයෙන් වෙන්කොට වදරා නැත. අන්භවයකට නොයන අන්තිම භවය වශයෙන්වදරා ඇත. එසේ හෙයින් විමසා බැලිය යුතුයයි කියන ලදී. ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් මෙසේ ද කියති. අන්ධ පෘථග්ජනයා ය කල්‍යාණ පෘථග්ජනයා යයි දෙකට බෙද කියති. එසේ කීමට හේතුවක් පෙළ අටුවා ටීකා අනුව නැත්තේය. ස්කන්ධ ආයතන – ධාතූන්ගේ යථාවබෝධය ඇත්තේ කල්‍යාණ පෘථග්ජනයාය, එසේ නැත්තේ අන්ධ පෘථග්ජනයා යයි ගෙන ඇත.

මේ භවයේ දී නැතත් දෙවැනි භවයෙදී කල්‍යාණ මිත්‍ර සේවනය ලැබීමෙන් ශ්‍රවණ ධාරණ ආදිය නිසා අවබෝධය ලැබිය හැකිය. ඒ නිසා එම කීමත් මනාව විමසා බැලිය යුතුය.

තවත් ආචාර්‍ය්‍ය කෙනෙක් ඒකාන්තයෙන් මාර්ග නොලබන්නාවූ නියත මිථ්‍යාදෘෂ්ටිකයා යයි දක්වත්, ඔවුහු අතිරේක පෘථග්ජනයකු දක්වන්නාහු වෙති. එහෙත් පාළි – අට්ඨකථාවන්හි කියා නැත. නියත මිථ්‍යාදෘෂ්ටිකයා ද ඒ භවයෙහි පමණක්ම අධිගමයක් නොලබයි. වෙන භවයක දී අධිගමයට පත්විය හැකිය. අධිගමයට පත්වීම ද කල්‍යාණ මිත්‍ර සංසේවනය ලබා මාර්ග ඵලයට පැමිණිය හැකිය. දනට නියත මිථ්‍යාදෘෂ්ටික නොවූයේ ද වට්ටජ්ඣාසය ඇති බැවින් සංසාර වට්ටයෙහි ඇල්ම ඇතිව නිවන ගැන ඇල්මෙක් නැතිව මාර්ගඵලයට නොපැමිණෙන්නහු ගනු ලැබේ. මෙසේ මාර්ගය ලබන්නාය, නොලබන්නාය, යන දෙදෙන පමණක් වදරා ඇත. නියත මිථ්‍යාදෘෂ්ටිකයා වදරා නැත. ඒ නිසා විමසා බලත්වා.]

**ස්කන්ධ යමකය නිමි.**

# 3

# ආයතන යමකය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!**

## ප්‍රඥප්ති වාර උද්දේශය

ස්කන්ධ යමකය දේශනා කොට වදරා අනතුරුව ආයතන යමකය වදාළ සේක. ඒ ආයතන යමකය ද ප්‍රඥප්ති වාර, ප්‍රවෘත්ති වාර, පරිඥා වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය,

ඒ තුන අතුරෙන් ප්‍රඥප්ති වාරය පළමු කොට වදාළ සේක. ඒ ප්‍රඥප්ති වාරය ද උද්දේශ නිර්දේශ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේශය පළමු කොට වදාළ සේක.

ඒ උද්දේශය ද පරිච්ඡේද වාර පරිච්ඡින්නුද්දේස වාර, විභාග වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පරිච්ඡේද වාරය පළමු කොට වදාළ සේක,

හෙවත්, ආයතනුද්දේස, නාමව්‍යවස්ථාන, නය වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් ආයතනෝද්දේශය පළමු කොට වදාළ සේක.

කෙසේ වදාළ සේක් ද යත්, 'ද්වාදසායතනානි'' යනුවෙනි. ඉන් අනතුරුව නාමව්‍යවස්ථානය වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, ''චක්ඛායතනං, සොතායතනං, ඝානායතනං, ජිව්හායතනං, කායායතනං, රූපායතනං සද්දායතනං ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං, මනායතනං, ධම්මායතනං, යනුවෙනු.

ද්වාදස – දොළොසෙක් වූ; ආයතනානි, – ආයතනවූවාහු; හොන්ති, – වෙති, චක්ඛායතනං, – චක්ෂුරායතනය ද – පෙ – ධම්මායතනං ධර්මායතනය, ඉති ඉමෙ, යන මොවුහු වෙති, නොහොත් චක්ඛායතනං, චක්ෂුරායතනය ද – පෙ – ධම්මායතනං – ධර්මායතනය ද, ඉති, – මෙසේ, – ද්වාදස, – දොළොසෙක් වූ, ආයතනානි, ආයතනයෝ; හොන්ති, – වෙති,

### 1 පද ශෝධන වාරය

නාම ව්‍යවස්ථානය දේශනා කොට වදරා අනතුරුව නයවාරය වදාළ සේක. ඒ නය වාරය ද පද ශෝධන වාරය, පද ශෝධන මූල චක්‍ර වාරය, ශුද්ධායතන වාරය ශුද්ධායතන මූලචක්‍ර වාරය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පදශෝධන වාරය පළමු කොට වදාළ සේක. ඒ පද ශෝධන වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදාළ සේක.

ඒ අනුලෝමය ද චක්ඛායතන යමක යනාදි වශයෙන් (12) දෙළොස් වැදෑරුම් වන්නේය. ඒ දෙළස අතුරෙන් චක්ඛායතන යමකය පළමු කොට වදළ සේක. ඒ චක්ඛායතන යමකය ද අනුලෝම ප්‍රශ්නය, ප්‍රතිලෝම ප්‍රශ්නය යනුවෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම ප්‍රශ්නය පළමුකොට වදළ සේක. ඒ අනුලෝම ප්‍රශ්නය ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක.

කෙසේ වදළ සේක් ද යත් ''චක්ඛු'' යනුවෙනි, ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් ''චක්ඛායතනං'' යනුවෙනි. චක්ඛු – චක්ෂුඃ ප්‍රසාදය චක්ඛායතනං, – චක්ෂුරායතනය නම් වේද; යනු අර්‍ථයි, චක්ඛු – යනු සන්නිට්ඨානයයි, චක්ඛායතනං, යනු සංසයයි, සන්නිට්ඨාන සංසය දෙපදයාගේ සමූහය අනුලෝම ප්‍රශ්නයයි.

අනුලෝම ප්‍රශ්නය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝම ප්‍රශ්නය වදළ සේක. ඒ ප්‍රතිලෝම ප්‍රශ්නය ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේද යත්, ''චක්ඛායතනං'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක්ද යත් ''චක්ඛු'' යනුවෙනි. චක්ඛායතනං – චක්ෂුරායතනය තෙමේ; චක්ඛු – චක්ෂුඃ ප්‍රසාදය නම් වේද, යනු අර්‍ථයි, චක්ඛායතනං – යනු සන්නිට්ඨානයයි, චක්ඛු යනු සංසයයි සන්නිට්ඨාන සංසය දෙපදයාගේ සමූහය ප්‍රතිලෝම ප්‍රශ්නයයි.

අනුලෝම ප්‍රශ්න - ප්‍රතිලෝම ප්‍රශ්න දෙකෙහි සමූහය, පදසොධන වාර අනුලෝමයෙහි පළමුවැනි වූ චක්ඛායතන යමකය නම් වේ.

චක්ඛායතන යමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව සොතායතන යමකය වදළ සේක. [චක්ඛායතන යමකය අනුව කියනු.] අනුලෝම ප්‍රශ්න ප්‍රතිලෝම ප්‍රශ්න දෙකෙහි සමූහය, දෙවැනි වූ සොතායතන යමකය නම් වේ. [ඝානායතන යමකය ආදිය ද මේ නය ක්‍රමයෙන් කියනු.] මෙසේ පදසෝධන වාර අනුලෝමයෙහි යමක (12) දෙළසෙකි. ප්‍රශ්න (24) සූවිස්සෙකි. අර්‍ථ (48) අටසාලිසෙකි.

### ප්‍රත්‍යනීකය

අනුලෝම වාරය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක, ඒ ප්‍රත්‍යනීකය ද චක්ඛායතන යමක යනාදි වශයෙන් දෙළොස් (12) වැදෑරුම් වන්නේය. [අනුලෝම නය ඇසුරු කොට කියනු.] මෙසේ පද ශෝධන වාර ප්‍රත්‍යනීකයෙහි යමක දෙළසෙකි (12). ප්‍රශ්න සූවිස්සෙකි (24). අර්‍ථ (48) අටසාලිසෙකි. අනුලෝම ප්‍රත්‍යනීක දෙක එකතුවෙහි නය (2) දෙකෙකි, යමක (24) සූවිස්සෙකි. ප්‍රශ්න (48) අටසාලිසෙකි. අර්‍ථ (96) සයානුවක් ද වෙති,

## 2 පද සෝධන මූලචක්‍ර වාරය

පද සෝධන වාරය දේශනා කොට වදරා අනතුරුව පදසොධන මූල චක්‍ර වාරය වදළ සේක. ඒ පද සෝධන මූල චක්‍ර වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක, ඒ අනුලෝමය ද චක්ඛායතන මූල ආදි වශයෙන් (12) වැදෑරුම්

වන්නේය, ඒ දෙළොස අතුරෙන් චක්ඛායතන මූලය පළමු කොට වදළ සේක. ඒ චක්ඛායතන මූලය ද සොතායතන මූලී ආදී වශයෙන් (11) එකොළොස් වැදෑරුම් වන්නේය, ඒ එකොළොස (11) අතුරෙන් සොතායතන මූලීය පළමු කොට වදළ සේක. ඒ සොතායතන මූලී වාරය ද අනුලෝම ප්‍රශ්න ප්‍රතිලෝම ප්‍රශ්න වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම ප්‍රශ්නය පළමු කොට වදළ සේක. ඒ අනුලෝම ප්‍රශ්නය ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් ''චක්ඛු'' යනුවෙනි ඉන් අනතුරුව සංසය වදළ සේක, කෙසේ වදළ සේක් ද යත්, ''චක්ඛායතනං'' යනුවෙනි, අනුලෝම ප්‍රශ්නය වදරා අනතුරුව ප්‍රතිලෝම ප්‍රශ්නය වදළ සේක. [පෙර සේ බෙදනු] කෙසේ වදළ සේක් ද යත් ''ආයතනා සොතායතනං'' යනුවෙනි.

අනුලෝම ප්‍රශ්න – ප්‍රතිලෝම ප්‍රශ්න දෙක පිළිබඳ සමූහය, පද සෝධන මූල චක්‍ර අනුලෝම වාරයෙහි පළමුවැනි වූ සෝතායතන මූලී චක්ඛායතන යමකය නම් වේ, සෝතායතන මූලී වාරය දේශනා කොට වදරා අනතුරුව ඝානායතන මූලී – පෙ – ධම්මායතන මූලී වාරය වදළ සේක, [සෝතායතන මූලී වාරය – අනුව කියනු] මෙසේ චක්ඛායතන මූලයෙහි යමක (11) එකොළසෙකි. ප්‍රශ්න (22) දෙවිස්සෙකි. අර්‍ථ (44) සූසාලිසෙකි,

චක්ඛායතන මූලය දේශනා කොට වදරා අනතුරුව සොතායතන මූලය වදළ සේක. ඒ සොතායතන මූලය ද චක්ඛායතන මූලී ආදී වශයෙන් (11) එකොළොස් වැදෑරුම් වන්නේය. [චක්ඛායතන මූලය අනුව කියනු.] මෙසේ සෝතායතන මූලයෙහි යමක (11) එකොළොසෙකි. ප්‍රශ්න (22) දෙවිස්සෙකි, අර්‍ථ (44) සූසාලිසෙකි, [ඝානායතන මූල – පෙ – ධම්මායතන මූලයන්හි ද යමක 11 – ප්‍රශ්න – 22 අර්‍ථ (44) සූසාලිසෙකි.] මෙසේ පද සෝධන මූල චක්‍ර වාරයෙහි මූල (12) දෙළසෙකි, යමක (132) එකසිය දෙතිසෙකි, ප්‍රශ්න (264) දෙසිය සූසැටෙකි, අර්‍ථ (528) පන්සිය අටවිස්සෙකි.

## ප්‍රත්‍යනීකය

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක, ඒ ප්‍රත්‍යනීකය ද නචක්ඛායතන මූල ආදී වශයෙන් (12) දෙළොස් වැදෑරුම් වන්නේය. [අනුලෝමය අනුව බෙද කියනු] කෙසේ වදළ සේක් ද යත්, ''න චක්ඛු න චක්ඛායතනං, නායතනා න සොතායතනං – පෙ – නායතනා න ධම්මායතනං'' මෙසේ න චක්ඛායතන මූලයෙහි යමක (11) එකොළොසෙකි ප්‍රශ්න (22) දෙවිස්සෙකි අර්‍ථ (44) සූසාලිසෙකි, [න සොතායතන මූල ආදියෙහි ද මෙ හා සමානය.] මෙසේ පද සෝධන මූල චක්‍ර වාරයෙහි මූල (12) දෙළොසෙකි. යමක (132) එකසිය දෙතිසෙක, ප්‍රශ්න (264) දෙසිය සූසැටෙකි. අර්‍ථ (528) පන්සිය විසි අටෙකි. මෙ සෙයින් අනුලෝම ප්‍රත්‍යනීක දෙක එකතුවෙන් ලැබෙන නය (2) දෙකෙකි. මූල (24) සූවිස්සෙකි. යමක (264) දෙසිය සූසැටෙකි. ප්‍රශ්න (528) පන්සිය විසි අටෙකි. අර්‍ථ (1056) එක්දහස් සපණසෙක් වෙති.

## 3 ශුද්ධායතන වාරය

පද සෝධන මූල චක්‍ර වාරය දේශනා කොට වදරා අනතුරුව ශුද්ධායතන වාරය වදළ සේක. [පද ශෝධන වාරය අනුව කියනු.] "චක්ඛු ආයතනං, ආයතනා චක්ඛු – පෙ – ධම්මා ආයතනං, ආයතනා ධම්මො, (යමක ආදිය එකතු කොට පෙර සේ කියනු.)

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනිකය වදළ සේක. (මෙහි ද දේශනා පාළිය සහ යමක ආදී සංඛ්‍යාව පෙර සේ දක්වනු.) මෙසේ අනුලෝම ප්‍රත්‍යනික දෙකෙහි එකතුවෙන් ලැබෙන නය දෙකෙකි. යමක (24) සූවිස්සෙකි. ප්‍රශ්න (48) අටසාලිසෙකි, අර්ථ (96) සයානුවෙක් ද වෙති.

## 4 ශුද්ධායතන මූල චක්‍ර වාරය

ශුද්ධායතන වාරය දේශනා කොට වදරා අනතුරුව ශුද්ධායතන මූල චක්‍ර වාරය වදළ සේක, [පද සෝධන මූල චක්‍ර වාරය අනුව කියනු. යමක සමූහ සංඛ්‍යාදිය ද සමානය. මෙ වාර සතරේ සමූහය විභාග වාර නම වේ.] මෙසේ විභාග වාරයෙහි වාර (4) සතරෙකි. නය (2) දෙකෙකි. මූල (48) අටසාලිසෙකි. යමක (576) පන්සිය සසැත්තෑවෙකි. ප්‍රශ්න (1152) එක්දහස් එකසිය දෙපණසෙකි. අර්ථ (2304) දෙදහස් තුන්සිය සතරෙක් වෙති.

**උද්දේශය නිමි.**

---

# ප්‍රඥප්ති වාර නිර්දේශය

**1 පද සෝධන වාරය:-** උද්දේශය දේශනා කොට වදරා අනතුරුව නිර්දේශය වදළ සේක. ඒ නිර්දේශය ද පද සෝධන වාර පද සෝධන මූල චක්‍ර වාර, ශුද්ධායතන වාර, ශුද්ධායතන මූල චක්‍ර වාර වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පද ශෝධන වාරය පළමු කොට වදළ සේක. ඒ පද සෝධන වාරය ද අනුලෝම ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද චක්ඛායතන යමක ආදී වශයෙන් (12) දොළොස් වැදෑරුම් වන්නේය. ඒ (12) දොළොස අතුරින් චක්ඛායතන යමකය පළමු කොට වදළ සේක. ඒ චක්ඛායතන යමකය ද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද ප්‍රශ්න විස්සර්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ ප්‍රශ්නය ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් "චක්ඛු" යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් "චක්ඛායතනං" යනුවෙනි, ප්‍රශ්නය වදරා අනතුරුව විස්සර්ජනාව වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් "දිබ්බ චක්ඛු පඤ්ඤා චක්ඛු චක්ඛු න චක්ඛායතනං, චක්ඛායතනං චක්ඛු චෙව චක්ඛායතනඤ්ච" යනුවෙනි.

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝමය දේශනා කොට වදළ සේක. ඒ ප්‍රතිලෝමය ද ප්‍රශ්න විස්සර්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් ප්‍රශ්නය පළමු කොට වදළ සේක, ඒ ප්‍රශ්නය ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් ''චක්ඛායතනං'' යනුවෙනි, සන්නිට්ඨානය වදරා අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් ''චක්ඛු'' යනුවෙනි, ප්‍රශ්නය දේශනා කොට වදරා අනතුරුව විස්සර්ජනාව වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''ආමන්තා යනුවෙනි.

චක්ඛු – චක්ෂුව; චක්ඛායතනං – චක්ෂුරායතනය නම් වේද; ඉති පුච්ඡායං සති; මෙසේ ප්‍රශ්නයෙක් ඇති කල්හි; දිබ්බ චක්ඛු – ද්විතිය විද්‍යාඥනය නම් වූ දිව්‍ය චක්ෂුස ද පඤ්ඤාචක්ඛු; – තෘතිය විද්‍යාඥනය නම් වූ ප්‍රඥා චක්ෂුස ද චක්ඛු – චක්ෂු නම් වේ. න චක්ඛායතනං – චක්ෂුරායතනය නම් නොවේ. චක්ඛායතනං – චක්ෂුරායතනය චක්ඛු චෙව; – චක්ෂු නම් ද වේ. චක්ඛායතනඤ්ච; චක්ෂුරායතන නම් ද වේ. ඉති විස්සජ්ජනා හොති; – මෙසේ විස්සර්ජනාව වේ.

චක්ඛායතනං – චක්ෂුරායතනය, චක්ඛු – චක්ෂු නම් වේදයි ඉති පුච්ඡායං සති; මෙසේ ප්‍රශ්නයෙක් ඇති කල්හි; ආමන්තා; චක්ෂුරායතන නම් වූ ධර්මය චක්ෂු නම් වේයැයි, ඉති විස්සජ්ජනා හොති; – මෙසේ පිළිතුරු වේ.

චක්ඛු චක්ඛායතනං. යයි වදරණ ලද අනුලෝම ප්‍රශ්නයෙහි චක්ඛු යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්, දිව්‍ය චක්ෂු නම් වූ ද්විතිය විද්‍යාඥනය ද. ගනු ලැබේ. චක්ඛායතනය ද ලැබේ. සංසයෙහි චක්ඛායතනය ම ලැබේ. [කොටස් බෙද පෙර සේ දක්වනු] ප්‍රතිලෝම ප්‍රශ්නයෙහි චක්ඛායතනං, යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය චක්ඛායතනය ලැබේ. සංසය ද එසේය.

චක්ඛායතන යමකය දේශනා කොට වදරා අනතුරුව සොතායතන යමකය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් ''සොතං සොතායතනන්ති, දිබ්බසොතං තණ්හාසොතං සොතං න සොතායතනං, සොතායතනං සොතඤ්චෙව සොතායතනඤ්ච, සොතායතනං සොතන්ති, ආමන්තා,'' යනුවෙනි.

සොතං, ශ්‍රෝතය; සොතායතනං, – ශ්‍රෝතායතනය නම වේදැයි; ඉති පුච්ඡායං සති, – මෙසේ ප්‍රශ්නයෙක් ඇති කල්හි; දිබ්බසොතං. – දිව්‍යශ්‍රෝත නම් වූ අභිඥාව ද තණ්හාසොතං – තෘෂ්ණා ශ්‍රෝත නම් වූ ලෝභ චෛතසිකය ද, සොතං, – ශ්‍රෝත නම්, – පෙ –

අනුලෝම සන්නිට්ඨානයෙහි, දිව්‍යශ්‍රෝත නම් වූ අභිඥාව ද තෘෂ්ණා ශ්‍රෝත නම් වූ ලෝභ චෛතසිකය ද, ගනු ලැබේ. ශ්‍රෝතායතනය ද ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේමය; ප්‍රතිලෝමයෙහි පෙර සංසය මෙනි, ''ඝානං ඝානායතනන්ති, ආමන්තා, ඝානායතනං ඝානන්ති, ආමන්තා;'' අනුලෝමයෙහි ඝානායතනය ලැබේ. සංසය ද එසේය. ප්‍රතිලොමයද එසේය.

''ජිව්හා ජිව්හායතනන්ති, ආමන්තා, ජිව්හායතනං ජිව්හාති ආමන්තා; ජිව්හායතනය ගනු ලැබේ. ''කායො කායායතනන්ති, කායායතනං ඨපෙත්වා අවසෙසො කායො න කායායතනං, කායායතනං කායො චෙව කායායතනඤ්ච, කායායතනං කායොති ආමන්තා;''

කායායතනං ඨපෙත්වා; – කායප්‍රසාද නම් වූ කායායතනය හැර; අවසෙසො කායො; – අවසේස වූ කය; න කායායතනං; – කායායතන නම් නොවේ; නොහොත් අවසෙසො; – ඉතිරි ධර්, කායො: – කාය නම් වේ, න කායායතනං; – කායායතන නම් නොවේ, (සෙස්ස සුගමයි)

අනුලෝම අභිධෙය්‍ය, සිත් (89) එකුන් අනූව චෛතසික (52) දෙපණස නිර්වාණය නම් වූ නාමකය ද, කායප්‍රසාදය හැර රූප (27) සත් විස්ස නම් වූ රූපකය ද, හස්තිකාය අශ්වකාය ආදි වූ ප්‍රඥප්ති කයද; ගනු ලැබේ. කායායතනය ද ලැබේ. සංසය පෙර සේම ලැබේ. ප්‍රතිලෝමයෙහි කායායතනය ලැබේ,

''රූපං රූපායතනන්ති, රූපායතනං ඨපෙත්වා අවසෙසං රූපං න රූපායතනං රූපායතනං රූපඤ්චෙව රූපායතනඤ්ච, රූපායතනං රූපන්ති, ආමන්තා''

රූපායතනං ඨපෙත්වා, – වර්ණරූප නම් වූ රූපායතනය හැර; අවසෙසං, – රූප නම් වූ අවශේසය; රූපං, – රූප නම් වේ. න රූපායතනං, – රූපායතනය නම් නොවේ,

අනුලෝම අභිධෙය්‍ය, තෘෂ්ණාවට අරමුණු වන්නා වූ ප්‍රිය වූ ද මිහිරි වූ ද (පියරූප – සාතරූප) ලෞකික සිත් (21) එක් අසූවය, චෛතසික (52) දෙපණසය රූපායතන වර්ජිත රූප (27) සත් විස්සය, යන මේ ධර්මයෝ ලැබෙති. රූපායතනය ද ලැබේ.

සංසය පෙරසේ ලැබේ. ප්‍රතිලෝමය ද පෙර සංසය මෙනි,

''සද්දෙ සද්දායතනන්ති, – ආමන්තා, සද්දායතනං සද්දෙති ආමන්තා; ශබ්දයතනය ලැබේ. ''ගන්ධො ගන්ධායතනන්ති; සීලගන්ධො සමාධි ගන්ධො පඤ්ඤාගන්ධො ගන්ධො, න ගන්ධායතනං, ගන්ධායතනං ගන්ධො චෙව ගන්ධායතනඤ්ච, ගන්ධායතනං ගන්ධොති, ආමන්තා,''

''ගන්ධො – ගන්ධය තෙමේ; ගන්ධායතනං; – ගන්ධායතන නම් වේ ද; සීල ගන්ධො – සීල ගන්ධය ද; සමාධිගන්ධො; – සමාධි ගන්ධය ද, පඤ්ඤාගන්ධො; – ප්‍රඥාගන්ධය ද ගන්ධො; – ගන්ධ නම් වේ. න ගන්ධායතනං; – ගන්ධායතනය නම් නොවේ,

අනුලෝම අභිධෙය්‍ය; – සම්මාවාචා සම්මා කම්මන්ත සම්මා ආජීව නම් වූ සීල ගන්ධය ද, සම්මාවායාම සම්මා සති, සම්මා සමාධි නම් වූ සමාධි ගන්ධය ද, සම්මා දිට්ඨි සම්මාසංකප්ප නම් වූ ප්‍රඥා ගන්ධය ද ගනු ලැබේ. ගන්ධායතනයද ගනු ලැබේ, සංසය පෙර සේමය, ප්‍රතිලෝමය ද පෙර සංසය මෙනි. (''සීල ගන්ධොති ආදිනි වායනවසෙන සීලාදීනං යෙව නාමානි'' අට්ඨකථා )

''රසො රසායතනන්ති, අත්ථරසො ධම්මරසො විමුත්ති රසො රසො, න රසායතනං, රසායතනං රසො චෙව රසායතනඤ්ච, රසායතනං රසොති ආමන්තා;

අනුලෝම අභිධෙය්‍ය, ඵලචිත්තෝත්පාද සතර නම්වූ අර්ථරසය ද මාර්ග චිත්තෝත්පාද සතර නම්වූ ධර්මරසය ද නිර්වාණ ධාතුව නම්වූ විමුක්ති රසය ද ගනු ලැබෙ, රසායතනය ද ගනු ලැබෙ. නොහොත්, කුශල අකුශල ආදිවූ පරමාර්ථ නම්වූ අර්ථරසය ද කුසලා ධම්මා අකුසලා ධම්මා ආදිවූ වචිභේද ශබ්දය නම්වූ ධර්මරසය ද නිර්වාණය නම්වූ විමුක්ති රසය ද ගනු ලැබෙ. රසායතනය ද ලැබෙ. සංසය පෙර සේ යොදනු. ප්‍රතිලෝමය ද පෙර සංසය මෙනි [''අත්ථරසොති ආදිනිපි සාදුමධුරචයෙන අත්ථාදීනං යෙව නාමානි'' අට්ඨකථා]

''ඵොට්ඨබ්බො ඵොට්ඨබ්බායතනන්ති, ආමන්තා; ඵොට්ඨබ්බායතනං ඵොට්ඨබ්බොති, ආමන්තා;'' අනුලෝම අභිධෙය්‍ය, ඵොට්ඨබ්බායතනය ලැබෙ. සංසය ද එසේය; ප්‍රතිලෝමය ද එසේමය.

''මනො මනායතනන්ති, ආමන්තා, මනායතනං මනොති, ආමන්තා'' මනායතනය ගනු ලැබේ. ''ධම්මො ධම්මායතනන්ති, ධම්මායතනං ඨපෙත්වා අවසෙසො ධම්මො න ධම්මායතනං, ධම්මායතනං ධම්මො චෙව ධම්මායතනඤ්ච ධම්මායතනං ධම්මොති; ආමන්තා;''

අනුලෝම අභිධෙය්‍ය, ධම්මායතනය හැර සිත් (89) එකුන් අනූව, ඖදරික රූප (12) දොළොස නම්වූ පරමාර්ථ ධර්ම හා සමූහ ප්‍රඥප්ති ධර්මයෝද ගනු ලැබෙති, ධර්මායතනයද ගනු ලැබෙ. සංසය පෙර සේ උදුරනු, ප්‍රතිලෝමය ද පෙර සංසය මෙනි.

**අනුලෝමය නිමි.**

---

## ප්‍රත්‍යනීකය

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්,'' න චක්ඛු න චක්ඛායතනන්ති ආමන්තා න චක්ඛායතනං න චක්ඛූති, දිබ්බචක්ඛු පඤ්ඤාචක්ඛු න චක්ඛායතනං චක්ඛු, චක්ඛුඤ්ච චක්ඛායතනඤ්ච ඨපෙත්වා අවසෙසං න චෙව චක්ඛු න චක්ඛායතනං;''

අනුලෝම අභිධෙය්‍ය, චක්ෂු තුන හැර ආයතන (11) එකොළොස හා ප්‍රඥප්ති ගනු ලැබෙති, සංසය ද එසේය; ප්‍රතිලෝමයෙහි දිව්‍ය චක්ෂු නම්වූ ද්විතීය විඥානය ද. ප්‍රඥ චක්ෂු නම්වූ තෘතිය විඥානය ද ගනු ලැබේ, චක්ෂු තුන හැර ආයතන (11) එකොළස ද ප්‍රඥප්ති ද ගනු ලැබෙති, සංසය පෙරසේම ලැබෙ.

''න සොතං න සොතායතනන්ති ආමන්තා; න සොතායතනං න සොතන්ති, දිබ්බ සොතං තණ්හාසොතං න සොතායතනං සොතං, සොතඤ්ච සොතායතනඤ්ච ඨපෙත්වා අවසෙසං න චෙව සොතං න ච සොතායතනං,''

දිබ්බසොතං, දිව්‍ය ශ්‍රෝත නම්වූ අභිඥාවද, තණ්හාසොතං, - තෘෂ්ණා ශ්‍රෝත නම්වූ ලෝභ චෛතසිකය ද, න සොතායතනං, - සෝතායතන නම් නොවේ. සොතං, - ශ්‍රෝත නම් වේ,

අනුලෝම අභිධෙය්‍ය, ශ්‍රොතස් තුන හැර ආයතන (11) එකොළස හා ප්‍රඥප්ති ලැබෙති, සංසයට ද එසේය ප්‍රතිලෝමයෙහි දිව්‍යශ්‍රෝත නම්වූ අභිඥාව ද තෘෂ්ණා ශ්‍රෝත නම්වූ ලෝභ චෛතසිකය ද ගනු ලැබෙති. ශ්‍රෝතස් තුන හැර ආයතන (11) එකොළස ද ප්‍රඥප්ති ද ලැබෙති. සංසය ස්වරූප පෙර සේමය.

"න ඝානං න ඝානායතනන්ති, ආමන්තා, න ඝානායතනං න ඝානන්ති ආමන්තා," අනුලෝමයෙහි ඝානායතනය හැර ආයතන (11) එකොළස ද ප්‍රඥප්ති ද ගනු ලැබෙති. සංසයෙහි ද එසේය. ප්‍රතිලෝමයෙහි ද එසේමැයි.

"න ජිව්හා න ජිව්හායතනන්ති, ආමන්තා, න ජිව්හායතනං න ජිව්හාති, ආමන්තා, "අනුලෝමයෙහි ජිව්හායතනය හැර ආයතන (11) එකොළස ද ප්‍රඥප්ති ද ගනු ලැබෙති, සංසයෙහි ද එසේම ලැබෙති. ප්‍රතිලෝමයෙහි ද එසේය.

"න කායො න කායායතනන්ති, ආමන්තා, න කායායතනං න කායොති කායායතනං ඨපෙත්වා අවසෙසො න කායායතනං කායො, කායඤ්ච කායායතනඤ්ච ඨපෙත්වා අවසෙසං න චෙව කායො නව කායායතනං,"

අනුලෝමයෙහි කුප ගුහා ආදි අවයව වූ ප්‍රඥප්ති ඒකදේශයෙක් ගනු ලැබේ. සංසය ද එසේය. (ප්‍රතිලෝමයට අනුව උදුරනු.)

"න රූපං න රූපායතනන්ති, ආමන්තා; න රූපායතනං න රූපන්ති රූපායතනං ඨපෙත්වා අවසෙසං න රූපායතනං රූපං, රූපඤ්ච රූපායතනඤ්ච ඨපෙත්වා අවසෙසං න චෙව රූපං න ච රූපායතනං"

අනුලෝමයෙහි, ලෝකෝත්තර සිත් (8) අටය, චෛතසික (52) දෙපණසය, නිර්වාණය සහ ප්‍රඥප්ති ගනු ලැබෙති. සංසය ද එසේය, (ප්‍රතිලෝමය පෙර සේ උදුරනු.)

"න සද්දෙ න සද්දයතනන්ති, ආමන්තා; න සද්දයතනං න සද්දෙති ආමන්තා" අභිධෙය්‍ය සද්දයතනය හැර ආයතන එකොළස හා ප්‍රඥප්ති ගනු ලැබෙති.

"න ගන්ධෙං න ගන්ධායතනන්ති, ආමන්තා; න ගන්ධායතනං න ගන්ධොති, සීලගන්ධො සමාධි ගන්ධො පඤ්ඤා ගන්ධො න ගන්ධායතනං ගන්ධො, න ගන්ධඤ්ච ගන්ධායතනඤ්ච ඨපෙත්වා අවසෙසං න චෙව ගන්ධො න ච ගන්ධායතනං"

අනුලෝම අභිධෙය්‍ය, ගන්ධ (4) සතර හැර ආයතන (11) එකොළස හා ප්‍රඥප්ති ගනු ලැබෙති. සංසය ද එසේ ලැබේ. (ප්‍රතිලෝමය පෙර සේ කියනු.) "නරසො න රසායතනන්ති, ආමන්තා. න රසායතනං න රසොති, අත්ථරසො ධම්මරසො විමුත්ති රසො න රසායතනං රසො, රසඤ්ච රසායතනඤ්ච ඨපෙත්වා අවසෙසං න චෙව රසො න ච රසායතනං,"

අනුලෝම අභිධෙය්‍ය, රස (4) සතර හැර ආයතන (11) එකොළස හා ප්‍රඥප්ති ගනු ලැබෙති. සංසය ද එසේය. (ප්‍රතිලෝමය පෙර සේ උද්ධරනු,) න ඵොට්ඨබ්බයෙහි ''ආමන්තා'' යනු පිළිතුරයි. අභිධෙය්‍ය; ඵොට්ඨබ්බායතනය හැර ආයතන (11) එකොළස හා ප්‍රඥප්ති ගනු ලැබෙති. න මනායතනයෙහි ද ''ආමන්තා'' යන පිළිතුරය, අභිධෙය්‍ය, මනායතනය හැර ආයතන (11) එකොළස හා ප්‍රඥප්ති ගනු ලැබෙති.

න ධම්මායතනයෙහි කූප ගුහාදී අවයව ප්‍රඥප්ති එක දේශයෙක් ගනු ලැබේ. (ප්‍රතිලෝම සන්නිට්ඨානය අනුලෝමය අනුව කියනු.)

**ප්‍රත්‍යනීකය නිමි. – පද ශෝධන වාරය නිමි.**

## 2 පද ශෝධන මූල චක්‍ර වාරය

පද ශෝධන' වාරය දේශනා කොට වදරා පද ශෝධන මූල චක්‍ර වාරය වදාළ සේක. (පෙර සේ කියනු.) ''චක්ඛු චක්ඛායතනන්ති, දිබ්බචක්ඛු පඤ්ඤා චක්ඛු චක්ඛු න චක්ඛායතනං, චක්ඛායතනං චක්ඛුචෙව චක්ඛායතනඤ්ච, ආයතනා සොතායතනන්ති, සෝතායතනං ආයතනඤ්චෙව සොතායතනඤ්ච, අවසෙසා ආයතනා න සොතායතනං;'' (අනුලෝමය පෙර සේ කියනු)

ප්‍රතිලෝම අභිධෙය්‍ය සොතායතනය හැර ආයතන (11) එකොළස ගනු ලැබෙති. සොතායතනය ද ගනු ලැබේ, (මේ නය ක්‍රමයට සමානව මූලී ක්‍රමයෙන් ආයතන (11) ඇතුලත් කරමින් කියනු යමක සමූහය උද්දේශයෙහි යට කියන ලදී.

### ප්‍රත්‍යනීකය

''න චක්ඛු න චක්ඛායතනන්ති ආමන්තා නායතනා න සොතායතනන්ති ආමන්තා'' (අනුලෝමය පෙර සේ කියනු) ප්‍රතිලෝමයෙහි ප්‍රඥප්තිය ගනු ලැබේ. සංසය ද එසේය. (මේ නයට සමානව ආයතන (12) දෙළොස අතුරෙන් එක එකෙක්හි සෙසු ආයතන (11) එකොළස ඇතුලත් කරමින් කියනු. ස්වරූපාර්ථ සමානමය. ඇතුලත් නොවෙනුයේ ප්‍රඥප්ති පමණෙකි)

**ප්‍රත්‍යනීකය නිමි, – පද ශෝධන වාර මූල චක්‍ර වාරය නිමි.**

## 3 ශුද්ධායතන වාරය

පද ශෝධන මූල චක්‍ර වාරය දේශනා කොට වදරා අනතුරුව ශුද්ධායතන වාරය වදාළ සේක. ''චක්ඛු ආයතනන්ති ආමන්තා, ආයතනා චක්ඛායතනන්ති චක්ඛායතනං ආයතනඤ්චෙව චක්ඛායතනඤ්ච, අවසෙසා ආයතනා න චක්ඛායතනං''

අනුලෝමයෙහි චක්ඛු තුන ලැබෙති. සංසය ද එසේය. ප්‍රතිලෝමයෙහි චක්ඛායතනය හැර ආයතන (11) එකොළස ලැබෙති. චක්ඛායතනය ද ලැබේ. සංසය පෙර සේමය, (කොටස් මාරුකොට කියනු) මේ නයට අනුව සියලුම

අනුලෝමයෙහි ආමන්තා'' යන ප්‍රතිවචනය ම කියනු, ප්‍රතිලෝමයෙහි ස්වරූප දර්‍ශනයම කියනු. සොතායතන යමකයෙහි ශ්‍රෝතස් තුන ලැබෙති. ඝානායතනයෙහි ඝානායතනය ලැබෙ. ජිව්හායතනයෙහි ජිව්හායතනය ලැබෙ. කායායතනයෙහි ආයතන බවට යන්නාවූ සිත් (89) එකුන් අනූව චෛතසික (52) දෙපණසය, නිර්‍වාණයයි කියන ලද නාම කයද, රූප (28) අටවිස්සයයි කියන ලද රූප කයද ගනු ලැබෙ.

රූපායතනයෙහි තෘෂ්ණාවට අරමුණු වන පියරූප සාතරූප නම්වූ ලෞකික සිත් (81) එක් අසූවය, චෛතසික (52) දෙපණසය, අටවිසි රූපය ද ලැබෙති; සද්දයෙහි සද්දායතනය ලැබේ. ගන්ධයෙහි ගන්ධ (4) සතර ලැබෙති. රසයෙහි රස (4) සතර ලැබෙති. ධම්මයෙහි පරමාර්‍ථ ධර්‍ම ලැබෙති.

**අනුලෝම නිමි.**

## ප්‍රත්‍යනීකය

''න චක්ඛු නායතනන්ති. චක්ඛුං ඨපෙත්වා අවසෙසා ආයතනා න චක්ඛු ආයතනා, චක්ඛුඤ්ච ආයතනඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චක්ඛු න ච ආයතනා නායතනා න චක්ඛායතනන්ති, ආමන්තා''

චක්ඛුං ඨපෙත්වා, – ප්‍රසාද චක්ෂුව හැර, අවසෙසා – ඉතිරිවූ ආයතනා – ආයතනයෝ; න චක්ඛු – චක්ෂු නම් නොවෙති, ආයතනා – ආයතන පමණක්ම වෙති; අනුලෝම අභිධෙය්‍ය, චක්ෂු තුන හැර ආයතන (11) එකොළස ගනු ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබෙති, න සොත වාරයෙහි ද බෙදීම සමානය, ශ්‍රෝතස් තුන හැර ආයතන (11) එකොළස ගනු ලැබෙති, ප්‍රඥප්තිය ද ලැබෙ. න ඝාන වාරයෙහි ද බෙදීම සමානය, ඝානායතනය හැර ආයතන (11) එකොළස ගනු ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබෙ. න ජිව්හා වාරයෙහි ද නය සමානයි.

''න කායො නායතනන්ති, ආමන්තා, නායතනා න කායොති, ආමන්තා'' අනුලොමයෙහි ප්‍රඥප්තිය ගනු ලැබෙ, සංසය ද එසේය. ප්‍රතිලෝමය ද එසේය, ''න රූපං නායතනාන්ති, රූපං ඨපෙත්වා අවසෙසා ආයතනා න රූපං ආයතනා රූපඤ්ච ආයතනඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව රූපං න ච ආයතනා, නායතනා න රූපායතනන්ති ආමන්තා,''

අනුලෝමයෙහි ලෝකොතර සිත් (8) – අට, චෛතසික (36) සතිස හා නිර්‍වාණය ගනු ලැබෙ, ප්‍රඥප්ති ද ලැබෙ. සංසය පෙර සේ ලැබෙ, ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය මෙනි. ''න සද්දෙ නායතනන්ති, සද්දං ඨපෙත්වා – පෙ – ආමන්තා'' ශබ්දයතනය හැර ආයතන (11) එකොළස ගනු ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබෙ.

''න ගන්ධො නායතනන්ති, ගන්ධං ඨපෙත්වා – පෙ – ආමන්තා,'' ගන්ධ (4) සතර හැර ආයතන (11) එකොළස ගනු ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබෙ. ''න රසො නායතනන්ති; රසං ඨපෙත්වා – පෙ – ආමන්තා;'' රස (4) සතර හැර ආයතන (11) එකොළස ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබෙ. ''න ඵොට්ඨබ්බො

නායතනන්ති, ඵොට්ඨබ්බං ඨපෙත්වා – පෙ – ආමන්තා'' ඵොට්ඨබ්බායතනය හැර ආයතන (11) එකොළස ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබේ. ''න මනො නායතනන්ති, මනං ඨපෙත්වා – පෙ – ආමන්තා'' මනායතනය හැර ආයතන (11) එකොළස ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබේ. ''න ධම්මො නායතනන්ති, ආමන්තා, නායතනා න ධම්මායතනන්ති, ආමන්තා'' අනුලෝමයෙහි ප්‍රඥප්තිය යනු ලැබේ. සංසය ද එසේය. ප්‍රතිලෝමය ද එසේය.

**ප්‍රත්‍යනීකය නිමි. – ශුද්ධායතන වාරය නිමි.**

## 4 ශුද්ධායතන මූලචක්‍ර වාරය

''චක්ඛු ආයතනන්ති, ආමන්තා, ආයතනා සොතායතනන්ති සොතායතනං ආයතනඤ්චෙව සොතායතනඤ්ච අවසෙසා ආයතනා න සොතායතනං, [මෙසේ ආයතන (12) දෙළස අතුරෙන් එක එකක් බැගින් මුල්කොට ඉතිරි (11) එකොළස වෙන වෙනම සම්බන්ධ කොට කියනු. අභිධෙය්‍ය ස්වරූප ඉදිරිම ශුද්ධායතන වාරයට සමාන මැයි.]

**අනුලෝමය නිමි.**

## ප්‍රත්‍යනීකයෙහි

න චක්ඛු නායතනන්ති චක්ඛුං ඨපෙත්වා අවසෙසා ආයතනා න චක්ඛු ආයතනා, චක්ඛුඤ්ච ආයතනඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චක්ඛු න ච ආයතනං, නායතනා න සොතායතනන්ති, ආමන්තා'' [මෙසේ ආයතන (12) දෙළස අතුරෙන් එක එකක් මුල් කොට ඉතිරි ආයතන (11) එකොළස වෙන වෙනම සම්බන්ධ කොට කියනු. අභිධෙය්‍ය ශුද්ධායතන ප්‍රත්‍යනීකයට සමානය·]

**ශුද්ධායතන මූල චක්‍ර වාරය නිමි.**

[ශුද්ධායතනයෙහි දී කාය හා ධර්ම අභිධෙය්‍ය ශුද්ධ පරමාර්ථ ධර්ම ගනු ලැබෙති, ප්‍රඥප්ති නොගනු ලැබේ. පද ශෝධනයෙහි දී චනාභි හස්තිකාය–අශ්වකාය ආදී ප්‍රඥප්තිය ද කාය ධර්ම අභිධෙය්‍ය ද ගන්නා ලදහ. එනිසා අර්ථ කථාවෙහි ''අවසෙසො කායොති නාමකායො රූපකායො හත්ථිකායො අස්සකායොති එවමාදී''යයි කියන ලදී. ශුද්ධායතනවාරයෙහි චනාභි ආයතන වශයෙන් ලැබෙන්නා වූ ශුද්ධ පරමාර්ථ ධර්මයම වදළ බැවින් ප්‍රඥප්ති නොගනු ලැබේ.]

**ප්‍රඥප්ති වාරය නිමි.**

---

# ප්‍රවෘත්ති, උත්පාද, වර්තමාන වාරය

**චක්ඛායතන මූලය;–** ප්‍රඥප්ති වාරය දේශනා කොට වදරා අනතුරුව ප්‍රවෘත්ති වාරය වදළ සේක. ඒ ප්‍රවෘත්ති වාරය ද උත්පාද වාරය නිරෝධ වාරය උත්පාද නිරෝධ වාරය වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් උත්පාද වාරය පළමු කොට වදළ සේක. ඒ උත්පාද වාරය ද වර්තමාන වාරය, අතීත වාරය, අනාගත වාරය, වර්තමානාතීත වාරය, වර්තමානානාගත වාරය, අතීතානාගත

වාරය, වශයෙන් සවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් වර්තමාන වාරය පළමු කොට වදළ සේක. ඒ වර්තමාන වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක, ඒ අනුලෝමය ද පුද්ගලවාර, ඔකාසවාර පුද්ගලෝකාස වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරය ද චක්ඛායතන මූල, සෝතායතන මූල යනාදි වශයෙන් (10) දශවැදෑරුම් වන්නේය. ඒ දශය අතුරෙන් චක්ඛායතන මූලය පළමු කොට වදළ සේක. ඒ චක්ඛායතන මූලය ද සෝතායතන මූලී යනාදී වශයෙන් (10) දසවැදෑරුම් වන්නේය. ඒ දශය අතුරෙන් සෝතායතන මූලී වාරය පළමු කොට වදළ සේක. [ශබ්දයතනය ප්‍රතිසන්ධික්ෂණයෙහි නොලැබෙන බැවින් මූල 10 මූලී 10, පමණක්ම ලැබෙති.] ඒ සෝතායතන මූලී වාරය ද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද පුච්ඡා–විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''යස්ස චක්ඛායතනං උප්පජ්ජති'' යනුවෙනි, ඉන් අන්තුරුව සංසය වදළ සේක, කෙසේ වදළසේක් ද යත්, ''තස්ස සොතායතනං උප්පජ්ජති'' යනුවෙනි,

පුච්ඡාව වදරා අනතුරුව විස්සජ්ජනාව වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''ස චක්ඛුකානං අසොතකානං උපපජ්ජන්තානං තෙසං චක්ඛායතනං උප්පජ්ජති, නො ච තෙසං සොතායතනං උප්පජ්ජති, ස චක්ඛුකානං සසොතකානං උපපජ්ජන්තානං තෙසං චක්ඛායතනඤ්ච උප්පජ්ජති, සොතායතනඤ්ච උප්පජ්ජති'' යනුවෙනි.

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රතිලෝමය වදළ සේක. ඒ ප්‍රතිලෝමය ද පුච්ඡා විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාව ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''යස්ස වා පන සොතායතනං උප්පජ්ජති'' යනුවෙනි, ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''තස්ස චක්ඛායතනං උප්පජ්ජති'' යනුවෙනි, පුච්ඡාව වදරා අනතුරුව විස්සර්ජනාව වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''සසොතකානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං සොතායතනං උප්පජ්ජති, නො ච තෙසං චක්ඛායතනං උප්පජ්ජති, සසොතකානං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං සොතායතනඤ්ච උප්පජ්ජති, චක්ඛායතනඤ්ච උප්පජ්ජති යනුවෙනි.

''යස්ස–යම් පුද්ගලයකුට චක්ඛායතනං–චක්ෂුරායතනය; උප්පජ්ජති, උපදමින් පවති; තස්ස;– ඒ චක්ෂුරායතනය උපදින පුද්ගලයාට; සොතායතනං;– ශ්‍රොතායතනය; උප්පජ්ජති;– උපදමින් පවතී ද යි; ඉති පුච්ඡායං සති;– මෙසේ ප්‍රශ්නයෙක් ඇති කල්හි; සචක්ඛුකානං;– චක්ෂුරායතනය ලැබීමට සුදුසුව අසොතකානං – ශ්‍රෝතායතනය ඉපදීමට අභව්‍යව, උපපජ්ජන්තානං,– ප්‍රතිසන්ධි ගන්නා වූ; තෙසං

ඒ පුද්ගලයන්ට; චක්ඛායතනං, – චක්ෂුරායතනය; උප්පජ්ජති. – උපදී තෙසං, – ඔවුන්ට; සොතායතනං, – ශ්‍රෝත්‍රායතනය; නො ච උප්පජ්ජති, – නොම උපදී, ස චක්ඛුකානං, – චක්ෂුරායතනය පහළ වීමට භව්‍ය වූ; සසොතකානං, – ශ්‍රෝත්‍රායතනය පහළ වීමට භව්‍ය වූ; උපපජ්ජන්තානං – ප්‍රතිසන්ධි ගන්නා වූ; තෙසං – ඒ පුද්ගලයන්ට; චක්ඛායතනඤ්ච – චක්ෂුරායතනය ද, උප්පජ්ජති, – උපදී සොතායතනඤ්ච – ශ්‍රෝත්‍රායතනය ද උපදී, ඉති විස්සජ්නා හොති, – මෙසේ විසඳීම වේ. යස්ස වා පන, – යම් පුද්ගලයකුට වනාහි, සොතායතනං – පෙ – (ඉහත දැක්වූ ලෙස බෙද කියනු.)

**අභිප්‍රායාර්ථය;–** [ස චක්ඛුකානං සසොතකානං යන්නෙහි සංවිද්‍යමාන අර්ථය කියනු ලැබේ. සලොමකො, සපක්ඛකො යනු මෙනි. ඒ නිසා චක්ෂුප්‍රසාදය ලැබීමට සුදුසු වූ ශෝත්‍රප්‍රසාදය ලැබීමට සුදුසු වූ අය කියන ලදහ. චක්ෂු ප්‍රසාදය සමග එකට උපදින, ශ්‍රෝත්‍රප්‍රසාදය සමග එකට උපදින (සහාර්ථය) නොකියන ලදී. කුමක් හෙයින් මෙසේ කියනු ලැබේ ද යත් සවිතක්කා ධම්මා යනාදී ධර්ම විභාගයෙහිදී ම ක්‍රියා සමවාය ඇත්තේය, මෙහි වනාහි පුද්ගලයා සමභ ධර්මයාගේ ක්‍රියා සමවායය නොමැති බැවිනි. ස චක්ඛුකානං (පටිලද්ධ චක්ඛුකානං) යනුවෙන් විවරණය කරන ටීකාපාඨය බලා ලැබීමට සුදුසු චක්ෂුව ඇත්තේ යයි ආචාර්ය වරයෝ අර්ථ යෝජනා කරති.

භුම්ම වජ්ජෙසු දෙවෙසු – පෙතෙ නිජ්ඣාමතණ්හිකෙ
නිරයෙසු ච සම්භොති – යොනෙකා චොපපාතිකො
භුම්ම දෙව මනුස්සෙසු – තිරච්ඡානෙ පරෙතරා
පෙතෙසු චාවසෙසෙසු – චතස්සො පි ච යොනියො

භුම්ම වජ්ජෙසු – භූම්‍යසථ දෙවියන් හැර; දෙවෙසු – දෙවියන් කෙරෙහි ද – නිජ්ඣාමතණ්හිකෙ-නිජ්ඣාම තණ්හික නම් වූ පෙතෙ ච, – ප්‍රේතයන් කෙරෙහි ද, නිරයෙසු ච, නිරයෙහි ද, ඔපපාතිකො ඕප්පාතික නම් වූ, ඒකාව යොනි, – යොනි සතරෙන් එකෙක්ම, සම්භොති, ලැබේ. භුම්ම දෙව මනුස්සෙසු, භූම්‍යසථ දෙවියන් හා මනුෂ්‍යයන් කෙරෙහි ද තථා එසේම: අපරේ; අන්‍ය වූ තිරච්ඡානෙ,– තිරශ්චීනයන් කෙරෙහි ද; අවසේසේසු, – නිජ්ඣාම තණ්හික ප්‍රේතයන්ගෙන් අවශේෂවූ; පෙතෙව, ප්‍රේතයන් කෙරෙහි ද; චතස්සො අපිච; සතරක් ම වූ; යොනියො හොන්ති යෝනිහු වෙති.

සතර යෝනිහු යනු – සංසෙදජ – ඕපපාතික අණ්ඩජ, ජලාබුජ. යන සතරය, බූමාටු දෙවීන් හැර සෙසු දෙවියෝ ද නිජ්ඣාමතණ්හික ප්‍රේතයෝ ද, තිරිසන්නු ද යන මොවුහු ඕපපාතිකයෝම වෙති. බූමාටූ දෙවියෝ ද මනුෂ්‍යයෝ ද, තිරශ්චීනයෝ ද නිජ්ඣාමතණ්හික ප්‍රේතයන් හැර සෙසු ප්‍රේතයෝ ද යන මොවුහු සතර යෝනියෙන්ම ප්‍රතිසන්ධි ගන්නෝ වෙති.

**සුගති භූමියෙහි චක්ඛු සොත ආදිය අඩු නොකරනු. විභාවිනී ටීකාවෙහි "තත්ථ සුගතියං මහානුභාවෙන කම්මුනා නිබ්බත්තමානානං ඕපපාතිකානං ඉන්ද්‍රිය වෙකල්ලායොගතො චක්ඛුසොත සානාලාභො සංසෙදජානං. භාවාලාභො**

පඨමකප්පික ඕපපාතිකානං වසෙනාපි, දුග්ගතියං පන චක්ඛුසොත භාවාලාභො ද්වින්නම්පි වසෙන, ඝානාලාභො සංසෙදජානමෙව වසෙන, ඕපපාතිකානං වසෙනාති දට්ඨබ්බං''යයි කියන ලදී,

ඝාන නැත්තාවූ ඕපපාතිකයෙක් නැත, ''අඝානකො ඕපපාතිකො නත්ථි'' යනු අර්ථකථාය. මේ අර්ථකථා, ටීකාපාඨ බලා කියනු. මෙසේ අභිධෙය්‍ය ඉදිරිමෙදි අධිප්‍රායාර්ථය සිතා බැලිය යුතුය.]

## අනුලෝම අභිධෙය්‍යාර්ථ

චක්ෂුරායතනය පමණක් ඉපදි ශ්‍රෝතායතනය නූපදින්නාවූ අපායෙහි ඕපපාතිකව උපදිමින් සිටින්නාවූ දුගති අහේතුක, පුද්ගලයා ද, සංසේදජව ගර්භසෙය්‍යකව උපදිමින් සිටින්නාවූ දුර්ගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයෝ ද, චක්ෂුරායතනය පමණක් ඉපදි ශ්‍රෝතායතනය නූපදීම චුතවන්නාවූ ගර්භසෙය්‍යකව උපදිමින් සිටින්නාවූ දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති.

චක්ෂුරායතන ශ්‍රෝතායතන දෙකම පහළ වන්නාවූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි (15) පසළොස, චෛතසික (35) පන්තිස කර්ජ කලාප 3 – 7 – 4 බැගින්ද වූ මේ නාම රූපයන්ගේ උත්පාද ක්ෂණ සමංගී වූ සචක්ඛුකව – සසොතකව පඤ්චවෝකාර භූමියෙහි ඉපදෙමින් සිටින්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාද යට එලසථ (3) තිදෙනා ද, ගනු ලැබෙති.

සංසය අභිධෙය්‍ය පෙර සේමය, ප්‍රතිලෝමයෙහි ශ්‍රෝතායතනය පමණක් ලැබී චක්ෂුරායතනය නොලබන්නාවූ අපායෙහි ඕපපාතිකව උපදිමින් සිටින්නාවූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද, සංසේදජව ගර්භසෙය්‍යකව උපදිමින් සිටින්නාවූ දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති, අනුලෝම සංසය ද එසේමය. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

[ගර්භසෙය්‍යකයනට චක්ෂු – ශ්‍රෝත දෙක අතුරෙන් පළමු කොට චක්ෂුස උපදී, එයින් පසු සතියක් ඉක්මගොස් ශ්‍රෝතය උපදී, එනිසා අනුලෝමයෙහි මෙන් ත්‍රිරාශිය නොගනු ලැබේ. ශ්‍රෝතායතනය පමණක් ඉපිද, චක්ෂුරායතනය නො ඉපිද චුතවන්නාවූ කෙනකු කියා නොමැත. ගර්භසෙය්‍යක [සත්ත්වයනට චක්ෂු ශ්‍රෝත ආදිය සත්වෙනි සතිය, – එකොළොස්වෙනි සතිය ආදියේ දි ඒකාන්තයෙන් ලැබෙන බැවින් ද ආදිම වූ ඉපදීම ජාතිය නමින් ගෙන වදළ බැවින් ද උපදිමින් පවත්නේ නම් වේයැයි ටීකාවෙහි කියා ඇත. ටීකාව බලා ආචාර්‍ය වරයෝ ගර්භසෙය්‍යකයා අභිධෙය්‍ය වශයෙන් කියති.]

සොතායතන මූලි වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ඝානායතන මූලි වාරය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, ''යස්ස චක්ඛායතනං උප්පජ්ජති තස්ස ඝානායතනං උප්පජ්ජතීති, ස චක්ඛුකානං අඝානකානං උපපජ්ජන්තානං තෙසං, ස චක්ඛුකානං ස ඝානකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන, ස ඝානකානං අ චක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං,''

අනුලෝම අභිධෙය්‍ය, චක්ෂුරායතනය පමණක් ඇතිව ඝ්‍රාණායතනය නැතිව උපදින සංසේදජ-ගර්භසෙය්‍යක දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද, චක්ෂුරායතනය පමණක් ඇතිව ඝ්‍රාණායතනය නොමැතිව චුත වන්නා වූ ගර්භසෙය්‍යකව උපදිමින් සිටින දුර්ගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝද රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පස, චෛතසික (35) පන්තිස කර්මජ කලාප (4) සතර බැගින් ඇති මේ නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූප භූමියෙහි උපදිමින් සිටින්නා වූ සහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද යට ඵලස්ථ (3) තිදෙනා ද යන මොවුහු ලැබෙති.

චක්ඛායතන ඝානායතන දෙකම ලැබීමට සුදුසු වූ කාමාවචර ප්‍රතිසන්ධි සිත් (10) දසය, චෛතසික (33) තෙතිස කර්මජ කලාප 3 – 7 බැගින් යන මේ නාම රූපයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ඛුක සඝානකව කාමභූමියෙහි උපදිමින් සිටින්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා ද යට ඵලසථ (2) දෙදෙනා ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

ප්‍රතිලෝම අභිධෙය්‍ය ඝ්‍රාණායතනය පමණක් ඇතිව චක්ෂුරායතනය නැතිව, අපායෙහි ඖපපාතිකව උපදනා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද සංසේදජ ව ගර්භසෙය්‍යක ව උපදනා වූ දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. අනුලෝම සංසය ද එසේම ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේම ලැබේ,

''යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස ජිව්හායතනං උප්පජ්ජතීති, ස චක්ඛුකානං අ ජිව්හකානං උපපජ්ජන්තානං තෙසං ස චක්ඛුකානං සජිව්හකානං උපපජ්ජන්තානං තෙසං යස්ස වා පන, ස ජිව්හකානං අ චක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං,''

අනුලෝම අභිධෙය්‍ය චක්ෂුරායතනය පමණක් ඇතිව ජිව්හායතනය නොමැතිව චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පස චෛතසික (35) පන්තිස කර්මජ කලාප (4) සතර යන මේ නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද, යට ඵලසථ ආයඨයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. චක්ඛායතන – ජිව්හායතන දෙකම ලැබෙන්නා වූ කාමාවචර ප්‍රතිසන්ධි (10) දශය චෛතසික (33) තෙතිස කර්මජ කලාප 3 – 7 බැගින් ඇති මේ නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ඛුක – සජිව්හක ව කාමාවචර භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා සහ යට ඵලසථ ආයඨයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය ද පෙර සේමය. [කාම භූමියෙහි ජිව්හාව අඩු නොකොට කියනු, ජිව්හාව නැතිව චුතවන පුද්ගලයා අජිව්හක වාරයෙහි ඇතුලත් කොට ස්වරූප උදුරති.]

**ප්‍රතිලෝමයෙහි අභිධෙය්‍ය, ජිව්හායතනය පමණක් ඇතිව චක්ඛායතනය නැතිව අපායෙහි ඖපපාතිකව උපදනා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයා සහ සංසේදජව ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද ගනු ලැබේ. අනුලෝම සංසය ද එසේය, සංසය අභිධෙය්‍ය පෙර සේමය.**

''යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස කායායතනං උප්පජ්ජතීති, ස චක්ඛුකානං අකායකානං උපපජ්ජන්තානං තෙසං ස චක්ඛුකානං සකායකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන, සකායකානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං.''

අනුලෝම අභිධෙය්‍ය, රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය, චෛතසික (35) පන්තිස්ස, කම්ජ, කලාප (4) සතර බැගින් යන මේ නාම රූපයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා සහ යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති.

චක්ඛායතනය ලැබීමට සුදුසු වූ කාමාවචර ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිස කම්ජ කලාප 3 – 7 බැගින් ඇති මේ නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචර භූමියෙහි ස චක්ඛුක, සකායක ව උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති. සංසය පෙර සේ උද්ධරනු.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චක්ෂුරායතනය නොමැතිව අපායෙහි ඕපපාතිකව උපදනා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද, සංසේදජ – ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති අහේතුක, සුගති අහේතුක පුද්ගලයෝ ද, චක්ෂුරායතනය පහළවීමට පෙර චුත වන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති, අනුලෝම සංසය ද එසේය. සංසය අභිධෙය්‍ය පෙර සේම උද්ධරනු.

**චක්ඛු මූල රූප මූලී:–** යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස රූපායතනං උප්පජ්ජතීති, ආමන්තා යස්ස වා පන, සරූපකානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, ස චක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය, චක්ෂුරායතනය නොලබා අපායෙහි ඕපපාතිකව උපදනා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද සංසේදජ – ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද, චක්ෂුරායතනය ලැබීමට ප්‍රථම චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනාවූ දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයලෝ ද, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ සත්ත්වයෙහි උපදනා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද ගනු ලැබේ. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය කම්ජ රූප කලාප 3 – 7 – 4 බැගින් ඇති මේ නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ චක්ෂුරායතනය ඇතිව පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා සහ යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

[පඤ්චවෝකාර භූමියෙහි රූපය නැත්තකු නැති බැවින් ''රූපායතනය උපදනා වූ'' යන විශේෂණය නොගන්නා ලදී. චක්ෂුව උපදිමින් ඇත්තේ නම් රූපය ද එකෙණෙහි උපදනේමය. ඒ නිසා පාලියෙහි ද ''සරූපකානං ස චක්ඛුකානං''යයි නොකියා ''ස චක්ඛුකානං''යයි වදරා ඇත. මේ නයක්‍රමය සුදුසුදැයි සිතා බැලිය යුතුය. ශබ්දයතන මූලී ප්‍රතිසන්ධි කාලයෙහි දී නොලැබෙන බැවින්

පුච්ඡාවෙහි පමණක් ගනු ලැබේ· මේ විස්සර්ජනා වාරයෙහි නොලැබේ. ඒ නිසා අර්ථකථාවේ ''සද්දායතනස්ස පටිසන්ධික්ඛණෙ අනුප්පත්තිතො නෙත සද්ධිං යමකස්ස විස්සජ්ජන මෙව නත්ථි''යයි කියන ලදී.]

''යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස ගන්ධායතනං උප්පජ්ජතීති, ස චක්ඛුකානං අගන්ධකානං උපපජ්ජන්තානං තෙසං, ස චක්ඛුකානං ස ගන්ධකානං උපපජ්ජනතානං තෙසං යස්ස වා පන, සගන්ධකානං අ චක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

රසායතන මූලියෙහි – ස චක්ඛුකානං අරසකානං තෙසං ''සරසකානං අචක්ඛුකානං තෙසං'' [ඵොට්ඨබ්බායතන මූලියෙහි – ස චක්ඛුකානං අ ඵොට්ඨබ්බකානං තෙසං, ස ඵොට්ඨබ්බකානං අ චක්ඛුකානං තෙසං'' යනුවෙන් කියනු. [මේ ගන්ධ – රස ඵොට්ඨබ්බ මූලි යමක තුන කායායතන යමකය මෙන් ස්වරූප සියල්ලම සමානය, කායායතන මූලිය අනුව ස්වරූප උදුරනු.]

''යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස මනායතනං උප්පජ්ජතීති ආමන්තා, යස්ස වා පන, සචිත්තකානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං,''

''ප්‍රතිලෝම අභිධෙය්‍ය, චක්ෂුරායතනය නොමැතිව අපායෙහි ඖපපාතිකව උපදින දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය. සංසේදජ – ගර්භසෙය්‍යකව උපදින දුර්ගති අහේතුක – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ය, චක්ෂුරායතනය ලැබීමට ප්‍රථම චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදින දුර්ගති අහේතුක – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ය, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ය, යට ඵලසථ් ආර්ය පුද්ගලයන් (3) තිදෙනා ද යන මේ අය යනු ලැබෙති. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොස චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප 3 – 7 – 4 බැගින් යන මේ නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ෂුකව පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ් ආර්යයන් (3) තිදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති. සංසය පෙර සේ ගනු ලැබේ,

''යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස ධම්මායතනං උප්පජ්ජතීති, ආමන්තා යස්සවා පන, අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චක්ෂුරායතනය නුපදින්නා වූ (ත්‍රිරාශිය පෙර සේ බෙද කියනු.) ප්‍රථම ජීවිත නවක රූපකලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ සත්ත්වයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතර චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අරූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ් ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය කර්මජ කලාප 3–7–4

බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි සචක්ඛුකව උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති.

**චක්ඛායතන මූලය නිමි.**

---

චක්ඛායතන මූලය දේශනා කොට වදරා ඝානායතන මූලය වදාළ සේක. [ඝානායතන මූලී ආදී කොට සද්දයතනය හැර ඉතිරි වාර (9) නවය චක්ඛායතන මූලය මෙන් වෙන වෙනම සම්බන්ධ කොට කියනු බෙදීම හා අභිධෙය්‍ය ඉදිරිමේ විශේෂයක් නොමැත.]

**ඝානායතන මූලය:-** ''යස්ස ඝානායතනං උප්පජ්ජති, තස්ස ජිව්හායතනං උප්පජ්ජතීති, සඝානකානං අජිව්හකානං උපපජ්ජන්තානං තෙසං සඝානකානං සජිව්හකානං උපපජ්ජන්තානං තෙසං යස්ස වා පන, සජිව්හකානං අඝානකානං උපපජ්ජනතානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය, ඝානායතනය පමණක් ඇතිව ජිව්හායතනය ලැබීමට ප්‍රථම වූත වන්නා වූ ගර්භසෙය්‍යකව උපදින දුර්ගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ඝානායතන ජිව්හායතන දෙකම ලැබීමට සුදුසු වූ කාමාවචර ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිස, කර්මජ රූප කලාප 3 – 7 බැගින් ඇති මේ නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාම භූමියෙහි සඝානකව සජිව්හකව උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලසථ ආර්ය පුද්ගලයෝ (2) දෙදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි ජිව්හායතනය පමණක් ඇතිව ඝානායතනය නොමැතිව සංසේදජ – ගර්භසෙය්‍යක වශයෙන් උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගනු ලැබෙති, අනුලෝම සංසයෙහි ද එසේය. සංසය අභිධෙය්‍ය පෙර සේ බෙද දක්වනු.

''යස්ස ඝානායතනං උප්පජ්ජති, තස්ස කායායතනං උප්පජ්ජතීති ආමන්තා. යස්ස වා පන, සකායකානං අඝානකානං උපපජ්ජන්තානං තෙසං, සඝානකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය ඝානායතනය නොමැතිව සංසේදජ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජනයෝ ද ඝානායතනය පහළ වීමට ප්‍රථම වූතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති,

ඝානායතනය ලැබීමට සුදුසු වූ කාමාවචර ප්‍රතිසන්ධි (10) දශය, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප 3 – 7 බැගින් ඇති මේ නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සඝානකව කාමාවචර භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයෝ (4) සිවුදෙනා සහ යට ඵලසථ ආර්ය පුද්ගලයෝ (2) දෙදෙනා ද ගනු ලැබෙති.

සංසය ඉහත කී සේ කියනු. (කාමාවචර භූමියෙහි කායායතනය නොමැති කෙනෙක් නැති නමුත් ''සකායකානං'' යයි රූප - අරූප භූමි ගැන සලකා කියා නැත.)

''යස්ස ඝානායතනං උප්පජ්ජති තස්ස රූපායතනං උප්පජ්ජතීති, ආමන්තා යස්ස වා පන, සරූපකානං අඝානකානං උපපජ්ජන්තානං තෙසං, සඝානකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ඝානායතනය නොමැතිව සංසේදජ - ගර්භසෙය්‍යකව කාමභූමියෙහි උපදනා වූ සු - දු අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (4) සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට ඵලසථ ආර්යයන් (3) තිදෙනාය ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාද ක්ෂණ සමංගීවූ අසඤ්ඤ සත්ත්වයෙහි උපදනා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය යන මොවුහු ගනු ලැබෙති. කාමාවචර ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය කර්මජකලාප 3 - 7 බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාමාවචර භූමියෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලසථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ උදුරනු.

''යස්ස ඝානායතනං උප්පජ්ජති තස්ස ගන්ධායතනං රසායතනං, ඵොට්-ඨබ්බායතනං'' [මේ වාර තුන කායායතන වාරය අනුව විස්තර කරනු.]

''යස්ස ඝානායතනං උප්පජ්ජති, තස්ස මනායතනං උප්පජ්ජතීති, ආමන්තා යස්ස වා පන සචිත්තකානං අඝානකානං උපපජ්ජන්තානං තෙසං, සඝානකානං තෙසං,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය ඝානායතනය නොමැතිව සංසේදජ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. මහග්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය. චෛතසික (35) පන්තිස. කර්මජ කලාප (4) බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපාවචර අරූපාවචර භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලසථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති. ඝානායතනය ලැබෙන්නාවූ කාමාවචර ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිස කර්මජ කලාප 3 - 7 බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ සඝානකව කාමාවචර භූමියෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලසථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති, සංසය අභිධෙය්‍ය පෙර සේ උදුරනු.

''යස්ස ඝානායතනං උප්පජ්ජති, තස්ස ධම්මායතනං උප්පජ්ජතීති, ආමන්තා, යස්ස වා පන අඝානකානං උපපජ්ජන්තානං තෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ඝානායතනය නොමැතිව සංසේදජ ගර්භ සෙය්‍යකව කාමභූමියෙහි උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, මහග්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) පන්තිස කර්මජ කලාප (4) සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර අරූපාවචර භූමියෙහි උපදනා වූ තිහේතුක පෘථග්ජනයාය යට එලසට් ආයතනයන් (3) තිදෙනාය, ප්‍රථම ජීවිත නවක රූපකලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥසත්ත්වයෙහි උපදනා වූ සුගති අහේතුක පෘථග්ජනයාය යන මොවුහු ගනු ලැබෙති. කාමාවචර ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය කර්මජ රූප කලාප 3 – 7 බැගින් යන මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ඝානකව කාමභූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාද යට එලසට් ආයතනයන් (2) දෙදෙනාද ගනු ලැබෙති. සංසය පෙර සේම ලැබේ.

**ඝාන මූලය නිමි.**

---

## ජිව්හායතන මූලය

''යස්ස ජිව්හායතනං උප්පජ්ජති, තස්ස කායායතනං උප්පජ්ජතීති, ආමන්තා, යස්ස වා පන සකායකානං අජිව්හකානං උපපජ්ජන්තානං තෙසං, සජිව්හකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ජිව්හායතනය ලැබීමට ප්‍රථමයෙන් චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ජිව්හායතනය ලබන්නා වූ කාමාවචර ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිස, කර්මජ කලාප 3 - 7 බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසට් ආයතනී පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති. සංසය පෙර සේම ගනු ලැබේ.

රූපායතන මූලියෙහි අනුලෝම – ''ආමන්තා'' යනු වේ. ප්‍රතිලෝමයෙහි සරූපකානං අජිව්හකානං උපපජ්ජන්තානං තෙසං සජිව්හකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ජිව්හායතනය ලැබීමට ප්‍රථම චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය චෛතසික (35) පන්තිසය. කර්මජ කලාප 3 – 7 බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට එලසට් ආයතනයන් (3) තිදෙනාය, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ සත්ත්වයෙහි උපදනා වූ සුගති අහේතුක පුද්ගලයාය යන මොවුහු ගනු ලැබෙති.

කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය, චෛතසික (33) තෙතිසය **කර්මජ** කලාප **3 – 7** බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ **උත්පාදක්ෂණ** සමංගී වූ කාම භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට එලසථ ආයූෂ පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති,

සංසය අභිධෙය්‍ය පෙරසේ ලැබේ. (ගන්ධ – රස – ඵොට්ඨබ්බ යන මේ යමක (3) තුන කායායතන මූලිය මෙන් අභිධෙය්‍ය කියනු.)

මනායතන මූලියෙහි අනුලෝම – ආමන්තා යනු වේ, ප්‍රතිලෝමයෙහි "සචිත්තකානං අජීවහකානං උපපජ්ජන්තානං තෙසං, සජීවහකානං උපපජ්ජන්තානං තෙසං"

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ජීවහායතනය ලැබීමට ප්‍රථම වූනවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, මහග්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය, චෛතසික (35) පන්තිසය කර්මජ කලාප (4) සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූප–අරූප භූමියෙහි උපදනා වූ තිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට එලසථ ආයූෂ පුද්ගලයෝ (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති.

කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (**33**) තෙතිසය කර්මජ කලාප (3 – 7) තුන – සත බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාම භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසථ ආයූෂ පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති, සංසය පෙරසේ මැයි,

ධම්මායතන මූලියෙහි අනුලෝම – ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි "අජීවහකානං උපපජ්ජන්තානං තෙසං, සජීවහකානං උපපජ්ජන්තානං තෙසං" ප්‍රතිලෝමයෙහි මනායතනය අනුවම අසඤ්ඤ සත්ත්වය වැඩි කොට ස්වරූප උදුරනු.

**ජිව්හායතන මූලය නිමි.**

---

# කායායතන මූලය

**"යස්ස කායායතනං උප්පජ්ජති, තස්ස රූපායතනං උප්පජ්ජතීති ආමන්තා. යස්ස වා පන, සරූපකානං අකායකානං උපපජ්ජන්තානං තෙසං, සකායකානං උපපජ්ජන්තානං තෙසං,"**



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

ප්‍රතිලෝම අභිධෙය්‍ය රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය චෛතසික (35) පන්තිසය කර්මජ කලාප (4) සතර බැගින්ය. ප්‍රථම ජීවිත නවක රූප කලාපය, යන මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපාවචර භූමියෙහි උපදනාවූ සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට එලසට් ආයති පුද්ගලයෝ (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති,

කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය කර්මජ කලාප (3 – 7) තුන සත බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාම භූමියෙහි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට එලසට් ආයති පුද්ගලයන් (2) දෙදෙනාය. යන මොවුහුද ගනු ලැබෙති. සංසය පෙරසේමය, ගන්ධමූලියෙහි ආමන්තා යනු වේ. රස ඵොට්ඨබ්බ – යමකයන්හිද සමානමැයි අභිධෙය්‍ය කාම ප්‍රතිසන්ධි (10) දශය චෛතසික (33) තෙතිස – කර්මජ කලාප (3 – 7) තුන සත යන මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාම භූමියෙහි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට එලසට් ආයති පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුහු ගනු ලැබෙති.

මන මූලියෙහි, අනුලෝමයට – ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි ''සචිත්තකානං අකායකානං උපපජ්ජන්තානං තෙසං, සකායකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය මහග්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (4) සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපාවචර අරූපාවචර භූමියෙහි උපදනාවූ ත්‍රිහේතුක පුද්ගලයාය, යට එලසට් ආයති පුද්ගලයෝ (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති.

කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය කර්මජ කලාප (3 – 7) තුන – සත බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාම භූමියෙහි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට එලසට් ආයති පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුහුද ගනු ලැබෙති. සංසය පෙර සේමය.

ධම්ම මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ, ප්‍රතිලෝමයෙහි ''අකායකානං උපපජ්ජන්තානං තෙසං ස කායකානං උපපජ්ජන්තානං තෙසං,'' ප්‍රතිලෝම අභිධෙය්‍ය (මනායතනය අනුව ස්වරූප කථනයේදී අසඤ්ඤසත්තය වැඩිකොට අභිධෙය්‍ය කිම පමණක් විශේෂයි.)

**කාය මූලය නිමි.**

---

## රූපායතන මූලය

''යස්ස රූපායතනං උප්පජ්ජති, තස්ස ගන්ධායතනං උප්පජ්ජතීති සරූපකානං අගන්ධකානං උපපජ්ජන්තානං තෙසං සගන්ධකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන, ආමන්තා, (අනුලෝම අභිධෙය්‍ය කායමූල අනුව රූපාවචර ගනු. රස – ඵොට්ඨබ්බ වාරක්‍රමය ද සමානය.)

''යස්ස රූපායතනං උපපජ්ජති, තස්ස මනායතනං උප්පජ්ජතීති, සරූපකානං අචිත්තකානං උපපජ්ජන්තානං තෙසං සරූපකානං සචිත්තකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සචිත්තකානං අරූපකානං උපපජ්ජන්තානං තෙසං යස්ස වා'' [අනුලෝමයෙහි අචිත්තකානං කියා ද ප්‍රතිලෝමයෙහි අරූපකානං කියා ද ඇත.]

අනුලෝම අභිධෙය්‍ය ප්‍රථම ජීවිතනවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ තලයෙහි සුගති අහේතුක පුද්ගලයා ගනු ලැබේ. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (33) පන්තිසය කර්මජ කලාප (3–7–4) තුන සත සතර මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති.

ප්‍රතිලෝමයෙහි අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (30) සමතිසය, යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති, අනුලෝම සංසය ද ගනු ලැබේ.

''යස්ස රූපායතනං උප්පජ්ජති, තස්ස ධම්මායතනං උප්පජ්ජතීති, ආමන්තා, යස්ස වා පන, අරූපකානං උපපජ්ජන්තානං තෙසං සරූපකානං උපපජ්ජන්තානං තෙසං,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය චෛතසික (30) සමතිසය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යට ඵලසථ ආයතී පුද්ගලයෝ (3) තිදෙනය යන මොවුහු ගනු ලැබෙති. පඤ්චවෝකාර අසඤ්ඤතලයන්හි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙන ද යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාද යන මොවුහු ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

## ගන්ධායතන මූලාදිය

''යස්ස ගන්ධායතනං උප්පජ්ජති, තස්ස රසායතනං උප්පජ්ජතීති, ආමන්තා, ඵොට්ඨබ්බායතනං උප්පජ්ජතීති, ආමන්තා,

කාමාවචර භූමියෙහි උපදින්නහු ගනු ලැබේ. [විස්තර වශයෙන් බෙද කියනු කායායතන මූලයට අනුව කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ සමානමැයි]

## මනායතන මූලය

''යස්ස මනායතනං උප්පජ්ජති, තස්ස ධම්මායතනං උප්පජ්ජතීති, ආමන්තා යස්ස වා පන, අචිත්තකානං උපපජ්ජන්තානං තෙසං, සචිත්තකානං උපපජ්ජන්තානං තෙසං,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගීවූ අසංඥ තලයෙහි උපදනාවූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ගනු ලැබේ. ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය කර්ම්ජ කලාප 3 – 7 – 4 බැගින් වූ මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ චතුවෝකාර පඤ්චවෝකාර භූමීන්හි උපදනාවූ පෘථග්ජන පුද්ගලයෝ (4) සිවුදෙනාය. යට එලසථ ආයභී පුද්ගලයෝ (3) තිදෙනාය. යන මොවුහු ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය,

**පුද්ගල වාරය නිමි.**

---

## ඕකාස වාරය

පුද්ගල වාරය දේශනා කොට වදරා අනතුරුව ඕකාසවාරය වදළ සේක.,– කෙසේ වදළ සේක් ද යත් ''යත්ථ චක්ඛායතනං උප්පජ්ජති තත්ථ සෝතායතනං උප්පජ්ජතීති ආමන්තා, යත්ථ වා පන, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති, සංසයට ද එසේය, ප්‍රතිලෝමයෙහි ද එසේමැයි.

''යත්ථ චක්ඛායතනං උප්පජ්ජති තත්ථ ඝාණායතනං උප්පජ්ජතීති, රූපාවචරෙ තත්ථ, කාමාවචරෙ තත්ථ, යත්ථ වා පන, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය අසංඥතලය හැර රූපාවචර භූමි (15) පසළොස ගනු ලැබෙති. කාමාවචර භූමි (11) එකොළස ද ගනු ලැබෙති. (ජිව්හා–කාය–ගන්ධ–රස–ඵොට්ඨබ්බ–සම්බන්ධ තැන්හි ද මෙයට සමානමැයි)

රූපමූලයෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි ''අසඤ්ඤසත්තෙ තත්ථ,'' යනාදිය වේ. ප්‍රතිලෝම අභිධෙය්‍ය අසංඥ තලය ගනු ලැබේ. පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති.

මනමූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි ''අරූපෙ තත්ථ, පඤ්චවොකාරෙ තත්ථ,'' ප්‍රතිලෝම අභිධෙය්‍ය, අරූප භූමි (4) සතර ගනු ලැබේ, පඤ්චවෝකාර භූමි (26) සවිස්සද ගනු ලැබේ.

ධම්ම මූලයෙහි, අනුලෝමයට ආමන්තා යනු වේ, ප්‍රතිලෝමයෙහි ''අසඤ්ඤසත්තෙ තත්ථ අරූපෙ තත්ථ පඤ්චවොකාරෙ තත්ථ'' ප්‍රතිලෝම අභිධෙය්‍ය අසංඥ තලය අරූප භූමි (4) සතර ගනු ලැබේ, පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. (මේ ක්‍රමයට අනුව ඕකාස වාර අවසානය දක්වා කියනු.)

## පුද්ගලෝකාස වාරය

''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජති, තස්ස තත්ථ සොතායතනං උප්පජ්ජතීති,'' පුද්ගල වාරය සමග පාලි විභාගය වෙනසක් නොමැත. යත්ථ – තත්ථ යයි කීම පමණක් විශේෂයි.)

අනුලෝම අභිධෙය්‍ය චක්ඛුරායතනය පමණක්ම ලැබී සෝතායතනය නො ලැබෙන්නා වූ අපායෙහි ඕපපාතිකව උපදනා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය [පුද්ගල වාරය අනුව ත්‍රිරාශිය කියනු] මේ පුද්ගලයන්ට අපාය භූමි (4) සතර මනුෂ්‍ය භූමිය භූම්‍යාශ්‍රිත විනිපාතික අසුර යයි කියන ලද චාතුර්මහාරාජිකයන්ගේ වශයෙන් කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති.

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසය කර්මජ කලාප (3–7–4) තුන සත සතර බැගින් වූ මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ චක්ෂු ශ්‍රෝත සහිත පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ ද යට ඵලසථ ආයථ පුද්ගලයන් තිදෙනාගේ ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති. සංසය ද පෙර සේ ගනු ලැබේ.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, සෝතායතනය පමණක්ම ලැබී චක්ඛායතනය නො ලැබෙන්නා වූ අපායෙහි ඕපපාතිකව උපදින්නා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ ද සංසේදජ ගර්භසෙය්‍යකව උපදින දුගති–සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ ද අපාය භූමි (4) සතරය මනුෂ්‍ය භූමිය භූම්‍යාශ්‍රිත විනිපාතික අසුරයයි කියන ලද චාතුර්මහාරාජිකයන් ගේ වශයෙන් කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

ඝාන මූලියෙහි, චක්ෂුරායතනය පමණක් ලැබී ඝානායතනය නොලැබෙන්නාවූ සංසේදජව ඕපපාතිකව උපදනා වූ දු–සු–අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ, නිරය වර්ජිත අපාය භූමි (3) තුනය මනුෂ්‍ය භූමිය භූම්‍යාශ්‍රිත විනිපාතික අසුර යැයි කියන ලද චාතුර්මහාරාජිකයන්ගේ වශයෙන් කාමාවචර භූමි (5) පස ද රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (4) සතර බැගින්ය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපභූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ අසඤ්ඤසත්ත භූමිය හැර රූපාවචර භූමි (15) පසළොස ද ගනු ලැබෙති.

චක්ඛායතන ඝානායතන දෙකම ලැබෙන්නා වූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිස කර්මජ රූපකලාප (3 – 7) තුන – සත බැගින්ය. යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමභූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුන්ගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති.

[අඝානකව උපදනා තන්හි කුමක් හෙයින් නිරය අත්හරිනු ලැබේ ද? නිරයෙහි ලැබෙන්නේ ඕපපාතික ප්‍රතිසන්ධිය පමණකි. සංසේදජ ආදීහු නොලැබෙති, "අඝානකො ඕපපාතිකො නත්ථි"යයි අට්ඨකථාහි කී බැවින් නිරයෙහි ඝානය නොමැති පුද්ගලයා බැහැර කරනු ලැබේ. අචක්ඛුකව උපදනේ නම් කාමාවචර භූමි (6) සය ද අඝානකව උපදනේ නම් නිරය හැර කාමාවචර භූමි (5) පස ද ස්වරූප වශයෙන් ගත යුතුයි, ජීවභාව ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භ සෙය්‍යකයාට ද නිරය හැර කාමාවචර භූමි (5) පස උදුරන අජිවහකයෙහි

ගර්භ සෙය්‍යකයා ද නිරයෙහි ඕපපාතිකයා ද අත්හරිනු ලැබේ. මේ නය ක්‍රමය තේරුම් ගෙන පුද්ගලෝකාස වාරය අවසානය තෙක් ස්වරූප උදුරා භූමි පිරිසිද කියනු, පුද්ගල වාරය සමඟ අභිධෙය්‍ය විශේෂයෙක් නොමැත.]

**අනුලෝමය නිමි.**

---

## ප්‍රත්‍යනීක - පුද්ගල වාරය

"යස්ස චක්ඛායතනං නුප්පජ්ජති, තස්ස සොතායතනං නුප්පජ්ජතීති, අචක්ඛුකානං සසොතකානං උපපජ්ජන්තානං තෙසං, සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං අසොතකානං උපපජ්ජන්තානං තෙසං" යස්ස වා පන, අසොතකානං උපපජ්ජන්තානං තෙසං"

අනුලෝම අභිධෙය්‍ය (අචක්ඛුකය පෙර සේ කියනු.) චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප කලාප, ජීවිත නවක කර්මජ රූප කලාපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයෝ (4) සිවු දෙනා ද, එලසථ ආයඞ පුද්ගලයෝ (4) සිවු දෙනා ද, චක්ඛායතන සොතායතන දෙකම නොලැබෙන අපායෙහි ඕපපාතිකව උපදනා වූ දුර්ගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද සංසේදජ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද චක්ඛායතන දෙකම ඉපදීමට පෙර චුත වන ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගීවූ අසංඥ සත්ත්ව තලයෙහි උපදනා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද, අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතර, චෛතසික (30) සමතිස යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා ද යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි ද අභිධෙය්‍ය උදුරනු. (පෙර සේ බෙද කියනු.)

ඝානායතන මූලියෙහි (සබ්බෙසං චවන්තානං – පෙර සේ අභිධෙය්‍ය උදුරනු) චක්ඛායතන ඝානායතන දෙක නොලබමින් සංසේදජ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද, චක්ඛායතන ඝානායතන දෙකම ඉපදීමට පෙර චුත වන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගයෝ ද අසංඥ සත්ත්වතලයෙහි උපදනා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයා ද අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා ද යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති.

ජිව්හා මූලියෙහි (සබ්බෙසං චවන්තානං – පෙර සේ කියනු.) චක්ඛායතන – ජිව්හායතන දෙකම ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනාවූ දුර්ගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද (අසංඥතල අරූපතල උපදින්නවුන් බෙද දක්වනු. ජිව්හාව ලැබිය යුතු අය ගන්නා බැවින් ගර්භසෙය්‍යකයාම ගනු ලැබේ.)

කායමූලියෙහි ("සබ්බෙසං චවන්තානං, අචක්ඛුකානං අකායකානං උපපජ්ජන්තානං," කියනු සබ්බෙසං චවන්තානං ස්වරූපං උද්ධරනු) අචක්ඛුක - අකායක යන තැන්හි අසඤ්ඤසත්ත අරූප භූමීන්හි උපදින්නාවුන් ස්වරූප කරනු.

රූප මූලියෙහි "සබ්බෙසං චවන්තානං, අරූපකානං උපපජ්ජන්තානං," කියනු. අරූපකානං - යන තැන අරූතලයෙහි උපදින්නනාහු ස්වරූප කරනු. මනමූලියෙහි "සබ්බෙසං චවන්තානං අචිත්තකානං උපපජ්ජන්තානං," අචිත්තකානං - යන තැන අසඤ්ඤසත්තයෙහි උපදින්නාහු ස්වරූප කරනු. ධම්ම මූලියෙහි "සබ්බෙසං චවන්තානං" පමණි.

ඝානමූල ජිව්හාමූලියෙහි, "සබ්බෙසං චවන්තානං අජිව්හකානං උපපජ්ජන්තානං" කියනු. ඝානායතන ජිව්හායතන දෙක ඉපදීමට පෙර චුතවන්නාවූ ගර්භසෙය්‍යකව උපදනාවූ දූර්ගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද, රූපාවචර අරූපාවචර භූමීන්හි උපදින්නාහු ද ස්වරූප වශයෙන් උද්ධරනු.

කාය මූලියෙහි "සබ්බෙසං චවන්තානං" අකායකානං උපපජ්ජන්තානං, යන තැන රූපාවචර අරූපාවචර භූමීන්හි උපදින්නාහු උද්ධරනු. [රූප මූලාදියෙහි චක්ඛු මූලයට සමානය, මේ නයට අනුව සලකා අවසානය තෙක් ස්වරූප ගනු.]

**පුද්ගල වාරය නිමි.**

---

## ඕකාස වාරය

"යත්ථ චක්ඛායතනං නුප්පජ්ජති තත්ථ ඝානායතනං නුප්පජ්ජතීති, ආමන්තා යත්ථ වා පන, රූපාවචරෙ තත්ථ, අසඤ්ඤසත්තෙ තත්ථ, අරූපෙ තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය, අසංඥ තලය හැර රූපාවචර භූමි (15) පසළොස ගනු ලැබෙති. නැවත අසංඥ තලයද අරූප භූමි (4) සතරද ගනු ලැබෙති. [පාලියෙහි ඇති සේ බෙද ස්වරූප උද්ධරනු, පුද්ගලෝකාස වාරයෙහි අභිධෙය්‍ය පාලි විභංගය පුද්ගල වාරයට වඩා විශේෂයෙක් නොමැත, භූමි විභාගයෙහි ද අනුලෝම පුද්ගලෝකාස වාරය ආශ්‍රය කොට බෙද කියනු.]

**වර්තමාන වාරය නිමි.**

---

[මේ වර්තමාන වාරයෙහි යමක සමූහය වනාහි පුද්ගලවාරයෙහි (66) සසැටෙකි ඕකාස වාරයෙහි (66) සසැටෙකි, පුද්ගලෝකාස වාරයෙහි (66) සසැටෙක් බැගින් ඇත්තාහ. ඔවුන්ගේ විස්සර්ජනයෙහි ශබ්දයතනයට පිළිතුරු නොලැබේ. ප්‍රශ්නයෙහි පමණක් ඇත. ඒ නිසා අට්ඨකථාවෙහි "සද්දයතනස්ස පටිසන්ධික්ඛණෙ අනුප්පත්තිතො තෙන සද්ධිං යමකස්ස විස්සජ්ජන මෙව නත්ථී"යයි කියන ලදි.

මෙසේ (66) සසැටෙක් යමක ලැබිය යුතු නමුත් පෙළෙහි චක්ඛායතන මූලයෙහි යමක (5) පසය, ඝානායතන මූලයෙහි යමක (3) තුනය, රූපමූලයෙහි (2) යමක දෙකය, මන මූලයෙහි (1) යමක එකය, යන මේ (11) එකොළොස්

යමක පමණක්ම ගෙනහැර තැබීම ''සදිස විස්සජ්ජනා'' සමාන පිළිතුරු ඇති බැවින් පාලිය කෙටි කිරීම පිණිස අඩුකොට තබන ලදී. ඒ නිසා'' එකොළසක්ම යමකයෝ ගන්නා ලද්දහ.

මෙසේ චක්ඛුව හා සොත, චක්ඛුව හා ඝාන, යන යමක (2) දෙක, සදිස විස්සජ්ජන ලැබෙන එකෙකි. කුමක් හෙයින් ද යත් ''චක්ඛු සොතායතනානං පවත්තිට්ඨානෙ පන ඝානායතනස්ස න ඒකන්තෙන පවත්තිතො කථං නුඛො එතං විස්සජ්ජෙතබ්බන්ති විමති නිවාරණත්ථං විස්සජ්ජිතං'' යනු අට්ඨකථායි, චක්ඛු - සොත දෙක පවත්නා තත්හි ඝානායතනයාගේ පැවැත්ම ඒකාන්ත නියමයෙක් නැති බැවින් කෙසේ නම් පිළිතුරු දිය යුතු දැයි ඇතිවන විමතිය දුරුකරනු පිණිස විස්සර්ජනාව කරන ලදී. මෙපමණකින් වටහාගත නොහැකි අය අට්ඨකථා ටීකාවන් බලත්වා!]

## අතීත වාරය

වත්මාන වාරය දේශනා කොට වදරා අනතුරුව අතීත වාරය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් ''යස්ස චක්ඛායතනං උප්පජ්ජිත්ථ, තස්ස සොතායතනං උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන, ආමන්තා,''

අනුලෝම අභිධෙය්‍ය උපදින චුතවන සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා ද ඵලසථ ආය්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනා ද ගනු ලැබෙති, (ඝාන - ජිව්හා ආදිය සම්බන්ධ කොට කියන තන්හි ද මේ ක්‍රමය සමානය, ඝානමූල ආදියෙහි ද වෙනසෙක් නොමැත,)

**පුද්ගල වාරය නිමි.** (ඔකාස වාරයෙහි ද වත්මාන වාරය අනුව මැයි,)

## පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය;**– ''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජිත්ථ. තස්ස තත්ථ සොතායතනං උප්පජ්ජිත්ථාති ආමන්තා, යස්ස වා පන යත්ථ ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය පඤ්චවෝකාර භූමියෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද ඵලසථ පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද සුද්ධාවාසය හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ගනු ලැබෙති. සංසය ද එසේමය. ප්‍රතිලෝමය ද එසේමය.

ප්‍රත්‍යනිකයෙහි, ආමන්තා, යනු වෙ අභිධෙය්‍ය, ශුද්ධාවාසයෙහි උපදින - චුතවන අනාගාමි ඵලසථ - අර්හත් ඵලසථ ආය්‍ය්‍ය පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස ද, අසංඥ තලයෙහි අරූප භූමියෙහි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ සහ ඵලසථ ආය්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද අසංඥ තලය හා අරූප භූමි (4) සතර ගනු ලැබෙති.

''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජිත්ථ තස්ස තත්ථ ඝානායතනං උප්පජ්ජිත්ථාති රූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය, රූප භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ සහ ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ. වෙහප්ඵල තෙක් ඇති රූපාවචර භූමි (10) දශය ගනු ලැබෙති. කාම භූමියෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද. ඵලස්ථ ආය්‍ය පුද්ගලයෝ (4) සිවු දෙනාගේ ද කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේය.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ" ශුද්ධාවාසයෙහි උපදින චුතවන අනාගාමී ඵලස්ථ අර්හත් ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් ගේ ශුද්ධාවාස භූමි (5) පසද අසඤ්ඤ තලය ද අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ සහ ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ අරූප භූමි (4) සතරද ගනු ලැබෙති. (ජිව්හා කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ ද මේ හා සමානය.)

රූප මූලයෙහි, අනුලෝමයට, ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි "අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, පඤ්චවොකාරානං තෙසං තත්ථ."

ප්‍රතිලෝම අභිධෙය්‍ය, අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ගනු ලැබේ. පඤ්චවෝකාර භූමියෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. ප්‍රත්‍යනීකයෙහි "සුද්ධාවාසානං. අරූපානං තෙසං තත්ථ"

මනමූලියෙහි, අනුලෝමයට-ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි, "අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ සහ ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද අරූප භූමි (4) සතර ගනු ලැබෙති. පඤ්චවෝකාර භූමියෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ, සහ ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේද ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ගනු ලැබෙති, ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය "සුද්ධාවාසානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" (පෙර සේ ස්වරූප උදුරනු.)

ධම්ම මූලියෙහි, අනුලෝමයට, ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි "අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ" ප්‍රතිලෝම අභිධෙය්‍ය අසංඥ තලයෙහි උපදින-චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලය ද අරූප භූමියෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ සහ ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද අරූප භූමි (4) සතර ගනු ලැබෙති.

(පඤ්චවෝකාර - ස්වරූප උදුරනු.) ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "සුද්ධාවාසානං තෙසං තත්ථ,"



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

**ඝානායතන මූලය**:- ඝානමූල-ජිව්හාමූලීයෙහි ආමන්තා යනු වේ. අභිධෙය්‍ය, කාමාවචර භූමියෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ එලස්ථ පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද කාම භූමි (11) එකොළස ගනු ලැබෙති. ප්‍රත්‍යනිකයෙහි ආමන්තා යනු වේ, අභිධෙය්‍ය රූපාවචර අරූපාවචර භූමීන්හි උපදින-චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ එලස්ථ ආයර් පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද රූපාවචර භූමි (16) සොළස ද අරූපාවචර භූමි )4) සතර ද ගනු ලැබෙති, (කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ-මේ සතර ද සමානය.)

රූපමූලියෙහි අනුලෝමයට ආමන්තා, යනු වේ. ප්‍රතිලෝමයෙහි, "රූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය, රූපාවචර භූමියෙහි උපදින-චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ සහ එලස්ථ ආයර් පුද්ගලයන් (4) සිවු දෙනාගේ ශුද්ධාවාස හැර රූපාවචර භූමි (21) එක්විස්ස යනු ලැබෙති. (කාමාවචර ස්වරූප උදුරනු) ප්‍රත්‍යනිකයෙහි අවශේෂ "සුද්ධාවාසානං, අරූපානං" (පෙර සේ උදුරනු.)

මනමූලියෙහි අනුලෝමයට ආමන්තා, යනු වේ. ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ, (ප්‍රතිලෝමයෙහි ශුද්ධාවාස - අසංඥතලය හැර රූපාවචර භූමි (10) දශය, අරූප භූමි (4) සතර උදුරනු,) ප්‍රත්‍යනිකයෙහි අවශේෂ, "සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං, තෙසං තත්ථ."

ධම්ම මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ, ප්‍රතිලෝමයෙහි, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ," ප්‍රතිලෝම අභිධෙය්‍ය, ශුද්ධාවාස හැර රූපාවචර භූමි (11) එකොළස හා අරූපාවචර භූමි (4) සතර උදුරනු "ප්‍රත්‍යනිකය" "සුද්ධාවාසානං" (ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලයෝ ද ඝානමූලය අනුවම කියනු.)

**රූපායතන මූලය**;- "යස්ස යත්ථ රූපායතනං උප්පජ්ජිත්ථ තස්ස තත්ථ මනායතනං උප්පජ්ජිත්ථාති අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, අරූපානං තෙසං තත්ථ,"

අනුලෝම අභිධෙය්‍ය, අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ගනු ලැබේ. පඤ්චවෝකාර භූමියෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ එලස්ථ ආයර් පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, අරූප භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන, පුද්ගලයාගේ සහ එලස්ථ ආයර් පුද්ගලයන් (4) සිවු දෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබේ.

අනුලෝම සංසයද ගනු ලැබේ. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය ''සුද්ධාවාසානං තෙසං ...'' ධම්ම මූලීයෙහි අනුලෝමයට ආමන්තා යනුවේ. ප්‍රතිලෝමයෙහි, ''අරූපානං තෙසං තත්ථ පඤ්චවොකාරානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, (පෙර සේ උදුරනු, ශුද්ධාවාසය බැහැර කරනු) ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, 'සුද්ධාවාසානං තෙසං තත්ථ,''

**මනායතන මූලය**:- ''යස්ස යත්ථ මනායතනං උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ ධම්මායතනං උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන යත්ථ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, අසංඥ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ගනු ලැබේ. චතුවෝකාර පඤ්චවෝකාර භූමීන්හි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ ඵලස්ථ ආයත පුද්ගලයන් (4) සිවුදෙනාගේද, චතුවෝකාර භූමි (4) සතර සහ ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සද ගනු ලැබෙති, ප්‍රත්‍යනීක අභිධෙය්‍ය ''ශුද්ධාවාසානං තෙසං තත්ථ''

**අතීත වාරය නිමි.**

---

## අනාගත පුද්ගල වාරය

**චක්ඛායතන මූලය**:- අතීත වාරය දේශනා කොට වදරා අනතුරුව අනාගත වාරය වදළ සේක. (බෙදීම පෙර සේ දක්වනු) ''යස්ස චක්ඛායතනං උප්පජ්ජිස්සති තස්ස සොතායතනං උප්පජ්ජිස්සතීති ආමන්තා, යස්ස වා පන ආමන්තා.''

අභිධෙය්‍යාර්, පඤ්චවෝකාර භූමියෙහි නැවත උපදින්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාද යට ඵලස්ථ ආයත පුද්ගලයන් (3) තිදෙනාද අසංඥ තල, අරූතලයෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාද යට ඵලස්ථ ආයත පුද්ගලයන් (3) තිදෙනාද; අසංඥ තල; අරූතලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පුද්ගයෝද ගනු ලැබෙති.

ප්‍රත්‍යනීකයෙහි ආමන්තා, යනුවේ. අභිධෙය්‍ය, චතුවෝකාර පඤ්චවෝකාර භූමීන්හි උපදනාවූ පශ්චිම භවික ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යට ඵලස්ථ ආයත පුද්ගලයන් (3) තිදෙනාය. චුතවන අර්හත් ඵලස්ථ ආයත පුද්ගලයාය, කාම ගති භූමි (7) සත, සුභකිණ්හ බඹලොව තෙක් ඇත්තාවූ රූපාවචර භූමි (9) නවය, යන මේ භූමි වලදී යට මාර්ග පිළිලැබ අරූප භූමියෙහි ඉපද පිරිනිවෙන්නාවූ පඤ්චවෝකාර භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. උපදින - චුතවන යට ඵලස්ථ ආයත පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමියෙහි එකින් එකට ඉපද පිරිනිවෙන්නාවූ අරූතලයෙහි උපදින - චුතවන යට ඵලස්ථ ආයත පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුහු ගනු ලැබෙති.

ඝානමූලියෙහි, ''යෙ රූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, තෙසං, ඉතරෙසං තෙසං''

අභිධෙය්‍ය, කාමසුගති භූමි (7) සතෙන් රූප භූමියට පැමිණ පිරිනිවෙන්නාවූ කාමාවචර භූමයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, රූපාවචර භූමි එකින් එකට ඉපද පිරිනිවෙන්නා වූ රූපභූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) දෙනාය. යන මොවුහු ගනු ලැබෙති.

කාම භූමියෙහි නැවතත් මතු උපදින්නා වූ කාම භූමියෙහි දැනට උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය. රූපාවචර අරූපාවචර භූමීන්හි උපදින - චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යන මොවුහුද ගනු ලැබෙති. සංසය පෙරසේමය.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය ''පච්ඡිම භවිකානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං [චක්ඛු - සොත - ප්‍රත්‍යනිකය අනුව කියනු. ජිව්හා-කාය-ගන්ධ-රස-ඵොට්ඨබ්බ වාරද සමානය. රූපමූලියෙහිද සෝතායතනය අනුව ස්වරූප උද්ධරනු.]

මනමූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි, ''යෙ අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං'' [ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධ වේදනාස්කන්ධ අනුව ස්වරූප උද්ධරනු.] ප්‍රත්‍යනිකයෙහි ''පච්ඡිම භවිකානං තෙසං'' (ධම්මමූලියද සමානය.)

**ඝානායතන මූලය**:- ''යස්ස ඝානායතනං උප්පජ්ජිස්සති තස්ස ජිව්හායතනං උප්පජ්ජිස්සතීති, ආමන්තා, යස්ස වා පන, ආමන්තා,'' අනුලෝම අභිධෙය්‍ය, කාමභූමියෙහි නැවතත් මතු උපදින්නාවූ කාමාවචරයෙහි උපදින - චුතවන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය. රූපාවචර අරූපාවචර භූමියෙහි - උපදින - චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ය. යන මොවුහු ගනු ලැබෙති. සංසයද එසේය ප්‍රත්‍යනිකයෙහි ආමන්තා; යනු පිළිතුරය,

අභිධෙය්‍ය - චතුවෝකාර පඤ්චවෝකාරයෙහි පශ්චිමභවිකව උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයාය, කාම සුගති භූමි (7) සතෙන් රූප භූමියට පැමිණ මතු පිරිනිවෙන්නා වූ කාම භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය. රූපභූමි එකින් එකට මතු මත්තෙහි ඉපද මතු පිරිනිවෙන්නා වූ රූප භූමියෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සත - සුභකිණ්හකය තෙක් ඇති රූප භූමි (9) නවය යන මෙහි දී යට මාර්ග ප්‍රතිලාභ කොට අරූප භූමියට පැමිණ මතු පිරිනිවෙන්නාවූ පඤ්චවෝකාරයෙහි උපදනාවූ ත්‍රිහේතුක ''පෘථග්ජන පුද්ගලයාය,

උපදින - චුතවන යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි මතු මත්තෙහි ඉපද පිරිනිවෙන්නා වූ අරූප භූමියෙහි උපදින - චුතවන යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති. [කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ, මේ සතර සම්බන්ධ කොට ගැනීමෙහි දී මේ ක්‍රමය සමානයි.]

රූප මූලියෙහි, අනුලෝමයට ආමන්තා යනු පිළිතුරය, ප්‍රතිලෝමයෙහි "යෙ රූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, තෙසං ඉතරෙසං තෙසං," (චක්ඛායතනය අනුව උදුරනු..) ප්‍රත්‍යනීකයද සමානයි.

මනමූලියෙහි අනුලෝමයට - ආමන්තා යනු පිළිතුරය, ප්‍රතිලෝමයෙහි "යෙ රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, තෙසං, ඉතරෙසං තෙසං ප්‍රතිලෝම අභිධෙය්‍ය, කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ මතු පිරිනිවෙන්නා වූ කාමාවචර භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, රූපාවචර භූමි එකින් එකට මතු මත්තෙහි ඉපද පිරිනිවෙන්නා වූ රූපාවචර භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය. කාම සුගති භූමි (7) සතෙහි දී සහ සුභකිණ්හකය තෙක් ඇති රූපාවචර භූමි (9) නවයෙහි දී යට මාර්ග ප්‍රතිලාභ කොට අරූප භූමි (4) සතරට පැමිණ මතු පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදනා වූ තිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදින - චුතවන යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය. මතු මතු අරූප භූමියෙහි ඉපද පිරිනිවෙන්නා වූ අරූප භූමියෙහි උපදින - චුතවන යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුහු ගනු ලැබෙති.

කාමාවචර භූමියෙහි නැවතත් උපදින්නා වූ කාමාවචර භූමියෙහි දැනට උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාය. රූපාවචර අරූපාවචර භූමින්හි උපදින - චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ද, ගනු ලැබෙති. ප්‍රත්‍යනීකයෙහි "පච්ඡිමභවිකානං තෙසං" [ධම්මමූලියෙහි ද මීට සමානය, ජිව්හා කාය මූලය ද ඝාන මූලයට වඩා වෙනසෙක් නොමැත.]

**මනායතන මූලය:-** මනායතන මූල ධම්මායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා, යනු පිළිතුරය, අභිධෙය්‍ය - පශ්චිමභවිකයා හැර සියලුම උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය. යන මොවුහු යනු ලැබෙති. ප්‍රත්‍යනීකයෙහි ආමන්තා, යනු පිළිතුරය, අභිධෙය්‍ය පශ්චිමභවිකයා උදුරනු. [ස්කන්ධ යමකයෙහි වේදනාස්කන්ධ මූලී අනුවම වේ. මනායතන-ධම්මායතන යන මේ දෙක අතුරෙන් මනායතනයට වඩා ධම්මායතනයට බොහෝ විස්තර දක්වන ලද්දේ කවර හෙයින් ද යත්, අසංඥ සත්ත්ව භූමියෙහි පශ්චිම භවිකයකු නොවිය හැකි බැවිනි, මේ පුද්ගල වාරයෙහි අනුලෝම ප්‍රතිලෝම විස්සර්ජනා සමාන වෙති.]

**පුද්ගල වාරය නිමි.**

(ඕකාස වාරය ද වර්තමාන වාරය අනුව වේ.)

# පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය;–** ''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජිස්සති, තස්ස තත්ථ සෝතායතනං උප්පජ්ජිසතීති, ආමන්තා. යස්ස වා පන යත්ථ ආමන්තා,''

අනුලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි චක්ඛායතන සෝතායතන දෙක මතු උපදින්නාවූ පඤ්චවෝකාර භූමියෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ගනු ලැබෙති, සංසයද එසේය.

[තමන් ඉපද සිටින කාමාවචර භූමියෙහි චක්ඛු සොත ඉදින් අඩු කරන ලද්දේ නම්, චක්ඛු සොත මතු නොලැබෙන සේ සලකනු ලැබේ. නැවත ලැබෙන්නේ නමුත් චක්ඛායතන සොතායතන ලැබෙන බව විශේෂයෙන් නොකියනු ලැබේ. මෙවැනි තන්හි මේ ක්‍රමය අනෛකාන්ත බව දත යුතුය.]

ප්‍රත්‍යනීකයට ආමන්තා, යනුවේ. අභිධෙය්‍ය පඤ්චවෝකාර භූමියෙහි උපදනාවූ පශ්චිමභවික ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය. චුතවන අර්හත් ඵලසථ ආයතී පුද්ගලයාය, මේ පුද්ගලයන්ගේ අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සද තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ පඤ්චවෝකාර භූමියෙහි උපදින–චුතවන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ අකනිට්ඨය හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සද අසංඥතලයෙහි උපදින – චුතවන සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලයද අරූප භූමියෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. ඵලසථ ආයතී පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරද ගනු ලැබෙති.

''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජිස්සති තස්ස තත්ථ ඝානායතනං උප්පජ්ජිස්සතීති, රූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ. යස්ස වා පන යත්ථ ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ රූපාවචර භූමියෙහි උපදින–චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ වෙහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශය ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු චක්ඛායතන ඝානායතන දෙක උපදින්නාවූ කාමාවචර භූමියෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලසථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ කාමාවචර භූමි (11) එකොළසද ගනු ලැබෙති. සංසයද පෙර සේ ගනු ලැබේ, ප්‍රත්‍යනීක අභිධෙය්‍ය **''පඤ්චවෝකාරේ පච්ඡිමභවිකානං අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ''** **[චක්ඛු හා සොත – ප්‍රත්‍යනීකය අනුව උද්ධරනු ජිව්හා – කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ මූලයෝද මීට සමානයහ.]**

රූපමූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. පටිලෝමයෙහි "අසඤ්ඤසත්තානං තෙසං තත්ථ පඤ්චවෝකාරානං තෙසං තත්ථ" ප්‍රතිලෝම අභිධෙය්‍ය අසඤ්ඤසත්ව භූමියෙහි මතු නැවතත් උපදින්නාවූ අසඤ්ඤසත්වයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ව භූමිය ගනු ලැබේ.

තමන් ඉපද සිටින භූමියෙහි නැවතත් උපදින්නාවූ පඤ්චවෝකාර භූමියෙහි උපදින–චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ ශුද්ධාවාස භූමිය හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්සද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "පඤ්චවෝකාරෙ පච්ඡිමභවිකානං අරූපානං තෙසං තත්ථ, පශ්චිමභවිකව පඤ්චවෝකාරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ අපාය භූමිය හැර පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ගනු ලැබෙති. (ඒකාන්ත වශයෙනි) තමන් ඉපද සිටින්නාවූ භූමියෙහි නැවත නූපදින්නාවූ පඤ්චවෝකාර අසඤ්ඤසත්ත භූමින්හි උපදින–චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනාය, යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සද, අසඤ්ඤසත්ත භූමියද (අනේකාන්ත) අරූප භූමියෙහි උපදින–චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාය එලසථ ආයඞ පුද්ගලයන් (4) සිවුදෙනාය යන මොවුන්ගේ අරූප භූමි (4) සතරද ගනු ලැබෙති.

මනමූලියෙහි, අනුලෝමයට ආමන්තා, යන පිළිතුරය. ප්‍රතිලෝමයෙහි "අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ, "ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ අරූප භූමියෙහි උපදින–චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ අරූප භූමි සතර ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ පඤ්චවෝකාර භූමියෙහි උපදින-චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්සද ගනු ලැබෙති. සංසය පෙරසේ උදුරනු.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "පච්ඡිමභවිකානං (21) සඤ්ඤසත්තානං තෙසං තත්ථ" පශ්චිමභවිකව චතුවෝකාර පඤ්චවෝකාර භූමින්හි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් එලස්ථ ආයඞ පුද්ගලයාය යන මොවුන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සද, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ චතුරවෝකාර පඤ්චවෝකාර භූමින්හි උපදින–චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ චතුවෝකාර භූමි (4) සතරද. අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සද, අසඤ්ඤසත්ත භූමියෙහි උපදින–චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත භූමියද යන මෙ භූමි ගනු ලැබෙති.

ධම්ම මූලියෙහි අනුලෝමයට, ආමන්තා යනු පිළිතුරය, ප්‍රතිලෝමයෙහි ''අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ''

ප්‍රතිලෝම අභිධෙය්‍ය අසඤ්ඤසත්ත භූමියෙහි නැවත උපදින්නා වූ අසඤ්ඤසත්තයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත භූමිය ද, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ අරූප භූමියෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ අරූප භූමි සතර ද ගනු ලැබෙති. [පඤ්චවෝකාර ස්වරූප උද්‍ධරනු] ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''පච්ඡිම භවිකානං තෙසං තත්ථ'' [පශ්චිම භවික ඒකාන්ත වාරය කියනු අනෝකාන්තයෙහි අසඤ්ඤසත්තය උද්‍ධරා කියනු.]

**චක්ඛායතන මූලය නිමි.**

---

ඝානායතනමූල ජිව්හායතනමූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. අනුලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින්නා වූ භූමියෙහි නැවත උපදින්නා වූ කාමාවචරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුන්ගේ කාමාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති. සංසය ද එසේය. ප්‍රතිලෝමය ද එසේය.

ප්‍රත්‍යනිකයෙහි අනුලෝමයට ආමන්තා යනු පිළිතුරය. අභිධෙය්‍ය, පශ්චිම භවිකව කාමාවචර භූමියෙහි උපදින්නා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය, චුතවන්නා වූ අර්හත් ඵලසථ ආයතී පුද්ගලයාය. යන මොවුන්ගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ කාමාවචර භූමියෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ කාමභූමි (11) එකොළස ද, රූප – අරූප භූමීන්හි උපදින – චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ය, ඵලස්ථ ආයතී පුද්ගලයන් (4) සිවු දෙනාය, යන මොවුන්ගේ රූපාවචර භූමි (16) සොළස හා අරූපාවචර භූමි (4) සතර ගනු ලැබෙති, [කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ වාරයෝ ද මේ ක්‍රමයට සමානය.]

රූපමූලියෙහි අනුලෝමයට ආමන්තා, යනු පිළිතුරය, ප්‍රතිලෝමයෙහි ''රූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ'' ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ රූපාවචර භූමියෙහි උපදින – චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ ශුද්ධාවාස හැර රූරාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති. [කාමාවචර ස්වරූප පෙර සේ උද්‍ධරනු.] ප්‍රත්‍යනික අභිධෙය්‍ය ''පඤ්චවෝකාරෙ පච්ඡිම භවිකානං, අරූපානං තෙසං තත්ථ (චක්ඛු හා රූප වාරය අනුව ස්වරූප උද්‍ධරනු.)

මනායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු පිළිතුරය, ප්‍රතිලෝමයෙහි ''රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ'' ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින්නා වූ භූමියෙහි නැවත උපදින්නා වූ

රූපාවචර අරූපාවචර භූමියෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ වේහප්ඵලයනෙක් ඇති රූපාවචර භූමි (10) දසය හා අරූපාවචර භූමි (4) සතර ගනු ලැබෙති. [කාමාවචර ස්වරූප පෙරසේ උදුරනු.] ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "පච්ඡිම භවිකානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ"

ධම්මමූලියෙහි අනුලෝමයට ආමන්තා, යනු වේ. ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ, "ප්‍රතිලෝම අභිධෙය්‍ය, [මනායතන මූලිය අනුවම අසඤ්ඤ සත්ත භූමිය ඇතුලත් කොට ස්වරූප උදුරනු. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "පච්ඡිම භවිකානං තෙසං තත්ථ" ඝානායතන මූලය නිමි. ජිව්හා – කාය–ගන්ධ – රස – ඵොට්ඨබ්බ වාරයෝද මේ අනුවම වෙති.)

**රූපායතන මූලය**:– "යස්ස යත්ථ රූපායතනං, උප්පජ්ජිස්සති, තස්ස තත්ථ මනායතනං උප්පජ්ජිස්සතීති, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ – අරූපානං තෙසං තත්ථ" [ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධ හා වේදනාස්කන්ධය අනුව උදුරනු.] ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "පච්ඡිම භවිකානං තෙසං තත්ථ," [අසඤ්ඤ සත්තය අනේකාන්තයට ඇතුලත් වේ.]

ධම්ම මූලියෙහි අනුලෝමයට ආමන්තා, ප්‍රතිලෝමයෙහි, "අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ අරූතලයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ අරූපභූමි (4) සතර ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස හා අසඤ්ඤ සත්ත භූමියද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "පච්ඡිමභවිකානං තෙසං තත්ථ" ඒකාන්තවාරයයි, අනේකාන්තයට අසඤ්ඤසත්තය ඇතුලත් වේ.

**මනායතන** මූලය;– මනායතන මූල ධම්මායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු පිළිතුරයි. ප්‍රතිලෝමයෙහි අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ, චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය අසඤ්ඤ සත්ත භූමියෙහි මතු නැවතත් උපදින්නා වූ අසංඥ තලයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ත භූමිය ගනු ලැබේ. තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ චතුවෝකාර පඤ්චවෝකාර භූමියෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන්

(4) සිවුදෙනාය, යට ඵලසථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ **අරූප භූමි** (4) සතරය ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ගනු ලැබෙති.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, පච්ඡිම භවිකානං තෙසං තත්ථ, (ස්වරූප පෙර සේ කියනු.)

**අනුලෝමය නිමි,**

(ප්‍රත්‍යනිකයෙහි ද අවශේෂ සංසය ස්වරූප බෙද කියනු. අනුලෝමයෙ අනුලෝම – ප්‍රතිලෝම දෙක මාරු කොට කියනු. වෙනසෙක් නොමැත.)

**අනාගත වාරය නිමි.**

---

## වත්‍තීමානාතීත වාරය

**චක්ඛායතන මූලය;–** අනාගත වාරය දේශනා කොට වදරා අනතුරුව වත්‍තීමානාතීත වාරය වදළ සේක. (පෙර සේ බෙද කියනු.) කෙසේ වදළ සේක් ද යත් ''යස්ස චක්ඛායතනං උප්පජ්ජති තස්ස සොතායතනං උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන – සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං සචක්ඛුකානං **උපපජ්ජන්තානං** තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප කලාප යන මේ නාමරූපයන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, ඵලසථ ආයති පුද්ගලයන් (4) සිවු දෙනාය, චක්ඛායතනය නොලැබෙන්නා වූ අපාය ඕපාතික ව, උපදනා වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය, සංසේදජ ගර්භසෙය්‍යකව උපදනා වූ දුගති – සුගති – අහේතුක පෘථග්ජන පුද්ගලයාය, චක්ඛායතනය ඉපදීමට පෙර වුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය.

ප්‍රථම ජීවිත නවක රූප කලාපයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥ තලයෙහි උපදනා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය.

අරූප ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (30) සමතිසය; යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අරූතලයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලසථ ආයති පුද්ගලයන් (3) තිදෙනා යන මොවුහු ගනු ලැබෙති.

චක්ඛායතනය ලැබෙන්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසය කර්මජ රූප කලාප (3 – 7 – 4) තුන – සත – සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ඛුක ව පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසථ ආයති පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍යං පෙර

සේමය. [ඝානායතන මූලි - මන - ධම්මායතන මූලි සියල්ල සමානමැයි අතීත පුද්ගල වාරය සියල්ල එක්වැනි බැගින් සමානයි. ප්‍රත්‍යනිකයෙහි අතිරේකයක් නොමැත. ''උප්පජ්ජිත්ථ හා ''නත්ථි'' යනුම වේ.]

**ඝානායතන මූලය;**- ඝානායතන මූල ජිව්හායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු පිළිතුරය. ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං අඝානකානං උපපජ්ජන්තානං තෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කම්ජ රූප කලාපයෝය. යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය, ඝානායතනය නොලබන්නා වූ; සංසේදජ - ගර්භ-සෙය්‍යකව උපදින දුගති-අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. ඝානායතනය ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. මහත්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) පන්තිස, කම්ජ කලාප (4) සතර බැගිනි, ප්‍රථම ජීවිත නවක රූප කලාපයන්ගේ ද යන මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර - අරූපාවචර භූමීන්හි උපදනා වූ සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ඝානායතනය ලැබෙන්නා වූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය, කම්ජ රූප කලාප (3 - 7) තුන - සත බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ සඝානකව කාම භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

**ජිව්හායතන මූලය:**- ජිව්හායතන මූල කායායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු පිළිතුරය. ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං; අජිව්හකානං උපපජ්ජන්තානං තෙසං, සජිව්හකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කම්ජ කලාප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය. ජිව්හායතනය ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදින දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. මහත්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) පන්තිසය, කම්ජ කලාප (4) සතර බැගිනි ප්‍රථම ජීවිත නවක කලාපය, යන මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර අරූපාවචර භූමීන්හි උපදනා වූ සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට එලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**ජිව්හායතනය** ලැබෙන්නා වූ කාමාවචර **ප්‍රතිසන්ධි** (10) දසය, චෛතසික (33) තෙතිසය, කර්‍මජ කලාප (3 – 7) තුන සත බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාමාවචරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලසථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**කායායතන මූලය;**– කායායතන මූල රූපායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං අකායකානං උපපජ්ජන්තානං තෙසං සකායකානං උපපජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, සියලුම චුතවන්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. ඵලස්ථ ආර්ය පුද්ගලයන් (4) සිවු දෙනාය. මහත්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික පන්තිස, කර්‍මජ කලාප (4) සතර බැගිනි, ප්‍රථම ජීවිත නවක කලාපය යන මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපාවචර භූමියෙහි උපදිනා වූ සුගති–අහේතුක–ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය කර්‍මජ කලාප (3 – 7) තුන - සත බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාමාවචර භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සතරදෙනාය. යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති,

**මනායතන මූලය:**– මනායතන මූල ධම්මායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං අචිත්තකානං උපපජ්ජන්තානං තෙසං සචිත්තානං උප්පජ්ජන්තානං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චුතවන්නා වූ සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය. අසංඥ තලයෙහි උපදනාවූ සුගති අහේතුක පුද්ගලයාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිසය, කර්‍මජ කලාප (3 – 7 – 4) තුන සත – සතර බැගින් යන මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ චතුවෝකාර පඤ්චවෝකාර භූමීන්හි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝද ගනු ලැබෙති.

**පුද්ගල වාරය නිමි.** (ඕකාස වාරය සුගමයි.)

---

## පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය:**– ''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජති තස්ස තත්ථ සොතායතනං උප්පජ්ජිත්ථාති, සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,''

**යස්ස වා පන යත්ථ:**- පඤ්චවෝකාරා චවන්තානං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,''

අනුලෝම අභිධෙය්‍ය රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිත් (1), එකය, චෛතසික (30) සමතිසය, කර්මජ කලාප (4) බැගින් යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සුද්ධාවාසයෙහි උපදනා වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3 – 7 – 4) තුන සත සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ෂුකව පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සද ගනු ලැබෙති, සංසය ද පෙර සේ ගනු ලැබේ.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙන් චුතවන්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය, යන මොවුන්ගේ ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය, චක්ඛායතනය නොලැබෙන අපායෙහි ඕපපාතිකව උපදනාවූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය, සංසේදජ – ගර්භසෙය්‍යකව උපදනා වූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය චක්ඛායතනය ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය, මනුෂ්‍ය භූමිය භූම්‍යාශ්‍රිත විනිපාතික අසුර නම් වූ චාතුර්මහාරාජිකයන්ගේ වශයෙන් කාමාවචර භූමි (6) සය, ගනු ලැබෙති. අනුලෝම සංසයට ද එසේම ලැබේ.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං අසඤ්ඤ සත්තානං, අරූපානං තෙසං තත්ථ,'' රූපාවචර පඤ්චමධ්‍යාන චුති සිත් (1) එකය, චෛතසික (30) තිසය. අන්තිම කර්මජ රූපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ ශුද්ධාවාසයෙහි චුතවන පිරිනිවෙන අනාගාමී, අර්හත් පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති.

**නොහොත්;**- රූපාවචර පඤ්චමධ්‍යාන චුති සිත් (1) එකය චෛතසික (30) සමතිසය, අන්තිම කර්මජ රූපය, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ ශුද්ධාවාසයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාගේ ශුද්ධාවාස භූමි (5) පසය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ රූපාවචර පඤ්චමධ්‍යාන චුති චිත්තය චෛතසික (30) සමතිසය, අන්තිම කර්මජ රූපයෝය, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ ශුද්ධාවාසයෙන් චුතවන්නා වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුදස්සී බඹතලය තෙක් ශුද්ධාවාස භූමි (4) සතරය අසඤ්ඤසත්තයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය, අරූපයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය. යන මොවුන්ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති.

[ශුද්ධාවාසයෙහි පිරිනිවෙන ක්‍රමදෙක දක්වූ තැන, පළමු ක්‍රමය ඒකාන්ත - අනේකාන්ත දෙක එක්තැන් කොට කියන ලදි. දෙවැනි ක්‍රමය වනාහි පිරිනිවෙන යන්න දෙකට බෙද දක්වූ පිළිවෙලය. මින් පසුවද සුද්ධාවාසයෙහි පිරිනිවෙන පදය දක්වෙන්නේ නම් දෙවැනි ක්‍රමය කියා ඒකාන්ත - අනේකාන්ත වෙන් කොට කියනු.]

ඝානායතන මූලියෙහි "රූපාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ-කාමාවචරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ,"

අනුලෝම අභිධෙය්‍ය, රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය, චෛසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (4) සතර බැගින්ය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපාවචර භූමියෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත භූමි වර්ජිත රූපාවචර භූමි (15) පසලොස ගනු ලැබෙති.

චක්ඛායතනය ලැබෙන්නාවූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දසය, චෛතසික (33) තෙතිසය කර්මජ කලාප (3 - 7) තුන - සත බැගින් ඇති මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ කාමාවචර භූමියෙහි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයන්ගේ කාමාවචර භූමි (11) එකොළසද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ ලැබෙ.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, කාමාවචර චුති සිත් (10) දසය, චෛතසික (33) තෙතිස, අන්තිම කර්මජ රූපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාම භූමියෙහි චුතවන්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, යන මේ පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසද අචක්ඛුකව කාමභූමියෙහි උපදනාවූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරද මනුෂ්‍ය භූමිය, භූම්‍යාශ්‍රිත විනිපාතික අසුර නම්වූ චාතුර්මහාරාජිකයන් ගේ වශයෙන් කාමාවචර භූමි (6) සයද ගනු ලැබෙති. අනුලෝම සංසයද එසේම ලැබෙ. (අචක්ඛුකව උපදින-යන්න සවිස්තරව කියනු.)

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, - "රූපාවචරා චවන්තානං, අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ,"

රූපාවචර චුති සිත් (5) පසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපයෝය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ රූපාවචරයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, ඵලසථ ආයර්‍ය පුද්ගලයෝ (4) සිවුදෙනාය යන මේ පුද්ගලයන්ගේ අසංඥ තලය හැර රූපාවචර භූමි (15) පසළොසද, අසංඥ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලයද. අරූප භූමියෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරද ගනු ලැබෙති. [ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලි වාරයෝද මේ අනුවම වෙති.]

රූපායතන මූලියෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ,-පඤ්චවෝකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,''

[අනුලෝමයෙහි අභිධෙය්‍ය, සොතමූලී වාර මෙන් උදුරනු. ප්‍රතිලෝමයෙහි ද ''පඤ්චවෝකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං'' යන්නෙහි අභිධෙය්‍ය ද සෝතමූලී ප්‍රතිලෝමයෙහි අභිධෙය්‍ය අනුවම වේ,]

අසඤ්ඤ සත්තයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ගනු ලැබේ. (මෙහිදී අසඤ්ඤසත්තය කීම පමණක් වෙනසි.) ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං, අරූපානං තෙසං තත්ථ,'' (පෙර සේ කියනු.)

මනායතන මූලියෙහි ද, අනුලෝමය සමානයි, ප්‍රතිලෝමයෙහි ''පඤ්චවෝකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං, අරූපානං තෙසං තත්ථ, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,'' (මෙහි ද රූපමූලියෙහි ''අසඤ්ඤසත්තානං'' යන තැන ''අරූපානං'' කීම පමණක් විශේෂයි.)

ප්‍රත්‍යනික අභිධෙය්‍ය - ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ'' (පෙර සේ උදුරනු) ධම්මායතන මූලියෙහි ද අනුලෝමයට සමානය, ප්‍රතිලෝමයෙහි සබ්බෙසං චවන්තානං, අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,'' (අනුලෝමය පෙර සේ උදුරනු.)

ප්‍රතිලෝම අභිධෙය්‍ය, චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය, අසංඥ තලය, අචක්ඛුකව කාමභූමියෙහි උපදනාවූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ය, යන මේ පුද්ගලයන්ගේ කාම භූමි (6) සයය. (විස්තර කරනු.) අසංඥ තලයෙහි උපදනා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ අසංඥ තලය අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ සහ යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ, (පෙර සේ උදුරනු.)

**චක්ඛායතන මූලය නිමි,**

---

## ඝාණායතන මූලය

ඝාණායතන මූල ජිව්හායතන මූලියෙහි, අනුලෝමයට ආමන්තා යනු පිළිතුරය, ප්‍රතිලෝමයෙහි ''කාමාවචරා චවන්තානං, අඝාණකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සඝාණකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය, කාමාවචර චුති සිත් (10) දශය, චෛතසික (33) තෙතිස අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ කාමභවයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, එලස්ථ ආර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය. මේ පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස ද, ඝ්‍රාණායතනය නොලබන සංසේදජ - ගර්භසෙය්‍යකව උපදින දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ සහ ඝ්‍රාණායතනය ලැබීමට පෙර චුතවන්නාවූ ගර්භසෙය්‍යකව උපදින දු - සු - අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ නිරය වර්ජිත අපාය භූමි (3) තුනය, මනුෂ්‍ය භූමිය භූම්‍යාශ්‍රිත විනිපාතික අසුර නම වූ චාතුර්මහාරාජිකයන්ගේ වශයෙන් කාමාවචර භූමි (5) පස ගනු ලැබෙති.

ඝ්‍රාණායතනය ලැබෙන්නාවූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3 – 7) තුන - සත, බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සඝ්‍රාණකව කාමාවචර භූමියෙහි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද යට එලස්ථ ආර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ ද කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ," රූපාවචර - අරූපාවචර භූමීන්හි උපදින - චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ ද එලස්ථ ආර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද රූපාවචර භූමි (16) සොළස සහ අරූපාවචර භූමි (4) සතර ගනු ලැබෙති. [කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලිහු ද මේ ජිව්හාමූලිය අනුව බෙදනු.]

රූපායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි "කාමාවචරා චවන්තානං, අඝානකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං තෙසං තත්ථ, සඝානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය, කාමාවචර භූමියෙහි චුත වන්නාවූ සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද එලස්ථ ආර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද කාම භූමි (11) එකොළස ද, අඝ්‍රාණකව කාම භූමියෙහි උපදනාවූ දුගති සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ නිරය වර්ජිත කාමාවචර භූමි (5) පසද, (කෙටියෙන් කී තැන විස්තර වශයෙන් ස්වරූප උද්ධරනු.) රූපාවචරයෙහි චුතවන්නාවූ සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ ද, එලස්ථ ආර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද සුද්ධාවාස හැර රූපාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති. සංසය "සඝානකානං" යන්න (උද්ධරනු) ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "සුද්ධාවාසානං, අරූපානං තෙසං තත්ථ," (පෙර සේ අභිධෙය්‍ය උද්ධරනු.)

මනායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා, යනු වේ. ප්‍රතිලෝමයෙහි "කාමාවචරා චවන්තානං, අඝානකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, සඝානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය, "කාමාවචරා චවන්තානං, අඝානකානං උපපජ්ජන්තානං" (පෙර සේ බෙදනු.) රූපාවචර - අරූපාවචර භූමීන්හි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා එලස්ථ ආර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ

වෙහප්ඵලය තෙක් ඇති රූප භූමි (10) දසය, අරූප භූමි (4) සතර ගනු ලැබෙති. සංසය "සසානකානං" (පෙර සේ උදුරනු) ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, (පෙර සේ උදුරනු.)

ධම්මමූලියෙහි අනුලෝමයට ආමන්තා, යනු වේ. ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං චවන්තානං අසානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සසානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය. සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ එලසථ ආයතී පුද්ගලයන් (4) සිවුදෙනාගේ කාම භූමි (11) එකොළසද රූපාවචර භූමි (16) සොළසද අරූප භූමි (4) සතරද ගනු ලැබෙති. අසානකව කාම භූමියෙහි උපදනාවූ දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පසද, මහත්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (4) සතර බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර-අරූපාවචර භූමියෙහි උපදනා වූ සුගති අහේතුක-ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ සහ යට එලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ ශුද්ධාවාස වර්ජිත රූපාවචර භූමි (11) එකොළස, අරූපාවචර භූමි (4) සතර ගනු ලැබෙති.

සසානකව උපදින්නා වූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දසය, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3-7) බැගින් ඇති මෙ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාම භූමියෙහි උපදනා වූ දුගති-සුගති පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ යට එලසථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (10) දශයද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "සුද්ධාවාසානං" (පෙර සේ බෙද උදුරනු.)

## ජිව්හායතන මූලය

ජිව්හායතන මූල කායමූලියෙහි අනුලෝමයට ආමන්තා, ප්‍රතිලෝමයෙහි "කාමාවචරා චවන්තානං අජිව්හකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සජිව්හකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝම අභිධෙය්‍ය කාමාවචර භූමියෙහි චුතවන්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ එලසථ ආයතී පුද්ගලයන් (4) සිවුදෙනාගේ කාම භූමි (11) එකොළසය ජිව්හායතනය ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනාවූ දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ නිරය වර්ජිත කාමාවචර භූමි (5) පස ගනු ලැබෙති. අජිව්හකව කාම භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ, යට එලසථ ආයතී පුද්ගයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළසද ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය ''රූපාවචරානං අරූපාවචරානං'' [ඝාන මූලය අනුව අජිව්හකයෙහි දී ''ජිව්හායතනය ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ'' මේ අන්තිම කීම පමණක් විශේෂයි.]

**කායායතන මූලය:–** කායායතන මූල රූපමූලියෙහි අනුලෝමයට ආමන්තා යනු වේ. ප්‍රතිලෝමයෙහි ''කාමාවචරා චවන්තානං රූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරං උප්පජ්ජන්තානං තෙසං තත්ථ,''

ප්‍රතිලෝම අභිධෙය්‍ය කාම භූමියෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාගේ ද එලසථ ආයඝ පුද්ගලයන් (4) සිව්දෙනාගේ ද කාම භූමි (11) එකොළස ද, රූප භූමියෙහි උපදින–චුතවන සුගති අහේතුක–ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ ද එලසථ ආයඝ පුද්ගලයන් (4) සිව්දෙනාගේ ද ශුද්ධාවාස වර්ජිත රූපාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති, කාමාවචරයෙහි උපදින්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාගේ ද යට එලසථ ආයඝ පුද්ගලයන් (2) දෙදෙනාගේ ද කාම භූමි (11) එකොළස ද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය සුද්ධාවාසානං අරූපානං තෙසං තත්ථ,''

මනායතන මූලියෙහි ප්‍රතිලෝමයෙහි ''කාමාවචරා චවන්තානං රූපාවචරානං අරූපාවචරානං'' [සුද්ධාවාස අත්හරිනු, ප්‍රත්‍යනීකයෙහි ''සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' පෙර සේ කියනු.]

ධම්මායතන මූලියෙහි අනුලෝමයට, ආමන්තා ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං අකායකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාගේ, එලස්ථ ආයඝ පුද්ගලයන් (4) සිව්දෙනාගේ කාම භූමි (11) එකොළස, රූප භූමි (16) සොළස අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (පෙර සේ කියනු)

රූපාවචර අරූපාවචර භූමින්හි උපදනා වූ සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට එලස්ථ ආයඝ පුද්ගලයන් (3) තිදෙනාගේ ශුද්ධාවාස වර්ජිත රූප භූමි (11) එකොළස අරූප භූමි (4) සතර ගනු ලැබෙති. කාමාවචර භූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාගේ යට එලස්ථ ආයඝ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළස ද ගනු ලැබෙති ප්‍රත්‍යනීක ''සුද්ධාවාසානං තෙසං තත්ථ,''

**රූපායතන මූලය:–** රූපායතන මූල ගන්ධායතන මූලියෙහි ''රූපාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, කාමාවචරා චවන්තානං තෙසං තත්ථ,''

අනුලෝම අභිධෙය්‍ය, රූපාවචරයෙහි උපදනා වූ සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට එලස්ථ ආයඝ පුද්ගලයන් (3) තිදෙනාගේ රූප භූමි (16) සොළස ගනු ලැබෙති. කාමාවචරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාගේ ආයඝ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළස ද ලැබෙති.

ප්‍රතිලෝම අභිධෙය්‍ය කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ එලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ කාම භූමි (11) එකොළස ගනු ලැබෙති. අනුලෝම සංසය ද එසේමය. ප්‍රත්‍යනීක, ''රූපාවචරා චවන්තානං, අරූපානං තෙසං තත්ථ,'' (පෙර සේ කියනු.)

මනායතන මූලියෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සරූපකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ . යස්ස වා පන යත්ථ – පඤ්චවොකාරා චවන්තානං, අරූපානං තෙස තත්ථ''

ප්‍රත්‍යනීකය, ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ'' [ස්කන්ධ යමක රූපස්කන්ධ වෙදනාස්කන්ධ අනුව උදුරනු.]

ධම්මායතන මූලියෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සරූපකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ සබ්බෙසං චවන්තානං, අරූපකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' (අනුලෝම පෙර සේ උදුරනු) ප්‍රතිලෝම අභිධෙය්‍ය, සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ එලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ කාම භූමි (11) එකොළස රූප භූමි (16) සොළස, අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (විස්තර ලෙස කියනු) අරූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ යට එලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. ප්‍රත්‍යනීකය, ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ''

**මනායතන මූලය:**– මනායතන මූල ධම්මායතන මූලියෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචිත්තකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, සබ්බෙසං චවන්තානං අචිත්තකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' (පෙර සේ උදුරනු) ප්‍රත්‍යනීකයෙහි ''සුද්ධාවාසේ පරිනිබ්බන්තානං තෙසං තත්ථ,'' අනුලෝමය නිමි.

[ප්‍රත්‍යනීකය ද අවසේස සංසය ද යට කියන ලදී. අනුලෝමය මාරුකොට කියනු.]

**වර්තමානාතීත වාරය නිමි.**

---

## වර්තමානානාගත වාරය

**චක්ඛායතන මූලය:**– වර්තමානාතීත වාරය දෙශනා කොට වදරා වර්තමානානාගත වාරය වදාළ සේක. (පද බෙද පෙර සේ කියනු) ''යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස සොතායතනං උපපජ්ජිස්සතීති, පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උප්පජ්ජන්තානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය පඤ්චවෝකාරයෙහි ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) **පන්තිස කර්මජ** කලාප (3 – 7 – 4) තුන සත සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලසථ ආයඹ පුද්ගලයෝ (3) තිදෙනාය, කාමසුගති භූමි (7) සතෙහිදී ද සුභකිණ්හකතෙක් රූපාවචර භූමි (9) නවයේදී ද යට මාර්‍ග ලබා අරූප භූමියෙහි ඉපිද මතු පිරිනිවෙන්නාවූ, පඤ්චවෝකාරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යට ඵලසථ ආයඹ පුද්ගලයෝ (3) තිදෙනාය. යන මොවුහු ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි මතු උපදින්නාවූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසය කර්මජකලාප (3 – 7 – 4) තුන සත සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි සචක්ඛුකව උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයඹ පුද්ගලයෝ (3) තිදෙනාය යන මොවුහු ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙරසේ ගනු ලැබේ.

ප්‍රතිලෝම අභිධෙය්‍ය පඤ්චවෝකාර භූමියෙහි නැවත උපදින්නාවූ චුති සිත් (19) එකුන් විස්සය. චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ කලාප, ජීවිත නවක රූප කලාපයන්ගේ ද භංගක්ෂණ සමංගීවූ චුතවන සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයඹ පුද්ගලයන් (3) තිදෙනාය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදනාවූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, අසංඥ තලයෙහි අරූතලයෙහි උපදනාවූ සුගති – අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මොවුහු ගනු ලැබෙති. [පඤ්චවෝකාරයෙහි නැවත උපදින්නාවූ යන විශේෂණය අන්තිම දක්වා ගනු ලැබේ.] අනුලෝම යංසය ද එසේම ලැබේ,

ප්‍රත්‍යනීක, ''අභිධෙය්‍ය පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම–භවිකානං යෙව අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං''

පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති සිත් (9) නවය චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථ ආයඹ පුද්ගලයෝය. පශ්චිම භවිකව අරූපයෙහි උපදනාවූ යට ඵලස්සථ ආයඹ පුද්ගලයෝ (3) තිදෙනාය චුතවන අර්හත් ඵලසථ පුද්ගලයෝය. කාම සුගති භූමි (7) සතෙහිදීද සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහිදී ද යට මාර්‍ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවෙන්නාවූ පඤ්චවෝකාරයෙහි චුතවන යට ඵලසථ ආයඹ පුද්ගලයන් (3) අරූප භූමි මතු මත්තෙහි එකින් එක ඉපද පිරිනිවෙන්නාවූ අරූතලයෙහි උපදින – චුතවන යට ඵලසථ ආයඹ පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

සානායතන මූලීයෙහි ''පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං යෙව රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උප–පජ්ජන්තානං තෙසං, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය, පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය. කාම සුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයථ පුද්ගලයෝ (2) දෙදෙනාය, රූපාවචර භූමි එකින් - එකට ඉහලට ඉපදී පිරිනිවෙන්නා වූ රූපාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සතෙහි සුභකිණ්හකය තෙක් ඇති රූපාවචර භූමි (9) නවයෙහි යට මාර්‍ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති,

කාමාවචර භූමියෙහි නැවත උපදින්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, කම්ජ රූප කලාප (3 - 7 - 4) තුන සත සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙරසේමය.

ප්‍රතිලෝම අභිධෙය්‍ය කාමාවචර භූමියෙහි නැවත උපදින්නා වූ, චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය; අන්තිම කම්ජ රූපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනාය, සචක්ඛුකව කාමාවචරයෙහි උපදනා වූ දු - සු අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මෙ පුද්ගලයෝ ගනු ලැබෙති. අසඤ්ඤසත්ත - අරූප තලයෙහි උපදින - සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති. අනුලෝම සංසයද එසේය.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "පඤ්චවෝකාරේ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං"

පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති සිත් (9) නවය, චෛතසික (35) පන්තිස, අන්තිම කම්ජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නා වූ අර්හත් ඵලස්ථ ආයථ පුද්ගලයාය, පශ්චිම භවිකව අරූපාවචරයෙහි උපදනා වූ යට ඵලස්ථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් ඵලස්ථ ආයථ පුද්ගලයාය, කාම සුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ මතු පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලස්ථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය, රූපාවචර භූමි එකින් එක ඉහලට ඉපද මතු පිරිනිවෙන්නාවූ රූපාවචරයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සතය සුභකිණ්හක තලය තෙක් රූපාවචර භූමි (9) නවය යන මෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවන්නා වූ යට ඵලස්ථ අයථ පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකින් එක ඉහළට ඉපද

මතු පිරිනිවෙන්නාවූ අරූප තලයෙහි උපදින චුතවන යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [ජිව්හා-කාය-ගන්ධ-රස-ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කීමෙහිදීද සමානය. රූප මූලීයද සෝතමූලී අනුවම ලැබේ.]

මනායතන මූලියෙහි "පච්ඡිම භවිකානං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං තෙසං, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං."

අනුලෝම අභිධෙය්‍ය, පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදනාවූ ත්‍රිහේතුක, පෘථග්ජන පුද්ගලයා සහ යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති. පශ්චිම භවිකයා හැර පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොස චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3 – 7 – 4) තුන – සත – සතර බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි සචක්ඛුකව උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා සහ යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාද ගනු ලැබෙති. ප්‍රතිලෝම අභිධෙය්‍ය, පිරිනිවෙන්නහු හැර චුති සිත් (19) එකුන්විස්ස, චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ චුතවන සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදනාවූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, අසඤ්ඤ සත්තයෙහි උපදනාවූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. පශ්චිම භවිකයා හැර අරූපයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසයද එසේය.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය. "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං තෙසං," පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථ ආයඝ් පුද්ගලයාය, පශ්චිම භවිකව අරූපයෙහි උපදනාවූ යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් ඵලස්ථ ආයඝ් පුද්ගලයාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [ධම්මමූලියෙහිද මේ ක්‍රමයම වේ. චක්ඛායතන මූලය නිමි. සෝත මූලයද චක්ඛු මූලයට සියල්ල සමානයි.]

**ඝානායතන මූලය**:– ඝානායතන මූල ජිව්හායතන මූලියෙහි, "පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, උපපජ්ජන්තානං තෙසං, ඉතරෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං චවන්තානං, අඝානකානං උපපජ්ජන්තානං තෙසං,"

අනුලෝම අභිධෙය්‍ය, කාම ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (4) සතරය චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3 – 7) තුන – සත යන මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (2) දෙදෙනාය,

කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර අරූපාවචර භූමියට පැමිණ මතු පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

කාමාවචර භූමියෙහි නැවත උපදින්නා වූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිස කර්මජ රූප කලාප (3 – 7) තුන – සත බැගින් ඇති මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ සස්‍රානකව කාමභූමියෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා සහ යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, කාමාවචර භූමියෙහි නැවත උපදින්නා වූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, අස්‍රානකව කාමාවචරයෙහි උපදනා වූ සුගති – දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය, මහග්ගත ප්‍රතිසන්ධි (9) නවය චෛතසික (35) පන්තිස කර්මජ කලාප (4) සතර බැගින් ඇති ප්‍රථම ජීවිත නවක රූප කලාපය යන මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපවචර – අරූපාවචර භූමියෙහි උපදනා වූ සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [රූප භූමි – අරූප භූමියෙහි ආර්‍ය්‍යයෝ කාම භූමියට පෙරළා නොඑති.] අනුලෝම සංසය ද පෙර සේ ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය - ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං.''

කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතරය, චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාමාවචරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාය, පශ්චිම භවිකව රූපාවචර – අරූපාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය චුතවන අර්හත් එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාය, කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි චුතවන්නා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, රූපාවචරයෙහි එකින් එක ඉහලට ඉපද පිරිනිවෙන්නා වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සතෙන් අරූප භූමියට පැමිණ පිරිනිවෙන්නාවූ කාමාවචර භූමියෙන් චුතවන යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, සුභකිණ්හක තලය තෙක් රූපාවචර භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවෙන්නාවූ රූපාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය උපදින – චුතවන යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකින් එක ඉහලට ඉපද පිරිනිවෙන්නා වූ අරූතලයෙහි උපදනාවූ ද චුතවන්නාවූ ද යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ පද සම්බන්ධ කිරීමෙහි ද සමාන වැයි.]

රූපායතන මූලියෙහි ''පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං යෙච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, උපපජ්ජන්තානංතෙසං ඉතරෙසං සසානකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන, සබ්බෙසං චවන්තානං අසානකානං උපපජ්ජන්තානං තෙසං,''

අනුලෝම අභිධෙය්‍ය පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයථ් පුද්ගලයන් (2) දෙදෙනාය. කාම-සුගති භූමි (7) සතෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයථ් පුද්ගලයන් (2) දෙදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. කාමාවචර භූමියෙහි නැවත උපදින්නා වූ සසානකව කාමාවචරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසථ ආයථ් පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයෝද ගනු ලැබෙති, සංසය අභිධෙය්‍ය පෙර සේය.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, පඤ්චවෝකාර භූමියෙහි නැවත උපදින්නා වූ, චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලසථ ආයථ් පුද්ගලයන් (3) තිදෙනාය. අසානකව කාමා-වචරයෙහි උපදනා වූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. රූපාවචර භූමින්හි උපදනා වූ සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලසථ ආයථ් පුද්ගලයෝ (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං යෙ ච අරූපං උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං,''

කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලසථයාය, පශ්චිමභවිකව රූපාවචර-අරූපාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයථ් පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් ඵලසථයාය, කාමසුගති භූමි (7) සතෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි චුතවන යට ඵලසථ ආයථ් පුද්ගලයන් (3) තිදෙනාය, සුභකිණ්හක තලය තෙක් රූපාවචර භූමි (9) නවයෙහි දී යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනි-වෙන්නා වූ රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදින-චුතවන යට ඵලසථ ආයථ් පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකින් එකට ඉහලට ඉපිද පිරිනිවෙන්නා වූ අරූප භූමියෙහි උපදින - චුතවන යට ඵලස්ථ ආයථ් පුද්ගලයන් (3) තිදෙනා ද යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

මනායතන මූලියෙහි, ''පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං ඉතරෙසං සසානකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං චවන්තානං අසානකානං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය, පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා සහ යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනා ගනු ලැබෙති. පශ්චිමභවිකයා හැර කාමප්‍රතිසන්ධි සිත් (10) දසය චෛතසික (33) තෙතිස කර්මජ කලාප (3 - 7) තුන සත බැගින් වූ මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ මේ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා සහ යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාද ගනු ලැබෙති.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, 'අසාතකව කාමාවචරයෙහි උපදනාවූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, පශ්චිමභවිකයා හැර රූපාවචර අරූපාවචරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසයද ගනු ලැබෙ,

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරේ අරූපාවචරෙ පච්ඡිම භවිකානං, තෙසං'' කාමාවචරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් එලස්ථ ආයති පුද්ගලයාය, රූපාවචර අරූපාවචරයෙහි පශ්චිමභවිකව උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආයති පුද්ගලයාය,. චුතවන අර්හත් එලස්ථ ආයති පුද්ගලයාය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [ධම්මායතන මූලියද සමානය] ජිව්හායතන මූලියෙහි සමානය.

[අජිව්හක යනු ජිව්හායතනය ඉපදීමට පෙර චුතවන්නාවූ ගර්භසෙය්‍යක - රූපසහිතව උපදින යනුද අකායකව, ඉපදීමෙහි යන තැන රූප අරූප භූමීන්හි උපදින යන්නම විශේෂයි.]

**රූපායතන** මූලය:- [රූපමූලි ගන්ධමූලිය චක්ඛුමූල ඝානමූලිය මෙන් **කියනු**. ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං අරූපකානං උපපජ්ජන්තානං'' කිවයුතු බවම **විශේෂයි** ප්‍රත්‍යනීක අවශේෂය මේ ක්‍රමයට සමානයි.]

මනායතන මූලියෙහි'' පච්ඡිමභවිකානං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං තෙසං සරූපකානං උපපජ්ජන්තානං තෙසං යස්ස වා පන සබ්බසං චවන්තානං අරූපකානං උපපජ්ජන්තානං තෙසං, අනුලෝම අභිධෙය්‍ය පශ්චිමභවිකව පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන සහ යට එලස්ථ ආයති පුද්ගලයෝ (3) තිදෙනා ගනු ලැබෙති.

පශ්චිමභවිකයා හැර පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොස චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3 - 7 - 4) තුන - සත - සතර බැගින්ය, ප්‍රථම ජීවිත නවක කලාපය, යන මේ ප්‍රතිසන්ධි, නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පඤ්චවෝකාර අඤ්ඤසත්ත භූමීන්හි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

ප්‍රතිලෝම අභිධෙය්‍ය සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාය, යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, පශ්චිම භවිකයා හැර අරූපයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ලැබේ. ප්‍රත්‍යනික අභිධෙය්‍ය, "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං, අරූප පච්ඡිමභවිකානං තෙසං," [පෙර සේ බෙද කියනු.. ස්කන්ධ යමක රූපස්කන්ධ හා වේදනාස්කන්ධ අනුව ම වේ. ධම්මායතන මූලිය ද මෙයට සමානය, ගන්ධ – රස – ඵොට්ඨබ්බ මූලයෝ ද ඝාන මූලය හා සමානය.]

**මනායතන මූලය;–** මනායතන මූල ධම්මායතන මූලියෙහි "පච්ඡිමභවිකානං උපපජ්ජන්තානං තෙසං, ඉතරෙසං සචිත්තකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං, චවන්තානං අචිත්තකානං උපප ජ්ජන්තානං තෙසං," ප්‍රත්‍යනිකය, "පරිනිබ්බන්තානං තෙසං,"

[ස්කන්ධ යමක වේදනාස්කන්ධ හා සංඥස්කන්ධවාරය අනුව අභිධෙය්‍ය උද්ධරනු. මේ පුද්ගල වාරයෙහි "සබ්බෙසං චවන්තානං" යන සබ්බ ශබ්දය සමග වදළ නමුත් අර්හත්, ඵලසථයා හැර උද්ධරනු. අර්හත් ඵලසථයා නොලැබෙන්නේ නම් කුමක් හෙයින් සබ්බ ශබ්දය වදරන ලද්දේද, සප්‍රදේශ – නිප්‍රදේශ වශයෙන් සබ්බ ශබ්දය දෙවැදෑම වේ. මෙහි නිප්‍රදේශ "සබ්බ නොවේ. සප්‍රදේශ "සබ්බ වශයෙන් වදරා ඇත.]

**පුද්ගල වාරය නිමි.** (ඕකාස වාරය ද සමානය,)

---

## පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය:–** "යස්ස යත්ථ චක්ඛායතනං උපපජ්ජති තස්ස තත්ථ සොතායතනං උපපජ්ජිස්සතීති, පච්ඡිමභවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ පඤ්චවෝකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ"

අනුලෝම අභිධෙය්‍ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) පන්තිස කර්මජ කලාප (3 – 7 – 4) තුන – සත – සතර බැගින් වූ මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පශ්චිමභවිකව පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (3) තිදෙනාය, යන මොවුන්ගේ අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3 – 7 – 4) තුන සත, සතර බැගිනි මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ

පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය. කර්මජ කලාප (3 – 7 – 4) තුන සත – සතර බැගිනි. මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය. යන මොවුන්ගේ ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය පෙර සේ උද්ධරනු.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ, පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප කලාප යන මේ නාම රූපයන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ගනු ලැබෙති,

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ චක්ඛායතනය නො ලැබෙන්නා වූ අපාය ඖපපාතිකව උපදින දුගති – අහේතුක පෘථග්ජන පුද්ගලයාය. සංසේදජ – ගර්භසෙය්‍යකව උපදින දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය. චක්ඛායතනය නොලබාම මතු චුතවන්නා වූ ගර්භසෙය්‍යකව උපදනා වූ දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය, යන මොවුන්ගේ අපාය භූමි (4) සතරය මනුෂ්‍ය භූමිය භුම්‍යාශ්‍රිත විනිපාතික අසුර නම්වූ චාතුර්මහාරාජිකයන්ගේ වශයෙන් කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති. [චක්ඛායතනය නොලබන්නා වූ අචක්ඛුක, යනු මෙහි අතිරේකයයි.]

අනුලෝම සංසය ද ලැබේ. ප්‍රත්‍යනික අභිධෙය්‍ය "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං; අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ" පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති සිත් (9) නවය චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයන්ගේ අපාය භූමි වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින්නා වූ භූමියෙහි නැවත නූපදින්නා වූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය. චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය,

තමන් ඉපද සිටින්නා වූ භූමියෙහි නැවත නූපදින්නාවූ අචක්ඛුකව කාමාවචරයෙහි උපදනා වූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමභූමි (6) සයය, අසඤ්ඤසත්ත භූමියෙහි උපදින–චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත භූමියය, අරූපයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, ඵලස්ථ ආයතී පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති.

ඝානායතන මූලියෙහි "පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං රූපාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, කාමාවචරා චවන්තානං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ,"

අනුලෝම අභිධෙය්‍ය කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3-7) තුන සත බැගිනි, මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පශ්චිමභවිකව කාමාවචරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට එලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුන්ගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය, චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3-7) තුන සත බැගිනි, මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ සචක්ඛුකව කාමාවචරයෙහි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය, යන මේ පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, රූප ප්‍රතිසන්ධි සිත් (5) පසය චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (4) සතර බැගිනි මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපාවචරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ සහ යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ අසඤ්ඤසත්ත වර්ජිත රූපාවචර භූමි (15) පසළොසය යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3-7) තුන සත බැගින් ඇති මේ නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ සචක්ඛුකව කාමාවචරයෙහි උපදනාවූ, පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය, යන මොවුන්ගේ කාමාවචර භූමි (11) එකොළසද ගනු ලැබෙති, සංසය අභිධෙය්‍ය පෙරසේම වේ.

ප්‍රතිලෝම අභියෙධ්‍ය, තමන් ඉපද සිටින්නාවූ භූමියෙහි නැවත උපදින්නාවූ කාම චුති සිත් (10) දශය චෛතසික (33) තෙතිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුන්ගේ කාමාවචර භූමි (11) එකොළසය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදනාවූ දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සයය, යන මේ භූමි ගනු ලැබෙති, අනුලෝම සංසයද ගනු ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරා චවන්තානං අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ," කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතරය චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් එලසථ ආයඞ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ කාම චුති සිත් (10) දශය චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූප. යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ කාමාවචර භූමි (11) එකොළසය,

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ අචක්ඛුකව කාමාවචරයෙහි උපදින - සුගති - දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සයය, [අනුලෝම ප්‍රතිලෝම දෙක්හි අචක්ඛු යනු අතිරේකයයි.] රූපාවචර චුති සිත් (5) පසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ රූපාවචරයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ එලස්ථ ආයති පුද්ගලයන් (4) සිවුදෙනාගේ අසඤ්ඤසත්වය හැර රූපාවචර භූමි (15) පසළොසය, අසඤ්ඤ තලයෙහි උපදින-චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසංඥතලය, අරූපයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ එලසථ ආයති පුද්ගලයන් (4) සිවුදෙනාගේ අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති. [ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ සම්බන්ධ කොට ගැනීම ද මේ හා සමානය.]

රූපමූලියෙහි ''පච්ඡිමභවිකානං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පඤ්චවෝකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' [චක්ඛු· සොත, අනුව අනුලෝමයෙහි සියල්ලම සමානය, ප්‍රතිලෝමයෙහි අසඤ්ඤ සත්තානං'' ගැනීමම විශේෂයි] අභිධෙය්‍ය, අසඤ්ඤ සත්ව භූමියෙහි නැවත උපදින්නා වූ අසඤ්ඤ සත්වයෙහි උපදින-චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත භූමිය ගනු ලැබේ· (මෙපමණක්ම විශේෂයි.)

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''පඤ්චවොකාරේ පරිනිබ්බන්තානං අරූපානං තත්ථ'' අසඤ්ඤසත්ත භූමියෙහි නැවත නූපදින්නා වූ අසඤ්ඤසත්තයෙහි උපදින-චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලය [මේ අසඤ්ඤසත්ත අතිරේකය, ''පරිනිබ්බන්ත'' යන තන්හි ඇතුලත් කරනු. මෙයම විශේෂයි.]

මනායතන මූලියෙහි අනුලෝමය සමානය ප්‍රතිලෝමයෙහි, ''පඤ්චවෝකාරා චවන්තානං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ'' [අනුලෝමය පෙරසේ අභිධෙය්‍ය උදුරනු. ප්‍රතිලෝමයෙහි සොතමූලී අනුවමය, අරූපානං යන්නම විශේෂයි.]

තමන් ඉපද සිටින භූමියෙහි නැවත. උපදින්නා වූ අරූපයෙහි, උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති, ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිමභවිකානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' [පඤ්චවොකාර පරිනිබ්බන්ත යනු ඒකාන්ත වාරයයි. අනේකාන්තයද උදුරනු. අචක්ඛුක අනේකාන්තය ද උදුරනු.]

පශ්චිමභවිකව අරූපයෙහි උපදනා වූ යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ ''චුතවන අර්හත් එලස්ථ ආයති පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ අරූපයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතරය, අසඤ්ඤසත්තයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

ධම්මායතන මූලියෙහි අනුලෝමය සමානය, ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං, අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, [ධම්මායතනයෙහි පුද්ගල වාරය අනුව විභංගයෙහි මෙන් විශේෂයක් නොමැති, සියලු භූමියෙහි පැතිරී ඇති බැවිනි.] ප්‍රතිලෝමයෙහි අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ, චුතිසිත් (19) එකුන්විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ, සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් සිවුදෙනාගේ, යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය අසංඥ තලය තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සයය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ අසංඥ තල - අරූතලයෙහි උපදනා වූ සුගති අහේතුක - ත්‍රිහේතික පෘථග්ජන පුද්ගලයන්ගේ, යට එලස්ථ ආයතී පුද්ගලයන්ගේ අසංඥ තලය, අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං තෙසං තත්ථ'' [පරිනිබ්බන්තානං, මෙහිදී අසඤ්ඤසත්තය ඇතුලත් කර කියනු.]

**චක්ඛුමූලය නිමි.** (සොත මූලය ද සමානමැයි.)

---

## ඝානායතන මූලය

ඝානමූල ජිව්හාමූලියෙහි, ''පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ-කාමාවචරා චවන්තානං, අඝානකානං කාමාවචරං උපපජ්ජන්තාන, තෙසං තත්ථ.''

අනුලෝම අභිධෙය්‍ය, කාම ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3 - 7) තුන - සත බැගිනි, මේ ප්‍රතිසන්ධි නාම රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පශ්චිමභවිකව කාමාවචරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට එලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සතය,

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නුපදින්නා වූ කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය, චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3 - 7) තුන - සත බැගිනි, මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි උපදනා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට එලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ කාමච්‍යුති සිත් (10) දසය, චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ අසංඥකව කාමාවචරයෙහි උපදනාවූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පස යන මේ භූමි ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ," කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතරය, චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජරූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදනාවූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාම භූමි (11) එකොළසය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදනාවූ අසංඥකව කාමාවචරයෙහි උපදනාවූ දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පසය, රූපාවචර අරූපාවචරයෙහි උපදින – චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ රූපාවචර භූමි (16) සොළසය අරූපාවචර භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති. [කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ මූලි වාර ද සමානය.]

රූප මූලියෙහි, අනුලෝමය සමානයි ප්‍රතිලෝමයෙහි, "කාමාවචරා චවන්තානං, අසඤ්ඤසත්තානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං තෙසං තත්ථ, [ජිව්හා-මූලි ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං" යනුම විශේෂයි.]

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ රූපාවචරයෙහි උපදින – චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ශුද්ධාවාස වර්ජිත රූපාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති, (මෙයම විශේෂයි.)

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ පච්ඡිම-භවිකානං, අරූපානං තෙසං තත්ථ," [කාමාවචර පරිනිබ්බන්ත–ඒකාන්තයයි, අනේකාන්තය "අසඤ්ඤ" යනුයි, සෙස්ස උද්ධරනු.] රූපාවචරයෙහි පශ්චිම භවිකව උපදින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චුතවන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ අසංඥ තලය හැර රූපාවචර භූමි (15) පසළොස, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ රූපාවචරයෙහි උපදින – චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අකනිට්ඨය වර්ජිත රූපාවචර භූමි (15) පසළොසය, අරූතලයෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ පඅරූ භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති.

මනායතන මූලියෙහි ද අනුලෝමය සමානය, ප්‍රතිලෝමයෙහි [රූපාවචරානං යන තැන රූපාවචරානං, අරූපාවචරානං ඇතිබවම විශේෂයි.] තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ රූපාවචර අරූපාවචරයන්හි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාගේ, වේහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දසය, අරූපාවචර භූමි (4) සතර ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," [කාමාවචර පරිනිබ්බන්ත ඒකාන්තයයි අනේකාන්ත අසානකයයි, සෙස්ස කියනු.] රූපාවචර අරූපාවචරයෙහි පශ්චිමභවිකව උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාගේ පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයන්ගේ, අසංඥ තලය වර්ජිත රූපාවචර භූමි (15) පසළොසය, අරූපාවචර භූමි (4) සතරය,

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ රූපාවචර අරූපාවචරයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාගේ අසඤ්ඤසත්තය, අකනිට්ඨාව හැර රූපාවචර භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරය, අසංඥ තලයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ද යන මේ භූමි ගනු ලැබෙති.

ධම්මායතන මූලියෙහි ද අනුලෝමය සමානය ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං චවන්තානං, අසානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ," [සබ්බෙසං චවන්තානං යන තැන චක්ඛායතන මූලයට අනුව උදුරනු.]

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පසය තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදනාවූ මහත්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (4) සතර බැගිනි ප්‍රථම ජීවිත නවක රූප කලාපය මේ ප්‍රතිසන්ධි නාමරූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපාවචර අරූපාවචර භූමින්හි, උපදනාවූ සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාගේ ශුද්ධාවාස වර්ජිත රූපාවචර භූමි (11) එකොළසය අරූපාවචර භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං තෙසං තත්ථ," [කාමාවචර පරිනිබ්බන්ත ඒකාන්තයයි අනේකාන්තය උදුරනු අසානක අවශේෂය ද පෙර සේ උදුරනු පශ්චිම භවික රූපාවචර අරූපාවචර ඒකාන්ත අනේකාන්ත අසඤ්ඤසත්තයයි, පෙර සේ උදුරනු]

**ඝාණායතන මූලය නිමි.** [ජිව්හා – කාය – ගන්ධ – රස – ඓාට්ඨබ්බ මූලයෝ ද මේ ක්‍රමයට අනුව කියනු.]

**රූපායතන මූලය:-** රූපමූල ගන්ධමූලයෙහි ''පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං රූපාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ කාමාවචරා චවන්තානං තෙසං තත්ථ,'' ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරා චවන්තානං අරූපානං තෙසං තත්ථ, [අභිධෙය්‍ය පෙර දක්වූ ක්‍රමය, ඇසුරුකොට උදුරනු සුගමයි.]

මනායතන මූලියෙහි, ''පච්ඡිමභවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ, පඤ්චවොකාරා චවන්තානං අරූපානං තෙසං තත්ථ,''

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං, අරූපෙ පච්ඡිම-භවිකානං අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ.'' [ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධ වේදනාස්කන්ධ අනුව ස්වරූප උදුරනු.]

ධම්මායතන මූලියෙහි, ''පච්ඡිමභවිකානං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං සරූපකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සබ්බෙසං චවන්තානං අරූපකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,'' [සන්නිට්ඨානයෙහි අනේකාන්ත පච්ඡිමභවිකයෙහි, අසඤ්ඤසත්ත අනේකාන්තය ඇතුලත් කොට උදුරනු.]

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම-භවිකානං තෙසං තත්ථ,'' [පඤ්චවොකාර පරිනිබ්බන්තයෙහි අසඤ්ඤසත්ත චවන්ත අනේකාන්තය ඇතුලත් කොට අභිධෙය්‍ය උදුරනු.]

**මනායතන මූල:-** පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං, ඉතරෙසං සචිත්තකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, සබ්බෙසං චවන්තානං අචිත්තකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, [පරිනිබ්බන්තානං චවන්තානං අනේකාන්තය ඇතුලත් කොට අභිධෙය්‍ය උදුරනු.]

**අනුලෝමය නිමි.**

[ප්‍රත්‍යනීකයෙහි අවශේෂ සංසය පෙර කියන ලදී, අනුලෝමයෙහි අනුලෝම ප්‍රතිලෝම දෙක මාරුකොට කියනු.]

**වර්තමානානාගත වාරය නිමි.**



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

## අතීතානාගත වාරය

**චක්ඛායතන මූලය:-** වර්තමානානාගත වාරය දේශනා කොට වදාරා අනතුරුව අතීතානාගත වාරය වදාළ සේක. (මෙසේ බෙද දක්වනු) ''යස්ස චක්ඛායතනං උප්පජ්ජිත්ථ, තස්ස සොතායතනං උප්පජ්ජිස්සතීති, පච්ඡිමභවිකානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං, යස්ස වා පන ආමන්තා,''

අනුලෝම අභිධෙය්‍ය, පශ්චිමභවිකව චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට එලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය. චුතවන අර්හත් ඵලසර් පුද්ගලයාය, කාම සුගති භූමි (7) සතෙහි සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියෙහි ඉපිද පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, උපදින චුතවන යට ඵලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකින් එක ඉහලට ඉපද පිරිනිවෙන්නා වූ අරූපයෙහි උපදින චුතවන යට ඵලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය. පඤ්චවෝකාර භූමියෙහි නැවත උපදින්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය, අසංඥ තලය - අරූ තලයන් හි උපදින - චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ස්වරූප පෙරසේ ලැබේ. [ප්‍රත්‍යනිකයෙහි සියල්ල සමානයි ඉතිරි කිසිත් නැත. ''නත්ථි හා උප්පජ්ජිත්ථ යනුම වේ.]

සානමූලියෙහි ''පච්ඡිම භවිකානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං යස්ස වා පන ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය, (පච්ඡිම භවික උදුරනු.)

කාමසුගති භූමි (7) සතෙන් රූප භූමියට පැමිණ මතු පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය, රූපාවචරයෙහි එකින් - එක ඉහලට ඉපිද පිරිනිවෙන්නා වූ රූපාවචරයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය. කාම සුගති භූමි (7) සතෙහි, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ මතු පිරිනිවෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. උපදින - චුතවන යට ඵලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය. අරූප භූමි එකින් එක ඉහලට ඉපිද පිරිනිවෙන්නා වූ අරූප භූමියෙහි උපදින-චුතවන යට ඵලසර් ආයති පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති,

කාමාවචර භූමියෙහි නැවත උපදින්නා වූ කාමාවචරයෙහි උපදින-චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසර් ආයති පුද්ගලයන් (2) දෙදෙනාය රූපාවචරයෙහි උපදින - චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ ලැබේ. [ජිව්හා - කාය - ගන්ධ - රස ඵොට්ඨබ්බ මූලි වාරයෝ ද මීට සමානය, රූප මූලිය ද සෝත මූලි හා සමානය.]

මනායතන මූලියෙහි ''පච්ඡිමභවිකානං තෙසං ඉතරෙසං තෙසං, යස්ස වා පන ආමන්තා.'' පශ්චිමභවිකව චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදිනා ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනය, චුතවන අර්හත් ඵලසථ පුද්ගලයෝය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති. පශ්චිම-භවිකයා හැර සියලුම උපදින–චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාද, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේමය, [ධම්මමූලය ද මේ අනුවමැයි, සොතමූල ඝානමූල – පෙ – මනමූල මේ මූලයෝ සියල්ල චක්ඛුමූලය අනුව සමාන මැයි ප්‍රත්‍යනිකයෙහි අතිරේක නොමැත,]

පුද්ගල වාරය නිමි. – (ඕකාස වාරය සුගමයි,)

---

## පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය:–** ''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ සොතායතනං උප්පජ්ජිස්සතීති, පඤ්චවොකාරෙ පච්ඡිමභවිකානං තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය, පශ්චිමභවිකව පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් ඵලසථ ආයඞ පුද්ගලයාය යන මේ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දසය, තමන් ඉපද සිටින – භූමියෙහි නැවත නූපදනා වූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි හැර පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත, උපදින්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන පෘථග්ජන, පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ ශුද්ධාවාස හැර පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය, ප්‍රත්‍යනික අභිධෙය්‍ය ''සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ,'' [අතීතවාරයෙහි මෙන් අවසේසය වේ.]

ඝානමූලියෙහි ''කාමාවචරෙ පච්ඡිමභවිකානං රූපාවචරානං තෙසං තත්ථ, ඉතරෙසං කාමාවරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය, පශ්චිමභවිකව කාමාවචරයෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය, චුතවන අර්හත් ඵලසථ ආයඞ පුද්ගලයාය, යන මේ පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්-ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය මේ

පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය රූපාවචරයෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ලයාය, එලසථ ආයඞ පුද්ගලයන් (4) සිවුදෙනාය මේ පුද්ගලයන්ගේ වේහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශය ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය මේ පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය, ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''සුද්ධාවාසානං - අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ,'' [ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලිහු සමානය.]

රූපායතන මූලියෙහි ''පඤ්චවෝකාරෙ පච්ඡිමභවිකානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' (අනුලෝමයෙහි චක්ඛු හා සොත අනුව උද්ධරනු.)

ප්‍රතිලෝම අභිධෙය්‍ය, අසංඥ තලයෙහි නැවත උපදින්නාවූ අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ත භූමිය ගනු ලැබේ. අනුලෝම සංසයද ගනු ලැබේ.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''සුද්ධාවාසානං, අරූපානං තෙසං තත්ථ,'' අසංඥ තලයෙහි නැවත නුපදින්නාවූ අසංඥතලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ගනු ලැබේ. [අසංඥ තලය අතිරේක වේ. සුද්ධාවාසය යට කියන ලදී.]

මනායතන මූලියෙහි අනුලෝමය සමානය, ප්‍රතිලෝමයෙහි ''අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ,'' ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින්නාවූ භූමියෙහි නැවත උපදින්නාවූ අරූප භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති, ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''ශුද්ධාවාසානං අරූපෙ පච්ඡිමභවිකානං අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ'' (අභිධෙය්‍ය සුමගයි)

ධම්මායතන මූලියෙහි, අනුලෝමය සමානයි ප්‍රතිලෝමයෙහි ''අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ,'' ප්‍රතිලෝම අභිධෙය්‍ය, අසංඥ තලයෙහි නැවත උපදින්නාවූ අසංඥ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය, තමන් ඉපද සිටින! භූමියෙහි නැවත උපදින්නාවූ අරූප තලයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ යට එලසථ ආයඞ පුද්ගලයන් තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''සුද්ධාවාසානං අරූපෙ පච්ඡිමභවිකානං තෙසං තත්ථ,'' ශුද්ධාවාසයෙහි උපදින - චුතවන අනාගාමී එලස්ථ අර්හත් එලසථ ආයඞ පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසය, පශ්චිමභවිකව අරූතලයෙහි උපදින යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ චුතවන අර්හත් එලසථ ආයඞ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ අරූතලයෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතරය, අසංඥ භූමියෙහි නැවත නූපදින්නාවූ අසංඥ තලයෙහි උපදින-චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය, මේ භූමි ගනු ලැබෙති.

**චක්ඛායතන මූලය නිමි.**

---

## ඝානායතන මූලය

ඝානායතන මූල ජිව්හායතන මූලියෙහි ''කාමාවචරෙ පච්ඡිමභවිකානං තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය පශ්චිමභවිකව කාමාවචරයෙහි උපදින්නාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගයන් (2) දෙදෙනාගේ චුතවන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම-සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ කාමාවචරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාම භූමි (11) එකොළස යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට පලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමාවචර භූමි (11) එකොළස ද ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය ''රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ,'' රූපාවචර අරූපාවචරයන්හි උපදින්-චුතවන සුගති අහේතුක-ත්‍රිහේතුක-පෘථග්ජන පුද්ගලයන්ගේ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ රූපාවචර භූමි (16) සොළසය අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති. [කාය-ගන්ධ-රස-ඵොට්ඨබ්බ මූලි හුද මේ අනුවම ගත යුතු.]

රූපායතන මූලියෙහි ''කාමාවචරෙ පච්ඡිම භවිකානං තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ රූපාවචරානං තෙසං තත්ථ,'' [අනුලෝමයෙහි ජිව්හාමූලි හා සමානය] ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ රූපාවචරයෙහි උපදින-චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස වර්ජිත රූපාවචර භූමි (11) එකොළස යන මේ භූමි ගනු ලැබෙති, ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''රූපාවචරෙ පච්ඡිමභවිකානං, අරූපානං තෙසං තත්ථ'' පශ්චිම භවිකව රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චුතවන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ අසංඥතලය හැර රූපාවචර භූමි (15) පසළොසය,

**තමන්** ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නාවූ රූපාවචරයෙහි උපදින - චුතවන **සුගති** අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ අකනිට්ඨාව හැර රූපාවචර භූමි (15) පසළොසය, අරූතලයෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන්ගේ ඵලසථ ආයති පුද්ගලයන් (4) සිවු දෙනාගේ අරූප භූමි (4) සතර යන මේ භූමි ගනු ලැබෙති,

මනායතන මූලියෙහි, අනුලෝමය සමානය, ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ" ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නාවූ රූපාවචර අරූපාවචරයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට ඵලසථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ වේහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දසය අරූපාවචර භූමි (4) සතර ගනු ලැබෙති.

**තමන්** ඉපද සිටින **භූමියෙහි** නැවත උපදින්නා**වූ** කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමාවචර භූමි (11) එකොළසද ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය "රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" [රූපාවචර අරූපාවචර පශ්චිමභවික ඒකාන්ත - අනේකාන්ත සියල්ල කියනු, අසඤ්ඤසත්ත සියල්ලත් කියනු.]

ධම්මායතන මූලියෙහි, අනුලෝමය සමානයි ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං අරූපාවචරානං යන තන්හි අසඤ්ඤසත්තය අනේකාන්ත වශයෙන් ඇතුලත් කොට ගැනීමම විශේෂයි, ප්‍රත්‍යනිකයෙහි "රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං තෙසං තත්ථ" අසඤ්ඤ සත්තය අනේකාන්තයෙහි ඇතුලත්කොට කියනු. සානායතන මූලය නිමි, [ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලයෝද මේ සානමූලය අනුවම ලැබෙති, විශේෂයෙක් නොමැත.]

**රූපායතන මූලය**:- රූපායතන මූල ගන්ධායතන මූලියෙහි "කාමාවචරෙ පච්ඡිම භවිකානං රූපාවචරානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ ආමන්තා"

අනුලෝම අභිධෙය්‍ය [කාමාවචරෙ පච්ඡිමභවිකානං ඒකාන්ත - අනේකාන්ත ස්වරූප පෙරසේ උදුරනු.] රූපාවචරයෙහි උපදින - චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ, ඵලස්ථ ආයති පුද්ගලයන් (4) සිවුදෙනාගේ ශුද්ධාවාස හැර රූපාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති, ප්‍රත්‍යනික අභිධෙය්‍ය "සුද්ධාවාසානං, අරූපානං තෙසං තත්ථ,"

මනායතන මූලියෙහි "පඤ්චවෝකාරෙ පච්ඡිම භවිකානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ අරූපානං තෙසං තත්ථ," ප්‍රත්‍යනික අභිධෙය්‍ය. "සුද්ධාවාසානං අරූපෙ පච්ඡිම-භවිකානං තෙසං තත්ථ" [ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධ හා වේදනාස්කන්ධය අනුව ස්වරූප උදුරනු.]

**මනායතන මූලය:-** මනායතන මූල ධම්මායතන මූලීයෙහි "පච්ඡිමභවිකානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," අනුලෝම අභිධෙය්‍ය පශ්චිම භවිකව චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ, චුතවන අර්හත් එලස්ථ ආයතී පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය කාමසුගති භූමි (7) සතය වේහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශය තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින්නා වූ චතුවෝකාර - පඤ්චවෝකාර භූමියෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස යන මෙ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින්නා වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින-චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ, යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතරය, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය යන මෙ භූමි ගනු ලැබෙති.

ප්‍රතිලෝම අභිධෙය්‍ය අසඤ්ඤසත්ත භූමියෙහි නැවත උපදින්නා වූ අසඤ්ඤසත්තයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ව භූමිය ගනු ලැබේ. ප්‍රත්‍යනික අභිධෙය්‍ය "සුද්ධාවාසානං තෙසං තත්ථ" ශුද්ධාවාසයෙහි උපදින - චුතවන අනාගාමි එලස්ථ අර්හත් එලස්ථ ආයතී පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසය අසඤ්ඤසත්ත භූමියෙහි නැවත නූපදින්නා වූ අසඤ්ඤසත්ත භූමියෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත භූමිය යන මෙ භූමි ගනු ලැබෙති.

**අනුලෝමය නිමි.**

[ප්‍රත්‍යනිකයෙහි ද අවශේෂ සංසය යට කියන ලදී. අනුලෝමය ප්‍රතිලෝමයට ද ප්‍රතිලෝමය අනුලෝමයට ද මාරු කොට කියනු. විශේෂයෙක් නොමැත]

**අතීතානාගත වාරය නිමි. – උත්පාද වාරය නිමි**

---

## නිරෝධ වර්තමාන වාරය

**චක්ඛායතන මූලය:-** උත්පාද වාරය දේශනා කොට වදරා නිරෝධ වාරය වදළ සේක. (පෙර සේ කියනු) කෙසේ වදළ සේක්ද යත් "යස්ස චක්ඛායතනං නිරුජ්ඣති, තස්ස සොතායතනං නිරුජ්ඣතීති, සචක්ඛුකානං අසොතකානං චවන්තානං තෙසං සචක්ඛුකානං චවන්තානං තෙසං, යස්ස වා පන සසොතකානං අචක්ඛුකානං චවන්තානං තෙසං," අනුලෝම අභිධෙය්‍ය චක්ඛායතනය පමණක් නිරුද්ධවන සෝතායතනය නිරුද්ධ නොවන, අපායෙහි ඕපපාතිකව චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, සංසේදජ ගර්භසෙය්‍යකව චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, චක්ඛායතනය පමණක් නිරුද්ධ

වන, සෝතායතනය නිරුද්ධ නොවන මතු චුතවන්නා වූ ගර්භසෙය්‍යකව චුතවන දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. මේ පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය මනුෂ්‍ය භූමිය, භූම්‍යාශ්‍රිත විනිපාතික අසුර නම් වූ චාතුර්මහාරාජික වශයෙන් කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති. චක්ඛායතන සෝතායතන දෙක නිරුද්ධ වන පඤ්චවෝකාර චුති සිත් (15) පසළොස, චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සචක්ඛුක සසොතකව පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති.

ප්‍රතිලෝම අභිධෙය්‍ය, සෝතායතනය පමණක් නිරුද්ධවන චක්ඛායතනය නිරුද්ධ නොවන ආපායික ඕපපාතිකව චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාගේ, සංසේදජ – ගර්භසෙය්‍යකව චුතවන දුගති–සුගති අහ්තුක පෘථග්ජන පුද්ගලයන්ගේ, කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, ''සබ්බෙසං උපපජ්ජන්තානං අචක්ඛුකානං අසොතකානං චවන්තානං තෙසං'' සියලුම චුතවන පුද්ගලයෝය. (පෙර සේ භූමි බෙද දක්වනු) චක්ඛායතන සෝතායතන දෙක නිරුද්ධ නොවන ආපායික ඕපපාතිකව චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. ගර්භසෙය්‍යකව චුතවන දුගති–සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, චක්ඛායතන සෝතායතන දෙක ඉපදීමට පෙර චුතවන්නා වූ ගර්භසෙය්‍යකව චුතවන දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සයය, අසංඥ තල අරූප-යෙහි චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය, මේ පුද්ගලයන්ගේ අසංඥ සත්ත්වය, අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

ඝානායතන මූලීයෙහි, චක්ඛායතනය පමණක් නිරුද්ධවී ඝානායතනය නිරුද්ධ නොවන්නා වූ සංසේදජ ගර්භසෙය්‍යකව චුතවන දුගති සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. චක්ඛායතනය පමණක් නිරුද්ධවී ඝානායතනය නිරුද්ධ නොවී මතු චුතවන්නා වූ ගර්භසෙය්‍යකව චුතවන සුගති – දුගති අහේතුක පෘථග්-ජන පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ නිරය වර්ජිත අපාය භූමි (3) තුනය, මනුෂ්‍ය භූමිය, භූම්‍යාශ්‍රිත විනිපාතික අසුර නම් වූ චාතුර්මහාරාජික වශයෙන් කාමාවචර භූමි (5) පසය රූපාවචර චුති (5) පසය චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (4) සතර බැගිනි, මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ රූපාවචර-යෙහි චුතවන ත්‍රිහේතුක පුද්ගලයාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ අසංඥසත්ත්වය හැර රූපාවචර භූමි (15) පසළොස යන භූමි ගනු ලැබෙති.

[මේ ක්‍රමය ඇසුර කොට උත්පාද වාරයෙහි උපපජ්ජන්ත යන තැන චවන්ත යනුද, චවන්ත යන තැන උපපජ්ජන්ත යනු ද මාරුකොට කියනු.]

**වර්තමාන වාරය නිමි.**

(අතීත වාරය ද උත්පාද අතීත වාරය සමග සියල්ල සමානය වෙනෙය්‍යා-ද්ධ්‍යාශය – දේශනා විලාස වශයෙන් වදරා ඇත.)

# අනාගත වාර – චක්ඛායතන මූලය

අනාගත වාරයෙහි ''යස්ස චක්ඛායතනං නිරුජ්ඣිස්සති තස්ස සොතායතනං නිරුජ්ඣිස්සතීති ආමන්තා, යස්ස වා පන, ආමන්තා,''

අනුලෝම අභිධෙය්‍ය, පඤ්චවෝකාර භූමියෙහි නැවතත් මතු නිරුද්ධ වන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට එලසථ ආයර්‍යයන් (3) තිදෙනාය, අසංඥතල – අරූතලයෙහි උපදින – චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ය, යන මොවුහු ගනු ලැබෙති.

ප්‍රත්‍යනිකයෙහි ආමන්තා යනු වේ. අභිධෙය්‍ය වනාහි, පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් එලස්ථ ආය්‍ය පුද්ගලයාය පශ්චිමභවිකව අරූතලයෙහි උපදින යට එලස්ථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් එලස්ථ ආය්‍ය පුද්ගලයාය කාම සුගති භූමි (7) සතය ශුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය යන මෙහි දී යට මාර්‍ග ලැබ අරූතලයට පැමිණ පිරිනිවීමට නියත වන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවන යට එලස්ථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අරූතලයෙහි ඔබ්නොබ ඉපද පිරිනිවීමට නියත වූ අරූතලයෙහි දනට උපදින – චුතවන යට එලස්ථ ආය්‍ය පුද්ගලයෝ (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ඝානමූලයෙහි, ''පච්ඡිමභවිකානං රූපාවචරං උපපජ්ජන්තානං යෙ ච රූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං, ඉතරෙසං තෙසං ''යස්ස වා පන, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය, පශ්චිමභවිකව රූප – භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ මතු පරිනිවන් යාමට නියත වූ කාම භූමියෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, රූප භූමියෙහි ඔබ්නොබ ඉපද පිරිනිවීමට නියත වූ රූප භූමියෙහි දනට උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, සුභ කිණ්හකය තෙක් රූපභූමි (9) නවයෙහි යට මාර්ග ලැබ අරූතලයට පැමිණ මතු පිරිනිවීමට නියත වූ රූපභූමියෙහි උපදින, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. කාම භූමියෙහි මතු නැවත නිරුද්ධ වීමට නියත වූ කාමභූමියෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට එලස්ථ ආය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය රූප – අරූප තලයන්හි උපදින – චුතවන සුගති අහේතුක – ත්‍රිහේතක පුද්ගලයාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංඝය අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ. ප්‍රතිලෝමය එසේමය.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිමභවිකානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං, ඉතරෙසං තෙසං" [චක්ඛු හා සොත අතිරේකය අනුව ස්වරූප උද්ධරනු ජිව්හා – කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බයෝද මීට සමානය රූපමූලීයද පෙර කියන ලද මූලී මෙන් උද්ධරනු.]

මනමූලීයෙහි, අනුලෝමය, ආමන්තා, ප්‍රතිලෝමයෙහි "පච්ඡිමභවිකානං අරූපං උපපජ්ජන්තානං, යෙ ච අරූපං උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං ඉතරෙසං තෙසං"

ප්‍රතිලෝම අභිධෙය්‍ය – පශ්චිමභවිකව අරූතලයෙහි උපදනා වූ යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සතය, ශුභකිණ්හකයතෙක් රූපභූමි (9) නවය යන මේ භූමියෙහි යට මාර්ග ලැබ අරූප භූමියට පැමිණ පරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි චුතවන යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමියෙහි ඔබ්නොබ ඉපිද පිරිනිවීමට නියත වූ අරූතලයෙහි උපදින – චුතවන යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (3) තිදෙනාය, අසංඥ තල – අරූතලයන්හි උපදින – චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය, ප්‍රත්‍යනීක අභිධෙය්‍ය – "පරිනිබ්බන්තානං තෙසං" ත්‍රිහේතුක චුති සිත් තෙළෙසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපය යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආය්‍යීයන් වහන්සේ ගනු ලැබෙති. ධර්මායතන මූලීයද මෙයට සමාන වේයි.

---

## ඝ්‍රාණායතන මූලය

ඝ්‍රාණායතන මූල ජිව්හායතන මූලියෙහි ආමන්තා යනු වේ. අභිධෙය්‍ය කාමාවචර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ කාමාවචරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (2) දෙදෙනාය, රූප – අරූප භූමීන්හි උපදින – චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ප්‍රත්‍යනීකයෙහි, ආමන්තා, යනු වේ. අභිධෙය්‍ය – කාමභූමියෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආය්‍යීයන් වහන්සේය. පශ්චිමභවිකව රූප – අරූප භූමීන්හි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන රහතන් වහන්සේය. කාම සුගති භූමි (7) සතෙන් රූප – අරූප භූමිවලට පැමිණ පිරිනිවීම නියත කොට ඇති කාම භූමියෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (3) තිදෙනාය, ශුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහිදී යට මාර්ග ලැබ අරූප භූමියට පැමිණ පිරිනිවීම

නියත කොට ඇති රූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදින-චුතවන යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, රූප භූමියෙහි ඔබිනොබ ඉපිද පිරිනිවීම නියත කොට ඇති රූප භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමියෙහි ඔබිනොබ ඉපිද පිරිනිවීමට නියත වූ අරූතලයෙහි උපදින - චුතවන යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කීම ද මෙයට සමානය, රූපායතන මූලියද චක්ඛු හා ඝානමූලිය අනුවම අභිධෙය්‍ය උදුරනු.]

මනායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''පච්ඡිම භවිකානං රූපාවචරං අරූපාවචරං උපපජ්ජන්තානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං ඉතරෙසං තෙසං''

ප්‍රතිලෝම අභිධෙය්‍ය පශ්චිම භවිකව රූප අරූප භූමින්හි උපදනා වූ, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, කාමසුගති භූමියෙන් රූප භූමියට පැමිණ පිරිනිවීමට නියත වූ කාම භූමියෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, රූප භූමියෙහි ඔබිනොබ ඉපද පිරිනිවීමට නියත වූ රූප භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සතෙහි යට මාර්ග ලැබ අරූප භූමියෙහි ඉපද පිරිනිවීමට නියත වූ කාමභූමියෙහි චුතවන යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ශුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලැබ අරූප භූමියෙහි ඉපද පිරිනිවීමට නියත වූ රූපභූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදින - චුතවන යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමියෙහි ඔබිනොබ ඉපද පිරිනිවීමට නියත වූ අරූප භූමියෙහි උපදින-චුතවන යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. කාමාවචර භූමියෙහි මතු නැවත නිරුද්ධවන්නා වූ කාම භූමියෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට එලස්ථ ආර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, රූප - අරූප භූමින්හි උපදින - චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ද යනු ලැබෙති.

සංසය අභිධෙය්‍ය පෙරසේම ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය - ''පරිනිබ්බන්තානං තෙසං'' ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, අවසාන කර්මජ රූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගිවූ පිරිනිවෙන අර්හත් එලස්ථ ආර්‍ය පුද්ගලයා ගනු ලැබේ. [ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලයෝද මීට සමානය, රූප මූලය ද චක්ඛුමූලය අනුව උදුරනු.]

---

## මනායතන මූලය

මනායතන මූල ධම්මායතන මූලියෙහි ආමන්තා, සන්නිට්ඨාන අභිධෙය්‍ය පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්යයන් වහන්සේ හැර සියලුම උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසයද එසේය. ප්‍රතිලෝමයද එසේය. (ප්‍රත්‍යනිකයෙහි අතිරේක වනුයේ ''පරිනිබ්බන්ත'' පමණි.)

**පුද්ගල වාරය නිමි.** (ඔකාස වාරය සුගමයි.)

---

## පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය:–** ''යස්ස යත්ථ චක්ඛායතනං නිරුජ්ඣිස්සති, තස්ස තත්ථ සොතායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන, ආමන්තා,''

අනුලෝම අභිධෙය්‍ය, – තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ පඤ්චවොකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති. සංසයද එසේය. ප්‍රත්‍යනිකයෙහි, ආමන්තා, අභිධෙය්‍ය – පඤ්චවෝකාර භූමියෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයන්ගේ අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත චුත නොවන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ අකනිට්ඨාව වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසඤ්ඤතලයෙහි උපදින – චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසංඥ භූමිය, අරූතලයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය, යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති,

සානමූලියෙහි, ''රූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ'' අනුලෝම අභිධෙය්‍ය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධවන්නා වූ රූප භූමියෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ අසඤ්ඤසත්තය හැර රූප භූමි (15) පසළොස ගනු ලැබෙති,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධවන්නාවූ කාමාවචරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, යන මේ පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසද ගනු ලැබෙති.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය – "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ" [චක්ඛු හා සොත මූලමූලී අනුව අභිධෙය්‍ය උදුරනු. ජිව්හා – කාය – ගන්ධ – රස ඵොට්ඨබ්බ සම්බන්ධ කොට ගැනීම ද මීට සමානමය]

රූපායතන මූලියෙහි අනුලෝමයෙහි ආමන්තා, ප්‍රතිලෝමයෙහි "අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ," ප්‍රතිලෝම අභිධෙය්‍ය අසඤ්ඤසත්ත භූමියෙහි මතු නැවතත් නිරුද්ධවන්නාවූ අසඤ්ඤ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ භූමිය ගනු ලැබේ. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාරයෙහි උපදිනු – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයඃ පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති, සංසය අභිධෙය්‍ය පෙර සේමය. ප්‍රත්‍යනික අභිධෙය්‍ය "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපානං තෙසං තත්ථ." [පඤ්චවෝකාර පරිනිබ්බන්ත – අනෝකාන්තයෙහි අසඤ්ඤසත්ත්ව අනෝකාන්තය ඇතුලත් කොට කියනු.]

මනායතන මූලියෙහි, අනුලෝමය, ආමන්තා ප්‍රතිලෝමයෙහි "අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ," ප්‍රතිලෝම අභිධෙය්‍ය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධවන්නාවූ අරූතලයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයඃ පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ අයගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාර භූමියෙහි උපදින–චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආයඃ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ මොවුන්ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය "පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආයඃ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයඃ පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ අයගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිටාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසංඥ තලයෙහි උපදින – චුතවන සුගති අහේතුක පුද්ගලයාගේ අසංඥ භූමිය, යන මේ භූමි ගනු ලැබෙති.

ධම්මායතන මූලියෙහි, අනුලෝමයට, ආමන්තා, ප්‍රතිලෝමයෙහි අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ පඤ්චවෝකාරානං තෙසං තත්ථ" මනායතන මූලියෙහි අසඤ්ඤසත්ව වැඩි කිරීම පමණක් විශේෂයි (පෙර සේ උදුරනු.) (අතිරේකයෙහි ද "පරිනිබ්බන්තානං යන අභිධෙය්‍යට අසඤ්ඤසත්ත වචන්ත යන අනෝකාන්තය ඇතුලත් කොට කීම පමණක් විශේෂයි.)

**ඝානායතන මූලය:-** ඝානායතන මූල ජිව්හායතන මූලියෙහි අනුලෝම ආමන්තා යනුවේ. අනුලෝම අභිධෙය්‍ය තමන් ඉපද සිටින භූමියෙහි මතු නිරුද්ධ වන්නාවූ කාම භූමියෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ගනු ලැබෙති.

සංසය අභිධෙය්‍ය ද එසේය, ප්‍රතිලෝමය ද එසේය. ප්‍රත්‍යනිකයෙහි ආමන්තා යනු ප්‍රතිවචනයයි, අභිධෙය්‍ය කාමාවචරයෙහි පිරිනිවෙන්නාවූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නිරුද්ධ නොවන්නාවූ කාම චුති සිත් (10) දශය චෛතසික (33) තෙතිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාමභූමියෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළසය, රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ රූප භූමි (16) සොළසය අරූප භූමි (4) සතරය යන භූමි ගනු ලැබෙති. [කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලි වාරයෝ ද මීට සමාන මැයි]

රූපායතන මූලියෙහි, අනුලෝමයට ආමන්තා ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ"

ප්‍රතිලෝම අභිධෙය්‍ය - තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූපාවචරයෙහි උපදින - චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ රූප භූමි (16) සොළස ගනු ලැබෙති. (කාමාවචර ස්වරූප පෙර සේ කියනු.)

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, - පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපානං තෙසං තත්ථ, [පඤ්චවොකාර පරිනිබ්බන්ත වාරය පෙර සේ කියනු. අනේකාන්තයෙහි අසඤ්ඤසත්ත චවන්ත පදය ඇතුලත් කරනු, අරූප භූමියෙහි උපපජ්ජන්ත චවන්ත පුද්ගල භූමි උදුරනු.]

මනායතන මූලියෙහි, අනුලෝමයට ආමන්තා ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ."

ප්‍රතිලෝම අභිධෙය්‍ය - තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූප - අරූප භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අසඤ්ඤසත්ත වර්ජිත රූප භූමි (15) පසළොස අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (කාමාවචර අභිධෙය්‍ය උදුරනු.)

ප්‍රත්‍යනික අභිධෙය්‍ය - "පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" [පරිනිබ්බන්තය ඒකාන්තය, අනේකාන්ත උදුරනු.] අසඤ්ඤසත්තයෙහි උපදින චුතවන පුද්ගල භූමි ගනු ලැබෙති.

ධම්මායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා-ප්‍රතිලෝමයෙහි ''රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ,'' තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූප–අරූප භූමින්හි උපදින–චුතවන සුගති අහේතුක–ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ රූප භූමි (16) සොළසය අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (කාමාවචර අභිධෙය්‍ය පෙර සේ උදුරනු.) ප්‍රත්‍යනීකය,–''පරිනිබ්බන්තානං තෙසං තත්ථ, [ඒකාන්ත–අනේකාන්ත බෙදනු, අසඤ්ඤසත්තා වචන්තය අනේකාන්තයට ඇතුලත් කොට උදුරනු ජිව්හා–කාය–ගන්ධ–රස–ඵොට්ඨබ්බ මූලය ද ඝානමූලය අනුව කියනු.]

**රූපායතන මූලය**:– රූපායතන මූල ගන්ධායතන මූලි අනුලෝමයෙහි ''රූපාවචරනං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ ''අනුලෝම අභිධෙය්‍ය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූපාවචරයෙහි උපදින–චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට එලසථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ රූප භූමි (16) සොළස ගනු ලැබෙති. (කාමාවචරය පෙර සේ උදුරනු.)

ප්‍රත්‍යනීකය ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපානං තෙසං තත්ථ'' [පඤ්චවෝකාරේ පරිනිබ්බන්ත ඒකාන්තය අනේකාන්තය උදුරනු, අසඤ්ඤසත්ත වචන්තය අනේකාන්තයට ඇතුලත් කරනු.]

මනායතන මූලියෙහි, ''අසඤ්ඤසත්තානං තෙසං තත්ථ පඤ්චවොකාරානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ අරූපානං තෙසං තත්ථ,'' [ස්කන්ධ යමකයෙහි රූප ස්කන්ධ හා වේදනාස්කන්ධ වාරය අනුව අභිධෙය්‍ය උදුරනු.]

ප්‍රත්‍යනීකයෙහි ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' ධම්මායතන මූලියෙහි අනුලෝමයට ආමන්තා ප්‍රතිලෝමයෙහි ''අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, (පෙර සේ උදුරනු.) ප්‍රත්‍යනීකයෙහි ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ''

**මනායතන මූලය**:– මනායතන මූල ධම්මායතන මූලියෙහි අනුලෝම ආමන්තා ප්‍රතිලෝමයෙහි, ''අසඤ්ඤසත්තානං තෙසං තත්ථ චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ ප්‍රතිලෝම අභිධෙය්‍ය, අසංඥ තලයෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ අසංඥ තලයෙහි උපදින–චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ගනු ලැබේ. (අවශේෂය පෙර සේ උදුරනු.) ප්‍රත්‍යනීකයෙහි, ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ,''

අනුලෝමය නිමි, [ප්‍රත්‍යනීකයෙහි සෙසු සංසය පෙර කියන ලදී. අනුලෝමය මාරු කොට කියනු.]

**අනාගත වාරය නිමි.**

---

## වත්‍තමානාතීත පුද්ගල වාරය

**චක්ඛායතන මූලය**:– වත්‍තමානාතීත වාරයෙහි "යස්ස චක්ඛායතනං නිරුජ්ඣති, තස්ස සොතායතනං නිරුජ්ඣිත්ථාති, ආමන්තා යස්ස වා පන, සබ්බෙසං උපපජ්ජන්තානං අචක්ඛුකානං චවන්තානං තෙසං, සචක්ඛුකානං චවන්තානං තෙසං"

ප්‍රතිලෝම අභිධෙය්‍ය – ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස චෛතසික (35) පන්තිස, කර්‍මජ කලාප (3 – 7 – 4) තුන – සත – සතර බැගිනි, මේ ධර්‍මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සියලුම උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අචක්ඛුකව කාමාවචරයෙහි චුතවන දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය අසංඥතල අරූපතලයෙහි චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

චක්ඛායතනය නිරුද්ධ වන්නා වූ පඤ්චවෝකාර චුති (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම වූ කර්‍මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. [මේ ක්‍රමය ආශ්‍රය කොට පුද්ගල වාරය කියනු, සෙස්ස යට කියන ලද මැයි] **(ඔකාස වාරය සුගමයි.)**

### පුද්ගලෝකාස වාරය

"යස්ස යත්ථ චක්ඛායතනං නිරුජ්ඣති තස්ස තත්ථ සොතායතනං නිරුජ්ඣිත්ථාති සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ" ඉතරෙසං සචක්ඛුකානං චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, පඤ්චවොකාරං උපපජ්ජන්තානං අචක්ඛුකානං කාමාවචරා චවන්තානං තෙසං තත්ථ"

අනුලෝම අභිධෙය්‍ය – රූපාවචර පඤ්චමධ්‍යාන චුති සිත් එකය, චෛතසික (30) සමතිසය අන්තිම කර්‍මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සුද්ධාවාසයෙහි පිරිනිවෙන අනාගාමී ඵලස්ථ – අර්හත් ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති.

පඤ්චවෝකාර චුතිසිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය අන්තිම කර්‍මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සචක්ඛුකව පඤ්චවෝකාර භූමියෙහි චුතවන පුහුදුන් පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

ප්‍රතිලෝම අභිධෙය්‍ය – පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය. කර්‍මජ රූප කලාප (3 – 7 – 4) තුන – සත – සතර බැගින් වූ මේ ධර්‍මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි උපදින

පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ යට ඵලස්ථ ආය්‍ය‍ර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ සුද්ධාවාස භූමි වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය සචක්ඛුකව කාමාවචරයෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය යන මෙ භූමි ගනු ලැබෙති. අනුලෝම සංසයද ගනු ලැබෙ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය - ''සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ,'' රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිත් එකය, චෛතසික (30) තිසය කර්මජ කලාප (4) සතර බැගින්ය. යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ සුද්ධාවාසයෙහි උපදින අනාගාමී ඵලස්ථ ආර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, අසඤ්ඤ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ තලය, අරූප භූමියෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේ අරූප භූමි (4) සතරය යන මෙ භූමි ගනු ලැබෙති.

[මෙ ක්‍රමය ඇසුරු කොට උත්පාදවාර උපපජ්ජන්ත-යන තන්හි, චවන්තය ද චවන්ත යන තන්හි උපපජ්ජන්තය ද මාරු කොට වදරා ඇති බැවින් විස්තර නොකියන ලදි.]

**වර්‍තමානාතීත වාරය නිමි.**

# වර්‍තමානානාගත පුද්ගල වාරය

**චක්ඛායතන මූලය:-** වර්‍තමානාතීත වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව වර්‍තමානානාගත වාරය වදළ සේක:- කෙසේ වදළ සේක් ද යත්, - ''යස්ස චක්ඛායතනං නිරුජ්ඣති, තස්ස සොතායතනං නිරුජ්ඣිස්සතීති, පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං, යෙච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං ඉතරෙසං සචක්ඛුකානං චවන්තානං තෙසං යස්ස වා පන, සබ්බෙසං උපපජ්ජන්තානං අචක්ඛුකානං චවන්තානං තෙසං සචක්ඛුකානං චවන්තානං තෙසං,''

අනුලෝම අභිධෙය්‍ය-පඤ්චවෝකාර ත්‍රිහේතුක චුතිසිත් (9) නවය චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආය්‍ය‍ර්‍ය පුද්ගලයාය, කාමසුගති භූමි (7) සත, සුභකිණ්හකය තෙක් රූපභූමි (9) නවය යන මෙ භූමිවල දී යට මාර්ග ලැබ අරූප භූමියෙහි ඉපද පිරිනිවෙන්නාවූ පඤ්චවෝකාරයෙහි චුතවන යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුහු ගනු ලැබෙති. පඤ්චවෝකාර භූමියෙහි මතු නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මෙ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

ප්‍රතිලෝම අභිධෙය්‍ය-පඤ්චවෝකාර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන්විස්ස, චෛතසික (35) පන්තිස කර්මජ කලාප (3-7-4) තුන - සත - සතර බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ උපදින සියලු පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය සචක්ඛුකව කාමාවචරයෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. අසඤ්ඤසත්ත-අරූප තලයන්හි චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පුද්ගලයෝද යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසයද එසේ ගනු ලැබේ.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය, "අරූපෙ පච්ඡිමභවිකානං තෙසං," පශ්චිම භවිකව අරූප භූමියෙහි උපදනාවූ යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය චුතවන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයාය, අරූප භූමි එකින් එක ඉහලට ඉපද පිරිනිවෙන්නාවූ අරූපයෙහි උපදින - චුතවන යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

## ඝාණායතන මූලීයෙහි

"පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං, ඉතරෙසං සචක්ඛුකානං චවන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං, අචක්ඛුකානං චවන්තානං තෙසං,"

අනුලෝම අභිධෙය්‍ය - පඤ්චවොකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයාය, කාමසුගති භූමි සතෙන් රූපභූමියට පැමිණ පිරිනිවෙන්නාවූ කාම භූමියෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය. රූපභූමි එකින් එක ඉහළට ඉපිද පිරිනිවෙන්නාවූ රූපභූමියෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සතෙහි සුභකිණ්හක තෙක් ඇති රූපභූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියෙහි මතු පිරිනිවීමට යන්නාවූ පඤ්චවෝකාරයෙහි චුතවන, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

කාමාවචර භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ සචක්ඛුකව පඤ්චවෝකාර භූමියෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා හා යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයෝද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය;-** කාමාවචර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3 - 7 - 4) තුන - සත - සතර බැගිනි, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ උපදින සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය, අචක්ඛුකව කාමාවචර භූමියෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය.

අසංඥතල අරූතලයෙහි චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය:-** "පච්ඡිම භවිකානං රූපාවචරං උපපජ්ජන්තානං අරූපෙ පච්ඡිම භවිකානං තෙසං," පශ්චිම භවිකව රූප භූමියෙහි උපදනා වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, සුභකිණ්හකය තෙක් රූපාවචර භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියෙහි ඉපද මතු පිරිනිවෙන්නා වූ රූපභූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, රූප භූමි එකින් එක ඉහළට ඉපද මතු පිරිනිවෙන්නා වූ රූපභූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, පශ්චිම භවිකව අරූපයෙහි උපදනාවූ යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය. චුතවන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයාය, අරූප භූමි එකින් එක ඉහළට ඉපිද මතු පිරිනිවෙන්නා වූ අරූතලයෙහි උපදින - චුතවන යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, [ජිව්හා - කාය - ගන්ධ - රස - පොට්ඨබ්බ මූලී වාරයෝද මීට සමානය රූපායතන මූලිය ද සෝතායතන මූලී මෙන් ස්වරූප උද්ධරනු.]

මනායතන මූලීයෙහි "පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං - තෙසං ඉතරෙසං සචක්ඛුකානං චවන්තානං තෙසං - යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං අචක්ඛුකානං චවන්තානං තෙසං"

**අනුලෝම අභිධෙය:-** පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති සිත් (9) නවය චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ කලාප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයා ගනු ලැබේ. පිරිනිවෙන්නා හැර සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය පෙර සේ ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය:-** ප්‍රතිසන්ධි සිත් (9) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3 - 7 - 4) තුන සත සතර බැගින් ඇති මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සියලුම උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, අචක්ඛුකව කාමාවචරයෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, අසංඥතල, අරූප තලයෙහි චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුහු ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ. ප්‍රත්‍යනීක අභිධෙය, "අරූපෙ පරිනිබ්බන්තානං තෙසං" අරූතලයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයා ගනු ලැබේ. ධම්මායතනය මූලිය ද සමානය,

## ඝ්‍රාණායතන මූලය

ඝ්‍රාණායතන මූල ජිව්හායතන මූලියෙහි "කාමාවචරෙ පරිනිබ්බන්තානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං ඉතරෙසං සඝානකානං චවන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං අඝානකානං චවන්තානං තෙසං,"

**අනුලෝම අභිධෙය්‍ය:-** කාමාවචරයෙහි පිරිනිවෙන අරහත් ඵලස්ථ ආර්ය පුද්ගලයෝය, කාමසුගති භූමි (7) සතෙන් රූප - අරූප භූමීන්ට පැමිණ පිරි- නිවෙන්නාවූ කාමාවචරයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, කාමාවචර භූමියෙහි මතු නැවත නිරුද්ධවන්නාවූ සඝානකව කාමභූමියෙහි චුතවන්නාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙරසේ ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** කාමාවචර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ සියලුම උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය අඝානකව කාමභූමියෙහි චුතවන්නාවූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, රූප - අරූප තලයෙහි චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පුද්ගලයන්ය, මොවුහු ගනු ලැබෙති, අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනික අභිධෙය්‍ය:-** ''රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං තෙසං' පශ්චිමභවිකව රූප - අරූප තලයන්හි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාය, චුතවන අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයාය, සුභකිණ්හක තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ මතු පිරිනිවෙන්නාවූ රූපභූමියෙහි උපදනාවූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදින - චුතවන යට ඵලස්ථ ආර්ය්‍ය පුද්ගල- යන් (3) තිදෙනාය රූප - අරූප භූමි එකින් එක ඉහළට ඉපද මතු පිරිනිවන් යන්නාවූ රූප - අරූප තලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, [කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලි වාරයෝ ද මීට සමානය.]

**රූපායතන මූලියෙහි:-** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, යෙ ච අරූපං උප- පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං ඉතරෙසං සඝාන- කානං චවන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං චවන්තානං තෙසං,''

**අනුලෝම අභිධෙය්‍ය:-** කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථයාය කාමසුගති භූමි (7) සතෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ මතු පිරිනිවන් යන්නාවූ කාමාවචරයෙහි චුතවන යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, පඤ්චවෝකාර භූමියෙහි නැවතත් මතු නිරුද්ධවන්නාවූ සඝානකව කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති, සංසය අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** පඤ්චවෝකාර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් සිවුදෙනාය, යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අඝානකව කාමාවචරයෙහි චුත-

චන්නාවූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, රූප - අරූප භූමින්හි චුතවන්නාවූ සුගති අහේතුක - ත්‍රිහේතුක යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, අනුලෝම සංසය ද ලැබේ. [අරූප තලයෙහි පෘථග්ජන ත්‍රිහේතුකයාම ලැබේ.]

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:-** ''රූපාවචරෙ පරිනිබ්බන්තානං, අරූපෙ පච්ඡිම-භවිකානං තෙසං''

රූපභූමියෙහි පිරිනිවෙන රහතන් වහන්සේය, පශ්චිම භවිකව අරූපතල-යෙහි උපදින යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, පිරිනිවෙන රහතන් වහන්සේය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ මතු පිරිනිවෙන්නාවූ රූප - භූමියෙහි චුතවන යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, අරූපභූමි එකින් එක ඉහළට ඉපිද මතු පිරිනිවෙන්නාවූ අරූප භූමියෙහි උපදින - චුතවන යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. [රූප භූමියට පැමිණ පිරිනිවෙන පුද්ගල-යකු පාලියෙහි වදරා නැත, එසේ කීම සුදුසු බැවින් ස්වරූප උදුරන ලදි.]

**මනායතන මූලියෙහි:-** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං තෙසං ඉතරෙසං සසානකානං චවන්තානං තෙසං යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං අසානකානං චවන්තානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලසථ ආයතී පුද්ගලයා ගනු ලැබේ. පිරිනිවෙන රහතන් වහන්සේ හැර සසානකව කාමා-වචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා සහ යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති.

**සංසය අභිධෙය්‍ය:-** පෙර සේම ගනු ලැබේ. ප්‍රතිලෝම අභිධෙය්‍ය සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනය, යට ඵලසථ පුද්ගලයන් (3) තිදෙනය, අසානකව කාමාවචරයෙහි චුතවන දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. රූප - අරූප භූමින්හි චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක යට ඵලසථ ආයතී පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:-** ''රූපාවචරෙ අරූපාවචරෙ පරිනිබ්බන්තානං තෙසං,'' රූප - අරූප භූමින්හි පිරිනිවෙන රහතන් වහන්සේ ගනු ලැබෙති. [ධම්මායතන මූලිය ද මෙයට අනුවම ලැබේ. ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බායතන මූලයෝ ද මේ ඝානායතන මූලයට සමානයහ.]

## රූපායතන මූලය

රූපායතන මූල ගන්ධායතන මූලියෙහි ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං යෙ ච රූපාවචරං - අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්-තානං තෙසං ඉතරෙසං සරූපකානං චවන්තානං තෙසං යස්ස වා පන, සබ්බෙසං

උපපජ්ජන්තානං අරූපකානං චවන්තානං තෙසං [චක්ඛායතන මූල ඝානායතන මූලිය හා සමානය.] **ප්‍රත්‍යනීකය,** ''පච්ඡිම භවිකානං රූපාවචරං උපපජ්ජන්තානං., (චක්ඛු මූල ඝාන මූලි මෙන් ස්වරූප උදුරනු.)

**මනායතන මූලියෙහි** ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං තෙසං ඉතරෙසං සරූපකානං චවන්තානං තෙසං, යස්ස වා පන, සබ්බෙසං උපපජ්ජන්තානං අරූපකානං චවන්තානං තෙසං,'' [ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධ හා වේදනාස්කන්ධ වාරය මෙන් උදුරනු.]

**ප්‍රත්‍යනීකය:**– ''අරූපෙ පරිනිබ්බන්තානං තෙසං'' (පෙර සේ ස්වරූප කියනු. ධම්මායතන මූලියද සමානය.)

## මනායතන මූලය

**මනායතන මූල ධම්මායතන මූලියෙහි;**– ''පරිනිබ්බන්තානං තෙසං, ඉතරෙසං සචිත්තකානං චවන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං, අචිත්තකානං චවන්තානං තෙසං,'' [ප්‍රත්‍යනීකයෙහි අවශේෂයෙක් නොමැත, පාලිගතික වූම විසඳුම වේ, ස්කන්ධ යමකයෙහි වේදනාස්කන්ධ හා සඤ්ඤස්-ඛන්ධ වාරය අනුව කියනු.]

**පුද්ගල වාරය නිමි.** (ඕකාස වාරය සුගමයි.)

---

# පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය:**– පුද්ගලෝකාස වාරයෙහි ''යස්ස යත්ථ චක්ඛායතනං නිරුජ්ඣති, තස්ස තත්ථ සොතායතනං නිරුජ්ඣිස්සතීති, පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ පඤ්චවොකාරං උපපජ්ජන්තානං, අචක්ඛුකානං කාමාවචරා චවන්තානං තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙය්‍ය;**– පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති සිත් (9) නවය, චෛතසික (35) පන්තිස අන්තිම කර්මජරූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලසථ ආයතී පුද්ගලයන්ගේ අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය අන්තිම කර්මජ රූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගීවූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලසථ ආයතී පුද්ගලයන්ගේ (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ අකනිට්ඨව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසස, අන්තිම කර්මජරූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගිවූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි චුතවන්නාවූ

පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය මෙ පුද්ගලයන්ගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය පෙරසේම ලැබෙති.

**ප්‍රතිලෝම අභිධෙයා:**- පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය. චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3 – 7 – 4) තුන - සත - සතර බැගිනි. මෙ ධර්මයන්ගේ උද්පාදක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධවන්නාවූ අචක්ඛුකව කාමාවචරයෙහි චුතවන දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති. [මෙහි දී තමන් උපදින්නාවූ භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ අචක්ඛුකය අතිරේකව ගනු ලැබේ.] අනුලෝම සංසය ද ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙයා:**- ''අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ'' අසංඥතල අරූතලයන්හි උපදින චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පුද්ගලයෝය ඵලස්ථ ආයතී පුද්ගලයන් (4) සිවුදෙනාය මේ පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ව භූමිය, අරූප භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ නොවන්නාවූ අචක්ඛුකව කාමාවචරයෙහි චුතවන්නාවූ දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති. [පාලි නැති අවසේසය පහසුය, මෙබඳු අවශේෂ අනේකාන්තය පාලියෙහි පිළිවෙළින් නැත, නැත්තේ නමුත් ලැබීමට සුදුසු තැන්හි ඇතුලත් කොට කියනු.]

**ඝානායතන මූලීයෙහි:**- ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරා, චවන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං කාමාවචරා චවන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ කාමාවචරං උපපජ්ජන්තානං අචක්ඛුකානං කාමාවචරා චවන්තානං තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙයා:**- කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතරය චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාමාවචර යෙහි පිරිනිවෙන අර්හත් ඵලසථ ආයතී පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ නොවන්නාවූ කාම චුති සිත් (10) දසය, චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූපය යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සචක්ඛුකව කාම භූමියෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, රූප චුති සිත් (5) පසය. චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ රූප භූමියෙහි චුතවන, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, ඵලසථ ආයතී පුද්ගලයන් (4) සිවු දෙනාය. යන මේ පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොස යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ කාම චුති සිත් (10) දහය චෛතසික (33) තෙතිසය අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සචක්ඛුකව කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලසථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය. යන මේ පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස ගනු ලැබෙති, සංසය පෙරසේම ලැබෙති.

**ප්‍රතිලෝම අභිධෙයය:**- කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3-7) තුන - සත බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාම භූමියෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලසථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය. යන මොවුන්ගේ කාම භූමි (11) එකොළසය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ අචක්ඛුකව කාමාවචරයෙහි චුතවන්නාවූ දුගති සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාම භූමි (6) සය යන මේ භූමි ගනු ලැබෙති, අනුලෝම සංසයද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙයය:**- ''රූපාවචරං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ'' රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය චෛතසික (35) පන්තිසය කර්මජ කලාප (4) සත බැගිනි. මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ රූපභූමියෙහි ඉපදෙන ත්‍රිහේතුක පෘථග්ජනයාය යට ඵලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ අසඤ්ඤ සත්ත වර්ජිත රූපාවචර භූමි (15) පසළොසය. අසංඥ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ භූමිය, අරූප තලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන - ඵලසථ ආයතී පුද්ගල (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ අචක්ඛුකව කාමාවචරයෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සයය. යන මේ භූමි ගනු ලැබෙති. [ජිව්හා - කාය - ගන්ධ - රස ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කිමේදීද මෙයට සමානය.]

**රූපායතන මූලියෙහි:**- [අනුලෝම, චක්ඛායතන මූල සොතායතන මූලිය මෙනි.] ප්‍රතිලෝමයෙහි ''පඤ්චවොකාරං උපපජ්ජන්තානං, අචක්ඛුකානං කාමාවචරා චවන්තානං ''අසංඤ්ඤසත්තානං තෙසං තත්ථ'' (යන මෙපමණක්ම විශේෂයි) අසංඥ තලයෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ අසංඥ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ සත්ව භූමිය ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙයය:**- ''අරූපානං තෙසං තත්ථ'' අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ සහ ඵලසථ ආයතී පුද්ගලයන් (4) සිවු දෙනාගේ අරූප භූමි (4) සතරය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ නොවන්නාවූ අචක්ඛුකව කාමාවචර භූමියෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාම භූමි (6) සයය, අසංඥ තලයෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ අසංඥ තලයෙන් චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය යන මේ භූමි ගනු ලැබෙති.

**මනායතන මූලියෙහි** ද (අනුලෝමය සමානය) ප්‍රතිලෝමයෙහි ''පඤ්චවොකාරං උපපජ්ජන්තානං, අචක්ඛුකානං කාමාවචරා චවන්තානං, අරූපානං තෙසං තත්ථ'' [සොතායතන අනුව එහි ප්‍රතිලෝමයෙහි ''අරූපානං'' යනු පමණක් විශේෂ වත් වේ.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ අරූප තලයෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති, ප්‍රත්‍යනීකයෙහි ''අරූපෙ පරිනිබ්බන්තානං. අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ'' [අරූපයෙහි පරිනිබ්බන්ත ඒකාන්තයි අනේකාන්ත අසඤ්ඤසත්තයය, අචක්ඛුක චවන්තයද අනේකාන්ත පදයට උදුරනු.]

**ධම්මායතන මූලිය** ද (අනුලෝමයට සමානය) ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං උපපජ්ජන්තානං. අචක්ඛුකානං චවන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං චවන්තානං තෙසං තත්ථ''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3 - 7 - 4) තුන, සත, සතර බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමගිවූ සියළුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයින් (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතරය පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, අසඤ්ඤ සත්ව භූමිය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ අචක්ඛුකව කාමාවචරයෙහි චුතවන සුගති - සුගති අහේතුක පුද්ගලයන්ගේ කාම භූමි (6) සයය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ අසංඥ තල අරූප තලයන්හි චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක - යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ අසංඥ තලය, අරූතල (4) සතර යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීකය:-** ''අරූපෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' (අරූපෙ පරිනිබ්බන්ත ඒකාන්තයි, අසඤ්ඤසත්ත චවන්ත හා අචක්ඛුක ද අනේකාන්ත වශයෙන් උදුරනු.)

## ඝාණායතන මූලය

**ඝාණායතන මූල ජිව්හායතන මූලියෙහි:-** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ ඉතරෙසං සඝානකානං චවන්තානං තෙසං තත්ථ. යස්ස වා පන යත්ථ, කාමාවචරං උපපජ්ජන්තානං, අඝානකානං කාමාවචරා චවන්තානං තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙය්‍ය;-** ත්‍රිහේතුක කාම චුති සිත් (4) සතරය චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමගීවූ කාම භූමියෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

කාමචුති සිත් (10) දශය, චෛතසික (33) තෙතිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සසානකව කාමභූමියෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ හා යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ද කාම භූමි (11) එකොළසය, යන මෙ භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ කාම චුති සිත් (10) දශය චෛතසික (33) තෙතිසය අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ කාම භූමියෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළස ද ගනු ලැබෙති. සංසය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම** අභිධෙය්‍ය:- කාම ප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3 - 7) තුන, සත බැගින් ඇති මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාමාවචරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළසය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ අසානකව කාම භූමියෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පස ගනු ලැබේ.

**ප්‍රත්‍යනීකය**:- ''රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ'' රූප අරූප තලයන්හි උපදින චුතවන පුද්ගලයන්ගේ රූප අරූප භූමි (20) ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ අසානකව කාමාවචරයෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පස ගනු ලැබෙති. [කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ මූලි කොට කීමෙහිදී ද මීට සමානය.]

රූපායතන මූලි (අනුලෝමයෙහි ජිව්හා මූලිය හා සමානය.) ප්‍රතිලෝමයෙහි ''කාමාවචරං උපපජ්ජන්තානං අසානකානං කාමාවචරා චවන්තානං, රූපාවචරානං තෙසං තත්ථ'' ප්‍රතිලෝම අභිධෙය්‍ය (රූපාවචරානං යනුම විශේෂයි.) තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූප භූමියෙහි උපදින චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක යට ඵලස්ථ ආයර්‍ය පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ රූප භූමි (16) සොළස ගනු ලැබෙති, [උපපජ්ජන්තේ නම් රූප භූමි (16) සොළසය චවන්ත, චේ නම් සුද්ධාවාස වර්ජිත රූප භූමි (11) එකොළසය, යථා ලාභ වශයෙනි.]

**ප්‍රත්‍යනීකය**:- ''රූපාවචරෙ පරිනිබ්බන්තානං අරූපානං තෙසං තත්ථ'' රූපාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආයර්‍යයන් වහන්සේගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ රූපාවචරයෙහි චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක යට ඵලසථ ආයර්‍ය පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ අකනිට්ඨාව හැර රූප භූමි (15) පසළොසය, අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආයර්‍ය පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ අරූප භූමි (4) සතරය, තමන්

ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ අසානකව කාමාවචරයෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පස යන මේ භූමි ගනු ලැබෙති.

**මනායතන මූලියෙහි**:- (අනුලෝමය සමානය) ප්‍රතිලෝමයෙහි, "කාමාවචරං උපපජ්ජන්තානං, අසානකානං කාමාවචරා චවන්තානං, රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ,"

**ප්‍රතිලෝම අභිධෙය්‍යා**:- තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූප, අරූප භූමින්හි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන යට එලස්ථ ආයඞ පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ රූප භූමි (15) පසළොස හා අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (මෙපමණක්ම විශේෂයි.)

**ප්‍රත්‍යනීක**:- "රූපාවචරේ අරූපාවචරෙ පරිනිබ්බන්තානං අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ" [රූපාවචර අරූපාවචර පරිනිබ්බන්ත **ඒකාන්ත** අනේකාන්තයි අසානකය අනේකාන්තයි **අසඤ්ඤසත්ත** සියල්ල අනේකාන්තයි.]

**ධම්මායතන මූලියෙහි**:- (අනුලෝම සමානය) ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං උපපජ්ජන්තානං තෙසං තත්ථ"

**ප්‍රතිලෝම අභිධෙය්‍යා**:- සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ කාම භූමි (11) එකොළසය රූප භූමි (16) සොළසය, අරූප භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ අසානකව කාමාවචරයෙහි චුතවන දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පසය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූපාවචර අරූපාවචරයෙහි චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක යට එලස්ථ ආයඞ පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ සුද්ධාවාස වර්ජිත රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීකය**:- "රූපාවචරේ අරූපාවචරේ පරිනිබ්බන්තානං තෙසං තත්ථ" [ඒකාන්ත - අනේකාන්ත උදුරනු අසඤ්ඤසත්ත චවන්ත අනේකාන්තයි අසානක අනේකාන්තය ඇතුලත්කොට උදුරනු ජිව්හායතන මූලියද සමානය අජිව්හක චවන්තයෙහි "ජිව්හා ලැබීමට ප්‍රථමයෙන් චුතවීමට නියත වූ පුද්ගලයා" යනුවෙන් කියන ලද්දම විශේෂයි. කායායතන මූලයටද ක්‍රමය සමානයි.]

---

## රූපායතන මූලය

**රූපායතන මූල ගන්ධායතන මූලියෙහි**:- "කාමාවචරේ පරිනිබ්බන්තානං රූපාවචරා චවන්තානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරා චවන්තානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ" රූපාවචරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ", (ස්වරූප සුගමයි,)

**මනායතන මූලීයෙහි:-** ''පඤ්ච වෝකාරේ පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තං චවන්තානං තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවොකාරා චවන්තානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ පඤ්චවෝකාරං උපපජ්ජන්තානං, අරූපානං තෙසං තත්ථ''

**ප්‍රත්‍යනීකය:-** ''අරූපෙ පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' (ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධය හා වේදනාස්කන්ධය මෙ පරිදි ස්වරූප උදුරනු.)

ධම්මායතන මූලීයෙහි ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සබ්බෙසං උපපජ්ජන්තානං අරූපකානං චවන්තානං තෙසං තත්ථ,''

**අනුලෝම අභිධෙය:-** පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් චලස්ථ ආයඹී පුද්ගලයන්ගේ අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ පඤ්චවෝකාර අසංඥ තලයන්හි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද යට චලස්ථ ආයඹී පුද්ගලයන් (3) තිදෙනාගේ ද අකනිට්ඨව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස හා අසංඥ භූමිය ගනු ලැබේ. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ පඤ්චවෝකාර අසංඥ තලයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ ද යට චලස්ථ ආයඹී පුද්ගලයන් (3) තිදෙනාගේ ද ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස හා අසඤ්ඤසත්ව භූමිය ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය:-** සියළුම ඉපදෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ යට චලස්ථ ආයඹී පුද්ගලයන් (3) තිදෙනාගේ කාම භූමි (11) එකොළස රූප භූමි (16) සොළොස අරූප භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ අරූප චුති සිත් (4) සතරය චෛතසික (30) තිසය, මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ අරූතලයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ සහ යට චලස්ථ ආයඹී පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීකය:-** ''අරූපෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' (ඒකාන්ත අනේකාන්ත බෙදනු.)

## මනායතන මූලය

**මනායතන මූල ධම්මායතන මූලීයෙහි:-** ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ ඉතරෙසං සචිත්තකානං චවන්තානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ සබ්බෙසං උපපජ්ජන්තානං, අචිත්තකානං චවන්තානං තෙසං තත්ථ'' අනුලෝම අභිධෙය පරිනිබ්බන්ත ඒකාන්ත අනේකාන්ත උදුරනු.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ චුති සිත් (19) එකුන්විස්ස චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ ද යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතරය සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය පෙරසේම ගනු ලැබෙති.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ කාම භූමි (11) එකොළස, අරූප භූමි (4) සතර අසංඥතලයෙහි, මතු නැවත නිරුද්ධ වන්නාවූ අසංඥ තලයෙහි චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසංඥ භූමිය යන භූමි ගනු ලැබෙති. [මෙහි අසඤ්ඤසත්තයෙහි මතු නිරුද්ධ වන්නාවූ අසඤ්ඤසත්තයෙහි චුතවන පුද්ගල භූමි කිම අතිරේකයි. 'ප්‍රත්‍යනික සංසය' පාලියෙහි අතිරේකව නැත. පාලි අනුව විසඳුම වේ අනුලෝමය නිමි. ප්‍රත්‍යනික සංසය අව-ශිෂ්ඨය, බෙද කියන ලදී. අනුලෝමයට ප්‍රතිලෝමය ප්‍රතිමෝමයට අනුලෝමය මාරුකොටම කියනු.]

**වත්මානානාගත වාරය නිමි.**

---

# අතීතානාගත පුද්ගල වාරය – චක්ඛායතන මූලය

**අතීතානාගත වාරයෙහි:-** ''යස්ස චක්ඛායතනං නිරුජ්ඣිත්ථ තස්ස සොතායතනං නිරුජ්ඣිස්සතීති, පඤ්ඤවෝකාරෙ පරිනිබ්බන්තානං, අරූපෙ පච්ඡිම භවිකානං, යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං ඉතරෙසං තෙසං යස්ස වා පන ආමන්තා''

**අනුලෝම අභිධෙය්‍ය;-** පඤ්චවෝකාරයෙහි !අර්හත් ඵලසථ ආයතී පුද්ගලයාය, පශ්චිමභවිකව අරූප භූමියෙහි උපදින යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයෝය. කාම සුගති භූමි (7) සතෙහි සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියෙහි ඉපද මතු පිරිනිවනට නියතවූ පඤ්චවෝකාරයෙහි චුත වන යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකෙන් එක ඉහලට ඉපද මතු පිරිනිවීමට නියතවූ අරූප භූමියෙහි උපදින චුතවන යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි මතු නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, අසංඥතල – අරූතලයන්හි උපදින චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. (ප්‍රත්‍යනිකයෙහි අතිරේක නොමැත, නත්ථි හා නිරුජ්ඣිත්ථ යනුම වේ.

**ඝානායතන මූලියෙහි:-** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරේ අරූපාවචරේ පච්ඡිම භවිකානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං ඉතරෙසං තෙසං''

**අනුලෝම අභිධෙය්‍ය:-** කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝය. පශ්චිම භවික රූප - අරූප භූමීන්හි උපදින ත්‍රිහේතුක පෘථග්- ජනයාය, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය. චුතවන අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයාය, කාම සුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ මතු පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාය, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, කාම සුගති භූමි (7) සතෙන් අරූප භූමියට පැමිණ පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, සුභකිණ්හතලය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවීමට නියත වූ රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදින චුතවන යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකින් එක ඉහලට ඉපද මතු පිරිනිවීමට නියත වූ අරූතලයෙහි උපදින - චුතවන යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

කාමාවචර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාය, රූප - අරූප භූමීන්හි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. [අතිරේකයක් නොමැත, ජිව්හා, - කාය - ගන්ධ - රස ඵොට්ඨබ්බ මූලි කොට කීමේදී ද මීට සමානය, රූපායතන මූලියද මෙයට සමානය.]

**මනායතන මූලියෙහි:-** ''පරිනිබ්බන්තානං තෙසං, ඉතරෙසං තෙසං, යස්ස වා පන, ආමාන්තා'' අනුලෝම අභිධෙය්‍ය ත්‍රිහේතුක චුති (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපය, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ චතුවෝකාර - පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ගනු ලැබෙති. පිරිනිවෙන රහතන් වහන්සේ හැර සියලුම උපදිමින් චුතවෙමින් සිටින, පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. [අතිරේකයක් නැත. සෝතායතන මූලය - ඝානායතන මූලය යනාදී වාරයෝ ද මේ අනුව දත යුතුය.]

**පුද්ගල වාරය නිමි.** - (ඔකාස වාරය සුගමය)

## පුද්ගලෝකාස වාරය

**චක්ඛායතන මූලය:-** පුද්ගලෝකාස වාරයෙහි ''යස්ස යත්ථ'' චක්ඛායතනං නිරුජ්ඣිත්ථ, තස්ස තත්ථ සොතායතනං නිරුජ්ඣිස්සතීති, පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙය්‍ය;-** පඤ්චවෝකාර ත්‍රිහේතුක චුති සිත් (9) නවය චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ නොවන්නා වූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස, ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. [අතීත සන්නිට්ඨාන පදයේ දී සුද්ධාවාස අත්හරිනු ලැබේ.]

ප්‍රතිලෝම අභිධෙය්‍ය:- රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිත් (1) එකය, චෛතසික (30) තිසය, කර්මජ රූප (4) බැගින් මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සුද්ධාවාසයෙහි උපදින අනාගාමි ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබේ. අනුලෝම සංසය ද එසේම ගනු ලැබේ. 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ'' රූපාවචර පඤ්චමධ්‍යාන චුති සිත් (1) එකය චෛතසික (30) තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සුද්ධාවාසයෙහි පිරිනිවෙන අනාගාමි ඵලස්ථ අර්හත් ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය අසංඥතල - අරූතලයන්හි උපදින චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගල (4) සිවු දෙනා යන මේ පුද්ගලයන්ගේ අසංඥ සත්ව භූමිය අරූප භූමි (4) සතර යන මේ භූමි ගනු ලැබෙති.

සායතන මූලියෙහි ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ, ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය:- කාමාවචරයෙහි අර්හත් ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නා වූ කාමාවචර චුති සිත් (10) දසය චෛතසික (33) තෙතිස අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මොවුන්ගේ කාම භූමි (11) එකොළසය රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගල (4) සිවුදෙන යන මොවුන්ගේ වෙහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශය යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධවන්නා වූ කාමාවචරයෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළස ද ගනු ලැබෙති. සංසය පෙර සේම ගනු ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:- ''සුද්ධාවාසානං අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ'' සුද්ධාවාසයෙහි උපදින - චුතවන අනාගාමි ඵලස්ථ අර්හත් ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය අසංඥසත්වයෙහි උපදින චුතවන

සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ව භූමිය අරූප තලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක, ඵලස්ථ ආයතී පුද්ගල (4) සිවුදෙනා යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති. (ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කීමේදී ද මීට සමානය.)

**රූපායතන මූලියෙහි:-** (අනුලෝමයෙහි සෝතායතන මූලි සමානය) ප්‍රතිලෝමයෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ [චක්ඛුමූල සොතමූලි අනුව ගැනීමේ දී ප්‍රතිලෝමයෙහි ''අසඤ්ඤසත්තානං'' යනුම විශේෂ වේ. අසඥසත්ත භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ අසඤ්ඤසත්තයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ව භූමිය ගනු ලැබේ. මෙපමණක්ම විශේෂයි.]

**ප්‍ර**ත්‍යනික අභිධෙය්‍ය:- ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං අරූපානං තෙසං තත්ථ'' අසංඥතලයෙහි මතු නැවත නිරුද්ධ නොවන්නා වූ අසංඥ සත්වයෙහි චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ත භූමිය (අවසේස සුද්ධාවාස පරිනිබ්බන්තයට අනුව ස්වරූප උද්ධරනු.)

**මනායතන මූලියෙහි ද:-** (අනුලෝමය සමානය) ''සුද්ධාවාසං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ [මෙහි අරූපානං යනුම විශේෂයි.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ අරූතලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන - යට ඵලස්ථ ආයතී පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (මෙපමණක්ම විශේෂයි.]

ප්‍රත්‍යනික **අභි**ධෙය්‍ය:- ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' (පාළි අනුව උද්ධරනු.)

ධම්මායතන මූලියෙහි ද:- (අනුලෝම විශේෂයෙක් නැත.) ප්‍රතිලෝමයෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ'' [මෙහිද මනායතන මූලියට වඩා අසඤ්ඤසත්තානං යනුම විශේෂයි.] අසංඥසත්ව භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ අසඤ්ඤ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ව භූමිය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධවන්නාවූ අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආයතී පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ අරූප භූමි (4) සතර යන මේ භූමි ගනු ලැබෙති.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය:- ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං අරූපෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' අසඤ්ඤ සත්ව භූමියෙහි මතු නැවතත් නිරුද්ධ නොවන්නාවූ අසංඥ සත්වයෙහි චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ව භූමිය [මේ අනේකාන්ත පදය ඇතුලත් කොට සුද්ධාවාසයට අනතුරුව ස්වරූප උද්ධරනු.]

## ඝානායතන මූලය

ඝානායතන මූල ජිව්හායතන මූලියෙහි ''කාමාවචරෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ ආමන්තා''

අනුලෝම අභිධෙය්‍ය කාමාවචරයෙහි පිරනිවෙන අර්හත් ඵලස්ථ ආයඊ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නා වූ කාම චුති සිත් (10) දසය චෛතසික (33) අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ කාම භූමියෙහි චුතවන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයඊ පුද්ගලයන් (3) තිදෙනාය, යන මොවුන්ගේ කාම භූමි (11) එකොළස යන මේ භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ කාමාවචරයෙහි උපදින - චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා යට ඵලස්ථ ආයඊ පුද්ගලයන් (2) දෙදෙනා යන මොවුන්ගේ කාම භූමි (11) එකොළස ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:- ''රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ'' [සියලු පුද්ගල භූමි උද්ධරනු කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ ඇතුලත් කොට කිමේදී ද මේ හා සමානය.]

රූපායතන මූලීයෙහි (අනුලෝමයෙහි ජිව්හාමූලී සමානයි.) ප්‍රතිලෝමයෙහි ''රූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ'' තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ රූපාවචරයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආයඊ පුද්ගල (3) තිදෙනා යන මොවුන්ගේ රූපභූමි (16) සොළස ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ කාම භූමියෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයින් (4) සිවුදෙන, යට ඵලස්ථ ආයඊ පුද්ගලයන් (2) දෙදෙන යන මොවුන්ගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:**- ''රූපාවචරෙ පරිනිබ්බන්තානං අරූපානං තෙසං තත්ථ'' [රූපාවචර පරිනිබ්බන්ත ඒකාන්තයය, අනේකාන්තය - අසඤ්ඤසත්ත වවන්ත අනේකාන්තය, අරූප - සියලු භූමි පුද්ගලයන්ගේ ස්වරූප වශයෙන් උද්ධරනු.]

**මනායතන මූලීයෙහි:**- (අනුලෝම සමානයි) ප්‍රතිලෝමයෙහි ''රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කාමවචරානං තෙසං තත්ථ'' තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ රූප අරූප භූමින්හි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආයඊ පුද්ගල (3) තුන්දෙන යන මොවුන්ගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොස අරූප භූමි (4) සතර ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නා වූ කාමභූමියෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනය. යට ඵලස්ථ ආයඊ පුද්ගලයන් (2) දෙදෙනාය යන මොවුන්ගේ කාමභූමි (11) එකොළසද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:**- ''රූපාවචරෙ අරූපාවචරේ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' [රූපාවචර අරූපාවචර පරිනිබ්බන්ත එකාන්ත - අනේකාන්තය, අසඤ්ඤසත්ත සියල්ල ස්වරූප උද්ධරනු.]



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

**ධම්මායතන මූලියෙහි:-** (අනුලෝමය සමානය) ප්‍රතිලෝමයෙහි ''රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ,'' තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූප - අරූප භූමීන්හි උපදින - චුතවන සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන - යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙන යන මොවුන්ගේ රූපභූමි (16) සොළස, අරූප භූමි (4) සතර ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:-** ''රූපාවචරෙ අරූපාවචරෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ,'' [රූපාවචර අරූපාවචර පරිනිබ්බන්ත ඒකාන්ත - අනේකාන්ත, අසඤ්ඤ සත්ත අනේකාන්තය ඇතුලත් කොට උද්ධරනු. ජිව්හා කාය - ගන්ධ - රස ඵොට්ඨබ්බ වාරද මේ ඝානමූල වාරය අනුව මැයි.]

---

## රූපායතන මූලය

**රූපායතන මූල ගන්ධායතන මූලියෙහි:-** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ ආමන්තා'' [චක්ඛායතන මූල ඝානායතන මූලි අනුව කියන ලද්දට අසඤ්ඤ සත්තය ඇතුලත් කොට උද්ධරනු.]

**ප්‍රත්‍යනීක අභිධෙය:-** ''සුද්ධාවාසානං, අරූපානං තෙසං තත්ථ'' මනායතන මූලියෙහි ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසානං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ,'' ''ප්‍රත්‍යනීක අභිධෙය්‍ය'' ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං, අරූපෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ,'' [ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධ හා වේදනාස්කන්ධ වාරය අනුව ස්වරූප උද්ධරනු.]

**ධම්මායතන මූලියෙහි:-** ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ,''

අනුලෝම අභිධෙය්‍ය:- පඤ්චවෝකාරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵල තෙක් රූපභූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ නොවන්නාවූ පඤ්චවෝකාර චුති (15) පසළොසය චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ පඤ්චවෝකාර අසංඥ තලයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙනාය, මොවුන්ගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, අසංඥ භූමිය යන මේ භූමි ගනු ලැබෙති. (සෙස්ස පෙර සේ කියනු) 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' ''සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං, අරූපෙ පරිනිබ්බන්තානං තෙසං තත්ථ''

## මනායතන මූලය

මනායතන මූල ධම්මායතන මූලියෙහි "පරිනිබ්බන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ." [අනුලෝම අභිධෙය්‍ය පරිනිබ්බන්ත ඒකාන්ත - අනේකාන්තය, සුද්ධාවාස අත්හරිනු.]

ප්‍රත්‍යනික අභිධෙය්‍ය:- "සුද්ධාවාසෙ පරිනිබ්බාන්තානං තෙසං තත්ථ [මතු නිරුද්ධ නොවන්නාවූ අසඤ්ඤ සත්ත භූමිය ඇතුලත් කොට උදුරනු. අනුලෝම නිමි. ප්‍රත්‍යනිකයෙහි ද සංසය දෙකට බෙද කියනු අනුලෝම - ප්‍රතිලෝම මාරු කොට කියනු.]

**අතීතානාගත වාරය නිමි. - නිරෝධ වාරය නිමි.**

---

# උත්පාද නිරෝධ - වර්තමාන වාරය

නිරෝධ වාරය දේශනා කොට වදරා උත්පාද නිරෝධ වාරය වදළ සේක. (පෙර සේ පද බෙද කියනු.) "යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස සොතායතනං නිරුජ්ඣතීති, නො, යස්ස වා පන, නො," අනුලෝම අභිධෙය්‍ය.

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොස, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3 - 7 - 4) තුන - සත - සතර බැගිනි, මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට එලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

## කොටස් කර දක්වීම

යම් ඒ පුද්ගලයෙකුට චක්ඛායතනය උපදිමින් ඇත්තේ වී නම්, සෝතායතනය නිරුද්ධ නොවන බැවින් "තස්ස සොතායතනං නිරුජ්ඣති" යන සංසය පදයාගේ අර්ථයක් නොමැත. එසේ යන්නිටයාන පදයාගේ අර්ථය ඇතිව සංසය පදයාගේ අර්ථයක් නොමැති බැවිනි. යම් පුද්ගලයකුට චක්ඛායතනය උපදමින් පවතී ඒ චක්ඛායතනය උපදමින් ඇති පුද්ගලයාට සෝතායතනය නිරුද්ධ වෙමින් ඇත්තේ දැයි සර්වඥයන් වහන්සේට විමතියක් නැත්තේ නමුත් වෙනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා, ප්‍රශ්න ජාති (4) සතර අතුරෙන් අසන ලද මෝස ප්‍රශ්නය අනුව චක්ඛායතනය උපදමින් ඇති උද්ගලයාට සෝතායතනය නිරුද්ධ නොවන බැවින්ම සංසය පදය ප්‍රතික්ෂෙප කොට පිළිතුරු පස අතුරෙන් 'නො' යන ප්‍රතිෂේධ විසඳුමෙන් පිළිතුරු සපයන ලදී.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** පඤ්චවෝකාර චුති සිත් (15) පසළොස චෛතසික (35) පන්තිස අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ සචක්ඛුකව පඤ්චවෝකාර භූමියෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය,

එලස්ථ ආයතී පුද්ගලයන් (4) සිවු දෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [සංසය පදයෙහි ස්වරූපාර් නැත. මේ ක්‍රමයට සමානව අනුලෝම සන්නිට්ඨානය උත්පාදය දක්වා ද, ප්‍රතිලෝම සන්නිට්ඨානය නිරෝධය දක්වාද කියනු-ස්වරූප උද්ධරනු.]

''යස්ස මනායතනං උප්පජ්ජති, තස්ස ධම්මායතනං නිරුජ්ඣතීති, නො'' අනුලෝම අභිධෙය්‍ය ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය කම්ජ කලාප (3 – 7 – 4) තුන, සත, සතර බැගිනි. මොවුන්ගේ උත්පාද ක්ෂණ සමංගිවූ චතුවෝකාර – පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (1) සිවුදෙනාය. යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය නොමැත. ප්‍රතිලෝම අභිධෙය්‍ය චුති සිත් (19) එකුන් විස්ස චෛතසික (35) පන්තිස අන්තිම කම්ජ රූප ජීවිත නවක කලාප, මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය එලස්ථ ආයතී පුද්ගලයන් (4) සතර දෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය පද අභිධෙය්‍ය නැත. අනුලෝම නිමි.

ප්‍රත්‍යනිකයෙහි ''යස්ස චක්ඛායතනං උප්පජ්ජති තස්ස සොතායතනං න නිරුජ්ඣතීති සසොතකානං චවන්තානං තෙසං අචක්ඛුකානං උපපජ්ජන්තානං අසොතකානං චවන්තානං තෙසං යසස් වා පන සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය;- පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කම්ජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගිවූ සසොතකව පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය,

එලස්ථ ආයතී පුද්ලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. චක්ඛායතනය නොමැතිව අපායෙහි ඕපපාතිකව උපදින දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයාය. සංසේදජ ගබ්භසෙය්‍යකව උපදින දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, චක්ඛායතනය පහළවීමට පළමුව චුතවීම නියතකොට ඇතිව ගබ්භසෙය්‍යකව උපදින දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, අසංඥ-තල අරූතලයෙහි උපදින දුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන, යට එලස්ථ ආයතී පුද්ගල (3) තිදෙනාය, සෝතායතනය නිරුද්ධ නොවන්නාවූ අපාය ඕපපාතිකව චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. සංසේදජ-ගබ්භ-සෙය්‍යකව චුතවන දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය සෝතායතනය නිරුද්ධ වීමට ප්‍රථමයෙන් චුතවීම නියත කොට ඇත්තාවූ ගබ්භසෙය්‍යකව චුතවන දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. අසඤ්ඤසත්ව අරූප භූමියෙහි චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝය, එලස්ථ ආර්ය පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. [මේ ක්‍රමය ආශ්‍රය කොට අසාතකව උපදින – චුතවන ආදි වාරයන්හි ද උත්පාද වාර, නිරෝධ වාර මෙනෙහි කොට ස්වරූප උද්ධරනු.]

''යස්ස මනායතනං නුප්පජ්ජති, තස්ස ධම්මායතනං න නිරුජ්ඣතීති, සබ්බෙසං චවන්තානං තෙසං අචිත්තකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සචිත්තකානං උපපජ්ජන්තානං තෙසං'' පුද්ගල වාරය නිමි. [පුද්ගලෝකාස වාරයෙහි ද මේ අනුවය. එහි භූමි විභාග දැක්වීමම විශේෂ වෙයි.] වර්තමාන වාරය නිමි, අතීත වාරය ද වෙනසක් නැත.

## අනාගත වාර චක්ඛායතන මූලය

අනාගත වාරයෙහි ''යස්ස චක්ඛායතනං උප්පජ්ජිස්සති, තස්ස සොතායතනං නිරුජ්ඣිස්සතීති ආමන්තා, යස්ස වා පන පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං ඉතරෙසං තෙසං''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:**- පශ්චිමභවිකව පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන, යට එලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙන කාමසුගති භූමි (7) සත සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, මේ භූමිවලදී යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවීම නියතකොට ඇත්තාවූ පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට එලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. පඤ්චවෝකාරයෙහි මතු නැවත උපදින්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින–චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අසංඥතල අරූතලයන්හි උපදින–චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මොවුහු ද ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං, යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'' (නිරෝධ වාර ප්‍රත්‍යනිකය අනුව ස්වරූප උදුරනු.)

**ඝානායතන මූලියෙහි:**- ''යෙ රූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං ඉතරෙසං තෙසං යස්ස වා පන පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං.''

**අනුලෝම අභිධෙය්‍ය:**- කාමසුගති භූමි (7) සතෙන් රූප භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තාවූ කාම භූමියෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට එලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, රූප භූමි එකින් එක ඉහළට ඉපිද පිරිනිවීම නියත කොට ඇත්තාවූ රූප භූමියෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යට එලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. කාම භූමියෙහි මතු නැවත ඉපදෙන්නාවූ කාම භූමියෙහි උපදින–චුතවන පෘථග්ජන පුද්ගලයෝ (4) සිවුදෙනාය. යට එලසථ ආයර්‍ය පුද්ගලයෝ (2) දෙදෙනාය, රූප–අරූප භූමිවල උපදින-චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මොවුහු ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය;**– පශ්චිම භවිකව කාමභූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, කාමසුගති භූමි (7) සතෙහි යට මාර්ග ලබා අරූප – භූමියට පැමිණ පිරිනිවීම නියතකොට ඇත්තාවූ කාමභූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, යට ඵලසථ ආර්‍ය පු්ගලයන් (2) දෙදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය:**– ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරෙ පච්ඡිම භවිකානං, යෙච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං.''

කාමභූමියෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්‍ය පුද්ගලයෝය, පශ්චිම භවිකව රූපාවචර – අරූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආර්‍ය පුද්ගල (3) තිදෙනාය, චුතවන අර්හත් ඵලස්ථ ආර්‍ය පුද්ගලයෝය. කාම සුගති භූමි (7) සතෙන් රූපභූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තාවූ කාමාවචරයෙහි චුතවන යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, සුභකිණ්හකය තෙක් රූපභූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තාවූ රූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, උපදින – චුතවන යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකින් එක ඉහළට ඉපිද පිරිනිවීම නියත කොට ඇත්තාවූ අරූ– තලයෙහි උපදින – චුතවන යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [ජිව්හා–කාය–ගන්ධ–රස–ඵොට්ඨබ්බ වාරෙ ්ද මීට සමානය, රූප මූලිය ද සෝතමූලිය හා සමානය.]

**මනායතන මූලියෙහි:**– ''අනුලෝම – ආමන්තා'' යනුයි. ප්‍රතිලෝමයෙහි ''පච්ඡිමභවිකානං උපපජ්ජන්තානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං,''

**ප්‍රතිලෝම අභිධෙය:**– පශ්චිම භවිකව චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආර්‍ය පුද්ගල (3) තිදෙනාය. කාම සුගති භූමි (7) සතෙහි සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූපභූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තාවූ පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. උපදින – චුතවන යට ඵලස්ථ ආර්‍ය පුද්ගල (3) තිදෙනාය. අරූප භූමි එකින් එක ඉහළට ඉපද පිරිනිවීම නියත කොට ඇත්තාවූ අරූතලයෙහි උපදින – චුතවන යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. පඤ්චවෝකාර භූමියෙහි මතු නැවත උපදින්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින – චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අසංඥ තල අරූතලයන්හි උපදින – චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක:**– ''පරිනිබ්බන්තානං තෙසං'' [ස්කන්ධ යමක රූපස්කන්ධ හා වේදනාස්කන්ධ වාරයට සමානය.] ධම්මායතන මූලිය ද මීට සමානය.

## ඝාණායතන මූලය

''යස්ස ඝානායතනං උප්පජ්ජිස්සති, තස්ස ජිව්හායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං ඉතරෙසං තෙසං''

**ප්‍රතිලෝම අභිධෙය:-** පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක, යට ඵලස්ථ ආර්ය පුද්ගල (2) දෙදෙන කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තා වූ කාමභූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආර්ය පුද්ගල (2) දෙදෙන කාම සුගති භූමි (7) සතෙහිදී යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තා වූ කාම භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආර්ය පුද්ගල (2) දෙදෙන යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. කාම භූමියෙහි මතු නැවතත් උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (2) දෙදෙනාය. රූප අරූප භූමින් හි උපදින - චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ය, යන මොවුහුද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය:-** ''කාමාවචරේ පරිනිබ්බන්තානං, රූපාවචරේ අරූපාවචරේ පච්ඡිමභවිකානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං,'' [නිරෝධ වාරයෙහි අවශේෂය අනුව ස්වරූප උද්ධරනු. කාය-ගන්ධ-රස ඵොට්ඨබ්බ සම්බන්ධ කොට ගැනීමද මීට සමානය.]

**රූපායතන මූලියෙහි:-** අනුලෝම - ආමන්තා, යනුය ප්‍රතිලෝමයෙහි ''පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, තෙසං ඉතරෙසං තෙසං,''

ප්‍රතිලෝම අභිධෙය:- පශ්චිම භවිකව පඤ්චවොකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන - යට ඵලස්ථ ආර්ය්‍ය පුද්ගල (3) තිදෙන කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තා වූ කාමභූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක, පෘථග්ජන යට ඵලස්ථ ආර්ය්‍ය පුද්ගල තිදෙන - (3) රූප භූමි එකින් එක ඉහළට ඉපද පිරිනිවීම නියත කොට ඇත්තා වූ රූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආර්ය්‍ය පුද්ගල (3) තිදෙන කාම සුගති භූමි (7) සතෙහි හා සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තා වූ පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආර්ය්‍ය පුද්ගල (3) තිදෙන යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. කාම භූමියෙහි මතු නැවතත් උපදින්නා වූ කාම භූමියෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාද යට ඵලස්ථ ආර්ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාද රූපාවචර අරූපාවර භූමින්හි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක අභිධෙය ''පඤ්චවොකාරේ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිමභවිකානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'' (නිරෝධ වාරය අනුව ස්වරූප උද්ධරනු.)**

**මනායතන මූලියෙහි:-** අනුලෝම-ආමන්තා ප්‍රතිලෝමයෙහි ''පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං,''

**ප්‍රතිලෝම අභිධෙය;-** පශ්චිම භවිකව චතුවෝකාර - පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන යට එලස්ථ ආයෂ්‍ර පුද්ගල (3) තිදෙන, කාමසුගති භූමි (7) සතෙන් රූප භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇති කාමභූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන, යට එලස්ථ ආයෂ්‍ර පුද්ගල (3) තිදෙන, රූප භූමි එකින් එක ඉහලට ඉපිද පිරිනිවීම නියත කොට ඇත්තාවූ රූප භූමියෙහි උපදින - චුතවන ත්‍රිහේතුක පෘථග්ජන, යට එලස්ථ ආයෂ්‍ර පුද්ගල තිදෙන (3) කාම සුගති භූමි (7) සතෙහි සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්‍ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තාවූ පඤ්චවෝ-කාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයාය, උපදින - චුතවන යට එලස්ථ ආයෂ්‍ර පුද්ගලයන් (3) තිදෙනාය, අරූප භූමි එකින් එක ඉහලට ඉපද පිරිනිවීම නියත කොට ඇත්තාවූ අරූප භූමියෙහි උපදින චුතවන යට එලස්ථ ආයෂ්‍ර පුද්ගලයෝ (3) තිදෙනය යන මොවුහු ගනු ලැබෙති.

කාමාවචර භූමියෙහි මතු නැවතත් උපදින්නාවූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයෂ්‍ර පුද්ගලයන් (2) දෙදෙනාය, රූප අරූප භූමින්හි උපදින - චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යන මෙ පුද්ගලයෝද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය:-** ''පරිනිබ්බාන්තානං තෙසං'' [ධම්මායතන මූලියද මීට සමානය, ජිව්හා - කාය - ගන්ධ - රස-ඵොට්ඨබ්බ මූල වාරයෝද මීට සමානය රූපායතන මූලයද චක්ඛායතන මූලය අනුව ගත යුතුය.]

## මනායතන මූලය

**මනායතන මූල ධම්මායතන මූලයෙහි** අනුලෝමය ආමන්තා; ප්‍රතිලෝම-යෙහි ''පච්ඡිමභවිකානං උපපජ්ජන්තානං තෙසං, ඉතරෙසං තෙසං'' ප්‍රතිලෝම අභිධෙය, පශ්චිම භවිකව චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන, යට එලස්ථ ආයෂ්‍ර පුද්ගලයන් (3) තිදෙන ගනු ලැබෙති. පශ්චිම භවික හැර සියලුම උපදිමින් චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා, යට එලස්ථ ආයෂ්‍ර පුද්ගලයන් (3) තිදෙනා, යන මේ පුද්ගලයෝද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය ''පරිනිබ්බන්තානං තෙසං'' (වේදනාස්කන්ධ සංඥස්කන්ධ අනුව ස්වරූප උද්ධරනු.)

පුද්ගල වාරය නිමි. (ඔකාස වාරය සුගමය.)

# පුද්ගලෝකාස වාරය - චක්ඛායතන මූලය

පුද්ගලෝකාස වාරයෙහි, "යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජිස්සති, තස්ස තත්ථ සොතායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා. යස්ස වා පන යත්ථ, පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවෝ-කාරානං තෙසං තත්ථ,"

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:**- පශ්චිම භවිකව පඤ්චවොකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අපාය වර්ජිත. පඤ්චවොකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නූපදින්නාවූ පඤ්චවොකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට ඵලස්ථ ආර්ය පුද්ගලයන් (3) තිදෙනාගේ අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, යන මේ භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් උපදින්නාවූ පඤ්චවොකාරයෙහි උපදින-චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස, යන මේ භූමි ද ගනු ලැබෙති. 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ" (නිරෝධවාරය අනුව උදුරනු.)

**ඝානායතන මූල:**- අනුලෝමයෙහි "රූපාවචරානං තෙසං තත්ථ කාමාව-චරානං තෙසං තත්ථ", "ප්‍රතිලෝමයෙහි" "පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ" (අනු-ලෝමයෙහි උත්පාද වාරයට අනුව ස්වරූප උදුරනු.)

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:**- පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගල (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ කාමාවචර යෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, යන මොවුන්ගේ කාම භූමි (11) එකොළසය, යන මේ භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් උපදින්නාවූ කාමාවචරයෙහි උපදින-චුතවන පෘථග්ජන පුද්ගලයන් සිවු දෙනාය, (4) යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, යන මොවුන්ගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය;**- "කාමාවචරේ පරිනිබ්බන්තානං රූපාවචරේ පච්ඡිම-භවිකානං, අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ" [පෙළෙහි ඇති ලෙස ඒකාන්ත-අනේකාන්ත උදුරනු. අසඤ්ඤසත්ත අරූප සියල්ල කියනු. ජිව්හා-කාය-ගන්ධ-රස-ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කීමෙදී ද මීට සමානය.]

**රූපායතන** මූලියෙහි:- අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි පච්ඡිමභවි-කානං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ,"

26

**ප්‍රතිලෝම අභිධෙය්‍ය;-** පශ්චිමභවිකව පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අපාය වර්ජිත පඤ්චවොකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපිද සිටින භූමියෙහි මතු නැවතත් නූපදින්නාවූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් (15) පසළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසඤ්ඤසත්වයෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ව භූමිය යන මේ භූමි ගනු ලබති. (ඉතරෙසං පඤ්චවොකාරානං යන තැන පෙර සේ සලකා ස්වරූප උදුරනු.)

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:-** "පඤ්චවොකාරේ පරිනිබ්බන්තානං, අරූපානං තෙසං තත්ථ" නිරොධ වාරය අනුව අවශේෂ අනෝකාන්තය උදුරනු.

මනායතන මූලියෙහි අනුලෝම - ආමන්තා, ප්‍රතිලෝමයෙහි "**පච්ඡිම භවිකානං** පඤ්චවෝකාරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවෝකාරානං තෙසං තත්ථ."

ප්‍රතිලෝම අභිධෙය්‍ය:- [පඤ්චවොකාර පච්ඡිමභවික උපපජ්ජන්ත ඒකාන්ත අනෝකාන්ත පෙර සේ බෙද දක්වනු.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ අරූපයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන හා යට් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (පෙර සේම අනුලෝම - ප්‍රතිලෝම 2 ම උදුරනු.) 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' "පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ." (නිරෝධ වාරයට අනුව ස්වරූප උදුරනු.)

**ධම්මායතන මූලියෙහි:- අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි "පච්ඡිමභවිකානං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ ඉතරෙසංපඤ්චවොකාරානං" (පෙර සේ 'තෙසං තත්ථ' කියනු.) 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' "පරිනිබ්බන්තානං තෙසං තත්ථ" (නිරෝධ වාරයේ ශේෂය මෙන් කියනු.)**

---

## ඝාණායතන මූලය

"යස්ස යත්ථ ඝාණායතනං උපපජ්ජිස්සති, තස්ස තත්ථ ජිව්හායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන යත්ථ පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ."

ප්‍රතිලෝම අභිධෙය්‍ය:- පශ්චිමභවිකව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ කාම ප්‍රතිසන්ධි

සිත් (10) දශය චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3 – 7) තුන, සත බැගිනි. මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිව්දෙනාගේ සහ යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළසය යන මේ භූමි ගනු ලැබෙති. 'ප්‍රත්‍යනික අභිධෙය' ''කාමාවචරේ පරිනිබ්බන්තානං, රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ'' [නිරෝධ වාර අවශේෂය අනුව ස්වරූප උද්ධරනු. කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ මූල වාරද මෙයට සමානය.]

**රූප මූලයෙහි:–** අනුලෝම ආමන්තා. ප්‍රතිලෝමයෙහි ''පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ'' [ජිව්හායතන මූලිය අනුව කියන ලද්ද අතුරෙන් රූපාවචරානං යනුම විශේෂයයි.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නා වූ රූපාවචරයෙහි උපදින – චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙන යන මොවුන්ගේ රූපාවචර භූමි (16) සොළස ගනු ලැබෙති. (මෙපමණක්ම විශේෂයි) ප්‍රත්‍යනික අභිධෙය. ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං, අරූපානං තෙසං තත්ථ,'' (නිරෝධය අනුව සෙස්ස දත යුතු.)

මනායතන මූලියෙහි:– අනුලෝම – ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ'' [මෙහිද රූපාවචරානං, අරූපාවචරානං යන මෙපමණක්ම විශේෂයි.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නා වූ රූප – අරූප භූමීන්හි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙන යන මොවුන්ගේ අසංඥ – තල වර්ජිත රූප භූමි (15) පසළොස හා අරූප භූමි (4) සතර ගනු ලැබෙති·

ප්‍රත්‍යනික අභිධෙය:– ''පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' (නිරෝධ වාරය අනුව උද්ධරනු.)

ධම්මායතන මූලියෙහි:– ප්‍රතිලෝමයෙහි ''පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ ඉතරේසං කාමාවචරානං තෙසං තත්ථ'' [මෙහිදී රූපාවචරානං යන තැන අසඤ්ඤසත්ත ඇතුලත් කිරීම විශේෂයයි. 'ප්‍රත්‍යනික අභිධෙය' ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' අසඤ්ඤසත්ත අනේකාන්තය ඇතුලත් කොට කියනු. ජිව්හා – කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ මූලයෝද මේ සානමූලය අනුව කිය යුතු.]

---

## රූපායතන මූලය

''යස්ස යත්ථ රූපායතනං උප්පජ්ජිස්සති, තස්ස තත්ථ ගන්ධායතනං නිරුජ්ඣිස්සතීති, රූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ පච්ඡිමභවිකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ'' 'ප්‍රත්‍යනික අභිධෙය' කාමාවචරේ

**පරිනිබ්බන්තානං, රූපාවචරේ පච්ඡිමභවිකානං අරූපානං තෙසං තත්ථ''** [චක්ඛායතන හා ඝානායතන මූලය ආශ්‍රය කොට ස්වරූප උද්ධරනු. රූපාවචරානං යන තැන අසඤ්ඤසත්තය ඇතුලත් කිරීම විශේෂයි.]

මනායතන මූලියෙහි අනුලෝම ''අසඤ්ඤසත්තානං තෙසං තත්ථ පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ පච්ඡිමභවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, අරූපානං තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ'' (ස්කන්ධ යමක - රූපස්කන්ධ හා වේදනාස්කන්ධයට සමානය.)

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:-** ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' **(ඒකාන්ත - අනේකාන්ත බෙදනු)** අසංඥ තලයෙහි මතු නැවත නූපදින්නා වූ අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ භූමිය (අනේකාන්ත.)

**ධම්මායතන මූලයෙහි:-** අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''පච්ඡිමභවිකානං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවොකාරානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' 'ප්‍රතිලෝම අභිධෙය්‍ය' [පච්ඡිමභවික පඤ්චවොකාර ඒකාන්ත අනේකාන්ත අසඤ්ඤසත්ත උපපජ්ජන්ත අනේකාන්තය ඇතුලත් කරනු.] 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ''

## මනායතන මූලය

මනායතන මූල ධම්මායතන මූලියෙහි අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''පච්ඡිම භවිකානං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං තෙසං තත්ථ, ''ප්‍රතිලෝම අභිධෙය්‍ය'' පච්ඡිමභවික ඒකාන්ත අනේකාන්ත, අසංඥ තලයෙහි නැවතත් නිරුද්ධ වන්නා වූ අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ භූමිය ගනු ලැබේ. තමන් ඉපද සිටින භූමියෙහි නැවතත් උපදින්නා වූ චතුවෝකාර - පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ, යට එලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි සුද්ධාවාස වර්ජිත (21) එක්විස්සද ගනු ලැබෙති. 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' (පෙර සේ කියනු) අනාගත වාරය නිමි. (වර්‍තමානාතීත වාරය, උත්පාදවාර වර්‍තමානාතීත වාරය හා සමානය.)

---

# වර්‍තමානානාගත වාරය - චක්ඛායතන මූලය

**වර්‍තමානානාගත වාරයෙහි:-** ''යස්ස චක්ඛායතනං උප්පජ්ජති, තස්ස සොතායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං'' (අනුලෝමයෙහි සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපපජ්ජන්ත, පෙර සේ කියනු.)

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** පඤ්චවෝකාර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. අසංඥතල අරූතලයෙහි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං, අරූපෙ පච්ඡිමභවිකානං යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'' (නිරෝධ වාර අවසේසය මෙනි.)

**ඝානායතන මූලියෙහි:-** ''පච්ඡිමභවිකානං රූපාවචරං උපපජ්ජන්තානං තෙසං ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං. යස්ස වා පන සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම අභිධෙය්‍ය:- පශ්චිම භවිකව රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙනාය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියට පැමිණ පිරිනිවීම නියත කොට ඇත්තාවූ රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙනාය. රූපාවචරයෙහි එකින් එක ඉහළට ඉපද පිරිනිවීම නියත කොට ඇත්තාවූ රූපාවචරයෙහි, උපදින ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙන, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [අරූප භූමියට නගින කෙනෙකු ගැන පෙළෙහි නැත. ලැබිය හැකි බැවින් ස්වරූප උද්ධරන ලදී.] කාමාවචර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, අසඤ්ඤතල අරූතලයෙහි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:- ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'' [නිරොධවාර ප්‍රත්‍යනීක අවශේෂය අනුව කියනු. ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කීමේදී ද මේ අනුවම කියයුතු රූපායතන මූලිය ද සෝත මූල හා සමානය]

**මනායතන මූලියෙහි:-** අනුලෝමය, - ආමන්තා, ප්‍රතිලෝමයෙහි සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං උපපජ්ජන්තානං-තෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** පිරිනිවෙන්නහු හැර සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, අසඤ්ඤසත්ව, අරූප භූමින්හි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු

ලැබෙති. සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආයඝ්‍ර පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය පරිනිබ්බන්තානං තෙසං'' (ධම්මායතන මූලිය ද මීට සමානය.)

## ඝානායතන මූලය

''යස්ස ඝානායතනං උප්පජ්ජති, තස්ස ජිව්හායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා යස්ස වා පන සබ්බෙසං චවන්තානං අඝානකානං උපපජ්ජන්තානං තෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** කාමාවචරෙහි මතු නැවත නිරුද්ධවන්නා වූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට එලස්ථ ආයඝ්‍ර පුද්ගලයන් (2) දෙදෙනාය, අඝානකව කාමාවචරයෙහි උපදින දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, රූප - අරූප භූමින්හි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට එලසථ ආයඝ්‍ර පුද්ගලයන් (2) දෙදෙනා යන මොවුහු ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'' [නිරෝධ වාරයෙහි අනාගත අවශේෂ අනුව ස්වරූප උදුරනු. කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ සම්බන්ධ කොට ගැනීමේදී ද මීට සමානය.]

රූපායතන මූලියෙහි ද අනුලෝම - ආමන්තා ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං අඝානකානං උපපජ්ජන්තානං තෙසං, සඝානකානං උපපජ්ජන්තානං තෙසං;''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:-** පඤ්චවෝකාර භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසථ ආයඝ්‍ර පුද්ගලයන් (3) තිදෙනාය, අඝානකව කාමාවචරයෙහි උපදින දුගති - සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, රූප අරූප භූමින්හි උපදින දුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන යට එලසථ ආයඝ්‍ර පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන් ගනු ලැබෙති. සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයෝ (4) සිවුදෙනය, යට එලසථ ආයඝ්‍ර පුද්ගලයන් (2) දෙදෙනය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති.

ප්‍රත්‍යනික අභිධෙය්‍ය:- ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං යෙ ච අරූපං උපපජ්ජිත්වා, පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'' (නිරෝධ වාර අනාගත වාරයට සමානයි.)

මනායතන මූලියෙහි ද අනුලෝම-ආමන්තා ප්‍රතිලෝමයෙහි ද බෙදීම සමානය ස්වරූප ඇදීරීමේදී පිරිනිවෙන්නාහු හැර සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලසථ ආයඝ්‍ර පුද්ගලයන් (3) තිදෙනාය, (අඝානක වාරය

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය පරිනිබ්බන්තානං තෙසං'' [ධම්මායතනය
සේ කියනු.) ප්‍රත්‍යනීක අභිධෙය්‍ය පරිනිබ්බන්තානං තෙසං'' [ධම්මායතනය සමබන්ධ කොට කීමේදී ද මීට සමානය, ජිව්හා – කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ මූල වාරයෝ ද මීට සමානයහ. රූපායතන මූල මනායතන මූලිය ද ස්කන්ධ යමකයට සමය.]

---

## පුද්ගලෝකාස වාරය – චක්ඛායතන මූලය

පුද්ගලොකාස වාරයෙහි ''යස්ස යත්ථ චක්ඛායතනං උප්පජ්ජති, තස්ස තත්ථ සොතායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන යත්ථ පඤ්චවොකාරා චවන්තානං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

ප්‍රතිලෝම අභිධෙය්‍ය:- තමන් ඉපද සිටිනා භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ පඤ්චවෝකාර චුති සිත් (15) පසළොසය චෛතසික (35) පන්තිසය. අන්තිම කර්මජ රූප යන මොවුන්ගේ භංගක්ෂණ සමංගීවූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය යන මේ භූමි ගනු ලැබෙති, සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ'' (නිරෝධ අනාගත ප්‍රත්‍යනීක වාරයට සමානය.)

**ඝාණායතන මූලියෙහි;**– ''රූපාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ කාමාවචරා චවන්තානං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' [අනුලෝමයෙහි පෙළට අනුව ස්වරූප උදුරනු.]

**ප්‍රතිලෝමයෙහි:**– තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමාවචර භූමි (11) එකොළසය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදනාවූ දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:**– ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරා චවන්තානං අසඤ්ඤසත්තානං. අරූපානං තෙසං තත්ථ'' [ස්වරූප සුගමයි, ජිව්හා – කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කීමේදී ද මීට සමානයි.]

**රූපායතන මූලයෙහි:**– අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''පඤ්චවොකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' (සෝතමූලි ප්‍රතිලෝමයෙහි-

2019 03 26 Paññaprami Na Uyana Free Distribution

කියන ලද්ද අතුරෙන් 'අසඤ්ඤසත්තානං' යනුම විශේෂයි.) අසඤ්ඤ සත්ත භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ අසඤ්ඤසත්තයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ව භූමිය ගනු ලැබේ. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං, අරූපානං තෙසං තත්ථ'' (නිරෝධ අනාගත වාරය අනුව උදුරනු.)

**මනායතන මූලියෙහි:–** අනුලෝම–ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''පඤ්චවොකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං, අරූපානං තෙසං තත්ථ සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' (මෙහිද සෝතමූලියෙහි කියන ලද්ද අතුරෙන් 'අරූපානං' යනුම විශේෂයි.)

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ අරූප භූමියෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙන යන මොවුන්ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය ''පරිනිබ්බන්තානං අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ'' (නිරෝධ වාරයට සමානය)

**ධම්මායතන මූලියෙහි:–** අනුලෝම ආමන්තා ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං, අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:–** තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නිරුද්ධ වන්නාවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය, අසඤ්ඤසත්ව භූමිය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය, අසංඥතල–අරූතලයෙහි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙන යන මේ පුද්ගලයන්ගේ අසංඥ භූමිය, අරූප භූමි (4) යතර යන මේ භූමි ගනු ලැබෙති. සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදනාවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්සද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය ''පරිනිබ්බන්තානං තෙසං තත්ථ'' (නිරෝධ වාරය අනුව උදුරනු.)

## ඝාණායතන මූලය

''යස්ස යත්ථ ඝාණායතනං උප්පජ්ජති, තස්ස තත්ථ ජිව්හායතනං නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන යත්ථ, කාමාවචරා චවන්තානං අඝානකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ සඝානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය:–** තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (11) එකොළසය, අඝානකව කාමාවචරයෙහි උපදින දුගති–සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ

කාමාවචර භූමි (5) පස, යන මෙ භූමි ගනු ලැබෙති. සඤානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමාවචර භූමි (11) එකොළසද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය "කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ" [නිරෝධ අනාගතවාර ප්‍රත්‍යනීකයට සමානය, කාය – ගන්ධ – රස – ඵොට්ඨබ්බ සම්බන්ධ කොට කීමේදී ද සමානය.]

**රූපායතන මූලියෙහි**:– අනුලෝම – ආමන්තා ප්‍රතිලෝමයෙහි "කාමාවචරා චවන්තානං, අසඤානකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං තෙසං තත්ථ, සඤානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ." [ජිව්හා මූලියෙහි කියන ලද්ද අතුරෙන් 'රූපාවචරානං' යනුම විශේෂයි.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූපාවචරයෙහි උපදින – චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙන යන මේ පුද්ගලයන්ගේ රූප භූමි (16) සොළස ගනු ලැබෙති. 'ප්‍රත්‍යනීක අභිධෙය්‍ය' "පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපානං තෙසං තත්ථ" [නිරොධවාර අනාගත ප්‍රත්‍යනීකය අනුව ස්වරූප උදුරනු.]

**මනායතන මූලියෙහි ද**:– අනුලෝම – ආමන්තා; ප්‍රතිලෝමයෙහි "කාමාවචරා චවන්තානං, අසඤානකානං කාමාවචරං උපපජ්ජන්තානං රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ, සඤානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ" [මෙහි ද 'රූපාවචරානං අරූපාවචරානං' මෙපමණක්ම විශේෂයි.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ රූපාවචර – අරූපාවචරයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජන – යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙන යන මෙ පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොස හා අරූප භූමි (4) සතර ගනු ලැබෙති. සඤානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක අභිධෙය්‍ය, "පරිනිබ්බන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" (පෙර සේ කියනු.)

**ධම්මායතන මූලියෙහි**:– අනුලෝම – ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං චවන්තානං, අසඤානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සඤානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ"

**ප්‍රතිලෝම අභිධෙය්‍ය**:– තමන් සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ සහ ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, අසඤ්ඤ භූමිය, අසඤානකව කාමාවචරයෙහි උපදින දුගති – සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පසය, රූපාවචර – අරූපාවචරයෙහි උපදින සුගති අහේතුක – ත්‍රිහේතුක යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල (3) තිදෙන යන මේ පුද්ගලයන්ගේ රූපභූමි (16) සොළසය අරූප භූමි (4) සතරය යන මෙ භූමි ගනු ලැබෙති. සඤානකව කාමාවචරයෙහි



2019 03 26 Paññaprami Na Uyana Free Distribution

උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති, 'ප්‍රත්‍යනික අභිධෙය්‍ය "පරිනිබ්බන්තානං තෙසං තත්ථ" (පෙර සේ කියනු) [ජිව්හා - කාය - ගන්ධ - රස - ඵොට්ඨබ්බ වාරයෝ ද සමානයහ,]

## රූපායතන මූලය

**රූපායතන මූල ගන්ධායතන මූලියෙහි:**– "රූපාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ" (අනුලෝමය – පෙර සේ උද්ධරනු.) ප්‍රතිලෝම අභිධෙය්‍ය – තමන් ඉපද සිටින භූමියෙහි නැවතත් නිරුද්ධ වන්නාවූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට **ඵලසථ** ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති.

කාමාවචරයෙහි උපදින යථොක්ත පුද්ගලයෝ ද භූමිහුද ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය "කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපවචරා චවන්තානං අරූපානං තෙසං තත්ථ" (පෙර සේ අභිධෙය්‍ය උද්ධරනු )

**මනායතන මූලියෙහි:**– "අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං **තෙසං** තත්ථ පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ යස්ස වා පන යත්ථ පඤ්චවොකාරා චවන්තානං අරූපානං තෙසං තත්ථ" ප්‍රත්‍යනික අභිධෙය්‍ය **"පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ"** (ස්කන්ධ යමකයෙහි රූපස්කන්ධ **හා** වේදනාස්කන්ධ **සමානයි.)**

**ධම්මායතන මූලියෙහි:**– අනුලෝම – ආමන්තා, ප්‍රතිලෝමයෙහි **"සබ්බෙසං** චවන්තානං අරූපකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සරූපකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ" ප්‍රතිලෝම අභිධෙය්‍ය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නාවූ සියලුම චුත වෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය, අසඤ්ඤසත්ව භූමිය අරූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලසථ ආයර්‍ය පුද්ගල (3) තිදෙන යන මේ පුද්ගලයන්ගේ අරූපභූමි (4) සතර ද යන මේ භූමි ගනු ලැබෙති. පඤ්චවොකාර – අසඤ්ඤසත්වයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ සහ යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ද පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, අසංඥ සත්ව භූමිය යන මේ භූමි ද ගනු ලැබෙති. ප්‍රත්‍යනික අභිධෙය්‍ය "පරිනිබ්බන්තානං තෙසං තත්ථ,"

## මනායතන මූලය

**මනායතන මූල ධම්මායතන**:–මූලියෙහි, අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං චවන්තානං, අචිත්තකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචිත්තකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ" (පෙර සේ උද්ධරනු) ප්‍රත්‍යනික අභිධෙය්‍ය "පරිනිබ්බන්තානං තෙසං තත්ථ," අනුලෝමය නිමි. [ප්‍රත්‍යනිකය ද සංසයෙහි

කියන ලදී. අනුලෝම - ප්‍රතිලෝම 2 මාරු කොට අනුලෝමය අනුව කියනු.] වර්තමානානාගත වාරය නිමි. (අතීතානාගත වාරය ද නිරෝධ අතීතානාගත වාරය හා සමානය,) උත්පාද නිරෝධ වාරය නිමි.

**ප්‍රවෘත්ති වාරය නිමි.**

---

## පරිඤ්ඤා වාරය

ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදරා අනතුරුව පරිඤ්ඤා වාරය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්; ''යො චක්ඛායතනං පරිජානාති, සො සොතායතනං පරිජානාතීති, ආමන්තා, යො වා පන, ආමන්තා,'' අනුලෝම අභිධෙය්‍ය 'අර්හත් මාර්ගසථ ආයතී පුද්ගලයා ගනු ලැබේ. [ස්කන්ධ යමකයෙහි පරිඤ්ඤා වාරය හා සමානය, විශේෂයක් නැත. ස්කන්ධ යමකයෙහි මෙන් කියනු.]

**ආයතන යමකයෙහි අභිධෙය්‍ය නිමියේ ය.**

# 4. ධාතු යමකය

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ! ! !

## ප්‍රඥප්ති උද්දේශ වාරය

ආයතන යමකය දේශනා කොට වදරා අනතුරුව ධාතු යමකය වදළ සේක. ඒ ධාතු යමකයද ප්‍රඥප්තිවාර, ප්‍රවෘත්තිවාර, පරිඥවාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් ප්‍රඥප්ති වාරය පළමු කොට වදළ සේක. [මේ ආදී පාළි ව්‍යවස්ථානය ආයතන යමකයෙහි කියන ලද ක්‍රමය ආශ්‍රය කොට කියනු..]

[පුච්ඡා සංඛ්‍යාවගණන් ගැනීමේදී චනාහි ධාතු (18) අටළොසක් බැවින් ආයතන යමකයට වැඩි වේ. ඒ නිසා සංඛ්‍යාව දක්වන්නෙමි, පද සොධනවාර අනුලෝමයෙහි යමක (18) දහ අටකි. ප්‍රත්‍යනිකයෙහි යමක (18) දහ අටකි. මෙසේ පද සෝධන වාරයෙහි යමක (36) සතිසක් ලැබෙති. පද සෝධන මූලචක්‍ර වාරයෙහි චනාහි මූල (18) දහ අටෙහි (17) බැගින් ලැබෙන බැවින් අනුලෝමයෙහි (306) තුන්සිය සයකි. ප්‍රත්‍යනිකයෙහි (306) තුන්සිය සයකි. මෙසේ යමක (612) හයසිය දෙළසෙක් ලැබෙති. සුද්ධ ධාතු වාරයෙහි ද පද සෝධනයෙහි මෙන් යමක (36) සතිසෙක් ලැබෙති. සුද්ධ ධාතු මූල චක්‍ර වාරයෙහි පදසෝධන මූල චක්‍ර වාරයෙහි සේ යමක (612) හයසිය දෙළසෙක් ලැබෙති. එනිසා වාර සතරක සමූහය වූ ප්‍රඥප්ති වාරයෙහි යමක (1296) එක්දහස් දෙසිය සයානුවක් වෙති. පුච්ඡා (2592) දෙදහස් පන්සිය දෙ අනුවකි අර්ථ (5184) පන් දහස් එකසිය අසූහතරක් ලැබෙති]

සහස්සානං ද්වයං පඤ්ච – සතානි ච ද්විනවුති,
පුච්ඡා ධාතු යමකස්ස – පණ්ණත්තිවාරජා මතා,

## ප්‍රඥප්ති වාර නිද්දේසය

උද්දේසය දේශනා කොට වදරා අනතුරුව නිද්දේශය වදළ සේක. ඒ නිද්දේසය ද [ව්‍යවස්ථානය ආයතන යමකය ඇසුරු කොට කියනු. ස්වල්ප මාත්‍රයක් දක්වන්නෙමි] ''චක්ඛු චක්ඛු ධාතුනි, දිබ්බචක්ඛු පඤ්ඤාචක්ඛු චක්ඛු, න චක්ඛු ධාතු චක්ඛුධාතු චක්ඛුචෙව චක්ඛු ධාතු ච, චක්ඛුධාතු චක්ඛුනි, ආමන්තා,'' (ආයතන මෙන් කියනු) (සෝත ධාතු ආදී යද ආයතන අනුව කියනු) ''චක්ඛු විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණ ධාතුනි ආමන්තා, චක්ඛු විඤ්ඤාණ ධාතු චක්ඛු විඤ්ඤාණන්ති, ආමන්තා,'' අනු-**ලෝම අභිධෙය්‍ය** – චක්ඛුවිඤ්ඤාණ ධාතුව ගනුලැබෙ. සංසයද ඒසේම ය. [සොත

**විඤ්ඤාණ** ධාතු ආදීයෙහි ද ක්‍රමය සමානය.] ''මනො මනොධාතූති, මනො ධාතුං ඨපෙත්වා අවසෙසො මනො න මනොධාතු, මනොධාතු මනො චෙව මනොධාතු ච, මනොධාතු මනොති, ආමන්තා;'' **අනුලෝම අභිධෙය්‍ය** මනෝධාතු ත්‍රිකය හැර ඉතිරි සිත් (86) අසූහය ගනු ලැබෙති. මනෝධාතුත්‍රිකය ද ගනු ලැබේ. **සංසය අභිධෙය්‍ය** පෙර සේ ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** මනෝධාතු ත්‍රිකය ගනු ලැබේ. (ප්‍රත්‍යනිකයෙහි ද මනෝධාතුවම විශේෂයි.) ''න මනො න මනොධාති, ආමන්තා; න මනොධාතුන මනොති මනොධාතුං ඨපෙත්වා අවසෙසො මනො න මනොධාතු මනො මනඤ්ච මනොධාතුඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව මනො, නච මනොධාතු, **ප්‍රතිලෝම අභිධෙය්‍ය** මනෝධාතුත්‍රිකය] හැර ඉතිරි සිත් (86) අසූ හය ගනු ලැබෙති. චෛතසික (52) දෙපණසය, රූප (28) අටවිස්සය, නිර්වාණය, ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. මේ [නය ක්‍රමය ඇසුරු කොට ප්‍රඥප්ති වාරය කියනු.]

## ප්‍රවෘත්ති වාරය

[ප්‍රවෘත්ති වාරයෙහි ''යස්ස චක්ඛුධාතු උප්පජ්ජති,'' යනාදි වශයෙන් ආයතන යමකයේ නය ක්‍රමයට සමානව කියනු. යමකාදි සංඛ්‍යාව වනාහි මෙසේය, චක්ඛු-ධාතු මූලක යමක (17) දහතකි. සෝතධාතු මූලක යමක (16) දසයකි. ඝානධාතු මූලක යමක (15) පසළොසකි, මෙසේ මුලපටන් පිඩු කරන ලද්දේ, පුද්ගල වාරයෙහි යමක (153) එකසිය පණස් තුනකි. ඕකාස වාර, පුද්ගලෝකාස, වාරයන්හි ද එසේම ලැබෙන බැවින් වාර තුන සම්පිණ්ඩණය කරන ලද අනුලෝමයෙහි යමක (459) සාරසිය පණස් නවයකි. ප්‍රත්‍යනිකයෙහි ද එසේම ලැබෙන බැවින් වර්තමානයෙහි යමක (918) නවසිය දහ අටක් ලැබෙති. අතීත ආදි වාරයන්හි ද මෙසේම ලැබෙන බැවින් වාර සය සම්පිණ්ඩණය කරන ලද උත්පාද වාරයෙහි යමක (5508) පන්දහස් පන්සිය අටක් වෙති. නිරෝධවාර උත්පාද නිරෝධ වාරයන්හි ද එයට සමානව ලැබෙන බැවින් සම්පූර්ණ ප්‍රවෘත්ති වාරයෙහි යමක (16524) දහසය දහස් පන්සිය විසි හතරක් වෙති. පුච්ඡා (33048) තිස්තුන් දහස් අට සාලිසක් වෙති. අර්ථ (66096) හැටහය දහස් සයානූවක් ලැබෙති.

තෙත්තිංසෙව සහස්සානි - අට්ඨ චත්තාලිසාධිකා.
නීති පුච්ඡා පවත්ති ම්හි - භවන්ති ධාතු යමකෙ.

විස්සර්ජනාවෙහි වනාහි ආයතන යමකයෙහි ප්‍රතිසන්ධි කාලයෙහි නොලැබෙන බැවින් සද්දයතනය මූල මූලී සහිත විස්සර්ජනයට නොගත්තාක් මෙන් මේ ධාතු යමකයෙහි ද, සද්දධාතු - සට්විඥානධාතු, යන මේ සතක් වූ ධාතූන් ප්‍රතිසන්ධි-චුති ක්ෂණයන්හි නො ලැබෙන බැවින්, ඒ සත් ධාතූහු මූල මූලී සහිත විස්සර්ජනාවට නොගන්නා ලදහ. සප්ත විඥාන ධාතූන් අතුරෙන් එකම මනොවිඥාන ධාතුව විස්සර්-ජනාවෙහි ගනු ලැබේ. ඒ මනෝවිඥාන ධාතුව ද මනායතනය අනුව කියනු. මේ ප්‍රවෘත්ති වාරයෙහි ආයතන යමකය හා සමඟ විශේෂයක් නොමැත.]

ප්‍රවෘත්ති වාරය නිමි

# පරිඥවාරය

[පරිඥවාරයෙහි "යො චක්ඛුධාතුං පරිජානාති" යනාදි වශයෙන් ස්කන්ධ යමකයට අනුව කියනු. යමක සංඛ්‍යාව වනාහි මෙසේය, චක්ඛුධාතු මූලක යමක (17) සතළොස බැගින් සම්පිණ්ඩනය කරන ලද්දේ අනුලෝමයෙහි (153) එක්සිය තෙපණසෙක් ලැබෙති. **ප්‍රත්‍යනිකයෙහි ද** එසේම ලැබෙන බැවින් වාර දෙක සම්පිණ්ඩනය කරන ලදුව වර්තමාන කාලයෙහි (306) තුන්සිය සයක් වෙති. අතීතාදි වාරයන්හිද එසේ ම ලැබෙන බැවින් සය වාරය සම්පිණ්ඩනය කරන ලද පරිඥවාරයෙහි යමක (1836) එක්දහස් අටසිය තිස් හයක් වෙති. පුච්ඡා (3672) තුන්දහස් හයසිය දෙසැත්තෑවකි. අර්ථ (7344) සත් දහස් තුන්සිය සූ සාලිසෙක් ලැබෙති.]

ධාතු යමක අභිධෙය්‍ය නිමි.

# 5. සච්ච යමකය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

## ප්‍රඥප්ති වාර උද්දේසය

ධාතුයමකය දේශනා කොට වදරා අනතුරුව සත්‍ය යමකය වදළ සේක.ඒ සත්‍ය යමකය ද ප්‍රඥප්ති වාර, ප්‍රවෘත්ති වාර, පරිඥවාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් ප්‍රඥප්ති වාරය පළමු කොට වදළ සේක. ඒ ප්‍රඥප්ති වාරය ද උද්දේස-නිද්දේස වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේසය පළමු කොට වදළ සේක. ඒ උද්දේශය ද පරිච්ඡේදවාර, පරිච්ජින්නුද්දේස වාර, විභාග වාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. හෙවත් සත්‍ය උද්දේස, නාම ව්‍යවස්ථාන, නය වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් සත්‍ය උද්දේස වාරය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක්දයත්, ''චත්තාරිසච්චානි'' යනුවෙනි. ඉන් අනතුරුව නාම ව්‍යවස්ථානය වදළ සේක. කෙසේ 'වදළ සේක් ද යත්,'' දුක්ඛ සච්චං සමුදය සච්චං නිරොධ සච්චං මග්ග සච්චං'' යනුවෙනි.

චත්තාරි – සතරක් වූවාහු, සච්චානි – සත්‍යයෝ; හොන්ති, – වෙති; දුක්ඛ සච්චං – දුක්ඛ සත්‍ය ද; සමුදය සච්චං – සමුදය සත්‍යය ද; නිරොධ සච්චං – නිරෝධ-සත්‍යය ද; මග්ග සච්චං – මාර්ග සත්‍යය ද; ඉති ඉමෙ; මොවුහු වෙති; හෙවත්; දුක්ඛ සච්චං – දුක්ඛ සත්‍යය ද – පෙ – මාර්ග සත්‍යය ද යන; ඉමෙ – මෙසේ; චත්තාරි – සතරක් වූ; සච්චානි – සත්‍යයෝ; හොන්ති – වෙති;

නාම ව්‍යවස්ථානය දේශනා කොට වදරා ඉන් අනතුරුව නය වාරය වදළ සේක. ඒ නය වාරය ද පදසෝධනවාරය, පද සෝධන මූලචක්‍ර වාරය, සුද්ධ සත්‍ය වාරය, සුද්ධ සත්‍ය මූලචක්‍ර වාරය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් **පද සෝධන වාරය** පළමු කොට වදළ සේක. ඒ පදසෝධන වාරයද අනුලෝම – ප්‍රත්‍යනික වශයෙන් (2) දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද දුක්ඛ සත්‍ය යමක යනාදි වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් දුක්ඛ සත්‍ය යමකය පළමු කොට වදළ සේක.ඒ දුක්ඛසත්‍ය යමකයද අනුලෝම පුච්ඡා – ප්‍රතිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑ-රුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් දයත්.

දුක්ඛං – යනුවෙනි; ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළ සේක් ද යත්, දුක්ඛ සච්චං – යනුවෙනි. දුක්ඛං–දුක්ඛය නම් වූයේ; දුක්ඛ සච්චං–දුක්ඛ සත්‍ය නම් වන්නේ ද? දුක්ඛං - යනු සන්නිට්ඨානය, දුක්ඛසච්චං - යනු සංසය, සන්නිට්ඨාන – සංසය දෙපදය එකතුවෙන් අනුලෝම පුච්ඡාව නිපදේ.

අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රතිලෝම පුච්ඡාව වදළ සේක. ඒ ප්‍රතිලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් – දුක්ඛසච්චං – යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ වදළසේක් ද යත්; දුක්ඛං යනුවෙනි. දුක්ඛ සච්චං – දුක්ඛ සත්‍ය තෙමේ; දුක්ඛං – දුක්ඛය නම් වේද; දුක්ඛ සච්චං – යනු සන්නිට්ඨානය, දුක්ඛං – යනු සංසය, සන්නිට්ඨාන – සංසය දෙපදයාගේ එකතුවෙන් ප්‍රතිලෝම පුච්ඡාව නිපදේ, අනුලෝම පුච්ඡා – ප්‍රතිලෝම පුච්ඡා දෙක එකතුවීමෙන් පදසෝධනවාර අනුලෝම යෙහි පළමු වැනි වූ දුක්ඛ සත්‍ය යමකය නිපදෙන්නේය. (මේ ක්‍රමයටම සමානව ඉතිරි සත්‍ය තුන කියනු). මෙසේ පදසෝධන වාර අනුලෝමයෙහි යමක (4) සතරකි. පුච්ඡා (8) අටකි. අර්ථ (16) සොළසෙක් ද වෙති.

අනුලෝමය දේශනාකොට වදරා අනතුරුව ප්‍රත්‍යනිකය වදළ සේක. ඒ ප්‍රත්‍යනිකය ද (මේ ක්‍රමයට අනුව කියනු) මෙසේ පද සෝධනවාර ප්‍රත්‍යනිකයෙහි යමක (4) සතරකි. ප්‍රශ්න (8) අටෙකි. අර්ථ (16) සොළසෙකි. අනුලෝම – ප්‍රත්‍යනික දෙපදය එකතු වීමෙන් යමක (8) අටෙකි. ප්‍රශ්න (16) සොළසෙකි. අර්ථ (32) දෙතිසෙක් ලැබෙති.

පදසෝධන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පද සෝධන මූල චක්‍ර වාරය වදළ සේක. ඒ පදසෝධන මූල චක්‍ර වාරය ද අනුලෝම–ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය. (මෙ ආදී වූ පාළි ව්‍යවස්ථානය ස්කන්ධ යමකය ඇසුරු කොට කියනු.) මේ පද සෝධන මූල චක්‍ර වාර අනුලෝමයෙහි දුක්ඛ සත්‍ය ආදී වූ මූල සතර අතුරෙන් එක එකෙක් හි යමක (3) තුන බැගින් ලැබෙන බැවින් යමක (12) දෙළසෙකි. ප්‍රශ්න (24) සූවිස්සෙකි. අර්ථ (48) අට සාලිසෙකි. (ප්‍රත්‍යනිකයෙහි ද මෙයට සමානය. ඒ සංඛ්‍යාවම ලැබේ.) අනුලෝම–ප්‍රත්‍යනික දෙපදය එකතුවීමෙන් මූල (8) අටෙකි. යමක (24) සූවිස්සෙකි. ප්‍රශ්න (48) අටසාලිසෙකි අර්ථ (96) සයානුවෙක් ලැබෙති. **සුද්ධ සත්‍යවාරයෙහි** පදසෝධන වාරයෙහි මෙන් යමක (8) අටෙකි. සුද්ධ සත්‍ය මූලචක්‍ර වාරයෙහි, පදසෝධන මූල චක්‍ර වාරය මෙන් යමක (24) සූවිස්සෙක් ලැබෙති. එ හෙයින් වාර සතර සම්පිණ්ඩනය කරන ලද්ද වූ ප්‍රඥප්ති වාරයෙහි වාර (4) සතරෙකි. නය (8) අටෙකි. මූල (16) සොළසෙකි. යමක (64) සූ සැටෙකි. ප්‍රශ්න (128) එක සිය අටවිස්සෙකි. අර්ථ (256) දෙසිය පණස් සයක් ලැබෙති.

අට්ඨවීසාධිකං සතං – පුච්ඡා පණ්ණත්ති වාරකෙ
සම්භවන්ති ගණනාය – පඤ්චමෙ සච්ච යමකෙ.

උද්දේසය නිමි.

## ප්‍රඥප්ති වාර නිර්දේශය

## පද ශෝධන වාරය

### අනුලෝම

උද්දේශය දේශනා කොට වදරා අනතුරුව නිද්දේශය වදළ සේක. ඒ නිද්දේශය ද පද ශෝධන වාරය, පදශෝධන මූල චක්‍ර වාරය සුද්ධ සත්‍ය වාරය, සුද්ධ සත්‍ය මූල-චක්‍ර වාරය වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. (පෙර සේ කියනු.)

**කෙසේ වදළ සේක් ද යත්** – ''දුක්ඛං දුක්ඛ සච්චන්ති, ආමන්තා, දුක්ඛ සච්චං දුක්ඛන්ති, කායිකං චෙතසිකං දුක්ඛං ඨපෙත්වා අවසෙසං දුක්ඛ සච්චං න දුක්ඛං කායිකං දුක්ඛං චෙතසිකං දුක්ඛං දුක්ඛඤ්චෙව දුක්ඛ සච්චඤ්ච''

කායිකං – කායික වූ; දුක්ඛං – දුක්ඛය – ද; චෙතසිකං චෛතසික වූ; දුක්ඛං – දුක්ඛය ද; ඨපෙත්වා – හැර; අවසෙසං – අවශේෂ ධර්මය; දුක්ඛ සච්චං – දුක්ඛ සත්‍ය නම් වේ. න දුක්ඛං – දුක්ඛ නම් නොවේ; කායිකං – කායික වූ දුක්ඛං – දුක්ඛයද; චෙතසිකං, – චෛතසික වූ: දුක්ඛං,- දුකඛයද, දුක්ඛඤ්චෙව, - දුක්ඛ නම් ද වේ; දුක්ඛ සච්චඤ්ච, දුක්ඛ සත්‍ය නම් ද වේ; හෙවත්, අවසෙසං,-ඉතිරි වූ; දුක්ඛ සච්චං,- [මෙසේ අවසෙසං - පදය දුක්ඛ සච්ච යන පදයා ගේ විශේෂණයි කරනු]

දුක්ඛං දුක්ඛ සච්චං – යනුවෙන් වදරණ ලද අනුලෝම පුච්ඡාවෙහි දුක්ඛං - යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථ නම්, දුක්ඛ සහගත කාය විඤ්ඤාණ චිත්තයෙහි ඇත්තා වූ වේදනා ව නම් වූ කායික දුක්ඛය, දෝස මූල දෙසිතෙහි ඇත්තා වූ වේදනාව නම් වූ චෛතසික දුක්ඛය ගනු ලැබේ. දුක්ඛ සච්චං යන සංසය පදයාගේ අභිධෙය්‍ය යෝද කියන ලද ඒ ධර්මයෝ වෙති. ප්‍රතිලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන පදයාගේ අභිධෙයාර්ථ, ලෞකික සිත් (81) එක් අසූ ව ය. තෘෂ්ණාව, කායික දුක්ඛ, චෛතසික දුක්ඛය ද හැර චෛතසික (51) එක් පණස, ඉන්ද්‍රියබද්ධ රූප (28) අට විස්ස යන මේ ධර්මයෝ ගනු ලැබෙති. කායික දුක්ඛය චෙතසික දුක්ඛය ද ගනු ලැබේ. සංසය පෙර සේ ලැබේ.

''සමුදයො සමුදය සච්චන්ති, සමුදය සච්චං ඨපෙත්වා අවසෙසො සමුදයො න සමුදය සච්චං, සමුදය සච්චං සමුදයො චෙව සමුදය සච්චඤ්ච, සමුදය සච්චං සමුද-යොති, ආමන්තා;'' සමුදය සච්චං - සමුදය සත්‍යය; ඨපෙත්වා - හැර; අවසෙ-සො - ඉතිරි ධර්මය; සමුදයො - සමුදය නම් වේ; න සමුදය සච්චං - සමුදය සත්‍ය නම් නොවේ, හෙවත්, අවසෙසො - අවශේෂ වූ; සමුදයො–සමුදය, න සමුදය සච්චං–සමුදය සත්‍ය නම් නොවේ,

අනුලෝමයෙහි - සමුදයො - යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථය, තෘෂ්ණාව හැර, අවශේෂ ක්ලේශයෝ (9) නවදෙනාය, ඒ ක්ලේශ (9) නවය හා එකට උපදනා වූ අකුශල් සිත් (12) දොළසය ඒ අකුශල චිත්තෝත්පාදයට අරමුණු වූ ලෞකික කුශල චිත්තොත්පාද යැයි කියන ලද (සමුදයසාමඤ්ඤය) පොදු සමුදය ධර්ම ගනු ලැබෙති. තෘෂ්ණාව නම් වූ සමුදය සත්‍යය ද ගනු ලැබේ. සමුදය සච්චං කියන ලද සංසයපදයාගේ අභිධෙය්‍යාර්ථ සමුදය සත්‍ය පමණක්ම ගනු ලැබේ. **ප්‍රතිලෝම** අභිධෙය්‍යාර්ථ වශයෙන් සමුදය සත්‍ය ගනු ලැබේ.

[සමුදය ශබ්දය හේතුවට කියනු ලැබේ. එහෙයින් දුක්ඛසත්‍යයාගේ හේතුධර්ම අභිධෙය්‍ය වශයෙන් ගත යුතු. ඒ නිසා අර්ථකථාවෙහි ''අවසෙසො සමුදයොති සච්ච-විභඞ්ගෙ නිද්දිට්ඨ කාමාවචර කුසලාදි භෙදෙ දුක්ඛ සච්චස්ස පච්චයො'' යයි සංවර්ණණා කරන ලදී.]

''නිරෝධො නිරොධ සච්චන්ති, නිරොධ සච්චං ඨපෙත්වා අවසෙසො නිරොධො න නිරොධ සච්චං, නිරොධ සච්චං නිරොධො චෙව නිරොධ සච්චඤ්ච, නිරොධ සච්චං නිරොධොති, ආමන්තා'' (ඉහත දැක් වූ ක්‍රමයට අර්ථ කියනු) **අනුලෝම** අභිධෙය්‍ය - කාමාවචර කුශලයෙන් ප්‍රහීණවන්නා වූ කෙලෙසුන්ගේ අභාවය නම් වූ තදඞ්ග නිරෝධය, මහග්ගත කුශලයෙන් ප්‍රහීණ වන්නා වූ නීවරණයන්ගේ අභාවය නම් වූ විෂ්කම්භණ නිරෝධය, මාර්ග කුශලයෙන් ප්‍රහීණ වන්නා වූ අනුශය කෙලෙසුන්ගේ අභාවය නම් වූ සමුච්ඡේද නිරෝධය, ඵල චිත්තයෙන් ප්‍රහීණ වන්නා වූ කෙලෙසුන්ගේ අභාවය නම් වූ පටිප්පස්සද්ධි නිරෝධය, චිත්ත චෛතසිකයන්ගේ භංගය නම් වූ ක්ෂණනිරෝධය යනාදි වූ (නිරෝධ සාමඤ්ඤය) පොදු නිරෝධය ගනු ලැබේ. නිර්වාණය නම් වූ නිරෝධ සත්‍ය ද ගනු ලැබේ. **සංසය අභිධෙය්‍ය** පෙරසේම ලැබේ.

[නිරෝධ ශබ්දය නිරුද්ධ වීම අර්ථයට කියනු ලැබේ. එහෙයින් නිරෝධ සාමඤ්ඤය හා නිර්වාණ ධර්මය අභිධෙය්‍ය වශයෙන් ගනු ලැබේ. ඒ නිසා අර්ථකථාවෙහි ''අවසෙසො නිරොධොති තදඞ්ග වික්ඛම්භන සමුච්ඡේද පටිප්පස්සද්ධි නිරොධොචෙව ඛණභඞ්ග නිරොධො ච'' යයි සංවර්ණණා කරන ලදී.]

''මග්ගො මග්ගසච්චන්ති, මග්ගසච්චං ඨපෙත්වා අවසෙසො මග්ගො න මග්ග සච්චං, මග්ගසච්චං මග්ගො චෙව මග්ග සච්චඤ්ච, මග්ගසච්චං මග්ගොති, ආමන්තා'' (ඉහත සේ අර්ථ කියනු) **අනුලෝම අභිධෙය්‍යාර්ථ** සහෙතුක කමාවචර විපාක, ක්‍රියා මහග්ගත චිත්තයන්හි ඇත්තා වූ පඤ්චාංගික මාර්ගය, මහාකුසල් සිත් අටෙහි ඇත්තා වූ අෂ්ඨාංගික මාර්ගය, ඵල සිත් (4) සතරෙහි ඇත්තා වූ අෂ්ටාංගික මාර්ගය මිථ්‍යාමාර්ගය, ජංගමාර්ගය, සකට මාර්ගය, යනාදි වූ (මග්ග සාමඤ්ඤය) පොදු මාර්ග ගනු ලැබේ. මාර්ග සිත් සතරෙහි ඇත්තා වූ මාර්ගාංග අට නම් වූ මාර්ග සත්‍යය ද ගනු ලැබේ.

[මග්ග ශබ්දය ජංග මග්ග - සකට මග්ග ආදී පොදු මාර්ග හා මාර්ග සත්‍ය කියන බැවින් (මග්ග සාමඤ්ඤ) පොදු මාර්ගත් මාර්ග සත්‍යයත් අභිධෙය්‍ය වශයෙන් ගන්නා ලදහ. එනිසා අට්ඨකථාවෙහි ''අවසෙසො මග්ගොති තස්මිං ඨො පන සමයෙ පඤ්චංඩගිකො මග්ගො හොති, අට්ඨඩගිකො මග්ගො මිච්ඡා මග්ගො ජඩග මග්ගො, සකට මග්ගො'ති එවමාදිකො'' යයි සංවර්ණණා කරන ලදී.]

ප්‍රත්‍යනීකය

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක ....... **කෙසේ වදළ සේක් ද යත්** ''න දුක්ඛං න දුක්ඛ සච්චන්ති, කායිකං දුක්ඛං චෙතසිකං දුක්ඛං ඨපෙත්වා අවසෙසං දුක්ඛ සච්චං නදුක්ඛං දුක්ඛ සච්චං, දුක්ඛඤ්ච දුක්ඛ සච්චඤ්ච ඨපෙත්වා අවසෙසං නචෙව දුක්ඛං නච දුක්ඛ සච්චං, න දුක්ඛ සච්චං න දුක්ඛන්ති ආමන්තා'' අවසෙසං, - ඉතිරි වූ, දුක්ඛසච්චං – දුක්ඛ සත්‍යය; න දුක්ඛං – දුක්ඛ නම් නොවේ. දුක්ඛ සච්චං – දුක්ඛසත්‍ය නම් පමණක් ම වේ. දුක්ඛඤ්ච– දුක්ඛය ද; දුක්ඛ සච්චඤ්ච – දුක්ඛං සත්‍යය ද; ඨපෙත්වා – තබා; අවසෙසං – අවශේෂය; නචෙව දුක්ඛං – දුක්ඛ නම් ද නොවේ; නච දුක්ඛ සච්චං – දුක්ඛ සත්‍ය නම් ද නො වේ; **අනුලෝම අභිධෙය්‍ය** – තෘෂ්ණා, කායික දුක්ඛ, චෛතසික දුක්ඛ, හැර ලෞකික සිත් (81) එක් අසූවය, චෛතසික (51) එක් පණසය, ඉන්ද්‍රිය බද්ධ රූප (28) අට විස්සය යන මේ ධර්මයෝ ගනු ලැබෙති. කායික දුක්ඛ, චෛතසික දුක්ඛ, දුක්ඛ සත්‍ය හැර ඉතිරි සත්‍ය (3) තුන්ය, සත්‍ය විනිර්මුක්ත වූ මාර්ග චිත්තෝත් පාද (29) එකුන් තිසය, ඵලචිත්තෝත්පාදයෝ (37) සත්තිස්සය, අනින්ද්‍රිය බද්ධ වූ ඍතුජ රූප කලාප (2) දෙකය. ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** – පෙර සේම ලැබේ. ප්‍රති ලෝමයෙහි පෙර සංසය ගනු ලැබේ.

''න සමුදයො න සමුදය සච්චන්ති, ආමන්තා, න සමුදය සච්චං න සමුදයොති. සමුදය සච්චං ඨපෙත්වා අවසෙසො සමුදයො න සමුදය සච්චං සමුදයො, සමුදයඤ්ච සමුදය සච්චඤ්ච ඨපෙත්වා අවසෙසො න චෙව සමුදයො, නච සමුදය සච්චං'' අවසෙසො – අවශේෂ වූ; සමුදයො - සමුදය තෙමේ; නච සමුදය සච්චං - සමුදය සත්‍ය නම නොවේ. සමුදයො - සමුදය නම් පමණක් වේ;

**අනුලෝම අභිධෙය්‍ය** - සමුදය සාමඤ්ඤය, සමුදය සත්‍යයද හැර, ඉතිරි සත්‍ය (3) තුනය, සත්‍ය විනිර්මුක්ත වූ මාර්ග චිත්තොත් පාද (29) එකුන්තිසය, ඵලචිත්-තොත් පාද (37) සත්තිසය, අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දෙකය ප්‍රඥප්තිය යන මේ ධර්ම ගනු ලැබෙති. සංසය ද එසේය, **ප්‍රතිලෝම අභිධෙය්‍ය** තෘෂ්ණාව හැර (9) නව ක්ලේශයෝ ය, ඒ නව ක්ලේශයන් හා සමඟ එකට උපදනා වූ දෙලොස් (12) අකුශල චිත්තෝත්පාදයෝය. ඒ අකුශල චිත්තෝත්පාදයන්ට අරමුණු වූ ලෞකික කුශල චිත්තෝත්පාදයෝ යයි කියන ලද (සමුදය සාමඤ්ඤය) පොදු සමුදය ගනු ලැබේ. සමුදය සාමඤ්ඤය, සමුදය සත්‍යය ද තබා ඉතිරි සත්‍ය (3)

තුනය, සත්‍ය විනිර්මුක්ත වූ මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිසය, ඵල චිත්තෝත්පාද (37) සත්තිසය, අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දෙකය ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. සංසය පෙර සේ ලැබේ.

''න නිරොධො නි නිරොධ සච්චන්ති, ආමන්තා,න නිරොධ සච්චං න නිරොධොති නිරොධ සච්චං ඨපෙත්වා අවසෙසො නිරොධො න නිරොධ සච්චං නිරොධො, නිරොධඤ්ච නිරොධ සච්චඤ්ච ඨපෙත්වා අවසෙසො නාචෙව නිරොධො නච නිරොධ සච්චං'' (පෙර සේ අර්ථ කියනු) **අනුලෝම අභිධෙය්‍ය** නිරෝධ සාමඤ්ඤය, නිරෝධ, සත්‍යය ද තබා, අවශේෂ සත්‍ය (3) තුනය සත්‍ය විනිර්මුක්ත වූ මාර්ග චිත්තෝත්පාද (29) එකුන් තිසය, ඵලචිත්තෝත්පාද (37) සත්තිසය, අනින්ද්‍රිය බද්ධ වූ ඍතුජ රූප කලාප (2) දෙක ය, ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ගනු ලැබෙති. **ප්‍රතිලෝම අභිධෙය්‍ය** කාමාවචර කුසලය ප්‍රහාණය කරනු ලබන කෙලෙසුන්ගේ අභාවයැයි කියන ලද තදංගනිරෝධය, මහග්ගත කුසලය ප්‍රහාණය කරනු ලබන නීවරණ යන්ගේ අභාවයයි කියන ලද විෂ්කම්භන නිරෝධය, මාර්ගය ප්‍රහාණය කරනු ලබන අනුසය කෙලෙසුන්ගේ අභාවයයි කියන ලද සමුච්ඡේද නිරෝධය ඵලය ප්‍රහාණය කරනු ලබන කෙලෙසුන්ගේ අභාව යයි කියන ලද පටිප්පස්සද්ධි නිරෝධය, චිත්ත චෛතසියන්ගේ ක්ෂණ භංගයයි කියන ලද ක්ෂණ නිරෝධය යනා දී වූ නිරෝධ සාමඤ්ඤය ගනු ලැබේ. නිරෝධ සාමඤ්ඤයද, නිරෝධ සත්‍ය ද තබා ඉතිරි ආර්‍ය්‍ය සත්‍ය (3) තුන ද සත්‍යවිනිර්මුක්ත වූ මාර්ගචිත්තෝත්පාද (29) එකුන්තිස, ඵල චිත්තෝත්පාද (37) සත්තිස අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දක හා ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙරසේම ලැබේ.

''න මග්ගො න මග්ග සච්චන්ති, ආමන්තා, න මග්ග සච්චං න මග්ගොති, මග්ග සච්චං ඨපෙත්වා අවසෙසො මග්ගො න මග්ග සච්චං මග්ගො, මග්ගඤ්ච මග්ග සච්චඤ්ච ඨපෙත්වා අවසෙසො නාචෙව මග්ගො, න ච මග්ග සච්චං'' (පෙර කී ක්‍රමයට අර්ථ දක්වනු.)

**අනුලෝම අභිධෙය්‍ය** මග්ග සාමඤ්ඤ, මාර්ගසත්‍යය ද තබා, අවශේෂ ආර්‍ය්‍ය සත්‍ය (3) තුනය, සත්‍ය විනිර්මුක්ත මාර්ගචිත්තෝපාද (29) එකුන්තිස, ඵලචිත්තෝත්පාද (37) සත්තිස, අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දෙක, ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ගනු ලැබෙති. සංසය ද එසේය, **ප්‍රතිලෝම අභිධෙය්‍ය** සහේතුක කාමාවචර විපාක, ක්‍රියා මහග්ගත සිත්හි ඇත්තාවූ පඤ්චාංගික මාර්ගය, මහා කුසල සිත් (8) අටෙහි ඇත්තා වූ අෂ්ටාංගික මාර්ගය, ඵලසිත් (4) සතරෙහි ඇත්තා වූ අෂ්ටාංගික මාර්ගය, මිථ්‍යා මාර්ග, ජංගමග්ග, සකට මග්ග, යනාදී වූ මග්ග සාමඤ්ඤ ගනු ලැබෙති. මග්ග සාමඤ්ඤ, මාර්ගසත්‍යයද තබා අවශේෂ ආර්‍ය්‍ය සත්‍ය (3) තුනය සත්‍ය විනිර්මුක්ත මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිස, ඵලචිත්තෝත් පාද (37) සත්තිස, අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දෙක ප්‍රඥප්ති යන මේ ධර්ම යෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේමය.

පද සොධන වාරය නිමි

2. පද ශෝධන මූල චක්‍ර වාරය

# අනුලෝමය

පදශෝධන වාරය දේශනා කොට වදරා අනතුරුව පදශෝධන මූල චක්‍ර වාරය වදළ සේක...... **කෙසේ වදළ සේක්ද යත්** ''දුක්ඛං දුක්ඛ සච්චන්ති, ආමන්තා, සච්චා සමුදය සච්චන්ති, සමුදය සච්චං සච්චඤ්චෙව සමුදය සච්චඤ්ච, අවසෙසා සච්චා න සමුදය සච්චං,'' සච්චා - සත්‍ය නම් වූවාහු සමුදය සච්චං - සමුදය, සත්‍ය නම් වෙත් ද; ඉති පුච්ඡායං සති - මෙසේ ප්‍රශ්නයක් ඇති කල්හි, සමුදය සච්චං සමුදය සත්‍ය තෙමේ; සච්චඤ්චෙව - සත්‍ය නම් ද වේ. සමුදය සච්චඤ්ච - සමුදය-සත්‍ය නම් ද වේ. අවසෙසා - සමුදය සත්‍යයෙන් අවශේෂයෝ, සච්චා - සත්‍ය නම් වෙති. න සමුදය සච්චං - සමුදය සත්‍ය නම් නොවෙති. **හෙවත්** අවසෙසා - සෙසු ධර්මයෝ - සච්චා - සත්‍යයෝ නම් වෙති. න සමුදය සච්චං සමුදය සත්‍ය නම් නොවෙති. (අනුලෝමයෙහි පද ශෝධනය අනුව අභිධෙය්‍ය උදුරනු.)

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** සමුදය සත්‍යය තබා අවශේෂ ආර්‍ය්‍ය සත්‍ය (3) තුන ගනු ලැබෙති. සමුදය සත්‍ය ද ගනු ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ. [ඉතිරි ආර්‍ය්‍ය සත්‍යදෙක මේ ක්‍රමයට අනුව සම්බන්ධ කරනු. සමුදය සත්‍ය මූල ආදී වූ මූල වාර තුනෙහි ද තුන - තුන බැගින් සම්බන්ධ කොට අනුලෝම පදශෝධන වාරය අනුව උදුරනු. ප්‍රතිලෝමයෙහි දුක්ඛ සත්‍ය මූලය හා සමානව ස්වරූප උදුරනු.]

අනුලෝමය නිමි

ප්‍රත්‍යනිකය

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනිකය වදළ සේක........ **කෙසේ වදළ සේක්ද යත්** ''නදුක්ඛං න දුක්ඛ සච්චන්ති, කායිකං දුක්ඛං චෙතසිකං දුක්ඛං ඨපෙත්වා අවසෙසං දුක්ඛං සච්චං න දුක්ඛං දුක්ඛ සච්චං දුක්ඛඤ්ච දුක්ඛ සච්චඤ්ච ඨපෙත්වා අවසෙසං නචෙව දුක්ඛං නච දුක්ඛ සච්චං, න සච්චා න සමුදය සච්චන්ති, ආමන්තා,'' (අනුලෝමයෙහි පදශෝධන වාරය අනුව ස්වරූප උදුරනු සුගමයි)

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** සත්‍යවිනිර්මුක්ත වූ මාර්ගචිත්තෝත්පාද (29) එකුන්තිස, ඵලචිත්තෝත්පාද (37) සත්තිස, අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දෙක ප්‍රඥප්ති යන මේ ධර්මයෝ ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය ද එසේය. [අවශේෂ ආර්‍ය්‍ය සත්‍ය දෙක සම්බන්ධ කිරීම ද මීට සමානය. න සමුදය සච්ච මූල ආදී වූ මූලවාර තුනෙහි ද තුන තුන බැගින් සම්බන්ධ කොට අනුලෝමයෙහි පදශෝධන වාරයට අනුව ස්වරූප උදුරනු. ප්‍රතිලෝමයෙහි සත්‍ය විනිර්මුක්තයෝ පමණක්ම ය, සියල්ලට ම ප්‍රතිවචන පමණක් ම ලැබෙති.

ප්‍රත්‍යනිකය නිමි. පද ශෝධන මූලචක්‍රවාරය නිමි.

3. ශුද්ධ සත්‍ය වාරය

# අනුලෝම

ශුද්ධ සත්‍ය වාරයෙහි ''දුක්ඛං සච්චන්ති, ආමන්තා, සච්චා දුක්ඛ සච්චන්ති, දුක්ඛ සච්චං සච්චඤ්චෙව දුක්ඛ සච්චඤ්ච, අවසෙසා සච්චා න දුක්ඛ සච්චං,'' **අනුලෝම අභිධෙය්‍ය** කායික දුක්ඛය, චෛතසික දුක්ඛය ගනු ලැබේ. සංසය ද එසේම ලැබේ. **ප්‍රතිලෝම අභිධෙය්‍ය** දුක්ඛ සත්‍යය තබා, සෙසු ආර්‍ය්‍ය සත්‍ය (3) තුන ගනු ලැබෙති. දුක්ඛ සත්‍යය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

''සමුදයො සච්චන්ති, ආමන්තා, සච්චා සමුදය සච්චන්ති සමුදය සච්චං සච්චඤ්චෙව සමුදය සච්චඤ්ච, අවසෙසා සච්චා න සමුදය සච්චං ''**අනුලෝම අභිධෙය්‍ය** සමුදය සාමඤ්ඤ, සමුදය සත්‍යය ගනු ලැබේ. සංසය ද ඒසේ ගනු ලැබේ. **ප්‍රතිලෝම අභිධෙය්‍ය** සමුදය සත්‍යය තබා සෙසු ආර්‍ය්‍ය සත්‍ය තුන ගනු ලැබෙති. සමුදය සත්‍යය ද ගනු ලැබේ.

''නිරොධො සච්චන්ති, ආමන්තා, සච්චා නිරොධ සච්චන්ති, නිරොධ සච්චං සච්චඤ්චෙව නිරොධ සච්චඤ්ච අවසෙසා සච්චා න නිරොධ සච්චං'' **අනුලෝම අභිධෙය්‍ය** සත්‍ය බවට යන්නා වූ නිරෝධ සාමඤ්ඤ නිරෝධ සත්‍ය ධර්මයෝ ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** එසේම ගනු ලැබේ. (ප්‍රතිලෝමයෙහි ක්‍රමය සමානය) ''මග්ගො සච්චන්ති, ආමන්තා, සච්චා මග්ග සච්චන්ති, මග්ග සච්චං සච්චඤ්චෙව මග්ග සච්චඤ්ච අවසෙසා සච්චා න මග්ග සච්චං **අනුලෝම අභිධෙය්‍ය** සත්‍ය බවට සුදුසු වූ මග්ග සාමඤ්ඤ මාර්ග සත්‍ය ධර්මයෝ ගනු ලැබෙති. **සංසය** ද එසේය. (ප්‍රතිලෝමයෙහි නය ක්‍රමයට සමානව උදුරනු.)

අනුලෝමය නිමි

---

ප්‍රත්‍යනිකය

අනුලෝමය දේශනා කොට වදරා අනතුරුව ප්‍රත්‍යනිකය වදළ සේක... **කෙසේ වදළ සේක් ද යත්** ''න දුක්ඛං න සච්චන්ති, දුක්ඛං ඨපෙත්වා අවසෙසා සච්චා, න දුක්ඛං සච්චා දුක්ඛඤ්ච සච්චඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව දුක්ඛං නච සච්චා, න සච්චා න දුක්ඛ සච්චන්ති, ආමන්තා,'' දුක්ඛං - දුක්ඛය; ඨපෙත්වා - තබා; අවසෙසා - අවශේෂ වූ; සච්චා - සත්‍යයෝ, නදුක්ඛං - නොමදුක්ඛ නම් වෙති, සච්චා - සත්‍ය නම් පමණක් වෙති, **අනුලෝම අභිධෙය්‍ය** - කායික දුක්ඛ, චෛතසික දුක්ඛය තබා, ආර්‍ය්‍ය සත්‍යයෝ (4) සතර දෙන ගනු ලැබෙති. සත්‍ය විනිර්මුක්ත වූ මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිස ඵල චිත්තෝත්පාද (37) සත්තිස, අනින්ද්‍රිය බද්ධ සංඝුජ රූප කලාප (2) දෙක ප්‍රඥප්ති යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙරසේම ලැබේ. (ප්‍රතිලෝමයෙහි පෙර කියන ලද සංසය අභිධෙය්‍ය උදුරනු.)

''න සමුදයො න සච්චන්ති, සමුදයං ඨපෙත්වා අවසෙසා සච්චා න සමුදයො සච්චා, සමුදයඤ්ච සච්චඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව සමුදයො නච සච්චා, න සච්චා න සමුදය සච්චන්ති, ආමන්තා'' **අනුලෝම** අභිධෙය්‍ය – සමුදය සාමඤ්ඤ, සමුදය සත්‍යය තබා, අවශේෂ සත්‍ය (3) තුන ගනු ලැබෙති. සත්‍ය විනිර්මුක්ත වූ මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිස, ඵලචිත්තෝත්පාද (37) සත්තිස අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දෙක, ප්‍රඥප්තිය යන ධර්මයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ලැබේ. ප්‍රතිලෝමයෙහි පෙර කියන ලද සංසය ගනු ලැබේ.

''න නිරොධො න සච්චන්ති, නිරොධං ඨපෙත්වා අවසෙසා සච්චා න නිරොධො සච්චා නිරොධඤ්ච සච්චඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව නිරොධො නච සච්චා, න සච්චා න නිරොධ සච්චන්ති, ආමන්තා.'' **අනුලෝම අභිධෙය්‍ය**– නිරෝධ සාමඤ්ඤ නිරෝධ සත්‍යය තබා, ආර්‍ය්‍ය සත්‍ය (3) තුන ගනු ලැබෙති, සත්‍ය විනිර්මුක්ත වූ මාර්ග චිත්තෝත් පාද (29) එකුන් තිස ඵල චිත්තෝත්පාද (37) සත්තිස, අනින්ද්‍රිය බද්ධ වූ ඍතුජ රූපකලාප (2) දෙක ප්‍රඥප්තිය, යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ. (ප්‍රතිලෝමයෙහි ද පෙර කියන ලද සංසය උද්ධරනු.)

'' න මග්ගො න සච්චන්ති, මග්ගං ඨපෙත්වා අවසෙසා සච්චා න මග්ගො සච්චා, මග්ගඤ්ච සච්චඤ්ච ඨපෙත්වා අවසෙසො න චෙව මග්ගො න ච සච්චා,න සච්චා න මග්ග සච්චන්ති, ආමන්තා ''**අනුලෝම අභිධෙය්‍ය** – මග්ග සාමඤ්ඤ, මාර්ග සත්‍යය තබා, ආර්‍ය්‍ය සත්‍ය (3) තුන ගනු ලැබෙති. සත්‍ය විනිර් මුක්ත වූ මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිස, ඵලචිත්තෝත්පාද (37) සත්තිස අනින්ද්‍රිය බද්ධ ඍතුජ රූප කලාප (2) දෙක, ප්‍රඥප්ති, යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති, **සංසය අභිධෙය්‍ය** – පෙර සේ ම ලැබේ. [ප්‍රතිලෝමයෙහි සංසය අභිධෙය්‍ය උද්ධරනු. මේ ශුද්ධ සත්‍ය වාරයෙහි සුදුසු පරිදි සත්‍ය බවට යන්නා වූ ධර්ම පමණක් ම වදාරා ඇති බැවින් මග්ග සාමඤ්ඤයෙහි, ඵලසිත්හි ඇත්තා වූ අෂ්ටාංගික මාර්ගය නොකියන ලදී. එසේ නොවදළ බැවින් ප්‍රත්‍යනිකයෙහි ඵලචිත්තෝත්පාද (37) සත්තිස උද්ධරන ලදහ.] සුද්ධ සත්‍ය වාරය නිමි. ශුද්ධ සත්‍ය මූලචක්‍ර වාරයෙහි ද විශේෂයක් නොමැත.

ප්‍රඥප්ති වාරය නිමි

---

[ස්ථාන ගණන වනාහි මෙසේ දත යුතු. 1. කායිකං දුක්ඛං චෙතසිකං දුක්ඛං ඨපෙත්වා අවසෙසං – යනු එකකි. 2. කායිකං දුක්ඛං චෙතසිකං දුක්ඛං යනු ද එකකි. 3. දුක්ඛඤ්ච දුක්ඛ සච්චඤ්ච ඨපෙත්වා අවසෙසං – යනු ද එකකි. 4. දුක්ඛ සච්චං – යනු ද එකකි. 5. අවසෙසා – යනු ද එකකි. 6. දුක්ඛං ඨපෙත්වා අවසෙසා සච්චා – යනු ද එකකි. 7. දුක්ඛඤ්ච සච්චඤ්ච ඨපෙත්වා අවසෙසා – යනු ද එකකි. මෙසේ දුක්ඛ සත්‍යයෙහි ස්ථාන (7) සතකි. 1. සමුදය සච්චං ඨපෙත්වා අවසෙසො සමුදයො යනු ද එකකි. 2. සමුදයඤ්ච සමුදය සච්චඤ්ච ඨපෙත්වා අවසෙසා – යනු

එකකි. 3. සමුදය සච්චං - යනු එකකි. 4. අවසෙසා - යනු එකකි. 5. සමුදයං ඨපෙත්වා අවසෙසා සච්චා - යනු ද එකකි. 6. සමුදයඤ්ච සච්චඤ්ච ඨපෙත්වා අවසෙසා යනු ද එකකි. මෙසේ සමුදය සත්‍යයෙහි ස්ථාන (6) සයකි. නිරෝධ සත්‍යයෙහි ද මෙසේ ම ස්ථාන සයකි. මාර්ග සත්‍යයෙහි ද මෙසේම ස්ථාන සයකි. ස්ථාන සමූහය පිඩු කරන ලද්දේ (25) පස් විස්සෙක් ගනු ලැබෙති.]

---

ප්‍රවෘත්ති වාර උත්පාද වර්තමාන වාරය

## දුක්ඛ සත්‍ය මූලය

ප්‍රඥප්ති වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රවෘත්ති වාරය වදළ සේක ඒ ප්‍රවෘත්ති වාරය ද උත්පාද වාරය, නිරෝධ වාරය, උත්පාද නිරෝධ වාරය වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. (පෙර සේ බෙද කියනු) ඒ පුද්ගල වාරයෙහි දුක්ඛ සත්‍ය මූලය, සමුදය සත්‍ය මූලය වශයෙන් (2) දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් දුක්ඛ සත්‍ය මූලය පළමුකොට වදළ සේක. ඒ දුක්ඛ සත්‍ය මූලයද සමුදය සත්‍ය මූලිය මාර්ග සත්‍ය මූලිය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සමුදය සත්‍ය මූලිය පළමුකොට වදළ සේක. **කෙසේ වදළ සේක්ද යත්** - **"යස්ස දුක්ඛ** සච්චං උප්පජ්ජති, තස්ස සමුදය සච්චං උප්පජ්ජතීති සබ්බෙසං උපපජ්ජන්තානං පවත්තෙ තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං දුක්ඛ සච්චං උප්පජ්ජති, නො ච තෙසං සමුදය සච්චං උප්පජ්ජති තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං දුක්ඛසච්චඤ්ච උප්පජ්ජති, සමුදය සච්චඤ්ච උප්පජ්ජති, **"යස්ස වා පන** - ආමන්තා," සබ්බෙසං - සියලු; උපපජ්ජන්තානං - වර්තමාන ප්‍රතිසන්ධික්ෂණ ඇතිව උපදින්නා වූ; තෙසං - ඒ සියලු සත්වයන්ගේ ද පවත්තෙ - ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයාගේ; උප්පාදක්ඛණෙ උත්පාදක්ෂණයෙහි; තෙසං - ඒ පුද්ගලයන්ගේ ..."

අනුලෝම පුච්ඡාවෙහි "**යස්ස** දුක්ඛ සච්චං උප්පජ්ජති" යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ - ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස කර්මජරූප කලාප (3, 7, 4) තුන, සත, සතර බැගිනි. ආදිම ජීවිත නවක රූප කලාපය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය; යට එලස්ථ ආයෂී පුද්ගලයන් (3) තිදෙනාය, පඤ්චවෝකාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි අරූප විපාක සිත් (4) සතර හැර තෘෂ්ණා විප්‍රයුක්ත වූ සිත් (77) සත් සැත්තෑවය, ලෝභ - දිට්ඨි - මාන වර්ජිත චෛතසික (49) එකුන් පණස, චිත්තජ රූප, යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. ආයෂී පුද්ගලයන් (8) අටදෙනාය. චතුවෝකාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි මෝහමූලද්වයය, මනෝද්වාරාවර්ජන චිත්තය, මහාකුශල,

මහාක්‍රියා, අරූප සිත් (12) දොළසය,ලෝභ - දිට්ඨි - මාන - දොස - ඉස්සා මච්ඡරිය - කුක්කුච්ච - ථීන - මිද්ධ - විරති - අප්පමඤ්ඤා වර්ජිත චෛතසික (38) අටතිස, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන, ඵලස්ථ ආයඞ පුද්ගල (4) සිවු දෙන යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි ලෝභ මූල සිත් (8) අටය, චෛතසික (22) දෙවිස්සය, චිත්තජ රූපයෝ ය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, චතුවෝකාර භූමියෙහි ලෝභමූල සිත් (8) අටය, චෛතසික (22) දෙවිස්සය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය. යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේම ලැබේ. ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය අභිධෙය්‍ය මැයි.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය - ''සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාද ක්ඛණෙ තෙසං'' චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප, ජීවිත නවක රූප කලාප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුත වෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ඵලස්ථ ආයඞ පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධි චිත්තයාගේ පටන් චුතියට අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ භංගක්ෂණ සමංගීවූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආයඞ පුද්ගලයන් (8) අට දෙනාය, අරූප භූමියෙහි උඩ මාර්ගත්‍රය, ඵල සිත් (4) සතරය, චෛතසික (36) සතිසය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ උඩ මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආයඞ පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

[අරූප භූමියෙහි මාර්ග ඵල චිත්තයන්ගේ උත්පාදක්ෂණයෙහි රූප ඉපදීමක් නැති බැවින් දුක්ඛසත්‍යයාගේ ඉපදීමක් නො ලැබේ. පඤ්චවෝකාරයෙහි මාර්ග ඵල, දුක්ඛ සත්‍ය නොවන නමුත් මාර්ග ඵල චිත්තයන් නිසා උපදනා වූ චිත්තජ රූප දුක්ඛ සත්‍ය බැවින් මාර්ග ඵල චිත්තයන්ගේ උත්පාදක්ෂණයෙහි දුක්ඛ සත්‍ය උපදනේ වේ]

''යස්ස දුක්ඛ සච්චං උප්පජ්ජති, තස්ස මග්ග සච්චං උප්පජ්ජතීති, සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ මග්ග විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං පඤ්චවෝකාරෙ මග්ගස්ස උප්පාදක්ඛණෙ තෙසං, **යස්ස වාපන**, අරූපෙ මග්ගස්ස උප්පාදක්ඛණෙ තෙසං''

සබ්බෙසං - සියලුම, උපපජ්ජන්තානං - ප්‍රතිසන්ධි ගනිමින් සිටින්නා වූ, තෙසං - ඒ පුද්ගලයන්ටද, පවත්තෙ - ප්‍රවෘත්ති කාලයෙහි - මග්ග විප්පයුත්ත චිත්තස්ස - මාර්ග විප්‍රයුක්ත චිත්තයාගේ; උප්පාදක්ඛණෙ - උත්පාදක්ෂණයෙහි; වත්තමානානං - පවත්නා වූ; තෙසං - ඒ පුද්ගලයන්ගේ ද; පඤ්චවොකාරෙ, පඤ්චවෝකාර භූමියෙහි; මග්ගස්ස, - මාර්ග චිත්තයාගේ; උප්පාදක්ඛණෙ - උත්පාදක්ෂණයෙහි; වත්තමානානං - පවත්නා වූ; තෙසං - ඒ පුද්ගලයන්ගේ ද;- අරූපෙ - අරූප භූමියෙහි මග්ගස්ස - මාර්ග - චිත්තයාගේ උප්පාදක්ඛණෙ; උත්පාදක්ෂණයෙහි - වත්තමානානං පවත්නා වූ; තෙසං - ඒ පුද්ගලයන්ගේ ද; (සුගමයි)

**අනුලෝම අභිධෙය**-ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3, 7, 4) තුන සත සතර බැගින් ඇති මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයර් පුද්ගලයන් (3) තිදෙනාය. පඤ්ච වෝකාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි අරූප විපාක සතර හැර මාර්ග වර්ජිත, සිත් (81) එක් අසූවය, චෛතසික (52) දෙපණසය, චිත්තජ රූප යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන-පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයර් පුද්ගලයන් (4) සිවු දෙනාය චතුවෝ කාර භූමියෙහි ප්‍රවෘත්ති කාලයෙහි ලෝභ මූල, මෝහමූල, මනෝද්වාරාවර්ජන, මහා කුසල මහාක්‍රියා, අරූප සිත් (12) දොළස, දෙස - ඉස්සා - මච්ඡරිය - කුක්කුච්ච - විරති - අප්පමඤ්ඤා වර්ජිත චෛතසික (43) තෙසාලිස යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය, ඵලසථ ආයර් පුද්ගල යන් (4) සිවුදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. පඤ්චවොකාර භූමියෙහි මාර්ග සිත් (4) සතරය, චෛතසික (36) සතිසය, **චි**ත්තජරූප, යන මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ මාර්ගස්ථ ආයර් පුද්ගලයන් (4) සිවුදෙනා ද ගනු ලැබෙති. **සංසය අභිධෙයය** පෙර සේම ලැබේ. **ප්‍රතිලෝම අභිධෙයය**, අරූප භූමියෙහි උඩ මාර්ග (3) තුනය, චෛතසික (36) සතිය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ උඩ මාර්ගස්ථ ආයර් පුද්ගලයන් (3) තිදෙන ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

[මේ ස්ථානයේදී සමහර ගුරුවරු, මාර්ගාංග අටෙහි උත්පාදක්ෂණ සමංගී පුද්ගලයා පමණක් ම මාර්ගසත්‍යයාගේ වර්තමාන ක්ෂණයෙහිදී උදුරති, මාර්ගාංග අට හැර මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිස, චිත්තජ රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයා ස්වරූප වශයෙන් නොගනිති. මෙසේ ස්වරූප ගැනීම අපේ ආචාර්‍ය වරයෝ සාර වශයෙන් නොසලකත්. කුමක් හෙයින් ද යත්, මාර්ගාංග අට පිළිබඳ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයාගෙන් වෙන්ව මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිස ලැබෙන්නේ නැත. එක් අයෙකුම ලැබෙන බැවින් මාර්ගක්ෂණයෙහි, අවශේෂ චිත්තෝත් පාද (29)

එකුන්තිස, චිත්තජ රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයා ද වර්තමාන මාර්ගක්ෂණයෙහි පුද්ගලයාම යයි ගෙන ආචාර්‍ය්‍ය පාදයෝ ඉහත ස්වරූප දක්වූ පරිදිම ස්වරූප උදුරති. සමහර ගුරුවරුන් ස්වරූප උදුරන සේ ස්වරූප ගතහොත් ගැනෙන්නේ කවර අභිධෙය්‍යාර්ථද යත්; ''අරූපෙ මග්ගස්ස උප්පාදක්ඛණෙ'' යන තැන මාර්ගාංග අටෙහි, උත්පාදක්ෂණ සමංගී පුද්ගලයා පමණක් කියා ඇති බැවින් මාර්ගාංග අට හැර මාර්ග චිත්තෝත්පාද (29) එකුන්තිසගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයාද ඇතුලත් විය නොහැකිය. මෙසේ ඇතුලත් නොවෙන්නේ නම් ප්‍රත්‍යනිකයෙහි ''සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ අරූපෙ ඵලස්ස උප්පාදක්ඛණෙ'' කියා සියලු උත්පාදක්ෂණ - සියලු භංගක්ෂණ, සමංගී අරූපයෙහි ඵලයාගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයාම වදරා ඇති බැවින් අනුලෝමයෙහි ද ඇතුලත් නොවෙයි. ප්‍රත්‍යනිකයෙහි ද ඇතුලත් නොවෙයි. ඒ හෙයින් ඒ වාදය විමසා බැලිය යුතුයි. **ප්‍රත්‍යනික අභිධෙය්‍ය** - ''සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ ඵලස්ස උප්පාදක්ඛණෙ තෙසං'' චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප ජීවිත නවක රූපකලාප, යන මොවුන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුත වෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනා ය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය, අරූප භූමියෙහි ඵලසිත් (4) සතරය, චෛතසික (36) සතිසය මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සතර දෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

[මේ සත්‍ය යමකයෙහි ප්‍රවෘත්තිවාරයෙහි දුක්ඛ සත්‍ය මූල යමක (3) තුනකි. සමුදය සත්‍යමූල යමක (2) දෙකකි. නිරෝධ සත්‍ය මූල යමක එකකි. මෙසේ යමක (6) සයක් ඇතුලත් විය යුතු නමුත්, නිරෝධ සත්‍ය වූ නිර්වාණ ධාතුව වනාහි උත්පාද-ස්ථිති - භංග යන ක්ෂණත්‍රයට නොවැටෙන බැවින් උප්පජ්ජති - කියාද, නිරුජ්ඣති - කියා ද වදරා නැත. ප්‍රවෘත්ති වාරයද උත්පාදවාර -- නිරෝධවාර වදරා ඇති බැවින් නිරෝධ සත්‍ය සමග සම්බන්ධ වන යමකයක් ගත නොහැකිය. එ නිසා දුක්ඛ - සත්‍ය මූලයෙහි සමුදය මග්ග - සම්බන්ධ කොට යමක දෙකකි. සමුදය මූලයෙහි මග්ග - සම්බන්ධ කොට යමක එකකි. මෙසේ යමක (3) තුනක් පමණක් ම පෙළෙහි පැමිණියේ වේ.]

## සමුදය සත්‍ය මූලය

''**යස්ස** සමුදය සච්චං උප්පජ්ජති, තස්ස මග්ග සච්චං උප්පජ්ජතීති, නො, **යස්ස වාපන** නො'' **අනුලෝම** අභිධෙය්‍ය -- ලෝභ මූල සිත් (8) අටය, චෛතසික (22) දෙවිස්ස මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

## කොටස් බෙද දක්වීම

සමුදය සත්‍ය පමණක් උපදිමින් ඇති පුද්ගලයනට මාර්ග සත්‍යය ඒ ක්ෂණයෙහි නොමැති බැවින් ''තස්ස මග්ග සච්චං උප්පජ්ජති'' යන සංසය පදයාගේ අභිධෙය්‍යාර්ථයක් නොමැත. එසේ සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය ඇතිව සංසය පදයාගේ අභිධෙය්‍ය නොමැති බැවින් යම් පුද්ගලයකුට සමුදය සත්‍යය උපදමින් ඇත්තේය, ඒ සමුදය සත්‍යය උපදිමින් ඇති පුද්ගලයාට මාර්ග සත්‍යයක් උපදමින් පවත්නේ දැයි සැකයක් සර්වඥ සන්තානයෙහි නැති නමුත්, වෛනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න කොට ප්‍රශ්න ජාති පස අතුරෙන් මොස ප්‍රශ්නයාගේ වශයෙන් අසන ලද ප්‍රශ්නයට අනුරූපව, සමුදය සත්‍යය උපදමින් ඇති පුද්ගලයාට මාර්ගසත්‍ය නුපදින බැවින් සංසය පදයාගේ අභිධෙය්‍ය ප්‍රතික්ෂේප කොට පිළිතුරු පස අතුරෙන් ''නො'' යයි ප්‍රතිෂේධ විසඳුමෙන් පිළිතුරු වදළහ.''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** මාර්ග සිත් (4) සතරය, චෛතසික (36) සතිසය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ මාර්ගස්ථ පුද්ගලයන් (4) සිවුදෙනා ගනු ලැබෙති. සංසය ස්වරූප නො ලැබේ. [කොටස් බෙද දක්වීම අනුලෝමයට සමානය] **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, තණ්හාවිප්පයුත්ත මග්ග විප්ප යුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං' සියලුම චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්ත, මාර්ග විප්‍රයුක්ත (77) සත් සැත්තෑ චිත්තයන්ගේ ලෝභ - දිට්ඨි - මාන වර්ජිත චෛතසික (49) එකුන් පණසගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, නිරෝධ සමාපත්තියට සම වැදුනාවූ අනාගාමි, අර්හත් ඵලස්ථ ආය්‍ය්‍ර පුද්ගලයෝය, අසඤ්ඤ සත්වයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පුද්ගල වාරය නිමි.

---

## ඕකාස වාරය.

''යත්ථ දුක්ඛ සච්චං උප්පජ්ජති, තත්ථ සමුදය සච්චං උප්පජ්ජතීති අසඤ්ඤ සත්තෙ තත්ථ, චතුවෝකාරෙ පඤ්චවොකාරෙ තත්ථ, **යත්ථ වාපන** – ආමන්තා.''

**අනුලෝම අභිධෙය්‍ය** - රූප ස්කන්ධය පමණක් උපදින ස්ථානය වූ අසඤ්ඤ සත්ව භූමිය ගනු ලැබේ. සතර නාමස්කන්ධයාගේ උත්පත්ති ස්ථානයවූ චතුවෝකාර භූමි (4) සතරය ස්කන්ධ පඤ්චකයාගේම උත්පත්ති ස්ථානය වූ පඤ්චවෝකාර භූමි (26) සවිස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේ ම ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය මෙනි. **ප්‍රත්‍යනීකයෙහි** – ''නත්ථි'' සමභ

පාළිගතිය වේ. ''යත්ථ දුක්ඛ සච්චං උප්පජ්ජති, තත්ථ මග්ග සච්චං උප්පජ්ජතීති අපායෙ, අසඤ්ඤසත්තෙ තත්ථ, අවසෙසෙ චතුවොකාරෙ, පඤ්චවොකාරෙ තත්ථ, **යත්ථ වා පන**-ආමන්තා'', **අනුලෝම අභිධෙය්‍ය** ලෞකික ස්කන්ධ පඤ්චකයාගේ උත්පත්ති ස්ථානය වූ අපාය භූමි (4) සතරය, රූපස්කන්ධයාගේ පමණක් උත්පත්ති ස්ථානය වූ අසඤ්ඤසත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති. ලෞකිකවූද ලෝකෝත්තර වූ ද ස්කන්ධ (4) සතර හා (5) පස පිළිබඳ උත්පත්ති ස්ථාන වූ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය **අභිධෙය්‍ය** පෙර සේම ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය ලැබේ. **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''නත්ථි'' යනු හා පාළිගතියම වේ.

''යත්ථ සමුදය සච්චං උප්පජ්ජති, තත්ථ මග්ග සච්චං උප්පජ්ජතීති, අපායෙ තත්ථ, අවසෙසෙ චතුවොකාරෙ, පඤ්චවොකාරෙ තත්ථ, **යත්ථ වා පන** ආමන්තා'' **අනුලෝම අභිධෙය්‍ය** – ලෞකික ස්කන්ධ පඤ්චකයාගේ උත්පත්ති ස්ථානය වූ අපාය භූමි (4) සතර ගනු ලැබේ. ලෞකික වූ ද ලෝකෝත්තර වූ ද ස්කන්ධ (4) සතරේ සහ පසේ උත්පත්ති ස්ථානය වූ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය යන භූමි ද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''අසඤ්ඤසත්තෙ තත්ථ,'' [ඕකාස වාර අනුලෝමය පිළිබඳ සියල්ලම මේ අනුවම කියනු.]

---

පුද්ගලෝකාස වාරය

## දුක්ඛ සත්‍ය මූලය

පුද්ගලෝකාස වාරයෙහි, ''**යස්ස යත්ථ** දුක්ඛ සච්චං උප්පජ්ජති, තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජතීති'' [විභංගය පුද්ගල වාරයට වඩා විශේෂයක් නොමැත.] **අනුලෝම අභිධෙය්‍ය** ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය කර්මජ රූප කලාප (3–7–4) තුන – සත – සතර බැගිනි, ජීවිත නවක රූප කලාපය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගි වූ සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, අසංඥතලය, පඤ්චවෝකාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි අරූප විපාක සිත් (4) සතර හැර, තෘෂ්ණා විප්‍රයුක්ත වූ සිත් (77) සත් සැත්තෑවය, ලෝභ – දිට්ඨි – මාන වර්ජිත චෛතසික (49) එකුන්පණසය, චිත්තජ රූප යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය, යන මේ පුද්ගලයන් ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, චතුවෝකාර ප්‍රවෘත්ති කාලයෙහි මෝහමූලද්වය, මනෝද්වාරාවර්ජනය, මහාකුශල, මහාක්‍රියා, අරූප සිත් (12) දොළසය, ලෝභ – දිට්ඨි – මාන – දෙස–ඉස්සා – මච්ඡරිය -

– කුක්කුච්ච - ථීන – මිද්ධ – විරති – අප්පමඤ්ඤා වර්ජිත චෛතසික (38) අටතිස යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද, ත්‍රිහේතුක පෘථග්ජනයාය, ඵලස්ථ ආය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ගනු ලැබෙති. පඤ්චවෝකාර භූමියෙහි ලෝභමූල සිත් (8) අටය, චෛතසික (22) දෙවිස්සය චිත්තජ රූපයෝ ය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, චතුවෝකාර භූමියෙහි ලෝභමූල සිත් (8) අටය. චෛතසික (22) දෙවිස්ස යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාය යට ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝමයෙහි** – පෙර කියන ලද සංසය අභිධෙය්‍යම ලැබේ. **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** - ''සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භඞ්ගක්ඛණෙ අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ, තෙසං තත්ථ'', චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම වූ කර්මජ රූප, ජීවිත නවක කලාපය යන මේ ධර්මයන් ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, අසංඥතලය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආය්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය යන මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය අරූප භූමියෙහි උඩ මාර්ග (3) තුනය ඵල සිත් (4) සතරය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය. යන මේ භූමි ගනු ලැබෙති.

[මේ නය ක්‍රමය ඇසුරු කොට පුද්ගල වාරය අනුව භූමි භෙදය කියනු. මාර්ගස්ථ ආය්‍ය්‍ය පුද්ගලයා කෙරෙන් අපාය භූමි (4) සතර අතහැර ස්වරූප උද්ධරනු. ප්‍රත්‍යනීකයෙහි සමුදය හා මාර්ග පුද්ගලෝකාස වාරයෙහි නිරෝධ සමාපත්තියට කී ලෙස උද්ධරනු. ප්‍රත්‍යනීකයෙහි අනුලෝමයට අනුව කියන ලද්ද අතුරෙන් අනුලෝම – ප්‍රතිලෝම මාරුකොට කියනු]

වර්තමාන වාරය නිමි.

---

අතීත පුද්ගල වාරය

## දුක්ඛ සත්‍ය මූලය

වර්තමාන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව අතීත වාරය වදළ සේක. (ව්‍යවස්ථානය පෙර සේ කියනු) ''**යස්ස** දුක්ඛසච්චං උප්පජ්ජිත්ථ තස්ස සමුදය සච්චං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන** - ආමන්තා'' අනුලෝම අභිධෙය්‍ය, සියලුම පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙන හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනා ගනු ලැබෙති. **සංසය** ද එසේය. **ප්‍රතිලෝමයට** ද එසේම ලැබේ. ප්‍රත්‍යනිකයෙහි ''නත්ථි'' යනු ම වේ.

''**යස්ස** දුක්ඛ සච්චං උප්පජ්ජිත්ථ, තස්ස මග්ග සච්චං උප්පජ්ජිත්ථාති, අනභිසමෙතාවීනං තෙසං, අභිසමෙතාවීනං තෙසං **යස්ස වා පන** ආමන්තා,'' අනභිසමෙතාවීනං - චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය අවබෝධ නොකරන ලද්ද වූ, තෙසං - ඒ පුද්ගලයනට, අභිසමෙතාවීනං - චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය අවබෝධ කරන ලද්ද වූ; තෙසං - ඒ ආර්‍ය්‍ය පුද්ගලයනට;

[''අභිසමෙතාවිනන්ති අභිසමිත සච්චානං'' යනු අට්ඨකථා පාඨයයි අභි - සං - පූර්ව ඉ - ගතියං ධාතුය, තාවී - ප්‍රත්‍යයයි] ''යෙ ගත්‍යත්ථා තෙ බුද්ධ්‍යත්ථා''යි කි බැවින් ඉ - ධාතුව අවබෝධාර්ථය කියයි. අභි - සං, උපසර්ග ධාත්වත්ථ අනුවර්තකයෝය, පියෙව්යෙන් ගමනාර්ථය කියන ඉ - ධාතුව ගත් කල්හි ධාත්වර්ථ විශේෂකව අවබෝධ අර්ථය කියනු ලැබේ. මෙසේ දෙයාකාරයෙන් අර්ථය සිතිය යුතුය.]

**අනුලෝම අභිධෙය්‍ය** - අනාදිමත් සංසාරයෙහි පටන් සෝවාන් මග තෙක් ආර්‍ය්‍ය සත්‍ය සතර පිළිබඳ අවබෝධයට නොපැමිණියා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා සහ සොවාන් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා ගනු ලැබේ. සොවාන් මාර්ගයට අනතුරුව ඵල චිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා ආර්‍ය්‍ය සත්‍ය සතර අවබෝධයට පැමිණියා වූ උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. [**ප්‍රත්‍යනික සංසය**- නොමැත. අනුලෝමයෙහි,නත්ථි - යන ප්‍රතික්ෂෙපයයි. ප්‍රතිලෝමයෙහි - උප්පජ්ජිත්ථ යනුවෙන් පාළි ගතියයි. සමුදය හා මාර්ගය සමාන මැයි]

පුද්ගල වාරය නිමි.

(ඕකාස වාරය සුගමයි)

පුද්ගලෝකාස වාරය

# දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි** "**යස්ස යත්ථ** දුක්ඛ සච්චං උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජිත්ථාති, සුද්ධාවාසානං දුතියෙ චිත්ත වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං, පඤ්චවොකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ආමන්තා,"

දුතියෙ - දෙවැනි වූ චිත්තෙ, - ප්‍රතිසන්ධියට අනතුරුව ලැබෙන ප්‍රථම භවංග චිත්තය, වත්තමානෙ - පවත්නා කල්හි, සුද්ධාවාසානං - සුද්ධාවාස භූමියෙහි ඉපද සිටින්නා වූ, තෙසං - ඒ පුද්ගලයන්ට ද, අසඤ්ඤ සත්තානං - අසඤ්ඤසත්ත භූමියෙහි - ඉපද සිටින්නා වූ, තෙසං - ඒ පුද්ගලයන්ට ද, තත්ථ - ඒ සුද්ධාවාස භූමි - අසංඥ භූමියෙහි, ඉතරෙසං - සුද්ධාවාස භූමියෙහි දෙවැනි සිත සහිත පුද්ගලයා තබා, චතුවොකාරානං - චතුවෝකාරයෙහි ඉපද සිටින පුද්ගලයන්ටද, පඤ්චවොකාරානං - පඤ්චවෝකාර භූමියෙහි ඉපද සිටින පුද්ගලයන්ට ද;

**අනුලෝම අභිධෙය්‍ය** - සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව ප්‍රථමභවංගයයි කියන ලද ඒකාන්ත දෙවැනි සිත, ඒ සිත හා සමඟ සමුදය සත්‍ය ඉපදීමක් අතීතයේදී වත් නොවූ බැවින් ඒ හා සමාන දෙවැනි සිත යයි කියන ලද භවංග චිත්තවාර (15) පසළොසය, මනෝද්වාරාවර්ජනය, භවනිකන්තික ප්‍රථම ජවනය මෙ සිත් (18) දහ අටේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ ආර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය අසඤ්ඤසත්වයෙහි උපදින - ච්‍යුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්වභූමිය යන භූමි ගනු ලැබෙති. සුද්ධාවාසය වන්නේ නම්, භවනිකන්තික ද්විතිය ජවනයේ පටන් ච්‍යුති චිත්තය දක්වා ද, අවසේස චතුවෝකාර පඤ්චවෝකාරය වන්නේ නම්, ප්‍රතිසන්ධි චිත්තයේ පටන් ච්‍යුති චිත්තය දක්වාද. සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආර්‍ය පුද්ගලයන් (8) අටදෙනාය, යන මෙ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙරසේම ලැබෙ. (ප්‍රතිලෝමයෙහි පෙර සංසය ස්වරූප උදුරනු) **ප්‍රත්‍යනිකයෙහි** - "සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ" රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිත් එකය, චෛතසික (30) තිසය යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති.

**දුක්ඛ සත්‍ය හා මාර්ග සත්‍යයෙහි** "සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අනභිසමෙතාවීනං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, අභිසමෙතාවීනං තෙසං තත්ථ,' **යස්ස වා පන** යත්ථ ආමන්තා" (අර්ථ සුගමයි) **අනුලෝම අභිධෙය්‍ය** සුද්ධාවාස

භූමියෙහි ප්‍රතිසන්ධියට අනතුරුව ප්‍රථම භවංගයයි කියන ලද නියත දෙවැනි ඝිත, ඒ ඝිත හා සමඟ මාර්ග සත්‍ය උපන්නකු අතීතයෙහි නොලැබෙන බැවින් ඒ හා සමාන දෙවැනි ඝිත නම් වූ, ඒ භවයෙහි අර්හත් මාර්ගය නොලබන්නේ නම් දෙවැනි භවංග යාගේ පටන් චුති චිත්තය දක්වා ද අර්හත් මාර්ගය ලබන්නේ නම් දෙවැනි භවංගයාගේ පටන් අර්හත් මාර්ගය දක්වා ද සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය.

[ද්‍විතිය භවංගයාගේ පටන් අර්හත් මාර්ගය තෙක් ද චුති චිත්තය තෙක් ද චිත්තයන් මාර්ග සත්‍ය නොලද්දකුට සමාන බැවින් සදිසූපචාර වශයෙන් ද්‍විතිය චිත්තය නම් වේ. ප්‍රථම භවංග චිත්තය වනාහි නියත බැවින් ද්‍විතියෙ චිත්තෙ යයි දක්වන ලදී.]

අවශේෂ චතුවෝකාර පඤ්චවෝකාර පුද්ගලයන්ට ඒ භවයෙහි මාර්ගය නොලැබෙන්නේ නම්,ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද ලැබෙන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් සෝතාපත්ති මාර්ග තෙක් ද සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, සොතාපත්ති මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය. [මේ වනාහි නියතයෙන් අනභිසමෙතාවී නම්.] **අන් භූමියක දීම** යට මාර්ගය ලබන ලද්දේ නමුත් තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය නොලද්දෙකු බැවින් 'තත්ථ අනභිසමෙතාවී – නම් වූ පුද්ගලයින් අතුරෙන් අන්‍ය භූමියකදී සොතාපත්ති මාර්ගය ලබා තමන්" ඉපද සිටින භූමියෙහි සකදගාමී මාර්ගය නොලබන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, ලබන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් සකදගාමී මාර්ගය දක්වා ද සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද සොතාපත්ති ඵලස්ථ, සකදගාමී මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝය. **අන්‍ය භූමියකදී** සකදගාමී මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි අනාගාමී මාර්ගය නොලබන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, ලබන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අනාගාමී මාර්ගය තෙක් ද සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද සකදගාමී ඵලස්ථ – අනාගාමී මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝය.

**අන්‍ය භූමියකදී** අනාගාමී මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහිදී අර්හත් මාර්ගය නොලබන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය තෙක් ද, ලබන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගය තෙක් ද සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ ක්ෂණ–ත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝ ය, යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්–ඵලය තෙක් රූපභූමි (10) දගය. [මේ වනාහි අනේකාන්තයයි] අසඤ්ඤ සත්වයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ව භූමිය යන මේ භූමි ගනු ලැබේ.

සුද්ධාවාසයෙහි උපදින්නෙන් නම, අර්හත් මාර්ගානන්තර ඵලයෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදනාවූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආයඵ පුද්ගලයාය අවසේස චතුවෝකාර - පඤ්චවෝකාර පුද්ගලයන්ට තමන් ඉපද සිටින භූමියෙහි, පූර්ව භවයකදී මාර්ගය ලබන ලද්දකු වේ නම් ප්‍රතිසන්ධි- යෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආයඵ පුද්ගලයින් (3) තිදෙනාය, ඵලස්ථ ආයඵ පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය අභිධෙයා** පෙර සේම ලැබේ. [ප්‍රතිලෝමයෙහි ඉහත සංසය අභිධෙයා උදුරනු.] **ප්‍රත්‍යනීකයෙහි** ''සුද්ධාවාසං උපප ජ්ජන්තානං තෙසං තත්ථ'' (දුක්ඛ සත්‍ය හා සමුදය සත්‍ය වාරයට අනුවම උදුරනු.)

**සමුදය සත්‍ය මූල මග්ග සත්‍ය මූලියෙහි** - ''සුද්ධාවාසානං දුතියෙ අකුසලෙ චිත්තෙ වත්තමානෙ අනභිසමෙතාවීනං තෙසං තත්ථ, අභිසමෙතාවීනං තෙසං තත්ථ'' දුතියෙ - දෙවැනි වූ, අකුසලෙ - අකුසල වූ, චිත්තෙ - සිතක්, වත්ත මානෙ - පවත්නා කල්හි; සුද්ධාවාසානං - සුද්ධාවාසයෙහි ඉපද සිටින්නා වූ, තෙසං - ඒ පුද්ගලයන්ට (සෙස්ස පෙර සේ කියනු) **අනුලෝම අභිධෙයා** - සුද්ධා- වාස භූමියෙහි භවනිකන්තික දෙවැනි ජවනයයි කියන ලද නියත දෙවැනි අකුසල චිත්තය, ඒ සිත හා සමඟ, මාර්ග සත්‍යය ලැබුවෙකු අතීතයෙහි නොමැති හෙයින් ඒ හා සමාන දුතිය චිත්ත යයි කියන ලද ඒ භවයෙහි අර්හත් මාර්ගය නොලබන්නෙන් නම් තතිය ජවනයේ පටන් චුතිය තෙක් ද, ලබන්නෙන් නම් තතිය ජවනයේ පටන් අර්හත් මාර්ගය තෙක් ද සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ අර්හත් මාර්ගස්ථ ආයඵ පුද්ගලයන් ගේ සුද්ධාවාස භූමි (5) පසය, අවසේස චතුවෝකාර පඤ්චවෝකාර පුද්ගලයන්ට ඒ භවයෙහි මාර්ගය ලැබෙන්නෝ නම්, [සෙස්ස දුක්ඛ සත්‍ය හා මාර්ග සත්‍ය වාරයෙහි සන්නිට්ඨාන සංසය අනුව සියල්ල සමානයි පෙර සේ කියනු.]

**ප්‍රත්‍යනීකයෙහි** ''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියට අනතුරුව ප්‍රථම භවංගයයි කියන ලද නියත දුතිය චිත්තය, ඒ චිත්තය සමඟ, සමුදය සත්‍යමාර්ග සත්‍ය ලැබූවකු අතීත- යෙහි නොමැති බැවින් ඒ හා සමාන දුතිය චිත්තයයි කියන ලද ප්‍රතිසන්ධිය, භවංග වාර (15) පසළොස, මනෝද්වාරාවර්ජනය, භවනික්න්තික ප්‍රථම ජවනය මේ (18) දහ අටක් වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ- අර්හත් මාර්ගස්ථ ආයඵ පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, අසංඥතලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය යන මේ භූමි ගනු ලැබෙති.

අනුලෝමය නිමි. [**ප්‍රත්‍යනීක සංසය** යට කියන ලදී. අනුලෝමයෙහි කියන ලද්ද අතුරෙන් අනුලෝම ප්‍රතිලෝම මාරුකොට කියනු.]

අතීත වාරය නිමි

## අනාගත වාරය

# දුක්ඛ සත්‍ය මූලය

අනාගත වාරයෙහි, ''**යස්ස** දුක්ඛ සච්චං උප්පජ්ජිස්ස ති, තස්ස සමුදය සච්චං උප්පජ්ජිස්සතිති, අග්ග මග්ග සමංගීනං, අරහන්තානං යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං **යස්ස වා පන** ආමන්තා'' අග්ග මග්ග සමංගී නං – අර්හත් මාර්ගය සමඟ සමන්විත වූ පුද්ගලයන්ට ද, අරහන්තානං – ක්ෂිණාශ්‍රව ආර්‍ය්‍ය පුද්ගලයන්ට ද. යස්ස චිත්තස්ස – යම් ඒ චෝදනා චිත්තයට, අනන්තරා – අනතුරුව, අග්ග මග්ගං – අර්හත් මාර්ගය, පටිලභිස්සන්ති – ලබන්නාහු ද, තෙන – ඒ චෝදනා චිත්තය සමඟ, සමංගීනං – සමන්වාගත වූ තෙසං – ඒ පුද්ගලයන්ට ද''

**අනුලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ග චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් මාර්ගස්ථ-ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගයට අනතුරුව ඵලචිත්තයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්ව අනන්තර චිත්තය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව චෝදනා චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, තෘෂ්ණාව නොම ඉපදී මාර්ග (4) සතර ලබන්නේ නම් අන්තිම තෘෂ්ණාවගේ පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදනා චිත්තයාගේ පූර්ව අනන්තර වූ අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ, භව්‍ය වූ ත්‍රිහේතුක පෘථග්ජනයෝය යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (3) තිදෙනාය. සෝවාන් වූ පසු තෘෂ්ණා පහළ වන්නේ නම් අන්තිම වූ තෘෂ්ණාවගේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනායට අනන්තර ප්‍රත්‍ය වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගියයි කියන ලද සොතාපත්ති ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, මැද මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනාය, මැද ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනාය.

සකෘදගාමී බවට පත්වූ පසු තෘෂ්ණා පහළ වන්නේ නම් අන්තිම වූ තෘෂ්ණාවෙ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට අනන්තර ප්‍රත්‍ය වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද සකෘදගාමී ඵලස්ථ, අනාගාමී මාර්ගස්ථ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අනාගාමී බවට පත් වූ පසු තෘෂ්ණාව උපදින්නේ නම් අන්තිම තෘෂ්ණාවෙ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට අනන්තර ප්‍රත්‍යය වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

[මෙහි දී අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන සිත නියතය, අන්තිම වූ තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට අනන්තර ප්‍රත්‍ය වූ අනුලෝමය දක්වා පහළ වන චිත්තයෝ චතාගි වෝදනය සමග සමුදය සත්‍ය නූපදීන හෙයින් සමාන බැවින් සදිසූපචාරය වශයෙන් කියන ලදහ. ඒ නිසා එම චිත්තයන්ගෙන් සමන්නාගත පුද්ගලයෝ ද ස්වරූප වශයෙන් ගන්නා ලදහ.]

තෘෂ්ණාව පහළ වීමක් නොමැතිවම මාර්ග සතර ලබන්නෝ වී නම්, අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිමට උපන් තෘෂ්ණාවට අනන්තර ප්‍රත්‍ය වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි නම වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය, සෝවාන් බවට පත් වූ පසු තෘෂ්ණාව පහළ වන්නෝ වී නම් අනාදිමත් සසර පටන් අන්තිම තෘෂ්ණාවගේ අනන්තරප්‍රත්‍යය වූ චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි නම වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය, සොතාපත්ති මාර්ගස්ථ - ඵලස්ථ ආයඞ පුද්ගලයෝය සකදාගාමී ඵලයට පත් වූ පසු තෘෂ්ණාව පහළ වන්නෝ වී නම් අනාදිමත් සසර පටන් අන්තිම තෘෂ්ණාවට අනන්තර ප්‍රත්‍ය වූ චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය යට මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනා ය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය. අනාගාමී බවට පත් වූ පසු තෘෂ්ණාව උපදින්නෝ වී නම් අනාදිමත් සසර පටන් අන්තිම තෘෂ්ණාවට අනන්තර ප්‍රත්‍ය වූ චිත්තය දක්වා සුදුසු පරිදි පහළ වන්නා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි නම් වූ භව්‍ය - පෘථග්ජන පුද්ගලයෝ ය යට මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝ (3) තිදෙනාය යට ඵලස්ථ ආයඞ පුද්ගලයෝ (3) තිදෙනය. මාර්ගය නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේම ගනු ලැබේ.

[මෙහි දී සුදුසු පරිදි උපදින ක්ෂණත්‍රය සමංගි, යයි කියන ලද බැවින් නිරොධ සමාපත්තියට සමවන් පුද්ගලයා ද අසඤ්ඤසත්ත්ව පුද්ගලයාද අතිරේක වෙති. ඒ නිසාම ක්ෂණත්‍රය සමංගි යයි ගන්නේ නමුත් ස්වරූප උද්ධරනා ලදී.] **ප්‍රතිලෝම යෙහි** පෙර සංසය ගනු ලැබේ.

**මාර්ග සත්‍ය මූලීයෙහි**'' අග්ගමග්ග සමංගීනං අරහන්තානං, යෙව පුථුජ්ජනා මග්ගං නපටිලභිස්සන්ති තෙසං යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති, යෙ වඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං **යස්ස වා පන** – ආමන්තා''

**අනුලෝම අභිධෙය්‍ය** -- අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගි නම වූ අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයාය අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාට අනන්තර ප්‍රත්‍ය වන චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝය, මාර්ගය නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, [යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගි නම වූ අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයෝය,

අනාදිමත් සසර පටන් අර්හත් මාර්ගයටපූර්ව වූ චෝදනයට අනන්තර ප්‍රත්‍ය වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. යටඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේ ම ලැබේ. **ප්‍රතිලෝමයෙහි** ඉහත සංසයම ලැබේ. **ප්‍රත්‍යනික අභිධෙය්‍ය** "පච්ඡිම චිත්ත සමංගීනං තෙසං," [සමුදය සත්‍ය මූලි - මාර්ග සත්‍යමූලි දෙකෙහි සංසය අවසේසයි] ත්‍රිහේතුක චුති (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය යන මොවුන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති.

## සමුදය සත්‍ය මූලය

"**යස්ස** සමුදය සච්චං උප්පජ්ජිස්සති, තස්ස මග්ග සච්චං උප්පජ්ජිසතීති, යෙ පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං, යෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං, **යස්ස වා, පන** යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං, යෙ චඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං," **අඤ්ඤෙ** - චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී පුද්ගලයා හැර ඉන් **අන්‍ය** වූ, යෙ ච - යම් කිසි පුද්ගලයෙක් වනාහි, මග්ගං - මාර්ගය, පටිලභිස්සන්ති - ලබන්නාහු වෙත් ද,

**අනුලෝම අභිධෙය්‍ය** - මාර්ගය නොලබන්නා වූ අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති, තෘෂ්ණාව පහළ නොවී සතර මාර්ගය ලබන්නා වූ කෙනෙක් වී නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය. සොවාන් ඵලයට පැමිණි පසු තෘෂ්ණාවක් පහළ වන්නේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්ව අනන්තරය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය, සොතාපත්ති මාර්ගස්ථ - සොතාපත්ති ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, සකදගාමී ඵලයට පැමිණිමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අනාදිමත් සංසාරයෙ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ, යට ඵලස්ථ දෙදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, අනාගාමී ඵලයට පැමිණිමෙන් පසු තෘෂ්ණාවක් පහළ වන්නේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාව ගේ පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදිඋපදනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ - යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** - පෙර සේම ලැබේ. **දුක්ඛ සත්‍ය හා සමුදය සත්‍ය වාරයෙහි** සංසය මැයි.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** - අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයෝය, තෘෂ්ණාවක් නොම ඉපදී සතර මාර්ගය ලබන්නෙක් වී නම් අන්තිම තෘෂ්ණාවගේ පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදනයට පූර්ව අනන්තර වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින්නා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තුන්දෙනා බැගිනි. සෝවාන් ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්වචෝදනයට පූර්ව අනන්තර වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ සොතාපත්ති ඵලස්ථ ආයති පුද්ගලයාය, මැද මාර්ගස්ථ මැද ඵලස්ථ (2) දෙදෙනා බැගින් වූ ආයති පුද්ගලයෝ ය, සකදගාමී ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදනයට පූර්ව අනන්තර වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන් ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ සකදගාමී ඵලස්ථ, අනාගාමී මාර්ගස්ථ අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයෝය, අනාගාමී ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් අන්තිම තෘෂ්ණාවෙහි පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්ව අනන්තර අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණ-ත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** - ''අග්ග මග්ග සමඞගිනං, අරහන්තානං තෙසං,' අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද්ද වූ අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝය, අර්හත් මාර්ගා නන්තර ඵල චිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පුද්ගල වාරය නිමි - (ඕකාස වාරය සුභමයි)

---

## දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි** - ''යස්ස යත්ථ දුක්ඛ සච්චං උප්පජ්ජිස්සති, තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජිස්සතීති, අග්ග මග්ග සමංගීනං, අරහන්තානං යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ආමන්තා.''

**අනුලෝම** අභිධෙය්‍ය - අර්හත් මාර්ගයේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් මාර්ගස්ථ ආයෳ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයාගේ පටන් පශ්චිම චිත්තයට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියනලද අර්හත් ඵලස්ථ ආයෳ පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමි ඵලස්ථ ආයෳ පුද්ගලයෝය, තෘෂ්ණාව නොම ඉපදී සතර මාර්ගය ලබන්නෙක් වූයේ වී නම්, අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්වානන්තර වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට මාර්ගස්ථ යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආයෳ පුද්ගලයෝය, සෝවාන් ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්වානන්තර වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ සෝතාපත්ති ඵලස්ථ ආයෳ පුද්ගලයෝය, යට මාර්ගස්ථ – යට ඵලස්ථ (2) දෙදෙනා බැගින් වූ ආයෳ පුද්ගලයෝය, සකෘදාගාමී ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ සකෘදාගාමී ඵලස්ථ, අනාගාමී මාර්ගස්ථ, අනාගාමී ඵලස්ථ ආයෳ පුද්ගලයෝ ය, අනාගාමී ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්වානන්තර වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයෳ පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි නැවත නොම උපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනයක් වන්නේ නම්, පඤ්චම ජවනයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද දෙස මූල, ලෝභ මූල, මහා කුසල ජවනයක් වී නම් අන්තිම තෘෂ්ණාවේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආයෳ පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයෳ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, අසඤ්ඤ තලයෙහි මතු නැවතත් උපදින්නා වූ අසංඥ තලයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ තල භූමිය ද ගනු ලැබේ.

තෘෂ්ණාව නොම ඉපදී සතර මාර්ගය ලබන්නෙක් වී නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවට පූර්ව අනන්තරය තෙක් සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය සෝවාන්ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවේ පූර්වානන්තර චිත්තය දක්වා, සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී

නම් වූ භව්‍ය වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ්ය, සොතාපත්ති මාර්ගස්ථ සෝතාපත්ති ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, සකදාගාමී ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය යට මාර්ගස්ථ – යට ඵලස්ථ දෙදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අනාගාමී ඵලයට පැමිණීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවෙහි පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ – යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, යන මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් නොම උපදින්නා වූ පුද්ගලයන්ට මරණාසන්න ජවනය ලෝභ ජවනය වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් සතර වන ජවනය දක්වා ද, දෝසමූල, මෝහමූල, මහා කුසල ජවනයක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනාවූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි යයි කියන ලද භව්‍යවූද, අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝය යනමේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි යයි කියන ලද භව්‍ය වූ ද අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ – යටඵලස්ථ (3) තිදෙනා බැගින් වූ, ආර්‍ය්‍ය පුද්ගලයෝය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙරසේම ගනු ලැබේ. **ප්‍රතිලෝමයෙහි** ද යට සංසය ම ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** – ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං තත්ථ'' ත්‍රිහේතුක චුති සිත් (13) තෙළසය චෛතසික (35) පන්තිසය යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. (මේ වනාහි ඒකාන්තය) තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද – අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, අසඤ්ඤසත්ව භූමියෙහි මතු නැවත නූපදින්නා වූ, අසඤ්ඤ තලයෙහි උපදින–චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥ භූමිය යන මේ භූමි ද ගනු ලැබෙති. (මේ වනාහි අනේකාන්තය)

මාර්ග සත්‍ය මූලියෙහි ''අග්ග මග්ග සමඞ්ගීනං, අරහන්තානං, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිල්භිස්සන්ති, ආපායිකානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්ස න්ති, යෙවඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති-

තෙසං තත්ථ, **යස්සවා පන යත්ථ** – ආමන්තා'' **අනුලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද ලද අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් ඒ භූමියෙහි මතු නැවත උපදින්නා වූ පුද්ගලයෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා ද, නූපදින්නා කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්ව අනන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය වූ ද අභව්‍ය වූද සුගති අහේතුක – ද්විහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7] සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය (මේ වනාහි යෙ ච පුථුජ්ජනා – යන ඒකාන්තයයි)

තමන් ඉපිද සිටින භූමියෙහි, ඒ ආත්ම භාවයෙහිදීම යට මාර්ග ලබා අන් භූමියෙක්හි මතු මාර්ග ලබා පිරිනිවීම නියතකොට ඇති පුද්ගලයන් අතුරෙන් ඒ භූමියෙහි මතු නැවතත් උපදින්නා වූ කෙනෙක් වන්නේ නම්, අන්තිම වූ මාර්ගයේ පටන් චුතිය දක්වාද, මතු නැවතත් නොම උපදින කෙනෙක් වන්නේ නම් අන්තිම මාර්ගයෙහි පටන් චුතියට පූර්ව අනන්තර චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියට පූර්ව භවයෙහිදීම යට මාර්ග ලබා අන්‍ය මතු භවයෙක්හි මතු මාර්ග ලබා පිරිනිවෙන්නා වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවතත් උපදින කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වාද, මතු නැවතත් නොම උපදින කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්ව අනන්තර චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන් ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, අන්‍ය භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් ඒ භූමියෙහි මතු නැවතත් උපදින කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වාද නොම උපදින කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්ව අනන්තර චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, සුදස්සිය තෙක් සුද්ධාවාස භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති, (මේ වනාහි **යෙ ච පුථුජ්ජනා** යන අනෛකාන්ත යයි).

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් උපදින කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වාද නොම උපදින කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්ව අනන්තර චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය, අසඤ්ඤ තලයෙහි මතු නැවතත් උපදින්නා වූ අසඤ්ඤ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අනාගාමි ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේ දී මාර්ග නොලබා මතු භවයක ලබන්නා වූ කෙනෙක් හෝ වේද, මේ ආත්ම භාවයේදි යට මාර්ගයම ලබා මතු භවයකදී මතු මාර්ග ලබන්නා වූ කෙනෙක් හෝ වේද, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද්ද වූ මතු ධර්මාවබෝධයට භව්‍යවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයෙහිදී ම මාර්ගය ලබන්නා වූ කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම මාර්ගයට පූර්ව ගෝත්‍රභූ-වෝදන යන් ගේ ද, අර්හත් මාර්ගයට පූර්ව වෝදනයාගේ ද පූර්ව අනන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ-යට ඵලස්ථ (3) තිදෙනා බැගින්වූ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, යන මෙ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය අභිධෙය** පෙර සේ ගනු ලැබේ. **ප්‍රතිලෝමයෙහි** ද ඉහත සංසය මැයි.

[මෙහි දී පුද්ගලෝකාස වාරයෙහි භූමි භේදය දක්වන බැවින් තමන් ඉපද සිටින භූමියෙහි සොතාපත්ති මාර්ගය තෙක් පමණක් ලබන්නා වූ කෙනෙක් ද ඇත. සකෘද ගාමි මාර්ගය තෙක් පමණක් ලබන්නෙක් ද ඇත. අනාගාමී මාර්ගය තෙක් පමණක් ලබන්නෙක් ද ඇත. අර්හත් මාර්ගය හිමි කොට ලබන්නෙක් ද ඇත. එ නිසා අන්තිමට ලබන මාර්ගයාගේ පූර්ව ගෝත්‍ර භූ වෝදන හා, අර්හත් මාර්ගයාගේ පූර්ව වෝදනයට පූර්වානන්තර වූ අනුලෝම චිත්තය දක්වා කියන ලද්දේ වෙයි. පුද්ගල වාරයෙහි වනාහි භූමි විභාගය නොදක්වෙන බැවින් මේ භවයෙහි දී ම මාර්ගය ලබන්නේ යයි කීවේ නම් අන්තිම භවයෙහි පශ්චිම භවිකයා ගත යුතු බැවින්, මාර්ග සතර එකම භවයක දී ලබන්නෙකුම ගත යුතු වන්නේය. ඒ නිසා අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් යැයි කියනලදි. පුද්ගල වාරයට වඩා පුද්ගලෝකාස වාරයෙහි අභිධෙය්‍ය කථනය දීර්ඝය, ස්වරූප මෙනෙහි කර ගත යුතු] (ප්‍රත්‍යනීක අභිධෙය්‍ය වනාහි දුක්ඛ සත්‍ය මූල සමුදය සත්‍ය මූලිය මෙනි)

# සමුදය සත්‍ය මූලය

''යස්ස යත්ථ සමුදය සච්චං උප්පජ්ජිස්සති තස්ස තත්ථ මග්ග සච්චං උප්පජ්ජිස්සතීති, ආපායිකානං, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති – තෙසං තත්ථ, යෙ මග්ගං පටි ලභිස්සන්ති තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** – යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති, යෙවඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ,''

**අනුලෝම අභිධෙය්‍ය** – තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා ද නූපදින්නෙක් වන්නේ නම්, ඒ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනය වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් සතරවැනි ජවනය දක්වාද දෝස මූල – මෝහ මූල මහාකුසල ජවන වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවට පූර්ව අනන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි වූ දුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය.

තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය නොලබන්නා වූ පුද්ගලයන් අතරෙන් ඒ භූමියෙහි නැවත උපදින්නෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා ද, නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනය වන්නේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් (4) සතරවැනි ජවනය දක්වා ද දෝස මූල, මෝහ මූල, මහා කුසල ජවනය වන්නේ නම්, අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය වූද – අභව්‍ය වූද සුගති අහේතුක ද්විහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය නෙක් රූප භූමි (10) දශය තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේ දීම යට මාර්ග ලබා අන් භවයෙක් හි- උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු උපදින පුද්ගලයෙක් වේ නම් අන්තිම මාර්ගයේ පටන් චුතිය දක්වා ද නූපදින්නා වූ පුද්ගල- යන්ගේ මාර්ගය ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින්නෙක් වේ නම් අන්තිම මාර්ගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්ව අනන්තර චිත්ත ය දක්වා සුදුසු පරිදි උපදින චිත්ත- යන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව භව යේ දී යට මාර්ගය ලබා මතු අන් භවයක දී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූ පුද්ගල යන් අතුරෙන් මෙ භූමියෙහි නැවත උපදින්නෙකු වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා ද නූපදින්නෙකු වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්- තර චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය,යන මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤාය- යතනය නෙක් චතුවෝකාර භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය

නෙක් රූප භූමි (9) නවය අන්‍ය භූමියෙක්හිදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු උපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා ද, නූපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය නෙක් චතුවෝකාර භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය නෙක් රූප භූමි (9) නවය, සුදස්සිය නෙක් ශුද්ධාවාස භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි, මේ ආත්ම භාවයේදී මාර්ග නොලබා මතු ආත්ම භවයේදී ලබන්නට නියත වූයේ ද, මේ ආත්ම භාවයේදී යට මාර්ගයම ලබා මතුභවයේදී උඩ මාර්ග ලබන්නට නියත වූයේ ද, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය දක්වා රූපාවචර භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේදී ම මාර්ගලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු උපදින්නා වූ පුද්ගලයෙක් වූයේ හෝ නූපදින්නාවූ පුද්ගලයෙක් වූයේ හෝ මාර්ගය ලැබීමෙන් පසු තෘෂ්ණාව නූපදින්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝය මාර්ගය ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම මාර්ගයට පූර්ව ගෝත්‍රභූ – වෝදනය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (3) තිදෙනය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබෙති.

තවද, තමන් ඉපද සිටින භූමියෙහි, මේ ආත්මභාවයේදීම මාර්ග ලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින පුද්ගලයා ද, මතු නූපදින පුද්ගලයන්ගේ මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින්නෙක් නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිමට ලැබූ මාර්ගයට පූර්ව ගෝත්‍රභූ – වෝදන දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගීයයි කියන ලද භව්‍යත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤයතනය නෙක් චතුවෝකාර භූමි (3) තුනය කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය නෙක් රූප භූමි (9) නවය, මාර්ගය

ලැබීමෙන් පසු තෘෂ්ණාව නූපදින පුද්ගලයෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ. (මේ නය ක්‍රම දෙක අතුරෙන් දෙවැනි යන ක්‍රමය අපේ ආචාර්‍යයන් වහන්සේ ගරු කොට කියති.)

(**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ ආර්‍ය පුද්ගලයෝය, තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයෙදීම මාර්ගය ලබන්නාවූ, මේ භූමියෙහි නැවත නූපදින්නා වූ පුද්ගලයන්ට, මාර්ගය ලැබීමෙන් පසු තෘෂ්ණාව නූපදින පුද්ගලයෙක් වේ නම් අන්තිම තෘෂ්ණාව පටන් අන්තිමට ලද මාර්ගයාගේ පූර්ව ගෝත්‍රභූ – චෝදනයෝය, අර්හත් මාර්ගයාගේ පූර්ව චෝදනයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය පුද්හලයෝ (3) තිදෙනාය මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාරභූමි (22) දෙවිස්ස ගනු ලැබෙති. **අනුලෝම සංසය** ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** "අග්ග මග්ග සමඞ්ගීනං, අරහන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආර්‍ය පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභජවනය වූයේ නම් පස්වෙනි ජවයෙහි පටන් චුතිය දක්වාද දෝස මූල–මෝහමූල – මහාකුසල ජවනයක් වූයේ නම් අන්තිම තෘෂ්ණාවගේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය. (**ආපායිකානං** – යනු අතිරේකයි)

තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය නොලබන පුද්ගලයන් අතුරෙන් මේ භූමි යෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනය වන්නේ නම්, පඤ්චම ජවනයේ පටන් චුතිය දක්වාද දෝස මූල – මෝහ මූල, මහා කුසල ජවනයක් වන්නේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය අභව්‍ය සුගති අහේතුක – ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය; තමන් ඉපද සිටින

භූමියෙහි මේ ආත්මභාවයේදීම යට මාර්ගය ලබා මතු අන්‍ය භූමියෙක මතු මාර්ග ලබා පිරිනිවීමට නියත වූවහු ද, මේ භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මාර්ගය ලැබීමෙන් පසු තෘෂ්ණාව නූපදින්නෙකු නම් අන්තිමට ලත් මාර්ගයේ පටන් චුතිය දක්වා ද තෘෂ්ණාව උපදින්නෙකු නම් අන්තිම තෘෂ්ණාවගේ පටන් චුතිය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්වභවයකදී යට මාර්ග ලබා සිට මතු අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවෙන්නට නියත වූවහු ද, මේ භූමියෙහි මතු නූපදින්නෙකු වන්නේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් චුතිය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් චතුවෝකාර භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූපාවචර භූමි (9) නවය, අන්‍ය භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නහු ද; මේ භූමියෙහි මතු නැවත නූපදින්නෙකු වන්නේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් චුතිය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් චතුවෝකාර භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, සුදස්සිය තෙක් සුද්ධාවාස භූමි (4) සතරය, (මෙය ව පුථුජ්ජනායන ඒකාන්ත – අනේකාන්තය අවශිෂ්ඨයි) අසඤ්ඤසත්තයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති. අනුලෝමය නිමි; **ප්‍රත්‍යනීක සංසය** ඉහත කියන ලදී. (අනුලෝමයට අනුව අනුලෝම- ප්‍රතිලෝම මාරු කොට කියනු.)

අනාගත වාරය නිමි

---

## වර්තමානාතීත වාරය

# දුක්ඛ සත්‍ය මූලය

**වර්තමානාතීත වාරයෙහි** ''**යස්ස** දුක්ඛ සච්චං උප්පජ්ජති, තස්ස සමුදය සච්චං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන** – සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං'' සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං,''

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප ජීවිත නවක රූප කලාපය යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය

ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙහි පටන් චුතියගේ පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍යපුද්ගලයන් (8) අට දෙනාය, අරූප භූමියෙහි උඩ මාර්ග (3) තුන, ඵලසිත් (4) සතර චෛතසික (36)සතිස යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3.7.4) තුන – සත – සතර බැගිනි. ප්‍රථම ජීවිත නවක රූපකලාපය, යන මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ සියලුම උපදමින් සිටින පෘථග්-ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංග චිත්තයේ පටන් චුතිය තෙක් අරූප භූමියෙහි මාර්ග-ඵල හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ. (අතිරේක කිසිවක් නැත.)

**මාර්ග සත්‍ය මූලීයෙහි** ''අනභිසමෙතාවීනං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, අභිසමෙතාවීනං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාද-ක්ඛණෙ තෙසං **යස්ස වා පන** අභිසමෙතාවීනං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං''

**අනුලෝම අභිධෙය්‍ය** – චතුරාර්‍ය්‍ය සත්‍යාවබෝධයට නොපැමිණෙන්නාවුන්ගේ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (3-7-4) තුන – සත – සතර බැගිනි. ප්‍රථම ජීවිත නවක රූපකලාපය යන මේ ධර්ම යන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි මාර්ගය නොලබන්නා වූ කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වාද මාර්ග ලබන්නෙක් වන්නේ නම් ප්‍රතිසන්ධි-යෙන් පසු ප්‍රථම භවංගයේ පටන් සෝතාපත්ති මාර්ගය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, සෝතාපත්ති මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති, චතුරාර්‍ය්‍ය සත්‍ය අවබෝධයට පැමිණෙන්නා වූ ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (3. 7. 4) තුන – සත– සතර – යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි පූර්වභයේ දී මාර්ගය ලැබූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා, මේ ආත්මභාව-යේදීම ලබන්නෙක් වන්නේ නම් සොතාපත්ති මාර්ගානන්තර ඵලයේ පටන් චුතිය දක්වා, අරූප භූමි (4) සතරෙහි මාර්ග -ඵල හැර සුදුසු පරිදිඋපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** - මාර්ගාධිගමනය කරන ලද්දවුන්ගේ ත්‍රිහේතුක චුති (13) තෙළෙසය චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපයෝය යන මේ ධර්ම යන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිව්දෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි පූර්ව ආත්ම භාවයේදීම මාර්ගය ලැබුවෙක් වී නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා, මේ ආත්ම භාවයේදීම මාර්ගය ලැබූ කෙනෙක් වේ නම් සෝතාපත්ති මාර්ගානන්තර ඵලයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, අරූප භූමියෙහි උඩ මාර්ග (3) තුන, ඵල සිත් (4) සතර, චෛතසික (36) සතිස යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** - ''අනභිසමෙතාවීනං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං,'' මාර්ගාවබෝධයට නොපැමිණියවුන්ගේ චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම වූ කර්මජ රූප, ජීවිතනවක කලාප රූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද, පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි මාර්ගය නොලබන්නෙක් වන්නේ නම් ප්‍රතිසන්ධි-යෙහි පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද මාර්ගය ලබන්නෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් සෝතාපත්ති මාර්ගය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, සෝතාපත්ති මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (අනුලෝමය සන්නිට්ඨාන පක්ෂයෙහි ම වේ.)

## සමුදය සත්‍ය මූලය

''**යස්ස** සමුදය සච්චං උප්පජ්ජති, **තස්ස** මග්ග සච්චං උප්පජ්ජිස්සතීති, අනභි-සමෙතාවීනං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං, අභිසමෙතාවීනං තණ්හාය උප්පාද-ක්ඛණෙ තෙසං **යස්ස වා පන** අභිසමෙතාවීනං තණ්හාය භංගක්ඛණෙ තණ්හා විප්ප-යුත්තෙ චිත්තෙ වත්තමානෙ, නිරොධ සමාපන්නානං තෙසං'', **අනුලෝම අභිධෙය්‍ය** මාර්ගාවබෝධය නොලැබූ, තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්-ජන පුද්ගලයන් 4 සිවුදෙනා ගනු ලැබෙති. මාර්ගාවබෝධය ලබන ලද්දවුන්ගේ දිට්ඨි ගත විප්ප යුත්ත තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති **ප්‍රතිලෝම අභිධෙය්‍ය** - සෝතා පත්ති මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධයට පැමිණෙන්නාවූ, දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද තෘෂ්ණා විප්‍රයුක්ත වූ සුදුසු පරිදි උපදනා චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන

ලද උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, නිරෝධ සමාපත්තියට සමවන් අනාගාමී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''අනභිසමෙතාවීනං තණ්හාය භංගක්ඛණෙ, තණ්හාවිප්පයුත්ත **චිත්තෙ** වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං'' අනාදිමත් සංසාරයෙහි පටන් සෝතාපත්ති මාර්ගය දක්වා චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මාවබෝධයට නොපැමිණියා වූ තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්තව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, සෝතා පත්ති මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාය, අසංඥ තලයෙහි උපදින- චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පුද්ගල වාරය නිමි (ඔකාස වාරය සුගමයි)

---

## පුද්ගලෝකාස වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි** – ''**යස්ස යත්ථ** දුක්ඛ සච්චං උප්ප ජ්ජති තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජිත්ථාති, සුද්ධාවාසානං උපපත්ති චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, පවත්තෙ **චිත්තස්ස** උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වාපන යත්ථ** චතුවෝකාරා, පඤ්චවොකාරා චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙය්‍ය** – ශුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධිය, භවංගවාර (16) දහසය, මනෝද්වාරාවර්ජනය, භවනිකන්තික ප්‍රථම ජවනය, මේ (19) එකුන් විස්සක් වූ චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, ප්‍රථම ජීවිත නවක කලාප රූපයාගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥ සත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති. සුද්ධාවාසය හැර, ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජකලාප (3. 7, 4) තුන – සත – සතර බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද චතුවෝකාර – පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, ප්‍රවෘත්ති කාලයෙහි සුද්ධාවාසය නම්, භවනිකන්තික ද්විතීය ජවනය පටන් චුතිය දක්වා ද, අවශේෂ

චතුවෝකාර පඤ්චවෝකාර භූමියක නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගය පටන් චුතිය දක්වා ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය, යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද චතුවෝකාරපඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි සුද්ධාවාසය වී නම් භවනිකාන්තික ද්විතීය ජවනයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද අවශේෂ චතුවෝකාර, පඤ්චවෝකාර භූමියක නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදිඋපදින චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය යන මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, අරූප භූමියෙහි උඩ මාර්ග (3) තුනය, ඵල සිත් (4) සතරය, චෛතසික (36) සතිසය මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගීයයි කියන ලද උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තුන් දෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාය යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** – ''සුද්ධාවාසානං උපපත්ති චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ'' (අනුලෝමය සන්නිට්ඨාන පක්ෂයෙහිය)

(උපපත්ති චිත්තස්ස – ප්‍රතිසන්ධි චිත්තයාගේ; භංගක්ඛණෙ, භංගක්ෂණයෙහි, (අර්ථයෝජනා කරනු) සදිසූපචාර, සමීපූපචාර වශයෙන් භවංගවාර (16) සොළස මනෝද්වාරාවර්ජනය, භවනිකන්තික ප්‍රථම ජවනය, මේ චිත්තක්ෂණයන් ද උපපත්ති චිත්තයටම ඇතුලත් කොට උදුරනු.)

සුද්ධාවාස භූමියෙහි, ප්‍රතිසන්ධිය, භවංගවාර (16) සොළස, මනෝද්වාරාවර්ජනය භවනිකන්තික ප්‍රථම ජවනය, මේ (19) එකුන් විසි චිත්තයන්ගේ, භංගක්ෂණ සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, අන්තිම වූ ජීවිත නවක කලාප රූපයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද අසංඥ තලයෙන් චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ සත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

''**යස්ස යත්ථ** දුක්ඛ සච්චං උප්පජ්ජති තස්ස තත්ථ මග්ග සච්චං උප්පජ්ජිත්ථාති සුද්ධාවාසානං උපපත්ති චිත්තස්ස උප්පාදක්ඛණෙ, අනභිසමෙතාවීනං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා යත්ථ** අභිසමෙතාවීනං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පා දක්ඛණෙ තෙසං තත්ථ,''

**අනුලෝම අභිධෙය්‍ය** – ශුද්ධාස භූමියෙහි ඒ ආත්මභාවයේ අර්හත් මාර්ගය නොලබන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ ආයු ‍පුද්ගලයෝය, අර්හත් මාර්ගස්ථ ආයු පුද්ගලයෝය යන මේ පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, මාර්ගය නොලබන ලද්ද වුන්ගේ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3–7–4) තුන – සත – සතර බැගිනි, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ඒ ආත්ම භාවයෙහි මාර්ග නොලබන්නෝ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා ද ලබන්නෝ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් සෝතාපත්ති මාර්ගය දක්වා ද සුදුසු පරිදි උපදනා වූ චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය සෝතාපත්ති මාර්ගස්ථ ආයු පුද්ගලයාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය; පෙර අන් භවයක දී යට මාර්ගය ලද්දේ නමුත්, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය නොලබන බැවින් "තත්ථ අනභිසමෙතාවී" නම් ලද්ද වූ පුද්ගලයන් අතුරෙන් අන් භූමියක සොතාපත්ති මාර්ගය ලැබ තමන් ඉපද සිටින භූමියෙහි ද සකදගාමී මාර්ගය නොලබන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් සකදගාමී මාර්ගය දක්වාද අරූප භූමියෙහි මාර්ග – ඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද සෝතාපත්ති ඵලස්ථ, සකදගාමී මාර්ගස්ථ ආයු පුද්ගලයෝය, අන් භූමියකදී සකදගාමී මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි දී අනාගාමී මාර්ගය නොලබන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෝ නම් ප්‍රතිසන්ධියේ පටන් අනාගාමී මාර්ගය දක්වාද අරූප භූමියෙහි මාර්ගඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද සකදගාමී ඵලස්ථ අනාගාමී මාර්ගස්ථ ආයු පුද්ගලයෝය, අන් භූමියකදී අනාගාමී මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි අර්හත් මාර්ගය නොලබන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෝ නම් ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගය දක්වාද අරූප භූමියෙහි මාර්ග ඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආයු පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය ප්‍රථම ජීවිත නවක රූප කලාප යාගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසඤ්ඤසත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය ලබන ලද්දවුන්ගේ ත්‍රිහේතුක ප්‍රතිසන්ධි (13) තෙළෙසය, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3, 7, 4) තුන – සත – සතර බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද යට ඵලස්ථ ආයු පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි

(7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දසය; ප්‍රවෘත්ති කාලයෙහි සුද්ධාවාසයෙහි වී නම් අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයෝය. අවශේෂ චතුවෝකාර පඤ්චවෝකාර පුද්ගලයන්ගේ තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව ආත්මභාවයෙහි මාර්ගය ලබන ලද්දෙක් වී නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා, මේ ආත්මභාවයේදීම මාර්ගය ලබන්නෙක් වේ නම්, මේ දූන් ලබන මාර්ගානන්තර ඵල චිත්තයේ පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආයතී පුද්ගලයන් සිවු දෙනාය මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. යන මේ භූමි ද ගනු ලැබෙති.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** තමන් ඉපද සිටින භූමියෙහි දී මාර්ගය ලබන ලද්දවුන්ගේ ත්‍රිහේතුක චුති (13) තෙලෙසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද ඵලස්ථ ආයතී පුද්ගලයන් (4) සිවුදෙනාය ප්‍රවෘත්ති කාලයෙහි සුද්ධාවාසයෙහි නම් අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයෝය. අවසේස චතුවෝකාර පඤ්චවෝකාර පුද්ගලයන්ගේ පූර්ව භවයෙහි මාර්ගය ලබන ලද්දේ නම්, තමන් ඉපද සිටින භූමියේ ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා මේ ආත්මභාවයේ දී ම මාර්ගය ලබන්නේ නම් ප්‍රථමයෙන් ලබන ලද මාර්ගානන්තර ඵලයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආයතී පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපායවර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, අරූප භූමියෙහි ප්‍රථමයෙන් ලබන ලද මාර්ග ඵලයට පසු උඩ මාර්ග උඩ ඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද සකදගාමී ඵලස්ථ ආයතී පුද්ගලයෝය. උඩ මාර්ගස්ථ ආයතී පුද්ගලයයෝ (2) දෙදෙනාය, උඩ ඵලස්ථ ආයතී පුද්ගලයෝ (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර යන මේ භූමි ගනු ලැබෙති. තවද තමන් ඉපද සිටින අරූප භූමියෙහි එම ආත්මභාවයේ දී ද පූර්ව ආත්ම භාවයේදී ද, ලබන ලද, උඩ මාර්ග (2) දෙකය උඩ ඵල (3) තුනය. යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය, උඩ ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන් ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** – ''සුද්ධා වාසානං උපපත්ති චිත්තස්ස භංගක්ඛණෙ, අනභිසමෙතාවීනං චවන්තානං පවත්තෙ චිත්ත ස්ස භංගක්ඛණෙ, අසඤ්ඤ සත්තා චවන්තානං තෙසං තත්ථ'' (අනුලෝමය – අනුලෝම සන්නිට්ඨාන පක්ෂයෙහිය)

සුද්ධාවාසයෙහි ඒ ආත්මභාවයේ අර්හත් මාර්ගය නොලබන්නෙකු නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද ලබන්නෙක් නම්. ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගයනෙක් සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයෝය. අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ සුද්ධා වාස භූමි (5) පසය, මාර්ගය ප්‍රතිලාභ නොකරන ලද්දවුන්ගේ චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, කර්මජ රූප, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද චතුවෝකාර, පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය ප්‍රවෘත්ති කාලයෙහි, මාර්ගය නොලබන්නෙකු වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද ලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් සෝතාපත්ති මාර්ගය නෙක්, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, වෙනත් භූමියක දීම යට මාර්ගය ලබන ලද්දේ නමුත් තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන හේතු වෙන් ''තත්ථ අනභිස-මෙතාවී'' නම් වූ පුද්ගලයන් අතුරෙන් අන් භූමියකදී සෝතාපත්ති මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි සකදාගාමී මාර්ගය නොලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධි-යෙහි පටන් චුතිය දක්වාද ලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් සකදාගාමී මාර්ගය නෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද සොතාපත්ති ඵලස්ථ – සකදාගාමී මාර්ගස්ථ ඵලස්ථ ආයඞ පුද්ගලයෝය..

අන් භූමියෙක සකදාගාමී මාර්ගය ලබා, තමන් ඉපද සිටින භූමියෙහි අනාගාමී මාර්ගය නොලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අනාගාමී මාර්ගය නෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද, සකදාගාමී ඵලස්ථ – අනාගාමී මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, අන් භූමියෙක අනාගාමී මා ර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි අර්හත් මාර්ගය නොලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද ලබන්-නෙකු වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගය දක්වාද සුදුසු පරිදි උපදින චිත්ත-යන් ගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ අරහත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය. මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වේහප්ඵලය නෙක් රූප භූමි (10) දශය, රූප භූමියෙහි සෝතාපත්ති ඵල-සකදාගාමී මාර්ග ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද සෝතාපත්ති ඵලස්ථ සකදාගාමී මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, තමන් ඉපද සිටින අරූප භූමියෙහි ප්‍රථමයෙන් ලබන ලද යට මාර්ග, යට ඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය, මැද ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය.

**තවත් සවිස්තරවශයෙන් වනාහි** – අරූප භූමියෙහි සොතා පත්ති ඵල සකදාගාමී මාර්ගයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද සෝතාපත්ති ඵලස්ථ – සකදාගාමී මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, අන් භවයකදී සකදාගාමී මාර්ගය ලැබ තමන් සිටින

අරූප භූමියෙහි අනාගාමී මාර්ගය නොලබන්නේ නම්, සකෘදාගාමී ඵලයය, ලබන්නේ නම්, සකෘදාගාමී ඵල - අනාගාමී මාර්ග ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද සකෘදාගාමී ඵලස්ථ - අනාගාමී මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අන් භූමියක අනාගාමී මාර්ගය ලබා තමන් ඉපද සිටින අරූප භූමියෙහි දී අර්හත් මාර්ගය නොලබන්නෙකු වේ නම්, අනාගාමී ඵලයද, ලබන්නෙකු වේ නම් අනාගාමී ඵල - අර්හත් මාර්ග ධර්මයන්ගේද උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, **තවත් ක්‍රමයකින්** - තමන් ඉපද සිටින අරූප භූමියෙහි ප්‍රථමයෙන් ලබන ලද යට මාර්ග - යටඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, අන්තිම ජීවිත නවක රූප කලාපයාගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද අසඥ්ඥසත්තයෙහි චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඥ්ඥතලය, යන මේ භූමි ගනු ලැබෙති.

(මෙසේ අරූප භූමියෙහි මාර්ග ඵල උත්පාදක්ෂණ සමංගී පුද්ගලයන් උදුරා දක්වන තැන්හි **ප්‍රත්‍යනීක** පෙළෙහි නොමැත, ලැබිය යුතු දෙය පමණක් උදුරනු ලැබේ. ලැබීමට සුදුසු නම් කුමක් හෙයින් පාලියෙහි නැත්තේද යත්, අනුලෝමය අනුලෝම සන්නිට්ඨානයෙහි ''අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ'' යයි වදරා ඇති බැවින් අනුලෝමයෙහි ඇත්තා වූ පාලිය ප්‍රත්‍යනීකයෙහි නැවත කීම සුදුසු නොවේ යයි ආචාර්‍ය්‍ය වරු කියති මෙසේ අවසේස ස්වරූප ද කියන ලද ක්‍රමයට සමානව ගත යුතුය.)

''**යස්ස යත්ථ** සමුදය සච්චං උප්පජ්ජති, තස්ස තත්ථ මග්ග සච්චං උප්පජ්ජිස්සතීති අනභිසමෙතාවීනං, තණ්හාය උප්පාදක්ඛණෙ, තෙසං තත්ථ අභිසමෙතාවීනං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** - අභිසමෙතාවීනං තණ්හාය භංගක්ඛණෙ තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ.''

**අනුලෝම අභිධෙය්‍ය** මාර්ගය නොලබන ලද්දූ වූ තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, (ඒකාන්ත) අන් භූමියක දී යට මාර්ගය ලබන ලද නමුත් තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය නොලැබූවෙකු බැවින් ''තත්ථ අනභිසමෙතාවී'' නම් වූ දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්ච වෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ගනු ලැබෙති. (අනේකාන්ත); තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය ලබන ලද්දූ වූ දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී යයි කියද ලද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – සුද්ධාවාසයෙහි නම්, අර්හත් මාර්ගානන්තර ඵල චිත්ත යෙ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, අවසේස චතුවෝකාර පඤ්චවෝකාර පුද්ගලයන්ගේ, පූර්ව ආත්ම භාවයෙක මාර්ගය ලබන ලද නම් තමන් ඉපද සිටින භූමියෙහි ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා, මේ වර්තමාන භවයේදීම ලබන්නෝ නම් ප්‍රථමයෙන් ලබන මාර්ගානන්තර ඵල චිත්තයේ පටන් දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්ත ව, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද උඩ මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, යන මේ භූමි ගනු ලැබෙති. **අනුලෝම** සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය**–''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ අනභිස මෙතාවීනං තණ්හාය භංගක්ඛණෙ, තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ''සුද්ධාවාසයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයයි කියන ලද නියත දෙවැනි සිතය, ඒ සිතට, අතීතයෙහි මාර්ගසත්‍ය අවබෝධ කළ කෙනෙකු එහි නොමැති බැවින් ඒ හා සමාන දෙවැනි සිත යයි කියන ලද, ඒ භවයේ අර්හත් මාර්ගය නොලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධිය දෙවැනි භවංගයේ පටන් චුතිය දක්වාද ලබන්නෙකු නම්, ප්‍රතිසන්ධිය, දෙවැනි භවංගයේ පටන් අර්හත් මාර්ගය දක්වා, දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගීය, තෘෂ්ණා විප්‍රයුක්තව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අනාගාමී ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන්ගේසුද්ධාවාස භූමි (5) පසය අවසේස චතුවෝකාර, පඤ්චවෝකාර පුද්ගලයන්ගේ. ඒ භවයෙහි මාර්ගය නොලබන්නෙකු නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වාද ලබන්නෙකු නම්, ප්‍රතිසන්ධියේ පටන් සෝතාපත්ති මාර්ගය තෙක් ද තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝය, මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය (ඒකාන්ත)

අන් භූමියෙක යට මාර්ගය ලබන ලද නමුත්, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය නොලබන ලද හෙයින් ''තත්ථ අනභිසමෙතාවී'' නම් වූ පුද්ගලයන් අතුරෙන් අන්‍ය භූමියෙක සෝතාපත්ති මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි දී සකදාගාමී මාර්ගය නොලබන්නෙකු වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෙකු නම්, ප්‍රතිසන්ධියෙහි පටන් සකදාගාමී මාර්ගය දක්වාද දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද සෝතාපත්ති ඵලස්ථ සකදාගාමී මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝය, අන්‍ය භූමියෙක සකදාගාමී මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි දී අනාගාමී මාර්ගය නොලබන්නෙකු වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෙකු වේ නම්

ප්‍රතිසන්ධියේ පටන් අනාගාමී මාර්ගය දක්වාද දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ, සුදුසු පරිදි උපදනාවූ තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ සකෘදාගාමී ඵලස්ථ, අනාගාමී මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝය, අන්‍ය භූමියෙක අනාගාමී මාර්ගය ලබා, තමන් ඉපද සිටින භූමියෙහි අර්හත් මාර්ගය නොලබන්නෙකු වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද ලබන්නෙකු වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගය දක්වා දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ සුදුසු පරිදි උපදින තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, (අනේකාන්ත) අසඤ්ඤසත්ව භූමිය, යන මේ භූමි ගනු ලැබෙති.

(සුද්ධ අතීත වාරය **දුක්ඛ සත්‍ය මූල මග්ග සත්‍ය මූලිය** ඇසුරුකොට උද්ධරනු, තෘෂ්ණාවගේ උත්පාද ක්ෂණය නැති බවම විශේෂයි, **ප්‍රත්‍යනිකයද** අනුලෝම - ප්‍රතිලෝම මාරු කොට කියනු.)

වර්තමානාතීත වාරය නිමි.

## වර්තමානානාගත පුද්ගල වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**වර්තමානානාගත වාරයෙහි** "**යස්ස** දුක්ඛ සච්චං උප්පජ්ජති, තස්ස සමුදය සච්චං උප්පජ්ජිස්සතීති, අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං ඉතරෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං **යස්සවා පන** සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්සච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං"

**අනුලෝම අභිධෙය්‍ය** - පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, අරූප භූමියෙහි අර්හත් ඵලය හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදාන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය, තෘෂ්ණාව නොඉපදී සතර මාර්ගය ලබන්නා වූ කෙනෙකු වේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදාන චිත්තයාගේ පූර්වානන්තර අනුලෝමය තෙක්, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය.

යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ (3) තිදෙනාය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ (3) තිදෙනාය. **සෝතාපන්න** වීමෙන් පසු තෘෂ්ණාව නො ඉපදී නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදනායට පූර්වානන්තර වූ අනුලෝමය තෙක්, අරූප භූමියෙහි මාර්ග ඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සෝතාපත්ති ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, මැද මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ (2) දෙදෙ-නාය, මැද ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ (2) දෙදෙනාය.

**සකදගාමි** වීමෙන් පසු තෘෂ්ණාව නොම උපදී නම් අන්තිම තෘෂ්ණාවෙ පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදනායට පූර්වානන්තර වූ අනුලෝමය තෙක්, අරූප භූමි-යෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සකදගාමි ඵලස්ථ, අනාගාමි මාර්ගස්ථ, අනාගාමි ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය. **අනාගාමි** වීමෙන් පසු තෘෂ්ණාව නොම උපදී නම අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදනායට පූර්වානන්තර වූ අනුලෝමය තෙක්, අරූප භූමියෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමි ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති; ප්‍රතිසන්ධිසිත් (19) එකුන් විස්සය. චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (3, 7, 4) තුන – සත – සතර බැගිනි, ප්‍රථම ජීවිතනවක රූප කලාපය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සියලුම උපදමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය; ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නොම ඉපදී මාර්ග සතර ලබන්නා වූ කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම වූ තෘෂ්ණාවට පූර්ව අනන්තර චිත්තය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. **සෝතාපන්න** වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්ව අනන්තර චිත්තය තෙක් අරූප භූමියෙහි සොතාපත්ති ඵලය හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපත්ති මාර්ගස්ථ, සෝතා-පත්ති ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය;

**සකදගාමි** වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්ව අනන්තර චිත්තය තෙක් අරූප භූමියෙහි මාර්ග ඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේ-තුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාය, අනාගාමි වීමෙන් පසු තෘෂ්ණාව උපදින්-නේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාව ගේ පූර්වා-නන්තර චිත්තය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත සුදුසු පරිදි උපදින චිත්ත-යන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට මාර්ගස්ථ, යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආයඞ් පුද්ගලයෝ ය, (මේ පශ්චිම

භව්‍යකයාද අන්තිම භවය වශයෙන් ගැනීම සුදුසුය) පශ්චිම භව්‍යකයෙක් නොවන්නේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් ච්‍යුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ගඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ, යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ම ගනු ලැබේ.

(මෙහි දී ත්‍රිහේතුක පෘථග්ජනයා පමණක් නොගෙන පෘථග්ජන (4) සිවුදෙනාම උදුරති. පැරණි ග්‍රන්ථ වල ද දක්වා ඇත. මෙසේ පෘථග්ජන (4) සිවුදෙනාම ගත හොත් ''ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ගය ලබන්නේය'' යන කීම සමහ විරුද්ධ වේ. කුමක් හෙයින් ද යත්, ත්‍රිහේතුකයා හැර සෙසු පෘථග්ජන (3) තිදෙනා ප්‍රවෘත්ති කාලයෙහි මාර්ග නොලබන බැවිනි. එනිසා පශ්චිම භව්‍යක ත්‍රිහේතුක පෘථග්ජනයා ගැනීම සුදුසු යයි සිතමි.)

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** පිරිනිවෙන්නා හැර චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම වූ කර්මජ රූපය ජීවිත නවක රූප කලාපය යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නොඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්-ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, සෝතාපන්න වීමෙන් පසු තෘෂ්ණාව උපදිනම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, සෝතාපත්ති මාර්ගස්ථ සෝතාපත්ති ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, සකදාගාමි වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට මාර්ගස්ථ - යට ඵලස්ථ (2) දෙදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය; **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්-ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ, යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගල යෝ ය, පශ්චිම භව්‍යකයෙක් නොවන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වා-නන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද - අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට මාර්ගස්ථ, යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආර්‍ය්‍ය පුද්ගලයෝය; අරූප භූමියෙහි සමුදය සත්‍ය උපදින්නා වූ කෙනෙකු වේ නම්, යට මාර්ග යට ඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ සොතාපත්ති ඵලස්ථයාය, මැද මාර්ගස්ථ, මැද ඵලස්ථ (2) දෙදෙනා

බැගින් වූ ආයඞ් පුද්ගලයෝය, යන මෙ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබෙ. (අනුලෝමයේ දී අරූප භූමියෙහි රූප නොමැති බැවින් මාර්ග ඵල උපදින කෙණෙහි දුක්ඛ සත්‍ය නො උපදී, එහෙයින් අත්හරින ලදී)

''**ප්‍රත්‍යනීක අභිධෙයය** – '' අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ අග්ග මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං''

(මෙහි 'අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච'' කියා ඇතැම් ග්‍රන්ථයක ඇත. අනුලෝමයෙහි ''අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ'' යයි ඇති බැවින් නැවත පාළියක් අවශ්‍ය නැත. ''අග්ග මග්ග ස්ස ච ඵලස්ස ච'' යනුම සුදුසු යයි ආචාර්‍ය පාදයෝ කියති.)

අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය, තෘෂ්ණාවක් නොම ඉපදී සතර මාර්ගය ලබන්නා වූ කෙනෙක් වෙ නම්, අන්තිම වූ තෘෂ්ණාවෙ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ,යට ඵලස්ථ (3) තිදෙනා බැගින් වූ ආයඞ් පුද්ගලයෝ ය, **සෝතාපන්න** වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නෙ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ සෝතාපත්ති ඵලස්ථයාය, මැද මාර්ගස්ථ, මැද ඵලස්ථ (2) දෙදෙනා බැගින් වූ ආයඞ් පුද්ගලයෝ ය.

**සකදගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නෙ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ සකදගාමී ඵලස්ථ අනාගාමී මාර්ගස්ථ, අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය; **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නෙ නම්, අන්තිම තෘණාෂ්වෙ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයට පූර්වානන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය, අරූප භූමියෙහි අර්හත් මාර්ග – අර්හත් ඵල චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය, අරූප භූමියෙහි සමුදය සත්‍ය නුපදින්නෙක් වෙ නම් යට මාර්ග-යට ඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සෝතාපත්ති ඵලස්ථ,මැද මාර්ගස්ථ (2) දෙදෙනා මැද ඵලස්ථ (2) දෙදෙනා යන ආයඞ් පුද්ගලයෝ ය, යන මෙ පුද්ගලයෝ ගනු ලැබෙති.

## දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය

"**යස්ස** දුක්ඛ සච්චං උප්පජ්ජති, තස්ස මග්ග සච්චං උප්පජ්ජිස්සතීති, අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස උප්පා දක්ඛණෙ, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටි ලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙචඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං උප පජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං **යස්ස වා පන** යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ යෙ චඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්සචඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං,"

**අනුලෝම අභිධෙය්‍ය** පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා අරූප භූමියෙහි අර්හත් ඵලය හැර සූදූසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයෝ ය. නියත වශයෙන් මාර්ග නොලබන්නා වූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3–7–4) තුන–සත–සතර බැගිනි ප්‍රථම ජීවිත නවක කලාපය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයා ගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝ ය, අනාගතයෙහි මාර්ග ලබන්නා වූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3–7–4) තුන–සත – සතර බැගිනි. ප්‍රථම ජීවිත නවක කලාප යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ මතුමාර්ග අධිගමනය කරන්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි මේ ආත්ම භාවයේදී මාර්ග නොලබා මතු භවයකදී මාර්ග ලබන්නාගේ ද මේ භවයේදී යට මාර්ග පමණක් ලබා මතු භවයේ දී මතු මාර්ග ලබන්නාගේ ද ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ ආත්මභාවයේදී ම මාර්ග ලබන්නේනම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර වූ අනුලෝමය

තෙක්, අරූප භූමියෙහි මාර්ගඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍යඃ** – අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ භංගක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ පුද්ගලයෝ ය, මාර්ග මතු ලබන්නා වූ චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපය, ජීවිත නවක රූප කලාපය, යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවෙමින් සිටින භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යටඵලස්ථ ආයාති පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි මේ භවයේදී මාර්ග නොලබා මතු භවයේදී ලැබීමට නියත වූවන්ගේ ද මේ භවයේදී යට මාර්ග පමණක් ලබා මතු භවයේදී උඩ මාර්ග ලැබීමට නියත වූ වන්ගේ ද ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ මතු අනාගත භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ භවයෙදීම අර්හත් මර්ගය ලැබීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, අරූප භූමියෙහි මැද මාර්ග යට ඵලයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සෝතාපත්ති ඵලස්ථයෝ ය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ දෙදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනික අභිධෙය්‍යඃ** ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං චවන්තානං, පවත්තෙ-චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පා දක්ඛණෙ තෙසං'' අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආයාති පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්ත-යන්ගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආයාති පුද්ගලයෝ ය, මාර්ග නොලබන්නාවූ චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපය, ජීවිත නවක රූප කලාපය, යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ මාර්ගාධි ගමනය නොකරන්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය; ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්වානන්තර චිත්තය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ මාර්ගාධිගමනයෙහි අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, අරූප භූමියෙහි අර්හත් මාර්ග ඵලයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ – අර්හත් ඵලස්ථ ආයාති පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

## සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය

''**යස්ස** සමුදය සච්චං උප්පජ්ජති, තස්ස මග්ග සච්චං උප්පජ්ජිස්සතීති, යෙ පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං, යෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං **යසස වා පන** යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, යෙ වඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං, තණ්හාය භංගක්ඛණෙ, තණ්හා විප්පයුත්තෙ චිත්තෙ වත්තමානෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං'', **අනුලෝම අභිධෙය්‍ය** තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද මාර්ග නොලබන් නා වූ අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා ගනු ලැබෙති. මාර්ග ලබන්නා වූ තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද මතුවට භව්‍ය වන්නා වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයඨ් පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආයඨ් පුද්ගලයෝ ය. අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණාවිප්‍රයුක්තව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, නිරෝධ සමාපන්න අනාගාමීහුය, අසංඥ තලයෙහි උපදින චුතවන මතුවට භව්‍ය වන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''අග්ග මග්ග සමඞගීනං අරහන්තානං, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ, තණ්හාවිප්පයුත්ත චිත්තෙ වත්තමානෙ තෙසං''

(මෙහිදී ''නිරොධ සමාපන්නානං අසඤ්ඤසත්තානං'' පාඨය අනුලෝමයෙහි දක්වා ඇති බැවින් නොදක්වන ලදී. අවශේෂ නිරෝධයට සමවදින රහතන් වහන්සේ සමඟ මාර්ග ලාභයෙහි අභව්‍ය වූ අසංඥසතත්වයා පමණක් ස්වරූප වශයෙන් ඇතුලත් කරන ලදැයි ආචාර්‍යයන් වහන්සේලා දක්වති.)

අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආයඨ් පුද්ගලයෝය. අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආයඨ් පුද්ගලයෝ ය, මාර්ග නොලබන්නා වූ තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්තව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද අභව්‍ය පෘථග්ජන පුද්ගලයන්

(4) සිවුදෙනාය, නිරෝධ සමාපත්තියට සමවැදුනාවූ අර්හත් ඵලස්ථ ආයු්‍ය පුද්ගලයෝ ය, අසංඥ සත්තයෙහි උපදින – චුතවන අභව්‍ය සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (නිරෝධ සමාපත්තිය වෙන් නොකළ නමුත් 'අරහන්තානං' යන්නෙහි ඇතුලත් වේ.)

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි)

## පුද්ගලෝකාස වාරය

## දුක්ඛ සත්‍ය මූලය

පුද්ගලෝකාස දුක්ඛ සත්‍ය මූල සමුදය සත්‍ය මූලියෙහි "අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** චතුවෝකාරා පඤ්චවොකාරා චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං තත්ථ."

**අනුලෝම අභිධෙය්‍ය** – පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයු්‍ය පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා අරූප භූමියෙහි අර්හත් ඵලය හැර, සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී යයි කියන ලද අර්හත් ඵලස්ථ ආයු්‍ය පුද්ගලයෝ ය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයා ගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයු්‍ය පුද්ගලයෝය, තෘෂ්ණා සිතක් නොම ඉපදී මාර්ග සතර ලබන්නොක් වේ නම්, (පුද්ගල වාරය අනුව ස්වරූප උදූරනු) **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදී නම් අන්තිම තෘෂ්ණාවගේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර වූ අනුලෝමය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයු්‍ය පුද්ගලයෝ ය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභජවනය වී නම් පඤ්චම ජවනයේ පටන් චුතිය දක්වා දෝස මූල, මෝහ මූල, මහාකුසල ජවනයක් වී නම් අන්තිම තෘෂ්ණාවේ පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල සිත් හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යටඵලස්ථ (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ අරූප

භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසඤ්ඤතල යෙහි උපදිනා සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤතලය, යන මේ භූමි ගනු ලැබෙති.

ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3.7.4) තුන - සත - සතර බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදිනා පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන් ගේ චතුවෝ කාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය. ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නොම ඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම වූ තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදිනා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. **සෝතාපන්න** වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා අරූප භූමියේ මාර්ගඵල හැර සුදුසු පරිදි උපදිනා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, සොතාපත්ති මාර්ගස්ථ, සොතාපත්ති ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය.

**සකදගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදිනා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ දෙදෙනාය, යට ඵලස්ථ දෙදෙනාය, **අනා-ගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර වූ චිත්තය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදිනා චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ තිදෙනාය, යට ඵලස්ථ තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, (මේ වනාහි පශ්චිම භවිකයාය)

තමන් ඉපද සිටිනා භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණා-සන්න ජවනය ලෝභ ජවනය වන්නේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් සතර වැනි ජවනය තෙක්, දෝස මූල - මෝහමූල - මහා කුසල ජවනයක් වන්නේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම වූ තෘෂ්ණාවට පූර්වානන්තරය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදිනා චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගල-යන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25)

පස් විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ ද අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට මාර්ගස්ථ තිදෙනාය, යට ඵලස්ථ පුද්ගලයන් තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම කර්මජ රූප, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නොම ඉපදී මාර්ග සතර ලබන්නා වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, සොතාපන්න වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම්වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපත්ති මාර්ගස්ථ සෝතාපත්ති ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, සකදාගාමී වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (2) දෙදෙනාය, යට ඵලස්ථ (2) දෙදෙනාය, අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභජවනයක් වූයේ නම්, ප්‍රතිසන්ධියේ පටන් සතරවැනි ජවනය දක්වා ද, දෝසමූල – මෝහ මූල, මහා කුසල ජවනයක් වූයේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්ව අනන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ න.ම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට

පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද, අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි සමුදය සත්‍ය ඉපදිය හැකි වූ යට මාර්ග, යට ඵලයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ සොතාපත්ති ඵලස්ථ, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** – ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්සචිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තා වචත්තානං, අරූපෙ අග්ගමග්ගස්සච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,'' අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය, තෘෂ්ණාවක් නො ඉපදී සතර මාර්ගය ලබන්නෙක් වේ නම් අන්තිම වූ තෘෂ් ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය.

**සෝතාපන්න** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අන්තිම වූ තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ සෝතාපත්ති ඵලස්ථයාය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය, **සකදාගාමී** වීමෙන් පසු, තෘෂ්ණාවක් උපදින්නේ නම් අන්තිම වූ තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ සකදාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය, අනාගාමී මාර්ගස්ථ පුද්ගලයෝ ය, අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අන්තිම වූ තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ මූල ජවනයක් වූයේ නම් පඤ්චම ජවයේ පටන් චුතිය දක්වාද, දෝස මූල, මෝහ මූල, මහා කුසල ජවනයක් වූයේ නම් අන්තිම වූ තෘෂ්ණාවේ පටන් චුතිය

දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසංඥතලයෙන් චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසඤ්ඤභූමිය, අරූප භූමියෙහි අර්හත් මාර්ග, අර්හත් ඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝ ය; තමන් ඉපද සිටින අරූප භූමියෙහි මතු නැවත සමුදය සත්‍යය නූපදින්නා වූ යට මාර්ග යට ඵලයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ සෝතාපත්ති ඵලස්ථයාය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

## දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලීය

''**යස්ස යත්ථ දුක්ඛ** සච්චං උප්පජ්ජති, තස්ස තත්ථ මග්ගසච්චං උප්පජ්ජිස්සතීති, අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

(මෙහි ''ආපායිකානං අසඤ්ඤසත්තං උපප ජ්ජන්තානං'' කියා තිබිය යුතු යයි ආචාර්‍ය පාදයෝ කියති, සුද්ධ අනාගතය බලා එසේ ඇතුලත් කිරීම සුදුසුය, පොත් වල කි යා නැත.)

''යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙචඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්සවා පන යත්ථ**, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, යෙ චඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ අරූපෙ මග්ගස්සච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං තත්ථ''

**අනුලෝමඅඬ්ඬෙය්‍ය**-පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, අරූප භූමියෙහි අර්හත් ඵලය හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්ච වෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය නොලබන්නා වූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප (3-7-4) තුන - සත - සතර බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ

චතුවෝකාර–පඤ්චවෝකාර භූමියෙහි උපදින භව්‍යවූද අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස, යන මේ භූමි ගනු ලැබෙති. (මෙ වනාහි ඒකාන්ත යයි)

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේ ම යට මාර්ගය ලබා අන් භවයෙක් හි උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූයේ නම්, අන්තිමට ලබන්නා වූ මාර්ගයේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි මාර්ගඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම වූ යට මාර්ගස්ථ (3) ත්දෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව ආත්මභාවයේදී යට මාර්ග ලබා අන්භවයෙක් හි උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි ඵලචිත්තය හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම වූ යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් රූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූපාවචර භූමි (9) නවය ය අන් භූමියක දීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි ඵලසිතහැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදකෂණ සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් චතුවෝකාර භූමි (3) තුනය කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූපාවචර භූමි (9) නවය, සුදස්සී තෙක් සුද්ධාවාස භූමි (4) සතරය, අසංඥකලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤකල භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනායාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයෝය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලබනනාවූ දුගති අහේතුක ප්‍රතිසන්ධිය හැර ප්‍රතිසන්ධි සිත් (18) අටළොසය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3–7–4) තුන – සත – සතර බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ මතු භව්‍ය සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන පුද්ගලයෝය. යට ඵලස්ථ ආයඞ පුද්ගලයෝ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, ප්‍රවෘත්ති කාලයෙහි තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැවිහි මාර්ග නොලබා මතු භවයේ දී ලැබීමට නියත වූවහුගේ ද, මේ අත් බැව්හිදී යට මාර්ග පමණක් ලබා අන් අත් බවකදී මතුමාර්ග ලැබීමට නියත වූවහුගේද, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි, මාර්ගඵල හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය සුගති අහේතුක – ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන

පුද්ගලයෝය යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බවෙහි මාර්ග ලබන්නෝ වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිමට ලැබූ මාර්ගයට පූර්ව වූ ගෝත්‍රභූ - වෝදනායන්ගේද, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනායාට පූර්වානන්තර වූ අනුලෝමය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය යට ඵලස්ථ (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත, පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය යනමේ භූමි ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනායාගේ භංගක්ෂණ සමංගී නම් වූ අනාගාමි ඵලස්ථ ආයූ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය ලබන්නා වූ, දුගති අහේතුක චුතිය හැර, චුති සිත් (18) අටළොස, චෛතසික (35) පන්තිස, අන්තිම වූ කර්මජ රූප මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ සුගති අහේතුක - ද්විහේතුක-ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලස්ථ ආයූ පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැවිහි මාර්ග නොලබා මතු ආත්මයෙහි දී ලැබීමට නියත වූවහුගේද මේ අත්බැවිහි යට මාර්ගයම ලබා මතු ආත්මයෙහිදී උඩ මාර්ග ලැබීමට නියත වූවහුගේ ද, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමගී නම් වූ භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි ඒ ආත්මභාවයේදීම මාර්ග ලැබීමට නියත වූවෙක් නම්, ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිමට ලැබූ මාර්ගයට පූර්ව වූ ගෝත්‍රභූ - වෝදනායන්ගේද, අර්හත් මාර්ගයට පූර්ව වෝදනායාට පූර්වානන්තරවූ අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයූ පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය; තමන් ඉපද සිටින අරූප භූමියෙහි මාර්ග සත්‍ය ලැබීමට නියත වූයේ, යට මාර්ග යට ඵලයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සෝතාපත්ති ඵලස්ථයෝ ය, මැද මාර්ගස්ථ දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යෙච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තා ච වන්තානං, අරූපෙ අග්ග මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,''

(මෙහි ''අරූපෙ මග්ගස්ස ච ඵලස්සච''යයි පොතේ ඇත. අනුලෝමයෙහි ඇති බැවින් ප්‍රත්‍යනිකයෙහි නැවත ගැනීම අවශ්‍ය නැත. ලැබිය යුතු බැවින් ස්වරූප උද්‍ධරන ලදැයි ආචාර්‍ය්‍ය පාදයෝ කිහ.)

අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී යයි කියන ලද අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගීනම් වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ, චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, අන්තිම වූ කර්මජ රූපය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍යවූ ද අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය. (මේ වනාහි ඒකාන්තයි)

තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැව්හිදීම යට මාර්ග ලබා මතු අන් භවයකදී උඩ මාර්ගලබා පිරිනිවීමට නියත වූයේ වේ නම්, අන්තිමට ලැබූ මාර්ගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි නොමැතිව පූර්ව භවයේදීම යට මාර්ගය ලබා මතු අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් වූ අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් වූ රූප භූමි (9) නවය, පූර්ව අන්භවයකදීම යට මාර්ගය ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නේ වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක්ඇත්තා වූ අරූප භූමි (3) තුනය කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් ඇත්තා වූ රූප භූමි (9) නවය, සුදස්සීය තෙක් ඇත්තා වූ සුද්ධාවාස භූමි (4) සතරය අසංඥතලයෙහි චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය, අරූප භූමියෙහි අර්හත් මාර්ග –අර්හත් ඵලයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ – අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, තමන්ඉපද සිටින අරූප භූමියෙහි මාර්ග සත්‍ය නොම උපදින්නාවූ යට මාර්ග යට ඵලයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ සෝතාපත්ති ඵලස්ථයෝය, යට මාර්ගස්ථ (2) දෙදෙනාය, යට ඵලස්ථ (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් ඇත්තා වූ අරූප භූමි (3) තුනය යන මේ භූමි ගනු ලැබෙති. (මේ සංසය අභිධෙය්‍ය අනුලෝම – අනුලෝමසන්නිච්ඨාන පක්ෂයෙහි වේ. චුතවන්නා සමහ කීම පමණක් විශේෂයි)

## සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලීය

සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි ''ආපායිකානං, යෙ ච පුථුජ්ජනා මග්ගං නපටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, යෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ, යසස** චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති,යෙචඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ, තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙය්‍ය** – තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී නම වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අපාය භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය ලැබීමට නියත නොවූ තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූ ද සුගති අහේතුක ද්විහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගය ලැබීමට නියත නොවූ, දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් ඇත්තා වූ අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් ඇත්තා වූ රූප භූමි (9) නවය, සුදස්සිය තෙක් ඇත්තා වූ සුද්ධාවාස භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත වූ තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ සුගති අහේතුක – ද්විහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නාම් වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැව්හි දී මාර්ග නොලබා පසු ආත්ම භාවයකදී ලැබීමට නියත වූවහුගේද, මේ භවයෙහි යට මාර්ග පමණක් ලබා පසු ආත්ම භාවයක දී උඩ මාර්ග ලැබීමට නියත වවහුගේ ද ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී නම් වූ, තෘෂ්ණා විප්‍රයුක්ත වූ සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය සුගති අහේතුක – ද්විහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යටඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය තමන් ඉපද සිටින භූමියෙහි දී මේ අත්බැව්හිම මාර්ග ලබන්නට නියත වූයෙක් නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිමට ලැබූ මාර්ගයට පූර්ව වූ ගොත්‍රභූ චෝදනයන්ගේ ද අර්හත් මාර්ගයට පූර්වවූ චෝදනයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් තෘෂ්ණාවගේ

භංගක්ෂණ සමංගී වූ තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයපගේ චතුවෝකාර භූමි (4), සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ගනු ලැබෙති. අනුලොම සංසයද ගනු ලැබේ.

**ප්‍රත්‍යනික අභිධෙය්‍ය** ''අග්ගමග්ග සමංගීනං අරහන්තානං යෙව පුථුජ්ජනා මග්ගං නපටිලභි ස්සන්ති, තෙසං තණ්හාය භංගක්ඛණෙ, තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්ත මානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ''අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයඞීපුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයඞී පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, (ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය. තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී නම් වූ තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූද - අභව්‍ය වූ ද සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැවහිදී ම යට මාර්ග ලබා අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවකු වේ නම් අන්තිමට ලැබූ මාර්ගයේ පටන් චුතිය දක්වා දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි, පූර්වභවයේදීම යට මාර්ග ලබා මතු අන් භවයෙක් හි උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා දිට්ඨිගත විප්‍රයුක්ත තණ්හාවගේ භංගක්ෂණ සමංගී වූ, තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකයතෙක් රූපාවචර භූමි (9) නවය, අන් භූමියෙක් හි යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නේ වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා දිට්ඨිගත විප්‍රයුක්ත තණ්හාවගේ භංගක්ෂණ සමංගී නම් වූ තෘෂ්ණා විප්‍රයුක්ත වූ සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, සුදස්සිය

තෙක් සුද්ධාවාස භූමි (4) සතරය, අසංඥතලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන මේ භූමි ගනු ලැබෙති. (ප්‍රත්‍යනීක **සංසය** අභිධෙය්‍ය පෙර කියා ඇත. අනුලෝමයෙහි දී අනුලෝම ප්‍රතිලෝම දෙක මාරු කොට කියනු)

වර්තමානානාගත වාරය නිමි

---

### අතීතානාගත පුද්ගල වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**අතීතානාගත වාරයෙහි ''යස්ස** දුක්ඛ සච්චං උප්පජ්ජිත්ථ, තස්ස සමුදය සච්චං උප්පජ්ජිස්සතීති, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං, **යස්සවා පන** - ආමන්තා'' (සුදධ අනාගත වාර පාලියට සමානය) **අනුලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තරඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝය, (අවශේසය සුද්ධ අනාගත වාරය අනුව ස්වරූප උදුරනු. මේ වාරයෙහි දී පශ්චිම චිත්තය දක්වා කීමම විශේෂයි. **මාර්ග සත්‍ය මූලියෙහි** ද සුද්ධ අනාගතය අනුව මැයි, පෙළෙහි ද ස්වරූපයෙහි ද විශේෂයක් නොමැත. මෙහි ද පශ්චිම චිත්තය දක්වා කීම විශේෂයි. (**සමුදය හා මාර්ග මූලියෙහි** ද දුක්ඛ හා මාර්ග මූලියට අනුව වේ. විශේෂයක් නොමැත **ප්‍රත්‍යනීක සංසය** නොමැත. අනුලෝමයෙහි ප්‍රතික්ෂේපයද ප්‍රතිලෝමයෙහි පාලිගතියද වේ.)

පුද්ගල වාරය නිමි.

---

### පුද්ගලෝකාස වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි ''යස්ස යත්ථ** දුක්ඛ සච්චං උප්පජ්ජිත්ථ. තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජිස්සන්ති අග්ගමග්ග සමංගීනං අරහන්තානං යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සතීති, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ, ඉතරෙසං, චතුවොකාරානං පඤ්චවෝකාරානං තෙසංතත්ථ **යස්ස වා පන යත්ථ** සුද්ධාවාසානං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙයා** – අර්හත් මාර්ග චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයථි පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයථි පුද්ගලයෝ ය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයථි පුද්ගලයෝ ය, තෘෂ්ණාවක් නො ඉපදී මාර්ග සතර ලැබීමට නියත වූවෙක් වේ නම් අන්තිම වූ තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, (අනාගත වාරයට සමානයි.)

**සෝතාපන්න** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ වී නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ සෝතාපත්ති ඵලස්ථ ආයථි පුද්ගලයෝය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය, **සකදගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නේ නම් අන්තිම තණ්හාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම්වූ සකදගාමී ඵලස්ථයෝය, අනාගාමී මාර්ගස්ථයෝය, අනාගාමී ඵලස්ථයෝය, **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අන්තිම තණ්හාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයථි පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් ගේ මරණාසන්න ජවනය, ලෝභමූල ජවනයක් වූයේ නම් පඤ්චම ජවනයේ පටන් චුතිය දක්වාද, දෝස, මූල, මෝහමූල, මහාකුසල ජවනයක් වූයේ නම් අන්තිම තණ්හාවේ පටන් චුතිය තෙක් ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍යවූ ද පෘථග්ජන පුද්ගලයෝ ද, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයථි පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, අසඤ්ඤතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤතල භූමිය, යන මේ භූමි ගනු ලැබෙති.

තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ගය ලබන්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, **සෝතාපන්න-සකදගාමී** – (පෙර සේ පුරවා කියනු) අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාව උපදින

පුද්ගලයන් අතුරෙන්, සුද්ධාවාසය වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවාංගයේ පටන් අන්තිම වූ තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා ද අවසේස චතුවෝකාර පඤ්චවෝකාර භවයක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභජවනය වේ නම් ප්‍රතිසන්ධියේ පටන් සතර වැනි ජවනය තෙක් ද දෙස මූල, මෝහ මූල, මහාකුසල ජවනයක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා ද සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධිය හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූද – අභව්‍යවූ ද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝම** අභිධෙය්‍ය – රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිත් (1) එකය, චෛතසික (30) මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ. (ප්‍රත්‍යනීක සංසය නොමැත. පාළියෙහිම විසඳුමවේ.)

**දුක්ඛසත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි** ''අග්ගමග්ග සමංගීනං අරහන්තානං යෙව පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති, අපායිකානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, යෙවඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ **යස්ස වාපන යත්ථ** සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ''

අනුලෝම අභිධෙය්‍ය – අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයුෂ්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නෙක් වේ නම්

ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා භව්‍ය වූ ද අභව්‍ය වූද සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැව්හිදීම යටමාර්ග ලබා මින් මතු අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇත්තෙක් වේ නම්, අන්තිමට ලැබූ මාර්ගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදිඋපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට මාර්ගස්ථ (3) තිදෙනාය යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙන් පූර්ව භවයේදී යට මාර්ග ලබා පසුව අන්භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇත්තෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞ පුද්ගලයෝ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයය.

අන්‍ය භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් සුද්ධාවාසය වේ නම්, ප්‍රති සන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා ද, සෙසු චතුවෝකාර පඤ්චවෝකාර භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, සුදස්සී තලය තෙක් සුද්ධාවාස භූමි (4) සතරය, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදිඋපදින චිත්කයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය, අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල භූමිය, යන මේ භූමි ගනු ලැබෙති.

අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැව්හි මාර්ග නොලබා පසු අත් බැව්හි මාර්ග ලැබීමෙහි නියත වූයේ වේ නම් ඔවුන්ගේ ද මේ අත්බැව්හි යට මාර්ග ලබා පසු අත් බවක දී උඩ මාර්ග ලැබීමෙහි නියත වූයේනම් ඔවුන්ගේ ද, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍ය වූ සුගති අහේ තුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැව්හිම මාර්ග ලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් සුද්ධාවාසයේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය තෙක් ද, අවසේස චතුවෝකාර පඤ්චවෝකාර භූමියක් වේ නම ප්‍රතිසන්ධියේ පටන් අන්තිමට ලැබූ

මාර්ගයට පූර්ව වූ ගෝත්‍රභූ - වෝදානයන්ගේ ද අර්හත් මාර්ගයට පූර්වවූ වෝදානයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම්වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලබන්නාවූ රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිත් එකය, චෛතසික (30) තිසය, මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි පස ලැබෙති (ප්‍රත්‍යනීකයෙහි විභංගය නැත. පාළි පමණකි.) **අවශේෂය** වනාහි, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ, රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිතය, චෛතසික (30) තිසය, මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම්වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුදස්සී තලය තෙක් සුද්ධාවාස භූමි (4) සතර ගනු ලැබෙති. (මෙහි පාළිය බලා මේ අනුව අවශේෂයක් ඇති නම් අනුලෝමයෙහි කියා ඇති බැවින් නැවත පාළිය නොවැදූරිමේ හේතුව තේරුම් ගත යුතුය.)

**සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි**- ''යස්ස යත්ථ සමුදය සච්චං උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ මග්ග සච්චං උප්පජ්ජිස්සතීති, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, යෙව පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති, ආපායිකානං තෙසං තත්ථ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති, යෙවඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ,

**අනුලෝම අභිධෙය්‍ය** - අර්හත් මාර්ගචිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නෝ වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍යවූද - අභව්‍ය වූද සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැවහි දිම යට මාර්ග ලබා පසු අත් බවක දී උඩමාර්ග ලබන්නට නියත වූයේ නම් අත්හිමට ලැබූ මාර්ගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට මාර්ගස්ථ (3) තිදෙනාය, යටඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියට පූර්ව භවයේදී යටමාර්ග ලබා අත්භවයක දී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත

චුයේ වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යටඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයය, අන් භූමියෙක් හි යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නාවූ පුද්ගලයන් අතුරෙන්, සුද්ධාවාසය වේ නම් භවනිකාන්තික ද්වීතීය ජවනයේ පටන් චුතිය දක්වාද, සෙසු චතුවෝකාර පවඤ්චවෝකාර භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය තෙක් රූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, සුදස්සී තලය තෙක් සුද්ධාවාස භූමි (4) සතරය, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති. (දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මුලියෙහි කියන ලද්ද අතුරෙන් ''සුද්ධාවාස භූමියෙහි භවනිකන්තික දෙවැනි ජවනයේ පටන්'' යනු ගත යුතුයි. අසඤ්ඤසත්තය ඇතුලත් නොවීමම වෙනසයි. **සංසය** අභිධෙය්‍යයෙහි විශේෂයෙන් ගත යුතු දේ කියන්නෙමි.)

තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැව්හි මාර්ග ලබන්නා වූ පුද්ගලයන් අතුරෙන්, සුද්ධාවාසයෙහි වේ නම් භවනිකන්තික ද්වීතීය ජවනයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර වූ අනුලෝමය තෙක් ද, අවසේස වූ චතුවෝකාර පඤ්චවෝකාර භූමි වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිමට ලැබූ මාර්ග චිත්තයට පූර්ව වූ ගෝත්‍රභූ - වෝදනයන්ගේ ද අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර වූ අනුලෝමය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍යය පෙර සේ ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** → තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලබන්නාවූ සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයයි කියන ලද නියත ද්වීතීය චිත්තය, ඒ සිත හා සමඟ සමුදය සත්‍ය උපන්නෙකු අතීතයෙහිද නොමැති බැවින් ඒ හා සමාන ''තංසදිස'' චිත්තයයි කියන ලද ප්‍රතිසන්ධිය, භවංග චිත්ත වාර (15) සොළොසය, මනෝද්වාරාවර්ජනය, භවනිකන්තික ප්‍රථම ජවනය, යන මේ චිත්ත වාර (19) එකුන් විස්සගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. **ප්‍රත්‍යනික අභිධෙය්‍ය** ''අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,''

**අසඤ්ඤ** තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ද, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ ශුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගය නම් වූ නියත ද්විතිය චිත්තය, (පෙර සේ කියනු) මේ (19) දහනවයක් වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයතී පුද්ගලයන්ගේ සුදස්සී තලය තෙක් ශුද්ධාවාස භූමි (4) සතර ගනු ලැබෙති (මේ ශුද්ධාවාස අවසේස පාළිය නැත අනුලෝමයෙහි දක්වා ඇති බැවින් නැවත දැක්වීමට අවශ්‍ය නැත. සමහර පාලියෙක අනුලෝම – ප්‍රතිලෝමයෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං' කියා ඇත.)

අතීතානාගත වාරය නිමි, උත්පාද වාරය නිමි.

---

## ප්‍රවෘත්ති නිරෝධ වර්තමාන වාරය

උත්පාද වාරය දේශනා කොට වදරා අනතුරුව නිරෝධ වාරය වදළ සේක (පද බෙදකීම උත්පාද වාරය අනුව කියනු) වර්තමාන වාරයෙහි බෙදු ස්වරූප කීම උත්පාද වාරයට වඩා විශේෂයක් නොමැත. උපපජ්ජන්ත යන්නට චවන්ත ද චවන්ත යන්නට උප්පජ්ජන්ත ද, උත්පාද යන්නට භංග ද, භංග යන්නට උත්පාද ද කීමම විශේෂ වෙයි. උත්පාද වාරය ඇසුරු කොට කියනු පෙලෙහි දැක්වෙන බැවින් විස්තර නොකියන්නෙමි. **අතීතවාරයද** උත්පාද වාරයට **වඩා වෙනසක් නොමැත.**

## අනාගත පුද්ගල වාරය

## දුක්ඛ සත්‍ය මූලය

අනාගත වාරයෙහි (දුක්ඛ සත්‍ය මූල සමුදය සත්‍ය මූලි විභංගය උත්පාද විභංගය සමහ සමානය) **අනුලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ග චිත්තයාගේ **ක්ෂණත්‍රය** සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයතී පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලචිත්ත යේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයෝය, (උත්පාදය දක්වා නිරෝධය ගනු ලැබේ. මෙ පමණම විශේෂය) අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයතී පුද්ගලයෝය, තෘෂ්ණා වක් නො ඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම් අන්තිම තෘෂ්ණාවගේ භංගයේ පටන් අර්හත් මාර්ගයාට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතා-පන්න – පෙ – සකදගාමී – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නෝ

නම් අන්තිම තෘෂ්ණාවගේ භංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයසී පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (උත්පාදවාරයෙහි කියන ලද්ද අතුරෙන් ''අන්තිම තෘෂ්ණාවගේ භංගක්ෂණයෙ පටන්' කීමම විශේෂයි)

''තෘෂ්ණාව නොඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම්, අනාදිමත් සංසාරයෙහි පටන් ආ අන්තිම තෘෂ්ණාවගේ උත්පාදක්ෂණය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, **සෝතාපන්න** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් ආ අන්තිම තෘෂ්ණාවගේ උත්පාද ක්ෂණය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයෝය, සෝතාපත්ති මාර්ගස්ථ යෝය, සෝතාපත්ති ඵලස්ථ යෝය, **සකදගාමී** – පෙ – අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අනාදිමත් සංසාරයෙ පටන් එන අන්තිම තෘෂ්ණාවගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යටඵලස්ථ (3) තිදෙනාය, මාර්ග නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** – ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං'' ත්‍රිහේතුක චුතියින් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයසී පුද්ගලයෝ ගනු ලැබෙති.

**දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලීයෙහි** ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං, අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස **චිත්තස්ස** අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, යෙ **වණ්ණෙ** මග්ගං පටිලභිස්සන්ති තෙසං''

**අනුලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ග චිත්තයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයසී පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයසී පුද්ගලයෝය, මාර්ග ප්‍රතිලාභ නොකරන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයසී පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයසී පුද්ගලයෝය, අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3)

තිදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** - පෙරසේම ගනු ලැබේ. (ප්‍රතිලෝමයෙහි පෙර කියන ලද සංසය මැයි, **ප්‍රත්‍යනීක සංසය** ද දුක්ඛ මූල සමුදය මූලියෙහි මෙනි.)

## සමුදය සත්‍ය මූලය

**සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි** "යෙපුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං, යෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං, **යස්ස වා පන** - අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති තෙසං" **අනුලෝම අභිධෙය්‍ය** - මාර්ග නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. තෘෂ්ණාවක් නො ඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය,

(තෘෂ්ණාවගේ උත්පාදය දක්වා යයි කීමම විශේෂයි. උත්පාද වාරය මෙනි) සෝතාපන්න - පෙ - සකදාගාමී - පෙ - **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම වූ තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආයඅ පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඅ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබේ. **සංසය අභිධෙය්‍ය** පෙර සේය.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** - අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී නම වූ අර්හත් මාර්ගස්ථ ආයඅ පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්වවූ වෝදන චිත්තයාගේ ක්ෂණ ත්‍රය සමංගී නම වූ අනාගාමී ඵලස්ථ ආයඅ පුද්ගලයෝය, තෘෂ්ණාව නො ඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම්, අන්තිම වූ තෘෂ්ණාවගේ භංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආයඅ පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඅ පුද්ගලයන් (3) තිදෙනාය, සෝතාපන්න - පෙ - සකදාගාමී - පෙ - **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම අන්තිම වූ තෘෂ්ණාවගේ භංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අනාගාමී ඵලස්ථ ආයඅ පුද්ගලයෝ ගනු ලැබෙති. පෙර සංසය ද ගනු ලැබේ. **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** "අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං තෙසං" අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී නම වූ අර්හත්ම මාර්ගස්ථ ආයඅ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අර්හත් ඵලස්ථ ආයඅ පුද්ගලයෝය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි.)

## පුද්ගලෝකාස වාරය

# දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි** – (දුක්ඛසත්‍ය මූල සමුදය මූලි විභංගය කිම පෙර කී උත්පාද වාරය මෙනි.) **අනුලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අර්හත් මාර්ගස්ථ ආයෝ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ **ක්ෂණත්‍රය** සමංගී නම වූ අර්හත් ඵලස්ථ ආයෝ පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අනාගාමී ඵලස්ථ ආයෝ පුද්ගලයෝය, තෘෂ්ණාවක් නො ඉපදී සතර මාර්ගය ලබන්නෙක්වේ නම අන්තිම වූ තෘෂ්ණාවගේ භංගක්ෂණයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න – පෙ – සකදගාමී – පෙ– **අනාගාමී** විමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම අන්තිම වූ තෘෂ්ණාවගේ භංගයේ පටන් අර්හත් මාර්ගස්ථයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අනාගාමී ඵලස්ථ ආයෝ පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නුපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභමූල ජවනයක් වේ නම පඤ්චම ජවනයාගේ භංගයේ පටන් චුති චිත්තයාගේ උත්පාදය දක්වා ද දෝස මූල, මෝහමූල, මහාකුසල ජවනයක් වේ නම අන්තිම තෘෂ්ණාවගේ භංගයේ පටන් චුති චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍ය වූද – අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසංඥ තලයෙහි මතු නැවත නිරුද්ධ වන්නට නියත වූ අසංඥ තලයෙහි උපදින – චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

තෘෂ්ණාව නො ඉපදී මාර්ග සතර ලබන්නේ වේ නම අන්තිම වූ තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපන්න – පෙ – සකදගාමී – පෙ – **අනාගාමී** විමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ

තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමි යෙහි මතු නැවත නුපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනය වේ නම් ප්‍රතිසන්ධියේ පටන් පඤ්චම ජවනයේ උත්පාදය දක්වා ද, දෝස මූල මෝහ මූල, මහා කුසල ජවනයක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූද - අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහිමතු නැවත උපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනා ය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

(දුක්ඛ මූල මාර්ග මූලියෙහි වනාහි **සන්නිට්ඨාන** - අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, **සංසය** - අග්ගමග්ග ස්ස උප්පාදක්ඛණෙ, මෙපමණක්ම උත්පාද වාරයට වඩා වෙනස වේ.) **අනුලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නාමවූ අර්හත් මාර්ගස්ථ ආයසී පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අර්හත් ඵලස්ථ ආයසී පුද්ගලයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා ද, නුපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නාම වූ අභව්‍ය වූ සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප් ඵලය තෙක් රූප භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි ඒ ආත්ම භාවයේදී ම යට මාර්ග ලබා අන් භූමියකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගක්ෂණයේ පටන් චුති චිත්තය දක්වා ද මතු නැවත නුපදින්නෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගක්ෂණයේ පටන් චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නාම වූ යට මාර්ගස්ථ (3) තිදෙනාය,

යට ඵලස්ථ (3) තිදෙනාය තමන් ඉපද සිටින භූමියෙන් පූර්ව ආත්මභාවයේදී ම යට මාර්ග ලබා අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇත්තා වූ පුද්ගලයන් අතුරෙන් ඒ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, මතු නැවත නූපදින්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, අන් භූමියෙක්හි දීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් ඒ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, නැවත නූපදින්නෙක් වේ නම් ප්‍රති සන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, සුදස්සී තලය දකවා සුද්ධාවාස භූමි (4) සතරය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, නූපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය, අසංඥ තලයෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ අසංඥතලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤතල භූමිය යන මෙ භූමි ගනු ලැබෙති.

අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී නම වූ අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝ ය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයෝය, මෙ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි ඒ ආත්මභාවයෙහි මාර්ග නොලබා මතු භවයක දී ලබන්නෙක්වේද - පෙ - මේ ආත්ම භාවයේ දී යට මාර්ග පමණක් ලබා මින් මතු භවයක දී උඩ මාර්ග ලබන්නේ වේද - පෙ - ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, මෙ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි ඒ භවයේදීම මාර්ග ලබන්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිමට ලැබූ මාර්ගයාගේ උත්පාදය, දක්වාද අර්හත් මාර්ගයාගේ පූර්ව වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ

භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේම ගනු ලැබේ.

## දුක්ඛ සමුදය මූල දුක්ඛ මාර්ග මූලී වාරය

''**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය**'' ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසංතත්ථ'' ත්‍රිහේතුක චුති සිත් (13) තෙළසය චෛතසික (35) පන්තිස, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයඝ් පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිටාව හැර පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, අසඤ්ඤතල් භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නාවූ අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය, යන මේ භූමි ගනු ලැබෙති.

## සමුදය සත්‍ය මූලය

**සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි** - අනුලෝම පාලිය උප්පාද වාරයට සමානයි. ප්‍රතිලෝමයෙහි ''අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ'' (මෙපමණක්ම විශේෂයි) **අනුලෝම අභිධෙය්‍ය** - තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වාද, නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනයක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් පඤ්චම ජවනයේ උත්පාදය දක්වා ද, දෝස මූල, මෝහමූල - මහාකුසල ජවනයක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ තෘෂ්ණාවගේ උත්පාදය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය.

තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නා වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වාද නූපදින්නාවූ පුද්ගලයන් ගේ මරණාසන්න ජවනය, ලෝභ ජවනය වේ නම් ප්‍රතිසන්ධියේ පටන් පස්වෙනි ජවනයාගේ උත්පාදය දක්වා ද, දෝස මූල මෝහ මූල, මහා කුශල ජවනයක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ තෘෂ්ණාවගේ උත්පාදය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය වූ ද, අභව්‍ය වූද සුගති අහේතුක ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය,

තමන් ඉපද සිටින භූමියෙහි මේ ජීවිතයේදී ම යට මාර්ග ලබා අන් භවයක දී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි නැවත උපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගක්ෂණය පටන් චුතිය දක්වාද, නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගක්ෂණය පටන් අන්තිම වූ තෘෂ්ණාවගේ උත්පාදක්ෂණය දක්වා ද සුදුසු දරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය.

තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව ආත්මභාවයේදී ම යට මාර්ග ලබා අන් භූමියෙක් හි උඩ මාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇත්තා වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා ද, නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, අන් භවයකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය මේ පුද්ගලයන් ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, සුදස්සි බඹතලය දක්වා සුද්ධාවාස භූමි (4) සතර යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි එම අත් බැව්හි මාර්ග නොලබා මින්මතු භවයේ දී ලබන්නේ නම් ඔහුගේ ද, මේ අත්බැව්හි යට මාර්ග පමණක් ලබා මතු භවයේ දී උඩ මාර්ග ලබන්නේ වේ නම් ඔහුගේ ද, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැව්හිම මාර්ග ලැබීමට නියත පුද්ගල යන් අතුරෙන් මේ භූමියෙහි පසුව උපදින කෙනෙක් වේ නම් ඔහුගේද නූපදින පුද්ගලයන්ගෙන් මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම් ඔහුගේද ප්‍රතිසන්ධියේ පටන් අන්තිමට ලැබූ මාර්ගයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා චතුවෝකාර භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය,

සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයය, මාර්ගය ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

ප්‍රතිලෝම අභිධෙය්‍ය – අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය. තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැවහිම මාර්ග ලබන්නා වූ ද, මේ භූමියෙහි නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම් අන්තිම තෘෂ්ණාවගේ භංගයේ පටන් අන්තිම මාර්ග චිත්තයාගේ උත්පාදය දක්වාද අර්හත් මාර්ග චිත්තයාගේ පූර්වයෙහි චෝදනයට පූර්ව අනන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ගනු ලැබෙති. **අනුලෝම සංසය** ද ගනු ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය - ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං අසඤ්ඤසත්තානං, තෙසං තත්ථ'', අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටිනභූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනයක් වේ නම් පඤ්චම ජවනයේ භංගක්ෂණයේ පටන් චුතිය දක්වා ද, දෝසමූල, මෝහ මූල, මහාකුසල ජවනයක් වේ නම්, අන්තිම වූ තෘෂ්ණාවගේ භංගයේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය,

තමන් ඉපද සිටින භූමියෙහි මාර්ගනොලබන පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනය වේ නම් පඤ්චම ජවනයේ භංගක්ෂණය පටන් චුතිය දක්වා ද, දෝසමූල, මෝහමූල, මහාකුසල ජවනයක් වේ නම් අන්තිම වූ තෘෂ්ණාවගේ භංගක්ෂණය පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූ ද සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4)

සතරය, කාමසුගති භූමි (7) සතය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත්බැව්හිම යට මාර්ග ලබා අන් භවයක දී උඩමාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇත්තා වූ, මේ භූමියෙහි නැවත නූපදින පුද්ගලයන්ගේ මාර්ගය ලැබීමෙන් පසු තෘෂ්ණාවක් උපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ග චිත්තයාගේ භංගක්ෂණයේ පටන් චුතිය දක්වා ද නැවත උපදින කෙනෙක් වේ නම් අන්තිම වූ තෘෂ්ණාවගේ භංගක්ෂණයේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය,

තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව ආත්ම භාවයේදීම යට මාර්ග ලබා සිට මතු අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇත්තා වූ මේ භූමියෙහි ද නැවත නූපදින කෙනෙක් වේ නම් අන්තිම වූ තෘෂ්ණාවගේ භංගක්ෂණය පටන් චුතිය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞ් පුද්ගල යන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය,

අන්‍ය භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන, එම භූමියෙහි ද නැවත නූපදින කෙනෙක් වේ නම් අන්තිම වූ තෘෂ්ණාවගේ භංගක්ෂණයේ පටන් චුතිය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) හතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයය සුදස්සී තලය තෙක් සුද්ධාවාස භූමි (4) සතරය, අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අංඥසත්ව තලය, යන මේ භූමි ගනු ලැබෙති. (ප්‍රත්‍යනිකය මාරු කොට කියනු) අනාගතවාරය නිමි.

(**වර්තමානාතීත වාරය** උත්පාද වාරයට වැඩි වෙනසක්ම නැත. උපපජ්ජන්ත- යන තැන වවත්ත ද, චවන්ත - යන තැන උපපජ්ජන්තද උත්පාද - යන තැන භංග - ද, භංග - යන තැන උත්පාද - ද යන මෙතෙක්ම විශේෂයි. උත්පාද වාරය **ඇසුරු කොට කියනු**)

## වර්තමානානාගත පුද්ගල වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**වර්තමානානාගත වාරයෙහි** - දුක්ඛ මූල සමුදය මූලියෙහි භංගක්ෂණය කියනු, **අනුලෝම අභිධෙය්‍ය** - පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගචිත්තයාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, අරූප භූමියෙහි අර්හත් ඵලය හැර සුදුසු පරිදි උපදින

චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ය, අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයෝ ය, තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ග ලබන කෙනෙක් වේ නම්, අන්තිම වූ තෘෂ්ණාවගේ භංගක්ෂණය පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා, අරූප භූමියෙහි මාර්ග, ඵල හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න – පෙ – සකදාගාමී – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනචිත්තයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා, අරූප භූමියෙහි ඵලය හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (උත්පාද වාරයෙහි කියන ලද්ද අනුරෙන් භංගය කීමම මෙහි විශේෂයි.)

පිරිනිවීම හැර චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප, ජීවිත නවක කලාප, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ, සියලුම චුත වෙමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාවක් නොඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් අන්තිම වූ තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, සෝතාපන්න – පෙ – සකදාගාමී – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා, අරූප භූමියෙහි මාර්ගඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, (අන්තිම භව ඇති පශ්චිම භවිකයා ගත යුතු) පශ්චිම භවිකයෙක් වේ නම් ප්‍රතිසන්ධියෙහි පටන් චුතියගේ පූර්වානන්තර චිත්තයදක්වා අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ, භව්‍ය වූ ද අභව්‍ය වූද, පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ ආයති පුද්ගලයෝ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයති පුද්ගලයෝ (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිසය කර්මජ කලාප (3- 7- 4) තුන–සත–සතරය ජීවිත නවකකලාප රූපය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී සියලුම උපදමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නො ඉපදී මාර්ග සතර ලබන්නෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ

සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. සෝතාපන්න – පෙ – සකදාගාමි – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, පශ්චිම භවිකයෙක් නොවේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථමභවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයෝ ය. යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3)තිදෙනාය. අරූප භූමියෙහි සමුදය සත්‍යය නිරුද්ධ වන්නා වූ යට මාර්ග, යට ඵල ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී සෝතාපත්ති ඵලස්ථයෝය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය. මැද ඵලස්ථ (2) දෙදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය.** ''අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ අග්ගමග්ගස්සච ඵලස්සච භංගක්ඛණෙ තෙසං'' අර්හත් මාර්ගයාගේඋත්පාදක්ෂණ සමංගී නම්වූ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, තෘෂ්ණාව පහළ නොවී මාර්ග සතර ලබන කෙනෙක් වේ නම් අන්තිම තෘෂ්ණාවෙන් පසු තදාරම්මණ – භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න – පෙ – සකදාගාමි – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නේ නම් අන්තිම තෘෂ්ණාවෙන් පසු තදාරම්මණ – භවංගයේ පටන් අර්හත් මාර්ගයාගේ පූර්ව වෝදනයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අරූප භූමියෙහි අර්හත් මාර්ග අර්හත් ඵල ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, අරූප භූමියෙහි සමුදය සත්‍ය නිරුද්ධ නොවන්නා වූ, යටමාර්ග යට ඵල ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී සෝතාපත්ති ඵලස්ථයෝය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**දුක්ඛ සත්‍ය මූල මාර්ගසත්‍ය මූලියෙහි** ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ අරහන්තානං චිත්තස්ස භගක්ඛණෙ, යෙව පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං

පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, යෙ චඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං **යස්සවා පන** – අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙ චඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්ජතානං. පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ මග්ගස්සච ඵලස්සච භංගක්ඛණෙ තෙසං'',

**අනුලෝම අභිධෙය්‍ය** – පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා අරූප භූමියෙහි අර්හත් ඵලය හැර සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝය, මාර්ග ලැබීමෙහි නියත නොවූ, චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපයෝ ය, ජීවිත නවක රූප කලාපය මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම වූ මාර්ග ඵලාධිගමයෙහි අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාල යෙහි ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

අර්හත් මාර්ගයට පූර්ව වෝදනයාගේ භංගක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයෝය, මාර්ග ලැබීමෙහි නියත වූ, චුතිසිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපයෝය, ජීවිත නවක කලාප රූපය, මේ ධර්ම යන්ගේ භංගක්ෂණ සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය ප්‍රවෘත්ති කාලයෙහි මේ අත් බැව්හි මාර්ග නොලබා පසු භවයෙක දී ලැබීමට නියතවූ ද, මේ භවයෙහි යට මාර්ග ලබා පසු භවයේදී උඩ මාර්ග ලැබීමට නියත වූද ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා අරූප භූමියෙහි මාර්ගඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ ආත්ම භාවයේදීම අර්හත් මාර්ගය ලැබීමට නියත වූයේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදනයාගේ පූර්වානන්තර අනුලෝමය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වෝදනයාගේ භංගක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයෝය, මාර්ග ලැබීමෙහි නියත වූ ප්‍රතිසන්ධි

සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3-7-4) තුන - සත - සතරය මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි මේ අත් බැව්හි මාර්ග නොලබා පසු භවයක දී ලැබීමට නියත වූ ද, මේ භවයෙහි යට මාර්ග ලබා පසු භවයේ දී උඩමාර්ග ලැබීමට නියත වූ ද, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ භවයෙහි ම අර්හත් මාර්ග ලැබීමෙහි නියත වූයේ වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය අරූප භූමියෙහි යට මාර්ග ඵල ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී සෝතාපත්ති ඵලස්ථ ආයති පුද්ගලයෝය මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, යට ඵලස්ථ (2) දෙදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය**-''අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ අග්ගමග්ගස්ස ච ඵලස්ස ච භංගක්ඛණෙ තෙසං''අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝය, මාර්ග ලැබීමෙහි නියත නොවූ, ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (3-7-4) තුන - සත - සතරය, ජීවිත නවක කලාප රූපය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී අභව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, අරූප භූමියෙහි අර්හත් මාර්ග අර්හත් ඵල ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ගනු ලැබෙති.

## සමුදය සත්‍ය මූලය

**සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි**-''යෙ පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ තෙසං, යෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ තෙසං **යස්සවා පන** අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, යෙචඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ, තණ්හා විප්ප යුත්ත චිත්තෙ වත්ත මානෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං''

**අනුලෝම අභිධෙය්‍ය** තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී මාර්ග ලැබීමෙහි නියත නොවූ, අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. මාර්ග ලැබීමට නියත වූ තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම** අභිධෙය්‍ය අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගීවූ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ගයාගේ පූර්ව වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්තව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රයසමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දනාය, යට මාර්ගස්ථ (3) තිදනාය යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, නිරෝධ සමාපත්තියට සමවැදුනාවූ අනාගාමී ආර්‍ය්‍ය පුද්ගලයෝය, අසංඥ තලයෙහි උපදින චුතවන භව්‍ය සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මෙ පුද්ගලයෝ ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** – ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ තෙසං'' අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, මාර්ග ලැබීමෙහි නියත නොවූ, තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී, තෘෂ්ණාව විප්‍රයුක්තව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ය, නිරෝධයට සමවැදුනාවූ ක්ෂීණාශ්‍රවයෝය, අසංඥ තලයෙහි උපදින චුතවන අභව්‍ය සුගති අහේතුක පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති

(මෙ නිරොධ සමාපන්නයා හා අසංඥ සත්ත්වයා අනුලෝම පාලියෙහි ඇති බැවින් නැවතත් ගැනීම සුදුසු නැතැයි ආචාර්‍ය්‍ය පාදයෝ කියති, සමහර ගුරුවරු පෙර – පසු පාළිය නොබලා, පෙළෙහි ඇති ලෙස ගැනීම රුචි කරති.)

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි)

---

## පුද්ගලෝකාස වාරය

# දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි දුක්ඛමූල සමුදය මූලියෙහි** "අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤ සත්තා චවන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරා පඤ්චවොකාරා චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංග්ක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච භංගක්ඛණෙ තෙසං තත්ථ,"

**අනුලෝම අභිධෙය්‍ය** – පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, (පුද්ගල වාරය අනුව ස්වරූප උදූරනු) **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක්උපදින්නේ නම් අන්තිම තෘෂ්ණාවගේ භංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදනයාගේ පූර්වානන්තර අනුලෝමය දක්වා අරූප භූමියෙහි ඵලය වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයඞ පුද්ගලයෝය,මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනය වේ නම් පඤ්චම ජවනයේ භංගයේ පටන් චුතිය දක්වාද, දෝසමූල මෝහමූල, මහාකුසල ජවනයක් වේ නම්, අන්තිම තෘෂ්ණාවගේ භංගයේ පටන් චුතිය දක්වාද, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද, අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යටමාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගල යන්ගේ අරූප භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25)පස්විස්සය, අසඤ්ඤ තලයෙහි චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ, චුතිසිත් (19) එකුන් විස්සය චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප කලාපයෝය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, මෙ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නො ඉපදී මාර්ග සතර ලබන්නෝ වේ නම්,ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය සෝතාපන්න

- පෙ - සකදාගාමී - පෙ - අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් (පෙර සේ බලා කියනු - පුද්ගලවාරය අනුව වේ) භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභමූල ජවනය වේ නම් ප්‍රතිසන්ධියේ පටන් සතර වැනි ජවනය දක්වා ද, දෝස මූල, මෝහමූල, මහාකුසල ජවනයක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා අරූප භූමියේ මාර්ගඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය වූද - අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, තමන් ඉපද සිටින භූමි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** - ප්‍රතිසන්ධිසිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය කර්මජ රූප කලාප (3-7-4) තුන-සත-සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාවක් නොඉපදී මාර්ග සතර ලබන කෙනෙක්වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපන්න - පෙ - සකදාගාමී - පෙ - අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත, පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටිනභූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනය වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වා ද, දෝසමූල, මෝහමූල, මහාකුසල ජවනයක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන පුද්ගල-

පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය වූද අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, තමන් ඉපද සිටින අරූප භූමියෙහි සමුදය සත්‍ය නිරුද්ධ වීමට නියත වූ, යට මාර්ග යට ඵල ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ සෝතාපත්ති ඵලස්ථ ආයඞී පුද්ගලයෝය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය,මැද ඵලස්ථ (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර, යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනික අභිධෙය්‍ය** ''අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තා නං උපපජ්ජන්තානං අරූපෙ අග්ගමග්ගස්සච ඵලස්සච භංගක්ඛණෙ තෙසං තත්ථ'' අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආයඞී පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආයඞී පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයඞී පුද්ගලයෝය, තෘෂ්ණාව නොඉපදී මාර්ග සතර ලබන කෙනෙක් වේ නම්, අන්තිම වූ තෘෂ්ණාවෙන් පසු තදරම්මණ භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනාය, සෝතාපන්න-පෙ - සකදාගාමී - පෙ - අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාව උපදින්නේ නම් අන්තිම තෘෂ්ණාවෙන් පසු තදරම්මණ භවංගයේ පටන් අර්හත් මාර්ගයාගේ පූර්ව වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලසථ ආයඞී පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභමූල ජවනයක් වේ නම් පඤ්චම ජවනයෙන් පසු තදරම්මණ භවංගයේ පටන් චුතිය දක්වාද, දෝස මූල - මෝහ මූල මහාකුසල ජවනයක් වේ නම් අන්තිම තෘෂ්ණාවෙන් පසු තදරම්මණ භවංගයේ පටන් චුතිය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය වූද අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, අසඤ්ඤසත්වයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤතල භූමිය,

අරූප භූමියෙහි අර්හත් මාර්ග අර්හත් ඵලධර්මයන්ගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝය. තමන් ඉපද සිටින අරූප භූමියෙහි සමුදය සත්‍ය නිරුද්ධ නොවන්නා වූ යට මාර්ග යට ඵලධර්මයන්ගේ භංගක්ෂණ සමංගී සෝතාපත්ති ඵලස්ථ ආයති පුද්ගලයෝය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර, යන මේ භූමි ගනු ලැබෙති.

## දුක්ඛමූල මංගී මූලීය

**දුක්ඛසත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි** – ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යෙච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ (මෙහි ''ආපායිකානං'' කියාද''අපායා''කියාද පාඨයක් ඇත ) යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, යෙචඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ, **යස්සවාපන යත්ථ**, අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙ චඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ මග්ගස්ස ච ඵලස්ච භංගක්ඛණෙ තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙය්‍ය** – පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, අරූප භූමියෙහි ඵලය හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝය, මේ පුද්ගලයන් ගේ - චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමෙහි නියත නොවූ චුති සිත් (19) එකුන්විස්සය චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙහි පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී භව්‍යවූ ද – අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැවහිම යට මාර්ග ලබා අන්බවක දී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගයේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව ආත්ම භාවයෙහිම යට මාර්ග ලබා අන් භවයකදී උඩමාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් වේ නම්

ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, අරූප භූමියෙහි ඵලය වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණසමංගී යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය පෙක් අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, අනාගත භූමියෙකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි ඵල සිත් හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, සුදස්සී තලය දක්වා ශුද්ධාවාස භූමි (4) සතරය, (මෙහි, පෙළට අනුව ස්වරූප ගන්නේ නම් ''යෙ ච පුථුජ්ජනා'' යන තැන සුගති අහේතුක චුතිය හැර අපායෙහි චුති පැවැත්ම ස්වරූප වශයෙන් ගත යුතු) අන්තිම ජීවිත නවක කලාප රූපයන්ගේ භංගක්ෂණ සමංගී අසංඥතලයෙන් චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයාගේ භංගක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයතී පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත වූ දුගති අහේතුක චුතිය වර්ජිත චුතිසිත් (18) අටළොසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී භව්‍ය සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලස්ථ (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැව්හි මාර්ග නොලබා පසු භවයක දී ලැබීමට නියත වූ ද, මේ භවයෙහි යට මාර්ග පමණක් ලබා මතු භවයේදී උඩමාර්ග ලැබීමට නියත වූද, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල ධර්ම වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජනයෝය, යටමාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්මභාවයේදීම මාර්ග ලැබීමට නියත වූයේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිමට ලැබූ මාර්ගයට පූර්ව වූ ගෝත්‍ර භූ, වෝදනදක්වාද, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වාද. අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යටඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙරසේම ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය** - අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථයෝය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත වූ දුගති අහේතුක ප්‍රතිසන්ධිය වර්ජිත, ප්‍රතිසන්ධිසිත් (18) අටළොසය, චෛතසික (35) පන්තිසය, කර්මජකලාප රූප (3-7-4) තුන-සත-සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, ප්‍රවෘත්ති කාලයෙහි තමන් ඉපද සිටිනා භූමියෙහි මේ අත් බැව්හි මාර්ග නොලබා පසු භවයේ දී ලැබීමට නියත වූද, මේ භවයේ දී යට මාර්ග පමණක් ලබා මතු භවයේදී උඩ මාර්ග ලැබීමට නියත වූ ද, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය,

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයෙහිම මාර්ග ලැබීමට නියත වූයේ වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිමට ලබන මාර්ගයේ උත්පාදය දක්වා ද, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදනයා ගේ පූර්වානන්තර අනුලෝමය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින අරූප භූමියෙහි මාර්ග සත්‍යය නිරුද්ධ වීම නියත නැත්තා වූ යට මාර්ග යට ඵලයන්ගේ භංගක්ෂණ සමංගී සෝතාපත්ති ඵලස්ථයෝය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය. යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය යන මේ භූමිගනු ලැබෙති.

**ප්‍රත්‍යනික අභිධෙය** - ''අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, පවතෙත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤ සත්තං උපපජ්ජන්තානං, අරූපෙ අග්ග මග්ගස්ස ච ඵලස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ.''

(මෙහි ''අපායං - අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං'' කියාද පාඨයක් ඇත.) අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයඞී පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (3-7-4) තුන-සත-සතරය, මේ ධර්මයන්

ගේ උත්පාදක්ෂණ සමංගී චතුවෝකාර, පඤ්චවෝකාර යෙහි උපදින භව්‍යවූ ද අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදිඋපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය වූද – අභව්‍යවූද, පෘථගජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය,

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේදීම යට මාර්ග ලබා අන් භවයකදී උඩමාර්ග ලබා පිරිනිවෙන්නට නියත වූ කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයට අනන්තර ඵලයේ පටන් චුතිය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී, යට ඵලස්ථ ආයඪ පුද්ගලයන් (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්වාත්ම භාවයෙහි ම යට මාර්ග ලබා අන් භවයක දී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූ කෙනෙක්වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ ආයඪ පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය,

අන් භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ ආයඪ පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, සුදස්සී තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, අසඤ්ඤතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤතල භූමිය, අරූප භූමියෙහි අර්හත් මාර්ග අර්හත් ඵල ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයඪ පුද්ගලයෝය, තමන් ඉපද සිටින අරූප භූමියෙහි මාර්ග සත්‍ය නිරුද්ධ වීමට නියත නොවූ, යට ඵලයන්ගේ භංගක්ෂණ සමංගී සෝතාපත්ති ඵලස්ථයෝ ය, මැද මාර්ගස්ථ දෙදෙනාය මැද ඵලස්ථ දෙදෙනාය යන මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති.

## සමුදය මූල මාර්ග මූලිය

**සමුදය සත්‍යමූල මාර්ග සත්‍ය මූලියෙහි** ''ආපායිකානං, යෙච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ තෙසං තත්ථ, යෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** – අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, යෙ චඤ්ඤෙ මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ'',

**අනුලෝම අභිධෙය්‍ය** - තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමෙහි නියත නොවූ තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී භව්‍ය වූ ද අභව්‍ය වූද සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7), සතය වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ දිට්ඨි ගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, සුදස්සි තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත වූ තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** - අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී අනාගාමි ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) විසි දෙකය, තමන් ඉපද සිටින භූමියෙහි (සෙස්ස උත්පාද වාරයට අනුව උදුරනු) තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්ත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී, අන්තිම මාර්ග චිත්තයාගේ උත්පාදක්ෂණයේ, පටන් අර්හත් මාර්ගයාගේ පූර්ව වූ වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා,- (මෙපමණක්ම විශේෂයි)

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** - "අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ" අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ, කෙනෙක් නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී තෘෂ්ණා විප්‍රයුක්ත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය වූද, අභව්‍ය වූද, පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර

භූමි (21) එක්විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භවයේදීම යට මාර්ග ලබා අන් භූමියෙක් හි උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගයේ පටන් චුතිය දක්වා දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ තෘෂ්ණා විප්‍රයුක්ත වූ සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය.

තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව භවයෙහිදීම යට මාර්ග ලබා අන්භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්ත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයඨ පුද්ගලයෝ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, අන් භූමියකදීම යට මාර්ග ලබා, තමන් ඉපද සිටින භූමියෙහි දී මාර්ග නොලබන කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා දිට්ඨිගත විප්‍රයුක්ත තෘෂ්ණාවගේ උත්පාදක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයඨ පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්ච ඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, සුදස්සී තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, අසඤ්ඤතලයෙහි උපදින-චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

වර්තමානානාගත වාරය නිමි

---

## අතීතානාගත පුද්ගල වාරය

**අතීතානාගත පුද්ගල වාරයෙහි** – (සුද්ධ අනාගත වාරය මෙනි, පෙළ සමානයි) **අනුලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයඨ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදිඋපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආයඨ පුද්ගලයෝය; (අවසේසය සුද්ධ අනාගත වාරය අනුව උදුරනු. විශේෂයක් නොමැත, පශ්චිම චිත්තය දක්වා කිම පමණක් විශේෂයි. දුක්ඛ මූල මාර්ග මූලි විභංගයද අනාගත වාරය මෙනි. ස්වරූපද අනාගත වාරය මෙනි අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, විශේෂ මෙපමණකි, සමුදය මූල මාර්ග මූලියෙහි ද දුක්ඛ මූල මාර්ග මූලි මෙනි.)

## පුද්ගලෝකාස වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි දුක්ඛමූල සමුදය මූලියෙහි** ද - (විභංගය උත්පාද වාරය මෙනි) **අනුලෝම අභිධෙය්‍ය** - අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආය෣ී පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආය෣ී පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදාන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී ආනාගාමී ඵලස්ථ ආය෣ී පුද්ගලයෝය, තෘෂ්ණාවක් නො ඉපදී මාර්ග සතර ලබන්නා වූ (සුද්ධ අනාගත වාරය මෙනි) සෝතාපන්න - පෙ - සකදාගාමී - පෙ - **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම්, අන්තිම වූ තෘෂ්ණාවේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදානයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අනාගාමී ඵලස්ථ ආය෣ී පුද්ගලයෝය, මෙ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනයක් වේ නම් පඤ්චම ජවනයේ භංගක්ෂණයේ පටන් චුතිය දක්වා ද, දෝසමූල, මෝහමූල, මහාකුසල ජවනයක් වේ නම් අන්තිම වූ - තෘෂ්ණාවගේ භංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය වූද අභව්‍ය වූ ද පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය, මේ භූමි ගනු ලැබෙති.

තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ගය ලබන කෙනෙක් වේ නම් (අනාගත වාරය අනුව කියනු)... අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාව උපදින පුද්ගලයන් අතුරෙන් සුද්ධාවාසය වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා ද, සෙසු චතුවෝකාර පඤ්චවෝකාර භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මෙ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ මූල ජවනයක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් පඤ්චම ජවනයේ උත්පාදය දක්වා ද, දෝසමූල, මෝහමූල මහාකුසල ජවනයක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය

දක්වා ද සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධිය හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අභව්‍යවූ ද, භව්‍ය වූද, පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී ''අභව්‍ය වූද භව්‍ය වූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය යට මාර්ගස්ථ (3) තිදෙනාය යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. **ප්‍රතිලෝම** අභිධෙය්‍ය රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිත් (1) එකය, චෛතසික (30), තිසය, කර්මජ රූප සතර බැගිනි, මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආය්‍යී පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක සංසය නොමැත.**

දුක්ඛ මූල මාර්ග මූලියෙහි ''අග්ග - මග්ග ස්ස භංගක්ඛණෙ'' (අවසේස විභංගය උත්පාද වාරය මෙනි) **අනුලෝම** අභිධෙය්‍ය - අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආය්‍යී පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආය්‍යී පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමෙහි නියත නොවූවෙක් නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍යවූ ද - අභව්‍යවූද සුගති අහේතුක - ද්විහෙතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය,

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේදීම යට මාර්ග ලබා අන්භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගක්ෂණයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්වාත්මභාවයේදීම යට මාර්ග ලබා අන්භවයකදී උඩ මාර්ගලබා පිරිනිවීමට නියත වූවෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ යට ඵලස්ථ ආය්‍යී පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන් ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, අන් භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි දී මාර්ග ලැබීමට නියත නොවූ පුද්ගලයන් අතුරෙන්, සුද්ධාවාසය වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දවාද, අවසේස චතුවෝකාර පඤ්චවෝකාර භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද,

සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනා ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය. සුදස්සී තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතරය, අසඤ්ඤසත්වයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ව භූමිය යන මේ භූමි ගනු ලැබෙති. (සංසය ස්වරූප ගැනීමේ දී සුද්ධ අනාගත වාරය අතුරෙන් උත්පාද වාරය මෙන් සුද්ධාවාස ප්‍රතිසන්ධිය අඩුකරනු)

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත වූ රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිත් (1) එකය, චෛතසික (30) සමතිසය, කර්මජ රූප කලාප (4) සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී සුද්ධාවාස-යෙහි උපදින අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති. (**ප්‍රත්‍යනීක සංසය** පෙළෙහි නැත) **අවශේෂ අභිධෙය්‍ය** – තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන්නාවූ රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිත් (1) එකය චෛතසික (30) සමතිසය කර්මජ කලාප (4) සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී සුද්ධාවාසයෙහි උපදින අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයන්ගේ සුදස්සී තලය තෙක් සුද්ධාවාස භූමි (4) සතර ගනු ලැබෙති.

## සමුදය සත්‍ය මූලය

**සමුදය මූල මාර්ග මූලියෙහි** ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, (දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලි විභංගයෙන් ''අසඤ්ඤසත්තානං'' යනු ගතයුතුය, ස්වරූප ඉදිරිමෙදිද සුද්ධාවාස අභිධෙය්‍ය අතුරෙන් භවනිකන්තික දෙවැනි ලෝභ ජවනයේ පටන් කියනු. **ප්‍රතිලෝම අභිධෙය්‍ය** – ''තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමෙහි නියත වූ''යයි කියා උත්පාදවාරය මෙන් ස්වරූප උදුරනු.) **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** –''අසඤ්ඤසත්තා-නං තෙසං තත්ථ''. අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ව භූමිය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමෙහි නියත නොවූවෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයයි කියන ලද නියත ද්‍විතිය චිත්-තය, ඒ සිත් සමඟ මීට පෙර සමුදය සත්‍ය මාර්ග සත්‍ය ඉපද නැති බැවින්, නොලද්-දෙතු හා සමාන බැවින් තංසදිස ද්‍විතිය චිත්තයැයි කියන ලද ප්‍රතිසන්ධි සිත්, භවංග සිත් (16) සොළසය, මනෝද්වාරා වර්ජනය, භවනිකන්තික ප්‍රථම ජවනය, මේ (19) එකුන් විසි චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයති පුද්ගලයන්ගේ සුදස්සී තලය දක්වා වුද්ධාවාස භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබෙති.

(අවශේෂය උත්පාද වාරය මෙනි)

නිරොධ වාරය නිමි.

## උප්පාද නිරෝධ වර්තමාන වාරය

නිරෝධ වාරය දේශනා කොට වදරා අනතුරුව උප්පාද නිරෝධ වාරය වදළ සේක ... ''යස්ස දුක්ඛ සච්චං උප්පජ්ජති, තස්ස සමුදය සච්චං නිරුජ්ඣතීති, නො **යස්ස වා පන නො**'' (අනුලෝමයෙහි ප්‍රතිෂෙධ විසර්ජනාවමැයි.) ''යස්ස දුක්ඛ සච්චං නුප්පජ්ජති, තස්ස සමුදය සච්චං න නිරුජ්ඣතීති, තණ්හාය භංගක්ඛණෙ තෙසං, සබ්බෙසං චවන්තානං, පවත්තෙ තණ්හාවිප්පයුත්ත චිත්තස්ස භංක්කඛණෙ අරූපෙ මග්ගස්සච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං **යස්ස වා පන** – සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, තෙසං''

**අනුලෝමඅභිධෙය්‍ය** ලොභමූලසිත් (8) අටය, චෛතසික (22) දෙවිස්සය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී පෘථග්ජනයන් (4) සිවුදෙනාය, යටඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙන, යන මොවුහු ගනු ලැබෙති. චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපයෝය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී සියලුම චුතවන පෘථග්ජනයන් (4) සිවුදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා තෘෂ්ණා විප්‍රයුක්ත වූ සිත් (81) එක් අසූවය, ලෝභ-දිට්ඨි – මාන වර්ජිත චෛතසික (49) එකුන් පණසය, චිත්තජ රූපය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී පෘථග්ජනයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය, අරූප භූමියෙහි උඩ මාර්ග (3) තුනය ඵලසිත් (4) සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී උඩ මාර්ගස්ථ (3) තිදෙනාය, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (3-7-4) තුන- සත- සතර බැගිනි. ප්‍රථම ජීවිත නවක රූප කලාපය මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී සියලුම උපදමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය: ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය ද මීට වෙනසක් ම නැත. ''මග්ගස්ස භංගක්ඛණෙ තෙසං'' දුක්ඛ මූල සමුදය මූලි වාරය ඇසුරෙන් කියනු මාර්ගයාගේ භංගක්ෂණ යයි මාරු කිරීමම විශේෂයි.)

**සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි** – ''මග්ගස්ස භංගක්ඛණෙ තෙසං තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, මග්ග විප්ප යුත්ත චිත්තස්ස භංගක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං **යස්ස වා පන** තණ්හාය

උප්පාදක්ඛණෙ නෙසං'' **අනුලෝම අභිධෙය්‍ය** - මාර්ග සිත් (4) සතරය, චෛතසික (36) සතිසය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනා ගනු ලැබෙති. තෘෂ්ණා විප්‍රයුක්ත සිත් (81) එක් අසූවය, චෛතසික (49) එකුන් පණසය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී පෘථග්ජනයන් (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය, මාර්ග විප්‍රයුක්ත සිත් (85) පස් අසූවය, චෛතසික (52) දෙපණසය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාය, නිරෝධ සමාපත්තියට සමවන් අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය, අසඤ්ඤසත්වයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේ ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** ලෝභමූල සිත් (8) අටය, චෛතසික (22) දෙවිස්සය මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

පුද්ගල වාරය නිමි. **පුද්ගලෝකාස වාරයෙහි** (නිරෝධ සමාපත්තිය අත්හැර කියනු. භූමීන්හි ද නය ක්‍රමය සමානව නියම කරනු. අතීත වාරය ද සම්පූර්ණයෙන් ම සමානය.)

## අනාගත පුද්ගලවාරය

## දුක්ඛ සත්‍ය මූලය

**අනාගත වාරයෙහි දුක්ඛ සත්‍ය මූල සමුදය සත්‍ය මූලියෙහි** - (විභංගය උත්පාද වාරයට සමානය.) **අනුලෝම අභිධෙය්‍ය** - අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව චෝදනා චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය, තෘෂ්ණාවක් නොඉපදී සතර මාර්ගය ලැබීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම තෘෂ්ණාවගේ භංගක්ෂණයේ පටන් අර්හත් මාර්ග යට පූර්ව වූ චෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න - පෙ - සකදාගාමී - පෙ - **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේනම් අන්තිම තෘෂ්ණාවගේ භංගක්ෂණයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

තෘෂ්ණාව නො ඉපද සතර මාර්ගය ලැබීමට නියත වූවෙක් වේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, සෝතාපන්න – පෙ – සකදගාමී – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය පෘථග්ජන (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සතර මාර්ගය ලැබීමට නියත නොවූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේම ගනු ලැබේ. (මේ සංසය වනාහි නිරෝධ වාරයට සම්පූර්ණයෙන් සමානය. **ප්‍රත්‍යනික** අභිධෙය්‍ය ''පච්ඡිම චිත්ත සමංගීනං'' උත්පාද වාරයට සමානය)

**දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලි** – (පාළි විභංගය නිරෝධ වාරයට සමානය) **අනුලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඊ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී ඵලස්ථ ආයඊ පුද්ගලයෝය, මාර්ග නොලබන අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඊ පුද්ගලයෝය, අර්හත් පුද්ගලයෝය, අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙරසේම ගනු ලැබේ. (**ප්‍රත්‍යනික** අභිධෙය්‍ය ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං'' උත්පාද වාරය මෙනි.)

සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලි (විභංගය ද නිරෝධ වාරය මෙනි.) **අනුලෝම අභිධෙය්‍ය** මාර්ග ලැබීමට නියත නොවූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. තෘෂ්ණාවක් නො ඉපදී සතර මාර්ගය ලබන කෙනෙක් වේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ ආනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපන්න – පෙ – සකදගාමී – පෙ – අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාවක් උපදින්නේ නම් අනාදිමත් සංසාරයෙහි පටන් අන්තිම තෘෂ්ණාවගේ අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. (අනුලෝමය උත්පාද වාරයට සමානය) **ප්‍රතිලෝම** අභිධෙය්‍ය අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඊ පුද්ගලයෝය, (සෙස්ස උත්පාද වාරය අනුවකියනු.) ප්‍රත්‍යනික අභිධෙය්‍ය අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං තෙසං'' (නිරෝධ වාරය මෙනි.)

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි)

## පුද්ගලෝකාස වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි දුක්ඛ සත්‍ය මූල සමුදය සත්‍ය මූලියෙහි** (විභංගය වනාහි උත්පාද වාර විභංගයට සමානය.) **අනුලෝම අභිධෙය්‍ය** – 'අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, (නිරෝධ වාරයෙහි පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාය, මෙහි වනාහි පූර්වානන්තර චිත්තය දක්වාය, මෙපමණක්ම විශේෂ වේ. සෙසු සන්නිට්ඨාන සංසය අභිධෙය්‍ය සියල්ල නිරෝධ වාරය අනුව උදුරනු.) – **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං තත්ථ'' (උත්පාද වාර අවසේසය අනුව ඒකාන්ත – අනේකාන්ත ස්වරූප උදුරනු.)

**දුක්ඛසත්‍ය මූල මාර්ග සත්‍ය මූලිය** – (විභංගය වනාහි නිරෝධවාර විභංගයට සමානය.) අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත **පඤ්චවෝකාර** භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ ක්ෂණත්‍රය සමංගී අභව්‍ය සුගති අහේතුක – ද්විහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය,

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්මභාවයේදීම යට මාර්ග ලබා අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගක්ෂණයේ පටන් චුතිය දකවාද නූපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගක්ෂණයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ කෂණත්‍රය සමංගී යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්ව ආත්මභාවයේදී ම යට මාර්ග ලබා අන් භවයකදී උඩමාර්ග ලබා පිරිනිවීමට නියත පුද්ගලයන් අතුරෙන්මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද, නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී

යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපභූමි (9) නවය, අන් භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග නොලබන පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර - චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය ක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9)නවයය, සුදස්සී තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි 4 සතරය, අසංඥතලයෙහි උපදින-චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලය යන මේ භූමි ගනු ලැබෙති. (සංසය අභිධෙය්‍ය නිරෝධ වාරයට සමානය, නිරෝධ වාරය අනුව කියනු. **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං තත්ථ'', උත්පාද වාරය අනුව ස්වරූප උද්ධරනු.)

## සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලී වාරය

සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි (විභංග පාළිය නිරෝධ වාරයට සමානය.) **අනුලෝම අභිධෙය්‍ය** ''අපායිකානං, යෙ ච පුථුජ්ජනා මග්ගං නපටිලභිස්සන්ති, (ඒකාන්තය, උත්පාද වාරය අනුව උද්ධරනු.) අනේකාන්තයෙහි තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේදීම යටමාර්ග ලබා අන්භවයකදී උඩමාර්ග ලබා පිරිනිවීමට නියත - පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගයේ පටන් චුතිය දක්වා ද නූපදින පුද්ගලයන්ගේ මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම්, අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වාන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්වාත්මභාවයේදී ම යට මාර්ග ලබා සිට අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත පුද්ගලයන් අතුරෙන්, මේ භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද, නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ (පෙර සේ භූමි නියම කරනු) ...සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, අන් භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට අනියත වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු

නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය. සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, සුදස්සී දක්වා සුද්ධාවාස භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්මභාවයේදී මාර්ග නොලබා පසු ආත්මභාවයේදී ලැබීමට නියත වූද, මේ භවයේදී යටමාර්ග පමණක් ලබා පසු භවයක දී උඩ මාර්ග ලැබීමට නියත වූද, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය කාම සුගති භූමි (7) සතය, වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය,

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්මභාවයේදී ම මාර්ග ලැබීමට නියත වූ පුද්ගලයන් අතුරෙන් මේ භූමියෙහි මතු නැවත උපදින්නා වූ ද, නූපදින පුද්ගලයන් අතුරෙන් මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයෝ ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම තෘෂ්ණාවගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය. යටඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය**, අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ කෂණත්‍රය සමංගී අනාගාමී මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝය, තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්මභාවයේදීම මාර්ග ලැබීමට නියත වූ, මේ භූමියෙහි ද නැවත නූපදීමට නියත වූ පුද්ගලයන් අතුරෙන් මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම්, අන්තිම තෘෂ්ණාවගේ පටන් අන්තිමට ලැබූ මාර්ග චිත්තයාගේ උත්පාදය දක්වා ද අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයට පූර්වානන්තර වූ අනුලෝමය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය යන මේ භූමි ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** - පෙර සේම ගනු ලැබේ.

ප්‍රත්‍යනීක අභිධෙය්‍ය - "අග්ග මග්ගස්ස භඞ්ගක්ඛණෙ, අරහන්තානං, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ," අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඹී පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදිත චිත්තයන්ගේ ක්ෂණ ත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආයඹී පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, ("ආපායිකානං යෙව පුථුජ්ජනා" සෙස්ස උත්පාද වාරය අනුව උදුරනු)

**අනෝකාන්ත අභිධෙය්‍ය** තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්මභාවයේදී ම යට මාර්ග ලබා අන් භවයක දී උඩමාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇති, මේ භවයෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් මාර්ග ලැබීමෙන් පසු තෘෂ්ණාව උපදින කෙනෙක් වේ නම් අන්තිමට ලැබූ මාර්ගයාගේ භංගයේ පටන් චුතිය දක්වාද, උපදින කෙනෙක් වේ නම් අන්තිම තෘෂ්ණාවේ පටන් චුතිය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණ ත්‍රය සමංගී යට මාර්ගස්ථ (3) තිදෙනය, යට ඵලස්ථ (3) තිදෙනාය,

තමන් ඉපද සිටින භූමියෙහි පූර්වාත්මභාවයේදී ම යට මාර්ග ලබා අන් භවක දී උඩ මාර්ග ලබා පිරිනිවීම නියත කොට ඇති, මේ භූමියෙහි නැවත නූපදින පුද්ගලයෙක් වේ නම් අන්තිම තෘෂ්ණාවගේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී යට ඵලස්ථ ආයඹී පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය,

අන් භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ, මෙ භූමියෙහි ද මතු නැවත නූපදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම තෘෂ්ණාවේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ යට ඵලස්ථ ආයඹී පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, සුදස්සි තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, අසඤ්ඤතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය, යන මේ භූමි ගනු ලැබෙති. (උත්පාදවාර නිරෝධ වාර සියල්ල සමානය, වෙනසක් නැත. ස්වල්ප වෙනසක්ම ඇත. ඉපදීමට නියත වූ නිරුද්ධ වීමට නියත වූ, යන දෙක ද ඇතුළත් කොට ස්වරූප උදුරනු) අනාගත වාරය නිමි. (වර්තමානාතීත වාරය ද උත්පාද වර්තමානාතීත වාරය **සමඟ සමානය.**)

## වර්තමානානාගත පුද්ගල වාරය

## දුක්ඛ සත්‍ය මූලය

**වර්තමානානාගත වාරයෙහි** (උත්පාද වාරය මෙන් විභංගය කියනු) **අනුලෝම අභිධෙය්‍ය.** පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයඹී පුද්ගලයෝය, අර්හත් මාර්ග අනන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, අරූප භූමියෙහි අර්හත් ඵලය වර්ජිත, සුදුසු පරිදි උපදින

චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයඞ් පුදගලයෝය, අර්හත් මාර්ගයට පූර්වචෝදන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ය, තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ගය ලබන කෙනෙක් වේ නම්, අන්තිම තෘෂ්ණාවෙන් පසු තදාරම්මණ භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදනයට පූර්වානන්තරඅනුලෝමය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න – පෙ – සකදාගාමී – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම් අන්තිම තෘෂ්ණාවෙන් පසු තදාරම්මණ – භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

(උත්පාද වාරයට කියන ලද්දෙන්, ''අන්තිම තෘෂ්ණාවෙන් පසු තදාරම්මණ භවංගයේ පටන්'' කීම පමණක් වෙනසි, අන්තිම තෘෂ්ණාවේ පටන් යි කියන ලද අන්තිම වූ තෘෂ්ණාවගේ උත්පාදය, සමුදය සත්‍ය නිරුද්ධ වීමට යන බැවින් තදාරම්මණ භවංගයේ පටන් ස්වරූප උදුරනු ලැබේ.)

ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35), පන්තිසය, කර්මජ රූප කලාප (3–7–4–) තුන–සත–සතරය ප්‍රථම ජීවිත නවක රූප කලාපය, මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී සියලුම උපදිමින් සිටින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු-දෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ග ලබන්නෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්-පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපන්න – පෙ – සකදාගාමී –පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදනේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදයේ පටන් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, පශ්චිම භවිකයෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන් ගේඋත්පාදක්ෂණ සමංගී භව්‍ය වූද – අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙරසේම ගනු ලැබේ.

(උත්පාද වාරයට කියන ලද්ද අතුරෙන්, 'අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා' කියන ලද්ද පමණක් විශේෂයි. **ප්‍රතිලෝමයෙහි** උත්පාද වාරය අනුව උදුරනු. **ප්‍රත්‍යනීක සංසයෙහි** විභංගය හා ස්වරූප උත්පාද වාරය අනුව වේ. විශේෂයක් නොමැත.)

**දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලී විභංග අභිධෙය්‍ය** – ''අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ යෙ ච පුථුජ්ජනා මග්ගං නාපටිලභිස්සන්ති තෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස

චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ,යෙ චඤ්චඤ මග්ගං පටිලභිස්සන්ති තෙසං උප්පජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං **යස්ස වා පන** යස්ස **චිත්තස්ස** අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති – පෙ – (උත්පාද වාරය අනුව කියනු)

**අනුලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා අරූප භූමියෙහි අර්හත් ඵලය වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝය, මාර්ග ලැබීමට නියත නොවූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප කලාප (3–7–4) තුන–සත–සතරය ප්‍රථම ජීවිත නවක රූප කලාපය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්වචෝදනයාගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝය, මාර්ග ලැබීමට නියත වූ ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප (3–7–4) තුන – සත–සතරය, ජීවිත නවක කලාපය මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි මේ ආත්ම භාවයේදී මාර්ග නොලබා මතු අන් භවයකදී මාර්ග ලබන්නට නියත වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3)තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ භවයෙහිදී ම අර්හත් මාර්ගය ලබන්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන්අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝම අභිධෙය්‍ය** – අර්හත් මාර්ගයට පූර්වචෝදන චිත්තයාගේ භංගක්ෂණ සමංගී (උත්පාද වාරය අනුව ස්වරූප උදුරනු) අරූප භූමියෙහි යට ඵල (3) තුනය, උඩ මාර්ග (3) තුනය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ (3) තිදෙනාය, උඩ මාර්ගස්ථ (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (උත්පාද වාරයට වඩා ඇති වෙනස මෙපමණකි) **ප්‍රත්‍යනීක** අභිධෙය්‍ය ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ අග්ග ඵලස්ස උප්පාදක්ඛණෙ තෙසං''

අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, මාර්ග ලැබීමට නියත නොවූ චුති සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, අප්තිම-කර්මජරූපයෝ්ය, මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී අභව්‍ය පෘථග්ජනයෝ්ය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියේ පටන් චුතියගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී අභව්‍ය පෘථග්ජන පුද්ගලයන් (4) සිවු-දෙනාය, අරූප භූමියෙහි අර්හත් ඵලයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

## සමුදය මූල මාර්ග මූලිය

**සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය මූලි වාරයෙහි** විභංග ස්වරූප, ''යෙ පුථුජ්ජනා මග්ගංන පටිලභිස්සන්ති, තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං යෙ මග්ගං පටිලභි-ස්සන්ති තෙසං තණ්හාය උප්පාදක්ඛණෙ තෙසං **යස්ස වා පන** අග්ගමග්ගස්සඋප්පාද-ක්ඛණෙ, ය ස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති, යෙ **චඤ්ඤෙ** මග්ගං පටිලභිස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ, තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං'''

(අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය උත්පාද වාරය අනුව උදුරනු. වෙනසක් නැත.) **ප්‍රතිලෝම අභිධෙය්‍ය** අර්හත් මාර්ගයාගේඋත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයට පූර්වානන්තර අනුලෝමය දක්වා තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්ත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී භව්‍ය පෘථග්ජනයෝ්ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, නිරොධ සමාපත්තියට සමවැදුනාවූ අනාගාමී ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, අසංඥතලයෙහි උපදින චුතවන භව්‍ය සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ්ය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ. **ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, යෙ ච පුථුජ්ජනා මග්ගං නපටිලභි-ස්සන්ති තෙසං තණ්හාය භංගක්ඛණෙ තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ තෙසං'', අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, මාර්ග ලැබීමට නියත නොවූ, තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්තව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අභව්‍ය පෘථග්ජන (4) සිවුදෙනාය, නිරෝධ සමාපත්තියට සමවැදුනාවූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, අසංඥතල යෙහි උපදින් චුතවන අභව්‍ය සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ්ය. යන මේ පුද්ගල යෝ ගනු ලැබෙති.

පුද්ගල වාරය නිමි (ඕකාස වාරය සුගමයි)

## පුද්ගලෝකාස වාරය

# දුක්ඛ සත්‍ය මූලය

**පුද්ගලෝකාස වාරයෙහි** දුක්ඛ සත්‍ය මූල සමුදය සත්‍ය මූලි (විභංගය වනාහි උත්පාදවාරයට සමානය.) **අනුලෝම** අභිධෙය්‍ය, පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, අරූප භූමියෙහි අර්හත්ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයෑ පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයෑ පුද්ගලයෝය, තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ගය ලබන කෙනෙක් වේ නම්. අන්තිම තෘෂ්ණාවෙන් පසු තදරම්මණ භවංගයේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදනයට පූර්වානන්තර අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න – පෙ – සකදාගාමී – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාවක් උපදී නම්, අන්තිම තෘෂ්ණාවෙන් පසු තදරම්මණ භවංග පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා අරූප භූමියෙහි ඵලය වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයෑ පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය, ලෝභජවනයක් වේ නම්, **පඤ්චම** ජවනයෙන් පසු තදරම්මණ භවංගයේ පටන් චුතිය දක්වාද, දෝස මූල – මෝහමූල මහාකුසල ජවනයක් වේ නම්, අන්තිම තෘෂ්ණාවෙන් පසු තදරම්මණ භවංගයේ පටන් චුතිය දක්වාද, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍යවූද අභව්‍ය වූද පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය, අසඤ්ඤතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය, යන මේ භූමි ගනු ලැබෙති.

ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිසය, කර්මජ රූප (3–7–4) තුන-සත-සතරය මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදිමින් සිටින පෘථග්ජන (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්සය, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණාව නො ඉපදී මාර්ග සතර ලැබීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවේ උත්පාදය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ

සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝ්ය, සෝතාපන්න – පෙ – සකදාගාමී – පෙ – **අනාගාමී** වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝ්ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. (''අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වා'' කීමම උත්පාද වාරයට වඩා වෙනසයි අන්තිම තෘෂ්ණාවගේ උත්පාදක්ෂණය දක්වා සමුදය සත්‍යය නිරුද්ධ වීමම නියත වේ.)

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය ලෝභ ජවනයක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වා ද, දෝසමූල – මෝහමූල මහා කුසල ජවනයක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම තෘෂ්ණාවගේ උත්පාදය දක්වාද, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය වූද • අභව්‍ය වූ ද පෘථග්ජනයන් (4) සිවුදෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍යවූද – අභව්‍ය වූද පෘථග්ජනයෝ්ය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය, මේ භූමි ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

(ප්‍රතිලෝමයෙහි උත්පාද වාරය අනුව සමානමය.) තමන් ඉපද සිටින අරූප භූමියෙහි සමුද සත්‍ය නිරුද්ධ වීමට නියතවූ, යට මාර්ග යට මාර්ග ඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී සෝතාපන්න ඵලස්ථයෝ්ය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනය, මේ පුද්ගලයන්ගේ අරූපභූමි (4) සතරය. (මෙපමණක්ම වෙනයි. උත්පාද වාරයෙහි නොකියන ලද්ද කියනු ලැබේ. **ප්‍රත්‍යනීක සංසය** විභංගයද උත්පාද වාරයට සමානය, ස්වරූප ද උත්පාද වාරයට අනුව උදුරනු) අරූප භූමියෙහි අර්හත් මාර්ග අර්හත් ඵල ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ්ය, තමන් ඉපද සිටින අරූප භූමියෙහි සමුදය සත්‍ය නිරුද්ධ වීමට නියත නොවූ යට මාර්ග යට ඵලධර්මයන්ගේඋත්පාදක්ෂණ සමංගී සෝතාපත්ති ඵලස්ථයෝ්ය, මැද මාර්ගස්ථ (2) දෙදෙනාය, මැද ඵලස්ථ (2) දෙදෙනාය, මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (''නිරුද්ධ වීමට නියත නොවූ,'' කීම පණක් විශේෂයි)

දුක්ඛ සත්‍ය මූල මාර්ග සත්‍ය මූලියෙහි ''අරහන්තානං චිත්තස්ස උප්පාදක්ඛණෙ යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං උප්පජ්ජන්තානං, පවතෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තං උපජ්ජන්තා නං තෙසං තත්ථ, (මෙතැන ''අපායං'' කියාද පාඨයක් ඇත.) අග්ග මග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, යෙවඤ්යඤ මග්ගං පටිලභිස්සන්ති තෙසං උපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ'', (ප්‍රතිලෝම විභංගය උත්පාදයට සමානය) **අනුලෝම අභිධෙය්‍ය** - අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා, අරූප භූමියෙහි අර්හත් ඵල වර්ජිත, සුදුසු පරිදි උපදිනා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ ප්‍රතිසන්ධි සිත් (3-7-4) තුන-සත-සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින භව්‍ය වූද අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය වූ ද - අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය,

තමන් ඉපද සිටින භූමියෙහි මේ ආත්ම භාවයේදීම යට මාර්ග ලබා අන් භවයෙක්හි උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිමට ලැබූ මාර්ගානන්තර ඵලයේ පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි පූර්වාත්මභාවයෙහි දීම යට මාර්ග ලබා අන් භවයකදී උඩ මාර්ග ලබා පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා, අරූප භූමියේ ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා, රූප භූමි (9) නවයය, අන් භූමියකදීම යට මාර්ග ලබා තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත නොවූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු චුතිය දක්වා අරූප භූමියෙහි ඵල වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ ආකිඤ්චඤ්ඤායතනය දක්වා අරූප භූමි (3) තුනය, කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, සුදස්සී තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය, යන මේ භූමි ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් මාර්ගස්ථ ආයතී පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්වචෝදන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී අනාගාමී ඵලස්ථ ආයතී පුද්ගලයෝය, තමන් ඉපද සිටින භූමියෙහි මාර්ග ලැබීමට නියත වූ දුගති අහේතුක ප්‍රතිසන්ධි වර්ජිත ප්‍රතිසන්ධි සිත් (18) අටළොස, චෛතසික (35) පන්තිස, කර්මජ රූප (3-7-4) තුන-සත-සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය, මේ පුද්ගලයන් චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, ප්‍රවෘත්ති කාලයෙහි තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැවිහි මාර්ග නොලබා පසු අත් බවකදී ලැබීමට නියත වූද, මේ භවයේ දී යට මාර්ග පමණක් ලබා පසු භවයේදී උඩමාර්ග ලැබීමට නියත වූද, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය සුගති අහේතුක - ද්විහේතුක - ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය, තමන් ඉපද සිටින භූමියෙහි මේ අත් බැවිහිම මාර්ග ලැබීමට නියත වූවෙක් නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිමට ලැබූ මාර්ගයාගේ උත්පාදක්ෂණය දක්වා ද, අර්හත් මාර්ගයාගේ පූර්වචෝදනයට පූර්වානන්තර අනුලෝමය දක්වා, අරූප භූමියෙහි මාර්ග ඵල වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, යන මේ භූමිද ගනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන අභිධෙය්‍ය** (උත්පාද වාරය අනුව උදුරනු) තමන් ඉපද සිටින අරූප භූමියෙහි මාර්ග සත්‍යය නිරුද්ධ වීමට නියත වූ යටඵල-උඩ මාර්ග ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ (3) තිදෙනාය, උඩ මාර්ගස්ථ (3) තිදෙනාය, යන මේ පුද්ගලයන් ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (මෙපමණක් ම විශේෂයි) **ප්‍රත්‍යනික අභිධෙය්‍ය** - ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං චිත්තස්ස භංගක්ඛණෙ, යෙ ච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ අග්ගඵලස්ස ච උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ''

**අනුලෝම අභිධෙය්‍ය** - (උත්පාදවාරය අනුව උදුරනු) අරූප භූමියෙහි අර්හත් ඵලයාගේ උත්පාදක්ෂණ සමංගී අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයෝය, තමන් ඉපද සිටින අරූප භූමියෙහි මාර්ග සත්‍ය නිරුද්ධ වීමට නියත නොවූ යට ඵල ධර්ම (3) තුනෙහි උත්පාදක්ෂණ සමංගී යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරය, (විශේෂය මෙපමණකි. මාර්ගස්ථ පුද්ගලයාගේ මාර්ගයාගේ උත්පාදක්ෂණයෙහි නිරෝධයට යාම නියත වන බැවින් මාර්ගස්ථ පුද්ගලයෝ නො ගනු ලැබෙති.)

**සමුදය සත්‍ය මූල මාර්ග සත්‍ය** මූලියෙහි විභංගය වනාහි අනුලෝම උත්පාදයට සමානය. ප්‍රතිලෝමයෙහි ''අග්ග මග්ග ස්ස උප්පාදක්ඛණෙ'' මෙපමණක්ම උත්පාදයට වඩා විශේෂ වේ. අනුලෝමයෙහි ස්වරූප උත්පාදය අනුව උදුරනු වෙනසක් නැත. ප්‍රතිලෝමයෙහි නිරෝධ වාරයෙහි ස්වරූප අනුව ඒ අතුරෙන් ''තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්ත වූ, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය'' යයි කීම පමණක් විශේෂයි)

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය** – ''අග්ග මග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, යෙච පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති – තෙසං තණ්හාය භංගක්ඛණෙ, තණ්හා විප්පයුත්ත චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' (නිරෝධවාර ප්‍රත්‍යනීකය අනුව ස්වරූප උදුරනු ''තෘෂ්ණාවගේ භංගක්ෂණ සමංගී, තෘෂ්ණා විප්‍රයුක්ත වූ සුදුසු පරිදි උපදින'' කීමම විශේෂයි.)

වර්තමානානාගත වාරය නිමි. අතීතානාගත වාරයද නිරෝධවාර අතීතානාගත වාරය හා සමානය.

ප්‍රවෘත්ති වාරය නිමි.

---

## පරිඥා වාරය

ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදරා අනතුරුව පරිඥාවාරය වදාළ සේක. ඒ පරිඥාවාරය ද, (පෙර ස්කන්ධ යමකයෙහි මෙන් වර්තමාන වාරාදිය බෙද කියනු.) ඒ වර්තමාන වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදාළ සේක. ඒ අනුලෝමය ද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමුකොට වදාළ සේක. ඒ අනුලෝමය ද පුච්ඡාවිස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදාළ සේක. ඒ පුච්ඡාවද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, යො දුක්ඛ සච්චං පරිජානාති, යනුවෙනි, ඉන් අනතුරුව සංසය වදාළ සේක, කෙසේ වදාළ සේක් ද යත්, සො සමුදය සච්චං පජාහති යනුවෙනි. පුච්ඡාව වදරා අනතුරුව විස්සජ්ජනාව වදාළ සේක. කෙසේ වදාළ සේක් ද යත්, ආමන්තා, යනු වෙනි. පජහති – ප්‍රහාණය කරමින් සිටීද (අර්ථ කියනු) අනුලෝමය වදරා අනතුරුව ප්‍රතිලෝමය වදාළ සේක. (පෙර සේ කියනු) **අනුලෝම** අභිධෙය්‍ය අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි ද නය ක්‍රමය සමානය.

(අතීත වාරයෙහි ''පරිජානිත්ථ' පජහිත්ථ', අනාගත වාරයෙහි 'පරිජානිස්සති' පජහිස්සති', මේ ආදී වශයෙන් කියනු. ස්කන්ධ යමකයෙහි කියන ලද ආකාරයට කියනු. මේ සත්‍ය යමක යෙහි දුක්ඛ සත්‍ය මූල සමුදය සත්‍ය මූලි යමක එකක් පමණක්ම ගනු ලැබේ. ස්කන්ධ යමක ආදියෙහි රූපස්කන්ධ මූල ආදියට සම්බන්ධ කොට වේදනාස්කන්ධ ආදී සියල්ල කියන ලද සේ මේ සත්‍ය යමකයෙහි දුක්ඛ සත්‍ය මූලයට සම්බන්ධ කොට සියලුම සත්‍ය නොකියනු ලැබේති. සමුදය මූලි එක පමණක්ම කියන ලද්දේ කවර හෙයින් ද යත්, නිරෝධ සත්‍ය මාර්ග සත්‍ය දෙක ලෝකෝත්තර ධර්ම බැවිනි. ඒ ලෝකෝත්තර ධර්ම විදර්ශනා කිරීම් වශයෙන් පිරිසිඳීමට නොගනු ලැබේති. දුක්ඛ සත්‍ය - සමුදය සත්‍ය දෙක ලෞකික ධර්ම බැවින් පිරිසිඳ අවබෝධ කටයුතු පරිඥ කෘත්‍ය ඇති ඒ සත්‍ය දෙක පමණක් වදරා ඇති බැවින් සමුදය මූලි වාරය පමණක් ගනු ලැබේ.

ඒ නිසා අට්ඨකථාවෙහි, ''යස්මාච ලොකුත්තර ධම්මෙ සු පරිඤ්ඤා නාම නත්ථි තස්මාඉධ ද්වේසච්චානි ගහිතානි, තත්ථ දුක්ඛ සච්චං පරිජානාතීති ඤාතතීරණ පරිඤ්ඤා වසෙන වුත්තං, සමුදය සච්චං පජහතීති ඤානපහාන පරිඤ්ඤාවසෙන, ඉති ඉමාසංපරිඤ්ඤානං වසෙන සබ්බ පදෙසු අත්ථො වෙදිතබ්බො''යි කියන ලදී.

පරිඥ වාරය නිමි

සත්‍ය යමක.වාචනා මාර්ගය නිමියේය.

# 6. සංස්කාර යමකය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## ප්‍රඥප්තිවාර උද්දේශය

සත්‍ය යමකය දේශනා කොට වදරා අනතුරුව සංස්කාර යමකය වදළ සේක. ඒ සංස්කාර යමකය ද ප්‍රඥප්තිවාර, ප්‍රවෘත්තිවාර, පරිඥාවාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් ප්‍රඥප්තිවාරය පළමුකොට වදළ සේක. ඒ ප්‍රඥප්ති වාරය ද උද්දේස – නිද්දේස වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේශය පළමුකොට වදළ සේක. ඒ උද්දේශය ද පරිච්ඡෙදවාර, පරිච්ඡින්නුද්දේසවාර, විභාග වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. නොහොත්, සංස්කාරෝද්දේශ වාරය, නාම ව්‍යවස්ථාපන වාරය, ස්වරූප කථන වාරය, නය වාරය වශයෙන් සිව්වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් සංස්කාරෝද්දේශය පළමු කොට වදළ සේක. **කෙසේ වදළ සේක්ද යත්,** ''තයො සංඛාරා'' යනුවෙනි. ඉන් අනතුරුව නාම ව්‍යවස්ථාපනය වදළ සේක. **කෙසේ වදළසේක් ද යත්**, ''කායසංඛාරො, වචීසංඛාරො, චිත්ත–සංඛාරො'' යනුවෙනි.

සංඛාරා - සංස්කාරයෝ; තයො - තුන් දෙනෙක්; හොන්ති · වෙති. කාය-සංඛාරො - කාය සංස්කාරයද; වචීසංඛාරො - වචී සංස්කාරයද; චිත්තසංඛාරො - චිත්ත සංස්කාරය ද, යන, ඉති ඉමෙ – මේ තිදෙන වෙති. නොහොත්, කායසංඛාරො ච - කාය සංස්කාරය ද; වචීසංඛාරො ච- වචී සංස්කාරය ද; චිත්තසංඛාරොච - චිත්ත සංස්කාරය ද; කියා, ඉති- මෙසේ; තයො – තුන් දෙනෙක්; සංඛාරා - සංස්කාරයෝ නම් වෙති.

ඉන් අනතුරුව ස්වරූප කථන වාරය වදළ සේක. ඒ ස්වරූප කථනයද, කාය සංස්කාරයාගේ ස්වරූප කථන වාරය, වචී සංස්කාරයාගේ ස්වරූප කථන වාරය, චිත්ත සංස්කාරයාගේ ස්වරූප කථන වාරය වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් කාය සංස්කාරයාගේ ස්වරූප කථන වාරය පළමු කොට වදළ සේක. **කෙසේ වදළ සේක්ද යත්** ''අස්සාස පස්සාසා කායසංඛාරො'' යනුවෙනි. ඉන් අනතුරුව වචීසංස්කාර ස්වරූප කථන වාරය වදළ සේක. **කෙසේ වදළ සේක්ද යත්** විතක්ක – විචාරා වචීසංඛාරො යනුවෙනි. ඉන් අනතුරුව චිත්ත සංඛාර සවරූප කථනය වදළ සේක. **කෙසේ වදළ සේක්ද යත්**

''සඤ්ඤාච වෙදනා ච චිත්තසංඛාරො, ඨපෙත්වා විතක්ක විචාරෙ සබ්බෙපි චිත්ත සම්පයුත්තකා ධම්මා චිත්ත සංඛාරො' යනුවෙනි.

අස්සාස-පස්සාසා - ආශ්වාස ප්‍රශ්වාසයෝ ; කායසංඛාරො - කාය සංස්කාර නම්.

[අස්සාස - පස්සාස යනු කායසංස්කාරයෙහි සඤ්ඤී නාමී සමානත්වයයි. කාය සංඛාරො, යනු සඤ්ඤා නාම ලිංග සමානත්වය යි. මෙහි නාමී - ලිංග සමානත්වය දක්වයි. නොහොත්, අස්සාස - පස්සාසා - ආශ්වාස ප්‍රශ්වාසයෝ; කායසංඛාරො - කායසංස්කාර නම්; හොති - වේ. හොති - යන්නෙහි සඤ්ඤා සඤ්ඤී සමානත්වය ලැබේ. පශ්චාත් කතෘම ප්‍රධාන වී හොති ක්‍රියාව ලොපය වේ.]

විතක්ක - විචාරා - විතර්ක විචාරයෝ; වචීසංඛාරො - වචීසංස්කාර නම්. සඤ්ඤා ච - සංඥාව ද; වෙදනා ච - වේදනාවද; චිත්තසංඛාරො - චිත්ත සංස්කාර නම්. විතක්ක-විචාරෙ - විතර්ක විචාරයන්; ඨපෙත්වා - හැර, සබ්බෙ - සියලු, චිත්තසම්ප යුත්තකා - සිත හා මිශ්‍ර වූ, ධම්මා - ධර්මයෝ ද, චිත්තසඞ්ඛාරො - චිත්තසංස්කාර නම් වේ.

අදහස:— කාය සංස්කාර කියනුයේ, චතුසමුට්ඨානික රූපය නම් වූ කරජ කායයා ගේ නිස්සන්ද ඵලය නම් වූ ආශ්වාස ප්‍රශ්වාස යයි කියන ලද චිත්තජ වායෝ ධාතු රූපය යි.

[''සංකරීයතෙති සංඛාරො'': යො සභාවො - යම් ස්වභාව ධර්මයක්, කායෙන කරජකය විසින්, සංඛරීයතෙ - සකස්කරනු ලැබේද, ඉති තස්මා - එහෙයින්, සො සභාවො - ඒ ස්වභාව ධර්මය, සංඛාරො - සංස්කාර නම්. 'සඞ්ඛාරො' - යනු කර්ම-සාධන කිතක පදයකි. ''සංස්කරීයතෙ' - යනු කර්මසාධන කිතක පද විග්‍රහය යි. සං-පූර්ව කර ධාතු යි, ණ-ප්‍රත්‍යයි. සං-පූර්ව කර-ධාතු අර්ථයෙහි නිපන් කතෘස්ථ ක්‍රියාව වනාහි චතුසමුට්ඨානික රූපය යි කියන ලද, හේතු ධර්මය වූ කරජ කායයාගේ උපත ප්‍රධාන වශයෙන් ගනු ලැබේ. කර්මස්ථ ක්‍රියාව වනාහි කරජ කායයාගේ නිස්සන්ද ඵලය වූ ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ උපත, කාරණූපචාරාර්ථ වශයෙන් ගනු ලැබේ. ණ - ප්‍රත්‍යයාගේ අර්ථය වනාහි, ඒ කාරණූපචාරාර්ථ වශයෙන් දන්නා ලද උත්පාද-වන්ත වූ ආශ්වාස ප්‍රශ්වාස නම් වූ චිත්තජ වායෝ ධාතුව ගනු ලැබේ.

''කායෙන සංඛාරො - කායසංඛාරො'': - කායෙන - කරජකය විසින්, සංඛාරො - සකස් කරන ලද්දේ, කායසංඛාරො - කාය සංස්කාර නම්, කරජකය විසින් සකස් කරන ලද්දයි. 'කායසංඛාරො' - යනු තතියා තත්පුරුෂ සමාසයයි. කායෙන සංඛාරො'යනු තතියා තත්පුරුෂ සමාස පද විග්‍රහයයි. 'කාය - සංඛාර' - යනු පදයි. කායසඞ්ඛාර පදයාගේ අභිධෙයාර්ථය වනාහි කරජ කායයාගේ නිස්සන්ද ඵලය වූ ආශ්වාස ප්‍රශ්වාස යයි කියන ලද චිත්තජ වායො ධාතුව ගනු ලැබේ.]

ඒ කාය සංස්කාරය වනාහි :—

(1) භූමි වශයෙන් රූපභූමි අරූපභූමීන්හි නොලැබේ. කාමභූමි (11) එකොළ-සෙහි පමණක් ලැබේ.

(2) ධ්‍යාන වශයෙන් වනාහි ප්‍රථමධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන යන්හි ලැබේ. චතුර්ථ ධ්‍යානයෙහි නොලැබේ.

(3) චිත්තොත්පාද වශයෙන් වනාහි දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය ද චුති-ප්‍රතිසන්ධි සිත් ද හැර කාම සිත් (44) සුසාලිසෙහි ම ලැබේ.

(4) පුද්ගලයන් වශයෙන් වනාහි, මවු කුසෙහි වෙසෙන පුද්ගලයෝ ය, මරණයට පත් වූ අය ය, නිරෝධ සමාපත්තියට සමවැදුනා වූ අනාගාමී රහත් ආර්‍ය්‍යයෝය, චතුර්ථ ධ්‍යානයට සමවැදනා වූ කාමාවචර පුද්ගලයෝය, රූපී බඹලොව උපන් බ්‍රහ්මයෝය, අරූපී බ්‍රහ්මයෝය, දිය යට සිටිනා අයය, මූර්ජාවට පත්වූවෝ ය, යන මේ පුද්ගලයන් (8) අට දෙනාට නොලැබේ. බලවත් අරමුණු ඇති කාමාවචර පුද්ගල-යන්ටම ලැබේ.

[මූර්ජා කාලය යනු දියෙහි වැටීම, ගසෙන් වැටීම, වෙඩි වැදීම ආදියෙන් සිහිසන් නැති වූ කාලය යි. ප්‍රශ්වාසයාගේ මූල නාභිය ය, මැද පපුව ය, අග නාසිකාවය. ආශ්වාසයාගේ මූල නාසිකාවයි, මැද පපුවය අග නාභිය යි. ('විසුද්ධි මග්ග') පැයක් තුලදී ආශ්වාස වාර (360) තුන්සිය සැටකි, ප්‍රශ්වාස (360) තුන්සිය සැටකි, සමූහය (720) සත්සිය විස්සකි, එක් දිනක දී ආශ්වාස ප්‍රශ්වාස වාර (43,200) හතලිස් තුන් දහස් දෙසීයකි.]

**වචීසංඛාර** යනු වචනයට හේතු වූ විතර්ක විචාරයෝ ය.

ඒ වචී සංස්කාරය :—

(1) භූමි වශයෙන් අසංඥ තලය හැර සියලු භූමීන්හි ලැබේ.

(2) ධ්‍යාන වශයෙන් වනාහි මූලභූත වූ ප්‍රථම ධ්‍යානයෙහි පමණක්ම ලැබේ.

(3) චිත්තෝත්පාද වශයෙන් වනාහි දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත කාම සිත් (44) සුසාලිසෙහි ම ලැබේ.

(4) පුද්ගලයන් වශයෙන් වනාහි අසඤ්ඤසත්ව පුද්ගලයෝය, නිරෝධ සමා-පත්තියට සමවැදුනා වූ අනාගාමී රහත් ආර්‍ය්‍ය පුද්ගලයෝය, මරණයට පත් වූවෝය යන මොවුන් හැර සියලු පුද්ගලයන්ට ලැබේ.

(''සංඛරොතීති සංඛාරො'': යො සභාවො - යම් ස්වභාව ධර්මයක් හෙමේ; වචියා - වාග්භෙද ශබ්දය; සංඛරොති - සකස් කෙරෙයි ද; ඉති තස්මා - එහිසා; සො සභාවො - ඒ ස්වභාව ධර්මය; සංඛාරො - සංස්කාර නම්. 'සංඛාරො' - යනු කර්තෘ සාධන කිතක පදයකි: 'සංඛරොති' - යනු කර්තෘ සාධන කිතක විග්‍රහය යි. සං- පූර්ව,

කර-ධාතුව යි. 'ණ'-ප්‍රත්‍යයි, සං-පූර්ව කර - ධාතුහුගේ අර්ථය වශයෙන් විතර්ක විචාර යන්ගේ සහජාතාදී ප්‍රත්‍ය ශක්තිය ලැබේ. ණ-ප්‍රත්‍යයගේ අර්ථය වශයෙන්, ඒ ශක්ති විශේෂයෙන් දන්නා ලද ශක්තිමන්ත නම් වූ විතර්ක විචාරයෝ ලැබෙති. වචීයා - වාග්භෙද ශබ්දයාගේ; සංඛාරො - සකස් කරන්නාහු යි; වචීසංඛාරො - වාග්භෙද ශබ්දය සකස්කරන්නා නම්. 'වචීසංඛාරො' - යනු ද්‍විතියා තත්පුරිස සමාස පදයි. 'වචීයා' - සංඛාරො' - යනු සමාස පද විග්‍රහයි. 'වචී' - 'සංඛාර' - යනු පද යි. 'වචී සංඛාරො' යන සමාස පදයාගේ අභිධෙයාාර්ථ වශයෙන් විතර්ක විචාරයෝ ලැබෙති.]

**චිත්තසංඛාරො** යනු විතර්ක විචාර වර්ජිත අවශේෂ චෛතසික (50) සම පණස වෙති.

[''සංඛරියතෙති සංඛාරො'': යො සභාවො - යම් ස්වභාව ධර්මයක්; චිත්තෙන සිතින්; සංකරියති - සකස්කරනු ලැබේද ; ඉති තස්මා - එහෙයින්; ඒ ස්වභාව ධර්මය; සංඛාරො - සංස්කාර නම්. 'සංඛාරො' - යනු කර්ම සාධන කිතක පදයකි; 'සංකරියතෙ' - යනු කර්ම සාධන කිතක විග්‍රහය යි. සං--පූර්ව කර--ධාතු යි, ණ-ප්‍රත්‍ය යි. සං--පූර්වකර - ධාතුහුගේ අර්ථයෙහි කර්‍තෘ අර්ථ ක්‍රියාවගේ අභිධෙය්‍ය වශයෙන්, සියලුම චිත්තයන්ගේ උත්පාදය ප්‍රධාන වශයෙන් ගනු ලැබේ. කර්මාර්ථ ක්‍රියාවට වනාහි විතර්ක විචාර වර්ජිත (50) සම- පණස් චෛතසිකයන්ගේ උත්පාදය කාරණූපචාරාර්ථ වශයෙන් ලැබේ. ණ- ප්‍රත්‍යයාගේ අභිධෙය්‍ය වශයෙන් ඒ කාරණූපචාරාර්ථ වශයෙන් දන්නා ලද උත්පාද වන්ත නම් වූ (50) සමපණස් චෛතසිකයෝ ලැබෙති. ''චිත්තෙන සංඛාරො - චිත්ත- සංඛාරො'': චිත්තෙන - සිත විසින්; සඞ්ඛාරො - සකස්කරන ලද නුයි, චිත්තසංඛාරො - චිත්ත සංස්කාර නම්. සිතින් සකස් කරන ලද් දයි. 'චිත්තසංඛාරො' - යනු තතියා තත්පුරුෂ සමාසයි. 'චිත්තෙන' - 'සංඛාරො' - යනු තතියා තත්පුරුෂ සමාස විග්‍රහයයි. 'චිත්ත' - 'සංඛාර' - යනු පදයි. 'චිත්ත සංඛාරො' යන සමාස පදයාගේ අභිධෙයාාර්ථ වශයෙන් විතර්ක විචාර වර්ජිත චෛතසිකයෝ (50) සම පණස ගනු ලැබෙති.]

ඒ චිත්ත සංස්කාරය වනාහි :—

(1) භූමි වශයෙන්, අසඤ්ඤසත්ව භූමිය හැර සෙසු සියලු භූමි (30) තිසෙහි ලැබේ.

(2) ධ්‍යාන වශයෙන් සියලුම ධ්‍යානයන්හි ලැබේ.

(3) චිත්තොත්පාද වශයෙන් වනාහි සියලු කාම සිත් (54) සූ-පණසෙහි ලැබේ.

(4) පුද්ගලයන්ගේ වශයෙන් වනාහි අසඤ්ඤසත්ව පුද්ගලයන්ද නිරෝධයට සමුවැදුනු අනාගාමී රහත් ආය්‍ය්‍ය පුද්ගලයන් ද, මරණයට පත්වූවන් ද හැර සෙසු සියලු පුද්ගලයන් කෙරෙහි ලැබේ.

[අනිකුත් යමකයන්හි ස්වරූප කථන වාරය නොකියා මේ සංස්කාර යමකයෙහි පමණක් ස්වරූප කථන වාරය කියන ලද්දේ කුමක් හෙයින් ද යත්:— ස්කන්ධාදිය වනාහි විභංගාදි වශයෙන් ග්‍රන්ථයෙහි ස්වරූප වෙන් කොට දේශනා කර ඇති බැවින් ස්වරූප අවබෝධ කිරීම පහසුය. මේ කාය සංස්කාරාදිය වනාහි පූර්වයෙහි ස්වරූප වදරා නැති බැවින් ස්වරූප අවබෝධ කර ගැනීමට නොහැකිය. ඒ නිසා මේ සංස්කාර යමකයෙහි ම ස්වරූප කථන වාරය වදරා ඇත. චිත්ත සංස්කාරය විතර්ක විචාර හැර චෛතසික (50) සම–පණස වෙති. එසේ නම් ''චිත්තසම්පයුත්තකා ධම්මා චිත්ත සංඛාරො''යයි වදළ බැවින් සඤ්ඤා-වේදනා දෙක ද **චිත්ත සම්ප්‍රයුක්තම** කොට ස්වරූප ගන්නාහු නොවෙද්ද; එසේ ස්වරූප ගන්නා හු නම්, සඤ්ඤා වේදනා දෙක කුමක් හෙයින් විශේෂ කොට වදරණ ලද්දහුද යත්:— වේදනා හා සඤ්ඤාව ස්කන්ධ වශයෙන් විශේෂයෙන් වෙන්ව වදළ බැවිනි. චිත්ත සංස්කාර යන නාමය සිත හා එකට යෙදෙන සියලු චෛතසිකයනට නමකි. එසේ නම් කුමක් හෙයින් ''ඨපෙත්වා විතක්ක විචාරෙ'' යයි වදරණ ලද්දේ ද යත්:— විතර්ක විචාරයන් වචීසංස්කාර වශයෙන් වෙනම ගන්නා ලද බැවින් ''ඨපෙත්වා විත්තකවිචාරෙ''යයි වෙන්ව වදරණ ලදී. එනිසා **අට්ඨකථාවෙහි** ''විතක්ක විචාරානං පන වචීසංඛාර භාවෙන විසුං ගහිතත්තා ඨපෙත්වා විතක්කවිචාරෙති වුත්තං''යි කියන ලදී.]

ස්වරූප කථන වාරය දේශනා කොට වදරා අනතුරුව නය වාරය වදළ සේක. ඒ නය වාරයද, පදසෝධන වාරය පදසෝධන මූලචක්‍රවාරය, (සුද්ධ සංස්කාර තැන්හි සම්බන්ධ වන බැවින් සුද්ධ සංස්කාර වාරය ද නම කොට) සුද්ධ සංස්කාර වාරය වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පදශෝධන වාරය පළමු කොට වදළ සේක. ඒ පදශෝධන වාරය ද අනුලෝම – ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමුකොට වදළ සේක. [මේ ආදී වශයෙන් පෙර කියන ලද යමක මෙන් කියනු.] මෙසේ සංස්කාර යමකයෙහි ප්‍රඥප්ති වාර උද්දේශයෙහි කුඩා වාර (3) තුනකි. නය (6) සයකි. යමක (24) සුවිස්සකි. පුච්ඡා (48) අට සාලිසකි. අර්ථ (96) සයානූවක් ද වෙති.

**අට්ඨ චත්තාලීස හොන්ති - පුච්ඡා සංඛාර යමකෙ**
**පණ්ණත්තිවාර උද්දෙසෙ - ඉති ඤෙයයා විභාවිනා**

---

## ප්‍රඥප්තිවාර නිර්දේශය

## 1. පදශෝධන වාරය

උද්දේශ වාරය දේශනා කොට වදරා අනතුරුව නිර්දේශ වාරය වදළ සේක. ඒ නිර්දේශ වාරය ද.... [පෙර සේ බෙද කියනු.] ''කායො කායසංඛාරොති, නො. කාය සංඛාරො කායොති, නො'' අනුලෝමයෙහි 'කායො' යන සන්නිවර්‍ගාන අභිධෙය්‍ය, චතුසමුට්ඨානික රූපයයි කියන ලද හේතුව වූ කරජ කය ගනු ලැබේ.

## කොටස් බෙද දැක්වීම

ඒ කරජකය හේතු ධර්මය වන බැවින් ඒ නම ලබයි. විපාක ඵල ධර්මය වූ කාය සංස්කාර නොවනබැවින් ''කායසංස්කාර'' යන සංසය පදයාගේ අභිධෙය්‍ය නොමැත. එසේ සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍ය ඇතිව, සංසය පදයාගේ අභිධෙය්‍ය නොමැති බැවින්, කාය නම් වූ ධර්මයට කාය සංස්කාර නම් වේද යි සර්වඥ සන්තානයෙහි විමති යක්නැති නමුත්, වේනෙය්‍යාධ්‍යාශය වශයෙන්, ප්‍රශ්න නාගා, ප්‍රශ්න ජාති සතර අතුරෙන් මෝඝ ප්‍රශ්න වශයෙන්, ප්‍රශ්නයට අනුරූපව, කාය නම් වූ ධර්මය කායසංස්කාර නම් නොවන බැවින්, සංසය පදයාගේ අභිධෙය්‍ය ප්‍රතික්ෂෙප කොට, පිළිතුරු පස අතුරෙන් ''නො'' යන ප්‍රතික්ෂෙධ විසඳුමෙන් පිළිතුරු වදරන ලදී. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, කරජ කායයාගේ නිස්සන්ද ඵලය වූ ආශ්වාස-ප්‍රශ්වාස යයි කියන ලද චිත්තජ වායො ධාතුව ගනු ලැබේ. [පෙර කොටස් බෙදූ ආකාරය බලනු.]

''වචී, වචීසංඛාරොති, නො; වචීසංඛාරො, වචීති, නො'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය -නිස්සන්ද ඵලය වූ වචීභෙද ශබ්දය ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන් නිට්ඨාන** අභිධෙය්‍ය, වාග්භෙද ශබ්දයාගේ හේතුව වූ විතර්ක විචාරයෝ ගනුලැබෙති.

''චිත්තං, චිත්තසංඛාරොති, නො; චිත්තසංඛාරො, චිත්තන්ති, නො'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය – හේතු ධර්මය වූ (89) එකුන් අනූ චිත්තය ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ඵල ධර්මය වූ විතර්ක විචාර වර්ජිත චෛතසිකයෝ (50) සමපණස ගනු ලැබෙති.

අනුලෝමය නිමි.

---

## ප්‍රත්‍යනීකය

''න කායො, න කායසංඛාරොති, කායසංඛාරො න කායො කායසංඛාරො, කායඤ්ච කායසංඛාර ඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව කායො නච කායසංඛාරො, න කායසංඛාරො න කායොති, කායො න කායසංඛාරො කායො, කාය ඤ්ච කායසඞ්ඛාර ඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව කායො නච කායසංඛාරො'' අනුලෝමයෙහි 'නකායෙෝ' යන සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ, කරජකායයාගේ නිස්සන් ද ඵලය වූ ආශ්වාස ප්‍රශ්වාස නම් වූ චිත්තජ වායෝ ධාතුව ගනු ලැබේ. කය ද කාය සංස්කාර ද හැර සිත් (89) එකුන් අනූව, චෛතසික (52) දෙපණස, රූප (28) අටවිස්ස, නිර්වාණය, ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ද එනු ලැබෙති. සංසය අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ.

[කාය යන්නෙහි අර්ථය චතුසමුට්ඨානික රූපය යි කියන ලද කරජකය නම් වේ. කුමක් හෙයින් කරජකය නම් වේ ද යත්: ''කරොති නිප්ඵාදෙති ති කරො, මාතාපිතුන්නං සුක්කසොණිතං'' කර-යන්නෙහි අර්ථය වනාහි මවුපියන්ගේ

ශුක්‍ර ශෝණිත යයි. ''කරෙන ජාතො කරජො''. කරෙන - මවුපියන්ගේ ශුක්‍ර ශෝණිතයෙන්; ජාතො - උපන්නේ තූ යි; කරජො - කරජ නම්. මවුපියන්ගේ ශුක්‍ර ශෝණිත හේතුවෙන් හටගත්තේ යන අර්ථයි. වචනාර්ථය මෙසේ හෙයින් කරජකය නම් වේ. මෙසේ වචනාර්ථ හා අසමාන වූ කරජකාය නොවූ රූප ද ඇති බැවින්, රූප අටවිස්ස 'නකාය-නකායසංඛාර'යෙහි අභිධෙය්‍ය කරන ලදී.

**තවද** මේ වචනාර්ථය නිදර්ශන උපලක්ෂණ නය අනුවගෙන කාම භූමියෙහි ආශ්වාස ප්‍රශ්වාස පවතින ආධ්‍යාත්මික චතුසමුට්ඨානික රූප සමූහය කය නම් වේ. ඒ, රූපයන් හැර, ආශ්වාස ප්‍රශ්වාස නොමැති රූප භූමියෙහි ඝාන - ජිව්හා-කාය -ඉත්ථි භාව - පුම්භාව වර්ජිත තිසමුට්ඨානික රූප (23) තෙවිස්ස, බහිද්ධා උතු සමුට්ඨානික රූප කලාප නකාය-නකායසංඛාරයෙහි අභිධෙය්‍යට ඇතුලත් කළයුතු වේ.

**තවද** වචීභෙද ශබ්දයට හේතු නොවූ නමුත් අරූප භූමියෙහි විතර්ක විචාරයන් වචීසංස්කාරයන් වශයෙන් වදරණ ලද්දක් මෙන්, කාය සංස්කාරයට හේතු නොවූ නමුත් සියලුම අටවිසි රූපය, කාය නම් වූ පදයාගේ ස්වරූප වශයෙන් අනුලෝමයෙහිදී ගෙන 'නකායො' යන ප්‍රත්‍යනිකයෙහි ඇතුලත් නොකොට, කාය- කායසංස්කාර වර්ජිත සිත් (89) එකූන් අනූවය, චෛතසික (52) දෙපණසය, නිර්වාණය ප්‍රඥප්තිය යන මේ ධර්මයෝම ස්වරූප වශයෙන් ගන්නේ නම් සුදුසු යයි සිතමි. කරජකාය නොවූ රූප ද කරජකය හා සමඟ කාය වශයෙන් සමාන බැවින් සදෘශෝපචාර වශයෙන් ගනු ලැබේ. කුමක් මෙන් ද යත්, වාග්භෙද ශබ්දයට හේතු නොවූ නමුත් අරූප භූමියෙහි විතර්ක විචාරයන් වචී සංස්කාර නමින් වදරන ලද මෙනි.]

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය චතුසමුට්ඨානික රූපයයි කියන ලද හේතු ධර්මය වූ කරජ කය ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ.

''න වචී න වචීසංඛාරොති, වචීසංඛාරො න වචී, වචීසංඛාරො, **වචීඤ්ච** වචීසංඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව වචී න වචීසංඛාරො, න වචීසංඛාරො න වචීති, වචී, න වචීසංඛාරො වචී වචීඤ්ච වචීසංඛාර ඤ්ච ඨපෙත්වා අවසෙසා නාචෙව වචී නච වචීසංඛාරො,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය විතර්ක විචාරයෝ ගනු ලැබෙත්. වචී-වචීසංස්කාර වර්ජිත සිත් (89) එකූන් අනූව, චෛතසික (50) සමපණස, රූප (28) අටවිස්ස, නිර්වාණ, ප්‍රඥප්ති යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ලැබේ.ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, වාග්භෙද ශබ්දය ගනු ලැබේ. [සංසය පෙර සේ උදුරනු.]

''න විතක්කං, න විතක්කසංඛාරොති, විතක්කසංඛාරො න විතක්කං විතක්කසංඛාරො, විතක්කඤ්ච විතක්කසංඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව විතක්කං නච විතක්කසංඛාරො න විතක්කසංඛාරො න විතක්කන්ති විතක්කං න විතක්කසංඛාරො විතක්කං, විතක්කඤ්ච

චිත්තසංඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා නවෙව චිත්තං නව චිත්තසංඛාරො'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, විතක්ක විචාර වර්ජිත චෛතසික (50) සමපණස ලැබෙති. චිත්ත-චිත්ත සංස්කාර වර්ජිත, විතක්ක-විචාර රූප (28) අටවිස්ස, නිර්වාණය, ප්‍රඥප්ති යන මේ ධර්මයෝ ද ගනුලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙරසේම ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, සිත් (89) එකුන් අනූව ලැබෙති. අනුලෝම සංසය ද ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ලැබේ.

පදශෝධන වාරය නිමි.

---

## 2. පද ශෝධන මූල චක්‍ර වාරය

පද ශෝධන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පදශෝධන මූලචක්‍ර වාරය වදළ සේක. (පෙර සේ බෙදනු.) ''කායො කායසංඛාරොති, නො, සංඛාරා වචීසංඛාරොති, වචීසංඛාරො සංඛාරො චෙව වචීසංඛාරොච, අවසෙසා සංඛාරා න වචීසංඛාරො'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, චතුසමුට්ඨානික රූපයයි කියන ලද හේතු ධර්මය වූ කරජ කය ලැබේ. **සංසය** අභිධෙය්‍ය නොමැත. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, කාය සංස්කාර හා චිත්ත සංස්කාර ගනු ලැබෙති. වචී සංස්කාරය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ලැබේ. කොටස් (බෙදීම-චිත්ත සංස්කාරය සම්බන්ධ කොට කීම මේ නය ක්‍රමයට අනුව කියනු.)

''වචී වචී සංඛාරොති, නො, සංඛාරා කාය සංඛාරොති, කාය සංඛාරො සංඛාරො චෙව කාය සංඛාරොච, අවසෙසා සංඛාරා න කාය සංඛාරො.'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** පද අභිධෙය්‍ය වචීභෙද ශබ්දය ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි වචී සංස්කාර චිත්ත සංස්කාර ගනු ලැබෙති. කාය සංස්කාරය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ම ය. (චිත්ත සංස්කාරය සම්බන්ධ කිරීම ද මෙසේයම.) ''චිත්තං චිත්තසංඛාරොති, නො, සංඛාරා කායසංඛාරොති,'' (සමානයි.)

අනුලෝමය නිමි

---

**ප්‍රත්‍යනීකයෙහි** ''නකායො නකායසංඛාරොති, කායසංඛාරො න කායො කායසංඛාරො, කායඤ්ච කායසංඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා නචෙව කායො නච කායසංඛාරො, න සංඛාරා න වචීසංඛාරොති, ආමන්තා. (''අනුලෝමයෙහි පද ශෝධනය අනුව උදුරනු.) **ප්‍රතිලෝමයෙහි** 'න සංඛාරා' යන **සන්නිට්ඨාන** පදයාගේ අභිධෙය්‍යාර්ථ නම්, සංස්කාර වර්ජිත සිත් (89) එකුන් අනූවය, රූප (28) අටවිස්සය, නිර්වාණය, ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ලැබෙති. **සංසයට** ද එසේම ලැබේ. (ප්‍රතිලෝමයද මෙසේමැයි. විශේෂ නැත. අවසානය දක්වා කියනු. 'න සංඛාරා' යනු පමණක් ස්වරූප උදුරනු.)

චක්‍රය නිමි.

# 3. ශුද්ධ සංස්කාර වාරය

**ශුද්ධ සංස්කාර වාරයෙහි**, ''කායසංඛාරො වචීසංඛාරොති, නො වචීසංඛාරො කායසංඛාරොති, නො'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාස යයි කියන ලද චිත්තජ වායො ධාතුව ගනු ලැබේ. **සංසයෙහි** අභිධෙය්‍ය නොමැත ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය**, විතර්ක විචාරයෝ ගනු ලැබෙති. **සංසයෙහි** අභිධෙය්‍ය නොමැත. (මේ නය ක්‍රමයට අනුව ස්වරූප උද්ධරනු.)

අනුලෝමය නිමි

---

**ප්‍රත්‍යනිකයෙහි**, ''න කායසංඛාරො, න වචී සංඛාරොති , වචී සංඛාරො න කායසංඛාරො වචී සංඛාරො, කායසංඛාරඤ්ච වචීසංඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා නාවෙච කාය සංඛාරො න වචීසංඛාරො, න වචීසංඛාරො න කාය සංඛාරොති, කායසංඛාරො න වචී සංඛාරො කායසංඛාරො, කායසංඛාරඤ්ච වචීසංඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා නාවෙච කායසංඛාරො න වචීසංඛාරො.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, විතර්ක විචාරයෝ ගනු ලැබෙති. කාය සංස්කාර - වචීසංස්කාර වර්ජිත සිත් (89) එකුන් අනූව, චෛතසික (50) සමපණස, රූප (28) අටවිස්ස, ප්‍රඥප්තිය යන මේ ධර්මයෝද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙරසේ මැයි, **ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන**අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාසයයි කියන ලද චිත්තජ වායො ධාතුව ලැබෙයි. අනුලෝම සංසය ද ගනු ලැබේ. 'න කායසංඛාරො න චිත්තසංඛාරොති' යන අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය විතර්ක- විචාර වර්ජිත චෛතසික (50) සමපණස් දෙනා ගනු ලැබෙති. කායසංස්කාර - චිත්තසංස්කාර වර්ජිත සිත් (89) එකුන් අනූවය, විතර්ක විචාරයෝ ය, රූප (28) අටවිස්සය, නිර්වාණය, ප්‍රඥප්තිය යන මේ ධර්මයෝ ද ගනු ලැබෙති. 'න වචීසංඛාරො න චිත්තසංඛාරොති' යන්හෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය විතර්ක විචාර වර්ජිත චෛතසික (50) සමපණස ගනු ලැබෙති. වචීසංස්කාර, චිත්ත සංස්කාර වර්ජිත සිත් (89) එකුන් අනූව, රූප (28) අටවිස්ස, නිර්වාණ ප්‍රඥප්ති ද ගනු ලැබෙති. (ප්‍රතිලෝමය සමානයි.)

ශුද්ධ සංස්කාර වාරය නිමි.

ප්‍රඥප්ති වාරය නිමි

---

## ප්‍රවෘත්ති වාර උත්පාද වර්තමාන වාරය

## පුද්ගල කාය සංස්කාර මූලය

ප්‍රඥප්ති වාරය දේශනා කොට වදරා අනතුරුව ප්‍රවෘත්ති වාරය වදළ සේක. (පෙර සේ බෙදු කියනු.] වර්තමාන වාරය ද අනුලෝම-ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය: [පෙර සේ පුද්ගලවාරාදිය කියනු]. කාය සංස්කාර මූල වචී සංස්කාර මූල වශයෙන් දෙවැදෑරුම් වන්නේය. මේ දෙක අතුරෙන් කාය සංස්කාර මූලය පළමු කොට වදළ සේක. ඒ කාය සංස්කාර මූලය ද වචී සංස්කාර මූලී චිත්ත සංස්කාර මූලී වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් වචී සංස්කාර මූලිය පළමු කොට වදළ සේක. **කෙසේ වදළ සේක් ද යත්**, ''යස්ස කායසංඛාරො උප්පජ්ජති තස්ස වචීසංඛාරො උප්පජ්ජතීති, විනා විතක්ක-විචාරෙහි අස්සාසපස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං කායසංඛාරො උප්පජ්ජති, නො ච තෙසං වචීසංඛාරො උප්පජ්ජති, පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං අස්සාස-පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං, **යස්සවා පන** විනා අස්සාස - පස්සාසෙහි විතක්ක-විචාරානං උප්පාදක්ඛණෙ තෙසං,''

"විතක්ක-විචාරෙහි - විතර්ක විචාරයන් සමග, විනා - විප්‍රයුක්තව, නොහොත් විතර්ක විචාරයන් වර්ජිත කොට, අස්සාස-පස්සාසානං - ආශ්වාස - ප්‍රශ්වාසයන්ගේ; උප්පාදක්ඛණෙ - උත්පාදක්ෂණයෙහි, වත්තමානානං· පවත්නාවූ; තෙසං· ඒ පුද්ගලයන්ගේ; - පෙ - පඨමජ්ඣානං - ප්‍රථම ධ්‍යානයට; සමාපන්නානං - සමවැදුනා පුද්ගලයන්ගේ; අස්සාසපස්සාසානං - ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ; උප්පාදක්ඛණෙ-උත්පාදක්ෂණයෙහිද; කාමාවචරානං - කාමාවචර පුද්ගලයන්ගේ ; අස්සාස පස්සාසානං - ආශ්වාස ප්‍රශ්වාසයන්ගේ, උප්පාදක්ඛණෙ - උත්පාදක්ෂණයෙහිද; වත්තමානානං - පවත්නා වූ; තෙසං - ඒ පුද්ගලයන්ගේ; **යස්ස වා පන**, - අස්සාස පස්සාසෙහි - ආශ්වාස ප්‍රශ්වාසයන් සමග; විනා - විප්‍රයුක්තව; විතක්ක විචාරානං - විතර්ක විචාරයන්ගේ, උප්පාදක්ඛණෙ - උත්පාදක්ෂණයෙහි; වත්තමානානං - පවත්නා වූ; තෙසං - ඒ පුද්ගලයන්ගේ; යනු අර්ථයි.

අනුලෝම පුච්ඡාවෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාස සමග එක විට උපදින ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දසය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දසය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී, ධ්‍යානයට සමවැදුනා වූ කාමාවචර පුද්ගලයෝ ගනු ලැබෙති. ආශ්වාස ප්‍රශ්වාස සමග එකවිට උපදින ප්‍රථම ධ්‍යාන සිත් (20) විස්සෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය, දෙපස් **විඤ්ඤාණ** සිත් (10) දසය වර්ජිත ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින කාම සිත් (44) සූ සාළිසය, ඔවුන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙරසේම ගනු ලැබේ.

[ප්‍රථම ධ්‍යාන සිත් (20) විස්සයයි කියනුයේ චතුෂ්කනය වශයෙන් පඤ්චක නයෙහි ප්‍රථම-ද්විතීය ධ්‍යාන දෙක එක්තැන් කොට ගැනීමෙනි. ආචාර්ය පාදයෝ මෙසේ ගනිති. ඇතැම් ගුරුවරු, ඛිප්පාභිඤ්ඤ පුද්ගලයන්ගේ වශයෙන් ප්‍රථම ධ්‍යානයෙහි විතර්ක විචාර යන අංග දෙක ඉක්මවා, ප්‍රීති, සුඛ, ඒකග්ගතා යන ධ්‍යානාංග (3) තුන සමඟ සම්ප්‍රයුක්තව, ප්‍රථම ධ්‍යානයට පසුව ලැබෙන පඤ්චකනයෙහි තෘතිය ධ්‍යානය, ද්විතීය ධ්‍යානයයි ගෙන, ප්‍රථම ධ්‍යාන සිත් (20) විස්ස ගනු ලැබෙත් යයි දක්වන්නාහ. මේ නය ක්‍රම දෙක මනාව පරීක්ෂා කොට බලා, රුචි කරන නය ක්‍රමයට ස්වරූප උදුරනු ආචාර්‍ය්‍යපාදයෝ වනාහි පළමු කී ක්‍රමය පිළිගනිති.]

ප්‍රතිලෝම පුච්ඡාවෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ආශ්වාස, ප්‍රශ්වාස තොර වූ ප්‍රථම ධ්‍යාන සිත් (20) විස්සෙහි උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර පුද්ගලයෝය, සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකොත්තර ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (14) දහතරේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය, දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත කාම සිත් (44) සුසාලිසෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝය, ලෝභ මූල (8) අට, මෝහමූල (2) දෙක, සම්පටිච්ඡන සිත් (2) දෙක, සන්තීරණ සිත් (3) තුන, අහේතුක ක්‍රියා සිත් (3) තුන, මහා කුසල් සිත් (8) අට, මහා ක්‍රියා සිත් (8) අට, ප්‍රථම ධ්‍යාන විපාකය; ද්විතීය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර සිත් (36) සතිසෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර පුද්ගලයෝය, ලෝභ මූල සිත් (8) අටය, මෝහ මූල (2) දෙකය, මනෝද්වාරාවජ්ජනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය යි කියන ලද සවිතර්ක සවිචාර සිත් (27) සත් විස්සෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක** අභිධෙය්‍ය: ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා අස්සාස-පස්සාසෙහි අවිතක්ක-අවිචාර- චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං'', සබ්බෙසං - සියලුම පුද්ගලයන්ගේ; චිත්තස්ස - චිත්තයාගේ භංගක්ඛණෙ - භංගක්ෂණයෙහි ද; අස්සාස පස්සාසෙහි - ආශ්වාස ප්‍රශ්වාසයන් සමඟ; විනා - විප්‍රයුක්තව; අවිතක්ක-අවිචාර-චිත්තස්ස- අවිතර්ක අවිචාර චිත්තයාගේ; උප්පාදක්ඛණෙ - උත්පාද ක්ෂණයෙහි ද, වත්තමානානං - පවත්නා වූ; තෙසං - ඒ පුද්ගලයන්ගේ ද; නිරොධ සමාපන්නානං - නිරෝධ සමාපත්තියට සමාපන්න වූ; අසඤ්ඤසත්තානං - අසංඥසත්ව වූ; තෙසං - ඒ පුද්ගලයන්ගේද, යනු අර්ථයි.

සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ ද - නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර - පුද්ගලයෝය, ආශ්වාස ප්‍රශ්වාස තොර වූ ද්විතීය ධ්‍යාන සිත් (10) දශයය, තෘතීය ධ්‍යාන සිත් (10) දශයය, චතුර්ථ ධ්‍යාන සිත් (18) දහ අටය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර පුද්ගලයෝය, සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකොත්තර

ද්විතීය ධ්‍යාන සිත් (7) සතය, තෘතීය ධ්‍යාන සිත් (7) සතය, චතුර්ථ ධ්‍යාන සිත් (15) පසළොසය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය; දෙපස් විඤ්ඤාණ සිත් (10) දශයගේ උත්පාදක්ෂණ සමංගී කාමාවචර පුද්ගලයෝය; චක්ඛු විඤ්ඤාණ (2) දෙසිතය, සොත විඤ්ඤාණ (2) දෙසිතය, තෘතීය ධ්‍යාන විපාක සිතය, චතුර්ථ ධ්‍යාන විපාක සිතය, පඤ්චම ධ්‍යාන විපාක සිතය, අරූප විපාක සිත් (4) සතරය, කියන ලද අවිතර්ක අවිචාර සිත් (11) එකොළොසගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර- අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපන්න වූ අනාගාමී අර්හත් ආයඞී පුද්ගලයෝය; අසංඥතලයෙහි උපදිනා චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

කායමූල චිත්තමූලීයෙහි: අනුලෝම - ආමන්තා. ප්‍රතිලෝමයෙහි ''විනා අස්සාස පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, අස්සාස- පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං,'' ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාස තොර වූ ප්‍රථම ධ්‍යාන සිත් (20) විස්සය, ද්විතීය ධ්‍යාන සිත් (10) දශයය, තෘතීය ධ්‍යාන සිත් (10) දශයය, චතුර්ථ ධ්‍යාන සිත් (18) දහඅටය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර පුද්ගලයෝ ය, සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන සිත් (14) දහතරය, ද්විතීය ධ්‍යාන සිත් (7) හතය, තෘතීය ධ්‍යාන සිත් (7) හතය, චතුර්ථ ධ්‍යාන සිත් (15) පසළොසය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය, ආශ්වාස ප්‍රශ්වාස තොරව කාමාවචර සිත් (54) සූ පනසගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝය; ලෝභ මූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය චක්ඛු විඤ්ඤාණ සිත් (2) දෙකය, සොත විඤ්ඤාණ සිත් (2) දෙකය, සම්පටිච්ඡන සිත් (2) දෙකය, සන්තීරණ සිත් (3) තුනය, අහේතුක ක්‍රියා සිත් (3) තුනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය, රූප විපාක සිත් (5) පසය යන සවිතර්ක - සවිචාර, අවිතර්ක- අවිචාර සිත් (43) තෙසාලිසගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර පුද්ගලයෝය ය; ලෝභමූල සිත් (8) අටය, මෝහ මූල සිත් (2) දෙකය, මනෝද්වාරාවර්ජනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය, අරූප විපාක සිත් (4) සතරය යි කියන ලද සවිතර්ක - සවිචාර, අවිතර්ක අවිචාර සිත් (31) එක් තිසගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ අරූපාවචර පුද්ගලයෝය; යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. ආශ්වාස ප්‍රශ්වාස සමහ ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය, ආශ්වාස ප්‍රශ්වාස සමහ, දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත කාම සිත් (44) සූසාලිසගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

[කාම-රූප භූමීන්හි චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) අටලොස යනු, චතුෂ්ක නය වශයෙන් රූපාවචර චතුර්ථ ධ්‍යාන ජවන් (2) දෙකය, ලෝකෝත්තර ධ්‍යාන (8) අටය, අරූප කුසල ජවන් (4) හතරය, ක්‍රියා ජවන් (4) හතරය මෙසේ මේ (18) අටලොස ලැබෙති. අරූප භූමියෙහි චතුර්ථ ධ්‍යාන (15) පසළොස යනු, සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර චතුර්ථ ධ්‍යාන (7) හතය, අරූප කුසල් (4) සතරය, ක්‍රියා (4) සතරය, මෙසේ මේ (15) පසළොස ලැබෙති.]

## වචී සංස්කාර මූලය

**වචීමූල චිත්තමූලියෙහි:** අනුලෝම - ආමන්තා. ප්‍රතිලෝමයෙහි ''විනා විතක්ක විචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) දහඅටය, යන මේ ධර්මයන්ගේ උත්පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර පුද්ගලයෝය; සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර ද්විතීය ධ්‍යාන ජවන් සිත් (7) සතය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (7) සතය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (15) පසළොසය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය; දෙපස් විඤ්ඤාණ සිත් (10) දශයේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝය; චක්ඛු විඤ්ඤාණ සිත් (2) දෙකය, සොත විඤ්ඤාණ සිත් (2) දෙකය, තෘතීය ධ්‍යාන විපාක සිතය, චතුර්ථ ධ්‍යාන විපාක සිතය, පඤ්චම ධ්‍යාන විපාක සිතය, අරූප විපාක සිත් (4) සතර යයි කියන ලද අවිතර්ක - අවිචාර සිත් (11) එකොළසගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර පුද්ගලයෝය, සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (14) දහතරේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ අරූපාවචර පුද්ගලයෝය, දෙපස් විඤ්ඤාණ සිත් (10) දසය වර්ජිත කාමසිත් (44) සුසාලිසේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝය; ලෝභමූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, සම්පටිච්ඡන සිත් (2) දෙකය, සන්තීරණ සිත් (3) තුනය, අහේතුක ක්‍රියා සිත් (3) තුනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියාසිත් (8) අටය, ප්‍රථම ධ්‍යාන විපාක සිතය, ද්විතීය ධ්‍යාන විපාක සිතයැයි කියන ලද සවිතර්ක සවිචාර සිත් (36) සතිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර පුද්ගලයෝය; ලෝභමූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, මනෝද්වාරා වර්ජනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටයයි කියන ලද සවිතර්ක සවිචාර සිත් (27) සත් විස්සගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ අරූපාවචර පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං'' සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්නවූ ද නොවූ ද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී - අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය, අසඤ්ඤ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (**කායමූල චිත්තමූලී, වචීමූල චිත්තමූලී ප්‍රත්‍යනීක සංසය** සියල්ල සමානය)

පුද්ගල වාරය නිමි.

---

## ඕකාස වාරය

# කාය සංස්කාර මූලය

**ඕකාස වාරයෙහි - කාය මූල වචී මූලියෙහි** - ''දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ තත්ථ පඨමජ්ඣානෙ, කාමාවචරෙ තත්ථ, **යත්ථ වා පන** - රූපාවචරෙ අරූපාවචරෙ තත්ථ'', අනුලෝම යෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, යන ධ්‍යානෝකාශය ගනු ලැබේ. ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්ස යන ධ්‍යානෝකාශයද, කාම භූමි (11) එකොළොස යන භූම්‍යාවකාශයද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය අසඤ්ඤ තලය වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරය යන භූම්‍යාවකාශය ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**කායමූල චිත්තමූලියෙහි** - අනුලෝම - ආමන්තා; ප්‍රතිලෝමයෙහි ''චතුත්ථජ්ඣානෙ, රූපාවචරෙ අරූපාවචරෙ තත්ථ, පඨමජ්ඣානෙ දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ, කාමාවචරෙ තත්ථ'', ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) අටළොස යයි කියන ලද ධ්‍යානෝකාශය; අසඤ්ඤ තල වර්ජිත රූපාවචර භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරය යි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ. ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශයයි කියන ලද ධ්‍යානෝකාශය, කාමභූමි (11) එකොළස යයි කියන ලද භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ලැබේ.

## වචී සංස්කාර මූලය

**වචීමූල චිත්තමූලියෙහි**— අනුලෝම- ආමන්තා; ප්‍රතිලෝමයෙහි ''ද්‍රුතියජ්ඣානෙ, තතියජ්ඣානෙ චතුත්ථජ්ඣානෙ තත්ථ, පඨමජ්ඣානෙ, කාමාවචරෙ, රූපාවචරෙ,අරූපාවචරෙ තත්ථ'' (අභිධෙය්‍ය සුගමයි. පෙළට අනුව ස්වරූප උද්ධරනු.) ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය: කායමූල වචීමූලියෙහි; ''චතුත්ථජ්ඣානෙ, අසඤ්ඤසත්තෙ තත්ථ'', කායමූල චිත්තමූලි - වචීමූල චිත්තමූලියෙහි ''අසඤ්ඤසත්තෙ තත්ථ'', [පෙර සේ උද්ධරනු.]

ඕකාස වාරය නිමි

---

## පුද්ගලෝකාස වාරය

## කාය සංස්කාර මූල

**පුද්ගලෝකාස වාරයෙහි කායමූල වචීමූලයෙහි** අනුලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාස සමහ ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන – තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානෝකාශ ගනු ලැබෙති. ආශ්වාස ප්‍රශ්වාස සමහ ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානෝකාශය ආශ්වාස ප්‍රශ්වාස හා සමහ එකට උපදින දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත කාම සිත් (44) සුසාලිසගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ප්‍රථම ධ්‍යාන සිත් (20) විස්සෙහි උත්පාද ක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර– රූපාවචර පුද්ගලයෝය; සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (14) දහතරෙහි උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන යයි කියන ලද ධ්‍යානොකාසය; ආශ්වාය ප්‍රශ්වාස තොර වූ දෙපස් විඤ් ඤාණ සිත් (10) දශය වර්ජිත වූ කාම සිත් (44) සුසාලිසෙහි උත් පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසයයි කියන ලද භූම්‍යාවකාශය; ලෝභමූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, සම්පටිච්ඡන සිත් (2) දෙකය, සන්තීරණ සිත් (3) තුනය, අහේතුක ක්‍රියා සිත් (3) තුනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය, ප්‍රථමධ්‍යාන විපාක චිත්තය, ද්විතීය ධ්‍යාන විපාක චිත්තයයි කියන ලද සවිතර්ක සවිචාර සිත් (36)

සතිසගේ උත්පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොස යයි කියන ලද භූම්‍යාවකාසය; ලෝභමූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, මනෝද්වාරාවර්ජනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය යි කියන ලද සවිතර්ක සවිචාර සිත් (27) සත්විස්සෙහිඋත්පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ අරූපාවචර පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

**ප්‍රත්‍යනික සංසය අභිධෙයඃ** – සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද – නොවූද, කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ද්විතීය - තෘතීය - චතුර්ථ ධ්‍යාන සංඛ්‍යාත වූ ධ්‍යානෝකාසය; කාමභූමි (11) එකොළසය, අසඥ්ඥසත්ත වර්ජිත රූපභූමි (15) පසළොස, අරූපභූමි (4) සතරය කියන ලද භූම්‍යාවකාසය; ආශ්වාස ප්‍රශ්වාස තොර වූ ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) දහඅටය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර – රූපාවචර පුද්ගලයෝය; සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර ද්විතීය ධ්‍යාන ජවන් සිත් (7) සතය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (7) සතය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (15) පසළොසය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය; මේ පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයයි කියන ලද ධ්‍යානෝකාශය; දෙපස් විඥ්ඥාණ සිත් (10)දසයෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය; චක්ඛු විඥ්ඥාණ සිත් (2) දෙකය, සොත විඥ්ඥාණ (2) දෙකය, තෘතීය ධ්‍යාන විපාක සිතය, චතුර්ථ ධ්‍යාන විපාක සිතය, පඤ්චම ධ්‍යාන විපාක සිතය, අරූප විපාක සිත් (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර සිත් (11) එකොළසගේ උත්පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසඤ්ඤ'තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය ද යන භූම්‍යාවකාශය ගනු ලැබෙති.

**කායමූල චිත්ත මූලියෙහි ප්‍රතිලෝම සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාස තොර වූ (පුද්ගල වාරය අනුව කියනු.)ප්‍රථම ධ්‍යාන,ද්විතියධ්‍යාන,තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානෝකාසය; ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත කාම සිත් (54) සුපණසගේ උත්පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස යයි කියන ලද භූම්‍යාවකාශය; ලෝභමූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, සම්පටිච්ඡන සිත් (2) දෙකය, සන්තීරණ සිත් (3) තුනය, අහේතුක ක්‍රියා සිත් (3) තුනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය, ප්‍රථම ධ්‍යාන විපාක චිත්තය, ද්විතිය ධ්‍යාන විපාක චිත්තය යි කියන ලද සවිතර්ක සවිචාර සිත් (36) සතිසගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සම නො වැදුනාවූ රූපාවචර

පුද්ගලයන්ගේ අසංඥ තලය වර්ජිත රූපභූමි (15) පසළොස යන භූම්‍යාවකාශය ලෝභමූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, මනෝද්වාරාවර්ජන සිතය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය යි කියන ලද සවිතර්ක සවිචාර සිත් (27) සත්විස්සෙහි උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ අරූපාවචර පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

ආශ්වාස ප්‍රශ්වාස හා සමග ප්‍රථමධ්‍යාන ජවන්සිත් (20) විස්සය, ද්විතියධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතිය ධ්‍යාන ජවන් සිත් (10) දශය යන මේ ධර්මයන්ගේ උත්පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන-ද්විතිය ධ්‍යාන–තෘතිය ධ්‍යාන ය යි කියන ලද ධ්‍යානෝකාශය; ආශ්වාස ප්‍රාශ්වාස හා සමඟ දෙපස් විඤ්ඤාණ (10) දශය වර්ජිත කාමසිත් (44) සූසාලිසෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාව කාශ ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ය.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** "සබ්බෙසං **චිත්තස්ස** භංගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," සියලුම චිත්තයන්ගේ **භංගක්ෂණ** සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර-රූපාවචර - අරූපාවචර - පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන-ද්විතිය - ධ්‍යාන-තෘතිය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානෝකාශය; කාම භූමි (11) එකොළස, අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොස, අරූප භූමි (4) සතරය යන භූම්‍යාවකාශ; අසංඥතලයෙහි උපදින ච්‍යුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල නම් වූ භූම්‍යාවකාශය ගනු ලැබේ.

## වචී සංස්කාර මූලය

**වචීමූල චිත්තමූලියෙහි** ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ද්විතිය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතිය ධ්‍යාන ජවන් සිත් (10) දශය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) දහ අටය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර පුද්ගලයෝය; සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර ද්විතිය ධ්‍යාන ජවන් සිත් (7) සතය, තෘතිය ධ්‍යාන ජවන් සිත් (7) සතය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (15) පසළොසය යන මේ ධර්මයන්ගේ උත්පාද ක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය; යන මේ පුද්ගලයන්ගේ ද්විතිය ධ්‍යාන - තෘතිය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානෝකාශයෝය; දෙපස් විඤ්ඤාණ සිත් (10) දශයගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; චක්ඛු විඤ්ඤාණ සිත් (2) දෙකය, සොත විඤ්ඤාණ සිත් (2) දෙකය, තෘතිය ධ්‍යාන විපාක චිත්තය, චතුර්ථ ධ්‍යාන විපාක චිත්තය, පඤ්චම ධ්‍යාන විපාක චිත්තය, අරූප විපාක (4) සතරය යි කියන ලද අවිතර්ක අවිචාර සිත් (11) එකොළසගේ උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරය යි කියන ලද භූම්‍යාවකාස ගනු ලැබෙති.

ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර පුද්ගලයෝය; සෝතාපත්ති මාර්ග වර්ජිත ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (14) දහතරෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන නම් වූ ධ්‍යානෝකාසය; දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත කාමසිත් (44) සුසාලිසෙහි උත්පාදක්ෂණ සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාසය; ලෝභ මූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, සම්පටිච්ඡන සිත් (2) දෙකය, සන්තීරණ සිත් (3) තුනය, අහේතුක ක්‍රියා සිත් (3) තුනය මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය, ප්‍රථම ධ්‍යාන විපාක සිතය, ද්විතීය ධ්‍යාන විපාක සිතය යි කියන ලද සවිතර්ක සවිචාර සිත් (36) සතිසෙහි උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොස යයි කියන ලද භූම්‍යාවකාශය; ලෝභ මූල සිත් (8) අටය, මෝහමූල සිත් (2) දෙකය, මනෝද්වාරාවර්ජනය, මහා කුසල් සිත් (8) අටය, මහා ක්‍රියා සිත් (8) අටය යි කියන ලද සවිතර්ක සවිචාර සිත් (27) සත් විස්සෙහි උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ අරූපාවචර පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර යයි කියන ලද භූමි අවකාශය ද ගනු ලැබේ. [**ප්‍රත්‍යනීක සංසය** අභිධෙය්‍ය ක්‍රමය ද සමානය. ]

වර්තමාන වාරය නිමි.

---

## අතීත පුද්ගල වාරය

වර්තමාන වාරය දේශනාකොට වදරා අනතුරුව අතීත වාරය වදළ සේක. **කෙසේ වදළ සෙක් ද යත්:** ''යස්ස කායසංඛාරො උප්පජ්ජිත්ථ, තස්ස වචීසංඛාරො උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන** - ආමන්තා,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, සියළුම පෘථග්ජන (4) සිවු දෙනාය, ආර්ය පුද්ගලයෝ (8) අට දෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය** පෙර සේම ගනු ලැබේ. [ප්‍රතිලෝමයෙහි ද නාය ක්‍රමය සමානයි. කායමූල චිත්තමූලි, වචීමූල චිත්තමූලි වාරයෝ ද සමානයහ.]

පුද්ගල වාරය නිමි. [ඕකාස වාරය සුගමයි.]

## පුද්ගලෝකාස වාර

**කාය සංස්කාර මූලය:**

''**යස්ස යත්ථ** කායසංඛාරො උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ වචීසංඛාරො උප්පජ්ජිත්ථාති, දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**-,රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය - ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය යන මේ ධර්මයන්ගේ ක්ෂණ ත්‍රය සමංගී ධ්‍යාන සාමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන යයි කියන ලද ධ්‍යානෝකාශ ගනු ලැබේ.

[මෙහි භූමාවකාශය නොව ධ්‍යානෝකාශය වන රූප - අරූප භූමීන්හි ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යානයන්ගේ ක්ෂණත්‍රය සමංගී පුද්ගලයන්ද, කාම භූමියෙහි ද්විතීය-තෘතීය ධ්‍යාන සමාපන්නයාට ආශ්වාස ප්‍රශ්වාස පහළ වන බැවින් ඔවුන් ද සඳහා ද්විතීය ධ්‍යාන-තෘතීය ධ්‍යාන පමණක් ස්වරූප කොට "දුතියජ්ඣානං තතියජ්ඣානං" යි කියනු ලැබේ.]

ප්‍රථමධ්‍යාන ජවන් සිත් (20) විස්සෙහි ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථමධ්‍යාන සංඛ්‍යාත ධ්‍යානෝකාශය, කාම සිත් (54) සූපණසෙහි ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූමාවකාශය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, සුද්ධාවාසය වේ නම් භව නිකන්තික ප්‍රථම ජවනයේ පටන් චුතිය දක්වා ද, අවසේස රූප- අරූප භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, සුදුසු පරිදි උපදිනා සවිතර්ක සවිචාර, අවිතර්ක අවිචාර සිත් (47) සත් සාලිසෙහි ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ සත්ව වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශය ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. [රූපාවචර භූමියෙහි ලැබෙන සවිතක්ක සවිචාර, අවිතක්ක අවිචාර සිත් (43) තෙසාලිසට අරූප විපාක සිත් (4) හතර ගනු ලැබෙති.]

**කායමූල චිත්තමූලියෙහි:** අනුලෝම-ආමන්තා; ප්‍රතිලෝමයෙහි, "චතුත්ථජ්ඣානං සමාපන්නානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, පඨමජ්ඣානං දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං කාමාවචරානං තෙසං තත්ථ", ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) අටළොසෙහි ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානෝකාශය; සුද්ධාවාසය වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වාද, අවශේෂ රූපාවචර - අරූපාවචර භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, සුදුසු පරිදි උපදින සවිතක්ක සවිචාර, අවිතක්ක අවිචාර සිත් (47) සත්සාලිසෙහි ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසඤ්ඤසත්ත වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශය ගනු ලැබේ.

ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතිය ධ්‍යාන ජවන් සිත් (10) දශය, යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන තෘතිය ධ්‍යාන නම් වූ ධ්‍යානෝකාශය, කාම සිත් (54) සූපණසගේ ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූමාවකාශ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**වචී සංස්කාර මූලය:**

අනුලෝම – ආමන්තා; ප්‍රතිලෝමයෙහි "දුතියජ්ඣානං තතියජ්ඣානං චතුත්ථජ්ඣානං සමාපන්නානං, සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං, ඉතරෙසං රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ," ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය, චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) දහ අට යන ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න කාමාවචර – රූපාවචර-අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානෝකාශය; සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංග යයි කියන ලද නියත දෙවැනි සිත, ඒ සිත සමඟ වචී සංස්කාර උපන් හෙයෙක් නොමැති බැවින් ඒ හා සමාන දෙවැනි සිත යයි කියන ලද භවංග වාර (15) පසළොසය, මනෝද්වාරාවර්ජනය, යන මේ චිත්තක්ෂණ (17) සතළොසගේ ක්ෂණත්‍රය සමංගී අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සෙහි ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානෝකාශය; කාම සිත් (54) සිවු පණසගේ ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; සුද්ධාවාසය වෙ නම් භව නිකන්තික ලෝභ ජවනයේ සිට චුතිය දක්වා ද, අවශේෂ රූප–අරූප භූමීන්හි වෙ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා ද, සුදුසු පරිදි උපදින සවිතක්ක සවිචාර අවිතක්ක අවිචාර – (47) සත්සාලිස් චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූපභූමි (4) සතරය යි කියන ලද භූම්‍යාවකාස ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක**

**කායමූල වචීමූලි ප්‍රත්‍යනීක සන්නිට්ඨාන** අභිධෙය්‍ය, "චතුත්ථජ්ඣානං සමාපන්නානං, සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) අටළොසෙහි ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානෝකාසය; සුද්ධාවාසයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංග යයි කියන ලද නියත දෙවැනි සිතය, ඒ සිත සමඟ පෙර වචී සංස්කාර උපන්නෙක් නොමැති බැවින් ඒ හා සමාන වූ ප්‍රතිසන්ධි සිත, භවංග වාර (15) පසළොස, මනෝද්වාරාවර්ජනය යන මේ චිත්ත වාර (18) දහඅටෙහි ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, අසඤ්ඤතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමි යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේත්.

**කායමූල චිත්තමූලි, වචීමූල චිත්තමූලි ප්‍රත්‍යනික සන්නිට්ඨාන** අභිධෙය්‍ය; "සුද්ධාවාසං උප්පජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ", රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි සිතය, චෛතසික (30) තිසය යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී අනාගාමී ඵලස්ථ ආයෑ පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, අසඤ්ඤතලයෙහි උපදින වූතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමි යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

අතීත වාරය නිමි.

## අනාගත - පුද්ගල වාරය

**කායසංස්කාර මූලය:**

**අනාගතවාර කායමූල වචීමූලියෙහි**, අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝම යෙහි "යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිම චිත්තං උපපජ්ජිස්සති, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, චවන්තානං තෙසං ඉතරෙසං-තෙසං", යස්ස චිත්තස්ස-, පශ්චිම චිත්තයාගේ පටන් ආපසු ගැනීමේදී ආශ්වාස ප්‍රශ්වාස හා සමග එකට පහළ වන යම (33) තෙතිස් වැනි චිත්තයට; අනන්තරා,- අනතුරුව; කාමාවචරානං,– කාමාවචර පුද්ගලයනට; පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති,- පශ්චිම චිත්තය උපදින්නේද; තෙසං,- ඒ පුද්ගලයන්ටද, [සෙස්ස සුගමයි]

අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය ප්‍රති සන්ධියේ පටන් අන්තිම ආශ්වාස ප්‍රශ්වාසයන් සමග එකවිට උපදින (33) තෙතිස් චිත්තයන්ගේ පූර්වානන්තර චිත්තය දක්වා කාමාවචර පශ්චිම භවික පුද්ගලයෝය; කාම භූමි (7) සතෙන් රූප - අරූප භූමියට ගොස් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස හා සමග එකවිට උපදින චිත්තයන්ගේ පූර්වානන්තර චිත්තය දක්වා කාමාවචර පුද්ගලයෝය; කාම භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා කාමාවචර පුද්ගලයෝය; සුද්ධාවාස වර්ජිත රූපාවචර-අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය** ද එසේ ම ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය: පශ්චිමචිත්තයාගේ පටන් ආපසු ගැනීමෙදී අන්තිම ආශ්වාස ප්‍රශ්වාස හා සමග එකට උපදින (33) තෙතිස් වැනි චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තයවූ දෙවැනි තදාරම්මණය, මරණාසන්න පස්වැනි ජවනය, භවංගය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර අර්හත් ඵලස්ථ ආයෑ පුද්ගලයෝය; ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය නම් වූ සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවන් යාමට නියත වූ කෙනෙක් වේ නම්,

ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, තෘතීය ධ්‍යාන විපාකය,චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියනලද අවිතර්ක අවිචාර සිතකින් පිරිනිවීමට නියත කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් (4) සතරවැනි මරණාසන්න ජවන් සිත දක්වා ද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර, අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර අරූපාවචර භූමියකට පැමිණ පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම වූ ආශ්වාස ප්‍රශ්වාස හා සමග එකට උපදින සිතේ පටන් චුතිය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචරව චුතවන පුද්ගලයෝය; රූපාවචර - අරූපාවචර භූමි එකින් එක ඉහළට ඉපද පිරිනිවීමට නියත වූ අසංඥතල - අකනිට්ඨාව හැර රූපාවචර අරූපාවචර පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම **සංසය** අභිධෙය්‍ය ද ගනු ලැබේ.

[**කායමූල චිත්ත මූලියෙහි**, අනුලෝම - ආමන්තා; ප්‍රතිලෝමයෙහි ද විභාගය වචීමූලි අනුවමැයි] ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, පශ්චිම චිත්තයාගේ සිට ආපසු ගැනීමේදී අන්තිම ආශ්වාස ප්‍රශ්වාසයන් සමග එකට උපදින (33) තෙතිස් වැනි චිත්තයාගේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තයවූ දෙවැනි තදාරම්මණය, මරණාසන්න පඤ්චම ජවනය, භවංගය දක්වා කාමාවචර පශ්චිම භවික පුද්ගලයෝය; ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න වූද - නොවූ ද, රූපාවචර අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; කාමසුගති භූමි (7) සතෙන් රූපාවචර අරූපාවචර භූමියකට පැමිණ පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමහ එකට උපදින චිත්තයන්ගේ සිට චුතිය දක්වා, චුතවන කාමාවචර පුද්ගලයෝය; රූපාවචර-අරූපාවචර භූමි එකින් එක ඉහලට ඉපද පිරිනිවීමට නියත වූ අසංඥතල - අකනිට්ඨාව වර්ජිත රූපාවචර - අරූපාවචර පුද්ගලයෝ ගනු ලැබෙති. කායමූල වචීමූලි සංසය ද ගනු ලැබේ.

**වචී සංස්කාර මූලය**

**වචීමූල චිත්ත මූලියෙහි**, අනුලෝම-ආමන්තා; ප්‍රතිලෝමයෙහි, "යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක-අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති තෙසං ඉතරෙසං තෙසං" ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය- තෘතිය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක සිත් (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, පස්වෙනි ජවනයේ ක්ෂණත්‍රය සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වන්නේ නම්, පස්වෙනි ජවන භවංගයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූද, ධ්‍යාන සමාපන්න වූද - නොවූද රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඹ පුද්ගලයෝ ගනු ලැබෙති.

ඥාන සම්ප්‍රයුක්ත මහා විපාක සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා ද,

තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යැයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න (4) සතරවැනි ජවනය දක්වා ද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවිකයෙක් නොවේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය, කායමූල වචීමූලියෙහි,** ''පශ්චිම චිත්තසමංගීනං යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක- අවිචාරං පච්ඡිමචිත්තං උපජ්ජිස්සති තෙසං'', ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසයයි කියන ලද සවිතර්ක සවිචාර, අවිතර්ක අවිචාර පශ්චිම **චිත්තයන්ගේ** ක්ෂණත්‍රය සමංගී වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයෝය; තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, **පඤ්චම** ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යැයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, **පඤ්චම** ජවනයාගේ ක්ෂණත්‍රය සමංගීවූ, භවංගයෙන් පසුව චුතිය වන්නේනම්, **පඤ්චම** ජවන භවංගයන්ගේ ක්**ෂණ**ත්‍රය සමංගී වූ, රූපාවචර අරූපාවචර අර්හත් ඵලස්ථ ආය්‍ර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. [ **කායමූල චිත්තමූලි, වචීමූල චිත්තමූලි, ප්‍රත්‍යනීක සංසය** අභිධෙය්‍ය, ''පච්ඡිම - චිත්ත සමංගීනං තෙසං'']

පුද්ගලය වාරය නිමි. ඕකාස වාරය පුගමයි

---

## පුද්ගලෝකාස වාරය

**කාය සංස්කාර මූලය:**

**පුද්ගලෝකාස** වාරයෙහි ''**යස්ස යත්ථ** කාය සංඛාරො උප්පජ්ජිස්සති, තස්ස තත්ථ වචී සංඛාරො උප්පජ්ජිස්සතීති, දුතිය ජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං තෙසං තත්ථ, **යස්සවාපන යත්ථ** යස්ස **චිත්තස්ස** අනන්තරා කාමාවචරානං පච්ඡිම **චිත්තං** උප්පජ්ජිස්සති, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ,''

අනුලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, කාමභූමියෙහි **ද්විතීය** ධ්‍යාන තෘතීය ධ්‍යාන යන්ට සමවැදීමේ නියත වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වා සුදුසු පරිදි උපදින ධ්‍යාන **චිත්තයන්ගේ** ක්ෂණත්‍රය සමංගීවූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර පුද්ගලයෝය; ධ්‍යාන සමවැදීමට නියත නොවූ කෙනෙක් වේ නම්, අන්තිමට ලැබෙන ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ධ්‍යානයාගේ පූර්වානන්තර **චිත්තය** දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර **පුද්ගලයෝය;** යන මේ පුද්ගලයන්ගේ **ද්විතීය** ධ්‍යාන තෘතීය ධ්‍යාන යයි කියන ලද ධ්‍යානෝකාශ ගනු ලැබේ. කාමාවචර භූමියෙහි ප්‍රථම ධ්‍යානයට

සමවැදීම නියත කොට ඇති කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර රූපාවචර පුද්ගලයෝය, ධ්‍යාන සමාපන්න වීමට නියත නොවූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ධ්‍යානයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය; යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානයයි කියන ලද ධ්‍යානෝකාශය; [අරූප භූමියෙහි ප්‍රථම ධ්‍යාන- ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යානයෝ ලෝකෝත්තර ධ්‍යානමඞ් ආයඞ සන්තාන-යෙහි පමණක් උපදිති. කාම භූමියට පෙරළා නො එන බැවින් අරූපී පුද්ගලයෝ නොගන්නා ලදහ.] ප්‍රතිසන්ධියේ සිට අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින (33) තෙතිස් වෙනි චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සත යයි කියන ලද භූමාවකාශය; තමන් ඉපිද සිටින භූමියෙහි මතු නැවතත් උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, සුද්ධ පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස නම් වූ භූමාවකාශය ද ගනු ලැබේ. සංඝය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, පශ්චිම චිත්තයාගේ සිට ආපසු ගැනීමේදී අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින (33) තෙතිස්වැනි සිතේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තරවූ දෙවැනි තදාරම්මණය මරණාසන්න පස්වැනි ජවනය,භවාංගය දක්වා කාමාවචර අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත යයි කියන ලද භූමාවකාශය ද; තමන් ඉපද සිටින භූමියේ මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින චිත්තයේ සිට චුතියට පූර්වා-නන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස නම් වූ භූමාවකාශය ද; කාම භූමියේදී ප්‍රථම ධ්‍යානයට සම වැදීමට නියත නොවූ, රූපාවචර-අරූපාවචර භූමියෙහිම සමවැදීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා, ධ්‍යාන සමපන්න වූ රූපාවචර අරූපාවචර පුද්ගලයෝය, රූපාවචර – අරූපාවචරයන්හි දී ද සම වැදීමට නියත නොවූවෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන යයි කියනලද ධ්‍යානෝකාශය ද, **හෙවත්** – කාමාවචර භූමියෙහි ප්‍රථම ධ්‍යානයට සම වැදීමට නියත නොවූ, රූපාවචර – අරූපාවචර භූමියෙහිදීම සම වැදීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයෝය; ප්‍රථමයෙන් සමවැදුනු ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ රූපාවචර – අරූපාවචර පුද්ගලයෝය; රූපාවචර – අරූපාවචර භූමියෙහි දී ද ධ්‍යාන සම වැදීමට නියත නොවූවෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ

එකට උපදින ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානයට පූර්වානන්තර චිත්තය දක්වා, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයෝ ය; ප්‍රථමයෙන් සමවැදුනු ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානයාගේ පූර්වානන්තරය දක්වා ධ්‍යාන සමාපන්න වූ රූපාවචර- අරූපාවචර පුද්ගලයෝය; යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන යයි කියන ලද ධ්‍යානෝකාශය ද,...

[මේ නය ක්‍රම දෙක අතුරෙන් පූර්ව නයෙහි, රූපාවචර – අරූපාවචර භූමියෙහි ප්‍රථම ධ්‍යානයට සමවදින්නාහට කාමාවචර පුද්ගලයා ඇතුලත් නොවේ. අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ධ්‍යානයේ පටන් ස්වරූප ගැනීමේදී රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ම ස්වරූප වශයෙන් ගන්නා බැවින් නුසුදුසු යයි අන් ක්‍රමයකින් ගන්නා ලදී. නුවණින් විමසා ගත යුතුය. මින් පසුවද මෙවැනි තැන්හි විමසිය යුතුය. නය සමාන බැවින් තේරුම් ගත හැකිය. අනෝකාන්තය හැර ලැබිය හැකි වූම ස්වරූප ගත යුතුය. පාලියේ නැත.]

ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ අනන්තරය දක්වාද, තෘතිය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සිව්වැනි ජවනය දක්වා ද, ධ්‍යාන සම්පන්න නොවූ රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයද; තමන් ඉපිද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන්, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූවෙක් නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තරය දක්වා ද, තෘතිය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සිව්වැනි ජවනය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥතල - අකනිට්ඨාව වර්ජිත රූප භූමි (14) තුදුසය අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයද; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවතත් උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා ධ්‍යාන සම්පන්න නොවූ රූපාවචර–අරූපාවචර පුද්ගලයන්ගේ වෙහප්ඵලය තෙක් රූපාවචර භූමි (10) දශය අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ. අනුලෝම ශංසය ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** ''පච්ඡිම - චිත්ත සමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, චතුත්ථජ්ඣානං සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'', ත්‍රිහේතුක චුති (13) තෙළස යයි කියන ලද සවිතර්ක සවිචාර, අවිතර්ක අවිචාර පශ්චිම චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී කාමාවචර- රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයාති පුද්ගලයන්ගේ කාම සුගති භූමි

(7) සතය, අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ද; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින චුතිසිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, අසංඥතල - අකනිට්ඨ වර්ජිත රූප භූමි (14) තුදුසය, අරූප භූමි (4) සතර දැයි කියන ලද භූම්‍යාවකාශය ද; ප්‍රථම ධ්‍යානයට මතු සම නොවදින්නාවූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමපන්න වූ කාම- රූප- අරූපි පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානෝකාශය ද; තෘතිය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයට පසුව චුතිය වේ නම් පඤ්චම ජවනයාගේ ක්ෂණත්‍රය සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම් පඤ්චම ජවන-භවංගයේ ක්ෂණත්‍රය සමංගී වූද, රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයුෂ් පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල, අසංඥ තල වර්ජිත වූ රූප භූමි (12) දොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ද;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් අවිතර්ක අවිචාර සිතින් චුතවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම් පඤ්චම ජවනයාගේ ක්ෂණත්‍රය සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම් පඤ්චම ජවන - භවංගයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල අසංඥතල - අකනිට්ඨව වර්ජිත රූපභූමි (11)එකොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයද;

කාමාවචර භූමියෙහි ද්විතීය ධ්‍යාන, තෘතිය ධ්‍යාන සම නොවදින්නා වූ රූපාවචර-අරූපාවචර භූමියෙහි පමණක්ම සමවැදීමට නියත වූවෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා, ධ්‍යාන සමාපන්න වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; රූපාවචර- අරූපාවචර භූමියෙහි ද ධ්‍යාන සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදනා වූ ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන- තෘතිය ධ්‍යාන යයි කියන ලද ධ්‍යානෝකාශය ද, **හෙවත්**, කාමාවචර භූමියෙහි ද්විතීය ධ්‍යාන- තෘතිය ධ්‍යාන සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම වූ ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය; ප්‍රථමයෙන් සමවැදුනු ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යානසමාපන්න රූපාවචර- අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන- තෘතිය ධ්‍යානයයි කියන ලද ධ්‍යානෝකාශය ද;

[පූර්ව අභිධෙය්‍ය රූපාවචර - අරූපාවචර භූමියෙහි ධ්‍යාන සමවදින්නා වූ නො වන්නා වූ වශයෙන් පුද්ගලයන් වෙන් කිරීම ප්‍රධාන කාරණ නොවේ. අප්‍රධාන වශයෙන් ස්වරූප ඉදුරු බැවින් ද, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ධ්‍යානය රූපාවචර - අරූපාවචර පුද්ගලයන් යනුවෙන් ස්වරූප උදුරන බැවින් ද, ඌනක - අධික දෙස් දක්වා අන් ක්‍රමයකින් ස්වරූප උදුරන ලදී.]

චතුර්ථ ධ්‍යාන ජවන (18) අටළොසෙහි ක්ෂණත්‍රය සමංගී ධ්‍යාන සම්පන්න වූ කාමාවචර - රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යාන සංඛ්‍යාත ධ්‍යානෝකාශය ද අසංඥ තලයෙහි උපදින චූතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ.

**කායමූල චිත්තමූලියෙහි:** අනුලෝම - ආමන්‍යං: ප්‍රතිලෝමයෙහි, ''යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිම-චිත්තං උප්පජ්ජිස්සති චතුත්ථජ්ඣානං සමාපන්නානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, පඨමජ්ඣානං, දුතියජ්ඣානංතතියජ්ඣානං සමාපන්නානං ඉතරෙසං කාමාවචරානං එතසං තත්ථ,''

ඉතරෙසං - **අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින (33) තෙතිස් චිත්තයන් අතුරෙන් පශ්චිම චිත්තයට** අනන්තර වූ දෙවැනි තදරම්මණය, මරණාසන්න පස්වැනි ජවනය,- භවංගය දක්වා ඇති **චිත්තයන්ගේ** ක්ෂණත්‍රය සමංගී පුද්ගලයන් කෙරෙන් අන්‍ය වූ; කාමාවචරානං - කාමාවචර පුද්ගලයන්ගේ ; යනු අර්ථයි.

ප්‍රතිලෝමයෙහි, **සන්නිට්ඨාන** අභිධෙය්‍ය: පශ්චිම චිත්තයාගේ සිට ආපසු ගැනීමෙදී අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින (33) තෙතිස් චිත්තයන්ගෙන් පශ්චිම **චිත්තයට** අනන්තර වූ දෙවැනි තදරම්මණය, මරණාසන්න පස්වැනි ජවනය, භවාංග දක්වා ධ්‍යාන සම නොවදින කාමාවචර අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉසිද සිටින භූමියෙහි මතු නැවත නුපදින කෙනෙක් වේ නම් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින චිත්තයන් කෙරෙන් චූතියට පූර්ව අනන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; කාම භූමියෙහි ප්‍රථම, ද්විතීය, තෘතීය ධ්‍යාන සමාපන්න නොවන්නාවූ, රූපාවචර-අරූපාවචර භූමීන්හි පමණක් සමවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, රූප - අරූප භූමියෙහිද ධ්‍යාන සමාපන්න නොවන්නාවූ කෙනෙක් වේ නම, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ධ්‍යාන අතුරින් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන ද්විතීය ධ්‍යාන- තෘතීය ධ්‍යාන සංඛ්‍යාත ධ්‍යානාවකාශය;

**තෙවත්**, කාමාවචර භූමියෙහි ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන සම නොවදින්නාවූ, රූප-අරූප භූමියෙහි පමණක් සම වදින්නාවූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ධ්‍යාන අතුරෙන් අන්තිම ධ්‍යානය තෙක් ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය, ප්‍රථමයෙන් සමාපන්න ධ්‍යාන අතුරෙන් අන්තිම ධ්‍යානය තෙක්ම ධ්‍යාන සමාපන්න වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය,

රූප-අරූප භූමීන්හි ද ධ්‍යාන සමාපන්න විමට නියත නොවූ අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ධ්‍යාන අතුරෙන් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය, ප්‍රථමයෙන් සමවදින්නා වූ ධ්‍යාන අතුරෙන් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර වූ ධ්‍යාන සමාපන්න වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය යි කියන ලද ධ්‍යානාවකාශය ද, [යනු බුරුම රට ඩයිං චොන් සෙයාඩෝ හිමියන් දක් වූ නය ක්‍රමය යි.]

චතුර්ථ ධ්‍යානයට සමවැදීමට නියත වූවෙක් වේ නම අන්තිම ධ්‍යානය දක්වා ද, සම වැදීමට නියත නොවූවෙක් වේ නම අන්තිම ධ්‍යානයට පූර්වානන්තර චිත්තය දක්වා ද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යානයයි කියන ලද ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයා ගේ පූර්වානන්තර චිත්තය දක්වා රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසය අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥතල - අකනිට්ඨ වර්ජිත රූපභූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ වෙහප්ඵලය තෙක් රූපභූමි (10) දශය අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශය ගනු ලැබේ.

කාමභූමියෙහි ප්‍රථමධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන සම වැදීමේ නියත වූවෙක් වේ නම් අන්තිම ධ්‍යානය තෙක් ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර පුද්ගලයෝය, සම නොවැදීමේ නියත කෙනෙක් වේ නම් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ධ්‍යානයට පූර්වානන්තරය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය - ද්විතීය ධ්‍යානය - තෘතීය ධ්‍යානය යි කියන ලද ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින (33) තෙතිස් වැනි චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ පශ්චිමභවික කාමාවචර පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූමාවකාශය: තමන් ඉපිද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, තමන් ඉපද සිටින භූමියෙහි නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා ද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස යයි කියන ලද භූමාවකාශය ද ගනු ලැබේ. **සංශය අභිධ්‍යා පෙරසේ** ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය** අභිධෙය: ''පච්ඡිම චිත්ත සමංගීනං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූපය යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී කාමාවචර – රූපාවචර– අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඝ් පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ සත්ව වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදිනා චුති සිත් (19) එකුන් විස්සගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, අසංඥසත්ව – අකනිට්ඨ වර්ජිත රූපාවචර භූමි (14) දුහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; ප්‍රථම ධ්‍යාන – ද්විතීය ධ්‍යාන – තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන් සම වැදීමට නියත නොවූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථමධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය; අසංඥතලයෙහි උපදින වූනවත සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසඤ්ඤ සත්ත භූමි යයි කියන ලද භූම්‍යාවකාශය, ගනු ලැබේ.

**වචීසංස්කාර මූලය**

**වචීමූලචිත්තමූලියෙහි** අනුලෝම - ආමන්තා; ප්‍රතිලෝමයෙහි, ''යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක- අවිචාරං පච්ඡිම - චිත්තං උප්පජ්ජිස්සති, දුතියජ්ඣානං, තතියජ්ඣානං, චතුත්ථජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං, ඉතරෙසං රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ,''

යස්ස චිත්තස්ස - යම් ඒ මරණාසන්න පස්වැනි ජවන චිත්තයට හා භවංග චිත්තයට; අනන්තරා- අනතුරුව; අවිතක්ක අවිචාරං - අවිතර්ක අවිචාර වූ; පච්ඡිම චිත්තං– පශ්චිම චිත්තය, උප්පජ්ජිස්සති - උපදින්නේ වේ ද; තෙන – ඒ මරණාසන්න පස්වැනි ජවනය, භවංග චිත්තය හා සමඟ; සමංගීනං–යෙදුනා වූ පුද්ගලයන්ගේද; යනු අර්ථ යි. [සෙස්ස සුගමයි.]

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය: තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ, ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, පස්වැනි ජවනයාගේ ක්ෂණත්‍රය සමංගීවූද, භවංගයෙන් පසුව චුතිය වන්නේ නම් පස්වැනි ජවනභවංගයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඝ් පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තලය, අසංඥ තල වර්ජිත රූප භූමි (11) දොළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටිනා භූමියෙහි මතු නැවත නූපදිනා පුද්ගලයන් අතුරෙන් අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසු චුතිය වන්නේ නම් පස්වැනි ජවනයේ ක්ෂණත්‍රය සමංගී වූ, භවංගයෙන් පසු චුතිය වන්නේ නම් පස්වැනි ජවන—භවංගයන්ගේ ක්ෂණත්‍රය සමංගීවූ, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල අසංඥ තල — අකනිට්ඨ වර්ජිත රූපභූමි (11) එකොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශය;

ද්විතීය ධ්‍යාන – තෘතීය ධ්‍යාන — චතුර්ථ ධ්‍යානයන් සමවැදීමට නියත වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වා ද, සම නොවදිනා කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර වූ චිත්තය දක්වා ද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය–තෘතීය–චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානෝකාශය ගනු ලැබේ.

ප්‍රථම ධ්‍යානයට සම වැදීමෙහි නියත වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වා ද, සම නොවදිනා කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, ධ්‍යාන සමාපන්න කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූමාවකාශය;

තමන් ඉපද සිටිනා භූමියෙහි මතු නැවත නූපදිනා කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, නැවත උපදිනා කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, සුදුසු පරිදි උපදිනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූමාවකාශය; ප්‍රථමධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය යයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද, තෘතීය ධ්‍යාන විපාක, චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න (4) සතරවැනි ජවනය දක්වා ද, සුදුසු පරිදි උපදිනා සවිතර්ක සවිචාර, අවිතර්ක අවිචාර චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර – අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූමාවකාශය,

තමන් ඉපද සිටිනා භූමියෙහි මතු නැවත නූපදිනා පුද්ගලයන් අතුරෙන් ප්‍රථම ධ්‍යාන විපාක, ද්විතීය ධ්‍යාන විපාක නම් වූ සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවන කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද, තෘතීය ධ්‍යාන

විපාක, චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර යන අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවන කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සතරවැනි ජවනය දක්වාද, සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර, අවිතර්ක අවිචාර චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ පශ්චිමභවික රූපාවචර- අරූපාවචර – පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශ;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන් අතුරෙන්, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවීමට නියත කෙනෙක් වේ නම, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතරය යි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් මරණාසන්න සතරවැනි ජවනය දක්වා ද, සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර – අවිතර්ක අවිචාර චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ සත්ව – අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය තෙක් රූපභූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ද ගනු ලැබෙති.

**සංසය** අභිධෙය්‍ය පෙර සේ ගනු ලැබේ. [භූම්‍යාවකාශය වේ නම්, ධ්‍යාන සමාපන්න නොවූ; ධ්‍යානාවකාශය වේ නම, ධ්‍යාන සමාපන්න වූ යයි කියනු.] **ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** කායමූල – චිත්තමූලී වාරයට සමානය.

අනාගත වාරය නිමි.

---

## වර්තමානාතීත පුද්ගල වාරය

**කායසංස්කාර මූලය**

**වර්තමානාතීත වාරයෙහි** ''යස්ස කායසංඛාරො උප්පජ්ජති, තස්ස වචීසංඛාරො- උප්පජ්ජිත්ථාති,ආමන්තා,**යස්ස වාපන** වචීසංඛාරො උප්පජ්ජිත්ථ තස්ස කායසංඛාරො උප්පජ්ජතීති, සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා අස්සාස-පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අස්සාස-පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං''

**ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන අභිධෙය්‍ය** සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සියලුචිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූද, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයෝය, නිරෝධ සමාපත්ති සමාපන්න වූ අනාගාමී අර්හත් ආර්‍ය පුද්ගලයෝය, අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

[අසංඥතල වාසීන් ප්‍රවෘත්ති කාලයෙහි ද ලැබෙන බැවින් අසංඥසත්ව පුද්ගලයා ගනු ලැබේ යයි ස්වරූප ඉදිරිම සුදුසු බව ඇතැම් ගුරුවරු කියති. සත්‍ය යමකයෙහි උප්පජ්ජන්ත -- චවන්ත යනුම වළඳ බැවින් ඒ ගුරුවරුන්ගේ වචනය නොගන්නා ලදී.]

ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ප්‍රථමධ්‍යාන ජවන (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතියධ්‍යාන ජවන (10) දශය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය, දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින කාම සිත් (44) සතලිස් සතරෙහි උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. [කායමූල චිත්ත මූලිය ද මේ ක්‍රමයට සමානය. ප්‍රත්‍යනීක සංසයක් නොමැත.]

**වචීසංස්කාර මූලය**

''යස්ස වචීසංඛාරො උප්පජ්ජති, තස්ස චිත්තසංඛාරො උප්පජ්ජිස්සති, අමන්තා. **යස්ස වා පන**, සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා විතක්කාවිචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං''

ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය: සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, අවිතර්ක අවිචාර සිත් (55) පස් පණසගේ උත්පාදක්ෂණ සමංගී වූ ද, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, නිරෝධයට සම වැදුනාවූ අනාගාමී අර්හත් ආර්ය පුද්ගලයෝය, අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සෙහි උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර රූපාවචර-අරූපාවචර පුද්ගලයෝය, දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත කාමසිත් (44) සතලිස් සතරය, ප්‍රථමධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය නම් වූ සවිතර්ක සවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර **රූපාවචර – අරූපාවචර** පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. (විස්තර වර්තමාන වාරයට අනුව උදුරනු) ප්‍රත්‍යනීක සංසය නොමැත. නොමැත.

පුද්ගල වාරය නිමි. [ඔකාස වාරය සුගමයි.]

## පුද්ගලෝකාශ වාරය

**කායසංස්කාර මූලය :**

**පුද්ගලෝකාශ වාරයෙහි**, ''**යස්ස යත්ථ** කායසංඛාරො උප්පජ්ජති, තස්ස තත්ථ වචීසංඛාරො උප්පජ්ජිත්ථාති, දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං අස්සාස - පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං අස්සාස - පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**-පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං අස්සාස-පස්සාසානං භංගක්ඛණෙ, තෙසං යෙව විනා අස්සාස - පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය, ආශ්වාස ප්‍රශ්වාස සමඟ උපදින ද්විතිය ධ්‍යාන ජවන (10) දශය, තෘතිය ධ්‍යාන ජවන (10) දශය ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන-තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය ගනු ලැබේ. ආශ්වාස ප්‍රශ්වාස සමඟ උපදින ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය, දෙපස් විඤ්ඤාණ සිත් (10) වර්ජිත ආශ්වාස ප්‍රශ්වාස සමග උපදින කාම සිත් (44) සුසාලිසේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ම ගනු ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය - ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සෙහි භංගක්ෂණ සමංගී වූ ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සෙහි උත්පාදක්ෂණ සමංගී වූද ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය; කාමසිත් (54) සුපණසගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත කාම සිත් (54) සුපණසගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; සුද්ධාවාසය වේ නම් භවනිකන්තික ප්‍රථම ජවනයේ සිට චුතිය දක්වාද සෙසු රූපාවචර අරූපාවචරයක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා ද, සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර අවිතර්ක අවිචාර සිත් (47) සත් සාලිසගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යානසමාපන්න නොවූ, රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොස, අරූප භූමි (4) සතර නම් වූ භූම්‍යාවකාශය ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ මැයි.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** - ''දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං අස්සාස- පස්සාසානං භංගක්ඛණෙ, තෙසං යෙව විනා අස්සාස-පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, චතුත්ථජ්ඣානං සමාපන්නානං, සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''

ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතීය ධ්‍යාන ජවන (10) දශය ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ද්විතීය ධ්‍යාන ජවන (10) දශය හා තෘතීය ධ්‍යාන ජවන (10) දශය ගේ උත්පාදක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නාම වූ ධ්‍යානාවකාශය; චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅටෙහි ක්ෂණත්‍රය සමංගී නාම වූ ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යාන නාම වූ ධ්‍යානාවකාශය; ශුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගය නාම වූ නිත්‍ය ද්විතීය චිත්තය ඡ් සිත සමග වචී සංස්කාරයක් පෙර ඉපද නැති බැවින් තූපන්නෙකුට සමාන හෙයින් ඒ හා සමාන ද්විතීය චිත්තයැයි කියන ලද ප්‍රතිසන්ධි සිතය, භවංග සිත් (15) පසළොසය මනෝද්වාරාවර්ජනය යන මෙ (18) අටළොසක් වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නාම වූ අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස යයි කියන ලද භූමාවකාශ; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය යන භූමාවකාශය ගනු ලැබේ.

**කායමූල චිත්තමූලියෙහි**, අනුලෝම-ආමන්තා; ප්‍රතිලෝමයෙහි, ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා අස්සාස-පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, අස්සාස-පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ'', ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන අභිධෙය්‍ය - ශුද්ධාවාසය වෙ නාම ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයෙහි සිට චුතිය දක්වාද, සෙසු කාමාවචර - රූපාවචර - අරූපාවචර භූමියක් වේ නාම ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සියලුම චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නාම වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර-රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන-තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නාම වූ ධ්‍යානාවකාශ; කාමභූමි (11) එකොළස, අසංඥ තල වර්ජිත රූපභූමි (15) පසළොස, අරූප භූමි (4) සතර යන භූමාවකාශ ගනු ලැබෙති.

ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ප්‍රථමධ්‍යාන ජවන (20) විස්ස, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය හා තෘතීය ධ්‍යාන ජවන (10) දශය ගේ උත්පාදක්ෂණ සමංගී නාම වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නාම වූ ධ්‍යානාවකාශ; ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින, දෙපස් විඥ්ඥාණ සිත් (10) දශය වර්ජිත කාම සිත් (44) සුසාලිසගේ උත්පාදක්ෂණ සමංගී නාම වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නාම වූ භූමාවකාශ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේ ම ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක** අභිධෙය්‍ය - ''සුද්ධාවාසං උප්පජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නාම වූ, අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසය, අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලය නාම වූ භූමාවකාශය ගනු ලැබේ.

**වචීසංස්කාර මූලය**

**වචීමූල චිත්තමූලියෙහි**: අනුලෝම - ආමන්තා; ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා විතක්කවිචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, තෙසං තත්ථ, විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය - ශුද්ධාවාසය වේ නම්; ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ සිට චුතිය දක්වා ද, සෙසු කාමාවචර - රූපාවචර - අරූපාවචර භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගිවූ, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර සිත් (55) පස් පණසගේ උත්පාදක්ෂණ සමංගි වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථමධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; කාමභූමි (11) එකොළස, අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොස, අරූපභූමි (4) සතර යැයි කියන ලද භූම්‍යාවකාශ ගනු ලැබෙති. ප්‍රථම ධ්‍යාන ජවන් (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යානසමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය, දෙපස් විඥ්ඥාණ සිත් (10) දශය වර්ජිත කාමසිත් (44) සූසාලිසය, ප්‍රථමධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය නම් වූ සවිතර්ක සවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරය යි කියන ලද භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. **ප්‍රත්‍යනීක** අභිධෙය්‍ය ''සුද්ධාවාසං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'',

වර්තමානාතීත වාරය නිමි.

---

## වර්තමානානාගත පුද්ගල වාරය

**කාය සංස්කාර මූලය**

**වර්තමානානාගත වාරයෙහි** - ''**යස්ස** කායසංඛාරො උප්පජ්ජති, තස්ස වචී සංඛාරො උප්පජ්ජිස්සතීති, ආමන්තා, **යස්ස වා පන** - සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණේ, විනා අස්සාස - පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අස්සාස-පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං''

**ප්‍රතිලෝම සන්නිට්ඨාන අභිධෙය්‍ය** - මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය , ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර සිතින් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද, තෘතීය ධ්‍යාන විපාක, චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර සිතෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සතරවැනි ජවනය

දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර - පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූවෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද, නොවූද කාමාවචර රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආර්ය පුද්ගලයෝය; අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය; යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන (10) දශයය, තෘතීය ධ්‍යාන ජවන් (10) දශයය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය; ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත කාමසිත් (44) සුසාලිසගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝය යන මේ පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙරසේමය. **ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** - ''පච්ඡිම - චිත්ත සමංගීනං යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං.'' [ශුද්ධ අනාගත වාරයෙහි අවශේෂය අනුව ස්වරූප උදුරනු.]

**කායමූල චිත්තමූලියෙහි** විභංගය ද කායමූල වචීමූලි විභංගය මෙනි. ප්‍රතිලෝම යෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය- ප්‍රතිසන්ධියෙහි සිට පච්ඡිම චිත්තයාගේ පූර්වානන්තරය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාද ක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර ,රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගල යෝය; පශ්චිම භවිකයෙක් නොවේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දකවා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාද ක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න වූද- නොවූද, කාමාවචර - රූපාවචර- අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. කායමූල වචීමූලි සංසය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේමය. **ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** ''පච්ඡිම-චිත්ත සමංගීනං තෙසං''. [ශුද්ධ අනාගත වාරය අනුව ස්වරූප උදුරනු).

**වචී සංස්කාර මූලය**

''සවිතක්ක - සවිචාර පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණේ, තෙසං, ඉතරෙසං විතක්ක විචාරානං උප්පාදක්ඛණේ තෙසං, **යස්ස වා පන** සබ්බෙසං චිත්තස්ස භංගක්ඛ ණේ, විනා අස්සාස - පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණේ, නිරෝධසමා-පන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං,''

**අනුලෝම සන්නිට්ඨාන අභිධෙය** - මහා විපාක ඥානසම්පයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ, කාමාවචර – රූපාවචර - අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයෝ ගනු ලැබෙත්. පශ්චිමචිත්තය හැර සවිතර්ක සවිචාර සිත් (66) සසැට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න වූද- නොවූද කාමාවචර - රූපාවචර පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගීවූ, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර – අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචර – රූපාවචර අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න අනාගාමී අර්හත් ආර්ය පුද්ගලයෝය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය ; යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. පෙර **සංසය** අභිධෙය්‍ය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේ මැයි.

**ප්‍රත්‍යනික සංසය අභිධෙය්‍ය**–සවිතක්ක–සවිචාර–පශ්චිම,චිත්තස්ස භංගක්ඛණේ, අවිතක්ක – අවිචාර පච්ජිමචිත්තසමංගීනං, තෙසං.'' සවිතක්ක සවිචාර පශ්චිම සිත් (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචර – රූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය, අවිතර්ක අවිචාර පශ්චිම සිත් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති.

පුද්ගල වාරය නිමි. (ඔකාස වාරය සුගමයි)

---

## පුද්ගලෝකාස වාරය

**කාය සංස්කාර මූලය**

**පුද්ගලෝකාස වාර, කායමූල වචීමූලියෙහි** ''**යස්ස යත්ථ** කායසංඛාරෝ උප්පජ්ජති, තස්ස තත්ථ වචී සංඛාරෝ උප්පජ්ජිස්සතීති, දුතියජ්ඣානං, තතිය ජ්ඣානං සමාපන්නානං අස්සාස - පස්සසානං උප්පාදක්ඛණේ තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං අස්සාස - පස්සසානං උත්පාදක්ඛණේ තෙසං තත්ථ, **යස්ස වා පන** පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං අස්සාස පස්සාසානං භංගක්ඛණේ, තෙසං යෙව විනා අස්සාස - පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණේ, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ.''

අනුලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය - ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ද්විතීය ධ්‍යාන ජවන (10) දශය තෘතීය ධ්‍යාන ජවන (10) දශය ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානෝක්කාසය; ප්‍රථම ධ්‍යානයට නියත වශයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, ආශ්වාස ප්‍රශ්වාස සමග අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානෝක්කාසය ගනු ලැබේ. ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර චිත්තය දක්වාද, ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ප්‍රථම ධ්‍යාන ජවන් (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානයයි කියන ලද ධ්‍යානාවකාශය; දෙපස් විඥ්ඥාණ සිත් (10) දශය වර්ජිත ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින කාම සිත් (44) සූසාලිසගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශයද ගනු ලැබේ. [සංසය අභිධෙය්‍ය පෙර සේමය]

ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය - ප්‍රථම ධ්‍යානයට නියත වශයෙන් මතු සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සමනොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර චිත්තය දක්වාද, ප්‍රථම ධ්‍යාන ජවන් (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය; [ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ නම වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගල යන්ගේ කාමසුගති භූමි (7) සත යයි කියන ලද භූම්‍යාවකාශය, ඒකාන්ත ස්වරූපයෝය]

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක්වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, මතු නූපදින කෙනෙක්වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තරචිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින කාමාවචර සිත් (54) සූපණසගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින කාමාවචර සිත් (54) සූපණසගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපනන නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; ප්‍රථම ධ්‍යාන විපාක, ද්විතීය ධ්‍යාන විපාක යයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දකවාද, තෘතීය ධ්‍යාන විපාක, චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සතරවැනි ජවනය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්ත යන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ, රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන්, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, තෘතීය ධ්‍යානවිපාක චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර නම් වූ අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම් , ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සිව්වැනි ජවනය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අංසඥතල - අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) හතරයයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ වෙහප්ඵලය දක්වා රූප භූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ. [අනාගත ශුද්ධ වාරයෙහි, රූපාවචරානං, අරූපාවචරානං යන්නට සමානයි]

**ප්‍රත්‍යනීක සංශය** අභිධෙය්‍ය - ''පච්ඡිමචිත්ත - සමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, දුතියජ්ඣානං, තතියජ්ඣානං සමාපන්නානං, අස්සාස - පස්සාසානං භංගක්ඛණේ, තෙසං යෙව විනා අස්සාස-පස්සාසෙහි චිත්තස්ස උත්පාදක්ඛණේ, චතුත්ථජ්ඣානං සමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.'' ''පච්ජිම චිත්ත සමංගීනං'' (ඒකාන්ත - අනේකාන්තයි) [ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සමවදින කෙනෙක් වේනම් අන්තිම ධ්‍යාන චිත්තයාගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න වූ කාම - රූප- -අරූප පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය]

''යස්ස චිත්තස්ස අනන්තරා'' (ඒකාන්ත - අනේකාන්ත) අනාගත වාරය අනුව ස්වරූප උදුරනු. ද්විතීය ධ්‍යාන ජවන සිත් (10) දශය හා තෘතීය ධ්‍යාන ජවනසිත් (10) දශයයේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව ද්විතීය ධ්‍යාන (10) දශය, තෘතීය ධ්‍යාන (10) දශයගේ උත්පාද ක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය හා චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅටගේ ක්ෂණත්‍රය සමංගී වූ චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය, අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල නම් වූ භූම්‍යාවකාශය ගනු ලැබේ.

**කායමූල චිත්තමූලියෙහි** - අනුලෝම - ආමන්තා; ප්‍රතිලෝමයෙහි, ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණේ, විනා අස්සාස - පස්සාසෙහි චිත්තස්ස උත්පාදක්ඛණේ තෙසං තත්ථ, අස්සාස - පස්සාසනං උප්පාදක්ඛණේ තෙසං තත්ථ,'' ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අභිධෙය්‍ය: පශ්චිම සිත් [ජ-ත-භ] (3) තුන හැර සියලු චිත්තයන්ගේ

භංගක්ෂණ සමංගී නම් වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සියලු චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතර හා භූම්‍යාවකාශ (3) තුන ගනු ලැබෙති. [සංසය වනාහි වර්තමාන වාරයෙහි "අස්සාස පස්සාසානං උප්පාදක්ඛණෙ" ස්වරූප අනුව උදුරනු.]

**ප්‍රත්‍යනික සංසය අභිධෙය්‍ය** - "පච්ඡිම-චිත්ත-සමංගීනං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ පශ්චිම චිත්ත සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය, ප්‍රථමධ්‍යාන - ද්විතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම - ද්විතීය - තෘතීය - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; (අනෝකාන්තය කියනු] අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලය නම් වූ භූම්‍යාවකාශය ගනු ලැබේ. [අනාගත සංසය මැයි. විශේෂයක් නොමැත]

තවත් ක්‍රමයක් කියනු ලැබේ. අනුලෝමයෙහි **සන්නිට්ඨාන පදයේ අභිධෙයාර්ථ** නම්, ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන යන්ට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශ ගනු ලැබේ. ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන යන්ට නියතයෙන් සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදිනා කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර චිත්තය දක්වාද, ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්ස ද්විතීය ධ්‍යාන ජවන් සිත් (10) දශය හා තෘතීය ජවන් සිත් (10) දශයගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය;

දෙපස් වි ඤ්ඤාණ සිත් (10) දශය වර්ජිතවූ ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින කාමසිත් (44) සූසාලිසගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශයද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ. (සන්නිට්ඨාන ස්වරූප වනාහි ලැබීමට සුදුසු නිසා උදුරන ලදි. පෙළෙහි නැත)

ප්‍රතිලෝම **සන්නිට්ඨාන අභිධෙය්‍ය**: ප්‍රථම ධ්‍යාන - ද්විතීය .ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම වදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර

ධ්‍යානය දක්වාද, සුදුසු පරිදි උපදින ධ්‍යාන ජවනයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාම - රූප - අරූපී පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ සතරය; ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තරය චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප අරූපී පශ්චිමභවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූපී පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥතල - අකනිට්ඨ වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූපී පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශයය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශ ගනු ලැබෙති. අනුලෝම සංසයද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක අභිධෙය්‍ය:** ''පච්ඡිම-චිත්ත සමඞ්ගීනං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, අන්තිම කර්මජ රූප යන මේ ධර්මයන්ගේ ක්ෂණ ත්‍රය සමංගී වූ , අර්හත් ඵලස්ථ ආයුෂ් පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි නැවත නූපදින චුති සිත් (19) එකුන් විස්සගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ කාම - රූපී - අරූපී පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥතල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; ප්‍රථම ධ්‍යාන ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත වූ අන්තිම ධ්‍යානයාගේ උත්පාද ක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න වූ කාම රූප - අරූපී පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතරය, අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල නම් වූද භූම්‍යාවකාශය ගනු ලැබේ.

**වචී සංස්කාර මූලය**

**වචීමූල චිත්තමූලීයෙහි:** "සවිතක්ක - සවිචාර-පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, ඉතරෙසං විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්සවා පන යත්ථ** සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා විතක්ක - විචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ," අනුලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය** මහා විපාක ඥානසම්ප්‍රයුක්ත (4) සතර හා ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර පශ්චිම සිත් (6) සදෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, ආභස්සරය තෙක් රූපභූමි (6) සයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින සවිතර්ක සවිචාර චුති සිත් (12) දොළස හා චෛතසික (35) පන්තිසගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, ආභස්සරය තෙක් රූපභූමි (6) සයයි කියන ලද භූම්‍යාවකාශය හා ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම් ,අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණ සමංගී නාම් වූ, ධ්‍යාන සමාපන්න වූ කාම - රූප - අරූපී පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය ගනු ලැබේ. ජවන - තදාරම්මණ භවංග යන පශ්චිම සිත් (3) තුන හැර සවිතර්ක සවිචාර සිත් (66) සසැට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න වූද, නොවූද කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය, කාමභූමි (11) එකොළසය, අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය අභිධෙය්‍ය** පෙර සේ ගනු ලැබේ

[තවත් අන් ක්‍රමයකි. ප්‍රථම ධ්‍යානයට සමවදින්නාවූම කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නාවූම කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යාන චිත්තය දක්වාද. ප්‍රථම ධ්‍යාන ජවන (20) විසිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාම - රූප - අරූප පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර සිත් (46) සසාලිසගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාම- රූප අරූප පශ්චිම භවික පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතය, අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූපභූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර සිත් (46) සසාලිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූප පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥතල - අකනිට්ඨ තල වර්ජිතරූප භූමි (15) පසළොසය, අරූපභූමි (4) සතරයයි කියනලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර සිත් (46) සසාලිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූප පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය නෙක් රූප භූමි (10) දශය, අරූපභූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයද ගනු ලැබේ. **සංසය අභිධෙය්‍ය** පෙර සේ ගනු ලැබේ.]

ප්‍රතිලෝමයෙහි **සන්නිවර්‍ධාන අභිධෙය්‍ය** ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර චිත්තයන්ගේ උත්පාද ක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න වූද- නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතරය; භූම්‍යාවකාශ (3) තුනය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි සිට චුතියට පූර්වානන්තරය චිත්තය දක්වාද ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම් , අන්තිම ධ්‍යානය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න වූද – නොවූද, කාමාවචර – රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතරය, කාම භූමි (11) එකොළසය, අසංඥතල – අකනිට්ඨතල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද – නොවූද කාමාවචර රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතර හා කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය දක්වා රූපභූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

[**තවත් කෙටි ක්‍රමයකි** ජවන, 'තදාරම්මණ, භවංග යන පශ්චිම චිත්තයන් (3) තිදෙන හැර, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න වූ-නොවූ කාමාවචර රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතර හා භූම්‍යාව-කාශ (3) තුන ගනු ලැබෙති. මෙසේද ස්වරූප උදුරා දක්වති.] පශ්චිම සිත් (3) තුන හැර සවිතර්ක සවිචාර සිත් (66) සසැට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද – නොවූද කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය ගනු ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

[**තවත් ක්‍රමයකි**: ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙය්‍ය - ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යානය දක්වාද, සියලුම ධ්‍යාන ජවනයන්ගේ භංගක්ෂණ සමංගී වූද, ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන ජවනයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න වූ කාම - රූප - අරූප පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතරය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූප පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය. අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූප පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥතල - අකනිට්ඨතල වර්ජිත රූපභූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූප පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.]

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය**: ''සවිතක්ක - සවිචාර - පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ අවිතක්ක - අවිචාර - පච්ඡිම චිත්ත සමංගීනං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' සවිතර්ක සවිචාර පශ්චිම චිත්ත (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, ආභස්සර තලය තෙක් රූපභූමි (6) සයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින සවිතර්ක සවිචාර චුති සිත් (12) දොළසගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, ආභස්සර තලය තෙක් රූප භූමි (6) සයයි කියන ලද භූම්‍යාවකාශය; ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න වූ කාම - රූප අරූප පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; තෘතීය ධ්‍යාන විපාකය චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන

ලද අවිතර්ක අවිචාර සිත් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර – අරූපාවචර අර්හත් එලස්ථ ආයඞ් පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල හා අසංඥතල වර්ජිත රූපභූමි (12) දොළසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූමාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින අවිතර්ක අවිචාර චුති සිත් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල, අසංඥතල හා අකනිට්ඨතල වර්ජිත රූප භූමි (11) එකොළසය, අරූපභූමි (4) සතර යයි කියන ලද භූමාවකාශය; ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන – චතුර්ථ ධ්‍යාන යන්ට නියතයෙන් සම නොවඩින්නා වූ කෙනෙක් වේ නම් , අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර-රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල නම් වූ භූමාවකාශය ගනු ලැබේ.

වර්තමානානාගත වාරය නිමි

---

## අතීතානාගත පුද්ගල වාරය

### කාය සංස්කාර මූලය

**අතීතානාගත වාරයෙහි**, ''**යස්ස** කායසංඛාරෝ උප්පජ්ජිත්ථ, තස්ස වචීසංඛාරෝ උප්පජ්ජිස්සතීති, පච්ඡිමචිත්තසමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක- අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති තෙසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන ආමන්තා,''**

අනුලෝම **සන්නිට්ඨාන** අභිධෙය: ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ කාමාවචර රූපාවචර – අරූපාවචර අර්හත් එලස්ථ ආයඞ් පුද්ගලයෝය; තෘතීය ධ්‍යාන විපාක, චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම්, පඤ්චම ජවනයාගේ ක්ෂණත්‍රය සමංගී වූ, භවංගයෙන් පසුව චුතිය වේ නම් පඤ්චම ජවන – භවයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ, රූපාවචර - අරූපාවචර අර්හත් එලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. මහා විපාක ඥාන සම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වාද, තෘතීය ධ්‍යාන විපාක, චතුර්ථ ධ්‍යාන

විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර නම් වූ අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සතර වැනි ජවනය දක්වා, ධ්‍යාන සමාපන්න වූද නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා ධ්‍යාන සමාපන්න වූද නොවූද කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේම ලැබේ.

**කායමූල චිත්තමූලියෙහි** අනුලෝම - ''පච්ඡිමචිත්ත සමංගීනං තෙසං, ඉතරෙසං තෙසං , **යස්ස වා පන** - ආමන්තා,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූප**, ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්ය පුද්ගලයෝ ගනු ලැබෙති. ප්‍රතිසන්ධියේ සිට පශ්චිම **චිත්තයට** පූර්වානන්තර **චිත්තය** දක්වා සුදුසු පරිදි උපදිනා චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද-නොවූද කාමාවචර - රූපාවචර – අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය, පශ්චිම භවික නොවූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා, ධ්‍යාන සමාපන්න වූද නොවූද, කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙරසේම ගනු ලැබේ.

[වචීමූල චිත්තමූලියෙහිද නය ක්‍රමය සමානය. මේ යමක තුනෙහි ප්‍රත්‍යනීක සංසය නොමැත.]

පුද්ගලවාරය නිමි. [ඕකාස වාරය සුගම යි]

---

## පුද්ගලෝකාස වාරය

කාය සංස්කාර මූලය:

''**යස්ස යත්ථ** කායසංඛාරො උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ වචීසංඛාරො උප්පජ්ජිස්සතීති, කාමාවචරෙ පච්ඡිම-චිත්ත-සමංගීනං, දුතියජ්ඣානං, තතියජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** – රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ,''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය** – කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතර හා චෛතසික (33) තෙතිසගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ කාමාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදිනා කාම චුති සිත් (10) දශය, චෛතසික (33) තෙතිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි චුතවන පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර – රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය;

ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතීය ධ්‍යාන ජවන (10) දශය ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර -රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය ගනු ලැබේ. ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සමවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොව දින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යානය දක්වාද, ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, මතු උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශයද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙරසේ ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිධාන ස්වරූපාර්ථ** - ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක්වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වාද තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූපවිපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සතරවැනි ජවනය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවීම නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙහි සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න සතරවැනි ජවනය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥතල අකනිට්ඨතල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේ ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංශය අභිධෙයය**-''රූපාවචරෙ, අරූපාවචරෙ, පච්ඡිමචිත්ත-සමංගීනං යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, චතුත්ථජ්ඣානං සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,''

මහග්ගත චුති සිත් (9) නවය, චෛතසික (35) පන්තිස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූපභූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින මහග්ගත චුති සිත් (9) නවය, චෛතසික (35) පන්තිසගේ භංගක්ෂණ සමංගීවූ, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර චුතවන පුද්ගලයන්ගේ අසංඥ තල - අකනිට්ඨා තල වර්ජිත වූ රූපභූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය, අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසු චුතිය වේ නම්, පඤ්චම ජවනයාගේ ක්ෂණත්‍රය සමංගී වූ, භවංගයෙන් පසුව චුතිය වේ නම්, පඤ්චම ජවන - භවංගයන්ගේ ක්ෂණත්‍රය සමංගීවූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල අසංඥ තල වර්ජිත රූප භූමි (12) දොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම්, පඤ්චම ජවනයාගේ ක්ෂණත්‍රය සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම්, පඤ්චම ජවන - භවංගයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල, අසංඥ තල, අකනිට්ඨා තල වර්ජිත වූ රූපභූමි (11) එකොළසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; චතුර්ථ ධ්‍යාන ජවන (18) අටළොසගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල භූමියයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

## කායමූල චිත්ත මූලීය

**කායමූල චිත්තමූලියෙහි**-අනුලෝමයෙහි-''කාමාවචරෙ පච්ඡිමචිත්ත-සමංගීනං තෙසං තත්ථ, පඨමජ්ඣානං දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං ඉතරෙසං කාමාවචරානං, තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**- චතුත්ථජ්ඣානං සමාපන්නානං, රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ.''

අනුලෝමයෙහි සන්නිට්ඨාන අභිධෙය්‍ය - කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතර හා චෛතසික (33) තෙතිස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ කාමාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශය; තමන්

ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කාම චුති සිත් (10) දශය හා චෛතසික (33) තෙතිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ, කාමාවචරයෙහි චුතවන පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය, ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථමධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය ගනු ලැබේ. ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සම වදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යානය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන -ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගීවූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේ මැයි.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**-චතුර්ථ ධ්‍යානයට නියතයෙන් සම වදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යානය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය තෙක් රූපභූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ. අනුලෝම් සංසය ද ගනු ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේ මය.

ප්‍රත්‍යනීක සංඝය අභිධෙය්‍ය- ''රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමචිත්ත -සමංගීනං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''

මහග්ගත චුති සිත් (9) නව දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයභ් පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින මහග්ගත චුති සිත් (9) නවය, චෛතසික (35) පන්තිස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ අසංඥ තල - අකනිටා තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; චතුර්ථධ්‍යානයට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

### චච්මූල චිත්තමූලීය

**චච්මූල චිත්තමූලීයෙහි** ''සවිතක්ක සවිචාර භූමියං පචඡිමචිත්ත සමංගීනං තෙසං තත්ථ, ඉතරෙසං සවිතක්ක - සවිචාර භූමියං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, අවිතක්ක - අවිචාර භූමියං තෙසං තත්ථ,''

අනුලෝමයෙහි **සන්නිවයාන ස්වරූපාර්ථ**-ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස, චෛතසික (35) පන්තිස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ කාමාවචර - රූපාවචර අරූපාවචර අර්හත් ඵලස්ථ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින චුතිසිත් (19) එකුන් විස්සය, චෛතසික (35) පන්තිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචර - රූපාවචර-අරූපාවචර චුතවන පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥ තල - අකනිටා තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය, නියතයෙන් ප්‍රථම ධ්‍යානයට සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යාන යාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර-රූපාවචර පුද්ගල යන්ගේ ප්‍රථම ධ්‍යානයයි කියන ලද ධ්‍යානාවකාශය ගනු ලැබේ.

නියතයෙන් ප්‍රථම ධ්‍යානයට සම වදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක්වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන් තර ධ්‍යානය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර-රූපාවචර-අරූපාවචර පුද්ගල යන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය , ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින

කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූමාවකාශය; ශුද්ධාවාසය වේ නම් භවනිකාන්තික ප්‍රථම ජවනයේ සිට පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වාද, අවශේෂ රූපාවචර - අරූපාවචර භූමියක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද,ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර-අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූමාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන්, සුද්ධාවාසයෙහි වේ නම්, භවනිකාන්තික ප්‍රථම ජවනයේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, අවශේෂ රූපාවචර - අරූපාවචර භූමියෙක්හි වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර-අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූමාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය දක්වා රූපාවචර භූමි (10) දශය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූමාවකාශයද ගනු ලැබේ. **සංසය අභිධෙය්‍ය** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය** නියතයෙන් ද්විතීය ධ්‍යාන -තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට සම වදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වා ද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යානය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධිය භවංග වාර (16) සොළසය, මනෝද්වාරාවර්ජනය යන මේ චිත්තවාර (18) අටළොස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමි ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (15) පසළොස නම් වූ භූමාවකාශය ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර මෙනි.

**ප්‍රත්‍යනීක සසංය අභිධෙය්‍ය** - ''අවිතක්ක-අවිචාර භූමියං පච්ඡිමචිත්ත - සමංගීනං අස ඤ්ඤසත්තානං තෙසං තත්ථ.'' නියතයෙන් ද්විතීය ධ්‍යාන-තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ ක්ෂණත්‍රය සමංගී යයි කියන ලද ධ්‍යාන සමාපන්න කාමාවචර-රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජනයන්ගේ අසංඥ තල යයි කියන ලද භූමාවකාශය ගනු ලැබේ.

අතීතානාගත වාරය නිමි.

---

උත්පාද වාරය නිමි.

## ප්‍රවෘත්තිවාර නිරෝධ වර්තමාන වාරය

[නිරෝධ වාරයෙහි වර්තමාන වාරය, උත්පාද වර්තමාන වාරයට සමානයි. උත්පාද වාරයෙහි උත්පාදක්ෂණය, නිරෝධ වාරයෙහි භංගක්ෂණ යයි කීම පමණක් විශේෂයි. අතීත වාරය ද සියල්ල සමානයි.]

## අනාගත පුද්ගල වාරය

### කාය සංස්කාර මූලය

**අනාගත වාරයෙහි කායමූලවචීමූලියෙහි**, අනුලෝම–ආමන්තා; ''**යස්ස වා පන** කාමාවචරානං පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණේ, යස්ස **චිත්තස්ස** අනන්තරා කාමාවචරානං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, රූපාවචරේ අරූපාවචරේ පච්ඡිමභවිකානං, යේච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, වචන්තානං තෙසං ඉතරෙසං තෙසං,''

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූප**, ත්‍රිහේතුක කාම චුති සිත් (4) සතරය, චෛතසික (33) තෙතිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර අර්හත් ඵලස්ථ ආයු පුද්ගලයෝය; පශ්චිම චිත්තයාගේ සිට ආපසු ගැනීමේදී අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට නිරුද්ධ වන චිත්තයේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර වූ දෙවැනි තදාරම්මණය මරණාසන්න පස්වෙනි ජවනය, භවංගය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර අර්හත් ඵලස්ථ ආයු පුද්ගලයෝ ය; ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පස්වෙනි ජවනයාගේ උත්පාදය දක්වාද, ධ්‍යාන සමාපන්න වූද නොවූද, රූපාවචර-අරූපාවචර පශ්චිමභවික පුද්ගලයෝය; කාම සුගති භූමි (7) සතෙන් රූපාවචර – අරූපාවචර භූමියකට පැමිණ පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට නිරුද්ධ වන චිත්තයේ සිට චුතිය දක්වා කාමාවචර චුතවන පුද්ගලයෝය; රූපාවචර – අරූපාවචර භූමි එකින් එක ඉහළට ඉපද පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා අසංඥ තල – අකනිට්ඨ තල වර්ජිත රූපි – අරූපි පුද්ගලයෝය; යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [උත්පාදයෙහිද අසංඥ සත්ව – අකනිට්ඨයන් අත්හැරීමට කැමති වෙමු.]

ප්‍රතිසන්ධියේ සිට අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධ වන චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා ධ්‍යාන සමාපන්න වූද – නොවූද, කාමාවචර පශ්චිම භවික පුද්ගලයෝය; කාමසුගති භූමි (7) සතෙන් චුතව රූපාවචර - අරූපාවචර භූමියකට පැමිණ පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට අන්තිම ආශ්වාස

ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධ වන චිත්තයාගේ උත්පාදය දක්වා ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර පුද්ගලයෝය; කාමාවචර භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා කාමාවචර පුද්ගලයෝය; සුද්ධාවාස වර්ජිත රූප - අරූප පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය අභිධෙය්‍ය** පෙර මෙනි.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** - ''සවිතක්ක - සවිචාර - පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේ, අවිතක්ක අවිචාර පච්ඡිමචිත්ත - සමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති තෙසං,'' මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය නම් වූ සවිතර්ක සවිචාර පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ කාමාවචර රූපාවචර අර්හත් ඵලස්ථ පුද්ගලයෝය; තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර පශ්චිම චිත්තයන් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝය; අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම් පස්වැනි ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම්, පස්වැනි ජවනයාගේ භංගය, භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූද, රූපාවචර-අරූපාවචර - අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝ ගනු ලැබෙති.

[කායමූල චිත්තමූලියද, කායමූල වචීමූලි වාරයට සමානය]

ප්‍රතිලෝම **සන්නිට්ඨාන අභිධෙය්‍ය** වනාහි ''කාමාවචරානං......'' [යනාදි වශයෙන් පෙර සේ ස්වරූපාර්ථ උදුරනු.] රූපාවචරෙ අරූපාවචරෙ යන තැන්හි, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා ධ්‍යාන සමාපන්න වූද-නොවූද රූපාවචර - අරූපාවචර පශ්චිම භව්‍ික පුද්ගලයෝය. [විශේෂය මෙපමණකි. සෙස්ස කායමූල වචීමූලි වාරය අනුව උදුරනු. ]

## වචීමූල චිත්තමූලීය

**වචීමූල - චිත්තමූලියෙහි**, අනුලෝම - ආමන්තා, ''**යස්ස වා පන** අවිතක්ක අවිචාර පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණේ, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති තෙසං , ඉතරෙසං තෙසං''

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**: තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතරයයි කියන ලද අවිතර්ක - අවිචාර පශ්චිම චිත්තයන් (7) සත් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝය; අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම්, පස්වැනි ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම්, පඤ්චම ජවනයාගේ භංගය , භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූද, රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝ ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් මරණාසන්න පස්වැනි ජවනයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද, නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද, අකනිට්ඨ තලවර්ජිත කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර මෙනි. [ධ්‍යාන සමාපන්න වූද - නොවූද යනු නොකිවත් මැනවි.]

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ**- කායමූල චිත්තමූලී, වචීමූල චිත්තමූලී යන මේ යමක දෙකෙහි "පච්ඡිමචිත්තස්ස භංගක්ඛණේ තෙසං", ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ කාමාවචර රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඝ්‍ය පුද්ගලයෝ ගනු ලැබෙ.

පුද්ගල වාරය නිමි [ඕකාස වාරය සුගමයි]

## පුද්ගලෝකාස වාරය

### කාය සංස්කාර මූලය

"**යස්ස යත්ථ** කායසංඛාරෝ නිරුජ්ඣිස්සති, තස්ස තත්ථ වචීසංඛාරෝ නිරුජ්ඣිස්සතීති, දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** කාමාවචරානං පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණේ, යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, රූපාවචරානං, අරූපාවචරානං තෙසං තත්ථ,'

[අනුලෝමයෙහි **සන්නිට්ඨාන සංසය** දෙකම උත්පාදවාර අනාගතය අනුව කියන ලද්ද අතුරෙන් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධ වන ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, චිත්තයාගේ උත්පාදය දක්වාද, කියා ස්වරූප උදුරනු විශේෂයක් නොමැත.]

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**: කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතර හා චෛතසික (33) තෙතිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර අර්හත් ඵලස්ථ ආයඝ්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කාමචුති

සිත් (10) දසදෙනාගේ උත්පාදක්ෂණසමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස යයි කියන ලද භූම්‍යාවකාශය පශ්චිම චිත්තයේ සිට ආපසු ගැනීමේදී අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධවන චිත්තයේ සිට පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර වූ දෙවැනි තදරම්මණය, මරණාසන්න පඤ්චම ජවන - භවංග දක්වා කාමාවචර අර්හත් ඵලස්ථ ආයසී පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධවන චිත්තයාගේ සිට චුතියට පූර්වානන්තර වූ දෙවැනි තදරම්මණය, මරණාසන්න පඤ්චම ජවනය, භවංගය දක්වා, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; කාමාවචර භූමියෙහි නියතයෙන් ප්‍රථම ධ්‍යානයට සම නොවදින්නා වූද, රූපාවචර - අරූපාවචර භූමියෙහි පමණක් සම වදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයෝ්ය; රූපාවචර - අරූපාවචර භූමියෙහිද සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝ්ය; මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවාකාශය:

ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය නම් වූ සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිචාර අවිතර්ක චිත්තයෙන් පිරිනිවීමට නියතවූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චමජවනයාගේ උත්පාදය දක්වාද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදය දක්වාද, අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර-අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල-අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ වෙහප්ඵලය දක්වා රූපභූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ. **[සංසය** වනාහි උත්පාද වාරය අනුව උදුරනු.]

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** "සවිතක්ක - සවිචාර - පච්ඡිම චිත්තස්ස-භංගක්ඛණේ, අවිතක්ක - අවිචාර - පච්ඡිමචිත්ත- සමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, චතුත්ථජ්ඣානං සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,"

මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථමධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර පශ්චිම චිත්තයන් (6) සදෙනගේ භංගක්ෂණ සමංගී නම් වූ, කාමාවචර - රූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, ආභස්සර තලය තෙක් රූපාවචර භූමි (6) සයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කාම චුති සිත් (10) දශය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චුති සිත් (12) දෙළොස හා චෛතසික (35) පන්තිස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ කාමාවචර - රූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, ආභස්සර තලය දක්වා රූප භූමි (6) සයයි කියන ලද භූම්‍යාවකාශය;

ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාමාවචර රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය; තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර පශ්චිමචිත්තයන් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම්වූ රූපාවචර අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල අසංඥ තල වර්ජිත වූ රූප භූමි (12) දෙළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින අවිතර්ක අවිචාර චුති සිත් (7) සත් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල, අසංඥ තල, අකනිට්ඨා තල වර්ජිත රූප භූමි (11) එකොළසය අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය;

අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, පඤ්චම ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම් පඤ්චම ජවනයාගේ භංග – භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල අසංඥ තල වර්ජිත රූප භූමි (12) දෙළසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, පඤ්චම ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම්, පඤ්චම ජවනයාගේ භංග - භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී වූද, රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානතල- අසංඥ තල- අකනිට්ඨාතල

වර්ජිත රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාව-කාශය කාමාවචර භූමියෙහි ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින්නා වූ, රූපාවචර - අරූපාවචර භූමින්හි පමණක් සම වදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; රූපාවචර අරූපාවචර භූමින්හිද නියතයෙන් සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධ වන ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; යන මේ පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන – තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය;

**තවත් නය ක්‍රමයකි**, කාමාවචර භූමියෙහි ද්විතීය ධ්‍යාන – තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාය සමඟ එකට නිරුද්ධ වන ධ්‍යානයාගේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්නවූ කාමාවචර පුද්ගලයෝය; ප්‍රථමයෙන් සමවැදුන ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සාමපන්න වූ රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය;

[පුරාණ ග්‍රන්ථයෙහි, රූපාවචර - අරූපාවචර භූමියෙහි නියතයෙන් ධ්‍යාන සම වදින්නා වූද – සම නොවදින්නා වූ දැයි කියා නිකරුණේ ස්වරූප ගන්නා ලද බැවින්ද, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ධ්‍යානයේ සිට රූපාවචර අරූපාවචර පුද්ගලයන් කියා ස්වරූප ගත් බැවින්ද, ඌනක – අධික දෙස් දක්වා තවත් ක්‍රමයක් දක්වන ලද්දේ වෙයි]

චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅට දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර – රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය: අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය නම් වූ භූම්‍යාවකාශය ගනු ලැබෙති.

**කාය මූල චිත්තමූලි**

**කාය මූල චිත්තමූලියෙහි**: අනුලෝම – ආමන්තා; ප්‍රතිලෝමයෙහි, ''කාමාවචරානං පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, චතුත්ථජ්ඣානං සමාපන්නානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, පඨමජ්ඣානං, දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (කාමාවචරානං පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ යන තන්හි කාම ත්‍රිහේතුක චුතිසිත් (4) සතරය, (පෙර සේ ඒකාන්ත – අනේකාන්ත උදුරනු.) අනන්තරා – පෙ පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති' යන තන්හි පච්චිම චිත්තයේ සිට ආපසු ගැනීමේදී පෙ- ඒකාන්ත අනේකාන්ත පෙරසේ උදුරනු.]

කාමාවචර භූමියෙහි ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින්නා වූ, රූපාවචර - අරූපාවචර භූමියෙහි පමණක් සමවදින්නාවූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ රූපාවචර අරූපාවචර පුද්ගලයෝය; රූපාවචර-අරූපාවචර භූමින්හිද සම නොවදින්නා වූ කෙනෙක්වේ අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධ වන්නා වූ ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; යන මේ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය;

**තවත් ක්‍රමයකි**: කාමාවචර භූමියෙහි ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින්නා වූ, රූපාවචර - අරූපාවචර භූමියෙහිම සම වදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට නිරුද්ධ වන්නා වූ ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයෝය; ප්‍රථමයෙන් සමවැදුනා වූ ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; රූපාවචර - අරූපාවචර භූමියෙහිද ධ්‍යාන සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමග එකට නිරුද්ධ වන්නා වූ ධ්‍යානයේ සිට අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයෝය; ප්‍රථමයෙන් සාමාපන්න වූ ධ්‍යානයාගේ පටන් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වා ධ්‍යාන සමාපන්න වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; [මේ ක්‍රමදෙක අතුරෙන් පසුව කියන ලද ක්‍රමය අපේ ආචාර්ය පාදයෝ උගන්වති].

චතුර්ථ ධ්‍යානයට නියතයෙන් සමවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය, යන මේ පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය

සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය දක්වා රූපභූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබෙති.

කාමාවචර භූමියෙහි ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යානයන්ට නියත යෙන් සම වදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර පුද්ගලයෝය: ධ්‍යාන සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින්නා වූ ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යාන චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයෝය; ඒ පුද්ගල යන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය ප්‍රතිසන්ධියේ සිට අන්තිම ආශ්වාස ප්‍රශ්වාසයන් දක්වා උපදින (33) තෙතිස් චිත්තයන්ගේ පූර්වාන්න්තර චිත්තය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නුපදින කෙනෙක් වේ නම් , ප්‍රතිසන්ධියේ සිට අන්තිම ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද, උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය සවරූප** පෙර සේමයි.

**ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ**: ''පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ''ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස හා චෛතසික (35) පන්තිසගේ භංගක්ෂණ සමංගී වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයර් පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නුපදින්නාවූ චුති සිත් (19) එකුන් විස්ස හා චෛතසික (35) පන්තිසගේ භංගක්ෂණ සමංගී නම් වූ චුතවන්නා වූ කාම - රූප අරූප පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥ තල අකනිටා තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය, ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර- රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන- ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; අසංඥ තල යෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ භූමියයි කියන ලද භූම්‍යාවකාශ ගනු ලැබෙති.

## වචී මූල චිත්තමූලි:

**වචීමූල චිත්තමූලියෙහි** අනුලෝම, ආමන්තා; ප්‍රතිලෝමයෙහි, ''අවිතක්ක අවිචාර - පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, දුතියජ්ඣානං, තතියජ්ඣානං, චතුත්ථජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං, ඉතරෙසං අරූපාවචරානං තෙසං තත්ථ''.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ**: අවිතර්ක අවිචාර පශ්චිම චිත්තයන් (7) සත්දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල වර්ජිත රූප භූමි (12) දෙළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ අවිතර්ක අවිචාර චුති සිත් (7) සත්දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල - අකනිට්ඨා තල වර්ජිත රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය;

[තෘතීය ධ්‍යාන විපාක, චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසු චුතිය වන්නේ නම්, පස්වැනි ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වන්නේ නම්, පස්වැනි ජවනයාගේ භංගක්ෂණ, භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී වූද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල-අසංඥ තල වර්ජිත වූ රූප භූමි (12) දෙළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නා වූ පුද්ගලයන් අතුරෙන් අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, පස්වැනි ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වන්නේ නම්, පස්වැනි ජවනයාගේ භංගක්ෂණ, භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල - අකනිට්ඨා තල වර්ජිත වූ රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;]

ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම වදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශ ගනු ලැබෙති.

ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම වදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ කාමාවචර පශ්චිමභවික, පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත නම් වූ භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද,

නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය;

ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්,ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් චුත වන්නට නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාක, චතුර්ථ ධ්‍යාන විපාක, පඤ්චම ධ්‍යාන විපාක, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත කෙනෙක් වේ නම් , ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයද ගනු ලැබේ.

**සංසය අභිධෙය්‍ය** පෙර සේම ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** - [කායමූල චිත්තමූලියට සමානමැයි.]

අනාගත වාරය නිමි.

---

[වර්තමානාතීත වාරයද, උත්පාදවාර - වර්තමානාතීත වාරය අනුව කියන ලද්ද කෙරෙන්, උත්පාදක්ෂණය - භංගක්ෂණය කියාද, භංගක්ෂණය - උත්පාදක්ෂණය කියාද මාරු කොට ස්වරූප උදුරනු.]

## වර්තමානානාගත පුද්ගල වාරය

# කාය සංස්කාර මූලය

**වර්තමානානාගත වාරයෙහි** – "**යස්ස** කායසංඛාරො නිරුජ්ඣති තස්ස වචීසංඛාරො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, **යස්සවා පන** සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, විනා අස්සාස-පස්සාසෙහි චිත්තස්ස භංගක්ඛණෙ, නිරෝධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං,අස්සාස – පස්සාසානං භංගක්ඛණෙ තෙසං,"

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය** මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූද ධ්‍යාන සමාපන්න වූද – නොවූද කාමාවචර – රූපාවචර – අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, කාමාවචර රූපාවචර – අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පුහුදුන් පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ආශ්වාස ප්‍රශ්වාස සමග එකට උපදින ප්‍රථම ධ්‍යාන ජවන් (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන් (10) දශය හා තෘතීය ධ්‍යාන ජවන් (10) දශ දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයෝය; දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත ආශ්වාස් ප්‍රශ්වාස සමග එකට උපදින කාමසිත් (44) සුසාලිස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයෝද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර මෙනි. **ප්‍රත්‍යනීක සංසය** අභිධෙය්‍යාර්ථ [මේ ශුද්ධ නිරෝධ අනාගත වාරයට සමානයි. විශේෂයක් නොමැත.]

## කායමූල චිත්තමූලී

**කායමූල චිත්තමූලියෙහි** – කායමූල වචීමූලී වාරයට සමානයි. ප්‍රතිලෝම යෙහි, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න වූද · නොවූද කාමාවචර

රූපාවචර අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමි අර්හත් ඵලස්ථ ආයු පුද්ගලයෝය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පුහුදුන් පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

[අස්සාස **පස්සාසානං** යන තැන පෙර සේ ස්වරූප උද්ධරනු].
**ප්‍රත්‍යනීක සංසය** අභිධෙය්‍ය- ''පච්ඡිමචිත්තස්ස භංගක්ඛණේ'' (ස්වරූප සුගමයි)

## වචීමූල චිත්තමූලීය

**වචීමූල චිත්තමූලියෙහි** - අනුලෝම - ''සවිතක්ක - සවිචාර - පච්ඡිමචිත්තස්ස භංගක්ඛණේ තෙසං, ඉතරෙසං විතක්ක - විචාරානං භංගක්ඛණේ තෙසං **යස්ස වාපන** සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණේ, විනා විතක්ක විචාරේහි චිත්තස්ස භංගක්ඛණේ නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, විතක්ක විචාරානං භංගක්ඛණේ තෙසං,''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය** මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ කාමාවචර රූපාවචර අර්හත් ඵලස්ථ ආයු පුද්ගලයෝ ගනු ලැබෙති. පශ්චිම චිත්තයන් හැර සවිතර්ක සවිචාර චිත්තයන් (66) සසැට දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙරසේ මැයි.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අභිධෙයිය ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ, අවිතර්ක අවිචාර චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, අවිතර්ක අවිචාර චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමවන් අනාගාමි - අර්හත් ආයු පුද්ගලයෝය අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පුහුදුන් පුද්ගලයෝය; යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

අනුලෝම සංසය අභිධෙය්‍යද ගනු ලැබේ. සංසය අභිධෙය්‍ය පෙරසේමයි.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය:** ''අවිතක්ක-අවිචාර-පච්ඡිමචිත්තස්ස භංගක්ඛණේ,'' අවිතර්ක අවිචාර පශ්චිම චිත්තයන් (7) සත් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති.

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි.)

## පුද්ගලෝකාස වාරය

# කාය සංස්කාර මූලය

**පුද්ගලෝකාශවාරයෙහි** ''**යස්ස යත්ථ** කාය සංඛාරො නිරුජ්ඣති, තස්ස තත්ථ වචීසංඛාරෝ නිරුජ්ඣිස්සතීති, දුතියජ්ඣානං, තතියජ්ඣානං සමාපන්නානං අස්සාස - පස්සාසානං භංගක්ඛණේ තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං අස්සාස - පස්සාසානං භංගක්ඛණේ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං අස්සාස-පස්සාසානං උත්පාදක්ඛණේ, තෙසං යේව විනා අස්සාස - පස්සාසෙහි චිත්තස්ස භංගක්ඛණේ, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය**-ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ද්විතීය ධ්‍යාන ජවන (10) දශය හා තෘතීය ධ්‍යාන ජවන (10) දශයගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; (ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය;) ගනු ලැබේ. (ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම වදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයට පූර්වාන්තර ධ්‍යානය දක්වාද,) ආශ්වාස - ප්‍රශ්වාස සමඟ එකට උපදින ප්‍රථම ධ්‍යාන ජවන (20) විසිදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින කාම සිත් (44) සුලාලිස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශයද, ගනු ලැබේ. සංසය **අභිධෙය්‍ය** පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය** - ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම වදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වා ද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ප්‍රථම ධ්‍යාන ජවන (20) විසි දෙනාගේ

උත්පාදක්ෂණ සමංගී නම් වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ප්‍රථම ධ්‍යාන ජවන (20) විසිදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූද ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වාද, නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාද ක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය; ප්‍රථම ධ්‍යාන විපාකය ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් , ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් සවිතර්ක සවිචාර චිත්තයෙන් චුත වීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත කෙනෙක් වේ නම, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර - පුද්ගලයන්ගේ අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ වෙහප්ඵලය දක්වා රූපභූමි (10) දශය, අරූප භූමි (4) සතර යැයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

අනුලෝම සංසය ද ගනු ලැබේ. සංසය ස්වරූපාර්ථ පෙර සේ මැයි .

**ප්‍රත්‍යනික සංසය සවරූපාර්ථ** - ''සවිතක්ක - සවිචාර - පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, අවිතක්ක- අවිචාර පච්ඡිමචිත්ත, සමංගීනං යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති ,දුතියජ්ඣානං තතියජ්ඣානං

සමාපන්නානං අස්සාස - පස්සාසානං උත්පාදක්ඛණේ, තෙසං යෙව විනා අස්සාස පස්සාසෙහි චිත්තස්ස භංගක්ඛණේ, චතුත්ථජ්ඣානං සමාපන්නානං, අසඤ්ඤ-සත්තානං තෙසං තත්ථ,''

මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, ආභස්සර තලය තෙක් රූප භූමි(6) සයයි කියන ලද භූම්‍යාවකාශය තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කාමච්‍යුති සිත් (10) දශය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළොසය. ආභස්සර තලය තෙක් රූප භූමි (6) සය යි කියන ලද භූම්‍යාවකාශය.

ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතරයයි කියන ලද අවිතර්ක අවිචාර පශ්චිම චිත්තයන් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසඤ්ඤ තල වර්ජිත රූප භූමි (12) දොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින, අවිතර්ක අවිචාර චුති චිත්තයන් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල-අසංඥ තල-අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (11) එකොළසය අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

[තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, පඤ්චම ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වන්නේ නම්, පඤ්චම ජවනයාගේ භංග-භවංගයා ගේ ක්ෂණත්‍රය සමංගී වූද ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර- අරූපාවචර අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල වර්ජිත රූප භූමි (12) දොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නිරුද්ධ නොවන්නා වූ අවිතර්ක අවිචාර චිත්තයෙන් චුත වීමට නියතවූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම් පඤ්චම ජවනයාගේ භංගක්ෂණ සමංගී වූ, භවංගයෙන් පසුව චුතිය වේ නම් පඤ්චම ජවනයාගේ භංග-භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;]

ද්විතීය ධ්‍යාන ජවන (10) දශය හා තෘතීය ධ්‍යාන (10) දශයගේ උත්පාදක්ෂණ සමංගී වූ , ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ද්විතීය ධ්‍යාන (10) දශය හා තෘතීය ධ්‍යාන (10) දශදෙනාගේ භංගක්ෂණ සමංගී වූ , ධ්‍යාන සමාපන්න වූ කාමාවචර රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශයය; චතුර්ථධ්‍යාන ජවන (18) අටළොස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ චතුර්ථ ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශයය; අසංඥ තල යෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

## කායමූල චිත්තමූලී

**කායමූල චිත්තමූලියෙහි**, අනුලෝම – ආමන්තා, ප්‍රතිලෝමයෙහි , ''සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණේ, විනා අස්සාස - පස්සාසෙහි **චිත්තස්ස** භංගක්ඛණේ තෙසං තත්ථ, අස්සාස – පස්සානං භංගක්ඛණේ තෙසං තත්ථ,''

[අනුලෝම **සන්නිට්ඨාන අභිධෙය**: ප්‍රථම ධ්‍යාන – ද්විතීය ධ්‍යාන – තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සම නොවදින්නාවූ කෙනෙක් වේ නම, ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය ගනු ලැබේ. ප්‍රතිලෝම සංසය ද ගනු ලැබේ. **සංසය** ස්වරූප පෙර සේම ලැබේ.] (පාළියෙහි නැතත් ලැබීමට සුදුසු පරිදි ස්වරූප දක්වන ලදී)

ප්‍රතිලෝම **සන්නිට්ඨාන අභිධෙය**: ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම වදින්නා වූ කෙනෙක් වේ නම, අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතීය ධ්‍යාන ජවන (10) දශය හා චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅටදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතීය ධ්‍යාන ජවන (10) දශය හා චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅට දෙනාගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර, රූපාවචර, අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යානයන්ට නියතයෙන් සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයට පූර්වානන්තර ධ්‍යානය දක්වා ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය හා තෘතීය ධ්‍යාන ජවන (10) දශයගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශයය,

දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත ආශ්වාස ප්‍රශ්වාස සමඟ එකට උපදින කාමසිත් (44) සුසාලිස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ. සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය** ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස හා චෛතසික (35) පන්තිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආය්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසඤ්ඤසත්ත වර්ජිත රූපභූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ චුති සිත් (19) දහනවය හා චෛතසික (35) පන්තිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොස, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය; ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යානයන්ට

මතු නියතයෙන් සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශයය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල භූමියයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

[උත්පාද වාරයෙහිද මෙසේ අනුලෝමයෙහි ධ්‍යානය වෙන් වෙන් කොට අභිධෙය්‍ය උද්ධරනු. පශ්චිම චිත්තයන් (3) තුන හැර සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතර හා භූම්‍යාවකාශ (3) තුන ගනු ලැබෙත් යයි වෙනත් කෙටි ක්‍රමයකින්ද අභිධෙය්‍ය උද්ධරනු ලැබේ]

## චචිමූල චිත්ත මූලිය

චචිමූල චිත්තමූලියෙහි,'' සවිතක්ක - සවිචාර - පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ, ඉතරෙසං විතක්ක - විචාරානං භංගක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා** පන යත්ථ, සබ්බෙසං චිත්තස්ස උත්පාදක්ඛණෙ, විනා විතක්ක - විචාරෙහි චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං තත්ථ,''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය**: මහා විපාක ඥානසම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්නනොවූ කාමාවචර - රූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, ආභස්සර තලය දක්වා රූපභූමි (6) සයයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ කාම චුති සිත් (10) දශය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර චුති සිත් (12) දෙළොස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, ආභස්සර තලය දක්වා රූප භූමි (6) සයයයි කියන ලද භූම්‍යාවකාශයය;ප්‍රථම ධ්‍යානයට මතු නියතයෙන් සම නොවදින්නාවූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය ගනු ලැබේ.

පශ්චිම චිත්තයන් (3) තුන හැර සවිතර්ක සවිචාර සිත් (6) සසැට දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානයයි කියන ලද ධ්‍යානාවකාශය හා කාමභූමි (11) එකොළසය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංශය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

[තවත් ක්‍රමයකි: ප්‍රථම ධ්‍යානයට සමවදින්නා වූ ම කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නාවූ ම කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ අනන්තරය දක්වාද, ප්‍රථම ධ්‍යාන ජවන් සිත් (20) විස්සෙහි භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාම - රූප - අරූපී පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශයය; ප්‍රතිසන්ධියේ පටන් **පශ්චිම චිත්තයාගේ** උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර **චිත්තයන්ගේ** භංගක්ෂණ සමංගී නම්වූ ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූපී **පශ්චිම** භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර **චිත්තයන්ගේ** භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප අරූපී පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර **චිත්තයන්ගේ** භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාම - රූප - අරූපී පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශයය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ].

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය** : ප්‍රථම ප්‍රධාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් සම වදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන (10) දශයය, තෘතීය ධ්‍යාන ජවන (10) දශයය, චතුර්ථ ධ්‍යාන ජවන (18) දහ අටය, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ද්විතීය ධ්‍යාන ජවන -10) දශයය, තෘතීය ධ්‍යාන ජවන (10) දශයය, චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅටය යන මේ ධර්මයයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන-තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශයය;

ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්කයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, සුදුසු පරිදි උපදින අවිතර්ක අවිචාර චිත්කයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශ ගනු ලැබේ. අනුලෝම **සංසය ද** ගනු ලැබේ. **සංසය අභිධ්‍යා** පෙර සේම ලැබෙයි. [උත්පාද වාරයෙහිද මෙසේ ධ්‍යාන සමාපන්න පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ වෙන්කොට ස්වරූප උදුරනු. ඉතිරි කෙටි ක්‍රමයද ''පශ්චිම චිත්තයන් (3) තුන හැර'' 'කියා ස්වරූපඋදුරන්න].

**ප්‍රත්‍යනීක සංසය ස්වරූප**: ''අවිතක්ක - අවිචාර - පච්ඡිමචිත්තස්ස භංගක්ඛණේ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' අවිතක්ක අවිචාර පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයඩ් පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල වර්ජිත රූපභූමි (12) දෙළස, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින අවිතර්ක අවිචාර චුති සිත් (7) සත්දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය;

ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් මතු සම නොවදින්නා වූ කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාම - රූප - අරූපි පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යාවකාශය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ව භූමිය නම් වූ භූම්‍යාවකාශය ගනු ලැබෙති.

වර්තමානානාගත වාරය නිමි

---

## අතීතානාගත පුද්ගල වාරය

## කාය සංස්කාර මූලය

**අතීතානාගත වාරයෙහි''යස්ස** කායසංඛාරො නිරුජ්ඣිත්ථ, තස්ස වචීසංඛාරො නිරුජ්ඣිස්සතීති, සවිතක්ක-සවිචාර- පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේ,අවිතක්ක අවිචාර - පච්ඡිමචිත්ත - සමඟ්ගිනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති තෙසං, ඉතරෙසං, තෙසං යස්ස වා පන ආමන්තා''[අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ, නිරෝධ අනාගත පුද්ගල වාරයෙහි කාය සංස්කාර

මූල වචීසංස්කාර මූලි ප්‍රත්‍යනීකය අනුව උදුරනු. සෙසු ස්වරූපාර්ථ, නිරෝධ අනාගත පුද්ගල වාරයෙහි කාය සංස්කාර මූල වචී සංස්කාර මූලි අනුලෝමය, ප්‍රතිලෝම පක්ෂය අනුව ස්වරූප උදුරනු. වෙනසක් නොමැත].

**චිත්ත සංස්කාර මූලියෙහි** - ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේතෙසං ඉතරෙසං තෙසං, **යස්ස වා පන** ආමන්තා.'' [අනුලෝමයෙහි ''පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ ස්වරූපාර්ථ - නිරෝධ අනාගත පුද්ගල වාර කාය සංස්කාරමූල චිත්ත සංස්කාර මූලි ප්‍රත්‍යනීකය අනුව උදුරනු. ''ඉතරෙසං යන්නෙහි ස්වරූපාර්ථ - නිරෝධ අනාගත පුද්ගල වාර කාය සංස්කාර මූල චිත්ත සංස්කාර මූලි අනුලෝමය, ප්‍රතිලෝම පක්ෂය අනුව උදුරනු. **වචීමූල චිත්තමූලියෙහි ද** කායමූල චිත්තමූලය මෙනි. ප්‍රත්‍යනීක යෙහි අවශේෂයක් නොමැත].

පුද්ගල වාරය නිමි. [ඕකාශ වාරය සුගමයි]

## පුද්ගලෝකාශ වාරය

## කාය සංස්කාර මූලය

**පුද්ගලෝකාශ වාරයෙහි**,කායමූල වචීමූලියෙහි අනුලෝම ස්වරූපාර්ථ, ''කාමාවචරෙ පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ, දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ,

අනුලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය**: කාම ත්‍රිහේතුක චුති සිත් (4) සතර හා චෛතසික (33) තෙතිස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ අර්හත් ඵලස්ථ ආයාී පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කාම චුති සිත් (10) දශය හා චෛතසික (33) තෙතිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර චුතවන පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශයය; ප්‍රථම ධ්‍යානයට මතු නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම්වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථමධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශයය;

ද්විතීය ධ්‍යාන ජවන (10) දශය හා තෘතීය ධ්‍යාන ජවන (10). දශ දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර – රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන – තෘතීය ධ්‍යාන – නම් වූ ධ්‍යානාවකාශ ගනු ලැබේ. ප්‍රථම ධ්‍යානයට නියතයෙන් මතු සම වදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂයණය දක්වාද, ධ්‍යාන සමාපන්නා වූ කාම – රූප–අරූපි පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශයය;

ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත යයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියගේ උත්පාදක්ෂණය දක්වාද, මතු උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශ ද ගනු ලැබෙති. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියනු ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදක්ෂණය දක්වාද ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර-අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් ප්‍රථම, ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකය නම් වූ සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියගේ උත්පාදක්ෂණය දක්වාද තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යන අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදක්ෂණය දක්වාද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය දක්වා රූපාවචර භූමි (10) දශය හා අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශ ගනු ලැබෙති. අනුලෝම සංසයද ගනු ලැබේ. **සංසය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය**: "රූපාවචරෙ අරූපාවචරෙ සවිතක්ක - සවිචාර පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, අවිතක්ක - අවිචාර - පච්ඡිමචිත්ත - සමංගීනං යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක-අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, චතුත්ථ-ජ්ඣානං සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ."

ප්‍රථමධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර පශ්චිම චිත්තයන් (2) දෙදෙනාගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයන්ගේ ආභස්සර තලය දක්වා රූප භූමි (6) සය නම් වූ භූම්‍යාවකාශය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින ප්‍රථම ධ්‍යාන විපාකය ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චුති චිත්තයන් (2) දෙදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර පුද්ගලයන්ගේ ආභස්සර තලය දක්වා රූප භූමි (6) සය නම් වූ භූම්‍යාවකාශයය; තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර පශ්චිම චිත්තයන් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගීවූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචරඅරූපාවචර-අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල වර්ජිත වූ රූප භූමි (12) දෙළොසය අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ අවිතර්ක අවිචාර චුති සිත් (7) සත්දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තලය - අසංඥ තලය - අකනිට්ඨ තලය වර්ජිත රූපභූමි (11) එකොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය; අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, පඤ්චම ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වන්නේ නම්, පඤ්චම ජවනයාගේ භංගය, භවංගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර- අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල වර්ජිත වූ රූප භූමි (12) දෙළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන් අතුරෙන් අවිතර්ක අවිචාර චිත්තයෙන් චුත වන්නාවූ පුද්ගලයන් ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම් පඤ්චම ජවනයාගේ භංගක්ෂණ සමංගී වූද භවංගයෙන් පසුව චුතිය වන්නේ නම් පඤ්චම ජවනයාගේ භංග- භවංගයාගේ ක්ෂණ-ත්‍රය සමංගී නම් වූද: ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - අසංඥ තල - අකනිට්ඨතල වර්ජිත රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය; චතුර්ථ ධ්‍යාන ජවන් සිත් (18) අටළොස ගේ ක්ෂණත්‍රය සමංගී වූ චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය; අසංඥ තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය නම් වූද භූම්‍යාවකාශ ගනු ලැබෙති.

## කායමූල චිත්ත මූලිය

**කායමූල චිත්තමූලියෙහි** [අනුලෝමයෙහි උත්පාදයට අනුව කියන ලද්ද අතුරෙන් භංගක්ෂණය උදුරනු. සංසය ස්වරූපයෙහිද පශ්චිම චිත්තයාගේ උත්පාදය අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණය දක්වා යයි ස්වරූප උදුරනු. ප්‍රතිලෝමයෙහි ද පශ්චිම චිත්තයාගේ උත්පාදය, අවසාන ධ්‍යානයාගේ උත්පාදය දක්වා යයිද උදුරනු **ප්‍රත්‍යනීක සංසය** ස්වරූපාර්ථය ''රූපාවචරෙ, අරූපාවචරෙ, පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,''

## චවීමූල චිත්ත මූලීය

**චවීමූල චිත්තමූලියෙහි** - අනුලෝමයෙහි ''සවිතක්ක - සවිචාර භූමියං පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ; ඉතරෙසං සවිතක්ක - සවිචාර - භූමියං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** අවිතක්ක - අවිචාර - භූමියං තෙසං තත්ථ.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍යාර්ථ**, ත්‍රිහේතුකච්‍යුති සිත් (13) තෙළෙස හා චෛතසික (35) පන්තිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ ච්‍යුති සිත් (19) එකුන්විසිදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) තුදුසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය; ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම නොවදින කෙනෙක් වේ නම්, අවසාන ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න කාමාවචර රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානයයි කියන ලද ධ්‍යානාවකාශ ගනු ලැබෙති.

ප්‍රථම ධ්‍යානයට නියතයෙන් සම වදින්නා වූ කෙනෙක් වේ නම්, අවසාන ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතයයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට ච්‍යුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට ච්‍යුති චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශයය;

ශුද්ධාවාස භූමිය වේ නම්, භව නිකාන්තික ප්‍රථම ජවනයේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, අවශේෂ රූපාවචර - අරූපාවචර භූමියක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණ ත්‍රය සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින

පුද්ගලයන් අතුරෙන් ශුද්ධාවාසයෙහි නම්, භවනිකාන්තික ප්‍රථම ජවනයේ සිට චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, අවශේෂ රූපාවචර - අරූපාවචර භූමියෙහි නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර- අරූපාවචර පුද්ගලයන්ගේ අසංඥ තල - අකනිටා තල වර්ජිත වූ රූපභූමි (14) තුදුසය, අරූපභූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයද ගනු ලැබේ, සංසය අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - ශුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධි චිත්තය, භවංග වාර (16) සොළසය, මනෝද්වාරාවර්ජනය යන මේ (18) අටළොස් චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම වූ අනාගාමී ඵලස්ථ ආය්‍ය පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පසයයි කියන ලද භූම්‍යාවකාශය; ද්විතීය ධ්‍යාන- තෘතීය ධ්‍යාන- චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් මතු සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ධ්‍යාන සමාපන්න කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානයයි කියන ලද ධ්‍යානාවකාශය ගනු ලැබේ.අනුලෝම සංසයද ගනු ලැබේ. **සංසය** ස්වරූපාර්ථ පෙරසේ ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය අභිධෙය්‍ය:** ''අවිතක්ක - අවිචාර - භූමියං පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''ද්විතීය ධ්‍යාන,තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යානයන්ට මතු සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් , අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය හා අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලයයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

අතීතානාගත වාරය නිමි.

නිරෝධ වාරය නිමි.

## උත්පාද නිරෝධ වර්තමාන පුද්ගල වාරය

උත්පාද නිරෝධ වාරයෙහි, ''**යස්ස** කායසඞ්ඛාරො උප්පජ්ජිස්සති, තස්ස තස්ස වචීසංඛාරො නිරුජ්ඣතීති, නො, යස්ස වා පන; නො, '' සියල්ලටම ප්‍රතිෂේධ පිළිතුරය.

පුද්ගල වාරය නිමි

(ඕකාස වාරය සුගමයි)

## පුද්ගලෝකාශ වාරය

# කාය සංස්කාර මූලය

"**යස්ස යත්ථ** කායසංඛාරො නුපජ්ජති, තස්ස තත්ථ වචිසංඛාරො න නිරුජ්ඣිහිති විතක්ක විචාරානං භංගක්ඛණේ තෙසං තත්ථ, විනා අස්සාස - පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණේ, විනා විතක්කවිචාරෙහි චිත්තස්ස භංගක්ඛණේ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, යස්ස වා යත්‍ර යත්ථ, - අස්සාස - පස්සාසානං උප්පාදක්ඛණේ තෙසං තත්ථ,"

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ප්‍රථම ධ්‍යාන ජවන (20) විසි දෙනාගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර- රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය; හා දෙපස් විඤ්ඤාණ සිත් (10 දශය වර්ජිත කාම සිත් (44) සුසාලිසය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සුදුසු පරිදි උපදින සවිතර්ක සවිචාර චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර- රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, අසංඥ තල වර්ජිත වූ රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශය ගනු ලැබේ.

ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාය සමාපන්න වූද - නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතරය භූම්‍යාවකාශ (3) තුනය,අවිතර්ක අවිචාර සිත් (55) පණස් පස් දෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශය, භූම්‍යාවකාශ (3) තුන හා අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ. සංසය ස්වරූපාර්ථ පෙර සේම ගනු ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ - ආශ්වාස ප්‍රශ්වාස හා සමඟ එකට උපදින ප්‍රථම ධ්‍යාන ජවන් (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන් (10) දශය, තෘතීය ධ්‍යාන ජවන් (10) දශය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශ හා දෙපස් විඤ්ඤාණ සිත් (10) වර්ජිත ආශ්වාසප්‍රශ්වාස සමඟ එකට උපදින කාමසිත් (44) සුසාලිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළස නම් වූ භූම්‍යාවකාශ ගනු ලැබේ. අනුලෝම සංසය ද ගනු ලැබේ. සංසය ස්වරූප පෙර සේම ගනු ලැබේ.

## කායමූල චිත්තමූලීය

''**යස්ස යත්ථ** කායසංඛාරො නුප්පජ්ජති, තස්ස තත්ථ චිත්තසංඛාරො න නිරුජ්ඣතීති, සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ, විනා අස්සාස පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** අස්සාස - පස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** : සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද නොවූද කාමාවචර - රූපාවචර අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතර හා භූම්‍යාවකාශ (3) තුන ගනු ලැබෙති. ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සියලු චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ධ්‍යානාවකාශ (4) සතර හා භූම්‍යාවකාශ (3) තුනද, අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය නම් වූ භූම්‍යාවකාශය ද ගනු ලැබේ. **සංශය** අභිධෙය්‍ය පෙර සේම ගනු ලැබේ.

[ප්‍රතිලෝමයෙහි ද ස්වරූපාර්ථ පෙර සේ උදුරනු.]

## වචීමූල චිත්තමූලී

''**යස්ස යත්ථ** වචීසංඛාරො නුප්පජ්ජති, තස්ස තත්ථ චිත්තසංඛාරො න නිරුජ්ඣතීති, සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ, විනා විතක්ක විචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්, **යස්ස වා පන යත්ථ** විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,'' [සන්නිට්ඨානය පෙර සේ උදුරනු.]

සංශය ස්වරූපාර්ථ: අවිතක්ක අවිචාර සිත් (55) පණස් පස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූද නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය භූම්‍යාවකාශ (3) තුන හා අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තලය නම් වූ භූම්‍යාවකාශය ගනු ලැබේ.

[පුද්ගල වාරයෙහි නිරෝධ සමාපත්තිය උදුරනු. මෙපමණක්ම විශේෂයි]

වර්තමාන වාරය නිමි. (අතීතවාරයෙහි සියල්ල සමානයි).

## අනාගත පුද්ගල වාරය

## කාය සංස්කාර මූලය

අනාගත වාරයෙහි ''**යස්ස** කායසංඛාරො උප්පජ්ජිස්සති, තස්ස වචීසංඛාරො නිරුජ්ඣිස්සතීති, - පෙ - චිත්තසංඛාරො නිරුජ්ඣිස්සතීති.'' [මෙ කාය සංස්කාර මූල, වචී සංස්කාර මූලි හා චිත්ත සංස්කාර මූලී යමක දෙක නිරෝධ වාර - විභංග ස්වරූප සියල්ලම සමානයි.]

## වචීමූල චිත්තමූලී

''**යස්ස** වචීසංඛාරො උප්පජ්ජිස්සති, තස්ස චිත්තසංඛාරො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, **යස්ස වා පන**: පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති තෙසං ඉතරෙසං තෙසං.''

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය** ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස නම් වූ පශ්චිම චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර අර්හත් එලස්ථ ආයඝ පුද්ගලයෝය; අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම්, පස්වැනි ජවනයාගේ ක්ෂණත්‍රය සමංගී වූද, භවංගයෙන් පසුව චුතියවේ නම් පශ්චිම ජවන-භවංගයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූද, රූපාවචර - අරූපාවචර අර්හත් එලස්ථ ආයඝ පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [සංසය පදයාගේ ස්වරූප, උත්පාද වාර වචී සංස්කාරයෙහි ලැබෙන ස්වරූප අනුව උදුරනු].

[පුද්ගල වාරය නිමි. ඕකාස වාරය සුගමයි]

## පුද්ගලෝකාස වාරය

පුද්ගලෝකාස වාරයෙහි [කායමූල හා වචීමූලි, කායමූල හා චිත්තමූලි යන මේ යමක දෙක නිරෝධ වාරය අනුව ස්වරූප උදුරනු. විශේෂයක් නොමැත.)

## වචීමූල චිත්තමූලීය

**වචීමූල චිත්තමූලීයෙහි**, අනුලෝමය - ආමන්තා: ප්‍රතිලෝමයෙහි, ''පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, දුතියජ්ඣානං ත තියජ්ඣානං චතුත්ථජ්ඣානං සමාපන්නාන තෙසං තත්ථ, පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං, ඉතරෙසං රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ,''

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ**: ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස නම වූ පශ්චිම චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර අර්හත් එලස්ථ ආයඝ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශය: තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ චුති සිත් (19) එකුන් විස්ස හා චෛතසික (35) පන්තිස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, අසංඥ තල - අකනිට්ඨා තල වර්ජිත වූ රූපභූමි (14) දහතරය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය: ප්‍රථම ධ්‍යානයට මතු සමනොවැදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ

ධ්‍යානයු සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශයය; **අවිතර්ක අවිචාර චිත්තයෙන්** පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වේ නම්, පස්වැනි ජවනයාගේ **ක්ෂණත්‍රය** සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වේ නම්, **පඤ්චම** ජවන භවංගයන් ගේ **ක්ෂණත්‍රය** සමංගී නම්වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - **අසංඥ** තල වර්ජිත රූප භූමි (12) දෙළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් **අවිතර්ක** අවිචාර **චිත්තයෙන්** චුතවන්නා වූ පුද්ගලයන්ගේ ජවනයෙන් පසුව චුතිය වන්නේ නම්, **පඤ්චම** ජවනයාගේ **ක්ෂණත්‍රය** සමංගී වූද, භවංගයෙන් පසුව චුතිය වන්නේ නම් **පඤ්චම** ජවන භවංගයන්ගේ **ක්ෂණත්‍රය** සමංගී නම් වූ ද, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර - අරූපාවචර - පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන තල - **අසංඥ** තල - අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (11) එකොළසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය; ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට මතු සම වදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණය දක්වාද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශ ගතු ලැබෙති. [සංසය පදයාගේ ස්වරූපාර්ථ, උත්පාද වාර - වචී සංස්කාරයෙහි ලැබෙන පරිදි උදුරනු. විශේෂයක් නොමැත]

ප්‍රත්‍යනික **සංසය අභිධෙය්‍ය** - ''පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ, අස **ඤ්ඤසත්තාන** තෙසං තත්ථ,'' [පශ්චිම චිත්තයාගේ භංගක්ෂණ ඒකාන්ත - අනේකාන්තය; අන්තිම ධ්‍යානයාගේ භංගක්ෂණය හා සමානය. අසංඥ තලයෙහි සියල්ල නිරෝධ වාර - ප්‍රත්‍යනික වාරය මෙනි.]

අනාගත වාරය නිමි. (වර්තමානාතීත වාරයෙහි උත්පාද වාරයෙහි මෙනි)

## වර්තමානානාගත පුද්ගල වාරය

## කාය සංස්කාර මූලය

වර්තමානානාගත වාරයෙහි, ''**යස්ස** කායසංඛාරො උප්පජ්ජති, තස්ස වචී සංඛාරො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, **යස්ස වා පන** සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණේ, විනා අස්සාසපස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණේ, නිරෝධසමාපන්නානං, අසඤ්ඤ-සත්තානං, තෙසං අස්සාස - පස්සාසානං උප්පාදක්ඛණේ තෙසං,

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන අභිධෙය්‍ය**: මහා විපාක ඥාන සම්ප්‍රයුක්ත සිත් (4) සතරය, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්ත යාගේ උත්පාදක්ෂණය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය - චතුර්ථ ධ්‍යාන විපාකය,

පවඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක සිත් (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට මරණාසන්න පඤ්චම ජවනයාගේ උත්පාදක්ෂණය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණය සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර-රූපාවචර අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය;

පශ්චිම භවික නොවූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආයඨ පුද්ගලයෝය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [අස්සාස - පස්සාසානං උප්පාදක්ඛණෙ යන තැන ස්වරූපාර්ථ, උත්පාද වාරය අනුව උදුරනු]

**ප්‍රත්‍යනීක සංසය අභිධෙයාාර්ථ** ''සවිතක්ක - සවිචාර පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ, අවිතක්ක - අවිචාර පච්ඡිමචිත්ත - සමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං,'' [ස්වරූපාර්ථ, නිරෝධ වාරයෙහි අනාගත වචී සංස්කාර නොම නිරෝධ වන ප්‍රත්‍යනීක සංසය අනුව උදුරනු]

## කායමූල චිත්ත මූලීය

**කායමූලිය** හා **චිත්ත මූලියෙහි**- අනුලෝමය-ආමන්තා;ප්‍රතිලෝමයෙහි,''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ,විනා අස්සාස-පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, අස්සාස-පස්සාසානං උප්පාදක්ඛණෙ, තෙසං.'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද, කාමාවචර - රූපාවචර- අරූපාවචර පශ්චිමභවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී - අර්හත් ආයඨ පුද්ගලයෝය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [අස්සාස - පස්සාසානං උත්පාදක්ඛණෙ, යන තැන ස්වරූපාර්ථ පෙර සේ උදුරනු. **ප්‍රත්‍යනීක** සංසයද පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, පෙර සේ උදුරනු.]

## වචීමූල චිත්තමූලීය

''යස්ස වචීසංඛාරො උප්පජ්ජති , තස්ස චිත්තසංඛාරො නිරුජ්ඣිස්සතීති ආමන්තා, යස්ස වා පන - සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා විතක්ක - විචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ,නිරොධ සමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං, විතක්ක විචාරානං උප්පාදක්ඛණෙ තෙසං,'' [අනුලෝමයෙහි වචී සංඛාර උත්පාදය අනුව ස්වරූප උදුරනු].

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ: ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න වූද - නොවූද කාමාවචර - රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයෝය; පශ්චිම භවික නොවූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූද -නොවූද, කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයෝය; නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය; අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යන මෙ පුද්ගලයෝ ගනු ලැබෙති. [විතක්ක - විචාරානං උප්පාදක්ඛණෙ' යන්නෙහි ස්වරූපාර්ථ උත්පාද වර්තමාන වාරය අනුව උදුරනු. ප්‍රත්‍යනික සංසය **ස්වරූපාර්ථ** පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං.'' නිරෝධ සමාපත්ති ප්‍රත්‍යනික වාරය අනුව උදුරනු.)

පුද්ගල වාරය නිමි. [ඕකාශ වාරය සුගමයි]

## පුද්ගලෝකාස වාරය

## කාය සංස්කාර මූලය

පුද්ගලෝකාස වාරයෙහි, ''යස්ස යත්ථ කායසංඛාරො උප්පජ්ජති, තස්ස තත්ථ වචීසංඛාරො නිරුජ්ඣිස්සතීති, ''[උත්පාදවාර වර්තමානානාගත විභංගය මෙනි අනුලෝමයෙහි ස්වරූපාර්ථ උත්පාදවාරය අනුව උදුරනු.]

ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ: ප්‍රථම ධ්‍යානයට මතු නියතයෙන් සම වදින කෙනෙක් වේ නම්, අන්තිම ධ්‍යානය දක්වාද, මතු සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ප්‍රථමධ්‍යාන ජවන (20) විසිදෙනාගේ භංගක්ෂණ සමංගී නම් වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ප්‍රථමධ්‍යාන ජවන (20) විසි දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථමධ්‍යානය නම් වූ ධ්‍යානාවකාශය; ප්‍රතිසන්ධියේ පටන්

පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත නම් වූ භූමාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදක්ෂණ ය දක්වාද, මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ , ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළස නම් වූ භූමාවකාශයය; ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතීය ධ්‍යාන විපාකයයි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය,, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය අරූප විපාක සිත් (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයකින් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පඤ්චම ජවනයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදිනා සවිතර්ක සවිචාර , අවිතර්ක අවිචාර චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ, ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර – අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන්, ප්‍රථම ධ්‍යාන විපාකය, ද්විතිය ධ්‍යාන විපාකය යි කියන ලද සවිතර්ක සවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදය දක්වාද, තෘතීය ධ්‍යාන විපාකය, චතුර්ථ ධ්‍යාන විපාකය, පඤ්චම ධ්‍යාන විපාකය, අරූප විපාක (4) සතර යයි කියන ලද අවිතර්ක අවිචාර චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට පඤ්චම ජවනයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ රූපාවචර අරූපාවචර් පුද්ගලයන්ගේ අසංඥ තල – අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) හතර යයි කියන ලද භූමාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ, රූපාවචර – අරූපාවචර පුද්ගලයන්ගේ වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූමාවකාශ ගනු ලැබෙති. අනුලෝම සංසය ගනු ලැබෙ.

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ - ‘‘සවිතක්ක - සවිචාර- පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ, අවිතක්ක - අවිචාර - පච්ඡිමචිත්ත සමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්ක - අවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, දුතියජ්ඣානං, තතියජ්ඣානං සමාපන්නානං අස්සාස - පස්සාසානං භංගක්ඛණෙ, තෙසං යෙව විනා අස්සාස -

පස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණේ, චතුත්ථජ්ඣානං සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.'' [නිරෝධ වාරයෙහි වර්තමාන - අනාගතය අනුව ස්වරූප උදුරනු. ද්විතීය ධ්‍යාන - තෘතීය ධ්‍යානයන්හි භංගක්ෂණ හා ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත උත්පාදක්ෂණ උදුරනු. වෙනස මෙපමණි.]

## කායමූල චිත්තමූලිය

[**කායමූල හා චිත්තමූලී** විභංග පාලිය උත්පාද වාරයෙහි මෙනි.]

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - ප්‍රථම ධ්‍යාන-ද්විතීය ධ්‍යාන-තෘතීය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට නියතයෙන් මතු සමවදින්නා වූ කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, මතු සම නොවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදය දක්වාද, ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්ස ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතීය ධ්‍යාන ජවන (10) දශය හා චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅට දෙනාගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත ප්‍රථම ධ්‍යාන ජවන (20) විස්ස, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතීය ධ්‍යාන ජවන (10) දශය හා චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන-ද්විතීය ධ්‍යාන-තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යාන නම් වූ ධ්‍යානාවකාශය: ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිතව සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර, රූපාවචර, අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්,ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර, රූපාවචර, අරූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, අසංඥ තල-අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තය දක්වා සුදුසුපරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, ආශ්වාස ප්‍රශ්වාස වර්ජිත සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර, රූපාවචර, අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය දක්වා රූපභූමි (10) දශයය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශ ගනු ලැබෙති. [සංසය ස්වරූප උත්පාද වාර අනුව උදුරනු.]

ප්‍රත්‍යනික සංසය ස්වරූප-''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.'' (නිරෝධ වාරය අනුව ස්වරූප උදුරනු].

## වචීමූල චිත්තමූලීය

යස්ස යත්ථ වචීසංඛාරො උප්පජ්ජති, තස්ස තත්ථ චිත්ත සංඛාරො නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යස්ස වා පන යත්ථ-සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, විනා විතක්ක - විචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, විතක්ක විචාරානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,''

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ - ප්‍රථමධ්‍යාන - ද්විතීය ධ්‍යාන - තෘතිය ධ්‍යාන - චතුර්ථ ධ්‍යානයන්ට මතු නියතයෙන් සමවදින කෙනෙක් වේ නම් අන්තිම ධ්‍යානය දක්වාද, සම නොවදින කෙනෙක් වේනම් අන්තිම ධ්‍යානයාගේ උත්පාදක්ෂණය දක්වාද , ප්‍රථම ධ්‍යාන ජවන් (20) විස්සය, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතිය ධ්‍යාන ජවන (10) දශය හා චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅට දෙනාගේ භංගක්ෂණ සමංගී වූද, ද්විතීය ධ්‍යාන ජවන (10) දශය, තෘතිය ධ්‍යාන ජවන (10) දශය හා චතුර්ථ ධ්‍යාන ජවන (18) දහඅට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ධ්‍යාන සමාපන්න වූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ ප්‍රථම ධ්‍යාන- ද්විතීය ධ්‍යාන,තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන යයි කියන ලද ධ්‍යානාවකාශයය; ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණ ය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අවිතර්ක අවිචාර චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර රූපාවචර - අරූපාවචර පශ්චිම භවික පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය, අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසය, අරූප භූමි (4) සතර යයි කියන ලද භූම්‍යාවකාශයය;

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ උත්පාදය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළසය, අසංඥ තල - අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශයය; තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ සිට චුති චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ධ්‍යාන සමාපන්න නොවූ කාමාවචර - රූපාවචර - අරූපාවචර පුද්ගලයන්ගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය දක්වා රූප භූමි (10) දශයය, අරූප භූමි (4) සතරයයි කියන ලද භූම්‍යාවකාශ ගනු ලැබෙති. [විතක්ක විචාරානං උප්පාදක්ඛණෙ'' යන තැන ස්වරූපාර්ථ, උත්පාද වාරයෙහි වචීසංස්කාර වර්තමානයට අනුව උද්ධරන්න.]

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ: ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.'' [නිරෝධ වාරය අනුව උද්ධරනු].

වර්තමානානාගත වාරය නිමි.

[අතීතානාගත වාරය, නිරොධ වාර - අතීතානාගත වාරයට සම්පූර්ණයෙන් සමානය.]

ප්‍රවෘත්ති වාරය නිමි.

## පරිඥවාරය

ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පරිඥ්ඤාවාරය වදළ සේක. ඒ පරිඥ්ඤාවාරයද, වර්තමාන වාර - පෙ - අතීතානාගත වාර වශයෙන් සවැදෑරුම් වන්නේය. [ස්කන්ධ යමකය හා සමානය. පෙර සේ බෙද කියනු.] 'යො කාය සංඛාරං පරිජානාති, සො වචී සංඛාරං පරිජානාතීති, ආමන්තා, යො වා පන ආමන්තා.

අනුලෝමයෙහි සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ - අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයො ගනු ලැබෙති. සංසයටද එසේම ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහිද එසේම ලැබේ.

'න පරිජානාති'' යන්නෙහිද, ආමන්තා: ස්වරූපාර්ථ, පෘථග්ජන - අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් හැර ආර්‍ය්‍ය පුද්ගලයෝ (7) සත් දෙනෙක් ගනු ලැබෙති.

''යො කාය සංඛාරං පරිජානිත්ථ, සො වචී සංඛාරං පරිජානිත්ථාති, ආමන්තා යො වා පන - ආමන්තා'' අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ - අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ද එසේස. [ප්‍රතිලෝමයෙහිද නය සමානය.]

''න පරිජානිත්ථ'' යන්නෙහිද පෘථග්ජන - අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් හැර සෙසු ආර්‍ය්‍ය පුද්ගලයෝ (7) සත්දෙනා ගනු ලැබෙති. ''යො කායසංඛාරං පරිජානිස්සති, සො වචීසංඛාරං පරිජානිස්සතීති, ආමන්තා, යො වා පන - ආමන්තා,''

අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ: භව්‍ය පෘථග්ජන, යට මාර්ගස්ථ තිදෙන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ තිදෙනා ගනු ලැබෙති.

අනාගත පරිජානිස්සති යන්නෙහි සවරූපාර්ථ අභව්‍ය පෘථග්ජන, අර්හත් මාර්ස්ථ. අර්හත් ඵලස්ථ පුද්ගලයෝ ගනු ලැබෙති.

(මේ පරිඥ්ඤාණ වාරය වනාහි ස්කන්ධ යමකාදි යමකයන්හි පරිඥ්ඤාණ වාරයට වෙනසක් නොමැත. අවශේෂ වාරද මේ ක්‍රමයට කියනු]

සංස්කාර යමක අභිධෙය්‍ය නිමි

# විෂය මාතෘකා සූචි

**අනුසය යමකය**

උත්පත්තිස්ථාන වාරය 1–6, මහාවාර අනුසය වාරය 6–8, පටිසානුසය මූලය 8–9, ද්විමූලය 9, ත්‍රිමූලය, 9–10, චතු මූලය 11, ඕකාශ වාර ඒකමූලය 11–13, ද්විමූලය 13–14, ත්‍රිමූලය 14, චතු මූල පඤ්ච මූල ඡමූල 15, පුද්ගලෝකාශ වාරය, ඒකමූලය 15, කොටස් බෙදීම 16, ඒකමූලය 16–18, ද්විමූලය 18-20, ත්‍රිමූලය 21–22, චතු මූලය 22–23, පඤ්ච මූල ඡමූල 23–27, මහාවාර අනුසය වාර ප්‍රත්‍යනීක පුද්ගල වාර ඒකමූලය 27–28, ත්‍රිමූලය–චතුමූලය 28.

ඕකාශ වාර ඒකමූලය 29–30, ද්විමූලය – ත්‍රිමූලය 30, පුද්ගලෝකාශ වාරය ඒකමූලය 30–32, තිමූල 32-33, චතු මූලය 33–34, මානානුසය මූලවාරය 34–35, පජහනවාර අනුලෝම පුද්ගල වාරය – ඒකමූලය 35–36, කාම මූල මාන මූලි 36–37, කාම මූල දිට්ඨි මූලි 37–38, කාම මූල භව මූලි – කාම මූල අවිජ්ජා මූලි 38, පටිඝ මූල මාන මූලි 38–39, මාන මූල දිට්ඨි මූලි ත්‍රිමූලය 39–40, පුද්ගලෝකාශ වාරය – ඒක මූලය 40 – 41, ද්විමූල – ත්‍රිමූලය 41, ඡමූල 42, පජහනවාර ප්‍රත්‍යනීක පුද්ගලවාරය – කාමරාගානුසය මූලය 42 – 43, තිමූල – චතු මූලය 43, පුද්ගලෝකාශ වාරය – කාමරාග මූල පටිඝ මූලිය 44, කාමරාග මූල මාන මූලිය 44–45, පරිඤ්ඤා වාරය 45–46, ඕකාශ වාරය 46–47, පුද්ගලෝකාශ වාරය – ඒක මූලය 47–48, ද්විමූලය 48–49, ත්‍රිමූලය 49, පහීන වාර ප්‍රත්‍යනීකය – පුද්ගලෝකාශ වාරය 50–51, ද්විමූලය 51–52, උප්පජ්ජන වාරය – ධාතු වාරය, 52–53, කොටස් බෙද දැක්වීම 54–55. රූප ධාතු මූලය 55–56, අරූප ධාතු මූලය 56–57 න කාමධාතු මූලය 57–58, න රූපධාතු මූලය 58 – 59, න අරූප ධාතු මූලය 59, නිගමනය 59–60.

**චිත්ත යමකය**. උද්දේශ වාරය 61–63, සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂ 63–64, අභිධර්ම චිත්ත මිශ්‍රක විශේෂ 65–66, නිද්දේස පුද්ගල වාරය 67–68, කොටස් බෙද දැක්වීම 68, – 75, ධම්ම වාරය 75–79, පුද්ගල ධම්ම වාරය, 79 සූත්‍රාන්ත චිත්ත මිශ්‍රකය 80–84, අභිධර්ම පද මිශ්‍රකය 84–88.

**ධම්ම යමක ස්වරූප**, පණ්ණත්ති උද්දේස වාරය 88–90, ප්‍රඥප්තිවාර නිද්දේසය පදශෝධන වාරය 91–92, පදශෝධන මූලචක්‍ර වාරය 92, ශුද්ධ ධර්ම වාරය 93, ශුද්ධ ධර්ම මූලචක්‍ර වාරය 94, ප්‍රවෘත්ති වාර උත්පාද වර්තමාන වාරය 94–අව්‍යාකෘත මූලි 95, අකුශල මූලය 95–96, ඕකාශ වාරය 96–97, අතීත වාරය 97, පුද්ගලෝකාශ වාරය 97–99, අනාගත පුද්ගල වාරය 99–101, පුද්ගලෝකාශ වාරය 101–102 කුශල හා අව්‍යාකෘතය 102 – 103, අකුශල හා අව්‍යාකෘතය 103 - 105, වර්තමානාතීත පුද්ගල වාරය 105–106, පුද්ගලෝකාශ වාරය 106–107, වර්තමානානාගත වාරය 107–110, කුශල හා අව්‍යාකෘතය 110, අකුශල හා අව්‍යාකෘතය 111, පුද්ගලෝකාශ වාරය 111–114, කුශල හා අව්‍යාකෘතය 115, අකුශල හා අව්‍යාකෘතය 115 – 116, අතීතානාගත පුද්ගල වාරය 116 – 117 පුද්ගලෝකාශ වාරය 117–119,

කුශල හා අව්‍යාකෘතය 119-120, නිරෝධ වාරය 120 - 121, කුශල හා අව්‍යාකෘතය 121, අකුශල හා අව්‍යාකෘතය 121-122, පුද්ගලෝකාශ වාරය 122-123, කුශල හා අව්‍යාකෘතය 124-125, අකුශල හා අව්‍යාකෘතය 125-126, වර්තමානානාගත වාරය 126-127, අතීතානාගත වාරය 227-128, පුද්ගලෝකාශ වාරය 128, උත්පාද නිරෝධ වාරය 129, කුශල හා අව්‍යාකෘතය 129, අනාගත පුද්ගල වාරය 130, පුද්ගලෝකාශ වාරය 130-132 වර්තමානානාගත වාරය, 132, පුද්ගලෝකාශ වාරය 132-133, භාවනා වර්තමාන වාරය 133-135.

**ඉන්ද්‍රිය යමකය**, ප්‍රඥප්ති වාර උද්දේශය 136, නිද්දේස වාර පදශෝධන වාරය 137-138, පද ශෝධන මූල චක්‍ර වාරය 138-139, සුද්ධින්ද්‍රිය වාරය 139-141, ප්‍රවෘත්ති වාරය 142-146, ඝානමූලය 146-150, ඉත්ථින්ද්‍රිය මූලය 150 - 153, ජීවිතින්ද්‍රිය මූලය 154-158, සෝමනස්ස මූලය 158 - 163, උපේක්ෂා මූලය 163-167 සද්ධින්ද්‍රිය මූලය 167-169, විරියින්ද්‍රිය මූලය 169-170, සමාධින්ද්‍රිය මූලය - පඤ්ඤින්ද්‍රිය මූලය අතීත වාරය 171, පුද්ගලෝකාස වාරය චක්ඛුන්ද්‍රිය මූලය 172-173, ඝානින්ද්‍රිය මූලය 173 - 175, ජීවිතින්ද්‍රිය මූලය 175-176, අනාගත පුද්ගල වාර චක්ඛුන්ද්‍රිය මූලය 176-177, ඝානින්ද්‍රිය මූලය 177-179, ඉත්ථින්ද්‍රිය මූලය 180-182, ජීවිතින්ද්‍රිය මූලය 182-184, සොමනස්සින්ද්‍රිය මූලය 184-185, පුද්ගලෝකාශ වාරය 185 - 187, ඝානින්ද්‍රිය මූලය 187 - 189, ඉත්ථින්ද්‍රිය මූලය 189 - 191, ජීවිතින්ද්‍රිය මූලය 191 - 194, සෝමනස්ස මූලය 194 - 195,

වර්තමානාතීත පුද්ගල වාරය 195, පුද්ගලෝකාස වාරය 195 - 196, ජීවිත මූලය, 197 - 199, වර්තමානානාගත පුද්ගල වාර චක්ඛු මූලය 199 - 201, ඝාන මූලය 202 - 204, ඉත්ථින්ද්‍රිය මූලය 204 - 207, ජීවිතින්ද්‍රිය මූලය 208 - 210, සෝමනස්සින්ද්‍රිය මූලය 210 - 212, උපෙක්ඛින්ද්‍රිය මූලය 212 - 213, පුද්ගලෝකාශ වාරය චක්ඛු මූලය 214 - 218, ඝානින්ද්‍රිය මූලය 218 - 222, ඉත්ථින්ද්‍රිය මූලය, 222 - 225, ජීවිතින්ද්‍රිය මූලය 225 - 227, සෝමනස්සින්ද්‍රිය මූලය,227-229, උපෙක්ඛින්ද්‍රිය මූලය 229 - 230, අතීතානාගතපුද්ගල වාරය 230-231 පුද්ගලෝකාශ වාර - චක්ඛු මූලය, 231-233, ඝානින්ද්‍රිය මූලය 233-235, ජීවිතින්ද්‍රිය මූලය 235, සෝමනස්සින්ද්‍රිය මූලය 235-236,උපේක්ඛින්ද්‍රිය මූලය 236, නිරෝධ වාරය 236, පරිඤ්ඤා වාර වර්තමානය 237-238, අතීත වාරය 238-240, අනාගත වාරය 240-241,වර්තමානාතීත වාරය 241,

**යමක ගණ්ඨි පද ශෝධනය:-**

ඉන්ද්‍රිය යමක පරිඤ්ඤා වාරය-වර්තමාන චක්ඛුන්ද්‍රිය මූලය 242-243,දෙමනස්සින්ද්‍රිය මූලය 243-244, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය 244,-අඤ්ඤින්ද්‍රිය මූලය 244-245 අතීත වාර චක්ඛුන්ද්‍රිය මූලය 245-246, දොමනස්සින්ද්‍රිය මූලය 246, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය 247, අඤ්ඤින්ද්‍රිය 147, අනාගත වාර චක්ඛුන්ද්‍රිය මූලය 248, දෙමනස්සින්ද්‍රිය මූලය 249, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය 249 - 250, අඤ්ඤින්ද්‍රිය මූලය 250 වර්තමානාතීත වාරය චක්ඛුන්ද්‍රිය මූලය 250 - 251, දෙමනස්සින්ද්‍රිය මූලය

251- 252, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය 252, අඤ්ඤින්ද්‍රිය මූලය 253, වර්තමානානාගත වාරය - චක්ඛුන්ද්‍රිය මූලය 253 - 254, දෙමනස්සින්ද්‍රිය මූලය 254, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය 255, අඤ්ඤින්ද්‍රිය මූලය, 255, අතීතානාගත වාරය - චක්ඛුන්ද්‍රියමූලය 256, දෙමනස්සින්ද්‍රිය මූලය **257** - අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය 257 - 158, අඤ්ඤින්ද්‍රිය මූලය 158.

**යමක ගැටපදය:**

මූලයමක ගැටපදය - **උද්දේස** වාරය 259 - 264, නිද්දේස වාරය 264 274, **ඛන්ධ යමක ගැටපද** - ප්‍රඥප්ති උද්දේස වාරය 274 - 277, ප්‍රඥප්ති නිද්දේශ වාරය 277 - 279, ප්‍රවෘත්ති වාරය 279 - 284, පරිඤ්ඤාවාරය 284 - 286, **ආයතන යමක ගණ්ඨි** - ප්‍රඥප්ති වාරය 286 - 290 - ප්‍රවෘත්ති වාරය 290 - 294. **ධාතු යමක ගණ්ඨි** 294-296. **සච්ච යමක ගණ්ඨි**-ප්‍රඥප්ති වාරය 297-299. ප්‍රවෘත්ති වාරය 300- 305 - පරිඤ්ඤා වාරය 305 - 306,

**සංඛාර යමක ගණ්ඨි**, ප්‍රඥප්ති වාරය 306 - 310, ප්‍රවෘත්ති වාරය 311 - 314. **යමක සම්පිණ්ඩනය** - විභංග සයක් පිළිබඳ සම්පිණ්ඩනය 315, ප්‍රශ්නෝත්තර සම්පිණ්ඩනය 315 - 316, ආයතන සම්පිණ්ඩනය 316 - 317, ඉන්ද්‍රිය සම්පිණ්ඩනය 317 - 318, බුරුම මහා විසුද්ධාරාමාධිපති මහානායක මාහිමියන් වහන්සේ විසින් රචිත යමක සම්පිණ්ඩනය 318 - 319,

**යමක අනු ගණ්ඨි පද** - මූල යමක-උද්දේස වාරය 320, ගණ්ඨි පද ශෝධනය 320 - 326, නිර්දේශ වාරය ගණ්ඨි පද ශෝධනය 326 - 342, **ස්කන්ධ යමකය** - ප්‍රඥප්ති වාරය - ගණ්ඨි පද ශෝධනය 343 - 352, ප්‍රවෘත්ති වාරය - ගණ්ඨි පද ශෝධනය 352 - 358, පරිඤ්ඤා වාරය ගණ්ඨි පද ශෝධනය 358 - 361, **ආයතන යමකය** - නාම ප්‍රඥප්ති වාරය - ගණ්ඨි පද ශෝධනය 362 - 368, ප්‍රවෘත්ති වාරය - ගණ්ඨි පද ශෝධනය 369 - 375, **ධාතු යමකය** ගණ්ඨි පද ශෝධනය 376 - 380. **සත්‍ය යමකය** ගණ්ඨි පද ශෝධනය 381-383, සත්‍යාර්ථ සොළස 383-395, පරිඤ්ඤා වාරය - ගණ්ඨිපද ශෝධනය 395 - 396, සංඛාර යමක ගණ්ඨි පද ශෝධනාය 396 - 408,

# 7. අනුසය යමකය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

### උත්පත්ති ස්ථාන වාරය

සංස්කාර යමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව අනුශය යමකය වදාළ සේක. ඒ අනුශය යමකයද පරිච්ඡෙද වාරය, පරිච්ජින්නුද්දෙස වාරය, උත්පත්තිස්ථාන වාරය, මහා වාරය වශයෙන් සිවුවැදෑරුම් වන්නේය. **හෙවත්** අනුසයුද්දෙස, නාමව්‍යවස්ථාන, උත්පත්තිස්ථාන මහා වාර වශයෙන් සිවුවැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් අනුසයුද්දෙස වාරය පළමු කොට වදාළ සේක. **කෙසේ වදාළසේක්ද යත්**, සත්තානුසයා - යනුවෙනි. ඉන් අනතුරුව නාම ව්‍යවස්ථානය වදාළ සේක, **කෙසේ වදාළසේක්ද යත්** ; කාමරාගානුසයො, පටිඝානුසයො, මානානුසයො, දිට්ඨානුසයො, විචිකිච්ඡානුසයො, භවරාගානුසයො, අවිජ්ජානුසයො, යනුවෙනි.

කාමරාගානුසයො ච - කාමරාගානුසයද ; - පෙ - අවිජ්ජානුසයො ච -අවිද්‍යානුසය දැයි ; ඉති - මෙසේ ; සත්ත - සත් දෙනෙක් ; අනුසයා - අනුශය නම් වූවාහු ; හොන්ති - වෙති. නොහොත් සත්ත - සත් - දෙනෙක් ; අනුසයා -අනුසය නම් ; හොන්ති - වෙති ; කාමරාගානුසයොච කාමරාගානුශයද ; - පෙ - අවිජ්ජානුසයො ච - අවිද්‍යානුසය දැයි ; ඉති ඉමෙ - යන මොවුහු වෙති.

නාම ව්‍යවස්ථානය දේශනා කොට වදරා ඉන් අනතුරුව උත්පත්ති ස්ථාන වාරය වදාළ සේක. ඒ උත්පත්ති ස්ථාන වාරයද කාමරාගානුශයේ උත්පත්ති ස්ථාන වාරය, පටිඝානුශයේ උත්පත්තිස්ථාන වාරය, මානානුශයේ උත්පත්ති ස්ථාන වාරය, දිට්ඨානුශයේ උත්පත්ති ස්ථාන වාරය, විචිකිච්ඡානුශයේ උත්පත්ති ස්ථාන වාරය, භවරාගානුශයේ උත්පත්තිස්ථාන වාරය, අවිද්‍යානුශයේ උත්පත්ති ස්ථාන වාරය වශයෙන් සත් වැදෑරුම් වන්නේය. ඒ සත අතුරෙන් **කාමරාගානුශයාගේ** උත්පත්තිස්ථාන වාරය පළමු කොට වදාළ සේක. **කෙසේද යත්;** ''කත්ථ කාමරාගානුසයො අනුසෙති, කාමධාතුයා, ද්විසු වෙදනාසු එත්ථ කාමරාගානුසයො අනුසෙති'', යනු වෙනි, කත්ථ - කවර ස්ථාන භූමියෙක්හි ; කාමරාගානුසයො - කාමරාගානුශය, අනුසෙති - අනුසයනය වේද ; **හෙවත්** අනුසෙති - අනුරූපං කාරණං ලභිත්වා උප්පජ්ජති - සුදුසු කරුණක් ලැබ උපන්නේ, උපදිමින් සිටින්නේ මතු උපදින්නේ වේද ; ඉති පුච්ඡායං - මෙවැනි ප්‍රශ්නයක් ;

සති – ඇතිකල්හි ; කාම ධාතුයා – කාම භූමි (11) එකොළස නම් වූ කාම ධාතුවෙහි ද ; ද්විසු – දෙකක් වූ ; වෙදනාසු – කාමාවචර සුඛ වේදනා (19) එකුන් විස්සය, කාමාවචර උපේක්ෂා වේදනා (32) දෙතිසය යන ; එත්ථ – මේ කාම ධාතු වේදනා දෙකෙහි ; කාමරාගානුසයො – කාමරාගානුසය ; අනුසෙති – අනුසයනය වේ. **හෙවත්**, අනුරූපං කාරණං ලභිත්වා උප්පජ්ජති – අනුරූප වූ කරුණක් ලැබ උපන්නේ, උපදිමින් සිටින්නේ, මතු උපදින්නේ ද වේ යයි ; ඉති විස්සජ්ජනා – මෙසේ විසඳුම, හොති – වෙයි.

කාමාරාගානුශයාගේ උත්පත්තිස්ථානය දේශනා කොට වදරා ඉන් අනතුරුව **පටිඝානුශයාගේ** උත්පත්තිස්ථානය වදළ සේක. කෙසේද යත් – ''කත්ථ පටිඝානුසයො අනුසෙති, දුක්ඛාය වේදනාය එත්ථ පටිඝානුසයො අනුසෙති,'' යනු වෙනි. කත්ථ – කවර ස්ථාන යෙක ; පටිඝානුසයො – පටිඝානුසය තෙමේ ; අනුසෙති – අනුසයනය වේද ? හෙවත් අනුසෙති – අනුරූපං කාරණං ලභිත්වා අනුසෙති – අනුරූප කාරණයක් ලැබ උපන්නේ, උපදිමින් සිටින්නේ, මතු උපදින්නේ වේදැයි ; ඉති පුච්ඡායං සති–මෙවැනි ප්‍රශ්නයක් ඇති කල්හි ; දුක්ඛාය – දුක්ඛවූ ; වේදනාය – තුනක් වූ දුක්ඛ වේදනා වෙහි ; එත්ථ – මේ දුක් වේදනා තුනෙහි ; පටිඝානුසයො – ප්‍රතිඝානුශය තෙමේ ; අනුසෙති – අනුසයනය වේ. **හෙවත්** අනුරූපං කාරණං ලභිත්වා උප්පජ්ජති – **සුදුසු** කරුණක් ලැබ උපන්නේ, උපදිමින් සිටින්නේ, මතු උපදින්නේද වේයැයි, ඉති විස්සජ්ජනා – මෙවැනි විසඳුමක් ; හොති – වේ.

පටිඝානුසයාගේ උත්පත්තිස්ථානය දේශනා කොට වදරා ඉන් අනතුරුව මානානුශයාගේ උත්පත්ති ස්ථානය වදළ සේක, **කෙසේද යත්**, කත්ථ මානානුසයො අනුසෙති, කාමධාතුයා, ද්විසු වෙදනාසු, රූපධාතුයා, අරූප ධාතුයා එත්ථ මානානුසයො අනුසෙති ' යනුවෙනි.

කාමධාතුයා – කාමභූමි (11) එකොළස නම් වූ කාම ධාතුවෙහි ද ; ද්විසු–දෙකක්වූ; වෙදනාසු – කාම සුඛ වේදනා (19) එකුන් විස්ස හා කාමඋපේක්ෂා වේදනා (32) දෙතිසෙහි ; රූපධාතුයා – රූපභූමි (16) සොළස නම්වූ රූපධාතුවෙහි ද අරූපධාතුයා– අරූපභූමි (සතර නම් වූ අරූප ධාතුවෙහිද, එත්ථ–මේ කාමධාතු, ද්වි වේදනා, රූප– ධාතු, අරූප ධාතුවෙහි ද ; මානානුසයො – මානානුශය තෙමේ ; අනුසෙති – අනුසයනය වේ ; **හෙවත්** අනුරූපං කාරණං ලභිත්වා උප්පජ්ජති – සුදුසු කරුණක් ලැබ උපන්නේ, උපදිමින් සිටින්නේ, මතු උපදින්නේ ද වේ; ඉන් අනතුරුව **දිට්ඨානුශයාගේ** උප්පත්තිස්ථානය වදළ සේක. **කෙසේද යත්** ''කත්ථ දිට්ඨානුසයො අනුසෙති – සබ්බ – සක්කාය පරියා පන්නෙසු ධම්මේසු, එත්ථ දිට්ඨානුසයො අනුසෙති,'' යනු වෙනි. සබ්බ **සක්කාය** පරියාපන්නෙසු–සියලුම සක්කායයෙහි ඇතුලත් වූ; ධම්මේසු– ලෞකික ධර්මයන්හි ; එත්ථ–මේ ත්‍රිවිධ ධාතු, ත්‍රිවිධ වේදනාවන්හි ; **දිට්ඨානුසයො** දිට්ඨානුශය තෙමේ ; අනුසෙති, අනුසයනය වේ, සුදුසු කරුණක් ලැබ උපන්නේ උපදිමින් සිටින්නේ මතු උපදින්නේද වේ යැයි – ඉති විස්සජ්ජනා හොති – මෙවැනි

විසඳුම වේ. ඉන් අනතුරුව **විචිකිච්ඡානුශයා ගේ** උත්පත්තිස්ථානය දේශනා කොට වදළ සේක. (දිට්ඨානුශයට සමානය) ඉන් අනතුරුව **භව රාගානුශයාගේ** උත්පත්ති ස්ථානය දේශනා කොට වදළ සේක. **කෙසේදයත්** 'කත්ථ භවරාගානු සයො අනුසෙති රූපධාතුයා අරූපධාතුයා එත්ථ භවරාගානුසයො අනුසෙති.'' යනු මෙනි. ඉන් අනතුරුව අවිජ්ජානුසයාගේ උත්පත්තිස්ථානය දේශනා කොට වදළ සේක. (දිට්ඨානුශයට සමානය).

''අනුසෙති – අනුසයනය වේ යනු වනාහි මාර්ගයෙන් ප්‍රහීණ නොකළ බැවිනැයි කියන ලද්දේ වෙයි, එනිසා මාර්ගයෙන් ප්‍රහීණ නොකළ තැනැත්තේ සියලු කල්හි, උපන්නේ, උපදමින් සිටින්නේ, මතු උපදින්නේ වේ යැයි තුන් කාලයාගේ වශයෙන් කියන ලද්දේ වේ, මෙසේ අර්ථ ගන්නා කල්හි අනුසෙති යන්නෙහි ''ති'' විභක්තිය අතීත අනාගත අර්ථයෙහිද වැටෙ – 'වත්තමානා පච්චුප්පන්නෙ'' යන සූත්‍රයෙහි වත්තමානා–යන යෝග විභාගයෙන් විභක්ති කරනු

## අධිප්‍රායාර්ථය

''කත්ථ කාමරාගානුසයො අනුසෙති'' යන පාඨයෙහි **අධිප්‍රායාර්ථය** වනාහි කාම භූමියට ඇති නිකාන්තිය නමැති ලෝභ චෛතසිකය නම් වූ කාමරාගානුශය, (1) පුද්ගලයන් වශයෙන් පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමීන් කෙරෙහි උපදී, අනාගාමී රහත් අය කෙරෙහි නූපදී, (2) ප්‍රහීණ අප්‍රහීණ වශයෙන් වනාහි සෝතාපත්ති මාර්ගස්ථ, සකදාගාමී මාර්ගස්ථයන් කෙරෙහි උපදී. අනාගාමී මාර්ගස්ථ, අර්හත් මාර්ගස්ථයන් කෙරෙහි නූපදී. (3) ස්ථාන නම්වූ භූමි වශයෙන් වනාහි කාමභූමි (11) එකොළස නම්වූ කාමධාතුවෙහි පමණක් අරමුණු කිරීම වශයෙන් උපදී. (4) වේදනා වශයෙන් වනාහි, කාම සුඛ වේදනා (19) එකුන් විස්සය, කාම උපේක්ෂා වේදනා (32) දෙතිසය යන මෙහි උපදී.

එසේ ඉපදීම ඇත්තේද ලෝභ මූල සොමනස්ස (4) සතරෙහිද, උපෙක්ෂා සහගත සතරෙහි ද, අරමුණු කිරීම වශයෙන් හා සහජාත වශයෙන් උපදී, අවසේස වේදනා (43) තෙසාළිසෙහිදී අරමුණු කිරීම වශයෙන් පමණක්ම උපදී. එසේ උපදින්නේද වේදනාවම පමණක් උපදනේ නොවේ. සහජාත ධර්මයන් සමඟ එකටම උපදින බැවින් කාම සුඛ සහගත චිත්තෝත්පාද, උපේක්ෂා සහගත චිත්තෝත්පාද, ස්වභාව – විපරීත ඉෂ්ට, ඉෂ්ට මධ්‍යස්ථවූ රූපයන්හි ද අරමුණු කිරීම වශයෙන් හා සහජාත වශයෙන්ද උපදී, (5)'' අනුසේති – පෙ – උප්පජ්ජති.'' යන්නෙහි අධිප්‍රායාර්ථ වනාහි, අනුශය තෙමෙ වර්තමාන උත්පාද – ඨිති – භංග වශයෙන් හටගැනිම ඇත්තේ හෝ නැත්තේ හෝ වේවා, යම් තාක් කල් මාර්ගයෙන් ප්‍රහීණ නොවේද ඒතාක් කල් සැමද අප්‍රහීණ වශයෙන් උපන්නේය. උපදමින් සිටින්නේය, මතු උපදින්නේ යයි තුන් කාලය වශයෙන් කියන ල්ද්දේ වෙයි. ඒ නිසා පුද්ගලයා කල්පනා නො කොට, ස්ථාන වූනැවියට කල්පනා කොට ගෙන කත්ථ කාමරාගානු

සයොඅනුසෙති'' යයි ප්‍රශ්න උපදවා කාමභූමි එකොළස නම් වූ කාම ධාතුව, කාම සුඛ වේදනා, කාම උපේක්ෂා වේදනාවන්ම ප්‍රධාන වශයෙන් අරමුණු කොට කාම ධාතුයා ද්විසු වේදනාසු එත්ථ කාමරාගානුසයො අනුසෙති'' යයි පිළිතුරු වදරා ඇත.

''ඍත්ථ පටිඝානුසයො අනුසෙති'' යන පාඨයෙහි **අධිප්‍රායාර්ථ** වනාහි ප්‍රතිසද්වයෙහි ඇත්තා වූ දෝස චෛතසිකය නම් වූ ප්‍රතිඝානුශය තෙමේ (1) පුද්ගලයන් වශයෙන්, පෘථග්ජන සෝතාපන්න, සකදගාමීන් කෙරෙහි උපදී. අනාගාමී රහතන් කෙරෙහි නූපදී, (2) වේදනා වශයෙන් වනාහි දෝමනස්ස වේදනා දෙක හා දුක්ඛ වේදනා එකය, මේ වේදනා තුනෙහි උපදී, එසේ උපදින්නේද දෝමනස්ස වේදනා දෙකෙහි අරමුණු කිරීම් වශයෙන් ද සහජාත වශයෙන් ද උපදී. එකම දුක්ඛ වේදනා වෙහි වනාහි අරමුණු කිරීම වශයෙන් පමණක්ම උපදී. එසේ උපදින්නේද වේදනාවම පමණක් උපදින්නේ නොවේ. සහජාත ධර්මයන්ද සමඟ උපදින බැවින්, ද්වේෂමූල චිත්තෝත්පාද දෙකය, දුක්ඛ සහගත කාය විඤ්ඤාණ චිත්තෝත්පාදය, ස්වභාවවිපරීත අනිෂ්ට වූ රූපයන්හි ද අරමුණු කිරීම වශයෙන් හා සහජාත වශයෙන් ද, උපදී. (37) ''අනුසෙති'' යන්නෙහි අධිප්‍රායාර්ථය වනාහි ඉහත කියන ලද මැයි. එනිසා පුද්ගලයා ගැන නොබලා ස්ථාන නම් වූ භූමියම කල්පනා කොට ගෙන ''ඍත්ථ පටිඝානුසයො අනුසෙති.'' යි කියා ප්‍රශ්න උපදවා, දුක්ඛ වේදනා තුන පමණක් ප්‍රධාන ආරම්මණය වශයෙන් ගෙන ''දුක්ඛාය වෙදනාය එත්ථ පටිඝානුසයො අනුසෙති'' යයි පිළිතුරු වදරණ ලදී.

''ඍත්ථ මානානුසයො අනුසෙති'' යන පාඨයෙහි **අභිප්‍රායාර්ථය** වනාහි, දිට්ඨිගත විප්පයුත්ත සිත් සතරෙහි පමණක් යෙදෙන මාන චෛතසිකයයි කියන ලද මානානුසය, (1) පුද්ගලයන්ගේ වශයෙන් පෘථග්ජන, සොතාපන්න, සකදගාමි, අනගාමීන් කෙරෙහි උපදී. රහතුන් කෙරෙහි නූපදී. (2) ප්‍රහීණ අප්‍රහීණ වශයෙන් සෝතාපත්ති මාර්ගස්ථ, සකදාගාමී මාර්ගස්ථ, අනාගාමී මාර්ගස්ථයන් කෙරෙහි පමණක් උපදී. අර්හත් මාර්ගස්ථයන් කෙරෙහි නූපදී. (3) භූමි වශයෙන් වනාහි කාම භූමි (11) එකොළසයයි කියන ලද කාමධාතු, රූපභූමි (16) සොළස නම් වූ රූපධාතු, අරූපභූමි (4) සතර නම් වූ අරූප ධාතු යන මේ ධාතු තුනෙහි අරමුණු කිරීම් වශයෙන් උපදී. (4) වේදනා වශයෙන් වනාහි, කාම සුඛ වේදනා (19) දහනවය, හා කාම උපේක්ෂා වේදනා (32) දෙතිසෙහි උපදී. එසේ උපදිනුයේද ලෝභමූල සෝමනස්ස සහගත (2) දෙක හා උපේක්ෂා සහගත දෙකෙහි අරමුණු කිරීම් වශයෙන්ද, සහජාත වශයෙන් ද උපදී. අවශේෂ වේදනා (47) සත්සාළිසෙහි වනාහි අරමුණු කිරීම වශයෙන් පමණක්ම උපදී. එසේ උපදිනුයේද වේදනාව පමණක්ම නොම උපදී, සහජාත චිත්ත චෛතසික ධර්මයන් සමඟම උපදින බැවින් කාමසුඛ වේදනා සහගත චිත්තෝත්පාද, උපේක්ෂා සහගත චිත්තෝත්පාද, ස්වභාව විපරීත ඉෂ්ට, ඉෂ්ට මධ්‍යස්ථ වූ රූපයන්ද අරමුණු කිරීම වශයෙන් හා සහජාත වශයෙන්ද උපදී. (5) ''අනුසෙති'' යන්නෙහි **අධිප්‍රායාර්ථ**

පෙර සේ කියනු, එ නිසා පුද්ගලයෙකු නො උදෙසා ස්ථානවූ භූමියම උදෙසා ගෙන ''කත්ථ මානානුසයො අනුසෙති''යි ප්‍රශ්න උපදවා, ත්‍රිවිධ ධාතුව, ද්විවේදනාවම ප්‍රධාන වශයෙන් ගෙන ''කාම ධාතුයා–පෙ– අනුසෙති''යි පිළිතුරු වදරණ ලදහ.

''කත්ථ දිට්ඨානුසයො අනුසෙති'' යන පාඨයෙහි **අධිප්‍රායාර්ථ** වනාහි, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙහිම සම්ප්‍රයුක්ත වන්නා වූ දිට්ඨි චෛතසිකය නම් වූ දිට්ඨානුසය තෙමේ, (1) පුද්ගලයන් වශයෙන් පෘථග්ජනයා කෙරෙහිම උපදී. සෝතාපන්න, සකදාගාමී, අනාගාමි අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයන් කෙරෙහි නූපදී. (2) ස්ථාන නම් වූ භූමි සවශයෙන් වනාහි, ත්‍රිවිධ ධාතුවෙහි පමණක්ම අරමුණු කිරීම් වශයෙන් උපදී.

(3) වේදනා වශයෙන් වනාහි, සුඛ වේදනා, දුක්ඛ වෙදනා, උපෙක්ෂා වේදනා නම් වූ වේදනා තුනෙහි උපදී. එසේ උපදිනුයේද, ලෝභමූල සොමනස්ස සහගත දෙක හා උපේක්ෂා සහගත දෙකෙහි පමණක් අරමුණු කිරීම වශයෙන් හා සහජාත වශයෙන්ද උපදී. අවශේෂ සිත් (77) සත් සැත්තෑවෙහි අරමුණු කිරීම වශයෙන් පමණක්ම උපදී. එසේ උපදිනුයේද වේදනාව පමණක්ම උපදින්නේ නොවේ. සහජාත චිත්තචෛතසික ධර්මයන් හා සමඟ එකට උපදින බැවින් සුඛ සහගත චිත්තෝත්පාද, දුක්ඛ සහගත චිත්තෝත්පාද, උපේක්ෂා සහගත චිත්තෝත්පාද, සභාව විපරීත ඉෂ්ට, ඉෂ්ට මධ්‍යස්ථ වූ රූපයන්හිද අරමුණු කිරීම් වශයෙන් හා සහජාත වශයෙන්ද උපදී. 'අනුසෙති'' යන්නෙහි **අධිප්‍රායාර්ථ** පෙරසේ කියනු, එනිසා පුද්ගලයෙකු නොඋදෙසා ස්ථාන නම් වූ භූමියම උදෙසා බලා ''කත්ථ දිට්ඨානුසයො අනුසෙති'' යි ප්‍රශ්න උපදවා, ත්‍රිවිධ ධාතුව, ත්‍රිවිධ වේදනා, සංක්ෂේපයෙන් දක්වූ පරිදි ''සබ්බ සක්කාය– පෙ – අනුසෙති'' යි පිළිතුරු වදරණ ලදහ. (විචිකිච්ඡානුසය දිට්ඨානුසයට සමානය, විචිකිච්ඡා සහගත උපෙක්ෂා වේදනාවෙහි අරමුණු කිරීම් වශයෙන් හා සහජාත වශයෙන් ද උපදී. මෙ පමණක්ම මාරුකොට කියනු)

''කත්ථ භවරාගානුසයො අනුසෙති'' යන පාඨයෙහි අධිප්‍රායාර්ථ වනාහි, රූපභූමි, අරූප භූමියෙහි නිකාන්තිය නම් වූ දිට්ඨිගත විප්පයුත්ත සිත් (4) සතරෙහි පමණක් සම්ප්‍රයුක්ත වන ලෝභ චෛතසික යයි කියන ලද භවරාගානුසය තෙමේ, (1) පුද්ගලයන් වශයෙන් පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි අනාගාමීන් කෙරෙහි උපදී. රහතුන් කෙරෙහි නොම උපදී. (2) ප්‍රහීණ අප්‍රහීණ වශයෙන් වනාහි සෝතාපත්ති මාර්ගස්ථ, සකදාගාමී මාර්ගස්ථ අනාගාමී මාර්ගස්ථයන් කෙරෙහි පමණක් උපදී. අරහත් මාර්ගස්ථයන් කෙරෙහි නූපදී. (3) ස්ථාන වූ භූමි වශයෙන් වනාහි රූපධාතු, අරූපධාතුන්හි අරමුණු කිරීම් වශයෙන් පමණක් උපදී. ධාතුද්වයෙහි ස්වරූප සැකෙවින් දක්වීම් වශයෙන් ''රූපධාතුයා –පෙ– අනුසෙති'' යයි පිළිතුරු වදරණ ලදහ.

''කත්ථ අවිජ්ජානුසයො අනුසෙති'' යන පාඨයෙහි **අධිප්‍රායාර්ථය** වනාහි, අකුසල් සිත් (12) දොළොසෙහි යෙදෙන්නාවූ මෝහ චෛතසිකය නම්වූ අවිද්‍යානුශය තෙමේ,

(පුද්ගලයන් මානානුශය අනුවද, භූමි ආදිය දිට්ඨානුශය අනුවද කියනු. අකුසල සිත් (12) දොළස හා වේදනා තුනෙහි අරමුණු කිරීම් වශයෙන් ද සහජාත වශයෙන්ද උපදී. මෙපමණක්ම විශේෂයි, දිට්ඨානුශයට සමානව නය ක්‍රමය උද්ධරනු).

''කාම ධාතුයා, ද්වීසු වෙදනාසු'' යන්නෙහි **අර්ථකථානය** වශයෙන් කාමධාතුව ස්ථාන වශයෙන් වෙනම නොගත යුතුය. කාමධාතුයා – කාමධාතුවෙහි ; ද්වීසු වෙදනාසු – දෙකක් වූ වේදනා වන්හි ; මෙසේ අර්ථය යොද කාමරාගානුශයට ස්ථානය, දෙකක්වූ වේදනාව යයි ගතයුතුය ; ටීකා ක්‍රමයෙන් වනාහී, ඉහත අර්ථ යෝජනාව දක්වූවා සේ කාම භූමි (11) එකොළස හා වේදනා දෙකද යන මේ ස්ථාන තුන ගනු ලැබෙති. මේ ක්‍රමයට සමානව මානානුශය ආදියෙහිද ගතයුතුය ; කාමරාගානුශය කාම ධාතු වේදනා දෙක්හි උපදී යයි කියන ලද දේශනාව වනාහි ඖදරික වශයෙන් සුවසේ අවබෝධ කරගැනීම පිණිස ප්‍රධාන නය වශයෙන් වදරණ ලදී, වේදනාව හා සම්ප්‍රයුක්ත වූ ධර්මයෝ ඉෂ්ටාරම්මණයෙහිද උපදින්නා හු යයි ගත යුතුය. ඒ නිසා අට්ඨ කථා වෙහි :-

''ඔළාරික වසෙන හි බොධනෙය්‍යො සුඛං බොධෙතුන්ති, නතු වෙස ආරම්මණ වසෙන අනුසයමානො, න කෙවලං ඉමාසු ද්වීසු වෙදනාසු චෙව, වෙදනා සම්පයුත්ත ධම්මෙසුච අනුසෙති, ඉට්ඨෙසු පන රූපාදීසුපි අනුසෙති යෙව' යි කියන ලදී. ප්‍රතිඝානුසයෙහි ද එයට සමානය. ''අනිට්ඨෙසු පන රූපාදීසුපි අනුසෙති යෙව''යි සංවර්ණණා කරන ලදී. ''පටිඝානුසයොහි අනිට්ඨාරම්මණෙ පටිහඤ්ඤණ වසෙන උප්පන්නො ථාමගතො කිලෙසො, තස්මා එත්ථ දෙමනස්සෙන සද්ධිං පටිඝො උප්පන්නොපි අතතනො පටිසකිච්චං අකරණ භාවෙන ඒව පටිඝානුසයො න හොති අබ්බොහාරිකත්තං ගච්ජති,'' යනාදී වශයෙන් අර්ථකථාහි ආ බැවින් ඉෂ්ටාරම්මණයෙහි දෝමනස්ස පටිඝානුසය නොවේ. අනිෂ්ඨාරම්මණයෙහි ම ථාමගත කේලෙශ බව වන්නේය, එනිසා අනිෂ්ඨාරම්මණයෙහි ම පටිඝානුශය උපදී යයි ගත යුතුය.

උත්පත්ති ස්ථාන වාරය නිමි.

## මහා වාර අනුසය වාරය

### අනුලෝම පුද්ගල කාමරාගානුසය මූලය.

උත්පත්තිස්ථාන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව මහා වාරය වදළ සේක. ඒ මහා වාරයද අනුසය වාර, සානුසය වාර, පජහන වාර, පරිඤ්ඤ වාර, පහින වාර, උප්පජ්ජන වාර, ධාතු වාර වශයෙන් සත් වැදෑරුම් වන්නේය. ඒ සත අතුරෙන් අනුසය වාරය පළමු කොට වදළ සේක. ඒ අනුශය වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද පුද්ගල වාරය, ඕකාස වාරය, පුද්ගලෝකාස

වාරය වශයෙන් තෙ වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරයද, ඒකමූල, ද්විමූල, තිමූල, චතු මූල පඤ්ච මූල, ඡමූල, වශයෙන් සවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් ඒකමූලය පළමු කොට වදළ සේක. ඒ ඒක මූලයද කාමරාගානුසය මූල, පටිඝානුසය මූල, මානානුසය මූල, දිට්ඨානුසය මූල, විචිකිච්ඡානුසය මූල, භවරාගානුසය මූල වශයෙන් සවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් කාමරාගානුසය මූලය පළමු කොට වදළ සේක. ඒ කාමරාගානුසය මූලය ද පටිඝානුසය මූලි යනාදි වශයෙන් සවැදෑරුම් වන්නේය, ඒ සය අතුරෙන් පටිඝානුසය මූලිය පළමු කොට වදළ සේක. ඒ පටිඝානුසය මූලියද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමයද පුච්ඡා-විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාවද සන්නිට්ඨාන-සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨා-නය පළමු කොට වදළ සේක. කෙසේ වදළසේක්ද යත් ''යස්ස කාමරාගානුසයො අනුසෙති'' යනුවෙනි.

ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේද යත් - ''තස්ස පටිඝානුසයො අනුසෙති'' කියාය, පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව විස්සජ්ජනාව වදළ සේක. කෙසේද යත් - ''ආමන්තා'' කියාය ; අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රතිලෝමය වදළ සේක. ඒ ප්‍රතිලෝමයද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් සන්නිටඨානය පළමු කොට වදළ සේක. කෙසේද යත් ''යස්ස වා පන පටිඝානුසයො අනුසෙති'' කියාය, ඉන් අනතුරුව සංසය වදළ සේක. **කෙසේද යත්** ''ආමන්තා'' යනු වෙනි.

**යස්ස** - යම් පුද්ගලයෙකුට ; කාමරාගානුසයො - කාම රාගානුසය ; අනුසෙති - අනුසයනය වේද ; **හෙවත්** අනුරූපං කාරණං ලභිත්වා උප්පජ්ජති - සුදුසු කරුණක් ලැබ උපන්නේ, උපදිමින් සිටින්නේ, මතු උපදින්නේ වේ ද; තස්ස - ඒ කාමරාගා--නුසය උපදින පුද්ගලයාට ; පටිඝානුසයො - පටිඝානුසය ; අනුසෙති - අනුසයනය වේද ? හෙවත් අනුසෙති අනුරූපං කාරණං ලභිත්වා උපපජජති - සුදුසු කරුණක් ලැබ උපන්නේ, උපදිමින් සිටින්නේ, මතු උපදින්නේ හෝ වේද ? ඉති පුච්ඡායං සති - මෙවැනි පැනයක් ඇති කල්හි, ආමන්තා-කාමරාගානුසය උපදින පුද්ගලයන්ට පටිඝානුසය උපදී ; ඉති විස්සජ්ජනා මෙවැනි පිළිතුරක් ; හොති - වෙයි ; (යස්සවාපන, යන්නෙහි ද ක්‍රමය සමාන ව කියනු.)

අනුලෝම පුච්ඡාවෙහි **සන්නිට්ඨාන පදයාගේ අභිධෙය්‍යාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයෝ ගනු ලැබෙති; **ප්‍රතිලෝමයෙහි** නය ක්‍රමය සමානය. (ප්‍රති වචනයයි) පතිඝානුසය මූලිය දේශනා කොට වදරා ඉන් අනතුරුව මනානුසය මූලිය වදළ සේක. (පෙර සේ කියනු) **කෙසේ වදළ සේක් ද යත්** ''යස්ස - කාමරාගානුසයො අනුසෙති, තස්ස මානානුසයො අනුසෙතීති, ආමන්තා, යස්ස

වාපන – මානානුසයො අනුසෙති, තස්ස කාමරාගානුසයො අනුසෙතීති–අනාගාමිස්ස මානානුසයො අනුසෙති, නොච තස්ස කාමරාගානුසයො අනුසෙති, **තිණ්ණං** පුග්ගලානං මානානුසයො ච අනුසෙති, කාමරාගානුසයො ච අනුසෙති.''

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ** අනාගාමි ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයෝ ද ගනු ලැබෙති, සංසය **ස්වරූපාර්ථ** පෙර සේ ම ගනු ලැබේ. (ස්වරූප දැක්වීමෙනි).

ඉන් අනතුරුව දිට්ඨානුසය මූලිය වදළ සේක. **කෙසේද යත්** ''යස්ස කාමරාගානුසයො අනුසෙති, තස්ස දිට්ඨානුසයො අනුසෙතීති, ද්වින්නං පුග්ගලානං කාමරාගානුසයො **අනුසෙති**, නොච තෙසං දිට්ඨානුසයො අනුසෙති, පුථුජ්ජනස්ස – පෙ – යස්සවාපන ''ආමන්තා.''

අනු ලෝමයෙහි **සන්නිට්ඨාන පදයා ගේ ස්වරූපාර්ථ** සෝතා පන්න, සකදාගාමි පුද්ගලයෝ ගනු ලැබෙති ; පෘථග්ජන පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේම ගනු ලැබේ. **ප්‍රතිලෝමයෙහිද** ඉහත සංසය ස්වරූපම ලැබේ. (විචිකිච්ඡානුසය මූලියද දිට්ඨානුසය මූලිය මෙනි. භවරාගානුසය මූලි, අවිජ්ජානුසය මූලියද මානානුසය මූලි භට සමානය ;)

කාමරාගානුසය මූලය නිමි.

---

## පටිඝානුසය මූලය

කාමරාගානුසය මූලය දේශනා කොට වදරා ඉන් අනතුරුව පටිඝානුසය මූලය වදළ සේක. ඒ පටිඝානුසය මූලයෙහිද මානානුසය මූලි යනාදි වශයෙන් පස් වැදෑරුම්, (කාමරාගානුසය මූලය අනුව කියනු) පටිඝානුසය මූලය දේශනා කොට වදරා ඉන් අනතුරුව මානානුසය මූලය වදළ සේක. ඒ මානානුසය මූලයද දිට්ඨානුසය මූලි යනාදි වශයෙන් සිවුවැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් දිට්ඨානුසය මූලය පළමු කොට වදළ සේක. **කෙසේද යත්** – ''යස්ස මානානුසයො අනුසෙති. තස්ස දිට්ඨානුසයො අනුසෙතීති, තිණ්ණං පුග්ගලානං මානානුසයො අනුසෙති, නො ච තෙසං දිට්ඨානුසයො අනුසෙති. පුථුජ්ජනස්ස, – – යස්සවාපන ආමන්තා.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – සෝතාපන්න, සකදගාමි, අනාගාමි පුද්ගලයෝ ගනු ලැබෙති. පෘථග්ජන පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේම ලැබේ. **ප්‍රතිලෝමයෙහිද** ඉහත සංසය ස්වරූපම ලැබේ. (විචිකිච්ඡානුසය මූලියද මේ ක්‍රමයට සමානය) භවරාගානුසය, අවිජ්ජානුසයටද ආමන්තා, පෘථග්ජන, සෝතාපන්න, සකදගාමි, අනාගාමි පුද්ගලයෝ ගනු ලැබෙති.

මානානුසය මූලය දේශනා කොට වදරා ඉන් අනතුරුව **දිට්ඨානුසය** මූලය වදළ සේක. ඒ දිට්ඨානුසය මූලයද විචිකිච්ඡානුසය මූලී යනාදී වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් විචිකිච්ඡානුසය මූලිය පළමු කොට වදළ සේක. **කෙසේද යත්**, ''යස්ස දිට්ඨානුසයො අනුසෙති, තස්ස විචිකිච්ඡානුසයො අනුසෙතිති, ආමන්තා ; යසස්වා පන ආමන්තා.'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**– පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති.

ඉන් අනතුරුව භවරාගානුසය මූලිය වදළ සේක. **කෙසේ වදළ සේක්ද යත්** –'' ''යස්ස දිට්ඨානුසයො අනුසෙති, තස්ස භවරාගානුසයො අනුසෙතිති, ආමන්තා, **යස්ස වා පන** – ''තිණ්ණං පුග්ගලානං – පුථුජ්ජනස්ස.'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝතාපන්න, සකදාගාමි, අනාගාමි පුද්ගලයෝ ගනු ලැබෙති, පෘථග්ජන පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේම ලැබේ. (අවිජ්ජානුසය ද මේ ක්‍රමයට සමානය, විචිකිච්ඡානුසය මූලය ද දිට්ඨානුසය මූලය මෙනි.)

ඉන් අනතුරුව භවරාගානුසය මූලය වදළ සේක. ඒ භවරාගානුසය මූලයෙහි ද අවිජ්ජානුසය මූලී වශයෙන් එකක්ම ඇත්තේය. අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. **කෙසේද යත්** – ''යස්ස භවරාගානුසයො අනුසෙති. තස්ස අවිජ්ජානුසයො අනුසෙතිති, ආමන්තා, **යස්සවා පන** ආමන්තා, අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි, අනාගාමි පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසයද** එසේම ලැබේ.

ඒක මූලය නිමි.

## ද්වි මූලය

ඒක මූලය දේශනා කොට වදරා ඉන් අනතුරුව ද්විමූලය වදළ සේක. ඒ ද්විමූලය ද මානානුසය මූලී යනාදී වශයෙන් පස් වැදෑරුම් වන්නේය, ඒ පස අතුරෙන් මානානුසය මූලිය පළමු කොට වදළ සේක. **කෙසේද යත්** (ඒක මූලය මෙනි, වෙනසක් නැත. මූලි වාර පස අවසානය තෙක් කියනු).

ද්වි මූලය නිමි.

## ත්‍රි මූලය

ද්වි මූලය දේශනා කොට වදාරා ඉන් අනතුරුව තිමූලය වදළ සේක. ඒ තිමූලයද, දිට්ඨානුසය මූලී යනාදී වශයෙන් සිවු වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන්, දිට්ඨානුසය මූලී පළමු කොට වදළ සේක. **කෙසේද යත්** ''යස්ස කාමරාගානුසයොච

**පටිඝානුසයො ච මානානුසයො ච අනුසෙන්ති, තස්ස දිට්ඨානුසයො අනුසෙති, ති ද්වින්නං පුග්ගලානං කාමරාගානුසයො ච පටිඝානුසයො ච මානානුසයො ච අනුසෙන්ති නො ච තෙසං දිට්ඨානුසයො අනුසෙති, පුථුජ්ජනස්ස කාමරාගානුසයොච පටිඝානුසයො ච මානානුසයොච අනුසෙන්ති, දිට්ඨානුසයොච අනුසෙති. යස්සවා පන – ආමන්තා.''**

අනුලෝම යෙහි සන්නිට්ඨාන **පදයාගේ ස්වරූපාර්ථය**–සෝතාපන්න, සකදගාමි පුද්ගලයෝ ගනු ලැබෙති. පෘථග්ජන පුද්ගලයාද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේම ලැබේ. (**විචිකිච්ඡානුසය** මූලියද මීට සමානය) කාමරාගානුසය මූලියෙහි – අනුලෝම – ආමන්තා, **ප්‍රතිලෝම**යෙහි ''අනාගාමිස්ස භවරාගානුසයො ච මානානුසයො ච අනුසෙන්ති, නොච තස්ස කාමරාගානුසයොච පටිඝානුසයොච අනුසෙන්ති, **තිණ්ණං** පුග්ගලානං භවරාගානුසයොච අනුසෙති, කාම – පටිඝ – අනුසෙන්ති, යස්ස වාපන'' භවරාගානුසයොච මානානුසයො ච අනුසෙන්ති, යන සන්නිට්ඨාන සංසය **පද එක දේශයක ස්වරූපාර්ථ** – අනාගාමි පුද්ගලයෝ ගනු ලැබෙති. පෘථග්ජන සෝතාපන්න, සකදාගාමි පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේම ගනු ලැබේ.

## කොටස් බෙද දක්වීම

එසේ ලැබෙන බැවින් යම් කෙනෙකුට භවරාගානුසය උපදිද, ඒ භවරාගානුසය උපදින පුද්ගලයාට කාමරාගානුසය, පටිඝානුසය, මානානුසය උපදින්දැයි, සර්වඥයන් වහන්සේට විමතියක් නැත්තේ නමුත්, වේනෙයාාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න පඤ්චකය අතුරෙන් පුරේ පඤ්හ පච්ඡාපඤ්හ යන දෙකේ ලක්ෂණයෙන් පිරිපුන් කොට පරිපූර්ණ ප්‍රශ්නයාගේ වශයෙන්, අසන ලද ප්‍රශ්නයට අනුරූපව, සන්නිට්ඨාන සංසය පද ඒක දේශයකගේ ස්වරූපාර්ථ ගෙන සංසය පදයේ සම්පූර්ණ ස්වරූප නොවන අනාගාමි පුද්ගලයා ගන්නා ලදී. ''අනාගාමිස්ස භවරාගානුසයොච, මානානුසයො ච අනුසෙන්ති, නොච තස්ස කාමරාගානුසයො ච පටිඝානුසයොච අනුසෙන්ති, යි පුරිම කොටස් ඇතුලත් කොට සංසය පද ඒකදේශයකගේ ස්වරූප **ප්‍රතිෂේධ** කොට, සන්නිට්ඨාන - සංසය දෙපදයේම පූර්ණ ස්වරූපය වන, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි යන පුද්ගලයන් ''**තිණ්ණං** පුග්ගලානං භවරාගානුසයොච අනුසෙති, කාමරාගානුසයොච පටිඝානුසයොච මානානුසයොච අනුසෙන්ති''යි පශ්චිම කොට්ඨාශය ගෙන සංසය පදය **ප්‍රතිෂේධ** නොකොට විසඳුම් පස අතුරෙන් පූර්ව – පශ්චිම කොටස් දෙකේ ස්වරූප දක්වූ ආකාරයෙන් ස්වරූප දර්ශන විස්සර්ජනා වශයෙන් පිළිතුරු දෙන ලදී. (අවිජ්ජානුසය මූලියත් මීට සමානය.)

තිමූලය නිමි

## චතු මූලය

ත්‍රි මූලය දේශනා කොට වදරා ඉන් අනතුරුව චතුමූලය වදළ සේක. ඒ චතු මූලය ද විචිකිච්ඡානුසය මූලී යනාදී වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් විචිකිච්ඡානුසය මූලී පළමු කොට වදළ සේක. **කෙණස්ද යත්** ''ආමන්තා'' **යස්සවා පන** ආමන්තා.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය ස්වරූපද** එසේමය, ප්‍රතිලෝමයද එසේය. (දිට්ඨානුසයට අනුව පෘථග්ජනයාම ගනු ලැබේ.) භවරාගානුසය මූලියෙහි අනුලෝමය ආමන්තා; ප්‍රතිලෝමයෙහි, ''අනාගාමිස්ස භවරාගානුසයොච මානානුසයො ච අනුසෙන්ති, නොච තස්ස කාමරාගානුසයොච පටිඝානුසායොච දිට්ඨානුසයොච අනුසෙන්ති, ද්වින්නං පුග්ගලානං භවරාගානුසයො ච කාමරාගානුසයො ච පටිඝානුසයොච මානානුසයොච අනුසෙන්ති, නොච තෙසං දිට්ඨානුසයො අනුසෙති, පුථුජ්ජනස්ස භවරාගානුසයොච අනුසෙති, කාමරාගානුසයොච -පෙ- අනුසෙන්ති.''

ප්‍රතිලෝමයෙහි – භවරාගානුසයොච – මානානුසයොච අනුසෙන්ති, යන සන්නිට්ඨාන පද ඒකදේශයෙහි ස්වරූපාර්ථ, අනාගාමි ඵලසථයෝ ගනු ලැබෙති. භවරාගානුසයො ච, කාමරාගානුසයො ච පටිඝානුසයො ච මානානුසයො ච අනුසෙන්ති, යන සන්නිට්ඨාන සංසය පද ඒක දේශයෙහි ස්වරූපාර්ථ, සෝතාපන්න, සකදගාමි පුද්ගලයෝ ගනු ලැබෙති. පෘථග්ජන පුද්ගලයාද ගනු ලැබේ. සංසය ස්වරූප පෙර සේම ලැබේ. (කොට්ඨාශ බෙද දැකවීම පෙර සේමය.)

පඨම, දුතිය, තතිය වාරයන් පෙරසේ කියනු, අවිජ්ජාව සම්බන්ධ කොටද මෙසේමය. චතුමූලය නිමි, චතු මූලය දේශනා කොට වදරා ඉන් අනතුරුව පඤ්චමූලය වදළ සේක. (චතු මූලය අනුව පඤ්ච මූල ඡමූල ද සමානයි).

පුද්ගල වාරය නිමි

---

## ඕකාස වාරය

## ඒක මූලය

පුද්ගල වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ඕකාස වාරය වදළ සේක. ඒ ඕකාස වාරයද ඒකමූල, ද්විමූල – පෙ – ඡ මූලාදී වශයෙන් සැවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් ඒකමූලය පළමු කොට වදළ සේක. (පද බෙදීම පුද්ගල වාරයට අනුව කියනු).

''**යත්ථ** කාමරාගා නුසයො අනුසෙති, තත්ථ පටිඝානුසයො අනුසෙතීති, නො; **යත්ථ වා පන** නො: අනුලෝමයෙහි **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ, කාමධාතුවෙහි වේදනාද්වය ගනු ලැබේ.

## කොටස් බෙද දක්වීම

ඒ කාමධතු වේදනා ද්වය කාමරාගානුසයාගේ අනුසයනය වන **ස්ථානය වූයේ වේ**, **පටිඝානුසයේ** අනුසයනය වන **ස්ථාන වූයේ** නොවෙයි. එහෙයින් ''තත්ථ පටිඝානුසයො අනුසෙති'' යන සංසය පදයාගේ **අර්ථ** නො ලැබේ. (කොටස් වනාහි පෙරසේ බෙද කියනු) ''යත්ථ වා පන පටිඝානුසයො අනුසෙති'' යන **ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ** දුක්ඛවේදනා තුන ගනු ලැබෙති. (පෙර සේ කියනු) **මානානුසය මූලියෙහි** අනුලෝම, ආමන්තා, ප්‍රතිලොමයෙහි ''රූපධාතුයා අරූප ධාතුයා එත්ථ මානානුසයො අනුසෙති,–පෙ– කාමධාතුයා ද්විසු වෙදනාසු එත්ථ.'' **ප්‍රතිලෝමයෙහි** රූපධාතු – අරූපධාතු ගනු ලැබෙති. කාමධාතු–වේදනාද්වයද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේ ගනු ලැබේ. **දිට්ඨානුසය මූලියෙහි**, අනුලෝමයෙහි – ආමන්තා; ප්‍රතිලෝමයෙහි, ''දුක්ඛාය වෙදනාය, රූප ධාතුයා අරූපධාතුයා එත්ථ, කාමධාතු ද්විසු වෙදනාසු එත්ථ.'' **ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, දුක්ඛ වේදනාව, රූපධාතු, අරූපධාතු ගනු ලැබෙති. කාමධාතු වේදනාද්වයද ගනු ලැබේ. (භවරාගානුසය **මූලියෙහි** අනුලෝම – **ප්‍රතිලෝම** දෙකම **ප්‍රතිෂේධයි**, **අවිජ්ජානුසය මූලිය** ද දිට්ඨානුසය **මූලි** මෙනි.)

කාම රාගානුසය මූලය නිමි

---

**පටිඝානුසය මූලයෙහි** ''**යත්ථ** පටිඝානුසයො අනුසෙති, තත්ථ මානානුසයො අනුසෙතීති, නො, **යත්ථ වා පන** නො.'' අනුලෝමයෙහි **දුක්ඛ** වේදනාව ලැබේ. **ප්‍රතිලෝමයෙහි** කාමධාතු වේදනාද්වය, රූප ධාතු අරූප ධාතු ගනු ලැබෙති. **දිට්ඨානුසය මූලියෙහි** – අනුලෝම – ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''කාම ධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා එත්ථ, දුක්ඛාය වෙදනාය එත්ථ.'' (පෙළහි ඇති ක්‍රමයට කියනු, විචිකිච්ඡානුසය **මූලියද** මෙයට සමානය, භවරාගානුසය **මූලියෙහි ප්‍රතිෂේධයි**, **අවිජ්ජානුසය මූලියෙහි** දිට්ඨානුසය මූලි මෙනි. පටිඝානුසය මූලය නිමි.

**මානානුසය මූල දිට්ඨානුසය මූලියෙහි**, අනුලෝම–ආමන්තා ; ප්‍රතිලෝමයෙහි, ''දුක්ඛාය වෙදනාය **එත්ථ**, කාමධාතුයා ද්විසු **වෙදනාසු**, රූපධාතුයා, අරූපධාතුයා එත්ථ.'' (විචිකිච්ඡාවද සමානයි) **භවරාගානුසය මූලියෙහි** ''කාම ධාතුයා ද්විසු වෙදනාසු එත්ථ, රූපධාතුයා අරූපධාතුයා එත්ථ.'' (අවිජ්ජානුසය **මූලිය** ද, **දිට්ඨානු**සය **මූලිය** මෙනි). මානානුසය **මූලය** නිමි.

**දිට්ඨානුසය** මූල විචිකිච්ඡානුසය මූලියෙහි, ආමන්තා ; ධාතු තුන, හා වේදනා තුන ගනු ලැබෙති, **භවරාගානුසය මූලියෙහි** ''කාමධාතුයා **තිසු** වෙදනාසු එත්ථ, රූපධාතුයා අරූප ධාතුයා එත්ථ.'' **අවිජ්ජානුසය** – **මූලියෙහි** – ආමන්තා, දිට්ඨානුසය මූලය නිමි. (විචිකිච්ඡානුසය මූලිය සමානයි) **භාරාගනුසය මූල අවිජ්ජානුසයමූලියෙහි** අනුලෝම – ආමන්තා, **ප්‍රතිලෝමයෙහි** ''කාම ධාතුයා **තිසු** වෙදනාසු එත්ථ, රූප ධාතුයා අරූප ධාතුයා එත්ථ''.

ඒක මූලය නිමි

---

## ද්විමූලය

''**යත්ථ** කාමරාගානුසයොච පටිඝානුසයොච අනුසෙන්ති, තත්ථ මානානුසයො අනුසෙතීති, නත්ථි, **යත්ථ වා** පන මානානුසයො අනුසෙති, –පෙ–රූපධාතුයා අරූප–ධාතුයා එත්ථ, කාම ධාතුයා ද්විසු වෙදනාසු එත්ථ, මානානුසයොච කාමාරාගානුස–යොච අනුසෙන්ති, නොච තත්ථ පටිඝානුසයො අනුසෙති.'' **ප්‍රතිලෝමයෙහි** ''මානානුසයො අනුසෙති'' යන **සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ** – රූපධාතු අරූප ධාතු ගනු ලැබෙති. ''මානානුසයොච කාමරාගානුසයොච අනුසෙන්ති'' යන **සන්නිට්ඨාන සංසය පද ඒක දෙශයෙහි ස්වරූපාර්ථ** – කාම ධාතු වේදනාද්වය ගනු ලැබේ. (සංසය පදයාගේ ස්වරූප නොමැත.)

### කොටස් බෙදීම

එසේ සන්නිට්ඨාන සංසය ඒකදේශය, පමණක් ස්වරූප උද්ධරා සංසය පදයාගේ ස්වරූප නොදැක්වූ බැවින්, යම තැනක මානානුසය උපදිද, ඒ මානානුසය උපදින තැන කාමරාගානුසය පටිඝානුසය උපදින්දැයි සර්වඥයන් වහන්සේට විමතියක් නැති නමුත්, වේනෙයාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති (14) සතර අතුරෙන් මෝඝ ප්‍රශ්නයාගේ වශයෙන් ප්‍රශ්නයට අනුරූපව, මානානුසය උපදින තැන, කාමරාගා නුසය, පටිඝානුසය නූපදින්නාවූ ම බැවින් ''නො'' යන ප්‍රතිෂේධ විස්සර්ජනාවෙන් පිළිතුරු වදළහ.

හෙවත් ප්‍රශ්න ජාති (4) සතර අතුරෙන්, පූර්ව ප්‍රශ්න, පශ්චාත් ප්‍රශ්න දෙකේ ලක්ෂණයෙන් පිරිපුන් වූ පරිපූර්ණ ප්‍රශ්න වශයෙන් ප්‍රශ්නයට අනුරූපව, සන්නිට්ඨාන පදයාගේ ස්වරූප ඇතිව සංසය පදයාගේ ස්වරූප නොමැතිව, රූප ධාතු අරූප ධාතූන් ''රූප ධාතුයා අරූප ධාතුයා එත්ථ මානානුසයො අනුසෙති, නොච තත්ථ කාමරාගානු–සයොච පටිඝානුසයොච අනුසෙන්ති.'' යි පූර්ව කොට්ඨාශය වෙන් කොට බෙදූ, සංසය ප්‍රතිෂේධ කොට, සන්නිට්ඨාන සංසය පද ඒක දේශයක ස්වරූප පමණක් ගෙන, සංසය පදයාගේ ස්වරූප නොමැති බැවින් කාමධාතුවෙහි වේදනාද්වය, ''කාම ධාතුයා ද්විසු වෙදනාසු එත්ථ මානානුසයො ච කාමරාගානුසයොච අනුසෙන්ති,

නොච තත්ථ පටිඝානුසයො අනුසෙති''යි පූර්ව කොට්ඨාශය වෙන් කොට බෙද ගෙන, සංසය පද ඒකදේශයක **ස්වරූප ප්‍රතිෂේධ** කොට විසඳුම් පස අතුරෙන්, පූර්ව කොට්ඨාශ, පශ්චිම කොට්ඨාශ දෙකෙහි ස්වරූප දක්වීම වශයෙන් **ස්වරූප දර්ශන විස්සර්ජනාවෙන් පිළිතුරු** වදරණ ලදහ.

**දිට්ඨානුසය මූලියෙහි** අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි රූප ධාතුයා, අරූප ධාතුයා එත්ථ දිට්ඨානුසයො අනුසෙති, නොච තත්ථ කාමරාගානුසයො ච පටිඝානුසයොච අනුසෙන්ති ; කාම ධාතුයා ද්විසු වේදනාසු එත්ථ දිට්ඨානුසයො ච කාමාරාගානුසයො ච අනුසෙන්ති, නොච තත්ථ පටිඝානුසයො අනුසෙති, දුක්ඛාය වෙදනාය එත්ථ දිට්ඨානුසයො ච පටිඝානුසයො ච අනුසෙන්ති, නොච තත්ථ කාමරාගානුසයො අනුසෙති, **යත්ථ වා පන.**''

දිට්ඨානුසයො අනුසෙති යන **සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ**–රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. දිට්ඨානුසයො ච කාමරාගානුසයොච අනුසෙන්ති, යන **සන්නිට්ඨාන සංසය ඒක දේශ ස්වරූපාර්ථ** කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති. **දිට්ඨානුසයො ච පටිඝානුසයො ච අනුසෙන්ති** යන **සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** දුක්ඛ වේදනාව ගනු ලැබේ.

(සංසය පදයාගේ ස්වරූපාර්ථ නොමැත, එහෙත් සන්නිට්ඨාන සංසය පද ඒක දේශයෙහි ස්වරූප ඇතිව සංසය පදයාගේ ස්වරූප නොමැති වන බැවින් ; පෙර සේ කියනු) විචිකිච්ඡාවද මෙ සමානය, (**භවරාගානුසය මූලියෙහි** අනුලෝම – නත්ථි **ප්‍රතිලෝමයෙහි** ''නො'' අවිජ්ජානු සය මූලියද දිට්ඨානුසය හා සමානය.)

ද්විමූලය නිමි

## ති මූලය

**තිමූල දිට්ඨානුසය මූලියෙහි**, අනුලෝම – නත්ථි ; **ප්‍රතිලෝමයෙහි**, ද්විමූලයට මෙන් **ප්‍රතිලෝම** තුන **කියන්න**. **භවරාගානුසය මූලියෙහි** – අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි ''මානානුසයො අනුසෙති'' **ප්‍රති**ලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**-රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. මානානුසයො අනුසෙති යන **සංසය පද ඒක දේශයෙහි ස්වරූපාර්ථ** ද එම රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. (සංසය පදයාගේ ස්වරූප කිසිත් නැත. **ප්‍රතිෂේධයි**, හෙවත් ප්‍රතිවචනයි අවිජ්ජානුසය මූලියෙහිද **ප්‍රතිලෝම** තුන **කියනු**.)

තිමූලය නිමි

## චතුමූල පඤ්චමූල

**චතුමූල විචිකිච්ඡානුසය මූලියෙහි**, ත්‍රි රාශිය කියන්න. **භවරාගානුසය මූලි** ප්‍රතිලෝම යෙහි ''මානානුසයො ච දිට්ඨානුසයොච අනුසෙන්ති. (ත්‍රිමූලය මෙනි) **අවිජ්ජානුසය මූලියෙහිද** ප්‍රතිලෝම ත්‍රිරාශිය කියනු, චතුමූලය නිමි, පඤ්චමූලයද චතුමූලය මෙනි.

## ෂමූලය

**ෂමූල අවිජ්ජානුසය මූලියෙහි** අනුලෝම – නත්ථි, **ප්‍රතිලෝමයෙහි** ''රූපධාතුයා අරූපධාතුයා එත්ථ අවිජ්ජානුසයොච මානානුසයො ච දිට්ඨානුසයො ච විචිකිච්ඡානුසයො ච භවරාගානුසයො ච අනුසෙන්ති, නොච තත්ථ කාමරාගානුසයොච පටිඝානුසයොච අනුසෙන්ති, කාමධාතුයා ද්විසු වෙදනාසු එත්ථ, දුක්ඛාය වෙදනාය **එත්ථ**'', (යට දැක්වූ ක්‍රමය අනුව ස්වරූප උදුරනු).

ඔකාස වාරය නිමි

## පුද්ගලෝකාස වාරය

## ඒකමූලය

**පුද්ගලෝකාස වාරයෙහි** (පුද්ගල වාරය අනුව මූලමූලි චක්‍ර බඳිනු) **යස්ස යත්ථ** කාමරාගානුසයො අනුසෙති, **තස්ස** තත්ථ පටිඝානුසයො අනුසෙතිති, නො, **යස්සවා පන යත්ථ** – නො.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි, පුද්ගලයන්ගෙ කාමධාතු **වේදනාද්වය** ගනු ලැබේ. (සංසය පදයාගේ ස්වරූප නොමැත.) **ප්‍රතිලෝමයෙහි** සන්නිට්ඨාන ස්වරූප අර්ථ, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. (සංසය පදයාගේ ස්වරූප නොමැත.)

### කාමමූල මාන මූලි

''**යස්ස යත්ථ** කාමරාගානුසයො අනුසෙති, **තස්ස** තත්ථ මානානුසයො අනුසෙතීති, ආමන්තා, **යස්සවා** පන යත්ථ, අනාගාමිස්ස කාමධාතුයා **ද්විසු** වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ මානානුසයො **අනුසෙති**, නොච **තස්ස** තත්ථ කාමරාගානුසයො **අනුසෙති**, **තිණ්ණං** පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ'',

**ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අනාගාමී පුද්ගලයන් ගේ කාමධාතු වේදනා ද්වය, රූපධාතු අරූපධාතු, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන් ගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙති, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වයද ගනු ලැබේ. සංසය ස්වරූප පෙර සේම ලැබේ.

## කොටස් බෙදදීම

එසේ ලැබෙන බැවින්- - - සන්නිට්ඨාන පදයාගේ ම ස්වරූපාර්ථ ගෙන, සංසය පදයාගේ ස්වරූපාර්ථ නොලැබෙන අනාගාමී පුද්ගලයන්ගේ කාම ධාතු වේදනා ද්වයය ; රූපධාතු අරූපධාතු අරමුණු කොට ''අනාගාමිස්ස කාමධාතුයා ද්වීසු වෙදනාසු රූප ධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ'' යි ප්‍රථම කොට්ඨාශය වෙන් කොට දක්වා, සංසය පදයාගේ **ස්වරූප ප්‍රතිෂේධ** කොට, සන්නිට්ඨාන පදයාගේම **ස්වරූප** ගෙන, සංසය පදයාගේ ස්වරූප නො ගෙන, පෘථග්ජන, සෝතා පන්න, සකදාගාමී, පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු අරමුණු කොට, ''**තිණ්ණං** පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ - පෙ - කාමරාගානුසයො අනුසෙති''යි දෙවැනි කොටස වෙන්කොට ; සංසය **ප්‍රතිෂේධ** කොට ; සන්නිට්ඨාන සංසය දෙපදයාගේ ස්වරූප වන පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ගෙන'' තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්වීසු වෙදනාසු තෙසං තත්ථ - - පෙ - අනුසෙන්ති'' යි තෙවැනි කොටස වෙන් කොට ගෙන, විසඳුම් පස අතුරෙන් ප්‍රථම ද්විතීය, තෘතීය කොට්ඨාශයන්ගේ ස්වරූප දැක්වීම් වශයෙන් **ස්වරූප** දර්ශන විස්සර්ජනා වශයෙන් පිළිතුරු වදළහ.

**දිට්ඨානුසය මූලි අනුලෝමයෙහි** ''ද්වින්නං පුග්ගලානං කාමධාතුයා ද්වීසු වෙදනාසු තෙසං තත්ථ, **පුථුජ්ජනස්ස** කාමධාතුයා ද්වීසු වෙදනාසු **තස්ස** තත්ථ, **යස්සවා** පන යත්ථ, **පුථුජ්ජනස්ස** දුක්ඛාය වෙදනාය, රූපධාතුයා, අරූප ධාතුයා **තස්ස** තත්ථ, - පෙ - තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්වීසු වෙදනාසු තස්ස තත්ථ, (විචිකිච්ඡා මූලියද මෙසේය. ස්වරූප සුගමයි.) **භවරාගානුසය මූලි - ප්‍රතිෂේධයි අවිජ්ජානුසය** මූලියෙහි - අනුලෝමය - ආමන්තා ; **ප්‍රතිලෝමයෙහි**, ''අනාගාමිස්ස කාමධාතුයා **තීසු** වෙදනාසු, රූපධාතුයා, අරූපධාතුයා, තස්ස තත්ථ ; **තිණ්ණං** පුග්ගලානං **දුක්ඛාය** වෙදනාය රූපධාතුයා, අරූප ධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්වීසු වෙදනාසු තෙසං තත්ථ,'' (මානානුසය, ආශ්‍රය කොට **ස්වරූප** හා කොටස් බෙද කියනු.)

කාමරාගානුසය මූලය නිමි.

---

**පටිඝානුසය** මූල මානානුසය මූලියෙහි, ප්‍රතිෂේධ මැයි, **දිට්ඨානුසය** මූල අනුලෝමයෙහි ''ද්වින්නං පුග්ගලානං **දුක්ඛාය** වෙදනාය තෙසං තත්ථ, පුථුජ්ජ-නස්ස දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ, **යස්සවාපන යත්ථ** - පුථුජ්ජනස්ස

කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ.'' (පෙළෙහි ආ පරිදි උදුරනු, විචිකිච්ඡා මූලියද සමානය).

**භවරාගානුසය මූලියෙහි** – ප්‍රතිෂේධයි, **අවිජ්ජානුසය මූලියෙහි** – අනුලෝම, ආමන්තා ; ප්‍රතිලෝමයෙහි අනාගාමිස්ස කාමධාතුයා තිසු වේදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, **තිණ්ණං** පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ,'' තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වෙදනාය තෙසං තත්ථ,'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ** – අනාගාමී පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු, ත්‍රිවිධ වේදනා, පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය, හා රූපධාතු අරූප ධාතු ගනු ලැබෙති. ඒ පෘථග්ජන සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා (3) තුනද ගනු ලැබෙති, සංසය ස්වරූප පෙර සේ ගනු ලැබේ.

පටිඝානුසය මූලය නිමි.

---

**මානානුසය මූල, දිට්ඨානුසය මූලියෙහි**–**තිණ්ණං** පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා, අරූපධාතුයා තෙසං තත්ථ, පුථුජ්ජනස්ස කාම ධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, **යස්සවා, පන යත්ථ**, පුථුජ්ජනස්ස, දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ.''

**අනුලෝම ස්වරූපාර්ථ** · සෝතාපන්න, සකදාගාමී, අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය හා රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. පෘථග්ජන පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය, රූපධාතු, අරූපධාතුවද ගනු ලැබෙති. (ප්‍රතිලෝමය සුගමයි) විචිකිච්ඡානුසය මූලියද මෙයට සමානයි.

**භවරාගානුසය මූලි** අනුලෝමයෙහි චතුන්නං පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, **යස්සවා පන යත්ථ** ආමන්තා.'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී, අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ගනු ලැබේ. ඒ පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී, අනාගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතුවද ගනු ලැබේ. සංසය සවරූප පෙරසේමය, **අවිජ්ජානුසය මූලියෙහි**-අනුලෝම ආමන්තා ; ප්‍රතිලෝමයෙහි ''චතුන්නං පුග්ගලානං දුක්ඛාය වෙදනාය තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාම ධාතුයා ද්විසු වෙදනාසු රූපධාතුයා, අරූප ධාතුයා තෙසං තත්ථ'', (ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූප සුගමයි.)

මානානුසය මූලය නිමි

---

**දිට්ඨානුසය මූල විචිකිච්ඡානුසයමූලියෙහි** – ආමන්තා ; පෘථග්ජන පුද්ගලයන් ගේ ත්‍රිවිධ ධාතුව, ත්‍රිවිධ වේදනාව ගනු ලැබේ. **භවරාගානුසය මූලියෙහි,** "පුථුජ්ජනස්ස කාමධාතුයා **තිසු** වෙදනාසු තස්ස තත්ථ, **තස්සෙව** පුග්ගලස්ස රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, **යස්ස වා** පන යත්ථ **තිණ්ණං** පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ, පුථුජ්ජනස්ස රූපධාතුයා අරූප ධාතුයා, තස්ය තත්ථ", (සවරූපාර්ථ සුගමය.)

**අවිජ්ජානුසය මූලියෙහි** – අනු ලෝමය, ආමන්තා ; **ප්‍රතිලෝමයෙහි** "තිණ්ණං පුග්ගලානං කාමධාතුයා තිසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, පුථුජ්ජනස්ස කාම ධාතුයා තිසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, (සවරූපාර්ථ සුගමයි.)

දිට්ඨානුසය මූලය නිමි

---

(විචිකිච්ඡානුසය මූලයද මෙයට සමානයි) **භවරාගානුසය මූල - අවිජ්ජානුසය මූලියෙහි,** අනුලෝමය – ආමන්තා ; **ප්‍රතිලෝමයෙහි** "චතුන්නං පුග්ගලානං" කාමධාතුයා **තිසු** වේදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ. (සුගමයි).

ඒකමූලය නිමි

---

## ද්විමූලය

ඒකමූලය දේශනා කොට වදරා ඉන් අනතුරුව **ද්විමූලය** වදළ සේක, "**යස්ස** යත්ථ කාමරාගානුසයොච පටිඝානුසයොච අනුසෙන්ති, තස්ස තත්ථ මානානුසයො අනුසෙතීති, නත්ථි, යස්සවාපන යත්ථ මානානුසයො අනුසෙති, **තස්ස** තත්ථ කාමරාගානුසයො ච පටිඝානුසයොච අනුසෙන්තීති, අනාගාමිස්ස කාමධාතුයා ද්වීසු වේදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, **තිණ්ණං** පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්වීසු වෙදනාසු තෙසං තත්ථ මානානුසයොච කාමරාගානුසයොච අනුසෙන්ති, නොච තෙසං තත්ථ පටිඝානුසයො අනුසෙති.".

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ,** අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වයෙහි, රූපධාතු අරූපධාතු, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ රූපධාතු – අරූපධාතු ගනු ලැබෙති, "මානානුසයොච කාමරාගානුසයොච අනුසෙන්ති" යන **සන්නිට්ඨාන** සංසය පද **ඒකදේශයාග් ස්වරූපාර්ථ** ඒ පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ කාමධාතුවෙහි වේදනාද්වය ගනු ලැබේ. (සංසය පදයාගේ සවරූප නොමැත.)

## කොටස් බෙදීම

එසේ සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ සවරූපාර්ථ ඇතිව සංසය පදයාගේ සවරූපම නැති බැවින්, යම් පුද්ගලයෙකුට යම් තැනක මානානුසය අනුසයනය වේද, ඒ මානානුසය අනුසයනය වන පුද්ගලයාට මානානුසය අනුසයනය වන තැන්හි කාමරාගානුසය පටිඝානුසය අනුසයනය වෙත් දැයි සර්වඥයන් වහන්සේට විමතියක් නැත. එහෙත් වෙනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න සතර අතුරෙන් පුරේපඤ්හා – පච්ඡාපඤ්හා දෙකෙහි ලක්ෂණ සමහ පිරිපුන් **පරිපුණ්ණ පඤ්හා** වශයෙන් ප්‍රශ්නයට අනුරූපව සන්නිට්ඨාන පදයාගේ සවරූපම ඇතිව, සංසය පදයාගේ සවරූප නොමැතිව,

අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වයය, රූපධාතු, අරූපධාතු අරමුණු කොට, ''අනාගාමිස්ස කාමධාතුයා ද්වීසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, – පෙ – අනුසෙන්ති'' යි පළමු කොටස බෙද වෙන් කොට ; සංසය පදයාගේ සවරූපාර්ථ **ප්‍රතිෂේධ** කොට සංසය පදයාගේ සවරූප නැති බැවින්, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු ගෙන ''**තිණ්ණං** පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ – පෙ – අනුසෙන්ති' යි දෙවැනි කොටස බෙද වෙන් කොට ; සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ සවරූපාර්ථම ඇතිව, සංසය පදයාගේ සවරූපාර්ථම නොමැතිව, ඒ පෘථග්ජන සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ගෙන ''තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ – පෙ – පටිඝානුසයො අනුසෙති'' යි තෙවැනි කොටස බෙද වෙන් කොට විසඳුම් පස අතුරෙන් **ප්‍රථම ද්විතීය–තෘතීය** කොට්ඨාශ තුනෙහි සවරූප **දැක්වීම්** වශයෙන් **ස්වරූප දර්ශන විස්සර්ජනා වශයෙන්** පිළිතුරු වදළහ.

**නොහොත් ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී, අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය, හා රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. (සංසය පදයාගේ සවරූපාර්ථම නොමැත.)

## කොටස් බෙද දැක්වීම

එසේ සන්නිට්ඨාන පදයාගේ සවරූපම ඇතිව, සංසය පදයාගේ සවරූප නොමැති බැවින් යම් පුද්ගලයෙකුට යම් තැනකදී මානානුසය උපදී, ඒ මානානුසය උපදින පුද්ගලයන්ට මානානුසය උපදින තැනදී කාමරාගානුසය පටිඝානුසය යන දෙක උපදිත්දැයි සර්වඥයන් වහන්සේට විමතියක් නැත්තේය, එහෙත් වේනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න නංවා ප්‍රශ්න සතර අතුරෙන් **මෝඝ ප්‍රශ්නයාගේ** වශයෙන් කරන ලද ප්‍රශ්නයට අනුරූපව මානානුසය උපදින පුද්ගලයන්ට මානානුසය

උපදින ස්ථානයේදී කාමරාගානුසය පටිඝානුසය දෙක නොම උපදින බැවින් සංසය පද ඒකදේශයාගේ ස්වරූප ප්‍රතික්ෂේප කරමින් ''නො'' යයි ප්‍රතිෂේධ විස්සර්ජනා වෙන් පිළිතුරු වදළහ.

**දිට්ඨානුසය මූලියෙහි** – අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි ''පුථුජ්ජනස්ස රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස කාමාධතුයා ද්වීසු වෙදනාසු තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස දුක්ඛාය වෙදනාය තස්ය තත්ථ,'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ – පෘථග්ජන පුද්ගලයාගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙති.

''දිට්ඨානුසයො ච කාමරාගානුසයොච අනුසෙන්ති'' යන **සන්නිට්ඨාන සංසය පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ**– ඒ පෘථග්ජන පුද්ගලයාගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබේ. දිට්ඨානුසයොච පටිඝානුසයොච අනුසෙන්ති'' යන **සන්නිට්ඨාන සංසය පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ** ඒ පෘථග්ජන පුද්ගලයාගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. (සංසය පදයාගේ ස්වරූප නොමැති) එසේ සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ ස්වරූපම ඇතිව සංසය පදයාගේ ස්වරූපම නොමැති බැවින් (මානානුසයට කියන ලද අයුරින් ස්වරූප දර්ශන ප්‍රතිෂේධ නය ක්‍රම දෙක කියනු) විචිකිච්ඡානුසය මූලියද එසේ මැයි.

භවරාගානුසය මූලියෙහි, අනුලෝම ''නත්ථි'' ප්‍රතිලෝම ''නො'' අවිජ්ජා-නුසය මූලියෙහි අනුලෝම ''නත්ථි'', ප්‍රතිලෝමයෙහි ''අනාගාමිස්ස කාමධාතුයා තිසු වේදනාසු, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, තිණ්ණං පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වෙදනාය තෙසං තත්ථ.''

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**– අනාගාමී පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු ත්‍රිවිධ වේදනා ; පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූප ධාතු ගනු ලැබෙති ; අවිජ්ජානුසයොච කාමරාගානුසයො ච අනුසෙන්ති – යන **සන්නිට්ඨාන සංසය ඒක දේශයාගේ ස්වරූපාර්ථ**, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබේ ; අවිජ්ජානුසයො ච පටිඝානුසයො ච අනුසෙන්ති' යන **සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ**. ඒ පෘථග්ජන සෝතාපන්න සකදාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ලැබෙති, (සංසය පදයාගේ ස්වරූප නොමැත) කොටස් බෙදීම මානානුසය මූලි මෙන් කියනු.

**ද්වි මූලය නිමි**

## තිමූලය

**යස්ස යත්ථ** කාමරාගානුසයො ච පටිඝානුසයො ච මානානුසයො ච අනුසෙන්ති, තස්ස තත්ථ දිට්ඨානුසයො අනුසෙතීති, නත්ථි, **යස්ස වාපන යත්ථ**, පුථුජ්ජනස්ස රූපධාතුයා අරූපධාතුයා තසස තත්ථ, තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්වීසු වෙදනාසු තස්ස තත්ථ, තස්සෙ ච පුග්ගලස්ස දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ.''

ප්‍රතිලෝමයෙහි ''දිට්ඨානුසයො ච මානානුසයො ච අනුසෙන්ති'' යන, **සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** – පෘථග්ජන පුද්ගලයාගේ රූප ධාතු අරූප ධාතු ගනු ලැබේ. දිට්ඨානුසයො ච කාමරාගානුසයොච මානානුසයොච අනුසෙන්ති යන **සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ - ඒ** පෘථග්ජන පුද්ගලයන් ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති. ''දිට්ඨානුසයො ච පටිඝානුසයොච අනුසෙන්ති'' යන **සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ ඒ පෘථග්ජන** පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. (සංසය පදයාගේ සවරූප ම නොමැත) කොටස් බෙදීම වනාහි පෙර කියන ලද ක්‍රමයඅනුව කරනු)

හවරාගානුසය මූලියෙහි – අනුලෝම – ''නත්ථි'' ප්‍රතිලෝමයෙහි ''යස්ස වා පන යත්ථ, චතුන්නං පුග්ගලානං රූපාධතුයා අරූප ධාතුයා තෙසං තත්ථ භවරාගානුසයො ච මානානුසයො ච අනුසෙන්ති, ''ප්‍රතිලෝමයෙහි ''භවරාගානුසයො ච මානානුසයො ච අනුසෙන්ති'' යන සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ සවරූපාර්ථ – පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී, අනාගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙති, (සංසය පදයාගේ සවරූපම නොමැති.)

## කොටස් බෙදීම

එසේ සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ සවරූප පමණක් ඇතිව පූර්ණ සංසය පදයාගේ සවරූප නොමැති බැවින්, යම් පුද්ගලයෙකුට යම් ස්ථානයකදී භවරාගානුසය උපදී, ඒ භවරාගානුසය උපදින පුද්ගලයාට භවරාගානුසය උපදින ස්ථානයේදී කාමරාගානුසය, පටිඝානුසය, මානානුසය උපදීත් දැයි සර්වඥයන් වහන්සේට විමතියක් නොමැත, එහෙත් වේනෙයයාධ්‍යාශයාගේ වශයෙන් ප්‍රශ්න නංවා ප්‍රශ්න ජාති සතර අතුරෙන් පශ්චිම කොට්ඨාශයාගේ සවරූපාර්ථ හා සමානවූ පච්ඡා පදෘහයෙන් විචාරන ලද ප්‍රශ්නයට අනුරූපව, භවරාගානුසය උපදින පුද්ගලායට, භවරාගානුසය උපදින අරමුණෙහි මානානුසය පමණක් උපදින බැවින් සන්නිට්ඨාන පදයාගේ සවරූපාර්ථ අනුමත කිරීම වශයෙන් ''මානානුසයො අනුසෙති''යි ප්‍රතිවචන විස්සර්ජනාවෙන් පිළිතුරු වදළහ.

**නො හොත්, ප්‍රතිලෝම** යෙහි සන්නිට්ඨාන **සවරූපාර්ථ**, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී, අනාගාමී, පුද්ගලයන්ගේ රූපධාතු-අරූපධාතු ගනු ලැබෙති. (සංසය පදයාගේ සවරූපම නොමැත) **කොටස්** බෙදීම එසේ-පෙ-කාමරාගානුසය, පටිඝානුසය මානානුසය තුන අනුසයනය නොවන්නාවූම බැවින් සංසය පදයාගේ සවරූපාර්ථ **ප්‍රතික්ෂේප** කිරීමෙන් **ප්‍රතිෂේධ** විස්සර්ජනා වෙන් පිළිතුරු වදළහ.

**අවිජ්ජානුසය මූලියෙහි**- අනුලෝම – නත්ථි ; **ප්‍රතිලෝමයෙහි** ''අනාගාමිස්ස දුක්ඛාය වේදනාය තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස කාම ධාතුයා ද්වීසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, **තිණ්ණං** පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්වීසු වෙදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වේදනාය, තෙසං තත්ථ''.

**ප්‍රතිලෝමයෙහි** සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ – අනාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ඒ අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය රූප ධාතු අරූප ධාතු, පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව හා ත්‍රිවිධ වේදනා ද ගනු ලැබෙති. ''මානානුසයො අනුසෙති'' යන **සංසය පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ** – පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී, අනාගාමී පුද්ගලයන් ගේ කාමධාතු වේදනා ද්වය හා රූපධාතු අරූප ධාතු ගනු ලැබෙති, ''කාමරාගානුසයො අනුසෙති ''යන සංසය පද ඒකදේශයාගේ සවරූපාර්ථ – පෘථග්ජන, සකදාගාමී, පුද්ගලයන් ගේ කාමධාතු වේදනා ද්වය ගනු ලැබේ. ''පටිඝානුසයො අනුසෙති'' යන සංසය පද ඒකදේශයාගේ සවරූපාර්ථ – පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති, (සංසය පදයාගේ සවරූපම නොමැත මෙසේ දිට්ඨානුසය මූලියෙහි මෙන් සුදුසු සේ සවරූප මිශ්‍රකොට උද්ධරනු).

තිමූලය නිමි

# චතුමූලය

**යස්ස යත්ථ** කාමරාගානුසයො ච පටිඝානුසයො ච මානානුසයො ච දිට්ඨානුස-යො ච අනුසෙන්ති, තස්ස තත්ථ විචිකිච්ඡානුසයො අනුසෙති ති, නත්ථි, (ප්‍රතිලෝම-යෙහි තිමූල දිට්ඨානුසය මූලී මෙන් ත්‍රිරාශිය උද්ධරනු) **භවරාගානුසය** මූලියෙහි අනු-ලොම–නත්ථි, පටිලෝමයෙහි ''**තිණ්ණං** පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ භවරාගානුසයොච මානානුසයො ච අනුසෙන්ති, –පෙ– පුථුජ්ජනස්ස රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ.''

ප්‍රතිලෝමයෙහි ''භවරාගානුසයො ච මානානුසයො ච අනුසෙන්ති'' යන සන්නිට්ඨාන සංසය පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ - සෝතාපන්න, සකදගාමී, අනාගාමී, පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. පෘථග්ජන පුද්ගලයන් ගේ රූපධාතු අරූප ධාතුවද ගනු ලැබේ. ''දිට්ඨානුසයො අනුසෙති'' යන සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ පෘථග්ජන පුද්ගලයන්ගේ රූපධාතු අරූප ධාතුව ගනු ලැබේ. (ස්වරූප දර්ශණයයි).

**අවිජ්ජානුසය මූලියෙහි** - අනුලෝම, - නත්ථි ; **ප්‍රතිලෝමයෙහි** ''අනාගාමිස්ස දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, (ද්වින්නං පුග්ගලානං - ත්‍රිරාශිය, පුථුජ්ජනස්ස- ත්‍රිරාශිය ) **ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ** අනාගාමී පුද්ගලයාගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති, ඒ අනාගාමී, පුද්ගලයන්ගේ කාමධාතු වේදනා දෙක, රූපධාතු, අරූපධාතු ; පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී, පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව හා ත්‍රිවිධ වේදනා ද ගනු ලැබෙති. ''මානානුසයො අනුසෙති'' යන **සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී, අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය, හා රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. ''කාමරාගානුසයො අනුසෙති'' යන **සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන් ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති. 'පටිඝානුසයො අනුසෙති'' යන **සංසය පද ඒක දේශකයාගේ** ස්වරූපාර්ථ පෘථග්ජන, සෝතාපන්න- සකදාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ''දිට්ඨානුසයො අනුසෙති යන **සංසය පද ඒක දේශයාගේ** ස්වරූපාර්ථ - පෘථග්ජන පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව හා ත්‍රිවිධ වේදනා ගනු ලැබෙති. (සංසය පදයාගේ අභිධෙයාර්ථ නැත) පෙර සේ කොටස් බෙදනු.

චතුමූලය නිමි. පඤ්ච මූලය ද චතුමූලය මෙනි.

---

# ඡ මූලය

**යස්ස යත්ථ** කාමරාගානුසයො ච පටිඝානුසයො ච මානානුසයො ච දිට්ඨානුසයො ච විචිකිච්ඡානුසයො ච භවරාගානුසයො ච අනුසෙන්ති, තස්ස, තත්ථ, අවිජ්ජානුසයො අනුසෙතීති, නත්ථි, **යස්ස** වාපන **යත්ථ** - අනාගාමිස්ස දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ අවිජ්ජානුසයො අනුසෙති, නො ච තස්ස තත්ථ-කාමාරාගානුසයො ච -පෙ- භවරාගානුසයො ච අනුසෙන්ති,- පෙ-තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු තස්ස තත්ථ. තස්සෙ ච පුග්ගලස්ස රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ.''

(මෙතැන්හි වනාහි ග්‍රන්ථයන්හි රූපධාතු අරූපධාතුව, ඉන්පසු-කාමධාතුයා ද්විසු වෙදනාසු, ඉන්පසු දුක්ඛ වෙදනා, දක්වා ඇත. ආචාර්ය පාදයෝ වනාහි, දුක්ඛ වේදනාව පළමු කොට සවරූප වශයෙන් උදුරා, සන්නිට්ඨාන පද සවරූපඝ ගෙන සවභාවයෙන් ලැබිය හැකි සවරූප ගනිති.)

ද්වින්නං පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වෙදනාය තෙසං තත්ථ, (පෘථග්ජනයාගේ ත්‍රිරාශිය සවරූප උදුරා, සියල්ල පිඩු කොට උදුරනු) ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ** – අනාගාමි පුද්ගලයන් ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙ. ඒ පුද්ගලයන්ගේම කාම ධාතු වෙදනා ද්වය; රූපධාතු අරූපධාතුය, පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ වේදනා තුනද ගනු ලැබෙති.''.

''මානානුසයො අනුසෙති'' යන සංසය **පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ** පෘථග්ජන සෝතාපන්න, සකදාගාමි, අනාගාමි පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය, හා රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. ''තස්ස තත්ථ භවරාගානුසයො අනුසෙති'' යන සංසය **පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි, අනාගාමි පුද්ගලයන්ගේ කාම ධාතු වේදනා ද්වය ගනු ලැබෙති. ''කාමරාගානුසයො අනුසෙති'' යන සංසය පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ පෘථග්ජන – සෝතාපන්න සකදාගාමි පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති. ''පටිඝානුසයො අනුසෙති'' යන **සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ**–පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ''දිට්ඨානුසයො ච විචිකිච්ඡානුසයෝච අනුසෙන්ති'' යන සංසය පද ඒක දෙශයාගේ ස්වරූපාර්ථ – පෘථග්ජන පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව හා ත්‍රිවිධ වේදනා ගනු ලැබෙති. (සම්පූර්ණ සංසය පදයාගේ සවරූප නැත.)

## කොටස් බෙද දැක්වීම

එසේ සන්නිට්ඨාන සංසය පද ඒක දේශයක පමණක් සවරූප ඇතිව සම්පූර්ණ සංසය පදයාගේ සවරූප නො මැති බැවින් යම් ඒ පුද්ගලයෙකුට යම් ඒ ස්ථානයක දී අවිජ්ජානුසය උපදී, ඒ අවිජ්ජානුසය උපදින පුද්ගලයනට අවිජ්ජානුසය උපදින ස්ථානයේ දී කාමරාගානුසය –පෙ– භවරාගානුසය කිම ? උපදින්නාහු දැයි සර්වඥයන් වහන්සේට විමතියක් නැත්තේමය, එහෙත් වේනෙයයාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති (4) සතර අතුරෙන් පුරේපච්ඡා පඤ්හ දෙකෙහි ලක්ෂණයෙන් පිරිපුන් පරිපූර්ණ පඤ්හ වශයෙන්, කරන ලද ප්‍රශ්නයට අනුරූපව, සන්නිට්ඨාන පදයාගේ සවරූපාර්ථ ඇතිව සංසය පදයාගේ ස්වරූපාර්ථ

නොමැතිව අනාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ''අනාගාමිස්ස දුක්ඛාය වේදනාය තස්ස තත්ථ අවිජ්ජානුසයො අනුසෙති'' නොච – පෙ – අනුසෙන්ති'' යි පළමුවැනි කොටස දක්වන ලදී.

සංසය පදයාගේ සවරූප ප්‍රතික්ෂේප කොට, සන්නිට්ඨාන සංසය පද ඒක දේශයක සවරූප පමණක් ගෙන, සම්පූර්ණ සංසය පදයාගේ සවරූප නොමැතිව, කාමධාතු වේදනාද්වයෙහි අවිජ්ජානුසය මානානුසය උපදින අනාගාමී පුද්ගලයා අරමුණු කොට, ''තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්වීසු වේදනාසු -පෙ- අනුසෙන්ති'' යි දෙවැනි කොටස දක්වන ලදී.

සංසය පද ඒක දේශයක සවරූපාර්ථ ප්‍රතිෂේධ කොට, සන්නිට්ඨාන සංසය පද ඒක දේශයක සවරූපාර්ථ ගෙන, සම්පූර්ණ සංසය සවරූපාර්ථ නොමැතිව රූපධාතු අරූප ධාතුවෙහි අවිජ්ජානුසය, මානානුසය, භවරාගානුසය උපදින අනාගාමී පුද්ගලයා අරමුණු කොට, ''තස්සෙව පුද්ගලස්ස රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ අවිජ්ජානුසයො ච, මානානුසයොච භවරාගානුසයො ච අනුසෙන්ති, නො ච – පෙ–අනුසෙන්ති'' යි තෙවැනි කොටස දක්වන ලදී. සංසය පද ඒකදේශයක සවරූපාර්ථ ප්‍රතිෂේධ කොට, සන්නිට්ඨාන සංසය පද ඒකදේශයක සවරූපාර්ථ ඇතිව, සම්පූර්ණ සංසය පදයාගේ සවරූපාර්ථ නොමැතිව රූපධාතු අරූපධාතුවෙහි අවිජ්ජානුසය, මානානුසය, භවරාගානුසය උපදින සෝතාපන්න, සකදගාමී පුද්ගලයන් අරමුණු කොට ''ද්වින්නං පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා -පෙ- අනුසෙන්ති'' යයි සිවුවැනි කොටස බෙද දක්වන ලදී.

සංසය පද ඒකදේශයක සවරූපාර්ථ ප්‍රතිෂේධ කොට, සන්නිට්ඨාන සංසය පද ඒක දේශයක සවරූපාර්ථම ඇතිව, සම්පූර්ණ සංසය පදයාගේ සවරූපාර්ථ නොමැතිව කාමධාතු වේදනාද්වයෙහි අවිජ්ජානුසය, කාමරාගානුසය උපදින සෝතාපන්න, සකදාගාමීන් අරමුණු කොට ''තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්වීසු වේදනාසු -පෙ- අනුසෙන්ති'' යි පස් වැනි කොටස බෙද වෙන් කරන ලදී, සංසය පද ඒකදේශයක සවරූපාර්ථ ප්‍රතිෂේධ කොට, සන්නිට්ඨාන සංසය පද ඒක දේශයක සවරූපාර්ථම ඇතිව, සම්පූර්ණ සංසය පදයාගේ සවරූපාර්ථ නොමැතිව, දුක්ඛ වේදනා තුනෙහි අවිජ්ජානුසය, පටිඝානුසය උපදින සෝතාපන්න, සකදගාමී පුද්ගලයන් අරමුණු කොට, ''තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වේදනාය තෙසං තත්ථ, – පෙ –, අනුසෙන්ති''යි සවැනි කොටස බෙද වෙන්කරන ලදී.

සංසය පද ඒක දේශයක සවරූපාර්ථ ප්‍රතිෂේධ කොට, සන්නිට්ඨාන සංසය පද ඒකදේශයක සවරූපාර්ථ පමණක් ඇතිව, සම්පූර්ණ සංසය පද සවරූපාර්ථ නොමැතිව, රූපධාතු අරූප ධාතුවෙහි අවිජ්ජානුසය, මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය. භවරාගානුසය උපදින්නා වූ පෘථග්ජන පුද්ගලයන් අරමුණු කොට ''පුථුජ්ජනස්ස රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, -පෙ- අනුසෙන්ති''යි සත්වැනි කොටස බෙද

දක්වන ලදී. සංසය පද ඒකදේශයක සවරූපාර්ථ **ප්‍රතිෂේධ** කොට, සන්නිට්ඨාන සංසය පද ඒක දේශයක සවරූපාර්ථ පමණක් ඇතිව, සම්පූර්ණ සංසය පද සවරූපාර්ථ නොමැතිව, කාමධාතු වේදනා ද්වයෙහි අවිජ්ජානුසය කාමරාගානුසය, මානානුසය, දිට්ඨානුසය විචිකිච්ඡානුසය උපදින පෘථග්ජන පුද්ගලයන් අරමුණු කොට, ''තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්වීසු වෙදනාසු තස්ස තත්ථ, -පෙ- අනුසෙන්ති''යි අටවැනි කොටස බෙද වෙන් කරන ලදී. සංසය පද ස්වරූපාර්ථ **ප්‍රතික්ෂේප** කොට, සන්නිට්ඨාන සංසය පද එක දේශයකගේ සවරූපාර්ථ පමණක් ඇතිව, සම්පූර්ණ සංසය පදයාගේ සවරූපාර්ථ නොමැතිව, දුක්ඛ වේදනා තුනෙහි, **පටිඝානුසය** දිට්ඨානුසය, විචිකිච්ඡානුසය උපදින පෘථග්ජන පුද්ගලයා අරමුණුකොට, ''තස්සෙව පුග්ගලස්ස දුක්ඛාය වේදනාය තස්ස තත්ථ - පෙ - අනුසෙන්ති''යි නවවැනි කොටස බෙද වෙන් කරන ලදී. සංසය පද ඒක දේශයක සවරූපාර්ථ **ප්‍රතික්ෂේප** කොට විසඳුම් ජාති පස අතුරෙන් පළමු කොටස -පෙ- නවවැනි කොටස ගේ සවරූපාර්ථ **දක්වීම්** වශයෙන් ස්වරූප දර්ශන විස්සර්ජනාවෙන් පිළිතුරු වදරණ ලදහ.

**නොහොත් ප්‍රති**ලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, පෘථග්ජන සෝතා-පන්න, සකදගාමී, **අනාගාමී** පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව හා ත්‍රිවිධ වේදනා ගනු ලැබෙති. (සම්පූර්ණ සංසය පදයාගේ සවරූපාර්ථ නොමැති).

## කොටස් බෙද දක්වීම

**මෙසේ** සන්නිට්ඨාන පදයාගේම සවරූපාර්ථ ඇතිව සම්පූර්ණ සංසය පදයා-ගේ සවරූපාර්ථ නොමැති බැවින් යම් මෙ පුද්ගලයෙකුට යම් තැනක අවිජ්ජානු-සය උපදී. ඒ අවිජ්ජානුසය උපදින පුද්ගලයාට අවිජ්ජානුසය උපදින **ස්ථාන**යෙහි කාමරාගානුසය - පෙ - භවරාගානුසය **කිම ?** උපදින්නාහු දැයි **සර්වඥයන්** වහන්සේට විමතියක් නැත්තේමය, එහෙත් වේනෙයනාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න-උපදවා **ප්‍රශ්න** ජාති (4) සතර අතුරෙන් මොස **පඤ්හ** වශයෙන්, අසනලද **ප්‍රශ්න**යට අනුරූපව, අවිජ්ජානුසය උපදින පුද්ගලයන්ට අවිජ්ජානුසය උපදින **ස්ථාන**යෙහි කාමාරාගානුසය -පෙ- භවරාගානුසය ඉපදීම **ප්‍රතික්ෂිප්ත** බැවින් සංසය පදයාගේ සවරූපාර්ථ වෙන් වෙන්ව **ප්‍රතික්ෂේප කිරීම්** වශයෙන් ''නො'' යයි **ප්‍රතිෂේධ** විස්සර්ජනා වෙන් පිළිතුරු වදරණ ලදී.

අනුලෝමය නිමි,

---

[මෙ අනුලෝම පුද්ගල වාර, ඒකමූලයෙහි යමක (21) **එක් විස්සකි, ද්විමූලකා**දියෙහි යමක (15) පසළොසකි, මේ දෙක එක් කල කල්හි යමක (36) **සති සෙකි, පුච්ඡා** (72) සැත්තෑ දෙකකි, අර්ථ (144) එකසිය **සුසාළිසෙක්**

ලැබෙති, ඕකාස වාර, පුද්ගලෝකාස වාරයන් හිදු ඒ හා සමානව ලැබෙති. මෙසේ අනුලෝමයෙහි වාර (3) තුනකි, මූල (12) දෙළසකි, යමක (108) එකසිය අටකි. පුච්ඡා (216) දෙසිය සොළසකි. අර්ථ (432) සාරසිය තිස් දෙකක් ලැබෙති.]

## මහාවාර අනුසය වාර ප්‍රත්‍යනීකය

## පුද්ගලවාර ඒකමූලය

අනුලෝමය දේශනාකොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක. ඒ ප්‍රත්‍යනීකයද පුදගල වාර, ඕකාස වාර, පුද්ගලෝකාස වාර වශයෙන් තුන් වැදෑරුම් වේ. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. (අනුලෝමයෙහි මෙන් මූල මූලී ගලපා කියනු).

''**යස්ස** කාමරාගානුසයො නානුසෙති, තස්ස පටිඝානුසයො නානුසෙති ති, ආමන්තා, **යස්සවා පන** ආමන්තා ;'' **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** වනාහි අනාගාමී, අර්හත් ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති, **සංසය** ද එසේමය. **ප්‍රතිලෝමයෙහි ද** එයම ලැබේ. **යස්ස** කාමරාගානුසයො නානුසෙන්ති. තස්ස මානානුසයො නානුසෙතිති, අනාගාමිස්ස කාමරාගානුසයො නානුසෙති, නොච තස්ස මානානුසයො නානු සෙති, අරහතො – **යස්ස වා** පන – ආමන්තා ;'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අනාගාමී ආයඞ් පුද්ගලයා ගනු ලැබේ. අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයාද ගනු ලැබේ. **සංසය ස්වරූපාර්ථය** පෙර සේම ලැබේ. **දිට්ඨානුසය** මූලියෙහි අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි ''ද්වින්නං පුග්ගලානං –පෙ– **ද්වින්නං** පුග්ගලානං, –පෙ –'' **ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝතාපන්න, සකදාගාමී පුද්ගලයෝ ගනු ලැබෙති. අනාගාමී, අර්හත් ආයඞ් පුද්ගලයෝද ගනු ලැබෙති. (විචිකිච්ඡානුසය මූලියද මෙසේමය, භවරාග අවිජ්ජා මූලිද මානානුසය මූලි හා සමඟ සමානය, පටිඝානුසය මූලයද මෙයට සමානය).

**මානානුසය මූල දිට්ඨානුසය** මූලි, දිට්ඨානුසය මූලියෙහි අනුලෝම – ආමන්තා **ප්‍රතිලෝමයෙහි** ''**තිණ්ණං පු**ග්ගලානං – පෙ – අරහතො,'' **ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝතාපන්න, සකදාගාමී, අනාගාමී පුද්ගලයෝ ගනු ලැබෙති. රහතන් වහන්සේද ගනු ලැබෙති. භවරාග – අවිජ්ජානුසය මූලියෙහි ආමන්තා ; රහතන් වහන්සේ ද ගනු ලැබෙති.

**දිට්ඨානුසය මූල විචිකිච්ඡානුසය** මූලියෙහි ආමන්තා ; එලස්ථ ආයඞ් පුද්ගලයෝ සිවු දෙන ලැබෙති, **භවරාගානුසය මූල අවිජ්ජානුසය මූලි** - අනුලෝමයෙහි "**තිණ්ණං** පුග්ගලානං -පෙ- අරහතො," ප්‍රතිලෝමයෙහි ආමන්තා "අනුලෝම **සන්ධිඡ්ඨාන ස්වරූපාර්ථ** සෝතාපන්න, **සකදාගාමී, අනාගාමී** පුද්ගලයෝ ගනු ලැබෙති. රහතන් වහන්සේද ගනු ලැබෙති. **සංසය** ස්වරූප **ප්‍රතිලෝම** පෙර සේම **ලැබති, භවරාග** මූල **අවිජ්ජා** මූලියෙහි - **ආමන්තා** රහතන් **වහ**න්සේ ද ගනු ලැබෙ.

ඒකමූලය නිමි.

(ද්වි මූලය ද කාමරාග මූලයට සමාන ය.)

## තිමූලය

දිට්ඨානුසය මූලියෙහි අනුලෝම - ආමන්තා ; ප්‍රතිලෝමයෙහි "ද්වින්නං පුග්ගලානං -පෙ- අනාගාමිස්ස -පෙ- අරහතො" ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, සෝතාපන්න, සකදගාමී, පුද්ගලයෝ ගනු ලැබෙති. "කාමරාගානුසයොච පටිඝානුසයො ච නානුසෙන්ති" යයි කියන ලද **සන්නිට්ඨාන සංසය පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** අනාගාමී පුද්ගලයෝ ගනු ලැබෙති "කාමරාගානුසයො ච පටිඝානුසයො ච මානානුසයො ච නානුසෙන්ති" යයි කියන ලද **සම්පූර්ණ සංසය පදයාගේ ස්වරූපාර්ථ**, අර්හත් එලස්ථ ආයඞ් **පු**ද්ගලයෝම ගනු ලැබෙති. (සවරූප දර්ශන විස්සර්ජනා වෙනි, විචිකිච්ඡා මූලියද මෙයට සමානය.) භවරාගානුසය අවිජ්ජානුසය මූලියෙහි - ආමන්තා ; රහතන් වහන්සේ ගනු ලැබෙති.

තිමූලය නිමි

## චතුමූල

විචිකිච්ඡාමූලියෙහි ප්‍රතිලෝම ත්‍රිරාශිය උද්‍ධරනු, භවරාගමූලි අවිජ්ජාමූලියෙහි- ආමන්තා ; පඤ්චමූල ඡමූල - සමානමය, ප්‍රතිවචන මැයි, රහතන් වහන්සේ ගනු ලැබෙති.

පුද්ගලවාරය නිමි.

# ඕකාස වාරය

## ඒකමූලය

ඕකාස වාරයෙහි "**යත්ථ** කාමරාගානුසයො නානුසෙති, තත්ථ පටිඝානුසයො නානුසෙතීති, දුක්ඛාය වෙදනාය එත්ථ, රූපධාතුයා අරූප ධාතුයා අපරියාපන්නෙ එත්ථ, **යත්ථ වා පන** - කාමධාතුයා ද්විසු වෙදනාසු එත්ථ," අනුලෝම - **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** දුක්ඛ වෙදනා තුන ගනු ලැබේ. රූපධාතු අරූප ධාතු අපරියාපන්න ද ධර්මයෝ ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේම ලැබේ. (අපරියාපන්න යනු ලෝකකෝත්තර ධර්ම (9) නවදෙන වෙති) ප්‍රතිලෝමයෙහි කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති. අනුලෝම සංසයද ගනු ලැබේ. සංසය සවරූප පෙර සේම ලැබේ. මානානුසය මූලියෙහි - "රූපධාතුයා අරූප ධාතුයා එත්ථ, දුක්ඛාය වෙදනාය, අපරියාපන්නෙ එත්ථ." (පෙර සේ උද්ධරනු) දිට්ඨානුසය මූලියෙහි "දුක්ඛාය වෙදනාය, රූපධාතුයා අරූප ධාතුයා අපරියාපන්නෙ එත්ථ", විචිකිච්ඡානුසය මූලියද සමානය, භවරාගානුසය මූලියෙහි "රූපධාතුයා අරූප ධාතුයා එත්ථ, දුක්ඛාය වෙදනාය, අපරියාපනෙන එත්ථ, **යත්ථ වා පන** කාමධාතුයා ද්විසු වෙදනාසු එත්ථ" අවිජ්ජානුසය මූලියෙහි ක්‍රමය සමානය, කාමරාගානුසය මූලය නිමි.

**පටිඝානුසය මූල මානානුසය මූලියෙහි** කාම ධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා, එත්ථ, **යත්ථ වා පන**, දුක්ඛාය වෙදනාය එත්ථ" (පාලි ඇති සේ සවරූප උද්ධරනු)

**දිට්ඨානුසය මූලියෙහි** "කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා එත්ථ, අපරියාපන්නෙ එත්ථ", භවරාගානුසය මූලියෙහි "රූපධාතුයා අරූප ධාතුයා එත්ථ, කාමධාතුයා ද්විසු වෙදනාසු, අපරියාපන්නෙ එත්ථ, **යත්ථ වා පන** දුක්ඛාය වෙදනාය එත්ථ, (අවිජ්ජානුසය මූලියෙහි දිට්ඨානුසය මූලිය මෙනි) පටිඝානුසය මූලය නිමි.

**මානානුසය මූල දිට්ඨානුසය මූලියෙහි**, — "දුක්ඛාය වෙදනාය එත්ථ, අපරියාපන්නෙ එත්ථ, **යත්ථ වා පන** ආමන්තා," (මේ සමානව විචිකිච්ඡානුසය මූලි උද්ධරනු) **භවරාගානුසය මූලියෙහි** අනුලෝම - ආමන්තා ; ප්‍රතිලෝමයෙහි "කාම ධාතුයා ද්විසු වෙදනාසු එත්ථ, දුක්ඛාය වෙදනාය, අපරියාපන්නෙ එත්ථ, (අවිජ්ජානුසය මූලියෙහි සවරූප දිට්ඨානුසය මූලි මෙනි,) මානානුසය මූලය නිමි.

**දිට්ඨානුසය මූල විචිකිච්ඡා මූලියෙහි**, ආමන්තා ; අපරියාපන්න ධර්ම ලැබෙති ; **භවරාගානුසය මූලියෙහි** අනුලෝම - ආමන්තා ; ප්‍රතිලෝමයෙහි - "කාමධාතුයා තිසු වෙදනාසු එත්ථ, අපරියාපන්නෙ එත්ථ," **අවිජ්ජානුසය**

මූලියෙහි ආමන්තා ; දිට්ඨානුසය මූලය නිමි. (විචිකිච්ඡානුසය මූලයද මෙ හා සමානය.) **භවරාගානුසය මූල අවිජ්ජානුසය මූලියෙහි — අනුලෝම** "කාමධාතුයා තිසු වෙදනාසු, එත්ථ ; අපරියාපන්නෙ එත්ථ." **ප්‍රතිලෝමයෙහි** – ආමන්තා;

ඒකමූලය නිමි.

## ද්විමූලය

**කාමරාගානුසය පටිඝානුසය මූල මානානුසය මූලියෙහි,** "රූපධාතුයා අරූප-ධාතුයා එත්ථ, අපරියාපන්නෙ එත්ථ, **යත්ථ වා පන,** දුක්ඛාය වෙදනාය එත්ථ, අපරියාපන්නෙ එත්ථ," **දිට්ඨානුසය මූලියෙහි** "රූපධාතුයා අරූපධාතුයා එත්ථ, අපරියාපන්නෙ එත්ථ, **යත්ථ වා පන,** ආමන්තා," **භවරාගානුසය මූලියෙහි** "රූපධාතුයා අරූප ධාතුයා එත්ථ, අපරියාපන්නෙ එත්ථ, **යත්ථ වා පන,** දුක්ඛාය වෙදනාය එත්ථ, කාමධාතුයා ද්විසු වෙදනාසු එත්ථ, අපරියා පන්නෙ එත්ථ." (අවිජ්ජානුසය මූලියෙහි සවරූපාර්ථ දිට්ඨානුසය මූලිගට සමානය.)

ද්වි මූලය නිමි.

## තිමූලය

දිට්ඨානුසය මූලි අනුලෝම-ප්‍රතිලෝමයෙහි — ආමන්තා, අපරියාපන්න ධර්ම ගනු ලැබෙති, භවරාගානුසය මූලියෙහිද - අනුලෝම - ආමන්තා; ප්‍රතිලෝමයෙහි "දුක්ඛාය වෙදනාය එත්ථ, කාමධාතුයා ද්විසු වෙදනාසු එත්ථ, අපරියාපන්නෙ එත්ථ," අවිජ්ජානුසය මූලියෙහි – ආමන්තා ;

තිමූලය නිමි.

(චතුමූල - පඤ්චමූල භවරාග සමග පෙර සේ ත්‍රිරාගිය කිඃනු) ෂමූල-අවිජ්ජාමූලියෙහි – ආමන්තා ; අපරියාපන්න ධර්මයෝ ගනු ලැබෙති.

ඕකාස වාරය නිමි.

# පුද්ගලෝකාස වාරය

## ඒකමූලය

**පුද්ගලෝකාස වාරයෙහි** "යස්ස යත්ථ කාමරාගානුසයො නානුසෙති, තස්ස තත්ථ පටිඝානුසයො නානුසෙතීති, තිණ්ණං පුග්ගලානං දුක්ඛාය වෙදනාය තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා, අපරියා පන්නෙ තෙසං තත්ථ, ද්වින්නං පුග්ගලානං සබ්බත්ථ, යස්ස වා පන යත්ථ

තිණ්ණං පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා, අපරියාපන්නෙ තෙසං තත්ථ, ද්වින්නං පුග්ගලානං සබ්බත්ථ,''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ඒ පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූප ධාතු, අපරියාපන්න. ධර්මයෝය ; අනාගාමී ; රහත් පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු, ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති. සංසය **ස්වරූපාර්ථ** පෙර සේම ලැබෙ.

**මානානුසය මූලියෙහි** – ''තිණ්ණං පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වෙදනාය අපරියාපන්නෙ තෙසං තත්ථ, අනාගාමිස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු රූපධාතුයා අරූප ධාතුයා තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස දුක්ඛාය වෙදනාය අපරියාපන්නෙ තස්ස තත්ථ, අරහතො සබ්බත්ථ, යස්ස **වා පන**, ආමන්තා,''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන් ගේ රූපධාතු අරූපධාතුය ; අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වයය හා රූප ධාතු අරූපධාතු ගනු ලැබෙති, ඒ පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී අනාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුනය, – අපරියාපන්න ධර්මයෝය, රහතන් වහන්සේ ගේ ත්‍රිවිධ ධාතුව ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝ ද ගනු ලැබෙති.

**දිට්ඨානුසය මූලියෙහි** ''පුථුජ්ජනස්ස දුක්ඛාය වෙදනාය, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස අපරියාපන්නෙ තස්ස තත්ථ, ද්වින්නං පුග්ගලානං සබ්බත්ථ, යස්ස **වා පන යත්ථ**, ද්වින්නං පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වෙදනාය, රූපධාතුයා අරූපධාතුයා, අපරියාපන්නෙ තෙසං තත්ථ, ද්වින්නං පුග්ගලානං සබ්බත්ථ, (මෙසේ බෙද කියනු) අනුලෝමයෙහි **සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ** – පෘථග්ජන පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුනය, රූපධාතු අරූප ධාතු ගනු ලැබෙති. ඒ පුහුදුන් පුද්ගලයන් ගේ අපරියාපන්න ධර්මයෝය ; අනාගාමී රහත් ආර්ය පුද්ගලයනගේ ත්‍රිවිධ ධාතු ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති. ඒ සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුනය ; රූපධාතු අරූප ධාතු, අපරියාපන්න ධර්මයෝය ; අනාගාමී රහත් ආර්ය පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති.

(ඒ පෘථග්ජනයාගේ ස්ථානයෙහි කුමක් හෙයින් ලෝකෝත්තර ධර්ම ගන්නා ලද්දහුද යත් ; සෝතාපත්ති මාර්ගයට පූර්ව වූ ගෝත්‍රභූ චිත්තය නිර්වාණය අරමුණු කොට උපදින බැවින්, එකෙණෙහි පෘථග්ජනයාට අරමුණු වශයෙන් ස්ථාන වන බැවිනි.)

**භවරාගානුසය මූලියෙහි – සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, පෘථග්ජන, සෝතාපන්න සකෘදගාමී අනාගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. ඒ පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ; අපරියාපන්න ධර්මයෝය ; අනාගාමී පුද්ගලයන්ගේ කාම ධාතු වේදනා තුනය ; අපරියාපන්න ධර්මයෝය ; අර්හත් පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු, ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති. සංසය **ස්වරූපාර්ථ** පෙර සේමය, (ප්‍රතිලෝමයෙහි ක්‍රමයද මෙයට සමානය.)

**අවිජ්ජානුසය මූලියෙහි** – පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුනය ; රූප ධාතු අරූප ධාතුය ; අනාගාමී පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු හා ත්‍රිවිධ වේදනා ගනු ලැබෙති. ඒ පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී අනාගාමී පුද්ගලයන්ගේ අපරියාපන්න ධර්මයෝය ; – අර්හත් පුද්ගලයන්ගේ ත්‍රිවිධධාතු ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති. සංසය **ස්වරූපාර්ථ** පෙර සේම ලැබේ. [මේ නය ක්‍රමය ඇසුරු කොට ඒකමූලය අවසානය තෙක් ස්වරූප උද්ධරනු, ද්විමූල -මානානුසය මූලි යනාදියෙහි වැඩි වෙනසක් නොමැති, ඒකමූලය හා සමානව ස්වරූප උද්ධරනු.]

## තිමූල

**තිමූල දිට්ඨානුසය මූලියෙහි – අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි** "ද්වින්නං පුග්ගලානං දුක්ඛාය වේදනාය තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වේදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං අරියාපන්නෙ තෙසං තත්ථ, අනාගාමිස්ස කාමධාතුයා ද්විසු වේදනාසු රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස දුක්ඛාය වේදනාය අපරියාපන්නෙ තස්ස තත්ථ, අරහතො සබ්බත්ථ."

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, සෝතාපන්න, සකෘදාගාමී පුද්ගලයන්ගේ ලෝකෝත්තර ධර්මයෝය ; අනාගාමී පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා එකය ; අපරියාපන්න ධර්මයෝය ; අර්හත් ආයර්‍ය පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු, ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝ ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි, "දිට්ඨානුසයො ච කාමරාගානුසයො ච මානානුසයො ච නානුසෙන්ති" යන සන්නිට්ඨාන සංසය **පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ**, ඒ සෝතාපන්න, සකෘදගාමී

පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ''දිට්ඨානුසයො ච පටිඝානුසයො ච නානුස්සෙන්ති'' යන **සන්නිට්ඨාන** සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ** ඒ සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. ''දිට්ඨානුසයො ච කාමරාගානුසයො ච පටිඝානුසයො ච නානුසෙන්ති'' යන **සන්නිට්ඨාන සංසය පද ඒකදේශ සවරූපාර්ථ** - අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය හා රූපධාතු අරූපධාතු ගනු ලැබෙති, **සන්නිට්ඨාන සංසය පූර්ණ පද සවරූපාර්ථ**, සෝතාපන්න සකදගාමී පුද්ගලයන්ගේ අපරියාපන්න ධර්මයෝය ; අනාගාමී පුද්ගලයන්ගේ **දුක්ඛ** වේදනා එකය ; අපරියාපන්න ධර්මයෝය ; අර්හත් ආයර්‍ය පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝ ගනු ලැබෙති. **සංසය සවරූපාර්ථ** පෙර සේම ගනු ලැබේ. (භවරාගානුසය මූලි **ප්‍ර**තිලෝමයෙහි වාර සය මේ නයක්‍රමය ඇසුරු කොට උදුරනු).

## චතුමූලය

**චතුමූල** භවරාගානුසය මූලියෙහි - අනුලෝම - ආමන්තා ; ප්‍රතිලෝමයෙහි (පෘථග්ජනයාට වාර තුනකි. ද්වින්නං - වාර තුනකි, අනාගාමිස්ස - වාර දෙකකි. අරහතො වාර එකකි, සියල්ල වාර නවයකි.) ප්‍රතිලෝමයෙහි ''භවරාගානු**සයො ච කාමරාගනුසයො ච මානානුසයො ච නානුසෙන්ති**'' යන **සන්නිට්ඨාන** සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ** පෘථග්ජන පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ''භවරාගානුසයො ච පටිඝානුසයො ච නානුසෙන්ති', යන **සන්නිට්ඨාන** සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ** - ඒ පෘථග්ජන පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ගනු ලැබේ. ''භවරාගානුසයො ච කාමරාගානුසයො ච මානානුසයො ච දිට්ඨානුසයොච නානුසෙන්ති'' යන **සන්නිට්ඨාන** සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ** - සෝතාපන්න, සකදගාමී පුද්ගලයන් ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබේ. ''භවරාගානුසයො ච පටිඝානුසයො ච දිට්ඨානුසයො ච නානු සෙන්ති'' යන **සන්නිට්ඨාන** සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ**- ඒ සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති ''භවරාගානුසයො ච කාමරාගානුසයො ච පටිඝානුසයො ච දිට්ඨානුසයොච නානුසෙන්ති'' යන **සන්නිට්ඨාන** සංසය **පද ඒක දේශයා ගේ සවරූපාර්ථ**- අනාගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ගනු ලැබෙති. ''**සන්නිට්ඨාන** සංසය **පූර්ණ** පද **සවරූපාර්ථ** - පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන් ගේ අපරියාපන්න ධර්මයෝ ය, අනාගාමී පුද්ගලයන්ගේ වේදනා තුනය අපරියාපන්න ධර්මයෝය; අර්හත් පුද්ගලයන් ගේ ත්‍රිවිධ ධාතුව ත්‍රිවිධ වේදනාව හා අපරියාපන්න ධර්මයෝ ගනු ලැබෙති. (කොටස් බෙද දැක්වීම අනුලෝමය ඇසුරු කොට **එසේ කියන්න.**)

**අවිජ්ජානුසය මූලියෙහි** "අනාගාමිස්ස දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස අපරියාපන්නෙ තස්ස තත්ථ, අරහතො සබ්බත්ථ, **යස්ස වා පන** යත්ථ - ආමන්තා ;" **ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - අනාගාමී පුද්ගලයාගේ දුක්ඛ වේදනාව ගනු ලැබේ. ඒ අනාගාමී පුද්ගලයාගේ අපරියාපන්න ධර්මයෝය ; අර්හත් ආයති පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව, වේදනාත්‍රය, හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති, සංසය ස්වරූප පෙර සේ ලැබෙති. **පඤ්චමූලයෙහි** භවරාගානුසය මූලි ප්‍රතිලෝමයෙහි වාර නවයකි, චතු මූලයෙහි මෙනි. අවිජ්ජානුසය මූලියෙහි ද චතුමූලයෙහි මෙනි, ඡමූලයෙහි ද නයක්‍රමය සමානය.) **ප්‍රත්‍යනිකය** -- -

පුද්ගලෝකාස වාරය නිමි.

---

මෙසේ ප්‍රත්‍යනිකයෙහිද වාර තුනකි. මූල (12) දෙළසකි. යමක (108) එකසිය අටකි. පුච්ඡා (216) දෙසිය සොළසකි. අර්ථ (432) සාරසිය දෙතිසෙක් ලැබෙති. අනුලෝම ප්‍රත්‍යනික දෙක එකතු වී ඇත්තා වූ අනුසය වාරයෙහි නය ක්‍රම (2) දෙකකි. වාර (6) සයකි. මූල (36) සතිසකි. යමක (216) දෙසිය සොළසකි. පුච්ඡා (432) සාරසිය දෙතිසකි. අර්ථ (864) අටසිය සූසැටක් ද ලැබෙති.

පුච්ඡානි චතුසතානි - ද්වත්තිංස අධිකානිච,
අනුසය වාරෙ හොන්ති - තථා සානුසයාදිසු,

අනුසය වාරය නිමි.

---

## සානුසය වාරය

අනුසය වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව සානුසය **වාරය** වදළ සේක. ඒ සානුසය වාරයද (ව්‍යවස්ථානය අනුසය වාරය අනුව කියනු) "යො කාමරාගානුසයෙන සානුසයො සො පටිඝානුසයෙන සානුසයොති, ආමන්තා : **යො වා පන** - ආමන්තා ;" යො පුග්ගලො, යම් පුද්ගලයෙක් තෙමේ ; කාමරාගානුසයෙන, - කාමරාගානුසය කරණ කොට ගෙන ; සානුසයො - අනුසය ඇත්තේ ; හොති - වේ ; සො පුග්ගලො - ඒ පුද්ගල තෙමේ ; පටිඝානුසයෙන - පටිඝානුසය කරණ කොට ගෙන ; සානුසයො - අනුසය සහිත වූයේ ; හොති - වේදැයි ; ඉති පුච්ඡායං සති - මෙවැනි පැනයක් ඇති කල්හි ; ආමන්තා, කාමරාගානුසයෙන් අනුසය සහිත වූ පුද්ගල තෙමේ පටිඝානුසයෙන් අනුසය සහිත වේ. යයි, ඉති විස්සජ්ජනා හොති ; මෙසේ විසඳුම වේ.

(මේ සානුසය වාරයට වනාහි, අනුසය වාරය මෙන් විභංග - ස්වරූප සියල්ල සමානය ; එක් ද උණ ආදී රෝගයකින් ආතුර වූවෙක් යම් මොහොතක ඒ රෝගය නොමැති වූයේ ද, උණ මතුවන හේතුවක් පහළ වූ විට රෝගය

මතු වන්නේය. එනිසා ඔහු රෝගියෙකැයි කියන්නා සේ පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමී පුද්ගලයන් ගේ කාමරාගානුසය මාර්ගයෙන් ප්‍රහාණය නොකළ බැවින් ලෝභ සිතක් නූපන් කෙණෙහිද, කාමරාගානුසය ඇත්තෙකැයි කියනු ලැබේ. පටිඝානුසය ආදියෙහිද මෙසේම ය, මේ සානුසය වාරයෙහිද අනුලෝමයෙහි පෘථග්ජන, යට ඵලසථ තිදෙනම පමණක් ගෙන වදරණ ලදී. ප්‍රත්‍යනීකයෙහිද පෘථග්ජන හා ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (4) සිවුදෙනා පමණක් වදරණ ලදහ. මාර්ගස්ථ සිවුදෙනා වනාහි නොවදරණ ලදී. ඒ කවර හෙයින් ද යත්- අනුසය ප්‍රහීණ කරමින් සිටින එකම චිත්තක්ෂණය ඇති කෙනෙක් බැවිනි)

**ඔකාශ වාරයෙහි**, යතො - යම් සථානයකින් ; උප්පජ්ජනෙන - උපන්නාවූ ; කාමරාගානුසයෙන - කාමරාගානුශයෙන් ; සානුසයො - අනුසය සහිත වූයේ ; හොති - වේද ; තතො - ඒ සථානයෙන් ; උප්පජ්ජනෙන - උපන්නාවූ ; පටිඝානුසයෙන - පටිඝානුසය කරන කොට ගෙන ; සානුසයො - අනුසය සහිත වූයේ, හොති - වන්නේදැයි ; ඉති පුච්ඡාය‍ං සති - මෙවැනි ප්‍රශ්නයක් ඇති කල්හි ; නො - නැතැයි ; ඉති විස්සජ්ජනා - මෙවැනි විසඳුමක් ; හොති - වේ.

**පුද්ගලෝකාය වාරයෙහි** - යො පුග්ගලො - යම් පුද්ගලයෙක් තෙම ; යතො- යම් සථානයකින් ; උප්පජ්ජනෙන - උපන්නාවූ ; කාමරාගානුසයෙන - කාමරාගානුසයෙන් ; සානුසයො අනුසය - සහිත වූයේ, හොති - වේ, මේ ආදි වශයෙන් අර්ථ යෝජනාව දත යුතුය. අනුශය වාරයට වැඩි වෙනසක් නොමැත.

සානුසය වාරය නිමි

---

## පජහන වාර අනුලෝම පුද්ගල වාරය

### ඒක මූලය

සානුසය වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පජහන වාරය වදළ සේක. (ව්‍යවසථානය පෙර සේ කියනු)

[ මේ පජහන වාරයෙහි වනාහි මාර්ගස්ථ සතර දෙනා පමණක් ම ගෙන හැර වදරා ඇත. ඒ මාර්ගස්ථ සතර දෙනා අතුරෙන් ද සෝතාපත්ති මාර්ගස්ථයා වනාහි දිට්ඨානුසය විචිකිච්ඡානුසය දෙක නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කොට, අවශේෂ ක්ලේශයන්ගේ අපාය ගාමිනි ශක්තිය ප්‍රහාණය කරන බැවින් ඒකදේශයකින් ප්‍රහාණය කරන්නේ නම් වේ යයි කියන ලදී. සකදාගාමී මාර්ගස්ථයා වනාහි කාමරාගානුසය, පටිඝානුසය දෙක, තුනී කරන්නේ

වේ. අනාගාමි මාර්ගස්ථයා වනාහි කාමරාගානුසය පටිඝානුසය දෙක නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කරන්නේ වේ-, සෙසු ක්ලෙශයන්ද දුර්වල බවට **පමුණු** වන්නේ වෙයි. අර්හත් මාර්ගස්ථ පුද්ගලයා වනාහි මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කරන්නේ වේ. සකල ක්ලෙශයන්ම ඉතිරි නැතිව ප්‍රහාණය කරයි]

''යො කාමරාගානුසයං පජහති – සො පටිඝානුසයං පජහතීති, ආමන්තා යො වා පන ආමන්තා ;'' යො – යම් පුද්ගලයෙක් තෙමේ ; කාමරාගානුසයං කාමරාගානුසය ; පජහති – ප්‍රහාණය කරමින් සිටී ; සො – ඒ කාමරාගානුසය ප්‍රහාණය කරමින් සිටින පුද්ගල තෙම ; පටිඝානුසයං – පටිඝානුසය ; පජහති – ප්‍රහාණය කරන්නේ දැයි ; ඉති පුච්ඡායං සති – මෙවැනි පැනයක් ඇති කල්හි ; ආමන්තා – කාමරාගානුසය ප්‍රහාණය කරමින් සිටින පුද්ගල තෙමේ පටිඝානුසයත් ප්‍රහාණය කරන්නේ වේ යයි ; ඉති විස්සජ්ජනා මෙවැනි විසඳුමක් ; හොති – වෙයි. (ප්‍රතිලෝමයෙහිද මේ ක්‍රමය මැයි) අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අනාගාමි මාර්ගස්ථ ආයති පුද්ගලයා ගනු ලැබේ. සංසය ද එසේමය (ප්‍රතිලෝමයෙහි ද නය සමානයි).

## කාම මූල මාන මූලි

''යො කාමරාගානුසයං පජහති, සො මානානුසයං පජහතීති, තදෙකට්ඨං **පජහති, යෝවා පන** නො,' යො – යම් පුද්ගලයෙක් තෙමේ ; කාමරාගානුසයං– කාමරාගානුසය ; පජහති – ප්‍රහාණය කරමින් සිටීද ; සො – හෙතෙමේ ; මානානුසයං – මානානුසය ; පජහති – ප්‍රහාණය කෙරේදැයි ; ඉති පුච්ඡායං සති – මෙවැනි පැනයක් ඇති කල්හි ; තදෙකට්ඨං – ඒ කාමරාගානුසය සමග ප්‍රහාණය කළයුතු වශයෙන් සමතැන පිහිටියාවූ මානානුසය ; පජහති – පජහන මත්තං කරොති, ප්‍රහාණ මාත්‍රයක් කරයි ; න නිරවසෙසං පජහති – නිරවශේෂව ප්‍රහාණය කරන්නේ නො වෙයි. ඉති විස්සජ්ජනා හොති – මෙවැනි විසඳුමක් වේ. අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – අනාගාමි මාර්ගස්ථ ආයති පුද්ගලයා ගනු ලැබේ. සංසයද එසේමය, ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයා ගනු ලැබේ. සංසය **ස්වරූපාර්ථ** නොමැති, අනුලෝමයෙහි ප්‍රතිවචනයි, ප්‍රතිලෝම යෙහි ප්‍රතිෂේධයි.

[ තදෙකට්ඨං පජහති යන්නෙහි **වචනාර්ථ** - '' තෙන එකට්ඨං අස්සාති තදෙකට්ඨො,'' යස්ස. යම් මානානුසයකගේ ; තෙන - ඒ කාමරාගානුසය සමඟ ; පහාණ වසෙන - ප්‍රහාණය කළයුතු සමානත්වයෙන්ද ; සහජාත වසෙන- එක්ව ඉපදීමේ සමානත්වයෙන් හෝ ; එකට්ඨං – සමාන වූ ස්ථාන ; අත්ථි-

ඇත්තේ ද; ඉති තස්මා – එහෙයින් ; සො මානානුසයො – ඒ මානානුසය තෙමේ ; තදෙකට්ඨො – තදෙකට්ඨ නම් වේ, "පහාන වසෙන සහජාත වසෙන" යයි කියනලද්දේ විශේෂණ වශයෙනි. "ධාතු දෙසනා වසෙන" කියන ලද විශේෂණය නොමැත.

අධිප්‍රායාර්ථ අනාගාමි මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා කාම භූමියෙහි නිකාන්තිය වූ කාම රාගානුසය නමැති ලෝභ ඒකදේශය ප්‍රහාණය කරයි, ඒ ලෝභ ඒකදේශයද දිට්ඨිගත විප්පයුත්ත (4) සතරෙහි යෙදුනා වූ ලෝභයයි. දිට්ඨිගත සම්පයුත්තය හා යෙදුනා වූ ලෝභය නොවේ. දිට්ඨිගත සම්පයුත්ත ලෝභය, සෝතාපත්ති මාර්ගයෙන් දිට්ඨිවිචිකිච්ඡාව නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කරන ලද බැවිනි. එහෙයින් ධම්ම සංගණි අට්ඨ කථාවෙහි "කිලෙසෙ පන අඤ්ඤෙ පජහති" යනාදි සංවර්ණණාව කරන ලදී. ඒ අනාගාමි මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ කාමභූමියෙහි නිකාන්තිය වූ දිට්ඨිගත විප්පයුත්ත ලෝභයයි කියන ලද කාමරාගානුසය ප්‍රහාණය කරන කල්හි, ඒ දිට්ඨිගත විප්පයුත්ත සිත්හි සම්ප්‍ර යුක්තවූ මානානුසය ඒක දේශයක් ප්‍රහාණය කරයි, නිරවශේෂව නොවේ. කවර නම් මානයක් අවශේෂ වන්නේද, යත්, රූප භූමි අරූප භූමියෙහි නිකාන්තිය වූ රූප රාග අරූප රාග යයි කියන ලද දිට්ඨිගත විප්පයුත්ත (4) සතරෙහි යෙදෙන ලෝභය සමඟ සම්ප්‍රයුක්තවූ මානානුසය අවශේෂ වන්නේය, ඒ මානය ප්‍රහාණය වනුයේ රහත් මගිනි. මෙසේ තදෙකට්ඨ ස්වරූප කියනු ]

## කාම මූල දිට්ඨි මූලී

"යො කාමරාගානුසයං පජහති, සො දිට්ඨානුසයං පජහතීති, නො, යො වා පන – තදෙකට්ඨං පජහති," තදෙකට්ඨං – ඒ දිට්ඨානුසය හා ප්‍රහාණය කළයුතු ස්ථාන ඇත්තා වූ කාමරාගානුසය ; පජහති – පජහන මත්තං කරොති ; ප්‍රහාණ මාත්‍රයක් කරයි ; න නිරවසෙසං පජහති – නිරවශේෂව ප්‍රහාණය කරන්නේ නොවේ. ප්‍රතිලෝම යෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ – සෝතාපත්ති මාර්ගස්ථයා ගනු ලැබේ. සංසය ද එසේමය, ප්‍රතිවචන විස්සර්ජනාව මැයි.

[ අධිප්‍රායාර්ථ – සෝතාපන්න පුද්ගල තෙමේ දිට්ඨානුසය ප්‍රහාණය කරන කල්හි දිට්ඨිගත සම්පයුත්ත ලෝභය නම්වූ කාමරාගානුසයද අපාය ගමනීය වූ දිට්ඨිගත විප්‍රයුක්ත ලෝභ සිත ප්‍රහාණය කරන කල්හි දිට්ඨි ගත විප්‍රයුක්ත චිත්තයන්හි යෙදෙන කාමරාගානුසය නම් වූ ලෝභ සිත් ද ප්‍රහාණය කෙරේ, නිරවශේෂව නොව ඒක දේශයෙනි, කවර කාම රාගානුසයක් සේස වේද යත්,

අපාය ගමනීය නොවූ දිට්ඨි ගත විප්පයුත්ත ලෝභය නම් වූ කාමරාගානුසය අවශේෂ වේ. ඒ අවශේෂ කාමරාගානුසය අනාගාමි මාර්ගස්ථ තෙමේ ප්‍රහාණය කරයි.]

## කාම මූල භව මූල

''**යො** කාමරාගානුසයං පජහති, සො භවරාගානුසයං පජහතීති, තදෙකට්ඨං පජහති, **යො වා පන** – නො, තදෙකට්ඨං – ඒ කාමරාගානුසය සමඟ ප්‍රහාණය කටයුතු පක්ෂයෙහි ඉපදීම් වශයෙන් සමාන ස්ථාන ඇත්තාවූ භවරාගානුසය ප්‍රහීණ කරයි. අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – අනාගාමි මාර්ගස්ථ ආර්ය පුද්ගලයා ගනු ලැබේ. සංසය ද එසේ ය. ප්‍රතිවචන පිළිතුරයි.

[ **අධිප්‍රේතාර්ථ** – අනාගාමි මාර්ගස්ථ ආර්ය පුද්ගල තෙමේ දිට්ඨිගත විප්පයුත්ත හා යෙදුනාවූ කාරාමගානුසය නිරවශේෂයෙන් ප්‍රහාණය කරයි. එසේ ප්‍රහාණය කරන කල්හි දිට්ඨිගත විප්පයුත්ත චිත්තයෙහි යෙදුනාවූ භවරාගානුසය දුර්වල බවට පත් කරයි. සියල්ල ප්‍රහාණය නො කෙරේ. අර්හත් මාර්ගයෙන් වනාහි සියල්ල ප්‍රහාණය කෙරේ .]

## කාම මූල අවිජ්ජා මූලී

''යො කාමරාගානුසයං පජහති, සො අවිජ්ජානුසයං පජාහතීති, තදෙකට්ඨං පජහති, **යො වා පන** නො.''

(**අධිප්‍රේතාර්ථ** – අනාගාමි මාර්ගස්ථ ආයර්‍ය පුද්ගල තෙමේ කාමරාග නම් වූ දිට්ඨිගත විප්පයුත්ත ලෝභය ප්‍රහාණය කරන කල්හි ඒ දිට්ඨිගත විප්පයුත්තය සමඟ යෙදුනාවූ මෝහයයි කියන ලද අවිජ්ජානුසය, අපාය ගමනීය නොවූ දෝස මූලය සමඟ සම්ප්‍රයුක්ත වූ මෝහයයි කියන ලද අවිජ්ජානුසය ද ප්‍රහාණය කරයි. නිරවශේෂව නොව සාවශේෂයෙනි. කවර අවිජ්ජාවක් අවශේෂ වේද යත්, උද්ධච්ච සහගත මෝහය, රූපරාග අරූපරාග සමඟ සම්ප්‍රයුක්තවූ දිට්ඨිගත විප්‍රයුක්ත මෝහයයි කියන ලද අවිජ්ජානුසය අවශේෂ වෙයි. ඒ අවිජ්ජානුසය වනාහි අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වේ.)

## පටිඝ මූල මාන මූලීය

''යො පටිඝානුසයං පජහති, සො මානානුසයං පජහතීති, තදෙකට්ඨං පජහති, **යො වා පන** – නො.'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**– අනාගාමි මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයා ගනු ලැබේ. සංසයද එසේය, ප්‍රතිලෝමයෙහි අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයා ගනු ලැබේ. සංසය ස්වරූප නොමැති.

[ මෙහි **අධිප්‍රේතාර්ථය**, අනාගාමි මාර්ගස්ථ ආයර්‍ය පුද්ගල තෙමෙ **ප්‍රතිඝානුසය** ප්‍රහාණය කරන කල්හි ඒ ප්‍රතිඝානුසය සමඟ ප්‍රහාතේකස්ථවූ කාමරාගානුසය සමඟ සම්ප්‍රයුක්ත වූ මානානුසය ප්‍රහාණය කරයි. නිරවශේෂව නොව සාවශේෂයෙනි. **(සෙස්ස පෙර සේ කියනු** දිට්ඨානුසය **මූලියෙහි** අනුලෝම, නො, ප්‍රතිලෝම- තදෙකට්ඨං පජහති.''

[ **අධිප්‍රේතාර්ථ** – සෝතාපත්ති **මාර්ගස්ථ** පුද්ගල තෙමෙ **දිට්ඨානුසය**, **ප්‍රහාණය** කරන කල්හි අපාය ගමනිය වූ දෝස මූල දෙසිතෙහි යෙදුනාවූ පටිඝානුසය ප්‍රහාණය කරයි. නිරවශේෂව නොව **සාවශේෂ** වශයෙනි. කවර **පටිඝානුසයක්** අවශේෂ වේද යත්, අපාය ගමනිය නොවූ දෝසමූලය හා **සම්ප්‍රයුක්ත** වූ පටිඝානුසය අවශේෂ වේ. ඒ පටිඝානුසය අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය කෙරේ. ]

''යො පටිඝානුසයං පජහති, සො භවරාගානුසයං පජහතීති, තදෙකට්ඨං පජහති, **යො වා** පන නො :''

[ මෙහිද අනාගාමි මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයා පටිඝානුසය ප්‍රහාණය කරන කෙණෙහි භවරාගානුසය දුර්වල බවට පැමිණේ. අවිජ්ජානුසයෙහි ද පටිඝානුසය ප්‍රහාණය කරන කල්හි පටිඝානුසය සමඟ සම්ප්‍රයුක්ත වූ මෝහය ; කාමරාගානුසය හා සම්ප්‍රයුක්ත මෝහය ද ප්‍රහාණය කෙරේ. සෙස්ස කියනු ]

## මාන මූල දිට්ඨි මූලී

මානානුසය **මූල දිට්ඨානුසය මූලියෙහි** අනුලෝම – ආමන්තා ; **ප්‍රතිලෝම**-යෙහි – තදෙකට්ඨං පජහති.''

( **අධිප්‍රේතාර්ථ** – සෝතාපත්ති මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයා වනාහි දිට්ඨානුසය ප්‍රහාණය කරන කෙණෙහි අපාය ගමනිය වූ දිට්ඨිගත **විප්‍රයුක්ත** චිත්තයන් ද ප්‍රහාණය කරන බැවින්, දිට්ඨි ගත විප්පයුත්තයන් සමඟ සම්ප්‍රයුක්ත වූ මානානුසයද ප්‍රහාණය කරයි. නිරවශේෂ ව නොව සාවශේෂවය, අපාය ගමනිය නොවූ දිට්ඨිගත විප්පයුත්තය හා යෙදුනු මානය අවශේෂ වේ. ඒ මානය අර්හත් මාර්ගයෙන් ප්‍රහීන වේ. දිට්ඨානුසය මූලියෙහි ද ක්‍රමය මේ සමානය. ද්විමූලය ඒකමූලයට සමානය.)

## ති මූලය

දිට්ඨානුසය මූලියෙහි අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි ''තදෙකට්ඨං පජහති'' (අධිප්‍රේතාර්ථ ක්‍රමය සමානව කියනු) **භවරාගානුසය මූලි අවිජ්ජානුසය** මූලියෙහි අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි මානානුසයං පජහති'', **ප්‍රතිලොම**යෙහි, **සන්නිට්ඨාන** සංසය පද **ඒකදේශයාගේ ස්වරූපාර්ථ** අර්හත් මාර්ගස්ථ

ආයඞ් පුද්ගලයා ගනු ලැබේ. (පූර්ණ සංසය පදයාගේ සවරූපාර්ථ නොමැති චතුමූල පඤ්චමූල - ඡමූලයන්හිද - අනුලෝම - නත්ථි ; ප්‍රතිලෝම විචිකිච්ඡානුසය මූලියෙහි 'තදෙකට්ඨං පජහති,'' භව රාග අවිජ්ජා මූලියෙහි ''මානානුසයඤ්ච භවරාගානුසයඤ්ච පජහති.'' (සවරූපාර්ථ අධිප්‍රේතාර්ථ ක්‍රමය සමානය.)

පුද්ගල වාරය නිමි (ඕකාස වාරය සුගමයි)

# පුද්ගලෝකාස වාරය

## ඒකමූලය

**පුද්ගලෝකාස වාරයෙහි** ''යො යතො කාමරාගානුසයං පජහති, සො තතො පටිඝානුසයං පජහතීති, නො, යො වා පන යතො, නො.'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන** සවරූපාර්ථ - අනාගාමි මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි, අනාගාමි මාර්ගස්ථ ආර්ය පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබේ. මානානුසය මූලියෙහි අනුලෝම - තදෙකට්ඨං පජහති, ප්‍රතිලෝමයෙහි නො, ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් ගේ කාමධාතු වේදනා ද්වය රූපධාතු අරූප ධාතු ගනු ලැබෙති. දිට්ඨානුසය මූලියෙහි අනුලොම නො, ප්‍රතිලෝමයෙහි ''අට්ඨමකො දුක්ඛාය වෙදනාය, රූපධාතුයා අරූප ධාතුයා සො තතො ; ස්වෙව පුග්ගලො කාමධාතුයා ද්විසු වෙදනාසු සො තතො දිට්ඨානුසයං පජහති, කාමරාගානුසයං තදෙකට්ඨං පජහති.'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** සවරූපාර්ථ - සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයාගේ දුක්ඛ වේදනාව හා රූප ධාතු අරූප ධාතු ගනු ලැබෙති. ඒ සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන්ගේ කාම ධාතු වේදනා ද්වය ද ගනු ලැබේ.

[**අට්ඨමකො** යනු සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයා කියනු ලැබේ. **අර්හත්** ඵලස්ථ ආයඞ් පුද්ගලයාගේ පටන් ආපසු මුලට ගණන් කිරීමෙ දී සෝතාපත්ති මාර්ගස්ථයා අටවෙනියා නම වේ. දක්ෂිණාර්හයන්ගේ වශයෙන් ගණන් ගැනීමෙදී රහතන් වහන්සේ අග්‍ර දක්ෂිණාර්හ වන බැවින් පළමු වැන්නා නම්. අර්හත් මාර්ගස්ථයා දෙවැන්නා නම්, - පෙ - සෝතාපත්ති මාර්ගස්ථයා අටවෙනියා නම වේ. ඒ සෝතාපත්ති මාර්ගස්ථයා වනාහි මේ පෙළෙහි අට්ඨමක නමින් වදරණ ලදී.]

**භවරාගානුසය** මූලියෙහි - අනුලෝම ප්‍රතිලෝම දෙක්හිම - නො ; ප්‍රතිෂේධ පිළිතුරය ; **අවිජ්ජාමූලියෙහි** - අනුලෝම - තදෙකට්ඨං පජහති'' ප්‍රතිලෝමයෙහි නො; **පටිඝානුසය මූල මානානුසය** මූලියෙහි අනුලෝම, ප්‍රතිලෝම දෙක්හිම

ප්‍රතිෂේධ මැයි. දිට්ඨානුසය මූලියෙහි අනුලෝම – නො ; ප්‍රතිලෝමයෙහි ''අට්ඨමකො කාමධාතුයා ද්වීසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා සො තතො, ස්වෙව පුග්ගලො දුක්ඛාය වෙදනාය සො තතො,'' භවරාග මූලියෙහි ප්‍රතිෂේධයි. අවිජ්ජා මූලියෙහි අනුලෝම, ''තදෙකට්ඨං පජහති, ප්‍රතිලෝම – නො;

මානානුසය මූල දිට්ඨානුසය මූලියෙහි – අනුලෝම – නො; ප්‍රතිලෝමයෙහි ''අට්ඨමකො දුක්ඛාය වෙදනාය සො තතො, ස්වෙව පුග්ගලො කාම ධාතුයා ද්වීසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා සො තතො', භවරාගානුසය මූලියෙහි අනුලෝම, අග්ගමග්ග සමංගි කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො, ස්වෙව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො,'' අවිජ්ජානුසය මූලියෙහි – අනුලෝම – ආමන්තා; ප්‍රතිලෝමයෙහි ''අග්ග මග්ග සමග්ගී දුක්ඛාය වෙදනාය සො තතො, ස්වෙව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු, රූපධාතුයා අරූප–ධාතුයා සො තතො''.

දිට්ඨානුසය මූල භවරාගානුසය මූලි අනුලෝමයෙහි ''අට්ඨමකො කාම ධාතුයා තීසු වෙදනාසු සො තතො, ස්වෙව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො'', ප්‍රතිලෝමයෙහි – නො ; අවිජ්ජා මූලියෙහි අනුලෝම – ''තදෙක–ට්ඨං පජහති'' ප්‍රතිලෝමයෙහි – නො; භවරාගමූල අවිජ්ජාමූලියෙහි – අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි 'අග්ග මග්ග සමංගී කාමධාතුයා තීසු වෙදනාසු සො තතො, ස්වෙව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො,''

ඒකමූලය නිමි

## ද්විමූලය

ද්විමූල මානානුසය මූලියෙහි – අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි නො; දිට්ඨානුසය මූලියෙහි – අනුලෝම නත්ථි ; ප්‍රතිලෝමයෙහි ''අට්ඨමකො රූප – ධාතුයා අරූපධාතුයා සො තතො, ස්වෙව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො, ස්වෙව පුග්ගලො දුක්ඛාය වෙදනාය සො තතො'', භවරාගමූලි අවිජ්ජාමූලියෙහි – අනුලෝම නත්ථි ; ප්‍රතිලෝමයෙහි නො,''

## තිමූල

දිට්ඨානුසය මූලියෙහි අනුලෝම – නත්ථි: ප්‍රතිලෝමයෙහි ''අට්ඨමකො රූපධාතුයා අරූපධාතුයා සො තතො ; ස්වෙව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු ස්වෙව පුග්ගලො සො තතො, දුක්ඛාය වෙදනාය සො තතො'', භවරාගානුසය–

මූලියෙහි අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි ''මානානුසයං පජහති'', **අවිජ්ජා–මූලියෙහි** අනුලෝම – නත්ථි ; ප්‍රතිලෝමයෙහි ''අග්ගමග්ග සමංගී දුක්ඛාය වෙදනාය සො තතො, ස්වෙව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු, රූප–ධාතුයා අරූපධාතුයා සො තතො, අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච පජහති, නො ච – පෙ – පජහති,'' චතුමූල පඤ්චමූලයෝ තිමූලයට සමානයහ.

## ඡමූල

**අවිජ්ජානුසය මූලියෙහි** – අනුලෝම – නත්ථි, ප්‍රතිලෝමයෙහි ''අග්ගමග්ග සමංගී දුක්ඛාය වෙදනාය සො තතො, ස්වෙව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො, ස්වෙව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො.''

[ මෙතැන – ග්‍රන්ථයන්හි රූපධාතු අරූපධාතු, ඉන්පසු කාමධාතුයා ද්වීසු වෙදනාසු, ඉන්පසු දුක්ඛාය වෙදනාය, යනු ඇත. මේ ග්‍රන්ථයන්ට අනුව ගතහොත් සන්නිට්ඨාන පදයාගේ සවරූපාර්ථ පසුව කියයුතු වන හෙයින් ආචාර්‍ය්‍යපාදයෝ දුක්ඛ වේදනාව මුල් කොට සවරූප උදුරති ]

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ** අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා–ගේ දුක්ඛ වේදනාව ගනු ලැබේ. ඒ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාගේ කාමධාතු වේදනාද්වය හා රූපධාතු අරූපධාතු ද ගනු ලැබෙති. මානානුසයං පජහති – යන සංසය පද **ඒකදේශයාගේ** සවරූපාර්ථ ඒ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාගේ කාමධාතු වේදනා ද්වය, රූපධාතු අරූපධාතු ගනු ලැබෙති.. භවරාගානුසයං පජහති – යන සංසය පද **ඒකදේශයාගේ සවරූපාර්ථ** ඒ අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාගේ රූපධාතු අරූපධාතු ගනු ලැබේ. පූර්ණ සංසය පද සවරූපාර්ථ නොමැත. (කොටස් බෙදීම පෙරසේ කරනු.)

පුද්ගලෝකාස වාරය නිමි. අනුලෝමය නිමි.

---

## පජහන වාර ප්‍රත්‍යනීක පුද්ගලවාර,

## කාමරාගානුසය මූලය

''**යො** කාමරාගානුසයං න පජහති, සො පටිඝානුසයං න පජහතීති, ආමන්තා **යො වා පන** – ආමන්තා :'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පෘථග්ජන' අනාගාමි මාර්ගස්ථයන් හැර ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත් දෙන ගනු ලැබෙති. **සංසය** ද එසේය , ප්‍රතිලෝමයෙහිද එසේමය ; **මානානුසය මූලියෙහි** ''අග්ග, මග්ග සමංගී කාමරාගානුසයං න පජහති, නොච සො මානානුසයං න පජහති

ද්වින්නං මග්ග සමංගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා; යො වා පන අනාගාමි මග්ග සමංගී – පෙ – ද්වින්නං මග්ග සමංගීනං ඨපෙත්වා අවසේසා පුග්ගලා', අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – අර්හත් මාර්ගස්ථ ආයතී පුද්ගලයා ගනු ලැබේ. පෘථග්ජන, අනාගාමී මාර්ගස්ථ අර්හත් මාර්ගස්ථයන් වර්ජිත සෙසු ආයතී පුද්ගලයන් (6) සය දෙනා ද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අනාගාමී මාර්ගස්ථ ආයතී පුද්ගලයා ගනු ලැබේ.

**දිට්ඨානුසය මූලියෙහි** ''අට්ඨමකො, අනාගාමි මග්ගසමංගීඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා, යො වා පන, අනාගාමි මග්ග සමංගී'' (භවරාග මූලි අවිජ්ජා මූලියද මානානුසය මූලි මෙනි, පටිඝානුසය මූලය මේ සමානය **මානානුසය මූල දිට්ඨානුසය** මූලියෙහි ''අට්ඨමකො, අග්ගමග්ග සමංගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙස්සා පුග්ගලා, **යො වා පන** – අග්ග මග්ග සමංගී.'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝතාපත්ති මාර්ගස්ථ ආයතී පුද්ගලයා ගනු ලැබේ. පෘථග්ජන, සෝතාපත්ති මාර්ගස්ථ, අර්හත් මාර්ගස්ථයන් වර්ජිත ආයතී පුද්ගලයන් (6) සය දෙනාද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගස්ථ ආයතී පුද්ගලයා ගනු ලැබේ.

(ඒක මූලය සුගමයි. ද්වි මූලයද ඒකමූලය මෙනි.)

## තිමූලය

**දිට්ඨානුසය මූලියෙහි** අනුලෝමයෙහි ''අට්ඨමකො, ද්වින්නං මග්ග සමංගීනඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා, අවසෙසා පුග්ගලා, **යො වා පන** අනාගාමි මග්ග සමංගි ; අග්ග මග්ග සමංගී,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝතාපත්ති මාර්ගස්ථ ආයතී පුද්ගලයා ගනු ලැබේ. පෘථග්ජන, සෝතාපත්ති මාර්ගස්ථ, අනාගාමී මාර්ගස්ථ අර්හත් මාර්ගස්ථයන් වර්ජිත ආයතී පුද්ගලයන් (5) පස් දෙනාද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි 'දිට්ඨානුසයඤ්ච මානානුසයඤ්ච න පජහති ' යන **සන්නිට්ඨාන පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ** අනාගාමී මාර්ගස්ථ පුද්ගලයා ගනු ලැබේ. ''දිට්ඨානුසයඤ්ච කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පජහති'', යන **සන්නිට්ඨාන සංසය පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ**, අර්හත් මාර්ගස්ථ ආයතී පුද්ගලයා ගනු ලැබේ. අනුලෝම සංසයද ගනු ලැබේ. සංසය පෙර සේමය (සෙස්ස සුගමයි.)

## චතුමූලය

**භවරාගානුසය මූලියෙහි** – අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝම ''අට්ඨමකො, අනාගාමි මග්ග සමංගී, ද්වින්නං මග්ග සමංගීනඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා,' සෙස්ස සුගමයි, පුද්ගලවාරය නිමි. (ඔකාස වාරය අනුසය වාරයට අනුව කියනු).

# පුද්ගලෝකාස වාරය

## කාමරාගමූල පටිසමූලීය

**පුද්ගලෝකාස වාරයෙහි** යො යතො කාමරාගානුසයං න පජහති, සො තතො පටිඝානුසයං න පජහතීති, අනාගාමී මග්ග සමංගී දුක්ඛාය වෙදනාය සො තතො කාමරාගානුසයං න පජහති, නො ච සො තතො පටිඝානුසයං න පජහති, ස්වේව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා අපරියාපන්නෙ සො තතො, අනාගාමී මග්ග සමංගිං ඨපෙත්වා අවසෙසා පුග්ගලා සබ්බත්ථ කාමරාගානුසයඤ්ච නපජහන්ති, – පෙ – යො වා පන යතො – අනාගාමී මග්ග සමංගී කාමධාතුයා ද්වීසු වෙදනාසු – පෙ –' අනුලෝම **සන්නිවයාන ස්වරූපාර්ථය,** අනාගාමී මාර්ගස්ථ ආයඞ් පුද්ගලයාගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ඒ අනාගාමී මාර්ගස්ථ ආයඞ් පුද්ගලයාගේ රූපධාතු, අරූපධාතු අපරියාපන්න ධර්මයෝය ; පෘථග්ජන, අනාගාමී මාර්ගස්ථයන් වර්ජිත ආයඞ් පුද්ගලයන් (7) සත් දෙනාගේ ත්‍රිවිධ ධාතුව, ත්‍රිවිධ වේදනාව හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති. **සංසය** ස්වරූපාර්ථ පෙර සේ මැයි, **ප්‍රතිලෝමයෙහි** නය සමානයි' (පෙලට අනුව සවරූප උදුරනු ).

## කාමරාග මූල මාන මූලීය

**යො යතො** කාමරාගානුසයං න පජහති, සො තතො මානානුසයං න පජහතීති, අග්ගමග්ග සමංගී කාමධාතුයා ද්වීසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා සො තතො, ස්වේව පුග්ගලො දුක්ඛාය වෙදනාය, අපරියාපන්නෙ සො තතො, ද්වින්නං මග්ගසමංගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා සබ්බත්ථ, **යො වා පන යතො** – අනාගාමී මග්ග සමංගී කාම ධාතුයා ද්වීසු වෙදනාසු සො තතො, සෙව ච පුග්ගලො දුක්ඛාය වෙදනාය, රූපධාතුය, අරූපධාතුයා, අපරියාපන්නෙ සො තතො, ද්වින්නං මග්ග සමංගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා සබ්බත්ථ.''

අනුලෝම **සන්නිවයාන** සවරූපාර්ථ අර්හත් මාර්ගසථ ආයඞ් පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය, රූපධාතු අරූපධාතු ලැබෙති. ඒ අර්හත් මාර්ගසථ පුද්ගලයන්ගේ දුක්ඛ වේදනාව, අපරියාපන්න ධර්මයෝය, පෘථග්ජන, අනාගාමී මාර්ගස්ථ, අර්හත් මාර්ගස්ථයන් වර්ජිත සෙඛ ආයඞ් පුද්ගලයන් (6) සය දෙනාගේ ත්‍රිවිධ ධාතු ත්‍රිවිධ වේදනා හා අපරියාපන්න ධර්මයෝද ගනු ලැබෙති. (ප්‍රතිලෝමයෙහි පෙළට අනුව සවරූප උදුරනු, මේ ක්‍රමයට සමානව ඒකමූල- යෙහි පෙළට අනුව සවරූප උදුරනු).

**ද්විමූල මානානුසය මූලියෙහි** "අග්ගමග්ග සමංගී කාමධාතුයා ද්වීසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා සො තතො, සෙච්ච පුග්ගලො (ඒකමූලයට අනුවම ප්‍රතිලෝමයෙහි වාර (4) සතර උදුරනු, දුක්ඛාය - ආදිකොට බෙදනු) **තිමූල දිට්ඨානුසය** මූලියෙහි – අනුලෝම – "අට්ඨමකො කාමධාතුයා **තීසු** වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා සො තතො, සෙච්ච පුග්ගලො අපරියාපන්නෙ සො තතො, ද්වින්නං මග්ග සමංගීනඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා සබ්බත්ථ." (ප්‍රතිලෝමයෙහි අනාගාමී මග්ග සමංගී වාර තුනකි. අග්ග මග්ග සමංගී වාර දෙකකි. සබ්බත්ථ – වාර එකකි, සියල්ල වාර (6) සයකි. **භවරාගානුසය** මූලියෙහි අනුලෝම - ආමන්තා ; ප්‍රතිලෝමයෙහි එම වාර සයකි). අවිජ්ජාමූලියෙහි – "අග්ගමග්ග සමංගී දුක්ඛාය වෙදනාය සො තතො, සෙච්ච පුග්ගලො අපරියා පන්නෙ සො තතො, ද්වින්නං මග්ග සමංගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා සබ්බත්ථ" (ප්‍රතිලෝමයෙහි අනාගාමී මග්ග සමංගී වාර තුනකි. සබ්බත්ථ වාර එකකි.)

**චතුමූල** භවරාග මූලියෙහි – අනුලෝම – ආමන්තා ; (ප්‍රතිලෝමයෙහි අට්ඨමකො – වාර දෙකකි, අනාගාමී මග්ග සමංගී වාර තුනකි. අග්ග මග්ග සමංගී වාර දෙකකි. සබ්බත්ථ – වාර එකකි. සියල්ල එකතුව වාර (8) අටකි. **අවිජ්ජා මූලියෙහි** අනුලෝම - වාර තුනකි, ප්‍රතිලෝම වාර (5) කි, **පඤ්චමූලයෙහි** චතුමූලයට සමානයි, **ෂමූල අවිජ්ජා මූලයෙහි** – අනුලෝම – වාර තුනකි. ප්‍රතිලෝමයෙහි අට්ඨමකො – වාර දෙකකි. අනාගාමී මග්ග සමංගී – වාර තුනකි, සබ්බත්ථ – වාර එකකි, සියල්ල වාර සයකි, (පෙර කියන ලද ක්‍රමය ඇසුරු කොට සවරූප උදුරනු).

පුද්ගලෝකාස වාරය නිමි. පජහන වාරය නිමි.

---

# පරිඤ්ඤා වාරය

පජහන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව **පරිඤ්ඤා** වාරය වදළ සේක. (පජහන වාරය අනුව සවරූප උදුරන්න. වෙනසක් නොමැත.)

**පහීනවාර අනුලෝම පුද්ගලවාර.**

## කාමරාගානුසය

**පරිඤ්ඤා** වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව **පහීන වාරය** වදළ සේක. (පෙර කියන ලද ආකාරයට ව්‍යවස්ථාන බෙද කියනු) "**යස්ස** කාමරාගානුසයො පහීනො, තස්ස පටිඝානුසයො පහීනො ති, ආමන්තා; **යස්ස වා පන** ආමන්තා," යස්ස – යම් පුද්ගලයෙකුගේ ; කාමරාගානුසයො – කාමරාගානුසය ;

**පහීනො** – ප්‍රහීණ වූයේ වේද, **තස්ස** – ඒ පුද්ගලයාගේ ; **පටිඝානුසයො** ; **පටිඝානුසය** ; **පහීනො** – ප්‍රහීන වූයේ දැයි ඉති පුච්ඡායං සති – මෙවැනි ප්‍රශ්නයක් ඇති කල්හි ; ආමන්තා ; එසේය, ප්‍රහීන වූයේ යැයි ; ඉති විස්සජ්ජනා – මෙවැනි විසඳුමක් : හොති – වේ. (යස්ස – යන සම්ප්‍රදායද යොදනු ලැබේ.) අනුලෝම – **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – අනාගාමි අර්හත් ආයනී පුද්ගලයෝ ලැබෙති. සංසයට ද එසේ මය.

**මානානුසය මූලියෙහි** ''අනාගාමිස්ස – අරහතො, **යස්ස වා පන** ආමන්තා'' (පෙළට අනුව සවරූප උද්ධරනු) **දිට්ඨානුසය** **මූලියෙහි** අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි, ''ද්වින්නං පුග්ගලානං – ''ද්වින්නං පුග්ගලානං – ප්‍රතිලෝම–යෙහි **සන්නිට්ඨාන ස්වරූපයෙහි** – සෝතාපන්න. සකදගාමි දෙදෙන ලැබෙති. අනාගාමි අර්හත් දෙදෙනද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේමය. – [භවරාගමූලි, අවිජ්ජාමූලි දෙක මානානුසය මූලි මෙනි, මේ නය ක්‍රමය ඇසුරු කොට පුද්ගලවාරය සම්පූර්ණයෙන් කියනු. මේ පහීනවාර පුග්ගල අනුලෝමයෙ, අනුසය වාර පුග්ගල ප්‍රත්‍යනික යන මේ දෙකම විභංග හා සවරූපාර්ථ වශයෙන් සමානය වෙනසක් නැත.]

පුද්ගල වාරය නිමි.

## ඕකාස වාරය

**ඕකාසය වාරයෙහි** ''යත්ථ කාමරාගානුසයො පහීනො, තත්ථ පටිඝානුසයො පහීණොති, න වත්තබ්බො පහීණොති වා අප්පහීනොති වා, **යත්ථ වා පන**'' (නය සමානයි) පහීනොති වා – ප්‍රහීන වූයේ යැයි ද ; අප්පහීනොති වා – ප්‍රහීන නොවූයේ යැයි ද ; න වත්තබ්බො – නො කිවයුතුය ; අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – කාම ධාතු වේදනා ද්වය ගනු ලැබේ. **සංසය පද** සවරූපාර්ථ නොවැත. ප්‍රතිෂේධ පිළිතුරය.

[අනුසය වාරයෙහි මෙන්, ''නො'' යයි පිළිතුරු නොදී ''න **වත්**තබ්බො'' යයි කවර හෙයින් විසඳන ලද්දේද යත් : උපදින ස්ථානය අසාධාරණ බැවින් එසේ පිළිතුරු දෙන ලදී. කාමරාගානුසය උපදින තැන එකකි, පටිඝානුසය උපදින තැන අනෙකකි. මාර්ගය වඩන ඇතැම් පුද්ගලයෙකුට කාමධාතු සුඛ වේදනා උපේක්ෂා වේදනා නම් වූ ඕකාසයෙහි කාමරාගානුසය ලැබේ. ඒ ඕකාසයෙහිදීම ඒ කාමරාගානුසය ප්‍රහානය කිරීම සිදුවේ. ඒ කාමරාගානුසය උපදින ස්ථානයේදී ද පටිඝානුසය නො ලැබේ. පටිඝානුසය උපදින ස්ථානයෙහිද කාමරාගානුසය නූපදී, ඒ නිසා ඒ පටිඝානුසය ඒ කාමරාගානුසයාගේ උපදින ස්ථානයේදී ප්‍රහීන වූයේ දැයි ඇසූ කල්හි, ප්‍රහීන වූයේයයි ද ප්‍රහීන නොවූයේ යයි කියාද නො කියයුතුයයි පිළිතුරු දක්වන ලදී.

**අධිප්‍රායාර්ථ** සංක්ෂෙපයෙනි, උපද්දි, අනුසයනය වේද, ඇත්තේදැයි ප්‍රශ්න නො කොට, ප්‍රහීන වූයේ දැයි විචාළ බැවින්, ඒ **ස්ථානයෙහි** සම්පූර්ණයෙන් නැති බැවින් ප්‍රහීන නොවූයේ යයි පිළිතුරු නොදී, ''න වත්තබ්බො'' යනාදී පාඨයෙන් විසඳන ලදී.

උපමාවකි – ගම් දෙකක් අතරෙන් එකක අඹ ගසක් ඇත. එහි කොස් ගසක් නොමැත. අනෙකෙහි කොස් ගසක් ඇත. අඹ ගසක් නො මැත. ඒ ගම් දෙකෙන් වෙන වෙනම අඹ ගස හා කොස් ගස ඉවත් කොට, නිමවා, යම් කෙනෙක් එක් ගමක අඹගස ඉවත් කළේ නම් ඔහු එහිම කොස් ගසත් ඉවත් කළේදැයි ප්‍රශ්න කළ කල්හි ඒ ගමෙහි කොස් ගසක් නොතිබුණ බැවින් ඉවත් කළේ යැයි ද ඉවත් නො කළේ යැයි ද නො කියන්නාක් මෙනි, අනුසය වාරයෙහි ''නො'' යයි ප්‍රතිෂේධ කරන තැන්හි ''න වත්තබ්බො'' යයි කියන ලද්දේද එසේම යයි දත යුතු).

ඕකාස වාරය නිමි.

---

# පුද්ගලෝකාස වාරය

## ඒක මූලය

''යස්ස **යත්ථ** කාමරාගානුසයො පහීනො, තස්ස තත්ථ පටිඝානුසයො පහීනොති, න වත්තබ්බො පහීනොති වා අප්පහීනොති වා, **යස්ස වා පන යත්ථ**'' (ක්‍රමය සමානයි) අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අනාගාමී රහත් ආයඞ් පුද්ගලයන් ගේ කාමධාතු වේදනා ද්වය ගනු ලැබේ. සංසය **ස්වරූපාර්ථ** නොමැත. **ප්‍රතිලෝමයෙහි** සන්නිට්ඨානාර්ථ – අනාගාමී අර්හත් ආයඞ් පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබේ. **මානානුසයමූලියෙහි** ''අනාගාමිස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු තස්ස තත්ථ කාමරාගානුසයො පහීනො, නොච තස්ස තත්ථ, මානානුසයො පහීනො, අරහතො කාමධාතුයා ද්විසු වෙදනාසු-**යස්ස වා පන යත්ථ** අරහතො රූපධාතුයා අරූපධාතුයා – පෙ – කාමරාගානුසයො න වත්තබ්බො පහීනොති වා අප්පහීනොති වා තස්සෙ ව පුග්ගලස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු තස්ස තත්ථ,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – අනාගාමී ආයඞ් පුද්ගලයාගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබේ. අර්හත් ආයඞ් පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ද ගනු ලැබේ. සංසය **ස්වරූපාර්ථ** පෙර සේ මය. ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ – අර්හත් ආයඞ් පුද්ගලයන් ගේ රූපධාතු අරූපධාතු ලැබෙති. අනුලෝම සංසයද ගනු ලැබේ. සංසය ස්වරූප පෙර සේම ලැබේ.

**දිට්ඨානුසය මූල විචිකිච්ඡානුසය මූලියෙහි** අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි ද්වින්නං පුග්ගලානං දුක්ඛාය වේදනාය, රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ, – පෙ – න වත්තබ්බො, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ, – පෙ – නොච තෙසං තත්ථ, ද්වින්නං පුග්ගලානං දුක්ඛාය වෙදනාය රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු තෙසං තත්ථ,'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව, ත්‍රිවිධ වේදනාව ; අනාගාමි රහත් පුද්ගලයන්ගේ දුක්ඛ වේදනාව රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. ඒ අනාගාමි රහත් පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ද ගනු ලැබේ. – සංසය සවරූප පෙරසේම ලැබේ. [භවරාගමූලියෙහි ''න වත්තබ්බො'' මැයි, **අවිජ්ජාමූලියෙහි** අනුලෝම – ප්‍රතිලෝම වාර දෙක බැගින් කියනු; **පටිඝානුසය මූල මානානුසයමූලියෙහි** ''න වත්තබ්බො'' මැයි. **දිට්ඨානුසය** මූලියෙහි අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි වාර (4) සතරක් කියනු. **භවරාග** මූලියෙහි ''න වත්තබ්බො'' මැයි. **අවිජ්ජා** මූලියෙහි අනුලෝම – ප්‍රතිලෝම වාර දෙක බැගින් වෙති.]

## මානමූල දිට්ඨි මූලි

මානානුසය මූල දිට්ඨානුසය මූලියෙහි – අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝම ''**තිණ්ණං** පුග්ගලානං දුක්ඛාය වෙදනාය තෙසං තත්ථ, – පෙ – න වත්තබ්බො, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, – පෙ – නො ච ; අරහතො දුක්ඛාය වෙදනාය තස්ස තත්ථ – පෙ – න වත්තබ්බො – පෙ – තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු, රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ'', (**භවරාග මූලියෙහි** අනුලෝම වාර දෙකකි. ප්‍රතිලෝමයෙහි – ආමන්තා ; **අවිජ්ජා මූලියෙහි** – අනුලෝම ආමන්තා ; ප්‍රතිලෝමයෙහි වාර දෙකක් කියනු. **දිට්ඨානුසය මූල භවරාගානුසය මූලි** අනුලෝමයෙහි ''**තිණ්ණං**'' වාර දෙකකි, ''අරහතො'' වාර දෙකකි. **අවිජ්ජා මූලි** – අනුලෝමයෙහි ''**තිණ්ණං**'' වාර එකකි. ''අරහතො'' වාර එකකි. ප්‍රතිලෝමයෙහි – ආමන්තා ; **භවරාග මූල අවිජ්ජාමූලියෙහි** – අනුලෝම – ආමන්තා; **ප්‍රතිලෝමයෙහි** වාර දෙකකි. )

ඒකමූලය නිමි

# ද්විමූලය

**ද්විමූලයෙහි** ''**යස්ස යත්ථ** කාමරාගානුසයො ච පටිඝානුසයො ච පහීනො, තස්ස තත්ථ මානානුසයො පහීනොති, නත්ථි, යස්ස **වා පන යත්ථ**'' – 'අරහතො'' වාර දෙකකි. **දිට්ඨානුසය** මූලි අනුලෝමයෙහි – නත්ථි ;

ප්‍රතිලෝමයෙහි ''ද්වින්නං පුග්ගලානං රූපධාතුයා අරූපධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වේදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වේදනාය තෙසං තත්ථ,'' ද්වින්නං පුග්ගලානං යන්නෙහි වාර තුනකි. සියල්ල එකතුව වාර (6) සයකි. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන් ගේ ත්‍රිවිධ ධාතුව, ත්‍රිවිධ වේදනාව ; අනාගාමි රහත් පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙත්. ඒ අනාගාමි රහත් ආයඞි පුද්ගලයන්ගේ කාමධාතු වේදනා තුනද ගනු ලැබේ.

''දිට්ඨානුසයොච කාමරාගානුසයොච පහීනොති'' යන **සන්නිට්ඨාන** සංසය **පද ඒක දේශයාගේ ස්වරූපාර්ථ** – අනාගාමි අර්හත ආයඞි පුද්ගලයන්ගේ කාම ධාතු වේදනා ද්වය ගනු ලැබෙති. ''දිට්ඨානුසයොච පටිඝානුසයො ච පහීනොති' යන **සන්නිට්ඨාන** සංසය **පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** – ඒ අනාගාමි රහත් ආයඞි පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. පූර්ණ සංසය පදයාගේ ස්වරූපාර්ථ නොමැත. **භවරාගානුසය** මූලියෙහි ''න වත්තබ්බො'' **අවිජ්ජා** මූලි ප්‍රතිලෝමයෙහි ''අරහතො'' වාර තුනකි, ද්විමූලයෙහි පටන් ඡමූලය දක්වා අනුලෝමයෙහි පිළිතුර ''නත්ථි''.

## තිමූලය

**තිමූල** දිට්ඨානුසය මූලි ප්‍රතිලෝමයෙහි ''ද්වින්නං පුග්ගලානං රූපධාතුයා අරූප ධාතුයා තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං කාමධාතුයා ද්විසු වේදනාසු තෙසං තත්ථ, තෙසඤ්ඤෙව පුග්ගලානං දුක්ඛාය වේදනාය තෙසං තත්ථ,'' අනාගාමිස්ස – වාර තුනකි. අරහතො – වාර තුනකි, සියල්ල වාර (6) සයකි. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුය, ත්‍රිවිධ වේදනාය ; අනාගාමි පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතුය ; අර්හත් පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. අනාගාමි පුද්ගලයන්ගේ කාම ධාතු වේදනා තුනය. රහත් පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතු හා වේදනා ද්වයද ගනු ලැබෙති. ''කාමරාගානුසයො පහීනො'' යන සංසය **පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** අනාගාමි අර්හත් ආයඞි පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති, ''පටිඝානුසයො පහීනො'' යන සංසය **පද ඒක-දේශයාගේ ස්වරූපාර්ථ** – අනාගාමි අර්හත් ආයඞි පුද්ගලයන්ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති ; ''මානානුසයො පහීනො'' යන සංසය පද **ඒකදේශයාගේ** ස්වරූපාර්ථ – අර්හත් ආයඞි පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව හා වේදනා ද්වය ගනු ලැබෙති. [භවරාගමූලි පටිලෝමයෙහි ''මානානුසයො පහීනො'' සෙස්ස ''න වත්තබ්බො'' අවිජ්ජාමූලි පටිලෝම වාර තුන කියනු, ස්වරූප සුගමයි, **චතුමූල විචිකිච්ඡාමූලි** පටිලෝම – වාර (9) නවයකි, භවරාගමූලි **අවිජ්ජා-මූලියන්හි** තිමූලයට සමානය, පඤ්චමූල ඡමූලයන්හි ද නයක්‍රමය සමානය.]

අනුලෝම නිමි

# පහීන වර ප්‍රත්‍යනීකය

## පුද්ගල වාරය

**ප්‍රත්‍යනීක "යස්ස** කාමරාගානුසයො අප්පහීනො, තස්ස පටිඝානුසයො අප්පහීනොති, ආමන්තා ; **යස්ස වා පන**, ආමන්තා '**සන්නිච්ඨාන අභිධෙයාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි, පුද්ගලයන් ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහිද එසේමය, "**යස්ස** කාමරාගානුසයො අප්පහීනො, තස්ස මානානුසයො – පෙ – ආමන්තා ; **යස්ස වා පන** – අනාගාමිස්ස – පෙ – තිණ්ණං," ප්‍රතිලෝමයෙහි **සන්නිච්ඨාන ස්වරූපාර්ථ** – අනාගාමි පුද්ගලයෝ ගනු ලැබෙති. පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයෝද ගනු ලැබෙති. (අනුසය වාර අනුලෝම අනුව කියනු ).

### ඔකාස වාරය

'**යත්ථ** කාමරාගානුසයො අප්පහීනො, තත්ථ පටිඝානුසයො අප්පහීනොති, න වත්තබ්බො පහීනො ති වා අප්පහීනොති වා, **යත්ථවා පන**" – නය සමානයි අනුලෝමයෙහි **සන්නිච්ඨාන ස්වරූපාර්ථ** කාමධාතු වේදනා ද්වය ගනු ලැබේ. (අනුලෝමය මෙනි, ප්‍රත්‍යනීක මෙන් වෙනසක් නොමැත.)

### පුද්ගලෝකාස වාරය

**පුද්ගලෝකාස වාරයෙහි**, "**යස්ස යත්ථ** කාමරාගානුසයො අප්පහීනො, තස්ස තත්ථ පටිඝානුසයො අප්පහීනොති, න වත්තබ්බො, **යස්ස වා පන යත්ථ**, න වත්තබ්බො', අනුලෝමයෙහි සන්නිච්ඨාන ස්වරූපාර්ථ පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි **සන්නිච්ඨාන ස්වරූපාර්ථ** – පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ කාමධාතු වේදනා තුන ගනු ලැබෙති.

**මානානුසය මූලියෙහි අනුලෝම** – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි "අනාගාමිස්ස රූපධාතුයා අරූපධාතුයා තස්ස තත්ථ, තස්සෙව පුග්ගලස්ස කාමධාතුයා ද්විසු වෙදනාසු තස්ස තත්ථ", තිණ්ණං – වාර දෙකකි. ප්‍රති ලෝමයෙහි **සන්නිච්ඨාන ස්වරූපාර්ථ** – අනාගාමි පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය ; රූපධාතු අරූප ධාතුව ; හා පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ රූපධාතු අරූප ධාතු ගනු ලැබෙති. – ඒ පෘථග්ජන, සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ගේ කාමධාතු වේදනාද්වය ද ගනු ලැබෙති. **දිට්ඨානුසය මූලී** – අනුලෝමයෙහි ද්විත්තාං– වාර එකකි, පුථුජ්ජනස්ස – වාර එකකි, ප්‍රතිලෝමයෙහි පුථුජ්ජනස්ස – වාර

දෙකකි. **භවරාග මූලියෙහි** න වත්තබ්බො ; **අවිජ්ජා මූලියෙහි** – අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝමයෙහි – අනාගාමිස්ස – වාර දෙකකි, තිණ්ණං – වාර දෙකකි, පටිඝානුසය මූල **මානානුසය මූලියෙහි** න වත්තබ්බො, මැයි' **දිට්ඨානුසය** මූලි අනුලෝමයෙහි ද්වින්නං – වාර එකකි. පුථුජ්ජනස්ස – වාර එකකි. ප්‍රතිලොම-යෙහි පුථුජ්ජනස්ස – වාර දෙකකි. **භවරාගමූලියෙහි** න වත්තබ්බො – මැයි, **අවිජ්ජාමූලියෙහි** – ප්‍රතිලෝමයෙහි – අනාගාමිස්ස – වාර දෙකකි. තිණ්ණං – වාර, දෙකකි. **මානානුසය මූල දිට්ඨානුසය** මූලි විචිකිච්ඡානුසය මූලි අනුලෝමයෙහි' තිණ්ණං – වාර එකකි. පුථුජ්ජනස්ස – වාර එකකි. ප්‍රතිලෝමයෙහි, පුථුජ්ජනස්ස – වාර දෙකකි, භවරාගමූලියෙහි – චතුන්නං පුග්ගලානං – වාර දෙකකි, **අවිජ්ජාමූලි** ප්‍රතිලෝමයෙහි – චතුන්නං වාර දෙකකි. **දිට්ඨානුසය මූල** භවරාග මූලි අනු-ලෝමයෙහි පුථුජ්ජනස්ස – වාර දෙකකි, ප්‍රතිලෝමයෙහි, තිණ්ණං - වාර එකකි, පුථුජ්ජනස්ස – වාර එකකි. **අවිජ්ජාමූලියෙහි** අනුලෝම – ආමන්තා ; ප්‍රතිලෝම-යෙහි තිණ්ණං වාර එකකි, පුථුජ්ජනස්ස – වාර එකකි, **භවරාගමූල අවිජ්ජාමූලියෙහි** අනුලෝම – ආමන්තා, ප්‍රතිලෝමයෙහි චතුන්නං – වාර දෙකකි.

ඒකමූලය නිමි

---

## ද්විමූලය

**ද්විමූල මානානුසය මූලි** අනුලෝමයෙහි – නත්ථි ; ප්‍රතිලෝමයෙහි වාර (4) සතරකි. ඒකමූලය මෙනි. **තිමූල දිට්ඨානුසය මූලියෙහි** – අනුලෝම – නත්ථි, ප්‍රතිලෝමයෙහි – වාර තුනකි, **භවරාගමූලි** අනුලෝම – නත්ථි ; අනුලෝම සියල්ලට ම ''නත්ථි'' මැයි, ප්‍රතිලෝමයෙහි ''මානානුසයො අප්පහීනො'' සෙස්ස න වත්තබ්බො'', **අවිජ්ජාමූලි** ප්‍රතිලෝමයෙහි, අනාගාමිස්ස – වාර තුනකි. තිණ්ණං වාර තුනකි. **චතුමූල** – **භවරාගමූලි** ප්‍රතිලෝමයෙහි, තිණ්ණං – වාර එකකි, පුථුජ්ජනස්ස – වාර එකකි, **අවිජ්ජාමූලි ප්‍රතිලෝමයෙහි** ''අනාගාමිස්ස දුක්ඛාය වෙදනාය තස්ස නත්ථි, කාමධාතුයා **ද්විසු** වෙදනාසු තස්ස නත්ථි, රූපධාතුයා අරූපධාතුයා තස්ස නත්ථි,'' ද්වින්නං පුග්ගලානං – වාර තුනකි. පුථුජ්ජනස්ස – වාර තුනකි. සියල්ල වාර (9) නවයකි, පඤ්චමූල – ඡමූල වාර තුනක්මය, **අවිජ්ජාමූලියෙහි**, වාර (9) නවයක් උදුරනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි – අවිජ්ජා-නුසයො අප්පහීනො, යන **සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ** අනාගාමි පුද්ගල-යන් ගේ දුක්ඛ වේදනා තුන ගනු ලැබෙති. ඒ අනාගාමි පුද්ගලයන්ගේ කාම ධාතු වේදනා ද්වය ; රූපධාතු අරූපධාතු; පෘථග්ජන, සෝතාපන්න, සකෘදාගාමි පුද්ගලයන්ගේ ත්‍රිවිධ ධාතුව හා ත්‍රිවිධ වේදනාවද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ නොමැත. – මානානුසයො අප්පහීනො යන සංසය **පද ඒකදේශයාගේ ස්වරූපාර්ථ** පෘථග්ජන, සෝතාපනන, සකෘදාගාමි අනාගාමි පුද්ගලයන් ගේ කාම-ධාතු වේදනා ද්වය, හා රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. කාමරාගානුසයො

අප්පහීනො යන සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න සකදගාමී පුද්ගලයන්ගේ කාමධාතු වේදනා ද්වය, ගනු ලැබෙති. පටිඝානුසයො, අප්පහීනො - යන සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ**, පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී පුද්ගලයන්ගේ දුක්ඛවේදනා තුන ගනු ලැබෙති. දිට්ඨානුසයො ච විචිකිච්ඡානුසයො ච අප්පහීනො - යන සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ** පෘථග්ජන පුද්ගලයන් ගේ ත්‍රිවිධ ධාතුව හා ත්‍රිවිධ වේදනාව ගනු ලැබේ. භවරාගානුසයො අප්පහීනො - යන සංසය **පද ඒකදේශයාගේ සවරූපාර්ථ** පෘථග්ජන, සෝතාපන්න, සකදගාමී, අනාගාමී පුද්ගලයන්ගේ රූපධාතු අරූපධාතු ගනු ලැබෙති. (පූර්ණ සංසය පදයාගේ සවරූපාර්ථ නොමැත කොටස් බෙදීම වනාහි අනුසය වාරය මෙනි.)

පහීන වාරය නිමි.

---

# උප්පජ්ජන වාරය

[උප්පජ්ජන වාරය අනුසය වාරය අනුව කියනු. උප්පජ්ජන ක්‍රියාව පමණක් විශේෂයි. උප්පජ්ජති යන්නෙහි උත්පාදක්ෂණයම නොගෙන, යම් තාක් මාර්ගයෙන් ප්‍රහාණය නොකෙරේද, ඒ තාක් කල් උපන්නේය. උපදිමින් සිටින්නේය, මතු උපදින්නේය යන කාල තුනෙහිම ගත යුතුය.]

## ධාතු වාරය

උප්පජ්ජන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව, ධාතුවාරය වදළ සේක. ඒ ධාතු වාරයද පුච්ඡා වාරය විස්සජ්ජනා වාරය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාවාරය පළමු කොට වදළ සේක. ඒ **පුච්ඡාවාරයද** කාමධාතු මූල, රූපධාතු මූල, අරූපධාතු මූල, න කාමධාතුමූල, න රූපධාතු මූල, න අරූපධාතු මූල, න කාම න අරූපධාතු මූල, න රූප න අරූපධාතු මූල, න කාම න රූපධාතු මූල, වශයෙන් නව වැදෑරුම් වන්නේය, ඒ නවය අතුරෙන් කාමධාතු මූලය පළමු කොට වදළ සේක. ඒ කාම ධාතු මූලය ද කාමධාතු මූලී යනාදී වශයෙන් (9) නව වැදෑරුම වන්නේය. ඒ නවය අතුරෙන් කාමධාතු මූලිය පළමු කොට වදළ සේක. **කෙසේ වදළ සේක්ද යත්** - කාමධාතුයා චුතස්ස කාමධාතුං උපපජ්ජන්තස්ස කති අනුසයා අනුසෙන්ති, කති අනුසයා නානු සෙන්ති, කති අනුසයා භංගා,'' කාම ධාතුයා - එකොළොස් කාම භූමියෙන් ; - චුතස්ස - චුතවූ ; කාමධාතුං - කාම භූමි (11) එකොළොසෙහි; උපපජ්ජන්තස්ස - උපදින්නා වූ පුද්ගලයාට ; කති - කොපමණ ; අනුසයා - අනුශය ධර්මයෝ, අනුසෙන්ති - සන්තානං අනුගතා හුත්වා සයන්ති - සන්තානයට ඇතුළු වී සයන ගත වෙත් ද ; කති - කොපමණ ; අනුසයා - අනුශය ධර්මයෝ ; නානුසෙන්ති - සන්තානං නානුගතා හුත්වා සයන්ති - සන්තානයට

ඇතුළු වී සයනය නො කරත් ද; කති - කොපමණ; අනුසයා - අනුශය ධර්මයෝ; භංගා - භඤ්ජිතබ්බා - මෙපමණ අනුශයෝ උපදිත්ය මෙපමණ නූපදිත් යයි බෙද වෙන් කොට දක්වනු ලැබෙත් ද; (රූපධාතු මූලි යනාදිය ද අනු පිළිවෙළින් සම්බන්ධ කොට කියනු)

[මෙසේ එක එක මූලයක නව වාරය බැගින් සම්බන්ධ කොට මූලිවාර නවය ගණනින් "නව නවා එකාසීති" පුච්ඡා (81) එක් අසූවක් ලැබෙති.]

පුච්ඡා වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව විස්සජ්ජනා වාරය වදළ සේක. (ව්‍යවස්ථානය පෙර සේ කියනු) "කාමධාතුයා චුතස්ස කාම ධාතුං උපපජ්ජන්තස්ස කස්සචි සත්ත අනුසයා අනුසෙන්ති, කස්සචි පඤ්ච අනුසයා අනුසෙන්ති, අනුසයා භංගා නත්ථි", කාම ධාතුයා - කාම භූමි (11) එකොළ-සින්; චුතස්ස - චුතවූ; කාමධාතුං - කාම භූමි (11) එකොළසෙහි; උපපජ්-ජන්තස්ස - ප්‍රතිසන්ධි ගන්නා වූ පුද්ගලයන්ට; කස්සචි - ඇතැම් පෘථග්ජන පුද්ගලයන්ට; සත්ත - සතක් වූ; අනුසයා - අනුශය ධර්මයෝ, - අනුසෙන්ති - සන්තානං අනුගතා හුත්වා සයන්ති - සන්තානයට ඇතුළු වී සයනය කරත්, කස්සචි - ඇතැම් සෝතාපන්න, සකදාගාමි පුද්ගලයන්ට, පඤ්ච - පසක් වූ; අනුසයා - අනුසය ධර්මයෝ; අනුසෙන්ති - සන්තානං අනුගතා හුත්වා සයන්ති-සන්තානයට ඇතුළු වී සයනය කරති, භංගා භඤ්ජිතබ්බා - මෙතෙක් අනුසයෝ උපදිත් ය - මෙතෙක් අනුසයෝ නූපදිත් යයි බෙද දැක්වීමට සුදුසු වූ; අනුසයා-අනුශය ධර්මයෝ; නත්ථි - නොමැත්තාහ.

**කාම ධාතුයා චුතස්ස** - **පදයාගේ සවරූපාර්ථ** - කාම චුති (10) දශය, චෛතසික (4) තෙතිස, හා අන්තිම කර්මජ රූපයන් ගේ භංගක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ (2) දෙදෙනාය යන මේ පුද්ගලයන්ගේ කාම භූමි (11) එකොළොස ගනු ලැබෙති. **කාමධාතුං උපපජ්ජන්-තස්ස** - **පදයාගේ ස්වරූපාර්ථ** - කාම ප්‍රතිසන්ධි (10) දශය, චෛතසික (33) තෙතිස හා කර්මජ රූප කලාප (3 - 7) තුන සත යන මොවුන් ගේ උත්පාද-ක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයර් පුද්ගලයන් දෙදෙනාය යන මේ පුද්ගලයන් ගේ කාම භූමි (11) එකොළස ගනු ලැබෙති.

**කස්සචි සත්ත අනුසයා අනුසෙන්ති** - යන **පදයාගේ සවරූපාර්ථ** පෘථග්ජන පුද්ගලයන් ගේ අනුශය සත ගනු ලැබෙති. කස්සචි පඤ්ච අනුසයා අනුසෙන්ති-යන පදයාගේ **සවරූපාර්ථ** - සෝතාපන්න, සකදගාමී පුද්ගලයන් ගේ දිට්ඨානු-සය විචිකිච්ඡානුසය වර්ජිත අනුසය පස ගනු ලැබෙති.

## කොටස් බෙදා දැක්වීම

එසේ ලැබෙන බැවින් එකොළොස් කාම භූමියෙන් චුත වී එකොළොස් කාමභූමියෙහි පටිසන්ධි ගන්නා වූ පුද්ගලයන්ට කොපමණ අනුශය උපදිත් ද, කොපමණ අනුශය නූපදිත් දැයි ප්‍රශ්න උපදවා ඇතැම් පෘථග්ජන පුද්ගලයන්ට අනුශය (7) සතක් ද, සෝතාපන්න, සකෘදාගාමී පුද්ගලයන්ට අනුසය (5) පසක් ද උපදින බව, "කස්සචි සත්ත අනුසයා අනුසෙන්ති, කස්සචි පඤ්ච අනුසයා අනුසෙන්ති, අනුසයා භංගා නත්ථි" යයි පිළිතුරු වදාරණ ලදී.

[අනුසයා භංගා නත්ථි – යන්නෙහි අධිප්‍රායාර්ථ පෘථග්ජන පුද්ගලයන්ට අනුසය (7) සතක් පහළ වෙති. ඒ සත අතුරෙන් මෙනම අනුසයක් උපදී මෙනම අනුසය නූපදී යයි ද මෙනම අනුසය ඇතැම් විට උපදී, මෙනම අනුසය ඇතැම් විට නූපදී යයි ද නො බෙදිය යුතුය. සෝතාපන්න සකෘදාගාමීන්ට ද එසේම නොබෙදිය යුතු වේ. එනිසා අට්ඨකථාවෙහි "අනුසයා භංගා නත්ථීති යස්ස හි යො අනුසෙති, සො අනුසෙති යෙව, යො නානුසෙති, සො නානුසෙති යෙව, අයං අනුසෙති ච නානුසෙති ච, අයං සියා අනුසෙති සියා නානු සෙතීති, එවං විභජිතබ්බො අනුසයො නාම නත්ථි," යි කියන ලදී. ]

කාම ධාතුයා – කාම සුගති භූමි (7) සතෙන් ; චුතස්ස – චුතවන්නාවූ ; රූපධාතුං – රූප භූමි (16) සොළසෙහි ; උපපජ්ජන්තස්ස – ප්‍රති සන්ධි ගන්නා වූ; කස්සචි – ඇතැම් පෘථග්ජන පුද්ගලයෙකුට ; සත්ත – සතක් වූ ; අනුසයා - අනුශය ධර්මයෝ ; අනුසෙන්ති - උපදිති. කස්සචි – සෝතාපන්න, සකෘදාගාමී ඇතැම් පුද්ගලයෙකුට ; පඤ්ච – පසක් වූ ; අනුසයා – අනුශය ධර්මයෝ; අනුසෙන්ති – උපදිත් ; කස්සචි – අනාගාමී ඇතැම් පුද්ගලයෙකුට ; තයො – තුනක් වූ අනුසයා – අනුසය ධර්මයෝ ; අනුසෙන්ති - උපදිත.

**කාම ධාතුයා චුතස්ස** – පදයාගේ ස්වරූපාර්ථ - කාම ත්‍රිහේතුක චුති (4) සතරය, චෛතසික (33) තෙතිස හා අන්තිම කර්මජ රූප කලාපයන්ගේ භංගක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ්, පුද්ගලයන් (3) තිදෙනාගේ කාම සුගති භූමි (7) සත ගනු ලැබෙති.

**රූපධාතුං උපපජ්ජන්තස්ස** - යන පදයාගේ ස්වරූපාර්ථ - රූප ප්‍රතිසන්ධි (5) පසය, චෛතසික (35) පන්තිස හා සතර බැගින් වූ කර්මජ රූප කලාපයන්ගේ, ආදිතම වූ ජීවිත නවක රූප කලාපයාගේ ද උත්පාදක්ෂණ සමංගී වූ සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ රූපභූමි (16) සොළස ගනු ලැබෙති.

**කස්සචි සත්ත අනුසයා අනුසෙන්ති** – යන පදයාගේ ස්වරූපාර්ථ – සුගති අහේතුක – ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අනුසය (7) සත ගනු ලැබෙති. කස්සචි පඤ්ච අනුසයා අනුසෙන්ති – යන්නෙහි ස්වරූපාර්ථ – සෝතාපන්න, සකෘදාගාමි පුද්ගලයන්ගේ දිට්ඨි විචිකිච්ඡා වර්ජිත අනුසය ධර්ම (5) පස ගනු ලැබෙති. **කස්සචි තයො අනුසයා අනුසෙන්ති** යන්නෙහි ස්වරූපාර්ථ – අනාගාමි පුද්ගලයන්ගේ මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය නම් වූ (3) තුනක් වූ අනුසය ධර්ම ගනු ලැබෙති.

[රූප භූමියෙහි පටිඝානුසය නොමැත. අසංඥතල භූමියෙහි ද අනුසය (7) සත ම නොමැත. එසේ නැත්තේ නමුත් ''කස්සචි සත්ත අනුසයා අනුසෙන්ති'' යනාදිය වදරා ඇත්තේ කවර හෙයින්ද යත්, භූමි වශයෙන් නැත්තේ නමුත් ඒ පුද්ගලයන්ගේ සන්තානයෙහි මාර්ගයෙන් ප්‍රහාණය නොකළ බැවින් වර්තමාන වශයෙන් පහළ නොවූවත් අතීතයෙහි හා අනාගතයෙහි පහළ වූද පහළ වන්නාවූත් ද ගෙන වදරණ ලදී.]

[කාමධාතුයා – කාමභූමි (7) සතෙන් ; චුතස්ස – චුතවූ ; අරූපධාතුං අරූප භූමි (4) සතරෙහි : විස්සජ්ජනා වාර තුන සමානය ; ස්වරූපාර්ථ සමානව උද්ධරනු, අරූප ප්‍රතිසන්ධි (4) – සතර කියනු ] කාමධාතුයා – කාම සුගති භූමි (7) සතෙන් ; චුතස්ස – චුතවූ ; න කාමධාතුං – නොම කාමධාතුව වූ රූපභූමි (16) සොළස හා අරූප භූමි (4) සතරෙහි (සමානව කියනු) කාම ධාතුයා – කාම භූමි (11) එකොළසෙන් ; චුතස්ස – චුතවූ ; න රූපධාතුං – නොම රූපධාතුව වූ, කාම භූමි (11) එකොළසෙහි අරූප භූමි (4) සතරෙහි ; කාමධාතුයා–කාමභූමි (11) එකොළසෙන් චුතස්ස – චුතවූ ; න අරූපධාතුං – නොම අරූප ධාතුව වූ කාමභූමි (11) එකොළසෙහි හා රූපභූමි (16) සොළසෙහි ; කාම–ධාතුයා – කාම සුගති භූමි (7) සතෙන්, චුතස්ස – චුතවූ ; න කාම ධාතුං න අරූප ධාතුං – කාමධාතු අරූප ධාතු නොවූ රූපභූමි (16) සොළසෙහි ; කාමධාතුයා–එකොළොස් කාම භූමියෙන් ; චුතස්ස – චුතවූ ; න රූපධාතුං න අරූප ධාතුං – රූපධාතු අරූපධාතු නොවූ ; කාමභූමි (11) එකොළසෙහි ; කාමධාතුයා – කාමසුගති භූමි (17) සතෙන් ; චුතස්ස – චුතවූ ; න කාමධාතුං න රූපධාතුං – කාමධාතු රූපධාතු නොවූ අරූප භූමි -4) සතරෙහි ;

කාම ධාතු මූලය නිමි.

## රූප ධාතු මූලය

රූපධාතුයා – අසංඥතල අකනිට්ඨ තල වර්ජිත රූපභූමි (14) දහතරෙන් චුතස්ස – චුත වූ; රූපධාතුං – අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසෙහි ; රූපධාතුයා – සුද්ධාවාස වර්ජිත රූපභූමි (11) එකොළසෙන් ; චුතස්ස ; චුත වූ ;

කාමධාතුං – කාමසුගති භූමි (7) සතෙහි ; උපපජ්ජන්තස්ස – ප්‍රතිසන්ධි ගන්නාවූ, පුද්ගලයන්ට ; සත්තෙ' ව – සතක් ම වූ ; අනුසයා – අනුසය ධර්මයෝ: අනුසෙන්ති – අනුසයනය වෙති.

[රූප භූමියෙන් චුතවන සුගති අහේතුක – ත්‍රිහේතුක පුද්ගලයන්ට කාමභූමියෙහි ද්විහේතුක ත්‍රිහේතුක ප්‍රතිසන්ධිම ලැබෙති, ආර්‍ය්‍ය පුද්ගලයෝ වනාහි රූප භූමියෙන් චුතව කාමභූමියෙහි ප්‍රතිසන්ධි නොගනිති, සත්තෙව අනුසයා අනුසෙන්ති යන පාළිය බලා තේරුම් ගත හැකිය.]

රූපධාතුයා – වේහප්ඵලය දක්වා ඇති රූපභූමි (10) දශයෙන් ; චුතස්ස – චුතවූ ; අරූප ධාතුං – අරූප භූමි (4) සතරෙහි ; රූපධාතුයා – අසංඥතල – අකනිට්ඨතල වර්ජිත රූපභූමි (14) දහතරෙන් ; චුතස්ස – චුතවූ ; න කාම ධාතුං – නොම කාමධාතුව වූ අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසෙහි හා අරූප භූමි (4) සතරෙහි ; රූපධාතුයා – සුද්ධාවාස වර්ජිත රූපභූමි (11) , එකොළසෙන් ; චුතස්ස – චුතවූ ; න රූපධාතුං – රූපධාතු නොවූ කාම සුගති භූමි (7) සතෙහි හා අරූප භූමි (4) සතරෙහි ; රූප ධාතුයා – අකනිට්ඨ තල වර්ජිත රූපභූමි (15) පසළොසෙන් ; චුතස්ස – චුත වූ ; න අරූපධාතුං – අරූප ධාතු නොවූ කාමසුගති භූමි (7) සතෙහි හා අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසෙහි ; රූපධාතුයා – අසංඥතල – අකනිට්ඨ තල වර්ජිත වූ රූපභූමි (14) දහතරෙන් ; චුතස්ස – චුත වූ ; න කාමධාතුං න අරූප ධාතුං - අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසෙහි ; රූප ධාතුයා – සුද්ධාවාස වර්ජිත රූපභූමි (11) එකොළසින් ; චුතස්ස – චුතවූ ; න රූප ධාතුං න අරූපධාතුං – කාම සුගති භූමි (7) සතෙහි ; රූප ධාතුයා – වේහප්ඵලය දක්වා ඇති රූපභූමි (10) දශයෙන් ; චුතස්ස – චුතවූ ; න කාමධාතුං න රූපධාතුං – අරූප භූමි (4) සතරෙහි ;

රූප ධාතු මූලය නිමි

## අරූප ධාතු මූලය

අරූප ධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ ; අරූප ධාතුං – අරූප භූමි (4) සතරෙහි ; අරූපධාතුයා - අරූපභූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ ; කාමධාතුං – කාම සුගති භූමි (7) සතෙහි : උපපජ්ජන්තස්ස – ප්‍රතිසන්ධි ගන්නා වූ පුද්ගලයන්ට ; සත්තෙව – සතක්ම වූ ; අනුසයා– අනුශය ධර්මයෝ; අනුසෙන්ති -- අනුසයනය වෙති ;

(මෙහි දී ද ''සත්තෙව'' යන්න බලා පෘථග්ජනයෝම ගනු ලැබෙති; ඔවුන් ත්‍රිහේතුක පෘථග්ජනයෝ ම වෙති. ආර්‍ය්‍යයෝ වනාහි පහතට නො බසිත්.)

අරූප ධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ – පුද්ගලයාට ; රූපධාතුයා – රූප භූමියෙහි ; උප්පත්ති නාම නත්ථි – ප්‍රතිසන්ධි ගැනීමක් නම් නැත්තේය ; හෙට්ඨා – යට භූමියෙහි ; උපපජ්ජමානො – උපදී නුයේ නම් ; කාමධාතුං යෙව – කාමභූමියෙහි පමණක්ම ; උපපජ්ජති – උපදී ; සත්තෙව – සතක්ම වූ ; අනුසයා – අනුශය ධර්මයෝ ; අනුසෙන්ති – අනුසයනය වෙති ; අරූපධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; න කාමධාතුං අරූප භූමි (4) සතරෙහි ;

[ න කාම ධාතුං – යයි කීවේ නමුත් අරූප, භූමි (4) සතරෙන් චුතව රූපාවචර භූමියෙහි නූපදී, එනිසා අරූප භූමි එකින් එක ඉහලට යාම ගත යුතුයි. කුමක් හෙයින් අරූප භූමියෙන් චුතව රූප භූමියෙහි නූපදින්නේ ද යත් – රූපාවචර ප්‍රතිසන්ධියට හේතුවූ රූපාවචර කුසල ධ්‍යානය අරූප භූමියෙහි නොමැති බැවිනි, එනිසා අට්ඨකථාවෙහි ''රූපධාතුයා උප්පත්ති නත්ථි ති කස්මා නත්ථි, උප්පත්ති නිප්ඵාදකස්ස රූපාවචරජ්ඣානස්ස අභාවා, සොහි සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා තං ධාතුං උපපන්නොති නාස්ස තත්ථ රූපාවචරජ්ඣානං අත්ථි, තදභාවා රූපධාතුයං උප්පත්ති නත්ථීති වෙදිතබ්බා', යයි කියන ලදී.

අරූපධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; න රූපධාතුං – කාම සුගති භූමි (7) සතෙහි හා අරූප භූමි (4) සතරෙහි ; අරූපධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; න අරූපධාතුං – කාමසුගති භූමි (7) සතෙහි ; අරූපධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; න කාම-ධාතුයා න අරූප ධාතුයා – රූප භූමියෙහි; උප්පත්ති නාම– ප්‍රතිසන්ධි ගැනීමක් නම් ; නත්ථි – නොමැත. අරූප ධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; න රූපධාතුං න අරූප ධාතුං – කාම සුගති භූමි (7) සතෙහි ; අරූප ධාතුයා – අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ ; න කාමධාතුං න රූප-ධාතුං – අරූප භූමි (4) සතරෙහි ;

අරූපධාතු මූලය නිමි

## න කාමධාතු මූලය

න කාමධාතුයා - සුද්ධාවාස වර්ජිත රූපභූමි (11) එකොළස හා අරූප භූමි (4) සතරෙන් – චුතස්ස – චුත වූ ; කාමධාතුං - කාම සුගති භූමි (7) සතෙහි ; න කාමධාතුයා – අසංඥතල – අකනිට්ඨ තල වර්ජිත රූප භූමි (14) දහතරෙන් හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස - චුතවූ ; රූපධාතුං – අසංඥතල වර්ජිත වූ රූප භූමි (15) පසළොසෙහි ; න කාමධාතුයා – වේහප්ඵලය දක්වා රූප භූමි (10) දසය හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ ; අරූපධාතුං – අරූප

භූමි (4) සතරෙහි ; න කාම ධාතුයා – අසංඥතල අකනිට්ඨ තල වර්ජිත වූ රූප භූමි (14) දහතරෙන් හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; න කාම ධාතුං – අසංඥතල වර්ජිත වූ රූප භූමි (15) පසළොසෙහි හා අරූප භූමි (4) සතරෙහි ; න කාම ධාතුයා – සුද්ධාවාස වර්ජිත රූපභූමි (11) එකොළසින් හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ ; න රූප ධාතුං – කාමසුගති භූමි (7) සත හා අරූප භූමි (4) සතරෙහි ;

න කාමධාතුයා – අකනිට්ඨව වර්ජිත රූප භූමි (15) පසළොසෙන් හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ ; න අරූපධාතුං – කාමසුගති භූමි (7) සත හා අසංඥ තල වර්ජිත රූප භූමි (15) පසළොසෙහි ; න කාම ධාතුයා – අසංඥ තල අකනිට්ඨ තල වර්ජිත, රූප භූමි (14) දහතරෙන් චුතස්ස – චුතවූ ; න කාමධාතුං න අරූප ධාතුං – අසංඥතල වර්ජිත රූප භූමි (15) පසළොසෙහි; න කාමධාතුයා – සුද්ධාවාස වර්ජිත – රූපභූමි (11) එකොළසෙන් හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; න රූප ධාතුං න අරූප ධාතුං – කාම-සුගති භූමි සතෙහි ; න කාම ධාතුයා – වේහප්ඵලය දක්වා ඇති රූප භූමි (10) දශය හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ ; න කාම ධාතුං – න රූපධාතුං – අරූප භූමි (4) සතරෙහි ;

කාම ධාතු මූලය නිමි.

---

# න රූප ධාතු මූලය

න රූපධාතුයා – කාම භූමි (11) එකොළස හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ; කාමධාතුං – කාම භූමි (11) එකොළසෙහි ; න රූප ධාතුයා – කාම සුගති භූමි (7) සත හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ ; අරූප ධාතුං – අරූප භූමි (4) සතරෙහි ; න රූප ධාතුයා – කාම සුගති භූමි (7) සතෙන් හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ; න කාම ධාතුං – රූප භූමි (16) සොළස හා අරූප භූමි (4) සතරෙහි ; න රූපධාතුයා – කාම භූමි එකොළසෙන් හා අරූප භූමි (4) සතරෙන් චුතස්ස – චුතවූ ; න රූපධාතුං – කාම භූමි (11) එකොළස හා අරූප භූමි (4) සතරෙහි ; න රූපධාතුයා - කාම භූමි (11) එකොළස හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ, න අරූප-ධාතුං – කාම භූමි එකොළස හා රූප භූමි (16). සොළසෙහි ; න රූපධාතුයා – කාම සුගති භූමි (7) සතෙන් හා අරූප භූමි සතරෙන් ; චුතස්ස-චුත වූ ; න අරූප ධාතුං - රූප භූමි (16) සොළසෙහි ; න රූපධාතුයා – කාම භූමි (11) එකොළස හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුතවූ, න රූප-

ධාතුං න අරූපධාතුං – කාම භූමි (11) එකොළසෙහි ; න රූපධාතුයා – කාම සුගති භූමි (7) සත හා අරූප භූමි (4) සතරෙන් ; චුතස්ස – චුත වූ, න කාම ධාතුං න රූප ධාතුං – අරූප භූමි (4) සතරෙහි ;

න රූප ධාතු මූලය නිමි

## න අරූප ධාතු මූලය

න අරූප ධාතුයා – කාම භූමි (11) එකොළසින්, හා සුද්ධාවාස වර්ජිත රූපභූමි (11) එකොළසින් ; චුතස්ස – චුත වූ ; කාමධාතුං – කාම භූමි (11) එකොළසෙහි ; න අරූපධාතුයා – කාම් සුගති භූමි (7) සතෙන්, අසංඥතල අකනිට්ඨා තල වර්ජිත රූපභූමි (14) දහතරෙන් ; චුතස්ස – චුත වූ ; රූපධාතුං – රූප භූමි (16) සොළසෙහි ; න අරූප ධාතුයා – කාම සුගති භූමි (7) සතෙන්; වේහප්ඵලය තෙක් ඇති රූප භූමි (10) දශයෙන් ; චුතස්ස – චුත වූ ; අරූප–ධාතුං – අරූප භූමි (4) සතරෙහි ; න අරූපධාතුයා – කාම සුගති භූමි (7) සතෙන් හා අසංඥතල අකනිධා තල වර්ජිත වූ රූප භූමි (14) දහතරෙන්; චුතස්ස – චුත වූ ; න කාම ධාතුං – රූප භූමි (16) සොළසෙහි හා අරූප භූමි (4) සතරෙහි ; න අරූපධාතුයා – කාම භූමි (11) එකොළසෙන් හා සුද්ධාවාස වර්ජිත රූප භූමි (11) එකොළසින් ; චුතස්ස – චුත වූ ; න රූප–ධාතුං – කාම භූමි (11) එකොළසෙහි හා අරූප භූමි (4) සතරෙහි ; න අරූප ධාතුයා – කාම භූමි (11) එකොළසින් හා අකනිට්ඨා තල වර්ජිත රූපභූමි (15) පසළොසින් :– චුතස්ස – චුත වූ ; න අරූපධාතුං – කාමභූමි (11) එකොළ–සෙහි හා රූප භූමි (16) සොළසෙහි ; න අරූපධාතුයා – කාමසුගති භූමි (7) සතෙන් හා , අසංඥතල අකනිට්ඨා තල වර්ජිත රූපභූමි (14) දහතරෙන් ; චුතස්ස – චුතවූ ; න කාමධාතුං න අරූපධාතුං – රූපභූමි (16) සොළසෙහි ; න අරූප ධාතුයා – කාමභූමි (11) එකොළසෙන් හා සුද්ධාවාස වර්ජිත රූප–භූමි (11] එකොළසෙන් ; චුතස්ස – චුත වූ ; න රූපධාතුං න අරූපධාතුං - කාම භූමි (11) එකොළසෙහි ; න අරූප ධාතුයා - කාම සුගති භූමි (7) සතෙන් හා වේහප්ඵලය තෙක් ඇති රූප භූමි (10) දශයෙන් ; චුතස්ස – චුත වූ ; නකාම–ධාතුං න රූප ධාතුං – අරූප භූමි (4) සතරෙහි ; **න අරූප ධාතු මූලය නිමි.**

(මේ ක්‍රමය ආශ්‍රය කොට සියල්ල කියනු).

## නිගමනය

බුරුම රට වන්වපෙන් පෙදෙසෙහි විසූ නන්දමෙධාභිධාන මහාථෙර පරපුරෙහි උද්ග්‍රහණය කරන ලද වවුන්භිලූ සෙයාඩෝ අනන්තධජ මහා රාජගුරු මාහිමියන් වහන්සේ විසින් රචිත අනුසය යමකයෙහි අර්ථ අධිප්‍රාය හා ස්වරූප කථනය නිම විය.

තෙභූමකෙ – කාම රූප අරූප යන භූමිත්‍රයෙහි ඇතුළත් වූ ; සත්තෙ – සත්වයන් ; නිබද්ධං – නිරන්තරයෙන් : (මේ පාඨ ශේෂයකි) කාම රාගාදිකං කාමරාගාදි වූ ; වා – නොහොත් ; කාමරාග – පටිඝ – මාන – දිට්ඨි – විචිකිච්ඡා – භවරාග – අවිජ්ජා නම් වූ, සත්තානුසයං – සතක් වූ අනුසය ධර්ම ; අරහත්ත මග්ගෙන – එක්දහස් පන්සියයක් පමණ වූ කෙලශයන් සිඳලන අර්හත් මාර්ගයෙන් ; (මෙයද පාඨශේෂයකි) පජහන්තෙන – නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කරන්නා වූ ; බුද්ධෙන – දුක්ඛය සමුදය යනාදී සකල ධර්මයන් පරෝපදේශ රහිතව සවයම්භූ ඥානයෙන් දැන වදාළ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් ; විවිධා විවිධ නයා– අනේක විවිධ නය විශේෂ ඇත්තා වූ ; චිත්තා – විචිත්‍ර වූ; යෙ යමකා – යම් යමක කෙනෙක් ; වා – යෙව යමකා – යමක ප්පකරණා ච – මූල, ඛන්ධ යනාදී යම් (10) දශයක් වූ යමකයෝ ; දෙසිතා – ශ්‍රී මුඛ දේශනාවෙන් වදරණ ලද්දා හු ද ; පරියත්‍යාදි ඉච්ඡන්තා – උද්ග්‍රහණ ධාරණාදී වශයෙන් දියුණුව කැමති වූ ; කුලපුත්තා – උතුම් කුලපුත්‍රයෝ ; ඉමං නිස්සයං – මේ යමක ප්‍රකරණ සවරූප කථන ග්‍රන්ථය; යථා සුඛං – සුවසේ ; පස්සන්තුව – ප්‍රඥා චක්ෂුසින්ද දකිත්වා. වා– නොහොත් ; පියවියෙන් ප්‍රසාද චක්ෂුසින් බලාද නුවණින් දකිත්වා, සික්ඛන්තුව – උද්ග්‍රහණ වශයෙන් ප්‍රගුණ කරත්වා. ධාරයන්තුව - සිත්හි ධරා ගෙන උගත් අයුරින් ම උගෙනීම උගැන් වීමද කෙරෙත්වා.

මෙතෙකින් අනුසය යමක සවරූප කථනය නිමියේය.

# 8 – චිත්ත යමකය

''නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස''

## උද්දේශ වාරය

අනුශය යමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව චිත්තයමකය දේශනා කළ සේක. ඒ චිත්ත යමකය ද උද්දේශ නිර්දේශ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේශය පළමු කොට වදාළ සේක. ඒ උද්දේශය ද, සුද්ධ චිත්ත සාමඤ්ඤ සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂ–අභිධර්ම චිත්ත මිශ්‍රක විශේෂ වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් සුද්ධ චිත්ත සාමඤ්ඤය පළමු කොට වදාළ සේක. ඒ සුද්ධ චිත්ත සාමඤ්ඤය ද පුද්ගල වාර, ධර්ම වාර, පුද්ගල ධර්මවාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදාළසේක. ඒ පුද්ගල වාරය ද උත්පාද–නිරෝධ කාලසම්භේද වාරය, උත්පාදෝත්පන්න වාරය, නිරෝධෝත්පන්න වාරය, උත්පාද වාරය, නිරෝධ වාරය, උත්පාද නිරෝධ වාරය, උප්පජ්ජමාන–නනිරෝධවාරය, උප්පජ්ජමානුප්පන්න වාරය, නිරුජ්ඣමානුප්පන්න වාරය උප්පන්නුප්පාද වාරය, අතීතානාගත වාරය, උප්පන්නුප්පජ්ජමාන වාරය, නිරුද්ධ නිරුජ්ඣමාන වාරය, අතික්කන්තකාල වාර වශයෙන් (14) දහතර වැදෑරුම් වන්නේය.

ඒ (14) දහතර අතුරෙන් උත්පාද නිරෝධ කාලසම්භේද වාරය පළමු කොට වදාළ සේක. ඒ උත්පාද නිරෝධ කාලසම්භේද වාරය ද, අනුලෝම – ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදාළ සේක. ඒ අනුලෝමය ද අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදාළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන – සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සනින්ට්ඨානය පළමු කොට වදාළ සේක. **කෙසේ වදාළසේක ද යත්**, ''**යස්ස** චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදාළ සේක. **ඒ කෙසේද යත්** ''තස්ස චිත්තං නිරුජ්ඣිස්සති, න උප්පජ්ජිස්සති යනුවෙනි, ''යස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති'' යනු සන්නිට්ඨානයයි. ''තස්ස චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති'' යනු සංසයයි. සන්නිට්ඨාන සංසය දෙපදය එකතුවෙන් අනුලෝම පුච්ඡාව සෑදේ.

අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව පටිලෝම පුච්ඡාව වදළ සේක. ඒ පටිලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. **ඒ කෙසේ ද යත්** ''යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති,'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. **ඒ කෙසේ ද යත්** ''තස්ස චිත්තං උප්ජ්ජිස්සති න නිරුජ්ඣති'' යනුවෙනි. සන්නිට්ඨාන සංසය දෙපදය එකතුවෙන් පටිලෝම පුච්ඡාව නිපදේ. අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡ දෙපදය එකතු වීමෙන් උත්පාද නිරෝධ කාලසම්භෙද වාර අනුලෝමයෙහි එක යමකය ක් නිපදේ.

අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍යකය වදළ සේක. ඒ ප්‍රත්‍යනිකය ද අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. **ඒ කෙසේ ද යත්** ''යස්ස චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. **ඒ කෙසේ ද යත්** – ''තස්ස චිත්තං න නිරුජ්ඣිස්සති **උප්පජ්ජිස්සති**'' යනුවෙනි (අනුලෝමය මෙන් **කියනු**).

අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව පටිලෝම පුච්ඡාව වදළ සේක. **ඒ කෙසේ ද යත්** – ''යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති, තස්ස චිත්තං න උප්පජ්ජිති නිරුජ්ඣති'' යනුවෙනි. අනුලෝම පුච්ඡා පටිලෝම පුච්ඡා දෙකෙහි එකතුව උත්පාද නිරෝධ කාලසම්භෙද වාර ප්‍රත්‍යනිකයෙහි එක් යමකයෙක් වන්නේ ය. අනුලෝම ප්‍රත්‍යනික දෙක එකතු-වෙන් උත්පාද නිරෝධ කාලසම්භෙද වාරයෙහි යමක (2) දෙක පුච්ඡා (4) සතර හා අර්ථ (8) අට ලැබෙන්නා හ.

[ කුමක් හෙයින් උත්පාද නිරෝධ කාලසම්භෙද වාරය නම් කියනු ලැබේද යත්, උත්පාදය හා භංගය ද වර්තමාන කාලය හා අනාගත කාලය ද මිශ්‍ර කොට වදළ බැවින් උත්පාද නිරෝධ කාලසම්භෙද වාර නම් වේ. මේ නය ක්‍රමයට අනුව අතික්කන්ත කාල වාරය දක්වා කියනු ]

මෙසේ පුද්ගල වාරයෙහි කුඩාවාර (14) දහතරෙකි. යමක (42) දෙසාලි සෙකි. පුච්ඡා (84) සූ අසූවෙකි. අර්ථ (168) එක්සිය අටසැටෙක් ද ලැබෙන්නාහ.

ඉන් අනතුරුව ධම්ම වාරය වදළ සේක. ඒ ධම්ම වාරය ද (පුද්ගල වාරය අනුව කියනු.) මෙසේ ධර්ම වාරයෙහි කුඩාවාර (14) දහතරෙකි. යමක (42) දෙසාලිසෙකි. පුච්ඡා (84) සූ අසූ**වකි**. අර්ථ (168) එකසිය අට සැටෙක් ලැබෙන්නාහ. [ පුද්ගල ධර්ම වාරයෙහි ද මේ නය ක්‍රමයට අනුව ලැබේ. )

මෙසේ **සුද්ධ** චිත්ත සාමඤ්ඤයෙහි මහාවාර (3) තුනෙකි. කුඩාවාර (42) දෙසාලිසෙකි. යමක (126) එකසිය විසි හයෙකි. පුච්ඡා (252) දෙසිය පණස් දෙකෙකි. අර්ථ (504) පන්සිය සතරෙක් ලැබෙන්නාහ.

ද්වෙ පඤ්ඤාස අතීතානි - ද්වෙ පුච්ඡා සතානිච
සුද්ධෙ චිත්ත යමකෙ – වාරෙ භවන්ති සංඛ්‍යතො,

සුද්ධ චිත්ත සාමඤ්ඤය නිමි.

---

## සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂ

සුද්ධ චිත්ත සාමඤ්ඤය දේශනාකොට වදරා ඉන් අනතුරුව සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂය වදළ සේක. ඒ සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂය ද සරාග පද මිශ්‍රක විතරාග පද මිශ්‍රක, සදෝස පද මිශ්‍රක, විතදෝස පද මිශ්‍රක, සමෝහ පද මිශ්‍රක, වීත මෝහ පද මිශ්‍රක, සංඛිත්ත පද මිශ්‍රක, වික්ඛිත්ත පද මිශ්‍රක, මහග්ගත පද මිශ්‍රක, අමහග්ගත පද මිශ්‍රක, උත්තර පද මිශ්‍රක, අනුත්තර පද මිශ්‍රක, සමාහිත පද මිශ්‍රක, අසමාහිත පද මිශ්‍රක, විමුත්ත පද මිශ්‍රක, අවිමුත්ත පද මිශ්‍රක වශයෙන් (16) දසය වැදෑරුම් වන්නේය. ඒ (16) දසය අතුරෙන් සරාග පද මිශ්‍රකය පළමු කොට වදළ සේක. ඒ සරාග පද මිශ්‍රකය ද පුද්ගල වාර, ධම්ම වාර, පුද්ගල ධම්ම වාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරය ද උත්පාද නිරෝධ කාලසම්භෙද වාර ආදී වශයෙන් (14) දහතර වැදෑරුම් වන්නේය. ඒ (14) දහතර අතුරෙන් උත්පාදනිරෝධ කාලසම්භෙද වාරය පළමු කොට වදළ සේක. එය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක.

**කෙසේ වදළ සේක් ද යත්** - ''යස්ස සරාග චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, තස්ස සරාග චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති, **යස්ස** වා **පන** සරාග චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති, තස්ස සාරාග චිත්තං උප්පජ්ජති නා නිරුජ්ඣති.'' යනුවෙනි.

අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක. **ඒ කෙසේ ද යත්** - ''යස්ස සරාග චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති තස්ස සරාග චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති. **යස්ස වා පන** සරාග චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති. තස්ස සරාග චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති'' යනුවෙනි.

මෙසේ උප්පාද නිරෝධ කාලසම්භෙද වාරයෙහි යමක (2) දෙකකි. පුච්ඡා (4) සතරකි අර්ථ (8) අටකි. [මේ නය ක්‍රමයට අනුව උත්පාදෝත්පන්න වාර ආදි වාර (13) දහතුන ම කියනු] මෙසේ පුද්ගල වාරයෙහි කුඩාවාර (14) දහතරෙකි. යමක (42) දෙසාලිසෙකි. පුච්ඡා (84) සූ අසූවෙකි. අර්ථ (168) එකසිය හැට අටෙක් ලැබෙති. [ධර්ම වාරයෙහි ද ඒ හා සමාන ය. පුද්ගල ධර්ම වාරයෙහි ද එසේම ලැබෙති.] මෙසේ සරාග පද මිශකයෙහි මහා වාර (3) තුනෙකි. කුඩා වාර (42) දෙසාලිසෙකි. යමක (126) එකසිය විසි හයෙකි. පුච්ඡා (252) දෙසිය පණස් දෙකෙකි. අර්ථ (504) පන්සිය හතරෙක් ලැබෙති. මීට සමානව, වීතරාග පද මිශ්‍රක යනාදියෙහි ද වෙන වෙනම ලැබෙන්නාහ. මෙසේ සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂයෙහි පද (16) සොළසෙකි. මහාවාර (48) හතලිස් අටෙකි. කුඩා වාර (672) හයසිය දෙසැත්තෑවෙකි. යමක (2016) දෙදහස් දසයෙකි. පුච්ඡා (4032) සාරදස් තිස් දෙකෙකි. අර්ථ (8064) අටදස් හැට හතරෙක් ලැබෙති.

**ද්වත්තිංස පුච්ඡාධිකානි - චත්තාරි සහස්සා නිච**
**සරාගා දි මිස්සකම්හි - වාරෙ හවන්ති සංඛ්‍යතා,**

[ලෝභමූල චිත්තෝපාද (8) අට සරාග චිත්ත නම්. ඉතිරි (81) ඒකාසූ චිත්තය වීතරාග නම්. ද්වේෂ මූල චිත්තෝත්පාද (2) දෙක සදෙස චිත්ත නම්. ඒ දෙක හැර ඉතිරි (87) සත් අසූ චිත්තය වීතදෙස නම්. මෝහ මූල චිත්තෝත්පාද (2) දෙක සමෝහ චිත්ත නම්. ඒ දෙක හැර ඉතිරි (87) සත් අසූ චිත්තය වීතමෝහ නම්, සසංඛාරික අකුසල චිත්තෝත්පාද (5) පස සංඛිත්ත චිත්ත නම්. උද්ධච්ච සහගත චිත්තය වික්ඛිත්ත නම්. රූපාවචර අරූපාවචර චිත්තෝත්පාද (27) සත්විස්ස මහග්ගත නම්. ඒ (27) සත්විස්ස හැර ඉතිරි සිත් (62) දෙසැට අමහග්ගත චිත්ත නම්. ලෞකික සිත් (81) එක් අසූව ස උත්තර චිත්ත නම්. ඉතිරි ලෝකෝත්තර සිත් (8) අට අනුත්තර නම්. මහග්ගත ලෝකෝත්තර සිත් (35) පන්තිස සමාහිත චිත්ත නම්. කාමාවචර සිත් (54) පණස්හතර අසමාහිත නම්. ලෝකෝත්තර සිත් (8) අට විමුත්ත චිත්ත නම්. ලෞකික සිත් (81) අසූ එක අවිමුත්ත චිත්ත නම්. මහා සති-පට්ඨාන සූත්‍රාර්ථකථාව හා විශුද්ධිමාර්ගාර්ථ කථාව ද බලා ඒ චිත්තයන්ගේ ස්වරූප හා සංඛ්‍යාව ගත යුතුයි.]

සූත්‍රාන්ත මිශ්‍රක විශේෂය නිමි.

## අභිධර්ම චිත්ත මිශ්‍රක විශේෂ

සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂය දේශනා කොට වදරා ඉන් අනතුරුව අභිධර්ම චිත්ත මිශ්‍රක විශේෂය වදළ සේක. ඒ අභිධර්ම චිත්ත මිශ්‍රක විශේෂය ද ත්‍රික මාතෘකා උද්දේශය, දුක මාතෘකා උද්දේශය වශයෙන් දෙවැදෑරුම්, වන්නේය. ඒ දෙක අතුරෙන් ත්‍රික මාතෘකා උද්දේශය පළමු කොට වදළ සේක. ඒ ත්‍රික මාතෘකා උද්දේශය ද කුසල ත්‍රික වේදනා ත්‍රික ආදී වශයෙන් (22) දෙවිසි වැදෑරුම් වන්නේය. ඒ (22) දෙවිස්ස අතුරෙන් කුසල ත්‍රිකය පළමු කොට වදළ සේක. ඒ කුසල ත්‍රිකය ද කුසල පද, අකුසල පද, අව්‍යාකෘත පද වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් කුසල පදය පළමු කොට වදළ සේක. ඒ කුසල පදයද පුද්ගලවාර, ධර්මවාර, පුද්ගල ධර්මවාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරය ද උත්පාද නිරෝධ කාලසම්භෙද වාර ආදී වශයෙන් (14) දහතර වැදෑරුම් වන්නේය.

ඒ (14) දහතර අතුරෙන් උත්පාද නිරෝධ කාලසම්භෙද වාරය පළමු කොට වදළ සේක. ඒ උත්පාද නිරෝධ කාලසම්භෙද වාරය ද අනුලෝම ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. **කෙසේ වදළ සේක් ද යත්** ''යස්ස කුසලං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, තස්ස කුසලං චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති, **යස්ස වා පන** කුසලං චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති, තස්ස කුසලං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති:'' යනුවෙනි.

ඉන් පසු ප්‍රත්‍යනිකය වදළ සේක. ඒ **කෙසේ ද යත්**, **යස්ස** කුසලං-චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති, තස්ස කුසලං චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති, **යස්ස වා පන** කුසලං චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති, තස්ස කුසලං චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති'' යනුවෙනි. මේ අයුරෙන් උත්පාද නිරෝධ කාලසම්භෙද වාරයෙහි යමක (2) දෙකෙකි. පුච්ඡා (4) සතරෙකි. අර්ථ (8) අටෙක් ද වෙති. (මේ හා සමානව උත්පාදෝත්පන්න වාර ආදී වාර (13) තෙළෙස කියනු).

මෙසේ පුද්ගල වාරයෙහි කුඩා වාර (14) දහතරෙකි. යමක (42) සතලිස් දෙකෙකි. පුච්ඡා (84) සූ අසූවෙකි. අර්ථ (168) එකසිය සැට අටෙක් ද ලැබෙති. [ ධර්ම වාරයෙහි ද ඒ හා සමානය. පුද්ගල ධර්ම වාරයෙහි ද එසේ ම ය ] මෙසේ කුසල පදයෙහි මහා වාර (3) තුනෙකි. කුඩා වාර (42) සතලිස් දෙකෙකි. යමක (126) එකසිය විසි හයෙකි. පුච්ඡා (252) දෙසිය පණස් දෙකෙකි. අර්ථ (504) පන්සිය සතරෙක් ලැබෙති. [ ඒ හා සමානව

අකුසල පද, අව්‍යාකෘත පදයන් හි ද වෙන වෙනම ලැබෙති.] මෙසේ කුසල ත්‍රිකයෙහි පද (3) තුනකි. මහා වාර (9) නවයෙකි. කුඩා වාර (126) එකසිය විසි හයෙකි. යමක (373) තුන්සිය හැත්තෑ අටෙකි. පුච්ඡා (756) සත්සිය පණස් හයෙකි. අර්ථ (1512) එක්දහස් පන්සිය දොළසෙක් ලැබෙති.

කුසල ත්‍රිකය දේශනා කොට වදරා ඉන් අනතුරුව වේදනා ත්‍රිකය වදළ සේක. [කුසල ත්‍රිකය මෙන් අවසාන ත්‍රිකය දක්වා කියනු] මෙසේ ත්‍රික මාතෘකා උද්දේශයෙහි පද (66) සැට සයෙකි. මහා වාර (198) එකසිය අනූ අටෙකි. කුඩා වාර (2772) දෙදහස් සත්සිය සැත්තෑ දෙකෙකි. යමක (8316) අටදහස් තුන්සිය දහසයෙකි. පුච්ඡා (16632) දහසය දහස් හයසිය තිස් දෙකෙකි. අර්ථ (33264) තිස් තුන් දහස් දෙසිය සැටසතරෙක් වෙති.

ත්‍රික මාතෘකා උද්දේශය නිමි.

---

ත්‍රික මාතෘකා උද්දේශය දේශනා කොට වදරා ඉන් අනතුරුව දුක **මාතෘකා උද්දේශය** වදළ සේක. ඒ දුක මාතෘකා උද්දේශය ද හේතු ගොච්ඡක යනාදි වශයෙන් (13) තෙළෙස් වැදෑරුම් වන්නේය. ඒ (13) තෙළෙස අතුරෙන් හේතු ගොච්ඡකය පළමු කොට වදළ සේක. ඒ හේතු ගොච්ඡකය ද හේතු දුක යනාදි වශයෙන් (6) සයවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් හේතු දුකය පළමු කොට වදළ සේක. [මේ ආදි ක්‍රමයට සරණ දුකය දක්වා කියනු] මෙසේ දුක මාතෘකා උද්දේශයෙහි පද (200) දෙසියයෙකි. මහා වාර (600) හයසියයෙකි. කුඩා වාර (8400) අටදහස් සාර සියයෙකි. යමක (12600) දොළොස් දහස් හය සියයෙකි. පුච්ඡා (25200) විසිපන්දහස් දෙසියයෙකි. අර්ථ (50400) පණස් දහස් සාරසියයෙක් වෙති. මෙසේ චිත්ත යමකයා ගේ මාතෘකා නය ක්‍රමයන්හි යමක (35658) තිස්පන්දහස් හයසිය පණස් අටෙකි. පුච්ඡා (71316) සැත්තෑ එක් දහස් තුන්සිය දහසයෙකි. අර්ථ (142632) එක් ලක්ෂ සතලිස් දෙදහස් හයසිය තිස් දෙකක් වෙති.

**එක සත්තති සහස්සං - තිසතං සොළසුත්තරං**
**සබ්බෙසං චිත්ත යමකෙ - පුච්ඡානං සංඛ්‍ය මුද්දිංසෙ**

රූප පමණක් ලැබි චිත්ත චෛතසික නොලැබෙන පදයක් මෝඝ පුච්ඡා වශයෙන් වදරණ ලදී. එහිසා **අට්ඨකථාවෙහි** "යානි පනෙත්ථ සනිදස්සනාදීනි පදානි චිත්තෙන සද්ධිං න නිරුජ්ඣන්ති, තානි මොඝ පුච්ඡා වසෙන ඨපිතානි" යයි කියන ලදී.

# නිද්දේස පුද්ගල වාරය

උද්දේශය දේශනා කොට වදරා ඉන් අනතුරුව නිර්දේශය වදළ සේක. ඒ නිර්දේශය ද සුද්ධ චිත්ත සාමඤ්ඤ – සූත්‍රාන්ත චිත්ත මිශ්‍රක විශේෂ, අභිධර්ම චිත්ත මිශ්‍රක විශේෂ වශයෙන් තුන්වැදෑරුම් වන්නේ ය. ඒ තුන අතුරෙන් සුද්ධ චිත්ත සාමඤ්ඤය පළමු කොට වදළ සේක. ඒ සුද්ධ චිත්ත සාමඤ්ඤය ද පුද්ගල වාරය, ධම්ම වාරය, පුද්ගල ධම්ම වාරය වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරය ද උත්පාද නිරෝධ කාලසම්භෙද වාරාදී වශයෙන් (14) දහතර වැදෑරුම් වන්නේය. ඒ (14) දහතර අතුරෙන් උත්පාද නිරෝධ කාලසම්භෙද වාරය පළමු කොට වදළ සේක. ඒ උත්පාද නිරෝධ කාලසම්භෙද වාරය ද අනුලෝම ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද අනුලෝම ප්‍රති ලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද පුච්ඡා, විස්සජ්ජනා, වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාවද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක.

කෙසේ වදළ සේක් ද යත් – ''යස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති' යනු වෙනි. ඉන් පසු සංසය වදළ සේක. ඒ **කෙසේ ද යත්** – ''තස්ස චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති'' යනුවෙනි. පුච්ඡාව වදරා ඉන් අනතුරුව විස්සර්ජනාව වදළ සේක. ඒ **කෙසේ ද යත්** - ''පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති. ඉතරෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති. න නිරුජ්ඣිස්සති චෙව උප්පජ්ජිස්සති ච'' යනුවෙනි. අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රතිලෝමය වදළ සේක. ඒ ප්‍රතිලෝමය ද පුච්ඡා විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. ඒ **කෙසේ ද යත්** - ''**යස්ස වා පන** චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. එ **කෙසේ ද යත්** ''තස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති'' යනුවෙනි. පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව විස්සර්ජනාව වදළ සේක. ඒ **කෙසේ ද යත්** - ''ආමන්තා'' යනුවෙනි.

යස්ස, - යම් පුද්ගලයකුට, චිත්තං, - චිත්තයක්, - උප්පජ්ජති, - උපදිමින්, පවතී. න නිරුජ්ඣති, - නොම නිරුද්ධ වේ. තස්ස, - ඒ පුද්ගලයාගේ, චිත්තං, - චිත්තය, නිරුජ්ඣිස්සති, - මතු නිරුද්ධ වන්නේ ද, න උප්පජ්ජිස්සති, - මතු නොම උපදින්නේ ද යි ඉති පුච්ඡායං සති, - මෙවැනි පැනයෙක් ඇති කල්හි පච්ඡිම චිත්තස්ස, - පශ්චිම චිත්තයාගේ, - උප්පාදක්ඛණෙ, - උත්පාද ක්ෂණයෙහි, වත්තමානානං, - පවත්නා වූ , තෙසං - ඒ පුද්ගලයන්ගේ, චිත්තං, - චිත්තය, - උප්පජ්ජති, - උපදිමින් පවතී. න නිරුජ්ඣති, - නොම නිරුද්ධ වේ. නිරුජ්ඣිස්සති,- මතු නිරුද්ධ වන්නේය. න උප්පජ්ජිස්සති මතු නොම උපදින්නේය. ඉතරෙසං, - පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූවන්ගෙන් අන්‍ය වූ පුද්ගලයන්ගේ, - චිත්තස්ස, - චිත්තයාගේ ; උප්පාදක්ඛණෙ, - උත්පාදක්ෂණයෙහි, තෙසං, - ඒ පුද්ගලයන්ගේ, චිත්තං, - චිත්තය,- උප්පජ්ජති, - උපදිමින් පවතී, න නිරුජ්ඣති, - නිරුද්ධ වෙමින් නොපවතී. නිරුජ්ඣිස්සති චෙව, - මතු නිරුද්ධ වන්නේ ද වේ. උප්පජ්ජිස්සති ච, - මතු උපදින්නේ ද වේ. (ප්‍රතිලෝමයෙහි අර්ථ සුගමයි).

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - පශ්චිම චිත්තයාගේ උත්පාද ක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථයන් හැර, සියලු චිත්තයන්ගේ උත්පාද ක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සිව්දෙනා හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනා ගනු ලැබෙති. ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස, නම් වූ පශ්චිම චිත්තයන් ගේ උත්පාද ක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපය** පෙර සේම ලැබේ.

## කොටස් බෙදා දැක්වීම

එසේ ලැබෙන බැවින් යම් කිසි පුද්ගලයකුට සිත උපදිමින් ඇත. නිරුද්ධ නොවමින් ඇත. ඒ පුද්ගලයාගේ සිත මතු නිරුද්ධ වන්නේ ද, නොම නිරුද්ධ වන්නේ දයි සර්වඥයන් වහන්සේට කෙසේ කෙසේ ද යන විමතියෙක් නොමැත. එහෙත් වෛනෙයාධ්‍යාශයාගේ වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති (4) සතර අතුරෙන් පුරේ පඤ්හා - පුච්ඡා පඤ්හා යන දෙකෙහි ලක්ෂණ යෙන් මිශ්‍ර වූ පරිපූර්ණ ප්‍රශ්නයාගේ වශයෙන් ප්‍රශ්නයට අනුරූපව, සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථම ඇත. සංසය පදයාගේ ස්වරූපාර්ථය ලැබිය නොහෙන බැවින් පශ්චිම චිත්තයාගේ උත්පාද ක්ෂණ සමංගී වූ පුද්ගලයන් හැර සියලු චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනා පළමු කොටසට වෙන්කර ගනු ලැබෙති. සන්නිට්ඨාන සංසය දෙපදයාගේ ම ස්වරූපාර්ථය වූ පශ්චිම චිත්තයාගේ උත්පාද ක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා පශ්චිම කොට්ඨාශයට බෙදා ගන්නා ලදී. මෙසේ දිය යුතු පිළිතුර නොදී, ''ඉතරෙසං'' යන පාඨයන් අවශේෂය

සුවසේ දැන ගැනීම පිණිස සන්නිට්ඨාන සංසය දෙපදයාගේ සවරූපාර්ථ වූ පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් එලසථ ආයුෂ්‍ය පුද්ගලයා "පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණේ තෙසං චිත්තං උප්පජ්ජති න-නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති" යයි පළමු කොටස බෙද, සන්නිට්ඨාන පදයාගේ ස්වරූප අර්ථයම ඇතිව සංසය පදයාගේ සවරූප නොමැතිව පශ්චිම චිත්තයාගේ උත්පාද ක්ෂණ සමංගී පුද්ගලයා හැර සියලු චිත්තයන්ගේ උත්පාද ක්ෂණ සමංගී පුද්ගලයා "ඉතරෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජති, න නිරුජ්ඣති නිරුජ්ඣිස්සති චෙව උප්පජ්ජිස්සති ච" යි පශ්චිම කොට්ඨාශය බෙද පිළිතුරු පස අතුරෙන් පූර්ව පශ්චිම කොට්ඨාශ දෙකේම සවරූප දක්වීම් වශයෙන් **ස්වරූප දර්ශන විස්සර්ජනා** වශයෙන් පිළිතුරු වදරණ ලදී. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, ත්‍රිහේතුක චුති තෙලෙස නම් වූ පශ්චිම චිත්තයාගේ උත්පාද ක්ෂණ සමංගී නම් වූ අර්හත් එලසථ ආයුෂ්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය ද එසේමය** (ප්‍රතිවචනයි).

අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍යනිකය වදළ සේක. **කෙසේ ද යත්** – "**යස්ස** චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති, තස්ස චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සතීති, නො, **යස්ස වා පන** – නත්ථි "අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, සියලු ම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා හා ආයුෂ්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. සංසය පද සවරූප නොමැති, (ප්‍රතිෂේධයි).

## කොටස් බෙද දැක්වීම

ප්‍රතිලෝමයෙහි සිත් මතු නිරුද්ධ නොවන්නා වූ උපදින්නා වූ කෙනෙක් නොමැත. එනිසා සන්නිට්ඨාන පදයාගේ සවරූප නොමැත. එසේ සන්නිට්ඨාන පදයාගේ සවරූපාර්ථ නොමැති නම් සංසය පදයාගේ ද සවරූපාර්ථ නොමැත. එසේ සන්නිට්ඨාන සංසය දෙපදයාගේ සවරූපාර්ථ නොමැති බැවින් යම් පුද්ගලයකුට සිත මතු නිරුද්ධ නොවන්නේය. උපදින්නේය. ඒ සිත මතු නිරුද්ධ නොවන්නා වූ උපදින්නා වූ පුද්ගලයාට සිත උපදිමින් නොමැත. නිරුද්ධ වෙමින් ඇත්තේද යි සර්වඥයන් වහන්සේට විමතියෙක් නොමැත. වේනෙය්‍යාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති (4) සතර අතුරෙන් මෝඝ ප්‍රශ්නයාගේ වශයෙන් අසන ලද ප්‍රශ්නයට අනුරූපව සන්නිට්ඨාන පදයාගේ සවරූපාර්ථ ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් පිළිතුරු (5) පස අතුරෙන් "නත්ථි" යන ප්‍රතිෂේධ විස්සර්ජනාවෙන් පිළිතුරු වදරණ ලදී.

උත්පාද නිරොධ කාලසම්භෙද වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව උත්පාදෝත්පන්න වාරය වදළ සේක. ඒ උත්පාදෝත්පන්න වාරය ද අනුලෝමය ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේ. ඒ දෙක අතුරෙන් අනු-

ලෝමය පළමු කොට වදළ සේක. **කෙසේ ද යත්** – ''යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං උප්පන්නන්ති, ආමන්තා, **යස්ස වා පන** – චිත්තස්ස භංගක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං නොච තෙසං චිත්තං උප්පජ්ජති. චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං චෙව උප්පජ්ජති ච.''

යස්ස, – යම් පුද්ගලයකුට ; චිත්තං, – සිතක්, උප්පජ්ජති, – උපදිමින් පවතී. තස්ස, – ඒ පුද්ගලයාට, චිත්තං, – සිතක් ද උප්පන්නං, – ක්ෂණත්‍රයට පත් වූයේ ද යි ; මෙසේ යෙදිය හැකිය. (තවත් ක්‍රමයක්) උප්පන්නං – වර්තමානව උපන්නේ වේ ද ; අනුලොමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සියලුම චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. **සංසය** ද එසේමය ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සිවු දෙනා හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ. **ප්‍රත්‍යනීක අනුලෝමයෙහි** ''චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, නිරෝධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං'' **යස්ස වා පන** ආමන්තා.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. නිරොධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආයර්‍ය පුද්ගලයෝ ද අසංඥ සත්ව පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේම ලැබේ.

**නිරෝධුප්පන්න වාරයෙහි** ''යස්ස චිත්තං නිරුජ්ඣති, තස්ස චිත්තං උප්පන්නන්ති, ආමන්තා, යස්ස වා පන, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තස්ස භංගක්ඛණෙ තෙසං [ උත්පාදෝත්පන්න වාරය සමග මාරු කොට කියනු ] ප්‍රත්‍යනීක සංසය ද ''නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං.''

**උත්පාදවාර වාරයෙහි** – වර්තමානාතීත වාර, වර්තමානානාගත වාර, අතීතානාගත වාර වශයෙන් තුන්වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් වර්තමානාතීත වාරය පළමු කොට වදළ සේක. **කෙසේද යත්** – ''යස්ස චිත්තං උප්පජ්ජති, තස්ස චිත්තං උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන – චිත්තස්ස භංගක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං.''

ප්‍රතිලෝමයෙහි සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ය. ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආයර්‍ය පුද්ගලයන් හා අසංඥසත්ත්ව පුද්ගලයෝ

ගනු ලැබෙති. සියලුම චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සිවුදෙනා හා ආර්‍ය්‍ය පුද්ගලයෝ (8) අට දෙනා ද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේම ලැබෙ.

ප්‍රත්‍යනිකයෙහි – අනුලෝමය – පාලිය අනුවය, ප්‍රතිලෝමයෙහි 'නත්ථි' වර්තමානානාගත වාරයෙහි "යස්ස චිත්තං උප්පජ්ජති, තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති, පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරේසං චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, යස්ස වා පන චිත්තස්ස භංගක්ඛණෙ නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං," අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ ත්‍රිහෙතුක චුති (13) තෙළෙස නම් වූ පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. පශ්චිම චිත්තය හැර සියලු චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී පෘථග්ජන (4) සතර දෙනා හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ද ගනු ලැබෙති.

**ප්‍රතිලෝමයෙහි** පශ්චිම චිත්තය හැර සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී පෘථග්ජන (4) සතර දෙනාය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය. නිරෝධ සමාපත්ති සමාපන්න වූ අනාගාමි අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයන් හා අසංඥ සත්ත්ව පුද්ගලයන් ගනු ලැබෙති. ප්‍රත්‍යනික අනුලෝමයෙහි "චිත්තස්ස, භංගක්ඛණෙ, නිරොධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං තෙසං, පච්ඡිම, චිත්තස්ස භංගක්ඛණෙ තෙසං," ප්‍රතිලෝමයෙහි "පච්ඡිම චිත්තස්ය උප්පාදක්ඛණෙ තෙසං (පෙර සේ කියනු).

අතීතානාගත වාරයෙහි "යස්ස චිත්තං උප්පජ්ජිත්ථ, තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති, පච්ඡිම චිත්ත සමංගීනං තෙසං, ඉතරෙසං තෙසං, යස්ස වා පන ආමන්තා" ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස නම් වූ පශ්චිම චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. පශ්චිම චිත්තය හැර සියලු චිත්තයන්ගේ ක්ෂණද්‍වය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය. නිරෝධ සමාපත්ති සමාපන්න අනාගාමි අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයන් හා අසංඥ සත්ත්ව පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර මෙනි. ප්‍රතිලෝමයෙහි පෙර **සංසය** සවරූප ගනු ලැබේ. ප්‍රත්‍යනික අනුලෝමයෙහි "නත්ථි:" ප්‍රතිලෝමයෙහි පාලිගති මැයි. උත්පාද වාරය නිමි.

**නිරෝධ වාරයෙහි** – වර්තමානාතීත වාර, වර්තමානානාගත වාර, අතීතානාගත වාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් වර්තමානාතීත වාරය පළමු කොට වදළ සේක. **කෙසේ ද යත්** – "**යස්ස** චිත්තං නිරුජ්ඣති, තස්ස චිත්තං නිරුජ්ඣිත්ථාති, ආමන්තා, යස්ස වා පන – චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, චිත්තස්ස භංගක්ඛණෙ තෙසං," (උත්පාද වාර සමග මාරු කොට උදුරනු).

**වර්තමානානාගත වාරයෙහි** ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, ඉතරෙසං චිත්තස්ස භංගක්ඛණෙ තෙසං'' ප්‍රතිලෝමයෙහි, ''චිත්තස්ස උප්පාදක්ඛණෙ' නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං. ''උත්පාදක්ෂණ සියල්ල'' උදුරනු. ප්‍රත්‍යනීක සංසය නොමැත. **අනාගත වාර අනුලෝමයෙහි**- ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, ඉතරෙසං තෙසං'' ප්‍රතිලෝමයෙහි ''ආමන්තා'', මෙහි ද ප්‍රත්‍යනීක සංසයෙක් නොමැත. නිරොධ වාරය නිමි.

**උත්පාද නිරෝධ වාර වර්තමානාතීත වාරයෙහි** – උත්පාද වාරය මෙනි **වර්තමානානාගත වාරයෙහි** – අනුලෝම ''ආමන්තා''. ප්‍රතිලෝමයෙහි, ''චිත්තස්ස භංගක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං, චිත්තස්ස උප්පාදකඛණෙ තෙසං,'' ප්‍රතිලෝමයෙහි **සන්නිටඨාන ස්වරූපාර්ථ** පශ්චිම චිත්තය හැර සියලු චිත්තයන්ගේ, භංගක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවුදෙනාය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාය. නිරොධ සමාපත්තියට සමාපන්න අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයන් හා අසංඥ සත්ත්වයන් ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං:'' **අතීතානාගත වාර නිරෝධ වාර** මෙනි, උත්පාද නිරෝධ වාරය නිමි.

**උප්පජ්ජමාන න නිරෝධ වාරයෙහි** ''යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං න නිරුජ්ඣිස්සතීති, ආමන්තා, **යස්ස වා** පන නිරෝධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං තෙසං, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං,'' ප්‍රත්‍යනීකයෙහි යස්ස චිත්තං න උප්පජ්ජති, තස්ස චිත්තං නිරුජ්ඣතීති, නිරොධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං තෙසං, චිත්තස්ස භංගක්ඛණෙ තෙසං,''

පෙළෙහි ඇති සේ සවරූප කියනු

**උප්පජ්ජමාන උප්පන්න වාරයෙහි** ''යස්ස චිත්තං උප්පජ්ජමානං, තස්ස චිත්තං උප්පන්නන්ති, ආමන්තා, **යස්ස වා පන** – චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං,:' **ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ** නිරොධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං'' **නිරුජ්ඣමාන උප්පන්න වාරයෙහි** ''යස්ස චිත්තං නිරුජ්ඣමානං තස්ස චිත්තං උප්පන්නන්ති, ආමන්තා, **යස්ස වා** පන චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, චිත්තස්ස භංගක්ඛණෙ තෙසං,'' **ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ** ''නිරොධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං තෙසං.''

**උප්පන්නුප්පාද වාර වර්තමානාතීතයෙහි** ''යස්ස චිත්තං උප්පන්නං, තස්ස චිත්තං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා** පන නිරොධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං, චිත්තසමංගීනං තෙසං, **වර්තමානාගත වාරයෙහි** ''යස්ස චිත්තං උප්පන්නං තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති. පච්ඡිම චිත්ත සමංගීනං

තෙසං, ඉතරෙසං චිත්ත සමංගීනං තෙසං, **යස්සවා පන** නිරොධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං තෙසං'' ප්‍රත්‍යනිකයෙහි යස්ස චිත්තං න උප්පන්නං, තස්ස චිත්තං න උප්පජ්ජිත්ථාති, උප්පජ්ජිත්ථ, **යස්ස වා** පන නත්ථි.:'' (අනාගත වාරයෙහි පාලි අනුරූපව ය.)

**අතීතානාගත වාරයෙහි** ''**යස්ස** චිත්තං උප්පජ්ජිත්ථ, නොව තස්ස චිත්තං උප්පන්නං, තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති, ආමන්තා, යස්ස වා පන – ආමන්තා,'' තස්ස, – ඒ පුද්ගලයාගෙ, චිත්තං, – චිත්තය, නොව උප්පන්නං, – **ක්ෂණත්‍රයට** නොපැමිණියේ වෙයි. අනුලෝමයෙහි නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමි අර්හත් ආයඞ් පුද්ගලයෝ, අසංඥ සත්ව පුද්ගලයෝ ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි ද මෙයට සමානය, **ප්‍රත්‍යනික** අනුලෝම නත්ථි:' ප්‍රතිලෝමයෙහි පාලිගතියයි, **ස්වරූපාර්ථ** පශ්චිම චිත්තයාගේ **ක්ෂණත්‍රය** සමංගි වූ අර්හත් චලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. අතීතානාගත වාරය නිමි.

උප්පන්නුප්පජ්ජමාන වාරයෙහි ''උප්පන්නං උප්පජ්ජමානන්ති, භංගක්ඛණෙ උප්පන්නං නො ච උප්පජ්ජමානං, **උප්පාදක්ඛණෙ** උප්පන්නංචෙව උප්පජ්ජ-මානඤ්ච උප්පජ්ජමානං උප්පන්නන්ති, ආමන්තා,:' **අනුලෝමයෙහි** භංගක්ෂණ සිත් ගනු ලැබෙති. උත්පාදක්ෂණ චිත්තයෝ ද ගනු ලැබෙති. **සංසය සවරූ-පාර්ථ** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමයෙහි ද පෙර සංසය ගනු ලැබේ. **ප්‍රත්‍යනික-යෙහි** ''න උප්පන්නං න උප්පජ්ජමානන්ති, ආමන්තා, න උප්පජ්ජමානං න උප්පන්නන්ති, භංගක්ඛණෙ න උප්පජ්ජමානං නො ච න උප්පන්නං, අතීතානා-ගතං චිත්තං නචෙව උප්පජ්ජමානං න ච උප්පන්නං,:' (පෙළට අනුව සවරූප උදුරනු). **නිරුද්ධ නිරුජ්ඣමාන වාරයෙහි** – ''නිරුද්ධං නිරුඣජාමානන්ති නො, නිරුජ්ඣමානං නිරුද්ධන්ති, නො,:' අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අතීත චිත්තයෝ ගනු ලැබෙති. (සංසය සවරූප නොමැත.) ප්‍රතිලෝමයෙහි භංගක්ෂණ චිත්තයෝ ලැබෙති. (සංසය සවරූප නොමැත.) ප්‍රත්‍යනිකයෙහි ''න නිරුද්ධං න නිරුජ්ඣමානන්ති, භංගකඛණෙ න නිරුද්ධං, නො ච න නිරුජ්ඣමානං, උප්පාදක්ඛණෙ අනාගතඤ්ච චිත්තං, න නිරුජ්ඣමානං න නිරුද්ධන්ති, අතීතං චිත්තං.:'

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** භංගක්ෂණ චිත්තයෝ ගනු ලැබෙති උත්පාදක්ෂණ චිත්තයන් හා අනාගත චිත්තයෝ ද ලැබෙති. **ප්‍රතිලෝමයෙහි** අතීත චිත්තයෝ ගනු ලැබෙති. අනෙක් ක්‍රමයෙක්, මේ වාර දෙකින් චිත්තය ප්‍රධාන කොට චිත්ත සමංගී පුද්ගලයා දක්වූහ. එනිසා උප්පන්නං යන **සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ** චිත්තයාගේ භංගක්ෂණ සමංගී පුද්ගලයා ගනු ලැබේ. චිත්තයාගේ උත්පාද ක්ෂණ සමංගී පුද්ගලයා ද ලැබේ. **සංසය ස්වරූප** පෙර මෙනි. නිරුද්ධං - යන **සන්නිට්ඨාන පදයාගේ** ස්වරූපාර්ථ අතීත

චිත්තය සමග යුක්තවූ පුද්ගලයා ලැබේ. ප්‍රතිලෝමයෙහි නිරුජ්ඣමානං යන **සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ** භංගක්ෂණය සමග යෙදුනා වූ පුද්ගලයා ලැබේ. **ප්‍රත්‍යනීකයෙහි** ද මේ ක්‍රමයට අනුව පුද්ගලයා උදුරනු.

අතික්කන්ත කාල වාරයෙහි ''යස්ස චිත්තං උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං තස්ස චිත්තන්ති, භංගක්ඛණෙ චිත්තං උප්පාදක්ඛණං වීතික්කන්තං භංගක්ඛණං අවීතික්කන්තං, අතීතං චිත්තං උප්පාදක්ඛණඤ්ච වීතික්කන්තං, භංගක්ඛණඤ්ච වීතික්කන්තං, **යස්ස වා පන** අතීතං චිත්තං,'' යස්ස, – යම් පුද්ගලයකුට ; චිත්තං, – චිත්තයක්, ඛණං,–උත්පාදක්ෂණය ; ඛණං, – පෙර නොවී මේ දූන්, **හෙවත්** ඛණං, – පසු නොවී මේ දූන්, **හෙවත්** ඛණං, මේ දූන් පවත්නා ක්ෂණය ; වීතික්කන්තං, – ඉක්ම ගියේ, අතික්කන්තං කාලං,– ඉකුත් වූ කාලය ඇත්තේ වේ. තස්ස, – ඒ පුද්ගලයාගේ ; චිත්තං, – චිත්තය ; නිරුජ්ඣමානං, – නිරුද්ධ වනුයේ, ඛණං, – භංගක්ෂණය ; ඛණං,– පෙරට නොවී, ඛණං,– පසු නොව් ; ඛණං,– මේ දූන් පවත්නා ක්ෂණය, – වීතික්කන්තං, – ඉක්ම ගියේ වී ; අතික්කන්ත කාලං, – ඉකුත් වූ කාලය ඇත්තේද යි; ඉතිපුච්ඡායං සති, - මෙවැනි පැනයක් ඇති කල්හි, භංගක්ඛණෙ, - භංගක්ෂණයෙහි, – චිත්තං, – සිත ; උප්පාදක්ඛණං, – උත්පාදක්ෂණය ; වීතික්කන්තං ,– ඉකුත්ව ගියේය, භංගක්ඛණං, – භංගක්ෂණය ; අවීතික්කන්තං, – ඉක්ම නොගියේය, අතීතං චිත්තං,– අතීත චිත්තය ; උප්පාදක්ඛණඤ්ච,– උත්පාදක්ෂණය ද ; වීතික්කන්තං,– ඉක්ම ගියේය, භංගක්ඛණඤ්ච,– භංගක්ෂණය ද ; වීතික්කන්තං,– ඉක්ම ගියේය. ප්‍රතිලෝමයෙහි ද ක්‍රමය සමානයි. අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** භංගක්ෂණය හා යෙදුනු පුද්ගලයා ගනු ලැබේ. අතීත චිත්තය සමග යෙදුනු පුද්ගලයා ද ලැබේ. (ස්වරූප දර්ශනය). ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** අතීත චිත්තය හා සමග යෙදුනු පුද්ගලයා ගනු ලැබේ. ස්වරූපාර්ථ සංසය ද, ඒ මැයි. (ප්‍රතිවචන).

[ ප්‍රතිවචන දක්වා ඇත්තේ නම් ''ආමන්තා:' ඇති බව දතයුතු, කුමක් හෙයින් ''අතීතං චිත්තං:' කියා ඇත්තේ ද යත්, මෙසේ ක්ෂණ ද්වයක් ඉක්ම ගියා වූයේ අතීත චිත්තය මැයි. වර්තමාන චිත්තයක් නොවේ. මේ විශේෂය දැක්වීමට තබන ලදී ]

**ප්‍රත්‍යනීකයෙහි** ''**යස්ස** චිත්තං න උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං, න නිරුජ්ඣමානං ඛණංඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං තස්ස චිත්තන්ති, උප්පාදක්කඛණෙ අනාගතං චිත්තං, **යස්ස වා පන** චිත්තං න නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං න උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස චිත්තන්ති භංගක්ඛණෙ

චිත්තං භංගක්ඛණං අවිතික්කන්තං නො ච උප්පාදක්ඛණං අවිතික්කන්තං උප්පාදක්ඛණෙ අනාගතඤ්ච චිත්තං භංගක්ඛණඤ්ච අවිතික්කන්තං, උප්පාදක්ඛණඤ්ච අවිතිකකන්තං :' යස්ස – යම් පුදගලයකුගේ ; චිත්තං – චිත්තය ; උප්පජ්ජමානං. – උපදිමින් පවත්නේ, ඛණං,– උත්පාදක්ෂණය,– ඛණං – පෙර නොව - මේ දැන්; න විතික්කන්තං, ඉකුත් නොවූයේ, න අතික්කන්තකාලං, - ඉකුත්වූ කාල යෙක් නැත්තේ වෙයි. උප්පාදක්ඛණෙ,– උත්පාදක්ෂණයෙහි, – චිත්තං, – චිත්තයද; අනාගතං,– අනාගත වූ ; චිත්තං, – චිත්තය ද, උප්පාදක්ඛණඤ්ච උත්පාදක්ෂණය ද, අවිතික්කන්තං – ඉකුත් නොවූයේය. භංගක්ඛණඤ්ච, – භංගක්ෂණය ද ; අවිතික්කන්තං – ඉකුත්ව නොගියේය. අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උත්පාදක්ෂණික චිත්තයන් හා ද අනාගත චිත්තයන් හා ද යුක්ත වූ පුද්ගලයෝ ගනු ලැබෙති. පුද්ගල වාරය නිමි.

## ධම්ම වාරය

පුද්ගල වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ධර්ම වාරය වදළ සේක. [ ව්‍යවස්ථානය පුද්ගල වාරය අනුව කියනු ] **උත්පාද නිරෝධ කාල සම්භෙද වාරයෙහි** ''යං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, තං චිත්තං නිරුජ්ඣිස්සති. න උප්පජ්ජිස්සතීති, ආමන්තා, **යං වා පන** – ආමන්තා,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – උත්පාදක්ෂණ චිත්තයෝ ගනු ලැබෙති. **සංසය** ද **ප්‍රතිලෝමය ද** එයමැයි.

[ අධිප්‍රායාර්ථ වනාහි උත්පාද ක්ෂණ ඇත්තා වූ යම් සිතක් වේ නම් එය උපදිමින් පවතී. නිරුද්ධ වෙමින් නොපවතී. ඒ උත්පාදක්ෂණ ඇත්තාවූ චිත්තය, මතු නිරුද්ධ වීම ඒකාන්ත බැවින් නිරුජ්ඣිස්සති කියාද වේ මය, ඒ උත්පාදක්ෂණ ඇත්තා වූ චිත්තය නිරුද්ධ වීමෙන් පසු ඉපදීමක් දක්වා නැති බැවින් ''**උප්පජ්ජිස්සති** මෙසේ **සන්නිට්ඨාන සංසය** සවරූප සමාන ය. ]

**ප්‍රත්‍යනීකයෙහි යං'** චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති. තං චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සතීති, නො, යං වා පන නත්ථි:' අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** භංගක්ෂණ චිත්තයෝ ලැබෙති. සංසය සවරූප නොමැත.

## කොටස් බෙදා දැක්වීම

**ප්‍රතිලෝමයෙහි** මතු නිරුද්ධ නොවන්නාවූ ද, නූපදින්නා වූ ද චිත්තයක් නම් නොමැති බැවින් සන්නිට්ඨාන පදයාගේ සවරූප නොමැත. එසේ සන්නිට්ඨාන පදයාගේ සවරූප නොමැති නම් සංසය පදයාගේ සවරූප ද නොමැත.

එසේ සන්නිච්ඨාන සංසය දෙ පදයාගේ ම සවරූපාර්ථ නොමැති බැවින් යම් **චිත්තයෙක්** මතු නිරුද්ධ නොවන්නේ නූපදින්නේ වේ. ඒ චිත්තය උපදිමින් නොමැත. නිරුද්ධ වෙමින් ඇත්තේ දැයි **සර්වඥයන්** වහන්සේට විමතියක් නැත්තේ ය. එහෙත් වෛනෙයාාධ්‍යාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති (4) සතර අතුරෙන් මොස පඤ්හා වශයෙන් ඇසූ ප්‍රශ්නයට අනුරූපව සන්නිච්ඨාන පදයාගේ සවරූපාර්ථ ප්‍රතික්ෂේප කිරීම වශයෙන් පිළිතුරු පස අතුරෙන් ''නත්ථි:' යන ප්‍රතික්ෂේප විස්සර්ජනාවෙන් පිළිතුර වදාළහ.

**උප්පාදෝත්පන්න** වාරයෙහි ''යං චිත්තං උප්පජ්ජති, තං චිත්තං උප්පන්නන්ති. ආමන්තා, යං **වා පන භංගක්ඛණෙ** චිත්තං උප්පන්නං, නො ච තං චිත්තං උප්පජ්ජති, උප්පාදක්ඛණෙ චිත්තං උප්පන්නඤ්චෙව උප්පජ්ජතිච,'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ** භංගක්ෂණයෙහි සිත ලැබේ. උත්පාදක්ෂණ චිත්තය ද ගනු ලැබේ. සංසය **සවරූපාර්ථ** පෙර මෙනි. **ප්‍රත්‍යනීක යෙහි** ''**යං** චිත්තං න උප්පජ්ජති, තං චිත්තං න උප්පන්නන්ති, භංගක්ඛණෙ චිත්තං න උප්පජ්ජති, නො ච තං චිත්තං න උප්පන්නං අතීතානාගතං චිත්තං, **යං වා පන** ආමන්තා,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ**, භංගක්ෂණ චිත්තය ලැබේ. අතීත සිත් අනාගත සිත් ද ගනු ලැබෙති.

**නිරෝධුප්පන්න වාරයෙහි** ''යං චිත්තං නිරුජ්ඣති, තං චිත්තං උප්පන්නන්ති, ආමන්තා, යං **වා පන** උප්පාදක්ඛණෙ චිත්තං භංගක්ඛණෙ චිත්තං, ''**ප්‍රත්‍යනීක** යෙහි ''යං චිත්තං න නිරුජ්ඣති, තං චිත්තං න උප්පන්නන්ති, උප්පාදක්ඛණෙ චිත්තං, අතීතානාගතං චිත්තං, **යං වා පන** ආමන්තා.,''

**උත්පාද වර්තමානාතීත** වාරයෙහි ''යං චිත්තං උප්පජ්ජති, තං චිත්තං උප්පජ්ජිත්ථාති, නො, යං වා පන නො,'' අනුලෝමයෙහි **සන්නිච්ඨාන සවරූපාර්ථ** උත්පාද ක්ෂණ චිත්තය ලැබේ. සංසය සවරූපාර්ථ නැත. **ප්‍ර**තිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අතීත චිත්තය ලැබේ.

සංසය සවරූප නැත. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''භංගක්ඛණෙ අනාගතඤ්ච චිත්තං,'' භංගක්ෂණ චිත්ත අනාගත චිත්තයෝ ලැබෙති. වර්තමාන අනාගතයෙහි ද ''නො'' යනු මය, ප්‍රතිලෝමයෙහි අනාගත සිත් ලැබෙති. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''භංගක්ඛණෙ අතීතඤ්ච චිත්තං,'' අතීතානාගත වාරයෙහි ද ''නො'' ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''පච්චුප්පන්නං චිත්තං'' වර්තමාන සිත ලැබේ.

නිරෝධ වර්තමානාතීත වාරයෙහි ''යං චිත්තං නිරුජ්ඣති, තං චිත්තං නිරුජ්ඣිත්ථාති, නො, යං වා පන නො, අනුලෝමයෙහි සන්නිට්ඨාන , ස්වරූපාර්ථ – භංගක්ෂණ සිත් ලැබෙති. සංසය ස්වරූපාර්ථ නොමැත. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ වනාහි අතීත සිත ගනු ලැබේ. සංසය ස්වරූප නැත. ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ — ''උප්පාදක්ඛණෙ අනාගතඤ්ච චිත්තං.'' වර්තමානානාගත වාරයෙහි යං චිත්තං නිරුජ්ඣති, තං චිත්තං, නිරුජ්ඣිස්සතීති, නො, යං වා පන ''නො'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ – උත්පාදක්ෂණ අනාගත සිත් ලැබෙත්. ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ ''අතීතං චිත්තං.'' අතීතානාගත වාරයෙහි ''යං චිත්තං නිරුජ්ඣිත්ථ, තං චිත්තං නිරුජ්ඣිස්සතීති, නො, යං වා පන නො'', ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ උත්පාදක්ෂණ සිත්, අනාගත සිත්, ගනු ලැබෙති. ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ ''භංගක්ඛණෙ චිත්තං.''

උත්පාද නිරෝධ වාරයෙහි – වර්තමානාතීත වාරය, උත්පාද වාර හා සමානය. වර්තමානානාගත වාරයෙහි ''යං චිත්තං උප්පජ්ජති, තං චිත්තං නිරුජ්ඣිස්සතීති, ආමන්තා, යං වා පන – අනාගතං චිත්තං, උප්පාදක්ඛණෙ චිත්තං'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ – අනාගත සිත ලැබේ. උත්පාදක්ෂණ සිත ද ලැබේ. ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ ''භංගක්ඛණෙ අතීතඤ්ච චිත්තං,'' අතීතානාගත වාරය නිරෝධ වාරය හා සමානය.

උප්පජ්ජමාන න නිරෝධ වාරයෙහි ''යං චිත්තං උප්පජ්ජති, තං චිත්තං න නිරුජ්ඣතීති, ආමන්තා, යං වා පන අතීතානාගතං චිත්තං, උප්පාදක්ඛණෙ චිත්තං න නිරුජ්ඣති, චෙව උප්පජ්ජති ච,'' ප්‍රත්‍යනිකය ''යං චිත්තං න උප්පජ්ජති, තං චිත්තං නිරුජ්ඣතීති, අතීතානාගතං චිත්තං, භංගක්ඛණෙ චිත්තං, යං වා පන ආමන්තා.'' අනුලෝමයෙහි අතීත සිත් අනාගත සිත් ලැබෙති. භංගක්ෂණ සිත ද ලැබේ.

උත්පදා මානෝත්පන්න වාරයෙහි ''යං චිත්තං උප්පජ්ජමානං, තං චිත්තං උප්පන්නන්ති, ආමන්තා, යං වා පන භංගක්ඛණෙ චිත්තං, උප්පාදක්ඛණෙ චිත්තං ''ප්‍රත්‍යනිකය'' යං චිත්තං න උප්පජ්ජමානං, තං චිත්තං, න උප්පන්නන්ති, භංගක්ඛණෙ චිත්තං, අතීතානාගතං චිත්තං,''

නිරුද්ධ මානෝත්පන්න වාරයෙහි ''යං චිත්තං නිරුජ්ඣමානං, තං චිත්තං උප්පන්නන්ති, ආමන්තා, යං වා පන — උප්පාදක්ඛණෙ චිත්තං, භංගක්ඛණෙ චිත්තං'' ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ ''අතීතානාගතං චිත්තං.''

උත්පන්නෝද්පාද වර්තමානාතීත වාරයෙහි ''යං චිත්තං උප්පන්නං, තං චිත්තං උප්පජ්ජිත්ථාති, නො, යං වා පන නො'', අනුලෝමයෙහි වර්තමාන සිත ලැබේ. ප්‍රතිලෝමයෙහි අතීත සිත ලැබේ. වර්තමානානාගත වාරයෙහි ''යං චිත්තං උප්පන්නං, තං චිත්තං, උප්පජ්ජිස්සතීති, නො, යං වා පන - නො,'' ප්‍රතිලෝමයෙහි අනාගත සිත ලැබේ. ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ ප්‍රථම යමකයෙහි ''අනාගතං චිත්තං, ද්විතීය යමකයෙහි ''අතීතං චිත්තං.''

අතීතානාගත වාරයෙහි ''යං චිත්තං උප්පජ්ජිත්ථ, නො ච තං චිත්තං උප්පන්නං, තං චිත්තං උප්පජ්ජිස්සතීති, නො, යං වා පන නො, අනුලෝම-යෙහි අතීත සිත ලැබේ. ප්‍රතිලෝමයෙහි අනාගත සිත ලැබේ. ප්‍රත්‍යනීකයෙහි වර්තමාන සිත ලැබේ.

**උත්පන්නෝත්පද්‍යමාන වාරයෙහි** ''උප්පන්නං උප්පජ්ජමානන්ති, භංගක්ඛ-ණෙ උප්පන්නං නො ච උප්පජ්ජමානං, උප්පාදක්ඛණෙ උප්පන්නඤ්චෙව උප්පජ්ජමානඤ්ච උප්පජ්ජමානං උප්පන්නන්ති, ආමන්තා,'' ප්‍රත්‍යනීක ''න උප්පන්නං න උප්පජ්ජමානන්ති, ආමන්තා, න උප්පජ්ජමානං න උප්ප-න්නන්ති, භංගක්ඛණෙ, අතීතානාගතං චිත්තං, ''**නිරුද්ධ නිරුජ්ඣමාන**, වාරයෙහි ''නිරුද්ධං නිරුජ්ඣමානන්ති, නො නිරුජ්ඣමානං නිරුද්ධන්ති, නො,'' අනුලෝමයෙහි අතීත සිත ලැබේ. ප්‍රතිලෝමයෙහි භංගක්ෂණ සිත ලැබේ. ප්‍රත්‍යනීකයෙහි ''න නිරුද්ධං න නිරුජ්ඣමානන්ති, භංගක්ඛණෙ, උප්පාදක්ඛණෙ අනාගතඤ්ච චිත්තං,''

**අතික්කන්ත කාල වාරයෙහි** ''යං චිත්තං උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්-කන්තං අතික්කන්ත කාලං, නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං තං චිත්තන්ති, භංගක්ඛණෙ චිත්තං උප්පාදක්ඛණං වීතික්කන්තං භංගක්ඛණං අවීතික්කන්තං, අතීතං චිත්තං උප්පාදක්ඛණඤ්ච වීතික්කන්තං භංගක්ඛණඤ්ච වීතික්කන්තං, **යං වා පන** අතීතං චිත්තං.''

අනුලෝමයෙහි භංගක්ෂණ සිත ලැබේ. අතීත චිත්තය ද ලැබේ. **සංසය ස්වරූපාර්ථ** පෙරසේ ලැබේ. **ප්‍රතිලෝමයෙහි** අතීත චිත්තය ලැබේ. **ප්‍රත්‍යනීක-යෙහි** ''යං චිත්තං, න උප්පජ්ජමානං, ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං න නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං තං චිත්තන්ති, උප්පාදක්ඛණෙ අනාගතං චිත්තං, **යං වා පන** චිත්තං න නිරුජ්ඣ-මානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං න උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්ත කාලං තං චිත්තන්ති, භංගක්ඛණෙ චිත්තං භංගක්ඛණං අවීතික්කන්තං නො ච උප්පාදක්ඛණං අවීතික්කන්තං, උප්පාදක්ඛණෙ

අනාගතඤ්ච චිත්තං, භංගක්ඛණඤ්ච අවිතික්කන්තං උප්පාදක්ඛණඤ්ච, අවිතික්කන්තං,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ උත්පාදක්ෂණ සිත්-අනාගත සිත් ලැබෙති. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** භංගක්ෂණ සිත් ලැබෙති. උත්පාදක්ෂණ සිත් හා අනාගත සිත් ද ලැබෙති. මින් පසු වාර තුන පුද්ගල වාර විභංගයට සමාන ය.

ධම්ම වාරය නිමි

# පුද්ගල ධම්ම වාරය

**පුග්ගල ධම්ම වාරයෙහි** ''යස්ස යං චිත්තං උප්පජ්ජති, න නිරුජ්ඣති, තස්ස තං චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සතීති, ආමන්තා, **යස්ස වා පන** යං චිත්තං – ආමන්තා.'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උත්පාදක්ෂණ ඇති චිත්තය සමග යෙදුනු පුද්ගලයා ගේ උත්පාදක්ෂණ ඇති සිත ගනු ලැබේ. සංසය ද ඒ මය. ප්‍රතිලෝමයෙහි ද එම සිතමැයි. **ප්‍රත්‍යනීකයෙහි** අනුලෝම-නො, **ප්‍රතිලෝමයෙහි**-නත්ථි.'' අනුලෝම **සන්නිට්ඨාන සවරූපාර්ථ** භංගක්ෂණය සමග යෙදුනු පුද්ගලයන්ගේ භංගක්ෂණ සිත ගනු ලැබේ. -(මේ ක්‍රමයට සමානව සවරූප උදුරනු)

[මේ පුද්ගල ධම්ම වාරය වනාහි ධම්ම වාරයට අනුගතිකය, එනිසා අන්තිම-යෙහි ''**යස්ස චිත්තකෙ** සකභාවෙන නිද්දිට්ඨෙ යං චිත්තකෙ ච යස්ස යං චිත්තකෙ ච එකන්තෙන නිද්දිට්ඨෙ:', ය යි පෙළෙහි ඇත්තේය. අර්ථ යොදන්-නේ නම මෙසේය, - යස්ස චිත්තකෙ-යස්ස චිත්තකො, යස්ස චිත්තක නම වූ පුද්ගල වාරය, සකභාවෙන, - තමන්ගේ සවභාවයෙන්, නිද්දිට්ඨෙ – නිද්දිට්ඨො-දක්වන ලද්දේ, හොති, – වේද, යං චිත්තකෙ – යං චිත්තකොච,- යං, චිත්තක නම් වූ ධම්ම වාරය ද, යස්ස යං චිත්තකෙ- යස්ස- යං චිත්තකො ච,- යස්ස යං චිත්තක නම් වූ පුද්ගල ධම්ම වාරය ද, එකන්තෙන, – සමානත්ව-යෙන්, නිද්දිට්ඨෙ – නිද්දිට්ඨො- දක්වන ලද්දේ, – හොති, වෙයි ; යස්ස චිත්ත-කෙ – යනාදියෙහි ප්‍රථමාන්ත විභක්ති මැයි, ප්‍රථමා විභක්ති එකවචන ''සබ්බතො ගස්සේවා'' සූත්‍රයෙහි වා ශබ්ද බලයෙන් ''ඒ'' ආදේශ කොට, වනප්පගුම්බෙ- යනාදියෙහි මෙන් යෙදී ඇත. **අධිප්‍රායාර්ථ** පුද්ගල වාරය වනාහි තමන්ගේ සවභාව වශයෙන් දක්වනු ලැබේ. ධම්ම වාරයද පුද්ගල ධම්ම වාරය ද සමානත්වයෙන් දක්වන ලද්දේ වෙයි ].

සුද්ධ චිත්ත සාමඤ්ඤය නිමි.

## සූත්‍රාන්ත චිත්ත මිශ්‍රකය

**සුද්ධ** චිත්ත සාමඤ්ඤය දේශනා කොට වදරා ඉන් අනතුරුව **සූත්‍රාන්ත** චිත්ත මිශ්‍රක විශේෂය වදාළ සේක. (පෙර සේ බෙද කියනු) ''යස්ස සරාගං චිත්තං උප්පජ්ජති, න නිරුජ්ඣති, තස්ස සරාගං චිත්තං නිරුජ්ඣිස්සති, න උපපජ්ජිස්සතීති, සරාග පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං සරාගං චිත්තං උප්පජ්ජති, න නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති න උපපජ්ජිස්සති, ඉතරෙසං සරාග චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං සරාගං චිත්තං උප්පජ්ජති, න නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති චෙව උප්පජ්ජිස්සති ච, **යස්ස වා පන** ආමන්තා.''

යස්ස, යම් කෙනකුට, සරාගං,-රාග සහිත වූ; චිත්තං-චිත්තයක්;-සරාග පච්ඡිම චිත්තස්ස; - පශ්චිම සරාග චිත්තයාගේ; ඉතරෙසං;- පශ්චිම සරාග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයා හැර සෙසු පුදගලයන්ට;

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**- සරාග පශ්චිම චිත්තය හැර සෙසු සරාග චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයෝ ගනු ලැබෙති. සරාග පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයා ද ගනු ලැබේ.

**සංසය ස්වරූපාර්ථ** පෙරසේමය, (කොටස් බෙදීම පෙර සේ කියනු)
**ප්‍රතිලෝමයෙහි** පෙර සංසය සවරූපාර්ථ ලැබේ. (ප්‍රතිවචනයි)

[පශ්චිම සරාග චිත්තය යනු තෘෂ්ණාවෙක් නො ඉපදී සතර මාර්ග ලැබීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම තෘෂ්ණාව හා සම්ප්‍රයුක්ත වූ සප්තම ජවනයාගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජනයාය. සෝතාපන්න වීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම්, සකෘදගාමී වීමෙන් පසු තෘෂ්ණාව –උපදනේ නම්, අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාව උපදනේ නම් අන්තිම තෘෂ්ණාව හා සම්ප්‍රයුක්ත වූ, සප්තම ජවනයාගේ උත්පාද ක්ෂණ සමංගී වූ සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී පුද්ගලයෝය, ඒ ආයඞ පුද්ගලයන් ගේ අන්තිම ලෝභ ජවනය ද වේ.] අනුලෝමයයි.

ප්‍රත්‍යනිකය:- ''යස්ස සරාගං චිත්තං න උප්පජ්ජති, නිරුජ්ඣති, තස්ස සරාගං චිත්තං න නිරුජ්ඣිස්සති, උප්පජ්ජිස්සතීති, නො, **යස්ස වා පන-නත්ථි,**'' අනු-ලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සරාග චිත්තයාගේ භංගක්ෂණ සමංගී වූ පුද්ගලයා ගනු ලැබේ. **සංසය** සවරූප නොමැත.- ප්‍රතිලෝමයෙහි රාගසිත් මතු නැවත නිරුද්ධ නොවන්නාවූ පුද්ගලයා නමින් කෙනෙක් නැත, මතු උපදින්නාවූ, මතු

නිරුද්ධ වන්නා වූ, මතු නූපදින්නා වූ පුද්ගලයන්ම ඇති බැවින් **සන්නිට්ඨාන** පදයාගේ ස්වරූප නොමැත. මොස ප්‍රශ්න බැවින් ප්‍රතික්ෂේප විසර්ජනාවෙන් පිළිතුරු වදරණ ලදී.

උත්පාද නිරෝධ කාල සම්භෙද වාරය නිමි.

---

**උත්පාදෝත්පන්න වාරයෙහි** ''**යස්ස** සරාගං චිත්තං උප්පජ්ජති තස්ස සරාගං චිත්තං උප්පන්නන්ති, ආමන්තා, යස්ස වා පන - සරාග චිත්තස්ස භංගක්ඛණෙ තෙසං සරාගං චිත්තං උප්පන්නං, නො ච තෙසං සරාගං චිත්තං උප්පජ්ජති, සරාග චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**-සරාග චිත්තයාගේ භංගක්ෂණ සමංගී පුද්ගලයා ගනු ලැබේ. සරාග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයා ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනිකයෙහි** ''යස්ස සරාගං චිත්තං න උප්පජ්ජති, තස්ස සරාගං චිත්තං න උප්පන්නන්ති, සරාග චිත්තස්ස භංගක්ඛණෙ තෙසං සරාගං චිත්තං න උප්පජ්ජති, නො ච තෙසං සරාගං චිත්තං න උප්පන්නං, වීතරාග චිත්ත සමංගීනං,-නිරොධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං, **යස්ස වා පන** ආමන්තා,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සරාග චිත්තයාගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (3) තුන්දෙනා ගනු ලැබෙති. වීතරාග සිත් (81) එක් අසූවගේ ක්ෂණ ත්‍රය සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා ය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, නිරෝධ සමාපන්න අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය, අසංඥ සත්තව පුද්ගලයෝ ය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. නිරෝධෝත්පන්න වාරය ද මෙයට සමානය.

උත්පාද **වර්තමානාතීත** වාරයෙහි ''**යස්ස** සරාගං චිත්තං උප්පජ්ජති, තස්ස සරාගං චිත්තං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන**- චිත්තස්ස භංගක්ඛණෙ, වීතරාග චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, සරාග චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද වීතරාගී සිත් (81) එක් අසූවගේ උත්පාද ක්ෂණ සමංගී වූද, පෘථග්ජන (4) සිවුදෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, නිරෝධසමාපත්තියට සමාපන්න අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය. අසංඥ සත්ත්ව පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සරාග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනිකය** ''**යස්ස** සරාගං චිත්තං න උප්පජ්ජති, තස්ස සරාගං චිත්තං න උප්පජ්ජිත්ථාති, උප්පජ්ජිත්ථ, **යස්ස වා පන** නත්ථි,'' **වර්තමානානාගත වාරයෙහි**

''යස්ස සරාගං චිත්තං උප්පජ්ජති, තස්ස සරාගං චිත්තං උප්පජ්ජිස්සතීති, සරාග පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරෙසං සරාග චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, යස්ස වා **පන** චිත්තස්ස භංගක්ඛණෙ, **වීතරාග** චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං''.

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සරාග පශ්චිම චිත්තයාගේ **උත්-පාදක්ෂණ** සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා හා යට ඵලස්ථ ආයුෂ්‍ය පුද්ගලයන්-(3) තිදෙනා ගනු ලැබෙති. පශ්චිම සරාග චිත්තය හැර සෙසු සරාග චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී පුද්ගලයෝ ද ගනු ලැබෙති.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පශ්චිම සරාග චිත්තය හැර සරාග සිත් උපදින්නාහු නම් චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, **වීතරාග** චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද පෘථග්ජන (4) සතර දෙනා, යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනා ගනු ලැබෙති. නිරෝධ සමාපත්තියට සමාපන්න අනාගාමි අර්හත් ආයුෂ්‍ය පුද්ගලයන් හා අසංඥ සත්ත්වයන් ද ගනු ලැබෙති. [විස්තර වශයෙන් ස්වරූප උදුරනු කැමැත්තේ නම් සත්‍ය යමක සමුදය සත්‍යය උත්පාද වාරය ඇසුරු කොට උදුරනු.]

**කෙසේද යත්**- තෘෂ්ණාව නො ඉපදී සතර මාර්ග ලබන්නෙක් වේ නම්, අනාදිමත් සසර පටන් පැමිණ අන්තිම වූ තෘෂ්ණාවට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූද, විතරාගී චිත්තයන්ගේ උත්පා-දක්ෂණ සමංගී නම් වූද පෘථග්ජන (4) සතර දෙනාය, සෝතාපන්න සකදාගාමී-අනාගාමී වීමෙන් පසු තෘෂ්ණාව උපදී නම් අනාදිමත් සසර පටන් එන අන්තිම පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, වීතරාග චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද මාර්ගාධිගමයට භව්‍ය පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ ආයුෂ්‍ය පුද්ගලයෝ (3) තුන් දෙනාය,

මාර්ග නොලබන්නෙක් වේ නම්, සුදුසු පරිදිඋපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, වීතරාග චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, මාර්ගාධිගමයට අභව්‍ය පෘථග්ජනයෝය, සරාග චිත්තයන් මතු නැවත උපදින්නා වූ නිරෝධ සමාපත්ති සමාපන්න අනාගාමි ආයුෂ්‍ය පුද්ගලයෝ අසංඥ සත්ත්ව පුද්ගලයෝ ගනු ලැබෙති, **ප්‍රත්‍යනීක සංසය** ස්වරූපාර්ථ ''අග්ගමග්ග සමඞ්ගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති,''

[සමුදය සත්‍ය මතු උපදින්නා වූ වාරයට අනුව ස්වරූප උදුරනු, අවසාන තෘෂ්ණාවගේ භංගක්ෂණයේ පටන්'' යයි කීම පමණෙක් විශේෂයි.]

**අතීතානාගත වාරයෙහි** ''යස්ස සරාගං චිත්තං උප්පජ්ජිත්ථ, තස්ස සරාගං චිත්තං උප්පජ්ජිස්සතීති, අග්ගමග්ග සමංගීනං අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං, යස්ස වා පන ආමන්තා.''

[සත්‍ය යමකයෙහි දුක්ඛ මූල සමුදය මූලිය මෙන් ස්වරූප උදුරනු. **ප්‍රත්‍යනීක** ස්වරූප නොමැත. නිරෝධ වාර, **උත්පාද** නිරෝධ වාරයන් ද උත්පාද වාර නය ක්‍රමය ආශ්‍රය කොට කියනු.]

**උප්පජ්ජමාන න** නිරොධ වාරයෙහි ''යස්ස සරාගං චිත්තං උප්පජ්ජති, තස්ස සරාගං චිත්තං න නිරුජ්ඣතීති, ආමන්තා, යස්ස් වා පන වීතරාග චිත්ත සමංගීනං නිරෝධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං, සරාග චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං.'' **ප්‍රත්‍යනීක** සංසය ස්වරූපාර්ථ ''සරාග චිත්තස්ස භංගක්ඛණෙ'' යයි මාරු කොට කියනු. **උත්පද්‍යමානෝත්පන්න** වාරයෙහි උත්පාදෝත්පන්න වාරය හා සමානය. නිරුද්ධමානෝත්පන්න වාරය නිරෝධ උත්පන්න වාරයට සමානය.

**උත්පන්නෝත්පාද වර්තමානාතීත වාරයෙහි** ''යස්ස සරාගං චිත්තං උප්පන්නං තස්ස සරාගං චිත්තං උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන වීතරාග චිත්ත සමංගීනං, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, සරාග චිත්ත සමංගීනං, තෙසං'', **වර්තමානානාගත වාරයෙහි** ''යස්ස සරාගං චිත්තං උප්පන්නං, තස්ස සරාගං චිත්තං උප්පජ්ජිස්සතීති, සරාග පච්ඡිම චිත්ත සමංගීනං තෙසං, ඉතරෙසං සරාග චිත්ත සමංගීනං තෙසං, යස්ස වා පන, වීතරාග චිත්ත සමංගීනං, නිරෝධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං'' [උත්පාද වර්තමානානාගත වාරය ඇසුරුකොට ස්වරූප උදුරනු.]

**ප්‍රත්‍යනීක ස්වරූපාර්ථ** ''යස්ස සරාගං චිත්තං න උප්පන්නං, තස්ස සරාගං චිත්තං න උප්පජ්ජිත්ථාති, උප්පජ්ජිත්ථ, යස්ස වා පන -නත්ථි'', ''යස්ස සරාගං චිත්තං න උප්පන්නං, තස්ස සරාගං චිත්තං න උප්පජ්ජිස්සතීති, වීතරාග චිත්ත සමංගීනං, නිරෝධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං තෙසං, සරාගං චිත්තං න උප්පන්නං -පෙ-අග්ගමග්ග සමංගීනං අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං, - යස්ස වා පන සරාග පච්ඡිම චිත්ත සමංගීනං තෙසං,''

[වර්තමානානාගත වාරය ඇසුරු කොට ස්වරූප උදුරනු.]

**අතීතානාගත වාරයෙහි** ''යස්ස සරාගං චිත්තං උප්පජ්ජිත්ථ, නො ච තස්ස සරාගං චිත්තං, උප්පන්නං, තස්ස සරාගං චිත්තං උප්පජ්ජිස්සතීති, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං යස්ස චිත්තස්ස, අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, නිරොධ-

සමාපන්නානං, තෙසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන** ආමන්තා,'' [**ප්‍රත්‍යනීකයෙහි** අනුලෝම- ''නත්ථි'' ප්‍රතිලෝමයෙහි පාලි අනුගතයි. ඉතිරි වාර තුනෙහි විභංග විශේෂයක් නැතැයි සිතමි. පුද්ගල වාරය නිමි. ධම්ම වාර- පුද්ගල ධම්ම වාරයෙහි මේ නය ක්‍රමය ඇසුරු කොට විභංගය වාර ස්වරූපයන් කියනු. **වීතරාග පද මිශ්‍රකයන්**-හි ද සරාග පද වාර ඇසුරු කොට සිතන්න.] සූත්‍රාන්ත පද මිශ්‍රක විශේෂය නිමි.

## අභිධම් පද මිශ්‍රකය

සූත්‍රාන්ත පද මිශ්‍රක විශේෂය දේශනා කොට වදරා අනතුරුව අභිධර්ම පද මිශ්‍රක විශේෂය වදළ සේක. ඒ අභිධර්ම පද මිශ්‍රක විශේෂය ද **ත්‍රිකමාතෘකා නිර්දේශය** ද්‍රික මාතෘකා නිර්දේශය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් ත්‍රික මාතෘකා නිර්දේශය පළමු කොට වදළ සේක. ඒ ත්‍රික මාතෘකා නිර්දේශය ද කුශලත්‍රික, වේදනාත්‍රිකාදීන්ගේ වශයෙන් (22) දෙවිසි වැදෑරුම් වන්නේය. ඒ කුශලත්‍රිකය ද කුසල පද අකුසල පද අව්‍යාකෘත පද වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් කුසල පදය පළමු කොට වදළ සේක. ඒ කුශල පදය ද පුද්ගල වාර, ධම්ම වාර, පුද්ගල ධම්ම වාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරය ද උත්පාද නිරෝධ කාලසම්භෙද වාරාදී වශයෙන් (14) දහතර වැදෑරුම් වන්නේය. ඒ (14) දහතර අතුරෙන් උත්පාද නිරෝධ කාලසම්භෙද වාරය පළමු කොට වදළ සේක. ඒ උත්පාද නිරෝධ කාලසම්භෙද වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක.

**කෙසේ වදළ සේක් ද යත්**- ''යස්ස කුසලං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති තස්ස කුසලං චිත්තං නිරුජ්ඣිස්සති, න උප්පජ්ජිස්සතීති, **පච්ඡිම** කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං කුසලං චිත්තං උප්පජ්ජති, න නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති, න උප්පජ්ජිස්සති, ඉතරෙසං කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං-කුසලං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති චෙව උප්පජ්ජිස්සති ච, යස්ස වා පන ආමන්තා.''

''අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගීවූ අර්හත් **මාර්ගස්ථ** ආර්‍ය්‍ය පුද්ගලයන් හැර කුසල් සිත් (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය. යට **මාර්ගස්ථ** ආර්‍ය්‍යයන් (3) තිදෙනාය, යට ඵල**ස්ථ**යන් (3) තිදෙනා ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථයා ද ගනු ලැබේ. සංසය

**ස්වරූපාර්ථ** පෙර සේය. (කොටස් බෙදා දැක්වීම ද පෙර සේ කියනු.) **ප්‍රතිලෝමයෙහි** ඉහත සංසය ස්වරූපම වේ. [පශ්චිම කුශල චිත්තය යනු අර්හත් මාර්ග චිත්තයය, අර්හත් මාර්ගයෙන් පසු කුසල් නූපදී.]

**ප්‍රත්‍යනීකයෙහි** ''යස්ස කුසලං චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති, තස්ස කුසලං චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සතීති, නො, යස්ස වා පන - නත්ථි'' අනුලෝම-කුසල් සිත් (21) එක් විස්සගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සිවුදෙනාය, මාර්ගස්ථ (4) සිවුදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනා ගනු ලැබෙති. සංසය නොමැත. ප්‍රතිලෝමයෙහි නොමැත.

**උත්පාදෝත්පන්න වාරයෙහි** ''යස්ස කුසලං චිත්තං උප්පජ්ජති, තස්ස කුසලං චිත්තං උප්පන්නන්ති, ආමන්තා, **යස්ස** වා පන - කුසල චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං,'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** කුසල් සිත් (21) එක්විස්සගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා, මාර්ගස්ථ (4) සතර දෙනා හා- යට ඵලස්ථ (3) තුන්දෙනා ගනු ලැබෙති. කුසල් සිත් (21) එක්විස්සගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා මාර්ගස්ථ (4) සතර දෙනා, හා යට ඵලස්ථ (3) තුන්දෙනාද ගනු ලැබෙති, **නිරෝධෝත්පන්න** වාරයෙහි ''යස්ස කුසලං චිත්තං නිරුජ්ඣති, තස්ස කුසලං චිත්තං උප්පන්නන්ති, ආමන්තා, යස්ස වා **පන**, කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, කුසල චිත්තස්ස භංගක්ඛණෙ තෙසං:'' වාර දෙකෙහි **ප්‍රත්‍යනීක** ස්වරූපාර්ථ ''අකුසල චිත්ත අබ්‍යාකත චිත්ත සමංගීනං නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං.''

උත්පාද **වර්තමානාතීත** වාරයෙහි ''යස්ස කුසලං චිත්තං උප්පජ්ජති, තස්ස කුසලං චිත්තං උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා **පන**-චිත්තස්ස භංගක්ඛණෙ, කුසල-විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරෝධ සමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං, කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං,'' [සියලු සිත් ද සියලු පුද්ගලයන් ද ස්වරූප වශයෙන් උද්ධරනු **ප්‍රත්‍යනීක** සංසය නැත, අනුලෝමයෙහි පාලි අනුගතයි, ප්‍රතිලෝමයෙහි ප්‍රතික්ෂේපයි.]

**වර්තමානානාගත** වාරයෙහි ''යස්ස කුසලං චිත්තං උප්පජ්ජති, තස්ස කුසලං චිත්තං උප්පජ්ජිස්සතීති, පච්ඡිම කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරෙසං කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, යස්ස වා පන චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං''.

අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අර්හත් මාර්ග චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයා ගනු ලැබේ. අර්හත්

මාර්ගය හැර ඉතිරි කුසල් සිත් (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා, යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනාද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේමය.

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ග චිත්තයට පූර්ව වූ වෝදනාය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද, අකුසල, අව්‍යාකෘත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද භව්‍ය පෘථග්ජන (4) සිව්දෙනා ය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, මාර්ග ප්‍රතිලාභ නොකරන සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, අකුශල අව්‍යාකෘත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය. නිරෝධ සමාපත්ති සමාපන්න අනාගාමී පුද්ගලයෝය. අසංඥ සත්ව පුද්ගලයෝය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. **අනුලෝම** සංසය ද ගනු ලැබේ. **ප්‍රත්‍යනීක** සංසය සවරූපාර්ථ "අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, තෙසං," (ධර්ම යමකයෙහි කුසල් නූපදින්නා වූ, වාරය ඇසුරු කොට සවරූප උදුරනු.)

**අතීතානාගත** වාරයෙහි "යස්ස කුසලං චිත්තං උප්පජ්ජිත්ථ, තස්ස කුසලං චිත්තං උප්පජ්ජිස්සතීති, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං තෙසං, ඉතරෙසං තෙසං, යස්ස වා පන ආමන්තා."

අලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ග චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථ පුද්ගලයා හා අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා අර්හත් ඵලස්ථ ආයර් පුද්ගලයෝ ගනු ලැබෙති. අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ග චිත්තයට පූර්ව වූ වෝදන චිත්තය දක්වා භව්‍ය පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය. මාර්ග ලාභයට අභව්‍ය වූ පුහුදුන් පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේම ය, ප්‍රත්‍යනීක සංසය නොමැත.

උත්පාද වාරය නිමි.

---

නිරෝධ වාර, උත්පාද නිරෝධ වාරයන්, උත්පාද වාරය ආශ්‍රයෙන් කියනු. උප්පජ්ජමාන න නිරොධ වාරයෙහි "යස්ස කුසලං චිත්තං උප්පජ්ජති, තස්ස කුසලං චිත්තං න නිරුජ්ඣතීති, ආමන්තා, යස්ස වා පන අකුසලාබ්‍යාකත චිත්ත සමංගීනං, නිරෝධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං, තෙසං කුසලං චිත්තං න නිරුජ්ඣති නො ච තෙසං කුසලං චිත්තං උප්පජ්ජති, කුසල චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං කුසලං චිත්තං න නිරුජ්ඣති චෙව උප්පජ්ජති ච,"

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අකුශල අව්‍යාකෘත චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය. ඵලසථ (4) සතර දෙනාය. නිරෝධ සමාපත්ති සමාපන්නවූ අනාගාමී රහත් ආයඞ පුද්ගලයෝ ය. අසංඥ සත්වයෝ ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. එක්විසි (21) කුසල චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා, මාර්ගසථ (4) සතර දෙනා, හා යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තුන් දෙනා ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේමය. ප්‍රත්‍යනිකයෙහි මාරු කොට කියනු. [උප්පජ්ජමාන උප්පන්නවාර, නිරුජ්ඣමාන උත්පන්නවාර, මේ වාරයෝ චනාහි උත්පාදෝත්පන්න වාර නිරෝධෝත්පන්න වාර සමග සමානය.]

උත්පන්නෝද්පාද වර්තමානාතීත වාරයෙහි ''යස්ස කුසලං චිත්තං උප්පන්නං, තස්ස කුසලං චිත්තං උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන- අකුසලාබ්‍යාකත චිත්ත සමංගීනං, නිරෝධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං, කුසල චිත්ත සමංගීනං තේසං,'' (සන්නිට්ඨානයෙහි සියලු පුද්ගලයන් සවරූප වශයෙන් උද්ධරනු) වර්තමානානාගත වාරයෙහි යස්ස කුසලං චිත්තං උප්පන්නං, තස්ස කුසලංචිත්තං උප්පජ්ජිස්සතීති, පච්ඡිම කුසල චිත්ත සමංගීනං තෙසං, ඉතරේසං කුසල චිත්ත සමංගීනං තෙසං, යස්ස වා පන අකුසලාබ්‍යාකත චිත්ත සමංගීනං, නිරෝධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං,''

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අන්තිම කුශල චිත්තයට පූර්ව වූ අකුශල අව්‍යාකෘත චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය, යට ඵලසථ ආයඞ පුද්ගලයන් (3) තුන් දෙනාය, නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී ආයඞ පුදගලයෝය, අසංඥසත්ත්වයෝ ය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ග චිත්තය හැර ඉතිරි සම විසි කුශල චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය, යට මාර්ගසථ (3) තුන් දෙනාය, යට ඵලසථ (3) තුන් දෙනාය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. ප්‍රත්‍යනික සංසය ''අරහන්තානං තෙසං.''

අතීතානාගත වාරයෙහි ''යස්ස කුසලං චිත්තං උප්පජ්ජිත්ථ, නො ච තස්ස කුසලං චිත්තං උප්පන්නං, තස්ස කුසලං චිත්තං උප්පජ්ජිස්සතීති, අරහන්තානං තෙසං, ඉතරෙසං අකුසලාබ්‍යාකත චිත්ත සමංගීනං, නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං, තෙසං යස්ස වා පන - ආමන්තා,''

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ- අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයේ පටන් පශ්චිම චිත්තය දක්වා අර්හත් ඵලසථ පුද්ගලයෝ ගනු ලැබෙත්. අනාදිමත් සංසාරයේ පටන් අවසාන වූ කුශල චිත්තයට පූර්ව වූ අකුශල අව්‍යාකෘත චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය, යට මාර්ගසථ (3) තිදෙනා ය,

යට ඵලසථ තිදෙනාය. නිරොධ සමාපත්ති සමාපන්න වූ අනාගාමී පුද්ගලයෝය. අසංඥසත්ව පුද්ගලයෝය යන මේ පුද්ගලයෝද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේමය. ප්‍රතිලෝම සංසය ද එය මැයි. ප්‍රත්‍යනීක අනුලෝමයෙහි ''නත්ථි'' ප්‍රතිලෝමයෙහි පාළි අනුගතයි. ඉතිරි වාර තුන පිළිබඳ සවරූප සුගමයි. [ධම්ම වාර, පුද්ගල ධම්ම වාරයන් ද පූර්ව නය ක්‍රමය ආශ්‍රය කොට කියනු. ඉතිරි ත්‍රික පදයන්ද කුශල පදය ඇසුරු කොට සිතන්න.]

[මේ සූත්‍රාන්ත මිශ්‍රක අභිධර්ම මිශ්‍රක පාළියෙහි පද භාජනී විභංගයට පෙළ නොමැත. මාතෘකා පුච්ඡා උද්දේශයන් හි ඇත. ගුරුවරු සුදුසු පරිදි නයක්‍රම ඇසුරු කොට සවරූප උදුරති. එසේ නය ක්‍රම උපදේශ මෙනෙහි කොට නුවණැත්තෝ පැහැදිලි සේ සවරූප උදුරති. මේ සවරූප කථනය සමහර තැන අඩුව ද ඇත. වැඩිව ද තිබෙනු ඇත. සර්වඥතා ඥානයට විෂය වූ ධර්මයක් බැවින් සිතා නිම නොකළ හැකි අර්ථ ඇති බැවින් සවභාව නිශ්‍රය කොට අඩුතැන් වැඩි කොට වැඩි තැන් අඩු කොට නිවැරදිව සවරූප උදුරති. ඉස්සා - මච්ඡරිය, මක්ඛ පලාස ගර්හාදිය නොකොට ගෞරවයෙන් නුවණින් සිතා සලකා සවරූප කියනු. සමහර ගුරුවරු චනාභි අභිධර්ම මිශ්‍රකය නිර්දේශයෙහි නොකියති. කුමක් හෙයින් ද යත් ධම්ම යමකයෙහි මාතෘකා වැඩි බැවින් කියන්නට සුදුසු නැතැයි කියති. කුමක් හෙයින් ද යත්, මේ චිත්ත යමකයෙහි උද්දේශයෙහි ම, ''යස්ස කුසලං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති'' යනාදී පාළියම ඇති බැවිනි. එනිසා නිද්දේසයෙහි ද කිම සුදුසු යයි දක්වන ලදී.]

චිත්ත යමක සවරූප විභාගය නිමි.

---

## 9 ධම්ම යමක ස්වරූප

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස! ! !

### පණ්ණත්ති උද්දේස වාරය

චිත්ත යමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව ධම්ම යමකය වදළ සේක. ඒ ධර්ම යමකය ද ත්‍රිකදුක වශයෙන් දෙවැදෑරුම් වේ. ඒ දෙක අතුරෙන් ත්‍රිකය පළමුකොට වදළ සේක. ඒ ත්‍රිකය ද කුශල ත්‍රික වේදනා ත්‍රික යනාදි වශයෙන් (22) දෙවිසි වැදෑරුම් වන්නේය. ඒ (22) දෙවිස්ස අතුරෙන් කුසල ත්‍රිකය පළමු කොට වදළ සේක. ඒ කුශලත්‍රිකය ද පණ්ණත්ති වාර, පවත්ති වාර, භාවනා වාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය.

[මෙහි ''යො කුසලං ධම්මං භාවෙති''යි ආ බැවින් පරිඤ්ඤා වාරයට භාවනා වාරයයි කියන ලදී. එහිසා ''අට්ඨකථාවෙහි'' යො කුසලං ධම්මං භාවෙති සො අකුසලං ධම්මං පජහතීති ආගතත්තා පනෙත්ථ පරිඤ්ඤාවාරොව භාවනාවාරො නාමාති වෙදිතබ්බො'' යි කියන ලදී.]

ඒ තුන අතුරෙන් ප්‍රඥප්ති වාරය පළමු කොට වදළ සේක. ඒ ප්‍රඥප්ති වාරය ද උද්දේශ නිද්දේශ වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේශය පළමු කොට වදළ සේක. ඒ උද්දේශය ද පදසෝධනවාර, පදශෝධන මූලචක්‍රවාර සුද්ධ ධර්මවාර, ශුද්ධ ධර්ම මූලචක්‍ර වාරය වශයෙන් (4) සිවුවැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පද ශෝධන වාරය පළමු කොට වදළ සේක. ඒ පද ශොධන වාරයද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද කුසල ධම්ම යමක, අකුශල ධම්ම යමක, අව්‍යාකෘත ධම්ම යමක, වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් කුශල ධර්ම යමකය පළමු කොට වදළ සේක. ඒ කුශල ධර්ම යමකය ද අනුලෝම පුච්ඡා ප්‍රතිලෝම පුච්ඡා වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය, ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ අනුලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේ වදළ සේක් ද යත් ''කුසලා'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේද යත් ''කුසලා ධම්මා'' යනුවෙනි.

කුශලා-යනු සන්නිට්ඨානයය, කුසලා ධම්මා යනු සංසයය. සන්නිට්ඨාන සංසය දෙපදයාගේ එකතුවෙන් අනුලෝම පුච්ඡාව සිදුවේ.

අනුලෝම පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රතිලෝම පුච්ඡාව වදළ සේක. ඒ ප්‍රතිලෝම පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේද යත් ''කුසලා ධම්මා'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේ ද යත් ''කුසලා'' යනුවෙනි. කුසලා ධම්මා-යනු සන්නිට්ඨාන යයි. කුසලා-යනු සංසයයි. සන්නිට්ඨාන සංසය දෙපදයාගේ එකතුවෙන් ප්‍රතිලෝම පුච්ඡාව සිදුවේ. අනුලෝම පුච්ඡා - ප්‍රතිලෝම පුච්ඡා යන දෙක එකතුවෙන් පද සෝධන වාර අනුලෝම-යෙහි පළමු වැනි කුසල ධර්ම යමකය සිදුවේ.

කුසල ධර්ම යමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව අකුශල ධර්ම යමකය වදළ සේක. -පෙ- අකුශල ධර්ම යමකය දේශනා කොට වදරා ඉන් අනතුරුව අව්‍යාකෘත ධර්ම යමකය වදළ සේක. -පෙ- මේ අයුරින්-පදසෝධන වාර අනුලෝම-යෙහි යමක තුනකි. පුච්ඡා 6 සයකි. අර්ථ (12) දෙළසක් වෙති අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක. (ප්‍රත්‍යනීකයෙහි ද

ක්‍රමය සමානය). මෙසේ පදසෝධන වාරයෙහි අනුලෝම - ප්‍රත්‍යනීක වාර දෙකෙහි නය (2) දෙකකි. යමක (6) සයකි. පුච්ඡා (12) දෙළසකි. අර්ථ (24) සූවිස්සක් ලැබෙති.

පද ශෝධන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පදසෝධන මූලචක්‍ර වාරය වදළ සේක. ඒ පදශෝධන මූලචක්‍ර වාරයද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද කුසල ධර්ම මූල, අකුශල ධර්ම මූල, අව්‍යාකෘත ධර්මමූල වශයෙන් (3) තුන්වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් කුශලධර්ම මූලය පළමු කොට වදළ සේක. ඒ කුශල ධර්ම මූලය ද අකුශල ධර්ම මූලි, අව්‍යාකෘත ධර්මමූලි වශයෙන් දෙවදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අකුශලධර්ම මූලිය පළමු කොට වදළ සේක, කෙසේ ද යත් ''කුසලා කුසලාධම්මා, ධම්මා අකුසලාධම්මා-'' යනුවෙනි. ඉන් අනතුරුව අව්‍යාකෘත මූලිය වදළ සේක. කෙසේ ද යත් ''කුසලා කුසලාධම්මා, ධම්මා අව්‍යාකතාධම්මා'' යනුවෙනි.

මෙසේ කුශල ධර්ම මූලයෙහි යමක (2) දෙකකි. පුච්ඡා (4) සතරකි. අර්ථ (8) ක් ලැබෙති. [අකුසල ධර්ම මූලයෙහි ද අව්‍යාකෘතධර්මමූලයෙහි ද ක්‍රමය මෙසේම ය.] මෙසේ පදසෝධන මූලචක්‍ර වාර අනුලෝමයෙහි මූල (3) තුනකි. යමක (6) සයකි. පුච්ඡා (12) දෙළසකි. අර්ථ (24) සූවිස්සක් ලැබෙති.

ඉන් අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක. (ප්‍රත්‍යනීකයෙහි ද ක්‍රමය සමානය) මෙසේ අනුලෝම ප්‍රත්‍යනීක දෙපදයෙහි එකතුවෙන් පදසෝධන මූලචක්‍ර වාරයෙහි නය (2) දෙකකි. මූල (6) සයකි. යමක (12) දොළසකි. පුච්ඡා (24) සූවිස්සකි. අර්ථ (48) සතලිස් අටක් ලැබෙති. පද සෝධන මූලචක්‍ර වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව සුද්ධ ධම්ම වාරය වදළ සේක. ඒ සුද්ධ ධම්ම වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය, -පෙ- [පදසෝධන වාරය අනුව සංඛ්‍යා කියනු සුද්ධ ධම්මමූලචක්‍ර වාරය ද පදසෝධන මූලචක්‍ර වාරය අනුව කියනු ක්‍රමය සමානය] මෙසේ පදසෝධන වාර, පදසෝධන මූලචක්‍ර වාර, සුද්ධ ධම්ම වාර සුද්ධ ධම්ම මූලචක්‍රවාර, එකතුවෙන් යමක (36) සතිසකි. පුච්ඡා (72) සැත්තෑදෙකකි. අර්ථ (144) එකසිය සතළිස් සතරක් ලැබෙති.

උද්දේශය නිමි.

# ප්‍රඥප්ති වාර නිර්දේශය

## පද ශෝධන වාරය

උද්දේශය දේශනා කොට වදරා අනතුරුව නිර්දේශය වදළ සේක. ඒ නිර්දේශය ද පදසෝධන වාර, පදසෝධන මූලචක්‍රවාර, සුද්ධ ධම්ම වාර, සුද්ධ ධම්ම මූලචක්‍රවාර වශයෙන් (4) සතර වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පදසෝධන වාරය පළමු කොට වදළ සේක. ඒ පදසෝධන වාරය ද අනුලෝම ප්‍රත්‍යනික වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද කුසලධම්ම යමකය අකුශල ධම්ම යමකය, අව්‍යාකෘත ධම්ම යමකය වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් කුසල ධම්ම යමකය පළමු කොට වදළ සේක. ඒ කුසල ධම්ම යමකය ද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළසේක. ඒ අනුලෝමය ද පුච්ඡා - විස්සජ්ජනා වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් පුච්ඡාව පළමු කොට වදළ සේක. ඒ පුච්ඡාව ද සන්නිට්ඨාන සංසය වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඒ දෙක අතුරෙන් සන්නිට්ඨානය පළමු කොට වදළ සේක. කෙසේද යත් ''කුසලා'' යනුවෙනි. ඉන් අනතුරුව සංසය වදළ සේක. කෙසේද යත් ''කුසලා ධම්මා'' යනුවෙනි. පුච්ඡාව දේශනා කොට වදරා ඉන් අනතුරුව විස්සජ්ජනාව වදළ සේක. කෙසේද යත්, ''ආමන්තා'' යනුවෙනි.

අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රතිලෝමය දේශනා කළ සේක. (අනුලෝම අනුව මැයි) කෙසේ ද යත් ''කුසලා ධම්මා කුසලාති'' ''ආමන්තා'' යනුවෙනි. කුසලා - කුසල නම් වූවෝ කුසලා ධම්මා, කුසල ධර්ම නම් වෙත් දැයි, ඉති පුච්ඡායං සති,- මෙවැනි පැනයක් ඇති කල්හි, ආමන්තා,- කුසල නම් වූවෝ, කුශල ධර්ම නම් වෙත් යයි, ඉති විස්සජ්ජනා හොති,- මෙවැනි විසඳුමක් වේ. (ප්‍රති-ලෝමයත් සමානයි) අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ (21) එක්විසි කුසල චිත්තය, හා (38) අටතිස් චෛතසිකය ලැබෙති. සංසය ද එසේ ලැබෙයි. (ප්‍රති-ලෝමයෙහි ද සවරූප සමානයි.) ''අකුසලා අකුසලා ධම්මාති, ආමන්තා,- අකුසලා ධම්මා අකුසලාති, ආමන්තා,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථය (12) දෙළොස් අකුසල චිත්තය හා (27) සත්විසි චෛතසිකය ලැබෙති. සංසය ද ඒ මැයි, ප්‍රතිලෝමයෙහි ද එසේය.

''අබ්‍යාකතා අබ්‍යාකතා ධම්මාති, ආමන්තා, අබ්‍යාකතා ධම්මා අබ්‍යාකතාති, ආමන්තා,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ (36) සතිස් විපාක චිත්තය, (20) විසි ක්‍රියා චිත්තය, (38) අටතිස් චෛතසිකය, (28) අටවිසි රූපය හා නිර්වාණය ලැබෙති. සංසය ද ඒ මැයි, ප්‍රතිලෝමයෙහි ද එසේය. ''න කුසලා නකුසලා ධම්මාති,

ආමන්තා, න කුසලා ධම්මා නකුසලාති ආමන්තා.'' අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, අකුශල ධර්ම, අව්‍යාකෘත ධර්ම හා ප්‍රඥප්ති ධර්ම ලැබෙති. සංසය ද ඒ මැයි, ප්‍රතිලෝමය ද එසේය. න අකුසලා න අකුසලා ධම්මාති, ආමන්තා, න අකුසලා ධම්මා න අකුසලාති, ආමන්තා,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ- කුසල ධර්ම, අව්‍යාකෘත ධර්ම හා ප්‍රඥප්ති ධර්ම ලැබෙති. සංසය ද ඒ මැයි, ප්‍රතිලෝම- යෙහි ද එසේය. ''න අබ්‍යාකතා න අබ්‍යාකතා ධම්මාති, ආමන්තා, න අබ්‍යාකතා ධම්මා න අබ්‍යාකතාති,'' ආමන්තා,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ කුශල ධර්ම, අකුශල ධර්ම හා ප්‍රඥප්ති ධර්ම ලැබෙති. සංසය ද ඒ මැයි, ප්‍රතිලෝම- යෙහි ද එසේය,

පද ශෝධන වාරය නිමි.

---

## 2. පදශෝධන මූලචක්‍ර වාරය

පද ශෝධන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පදශෝධන මූලචක්‍ර වාරය වදළ සේක. ඒ පදශෝධන මූලචක්‍ර වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය, ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද (උද්දේශය මෙන් කියනු) කෙසේ ද යත්, ''කුසලා කුසලාධම්මාති, ආමන්තා, ධම්මා අකුසලා ධම්මාති, අකුසලා ධම්මා ධම්මා චෙව අකුසලා ධම්මා ච, අවසෙසා ධම්මා න අකුසලා ධම්මා:'' ප්‍රතිලෝම පුච්ඡාවෙහි ධම්මා- යන සන්නිට්ඨාන පද සවරූපාර්ථ- කුසල ධර්ම අව්‍යාකෘත ධර්ම හා සමූහ ප්‍රඥප්ති ධර්ම ලැබෙති. අකුශල ධර්මයෝ ද ලැබෙති. සංසය සවරූප පෙර සේමය. ''කුසලා කුසලා- ධම්මාති, ආමන්තා, ධම්මා අබ්‍යාකතා ධම්මාති, අබ්‍යාකතා ධම්මා ධම්මා චෙව අබ්‍යාකතා ධම්මාච, අවසෙසා ධම්මා න අබ්‍යාකතා ධම්මා,'' ප්‍රතිලෝමයෙහි ධම්මා- යන සන්නිට්ඨාන පද සවරූපාර්ථ කුසල ධර්ම අකුශල ධර්ම, සමූහ සංඛ්‍යාත ප්‍රඥප්ති ධර්ම ලැබෙති. අව්‍යාකෘත ධර්ම ද ලැබෙති, සංසය සවරූප පෙරසේමය.

[අකුශල ධර්මමූල, අව්‍යාකෘත ධර්ම මූලයන්හි ද මේ ක්‍රමයට අනුව යමක දෙක බැගින් ලැබෙති. සියල්ල අනුලෝම (6) සයකි.]

ප්‍රත්‍යනීකයෙහි ''න කුසලා න කුසලාධම්මාති, ආමන්තා, න ධම්මා න අකුසලා ධම්මාති, ආමන්තා,'' අනුලෝමයෙහි න කුසලා යන සන්නිට්ඨාන පද සවරූපාර්ථ අකුශල ධර්ම, අව්‍යාකෘත ධර්ම හා ප්‍රඥප්ති ධර්ම ලැබෙති. සංසයෙහි ද ඒ ධර්ම මැයි. ප්‍රතිලෝමයෙහි න ධම්මා- යන සන්නිට්ඨාන පද සවරූපාර්ථ කූප ගුහාදී අවයව වූ ප්‍රඥප්ති ඒක දේශයක් ලැබේ. සංසය ද ඒ මැයි [සියලු ප්‍රතිලෝමය මේ ප්‍රතිලෝමය හා සමානමැයි, අකුශල ධර්ම මූල න අව්‍යාකෘත මූලයන්හි ද මේ ක්‍රමය සමානය, ප්‍රත්‍යනීකයෙහි යමක (6) සයකි.]

පද ශෝධන මූලචක්‍ර වාරය නිමි.

## 3. ශුද්ධ ධම්ම වාරය

ශුද්ධ ධර්ම වාරයෙහි "කුසලා ධම්මාති, ආමන්තා, ධම්මා කුසලා ධම්මාති, කුසලා ධම්මා ධම්මා චෙව කුසලා ධම්මා ච, අවසෙසා ධම්මා න කුසලා ධම්මා," අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ (21) එක්විසි කුශල චිත්තය, හා (38) අටතිස් චෛතසිකය ලැබෙති. සංසයෙහි ද ඒ මැයි. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අකුශල ධර්ම, අව්‍යාකෘත ධර්ම ලැබෙති. කුශල ධර්ම ද ලැබෙති. සංසය පෙරසේමය. (ශුද්ධ ධර්ම බැවින් ප්‍රඥප්තිය උදුරනු නොලැබේ.)

"අකුසලා ධම්මාති, ආමන්තා, ධම්මා අකුසලා ධම්මාති, අකුසලා ධම්මා ධම්මා චෙව අකුසලා ධම්මා ච, අවසෙසා, ධම්මා න අකුසලා ධම්මා," අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අකුශල ධර්ම ලැබෙති. සංසයෙහි ද ඒ යැයි. ප්‍රතිලෝම-යෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ-කුශල ධර්ම හා අව්‍යාකෘත ධර්ම ලැබෙති. අකුශල ධර්ම ද ලැබෙති. "අබ්‍යාකතා ධම්මාති, ආමන්තා, ධම්මා අබ්‍යාකතා ධම්මාති, අබ්‍යාකතා ධම්මා ධම්මා චෙව අබ්‍යාකතා ධම්මා ච අවසෙසා ධම්මා න අබ්‍යාකතා ධම්මා" අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අව්‍යාකෘත ධර්ම ලැබෙති සංසයෙහි ද ඒ මැයි, ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ කුසලධර්ම හා අකුශල ධර්ම ලැබෙති. අව්‍යාකෘත ධර්ම ද ලැබෙත්.

අනුලෝම නිමි.

---

ප්‍රත්‍යනිකයෙහි "න කුසලා න ධම්මාති, කුසලං ඨපෙත්වා අවසේසා ධම්මා න කුසලා ධම්මා කුසලඤ්ච ධම්මෙ ච ඨපෙත්වා අවසෙසා න චෙව කුසලා න ච ධම්මා, න ධම්මා න කුසලාධම්මාති, ආමන්තා," අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අකුශල ධර්ම හා අව්‍යාකෘත ධර්ම ලැබෙති, ප්‍රඥප්තිය ද ලැබේ. සංසයෙහි පෙර මෙනි. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ ප්‍රඥප්තිය ලැබේ.

"න අකුසලා න ධම්මාති, අකුසලං ඨපෙත්වා අවසේසා ධම්මා න අකුසලා ධම්මා, අකුසලඤ්ච ධම්මෙ ච ඨපෙත්වා, අවසේසා න චෙව අකුසලා න ච ධම්මා, නධම්මා, න අකුසලා ධම්මාති, ආමන්තා," අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ කුශලධර්ම හා අව්‍යාකෘත ධර්ම ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබේ. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ ප්‍රඥප්තිය ලැබේ.

"න අබ්‍යාකතා න ධම්මාති, අබ්‍යාකතං ඨපෙත්වා අවසේසා ධම්මා න අබ්‍යාකතා ධම්මා, අබ්‍යාකතඤ්ච ධම්මෙච ඨපෙත්වා අවසේසා න චෙව අබ්‍යාකතා න ච ධම්මා, න ධම්මා න අබ්‍යාකතා ධම්මාති, ආමන්තා," අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ කුශල ධර්ම, අකුශල ධර්ම ලැබෙති. ප්‍රඥප්තිය ද ලැබේ. සංසයෙහි පෙර සේය. සුද්ධ ධර්ම වාරය නිමි.

## ශුද්ධ ධම් මූල චක්‍ර වාරය

ශුද්ධ ධර්ම මූල චක්‍රවාරයෙහි ''කුසලා ධම්මාති, ආමන්තා, ධම්මා අකුසලා ධම්මාති, අකුසලා ධම්මා ධම්මා චෙව අකුසලා ධම්මා ච, අවසෙසා ධම්මා න අකුසලා ධම්මා, (ශුද්ධ ධර්ම වාරය මෙනි, ක්‍රමය සමානය.)

පණ්ණත්ති වාරය නිමි.

---

## ප්‍රවෘත්තිවාර, උත්පාද වර්තමාන වාරය

පණ්ණත්තිවාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රවෘත්ති වාරය වදළ සේක. ඒ ප්‍රවෘත්ති වාරය ද උත්පාද වාර, නිරෝධ වාර, උත්පාද නිරෝධ වාර, වශයෙන් තුන්වැදෑරුම් වන්නේය.

ඒ තුන අතුරෙන් උත්පාද වාරය පළමුකොට වදළ සේක. ඒ උත්පාද වාරය ද වර්තමාන වාර, අතීත වාර, අනාගතවාර වර්තමානාතීත වාර, වර්තමානානාගත වාර, අතීතානාගත වාර වශයෙන් (6) සය වැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් වර්තමාන වාරය පළමු කොට වදළ සේක. ඒ වර්තමාන වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද පුද්ගල වාර, ඕකාස වාර, පුද්ගලෝකාස වාර වශයෙන් තුන් වැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරය ද කුසල ධර්ම මූල, අකුසල ධර්ම මූල වශයෙන් දෙවැදෑරුම් වන්නේ ය. ඒ දෙක අතුරෙන් කුශලධර්ම මූලය පළමු කොට වදළ සේක. කෙසේද යත් ''යස්ස කුසලා ධම්මා උප්පජ්ජන්ති, තස්ස අකුසලා ධම්මා උප්පජ්ජන්තීති, නො, යස්ස වා පන නො''.

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ (21) එක්විසි කුසල චිත්තයාගේ හා (38) අටතිස් චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය. අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා හැර සෙසු ආර්‍ය්‍ය පුද්ගලයෝ (7) සත් දෙනා ලැබෙති. (සංසය සවරූප නොමැත.) ප්‍රතිලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අකුසල සිත් (12) දොළස හා චෛතසික (27) සත් විසි දෙනාගේ උත්පාද-ක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ලැබෙති. ඒ පුද්ගලයන්ට අකුශල් පහළවන කෙණෙහි කුශල් පහළ නොවන බැවින් සංසය පදයාගේ සවරූපාර්ථ නොමැත. මෝඝ ප්‍රශ්න වශයෙන් ප්‍රතිෂේධ විස්සර්ජනාව කරන ලදී.

## අව්‍යාකෘත මූලි

''යස්ස කුසලා ධම්මා උප්පජ්ජන්ති, තස්ස අබ්‍යාකතා ධම්මා උප්පජ්ජන්තීති අරූපෙ කුසලානං උප්පාදක්ඛණෙ තෙසං, පඤ්චවොකාරෙ කුසලානං උප්පාදක්ඛණෙ' තෙසං, යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තේසං.''

[මේ ප්‍රතිලෝම විභංගයෙහි අබ්‍යාකතය දුක්ඛ සත්‍යය සමග සමානව ආ බැවින් සත්‍ය යමකය ඇසුරු කොට ''නිරෝධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං,'' නැත්තේ යයි ගුරුවරු විස්තර කියති.]

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ-අරූප භූමියෙහි මහා කුශල චිත්තයන් (8) අට, අරූප කුසල (4) සතර හා මතු මාර්ග (3) තිදෙනාගේ උත්පාද ක්ෂණ සමංගී නම් වූ ත්‍රිහේතුක පෘථග්ජනයා ය. උඩ මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනා ලැබෙති. පඤ්චවෝකාර භූමියෙහි (21) එක්විසි කුශල චිත්තය, (38) අටතිස් චෛතසිකය සහ චිත්තජ රූපයන් ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනාය. අර්හත් ඵලස්ථයා වර්ජිත ආර්ය පුද්ගලයන් (7) සත් දෙනා ද යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේය. ප්‍රතිලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ (19) එකුන්විසි ප්‍රතිසන්ධි චිත්තය, චෛතසික (35) පන්තිස, කර්මජ රූපකලාප (3,7,4) තුන, සත, සතර, ප්‍රථම ජීවිත නවක රූප කලාපය යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ සියලුම උපදිමින් සිටින පෘථග්ජන(4)සතර දෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයාගේ පටන් චුතිය දක්වා ද, අරූප භූමියෙහි අකුසල වර්ජිත (12) දෙළොස් අකුශල්ය. (36) සතිස් විපාකය (20) විසි ක්‍රියා චිත්තය, (52) දෙපණස් චෛතසිකය හා චිත්තජ රූපයන්ගේ උත්පාද ක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා හා ඵලස්ථ ආයති පුද්ගලයන් (4) සතර දෙනා ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

## අකුසල මූලය

''යස්ස අකුසලා ධම්මා උප්පජ්ජන්ති, තස්ස අබ්‍යාකතා ධම්මා උප්පජ්ජන්තීති, අරූපෙ අකුසලානං උප්පාදක්ඛණෙ තෙසං, පඤ්චවොකාරෙ අකුසලානං උප්පාදක්ඛණෙ තේසං, යස්ස වා පන සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ අකුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තේසං, පඤ්චවොකාරෙ අකුසලානං උප්පාදක්ඛණෙ තේසං.''

අනුලෝම සන්නිට්ඨාන සවරූපාර්ථ, අරූප භූමියෙහි ලෝභ මූල (8) අට, මෝහ මූල (2) දෙක හා (23) තෙවිසි චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයා හා යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති.

පඤ්චවෝකාර භූමියෙහි (12) දොළොස් අකුසලය, (27) සත්විසි චෛතසිකය හා චිත්තජ රූපයන්ගේ උත්පාද ක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා හා යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. ප්‍රතිලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ ප්‍රතිසන්ධි සිත් (19) දහනවය, චෛතසික (35) පන්තිස, කර්මජකලාප (3,7,4) තුන සත සතර, ප්‍රථම ජීවිත නවක කලාප යන මේ ධර්මයන්ගේ උත්පාද ක්ෂණ සමංගී වූ උපදිමින් සිටින සියලූ පෘථග්ජන (4) සතර දෙනාය, යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා අරූප භූමියෙහි කුශල වර්ජිත (21) එක්විසි කුශල චිත්තය, (36) සතිස් විපාක චිත්තය, (20) විසි ක්‍රියා චිත්තය, (38) අටතිස් චෛතසිකය, හා චිත්තජ රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනා හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. අනුලෝම සංසය ද ලැබේ.

පුද්ගලවාරය නිමි.

## ඕකාස වාරය

ඕකාස වාරයෙහි "යත්ථ කුසලා ධම්මා උප්පජ්ජන්ති, තත්ථ අකුසලා ධම්මා උප්පජ්ජන්තීති, ආමන්තා, යත්ථ වා පන ආමන්තා." අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, චතුවෝකාර භූමි (4) සතරය, පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ලැබෙති. සංසයෙහි ද ඒ මය. (ප්‍රතිලෝමයෙහි ද නය ක්‍රමය සමානය).

ප්‍රත්‍යනිකයෙහි අසංඥතලය ගනු ලැබේ. අව්‍යාකෘත මූලියෙහි අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි "අසඤ්ඤ සත්තෙ තත්ථ, චතුවොකාරෙ පඤ්චවොකාරෙ තත්ථ" (අකුසල මූලය ද මෙසේමය.)

(පුද්ගලෝකාශ වාරයෙහි ද පුද්ගල වාර මෙන් සවරූප උදුරා භූමි නියම කිරීමම විශේෂයි.)

ප්‍රත්‍යනිකයෙහි කුසල හා අකුසල ප්‍රත්‍යනික සංසය සවරූපාර්ථ- "සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත අකුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං, තේසං." සියලු චිත්තායන්ගේ

භංගක්ෂණ සමංගී වූද, (36) සතිස් විපාක චිත්තය හා (20) විසි ක්‍රියා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද පෘථග්ජන (4) සතර දෙනාය. ආර්ය පුද්ගලයන් (8) අට දෙනාය, නිරෝධ සමාපත්තියට සමාපන්න අනාගාමි අර්හත් පුද්ගලයෝය අසංඥසත්වයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

කුසල අව්‍යාකෘත ප්‍රත්‍යනීක ස්වරූපාර්ථ ''සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ අකුසලානං උප්පාදක්ඛණෙ තෙසං'', චුතිසිත් (19) දහනවය චෛතසික (35) පන්තිස් , අන්තිම කර්මජ රූප යන මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවන පෘථග්ජන (4) සතර දෙනාය. ඵලස්ථ ආර්‍ය පුද්ගලයෝ (4) සතර දෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා වූ සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනාය. ආර්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, අරූපභූමියෙහි ලෝභ මූල සිත් (8) අට, මෝහ මූල සිත් (2) දෙක, හා චෛතසික (23) තෙවිස්සගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ත්‍රිහේතුක පෘථග්ජනයා හා යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් තිදෙනා ගනු ලැබෙත්.

අකුසල හා අව්‍යාකෘත සංසය ස්වරූපාර්ථ ''සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, අරූපෙ කුසලානං, උප්පාදක්ඛණෙ තෙසං,'' (''නය ක්‍රමය සමානව උදුරනු. පුද්ගලෝකාශයෙහි ද සමානය), වර්තමාන වාරය නිමි.

## අතීත වාරය

වර්තමාන වාරය දේශනා කොට වදරා අනතුරුව අතීත වාරය වදළ සේක. ''යස්ස කුසලා ධම්මා උප්පජ්ජිත්ථ, තස්ස අකුසලා ධම්මා උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන ආමන්තා,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ පෘථග්ජන (4) සතර දෙනා හා ආර්‍ය පුද්ගලයින් (8) අටදෙනා ලැබෙති. (පුද්ගලවාරයට සම්පූර්ණයෙන් සමානයි, ඕකාසවාරය සුගමයි)

## පුද්ගලෝකාස වාරය

''යස්ස යත්ථ කුසලා ධම්මා උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ අකුසලා ධම්මා උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ කුසලා ධම්මා උප්පජ්ජිත්ථාති, සුද්ධාවාසානං දුතියෙ අකුසලෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ.''

ප්‍රතිලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ ශුද්ධාවාස භූමියෙහි භවනිකන්තික ද්විතීය ජවනය නම් වූ නියමිත අකුසල චිත්තය ඒ සිතට ප්‍රථමයෙහි-කුශලෝත්පාදයක් එහි නොමැති බැවින් ඒ හා සමාන දෙවැනි සිත නම් වූ තෙවැනි

ජවනයේ පටන් එහි පළමු හටගන්නා මහා කුශල ප්‍රථම ජවනය තෙක් සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථ ආයත් පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති. ශුද්ධාවාසය වන්නේ නම ප්‍රථම මහා කුශල ද්විතීය ජවනයාගේ පටන් චුතිය දක්වා ද, ඉතිරි චතුවෝකාර, පඤ්චවෝකාර වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයත් පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේමය.

ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ,. අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''

ශුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවාංගය නම් වූ නියමිත ද්විතීය චිත්තය, ඒ චිත්තයට පළමු එහි අකුසල චිත්තයක් පහළ වී නැති බැවින් ඒ සමාන ද්විතීය චිත්තය නම් වූ ප්‍රතිසන්ධිය, භවාංග (16) දහසය, මනෝද්වාරාවර්ජන, භවනිකාන්තික ප්‍රථම ජවනය, යන මේ චිත්තෝද්පාද (19) එකුන් විස්සගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථ ආයත් පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස හා අසංඥතල වාසී පුද්ගලයන්ගේ අසංඥ භූමිය ලැබේ.

අව්‍යාකෘත මූලියෙහි අනුලෝම- ආමන්තා; ප්‍රතිලෝමයෙහි ''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝ-කාරානං පඤ්චවෝකාරානං, තෙසං, තත්ථ,'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ ශුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගය නම් වූ නියමිත ද්විතීය චිත්තය, ඒ සිතට පෙර කුශල් උපන්නෙක් එහි නොමැති බැවින් ඒ හා සමාන ද්විතීය චිත්තය නම් වූ දෙවැනි භවංගයේ පටන් ප්‍රථම වූ මහා කුශල ප්‍රථම ජවනය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමි ඵලසථ ආයත් පුද්ගලයන්ගේ සුද්ධවාස භූමි (5) පස හා අසංඥසත්ත්වයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබෙති, ශුද්ධාවාසයෙහි වේ නම් ප්‍රථමයෙන් පහළවන මහා කුශල ද්විතීය ජවනයේ පටන් චුතිය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයත් පුද්ගලයන් (8) අටදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) විසිහය ද ගනු ලැබෙති. සංසය සවරූප පෙර මෙනි.

ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''සුද්ධාවාසානං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' රූපාවචර පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි (1) එක හා චෛතසික (30) තිස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථ ආයත් පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති.

අකුසල හා අව්‍යාකෘතයෙහි-අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තේසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ". ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංග නම් වූ නියත ද්විතිය චිත්තයය. එහි දී ඒ හා අකුශල් උපන්නෙක් අතීතයෙහි නොමැති බැවින් ඒ හා සමාන භවංග වාර (15) පසළොස ය, මනෝද්වාරාවජ්ජනය, භවනිකාන්තික ප්‍රථම ජවනය යන මේ චිත්තවාර (18) අටළොස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමි ඵලස්ථ ආයතී පුද්ගලයන්ගේ පඤ්ච ශුද්ධාවාස භූමිය, හා අසංඥසත්ව පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ලැබේ. ශුද්ධාවාසය වේ නම් භවනිකන්තික දෙවැනි ජවනයේ පටන් චුතිය දක්වා ද ඉතිරි චතුවෝකාර පඤ්චවෝකාර වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ලැබෙති. සංසය සවරූප පෙරසේය. ප්‍රත්‍යනික "සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ," (පෙර සේ උද්ධරනු)

අතීත වාරය නිමි.

## අනාගතපුද්ගල වාරය

අනාගත වාරයෙහි "යස්ස කුසලා ධම්මා උප්පජ්ජිස්සන්ති, තස්ස අකුසලා ධම්මා උප්පජ්ජිස්සන්තීති, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං, ඉතරෙසං තේසං, යස්ස වා පන ආමන්තා." අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලස්ථ ආයතී පුද්ගලයෝය.

අකුශල් පහළ නොවී සතර මාර්ගය මතු ලබන්නාවූකෙනෙක් වේ නම්, අවසාන අකුශල චිත්තයාගේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ පූර්වානන්තර අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යටමාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය.

සෝතාපන්න, සකදගාමි, අනාගාමි ඒමෙන් පසු අකුශල් උපදිත් නම් අවසාන අකුශල යාගේ පටන් අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයට පූර්වානන්තර වූ අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලස්ථ ආයතී පුද්ගලයෝ ගනු ලැබෙති. අකුසල් පහළ නොවී සතර මාර්ග ලබන්න

වූ කෙනෙක් වේ නම්, අනාදිමත් සංසාරයෙහි පටන් අවසාන අකුසලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ භව්‍ය පෘථග්ජන යෝය. සෝතාපන්න-සකදාගාමි-අනාගාමි වීමෙන් පසු අකුශල් උපදිත් නම් අනාදිමත් සංසාරයෙහි පටන් අවසන් වූ අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මාර්ග නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''අග්ග මග්ග සමංගීනං, අරහන්තානං තේසං,'' අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයන් හා අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. කුසල හා අව්‍යාකෘතයෙහි ''අනුලෝම, ආමන්තා, ප්‍රතිලෝමයෙහි-අග්ගමග්ග සමංගීනං, අරහන්තානං තේසං, ඉතරෙසං, තෙසං,'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ අනන්තර චිත්තය දක්වා අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝ ලැබෙති.

අනාදිමත් සංසාරයෙහි පටන් අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, මාර්ග නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජනයෝය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''පච්ඡිම චිත්ත සමංගීනං තේසං'' ත්‍රිහේතුක චුති (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය යන පශ්චිම චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති.

අකුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''අග්ග මග්ග සමංගීනං, අරහන්තානං යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං,''

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථයෝය. අර්හත්මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා අර්හත් ඵලස්ථයෝය. අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලස්ථයෝය. අකුශල පහළනොවී සතර මාර්ගය ලබන්නා වූ කෙනෙක් වේ නම් අවසාන අකුශල චිතත්යාගේ පටන් වෝදනයට පූර්ව අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. සෝතාපන්න, සකදාගාමි, අනාගාමි වීමෙන් පසු අකුශල

පහළ වෙත්නම අන්තිම අකුශල චිත්තයාගේ පටන් චෝදන චිත්තයට පූර්ව වූ අනු-ලෝමය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

අකුශල පහළ නොවී සතර මාර්ග ලබන්නා වූ කෙනෙක් වේ නම් අනාදිමත් සංසාරයේ පටන් අවසාන අකුශල චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය. සෝතාපන්න, සකදගාමි, අනාගාමි, වීමෙන් පසු අකුශල පහළ වේ නම අනාදිමත් සංසාරයේ පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝ ය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, මාර්ග නොලබන්නා වූ පෘථග්ජන පුද්ගල-යෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (දුක්ඛ සත්‍ය හා සමුදය සත්‍ය මූලිය මෙනි.) ප්‍රත්‍යනික සංසය සවරූපාර්ථ ''පච්ඡිම චිත්ත සමංගීනං තේසං,'' (පෙර සේ සවරූප උද්ධරනු)

පුද්ගල වාරය නිමි. (ඔකාස වාරය සුගමයි.)

---

## පුද්ගලෝකාස වාරය

පුද්ගලෝකාශ වාරයෙහි ''කුශල හා අකුශල අනුලෝමයෙහි ''යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං තෙසං තත්ථ''. ප්‍රතිලෝමයෙහි - ආමන්තා,'' අනුලෝම සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලසථ-යෝය. අකුශල පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වේ නම් අවසාන අකුසල චිත්තයාගේ පටන් චෝදනයට පූර්ව අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය, සෝතාපන්න-සකදගාමි-අනාගාමි වීමෙන් පසු අකුශල උපදිත් නම අවසාන අකුශලයාගේ පටන් චෝදනයට පූර්ව අනුලෝමය දකවා අනාගාමි ඵලසථ ආයඞ් පුද්ගලයෝ ය. යන මේ ආයඞ් පුද්ගල-යන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වේ නම්, අවසාන අකුශල ජවනයාගේ පටන් සතරවැනි ජවනය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍යවූද, අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර හා අකනිට්ඨා තලවර්ජිත පඤ්චවෝකාර

භූමි (25) පස්විස්ස ගනු ලැබෙති. අකුශල පහළ නොවී සතර මාර්ග ලබන්නා වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශල චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයෝ ය. සෝතාපන්න-සකදාගාමි-අනාගාමි වීමෙන් පසු අකුශල පහළවෙත් නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයෝය, යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන කුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද, පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද, අභව්‍ය වූද, පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය. යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේමය. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් ගේ මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම් අන්තිම කුශල ජවනයාගේ පටන් සතරවැනි ජවනය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූද, පෘථග්ජන (4) සතර දෙනාගේ කාමභූමි (11) එකළොස ගනුලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබෙ. [සන්නිට්ඨාන ස්වරූපයෙහි පාළිය නැත. ලැබීමට සුදුසු නිසා සවරූප උද්ධරන ලදී.]

## කුසල හා අව්‍යාකෘතය

කුශල හා අව්‍යාකෘතයෙහි - අනුලෝම ''ආමන්තා,'' ප්‍රතිලෝමයෙහි ''අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං, පඤ්චවෝකාරානං තෙසං තත්ථ,'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගසථ පුද්ගලයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආයති

පුද්ගලයෝය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (12) දොළසය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම්, පශ්චිම ජවනයාගේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද, අකුශල ජවනයක් වන්නේ නම්, අවසාන කුශල ජවනයාගේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දකවා සූදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූද පෘථග්ජන (4) සතර දෙනාය, යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනා ය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අකනිට්ඨ තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය.

අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නා වූ, අසංඥතලයෙහි උපදිමින් චුතවෙමින් සිටින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන මේ භූමි ලැබෙති. ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගයට පූර්ව වෝදාන චිත්තය දකවා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියෙහි පටන් සතර වැනි ජවනය දක්වාද, අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම කුශල ජවනයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද-අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අකනිට්ඨ තලය වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ.

## අකුසල හා අව්‍යාකෘතය

අකුශල හා අව්‍යාකෘතයෙහි - අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි "අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අගමග්ගං පටිලභිස්සන්ති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තතථ."

අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගසථ ආයථි පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආයථි පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථයෝය. අකුශල පහළ නොවී සතර මාර්ගය ලබන්නා වූ කෙනෙක් වන්නේ නම් අවසාන අකුශලයාගේ පටන් වෝදනයට පූර්ව අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය.

සෝතාපන්න-සකෘදගාමි-අනාගාමි වීමෙන් පසු අකුශල පහළ වන්නේ නම් අවසාන අකුශලයාගේ පටන් වෝදනයට පූර්ව අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම් පඤ්චම ජවනයාගේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද කුශල ජවනයක් වන්නේ නම්, අවසාන අකුශල ජවනයාගේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අකනිටාතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය. අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන මේ භූමි ගනු ලැබේ.

අකුශල පහළ නොවී සතර මාර්ගය ලබන්නා වූ කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, සෝතාපන්න-සකෘදගාමි-අනාගාමි වීමෙන් පසු අකුශල පහළවන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම අකුශලයාගේ අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන (4) සතර දෙනාය, යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිටාතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, ශුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ගනු ලැබේ.

ප්‍රත්‍යනීක සංසය කුශල හා අකුශලයෙහි "අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, අසඤ්ඤසත්තානං තෙසං, තත්ථ," අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (12) දොළසය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ කෙනෙක් වන්නේ නම්, පඤ්චම ජවනයාගේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසංඥතල වාසීන්ගේ අසංඥතල භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

කුශල හා අව්‍යාකෘතයෙහි ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "පච්ඡිම චිත්ත සමංගීනං තේසං තත්ථ," ත්‍රිහේතුක චුති (13) තෙළෙසගේ හා චෛතසික (35) පන්තිස් දෙනාගේ ක්ෂණත්‍රය සමංගීවූ අරහත් ඵලස්ථ ආයඞ පුද්ගලයන්ගේ චතුවෝකාරභූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ චුති සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය. අසංඥතල භූමියෙහි මතු නැවත නූපදින්නාවූ අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ. (අකුශල හා අව්‍යාකෘතයෙහි ද ප්‍රත්‍යනීක සංසය ස්වරූප සමානයි)

අනාගත වාරය නිමි.

---

# වර්තමානාතීත පුද්ගල වාරය

වර්තමානාතීත වාරයෙහි "යස්ස කුසලා ධම්මා උප්පජ්ජන්ති, තස්ස අකුසලා-ධම්මා උප්පජ්ජිත්ථාති, ආමන්තා, යස්ස වා පන සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤ-

සත්තානං තෙසං, කුසලානං උප්පාදක්ඛණෙ තෙසං,'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද, (12) දොළොස් අකුශල චිත්තය, (36) සතිස් විපාක චිත්තය, (20) විසි ක්‍රියා චිත්තය යන මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද පෘථග්ජන (4) සතර දෙනාය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, නිරෝධසමාපත්ති සමාපන්න වූ අනාගාමි අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය. අසංඥසත්ත්ව පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (21) එක්විසි කුශල චිත්තය හා (38) අටතිස් චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාද, අර්හත් ඵලසථ වර්ජිත ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත් දෙනාද ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේ ලැබේ. ප්‍රත්‍යනික සංසය නොමැත. අව්‍යාකෘත මූලීය ද මෙයට සමානය.

අකුශල මූල අව්‍යාකෘත මූලියෙහි අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ,-අකුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තේසං, අකුසලානං උප්පාදක්ඛණෙ තෙසං'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, (21) එක්විසි කුසල චිත්තය, (36) සතිස් විපාකය, (20) විසි ක්‍රියා චිත්තය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද පෘථග්ජන (4) සතර දෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමි අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝය, අසංඥ සත්ව පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (12) දොළොස් අකුශල චිත්තය හා (27) සත්විසි චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාද යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාද ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේ මැයි. ප්‍රත්‍යනික සංසය නොමැත. පුද්ගල වාරය නිමි. (ඔකාස වාරය සුවගයි).

## පුද්ගලෝකාස වාරය

පුද්ගලෝකාශ වාරයෙහි - කුශලමූල අව්‍යාකෘත මූලි - අනුලෝම, ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, තත්ථ, කුසලානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ සුද්ධාවාසයෙහි වන්නේ නම්, භවනිකන්තික දෙවැනි ජවනයාගේ පටන් චුතිය දක්වා ද, ඉතිරි චතුවෝකාර, පඤ්චවෝකාරයෙහි වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දකවා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූද, (12) දොළොස් අකුශලය, (36) සතිස් විපාකය, (20) විසි ක්‍රියාවන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති. (21) එක්විසි කුශල (38) අටතිස් චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා අර්හත් ඵලසථයාවර්ජිත

ආයර්‍ය පුද්ගලයන් (7) සත් දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද, පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. ''සංසය සවරූප පෙර මෙනි. ප්‍රත්‍යනීක සංසය සවරූප ''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' (ශුද්ධ අතීතවාරය මෙන් උදුරනු.)

කුශල හා අව්‍යාකෘතයෙහි-අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, කුසලානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ.'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ-ශුද්ධාවාසයෙහි වන්නේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවාංගයේ පටන් චුතිය දක්වා ද, ඉතිරි චතුවෝකාර, පඤ්චවෝකාරයෙහි වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, (12) දොළොස් අකුශල, (36) සතිස් විපාක (20) විසි ක්‍රියා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර, පඤ්චවෝකාර භූමි (25) විසිනය හා අසංඥසත්ව පුද්ගලයන්ගේ අසංඥභූමිය ගනු ලැබේ. (21) එක්විසි කුශල (38) අටතිස් චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා අර්හත් ඵලසථයා වර්ජිත ආයර්‍ය පුද්ගලයන් (7) සත් දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද, පඤ්චවෝකාර භූමි (26) විසිනය ද ගනු ලැබෙති, ප්‍රත්‍යනීක සංසය ''සුද්ධාවාසං උපපජ්ජන්තානං'' [අතීත වාරය මෙන් උදුරනු. අකුශල හා අව්‍යාකෘතයෙහි ද නය ක්‍රමය සමානයි].

වර්තමානාතීත වාරය නිමි.

## වර්තමානානාගත වාරය

වර්තමානානාගත වාරයෙහි ''යස්ස කුසලා ධම්මා උප්පජ්ජන්ති, තස්ස අකුසලා ධම්මා උප්පජ්ජිස්සන්තීති, අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරෙසං කුසලානං උප්පාදක්ඛණෙ තෙසං, යස්ස වා පන සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරෝධසමාපන්නානං, අසඤ්ඤසත්තානං, තෙසං, කුසලානං උප්පාදක්ඛණෙ තෙසං''.

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගසථ ආයර්‍ය පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලසථ ආයර්‍ය

පුද්ගලයෝය. අකුශල පහළ නොවී සතරමාර්ග ලබන්නෙක් වේ නම් අවසාන අකුශලයෙන් පසු සුදුසු පරිදි උපදින ලෞකික කුශල් සිත් (17) සතළොස හා යට මාර්ගත්‍රයාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථයන් (3) තිදෙනාය.

සෝතාපන්න වීමෙන් පසු අකුශල පහළ වන්නේ නම්, අවසාන අකුශලයෙන් පසු සුදුසු පරිදි උපදින ලෞකික කුශල් සිත් (17) සතළොස හා සකෘදාගාමී මාර්ග, අනාගාමී මාර්ගයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සෝතාපත්ති ඵලස්ථයෝය. මැද මාර්ගස්ථ දෙදෙනාය, මැද ඵලස්ථ දෙදෙනාය, සකෘදාගාමී වීමෙන් පසු අකුශල පහළ වන්නේ නම් අවසාන අකුශලයෙන් පසු සුදුසු පරිදි උපදින ලෞකික කුශල් සිත් (17) සතළොස හා අනාගාමී මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ සකෘදාගාමී ඵලස්ථයෝය, අනාගාමී මාර්ගස්ථයෝය, අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝය.

අනාගාමී වීමෙන් පසු අකුශල පහළවන්නේ නම් අවසාන අකුශලයෙන් පසු සුදුසු පරිදි උපදින ලෞකික කුශල් සිත් (17) සතළොසගේ උත්පාද ක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝත් ගනු ලැබෙති. අකුසල පහළ නොවී සතර මාර්ගය ලබන්නෙක් වන්නේ නම්, අවසාන අකුශලයට පූර්වයෙන් සුදුසු පරිදි පහළවන ලෞකික කුශල් සතළොසගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය පෘථග්ජනයෝය. සෝතාපන්න වීමෙන් පසු අකුශල පහළ වන්නේ නම්, අවසාන අකුශලයට පූර්වයෙන් සුදුසු පරිදි පහළවන ලෞකික කුශල් (17) සතළොස සෝතාපත්ති මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ, භව්‍ය පෘථග්ජනයන් හා සෝතාපත්ති මාර්ගස්ථයෝය, සෝතාපත්ති ඵලස්ථයෝය, සකෘදාගාමී වීමෙන් පසු අකුශල පහළ වන්නේ නම්, අවසාන අකුශලයට පූර්වයෙන් සුදුසු පරිදි උපදින ලෞකික කුශල් (17) සතළොස හා සෝතාපත්ති මාර්ග, සකෘදාගාමී මාර්ගයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (2) දෙදෙනාය. යට ඵලස්ථ (2) දෙදෙනාය, අනාගාමී වීමෙන් පසු අකුශල පහළ වන්නේ නම්,-අවසාන අකුශලයට පූර්වයෙන් සුදුසු පරිදි උපදින ලෞකික කුශල් (17) සතළොස හා යට මාර්ගත්‍රයේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මාර්ග නොලබන්නෙක් වේ නම් සුදුසු පරිදි උපදින ලෞකික කුශල් (17) සතළොසගේ උත්පාදක්ෂණ සමංගී වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අකුසල පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වේ නම්, අනාදිමත් සංසාරයේ පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භඞ්ගක්ෂණ සමංගී වූද, අකුශල් (12) දොළොස, ආවර්ජනා (2) දෙක හා ලෞකික විපාක සිත් (32)

දෙතිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූද භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපන්න වීමෙන් පසු අකුශල පහළ වන්නේ නම්, අනාදිමත් සංසාරයේ පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, අකුශල් (12) දෙළොස, ආවර්ජනා සිත් (2) දෙක, ලෞකික විපාක සිත් (32) දෙතිස හා සෝතාපත්ති ඵල චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූද, භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය. සෝතාපත්ති මාර්ගසථයෝය, සෝතාපත්ති ඵලසථ ආයථි පුද්ගලයෝය.

සකදගාමි වීමෙන් පසු අකුශල් පහළ වන්නාහු නම්, අනාදිමත් සංසාරයෙහි පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද, අකුශල් සිත් (12) දෙළස, ආවර්ජනා සිත් (2) දෙක, ලෞකික විපාක සිත් (32) දෙතිය, සෝතාපත්ති ඵල, සකදගාමි ඵල චිත්ත-යන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගසථ (2) දෙදෙනාය, යට ඵලසථ (2) දෙදෙනාය, අනාගාමි වීමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම් අනාදිමත් සංසාරයෙහි පටන් එන අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දකවා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, අකුශල් සිත් (12) දොළසය, ආවර්ජනා සිත් (2) දෙකය, ලෞකික විපාක සිත් (32) දෙතිස හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය, මාර්ගාධිගමය නොකරන්නෙක් වේ නම්, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංග-ක්ෂණ සමංගී වූද, අකුශල් සිත් (12) දෙළස ආවර්ජනා සිත් (2) දෙක, ලෞකික විපාකසිත් (32) දෙතිසගේ උත්පාදක්ෂණ සමංගී වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය නිරෝධ සමාපත්ති සමාපන්න වූ අනාගාමි ආයථි පුද්ගලයෝය, අසංඥසත්ව පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනුලෝම සංසය ද ගනු ලැබේ.

ප්‍රත්‍යනික සංසය සවරූපාර්ථ ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්-ඛණෙ තෙසං,'' අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගසථ පුද්ගලයෝ ය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආයථි පුද්ගල-යෝය, අර්හත් මාර්ගයට පූර්ව චෝදනයාගේ භංගක්ෂණ සමංගී වූ අනාගාමි ඵලසථ ආයථි පුද්ගලයෝය, අකුසල් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වේ නම්, අවසාන අකුසලයාගේ පටන් චෝදනයට පූර්ව අනුලෝමය දකවා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද, අකුශල් සිත් (12) දෙළස ආවර්ජනා සිත් (2) දෙක, ලෞකික විපාක සිත් (32) දෙතිස හා යටඵල සිත් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යටඵලසථ (3) තිදෙනාය.

සෝතාපත්ත විමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම්, අවසාන අකුශලයාගේ පටන් චෝදනයට පූර්ව වූ අනුලෝම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද අකුශල් සිත් (12) දෙළස ආවර්ජන සිත් (2) දෙක ලෞකික විපාක සිත් (32) දෙතිස හා යට ඵල සිත් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ මැද මාර්ගසථ (2) දෙදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය. සකෘදාගාමී විමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම්, අවසාන අකුශලයාගේ පටන් චෝදනයට පූර්ව අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද අකුශල් සිත් (12) දෙළස, ආවර්ජනා සිත් (2) දෙක ලෞකික විපාක සිත් (32) දෙතිස, සකෘදාගාමී ඵල අනාගාමී ඵල චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සකෘදාගාමී ඵලසථ, අනාගාමී මාර්ගසථ අනාගාමී ඵලසථ ආයඨ පුද්ගලයෝය.

අනාගාමී වීමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම්, අවසාන අකුශල චිත්තයාගේ පටන් චෝදනයට පූර්ව වූ අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, අකුසල් සිත් (12) දෙළොස, ආවර්ජනා සිත් (2) දෙක, ලෞකික විපාක සිත් (32) දෙතිස, හා අනාගාමී ඵල චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමී ඵලසථ ආයඨ පුද්ගලයෝය. නිරෝධ සමාපත්ති සමාපන්න වූ අර්හත් ඵලසථ ආයඨ පුද්ගලයෝ යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

## කුසල හා අව්‍යාකෘතය

කුශල හා අව්‍යාකෘතයෙහි - අනුලෝම - ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, කුසලානං උප්පාදක්ඛණෙ තෙසං''. ප්‍රතිලෝම සන්නිවයාන සවරූපාර්ථ, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අකුශල් සිත් (12) දෙළස, විපාක සිත් (36) සතිස හා ක්‍රියා සිත් (20) විස්සගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. ආයඨ පුද්ගලයන් (8) අට දෙනාය. පශ්චිම භවිකයෙක් නොවන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අකුශල් සිත් (12) දෙළස, ආවර්ජනා සිත් (2) දෙක, ලෞකික විපාක සිත් (32) දෙතිස, හා යට ඵලසිත් (3) තුන් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය, යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, නිරෝධ සමාපත්ති සමාපන්න වූ අනාගාමී අර්හත් ආයඨ පුද්ගලයෝය. අසංඥසත්ත්වයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (21) එක්විසි කුශල චිත්තය හා (38) අටතිස් චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනාද අර්හත් ඵලසථ වර්ජිත ආයඨ පුද්ගලයන් (7) සත් දෙනාද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං'' (අනාගත වාරය මෙන් සවරූප උදුරනු-

## අකුසල හා අව්‍යාකෘතය

අකුශල හා අව්‍යාකෘතයෙහි-අනුලෝමය-ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, අකුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං, තෙසං, අකුසලානං උප්පාදක්ඛණෙ තෙසං", ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ (21) එක්විසි කුශලය (36) සතිස් විපාකය හා (20) විසි ක්‍රියා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය. පශ්චිම භවියෙක් නොවන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ග වර්ජිත කුසල් සිත් (20) විස්ස, ආවර්ජනාද්වය, ලෞකික විපාක (32) දෙතිස හා යට ඵලචිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද, අභව්‍ය වූද පෘථග්ජනයෝය, යට මාර්ගසථ (3) තිදෙනා ය, යට ඵලසථ (3) තිදෙනාය නිරෝධසමාපත්ති සමාපන්න වූ අනාගාමි රහත් ආර්‍ය්‍ය පුද්ගලයෝය. අසඤ්ඤ සත්තයෝය යන මෙ පුද්ගලයෝ ගනු ලැබෙති. (12) දෙළොස් අකුශලය හා (27) සත්විසි චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාද යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් 3 තිදෙනා ද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ"පච්ඡිම චිත්ත සමංගීනං, තෙසං,". (පෙර සේ උදුරනු)

පුද්ගලවාරය නිමි. (ඕකාස වාරය සුගමයි.)

## පුද්ගලෝකාස වාරය

පුද්ගලෝකාස වාරයෙහි කුසලමූල අකුසලමූලියෙහි "අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, තෙසං තත්ථ, ඉතරෙසං කුසලානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ.". ["චතුවෝකාරෙ පඤ්චවොකාරෙ" කියා පෙළෙහි ඇතත් යට යමකය හා සංසන්දනය නොවේ.]

අනුලෝම සන්නිට්ඨාන සවරූපාර්ථ - අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගසථ පුද්ගලයෝය, අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථ පුද්ගලයෝය, අකුශල් පහළ නොවී සතර මාර්ග ලබන්නාවූ කෙනෙක් වන්නේ නම්, අවසාන අකුශලයෙන් පසු සුදුසු පරිදි උපදින ලෞකික කුශල් (17) සතලොස හා යටමාර්ග චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය.

සෝතාපන්න - සකදගාමි - අනාගාමි වීමෙන් පසු අකුශල් සිත් පහළ වෙත් නම් [පුද්ගල වාරය මෙන් උදුරනු] මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම් අවසාන අකුශලයෙන් පසු සූදුසු පරිදි උපදින ලෞකික කුශල් සිත් (17) දහත හා යට මාර්ග චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද, පෘථග්ජන (4) සතර දෙනා යට මාර්ගසථ (3) තිදෙනා හා යට ඵලසථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ගනු ලැබෙති.

අකුශල් පහල නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුසලයට පූර්වයෙහි සුදුසු පරිදි උපදින ලෞකික කුශල් සිත් (17) දහතගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, සෝතාපන්න වීමෙන් පසු අකුශල් පහළ වන්නාහු නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයාට පූර්ව වූ සුදුසු පරිදි උපදිනලෞකික කුශල් සිත් (17) සතලොස හා සෝතාපත්ති මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. සෝතාපත්ති මාර්ගසථයෝය. සෝතාපත්ති ඵලසථයෝය. සකදගාමි-අනාගාමි වීමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයාට පූර්ව වූ සුදුසු පරිදි උපදින ලෞකික කුසල් සිත් (17) සතලොස හා යට මාර්ග චිත්තයන් තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහෙතුක පෘථග්ජනයෝය. යට මාර්ගසථ (2) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම් අවසාන කුශල චිත්තයට පූර්වයෙහි සුදුසු පරිදි උපදින ලෞකික කුසල් සිත් (17) දහත හා යට මාර්ග චිත්තයන් තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද, අභව්‍ය වූද පෘථග්ජන (4) සතරදෙනාය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (෴) තිදෙනාය. මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම්, අවසාන අකුශලයට පූර්වයෙහි සුදුසු පරිදි උපදින ලෞකික කුසල් (17) සතලොසගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන (4) සතර දෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨා තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නාවූ කෙනෙක් වන්නේ නම්, අවසාන අකුශල චිත්තයට පූර්වයෙහි සුදුසු පරිදි උපදින ලෞකික කුසල් සිත් (17) දහත හා යට මාර්ග චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන (4) සතර දෙනා,

යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර මෙනි.

[මරණාසන්න අකුසල ජවනය පෘථග්ජනයන්ට පමණක් ලැබේ. ආර්‍ය පුද්ගලයන්ට නොලැබේ. පෘථග්ජනයන් අතුරෙන් ද දුගතියට යන්නවුන් හට පමණක්ම ලැබේ.]

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අකුශල් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අකුශල් සිත් (12) දොළස, ආවර්ජනද්වය හා ලෞකික විපාක (32) දෙතිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, සෝතාපන්න වීමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අකුශල් සිත් (12) දොළස, ආවර්ජනද්වය, ලෞකික විපාක (32) දෙතිස හා සෝතාපත්ති ඵල චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, සෝතාපත්ති මාර්ගස්ථයෝය. සෝතාපත්ති ඵලස්ථ පුද්ගලයෝය.

සකදාගාමි වීමෙන් පසු–අනාගාමි වීමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයට පූර්ව අනන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, අකුශල් සිත් (12) දොළස ආවර්ජනාද්වය ලෞකික විපාක සිත් (32) දෙතිස හා යට ඵල සිත් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් මරණාසන්න සතරවැනි ජවනය දක්වා ද, කුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයට පූර්වානන්තර චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අකුසල් සිත් (12) දොළස, ආවර්ජන ද්වය, ලෞකික විපාක (32) දෙතිස හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද, පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ යෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී

නම් වූ, අකුශල් සිත් (12) දොළසය, ආවර්ජනාද්වය, ලෞකික විපාක සිත් (32) දෙතිස, හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන (4) සතර දෙනාය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර හා සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස, ගනු ලැබෙති. අනුලෝම යංසය ස්වරූපද ගනු ලැබේ.

ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ - ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං, තත්ථ,'' අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී අර්හත් ඵලස්ථයෝය. අර්හත් මාර්ගයට පූර්ව චෝදනයාගේ භංගක්ෂණ සමංගී වූ අනාගාමි ඵලස්ථයෝය. අකුශල් සිත් පහළ නොවී සතර මාර්ග ලබන්නා වූ යෙනෙක් වන්නේ නම් අවසාන අකුශල චිත්තයාගේ පටන් චෝදනයට පූර්ව අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගීවූ අකුශල් සිත් (12) දොළස, ආවර්ජන ද්වය, ලෞකික විපාක (32) දෙතිස, හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ නව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය.

සෝතාපන්න- සකදගාමි- අනාගාමි වීමෙන් පසු අකුශල් සිත් පහළ වන්නාහු නම් අවසාන අකුශල චිත්තයාගේ පටන් චෝදනයට පූර්ව අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අකුශ් (12) දොළොසය. ආවර්ජනාද්වය, ලෞකික විපාක (32) දෙතිය හා අනාගාමි ඵල චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමි ඵලස්ථ පුද්ගලයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් ගේ මරණාසන්න ජවනය අකුශල, ජවනයක් වන්නේ නම්, පස්වැනි ජවනයේ පටන් චුතිය දක්වා ද කුශල ජවනයක් වන්නේ නම් අවසාන අකුශල ජවනයේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අකුශල් සිත් (12) දොළොසය. ආවර්ජනා ද්වය ලෞකික විපාක (32) දෙතිස හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූද භව්‍ය වූද, අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යවා ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨා තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස හා අසංඥතල වාසී අසංඥ සත්ව යන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

## කුසල හා අව්‍යාකෘතය

කුශල හා අව්‍යාකෘතයෙහි - අනුලෝම - ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ, කුසලානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ," ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ ප්‍රතිසන්ධියෙහි පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, ආර්යයන් (8) අට දෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝ-කාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ කෙනෙක් වන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්-ෂණ සමංගී වූ, අකුශල් සිත් (12) දොළොසය, ආවර්ජනාද්වය ලෞකික විපාක සිත් (32) දෙතිස හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අසඤ්ඤතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නාවූ කෙනෙක්වන්නෝ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, අකුශල් සිත් (12) දොළස, ආවර්ජනද්වය, ලෞකික විපාක (32) දෙතිස හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන (4) සතර දෙනාය. යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්සය, අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නාවූ අසංඥ සත්ත්ව යන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ. (21) එක්විසි කුශල චිත්තය හා (38) අටතිස් චෛතසිකයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා අර්හත් ඵලසථයා වර්ජිත ආර්‍ය පුද්ගලයන් (7) සත් දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ "පච්ඡිම චිත්ත සමංගීනං තෙසං තත්ථ", (අනාගත වාරය මෙන් උද්ධරනු.)

## අකුසල හා අව්‍යාකෘතය

අකුශල හා අව්‍යාකෘතයෙහි-අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, අකුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤ සත්තානං, තෙසං තත්ථ අකුසලානං උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,"

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තන්යගේ භංගක්ෂණ සමංගී වූ (21) එක්විසි කුශල චිත්තය, (36) සතිස් විපාක චිත්තය හා (20) විසි ක්‍රියා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් හා ආය්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ කෙනෙක් නම් ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගය වර්ජිත කුසල් සිත් (20) විස්සය. ආවර්ජනා ද්වය ලෞකික විපාක (32) දෙතිස හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන, යට මාර්ගසථ (3) තිදෙනා හා යට ඵලසථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය අකනිට්ඨ තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නාවූ කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ග වර්ජිත කුසල් සිත් (20) විස්ස, ආවර්ජන ද්වය, ලෞකික විපාක (32) දෙතිස හා යට ඵල චිත්තයන් (3) තිදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද, අභව්‍ය වූද පෘථග්ජනයෝය, යට මාර්ගසථ (3) තිදෙනා හා යට ඵලසථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නාවූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ. (12) දෙළොස් අකුශල චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා යට ඵලසථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංඝය සවරූපාර්ථ ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං තත්ථ.'' (සමානය)

වර්තමානානාගත වාරය නිමි.

---

## අතීතානාගත පුද්ගල වාරය

අතීතානාගත වාරයෙහි ''යස්ස කුශලා ධම්මා උප්පජ්ජිත්ථ, තස්ස අකුසලා ධම්මා උප්පජ්ජිස්සන්තීති, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති, තෙසං, ඉතරෙසං තෙසං, යස්ස වා පන අමන්තා.''

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය. [සෙස්ස ශුද්ධ අනාගත වාරයෙහි කුශල හා අව්‍යාකෘතය අනුව උදුරනු. ප්‍රත්‍යනීක සංසය නොමැත.]

අව්‍යාකෘත මූලීයෙහි "පච්ඡිම චිත්ත සමංගීනං තෙසං, ඉතරෙසං, තෙසං යස්ස වා පන, ආමන්තා." අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, යන පශ්චිම චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. අනාදිමත් සංසාරයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා භව්‍ය පෘථග්ජනයෝ ද, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනා ද මාර්ග නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙත්. (අකුශල හා අව්‍යාකෘතය ද මෙසේය)

පුද්ගල වාරය නිමි. (ඔකාස වාරය සුමගයි)

---

## පුද්ගලෝකාස වාරය

"යස්ස යත්ථ කුසලා ධම්මා උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ අකුසලා ධම්මා උප්පජ්ජිස්සන්තීති, අග්ගමග්ග සමංගීනං අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං, චතුවෝකාරානං පඤ්චවෝකාරානං, තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ, ඉතරෙසං, චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ,"

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ පුද්ගලයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථයෝය. අර්හත් මාර්ගයට පූර්වයෙහි චෝදනයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලස්ථයෝය. අකුසල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම්, අවසාන අකුශල චිත්තයාගේ පටන් චෝදනයාගේ පූර්වයෙහි අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. සෝතාපන්න- සකදාගාමි- අනාගාමි වීමෙන් පසු -පෙ- අනාගාමි ඵලස්ථයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම්, පස්වැනි ජවනයේ පටන් චුතිය දක්වා ද කුසල ජවනයක් වන්නේ නම් අවසාන වූ අකුශල ජවනයාගේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර හා අකනිට්ඨාතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ගනු ලැබෙති.

අකුශල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශල චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. සෝතා-පන්න සකදාගාමි- අනාගාමි වීමෙන් පසු අකුශල් සිත් පහළ වන පුද්ගලයන් අතුරෙන් සුද්ධාවාසයෙහි වන්නේ නම්, ප්‍රථමයෙන් ම පහළ වන මහා කුශල් දෙවැනි ජවන් සිතේ පටන් අවසාන ම අකුශල චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, අව-සේස චතුවෝකාර, පඤ්චවෝකාරයෙහි වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශල චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි නමවූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන් අතුරෙන් සුද්ධාවාසයෙහි නම්, ප්‍රථමයෙන් ම, පහළවන මහාකුශල දෙවැනි ජවන් සිතෙහි පටන් අවසාන අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, අවසේස චතුවෝකාර, පඤ්චවෝකාර පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය, අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් මරණාසන්න සතරවැනි ජවන් සිත දක්වා ද කුශල ජවනයක් නම් ප්‍රතිසන්ධියේ පටන් අකුශලයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන සතර(4) සතර දෙනා, යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨා තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි වූ භව්‍ය වූද, අභව්‍ය වූද පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම පුච්ඡාවෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවාංගයයි කියන ලද නියත දෙවැනි සිතය. ඒ සිත හා සමග කුශල් සිත් පහළ වූ කෙනෙක් අතීතයෙහි නොමැති බැවින් ඒ හා සමාන ද්‍විතීය චිත්තයයි කියන ලද ප්‍රතිසන්ධිය, දෙවැනි භවාංගයේ පටන් ප්‍රථමයෙන් ම පහළ වන මහාකුශල ප්‍රථම ජවන් සිත දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලසථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි පස ගනු ලැබෙති. පෙර කියන ලද සංසය සවරූප ද ලැබේ. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ ''අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' අසංඥතල වාසීන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

## කුසල හා අව්‍යාකෘතය

කුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝම ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස යන පශ්චිම චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආයර්‍ය පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ චුති සිත් (19) එකුන්විස්ස හා චෛතසික (35) පන්තිස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි චුත වන පෘථග්ජන (4) සතර දෙනාගේ යට ඵලසථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා අකනිට්ඨා තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ගනු ලැබෙති.

ශුද්ධාවාසයෙහි නම් ප්‍රථමයෙන් ම පහළ වන මහාකුශල දෙවැනි ජවනයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන්, සුද්ධාවාසයෙහි වේනම්, ප්‍රථම මහා කුශල ද්විතීය ජවනයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වාද, අවශේෂ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයන්ගේ ද යට මාර්ගසථ (3) තිදෙනා හා යට ඵලසථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද අකනිට්ඨාතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ද.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන, යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි (සුද්ධාවාසානං - යන තැන අකුසල මූලිය මෙන් කියනු.)

අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ. [ප්‍රත්‍යනික සංසය- අතිරේක පෙළක් නැත. පාළි ගතිය මැයි, මේ ක්‍රමයට සමානයි. ''ශුද්ධාවාසයෙහි භවනිකාන්තික දෙවැනි ජවනයේ පටන්'' කීමම විශේෂයි. ''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ'' යන තන්හි ද අතීත වාරයට අනුව උදුරනු] උත්පාද වාරය නිමි.

## නිරෝධ වාරය

නිරෝධ වාරයෙහි වර්තමාන වාරය (උත්පාද වර්තමාන වාරය අනුව එහි උත්පාද භංග දෙක මාරු කොට කියන්න. අතීත වාරය ද එයට සමානය.) අනාගත වාරයෙහි ''යස්ස කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති, තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති, අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං යස්ස වා පන ආමන්තා.''

අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ, අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව වූ චෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයතී පුද්ගලයෝය. අකුසල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නට නියත වූ කෙනෙක් වන්නේ නම්, අවසාන අකුශල චිත්තයාගේ භංගයේ පටන් චෝදන චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න සකදාගාමී-අනාගාමී -පෙ- අනාගාමී ඵලස්ථ ආයතී පුද්ගලයෝ ගනු ලැබෙති. අකුශල් සිතක් පහළ නොවී සතර මාර්ගය ලැබීමේ නියත වූවෙක් වන්නේ නම්, අනාදිමත් සංසාරයෙහි පටන් අවසාන අකුශල චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගීවූ භව්‍ය පෘථග්ජනයෝය. සෝතාපන්න සකදාගාමී- අනාගාමී-පෙ- භව්‍ය පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, මාර්ග නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබේ. ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං තෙසං,'' අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ

සමංගී වූ අර්හත් මාර්ගසථ ආයථ පුද්ගලයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආයථ පුද්ගලයෝ ගනු ලැබෙති.

## කුශල හා අව්‍යාකෘතය

කුශල හා අව්‍යාකෘත අනුලෝමයෙහි–ආමන්තා, ප්‍රතිලෝමයෙහි- ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං තෙසං, ඉතරෙසං තෙසං'' අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගසථ ආයථ පුද්ගලයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථයෝ ගනු ලැබෙති. අනාදිමත් සංසාරයේ පටන් අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණය දක්වා භව්‍ය පෘථග්ජනයෝ ද අර්හත් ඵලසථයා වර්ජිත ආයථ පුද්ගලයන් (7) සත්දෙනා ද, මාර්ග නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේ ලැබේ.

ප්‍රත්‍යනික සංසය සවරූපාර්ථ ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ'' ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස් දෙනාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගසථ ආයථ පුද්ගලයෝ ගනු ලැබෙති.

## අකුශල හා අව්‍යාකෘතය

අකුශල හා අව්‍යාකෘතයෙහි–අනුලෝම,–ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''අග්ගමග්ග සමංගීනං, අරහන්තානං යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං, ඉතරෙසං, තෙසං'', ප්‍රතිලෝමයෙහි සන්නිච්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගසථයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආයථ පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව වූ වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලසථ ආයථ පුද්ගලයෝය. අකුශල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම් අවසාන අකුශල-යාගේ භංගක්ෂණයේ පටන් වෝදනයට පූර්ව අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, සෝතාපන්න-සකදගාමී-අනාගාමී-පෙ- අනාගාමී ඵලසථ පුද්ගලයෝ ගනු ලැබෙති.

අකුශල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම් අනාදිමත් සංසාරයේ පටන් අවසාන අකුශලයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජන පුද්ගලයෝය. සෝතාපන්න-සකදගාමී- අනාගාමී වීමෙන් පසු අකුසල් සිත් පහළ වන්නාහු නම අනාදිමත් සංසාරයේ

පටන් අවසාන අකුශලයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, මාර්ගයක් නොලබන්නා වූ පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේ ලැබේ. ප්‍රත්‍යනික සංසය ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං'' (පෙර සේ සවරූප කියනු.) පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුමගයි).

## පුද්ගලෝකාස වාරය

පුද්ගලෝකාශ වාරයෙහි-කුශල හා අකුශලයෙහි–අනුලෝම ''අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ ආමන්තා.''

අනුලෝමයෙහි සන්නිවය්‍යාත සවරූපාර්ථ අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් මාර්ගස්ථ පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව චෝදන චිත්තයා ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ පුද්ගලයෝය, අකුසල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නා වූ කෙනෙක් වන්නේ නම්, අවසාන අකුශලයාගේ භංගයේ පටන් චෝදනයට පූර්ව අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය, සෝතාපන්න- සකදාගාමී- අනාගාමී- පෙ- අනාගාමී ඵලස්ථයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම් අවසාන අකුශල ජවනයාගේ භංගයේ පටන් පඤ්චම ජවනයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද-අභව්‍යවූද පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර හා අකනිට්ඨාතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ගනු ලැබෙති.

අකුශල් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශලයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය, සෝතාපන්න- සකදාගාමී- අනාගාමී වීමෙන් පසු අකුශල් පහළ වන්නාහු නම් -පෙ- භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශල චිත්තයාගේ උත්පාදය දක්වා ද අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන කුශලයාගේ උත්පාදය දක්වා ද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද– අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ තලය වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද – අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේ ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම්, අවසාන කුශලයාගේ භංගයේ පටන් පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජන (4) සතර දෙනාගේ කාමභූමි (1) එකොළස ගනු ලැබෙති. [පෙළෙහි නැත. සවරූප ලැබීමට සුදුසු හෙයින් උද්ධරන ලදී. පාළියෙහි නොමැති හේතුව සත්‍ය යමකයෙහි කියා ඇත.]

ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ "අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං අසඤ්ඤසත්තානං තෙසං, තත්ථ," අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගසථ පුද්ගලයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආයථි පුද්ගලයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ කෙනෙක් වන්නේ නම්, පඤ්චම ජවනයාගේ භංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද–අභව්‍ය වූද පෘථග්ජන පුද්ගලයෝය, යට ඵලසථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාව වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය, අසංඥ සත්ත්වයන්ගේ අසංඥ තල භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

## කුශල හා අව්‍යාකෘතය

කුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝම–ආමන්තා, ප්‍රතිලෝමයෙහි ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ'', ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අර්හත් මාර්ගයාගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගස්ථයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම් පඤ්චම ජවනයාගේ භංගයේ පටන් චුති විපාකයාගේ උත්පාදක්ෂණය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද–අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට ඵලස්ථයෝ (3) තිදෙනාය, අකුශල ජවනයක් වන්නේ නම්, අවසාන කුශලයාගේ භංගයේ පටන් චුතිචිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය. අසංඥසත්ත්ව භූමියෙහි මතු නිරුද්ධ වන්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥසත්ත භූමිය ගනු ලැබේ.

ප්‍රතිසන්ධියේ පටන් අර්හත් මාර්ගයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. අර්හත් ඵලස්ථයා වර්ජිත ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත් දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරද අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ද, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පස්වැනි ජවනයාගේ උත්පාදය දක්වා ද, අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේපටන් අවසාන කුශලයාගේ උත්පාදක්ෂණය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය-සමංගී වූ භව්‍ය වූද – අභව්‍ය වූ පෘථග්ජන පුද්ගලයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනා යට, ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන් ගේ චතුවෝකාර භූමි (4) සතර ද අකනිට්ඨ තලය වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ද,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබේ.

ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ." ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස නම් වූ පශ්චිම චිත්තයාගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් ඵලසථ ආයතී පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ චුතිසිත් (19) එකුන් විස්ස හා චෛතසික (35) පන්තිසගේ භංගක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙන් චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලසථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය අකනිට්ඨා වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය. අසංඥසත්ත්ව භූමියෙහි මතු නැවත නූපදින්නා වූ අසංඥ-තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

## අකුසල හා අව්‍යාකෘතය

අකුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝම - ආමන්තා, ප්‍රතිලෝමයෙහි, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ,"

ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ, අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගසථයෝය. අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා අර්හත් ඵලසථයෝය. අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලසථයෝය. අකුශල සිත් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම්, අවසාන අකුශලයාගේ භංගයේ පටන් වෝදනායට පූර්ව අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය. යට ඵලසථ (3) තිදෙනාය. සෝතාපන්න- සකදගාමී- අනාගාමී- පෙ-අනාගාමි ඵලස්ථයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය අකුශල් ජවනයක් වන්නේ නම් පඤ්චම ජවනයාගේ භංගයේ පටන් චුති චිත්තයාගේ උත්පාදය දක්වා ද කුශල ජවනයක් වන්නේ නම්, අවසාන අකුශලයාගේ භංගයේ පටන් චුති චිත්තයාගේ උත්පාදය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ-භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගසථ (3) තිදෙනාය, යට ඵලසථ (3) තුන් දෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨාතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය. අසංඥතල භූමියෙහි මතු නිරුද්ධ වන්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ සත්ත්ව භූමිය යන මේ භූමි ගනු ලැබේති.

අකුශල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම් ප්‍රසන්ධියේ පටන් අවසාන අකුශලයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. සෝතාපන්න-සකදාගාමි- අනාගාමි -පෙ- අවසාන අකුශලයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ද,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය අකුශල ජවනයක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වා ද කුශල ජවනයක් වන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන අකුශල ජවනයාගේ උත්පාදය දක්වා ද භව්‍ය වූද-අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද අසංඥිවා තලය වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස ද.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වන්නේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද,-අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය, මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර ද, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සද ගනු ලැබෙති. සංසය සවරූපාර්ථ පෙර සේ ලැබේ. ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ කුශල මූලයට සමය, අනාගත වාරය නිමි. (වර්තමානාතීත වාරය වනාහි උත්පාද වාරයට සමය, උත්පාද-භා භංග දෙක මාරු කොට කියනු.)

## වර්තමානානාගත වාරය

වර්තමානානාගත වාරයෙහි ''යස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්ති, තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති, අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ තෙසං, ඉතරෙසං කුසලානං භංගක්ඛණෙ තෙසං, යස්ස වා පන සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ කුසල විප්පයුත්ත චිත්තස්ස භංගක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං''.

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ (උත්පාද වාරයෙහි මෙන් කියනු. භංගඛක්ෂණෙ-යයි කීමම විශේෂයි) ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අකුශල් සිත් පහළ නොවී සතර මාර්ගය ලබන්නෙක් වන්නේ නම්, අනාදිමත් සංසාරයෙහි පටන් අවසාන අකුශලයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ

උත්පාදක්ෂණ සමංගී වූ, (12) දොළොස් අකුශලය, ආවර්ජන ද්වය, හා ලෞකික විපාක සිත් (32) දෙතිසගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝය. සෝතාපන්න සකදාගාමි- අනාගාමි- පෙ- [උත්පාද වාරයට සමය, "අකුශලයාගේ උත්පාදක්ෂණය දක්වා" කීම පමණක් වෙනසි.]

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, අරහන්තානං, යස්සචිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සනති තස්ස චිත්තස්ස උප්පාද-දක්ඛණෙ තෙසං" අර්හත් මාර්ගයාගේ උත්පාදක්ෂණ සමංගී වූ -පෙ- [උත්පාද වාරය ආශ්‍රය කොට උද්ධරනු. "අවසාන අකුසලයාගේ භංගයේ පටන්" යි කියනු. කුශල හා අව්‍යාකෘතය ද අකුශල හා අව්‍යාකෘතය ද සුගමයි. ප්‍රතිලෝමයෙහි "පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා" කීම පමණක් වෙනසි. උත්පාද ක්‍රමයට අනුව කියනු.]

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං," (ඕකාස වාරය සුගමයි. පුද්ගලෝකාස වාරයෙහි කුශල හා අකුශලය, උත්පාද වාරයට සමානය. උත්පාද භංග දෙක මාරුකොට කීම පමණක් විශේෂයි.

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස උප්පාදක්-ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ." [කුශල හා අව්‍යාකෘතය, අකුශලය හා අව්‍යාකෘතය, උත්පාදයට සමානය. පශ්චිම චිත්තයාගේ උත්පාද- අනෛකාන්තයෙහි "චුති චිත්තයාගේ උත්පාදය දක්වා" කියනු.] ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙස තත්ථ," ඒකාන්ත-අනෛකාන්තය පෙර සේ උද්ධරනු. වර්තමානානාගත වාරය නිමි.

## අතීතානාගත වාරය

අතීතානාගත වාරයෙහි "යස්ස කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ, තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං,"

අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ, අර්හත් මාර්ගසථයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ-යෝය. [සෙස්ස අනාගත අකුශල අව්‍යාකෘත ප්‍රතිලෝමය අනුව උද්ධරනු.]

ප්‍රත්‍යනීක නොමැත. කුසල හා අව්‍යාකෘත අනුලෝමයෙහි "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං, ඉතරෙසං තෙසං," ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස යන පශ්චිම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ අර්හත් මාර්ගසථ ආයතී පුද්ගලයෝ

ගනු ලැබෙති. ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පශ්චිම භවික වූ ත්‍රිහේතුක පෘථග්ජනයෝ ද, ආයඞී පුද්ගලයන් (8) අට දෙනා ද පශ්චිම භවික නොවූ කාමාවචර, රූපාවචර අරූපාවචර පුද්ගලයෝ ද ගනු ලැබෙති. අකුශල හා අව්‍යාකෘතය ද මෙයට සමානය. ප්‍රත්‍යනීක සංසය නොමැත.

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි.)

## පුද්ගලෝකාස වාරය

පුද්ගලෝකාශ වාරයෙහි ''යස්ස යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති, තස්ස තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති, අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ,''

අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගස්ථ ආයඞී පුද්ගලයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආයඞී පුද්ගලයෝය. අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමි ඵලස්ථ ආයඞී පුද්ගලයෝය. අකුශල් පහළ නොවී සතර මාර්ග ලබන්නා වූ කෙනෙක් වන්නේ නම් අවසාන අකුශලයාගේ භංගයේ පටන් වෝදනයට පූර්ව අනුලෝමය දක්වා [''අවසන් අකුශලයාගේ භංගයේ පටන්'' කීම පමණක් වෙනසි. උත්පාද වාරය අනුව ස්වරූප උද්ධරනු. සංසය ස්වරූපාර්ථයෙහි ද ''අවසාන අකුශලයාගේ උත්පාදය දක්වා''යි උද්ධරනු ප්‍රතිලෝමයෙහි ද උත්පාද වාරය අනුව මැයි.]

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ ''අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' කුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝමයෙහි ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' [උත්පාදයට සමානය, පශ්චිම චිත්තයාගේ භංගය උද්ධරනු. සංසයෙහි පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා උද්ධරනු. අකුසල හා අව්‍යාකෘතයෙහි ද සමානය.]

නිරෝධ වාරය නිමි.

# උත්පාද නිරෝධ වාරය

උත්පාද නිරෝධ වාරයෙහි වර්තමාන වාර අනුලෝමයෙහි ප්‍රතිෂෙධම ලැබේ. ප්‍රත්‍යනිකයෙහි ''යස්ස කුසලා ධම්මා නුප්පජ්ජන්ති, තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති, අකුසලානං භංගක්ඛණෙ තෙසං, කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අකුසල විප්පයුත්ත චිත්තස්ස භංගක්ඛණෙ, නිරෝධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං, යස්ස වා පන කුසලානං උප්පාදක්ඛණෙ තෙසං,''

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ (12) දෙළොස් අකුශල චිත්තය හා (27) සත්විසි චෛතසිකයන්ගේ භංගක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා යට ඵලසථ (3) තිදෙනා ගනු ලැබෙති. (12) දෙළොස් අකුශල, (36) සතිස් විපාකය හා (20) විසි ක්‍රියාවන්ගේ උත්පාදක්ෂණ සමංගී වූද, (21) එක්විසි කුශලය, (36) සතිස් විපාකය හා (20) විසි ක්‍රියාවන්ගේ භංගක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාද ආයඖ පුද්ගලයන් (8) අට දෙනා ද නිරෝධ සමාපත්ති සමාපන්න වූ අනාගාමි අර්හත් ආයඖ පුද්ගලයෝ ද අසංඥ සත්ත්ව යෝද, ගනු ලැබෙති, සංසය සවරූපාර්ථ පෙර සේ ලැබේ. ප්‍රතිලෝම සවරූපාර්ථ පෙර සේ කියනු.

## කුසල හා අව්‍යාකෘතය

කුශල හා අව්‍යාකෘත අනුලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං, සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ කුසල විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණේ, අරූපෙ කුසලා කුසලානං භංගක්ඛණෙ තෙසං, යස්ස වා පන කුසලානං උප්පාදක්ඛණෙ තෙසං'',

අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ සියලුම චුතවන පෘථග්ජන (4) සතර දෙනාය, ඵලසථ (4) සතර දෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා අරූප භූමියෙහි කුශල අකුශලයන් හැර සියලු චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී යයි කියනලද පෘථග්ජන (4) සතර දෙනා හා ආයඖ පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. [නිරෝධ සමාපන්නයන් හා අසංඥසත්ත්වයන් මෙතැනදී නොගන්නා බව ආචාර්‍ය්‍ය පාදයෝ කියති.]

උපදිමින් සිටින සියලු පෘථග්ජනයන් (4) සතර දෙනාය, යට ඵලසථ (3) තිදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා ද, (12) දෙළොස් අකුශල චිත්තය, (36) සතිස් විපාක චිත්තය හා (20) විසි ක්‍රියා චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනාය, ඵලසථ (4) සතර දෙනාය, අරූප භූමියෙහි කුශල අකුශලයන්ගේ භංගක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජනයෝද ඌර්ධමාර්ගසථ (3) තිදෙනාද යට ඵලසථ (3) තිදෙනා ද

ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේ ලැබේ. [ප්‍රතිලෝමයෙහි පෙර සේ උද්ධරනු අකුශල හා අව්‍යාකෘතයෙහි ද ක්‍රමය සමානය. ඔකාශ වාරය සුගමයි. පුද්ගලෝකාශ වාරය ද සමානය, නිරෝධ සමාපත්තිය ගැනීමම විශේෂයි. අතීත වාරය ද නය ක්‍රමය සමානයි.]

## අනාගත පුද්ගල වාරය

අනාගත වාරයෙහි "යස්ස කුසලා ධම්මා උප්පජ්ජිස්සන්ති, තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති, යස්ස චිත්තස්ස අනන්තරා". (උත්පාද පාළිය මෙනි) අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයට පූර්ව වෝදනයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලසථ ආයති පුද්ගලයෝය. අකුශල් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම් අවසාන අකුශලයාගේ භංගයේ පටන් වෝදනයට පූර්ව අනුලෝමය දක්වා, (සෙස්ස නිරෝධ වාරය මෙනි.) පෙර සේ උද්ධරනු.'

ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ "අග්ගමග්ග සමංගීනං, අරහන්තානං තෙසං", උත්පාද වාරය මෙන් උද්ධරනු. කුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝම-"ආමන්තා" ප්‍රතිලෝමයෙහි, "අග්ගමග්ග සමංගීනං, අරහන්තානං තෙසං ඉතරෙසං තෙසං", උත්පාද වාරය මෙනි. අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගසථයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථයෝය. (සෙස්ස උත්පාද වාරය මෙන් උද්ධරනු) ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ" "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං," [අකුශල හා අව්‍යාකෘතයෙහි උත්පාද පාලියෙහි මෙනි. සවරූපාර්ථයෙහි ද පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා යයි කියනු. සෙස්ස උත්පාද වාරය මෙනි.]

## පුද්ගලෝකාස වාරය

පුද්ගලෝකාශ වාරයෙහි [කුශල හා අකුශල අනුලෝමයෙහි උත්පාද පාලිය මෙනි.] අනුලෝමයෙහි සන්නිට්ඨාන සවරූපාර්ථ අර්හත් මාර්ගයට පූර්ව වෝදන-යාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අනාගාමී ඵලසථයෝය. අකුශල් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම්, අවසාන අකුශලයාගේ භංගයේ පටන් වෝදනයාගේ පූර්ව අනුලෝමය දක්වා [උත්පාදයමෙන් කියනු. "අවසාන අකුශලයාගේ භංගයේ පටන් "යි කීමම විශේෂයි, සංසය සවරූප නිරෝධය මෙන් උද්ධරනු.]

ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ "අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, අසඤ්ඤ-සත්තානං තෙසං තත්ථ", අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත්

මාර්ගසමඞ්ගීයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්‍ෂණ ත්‍රය සමංගී වූ අර්හත් ඵලසමඞ්ගී ආයතී පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නාවූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම්, පඤ්චම ජවනයේ පටන් චුතිය දක්වා ද, අකුශල ජවනයක් වන්නේ නම්, අවසාන අකුශලයාගේ භංගයේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්‍ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට ඵලසමඞ්ගී (3) තිදෙනාය යන මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර හා අකනිට්ඨ තලය වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස හා අසංඥ සත්ත්වයන්ගේ අසංඥ තල භූමිය ගනු ලැබේ.

කුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝම-''ආමන්තා,'' ප්‍රතිලෝමයෙහි ''අග්ගමග්ග සමංගීනං, අරහන්තානං, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගසමඞ්ගීයෝය, අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසමඞ්ගීයෝය. මේ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන්ගේ මරණාසන්න ජවනය කුශල ජවනයක් වන්නේ නම්, පඤ්චම ජවනයාගේ පටන් චුතියගේ උත්පාදය දක්වා ද, අකුශල ජවනයක් වන්නේ නම්, අවසාන කුශලයාගේ පටන් චුතියේ උත්පාදය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූද-අභව්‍ය වූද පෘථග්ජනයන්ගේ හා යට ඵලසමඞ්ගී ආයතී පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ තලය වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස්විස්ස හා අසංඥතල භූමියෙහි මතු නැවත නිරුද්ධ වන්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල භූමිය ගනු ලැබේ. [සංසය ස්වරූපාර්ථ උත්පාද වාරය අනුව උදුරනු.] ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ,'' [නිරෝධ වාරය මෙන් උදුරනු.] අකුශල හා අව්‍යාකෘතයෙහි අනුලෝම, ''ආමන්තා,'' ප්‍රතිලෝමයෙහි උත්පාද වාරය මෙනි. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ, අර්හත් මාර්ගයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් මාර්ගසමඞ්ගීයෝය. අර්හත් මාර්ගානන්තර ඵලයේ පටන් පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසමඞ්ගීයෝය, අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලසමඞ්ගී ආයතී පුද්ගලයෝය.

(සෙස්ස උත්පාද වාරය හා සමානය.) ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ,'' (නිරෝධය මෙන් උද්ධරනු.) අනාගත වාරය නිමි. වර්තමානාතීත වාරයෙහි උත්පාද වාරය හා සමානය.

## වර්තමානානාගත වාරය

වර්තමානානාගත වාරයෙහි ''යස්ස කුසලා ධම්මා උප්පජ්ජන්ති, තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති, අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ,'' - පෙ- උත්පාද වාර පාළිය මෙනි. (අනුලෝම සන්නිට්ඨාන සංසය උත්පාද වාරය හා සමානය.) ප්‍රති-ලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ අකුශල් සිතක් පහළ නොවී සතර මාර්ග ලබන්නෙක් වන්නේ නම්, අනාදිමත් සංසාරයේ පටන් අවසාන අකුශල චිත්තයාගේ උත්පාදය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගීවූ -පෙ- (සෙස්ස උත්පාද වාරය හා සමානය.)

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ ''අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ තෙසං'' [ස්වරූප.ර්ථ උත්පාද වාරය මෙනි. එහි අවසාන අකුශල චිත්තයාගේ භංගක්ෂණයේ පටන් වෝදානයට පූර්ව අනුලෝමය දක්වා සුදුසු පරිදි උපදින චිත්ත-යන්ගේ භංගක්ෂණ සමංගී වූ ආවර්ජන ද්වය, ලෞකික විපාක සිත් (32) දෙතිස, හා යට ඵල සිත් (3) තිඃදනාගේ උත්පාදක්ෂණ සමංගී යනාදිය කියනු. විශේෂය මෙ පමණකි.

කුශල හා අව්‍යාකෘතය අකුශල හා අව්‍යාකෘත මේ යමක දෙකෙහි පාලිය හා ස්වරූපාර්ථ උත්පාද වාරය හා ප්‍රතිලෝමයෙහි පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා ස්වරූප ගැනීමම විශේෂයි.] ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං,'' නිරොධ වාරය මෙන් උද්ධරනු.

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි.)

---

## පුද්ගලෝකාස වාරය

[පුද්ගලෝකාශ වාරයෙහි කුශල හා අකුශලයෙහි අනුලෝම උත්පාද වාරය මෙන් උද්ධරනු. ප්‍රතිලෝමයෙහි ද අවසාන අකුශලයාගේ උත්පාදය දක්වා අනෙන්-කාන්ත පදයෙහි ද ''පඤ්චම ජවනයාගේ උත්පාදය දක්වා'' යි කියනු. උත්පාද වාරයට වඩා විශේෂ මෙපමණකි.]

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "අග්ගමග්ගස්ස භංගක්ඛණෙ, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ." [අවසාන අකුශල චිත්තයාගේ භංගය, පඤ්චම ජවනයාගේ භංගයේ පටන්" කීම ම උත්පාද වාරයට වඩා විශේෂ වේ. නිරුද්ධවන්නා වූ, උපදින්නා වූ චිත්තයන් කල්පනා කොට ගතයුතුය. උත්පාදක්ෂණය දක්වා නිරුද්ධ වන්නාවූ චිත්තය ලැබේ. නිරුද්ධ නො වන්නේ නම්, භංගයේ පටන් උදුරනු.]

කුශල හා අව්‍යාකෘතය, අකුශල හා අව්‍යාකෘතය. [මේ යමක, දෙක, උත්පාදයට සමානය, ප්‍රතිලෝමයෙහි පශ්චිම චිත්තයාගේ උත්පාදය දක්වා උදුරනු. අනේකාන්ත පදයෙහි ද චුතියගේ උත්පාදක්ෂණය දක්වා උදුරනු. මෙපමණක් ම උත්පාද වාරයට වඩා විශේෂ වේ.] ප්‍රත්‍යනීක සංසය "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ," වර්තමානානාගත වාරය නිමි. අතීතානාගත වාරය චනාභි නිරෝධ වාරයට සමානයි. උත්පාද නිරෝධ වාරය නිමි.

## භාවනා වර්තමාන වාරය

ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව භාවනා වාරය වදළ සේක. ඒ භාවනා වාරය ද, (වර්තමානාදි වාරයන් බලා පෙර සේ කියනු.) වර්තමාන වාරය පළමු කොට වදළ සේක. ඒ වර්තමාන වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද කුශල ධම්ම මූල අකුශල ධම්ම මූලි වශයෙන් එක් වැදෑරුම් වන්නේය. එයද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමුකොට වදළ සේක. කෙසේ වදළ සේක්ද යත්- "යො කුසලං ධම්මං භාවෙති, සො අකුසලං ධම්මං පජහතීති, ආමන්තා, යො වා පන ආමන්තා." අනුලෝමයෙහි සන්නිවර්ථාන ස්වරූපාර්ථ, අර්හත් මාර්ගසථ ආයඪ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ද ඒ මැයි. ප්‍රත්‍යනීකයෙහි ද, ආමන්තා, පෘථග්ජනයන් හා, අර්හත් මාර්ගසථයා හැර ආයඪ පුද්ගලයන් (7) සත් දෙනා ගනු ලැබේ.

වර්තමාන වාරය නිමි.

---

### අතීත වාරය

අතීත වාරයෙහි "යො කුසලං ධම්මං භාවිත්ථ, සො අකුසලං ධම්මං පජහිත්ථාති, ආමන්තා,"-අර්හත් ඵලසථ ආයඪ පුද්ගලයෝ ලැබෙති. ප්‍රත්‍යනීකයෙහි ද "ආමන්තා," පෘථග්ජනයන් හා අර්හත් ඵලසථයා වර්ජිත ආයඪ පුද්ගලයන් (7) සත්දෙනා ගනු ලැබෙති. අතීත වාරය නිමි.

### අනාගත වාරය

අනාගත වාරයෙහි "යො කුසලං ධම්මං භාවිස්සති, සො අකුසලං ධම්මං පජහිස්සතීති, ආමන්තා," භව්‍ය පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනා ගනු ලැබෙති. ප්‍රත්‍යනීක "ආමන්තා," අභව්‍ය පෘථග්ජනයන්. අර්හත් මාර්ගස්ථයන් හා අර්හත් ඵලස්ථයෝ ගනු ලැබෙති. අනාගත වාරය නිමි.

### වර්තමානාතීත වාරය

වර්තමානාතීත වාරයෙහි "යො කුසලං ධම්මං භාවෙති, සො අකුසලං ධම්මං පජහිත්ථාති, නො, යො වා පන නො, යො කුසලං ධම්මං න භාවෙති, සො අකුසලං ධම්මංන පජහිත්ථාති අරහා කුසලං ධම්මං න භාවෙති, නො ච අකුසලං ධම්මං න පජහිත්ථ,අග්ගමග්ග සමංගිඤ්ච අරහන්තඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා කුසලඤ්ච ධම්මංන භාවෙන්ති, අකුසලඤ්ච ධම්මං න පජහිත්ථ, යො වා පන අග්ගමග්ගසමඞ්ගි".

"අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ-අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ගනු ලැබෙති. පෘථග්ජන යට මාර්ගස්ථ (3) තිදෙන හා යට ඵලස්ථ (3) තිදෙනා ද ගනු ලැබෙති. ප්‍රතිලෝම පුච්ඡාවෙහි අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ගනු ලැබෙති. පෘථග්ජන යට මාර්ගස්ථ (3) තිදෙනා, යට ඵලස්ථ (3) තිදෙනා ද ගනු ලැබෙති. වර්තමානාතීත වාරය නිමි.

### වර්තමානානාගත වාරය

වර්තමානානාගත වාරයෙහි"යො කුසලං ධම්මං න භාවෙති,"යන සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ භව්‍ය පෘථග්ජනයන්ය. යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ (3) තිදෙනා ගනු ලැබෙති. අභව්‍ය පෘථග්ජනයන් හා අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබේ. ප්‍රලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ, අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ගනු ලැබෙති. අභව්‍ය පෘථග්ජනයෝ ද අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ද ගනු ලැබෙති. වර්තමානානාගත වාරය නිමි.

### අතීතානාගත වාරය

අතීතානාගත වාරයෙහි යො කුසලං ධම්මං න භාවිත්ථ, යන සන්නිට්ඨාන පද ස්වරූපාර්ථ භව්‍ය පෘථග්ජනයෝය යට මාර්ගස්ථ (3) තිදෙනා, යට ඵලස්ථ (3) තිදෙනා ගනු ලැබෙති. අර්හත් මාර්ගස්ථයෝ ද, අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ

ද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**- අර්හත් ඵලස්ථ ආයඹ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගස්ථයෝද අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති,

[අව්‍යාකෘතය භාවේතව්‍ය ද නොවේ. ප්‍රහාතව්‍ය ද නොවේ, එනිසා මේ වාරයෙහි නොවදරණ ලදී. එහෙයින් අර්ථකථාවෙහි, ''තත්ථ යස්මා අබ්‍යාකතො ධම්මො නෙව භාවෙතබ්බො, න පහාතබ්බො, තස්මා තං පදමෙව න උද්ධටං'' ය යි කියන ලදී.]

ධම්ම යමක ස්වරූප කථනය නිමියේය.

# 10. ඉන්ද්‍රිය යමකය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## ප්‍රඥප්ති වාර උද්දේශය

ධම්ම යමකය දේශනා කොට වදාරා ඉන් අනතුරුව ඉන්ද්‍රිය යමකය වදාළ සේක. ඒ ඉන්ද්‍රිය යමකය ද ප්‍රඥප්ති වාරය, ප්‍රවෘත්ති වාරය, පරිඥ වාරය වශයෙන් තෙවැදැරුම් වන්නේය. ඒ තුන අතුරෙන් ප්‍රඥප්ති වාරය පළමු කොට වදාළ සේක. ඒ ප්‍රඥප්ති වාරය ද උද්දේශ-නිද්දේශ වශයෙන් දෙවැදැරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් උද්දේශය පළමු කොට වදාළ සේක. ඒ උද්දේශයද පරිච්ඡේද වාරය පරිච්ඡින්නුද්දේශ වාරය, විභාග වාරය වශයෙන් තෙවැදැරුම් වන්නේය. හෙවත් ඉන්ද්‍රිය උද්දේශය, නාම ව්‍යවස්ථාපනය, නය වාරය වශයෙන් තෙවැදැරුම් වන්නේය. ඒ තුන අතුරෙන් ඉන්ද්‍රිය උද්දේශ වාරය පළමු කොට වදාළ සේක. **කෙසේද යත්** '' බාවීසතින්ද්‍රියානි :'' යනුවෙනි.

ඉන් අනතුරුව නාම ව්‍යවස්ථාපනය වදාළ සේක. කෙසේද යත්, '' චක්ඛුන්ද්‍රියං, සොතින්ද්‍රියං, ඝානින්ද්‍රියං, ජිව්හින්ද්‍රියං, කායින්ද්‍රියං, මනින්ද්‍රියං, ඉත්ථින්ද්‍රියං, පුරිසින්ද්‍රියං, ජීවිතින්ද්‍රියං, සුඛින්ද්‍රියං, දුක්ඛින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං, දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං, සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං, අඤ්ඤාතාවින්ද්‍රියං:' යනුවෙනි. (පෙරසේ අර්ථ කියනු).

නාම ව්‍යවස්ථාපනය දේශනා කොට වදාරා ඉන් අනතුරුව නය වාරය වදාළ සේක. ඒ නයවාරයද පදශෝධන වාරය, පද ශෝධන මූලචක්‍රවාරය, සුද්ධින්ද්‍රිය වාරය, සුද්ධින්ද්‍රිය මූලචක්‍රවාරය වශයෙන් සිව්වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පදශෝධන වාරය පළමු කොට වදාළ සේක. ඒ පදශෝධන වාරය ද අනුලෝම-ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදැරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදාළ සේක. ඒ අනුලෝමයද චක්ඛුන්ද්‍රිය යමකය ආදී වශයෙන් (22) දෙවිසි වැදැරුම් වන්නේය. ඒ දෙවිස්ස අතුරෙන් චක්ඛුන්ද්‍රිය යමකය පළමු කොට වදාළ සේක. ඒ චක්ඛුන්ද්‍රිය යමකය ද අනුලෝම පුච්ඡා-ප්‍රතිලෝම පුච්ඡා වශයෙන් දෙවැදැරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝම පුච්ඡාව පළමු කොට වදාළ සේක (ආයතන යමකයෙහි නයක්‍රමය ඇසුරු කොට උද්දේශය කියනු. යමක එකතුව ද ආයතන යමකය ඇසුරු කොට එකතු කරනු .)

උද්දේශය නිමි.

# නිර්දේශ වාරය

## 1 පද සෝධන වාරය

උද්දේශය දේශනා කොට වදරා ඉන් අනතුරුව නිද්දේශය වදළ සේක. ඒ නිද්දේශයද පද සෝධන වාරය, පදශෝධන මූල චක්‍ර වාරය සුද්ධින්ද්‍රිය වාරය, සුද්ධින්ද්‍රිය මූල චක්‍ර වාරය වශයෙන් සිව් වැදෑරුම් වන්නේය. ඒ සතර අතුරෙන් පදශෝධන වාරය පළමු කොට වදළ සේක. **කෙසේද යත්**: '' චක්ඛු චක්ඛුන්ද්‍රියන්ති දිබ්බචක්ඛු **පඤ්ඤා** චක්ඛු න චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියං චක්ඛුංචෙව චක්ඛුන්ද්‍රියඤ්ච, චක්ඛුන්ද්‍රියං චක්ඛූති, ආමන්තා , සොතින්ද්‍රිය--ඝාහින්ද්‍රිය – ජිව්හින්ද්‍රිය–කායින්ද්‍රිය–මනින්ද්‍රිය,මේ. යමකයන් ආයතන යමකය මෙන් කියනු] ''ඉත්ථී ඉත්ථින්ද්‍රියන්ති, නො, ඉත්ථින්ද්‍රියං ඉත්ථීති නො :''

**අනුලෝම පුච්ඡාවෙහි** ඉත්ථි–යන **සන්නිවයාන පදයා ගේ ස්වරූපාර්ථ**–ස්ත්‍රී භාව රූපය, ආශ්‍රය කොට කියනු ලබන ස්ත්‍රී සංඛ්‍යාත අවිද්‍යාමාන ප්‍රඥප්තිය ගනු ලැබේ. (සංසය පදයා ගේ ස්වරූපාර්ථ නොමැත.) පෙර සේ කොටස් බෙද දක්වන්න. ප්‍රතිලෝමයෙහි **සන්නියාන ස්වරූපාර්ථ** ඉත්ථින්ද්‍රිය රූපය ගනු ලැබේ. (සංසය පද ස්වරූපාර්ථ නොමැත). ''පුරිසො පුරිසින්ද්‍රියන්ති නො, පුරිසින්ද්‍රියං පුරිසොති නො:'' අනුලෝමයෙහි **සන්නිවයාන ස්වරූපාර්ථ** පුරුෂභාවරූපය ආශ්‍රය කොට පුරුෂයා යයි කියන ලද අවිද්‍යාමාන ප්‍රඥප්තිය ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන්නිවයාන සවරූපාර්ථ** පුරිසින්ද්‍රිය රූපය ගනු ලැබේ. ජීවිතං යන්නෙහි ස්වරූපාර්ථ රූප ජීවිතේන්ද්‍රිය, නාමජීවිතේන්ද්‍රිය ගනු ලැබේ. (ප්‍රතිලෝමයෙහි ද නයක්‍රමය සමානය).

සුඛං යන්නෙහි සුඛින්ද්‍රිය ලැබේ. දුක්ඛං යන්නෙහි දුක්ඛින්ද්‍රිය ලැබේ. සොමනස්සං--යන්නෙහි සෝමනස්සින්ද්‍රිය ලැබේ. දෝමනස්සං යන්නෙහි දෝමනස්සඉන්ද්‍රිය ලැබේ. ''උපෙක්ඛා උපෙක්ඛින්ද්‍රියන්ති උපෙක්ඛින්ද්‍රියං ඨපෙත්වා අවසෙසා උපෙක්ඛා න උපෙක්ඛින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං උපෙක්ඛා චෙව උපෙක්ඛින්ද්‍රියඤ්ච; උපෙක්ඛින්ද්‍රියං උපෙක්ඛාති ආමන්තා :'' උපේක්ඛා යන **සන්නිවයාන පදයා ගේ ස්වරූපාර්ථ** ඡළඞ්ගුපෙක්ඛා, බ්‍රහ්මවිහාරුපෙක්ඛා, බොජ්ඣඞ්ගුපෙක්ඛා, විරියුපෙක්ඛා විපස්සනුපෙක්ඛා, සඞ්ඛාරුපෙක්ඛා, තත්‍රමජ්ඣත්තුපෙක්ඛා, ඣානුපෙක්ඛා, පාරිසුද්ධුපෙක්ඛා යන උපෙක්ඛා 9 නවය ගනු ලැබෙති. වෙදනුපෙක්ඛාව ද ලැබේ. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

[ඡ—බ්‍ර—බො—වී—වෙ—සං—වි—ත—ඣා—පා—යනු—සංක්ෂේප උපෙක්ෂා 10 යි]

සද්ධින්ද්‍රිය ආදියෙහි අනුලෝම ප්‍රතිලෝම දෙකෙහිම—ආමන්තා—සමාධින්ද්‍රියෙහි වීයඞ් නොමැති සිත් (16). දසය හා විචිකිච්ඡාසම්ප්‍රයුක්ත චිත්තයද, වර්ජිත (72). දෙසැත්තෑ චිත්තයෙහි ඇත්තාවූ ඒකග්ගතා නම් වූ සමාධින්ද්‍රිය ලැබේ.

පඤ්ඤින්ද්‍රියෙහි චනාහි ලෞකික ත්‍රිහේතුක සිත් (39). එකුන් සාලිසෙහි ඇත්තාවූ ප්‍රඥව ලැබේ. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙහි චනාහි සොතාපත්ති මග්ගයෙහි ඇත්තා වූ ප්‍රඥව ලැබේ. අඤ්ඤින්ද්‍රියෙහි මැද ලෝකෝත්තර ප්‍රඥ (6) සය ගනු ලැබෙති. අඤ්ඤාතාවින්ද්‍රියෙහි අර්හත් ඵල සම්ප්‍රයුක්ත ප්‍රඥව ලැබේ. අනුලෝමය නිමි.

**ප්‍රත්‍යනිකයෙහි** '' න චක්ඛු න චක්ඛුන්ද්‍රියන්ති :'' යනාදිය චනාහි ආයතන යමකයෙහි මෙනි. '' න ඉත්ථී න ඉත්ථින්ද්‍රියන්ති ඉත්ථින්ද්‍රියං න ඉත්ථී ඉත්ථින්ද්‍රියං ඉත්ථිඤ්ච, ඉත්ථින්ද්‍රියඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව ඉත්ථී නච ඉත්ථින්ද්‍රියං න ඉත්ථින්ද්‍රියං න ඉත්ථීති ඉත්ථී න ඉත්ථින්ද්‍රියං ඉත්ථී, ඉත්ථිඤ්ච ඉත්ථින්ද්‍රියඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව ඉත්ථී නච ඉත්ථින්ද්‍රියං:'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ඉත්ථින්ද්‍රිය රූපය ගනු ලැබේ. ස්ත්‍රිය ද, ඉත්ථින්ද්‍රිය ද හැර සිත් (89) එකුන් අනූව චෛතසික (52) දෙපණස රූප (26) අටවිස්ස හා නිර්වාණයද ප්‍රඥප්තිය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර මෙනි.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ඉත්ථිභාවරූපය ආශ්‍රය කොට ඉත්ථියයි කියන ලද අවිද්‍යමාන ප්‍රඥප්තිය ලැබේ. පෙර සංසය ස්වරූප ද ලැබෙයි. (න පුරිසො න පුරිසින්ද්‍රියං--යන්නෙහි ද නය ක්‍රමය සමානය). '' න ජීවිතං න ජීවිතින්ද්‍රියන්ති'' යන්නෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ජීවිත ඉන්ද්‍රිය හැර සිත් (89) එකුන්අනූවද චෛතසික (51) එක් පණස ද රූප (27) සත් විස්සද නිර්වාණ ප්‍රඥප්ති ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** ද ඒ ධර්මයෝම වෙති.

''න උපෙක්ඛා න උපෙක්ඛින්ද්‍රියන්ති ආමන්තා න උපෙක්ඛින්ද්‍රියං න උපෙක්ඛාති උපෙක්ඛින්ද්‍රියං ඨපෙත්වා අවසෙසා උපේක්ඛා න උපෙක්ඛින්ද්‍රියං උපෙක්ඛා උපෙක්ඛඤ්ච, උපෙඛික්න්ද්‍රියං ච ඨපෙත්වා අවසෙසා න චෙව උපෙක්ඛා න ච උපෙක්ඛින්ද්‍රියං'' 'ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ඛින්ද්‍රිය හැර උපෙක්ෂා නවය ගනු ලැබෙති. උපෙක්ෂාවද උපෙක්ඛින්ද්‍රිය ද හැර සිත් (89) එකුන් අනූව චෛතසික (52) දෙ පණස රූප (28) අටවිස්ස නිර්වාණය ද ප්‍රඥප්තිය ද ලැබෙති. (මේ ක්‍රමයට සමානව සෙස්ස කල්පනා කොට උද්ධරනු.)

පදශෝධන වාරය නිමි.

## 2. පදශෝධන මූලචක්‍ර වාරය

**පදශෝධන මූල චක්‍ර වාරයෙහි** '' චක්ඛු චක්ඛුන්ද්‍රියන්ති දිබ්බචක්ඛු පඤ්ඤා චක්ඛු චක්ඛු න චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියං චක්ඛු චෙව චක්ඛුන්ද්‍රියඤ්ච, ඉන්ද්‍රියා සොතින්ද්‍රියන්ති, සොතින්ද්‍රියං ඉන්ද්‍රියඤ්චෙව සොතින්ද්‍රියඤ්ච අවසෙසා ඉන්ද්‍රියා න සොතින්ද්‍රියං'

ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සොතින්ද්‍රිය වර්ජිත සෙසු ඉන්ද්‍රිය (21) එක් විස්ස ලැබෙති. සෝතින්ද්‍රිය ද ගනු ලැබේ. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. [මේ නය ක්‍රමය ආශ්‍රයෙන් අනුලෝම අවසානය තෙක් සියල්ල කියනු].

**ප්‍රත්‍යනිකයෙහි** ''න චක්ඛු න චක්ඛුන්ද්‍රියන්ති ආමන්තා න ඉන්ද්‍රියා න සොතින්ද්‍රියන්ති ආමන්තා'' න චක්ඛු නම් වූ **සන්නිට්ඨාන පදයා ගේ ස්වරූපාර්ථ** චක්ඛු (3) තුන හැර සිත් (89) අසූ නවය චෛතසික (52) දෙපණස, රූප (27) සත්විස්ස, නිර්වාණ, ප්‍රඥප්ති ගනු ලැබෙති. [**පඤ්ඤා** චක්ඛු නමින් සියලු ප්‍රඥව නො වදළ බැවින් චෛතසික (52) පණස් දෙක යයි කියන ලදී. සියලු ධර්ම නොකියත්තේනම් මේ ක්‍රමයට ස්වරූපය උදුරනු].

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ජීවිත—වේදනා—සද්ධා—විරිය—සති—ඒකග්ගතා පඤ්ඤා වර්ජිත චෛතසික (45) සතලිස් **පසය** ඉන්ද්‍රිය රූප (8) අට වර්ජිත අනින්ද්‍රිය රූප (20) විස්ස, නිර්වාණ ප්‍රඥප්ති ලැබෙති. **සංසයට ද** එසේය. [එකග්ගතා සියල්ල ඉන්ද්‍රියෙහි නො වදළ බැවින් අඩුවක් නො මැත. මේ නය ක්‍රමය සම්බන්ධ කොට කියනු].

## 3. සුද්ධින්ද්‍රිය වාරය

**සුද්ධින්ද්‍රිය වාරයෙහි** ''චක්ඛු ඉන්ද්‍රියන්ති, ආමන්තා, ඉන්ද්‍රියා චක්ඛුන්ද්‍රියන්ති චක්ඛුන්ද්‍රියං ඉන්ද්‍රියඤ්චෙව චක්ඛුන්ද්‍රියඤ්ච, අවසෙසා ඉන්ද්‍රියා න චක්ඛුන්ද්‍රියං [ආයතන මෙන් උදුරනු]. සොතං ඉන්ද්‍රියන්ති, යං ''සොතං ඉන්ද්‍රියං තං සොතඤ්චෙව ඉන්ද්‍රියඤ්ච අවසෙසං සොතං න ඉන්ද්‍රියං, ඉන්ද්‍රියා සොතින්ද්‍රියන්ති, සොතින්ද්‍රියං ඉන්ද්‍රියඤ්චෙව සොතින්ද්‍රියඤ්ච අවසේසා ඉන්ද්‍රියා න සොතින්ද්‍රියං'' යං සොතං යම් සෝතයක් ඉන්ද්‍රියං ඉන්ද්‍රිය නම් වේද, තං—ඒසොතින්ද්‍රිය නම් වූ ධර්මය සොතංචෙව සෝත නම් ද වේ. ඉන්ද්‍රියංච ඉන්ද්‍රිය නම් ද වේ.

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තෘෂ්ණා ශ්‍රෝතස ගනු ලැබේ. දිව්‍ය ශ්‍රෝත නම් වූ අභිඥාවද, සෝතින්ද්‍රිය ද ගනු ලැබේ. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. කොටස් බෙද දක්වන්න.

''කායෝ ඉන්ද්‍රියන්ති යො කායො ඉන්ද්‍රියං සො කායො චෙව ඉන්ද්‍රියඤ්ච අවසෙසෝ කායො න ඉන්ද්‍රියං ඉන්ද්‍රියා කායින්ද්‍රියන්ති -පෙ-'' යො කායො—යම් කයෙක්: ඉන්ද්‍රියං—ඉන්ද්‍රිය නම් වේද සො කායෝ—ඒ ඉන්ද්‍රිය නම් වූ කය කායොචෙව—කාය නම් ද වේ. ඉන්ද්‍රියඤ්ච—ඉන්ද්‍රිය නම් ද වේ.

අනුලෝමයෙහි කායෝ—නම් වූ **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ජීවිත,—වෙදනා—සද්ධා—විරිය—සති—එකග්ගතා—**ප්‍රඥා** වර්ජිත චෛතසික (45), පන්සාළිස නිර්වාණ, නම් වූ නාමකය, ඉන්ද්‍රිය රූප (8) අට වර්ජිත (20), සමවිසි රූපය නම් වූ රූපකය හා හත්ථිකාය අශ්වකාය යනාදි වූ ප්‍රඥප්තිකය ගනු ලැබෙති. ඉන්ද්‍රිය (22) දෙවිස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

" ඉත්ථි ඉත්ථින්ද්‍රියන්ති නො, ඉන්ද්‍රියා ඉත්ථින්ද්‍රියන්ති, ඉත්ථින්ද්‍රියං ඉන්ද්‍රියං චෙව ඉත්ථින්ද්‍රියඤ්ච අවසෙසා ඉන්ද්‍රියා න ඉත්ථින්ද්‍රියං" [සොඃකාය—මේ යමක දෙක්හි අනුලෝම, ආමන්තා—කියා පාඨයක් ඇත. ගුරුවරු වනාහි බෙද බෙද විස්තර වශයෙන් උගන්වති].

"උපෙක්ඛා ඉන්ද්‍රියන්ති, යා උපෙක්ඛා ඉන්ද්‍රියා, සා උපෙක්ඛාචෙව ඉන්ද්‍රියඤ්ච අවසෙසා උපෙක්ඛා න ඉන්ද්‍රියං, ඉන්ද්‍රියා උපෙක්ඛින්ද්‍රියන්ති, (පෙර සේ කියනු). යා උපෙක්ඛා—යම් උපෙක්ෂාවක් ඉන්ද්‍රියා ඉන්ද්‍රිය නම් වේ ද ; සා—ඒ ඉන්ද්‍රිය නම් වූ උපෙක්ෂාව-උපෙක්ඛා චෙව — උපෙක්ෂා නම් ද වේ. ඉන්ද්‍රියඤ්ච—ඉන්ද්‍රිය නම් ද වේ.

අනුලෝම පුච්ඡාවෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ඡළඞ්ගුපෙක්ඛා, බ්‍රහ්ම විහාරුපෙක්ඛා, බොජ්ඣඞ්ගුපෙක්ඛා, තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ඣානුපෙක්ඛා, පාරිසුද්ධි උපෙක්ඛා ගනු ලැබෙති. (ධර්ම වශයෙන් තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවමැයි) විරියුපෙක්ඛා, සඞ්ඛාරුපෙක්ඛා, වෙදනුපෙක්ඛා විපස්සනුපෙක්ඛා ද ගනු ලැබෙති.. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

[සංඛාරුපෙක්ඛා විපස්සනුපෙක්ඛා දෙක ප්‍රඥාවය, විරියුපෙක්ඛාව වීර්‍ය්‍යය, වෙදනුපෙක්ඛාව වේදනාමැයි, මෙසේ ධර්ම වශයෙන් දත යුතු කොටස් බෙද දැක්විය යුතුය. සෙසු සියලු අනුලෝමයෙහි—"ආමන්තා" පිළිතුර ලැබේ. ප්‍රතිලෝමයෙහි ද ක්‍රමය සමානය].

අනුලෝමය නිමි

———

අනුලෝමය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රත්‍යනීකය වදළ සේක. **කෙසේද යත්** : "න චක්ඛු න ඉන්ද්‍රියන්ති, චක්ඛුං ඨපෙත්වා අවසෙසා ඉන්ද්‍රියා න චක්ඛු ඉන්ද්‍රියා චක්ඛුඤ්ච ඉන්ද්‍රියෙච ඨපෙත්වා අවසෙසා න චෙව චක්ඛු න ච ඉන්ද්‍රියා",

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** චක්ඛු ජාති තුන හැර ඉන්ද්‍රිය ධර්ම (21) එක් විස්ස ලැබෙති. චක්ඛු (3) තුන, ඉන්ද්‍රිය ධර්ම වර්ජිත චෛතසික (46) පන්සාලිස අනින්ද්‍රිය රූප (20) විස්ස නිර්වාණය හා ප්‍රඥප්තිය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපය** පෙර සේ ලැබේ.

''න සොතං න ඉන්ද්‍රියන්ති, සොතං ඨපෙත්වා අවසෙසා ඉන්ද්‍රියා න සොතං ඉන්ද්‍රියා සොතඤ්ච ඉන්ද්‍රියෙච ඨපෙත්වා අවසෙසා න චෙව සොතං න ච ඉන්ද්‍රියා න ඉන්ද්‍රියා න සොතින්ද්‍රියන්ති ආමන්තා''. අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ශ්‍රෝතස් (3) තුන හැර ඉන්ද්‍රිය ධර්ම (21) එක් විස්ස ලැබෙති. ශ්‍රෝතස් (3) තුන ඉන්ද්‍රිය ධර්ම වර්ජිත චෛතසික (45) පන්සාලිස, අනින්ද්‍රිය රූප (20) විස්ස නිර්වාණය හා ප්‍රඥප්තිය ද ගනු ලැබේ. **සංසය ස්වරූපාර්ථය** පෙර සේ ගනු ලැබේ. (ඝාන—ජිව්හා නයක්‍රම සමානය).

''න කායො න ඉන්ද්‍රියන්ති, ආමන්තා,න ඉන්ද්‍රියා න කායින්ද්‍රියන්ති, ආමන්තා'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**—කූප ගුහා දි අවයව සංඛ්‍යාත ඒකදේශ ප්‍රඥප්තියක් ගනු ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ඉන්ද්‍රිය ධර්ම වර්ජිත චෛතසික (45) පන්සාලිස අනින්ද්‍රිය රූප (20) විස්ස නිර්වාණය හා ප්‍රඥප්තිය ලැබේ.

''න උපෙක්ඛා න ඉන්ද්‍රියන්ති උපක්ඛං ඨපෙත්වා අවසෙසා ඉන්ද්‍රියා න උපෙක්ඛා ඉන්ද්‍රියා, උපෙක්ඛඤ්ච ඉන්ද්‍රියෙච ඨපෙත්වා අවසෙසා නචෙ ච උපෙක්ඛා නච ඉන්ද්‍රියා, න ඉන්ද්‍රියා න උපෙක්ඛින්ද්‍රියන්ති ආමන්තා:'' අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ෂා දශය වර්ජිත ඉන්ද්‍රිය ධර්ම (21) එක් විස්ස ලැබෙති. උපෙක්ෂා (10) දශය ඉන්ද්‍රිය ධර්ම වර්ජිත චෛතසික (45) පන්සාලිස අනින්ද්‍රිය රූප (20) විස්ස නිර්වාණය හා ප්‍රඥප්තිය ද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේ ගනු ලැබේ.

''න අනඤ්ඤාතඤ්ඤස්සාමීති න ඉන්ද්‍රියන්ති අනඤ්ඤාතඤ්ඤස්සාමීතිං ඨපෙත්වා අවසෙසා ඉන්ද්‍රියා න අනඤ්ඤාතඤ්ඤස්සාමීති ඉන්ද්‍රියා අනඤ්ඤාතඤ්ඤස්සාමීති-ඤ්ච ඉන්ද්‍රියෙච ඨපෙත්වා අවසෙසා නචෙච අනඤ්ඤාතඤ්ඤස්සාමීති නච ඉන්ද්‍රියා, න ඉන්ද්‍රියා න අනඤ්ඤා තඤ්ඤස්සාමීතින්ද්‍රියන්ති ආමන්තා'' අනුලෝම යෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වර්ජිත ඉන්ද්‍රිය ධර්ම (21) එක් විස්ස ලැබෙති. අනඤ්ඤාතඤ්ඤස්සාමීතිය හා ඉන්ද්‍රිය ධර්ම වර්ජිත චෛතසික (45) පන්සාලිස අනින්ද්‍රිය රූප (20) විස්ස නිර්වාණය හා ප්‍රඥප්තිය ද ගනු ලැබේ. (සෙස්ස සමානය). ශුද්ධින්ද්‍රිය මූලචක්‍ර වාරයෙහි නය ක්‍රමය සමානය.

ප්‍රඥප්ති වාරය නිමි.

# ප්‍රවෘත්ති වාරය

## උත්පාද වර්තමාන වාරයෙහි චක්ඛු මූලය

ප්‍රඥප්ති වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව ප්‍රවෘත්ති වාරය වදළ සේක. ඒ ප්‍රවෘත්ති වාරය ද උත්පාද වාරය, නිරෝධ වාරය, උත්පාද නිරෝධ වාරය වශයෙන් තෙවදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් උත්පාද වාරය පළමු කොට වදළ සේක. ඒ උත්පාද වාරයද වර්තමාන වාරය, අතීත වාරය, අනාගත වාරය, වර්තමානාතීත වාරය, වර්තමානානාගත වාරය, අතීතානාගත වාරය වශයෙන් සය වැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් වර්තමාන වාරය පළමු කොට වදළ සේක. ඒ වර්තමාන වාරය ද අනුලෝම ප්‍රත්‍යනීක වශයෙන් දෙවැදෑරුම් වන්නේය. ඒ දෙක අතුරෙන් අනුලෝමය පළමු කොට වදළ සේක. ඒ අනුලෝමය ද පුද්ගල වාර, ඕකාශ වාර, පුද්ගලෝකාශ වාර වශයෙන් තෙවැදෑරුම් වන්නේය. ඒ තුන අතුරෙන් පුද්ගල වාරය පළමු කොට වදළ සේක. ඒ පුද්ගල වාරයද චක්ඛුන්ද්‍රිය මූල යනාදී වශයෙන්, (15), පසළොස් වැදෑරුම් වන්නේය. ඒ (15) පසළොස අතුරෙන් චක්ඛුන්ද්‍රිය මූලය පළමු කොට වදළ සේක.

ඒ චක්ඛුන්ද්‍රිය මූලය ද සෝතින්ද්‍රිය මූලී යනාදී වශයෙන් (15) පසළොස් වැදෑරුම් වන්නේය. ඒ (15) පසළොස අතුරෙන් සෝතින්ද්‍රියමූලිය පළමු කොට වදළ සේක. **කෙසේ ද යත්:** (සෝත-ඝාන-ජිව්හා-කායමූලීයයන් ආයතන යමකය මෙන් කියන්න. මේ වර්තමාන වාරයෙහි පුද්ගලවාර, පුද්ගලෝකාශ වාර, දෙක පිඩු කොට ස්වරූප උදුරා දක්වන්නෙමි.)

**ඉත්ථින්ද්‍රිය මූලයෙහි** ''සචක්ඛුකානං න ඉත්ථිනං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචක්ඛුකානං ඉත්ථිනං උපපජ්ජන්තීනං තාසං තත්ථ, **යස්සවා පන යත්ථ** ඉත්ථිනං අචක්ඛුකානං උපපජ්ජන්තීනං තාසං තත්ථි,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** කාම ප්‍රතිසන්ධි (10) දශය, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3.7.) තුන-සත බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ෂුක පුරුෂ-නපුංසකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (4) සතර බැගින් ඇති මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ අසංඥ තල වර්ජිත රූපාවචර භූමි (15) පසළොස ගනු ලැබෙති.

කාමප්‍රතිසන්ධි සිත් (10) දශය චෛතසික (33)තෙතිස, කර්මජ කලාප (3.7) තුන-සත බැගිනි. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ෂුක ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතරදෙනාගේ යට ඵලස්ථ (2) දෙදෙනාගේ

කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථය** පෙර සේ ගනු ලැබේ. ප්‍රතිලෝම පුච්ඡාවෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අචක්ඛුක ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති. **පෙර සංසය** ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං න ඉත්ථීනං උපපජ්ජන්තානං, තෙසං තත්ථ'' චුතිසිත් (19) එකුන් විස්ස චෛතසික (35), පන්තිස අවසාන කර්මජ රූප කලාප, ජීවිත නවක රූප කලාප මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගීවූ සියලුම චුතවෙමින් සිටින පෘථග්ජන (4) සිවුදෙනා **ගේ හා එලස්ථ ආයති** පුද්ගලයන් (4). සතර දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර පඤ්චවෝකාරභූමි (26) ස විස්ස, අසංඥතල භූමිය ; අචක්ඛුකව පුරිස නපුංසකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සයය, අසංඥතල-අරූතලයන්හි උපදින සුගතිඅහේතුක--ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනා ගේ අසංඥතල භූමිය හා අරූපභූමි සතර ගනු ලැබෙති.

**පුරිසේන්ද්‍රිය මූලියෙහි** ''සචක්ඛුකානං න පුරිසානං උපපජ්ජන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං පුරිසානං උපපජ්ජන්තානං තෙසං තත්ත්ථ **යස්ස වා පන යත්ථ** පුරිසානං අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, :' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** කාමප්‍රතිසන්ධි සිත් (10) දශය, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3, 7) තුන සත, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සචක්ඛුක නපුංසකව-ස්ත්‍රීන්ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4), සතර දෙනා ගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමභූමි (11) එකොළසය.

රූපාවචර ප්‍රතිසන්ධි සිත් (5) පසය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (4) සතරය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනා ගේ අසංඥකල වර්ජිත රූපභූමි (15) පසළොස ලැබෙති.

කාමප්‍රතිසන්ධි සිත් (10) දශය, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3.7) තුන සත මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගි වූ සචක්ඛුක පුරිසව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබේ. **සංසය රූපාර්ථ** පෙර සේ ලැබේ. ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ අචක්ඛුක පුරිසව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචරභූමි (6) සය ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "සබ්බෙසං චවන්තානං, අචක්ඛුකානංන පුරිසානං උප පජ්ජන්තානං තෙසං තත්ථ," සියළුම චුතවන පුද්ගලයන්ගේ සියලු භූමි, අචක්ඛුකව නපුංසක-ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක,-සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය, අසංඥතල-අරූතලයන් හි උපදින සුගති අහේතුක—ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ, යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනා ගේ අසංඥතල භූමි, අරූප භූමි (4) සතර ගනු ලැබෙ. **ජීවිතෙන්ද්‍රිය මූලියෙහි** අනුලෝමය "ආමන්තා" ප්‍රතිලෝමයෙහි "අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ."

(චක්ඛායතන—ධම්මායතන මෙන් ස්වරූප උදූරන්න, සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය—දෙමනස්සින්ද්‍රිය, අන ඤ්ඤාත ඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය ය මේ ඉන්ද්‍රිය සය මූල මූලී ක්‍රමයෙන් වදරා නොමැත. කවර හෙයක්හ් ද යත්, මේ සයක් වූ ඉන්ද්‍රියයන් ප්‍රවෘත්ති කාලයෙහි පමණක් උපදින බැවිනි.)

**සොමනස්සින්ද්‍රිය මූලියෙහි** "සචක්ඛුකානං විනා සොමනස්සෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං සොමනස්සෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ආමන්තා," අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පඤ්චවෝකාර උපෙක්ෂා ප්‍රතිසන්ධි සිත් (7) සත චෛතසික (32) දෙතිස, කර්මජ කලාප (3.7.4) තුන-සත-සතර, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ඇස් ඇතිව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනා ගේ කාමභූමි (11) එකොළසය, වෙහප්ඵල භූමිය හා සුද්ධාවාස භූමි (5) පස ලැබෙති.

සොමනස්ස ප්‍රතිසන්ධි සිත් (8) අටය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3.7.4) තුන-සත-සතර මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී නමවූ ද්විහේතුක—ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ, යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත සුභකිණ්හ තලය දක්වා රූපාවචර භූමි (9) නවය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර මෙනි. **ප්‍රත්‍යනීකය** "සබ්බෙසං චවන්තානං විනා සෝමනස්සෙන අචක්ඛුකානං උප පජ්ජන්තානං තෙසංත්ථ" (පෙර සේ ස්වරූප උදූරනු).

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** "සචක්ඛුකානං විනා උපෙක්ඛාය උපපජ්ජන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං උපෙක්ඛාය උපපජ්ජන්තානං තෙසං තත්ථ :' **යස්සවා පන යත්ථ** උපෙක්ඛාය අචක්ඛුකානං උප පජ්ජන්තානං තෙසං තත්ථ" අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝමනස්ස ප්‍රතිසන්ධි සිත් (8) අටය, චෛතසික (35) පන්තිසය, කර්මජ කලාප (3.7.4) තුන-සත-සතර මේ ධර්යන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක-ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යටඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනා ගේ කාමසුගති භූමි (7) සත හා සුභකිණ්හ තලය දක්වා රූපාවචර භූමි (9) නවය ලැබෙති.

**පඤ්චවෝකාර** උපේක්ෂා ප්‍රතිසන්ධි සිත් (7) සතය, චෛතසික (32) දෙතිස කර්මජ කලාප (3.7.4) තුන-සත-සතර මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ඇස් ඇතිව **පඤ්චවෝකාරයෙහි** උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළස වෙහප්ඵල භූමිය ද සුද්ධාවාස භූමි (5) පස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබෙ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ඇස් නැතිව කාමාවචරයෙහි උපදින්නා වූ දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ය. අරූතලයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. **පෙර සංසයද** ගනු ලැබෙ. **ප්‍රත්‍යානික සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චවන්තානං සචක්ඛුකානං විනා උපෙක්ඛාය උපපජ්ජන්තානං තෙසං තත්ථ'' සියලුම චුතවන පුද්ගලයන්ගේ සියලු **භූමි,** අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමි ගනු ලැබෙති.

**සද්ධින්ද්‍රිය මූලියෙහි** ''සචක්ඛුකානං විනා සද්ධාය උපපජ්ජන්තානං තෙසං තත්ථ සචක්ඛුකානං සද්ධාය උප පජ්ජන්තානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ** අචක්ඛුකානං සද්ධාය උප පජ්ජන්තානං තෙසං තත්ථ'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක **ප්‍රතිසන්ධි** සිත් (2) දෙකය, ඡන්ද-පීති-වීරිය වර්ජිත අන්‍යසමාන චෛතසික (10) දශය කර්මජ කලාප (3.7) තුන සත මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගීවූ ඇස් ඇතිව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්-ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය ලැබෙති. සහේතුක **පඤ්චවෝකාර** ප්‍රතිසන්ධි (13) තෙළෙස, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3.7.4) තුන-සත-සතර මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ **පඤ්චවෝකාරයෙහි** උපදින ද්වි-හේතුක-ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (3)-තිදෙනා ගේ අපාය වර්ජිත **පඤ්චවෝකාර** භූමි (22) දෙ විස්ස ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබෙ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අරූප භූමි යෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ අරූප භූමි (4) සතර ලැබෙති. **අනුලෝම සංසය ස්වරූපද** ලැබෙ. **ප්‍රත්‍යානික සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං විනා සද්ධාය උප පජ්ජන්තානං තෙසං තත්ථ'' සියලුම චුතවන පුද්ගලයන් ගේ සියලු භූමි, ඇස් නැතිව උපදින කාමාවචර පුද්ගල-යන් ගේ භූමි, අසංඥතලයෙහි උපදින පුද්ගලයන් ගේ භූමි ගනු ලැබෙති.

**විරියේන්ද්‍රිය මූලියෙහි** ''සචක්ඛුකානං විනා විරියෙන උප පජ්ජන්තාන තෙසං තත්ථ, '' **සතින්ද්‍රිය මූලියෙහි** ''සචක්ඛුකානං විනා සතියා උප පජ්ජන්තානං තෙසං තත්ථ'' **සමාධීන්ද්‍රිය ''මූලියෙහි** සචක්ඛුකානං විනා සමාධිනා උප පජ්ජන්තානං

තෙසං තත්ථ'' (සද්ධින්ද්‍රිය මෙන් උදුරනු). **පඤ්ඤින්ද්‍රිය මූලියෙහි** ''සචක්ඛුකානං විනා ඤාණෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ, සචක්ඛුකානං ඤාණෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ** අචක්ඛුකානං විනා ඤාණෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙකය, මහා විපාක ඤාණ විප්‍රයුක්ත ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (32) දෙතිසය, කර්මජ කලාප (3.7) තුන සත මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ දුගති අහේතුක, සුගති අහේතුක ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමභූමි (11) එකොළස ලැබෙති. පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (9) නවය චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3.7.4) තුන-සත-සතර-මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමගී වූ පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ අපාය භූමි වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ද ගනු ලැබෙති.

**ප්‍රතිලෝමයෙහි** අරූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන් යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) ත්‍රිදෙනා ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක ස්වරූපාර්ථ** ''සබ්බෙසං චවන්තානං අචක්ඛුකානං විනා ඤාණෙන උපපජ්ජන්ත නං තෙසං තත්ථ.'' සියලුම චුතවන පුද්ගලයන් ගේ සියලු භූමි, ඇස් නැතිව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය, අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබෙ.

චක්ඛුමූලය නිමි.

---

සෝත මූලය ද චක්ඛුමූලයට සමානය

## ඝාන මූලය

**ඝාන මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි** ''සඝානකානං න ඉත්ථීනං උපපජ්ජන්තානං තෙසං තත්ථ සඝානකානං ඉත්ථීනං උපපජ්ජන්තානං තාසං තත්ථ **යස්සවා පන යත්ථ** ඉත්ථීනං අඝානකානං උප පජ්ජන්තීනං තාසං තත්ථ, ඉත්ථීනං ස ඝානකානං උප පජ්ජන්තීනං තාසං තත්ථ''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** කාම ප්‍රතිසන්ධි (10) දසය චෛතසික (33) තෙතිස කර්මජ කලාප (3.7) තුන-සත-මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී සඝානකව පුරුෂ-නපුංසකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ

යට එලස්ථ ආයූ පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමාවචර භූමි (11) එකොළස ගනු ලැබෙති. කාම ප්‍රතිසන්ධි (10) දශය චෛතසික (33) තෙතිස කර්මජ කලාප (3.7) තුන-සත මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි සඝානකව උපදින ස්ත්‍රී පෘථග්ජන (4) සතර දෙනාගේ යට එලස්ථ ආයූ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ** කාමාවචරයෙහි අඝානකව උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන ස්ත්‍රීන් ගේ කාමාවචර භූමි (5) පස ගනු ලැබෙති. පෙර සංසය ස්වරූපාර්ථ ද ගනු ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "සබ්බෙසං චවන්තානං අඝානකානං න ඉත්ථීනං උපපජ්ජන්තානං තෙසං තත්ථ" සියලුම චුතවන පුද්ගලයන් ගේ සියලු භූමි අඝානකව කාමාවචරයෙහි නපුංසකව පුරිසව උපදින දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ නිරය වර්ජිත කාමාවචර භූමි (5) පස, රූපාවචර, අරූපාවචරයෙහි, උපදින සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ යට එලස්ථ ආයූ පුද්ගලයන් (3) තිදෙනා ගේ රූප භූමි (16) දහසය, අරූපභූමි (4) සතර ගනු ලැබෙති. (පුරිසින්ද්‍රිය මූලිය ද මේ හා සමානව මාරුකොට කියනු. **ජීවිතින්ද්‍රිය මූලිය** ධම්මායතනය **මෙන් කියනු**).

**සොමනස්සින්ද්‍රිය මූලි** අනුලෝමයෙහි "සඝානකානං විනා සොමනස්සෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ, සඝානකානං සොමනස්සෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා පන** යත්ථ සොමනස්සෙන අඝානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ"

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** කාම උපේක්ෂා ප්‍රතිසන්ධි (6) සදෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ යට එලස්ථ ආයූ පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමභූමි (11) එකොළස ලැබෙති.

සෝමනස්ස සහගත කාමප්‍රතිසන්ධි (4) සතර දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක-ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට එලස්ථ ආයූ පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාම සුගති භූමි (7) සත ද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. (සොමනස්ස ප්‍රතිසන්ධියෙහි අඝානකයෙක් සම්පූර්ණයෙන් නොමැති බැවින් සඝානකයයි නොකියන ලදි.) ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** රූපාවචර සොමනස්ස ප්‍රතිසන්ධි සතර දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට එලස්ථ (3) තිදෙනා ගේ සුභකිණ්හක තලය දක්වා රූපාවචර භූමි (9) නවය ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

**ප්‍රත්‍යනීක ස්වරූපාර්ථ** "සබ්බෙසං චවන්තානං අඝානකානං විනා සොමනස්සෙන-උපපජ්ජන්තානං තෙසංතත්ථ" සියලුම චුතවන පුද්ගලයන් ගේ සියලු භූමි අඝානකව

කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන් ගේ නිරය වර්ජිත කාමාවචර භූමි, (5) පස, මහත්ගත උපෙක්ෂා ප්‍රතිසන්ධි (5) පස, චෛතසික (30) සමතිස කර්මජ කලාප (4) සතර ප්‍රථම ජීවිත නවක කලාපය මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර, අරූපාවචර භූමියෙහි උපදින සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ගේ, වෙහප්ඵලය, අසංඥතලය, සුද්ධාවාස භූමි (5) පස හා අරූප භූමි (4) සතර ගනු ලැබෙති.

**උපේක්ඛින්ද්‍රිය මූලියෙහි** ''සඝානකානං විනා උපෙක්ඛාය උපපජ්ජන්තානං තෙසං තත්ථ සඝානකානං උපෙක්ඛාය උප පජ්ජන්තානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ** උපේක්ඛාය අඝානකානං උප පජ්ජන්තානං තෙසංතත්ථ'' **අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සොමනස්ස සහගත කාම ප්‍රතිසන්ධි(4) සතර දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සත ලැබෙති. උපේක්ෂා සහගත කාම ප්‍රතිසන්ධි (6) සය චෛතසික (32) දෙතිස, කර්මජ කලාප (3.7) තුනඝත මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

**ප්‍රතිලෝමයෙහි** අඝානකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන් ගේ නිරය වර්ජිත කාමාවචර භූමි (5) පස මහත්ගත උපේක්ෂා සහගත ප්‍රතිසන්ධි (5) පස චෛතසික (30) සම තිසය, කර්මජ කලාප (4) සතර මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර අරූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ගේ වෙහප්ඵලය සුද්ධාවාස භූමි (5) පස හා අරූප භූමි (4) සතර ලැබෙති. **අනුලෝම සංසය ස්වරූපාර්ථ** ද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චවන්තානං, අඝානකානං, විනා, උපෙක්ඛාය, උපපජ්ජන්තානං තෙසං තත්ථ''. සියලුම චුතවන පුද්ගලයන් ගේ සියලු භූමි රූපාවචර සෝමනස්ස ප්‍රති සන්ධි (4) සතර, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (4) සතර මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ගේ සුභකිණ්හක තලය දක්වා රූප භූමි (9) නවය, අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

**සද්ධින්ද්‍රිය මූලියෙහි** ''සඝානකානං විනා සද්ධාය උපපජ්ජන්තානං තෙසං තත්ථ සඝානකානං සද්ධාය උපපජ්ජන්තානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ**

අසඤ්ඤසත්තානං සද්ධාය උපපජ්ජන්තානං තෙසං තත්ථ'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි (2) දෙකය, **ඡන්ද-පීති-විරිය** වර්ජිත අන්‍ය සමාන චෛතසික (10) දශය, කර්මජ කලාප (3.7) තුන-සත, මේ ධර්මයන් ගේ **උත්පාදක්ෂණ** සමංගී වූ කාමාවචරයෙහි සඤ්ඤාකව උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය ලැබෙති.

මහා විපාක ප්‍රතිසන්ධි (8) අටය, චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3.7) තුන-සත මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි උපදින ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සතද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** මහග්ගත ප්‍රතිසන්ධි සිත් (9) නවය, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (4) සතර මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර අරූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ අසංඥතල වර්ජිත රූපාවචර භූමි (15) පසළොස, අරූප භූමි (4) සතර ලැබෙති. **පෙර සංසයද** ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චවන්තානං අසඤ්ඤසත්තානං විනා සද්ධාය උපපජ්ජන්තානං තෙසං තත්ථ'' සියලුම චුතවන පුද්ගල භූමි, කාමාවචරයෙහි අසඤ්ඤකව උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ නිරය වර්ජිත කාමාවචර භූමි (5) පස අසංඥ තලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ලැබේ. (විරියින්ද්‍රිය—සතින්ද්‍රිය—සමාධින්ද්‍රිය මෙයට සමානය).

**පඤ්ඤින්ද්‍රිය මූලියෙහි** ''සඤ්ඤසත්තානං විනා ඤාණෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ සඤ්ඤකානං ඤාණෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ** අසඤ්ඤසත්තානං ඤාණෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙකය, මහාවිපාක ඥානවිප්‍රයුක්ත ප්‍රතිසන්ධි සිත් (4) සතරය, චෛතසික (32) දෙතිස කර්මජ කලාප (3.7) තුන-සත මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ සඤ්ඤකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමභූමි (11) එකොළස ලැබෙති. මහා විපාක ඥාන සම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධි (4) සතර චෛතසික (33) තෙතිස කර්මජ කලාප (3.7) තුන-සත මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සත ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

**ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ**- මහත්ගත ප්‍රතිසන්ධි (9) නවය චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (4) සතර, මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ රූපාවචර අරූපාවචරයෙහි උපදිනා ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ අසංඥ තලය වර්ජිත රූප භූමි (15) පසළොස හා අරූප භූමි (4) සතර ගනු ලැබෙති. **අනුලෝම සංසය ස්වරූප** ද ගනු ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චවනානානං අඣානකානං විනා ඣානෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ'' සියලුම චුතවන පුද්ගල භූමි අඣානකව කාමාවචරයෙහි උපදිනා දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ නිරය වර්ජිත කාමාවචර භූමි (6) සය, අසංඥ තලයෙහි උපදිනා සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

ඝාන මූලය නිමි

---

# ඉත්ථින්ද්‍රිය මූලය

'' **යස්ස යත්ථ** ඉත්ථින්ද්‍රියං උප්පජ්ජති තස්ස තත්ථ පුරිසින්ද්‍රියං උප්පජ්ජතීති, නො, **යස්ස වා පන යත්ථ**, නො,'' අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ—කාමප්‍රතිසන්ධි (10) දශය චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3,7) තුන-සත මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදිනා පෘථග්ජන (4) සතර දෙනා ගේ යට ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ගනු ලැබෙති. (සංසය පදයා ගේ ස්වරූප නොමැත. ප්‍රතිලෝමයෙහි නය ක්‍රමය සමානය. පුරුෂයා කිවයුතු).

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ**,''සබ්බෙසං චවන්තානං න ඉත්ථීනං න පුරිසානං උපපජ්ජන්තානං තෙසං තත්ථ,'' සියලුම චුතවන පුද්ගල භූමි නපුංසකව කාමාවචරයෙහි උපදිනා දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය රූපාවචර අරූපාවචරයෙහි උපදිනා සුගති අහේතුක, දුගති අහේතුක පෘථග්ජනයන් ගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ රූප භූමි (16) දහසය හා අරූප භූමි (4) සතර ලැබෙති.

**ජීවිතේන්ද්‍රිය මූලියෙහි**— අනුලෝම-ආමන්තා ප්‍රතිලෝමයෙහි ''න ඉත්ථීනං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉත්ථීනං උපපජ්ජන්තීනං තාසං තත්ථ'' ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ කාම ප්‍රතිසන්ධි (10) දශය, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3.7) තුන-සත, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි නපුංසකව පුරිසව උපදිනා පෘථග්ජන (4) සතර දෙනා ගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය

පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමභූමි (11) එකොළස, රූපාවචර, අරූපාවචරයෙහි උපදින සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන, යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනා ගේ රූපභූමි (16), දහසය, හා අරූපභූමි (4) සතර ගනු ලැබෙති. කාම ප්‍රතිසන්ධි (10) දශය චෛතසික (33) තෙතිසය කර්මජ කලාප (3, 7) තුන-සත **මේ** ධර්මයන් ගේ **උ**ත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළසද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීකයෙහි** "සබ්බෙ-සං චවන්තානං තෙසං තත්ථ" (පෙර සේ උදුරනු).

**සොමනස්සින්ද්‍රිය** මූලියෙහි "ඉත්ථීනං විනා සොමනස්සෙන උපපජ්ජන්තීනං තාසං තත්ථ ඉත්ථීනං සොමනස්සෙන උපපජ්ජන්තීනං තාසං තත්ථ **යස්ස වා පන යත්ථ** සොමනස්සෙන න ඉත්ථීනං උපපජ්ජන්තානං තෙසං තත්ථ" අනුලෝම-යෙහි **සනිට්ඨාන ස්වරූපාර්ථ** කාම උපෙක්ෂා ප්‍රතිසන්ධි (6) සය දෙනාගේ උත්පා-දක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ලැබෙති. සොම-නස්ස කාම ප්‍රතිසන්ධි (4) සතරය, චෛතසික (33) තෙතිසය, කර්මජ කලාප (3.7) තුන-සත. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයේ ස්ත්‍රීව උපදින ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාම සුගති භූමි (7) සතද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි පුරුෂව උපදින රූපාවචරයෙහි උපදින ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ කාම සුගති භූමි (7), සත හා සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ගනු ලැබේ. **අනුලෝම සංසය ස්වරූප ද** ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "සබ්බෙසං චවන්තානං න ඉත්ථීනං විනා සොම-නස්සෙන උපපජ්ජන්තානං තෙසං තත්ථ" සියලුම චුතවන පුද්ගලභූමි, උපෙක්ෂා ප්‍රතිසන්ධි (11) එකොළස, චෛතසික (32) දෙතිසය කර්මජ කලාප (3.7.4) තුන-සත-සතර මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි නපුං-සකව, පුරුෂව උපදින රූපාවචර අරූපාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනා ගේ කාමභූමි (11) එකොළස වෙහප්ඵල අසංඥතල, සුද්ධාවාස භූමි, (5) පස හා අරූපභූමි (4) සතර ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** "ඉත්ථීනං විනා උපෙක්ඛාය උපපජ්ජන්තීනං, තාසං තත්ථ, ඉත්ථීනං උපෙක්ඛාය උපපජ්ජන්තීනං තාසං තත්ථ, **යස්ස වා පන යත්ථ** උපෙක්ඛාය න ඉත්ථීනං උපපජ්ජන්තානං තෙසංතත්ථ, "අනුලෝමයෙහි **සන්නිට්-**

**ධාන ස්වරූපාර්ථ** කාමාවචර සෝමනස්ස ප්‍රතිසන්ධි (4) සතර, චෛතසික (33) තෙතිස, කර්මජ කලාප (3.7) තුන-සත. මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාම සුගති භූමි (7) සත ලැබෙති. කාම උපේක්ෂා ප්‍රතිසන්ධි (6) සදෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාම භූමි (11) එකොළසද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපේක්ෂා ප්‍රතිසන්ධි (11) එකොළස ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි නපුංසකව, පුරුෂව උපදින, රූපාවචර අරූපාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනා ගේ යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය, සුද්ධවාස භූමි (5) පස හා අරූප භූමි (4) සතර ලැබෙති. පෙර සංසය ස්වරූපද ගනු ලැබේ.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** "සබ්බසං චවන්තානං, න ඉත්ථීනං විනා උපෙක්ඛාය උපපජ්ජන්තානං තෙසං තත්ථ," සියලුම චුතවන පුද්ගල භූමි, සොම-නස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ කාමාවචරයෙහි පුරුෂව උපදින රූපාවචර, අරූපාවචරයෙහි උපදින ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත හා සුභකිණ්හක තලය දක්වා රූපභූමි (9) නවය, අසංඥතලයෙහි උප-දින, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥසත්ත්ව භූමිය ලැබේ.

**සද්ධින්ද්‍රිය මූලියෙහි** "ඉත්ථීනං අහේතුකානං උපපජ්ජන්තීනං තාසං තත්ථ, ඉත්ථීනං සහේතුකානං, උපපජ්ජන්තීනං තාසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, න ඉත්ථීනං සහේතුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ," අනුලෝමයෙහි **සන්-නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙකෙහි උත්පාදක්ෂණ සමංගී නම්වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය ලැබෙති. මහා විපාක ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමසුගති භූමි (7) සතද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සහේතුක ප්‍රතිසන්ධි (17) සත-ලොස ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි පුරිසව උපදින රූපාවචර අරූපාවචරයෙහි උපදින ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන යන්ගේ යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ලැබෙති. **පෙර සංසය ස්වරූපාර්ථ** ද ගනු

ලැබෙති. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "සබ්බෙසං චවන්තානං න ඉත්ථීනං අහේතුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ".

සියලුම චුතවන පුද්ගල භූමි, අහේතුක ප්‍රතිසන්ධි (2) දෙදෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි නපුංසකව පුරුෂව උපදින දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබෙයි. (වීරිය-සති-සමාධි මූලිහු ද සාමානය).

**පඤ්ඤින්ද්‍රිය මූලියෙහි**, "ඉත්ථීනං ඤාණ විප්පයුත්තානං උපපජ්ජන්තීනං තාසං තත්ථ ඉත්ථීනං ඤාණ සම්පයුත්තානං උපපජ්ජන්තීනං තාසං තත්ථ **යස්ස වා පන යත්ථ** ඤාණ සම්පයුත්තානං න ඉත්ථීනං උපපජ්ජන්තානං තෙසං තත්ථ," අනුලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ**, අහේතුක ප්‍රතිසන්ධි මහා විපාක ඤාණ විප්‍රයුක්ත ප්‍රතිසන්ධි (4) සතර දෙනා ගේ උත්පාදක්ෂණ සමංගීවූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින දුගති අහේතුක, සුගති අහේතුක, ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමභූමි (11) එකොළස ලැබෙති. කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි (4) සතරදෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි ස්ත්‍රීව උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාම සුගති භූමි (7) සතද ගනු ලැබෙති' සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ත්‍රිහේතුක ප්‍රතිසන්ධි (13). තෙළෙස ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ කාමාවචරයෙහි පුරුෂව උපදින රූපාවචර අරූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ලැබෙති. **පෙර සංසය ස්වරූපද** ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ**, "සබ්බෙසං චවන්තානං න ඉත්ථීනං ඤාණ විප්පයුත්තානං උපපජ්ජන්තානං තෙසං තත්ථ," සියලුම චුතවන පුද්ගල-භූමි අහේතුක ප්‍රතිසන්ධි (2) දෙදෙනා ගේ මහා විපාක ඤාන විප්‍රයුක්ත ප්‍රතිසන්ධි (4) සතර දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ කාමාවචරයෙහි නපුංසකව පුරුෂව උපදින දුගති අහේතුක සුගති අහේතුක, ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමභූමි (11) එකොළස හා අසංඥතලයෙහි උපදින සුගති අහෙතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබේ. ඉත්ථින්ද්‍රිය මූලය නිමි. (පුරිසින්ද්‍රිය මූලයද සමානය. පද මාරු කොට කියනු.)

[මෙසේ පුරිසින්ද්‍රිය මූලය දක්වා චුති ප්‍රතිසන්ධිය දක්වනු ලැබේ. ජීවිතේන්ද්‍රිය මූලයේ පටන් ප්‍රතිසන්ධි- ප්‍රවෘත්ති- චුති වදරා ඇත]

## ජීවිතේන්ද්‍රිය මූලය

"**යස්ස යත්ථ** ජීවිතින්ද්‍රියං උප්පජ්ජති, තස්ස තත්ථ සොමනස්සින්ද්‍රියං **උප්පජ්ජතීති** විනා සොමනස්සෙන උපපජ්ජන්තානං පවත්තෙ සොමනස්ස-විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ."

[පොතෙහි " නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං, කියා ඇත. ගුරුවරු එය සුදුසු යයි නොකියති, කුමක් හෙයින් ද යත් සත්‍ය යමක දුක්ඛ සත්‍ය යමකයෙහි නො වදළ බැවිනි. ජීවිතේන්ද්‍රිය දුක්ඛ සත්‍යය හා සමානත්වයෙන් ගන්නා ලද්දකි].

"සොමනස්සෙන උපපජ්ජන්තානං පවත්තෙ සොමනස්ස සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තේසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, ආමන්තා," අනුලොමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ෂා ප්‍රතිසන්ධි (11) එකොළස, චෛතසික (32) දෙතිස, කර්මජ කලාප (3-7-4), තුන සත සතර බැගිනි. ප්‍රථම ජීවිත නවක රූප කලාප, යන මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ යමංගී වූ පෘථග්ජන (4), සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතරය. කාමභූමි (11) එකොළස, වේහප්ඵලය, අසංඥතලය, සුද්ධාවාස භූමි (5) පසය, ප්‍රවෘත්ති කාලයෙහි, සුඛ-දුක්ඛ-දෞර්මනස්ස-උපෙක්ෂා සහගත චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4), සතර පඤ්චවෝකර භූමි (26) සවිස්ස ලැබෙති.

සොමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රි හේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3), තිදෙනාගේ කාම සුගති භූමි (7) සත, සුභ කිණ්හක තලය දක්වා රූප භූමි (9) නවය ප්‍රවෘත්ති කාලයේ සොමනස්ස සහගත සිත් (62), දෙසැට දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්සද ගනු ලැබෙති. **සංශය ස්වරූප** පෙර සේම ලැබේ.

**ප්‍රත්‍යනීක සංශය ස්වරූපාර්ථ** "සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ" සියලුම චුතවන පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4), සතර දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර පඤ්චවෝකාර භූමි (26) සවිස්ස අසංඥතල භූමිය ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධි-යෙහි පටන්, චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන් ගේ භඞ්ගක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයර්‍ය පුද්ගලයන්

(8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** "විනා උපෙක්ඛාය උපපජ්ජන්තානං පවත්තෙ උපෙක්ඛා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ උපෙක්ඛාය උපපජ්ජන්තානං පවත්තෙ උපෙක්ඛා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ**, ආමන්තා."

**අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සොමනස්ස ප්‍රතිසන්ධි (8) අටදෙනා ගේ **උත්පාදක්ෂණ** සමංගී වූ ද්විහේතුක, **ත්‍රිහේතුක** පෘථග්ජනයන් **ගේ** හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම **සුගති** භූමි (7) සතය. **සුභකිණ්හකය** දක්වා රූපාවචර භූමි (9) නවය, අසංඥතලයෙහි උපදින **සු**ගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි සුඛ, දුක්ඛ, සෞමනස්ස, දෞර්මනස්ස සහගත **චිත්තයන්** ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා **ආයර්‍ය පුද්ගලයන්** (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර **භූමි** (26) සවිස්ස ගනු ලැබෙති. **උපෙක්ෂා ප්‍රතිසන්ධි** (11) එකොළස ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය **පුද්ගලයන්** (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර **කාමභූමි** (11) එකොළස වෙහප්ඵලය **සුද්ධාවාය** භූමි(5) පස, ප්‍රවෘත්ති කාලයෙහි උපෙක්ෂා සහගත සිත් (55) පස්පණස ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26). සවිස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේම ලැබේ. **ප්‍රත්‍යනීක සංසය** සමානමැයි.

**සද්ධින්ද්‍රිය මූලියෙහි** "අහේතුකානං උපපජ්ජන්තානං, පවත්තෙ සද්ධාවිප්ප යුත්ත චිත්තස්ස, උප්පාදක්ඛණෙ, තෙසං තත්ථ, සහේතුකානං උපපජ්ජන්තානං පවත්තෙ සද්ධා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ආමන්තා."

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි (2) දෙදෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ දුගති අහේතුක, **සු**ගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය, අසංඥ තලයෙහි උපදින **සුගති** අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ **අසංඥ** තල භූමි, ප්‍රවෘත්ති කාලයෙහි **අශෝභන සිත්** (30) තිස් දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ඵලස්ථ ආයර්‍ය **පුද්**ගලයන් (4) සතර දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ලැබෙති. සහේතුක ප්‍රතිසන්ධි සිත් (17) සත ළොස ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, **ත්‍රිහේතුක** පෘථග්ජන **පුද්ගලයන් ගේ**

හා යට එලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. ප්‍රවෘත්ති කාලයෙහි සෝභන සිත් (59) එකුන් සැට දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබෙ. **ප්‍රත්‍යනීකය** සමානය.

විරියේන්ද්‍රිය මූලියෙහි "අහේතුකානං උපපජ්ජන්තානං, පවත්තෙ විරිය **විප්ප-යුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ** තෙසං තත්ථ සහේතුකානං උපපජ්ජන්තානං පවත්තෙ විරිය සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ." අනුලොමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙකෙහි උත්පාදක්ෂණ සමංගී වූ දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය, අසංඥ තලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥ තල භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි විරිය නොයෙදෙන සිත් (16) දහසය දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනා ගේ හා එලසථ ආයර්‍ය පුද්ගලයන් (4) සතර දෙනා ගේ පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ලැබෙති.

සහේතුක ප්‍රතිසන්ධි සිත් (17) සතලොස ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ හා යට එලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ප්‍රවෘත්ති කාලයෙහි වියර්‍ය සම්ප්‍රයුක්ත වූ සිත් (73) තෙසැත්තෑව ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයර්‍ය පුද්-ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබෙ. **ප්‍රත්‍යනීකය** සමානය.

**සමාධින්ද්‍රිය මූලියෙහි** අහේතුකානං උපපජ්ජන්තානං, පවත්තෙ සමාධි **විප්පයුත්ත** චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, සහේතුකානං උපපජ්ජන්තානං, පවත්තෙ සමාධි **සම්පයුත්ත චිත්තස්ස** උප්පාදක්ඛණෙ තෙසං තත්ථ". අනු-ලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙකෙහි උත්පාදක්ෂණ සමංගී වූ දුගති, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) සය අසඤ්ඤතලයෙහි උපදින පුද්ගලයන් ගේ අසංඥතල භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි ස්මාධින්ද්‍රිය තොර සිත් (17) සතලොසගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා එලස්ථ ආයර්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26)

සවිස්ස ගනු ලැබෙති. (සමාධීන්ද්‍රිය නොමැති සිත් (17) දහත යනු විරියින්ද්‍රිය නොයෙදෙන සිත් (16) දහසය හා විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත ද යන (17) දහතයි.)

සහේතුක ප්‍රතිසන්ධි සිත් (17) දහත් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන යට ඵලස්ථ ආයඁ පුද්ගලයන් (3) තිදෙනා ගේ ද චතුවෝකාර භූමි (4) සතර හා අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. ප්‍රවෘත්ති කාලයෙහි සමාධීන්ද්‍රිය යෙදෙන සිත් (72) දෙසැත්තෑවෙහි උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයඁ පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. **සංසය සවරූප** පෙර සේ ලැබෙ. **ප්‍රත්‍යනිකය**. සමානය.

**පඤ්ඤින්ද්‍රිය මූලියෙහි** "ඤාණ විප්පයුත්තානං උපපජ්ජන්තානං, පවත්තෙ ඤාණවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ ඤාණ සම්පයුත්තානං උපපජ්ජන්තානං, පවත්තෙ ඤාණ සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ," අනුලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙක මහා විපාක ඤාණ විප්‍රයුක්ත ප්‍රතිසන්ධි සිත් (4) සතර චෛතසික (32) දෙතිස, කර්මජ කලාප (3– 7) තුන - සත, මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ, දුගති අහේතුක ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමභූමි (11) එකොළස, අසංඥතල භූමියෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥ තල භූමිය ප්‍රවෘත්ති කාලයෙහි අකුශල (12) දොළස, අහේතුක සිත් (18) දහ අට හා ඤාණ විප්‍රයුක්ත කාම සෝභන සිත් (12) දොළොස් දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ ඵලස්ථ ආයඁ පුද්ගලයන් (4) සතර දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්ච වෝකාර භූමි (26) සවිස්ස ලැබෙති.

ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (13) තෙළෙස, චෛතසික (35) පන්තිස කර්මජ කලාප. (3. 7. 4) තුන - සත - සතර මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආයඁ පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස ප්‍රවෘත්ති කාලයෙහි ඤාන සම්ප්‍රයුක්ත කාමසෝභන සිත් (12) දොළොස හා මහග්ගත ලෝකෝත්තර සිත් (35) පන්තිස් දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) දෙනා ගේ හා ආයඁ පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද **පඤ්චවෝකාර** භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. **සංසය සවරූපාර්ථ** පෙර මෙනි. **ප්‍රත්‍යනීක** සංසය නය ක්‍රමය සමානය.

**මනින්ද්‍රිය මූලියෙහි** "අචිත්තකානං උපපජ්ජන්තානං, තෙසං තත්ථ, සචිත්තකානං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, තෙසං තත්ථ." **අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අසඤ්ඤතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබේ. ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්ස, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3. 7. 4) තුන - සත - සතර මේ ධර්මයන් ගේ උත්පාදක්ෂණ සමංගී **වූ** චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උදිපන පෘථග්ජන (4) සතර දෙනා ගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර, පඤ්චවෝකාර භූමි (26) **සවිස්ස** ප්‍රවෘත්ති කාලයෙහි (89) එකුන් අනූ චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද, පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබේ. **සංසය ස්වරූපාර්ථ** පෙර සේම ලැබේ. **ප්‍රත්‍යනීකය** සමානය. (මේ මනින්ද්‍රිය මූලියෙහි "නිරොධ සමාපන්නානං අසඤ්ඤසත්තානං," කියා පෙළෙහි ඇත. ආචාර්‍ය පාදයෝ ස්වරූප ඉදිරිපේදි, අසංඥසත්ත උපපජ්ජන්තය පමණක් උදුරති).

ජීවිතේන්ද්‍රිය මූලය නිමි.

---

## සොමනස්ස මූලය

**සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** අනුලෝම ප්‍රතිලෝම ප්‍රතිෂේධමැයි **අනුලෝම** සන්නිට්ඨාන **ස්වරූපාර්ථ** සෝමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පඤ්චවෝකාරයෙහි උපදින ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජනයන් ගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත, **සුභකිණ්හකය** දක්වා රූපභූමි (9) නවය, ප්‍රවෘත්ති කාලයෙහි සෝමනස්ස සහගත (62) දෙසැට චිත්තයා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන සතර දෙනා ගේ, හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විඩිභය ලැබේ. (සංසය පද ස්වරූප නොලැබේ. ප්‍රතිලෝම සන්නිට්ඨාන **පද ස්වරූපාර්** උපෙක්ෂා ප්‍රතිසන්ධි සිත් (11) එකොළස ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ කාමභූමි (11) එකොළස, වේහප්ඵලය, සුද්ධාවාස භූමි පස හා අරූප භූමි (4) සතර, ප්‍රවෘත්ති කාලයෙහි උපෙක්ෂා සහගත සිත් (55) පස් පණසෙහි උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවොකාර **භූමි** (4) සතර හා පඤ්චවෝකාර භූමි (26)

විඨිහය ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක සංසය** ''සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස, භඞ්ගක්ඛණෙ සොමනස්ස විප්පයුත්ත උපෙක්ඛා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''

[පුද්ගල වාරය වේ නම්, ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, සොමනස්ස විප්පයුත්ත උපෙක්ඛා, විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං,'' කියා උගන්වති. පසුව දක්වන පාඨ සත්‍ය යමකය සමග සමානය පුද්ගලෝකාශයෙහි ''නිරොධ සමාපන්නානං'' ඇතුලත් නො කරනු ලැබේ.]

සියලු චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී වූ සුඛ, දුක්ඛ, දෙමනස්ස සහගත චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය. පඤ්චවෝකාර භූමි (26) සවිස්සය. අසංඥතලයෙහි උපදින අසංඥසත්වයන්ගේ අසංඥකලය යන මේ භූමි ලැබෙති.

**සෝමනස්සින්ද්‍රිය මූල සද්ධින්ද්‍රිය මූලියෙහි**, ''[සොමනස්සේන විනා සද්ධාය, උපපජ්ජන්තානං, පවත්තෙ සොමනස්ස විප්පයුත්ත සද්ධාවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ'' යයි පෙළ හි ඇත. මේ පෙළට අනුව ප්‍රතිසන්ධි සිත් (19) දහනවය අතුරෙන් ශ්‍රද්ධාව සමග සම්ප්‍රයුක්ත නොවෙන සෝමනස්ස ප්‍රතිසන්ධියක් නම් නැත. සෝමනස්ස ප්‍රතිසන්ධිය සෝභන මැයි ඒ නිසා කිම සුදුසු නැත. ප්‍රවෘත්ති කාලයෙහි පමණක් ම කිම සුදුසු යයි කියන ලදහ. [මෙසේ පාළි විභංගය වදරා ඇත.]

''පවත්තෙ සෝමනස්ස සම්පයුත්ත සද්ධා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ සෝමනස්සේන උපපජ්ජන්තානං පවත්තෙ සෝමනස්ස සම්පයුත්ත සද්ධාසම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තේසං තත්ථ, යස්ස වා පන යත්ථ සහේතුකානං විනා සෝමනස්සේන උපපජ්ජන්තානං, පවත්තෙ සද්ධාසම්පයුත්ත සෝමනස්ස විප්ප යුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ.''

**අනුලෝම සන්නිවධාන ස්වරූපාර්**, ලෝභමූල සෝමනස්ස සහගත සිත් (4) සතර සෝමනස්ස සන්තීරණ හා හසිතුත්පාදයා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා එලසථ ආයතී පුද්ගලයන් (4) සතර දෙනා ගේ චතුවෝකාර භූමි (4), සතර හා පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති. සෝමනස්ස ප්‍රතිසන්ධි සිත් (8) අට දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ හා යට එලසථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි, (7) සත සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය ප්‍රවෘත්ති කාලයෙහි කාමාවචර සෝභන

සෝමනස්ස සහගත සිත් (12) දොළස හා මහග්ගත ලෝකෝත්තර සිත් (44) සුසාලිසගේ, උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) විසි හයද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ සහේතුක උපේක්ෂා ප්‍රතිසන්ධි සිත් (9) නවයේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන, යට ඵලසථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර කාම සුගති භූමි (7) සත වෙහප්ඵලය හා සුද්ධාවාස භූමි (5) පස ප්‍රවෘත්ති කාලයෙහි සෝභන සහේතුක උපේක්ෂා (35) පන්තිස් චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති.

**ප්‍රත්‍යනීක** සංසය ස්වරූපාර්ථ ''සබ්බෙසං චිත්තස්ස භඩ්ගක්ඛණේ සෝමනස්ස විප්පයුත්ත සද්ධා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ'' සියලු චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී වූ ද අකුශල උපෙක්ෂා සහගත සිත් (6) සය දෝෂමූල සිත් (2) දෙක අහේතුක උපේක්ෂා සහගත සිත් (14) - දහතර හා කාය විඤ්ඤාණ සිත් දෙකෙහි ද උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආය්‍ය පුද්ගලයන් අට දෙනා ගේ චතුවෝ-කාර භූමි (4) සතර පඤ්චවෝකාර භූමි (26) විසිහය හා අසඤ්ඤතලභූමිය ගනු ලැබේ. (''සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භඩ්ගක්ඛණෙ'' යනාදීන් පෙළෙහි ඇත.)

**විරියින්ද්‍රිය මූලියෙහි** ''පවත්තෙ සොමනස්ස සම්පයුත්ත විරියවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ'' -පෙ- [ සෙසු පාඨ සුගමය ] අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, සෝමනස්ස සන්තීරණ චිත්තයා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ඵලසථ ආය්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේ පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති. සෝමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් **ගේ හා** යට ඵලසථ ආය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය ප්‍රවෘත්ති කාලයෙහි ලෝභමූල සෝමනස්ස සහගත සිත් (4) සතර හසිතෝත්පාද සිත කාමසෝභන සෝමනස්ස සහගත සිත් (12) දොළස හා මහග්ගත ලෝ-කෝත්තර සෝමනස්ස සහගත සිත් (44) **සුසාළිස්** දෙනා ගේ **උත්පාදක්ෂණ** සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) විසිහය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සහේතුක උපෙක්ෂා (9) නවය හා චෛතසික (32) දෙතිසගේ උත්පාදක්ෂණ සමංගීවූ චතුවෝකාර පඤ්චවෝකාර-යෙහි උපදින ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ හා යට ඵලසථ ආයසී පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර, කාම සුගති භූමි (7) සත වේහප්ඵලය සුද්ධාවාස භූමි (5) පස ප්‍රවෘත්ති කාලයෙහි අකුශල උපේක්ෂා සහගත සිත් (6) සය, දෝෂමූල (2) දෙක, මනෝද්වාරාවර්ජනය, කාමසෝභන උපෙක්ෂා සහගත සිත් (12) දොළස හා පඤ්චමධ්‍යාන සිත් (23) තෙවිසි දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනා ගේ හා ආයසී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චිත්තස්ස භඩ්ගක්ඛණෙ සෝමනස්ස විප්පයුත්ත විරිය විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' සියලුම චිත්තයන් ගේ භඩ්ගක්ඛණ සමංගී වූ දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය, පඤ්චද්වාරා වර්ජනය, සම්පටිච්ඡන (2) ද්වය හා උපේක්ෂා සන්-තිරණ සිත් (2) දෙදෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයසී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර පඤ්චවෝකාර භූමි (26) විසිහය අසංඥ සත්ත්වයන් ගේ අසංඥ තල භූමිය ගනු ලැබේ.

**සමාධින්ද්‍රිය මූලියෙහි** ''පවත්තෙ සොමනස්ස සම්පයුත්ත සමාධි විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ,'' [**අනුලෝමයෙහි** විරිඩින්ද්‍රිය මෙන් ස්වරූප උදුරනු **ප්‍රතිලෝමයෙහි** විචිකිච්ඡා සහගත චිත්තය අත් හැරීමම විශේෂයි. **ප්‍රත්‍යනීකයෙහි** විචිකිච්ඡා සහගත චිත්තය කිවයුතුය.]

**පඤ්ඤින්ද්‍රිය මූලියෙහි** ''සොමනස්සෙන ඤාණ විප්පයුත්තානං උපපජ්ජන්තානං පවත්තෙ සොමනස්ස සම්පයුත්ත ඤාණ විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ සෝමනස්සෙන ඤාණ සම්පයුත්තානං උපපජ්ජන්තානං පවත්තෙ සෝමනස්ස සම්පයුත්ත ඤාණ සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ඤාණ සම්පයුත්තානං විනා සොමනස්සේන උපපජ්ජන්තානං පවත්තෙ ඤාණ සම්පයුත්ත සෝමනස්ස විප්පයුත්ත චිත්තස්ස උප්පාදකඛණෙ තෙසං තත්ථ.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** මහා විපාක ඥාන සම්ප්‍රයුක්ත සෝම-නස්ස ප්‍රතිසන්ධි සිත් (2) දෙකෙහි උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක පෘථග්-ජන පුද්ගලයන් ගේ කාම සුගති භූමි (7) සත ප්‍රවෘත්ති කාලයෙහි අකුශල සෝමනස්ස සහගත සිත් (4) සතරය යන සෝමනස්ස සහගත සිත් (6) සය දෙනාගේ

උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා එලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සතර දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති.

ත්‍රිහේතුක සොමනස්ස සහගත ප්‍රතිසන්ධි සිත් (6) සය දෙනාගේ උත්පාදක්ෂණ සමංගීවූ ත්‍රිහේතුක පෘථග්ජන යට එලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත හා සුභකිණ්හකය දක්වා රූපභූමි (9) නවය ප්‍රවෘත්ති කාලයෙහි ඥානසම්ප්‍රයුක්ත කාමාවචර සෝභන සෝමනස්ස සහගත සිත් (6) සය, මහග්ගත ලෝකෝත්තර සෝමනස්ස සහගත සිත් (44) සුසාලිස ගේ උප්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනා ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ත්‍රිහේතුක උපෙක්ෂා ප්‍රතිසන්ධි සිත් (7) සත් දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ හා යට එලසථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර කාමසුගති භූමි (7) සත වෙහප්ඵලය පඤ්ච සුද්ධාවාසය, ප්‍රවෘත්ති කාලයෙහි ඥානසම්ප්‍රයුක්ත කාම සෝභන උපෙක්ෂා සහගත සිත් (6) සදෙනාගේ හා පඤ්චමධ්‍යාන සිත් (23) තෙවිසි දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති. **පෙර කියන ලද සංසය ස්වරූපද** ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චිත්තස්ස භඩ්ගක්ඛණෙ, සෝමනස්ස-විප්පයුත්ත ඤාණවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.'' සියලුම චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී වූ අකුශල උපේක්ෂා සහගත සිත් (6) සය, දෝසමූල, (2) දෙක අහේතුක උපේක්ෂා සහගත සිත් (14) දහතර, කාය විඥාන ද්වය හා ඥාන විප්‍රයුක්ත කාමාවචර සෝභන උපෙක්ෂා සහගත සිත් (6) සය දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනා ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය, අසංඥසත්ව පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

**මනින්ද්‍රිය මූලීයෙහි** අනුලෝම-ආමන්තා ප්‍රතිලෝමයෙහි ''සචිත්තකානං විනා සෝමනස්සේන උපපජ්ජන්තානං පවත්තෙ සෝමනස්ස විප්පයුත්ත චිත්-තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, සෝමනස්සේන උපපජ්ජන්තානං පවත්තෙ සොමනස්ස සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ.''

ප්‍රතිලොමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ෂා සහගත ප්‍රතිසන්ධි සිත් (11) එකොළස ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිව්දෙනාගේ හා යට **ඵලස්ථ** ආයතී පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර කාමභූමි (11) එකොළස, වේහප්ඵලය පඤ්චශුද්ධාවාසය, ප්‍රවෘත්ති කාලයෙහි සුඛ, දුක්ඛ, දෝමනස්ස උපෙක්ෂා සහගත චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර **හා** පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති.

සෝමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගීවූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ හා යට **ඵලස්ථ** ආයතී පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ප්‍රවෘත්ති කාලයෙහි සෝමනස්ස සහගත (62) දෙසැට චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනා ගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ද ගනු ලැබෙති. **සංශය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක සංශය**, ''සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ.''

සියලුම චිත්තයන් ගේ භංගක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා ගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර, පඤ්චවෝකාර භූමි (26) විසිහය හා අසංඥතල වාසීන් ගේ අසංඥතල භූමි ලැබේ.

සෝමනස්සින්ද්‍රිය මූලය නිමි.

---

## උපෙක්ෂා මූලය

**උපෙක්ඛින්ද්‍රිය** මූල සද්ධින්ද්‍රිය මූලියෙහි ''උපෙක්ඛාය අහේතුකානං, උපපජ්ජන්තානං, පවත්තෙ උපෙක්ඛා සම්පයුත්ත සද්ධාවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, උපෙක්ඛාය සහේතුකානං, **සද්ධාය** උපපජ්ජන්තානං, පවත්තෙ උපෙක්ඛා සම්පයුත්ත සද්ධා සම්පයුත්ත චිත්තස්ස උපපාදක්ඛණෙ-තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ** සහෙතුකානං විනා උපෙක්ඛාය උපපජ්ජන්තානං පවත්තෙ සද්ධා සම්පයුත්ත උපෙකඛා විප්පයුත්ත චිත්තස්ස උප්පාදකඛණෙ තෙසං තත්ථ.''

අනුලොම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි (2) දෙසිතෙහි උත්පාදක්ෂණ සමංගී වූ දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ප්‍රවෘත්ති කාලයෙහි අකුශල උපෙක්ෂා සහගත සිත් (6) සය හා අහේතුක උපෙක්ෂා සහගත සිත් (14) දහතර දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් සතර දෙනාගේ හා ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේ, චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති.

සහේතුක උපේක්ෂා ප්‍රතිසන්ධි (9) නව දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ හා යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර කාම සුගති භූමි (7) සත වෙහප්ඵලය, පඤ්චශුද්ධාවාසය, ප්‍රවෘත්ති කාලයෙහි කාමාවචර සෝභන උපෙක්ෂා සහගත සිත් (12) දෙළස, හා පඤ්චමධ්‍යාන සිත් (23) තෙවිසි දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා ගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) විසිහය ද ගනු ලැබෙති **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයේ **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝමනස්ස ප්‍රතිසන්ධි සිත් (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ හා යට ඵලසථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත හා සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, ප්‍රවෘත්ති කාලයෙහි කාම සෝභන සෝමනස්ස සහගත සිත් (12) දෙළස, හා මහත්ගත ලෝකෝත්තර සෝමනස්ස සහගත සිත් (44) සුසාලිස් දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති. **අනුලෝම සංසය ස්වරූපද** ගනු ලැබෙති. සංසය **ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ උපෙක්ඛා විප්පයුත්ත සද්ධාවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ" සියලුම චිත්තයන් ගේ භඞ්ගක්ෂණ සමංගී වූද ලෝභමූල සෝමනස්ස සහගත සිත් (4) සතර දෙසමූල (.) දෙක කාය විඤ්ඤාණ සිත් (2) දෙක සෝමනස්ස සන්තීරණය, හා හසිතෝත්පාදයාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙ නාගේ චතුවෝකාර භූමි (4) සතර පඤ්චවෝකාර භූමි (26) විසිහය හා අසංඥතල වාසීන් ගේ අසංඥතල භූමිය ගනු ලැබේ

**වීරියින්ද්‍රිය මූලියෙහි** "උපෙක්ඛාය අහේතුකානං උපපජ්ජන්තානං—පෙ— (විභංගය පෙර මෙනි). අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක

ප්‍රතිසන්ධි සිත් (2) දෙදෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ දුගති අහේතුක' සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමාවචර භූමි (6) හය, ප්‍රවෘත්ති කාලයෙහි මනෝද්වාරාවර්ජනය වර්ජිත අහේතුක උපෙක්ෂා සහගත (13) තෙළෙස් චිත්තයන් ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ඵලස්ථ ආයතී පුද්ගලයන් (4) සිවු දෙනා ගේ පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති.

සහේතුක උපෙක්ෂා ප්‍රතිසන්ධි (9) නව දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ හා යට **ඵලස්ථ** ආයතී පුද්ගලයන් (3) තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර කාම සුගති භූමි (7) සත වේහප්ඵලය පඤ්ච ශුද්ධාවාස භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි අකුශල උපෙක්ෂා සහගත සිත් (6) සය, මනෝද්වාර වර්ජනය කාමසෝභන උපෙක්ෂා සහගත සිත් (12) දෙළස හා පඤ්චමධ්‍යාන සිත් (23) තෙවිසි දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනා ගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර ද, පඤ්චවෝකාර භූමි (26) විසි හයද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ මැයි.

ප්‍රතිලෝම **සන්නිතිවර්‍ධාන සවරූපාර්ථ** සෝමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ හා යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත, හා සුභකිණ්කය දක්වා රූප භූමි (9) නවය, ප්‍රවෘත්ති කාලයෙහි ලෝභමූල සෝමනස්ස සහගත සිත් (4) සතර, දෝෂමූල (2) දෙක, හසිතෝත්පාදය, කාමාවචර සෝභන සෝමනස්ස සහගත සිත් (12) දෙළස හා මහග්ගත ලෝකෝත්තර සෝමනස්ස සහගත සිත් (44) සුසාලිස් දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනා ගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) හා පඤ්චවෝකාර භූමි (26) විසිහය **පෙර කියන ලද සංසය සවරූපද** ලැබෙ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ උපෙක්ඛා විප්පයුත්ත විරිය විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූද කාය විඤ්ඤාණ සිත් (2) දෙක හා සෝමනස්ස සන්තිරණ චිත්තයා ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා ගේ හා ආයතී පුද්ගලයන් (8) අට දෙනා ගේ චතු-වෝකාර භූමි (4) සතර පඤ්චවෝකාර (26) සවිසි භූමිය හා අසංඥ තල වාසීන්ගේ අසංඥසත්ත්ව භූමිය ගනු ලැබෙති, [සතින්ද්‍රිය ද 'සද්ධින්ද්‍රිය මෙනි, සමාධින්ද්‍රිය මූලිය ද විරියින්ද්‍රිය මූලියට සමානය. විචිකිච්ඡා සහගත චිත්තය සන්නිට්ඨාන පදයෙහි ඇතුලත් කොට සවරූප ඉදිරීමම විශේෂයි.]

**පඤ්ඤින්ද්‍රිය මූලියෙහි** උපෙක්ඛාය ඤාණ විප්පයුත්තානං උපපජ්ජන්තානං, පවත්තෙ උපෙක්ඛා සම්පයුත්ත ඤාණ විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,'' (විභංගය සමානය) අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙක හා මහා විපාක උපෙක්ෂා සහගත ඤාණ විප්පයුත්ත ප්‍රතිසන්ධි සිත් දෙකකි උත්පාදක්ෂණ සමංගී වූ දුගති අහේතුක සුගති අහේතුක ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමභූමි (11) එකොළස, ප්‍රවෘත්ති කාලයෙහි අකුසල උපෙක්ෂා සහගත සිත් (6) සය අහේතුක උපෙක්ෂා සහගත සිත් (14) දහතර, ඤාන විප්‍රයුක්ත කාම සෝභන උපෙක්ෂා සහගත සිත් (6) සය දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා එලස්ථ ආයති පුද්ගලයන් (4) සිවු දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසි **හය** ලැබෙති.

ත්‍රිහේතුක උපෙක්ෂා ප්‍රතිසන්ධි (7) සත් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාගේ හා යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර කාම සුගති භූමි (7) සත වෙහප්ඵලය, පඤ්ච සුද්ධාවාස භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි ඤාන සම්ප්‍රයුක්ත කාම සෝභන උපෙක්ෂා සහගත සිත් (6) සය, හා පඤ්චමධ්‍යාන සිත් (23) තෙවිසි දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයති පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) විසිහය ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර මෙනි.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – ත්‍රිහේතුක සෝමනස්ස ප්‍රතිසන්ධි (6) සදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ කාම සුගති භූමි (7) සත, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, ප්‍රවෘත්ති කාලයෙහි ඤානසම්ප්‍රයුක්ත කාම සෝභන සෝමනස්ස සහගත සිත් (6) සය, හා මහග්ගත ලෝකෝත්තර සෝමනස්ස සහගත සිත් (44) සුසාලිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයති පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසි හය ලැබෙති, **පෙර සංසය ස්වරූපද** ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, උපෙක්ඛා විප්පයුත්ත ඤාණ විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' සියලුම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද, ලෝභමූල සෝමනස්ස සහගත සිත් (4) සතර, දෝසමූල සිත් (2) දෙක, කායවිඤ්ඤාණ සිත් (2) දෙක, සෝමනස්ස සන්තිරණ සිත, හසිතෝත්පාද සිත, හා ඤාන විප්‍රයුක්ත කාමසෝභන සෝමනස්ස සහගත සිත් (6) සදෙනාගේ උත්පාදක්ෂණ

සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර (26) සවිසි භූමිය, අසංඥ තලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥ තල භූමිය ගනු ලැබේ.

**මනින්ද්‍රියමූලීයෙහි** – අනුලෝම-ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සචිත්තකානං විනා උපෙක්ඛාය උපපජ්ජන්තානං, පවත්තෙ උපෙක්ඛා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, උපෙක්ඛාය උපපජ්ජන්තානං පවත්තෙ උපෙක්ඛා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ."

ප්‍රතිලෝම **සන්නිවධාන ස්වරූපාර්ථ** – සෝමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගි වූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ **හා** යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සත, **සුභකිණ්හකය** දක්වා රූප භූමි (9) නවය, ප්‍රවෘත්ති කාලයෙහි සුඛ, දුක්ඛ සෝමනස්ස දෝමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගිවූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ගනු ලැබෙති. උපෙක්ෂා සහගත ප්‍රතිසන්ධි (11) එකොළොස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ, පෘථග්ජන (4) සිවු දෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් තිදෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර, කාමභූමි (11) එකොළස, වේහප්ඵලය, පඤ්ච සුද්ධාවාස භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි උපෙක්ෂා සහගත සිත් (55) පස්පණසගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරද පඤ්චවෝකාර භූමි (26) විසිහය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනිකයෙහි** සෝමනස්සින්ද්‍රිය මෙනි.

උපෙක්ඛිද්‍රින්ය මූලය නිමි.

---

## සද්ධින්ද්‍රිය මූලය

සද්ධින්ද්‍රිය මූල විරියින්ද්‍රිය මූලියෙහි, අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි 'පවත්තෙ විරිය සම්පයුත්ත සද්ධා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, සහේතුකානං උපපජ්ජන්තානං (සද්ධාය) පවත්තෙ සද්ධා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,"

ප්‍රතිලෝමයෙහි **සන්නිවධාන ස්වරූපාර්ථ** අකුශල් සිත් (12) දොළස, මනෝද්වාරාවර්ජන, හා හසිතෝත්පාද චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ

පෘථග්ජන (4) සිවුදෙනාගේ, ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (4) සිවුදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ගනු ලැබෙති. සහේතුක ප්‍රතිසන්ධි සිත් (17) සතලොස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස, ප්‍රවෘත්ති කාලයෙහි සෝභන (59) එකුන් සැට හෝ (91) එක් අනූ චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ආයඞ් පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර (26) සවිසි භූමිය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චිත්තස්ස භඩ්ගක්ඛණෙ විරිය විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' [ස්වරූපාර්ථ සුගමයි, සමාධින්ද්‍රිය මූලියද සමානයි. විචිකිච්ඡා සහගත චිත්තස්ස ප්‍රතිලෝම-යෙහි අඩුකරනු. ප්‍රත්‍යනිකයෙහි ඇතුලත් කරනු. විරියින්ද්‍රියට වඩා වෙනස මෙපමණි].

**පඤ්ඤින්ද්‍රිය මූලියෙහි** '' සහෙතුකානං ඤාණවිප්පයුත්තානං උපපජ්ජන්තානං පවත්තෙ සද්ධාසම්පයුත්ත ඤාණවිප්පයුත්ත චිත්තස්ස උපපාදක්ඛණෙ තෙසං-තත්ථ, සහෙතුකානං ඤාණසම්පයුත්තානං උප්පජ්ජන්තානං, පවත්තෙ සද්ධා සම්පයුත්ත ඤාණසම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,'' අනු-ලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** මහා විපාක ඥානවිප්‍රයුක්ත ප්‍රතිසන්ධි සිත් (4) සිවු දෙනා ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාම සුගති භූමි (7) සත, ප්‍රවෘත්ති කාලයෙහි ඥන විප්‍රයුක්ත කාමසෝභන (12) දෙළොස් චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවුදෙනා ගේ හා ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (4) සිවු දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ලැබෙති.

ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සිත් (13) තෙළෙසගේ උත්පාදක්ෂණ සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජන, හා යට ඵලසථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්ස, ප්‍රවෘත්ති කාල යෙහි ත්‍රිහේතුක සිත් (47) සත් සාලිසගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ආයඞ් පුද්ගලයන් (8) අට දෙනා ගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසි හයද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''සබ්බෙසං චිත්තස්ස භඩ්ගක්ඛණෙ, සද්ධා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ,'' (පෙර සේ ස්වරූප උදුරනු).

**මනින්ද්‍රිය මූලියයකි**—අනුලෝම—ආමන්තා ප්‍රතිලෝමයෙහි "සචිත්තකානං අහේතුකානං උපපජ්ජන්තානං, පවත්තෙ සද්ධා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, සහේතුකානං උපපජ්ජන්තානං, පවත්තෙ සද්ධා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ."

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි සිත් (2) දෙකෙහි උත්පාදක්ෂණ සමංගීවූ දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ප්‍රවෘත්ති කාලයෙහි අසෝභන (30) සමතිස් චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවුදෙනා ගේ හා එලසථ ආයඝ්‍ර පුද්ගලයන් (4) සිවුදෙනාගේ චතුවෝකාර (4) සිවුභූමි, පඤ්චවෝකාර (26) සවිසි භූමිය ගනු ලැබෙති, සහේතුක ප්‍රතිසන්ධි (17) සතළොස් චිත්ත-යන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන හා යට එලස්ථ ආයඝ්‍ර පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා අපාය වර්ජිත පඤ්චවෝකාර (22) දෙවිසි භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි (9) එකුන් සැටක් වූ හෝ (91) එක් අනූ සෝභන චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා හා ආයඝ්‍ර පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර (26) සවිසි භූමිය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථය** පෙර මෙනි. [ප්‍රත්‍යනීකය සමානය.]

සද්ධින්ද්‍රිය මූලය නිමි.

## විරියින්ද්‍රිය මූලය

**විරියින්ද්‍රිය මූල සමාධින්ද්‍රිය මූලි** අනුලෝමයෙහි "පවත්තෙ විරිය සම්පයුත්ත සමාධි විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, සහේතුකානං (සමධිනා) උපපජ්ජන්තානං, පවත්තෙ සමාධි සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ආමන්තා." අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** විචිකිච්ඡා සහගත චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ චතුර්වෝකාර භූමි (4) සතර කාමභූමි (11) එකොළස, වෙහප්ඵලය තෙක් රූප භූමි (10) දශය ගනු ලැබෙති.

සහේතුක ප්‍රතිසන්ධි (17) සතළොස් චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන හා යට එලසථ ආයඝ්‍ර පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර, අපාය වර්ජිත පඤ්චවෝකාර (22) දෙවිසි භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි සමාධින්ද්‍රිය යෙදෙන (72) දෙසැත්තෑ චිත්ත-යන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙන හා

ආයය්‍ පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර, හා පඤ්චවෝකාර (26) සවිසි භූමිය ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. [ප්‍රත්‍යනිකයෙහි විරිය විප්පයුත්ත සිත් කියනු.]

පඤ්ඤින්ද්‍රිය මූලියෙහි "සහේතුකානං ඤාණ විප්පයුත්තානං (විරියෙන විනාඤාණෙන) උපපජ්ජන්තානං" [විභංගය සෙර සේ සමානව කියනු.] අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** මහාවිපාක ඥානවිප්‍රයුක්ත ප්‍රතිසන්ධි සිත් (4) සිවුදෙනාගේ උත්පාදක්ෂණ සමංගි වූ ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සත. ප්‍රවෘත්ති කාලයෙහි අකුශල් සිත් (12) දෙළස, මනෝද්වාරාවර්ජනය, හසිතෝත්පාදය හා ඤාණවිප්‍රයුක්ත කාම සෝභන සිත් (12) දෙළොස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගි වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා හා ඵලසථ ආයය්‍ පුද්ගලයන් (4) සිවු දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවොකාර (26) සවිසි භූමිය ගනු ලැබේ.සංසය පද ස්වරූපාර්ථ පෙර සේ කියනු. ප්‍රත්‍යනිකය ද සමානයි.

**මනින්ද්‍රිය මූලියෙහි** අනුලෝම— ආමන්තා. ප්‍රතිලෝමයෙහි "සචිත්තකානං අහේතුකානං (විනා විරියෙන) උපපජ්ජන්තානං පවත්තෙ විරියසම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, සහේතුකානං (විරියෙන) උපපජ්ජන්තානං පවත්තෙ විරියසම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ," ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අහේතුක ප්‍රතිසන්ධි (2) දෙසිතෙහි උත්පාදක්ෂණ සමංගිවූ දුගති සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමභූමි (6) සය, ප්‍රවෘත්ති කාලයෙහි විරිය නොයෙදෙන (16) සොළොස් චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවුදෙනා හා ඵලසථ ආයය්‍ පුද්ගලයන් (4) සිවුදෙනාගේ පඤ්චවෝකාර (26) සවිසි භූමිය ගනු ලැබේ.

සහේතුක ප්‍රතිසන්ධි (17) සතළොස් චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලසථ ආයය්‍ පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර (4) සිවු භූමිය, අපාය වර්ජිත පඤ්චවෝකාර (22) දෙවිසි භූමිය, ප්‍රවෘත්ති කාලයෙහි විරිය යෙදෙන (73) තෙසැත්තෑ චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවුදෙනා හා, ආයය්‍ පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර (4) සිවු භූමිය හා පඤ්චවෝකාර (26) සවිසි භූමිය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. ප්‍රත්‍යනිකයෙහි ද ක්‍රමය සමානයි.

විරියින්ද්‍රිය මූලය නිමි.

---

## සෞමාධීන්ද්‍රිය මූලය

සමාධින්ද්‍රිය මූලය ද වීරියින්ද්‍රිය මූලයට සමානය. අනුලෝමයෙහි **විචිකිච්ඡා සහගත** චිත්තය අත්හැරීම පමණක් ම විශේෂයි.

## පඤ්ඤින්ද්‍රිය මූලය

**පඤ්ඤින්ද්‍රිය මූල මනින්ද්‍රිය මූලියෙහි**—අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි "සචිත්තකානං ඤාණවිප්පයුත්තානං උපපජ්ජන්තානං, පවත්තෙ ඤාණ විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, ඤාණ සම්පයුත්තානං උපපජ්ජන්තානං පවත්තෙ ඤාණ සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ," ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – අහේතුක ප්‍රතිසන්ධි (2) දෙසිතෙහි හා මහා විපාක ඥානවිප්‍රයුක්ත ප්‍රතිසන්ධි (4) සතරෙහි උත්පාදක්ෂණ සමංගී වූ දුගති අහේතුක, සුගති අහේතුක, ද්විහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ කාමභූමි (11) එකොළස, ප්‍රවෘත්ති කාලයෙහි අකුශල් සිත් (12) දොළස අහේතුක සිත් (18) දහ අට හා ඥාන විප්‍රයුක්ත කාම සෝභන සිත් (12) දොළොස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සිවුදෙනා හා ඵලසථ ආයථ පුද්ගලයන් (4) සිවු දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර (26) යවිසි භූමිය ලැබෙ. ත්‍රිහේතුක ප්‍රතිසන්ධි (13) තෙළෙස් චිත්තයන්ගේ—පෙ—(පෙර සේ උදුරනු) ප්‍රත්‍යනිකයෙහි ද නය ක්‍රමය සමානය වර්තමාන වාරය නිමි.

---

## අතීත වාරය

වර්තමාන වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව අතීත වාරය වදළ සේක. (ව්‍යවස්ථාපනය පෙරසේ කියනු.) "යස්ස චක්ඛුන්ද්‍රියං උප්පජ්ජිත්ථ' තස්ස ඝානින්ද්‍රියං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන**—ආමන්තා," අනු ලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**—සියලු උපදින—චුතවන පෘථග්ජන (4) සිවුදෙනා හා ඵලසථ ආයථ පුදගලයන් (4) සිවුදෙනා ලැබෙති. **සංසයට** ද එසේය. ප්‍රතිලෝමයෙහි ද ඒ හා සමානය, (පුරිසින්ද්‍රිය මූලය දක්වාම මෙසේය පතිවචන පිළිතුර මැයි, ස්වරූපාර්ථ වෙනසක් ද නැත.)

"**යස්ස ජීවිතින්ද්‍රියං** උප්පජ්ජිත්ථ, තස්ස සොමනස්සින්ද්‍රියං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන**–ආමන්තා," අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සියලු පෘථග්ජනයෝ ද — ආයථ පුද්ගලයන් (8) අට දෙනා ද ලැබෙති. **සංසයට** ද එසේය. ප්‍රතිලෝමයෙහි ද සමානය, **පඤ්ඤින්ද්‍රිය** මූලය දක්වා සමානය. **පුතිවචන** පිළිතුර මය, පුද්ගල වාරය නිමි. (ඕකාශ වාරය සුගමයි.)

# පුද්ගලෝකාශ වාරය

## චක්ඛුන්ද්‍රිය මූලය

" යස්ස යත්ථ චක්ඛුන්ද්‍රියං උප්පජ්ජිත්ථ තස්ස තත්ථ ඉත්ථින්ද්‍රියං උප්පජ්ජිත්ථාති, රූපාවචරානං තෙසං තත්ථ, කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**—ආමන්තා," අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** රූපාවචර භූමියෙහි උපදින—චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා ඵල**සථ** ආයඞ් පුද්ගලයන් (4) සිවු දෙනාගේ වෙහප්ඵල භූමිය දක්වා රූපභූමි (10) දශය ලැබෙති. කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනා ගේ හා ඵලසථ ආයඞ් පුද්ගලයන් (4) සතර දෙනාගේ කාමභූමි (11) එකොළාස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** " සුද්ධාවාසානං අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ," සුද්ධාවාසයෙහි උපදින චුතවන අනාගාමි ඵලසථ, අර්හත් ඵලසථ ආයඞ් පුද්ගලයන්ගේ පඤ්චසුද්ධාවාස භූමිය, අසංඥසත්ව පුද්ගලයන්ගේ අසංඥ තල භූමිය, අරූප භූමියෙහි උපදින චුතවන පුද්ගලයන්ගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. (පුරිසිද්‍රිත්‍ය සම්බන්ධ කොට කීමේ දී ද මේ හා සමානය.)

**ජීවිතේන්ද්‍රිය මූලියෙහි** - අනුලෝම - ආමන්තා, ප්‍රතිලෝමයෙහි "**අසඤ්ඤ**සත්තානං අරූපානං, තෙසං තත්ථ, **පඤ්ච**වෝකාරානං තෙසං තත්ථ," ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අසංඥතල භූමියෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය. අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන හා ඵලසථ ආයඞ් පුද්ගලයන් (4) සිවු දෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. පඤ්චවෝකාර භූමියෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනා හා ඵලසථ (4) සිවුදෙනාගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙරසේ ලැබේ. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** " සුද්ධාවාසානං තෙසං තත්ථ".

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** " **යස්ස යත්ථ** චක්ඛුන්ද්‍රියං උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ සොමනස්සින්ද්‍රියං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන යත්ථ**—ආමන්තා," අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**—පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනා හා ඵල**සථ** (4) සිවුදෙනාගේ සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර (21) එක්විසි භූමිය ගනු ලැබේ. සංසයට ද එසේය. (පාලියෙහි ඇති සේ **කියනු**.)

**පරමාර්ථ වශයෙන් ස්වරූප උද්ධරන්නේ නම් මෙසේය.** අපායෙහි උපදින චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපායභූමි (4) සතර හා

වේහප්ඵලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන හා **එලසථ** (4) සිවුදෙනාගේ වේහප්ඵල භූමිය ගනු ලැබේ. **පඤ්චවෝකාරයෙහි** උපදින චුතවන ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලසථ (4) සිවු දෙනාගේ කාමසුගති භූමි (7) සත සුභකිණ්හකය දක්වා රූපභූමි (9) නවය ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනිකයෙහි**— ආමන්තා, ස්වරූප වශයෙන් සුද්ධාවාස, අසඤ්ඤසත්ව, අරූප භූමි උදුරනු.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි**—අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි "අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරනං තෙසං තත්ථ," අනුලෝමයෙහි **සන්නිට්ඨාන සවරූපාර්ථ**—පාලියෙහි ඇති පරිදි සුද්ධාවාස අනහැර පෙර සේ උදුරනු. **ලැබිය යුතු පරමාර්ථ වශයෙන් මෙසේය.** රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ඵලස්ථ (4) සිවු දෙනාගේ සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය ලැබෙති. පඤ්චවෝකාරයෙහි උපදින— චුතවන පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ඵලස්ථ (4) සිවු දෙනාගේ කාම භූමි (11) එකොළස හා වේහප්ඵල භූමිය ද ගනු ලැබේ. **සංසය සවරූපාර්ථ** පෙර සේ ලැබේ. ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අරූප භූමියෙහි උපදින—චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ඵලස්ථ (4) සිවු දෙනා ගේ අරූප භූමි (4) සතර ලැබෙති. **පෙර කියන ලද සංසය ස්වරූප ද** ගනු ලැබෙති. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** සුද්ධාවාසානං, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ."

**සද්ධින්ද්‍රිය මූලියෙහි**—අනුලෝම—ආමන්තා, ප්‍රතිලෝමයෙහි "අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ, "අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**—අපායෙහි උපදින චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතර ගනු ලැබෙති. පඤ්චවෝකාරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලසථ ආයඞ පුද්ගලයන් (4) සතර දෙනාගේ කාමසුගතිභූමි (7) සත ද වේහප්ඵලය තෙක් රූප භූමි (10) දශය ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබෙති. ප්‍රතිලෝම-යෙහි අරූප භූමිය උදුරනු. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** "සුද්ධාවාසානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ"' (පෙර සේ උදුරනු, නය ක්‍රමය **පඤ්ඤි**න්ද්‍රිය දක්වා ම සමානය.)

## සංනින්ද්‍රිය මූලය

"**යස්ස යත්ථ** සානින්ද්‍රියං උප්පජ්ජිත්ථ, තස්ස තත්ථ ඉත්ථින්ද්‍රියං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන යත්ථ** ආමන්තා," අනුලෝමයෙහි ස්වරූපාර්ථ, කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා එලසථ

ආයඞ්‍ පුද්ගලයන් (4) සතර දෙනාගේ කාමභූමි (11) එකොළස ගනු ලැබෙති. ප්‍රත්‍යනිකයෙහි "ආමන්තා" ස්වරූපාර්ථ, රූපාවචර, අරූපාවචර භූමි උදුරනු.

**ජීවිතේන්ද්‍රිය මූලියෙහි**— ධම්මායතනය මෙන් උදුරනු **සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** අනුලෝම ආමන්තා, ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං තෙසං තත්ථ," අනුලෝම **සන්නිට්ඨාන — ස්වරූපාර්ථ** — අපායෙහි උපදින චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතර ගනු ලැබෙති. කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලසථ ආයඞ්‍ පුද්ගලයන් (4) සිවු දෙනාගේ කාමසුගති භූමි (7) සත ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සංනිට්ඨාන ස්වරූපාර්ථ** —රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයාගේ හා එලසථ ආයඞ්‍ පුද්ගලයන් (4) සිවුදෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ගනු ලැබෙති. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ," වෙහප්ඵලයෙහි හා සුද්ධාවාසයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලසථ ආයඞ්‍ පුද්ගලයන් (4) සතර දෙනාගේ වෙහප්ඵලය හා සුද්ධාවාස භූමි (5) පසය, අසංඥතල— අරූතලයන්හි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලසථ ආයඞ්‍ පුද්ගලයන් (4) සිවු දෙනාගේ අසංඥතල භූමිය හා අරූප භූමි (4) සතර ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** අනුලෝම, ආමන්තා, ප්‍රතිලෝමයෙහි "රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කාමාවචරානං තෙසං තත්ථ," ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලසථ ආයඞ්‍ පුද්ගලයන් (4) සිවු දෙනාගේ වෙහප්ඵලය හා අරූපභූමි (4) සතර ගනු ලැබෙති. කාමාවචරයෙහි උපදින චුතවන පුද්ගලයන් හා භූමි ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ**— "සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ", රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලසථ ආයඞ්‍ පුද්ගලයන් (4) සිවු දෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය, සුද්ධාවාස භූමි (5) පස, අසංඥතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

(සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ගැන පෙළෙහි නැත. ලැබියයුතු බැවින් උදුරන ලදී. සදදින්ද්‍රිය මූලි යනාදියෙහි අපාය භූමිය ඇතුලත් කොට කියනු. මනින්ද්‍රිය වනාහි මනායතනයට සමානය. ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය

දක්වා සානින්ද්‍රියමූල හා සමානය. මේ වනාහි චුති ප්‍රතිසන්ධියෙහි කියනු ලැබේ. ජීවිතේන්ද්‍රිය මූලයේ පටන් පඤ්ඤින්ද්‍රිය මූලය දක්වා ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති චුති තුනම කියනු ලැබෙති.)

## ජීවිතේන්ද්‍රිය මූලය

**ජීවිතේන්ද්‍රිය මූල සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** ''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවෝකාරානං තෙසං තත්ථ,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගය නම් වූ නියත දුතිය චිත්තය, ඒ සිත සමග සෝමනස්සින්ද්‍රිය පහළ වූ කෙනෙක් පෙර එහි නොවූ බැවින් ඒ හා සමාන දුතිය චිත්තය නම් වූ ද්විතීය භවංගයේ පටන් ප්‍රථමයෙන් ම පහළවන සොමනස්ස සහගත ප්‍රථම ජවනය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ **ක්ෂණත්‍රය** සමංගී වූ අනාගාමී **ඵලසථ** ආයඹ් පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස හා අසංඥසත්වයන්ගේ අසංඥතල භූමිය ද ගනු ලැබේ.

ශුද්ධාවාසය වෙ නම්, ප්‍රථම සෝමනස්ස සහගත ද්විතීය ජවනයේ පටන් චුතිය දක්වාද, අවශෙෂ චතුවෝකාර පඤ්චවෝකාර භූමිය වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සිවු දෙනාගේ හා ආයඹ් පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝ-කාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනික සංයය ස්වරූපාර්ථ**—''සුද්ධාවාසානං උප-පජ්ජන්තානං තෙසං තත්ථ,'' රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිත් (1) එකය චෛතසික (30) තිසය, මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලසථ ආයඹ් පුද්ගලයන්ගේ ශුද්ධාවාස භූමි (5) පස ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය** මූලීයෙහි ''අසඤ්ඤසත්තානං තෙසංතත්ථ චතුවෝකාරානං තෙසං තත්ථ, යස්ස **වාපන යත්ථ**—ආමන්තා,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**—අසංඥසත්වයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ. ශුද්ධාවාසය වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා ද, අවශේෂ චතුවෝකාර පඤ්චවෝකාර භූමියක් වෙ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ හා ආයඹ් පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** සුද්ධාවාසානං උපපත්ති-චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ''' පෙර සේ ස්වරූප උදුරනු. (මනින්ද්‍රිය මූලිය මෙනි. සමාන මැයි )

**සෝමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** — අනුලෝම ''ආමන්තා'', ප්‍රතිලෝමයෙහි ''සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ,'' (ජීවිතේන්ද්‍රිය මූලය මෙන් උදුරනු අසංඥතලය ඇතුලත් නො වීම ම වෙනසි' මනින්ද්‍රිය මූලිය සෙක් නය ක්‍රමය සමානය.) **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ,'' (උපෙක්ඛින්ද්‍රිය **මූලයේ** පටන් පඤ්ඤින්ද්‍රිය මූලය දක්වා 'ආමන්තා' පිළිතුරම ලැබේ. රූපාවචර ප්‍රතිසන්ධිය වෙත් කොට ස්වරූප උදුරනු.)

අතීත වාරය නිමි

---

# අනාගත පුද්ගලවාර චක්ඛු මූලය

අනාගත වාරයෙහි චක්ඛු මූල සොතමූලි, ඝාන—ජිව්හා— කාය මූලි වාරයන් ආයතන යමකයෙහි මෙන් කියනු. ''**යස්ස** චක්ඛුන්ද්‍රියං උප්පජ්ජිස්සති, තස්ස ඉත්ථින්ද්‍රියං උප්පජ්ජිස්සතීති. යෙ රූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි **භවෙ** දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති, තෙසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන**—ආමන්තා'' [දස්සෙත්වා — යී පෙළෙහි ඇත. දයෙත්වා—යි ගුරුවරු උගන්වති.] යෙච පුරිසා, — යම් පුරුෂ කෙනෙක්, එතෙනෙව භාවෙන, — ඒ පුරුෂාත්මභාවයෙන් ම, කතිචි භවෙ,— ආත්මභාව කිහිපයක්,—දස්සෙත්වා,— උත්පත්ති වශයෙන් දක්වා, පරිනිබ්බායිස්සන්ති,— පිරිනිවෙන්නාහු ද,.

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – යෙ රූපාවචරං— යන්න ආයතන මෙන් උදුරනු. පුරුෂාත්මභාවයෙන් ආත්මභාව එකක් දෙකක් ආදි වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චූතවන පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනාය. යට ඵලස්ථ ආයු පුද්ගලයන් (2) දෙදෙනා සහ රූපාවචර අරූපාවචරයෙහි උපදින චූතවන සුගති අහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. චක්ඛුන්ද්‍රිය ඉත්ථින්ද්‍රිය දෙකම උපදින්නා වූ කාමාවචරයෙහි උපදින චූතවන පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනා ද යට ඵලස්ථ ආයු පුද්ගලයන් (2) දෙදෙනා ද, රූපාවචර අරූපාවචරයෙහි උපදින චූතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රත්‍යනීක සංසය **ස්වරූපාර්ථ**—'' පච්ඡිම භවිකානං' යෙ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං'' [ආයතන යමකය මෙන් පෙර සේ කියනු. පුරිසින්ද්‍රිය ද මෙයට සමානය, ජීවිතේන්ද්‍රිය ද ධම්මායතනය මෙනි.]

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** "යෙ සචක්ඛුකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං, **යස්සවා පන**—ආමන්තා," අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — මහා විපාක තෘතීය යුගලයෙන් හා රූපාවචර පඤ්චම ධ්‍යාන විපාක චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින-චුතවන පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා හා, අසංඥතල, අරූතලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. චක්ඛුන්ද්‍රිය සෝමනස්සින්ද්‍රිය දෙකම මතු පහළ වන්නා වූ පඤ්ච වෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ද, යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා ද අසංඥතල — අරූතලයෙහි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක** සංසය ඉත්ථින්ද්‍රිය මූලිය මෙනි.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** "යෙ සචක්ඛුකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං **යස්ස වා පන** යෙ අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං"' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**— මහා විපාක ප්‍රථම යුගලයෙන් හා රූපාවචර සෝමනස්ස සහගත විපාක සිත් (4) සතරෙන් පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන පුද්ගලයන් (4) සතර දෙනා ය. යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා හා අසංඥතල—අරූතලයෙහි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති, චක්ඛුන්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය දෙකම මතු පහළවන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ද, යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා ද, අසංඥතල අරූතලයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමය පෙර සේ කියනු. **ප්‍රත්‍යනීකයෙහි** — "පච්ඡිම-භවිකානං තෙසං," [සද්ධින්ද්‍රිය පටන් මනින්ද්‍රිය මූලිය දක්වා චක්ඛායතනය මෙන් කියනු.]

චක්ඛුන්ද්‍රිය මූලය නිමි.

---

## ඝාණින්ද්‍රිය මූලය

**ඝාණින්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි** "යෙ පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන**—ආමන්තා," අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — පුරුෂාත්මභාවයෙන් ආත්ම එකක් දෙකක් යනාදී වශයෙන් ඉපදී පිරිනිවීමට නියත වූ කාමාවචර යෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ය. යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනා හා රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති

අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ඝානින්ද්‍රිය ඉත්ථින්ද්‍රිය දෙකම මතු ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) හතර දෙනා ද යට එලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනා ද, රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය සවරූප පෙර සේ ලැබේ, **ප්‍රත්‍යනිකයෙහි** ''පච්ඡිම භවිකානං, යෙච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං,'' (පෙර සේ කියනු) [පුරිසින්ද්‍රිය මූලියෙහි ද ක්‍රමය සමානය, පද මාරුකොට කීම පමණක් වෙනසි. ජීවිතේන්ද්‍රියෙහි ද ධම්මායතනය මෙනි.]

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** ''යෙ සඤානකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං යස්ස වා පන යෙ රූපාවචරං —පෙ—'' අනුලෝම **සන්නිවධ්‍යාන ස්වරූපාර්ථ** — මහා විපාක තෘතීය යුගලයෙන් පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය. යට එලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනා හා රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති. ඝානින්ද්‍රිය සෞමනස්සින්ද්‍රිය දෙකම මතු ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ද, යට එලසථ ආයථ පුද්ගලයන් දෙදෙනා ද, රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම **සන්නිවධ්‍යාන ස්වරූපාර්ථ** — කාම සුගති භූමි (7) සතෙන් චුතව **සුභකිණ්හකය** තෙක් රූප භූමි (9) නවයෙහි ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින — චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට එලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය, වේහප්ඵලයෙන් චුතව සුභකිණ්හකය තෙක් රූපාවචර භූමි (9) නවයෙහි ඔබ්ඃනාබ ඉපදී පිරිනිවීමට නියත වූ වේහප්ඵලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. සුභකිණ්හකය තෙක් රූපාවචර භූමි (9) නවයෙහි ඔබ්බෙනාබ ඉපදී පිරිනිවීමට නියත වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන් හා යට එලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙන ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර කී සංසය මැයි.

**ප්‍රත්‍යනිකයෙහි** ''පච්ඡිම භවිකානං, යේ ච අරූපං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං,'' පශ්චිම භවික පුද්ගලයෝය, කාමසුගති භූමි (7) සතෙන් හා **සුභකිණ්හකය** දක්වා රූපභූමි (9) නවයෙන් චුතව වේහප්ඵලය හා පඤ්ච **සුද්ධාවාසයට** පැමිණ පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන **ත්‍රිහේතුක** පෘථග්ජනයෝය. යට එලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාය.

වෙහප්ඵල සුද්ධාවාස භූමින්හි ඔබ්බෙනොබ ඉපද පිරිනිවීමට නියත වූ වෙහප්ඵල සුද්ධාවාස භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට එලසඵ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය. [අරූප භූමියෙහි ඉපද පිරිනිවීමට නියත වූවන් වනාහි පෙර සේ උදුරනු.]

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** '' යෙ සසානකා සොමනස්සේන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන** යෙ රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, '' අනුලෝමයෙහි **සංනිවඨාන ස්වරූපාර්ථ** මහා විපාක ප්‍රථම යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය, යට එලසඵ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය, රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ඝානින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය දෙක මතු ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනා ද, යට එලසඵ ආඞ පුද්ගලයන් (2) දෙදෙනා ද, රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිවඨාන ස්වරූපාර්ථ** — කාමසුගති භූමි (7) සතෙන් හා සුභකිණ්හකය දක්වා රූපභූමි (9) නවයෙන් චුතව වෙහප්ඵල — පඤ්චශුද්ධාවාස යෙහි ඉපද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින — චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට එලසඵ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, වෙහප්ඵල සුද්ධාවාස භූමියෙහි ඔබ්බෙනොබ ඉපද පිරිනිවීමට නියත වූ වෙහප්ඵල සුද්ධාවාස භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට එලසඵ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය. [අරූප භූමිය ගැන පෙර සේ කියනු.]

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''පච්ඡිම භවිකානං තෙසං'' **පශ්චිම** භවික පුද්ගලයෝය. කාමසුගති භූමි (7) සතෙන් චුතව සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයට පැමිණ පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට එලසඵ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, වෙහප්ඵල තලයෙන් චුතව සුභකිණ්හක තලය දක්වා රූපභූමි (9) නවයට පැමිණ පිරිනිවීමට නියත වූ වෙහප්ඵලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝය. සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි ඔබ්බෙනොබ ඉපද පිරිනිවීමට නියත වූ රූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට එලසඵ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [සද්ධින්ද්‍රිය පටන් මනින්ද්‍රිය මූලිය තෙක් මනායතනය මෙන් කියන්න.]

ඝානින්ද්‍රිය මූලය නිමි.

# ඉත්ථින්ද්‍රිය මූලය

**ඉත්ථින්ද්‍රිය මූල පුරිසින්ද්‍රිය මූලියෙහි** "යා ඉත්ථියො එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තාසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන** — යෙ පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං, "අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — ස්ත්‍රී භාවයෙන් ආත්මභාව එකක් දෙකක් ආදී වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනා. යට ඵලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනා හා රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය දෙක මතු ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ද, යට ඵලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනා ද රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනා, යට ඵලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනා හා රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. පෙර කියන ලද සංසය ද ගනු ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "පච්ඡිම භවිකානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං," (ඝානින්ද්‍රිය ප්‍රත්‍යනීකය සේ උදුරනු.)

**ඉත්ථින්ද්‍රියමූල ජීවිතේන්ද්‍රිය මූලියෙහි**, අනුලෝම "ආමන්තා", ප්‍රතිලෝමයෙහි "යෙ රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං" [යෙ රූපාවචරං යනාදිය පෙර සේ උදුරනු.] යෙ ච පුරිසා – යනාදිය ද පෙර සේ කියනු **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "පච්ඡිමභවිකානං තෙසං" යනුයි.

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** "යා ඉත්ථියො එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තාසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන** — යෙ රූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, "

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — ස්ත්‍රීභාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපද මහාවිපාක තෘතිය යුගලයෙන් පිරිනිවීමට නියත වූ කාමභූමියෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනා හා යට එලසථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා හා රූප — අරූප තලයන්හි උපදින — චුතවන සුගති අහේතුක — ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ඉත්ථින්ද්‍රිය— සෝමනස්සින්ද්‍රිය දෙකම ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනා ද යට ඵලසථ (2) දෙදෙනා ද රූපාරූප භූමියෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ගනු ලැබේ.

ප්‍රතිලෝමයෙහි යෙ රූපාවචරං — යනාදිය ඝානින්ද්‍රිය මෙන් උදුරනු. පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපිද මහාවිපාක ප්‍රථම යුගලයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ කාමභූමියෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනා, යට ඵලසථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා හා රූපා රූප භූමින්හි උපදින චුතවන සුගති අහේතුක — ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. **ඉහත සංසය ස්වරූප ද** ගනු ලැබේ.

ප්‍රත්‍යනීක සංසය ස්වරූප — ''පච්ඡිම භවිකානං, යෙච අරූපං — පෙ — යෙච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, '' [පච්ඡිම භවිකානං, යෙ ච අරූපං — යන්න ඝානින්ද්‍රිය මෙන් උදුරනු.] පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපද මහාවිපාකසිත් තෘතිය යුගලයාගේ වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය, යට ඵලසථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා හා රූපා රූප භවයන්හි උපදින චුතවන සුගති අහේතුක — ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** — ''**යා** ඉත්ථියො එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා සෝමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තාසං, ඉතිරෙසං තෙසං, **යස්ස වා පන**, යෙ රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති යෙ ච පුරිසා එතෙනෙව භාවෙන — පෙ — තෙසං '' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — ස්ත්‍රී භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන්, මහාවිපාක සිත් ප්‍රථම යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාම භූමියෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනා, යට ඵලසථ ආඞ් පුද්ගලයන් (2) දෙදෙනා හා රූපාවචර — අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ඉත්ථින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය දෙකම මතු ලැබෙන්නා වූ කාමාවචරයෙහි උදිපන චුතවන පෘථග්ජන (4) සිවු

දෙනා ද, එලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනා ද රූපාරූප භවයන්හි චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** [යෙ රූපාවචරං අරූපාවචරං — යන්න ඝානින්ද්‍රියට මෙන් උදුරනු.] පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපද මහාවිපාක තෘතිය යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා, යට එලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනා හා රූපාරූප භවයෙහි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. ඉහත **සංසය ස්වරූප ද** ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''පච්ඡිම භවිකානං, යෙ ච පුරිසා — පෙ — සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං,'' (පච්ඡිම භවිකානං යන්න පෙර සේ උදුරනු.) පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපද මහාවිපාක ප්‍රථම යුගලයාගේ වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාය, යට එලසථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනා හා රූපාරූප භවයන්හි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. [සද්ධින්ද්‍රිය ආදිකොට ඇති වාරයෝ ජීවිතින්ද්‍රිය මූලියට සමානය. පුරිසින්ද්‍රිය මූලයද ඉත්ථින්ද්‍රිය හා සමානය. යෙ පුරිසා යනුවෙන් මාරුකොට කීම පමණක්ම විශේෂයි.]

## ජීවිතේන්ද්‍රිය මූලය.

**ජීවිතේන්ද්‍රිය මූලයෙහි** ''යස්ස ජීවිතින්ද්‍රියං උප්පජ්ජිස්සති, තස්ස සොමනස්සින්ද්‍රියං උප්පජ්ජිස්සතීති, යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං, ඉතරෙසං තෙසං යස්සවා පන ආමන්තා'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** මහාවිපාක සිත් තෘතිය යුගලය හා මහග්ගත විපාක උපෙක්ඛා සහගත (5) පස් දෙනා ගේ වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම වූ සොමනස්ස සහගත චිත්තයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් හා ආයඞ පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. සොමස්ය සහගත චිත්තයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ කෙනෙක් වේනම්, අනාදිමත් සංසාරයෙහි පටන් එන පශ්චිම චිත්තයාගේ පූර්වාන්තර චිත්තය දක්වා ද, උපේක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අනාදිමත් සංසාරයෙහි පටන් එන අන්තිම සෝමනස්ස සහගත චිත්තයට පූර්ව අනන්තර චිත්තය දක්වාද

භව්‍ය පෘථග්ජන හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ද, මාර්ග නොලබන අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙත්. **සංසය සවරූප** පෙර සේ ගනු ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූප** "පච්ඡිම චිත්ත සමංගීනං තෙසං" ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය යන මේ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** "යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං, ඉතරෙසං තෙසං, **යස්ස වා පන ආමන්තා**" "යස්ස චිත්තස්ස, — අවසාන වූ යම් උපෙක්ෂා සහගත චිත්තයකට, අනන්තරා— අනතුරුව; අනුලෝම **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ සෝමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම උපෙක්ෂා සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අනාදිමත් සංසාරයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සෝමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් අනාදිමත් සංසාරයේ පටන් අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද භව්‍ය පෘථග්ජනයෝ ද ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ද, මාර්ග ඵල නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූප** "පච්ඡිම චිත්ත සමංගීනං තෙසං"

[අවසාන උපෙක්ෂා සහගත චිත්තයේ පටන්, යයි සවරූප ගත් තැන්හි රහතන් වහන්සේම ගතයුතු වෙති. කුමක් හෙයින් ද යත්, සියලුම චිත්ත වීථි ආවර්ජනා වෙන් තොරව නොලැබෙන බැවිනි. ඒ වචනය සත්‍යයකි. මරණාසන්න වීථියෙහි ජවන — තදාරම්මණයන් සෝමනස්ස සහගත වන නමුත් මනෝද්වාරාවර්ජනය උපෙක්ෂා සහගතම වන බැවින් අවසාන උපෙක්ෂා සහගත සිත ඇත. ජවන තදාරම්මණ සිත් ද උපෙක්ෂා සහගත වෙත් නම් පඤ්චම ජවන—දෙවැනි තදාරම්මණයෝ උපෙක්ෂා සහගත වෙති. එනිසා රහතන් වහන්සේම ගනු ලැබෙති. සෝමනස්සින්ද්‍රිය මූලියෙහි අවසාන සෝමනස්ස සහගත චිත්තයේ පටන් — සවරූප ඉදිරිමේ දී භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන් ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. මෙහි දී කුමක් හෙයින් ත්‍රිහේතුක පෘථග්ජනයන් හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙත් ද, යත් උපෙක්ෂා සහගත චිත්තයෙන් ප්‍රතිසන්ධි ගන්නා වූ පුද්ගලයන්ට පිරිනිවීමට සමීප කාලයේ දී සෝමනස්ස සහගත ජවන තදාරම්මණ පහළ නොවී අන්තිම මාර්ග වීථි ඵලවීථි—මරණාසන්න වීථි ආදිය උපෙක්ෂා සහගත වද පහළවන බැවිනි. මෙසේ ලැබීමට සුදුසු වූ ද නොවූ ද චිත්තයන් අනුව නුවණින් කල්පනා කොට තේරුම් කරගත යුතුය.]

**සද්ධින්ද්‍රිය ආදි මූලියෙහි**—ආමන්නා—යනුම වේ.

පශ්චිම චිත්තය හැර සියලුම චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනා හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ලැබෙති. (නවත් ක්‍රමයකි). අනාදිමත් සංසාරයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා භව්‍ය පෘථග්ජන. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා හා මාර්ගඵල නොලබන අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. (අන් ක්‍රමයකි) අනාදිමත් සංසාර යෙහි පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා භව්‍ය පෘථග්ජන ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා හා මාර්ග ඵල ලබන භව්‍ය පෘථග්ජන පුද්ගලයෝද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීකය**-"ආමන්තා," **ස්වරූපාර්ථ** ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස, චෛතසික (35) පන්තිස. මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති.

## සොමනස්සින්ද්‍රිය මූලය

**සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි යස්ස** "චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උපපජ්ජිස්සති තෙසං, ඉතරෙසං තෙසං **යස්ස වා පන** — සස්ස චිත්තස්ස අනන්තරාඋපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං, " යස්ස චිත්තස්ස, — අවසාන යම් සොමනස්ස සහගත චිත්තයකගේ. "

අනුලෝම **සංනිට්ඨාන ස්වරූපාර්ථ** — සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන උපෙක්ෂා සහගත චිත්ත යාගේ පටන් පශ්චිම චිත්තයට පූර්වාන්තර චිත්තය දක්වා අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. සෝමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේනම්, අනාදිමත් සංසාරයෙහි පටන් පැමිණි අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයෙහි පූර්වානන්තර චිත්තය දක්වාද, උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙකු වේ නම්, අනාදිමත් සංසාරයේ පටන් එන අවසාන සොමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා වූ භව්‍ය පෘථග්ජනයෝ ද, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) දෙනා ද, මාර්ග ඵල නොලබන්නා වූ අභව්‍ය පෘථග්ජනයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙරසේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් අන්තිම වූ සෝමනස්ස සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයා ගේ පූර්ව අනන්තර චිත්තය දක්වා භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන් සහ ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ගනු ලැබෙති. **උභත සංසය** ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** — "පච්ඡිම චිත්තසමඞ්ගීනං තෙසං," [සෝමනස්සින්ද්‍රිය හා සද්ධින්ද්‍රිය මූලි යනාදිය ද, උපෙක්ඛින්ද්‍රිය හා සද්ධින්ද්‍රිය මූලි යනාදිය ද ජීවිතේන්ද්‍රිය මූලයට සමානය, සද්ධින්ද්‍රිය මූලාදිය ද ජීවිතේන්ද්‍රිය මූලයට සමානය.] පුද්ගල වාරය නිමි, (ඔකාස වාරය සුගමයි).

## පුද්ගලෝකාස වාරය.

පුද්ගලෝකාස වාරයෙහි — චක්ඛුන්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි "රූපාවචරානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ** — ආමන්තා," අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ,** තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගේ වෙහප්ඵලය දක්වා රූපාවචර භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් ආදී වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සතය,

තමන් ඉපද සිටින භූමියෙහි චක්ඛුන්ද්‍රියම ලැබී ඉත්ථින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි චක්ඛුන්ද්‍රිය — ඉත්ථින්ද්‍රිය දෙකම ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබේ. සංසය ස්වරූප පෙරසේමය. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** " පඤ්චවොකාරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ, " [ආයතන මෙන් උදුරනු. පුරිසින්ද්‍රිය මූලිය ද සමානය මාරුකොට කියනු. ජීවිතේන්ද්‍රිය මූලිය ද ධම්මායතනයට සමානය.]

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** "යෙ සචක්ඛුකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ **යස්ස වාපන යත්ථ** — ආමන්තා, " අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක ඥානිය ද්වය. හා රූපාවචර පඤ්චමධ්‍යාන විපාක චිත්තයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා

යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ කාම සුගති භූමි (7) සතය, වෙහප්ඵල භූමිය, තමන් ඉපද සිටින භූමියෙහි චක්ඛුන්ද්‍රිය පමණක් ලැබී සොමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ **පඤ්චවෝකාරයෙහි** උපදින චුතවනපෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම භූමි (11) එකොළස හා වෙලප්ඵල භූමිය ගනු ලැබේ.

තමන් ඉපද සිටින භූමියෙහි චක්ඛුන්ද්‍රිය — සෝමනස්සින්ද්‍රිය දෙකම ලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන **සු**ගති අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සත ද සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබෙති. ප්‍රතිලෝමයෙහි **ඉහත සංසය** ම ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූප** '' පඤ්චවෝකාරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤ-සත්තානං , අරූපානං තෙසං තත්ථ, '' ( පෙර සේ උදුරනු. )

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** '' යෙ සචක්ඛුකා සෝමනස්සේන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** — අරූපානං තෙසං තත්ථ, '' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක ප්‍රථම යුගලය හා රූපාවචර සොමනස්ස සහගත විපාක සිත් (4) සතරෙන් ඉපිද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගේ කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපභූමි (9) නවය,

තමන් ඉපද සිටින භූමියෙහි චක්ඛුන්ද්‍රිය පමණක් ලබන උපෙක්ඛින්ද්‍රිය නොලබන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි දෙකම ලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළස ද වෙහප්ඵල භූමිය ද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ අරූප භූමි-යෙහි උපදින — චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. **පෙර කියන ලද සංසය ස්වරූප ද** ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** '' පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ''

**සද්ධින්ද්‍රිය මූලියෙහි** — අනුලෝම — ආමන්තා, ප්‍රතිලෝමයෙහි "අරූපානං තෙසං තත්ථ, පඤ්චවෝකාරානං තෙසං තත්ථ," අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ, අපායෙහි උපදින චුතවන දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි (4) සතර ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ පඤ්චවෝකාර යෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලසථ ආයථ පුද්ගලයන් (3) තිදෙනාගේ අපාය හා සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (17) සතළොස ද ගනු ලැබෙති **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

[ස්වරූප ලැබිය යුතු බැවින් උද්ධරන ලදී. පෙළෙහි නොමැති, අපාය ප්‍රතිසන්ධියේ ද ශ්‍රද්ධාව සම්ප්‍රයුක්තව නැති බැවින් වෙන්කොට ස්වරූප උද්ධරන ලදී. ප්‍රතිලෝමයෙහි ද පෙර සේ උද්ධරනු. විරියින්ද්‍රිය—සමාධින්ද්‍රිය—පඤ්ඤින්ද්‍රිය මූලයෝ ද මෙයට සමානය, මනින්ද්‍රිය මූලිය මනායතනයට සමානයි.]

## ඝානින්ද්‍රිය මූලය

**ඝානින්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි** "යෙ පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** — ආමන්තා," අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** — පුරුෂ භාවයෙන් ආත්මභාව එක — දෙක යනාදි වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලසථ ආයථ පුද්ගලයන් දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි ඝානින්ද්‍රිය පමණක් ලැබී, ඉත්ථින්ද්‍රිය නොලබන්නා වූ කාමාවචරයෙහි උපදින — චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලසථ ආයථ පුද්ගලයන් දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි ඝානින්ද්‍රිය ඉත්ථින්ද්‍රිය දෙකම ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලසථ ආයථ පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙරයේය **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** "කාමාවචරේ පච්ඡිම භවිකානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ," පුරිසින්ද්‍රිය මූලිය ද සමානය, ජීවිතේන්ද්‍රිය මූලිය ධම්මායතනය මෙනි.

**සොමනස්සින්ද්‍රිය මූලියෙහි** "යෙ සසානකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, රූපාවචරානං තෙසං තත්ථ." අනුලෝමයෙහි **සන්නිට්ඨාන**

**ස්වරූපාර්ථ** තමන් ඉපිද සිටින භූමියෙහි මහාවිපාක තෘතිය යුගලයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදිනා චුතවන සුගති අහේතුක ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට ඵලස්ථ (2) දෙදෙනාය යන මේ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සතය.

තමන් ඉපිද සිටින භූමියෙහි ඝ්‍රාණින්ද්‍රිය පමණක් ලැබී සෝමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ගනු ලැබෙති. තමන් ඉපිද සිටින භූමියෙහි ඝ්‍රාණින්ද්‍රිය සෝමනස්සින්ද්‍රිය යන දෙකම ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තමන් ඉපද සිටින භූමියෙහි මතු උපදින්නා වූ රූපාවචරයෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (3) තිදෙනාගේ සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය ගනු ලැබෙති. **යට කී සංසය ස්වරූප** ද ලැබෙති. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "පඤ්චවෝකාරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ,"

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** "යෙ සඝානකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ, " අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථය** තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක ප්‍රථම යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට ඵලස්ථ (2) දෙදෙනාය, තමන් ඉපද සිටින භූමියෙහි ඝ්‍රාණින්ද්‍රිය පමණක් ලැබී උපෙක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ (2) දෙදෙනාය යන මේ පුද්ගලයන්ගේ කාම සුගති භූමි (7) සත ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි ඝ්‍රාණින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය දෙකම ලැබෙන්නා වූ කාමාවරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයසී පුදගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථය** පෙර සේම ලැබෙති.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචර අරූපාවචරයෙහි උපදින-චුතවන ත්‍රිහේතුක පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (3) තිදෙනාගේ වේහප්ඵල භූමිය, අරූප

භූමි (4) සතර ලැබෙති. **පෙර කී සංසය ස්වරූප** ද ලැබෙති. ප්‍රත්‍යනික සංසය ''පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, (පච්ඡිම භවික ඒකාන්ත අනේකාන්ත කියනු.)

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ රූපාවචර – අරූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ ද යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ ද සුභකිණ්හ තලය තෙක් රූප භූමි (9) නවය, අසංඥ තලයෙහි උපදින චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලය ගනු ලැබේ. [සද්ධින්ද්‍රිය මූලියෙහි පටන් පඤ්ඤින්ද්‍රිය මූලිය දක්වා අපාය අඩුකොට ස්වරූප උදුරනු. මනින්ද්‍රිය මූලිය ද මනායතනය මෙනි.]

## ඉත්ථින්ද්‍රිය මූලය

**ඉත්ථින්ද්‍රිය මූල පුරිසින්ද්‍රිය මූලියෙහි** ''**යා** ඉත්ථියො එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තාසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා, පන යත්ථ** යෙ පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ,'' අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තමන් ඉපද සිටින භූමියෙහි ස්ත්‍රී භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදී වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය සමඞ්ගම ලැබී පුරිසින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු-දෙනාගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනාගේ කාම භූමි (11) එකොළස ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය දෙකම ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනාගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළොස ද ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබෙති. (ප්‍රතිලෝමයෙහි ද මේ සමානව ස්වරූප උදුරනු).

**ප්‍රත්‍යනිකයෙහි** ''කාමාවචරෙ පච්ඡිම භවිකානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ'' **ජීවිතේන්ද්‍රිය** මූලි අනුලෝමයෙහි ''ආමන්තා'' ප්‍රතිලෝමයෙහි ''රූපාවචරානං අරූපාවචරානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ'', (ස්වරූප සුගමයි, යට ක්‍රමය අනුව උදුරනු.)

**සොමනස්සින්ද්‍රිය මූලියෙහි** ''**යා** ඉත්ථියො එතෙනෙව භාවෙන උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තාසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** යෙ ච පුරිසා එතෙනෙව භාවෙන සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ.''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තමන් ඉපද සිටින භූමියෙහි ස්ත්‍රී භාවයෙන් ආත්මභාව එක දෙක ආදී වශයෙන් මහාවිපාක තෘතිය යුගලයෙන් ඉපද පිරිනිවෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ හා යට ආයඞ් ඵලස්ථ (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය පමණක්ම ලැබ සෝමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ආයඞ් ඵලස්ථ (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ද ගනු ලැබෙති. **සංසය ස්වරූප පෙර සේ මැයි**

**ප්‍රතිලෝමයෙහි** [රූපාවචරානං, යන්න ඝානින්ද්‍රිය මෙන් උද්ධරනු.] පුරුෂ භාවයෙන් ආත්මභාව එක දෙක යනාදී වශයෙන් මහා විපාක ප්‍රථම යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ, කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ආයඞ් ඵලස්ථ (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත, තමන් ඉපද සිටින භූමියෙහි සෝමනස්සින්ද්‍රිය පමණක්ම ලැබී ඉත්ථින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින - චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ආයඞ් ඵලස්ථ (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ගනු ලැබෙති. යට **සංසය** ද ලැබේ. **ප්‍රත්‍යනීක සංසය** ස්වරූපාර්ථ "පඤ්චවෝකාරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං, අරූපානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, තෙසං තත්ථ," (ස්වරූප ඉදිරිම පහසුය, ඝානින්ද්‍රිය, ආශ්‍රය කොට උද්ධරනු.)

**උපෙක්ඛින්ද්‍රිය** මූලියෙහි "යා ඉත්ථියෝ එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, තාසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්සවා පන යත්ථ** රූපාවචරානං අරූපාවචරානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ."

අනුලෝමයෙහි **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ, තමන් ඉපද සිටින භූමියෙහි ස්ත්‍රී භාවයෙන් ආත්මභාව එක දෙක ආදී වශයෙන්, මහාවිපාක ප්‍රථම යුගලයාගේ වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ ද යට ආයඞ් ඵලස්ථ (2) දෙදෙනාගේ ද කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය පමණක් ලැබී උපෙක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ ද යට ආයඞ් ඵලස්ථ (2) දෙදෙනාගේ ද කාම සුගති භූමි (7) සත ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යන දෙකම ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනාගේ ද යට ආයඞ් ඵලස්ථ (2) දෙදෙනාගේ ද කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. [**ප්‍රතිලෝමයෙහි** සානමූලය මෙනි. රූපාවචරානං අරූපාවචරානං යනුවෙන් උද්ධරනු. යෙ ච පුරිසා යනු ද පෙරසේ උද්ධරනු.] **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''පච්ඡිම භවිකානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ.'' පෙර සේ උද්ධරනු. [සද්ධින්ද්‍රියෙහි පටන් මනින්ද්‍රිය දක්වා සමාන මය. පුරිසින්ද්‍රිය මූලය ද ඉත්ථින්ද්‍රියට සමානව කියනු.]

## ජීවිතේන්ද්‍රිය මූලය

**ජීවිතේන්ද්‍රිය මූල සොමනස්සින්ද්‍රිය මූලියෙහි** ''**යස්ස** චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ. **යස්ස වා පන යත්ථ** ආමන්තා'' අනුලෝම **සන්නිට්ඨානයෙහි** උපේක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූයේ වේ නම්, අන්තිම වූ සෝමනස්ස සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ සහ ආයඞ් පුද්ගලයන් (8) අටදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය සුද්ධාවාස භූමි (5) පසය, තමන් ඉපද සිටිනා භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් යමෙක් උපෙක්ෂා සහගත චිත්තයෙන් චුතවන්නේ නම අන්තිම වූ සොමනස්ස සහගත චිත්තයාගේ පටන් චුතියට පූර්වාන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගි වූ භව්‍ය වූ ද- අභව්‍ය වූ ද පෘථග්ජන (4) සතර දෙනාගේ ද, යට මාර්ගස්ථ (3) තිදෙනාගේ ද යට ඵලස්ථ (3) තිදෙනාගේ ද, චතුවෝකාර භූමි (4) සතරය, කාමභූමි (11) එකොළසය, වෙහප්පඵල භූමිය, සුදස්සී තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය. අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන භූමි ගනු ලැබෙති.

සෝමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූයේ නම, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූයේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ සෝමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ ද ආයඞ් පුද්ගලයන් (8) අටදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතර, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් සොමනස්ස සහගත චිත්තයෙන් චුතවීමට නියත වූයේ වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, උපෙක්ෂා සහගත චිත්තයෙන් චුතවීමට නියත වූයේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ සෝමනස්ස සහගත චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ හා යට මාර්ගස්ථ (3) තිදෙනාගේ යට ඵලස්ථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨතල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ, යට මාර්ගස්ථ (3) තිදෙනාගේ, යට ඵලස්ථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. **යංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "පච්ඡිම චිත්ත සමඞ්ගීනං තෙසං තත්ථ" ස්වරූපාර්ථ - පශ්චිම චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී වූ අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතර, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. (අනෝකාන්තය පෙර සේ උද්ධරනු.) අසඤ්ඤසත්ව භූමියෙහි මතු නැවත නූපදින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන් ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

**උපේක්ඛින්ද්‍රිය මූලියෙහි** "යසස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ආමන්තා," අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ, සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූයේ වේ නම්, අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අරහත් ඵලස්ථ ආයූ පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හතලය දක්වා රූපාවචර භූමි (9) නවය,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් සොමනස්ස සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම් අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ ද සට මාර්ගස්ථ (3) තිදෙනාගේ ද, යට ඵලස්ථ (3) තිදෙනාගේ ද කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය, අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නා වූ අසංඥ පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන මෙ භූමි ගනු ලැබෙති.

උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධි චිත්තයාගෙ පටන් අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. ආර්‍ය්‍ය පුද්ගලයෝ (8) අට දෙනාය. යන මෙ පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපිද සිටින භූමියෙහි මතු නැවත නුපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් උපෙක්ෂා සහගත චිත්තයෙන් චුතවීම නියත කොට ඇති කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද, සොමනස්ස සහගත චිත්තයෙන් චුතවීම නියත කොට ඇති කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍යවූද පෘථග්ජනයන්ගේ ද යට මාර්ගස්ථ (3) තිදෙනාගේ ද, යට ඵලස්ථ (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතර, අකනිට්ඨ තලය.වර්ජිත පඤ්චවෝකා. භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ යට මාර්ගස්ථ (3) තිදෙනාගේ ද, යට ඵලස්ථ (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස යන මෙ භූමි ද ගනු ලැබෙති **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක සංසය සමානය.**

**සද්ධින්ද්‍රිය මූලී ආදියෙහි** අනුලෝම "අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ," අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, අසංඥතල භූමියෙහි මතු නැවත උපදින්නා වූ සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතලය ගනු ලැබේ. ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ ද ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නුපදින්නාවූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද – අභව්‍ය වූ ද පෘථග්ජන පුද්ගලයන්ගේ ද, යට මාර්ගස්ථ (3) තිදෙනාගේ ද යට ඵලස්ථ (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතරය. අකනිට්ඨව වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින

කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද - අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ ද යට මාර්ගස්ථ (3) තිදෙනාගේ ද යට ඵලස්ථ (3) තිදෙනාගේ ද චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය යන මෙ භූමි ද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීකයේ** නය ක්‍රමය සමානයි.

## සෝමනස්ස මූලය

**සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලීයෙහි** ''යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති. තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ,** යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං තත්ථ,'' (අනුලෝම සන්නිට්ඨානය පෙර සේ උදුරනු.)

සෝමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීම නියත කොට ඇති කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ සෝමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් සොමනස්ස සහගත චිත්තයෙන් චුතවීම නියත කොට ඇති කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද උපෙක්ෂා සහගත චිත්තයෙන් චුතවීම නියත කොට ඇති කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අන්තිම වූ සොමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජන, යට මාර්ගස්ථ (3) තිදෙන හා යට ඵලස්ථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ තලය වර්ජිත වූ පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජන, යට මාර්ගස්ථ (3) තිදෙන, හා යට ඵලස්ථ (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය, යන මේ භූමි ද යනු ලැබෙති. **සංසය සවරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමය පෙර සේ බලා උදුරනු. [සද්ධින්ද්‍රිය

මුලි යනාදියෙහි ද ජීවිතේන්ද්‍රිය මූලය මෙනි. අසංඥතලය ඇතුලත් නැති බවම විශේෂයි. උපෙක්ඛින්ද්‍රිය මූලයෙහි ද ජීවිතේන්ද්‍රිය මූලය මෙනි. අසංඥතලය ඇතුලත් නැති බවම විශේෂයි. සද්ධින්ද්‍රිය මූල යනාදියෙහි ද ප්‍රතිවචන පමණකි. අසංඥතල සම්පූර්ණයෙන් බැහැර වේ.]

අනාගත වාරය නිමි.

---

## වර්තමානාතීත පුද්ගල වාරය

**වර්තමානාතීත වාරයෙහි** ''**යස්ස** චක්ඛුන්ද්‍රියං උප්පජ්ජති, තස්ස ඉත්ථින්ද්‍රියං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන**, සබ්බෙසං චවන්තානං, අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, (මනින්ද්‍රිය මූලි දක්වා මේ ක්‍රමය සමානයි, ආයතන මෙන් ස්වරූප උදුරන්න.)

**ඉත්ථින්ද්‍රිය මූල පුරිසින්ද්‍රිය මූලියෙහි අනුලෝම** ''ආමන්තා'' පටිලෝමයෙහි ''සබ්බෙසං චවන්තානං, නඉත්ථිනං උපපජ්ජන්තානං, තෙසං'' (මනින්ද්‍රිය මූලි දක්වා මේ නය ක්‍රමයට අනුවම ස්වරූප උදුරන්න. පුරිසින්ද්‍රිය මූලය ද මෙයට සමානය.)

**ජීවිතේන්ද්‍රිය මූලයෙහි** ''**යස්ස** ජීවිතින්ද්‍රියං උප්පජ්ජති, තස්ස සොමනස්සින්ද්‍රියං උප්පජ්ජිත්ථාති, ආමන්තා, **යස්ස වා පන** සබ්බෙසං චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං, සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං,'' (පාලියෙහි ඇති සේ සියල්ල උදුරනු. ප්‍රත්‍යනීකය නොමැත.)

**සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** අනුලෝම - ''ආමන්තා'' පටිලෝමයෙහි ''සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, සොමනස්ස විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං, සොමනස්සෙන උපපජ්ජන්තානං, පවත්තෙ සොමනස්ස සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, තෙසං'' [සෙස්ස සමානය, උපෙක්ඛින්ද්‍රිය මූල යනාදියෙහි ද ක්‍රමය සමාන ය. වර්තමානාතීත වාරය සම්පූර්ණ කොට ස්වරූප උදුරනු පුද්ගල වාරය නිමි. ඕකාස වාරය සුගමයි.]

## පුද්ගලෝකාස වාරය

(පුද්ගලෝකාශ වාරයෙහි චක්ඛුන්ද්‍රිය මූල ජීවිතින්ද්‍රිය මූලි දක්වා ආයතන මෙන් උදුරනු.) සොමනස්සින්ද්‍රිය මූලියෙහි ''සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං **තත්ථ** ඉතරෙසං සචක්ඛුකානං උප්පජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** පඤ්චවොකාරා චවන්තානං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ.''

**අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ** රූපාවචර - පඤ්චම ධ්‍යාන ප්‍රතිසන්ධි (1) එකය, චෛතසික (30) සමතිසය, සුද්ධාවාසයෙහි උපදින වෙහප්ඵලයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්

තිදෙනාගේ වේහප්ඵලය, සුද්ධාවාස භූමි පසය, අපායෙහි සචක්ඛුකව උපදින දුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අපාය භූමි සතර ගනු ලැබෙති. [වේහප්ඵලය හා අපාය භූමි පෙළෙහි නැත. සුදුසු බැවින් ස්වරූප උදුරන ලදී.]

සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තුන්දෙනාගේ කාමසුගති භූමි (7) සත ද, සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **පටිලෝමයෙහි** පඤ්චවෝකාරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් සිවු දෙනාගේ කාමසුගති භූමි (7) සත, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය සචක්ඛුකව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ මනුෂ්‍ය භූමිය, හා චාතුර්මහාරාජික භූමිය ගනු ලැබේ. **ප්‍රත්‍යනීක ස්වරූපාර්ථ** "සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං,. අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ."

**උපෙක්ඛින්ද්‍රිය මූලි** අනුලෝමයෙහි "සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** පඤ්චවොකාරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ,"

අනුලෝමයෙහි, රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය, සුද්ධාවාස භූමි (5) පස ගනු ලැබෙති. සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්. (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළස ද වේහප්ඵලය ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

**පටිලෝමයෙහි** - පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන සිවුදෙනාගේ, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවුදෙනාගේ කාමභූමි (11) එකොළස, වේහප්ඵල භූමිය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය, අරූප භූමියෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීකය** - "සුද්ධාවාසෙ පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" රූපාවචරයෙහි චුතවන ත්‍රිහේතුක පෘථග්ජන හා ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය. සුද්ධාවාස භූමි (5) පසය, අසඤ්ඤසත්ත පුද්ගලයන්ගේ අසංඥ භූමිය යන මේ භූමි ගනු ලැබෙති [සද්ධින්ද්‍රිය මූලි පටන් පඤ්ඤින්ද්‍රිය මූලී දක්වා අනුලෝම සන්නිට්ඨාන ස්වරූපයට අපාය ඇතුළත් කොට ස්වරූප උදුරනු.]

## ජීවිත මූලය

**ජීවිතේන්ද්‍රිය මූල සොමනස්සින්ද්‍රිය මූලියෙහි** ''සුද්ධාවාසානං උපපත්ති චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං, පවත්තෙ චිත්තස්ස භඞ්ගක්ඛණෙ''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියේ පටන් ප්‍රථමයෙන්ම ලැබෙන සෝමනස්ස සහගත ප්‍රථම ජවන් සිත දක්වා සූදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි පස හා අසංඥ තලයෙහි උපදින පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

ප්‍රතිසන්ධි සිත් (19) එකුන්විස්ස චෛතසික (35) පන්තිස මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ චතුවෝකාර - පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් සිවුදෙනාගේ, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය. ප්‍රවෘත්ති කාලයෙහි සුද්ධාවාසය වේ නම් මුලින්ම උපදින සොම්නස්ස සහගත ද්විතිය ජවනයේ පටන් චුති චිත්තය දක්වා ද අවශේෂ චතුවෝකාර පඤ්චවෝකාර භූමි වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුති චිත්තය දක්වා ද සූදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් සිවු දෙනාගේ, ආයර්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද, පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප පෙර සේ** ලැබේ. **පටිලෝමයෙහි** (චුතවන්නාට චතුවෝකාර භූමි (4) සතර ද පඤ්චවෝකාර භූමි (26) සවිස්ස ද උදුරනු. ප්‍රවෘත්ති කාලයෙහි පෙර සේ උදුරනු. භංගක්ෂණය කීම පමණක් වෙනයි.)

ප්‍රත්‍යනීක **සංසය ස්වරූපය** ''සුද්ධාවාසානං උපපත්ති චිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤ සත්තා චවන්තානං තෙසං තත්ථ.'' සුද්ධාවාස භූමියෙහි ප්‍රතිසන්ධියේ පටන් ප්‍රථමයෙන්ම ලැබෙන සොමනස්ස සහගත ප්‍රථම ජවනය දක්වා සූදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පසය, අසඤ්ඤ සත්තයෙහි චුතවන සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය යන මේ භූමි ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** ''සුද්ධාවාසං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං, චතුවොකාරං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** චතුවොකාරා .පඤ්චවොකාරා චවන්තානං, පවත්තෙ චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ.''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** රූපාවචර පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සිත හා චෛතසික (30) සමතිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස, හා ප්‍රථම වූ ජීවිත නවක රූප කලාපයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අසංඥතලයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

ප්‍රතිසන්ධි සිත් (19) එකුන් විස්සගේ හා චෛතසික (35) පන්තිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්සය. ප්‍රවෘත්ති කාලයෙහි සුද්ධාවාසය වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුති චිත්තය දක්වා ද, (මෙපමණක්ම සොමනස්සින්ද්‍රියට වඩා වෙනස් වේ. සුද්ධාවාසයෙහි ප්‍රථම භවංගයේ පටන් උපෙක්ඛින්ද්‍රිය ඉපදීම බලා ස්වරූප උද්ධරනු. පටිලෝමය පෙර සේ බලා කියනු.) ප්‍රත්‍යනීක **සංසය** "සුද්ධාවාසානං උපපත්ති චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ", (ප්‍රතිසන්ධි චිත්තයාගේ භංගය උද්ධරනු. සද්ධින්ද්‍රිය මූලි යනාදිය ද මෙයට සමානය.)

**සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලි** යනාදියෙහි අනුලෝම, "ආමන්තා" යනු මය, පටිලෝමයෙහි "(චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ, සොමනස්ස විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ)" සොමනස්සෙන උපපජ්ජන්තානං, පවත්තෙ සොමනස්ස සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,"

පටිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** චතුවෝකාර පඤ්චවෝකාරයෙන් චුතවන පෘථග්ජන සිවුදෙනාගේ ද, ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් සිවුදෙනාගේ ද ප්‍රවෘත්ති කාලයෙහි සුද්ධාවාසය වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුති චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා ද අවසේස චතුවෝකාර පඤ්චවෝකාර භූමි වෙත් නම්, ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනාගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර හා පඤ්චවෝකාර භූමි (26) විසිහය ගනු ලැබෙති. (සංසය ස්වරූප ප්‍රත්‍යනීකය මෙන් කිනුය)

**ප්‍රත්‍යනීකය**, "සුද්ධාවාසං උපපජ්ජන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," රූපාවචර **පඤ්චමධ්‍යාන** ප්‍රතිසන්ධිසිත්, එකය. චෛතසික (30) සමතිසය, යන මෙ ධර්මයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ අනාගාමී ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ සුද්ධාවාස භූමි (5) පස හා අසංඥසත්වයන්ගේ අසංඥතල භූමිය ගනු ලැබේ.

**උපෙක්ඛින්ද්‍රිය මූල සද්ධින්ද්‍රිය මූලි** යනාදියෙහි "සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං උපෙක්ඛාය උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ,

උපෙක්ඛා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ,'' (සොමනස්සින්ද්‍රියයේ පටන් සියලු මූලයන්හි පටිලෝමයෙහි ''සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ සොමනස්ස විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ'' යනාදී වශයෙන් යොද කීම මැනවැයි ගුරුවරු කියති.) අර්ථ සුගමයි.

**සද්ධින්ද්‍රිය මූල යනාදියෙහි** ''සුද්ධාවාසං උපපජ්ජන්තානං'' යනුම වේ. අනුලෝමය කියනු – පටිලෝමයෙහි ද පූර්වා කියනු. ''සද්ධා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ'' යනාදිය ද කියනු. **ප්‍රත්‍යනීක සංසයෙහි**, චනාහි ''සුද්ධාවාසානං උපපත්ති චිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං''යි කියනු.

වර්තමානාතීත වාරය නිමි

## වර්තමානානාගත පුද්ගල වාර චක්ඛුමූලය

චක්ඛු මූල සෝතමූලි යනාදිය ආයතන යමකය මෙන් කියන්න. ඉත්ථින්ද්‍රිය මූලියෙහි ''පච්ඡිම – භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, යෙච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං, යස්ස වා පන සබ්බෙසං චවන්තානං, අචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං''.

අනුලෝමයෙහි **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ පඤ්චවෝකාරයෙහි පශ්චිම භවිකව උපදින ත්‍රිහෙතුක පෘථග්ජනයෝ ය. යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය, කාමසුගති භූමි (7) සතෙන් චුතව රූපාවචර භූමියෙහි ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා ය. රූපාවචර භූමියෙහි එකින් එක ඉහළට ඉපද පිරිනිවීමට නියත වූ රූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය කාමසුගති භූමි (7) සතෙහි හා සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවයෙහි යට මාර්ග ලබා අරූප භූමියෙහි ඉපද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගල යන් (3) තිදෙනා ය, පුරුෂ භාවයෙන් ජාති එකක් දෙකක් යනාදී වශයෙන් ඉපද පිරිනි විමට නියත වූ සචක්ඛුකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනා ය. යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ය යන මේ පුද්ගලයෝ ලැබෙති.

නැවතත් ඉත්ථින්ද්‍රිය ලැබෙන්නා වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින්නා වූ පෘථග්ජන (4) සිවුදෙනා ද යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ඉත්ථින්ද්‍රිය නැවතත් ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවු දෙනා ය, යට එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ය, අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජනයෝ ය. අසංඥතල – අරූප තලයෙහි උපදින සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං යෙ ච රූපාවචරං - අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං,'' (පඤ්චවෝකාරයෙහි පරිනිබ්බන්ත'' යනාදිය ආයතන යමකයෙහි මෙන් උදුරනු.)

පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවු දෙනා ය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ය.

අචක්ඛුකව කාමාවචරයෙහි උපදින චුතවන දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජනයෝ ය. අසංඥතල - අරූප තලයෙහි උපදින - චුතවන සුගති අහේතුක-ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (පුරිසින්ද්‍රිය වාරය ද මෙසේ ය. ඉත්ථින්ද්‍රිය - පුරිසින්ද්‍රිය මාරුකොට කීමම විශේෂයි.)

**සොමනස්සින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, යෙ ච සචක්ඛුකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උප-පජ්ජන්තානං තෙසං, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං,'' ප්‍රතිලෝම-යෙහි නය ක්‍රමය සමානය, අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පශ්චිම භවිකව **පඤ්චවෝකාරයෙහි** උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. - යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ය, මහා විපාක ඥාතිය යුගලයෙන් හා මහත්ගත විපාක උපෙක්ෂා සහගත සිත් පසෙන් ඉපදී පිරිනිවීමට නියතවූ සචක්ඛුකව පඤ්චවෝකාර-යෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. නැවතත් සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනා ද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබෙ.

ප්‍රතිලෝමයෙහි නැවතත් සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්-ජන පුද්ගලයන් (4) සිවුදෙනා ය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය. අචක්ඛුක ව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජනයෝය. අසංඥතල - අරූප තලයෙහි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. ඉහත සංසය ස්වරූපද ලැබෙ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූප** ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං. අරූපෙ පච්ඡිමභ-විකානං, යෙ ච සචක්ඛුකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'' (පඤ්චවොකාරෙ පරිනිබ්බන්ත - අරූපෙ පච්ඡිම භවික පෙර සේ උදුරනු.) මහාවිපාක ඥාතිය යුගලයෙන් හා මහග්ගත විපාක උපෙක්ෂා සහගත සිත් පසෙන් ඉපද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන (4)

සිවුදෙනාය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය, අචක්ඛුකව කාමාවචර-යෙහි උපදින චුතවන දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජනයෝ ය. අසංඥතල අරූප තලයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, යෙ ච සචක්ඛුකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්-ජන්තානං තෙසං, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං,'' ප්‍රතිලෝමයෙහි නය ක්‍රමය සමානය.

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ය. මහා විපාක සිත් ප්‍රථම යුගලයෙන් හා රූපාවචර විපාක සොමනස්ස සහගත සිත් (4) සතරෙන් ඉපද පිරිනිවීමට නියත වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාය. යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. උපෙක්ඛින්ද්‍රිය මතු නැවත උපදින්නා වූ සචක්ඛුකව පඤ්චවෝකාර-යෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනා ද යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ඛින්ද්‍රිය මතු නැවත ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවුදෙනාය. යට එලස්ථ ආයඞ පුද්ගලයන් දෙදෙ-නාය. අචක්ඛුකව කාමාවචරයෙහි උපදින අසංඥතල - අරූප තලයෙහි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. ඉහත දැක් වූ **සංසය** ස්වරූප ද ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''පඤ්චවොකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං යෙ ච සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'', (පඤ්චවෝකාරේ පරිනිබ්බන්ත - අරූපෙ පච්ඡිම භවිකයන් පෙර සේ උද්ධරනු.) මහා විපාක සිත් ප්‍රථම යුගලයෙන් හා රූපාවචර විපාක සොමනස්ස සහගත සිත් (4) සතරෙන් ඉපද පිරිනිවීමට නියතවූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය. යට එලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ය. අචක්ඛුකව කාමාවචරයෙහි උපදින චුතවන දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය. අසංඥතල - අරූප තලයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (සද්ධින්ද්‍රිය මූලියෙහි පටන් මනින්ද්‍රිය මූලි දක්වා මනායතනය මෙන් කියන්න.)

චක්ඛුන්ද්‍රිය මූලය නිමි

## සංසන්දන මූලය

**ඝානින්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති,යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං, ඉතරෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං **සස්ස වා පන** සබ්බෙසං චවන්තානං, අඝානකානං උපපජ්ජන්තානං තෙසං,''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාය. [කාම භූමියෙන් රූප අරූප භූමීන්ට නගින පුද්ගලයන් ගැන ආයතන යමකයෙහි මෙන් ස්වරූප උදුරනු] පුරුෂාත්මභාවයෙන් ආත්ම එකක් දෙකක් යනාදී වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාය. යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. මතු නැවතත් ඉත්ථින්ද්‍රිය ලැබෙන්නා වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනා ද යට එලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනා ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

**පටිලෝමයෙහි** මතු නැවත ඉත්ථින්ද්‍රිය ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය. යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාය. අඝානකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. රූපාවචර අරූපාවචරයෙහි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. **යට දැක්වූ සංසය ස්වරූප ද** ලැබෙති.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං, යෙච රූපාවචරං අරූපවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං,'' [කාමාවචරෙ පරිනිබ්බන්තානං - යනාදිය පෙර සේ උදුරනු.]

පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් පමණ ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය. යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාය. අඝානකව කාමාවචරයෙහි උපදින චුතවන දුගති අහේතුක සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයෝය. රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [පුරිසින්ද්‍රිය මූලියෙහි ද ක්‍රමය සමානය. ජීවිතින්ද්‍රිය ධම්මායතනය මෙනි.]

**සොමනස්සින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, යෙ ච සඝානකා උපෙක්ඛාය උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං ඉතරෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං,''

පටිලෝමයෙහි නය ක්‍රමය සමානය, අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට එලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය. මහාවිපාක සිත් තෘතිය යුද්ගලයෙන් හා මහග්ගත විපාක උපෙක්ෂා සහගත චිත්තයන් (5) පස් දෙනාගේ වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ සසානකව කාමාවචරයෙ හි උපදින පෘථග්ජන (4) සිවු දෙනාය. යට එලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයෝ ලැබෙති. මතු නැවතත් සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ සසානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනා ද යට එලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනා ද ලැබෙති.

පටිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවු දෙනා ය. යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය. අසානකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝය, රූපාවචර අරූපාවචරයෙහි උපදින සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. යට **සංසය ස්වරූප ද** ලැබේ.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං, යෙච සසානකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'', [කාමාවචර පරිනිබ්බන්ත - යනාදිය උදුරනු.]

මහාවිපාක සිත් තෘතිය යුගලයෙන් හා මහග්ගත විපාක උපේක්ෂා සහගත සිත් (5) එසෙන් ඉපද පිරිනිවීමට නියතවූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවුදෙනාය යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනාය. අසානකව කාමාවචරයෙහි උපදින චුතවන දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. යට එලස්ථ ආයතී පුද්ගලයන් (3) තිදෙනා ය, යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං යෙ ච සසානකා සොමනස්සෙන උපපජ්ජත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං, ඉතරෙසං සසානකානං උපපජ්ජන්තානං තෙසං'' [පටිලෝමයෙහි නය ක්‍රමය සමානය].

අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ පශ්චිම භවිකව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට එලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය, මහා විපාක සිත් ප්‍රථම යුගලයෙන් හා රූපාවචර විපාක සොමනස්ස සහගත සිත් (4) සතරෙන් ඉපද පිරිනිවීමට නියත වූ ස සානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාය, යට එලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයෝ

ගනු ලැබෙති, මතු නැවතත් උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනා ද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබෙ.

පටිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, මතු නැවතත් උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවුදනා ය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය. අසානකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු බෙති. යට සංසය ස්වරූපාර්ථ ද ලැබෙ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරෙ අරූපාවචරේ පච්ඡිම භවිකානං, යෙ ච සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං'', (කාමාවචර පරිනිබ්බන්ත - යනාදිය පෙර සේ බලා උද්‍ධරනු.) මහාවිපාක සිත් ප්‍රථම යුගලයෙන් හා රූපාවචර විපාක සෝමනස්ස සහගත සිත් (5) පසෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවු දෙනා ය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය. අසානකව කාමාවචරයෙහි උපදින චුතවන දුගති අහේතුක සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ යන මොවුහු ලැබෙති.

සානින්ද්‍රිය මූලය නිමි

---

## ඉත්ථින්ද්‍රිය මූලය

ඉත්ථින්ද්‍රිය මූල පුරිසින්ද්‍රිය මූලියෙහි ''පච්ඡිම භවිකානං ඉත්ථිනං උපපජ්ජන්තීනං, යාව ඉත්ථියො රූපාවරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති. යා ච ඉත්ථියො එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තාසං උපපජ්ජන්තානං තාසං, ඉතරාසං ඉත්ථිනං උපපජ්ජින්තිනං තාසං, **යස්ස වා පන** සබ්බෙසං චවන්තානං නඉත්ථිනං උපපජ්ජන්තානං තෙසං''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, පශ්චිම භවික ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාය. කාමසුගති භූමි (7) සතෙන් සැව රූපාවචර අරූපාවචර භූමියට පැමිණ පිරිනිවීමට නියත වූ ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ය.

[ස්ත්‍රීහු ආයඞ් වූවද පෘථග්ජන වූවද අෂ්ට සමාපත්ති ලාභී වූවද බ්‍රහ්මපාරිසජ්ජයෙහි පමණක්ම උපදිති. ඉහළට යාගත නොහැකි වෙති. වරක් බ්‍රහ්මපාරිසජ්ජයෙහි ඉපද එයින් පසු ඉහළට යා හැකි වෙති. ''යා ච ඉත්ථියො රූපාවචරං අරූපාවචරං'' යනාදි පාඨය ඒ සඳහා කියන ලදී.]

ස්ත්‍රීභාවයෙන් ආත්මභාව එකක් දෙකක් පමණ ඉපද පිරිනිවීමට නියත වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. මතු නැවත පුරිසින්ද්‍රිය ලබන්නා වූ ස්ත්‍රීන්ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනා ද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

පටිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** මතු නැවතත් පුරිසින්ද්‍රිය ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනාය නපුංසකව, පුරිසව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනාය. රූපාවචරයෙහි අරූපාවචරයෙහි උපදින සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය යන මේ අය ගනු ලැබෙති. **යට දැක්වූ සංසය ස්වරූපාර්ථ** ද ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං, යා ච ඉත්ථියො රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, යා ච ඉත්ථියො එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තාසං චවන්තීනං තාසං,'' - කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ය. පශ්චිම භවිකව පුරුෂව උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා ය. [ලැබීමට සුදුසු හෙයින් උදුරනු ලැබේ. විභංගයෙහි නොමැත.] පශ්චිම භවිකව රූපාවචර අරූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. චුතවන අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය. කාම සුගති භූමි සතෙන් චුතව රූපාවචර - අරූපාවචර භූමිවලට පැමිණ පිරින්වීමට නියත වූ ස්ත්‍රීන්ව කාමාවචරයෙහි චුතවන පුරුෂව කාමාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තුන්දෙනාය. රූපාවචර - අරූපාවචර භූමි එකින් එක ඉහළට ඉපද පරිනිවීමට නියත වූ රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය. ස්ත්‍රීභාවයෙන් ම ආත්මභාව එකක් දෙකක් පමණ ඉපද පිරිනිවීමට නියත වූ ස්ත්‍රීන්ව කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා ය. නපුංසකව - පුරුෂව කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනාය. රූපාවචර අරූපාවචරයෙහි උපදින චුත වන සුගති අහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

[ආර්‍ය්‍ය භාවයට පත් වූ පුරුෂයෝ නැවත ස්ත්‍රීභාවයට නොයෙති. එනිසා පෘථග්ජන (4) සිවුදෙනා පමණක් ස්වරූප වශයෙන් ගත යුතුවේ. ආර්‍ය්‍ය භාවයට පත් වූ ස්ත්‍රීහු පිරිනිවීමට සමීප කාලයෙහි වුවද පුරුෂ බවට පත්විය හැකි ය යි ආචාර්‍ය්‍ය පාදයෝ කියති. ජීවිතින්ද්‍රිය මූලිය සුගමයි.]

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං ඉත්ථීනං උපපජ්ජන්තීනං, යා ච ඉත්ථියො උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තාසං උපපජ්ජන්තීනං තාසං, ඉතරාසං ඉත්ථීනං උපපජ්ජන්තීනං තාසං, **යස්ස වා පන** සබ්බෙසං චවන්තානං, න ඉත්ථීනං උපපජ්ජන්තානං තෙසං.''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පශ්චිම භවකව ස්ත්‍රීත්ව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනාය, මහාවිපාක සිත් තෘතිය යුගලයෙන් හා මහද්ගත විපාක උපෙක්ෂා සහගත සිත් පසෙන් ඉපද පිරිනිවීමට නියම වූ ස්ත්‍රීත්ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ ස්ත්‍රීත් ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනා ද ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ මතු නැවත සෝමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය. නපුංසකව - පුරුෂව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනාය. රූපාවචර අරූපාවචර යෙහි උපදින සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ ස්ත්‍රීත්ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනා හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක **සංසය ස්වරූපාර්ථ** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං යා ච ඉත්ථියො උපෙක්ඛාය උපපජ්ත්වා පරිනිබ්බායිස්සන්ති තාසං චවන්තීනං තාසං'',

[එතෙනෙව භාවෙන - යනාදිය කැමති නොවෙති. ඉත්ථින්ද්‍රිය චනාගි අනාගත නොවෙයි. වර්තමාන ම වෙයි.] කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ග ලයෝ ය. පශ්චිමභවික පුරුෂව උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනා ය. පශ්චිම භවිකව රූපාවචර අරූපාවචර යෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආයඞ් පුද්ගල යන් (3) තිදෙනාය. චුතවන අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය. මහාවිපාක සිත් තෘතිය යුගලයෙන් හා මහත්ගත විපාක උපෙක්ෂා සහගත සිත් පසෙන් ඉපද පිරිනිවීමට නියත වූ ස්ත්‍රීත්ව කාමාවචරයෙහි චුතවන, නපුංසකව - පුරුෂව කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවු දෙනාය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය. රූපාවචර අරූපා වචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං ඉත්ථීනං උපපජ්ජන්තීනං, යා ච ඉත්ථියො සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තාසං උපපජ්ජන්තීනං තාසං, ඉතරාසං ඉත්ථීනං උපපජ්ජන්තීනං තාසං, **යස්සවාපන**''(නය ක්‍රමය සමානය)

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, පශ්චිම භවික ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් දෙදෙනාය. මහාවිපාක සිත් ප්‍රථම පුගලයෙන් හා රූපාවචර විපාක සෝමනස්ස සහගත සිත් සතරෙන් ඉපද පිරිනිවීමට නියත වූ ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාය, යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් (2) දෙදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. — මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ සත්‍රීන් ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනා ද යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. (පටිලෝමයෙහි පෙර සේ උද්ධරනු. ''මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ'' යනුවෙන් කියා උද්ධරනු.) **ප්‍රත්‍යනීක සංසය** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං රූපාවචරෙ අරූපා වචරෙ පච්ඡිම භවිකානං යා ච ඉත්ථියො සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සනති තාසං චවන්තීනං තාසං'', [සොමනස්සය ඇසුරු කොට ස්වරූප උද්ධරනු.]

**සද්ධින්ද්‍රියය මූලි යතාදිය** ''පච්ඡිම භවිකානං ඉත්ථීනං උපපජ්ජන්තීනං තාසං, ඉතරාසං ඉත්ථීනං උපපජ්ජන්තීනං තාසං, **යස්සවා පන**'' (නය ක්‍රමය සමානය) අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පශ්චිම භවික ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් (2) දෙදෙනාය, යන මේ අය ගනු ලැබෙති. පශ්චිම භවිකයා හැර ස්ත්‍රීන් ව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනා ද යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් දෙදෙනා ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

පටිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පිරිනිවෙන්නා හැර සියලුම චුතවන පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් දෙදෙනාය. නපුංසකව - පුරුෂව කාමා වචරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාය, යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් (2) දෙදෙනාය. රූපාවචර - අරූපාවචරයෙහි උපදින සුගති අහේතුක - ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් තිදෙනාය යන මෙ පුද්ගලයෝ ගනු ලැබෙති. **පෙර කියන ලද සංසය** ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ**, ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං, තෙසං'' කාමාවචරයෙහි පිරිනිවෙන **අර්හත්** ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ය. පශ්චිම භවික පුරුෂව උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් (2) දෙදෙනා ය, පශ්චිම භවිකව රූපාවචර අරූපාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට ඵලස්ථ ආයෑ පුද්ගලයන් (3) තිදෙනා ය, චුතවන අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ඉත්ථින්ද්‍රිය මූලය නිමි. (පුරිසින්ද්‍රිය මූලයද මෙයට සමානය.)

## ජීවිතින්ද්‍රිය මූලය

**ජීවිතින්ද්‍රිය මූල සොමනස්සින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, **යස්ස වා පන**, සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං''.

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, මොවුන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය. උපේක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් නම්, අවසාන වූ සොමනස්ස සහගත චිත්තයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. ආර්‍ය පුද්ගලයන් අටදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

ප්‍රතිසන්ධි සිත් (19) එකුන්විස්සය චෛතසික (35) පන්තිසය මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ සියලුම උපදින පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් තිදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද, උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අන්තිම වූ සොමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය. ආර්‍ය පුද්ගලයන් අට දෙනාය. [පශ්චිම භවිකයා ගතයුතු] පශ්චිම - භවික නොවූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජනයෝ ය. යට මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයන් තිදෙනාය. යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් තිදෙනාය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේම ලැබේ.

පටිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, පිරිනිවෙන්නා හැර චුති සිත් (19) එකුන් විස්ස චෛතසික (35) පන්තිස මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවන පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් තුන්දෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් නම් ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන සොමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයෝ ය. ආර්‍ය පුද්ගලයන් අටදෙනාය. පශ්චිම භවිකයෙක් නොවේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිචිත්තයට

පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ තුන් දෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. පෙර දක්වූ සංසය ස්වරූප ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උපපජ්ජිස්සති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ." ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙසය, චෛතසික (35) පන්තිසය, යන මේ පශ්චිම චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, අවසාන සෝමනස්ස සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්-ජන හා ආර්‍ය්‍ය පුද්ගලයන් අට දෙනා යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** "පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරෙසං (නය ක්‍රමය සමානය) යස්ස වා පන සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං".

අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ, ත්‍රිහේතුක චුතිසිත් (19) එකුන්විස්ස හා චෛතසික (35) පන්තිස්-දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණා-ශ්‍රවයෝය. සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ගනු ලැබෙති.

සියලුම උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවුදෙනා ය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල-යන් (3) තිදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වාද, සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය. පශ්චිම භවික නොවූයේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජන වූයෝ ය. යටමාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ය. මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමයෙහි නය ක්‍රමය සුගමයි.

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං "(අනුලෝමයෙහි අනුලෝම සන්නිට්ඨාන මෙන් භංගක්ෂණය කියනු.)

**සද්ධින්ද්‍රිය මූල යනාදියෙහි** "පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ – පෙ – ඉතරෙසං, (නය ක්‍රමය සමානය) **යස්ස වා පන** සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං", අනුලෝම **සන්නිට්ඨාන සවරූපාර්ථ** ත්‍රිහේතුක චුති සිත් (13) තෙලෙස හා චෛතසික (35) පන්තිස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සියලුම උපදින පෘථග්ජන (4) සිවුදෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ය. පශ්චිම – භවික නොවූවෙක් නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ද අභව්‍ය වූ ද පෘථග්ජනයෝ ය. යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනා ය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය සවරූපාර්ථ** පෙර සේ ලැබෙ. (පටිලෝමයෙහි සමානව ස්වරූප උදුරනු චවන්ත භංගක්ෂණ – යනුම විශේෂයි.) **ප්‍රත්‍යනීක සංසය සවරූපාර්ථ**, "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං" (පෙර සේ කියනු.)

ජීවිතින්ද්‍රිය මූලය නිමි.

---

## සොමනස්සින්ද්‍රිය මූලිය

සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි, "සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරේසං සොමනස්සෙන උපපජ්ජන්තානං, පවත්තෙ සොමනස්ස සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, **යස්සවා** පන සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, සොමනස්ස විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං", (මෙහි සබ්බෙසං චවන්තානංයි ද පෙළෙහි ඇත.)

අනුලෝම **සන්නිට්ඨාන සවරූපාර්ථ** සොමනස්ස සම්ප්‍රයුක්ත පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය, සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූවෙක් වේ නම්, අවසාන උපෙක්ෂා සහගත චිත්තයාගෙන් පසු සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ගනු ලැබෙති.

සොමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ය. ප්‍රවෘත්ති කාලයෙහි උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අවසාන වූ සෝමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ **උත්පාදක්ෂණ** සමංගී වූද සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියතවූ කෙනෙක් වේ නම්, ප්‍ර තිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයට පූර්වයෙහි සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදනාය. පශ්චිම භවික නොවූවෙක් වේ නම්; ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූද අභව්‍ය වූද පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් ති දෙ නා ය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථය** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියතවූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයන්ගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ සුඛ, දුක්ඛ, දෞමනස්ස, උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම්වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනා ය, පශ්චිම භවිකයෙක් නොවන්නේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ සුඛ, දුක්ඛ, දෞමනස්ස, උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූද අභව්‍ය වූ ද පෘථග්ජනයෝය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය, නිරොධ සමාපත්ති සමාපන්න වූ අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝ ය. අසංඥ සත්වයෝය. යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **පෙර කියන ලද සංසය ස්වරූපද** ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්ත සමඞ්ගීනං, යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, තෙසං,'' සොමනස්ස සම්පයුත්ත පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ භංගක්ෂණ සමංගී වූ ද, උපෙක්ෂා සම්ප්‍රයුක්ත පශ්චිම චිත්තයන් (7) සත් දෙනාගේ ක්ෂණත්‍රය සමංගී වූ ද අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාය. සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම උපෙක්ෂ

සහගත චිත්තයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ සුඛ දුක්ඛ, උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා ගනු ලැබෙති. (දෞර්මනස්සය නො ලැබේ.)

සද්ධින්ද්‍රිය මූලි යනාදියෙහි ''සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරෙසං තෙසං (නය සමානයි) යස්ස වා ප. න සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ සොමනස්ස විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, නිරොධ සමාපන්නානං අසඤ්ඤ සත්තානං තෙසං'', අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ, සොමනස්ස සහගත පශ්චිම චිත්තයන් (6) සය දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා ලැබෙති. සොමනස්ස ප්‍රතිසන්ධි (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. ප්‍රවෘත්ති කාලයෙහි පශ්චිම චිත්තය හැර සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝ ය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, මාර්ග ඵල නොලබන්නෙක් වේ නම්, සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයන් සතර දෙනා ද ගනු ලැබෙති. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්ත ය දක්වා සුදුසු පරිදි උප දින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ සුඛ, දුක්ඛ, දෞර්මනස්ස, උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝය. ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය. පශ්චිම භවික නොවන්නෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුති චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ, සුඛ, දුක්ඛ, දෞර්මනස්ස, උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද, පෘථග්ජනයෝ ය. යට මාර්ගස්ථ තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තුන්දෙනාය, නිරෝධ සමාපත්තියට සමාපන්න වූ අනාගාමී අර්හත් ආර්‍ය්‍ය පුද්ගලයෝ ය. අසංඥ සත්වයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (මෙහි පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ස්වරූප ගන්නා ලද තැන භව්‍ය වූ පෘථග්ජන සිවුදෙනා පොදුවේ ගෙන, ඉන් පසු අභව්‍ය පෘථග්ජනයා ගෙන එක් වාරයක් උද්ධරනු.) **ප්‍රත්‍යනීක සංශය ස්වරූප** ''සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්ත සමංගීනං තෙසං,'' (පෙර සේ ස්වරූප උද්ධරනු).

සොමනස්සින්ද්‍රිය මූලය නිමි.

---

## උපෙක්ඛින්ද්‍රියාදි මූලය

**උපෙක්ඛින්ද්‍රිය මූල සද්ධින්ද්‍රිය** මූලි යනාදි මූලි වාරයන්හි, ''උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, ඉතරෙසං උපෙක්ඛාය උපපජ්ජන්තානං පවත්තෙ උපෙක්ඛා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, (ඉතරෙසං උපෙක්ඛා සම්ප්‍රයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ' යයි ගුරුවරු උගන්වති.) **යස්ස වා පන** සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, උපෙක්ඛා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ නිරොධ සමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං'' (මෙතැන ''සබ්බෙසං චවන්තානං'' කියා පාලියෙහි ඇත.)

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ෂා සහගත පශ්චිම චිත්තයන් (7) සත් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා ගනු ලැබෙති. උපෙක්ෂා ප්‍රතිසන්ධි (11) එකොළසගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන සතර දෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තුන්දෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි පශ්චිම චිත්තය හැර සුදුසු පරිදි උපදින උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ පෘථග්ජන (4) සතර දෙනාය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය. මාර්ග නොලබන කෙනෙක් වේ නම් සුදුසු පරිදි උපදින උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අභව්‍ය පෘථග්ජන පුද්ගලයන් යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. (සොමනස්සින්ද්‍රිය මූලය මෙන් මාරුකොට ස්වරූප උද්ධරනු.) පටිලෝමය සුගමයි. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්ත සමංගීනං තෙසං" (සුගමයි, පෙර සේ උද්ධරනු.)

**සද්ධින්ද්‍රිය මූල විරියින්ද්‍රිය මූලී** යනාදියෙහි, "පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං, සද්ධාය උපපජ්ජන්තානං පවත්තෙ සද්ධාසම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ - දෙ - (ඉතරෙසං සහෙතුකානං උප්පජ්ජන්තානං, පවත්තෙ සද්ධා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ කියා ද උගන්වති.) පටිලෝමයෙහි "සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, සද්ධා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ නිරෝධ සමාපන්නානං, අසඤ්ඤ සත්තානං තෙසං."

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** ත්‍රිහේතුක චුති සිත් (13) තෙළෙස් දෙනාගේ හා චෛතසික (35) පන්තිසගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍ර වයන් වහන්සේලා ගනු ලැබෙති. සහේතුක ප්‍රතිසන්ධි සිත් -17) සත ළොසගේ හා චෛතසික (35) පන්තිසගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයෝය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, ප්‍රවෘත්ති කාලයෙහි පශ්චිම චිත්තය හැර, සෝභන චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය පෘථග්ජනයෝය, ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාය, මාර්ගඵල නොලබන්නෙක් වේ නම්, සුදුසු පරිදි උපදින සෝභන චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය පෘථග්ජනයෝය, යන මේ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබේ. **ප්‍රතිලෝමයෙහි** නය ක්‍රමය සමානව උද්ධරන්න. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං".

විරයින්ද්‍රිය මූල යනාදියෙහි ද "පච්ඡම චිත්තස්ස උප්පාද ක්ඛණෙ" කියා අනුලෝ මයෙහි පෙර සේ කියනු. පටිලෝමයෙහි ද වීරිය විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ." යනාදිය පෙර සේම කියනු. (ස්වරූප ඉදිරිමෙහිදී ද ඉන්ද්‍රිය අවසානය දක්වා විප්පයුත්තය කියා උද්ධරනු.) පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුමගයි.)

## පුද්ගලෝකාස වාරය

# චක්ඛු මූලය

**පුද්ගලෝකාශ චක්ඛුන්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරං උපපජ්ජන්තානං යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති, තෙසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ**, කාමාවචරා චවන්තානං, අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ,''

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පශ්චිම භවික කාමාවචරයෙහි උපදින ''ඝනාදිය ආයතන යමකයෙහි චක්ඛුමූල සාන මූලි මෙන් උදුරනු.) පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් ඝනාදී වශයෙන් ඉපද පිරිනිවීමට නියත වූ සචක්ඛුකව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය නොලැබෙන්නා වූ සචක්ඛුකව කාමාවචරයෙහි උපදින්නා වූ පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් දෙදෙනාගේ කාමභූමි (11) එකොළස යනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය මතු ලැබෙන්නා වූ සචක්ඛුකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබේ.

පටිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ, තමන් ඉපද සිටින භූමියෙහි මතු ඉත්ථින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය තමන් ඉපද සිටින භූමියෙහි මතු ඉත්ථින්ද්‍රිය ලැබෙන්නා වූ අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ගනු ලැබෙති. පෙර කියන ලද සංසය ස්වරූපාර්ථ ද ගනු ලැබෙති.

ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ, ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරා චවන්තානං, අසඤ්ඤසත්තානං, අරූපානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කත්චි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං තත්ථ,'' කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන්ගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නුපදින්නා වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සතරදෙනාගේ හා යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තුන් දෙනාගේ කාමභූමි (11) එකොළසය, රූපාවචර චුති සිත් (5) පස් දෙනාගේ හා චෛතසික (35)

පත්තිසගේ භංගක්ෂණ සමංගි වූ රූපාවචරයෙන් චුත වන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ අසංඥතල වර්ජිත රූපභූමි (15) පසළොසය, අසංඥසත්ව භූමිය, අරූප භූමි (4) සතරය.

පුරුෂාත්ම භාවයෙන් ජාති එකක් දෙකක් යනාදීන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට එලස්ථ ආයති පුද්ගලයන් දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු ඉත්ථින්ද්‍රිය නොලැබෙන්නා වූ, කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට එලස්ථ ආයති පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, තමන් ඉපද සිටින භූමියෙහි මතු ඉත්ථින්ද්‍රිය නොලැබෙන්නා වූ අචක්ඛුක ව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය යන මේ භූමි ගනු ලැබෙති. පුරිසින්ද්‍රිය මූලි නය ක්‍රමය සමානය, (ජීවිතින්ද්‍රිය මූලිය ද ධම්මාය තනය මෙනි.)

සොමනස්සින්ද්‍රිය මූලියෙහි "පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං යෙ ච සචක්ඛුකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ පඤ්චවො කාරා චවන්තානං, අචක්ඛුකානං කාමා වචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ."

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදින ඒ කාන්ත – අනේකාන්ත වාරයන් පෙර සේ උදුරනු.) තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක සිත් තෘතිය යුගලයෙන් හා රූපාවචර පඤ්චමධ්‍යාන විපාක චිත්තයෙන් ඉපද පිරිනිවීමට නියත වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පුද්ගලයන්ගේ හා යටඑලස්ථ ආයති පුද්ගලයන් තුන්දෙනාගේ කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵල භූමිය, තමන් ඉපද සිටින භූමියෙහි මතු සොම නස්සින්ද්‍රිය නොලැබෙන්නාවූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන පුද්ගලයන් (4) සිවු දෙනාගේ හා යට එලස්ථ ආයති පුද්ගලයන් තුන්දෙනාගේ කාමභූමි(11) එකොළසය, වෙහප්ඵල භූමිය, යන භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු සෝමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ සචක්ඛුකව පඤ්චවෝකාර භූමියෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය සුභ **කිණ්හ** කය තෙක් රූපභූමි (9) නවය යන මේ භූමි ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථය** පෙර සේ ලැබෙ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තමන් ඉපද සිටින භූමියෙහි මතු සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවන සුගතිඅහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට එලස්ථ ආයති පුද්ගල යන් තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය තෙක් රූප භූමි (9) නවය, තමන් ඉපද

සිටින භූමියෙහි මතු සෝමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ අචක්ඛුකව කාමාවචරයෙහි උප දින සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ මනුෂ්‍ය භූමිය හා චාතුර්මහාරාජික භූමිය යන මේ භූමි ලැබෙති. පෙර කියන ලද සංසය ස්වරූප ද ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං, අසඤ්ඤසත්තානං, අරූපානං, යෙ ච සචක්ඛුකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං තත්ථ", (පඤ්චවෝකාර පරිනිබ්බන්ත-ඒකාන්ත අනේකාන්තය පෙර සේ උදුරනු.) අසංඥතලය, අරූප භූමි සතර හා අරූපී පුද්ගලයෝ ය. මහාවිපාක සිත් තෘතිය යුගලයෙන් හා රූපාවචර පඤ්චමධ්‍යාන විපාක චිත්තයෙන් ඉපද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයෂ්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, වේහප්ඵල භූමිය, තමන් ඉපද සිටින භූමියෙහි මතු සෝමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවන පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයෂ්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළස, වේහප්ඵල භූමිය, තමන් ඉපද සිටින භූමියෙහි මතු සෝමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය යන මේ භූමි ගනු ලැබෙති.

උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි "පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං, යෙ ච සචක්ඛුකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, පඤ්චවොකාරා චවන්තා නං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ," අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ (පශ්චිම භවික පඤ්චවෝකාර ඒකාන්ත – අනේකාන්ත භූමි පෙර සේ බලා උදුරනු.)

තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක සිත් ප්‍රථම යුගලයෙන් හා රූපාවචර සෝමනස්ස සහගත විපාක සිත් සතරෙන් ඉපද පිරිනිවීමට නියත වූ, සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයෂ්‍ය පුද්ගලයන් තුන් දෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපභූමි (9) නවයය, තමන් ඉපද සිටින භිමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේ තුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයෂ්‍ය පුද්ගලයන් (3) තුන්දෙනාගේ කාමසුගති භූමි (7) සතය. සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ සචක්ඛුක ව පඤ්චවෝකාරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයෂ්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළසය, වේහප්ඵලය යන මේ භූමි ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම **සන්නිවධාන ස්වරූපාර්ථ**, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවන, පෘථග්ජන සිවුදෙනාගේ, යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ කාම භූමි (11) එකොළසය, වෙහප්ඵලය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපේක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ අවක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සයය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ අරූප තලයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතරය යන මේ භූමි ගනු ලැබෙති. පෙර කියන ලද සංසය ද ලැබෙති.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ**, ''පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං, අරූපෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං, යෙ ච සචක්ඛුකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං තත්ථ,'' (පඤ්චවොකාර පරිනිබ්බන්ත – ඒකාන්ත – අනේකාන්තය පෙර සේ බලා උද්ධරනු. අරූපෙ පච්ඡිම භවික – ඒකාන්ත – අනේකාන්තය ද පෙර සේ උද්ධරනු.) අසංඥතල වාසි පුද්ගලයන් ද භූමි ද මහා විපාක සිත් ප්‍රථම යුගලයෙන් හා රූපාවචර සොමනස්ස විපාක සිත් (4) සතරෙන් ද ඉපද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි චුතවන සුගති අහේතුක ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ කාම සුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ අවක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සය ය, යන මේ භූමි ගනු ලැබෙති.

සද්ධින්ද්‍රිය මූලියෙහි ''පච්ඡිම භවිකානං පඤ්චවොකාරං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සචක්ඛුකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්සවා** පන යත්ථ පඤ්චවොකාරා චවන්තානං අචක්ඛුකානං කාමාවචරං උපපජ්ජන්තානං අරූපානං තෙසං තත්ථ,''

අනුලෝම **සන්නිවධාන ස්වරූපාර්ථ** පශ්චිම භවිකව පඤ්චවෝකාරයෙහි උපදින පුද්ගලයන් හා භූමි, (අනේකාන්තය ද උද්ධරනු.) තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ සචක්ඛුකව අපායෙහි උපදින දුගති අහේතුක පෘථග්ජනයන්ගේ අපාය භූමි (4) සතර ගනු ලැබෙති. (ලැබීමට සුදුසු බැවින් උද්ධරන ලදී. විභංගය නොමැත.)

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සද්ධින්ද්‍රිය ලැබෙන්නා වූ සචක්ඛුකව පඤ්චවෝකාරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතද, වෙහප්ඵලය දක්වා රූපභූමි (10) දශයද ගනු ලැබෙති. **සංසය ස්වරූපය** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සද්ධින්ද්‍රිය ලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය දක්වා රූපාවචර භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සද්ධින්ද්‍රිය ලැබෙන්නා වූ අචක්ඛුකව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක පෘථග්ජනයන්ගේ කාමාවචර භූමි (2) දෙකය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ අරූප භූමියෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර යන මේ භූමි ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපය** "පඤ්චවෝකාරෙ පරිනිබ්බන්තානං අරූපෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤ සත්තානං තෙසං තත්ථ", (පඤ්චවෝකාරයෙහි පරිනිබ්බන්ත - ඒකාන්ත, - අනේකාන්ත භූමි පෙර සේ උදුරනු.) තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සද්ධින්ද්‍රිය නොලැබෙන්නා වූ අචක්ඛුකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (6) සයය, [අරූප පච්ඡිම භවික ඒකාන්ත - අනේකාන්තය ද අසඤ්ඤසත්ත භූමි පුද්ගල ද පෙර සේ උදුරනු. පඤ්ඤින්ද්‍රිය නිමාව දක්වා වෙනසක්නොමැත. මනින්ද්‍රිය මූලිය මනායතනයට වඩා වෙනසක් නැත.]

චක්ඛුන්ද්‍රිය මූලය නිමි.

---

## ඝාණින්ද්‍රිය මූලය

**ඝාණින්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය** මූලියෙහි "පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං ඝානකානං උපපජ්ජන්තානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ කාමාවචරා චවන්තානං, අඝානකානං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ,"

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පච්ඡිම භවික කාමාවචර - ඒකාන්ත - අනේකාන්තයන් පෙර සේ කියනු). පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදී වශයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ ඝානකව කාමාවචරයෙහි උපදින සුගති

අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත ඉත්ථීන්ද්‍රිය නොලැබෙන්නා වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාගේ සහ යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත ඉත්ථීන්ද්‍රිය ලැබෙන්නා වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන සිවුදෙනාගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත ඉත්ථීන්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවු දෙනාගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත අසානකව කාමාවචරව උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පස යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරානං අරූපාවචරානං, යෙ ච පුරිසා එතෙනෙව භාවෙන කතිවි භවෙ දස්සෙතවා පරිනිබ්-බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං තත්ථ," (කාමාවචර පරිනිබ්බන්ත - යනාදිය පෙර සේ උදුරනු.) පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදී වශයෙන ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන, අසානකව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත ඉත්ථීන්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන, අසානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවු දෙනාගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනාගේ කාමභූමි (11) එකොළස යන මෙ භූමි ගනු ලැබෙති.

ඝානින්ද්‍රිය මූල සොමන ස්සින්ද්‍රිය මූලියෙහි "පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, යෙ ච සඝානකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං සඝානකානං උපපජ්ජන්තානං තෙසං න තථ, **යස්ස වා පන යත්ථ** කාමාවචරා චවන්තානං, අඝානකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං තෙසං තත්ථ",

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පච්ඡිම භවික කාමාවචර, ඒකාන්ත-අනේකාන්තයන් පෙර සේ උදුරනු.) තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක ඤාණ විප්‍රයුක්ත යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ සඝානකව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට එලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ සඝානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ සඝානක ව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේම ලැබේ.

පටිලෝම **සන්නිවයාන ස්වරූපාර්ථය** තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සෝමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ අසඝානකව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක පුද්ගලයන්ගේ කාම භූමි (2) දෙකය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත **උපදින්නා** වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය යන මේ භූමි ගනු ලැබෙති. පෙර කියන ලද සංසය ස්වරූප ද ගනු ලැබේ.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ**, ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං, අරූපානං, යෙ ච සඝානකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තේසං තත්ථ'', (කාමාවචර පරිනිබ්බන්ත යනාදිය පෙර සේ උදුරනු.)

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජන හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ වෙහප්ඵල භූමිය, (විභංගයෙහි නැතත් සුදුසු බැවින් උදුරන ලදී.) මහාවිපා ක සිත් තෘතිය යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සෝමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ-හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ අසඝානකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ නිරය වර්ජිත කාමාවචර භූමි (5) පස යන මෙ භූමි ගනු ලැබෙති.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි**, ''පච්ඡිම භවිකානං කාමාවචරං උපපජ්ජන්තානං, යෙ ච සඝානකා සොමනස්සෙන උපපජ්ජන්ත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, කාමාවචරා චවන්තානං, අසඤ්ඤකානං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ''

අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ (පච්ඡිම භවික කාමාවචර - ඒකාන්ත, අනේකාන්තය පෙර සේ උදුරනු.) ත මන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක සිත් ප්‍රථම යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ සසානකව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය,

තමන් ඉපද සිටින භූමියෙහි උපෙක්ඛින්ද්‍රිය මතු නැවත නොලැබෙන්නා වූ සසානකව කාමාවචරයෙ හි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග් ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ සසානකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙර සේ ලැබේ.

පටිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ අසානකව කාමාවචර-යෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ කාමාවචර භූමි (5) පසය,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචර අරූපාවචරයෙහි උපදින චුත වන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාගේ වේහප්ඵල භූමිය, අරූප භූමි (4) සතර යන මේ භූමි ලැබෙති. **පෙර කියන ලද සංසය** ද ලැබේ.

ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං, යෙච සසානකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං තත්ථ,'' (කාමාවචර පරිනිබ්බන්ත රූපාවචර - යනාදිය පෙර සේ උදුරනු.)

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උප දින්නා වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (3) තිදෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය. (විභංගය නැත. සුදුසු නිසා උදුරන ලදි.) අසඤ්ඤසත්ත භූමි පුද්ගලයෝ ය. මහාවිපාක සිත් ප්‍රථම යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක, පෘථග්ජන පුද්ගලයන්ගේ හා යට ඵලස්ථ ආයඝ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලසථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ අසංඥකව කාමාවචරයෙහි උපදින දුගති අහේතුක, සුගති අහේතුක, පෘථග්ජනයන්ගේ කාමාවචර භූමි (5) පස යන මේ භූමි ගනු ලැබෙති. (සද්ධින්ද්‍රිය මූලී යනාදීයෙහි සුගමයි. චක්ඛුන්ද්‍රිය මූලය ආශ්‍රය කොට උදුරනු.)

## ඉත්ථින්ද්‍රිය මූලිය

**ඉත්ථින්ද්‍රිය මූල පුරිසින්ද්‍රිය මූලීයෙහි** '' පච්ඡිම භවිකානං ඉත්ථිනං, උපපජ්ජන්තීනං, යාව ඉත්ථියො එතෙනෙ ච භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තාසං උපපජ්ජන්තීනං තාසං තත්ථ. **යස්ස වාපන යත්ථ** කාමාවචරාවචන්තානං නඉත්ථිනං කාමාවචරං උපපජ්ජන්තානං තෙසං තත්ථ'',

අනුලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ ස්ත්‍රී ආත්මභාවයෙන් පශ්චිමභවික කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනාගේ, කාමසුගති භූමි (7) සතය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, ස්ත්‍රී භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදී වශයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත පුරිසින්ද්‍රිය නොලැබෙන්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස යන මේ භූමි ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත පුරිසින්ද්‍රිය ලැබෙන්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

පටිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත පුරිසින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (1) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත පුරිසින්ද්‍රිය ලැබෙන්නා වූ පුරුෂව හා නපුංසකව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළස ගනු ලැබෙති.

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරානං අරූපාවචරානං, යා ච ඉත්ථියො එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තාසං චවන්තීනං තාසං තත්ථ'' කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන් වහන්සේය, පශ්චිම භවික පුරුෂව උපදින ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනා ය. යන මේ පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ කාමාවචරයෙහි චුතවන, නපුංසකව පුරුෂව කාමාවචරයෙහි උපදින පෘථග්ජන සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම භූමි (11) එකොළසය, රූපාවචර - අපරූපාවචර භූමි පුද්ගලයෝ ය. ස්ත්‍රී භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි චුතවන, නපුංසකව - පුරුෂව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත පුරිසින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන, නපුංසකව පුරුෂව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2)දෙදෙනාගේ කාම භූමි (11) එකොළස යන මේ භූමි ගනු ලැබෙති.

**ජීවිතින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම භවිකානං ඉත්ථීනං උපපජ්ජන්තීනං තාසං තත්ථ, ඉතරාසං ඉත්ථීනං උපපජ්ජන්තීනං තාසං තත්ථ, **යස්ස වා පන යත්ථ** කාමාවචරා චවන්තානං, න ඉත්ථීනං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ'',

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** පශ්චිම භවික ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉප ද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ සහ යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනා ගේ කාමභූමි (11) එකොළස ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. (පටිලෝමයෙහි, ''තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ'' යයි ස්වරූප උදුරනු සුගමයි.)

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ,** ''කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිම භවිකානං තෙසං තත්ථ'' කාමාවචරයෙහි පිරිනිවෙන අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ය. පශ්චිම භවික පුරුෂව උපදින ත්‍රිහේතුක පුද්ගලයෝය. යට ඵලස්ථ ආයසී පුද්ගලයන් 2 දෙදෙනාය, යන මේ පුද්ගලයන්ගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ කාමාවචරයෙහි චුතවන, නපුංසකව - පුරුෂව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයසී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, (සෙස්ස පෙර සේ උදුරනු.)

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි** "පච්ඡිම භවිකානං ඉත්ථීනං උපපජ්ජන්තීනං, යාව ඉත්ථියො උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තාසං උපපජ්ජින්තීනං තාසං තත්ථ, ඉතරාසං ඉත්ථීනං උපපජ්ජින්තීනං තාසං තත්ථ, **යස්ස වා පන යත්ථ** කාමාවචරා චවන්තානං නඉත්ථීනං කාමාවචරං උපපජ්ජන්තානං, රූපාවචරානං තෙසං තත්ථ."

අනුලෝම **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ, [පච්ඡිම භවික ඉත්ථි කාමාවචර උප්පජ්ජන්ත – ඒකාන්ත, අනේකාන්තය පෙර සේ උදූරන්න.] තමන් ඉපද සිටින භූමියෙහි මහා විපාක සිත් තෘතිය යුගලයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ ස්ත්‍රීව [කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සෝමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළසය, යන මේ භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි සෝමනස්සින්ද්‍රිය මතු නැවත ලැබෙන්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ද ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ පෙරසේ ලැබේ.

පටිලෝම **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සෝමනස්සිද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි චුතවන, සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි සෝමනස්සින්ද්‍රිය මතු නැවත ලැබෙන්නා වූ නපුංසකව – පුරුෂව කාමාවචරයෙහි උපදින සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය, යන මේ භූමි ගනු ලැබෙති.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථය** "කාමාවචරෙ පරිනිබ්බන්තානං, රූපාවචරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං අරූපානං, යාව ඉත්ථියො උපෙක්ඛාය උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තාසං චවනන්තිනං තාසං තත්ථ, (කාමාවචරෙ පරිනිබ්බන්ත – යනාදිය පෙරසේ උදූරනු.)

මහාවිපාක සිත් තෘතිය යුගලයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ ස්ත්‍රීව කාමාවචරයෙහි චුතවන, පුරුෂව – නපුංසකව කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාගේ කාම-සුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත

සෝමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ ස්ත්‍රීව කාමාවචරයෙහි චුතවන, පුරුෂව - නපුංසකව කාමාවචරයෙහි උපදින චුතවන, පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයෳී පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළස යන මේ භූමි ගනු ලැබෙති. [උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි ද සොමනස්සින්ද්‍රිය මූලිය ඇසුරු කොට ස්වරූප උදුරන්න. විශේෂයක් නොමැත. සුගමයි. සොමනස්ස උපෙක්ඛා පමණක් මාරු කොට කියන්න. සද්ධින්ද්‍රිය මූලී යනාදියෙහි පූර්වයෙහි නය ක්‍රමය ආශ්‍රය කොට සන්නිට්ඨානයෙහි අපාය හැර ස්වරූප උද්ධරනු පුරිසින්ද්‍රිය මූලය වද මේ ක්‍රමය සමානය]

## ජීවිතින්ද්‍රිය මූලය

**ජීවිතින්ද්‍රිය මූල සොමනස්සින්ද්‍රිය මූලියෙහි**, ''පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පනයත්ථ** චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ.''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** [පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණ සමංගී, ඒකාන්ත - අනේකාන්තය පෙර සේ උද්ධරනු.] උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අන්තිම සෝමනස්ස සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය ත්‍රිහේතුක පුද්ගලයන්ගේ හා ආයෳී පුද්ගලයන් (8) අටදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වේහප්ඵල භූමිය, සුද්ධාවාස භූමි (5) පසය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් උපෙක්ෂා සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන වූ සෝමනස්ස සහගත චිත්තයාගේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ද - අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ හා යට මාර්ගස්ථ ආයෳී පුද්ගලයන් (3) තිදෙනාගේ යට ඵලස්ථ ආයෳී පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර, කාමභූමි (11) එකොළස, වේහප්ඵල භූමිය, සුදස්සි තලය තෙක් සුද්ධාවාස භූමි (4) සතර අසංඥතලයෙහි උපදින පුද්ගලයන් හා භූමිය ද යන මේ භූමි ලැබෙති.

ප්‍රතිසන්ධි සිත් (19) දහනවය, චෛතසික (35) පන්තිස, කර්මජ කලාප (3,7,4) තුන, සත, සතර, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයෳී පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය. පඤ්චවෝකාර භූමි (26) ස විස්සය, ප්‍රවෘත්ති කාලයෙහි සෝමනස්ස

සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වාද, උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අවසාන සෝමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් සොමනස්ස සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්. ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා ද, උපෙක්ෂා සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අවසාන සෝමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ හා යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ තල වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද, පෘථග්ජන (4) සතර දෙනාගේ, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ චුතිසිත් (19) දහනවය, චෛතසික (35) පන්තිස, කර්මජ රූප කලාප (3, 7, 4) තුන - සත - සතර මේ ධර්මයන්ගේ භංගක්ෂණ සමංගී වූ සියලුම චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සතර දෙනාගේ චතුවෝකාර භූමි (4) සතර පඤ්චවෝකාර භූමි 26 සවිස්ස, මේ භූමිගනු ලැබෙති. [ප්‍රවෘත්ති කාලයේ - පෙර සේ කියනු භංගක්ෂණය තිම ම වෙනසයි.]

. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ**, "පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ" [පශ්චිම චිත්තයාගේ භංගක්ෂණ - ඒකාන්ත අනේකාන්තය පෙර සේ කියනු.]

[උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන සෝමනස්ස සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා, භංගක්ෂණ සමංගී යයි කිම පමණක් විශේෂයි.] [අනුලෝමය, අනුලෝම අනුව කියන්න. උපෙක්ඛින්ද්‍රිය මූලිය ද සොමනස්සින්ද්‍රිය මූලිය ඇසුරු කොට කියන්න. විශේෂයක් නැත. පහසු ය.]

සද්ධින්ද්‍රිය මූලි යනාදියෙහි ද ''පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ තෙසං තත්ථ,'' [පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණ - ඒකාන්ත අනේකාන්ත පෙර සේ කියනු සුගමයි.] **ප්‍රත්‍යනීක** සංසය ''පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තා චවන්තානං තෙසං තත්ථ,'' (ස්වරූප සුගමයි.)

## සෞමනස්සින්ද්‍රිය මූලය

**සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** ''සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, ඉතරෙසං සොමනස්සෙන උපපජ්ජන්තානං, පවත්තෙ සොමනස්ස සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ, සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ සොමනස්ස විප්පයුත්ත ,චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ'' [පෙළෙහි චතුවොකාරා පඤ්චවොකාරා චවන්තානං, කියා ඇත.] අනුලෝම **සන්නිධාන ස්වරූපාර්ථ**, සොම නස්ස සම්ප්‍රයුක්ත පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන්ගේ කාමසුගති භූමි (7) සතය. සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ සොමනස්ස චුති සිත් (8) අට දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවයය, සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන උපෙක්ෂා සහගත චිත්තයෙන් පසුව සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයන්ගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපභූමි (9) නවය ය,

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් සෞමනස්ස සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම් අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයෙන් පසු සුදුසු පරිදි උපදින සෞමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍යවූද අභව්‍ය වූද පෘථග්ජනයන්ගේ හා යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූප භූමි (9) නවය, මේ භූමි ගනු ලැබෙති.

සොමනස්ස ප්‍රතිසන්ධි (8) අටය, චෛතසික (35) පන්තිසය, මේ ධර්මයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය. **සුභකිණ්හකය** දක්වා රූපාවචර භූමි (9) නවය, ප්‍රවෘත්ති කාලයෙහි උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද, සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන උපෙක්ෂා සහගත චිත්තයන්ට පූර්වයෙන් සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ, භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය. අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් උපෙක්ෂා සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ ද සොමනස්ස සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පූර්වයෙහි සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද, පෘථග්ජනයන්ගේ හා යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අකනිට්ඨ තලය වර්ජිත පඤ්චවෝකාර භූමි (25) පස් විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම්, සුදුසු පරිදි උපදින සොමනස්ස සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ හා යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද කාමභූමි (11) එකොළස ද වෙහප්ඵල භූමිය දක්වා රූපාවචර භූමි (10) දශය ද ගනු ලැබෙති. සංසය **ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. [පටිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ පුද්ගල වාරයෙහි මෙනි. භූමි බෙද ඒකාන්ත – අනේකාන්ත උදුරනු.]

**ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ**, "සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්ත සමංගීනං යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තස්ස භංගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ," [සෝමනස්ස සම්ප්‍රයුක්ත පශ්චිම චිත්තයන් (6) සදෙනාගේ භංගක්ෂණ යනාදිය ඒකාන්ත අනේකාන්ත පෙර සේ උදුරා දක්වනු].

සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා, සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද, සුඛ, දුක්ඛ, උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ක්ෂණශ්‍රවයන්ගේ කමාසුගති භූමි (7) සතය. සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9)

නවය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ පුද්ගලයන් අතුරෙන් සොමනස්ස සහගත චිත්තයෙන් චුතවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයේ පටන් චුතියට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණ සමංගී වූ ද, සුඛ, දුක්ඛ, දෞමනස්ස, උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ ද, අභව්‍ය වූ ද, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය, අසංඥතල වාසීන්ගේ අසඤ්ඤසත්ව භූමිය යන මේ භූමි ගනු ලැබේති. [සද්ධින්ද්‍රිය මූලි යනාදියෙහි පුද්ගල වාරය අනුව, ඒකාන්ත - අනෛකාන්ත භූමි බෙද ස්වරූප උද්ධරන්න. සුගමයි.]

## උපෙක්ඛින්ද්‍රිය මූලය

**උපෙක්ඛින්ද්‍රිය මූල සද්ධින්ද්‍රිය මූලියෙහි** "උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ, ඉතරෙසං උපෙක්ඛාය උපපජ්ජන්තානං, පවත්තෙ උපෙක්ඛා සම්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ. **යස්ස වා පන යත්ථ** සබ්බෙසං චිත්තස්ස භංගක්ඛණෙ, උපෙක්ඛා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ, තෙසං තත්ථ."

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උපෙක්ෂා සම්ප්‍රයුක්ත පශ්චිම චිත්තයන් (7) සත්දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ අරහත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමසුගති භූමි (7) සතය, වෙහප්ඵලය, සුද්ධාවාස භූමි (5) පසය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ උපෙක්ෂා සහගත චුතිසිත් (11) එකොළොස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ පෘථග්ජන (4) සතර දෙනාගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමභූමි (11) එකොළසය, වේහප්ඵල භූමිය, සුදස්සී තලය දක්වා සුද්ධාවාස භූමි (4) සතරය, යන මේ භූමි ගනු ලැබේති.

උපෙක්ෂා ප්‍රතිසන්ධි (11) එකොළොස් දෙනාගේ උත්පාදක්ෂණ සමංගී වූ පෘථග්ජන සතර දෙනාගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, කාමභූමි (11) එකොළසය, වේහප්ඵල භූමිය, සුද්ධාවාස භූමි (5) පසය. ප්‍රවෘත්ති කාලයෙහි පශ්චිම චිත්තය හැර සුදුසු පරිදි උපදින උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අටදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නූපදින්නා වූ කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුතියගේ පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී නම් වූ භව්‍ය වූ ද - අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය. අකනිට්ඨා තලය හැර පඤ්චවෝකාර භූමි (25) පස්විස්සය.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් චුති චිත්තය දක්වා සුදුසු පරිදි උපදින උපෙක්ෂා සහගත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ භව්‍යවූ ද අභව්‍ය වූ ද පෘථග්ජනයන්ගේ, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතර ද, සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක්විස්ස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේමය. [ප්‍රතිලෝමය සුගමයි, පුද්ගල වාරය ඇසුරු කොට උදුරනු. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ, සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්ත සමංගීනං; අසඤ්ඤසත්තානං තෙසං තත්ථ", [පුද්ගල වාරයට කියන ලද පරිදි එයට වඩා භූමි බෙද ඒ හා සමානව උදුරනු. සෙසු මූල මූලී ක්‍රමය සුවසේ දත හැකිය. පුද්ගල වාරය ඇසුරු කොට කියන්න.]

වර්තමානානාගත වාරය නිමි

---

## අතීතානාගත පුද්ගල වාරය

**අතීතානාගත වාරයෙහි** "යස්ස චක්ඛුන්ද්‍රියං උප්පජ්ජිත්ථ, තස්ස ඉත්ථින්ද්‍රියං උප්පජ්ජිස්සතීති, පච්ඡිම භවිකානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති, යෙ ච පුරිසා එතෙනෙ ච භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං ඉතරෙසං තෙසං **යස්ස වා පන** ආමන්තා" (ප්‍රතිලෝම මුළුල්ලට ම "අමන්තා" යනු පිළිතුර වේ.)

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පශ්චිම භවික යනාදිය පෙර සේ උදුරනු.) පුරුෂ භාවයෙන් ආත්ම භාව එකක් දෙකක් යනාදි වශයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය. රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

මතු නැවත ඉත්ථින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනා ද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීකයෙහි** චනාහි "නත්ථි උප්පජ්ජිත්ථ" යනු ම වේ. පුරිසින්ද්‍රිය මූලිය ද මෙයට සමානය.

**ජීවිතින්ද්‍රිය මූලියෙහි** "පච්ඡිම භවිකානං තෙසං, ඉතරෙසං තෙසං," ධම්මායතනයෙහි මෙන් උදුරනු. **සොමනස්සින්ද්‍රිය** මූලියෙහි පච්ඡිම භවිකානං, යෙ ච උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං" අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පශ්චිම භවිකයා පෙර සේ කියනු.) මහාවිපාක සිත් නාතිය යුගලයෙන් හා මහග්ගත විපාක උපෙක්ෂා සහගත සිත් (5) පසෙන් ඉපද

පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාය. යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය. අසඤ්ඤසත්ත අරූප තලයන්හි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය. මේ පුද්ගලයෝ ගනු ලැබෙති. මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ **පඤ්චවෝකාරයෙහි** උපදින චුතවන පෘථග්ජන (4) සතර දනාය. යට එලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනාය. **අසඤ්ඤසත්ත**, අරූප තලයන්හි උපදින චුතවන සුගති අහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයෝ යන මේ පුද්ගලයයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ.

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි**, ''පච්ඡිම භවිකානං, යෙ ච සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං, ඉතරෙසං තෙසං'' [සොමනස්සින්ද්‍රිය ඇසුරු කොට උදුරනු. නය ක්‍රමය සමානය. සද්ධින්ද්‍රිය ඇදි කොට ඇත්තා වූ මූලියන්හි ජීවිතින්ද්‍රිය මෙනි. පුරිසින්ද්‍රිය මූලය දක්වාම මෙසේය.]

**ජීවිතින්ද්‍රිය මූල සොමනස්සින්ද්‍රිය මූලියෙහි**, ''පච්ඡිම චිත්ත සමංගීනං යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං ඉතරෙසං තෙසං''

පශ්චිම චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී නම් වූ අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය. උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, අවසාන වූ සෞමනස්ස සහගත චිත්තයාගේ පටන් පශ්චිම චිත්තයට පූර්වානන්තර චිත්තය දක්වා සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයෝ ය. ආයති පුද්ගලයන් (8) අට දෙනා ය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. (සංසය චනාගි අනාගත වාරය මෙන් උදුරන්න.)

**උපෙක්ඛින්ද්‍රිය** මූලියෙහි ''පච්ඡිම චිත්ත සමංගීනං, යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං ඉතරෙසං තෙසං'' (නය ක්‍රමය සමානව උදුරනු.) **සද්ධින්ද්‍රිය මූලි යනාදියෙහි** ''පච්ඡිම චිත්ත සමංගීනං තෙසං ඉතරෙසං තෙසං,'' (අනාගත වාරය අනුසාරයෙන් උදුරනු.)

පුද්ගල වාරය නිමි. (ඕකාස වාරය සුගමයි.)

## පුද්ගලෝකාසවාර චක්ඛුමූලය

**චක්ඛුන්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි**, ''කාමාවචරෙ පච්ඡිම භවිකානං, රූපාවචරානං, යෙච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** ආමන්තා''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පශ්චිම භවික කාමාවචර ඒකාන්ත - අනේකාන්තය පෙර සේ උදුරනු). රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා එලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (4) සිවු දෙනාගේ වේහප්ඵල භූමිය දක්වා රූපාවචර භූමි (10) දශය, තමන් ඉපද සිටින භූමියෙහිම මතු නැවත පුරුෂ භාවයෙන් ආත්මභාව එකක් දෙකක් යනාදීන් ඉපිද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය.

තමන් ඉපද සිටින භූමියෙහි ඉත්ථින්ද්‍රිය මතු නැවත නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සිවුදෙනාගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස යන මේ භූමි ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත ඉත්ථින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** "සුද්ධාවාසානං අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ" [පෙර සේ උදුරනු පුරිසින්ද්‍රිය මූලියද සමානය, ජීවිතින්ද්‍රිය මූලිය ධම්මායතනය මෙනි.]

**සෝමනස්සින්ද්‍රිය මූලියෙහි**, "පඤ්චවොකාරෙ පච්ඡිම භවිකානං, යෙ ච සචක්ඛුකා උපෙක්ඛාය උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ **යස්ස වා පන යත්ථ** ආමන්තා" අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, [පඤ්චවෝකාර පශ්චිම භවික ඒකාන්ත අනේකාන්තයන් සුද්ධාවාස අඩුකොට පෙර සේ උදුරනු.]

තමන් ඉපද සිටින භූමියෙහි මහා විපාක සිත් ඥානිය යුගලයෙන් හෝ රූපාවචර පඤ්චම ධ්‍යාන විපාක චිත්තයෙන් හෝ ඉපද පිරිනිවීමට නියත වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, වේහප්ඵල භූමිය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළස, වේහප්ඵලභූමිය යන මේ භූමි ගනු ලැබෙති..

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ "සුද්ධාවාසානං, අසඤ්ඤසත්තානං අරූපානං තෙසං තත්ථ",

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි**, ''පඤ්චවොකාරෙ පච්ඡිමභවිකානං, යෙ ච සචක්ඛුකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ ඉතරෙසං පඤ්චවොකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, අරූපානං තෙසං තත්ථ'' අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, [පඤ්චවොකාර පච්ඡිම භවික, ඒකාන්ත – අනේකාන්ත සුද්ධාවාසය හැරයි.]

තමන් ඉපද සිටින භූමියෙහි මහා විපාක සිත් ප්‍රථම යුගලයෙන් ද රූපාවචර විපාක සෝමනස්ස සහගත චිත්තයෙන් ද ඉපද පිරිනිවීමට නියත වූ, (පෙර සේ කියනු.) තමන් ඉපද සිටින භූමියෙහි උපෙක්ඛින්ද්‍රිය මතු නැවත නොලැබෙන්නාවූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමසුගති භූමි (7) සතය, සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය යන භූමි ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි උපෙක්ඛින්ද්‍රිය මතු නැවත ලැබෙන්නා වූ පඤ්චවෝකාරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ සහ යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ කාමභූමි (11) එකොළස ද, වේහප්ඵලභූමිය ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ.

ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ, තමන් ඉපද සිටින භූමියෙහි උපෙක්ඛින්ද්‍රිය මතු නැවත ලැබෙන්නා වූ අරූප භූමියෙහි උපදින – චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනාගේ අරූප භූමි (4) සතර ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංසය ස්වරූප ''සුද්ධාවාසානං, අරූපෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ'' (සද්ධින්ද්‍රිය මූලි යනාදියෙහි මනායතනය මෙන් ස්වරූප කියනු සන්නිට්ඨානයට අපාය ඇතුලත් කොට උදුරනු. වෙනස මෙපමණකි.)

## සංඥින්ද්‍රිය මූලය

**සාතින්ද්‍රිය මූල ඉත්ථින්ද්‍රිය මූලියෙහි**, ''කාමාවචරෙ පච්ඡිමභවිකානං, යෙච පුරිසා එතෙනෙව භාවෙන කතිචි භවෙ දස්සෙත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ,'' (සුගමයි) **ප්‍රත්‍යනීක සංසය ස්වරූපය** ''රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ'',

**සොමනස්සින්ද්‍රිය මූලියෙහි** ''කාමාවචරෙ පච්ඡිමභවිකානං, යෙ ච සඝානකා උපෙක්ඛාය උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, රූපාවචරානං තෙසං තත්ථ,'' —

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** (පශ්චිම භවික කාමාවචර - ඒකාන්ත, අනේකාන්තයන් පෙර සේ උදුරනු). තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක සිත් තෘතිය යුගලයෙන් ඉපද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමභූමි (11) එකොළස, යන මේ භූමි ගනු ලැබෙති.

තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත සොමනස්සින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ.

**ප්‍රතිලෝමයෙහි** - තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ' "රූපාවචරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤසත්තානං, අරූපානං තෙසං තත්ථ".

**උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි**, "කාමාවචරෙ පච්ඡිම භවිකානං, යෙ ච සසානකා සොමනස්සෙන උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං තත්ථ, ඉතරෙසං කාමාවචරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** - රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ" අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - (කාමාවචර පශ්චිම භවිකයා පෙර සේ උදුරන්න.) තමන් ඉපද සිටින භූමියෙහි මහාවිපාක සිත් ප්‍රථම පුගලයෙන් ඉපිද පිරිනිවීමට නියත වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක, ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (2) දෙදෙනාගේ කාමසුගති භූමි (7) සතය, තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපේක්ඛින්ද්‍රිය නොලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන සුගති අහේතුක, ද්විහේතුක ත්‍රිහේතුක පෘථග්ජනයන් ගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් දෙදෙනාගේ කාමසුගති භූමි (7) සත ගනු ලැබෙති. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපෙක්ඛින්ද්‍රිය ලැබෙන්නා වූ කාමාවචරයෙහි උපදින චුතවන පෘථග්ජන (4) සතර දෙනාගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් දෙදෙනාගේ කාමභූමි (11) එකොළස ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ.

**ප්‍රතිලෝමයෙහි** - තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචර අරූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞී පුද්ගලයන් (3) තිදෙනාගේ වේහප්ඵල භූමිය හා අරූප භූමි (4) සතර ගනු ලැබෙති. ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ- "රූපාවචරෙ පච්ඡිම භවිකානං, අසඤ්ඤ-

සත්තානං තෙසං තත්ථ''. [රූපාවචර අරූපාවචර පශ්චිම භවික ඒකාන්ත අනෛකාන්තයන් පෙර සේ උදුරනු.] තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ රූපාවචරයෙහි උපදින චුතවන ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාගේ සුභකිණ්හකය දක්වා රූපාවචර භූමි (9) නවය, අසඤ්ඤසත්ත භූමි පුද්ගලයන් ගනු ලැබෙති. [සද්ධින්ද්‍රිය මූලි යනාදියෙහි සුගමයි ඉත්ථින්ද්‍රිය මූල යනාදියෙහි ද සාහින්ද්‍රිය මූලයට සමානය.]

## ජීවිතින්ද්‍රිය මූලය

**ජීවිතින්ද්‍රිය මූල සොමනස්සින්ද්‍රිය** මූලියෙහි ''පච්ඡිම චිත්ත සමංගිනං, යස්ස චිත්තස්ස අනන්තරා උපෙක්ඛා සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන** යත්ථ – සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ'', —

අනුලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** [ත්‍රිහේතුක චුති (13) තෙළෙස, -එප- ඒකාන්ත අනෛකාන්තයන් පෙර සේ උදුරනු. සෙස්ස අනාගතය මෙනි.] ඉතරෙසං යනු තැන, සොමනස්ස සහගත චිත්තයෙන් පිරිනිවීම නියත කොට ඇති කෙනෙක් වේ නම් ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන් අතුරෙන් සුද්ධාවාසය වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් අවසාන වූ සොමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, අවසෙස චතුවෝකාර පඤ්චවෝකාරයෙහි වේ නම් ප්‍රතිසන්ධියේ පටන් අවසාන සොමනස්ස සහගත චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් [3] තිදෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත නුපදින්නා වූ – පෙ – අනෛකාන්තය. (ප්‍රත්‍යනීක සංසය නොමැත. පාළි ගති පමණි. උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි ද අනාගත වාරය අනුසාරයෙන් සමානව උදුරනු.) **සද්ධින්ද්‍රිය** මූලි යනාදියෙහි ''පච්ඡිම චිත්ත සමංගිනං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ** — සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ'' **ප්‍රත්‍යනීක සංසය** නොමැත. පාළි ගති පමණි.

## සොමනස්සින්ද්‍රිය මූලය

**සොමනස්සින්ද්‍රිය මූල උපෙක්ඛින්ද්‍රිය මූලියෙහි** ''පච්ඡිම චිත්ත සමංගිනං, යස්ස චිත්තස්ස අනන්තරා සොමනස්ස සම්පයුත්ත පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං තත්ථ, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ, යස්ස වා පන යත්ථ සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ'', අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ – පෙර සේ උදුරනු. ඉතරෙසං යන තැන, සොමනස්ස-

සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් අවසාන වූ උපෙක්ෂා සහගත චිත්තයාට පූර්වානන්තර චිත්තය දක්වා ද, උපෙක්ෂා සහගත චිත්තයෙන් පිරිනිවීමට නියත වූ පුද්ගලයන් අතුරෙන් සුද්ධාවාසය වේ නම්, සියල්ලට ප්‍රථම සොමනස්ස සහගත ද්‍විතිය ජවනයාගේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, අවශේෂ චතුවෝකාර පඤ්චවෝකාරයෙහි වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තරය දක්වා ද සූදුසු පරිදි උපදින චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජනයන්ගේ හා ආර්‍ය්‍ය පුද්ගලයන් (8) අට දෙනාගේ චතුවෝකාර භූමි (4) සතරය, අපාය වර්ජිත පඤ්චවෝකාර භූමි (22) දෙවිස්සය, [අනන්තානන්තය නය සූමියට සමානව උදුරනු. තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා උදුරනු. ප්‍රතිලෝමය පෙර සේ උදුරනු.] **ප්‍රත්‍යනීක සංසය** ස්වරූපාර්ථ "අසඤ්ඤසත්තානං තෙසං තත්ථ".

## උපෙක්ඛින්ද්‍රිය මූලය

**උපෙක්ඛින්ද්‍රිය මූල සද්ධින්ද්‍රිය මූලි යනාදියෙහි** "පච්ඡිම චිත්ත සමංගීනං තෙසං තත්ථ ඉතරෙසං චතුවෝකාරානං පඤ්චවෝකාරානං තෙසං තත්ථ, **යස්ස වා පන යත්ථ**, -සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ, **සංසයෙහි** සුද්ධාවාසයෙහි වේ නම්, ප්‍රතිසන්ධියෙන් පසු ප්‍රථම භවංගයේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද, අවසේස චතුවෝකාර පඤ්චවෝකාරයෙහි වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් පශ්චිම චිත්තයාගේ පූර්වානන්තර චිත්තය දක්වා ද – පෙ – (අනන්තාන්තයෙහි ද මෙසේම කියනු.) තමන් ඉපද සිටින භූමියෙහි මතු නැවත උපදින්නා වූ කෙනෙක් වේ නම්, ප්‍රතිසන්ධියේ පටන් චුතිය දක්වා සූදුසු පරිදි උපදින චිත්තයන්ගේ – පෙ – චතුවෝකාර භූමි (4) සතර ද සුද්ධාවාස වර්ජිත පඤ්චවෝකාර භූමි (21) එක් විස්ස ද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක සංසය** ස්වරූපාර්ථ – "අසඤ්ඤසත්තානං තෙසං තත්ථ" (සද්ධින්ද්‍රිය මූල යනාදියෙහි ද මෙයට සමානය. විශේෂයෙක් නොමැත.)

අතීතානාගත වාරය නිමි. උත්පාද වාරය නිමි.

## නිරෝධ වාරය

නිරොධ වාර – උත්පාද නිරොධ වාරයන් පිළිබඳ පෙළෙහි නැත. උත්පාදයෙහි කියන ලද නය ක්‍රමය යට යමකයන්හි කියන ලද නය ක්‍රමයන්ගේ අනුසාරයෙන් කීමටත් දැන ගැනීමටත් හැකි බැවින් පෙළෙහි නොදක්වන ලදී. පෙළෙහි නැතත් යට කියන ලද නය ක්‍රමය ඇසුරු කොට උගත යුතුය. ග්‍රන්ථය දික්වන බැවින් නොලියන ලදී. ප්‍රවෘත්ති වාරය නිමි.

## පරිඥා වාරය

# වර්තමානය

ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පරිඥා වාරය වදළ සේක. ඒ පරිඥා වාරය ද වර්තමාන වාර, අතීත වාර, අනාගත වාර, වර්තමානාතීත වාර, වර්තමානානාගත වාර, අතීතානාගත වාර වශයෙන් සවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් වර්තමාන වාරය පළමු කොට වදළ සේක. **කෙසේ වදළ සේක්ද** යත්, ''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො සොතින්ද්‍රියං පරිජානාතීති, ආමන්තා, **යො වා පන** ආමන්තා.'' අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ – අර්හත් මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. [සොත – ඝාන – ජිව්හා – කාය – **ඉත්ථින්ද්‍රිය** – පුරිසින්ද්‍රිය – ජීවිතින්ද්‍රිය – සුඛ – දුක්ඛ – සොමනස්ස – උපෙක්ඛා සද්ධා – විරිය – සති – සමාධි – පඤ්ඤා – නෙ මේ ඉන්ද්‍රියයෝ ද සමානම ය. අර්හත් මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ ම ගනු ලැබෙති.] ප්‍රත්‍යනිකයෙහි ''ආමන්තා'' යනු ම ය. **ස්වරූපාර්ථ** පෘථග්ජනයා හා අර්හත් මාර්ගස්ථයා හැර සෙසු ආර්‍ය පුද්ගලයන් (7) සත් දෙනා ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො දෝමනස්සින්ද්‍රියං පජහතීති, නො, **යො වා පන** –නො, ''පටිලෝමයෙහි දෙමනස්සින්ද්‍රියං පජහති – යන **සන්නිට්ඨානයෙහි** ස්වරූපාර්ථ – අනාගාමී මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. **ප්‍රත්‍යනිකයෙහි** – ''ද්වෙ මග්ග සමංගිනො ඨපෙත්වා අවසෙසා පුග්ගලා'' පෘථග්ජනයා හා අනාගාමී මාර්ගස්ථ – අර්හත් මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයන් හැර සෙසු ආර්‍ය පුද්ගලයන් (6) සදෙනා ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙතීති නො යො වා පන – නො'' පටිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ– සෝතාපත්ති මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. **ප්‍රත්‍යනිකයෙහි** – ''ද්වෙමග්ග සමංගිනො ඨපෙත්වා අවසෙසා පුග්ගලා'' පෘථග්ජනයාය, සෝතාපත්ති මාර්ගස්ථ – අර්හත් මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයන් හැර සෙසු ආර්‍ය පුද්ගලයන් (6) සදෙන ලැබෙති. ''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති. සො අඤ්ඤින්ද්‍රියං භාවෙතීති, ආමන්තා **යො වා පන** – ආමන්තා,'' අර්හත් මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති.

[ද්වෙ මග්ග සමංගිනො අඤ්ඤින්ද්‍රියං භාවෙන්ති පෙළෙහි ඇත. මෙහි අග්ගමග්ග සමග්ගී යයි ගන්නා ලදී. ද්වෙ යනුවෙන් සකෘදාගාමී - අනාගාමී මාර්ගස්ථ දෙදෙනා ගැනෙති. ආචාර්‍ය පාදයෝ වනාහි - පරිඤ්ඤා යනුවෙන් උපරිම අර්ථය කියා ඇති බැවින් අර්හත් මාර්ගස්ථයාම ගැනීම සුදුසු වේ නු යි ආමන්තා - කියා ප්‍රතිවචන දීමට උගන්වති.]

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති - සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරෙ‍ාතීති. නො- **යො වා පන** - නො.'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ අර්හත් මාර්ගානන්තර ඵලයෙන් යුක්ත වූ අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයෝ ගනු ලැබෙති. **ප්‍රත්‍යනික ස්වරූපාර්ථ** - පෘථග්ජනයාය, අර්හත් මාර්ගස්ථ - අර්හත් මාර්ගානන්තර ඵලයෙන් යුක්ත වූ අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයන් හැර ආයතී පුද්ගලයන් (7) සත් දෙනා ලැබෙති.

''යො දොමනස්සින්ද්‍රියං පජහති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙතීති, නො - යො වා පන - නො,'' අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - සෝතාපත්ති මාර්ගස්ථ ආයතී පුද්ගලයෝ ගනු ලැබෙති. **ප්‍රත්‍යනික ස්වරූපාර්ථ** පෘථග්ජනයාය, සෝතාපත්ති මාර්ගස්ථ, අනාගාමී මාර්ගස්ථ ආයතී පුද්ගලයන් වර්ජිත සෙසු ආයතී පුද්ගලයන් (6) සදෙන ගනු ලැබෙති.

[පෙළෙහි, ''ද්වෙමග්ග සමංගිනො ඨපෙත්වා අවසේසා'' යනාදිය ඇත. ආචාර්‍ය්‍ය පාදයෝ වනාහි, ''සත්ත පුග්ගලා - අට්ඨ පුග්ගලා'' යනාදි වශයෙන් පෙළ උගන්වති. අර්හත් මාර්ගස්ථ දෙදෙනෙක් ගනු ලබන බැවින්, ''අග්ගමග්ග සමංගිඤ්ච අරහන්තඤ්ච ඨපෙත්වා'' යයි කී බැවින් අවසෙසා යන තැනට රහතන් වහන්සේලා ඇතුලත් නොවෙති. සංඛ්‍යාව කී බැවින් අර්හත් මාර්ගානන්තර ඵලයෙන් යුක්ත වූ අර්හත් ඵලස්ථයා හැර ගනු ලබන බැවින් සංඛ්‍යාව රුචි කරන ලදී. සෙස්ස සුවසේ දත හැකිය.]

වර්තමාන වාරය නිමි

---

## අතීත වාරය

**අතීත වාරයෙහි** ''යො චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො දොමනස්සින්ද්‍රියං පජහිත්ථාති, ආමන්තා, **යො වා පන** ද්වෙ - පුග්ගලා දොමනස්සින්ද්‍රියං පජහිත්ථ, නො ච තෙ චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, අරහා දොමනස්සින්ද්‍රියඤ්ච පජහිත්ථ, චක්ඛුන්ද්‍රියඤ්ච පරිජානිත්ථ.''

පටිලෝම **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ, අනාගාමී ඵලස්ථ - අර්හත් මාර්ගස්ථ ආයතී පුද්ගලයන් දෙදෙන ගනු ලැබෙති. අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ද ගනු ලැබෙති. **ප්‍රත්‍යනික සංසය ස්වරූප** ''ඡ පුග්ගලා'' පෘථග්ජනයාය, යට මාර්ගස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය. යට ඵලස්ථ ආයතී පුද්ගලයන් (2) දෙදෙනාය, අනාගාමී මාර්ගස්ථ ආයතී පුද්ගලයාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථාති ආමන්තා යො වා පන - ඡ පුග්ගලා - අරහා'' ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** සෝතාපත්ති මාර්ගස්ථ - අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයන් දෙදෙන හැර සෙසු ආයතී පුද්ගලයන් (6) සදෙන ගනු ලැබෙති. අර්හත් ඵලස්ථ ආයතී පුද්ගලයෝ ද ගනු ලැබෙති. ප්‍රත්‍යනිකයෙහි - ''ද්වෙ පුග්ගලා - ස්වරූපාර්ථ පෘථග්ජනයා හා සෝතාපත්ති මාර්ගස්ථආයතී පුද්ගලයා යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථාති, ආමන්තා යො වා පන – ආමන්තා,'' – අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. **ප්‍රත්‍යනීකයෙහි** – ''ආමන්තා'' පෘථග්ජනයා සහ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා හැර සෙසු ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත් දෙනා ගනු ලැබෙති.

යො චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිත්ථාති, යො අග්ගඵලං සච්ඡිකරොති, සො චක්ඛුන්ද්‍රියං – පෙ – යො අග්ගඵලං සච්ඡාකාසි **යො වා පන** ආමන්තා'' යො – යම් ආර්‍ය්‍ය පුද්ගලයෙක්, අග්ගඵලං – අර්හත් ඵලය, සච්ඡිකරොති, – ප්‍රත්‍යක්ෂ කරයි ද, – පෙ – සච්ඡාකාසි, – ප්‍රත්‍යක්ෂ කෙළේවේද– අනුලෝම **සන්නිට්ඨාන** ස්වරූපාර්ථ – අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් යුක්ත වූ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විත වූ අර්හත් ඵලස්ථයා හැර, අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක සංසය ස්රූපාර්ථය** – ''අට්ඨ පුග්ගලා'' පෘථග්ජනයාය, අර්හත් ඵලස්ථයා හැර සෙසු ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත් දෙනාය යන පුද්ගලයන් අට දෙනා ලැබෙති.

''යො දෝමනස්සින්ද්‍රියං පජහිත්ථ, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථාති, ආමන්තා, යො වා පන චත්තාරො පුග්ගලා – තයො පුග්ගලා''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - අනාගාමි ඵලස්ථ - අර්හත් මාර්ගස්ථ - අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. ''**යො** දෙමනස්සින්ද්‍රියං පජහිත්ථ, සො අඤ්ඤින්ද්‍රියං - පෙ - දේව පුග්ගලා - අරහා - **යො වා පන** - ආමන්තා'' **ස්වරූපාර්ථ චක්ඛුන්ද්‍රියෙහි** මෙනි. ''යො දෙමනස්සින්ද්‍රියං පජහිත්ථ, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිත්ථාති. තයො පුග්ගලා - යො අග්ගඵලං සච්ඡාකාසි (පෙළෙහි අරහා - කියා ඇත.) **යො වා පන** – ආමන්තා,''

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අනාගාමි ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ, අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්නාගත අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමනවිත අර්හත් ඵලස්ථයා හැර කෂීණාශ්‍රවයෝ ද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීක ස්වරූපාර්ථ** - ''ජ පුග්ගලා – යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතිනද්‍රියං භාවිත්ථ, සො අඤ්ඤදින්ද්‍රියං භාවිත්ථාති, ජ පුග්ගලා, අරහා – **යො වා පන** ආමන්තා'',

අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** – සොතාපත්ති මාර්ගස්ථ අර්හත් ඵලස්ථයන් හැර සෙසු ආර්‍ය්‍ය පුද්ගලයන් (1) සදෙනා ලැබෙති. ක්ෂීණාශ්‍රවයෝ ද ගනු ලැබෙති. **ප්‍රත්‍යනීකය** ''දේව පුග්ගලා'' පෘථග්ජනයා හා සෝතාපතති මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථ. සො අඤ්ඤා තාවින්ද්‍රියං සච්ඡිකරිත්ථාති, සත්ත පුග්ගලා – අරහා, [යො අග්ගඵලං

සච්ඡිකාසි, අරහා - යනුවෙන් පෙළෙහි ඇත.] **යො වා පන** ආමන්තා, ''සෝතාපත්ති මාර්ගස්ථයා හැර උඩ මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ය. අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයාය. මෙ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයා හැර සෙසු අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ද ලැබෙති. **ප්‍රත්‍යනිකය** ''ද්වෙ පුග්ගලා'' පෘථග්ජනයා සහ සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. අඤ්ඤින්ද්‍රිය මූලය ද චක්ඛුන්ද්‍රිය මූලය මෙනි.

අතීත වාරය නිමි

---

## අනාගත වාරය

**අනාගත වාරයෙහි** - ''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිස්සති සො දෙමනස්සින්ද්‍රියං පජහිස්සතීති, ද්වෙ පුග්ගලා, පඤ්ච පුග්ගලා **යො වා පන** - ආමන්තා, ''අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ අනාගාමී මාර්ගස්ථ, අනාගාමී ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. භව්‍ය පෘථග්ජනයෝ ද යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා ද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනා ද ගනු ලැබෙති.

**ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''තයො පුග්ගලා'' අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝය, අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. ''යො චක්ඛුන්ද්‍රියං පරිජානිස්සති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිස්සතීති, ජ පුග්ගලා, යෙ පුථුජ්ජනා මග්ගං පටිලභිස්සන්ති, **යො වා පන** ආමන්තා.''

අනුලෝම සන්නිට්ඨාන, **ස්වරූපාර්ථ** - යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා හා යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති. භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. ප්‍රත්‍යනික ස්වරූප - ''තයො පුග්ගලා'' අභව්‍ය පෘථග්ජනයන් හා අර්හත් මාර්ගස්ථ - අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. [අඤ්ඤින්ද්‍රිය සමානමය] ''යො චක්ඛුන්ද්‍රියං පරිජානිස්සති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති ආමන්තා, **යො වා පන**- අග්ගමග්ග - සමංගී - සත්ත -පුග්ගලා **ප්‍රත්‍යනිකයෙහි**, ද්වෙ පුග්ගලා - **යො** දෙමනස්සින්ද්‍රියං පජහිස්සති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිස්සතීති, චත්තාරො පුග්ගලා යෙ පුථුජ්ජනා මග්ගං පටිලභිස්සන්ති, **යො වා පන** - ආමන්තා''

අනුලෝම සන්නිට්ඨාන **ස්වරූපාර්ථ** -යට මාර්ගස්ථ (2) දෙදෙනා යට ඵලස්ථ (2) දෙදෙනා ගනු ලැබෙති. භව්‍ය පෘථග්ජනයෝ ද ගනු ලැබෙති. - **ප්‍රත්‍යනිකයෙහි** ''පඤ්ච පුග්ගලා'' අභව්‍ය පෘථග්ජනයෝ ය. උඩ මාර්ගස්ථ දෙදෙනාය, උඩ ඵලස්ථ දෙදෙනාය. මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [අඤ්ඤින්ද්‍රිය චක්ඛුන්ද්‍රිය මෙනි.] ''යො දෙමනස්සින්ද්‍රියං පජහිස්සති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති ආමන්තා, **යො වා පන** තයො පුග්ගලා - පඤ්ච පුග්ගලා ''

පටිලෝම සන්නිට්ඨාන. ස්වරූපාර්ථ - අනාගාමි මාර්ගස්ථ - අනාගාමි ඵලස්ථ - අර්හත් මාර්ගස්ථ ආයූ පුද්ගලයෝ ලැබෙති. භව්‍ය පෘථග්ජනයෝ ද යට මාර්ගස්ථ දෙදෙනා ද යට ඵලස්ථ දෙදෙනා ද ගනු ලැබෙති. ප්‍රත්‍යනිකයෙහි - ''ද්වෙ පුග්ගලා'' අභව්‍ය පෘථග්ජනයා හා අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයෝ ගනු ලැබෙති. ''යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙස්සති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති. ආමන්තා. යො වා පන සත්ත පුග්ගලා - යෙ පුථුජ්ජනා මග්ගං පටිලභිස්සන්ති.''

පටිලෝමයෙහි සන්නිට්ඨාන ස්වරූපාර්ථ - අර්හත් ඵලස්ථයන් වර්ජිත ආයූ පුද්ගලයන් (7) සත් දෙනා ලැබෙති. භව්‍ය පෘථග්ජනයා ද ගනු ලැබෙ. ප්‍රත්‍යනික යෙහි ''ද්වෙ පුග්ගලා'' අභව්‍ය පෘථග්ජනයා හා අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයෝ ගනු ලැබෙති. (අඤ්ඤින්ද්‍රිය මූලය චක්ඛුන්ද්‍රිය මූලයට සමානමය.)

අනාගත වාරය නිමි.

---

## වර්තමානාතීත වාරය

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො දොමනස්සින්ද්‍රියං පජහිත්ථාති, ආමන්තා. යො වා පන - ද්වෙ පුග්ගලා, අග්ග මග්ග සමංගී,'' පටිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ - අනාගාමි ඵලස්ථ, අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගස්ථ ආයූ පුද්ගලයෝ ද ගනු ලැබෙති. ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ - ''ඡ පුග්ගලා'' - පෘථග්ජනයාය, යට මාර්ගස්ථ ආයූ පුද්ගලයන් තිදෙනා ය. යට ඵලස්ථ ආයූ පුද්ගලයන් (2) දෙදෙනාය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථාති, ආමන්තා, යො වා පන ඡ පුග්ගලා, අග්ගමග්ග සමංගී,'' පටිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ - අර්හත් මාර්ගස්ථ - සෝතාපත්ති මාර්ගස්ථයන් හැර සෙසු ආයූ පුද්ගලයන් (6) සදෙන ගනු ලැබෙති. අර්හත් මාර්ගස්ථ ආයූ පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබෙ. [ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ- ''ද්වෙ පුග්ගලා'' පෘථග්ජනයා හා සෝතාපත්ති මාර්ගස්ථ ආයූ පුද්ගලයෝ ගනු ලැබෙති. අවශේෂ වාරයන්හි ස්වරූපාර්ථ වර්තමාන වාර, අතීතවාර, අනාගත වාරයන්ගේ අනුසාරයෙන් ලැබෙන පරිදි සුදුසු සේ කියන්න.]

පරිඤ්ඤා වාරය නිමි.

ඉන්ද්‍රිය යමක ස්වරූපාර්ථ සමාප්තයි.
මෙසේ දශවිධ යමක ස්වරූප විභාගය නිමියේ වේ.

# යමක ගණ්ඨි පද ශෝධන 1

## ඉන්ද්‍රිය යමක පරිඤ්ඤ වාරය

### වර්තමාන චක්ඛුන්ද්‍රිය මූලය

ප්‍රවෘත්ති වාරය දේශනා කොට වදරා ඉන් අනතුරුව පරිඤ්ඤා වාරය වදළ සේක. ඒ පරිඤ්ඤා වාරය ද වර්තමාන වාර, අතීත වාර, අනාගත වාර, වර්තමානාතීත වාර, වර්තමානානාගත වාර අතීතානාගත වාර වශයෙන් සවැදෑරුම් වන්නේය. ඒ සය අතුරෙන් **වර්තමාන වාරය** පළමු කොට වදළ සේක, - පෙ- කෙසේ වදළ සේක් ද යත්, ''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො සොතින්ද්‍රියං පරිජානාතීති, ආමන්තා, **යො වා පන** - ආමන්තා,''

අනුලෝම **සන්නිවඨාන ස්වරූපාර්ථ** - අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. සංසය ද එසේය. ප්‍රතිලෝමයෙහිද එසේමැයි. ප්‍රත්‍යනිකයෙහි - **''ආමන්තා''** ස්වරූපාර්ථ - පෘථග්ජනයෝය, අර්හත් මාර්ගස්ථ වර්ජිත සෙසු ආයඞ් පුද්ගලයන් (7) සත්දෙන යන මොවුහු ලැබෙති. (මෙසේ දෙමනස්සින්ද්‍රිය වර්ජිත ඉතිරි ලෞකික ඉන්ද්‍රියයන් (17) සතළොස ස්කන්ධ යමක පරිඤ්ඤාවාරයට සමානව කියන්න.)

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති සො දෙමනස්සින්ද්‍රියං පජහතීති නො, **යො වා පන** නො,'' අනුලෝම **සන්නිවඨාන ස්වරූපාර්ථ** අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූප** නොමැත. පටිලෝම **සන්නිවඨානයෙහි ස්වරූපාර්ථ** - අනාගාමි මාර්ගස්ථ .ආයඞ් පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූප** නොමැත. **ප්‍රත්‍යනික සංසය ස්වරූප** ''ද්වෙ මග්ග සමංගිනො ඨපෙත්වා අවසේසා පුග්ගලා'' **ස්වරූපාර්ථ** - පෘථග්ජනයෝය. අනාගාමි මාර්ගස්ථ - අර්හත් මාර්ගස්ථ දෙදෙනා හැර සෙසු ආයඞ් පුද්ගලයන් (6) සදෙනා යන මොවුහු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙතීති නො, **යො වා පන** නො, අනුලෝම **සන්නිවඨාන ස්වරූපාර්ථ** - අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයො ගනු ලැබෙති. සංසය ස්වරූපාර්ථ නොමැත. ප්‍රතිලෝම **සන්නිවඨාන ස්වරූපාර්ථ** සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** නොමැත. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''ද්වෙ මග්ග සමංගිනො ඨපෙත්වා අවසේසා පුග්ගලා.'' **ස්වරූපාර්ථ** - පෘථග්ජනයෝය, සොතාපත්ති මාර්ගස්ථ - අර්හත් මාර්ගස්ථ දෙදෙනා වර්ජිත සෙසු ආයඞ් පුද්ගලයන් (6) සදෙන ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙතීති, ආමන්තා, **යො වා පන**-ද්වෙ මග්ග සමංගිනො, අග්ගමග්ග සමංගී.'' අනුලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ** - අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ද එසේම ලැබේ. ප්‍රතිලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ** - සකෘදාගාමි මාර්ගස්ථ - අනාගාමි මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙන ගනු ලැබෙති. අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයාද ගනු ලැබේ. සංසය ස්වරූප පෙර සේ මැයි. **ප්‍රත්‍යනික සංසය ස්වරූප**- තයො මග්ගසමංගිනො ඨපෙත්වා අවසෙසා පුග්ගලා.'' **ස්වරූපර්ථ** - පෘථග්ජනයෝය. සෝතාපත්ති මාර්ගස්ථයාය, ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (4) සතර දෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරොතීති. නො, **යො වා පන**, නො, ''අනුලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ**-අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. සංසය නොමැත. ප්‍රතිලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ** අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විතවූ අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ස්වරූප නොමැත. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ.**'' අග්ග මග්ග සමංගිඤ්ච අරහන්තඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා'' **ස්වරූපාර්ථ**-පෘථග්ජනයෝය. අර්හත් මාර්ගස්ථ, අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයාද වර්ජිත සෙසු ආයඞ් පුද්ගලයන් (7) සත්දෙනා ගනු ලැබෙති.

චක්ඛුන්ද්‍රිය මූලය නිමි.

---

## දෙමනස්සින්ද්‍රිය මූලය

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙතීති. නො, **යො වා පන**, නො,'' අනුලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ** - අනාගාමි මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** නොමැත. ප්‍රතිලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ** - සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** නොමැත. **ප්‍රත්‍යනික ස්වරූපාර්ථ** ''ද්වෙ මග්ග සමග්ගිනො ඨපෙත්වා අවසෙසා පුග්ගලා.'' **ස්වරූපාර්ථ** - පෘථග්ජනයෝය. සෝතාපත්ති මාර්ගස්ථ අනාගාමි මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙනා හැර සෙසු ආයඞ් පුද්ගලයන් (6) සයදෙනා ලැබෙති.

''යො දෙමනස්සින්ද්‍රියං පජහති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙතීති, ආමන්තා, **යො වා පන** – ද්වෙ පුග්ගලා – අනාගාමි මග්ග සමංගී.'' අනුලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ** අනාගාමි මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය** ද එසේය. ප්‍රතිලෝම **සන්නිවර්‍ධාන ස්වරූපාර්ථ**-සකෘදාගාමි මාර්ගස්ථ - අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. අනාගාමි මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය** පෙර සේය. **ප්‍රත්‍යනික සංසය ස්වරූප** - ''තයො මග්ග සමංගිනො ඨපෙත්වා අවසෙසා පුග්ගලා,'' ස්වරූපාර්ථ - පෘථග්ජනයෝය, සෝතපාත්ති මාර්ගස්ථයාය, ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (4) සතර දෙනාය මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහති, සො අඤ්ඤතාවින්ද්‍රියං සච්ඡිකරොතීති, නො **යො වා පන** නො, ''අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - අනාගාමි මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** නොමැත. ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත්ඵලස්ථ ආයඞ පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** නොමැත. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** අනාගාමි මග්ග සමංගිඤ්ච අරහන්තඤ්ච ඨපෙත්වා අවසේසා පුග්ගලා'' **ස්වරූපාර්ථ** - පෘථග්ජනයෝය, අනාගාමි මාර්ගස්ථ අර්හත් මාර්ගාන්තරය ඵල චිත්තයෙන් සමන්විත වූ අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයන් වර්ජිත සෙසු ආයඞ පුද්ගලයන් (7) සත් දෙනා ගනු ලැබෙති.

දෙමනස්සින්ද්‍රිය මූලය නිමි.

---

## අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය

**යො** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙතීති. නො **යො වා පන**,නො''අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**-සොතාපත්ති මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝ ගනු ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** නැත. ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** - උඩ මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති. සංසය ස්වරූප නැත. **ප්‍රත්‍යනීක** සංසය ස්වරූපාර්ථ - ''චත්තාරො මග්ග සමංගිනො ඨපෙත්වා අවසේසා පුග්ගලා,'' ස්වරූපාර්ථ පෘථග්ජනයෝය. ඵලස්ථ ආයඞ පුද්ගලයන් (4) සතර දෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''**යො** අනඤ්ඤාතඤ්ඤාස්සාමීතින්ද්‍රියං භාවෙති. සො අඤ්ඤතාවින්ද්‍රියං සච්ඡිකරොතීති, නො, යො වා පන - නො, අනුලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ - සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූප** නොමැත. ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූපාර්ථ** නොමැත. **ප්‍රත්‍යනීක** සංසය **ස්වරූපාර්ථ** - ''අට්ඨමක ඤ්ච අරහන්තඤ්ච ඨපෙත්වා අවසේසා පුග්ගලා.'' **ස්වරූප** - පෘථග්ජනයෝය, සෝතාපත්ති මාර්ගස්ථ - අර්හත් මාර්ගානන්තර ඵලචිත්ත සමන්විත අර්හත් ඵලස්ථයා ද හැර සෙසු ආයඞ පුද්ගලයන් (7) සත් දෙනා ගනු ලැබෙති.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය නිමි.

---

## අඤ්ඤින්ද්‍රිය මූලය

''**යො** අඤ්ඤින්ද්‍රියං භාවෙති,සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරොන්ති,නො, **යො වා පන**-නො''අනුලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** උඩ මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨාන ස්වරූපාර්ථ - අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් යුක්තවූ අර්හත් ඵලස්ථ

ආයඣියන් වහන්සේ ගනු ලැබෙති. **සංසය ස්වරූපය** නොමැත. **ප්‍රත්‍යනීක සංසය ස්වරූප**''තයො මග්ගසමංගිනො ච අරහංත්‍යඤ්ච ඨපෙත්වා අවසේසා පුග්ගලා,'' ස්වරූප පෘථග්ජනයෝය, උඩ මාර්ගස්ථ ආයඣි පුද්ගලයන් (3) තිදෙනා හා අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථ ආයඣියන් වහන්සේද හැර සෙසු ආයඣි පුද්ගලයන් (5) පස් දෙනා ලැබෙති.

වර්තමාන වාරය නිමි.

---

## අතීත වාර චක්ඛුන්ද්‍රිය මූලය

**අතීත වාරයෙහි** - ''යො චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො දෙමනස්සින්ද්‍රියං පජහිත්ථාති, ආමන්තා, **යො වා පන** ද්වෙ පුග්ගලා, - අරහා,'' අනුලෝම **සන්නිවධාන** අර්හත් ඵලස්ථ ආයඣියන් වහන්සේ ගනු ලැබෙති. **සංසය** ද එසේය. ප්‍රතිලෝම සන්නිවධාන - අනාගාමි ඵලස්ථ - අර්හත් මාර්ගස්ථ ආයඣි පුද්ගලයන් (2) දෙදෙනා ගනු ලැබෙති. අර්හත් ඵලස්ථ ආයඣියන් වහන්සේද ලැබේ. සංසය පෙර සේමය. **ප්‍රත්‍යනීක සංසය ස්වරූපාර්ථ** ''ඡ පුග්ගලා'' ස්වරූප - පෘථග්ජනයාය, යට මාර්ගස්ථ (3) තිදෙනා හා යට ඵලස්ථ ආයඣි පුද්ගලයන් (2) දෙදෙනා ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථාති, ආමන්තා, **යො වා පන** ඡ පුග්ගලා - අරහා''

අනුලෝම **සන්නිවධාන** - අර්හත් ඵලස්ථ ආයඣියන් වහන්සේ ලැබෙති. සංසය ද ඒ මැයි. ප්‍රතිලෝම **සන්නිවධානය** - උඩ මාර්ගස්ථ (3) තිදෙන හා යට ඵලස්ථ ආයඣි පුද්ගලයන් (3) තිදෙන ගනු ලැබෙති. අර්හත් ඵලස්ථ ආයඣියන් වහන්සේද ලැබේ. **සංසය ස්වරූපය** පෙර සේ මැයි. **ප්‍රත්‍යනීක** සංසය ''ද්වෙ පුග්ගලා''පෘථග්ජනයා හා සොතාපත්ති මාර්ගස්ථ ආයඣි පුද්ගලයා ගනු ලැබේ.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථාති. ආමන්තා **යො වා පන** ආමන්තා,''අනුලෝම සන්නිවධාන - අර්හත් ඵලස්ථ ආයඣියන් වහන්සේ ගනු ලැබෙති. **සංසය** ද ඒ මය. පටිලෝමය ද එය මැයි. **ප්‍රත්‍යනීකයෙහි** ''ආමන්තා'' **ස්වරූප**- පෘථග්ජනයෝය, අර්හත් ඵලස්ථ ආයඣි පුද්ගලයා හැර සෙසු ආයඣි පුද්ගලයන් (7) සත් දෙනා ගනු ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අඤ්ඤාතාවින්ද්‍රියං **සච්ඡිකරිත්ථාති**. යො අග්ගඵලං **සච්ඡිකරොති**. යො චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, නො ච අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිත්ථ,යො අග්ගඵලං සච්ඡාකාසි. සො චක්ඛුන්ද්‍රියඤ්ච පරිජානිත්ථ, අඤ්ඤාතාවින්ද්‍රියංච **සච්ඡිකරිත්ථ**. **යො වා පන** - ආමන්තා.''

යො, - යමෙක්, අග්ගඵලං - අර්හත් ඵලය, සච්ඡිකරොති, - ප්‍රත්‍යක්ෂ කරමින් සිටිද, - සච්ඡාකාසි, - ප්‍රත්‍යක්ෂ කෙළේ වේ ද,

අනුලෝම **සන්නිට්ඨානය**-අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් යුක්තවූ අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝ ගනු ලැබෙති. අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් යුක්ත වූ අර්හත් ඵලස්ථයා හැර සෙසු අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ මය. ප්‍රතිලෝමයෙහිද පෙර කියන ලද්ද මය. **ප්‍රත්‍යනික සංසය** – ''අට්ඨ පුග්ගලා'' ස්වරූපාර්ථ පෘථග්ජනයෝය. අර්හත් ඵලස්ථ වර්ජිත සෙසු ආයඞ පුද්ගලයන් (7) සත් දෙනා ලැබෙති.

චක්ඛුන්ද්‍රිය මූලය නිමි

## දෞමනස්සින්ද්‍රිය මූලය

''**යො** දොමනස්සින්ද්‍රියං පජහිත්ථ, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතිංන්ද්‍රිය භාවිත්ථාති, ආමන්තා, **යො වා පන**, චත්තාරො පුග්ගලා තයො පුග්ගලා,''ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූප** මැද මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනා හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනා ගනු ලැබෙති. අනාගාමි ඵලස්ථ අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආයඞ පුද්ගලයෝද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝම සන්නිට්ඨාන සංසය ද කියන ලද සංසය ස්වරූපම වෙති. **ප්‍රත්‍යනික සංසය ස්වරූපාර්ථ** ''ද්වෙ පුග්ගලා'' **ස්වරූපාර්ථ** – පෘථග්ජනයන් හා සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝ ලැබෙති.

'**යො** දොමනස්සින්ද්‍රියං පජහිත්ථ, සො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථාති. ද්වෙ පුග්ගලා අරහා. **යො වා පන** ආමන්තා.'' අනුලෝම **සන්නිට්ඨාන** අනාගාමි ඵලස්ථ – අර්හත් මාර්ගස්ථ ආයඞ පුද්ගලයෝ ලැබෙති. අර්හත් ඵලස්ථ ආයඞ පු෴ගලයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූපය** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන **සංසය** ස්වරූපාර්ථ ද කියන ලද සංසය ස්වරූපම වෙති. ප්‍රත්‍යනික සංසය ''ඡ පුග්ගලා'' **ස්වරූපාර්ථ** – පෘථග්ජනයෝය. යට මාර්ගස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙනාය යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (2) දෙදෙනාය. යන මොවුහු ලැබෙති.

''**යො** දොමනස්සින්ද්‍රියං පජහිත්ථ,සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිත්ථාති,තයො පුග්ගලා, – පෙ – යො අග්ග ඵලං සච්ඡාකාසි, (පෙළෙහි ''අරහා'' කියා ඇත.) යො වා පන – ආමන්තා'' අනුලෝම සන්නිට්ඨාන – අනාගාමි ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථ යන ආයඞ පුද්ගලයන් (3) තිදෙනා ලැබෙති.–අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමනාවිත අර්හත් ඵලස්ථයන් වර්ජිත සෙසු ක්ෂීණාශ්‍රවයෝ ද ගනු ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමය ද පෙර කියන ලද්ද මය, **ප්‍රත්‍යනික** සංසය – ''ඡ පුග්ගලා'' **ස්වරූපාර්ථ**–පෘථග්ජන, යට මාර්ගස්ථ (3) තිදෙන හා යට ඵලස්ථ ආයඞ පුද්ගලයන් (3) තිදෙන යන මේ පුද්ගලයෝ ලැබෙති.

දොමනස්සින්ද්‍රිය මූලය නිමි.

## අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය

''**යො** අනඤ්ඤාතඤ්**ඤස්**සාමීතින්ද්‍රියං භාවිත්ථ සො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථාති. ඡ පුග්ගලා, අරහා **යො වා පන**-ආමන්තා'' අනුලෝම **සන්නිට්ඨාන**- උඩ මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙන හා යට ඵලස්ථ ආර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති. අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ද ගනු ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමය ද පෙර කියන ලද්දමය. **ප්‍රත්‍යනීක** සංසය ''ද්වෙ පුග්ගලා'' ස්වරූප - පෘථග්ජන, සෝතාපත්ති මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති,

'' **යො** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථ සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡි-කරිත්ථා සත්ත පුග්ගලා, යො අග්ගඵලං සච්ඡාකාසි. (පෙළෙහි ''අරහා'' කියාඇත) **යො වා පන** - ආමන්තා'' අනුලෝම සන්නිට්ඨාන–උඩමාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය. අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයාය. මේ ආර්‍ය පුද්ගලයෝ (7) සත්දෙනා ලැබෙති. අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයා වර්ජිත සෙසු ක්ෂීණාශ්‍රවයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. ප්‍රතිලෝම සංසය ද පෙර මෙනි. **ප්‍රත්‍යනීක** සංසය – ''ද්වෙ පුග්ගලා'' **ස්වරූප** – පෘථග්ජන – සෝතාපත්ති මාර්ගස්ථ ආර්‍ය පුද්ගලයෝ යන දෙදෙන ලැබෙති.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය නිමි.

---

## අඤ්ඤින්ද්‍රිය මූලය

''යො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථ, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිත්ථාති. යො අග්ගඵලං සච්ඡිකරොති, සො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථ නො ච අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිත්ථ, යො අග්ගඵලං සච්ඡාකාසි. සො අඤ්ඤින්ද්‍රියංච භාවිත්ථ, අඤ්ඤාතා-වින්ද්‍රියංච සච්ඡිකරිත්ථ, යො වා පන - ආමන්තා'' අනුලෝම **සන්නිට්ඨාන** අර්හත් ඵලස්ථ ආර්‍ය පුද්ගලයෝ ලැබෙති.අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විතවූ අර්හත් ඵලස්ථයන් හැර සෙසු ක්ෂීණාශ්‍රවයෝ ද ලැබෙති. සංසය පෙර සේ මැයි. ප්‍රතිලෝමය ද පෙර සේ මැයි. **ප්‍රත්‍යනීක** සංසය ''අට්ඨ පුග්ගලා'' **ස්වරූප** - පෘථග්-ජනයා හා අර්හත් ඵලස්ථයන් වර්ජිත සෙසු ආර්‍ය පුද්ගලයන් (7) සත්දෙනා ගනු ලැබෙති.

අතීත වාරය නිමි.

## අනාගත වාර චක්ඛුන්ද්‍රිය මූලය

**අනාගත වාරයෙහි** - ''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිස්සති, සො දොමනස්සින්ද්‍රියං පජහිස්සතිති, ද්වෙ පුග්ගලා, පඤ්ච පුග්ගලා, **යො වා පන** - ආමන්තා'' අනුලෝම **සන්නිට්ඨාන** අනාගාමි මාර්ගස්ථ, අනාගාමි ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ගනු ලැබෙති. භව්‍ය පෘථග්ජනයා ද යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමය ද පෙර මෙනි. **ප්‍රත්‍යනීක** සංසය - ''තයො පුග්ගලා'' **ස්වරූප** - අභව්‍ය පෘථග්ජන හා අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිස්සති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙස්සතීති, ඡ පුග්ගලා, යෙ පුථුජ්ජනා මග්ගං පටිලභිස්සන්ති තෙ චක්ඛුන්ද්‍රියඤ්ච පරිජානිස්සන්ති, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියඤ්ච භාවෙස්සන්ති. යො වා පන ආමන්තා,'' අනුලෝම සන්නිට්ඨාන - යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ලැබෙති. භව්‍ය ත්‍රිහේතුක පෘථග්ජන යෝ ද ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ම ලැබේ. ප්‍රතිලෝමය ද එසේමය. **ප්‍රත්‍යනීක** සංසය ''තයො පුග්ගලා'' **ස්වරූප** - අභව්‍ය පෘථග්ජනයන් හා අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිස්සති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති. ආමන්තා **යො වා පන** ආමන්තා.'' අනුලෝම **සන්නිට්ඨාන**, භව්‍ය පෘථග්ජනයා හා යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙන යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙන ගනු ලැබෙති. සංසය ද ඒ මැයි ප්‍රතිලෝමය ද ඒ මැයි. **ප්‍රත්‍යනීකයෙහි** ''ආමන්තා'' **ස්වරූප** - අභව්‍ය පෘථග්ජනයා හා අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගල යෝ ගනු ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිස්සති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති ආමන්තා **යො වා පන** - අග්ගමග්ග සමඟ්ගී, සත්ත පුග්ගලා''ප්‍රතිලෝම **සන්නිට්ඨාන** - අර්හත් මාර්ගස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. භව්‍ය පෘථග්ජනයා ද, යට මාර්ගස්ථ තිදෙනා ද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ගනු ලැබෙති. සංසය පෙර සේමය. අනුලෝමයෙහි **සන්නිට්ඨාන** සංසය ස්වරූප ද කියන ලද සංසය ස්වරූප මැයි. **ප්‍රත්‍යනීකයෙහි** - ''ද්වෙ පුග්ගලා' **ස්වරූප** අභව්‍ය පෘථග්ජනයා හා අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ලැබෙති.

චක්ඛුන්ද්‍රිය මූලය නිමි.

## දෙමනස්සින්ද්‍රිය මූලය

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහිස්සති,සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙස්සතීති, චත්තාරෝ පුග්ගලා, යෙ පුථුජ්ජනා මග්ගං පටිලභිස්සන්ති තෙ, **යො වා පන** ආමන්තා'' අනුලෝම **සන්නිට්ඨාන** - යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා ගනු ලැබෙති. භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය **ස්වරූපය** පෙර සේ ලැබේ. ප්‍රතිලෝමයෙහි ද පෙර සේ මය. **ප්‍රත්‍යනීක** සංසය ''පඤ්ච පුග්ගලා'' **ස්වරූපය,** අභව්‍ය පෘථග්ජනයා හා උඩ මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා උඩ ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ගනු ලැබෙති.

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහිස්සති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති, ආමන්තා, **යො වා පන** - ද්වෙ පුග්ගලා, පඤ්ච පුගගලා,'' ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අනාගාමි මාර්ගස්ථ අනාගාමි ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ (2) දෙදෙන ලැබෙති. භව්‍ය පෘථග්ජනයා ද යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා ද ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝමයෙහි **සන්නිට්ඨාන** සංසය ද කියන ලද සංසය ස්වරූප මය. **ප්‍රත්‍යනීක** සංසය - ''තයො පුග්ගලා'' අභව්‍ය පෘථග්ජන හා අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ලැබෙති.

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහිස්සති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති, ආමන්තා, **යො වා පන,** තයො පුග්ගලා, පඤ්ච පුග්ගලා,'' ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන, අනාගාමි මාර්ගස්ථ, අනාගාමි ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙන ලැබෙති. භව්‍ය පෘථග්ජනයන් ද යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් දෙදෙනා ද යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනා ද ගනු ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝමයෙහි සන්නිට්ඨාන සංසය **ස්වරූප** කියන ලද සංසය ස්වරූප මය. **ප්‍රත්‍යනීක** සංසය - ''ද්වෙ පුග්ගලා'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජනයන් හා අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති.

දෙමනස්සින්ද්‍රිය මූලය නිමි.

---

## අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය

''යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියංභාවෙස්සති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති, ආමන්තා, **යො වා පන** ඡ පුග්ගලා, යෙ පුථුජ්ජනා මග්ගං පටිලභිස්සන්ති තෙ, ' ප්‍රතිලෝම **සන්නිට්ඨාන** - යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා හා යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති. භව්‍ය පෘථග්ජන පුද්ගලයෝද ගනු ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝමයෙහි සන්නිට්ඨාන

සංසය ද කියන ලද සංසය **ස්වරූප** ප්‍රත්‍යනීක සංසය – ''නමයො පුග්ගලා'' **ස්වරූප** අභව්‍ය පෘථග්ජනයා හා අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති.

''යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙස්සති. සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති. ආමන්තා, **යො වා පන** සත්ත පුග්ගලා, යෙ පුථුජ්ජනා මග්ගං පටිලභිස්සන්ති තෙ.'' ප්‍රතිලෝම **සන්නිවඨාන**, අර්හත් ඵලස්ථ වර්ජිත සෙසු ආයඞ් පුද්ගලයන් (7) සත් දෙන ගනු ලැබෙති. භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. අනුලෝමයෙහි **සන්නිවඨාන** සංසය ස්වරූප කියන ලද සංසය ස්වරූපමය. ප්‍රත්‍යනීක සංසය, ''ද්වෙ පුග්ගලා'' **ස්වරූපාර්ථ** අභව්‍ය පෘථග්ජන හා අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ගනු ලැබෙති.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය නිමි.

---

## අඤ්ඤිත්‍ද්‍රිය මූලය

''**යො** අඤ්ඤින්ද්‍රියං භාවෙස්සති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති ආමන්තා. **යො වා පන**, අග්ග මග්ග සමංගී සත්ත පුග්ගලා,'' ප්‍රතිලෝම **සන්නිවඨාන** අර්හත් මාර්ගස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. භව්‍ය පෘථග්ජනයන් ද යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ද යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනා ද, ගනු ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝමයෙහි **සන්නිවඨාන** සංසය ස්වරූප ද කියන ලද සංසය ස්වරූප මය. **ප්‍රත්‍යනීක** සංසය ''ද්වෙ පුග්ගලා'' **ස්වරූපාර්ථ** අභව්‍ය පෘථග්ජනයන් හා අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති.

අනාගත වාරය නිමි.

---

## වර්තමානාතීත වාරය

# චක්ඛුන්ද්‍රිය මූලය

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො දෙමනස්සින්ද්‍රියං පජහිස්සතීති, ආමන්තා, **යො වා පන** ද්වෙ පුග්ගලා, අග්ග මග්ගී සමංගී,'' ප්‍රතිලෝම සන්නිවඨාන, අනාගාමී ඵලස්ථ , අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. අර්හත් මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ද ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. අනුලෝමයෙහි **සන්නිවඨාන** සංසය ස්වරූප ද කියන ලද සංසය ස්වරූප මය. **ප්‍රත්‍යනීක** සංසය, ''ජ පුග්ගලා' **ස්වරූපාර්ථ** පෘථග්ජනයා හා යට මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙන, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (2) දෙදෙන ගනු ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථාති ආමන්තා, **යො වා පන** ඡ පුග්ගලා, අග්ග මග්ග සමංගී,'' ප්‍රතිලෝම **සන්නිට්ඨාන** අර්හත් මාර්ගස්ථ, සෝතාපත්ති මාර්ගස්ථ ආයති පුද්ගලයන් දෙදෙනා හැර සෙසු ආයති පුද්ගලයන් (6) සදෙනා ලැබෙති. අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ද ලැබෙති. සංසය **ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝමයෙහි **සන්නිට්ඨාන** සංසය ස්වරූප ද කියන ලද සංසය ස්වරූප මය. **ප්‍රත්‍යනීක සංසය** ''ද්වෙ පුග්ගලා'' **ස්වරූපාර්ථ** පෘථග්ජන සෝතාපත්ති මාර්ගස්ථයෝ ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථාති, නො, **යො වා පන** නො, අනුලෝම **සන්නිට්ඨාන** අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. **සංසය ස්වරූප** නොමැත. **ප්‍රත්‍යනීක** සංසය, ''සත්ත පුග්ගලා'' **ස්වරූපාර්ථ**, පෘථග්ජනයා හා යට මාර්ගස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනා හා යට ඵලස්ථ ආයති පුද්ගලයන් (3) තිදෙනා ගනු ලැබෙති.

**යො** චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිත්ථාති, නො **යො වා පන** නො, '' අනුලොම සන්නිට්ඨාන, අර්හත් මාර්ගස්ථ පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූප** නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨාන, අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයා වර්ජිත, ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රත්‍යනීක සංසය ''අට්ඨ පුග්ගලා'' ස්වරූප පෘථග්ජනයා හා යට මාර්ගස්ථ ආයති පුද්ගලයන් 3 තිදෙනාය; යට ඵලස්ථ, ආයති පුද්ගලයන් (3) තිදෙනා. අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ද, ලැබෙති.

චක්ඛුන්ද්‍රිය මූලය නිමි

---

## දොමනස්සින්ද්‍රිය මූලය

''**යො** දොමනස්සින්ද්‍රියං පජහති, යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථාති ආමන්තා, යො වා පන ඡ පුග්ගලා, අනාගාමි මග්ග සමංගී,' ප්‍රතිලෝම **සන්නිට්ඨාන**, සොතාපත්ති මාර්ගස්ථ – අනාගාමි මාර්ගස්ථ ආයති පුද්ගලයන් වර්ජිත සෙසු ආයති පුද්ගලයන් (6) සදෙන ලැබෙති. අනාගාමි මාර්ගස්ථ ආයති පුද්ගලයෝද ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. අනුලෝමයෙහි **සන්නිට්ඨාන** සංසය ස්වරූප ද කියන ලද සංසය ස්වරූපමය. **ප්‍රත්‍යනීක** සංසය, ''ද්වෙ පුග්ගලා'' **ස්වරූප** පෘථග්ජනයන් හා සොතාපත්ති මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ගනු ලැබෙති.

''**යො** දොමනස්සින්ද්‍රියං පජහති, සො අඤ්ඤින්ද්‍රියං භාවිත්ථාති, නො යො වා **පන** නො,'' අනුලෝම **සන්නිට්ඨාන** අනාගාමි මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ලැබෙති. **සංසය** ස්වරූප නොමැත. ප්‍රතිලෝමයෙහි සන්නිට්ඨාන, අර්හත් ඵලස්ථ

ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත **ප්‍රත්‍යනීක සංසය** "සත්ත පුග්ගලා ස්වරූප, පෘථග්ජනයෝය. අනාගාමි මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයන් හැර සෙසු ආයඞ් පුද්ගලයන් (6) සදෙන ලැබෙති.

"**යො** දෙමනස්සින්ද්‍රියං පජහති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සති, නො යො වා පන , නො" අනුලෝම **සන්නිට්ඨාන**, අනාගාමි මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨාන, අර්හත් මාර්ගානන්තර ඵල**චිත්ත**යෙන් යුක්ත වූ අර්හත් ඵලස්ථ වර්ජිත සෙසු ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රත්‍යනීක සංසය, "අට්ඨ පුග්ගලා" ස්වරූපාර්ථ, පෘථග්ජනයෝය. අනාගාමි මාර්ගස්ථ – අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් යුක්ත වූ අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනා හැර සෙසු ආයඞ් පුද්ගලයන් (7) සත් දෙනා ලැබෙති.

දෙමනස්සින්ද්‍රිය මූලය නිමි.

---

## අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය

"යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙති, සො අඤ්ඤින්ද්‍රියං භාවිස්සති නො යො වා පන නො, "අනුලෝම **සන්නිට්ඨාන**, සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨාන, අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නැත. ප්‍රත්‍යනීක සංසය, "සත්ත පුග්ගලා"**ස්වරූපාර්ථ** පෘථග්ජනයෝය. සෝතාපත්ති මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයන් දෙදෙනා වර්ජිත සෙසු ආයඞ් පුද්ගලයන් (6) සදෙන ලැබෙති.

"යො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සති, නො යො වා පන නො" අනුලෝම සන්නිට්ඨානය, සොතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨානය අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයන් හැර සෙසු ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රත්‍යනීක සංසය, "අට්ඨ පුග්ගලා', ස්වරූප පෘථග්ජනයෝය. උඩ මාර්ගස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් (3) තිදෙනාය, අර්හත් මාර්ගානන්තර ඵලචිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථ ආයඞ් පුද්ගලයාය. මේ පුද්ගලයෝ ලැබෙති. [පෙළෙහි - "සත්ත පුග්ගලා" කියා ඇත. අතීත වාරය සමග අසමාන බැවින් කල්පනා කටයුතුය.]

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය නිමි.

## අඤ්ඤින්ද්‍රිය මූලය

''**යො** අඤ්ඤින්ද්‍රියං භාවෙති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති, නො, යො වා පන, නො,'' අනුලෝම සන්නිට්ඨානය උඩ මාර්ගස්ථ ආයූ පුද්ගලයන් (3) තිදෙන ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨානය - අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත අර්හත් ඵලස්ථයන් වර්ජිත සෙසු ක්ෂිණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රත්‍යනික සංසය, ''ඡ පුග්ගලා'' ස්වරූප, පෘථග්ජනයාය, සෝතාපත්ති මාර්ගස්ථයාය, යට ඵලස්ථ (3) තිදෙනාය, අර්හත් මාර්ගානන්තර ඵල චිත්තයෙන් සමන්විත වූ අර්හත් ඵලස්ථයාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. [''පඤ්ච පුග්ගලා'' යි පෙළෙහි ඇත. අතීත වාරය සමග නොගැලපෙන බැවින් විමසාගත යුතු.]

වර්තමානාතීත වාරය නිමි.

---

### වර්තමානානාගත වාරය

## චක්ඛුන්ද්‍රිය මූලය

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො දෙමනස්සින්ද්‍රියං පජහිස්සතීති, නො යො වා පන නො,'' අනුලෝම සන්නිට්ඨානය අර්හත් මාර්ගස්ථ ආයූ පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨානය. භව්‍ය පෘථග්ජන යෝය. යට මාර්ගස්ථ ආයූ පුද්ගලයන් (2) දෙදෙනාය. මේ පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රත්‍යනික සංසය, ''චත්තාරො පුග්ගලා,'' ස්වරූප, අභව්‍ය පෘථග්ජනයෝය. අනාගාමි මාර්ගස්ථයෝය, අනාගාමි ඵලස්ථයෝය. අර්හත් මාර්ගස්ථයෝය. මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියංභාවෙස්සතීති. නො, යො වා පන, නො,'' අනුලෝම සන්නිට්ඨානය, අර්හත් මාර්ගස්ථ ආයූ පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සන්නිට්ඨානය, භව්‍ය පෘථග්ජනයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රත්‍යනික - සංසය, ''අට්ඨ පුග්ගලා'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජනයෝය, අර්හත් මාර්ගස්ථයන් වර්ජිත ආයූ පුද්ගලයන් (7) සත් දෙන ලැබෙති.

''යො චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති, නො යො වා පන නො, අනුලෝම සන්නිට්ඨානය අර්හත් මාර්ගස්ථ ආයූ පුද්ගලයෝ ලැබෙති, සංසය ස්වරූප නොමැත. පටිලෝම සන්නිට්ඨානය, භව්‍ය පෘථග්ජන, යට මාර්ගස්ථ (3) තිදෙන, යට ඵලස්ථ (3) තිදෙන ලැබෙති. සංසය ස්වරූප නොමැත. **ප්‍රත්‍යනික සංසය** ''ද්වෙ පුග්ගලා'' **ස්වරූප**, අභව්‍ය පෘථග්ජන, අර්හත් ඵලස්ථ ආයූ පුද්ගලයෝ ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානාති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති,ආමන්තා **යො වා පන** , සත්ත පුග්ගලා, අග්ගමග්ග සමංගී,'' පටිලෝම **සන්නිවර්‍ථානය** භව්‍ය පෘථග්ජන, යට මාර්ගස්ථ (3) තිදෙන. යට ඵලස්ථ (3) තිදෙන ලැබෙති. අර්හත් මාර්ගස්ථයෝ ද ලැබෙති. සංසය ස්වරූප පෙර සේ මය. අනුලෝමයෙහි **සන්නිවර්‍ථාන සංසය** ස්වරූපාර්ථ ද කියන ලද සංසය ස්වරූප මය. **ප්‍රත්‍යනීක සංසය** ''ද්වෙ පුග්ගලා'' **ස්වරූප**, අභව්‍ය පෘථග්ජන, අර්හත් ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ලැබෙති.

චක්ඛුන්ද්‍රිය මූලය නිමි.

---

## දෙමනස්සින්ද්‍රිය මූලය

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහති, සො අනඤ්ඤාත ඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙස්සතීති, නො, **යො වා පන** නො,'' අනුලෝම **සන්නිවර්‍ථානය** අනාගාමි මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ලැබෙති. **සංසය ස්වරූප** නොමැත. පටිලෝම **සන්නිවර්‍ථානය** භව්‍ය පෘථග්ජනයෝ ලැබෙති. **සංසය ස්වරූප** නොමැත. **ප්‍රත්‍යනීක සංසය** ''අට්ඨ පුග්ගලා'' **ස්වරූප**, අභව්‍ය පෘථග්ජනයෝය. අනාගාමි මාර්ගස්ථයන් වර්ජිත සෙසු ආර්‍ය්‍ය පුදගලයන් (7) සත් දෙනා ලැබෙති.

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති, ආමන්තා, **යො වා පන**, ජ පුග්ගලා අනාගාමි මග්ග සමංගී,'' ප්‍රතිලෝම . **සන්නිවර්‍ථානය**, භව්‍ය පෘථග්ජන, යට මාර්ගස්ථ (2) දෙදෙන, යට ඵලස්ථ (3) තිදෙන ලැබෙති. අනාගාමි මාර්ගස්ථයෝ ද ලැබෙති. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝමයෙහි **සන්නිවර්‍ථාන සංසය** ස්වරූප ද කියන ලද සංසය ස්වරූප මය. **ප්‍රත්‍යනීක සංසය** ''තයො පුග්ගලා'' **ස්වරූප** අභව්‍ය පෘථග්ජන – අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ, මේ පුද්ගලයෝ ලැබෙති.

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති. ආමන්තා, **යො වා පන** සත්ත පුග්ගලා අනාගාමි මග්ග සමංගී,'' ප්‍රතිලෝමයෙහි **සන්නිවර්‍ථාන ස්වරූපාර්ථ** භව්‍ය පෘථග්ජනයාය, අනාගාමි මාර්ගස්ථ – අර්හත් ඵලස්ථ දෙදෙනා හැර ආර්‍ය්‍ය පුද්ගලයන් (6) සයදෙනා. යන මොවුහු ගනු ලැබෙති. අනාගාමි මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා ද ගනු ලැබේ. **සංසය ස්වරූප** පෙර සේ ලැබේ. අනුලෝම සන්නිවර්‍ථාන-සංසය ස්වරූප ද කියන ලද ඒ සංසය ස්වරූපමය, **ප්‍රත්‍යනීක සංසය** 'ද්වෙ පුග්ගලා' ස්වරූපාර්ථ අභව්‍ය පෘථග්ජනයාය. අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය. මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

දෙමනස්සින්ද්‍රිය මූලය නිමි.

## අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය

''**යො** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙති, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති ආමන්තා, **යො වා පන**, ජ පුග්ගලා, අට්ඨමකො,'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** භව්‍ය පෘථග්ජනයාය, මැද මාර්ගස්ථ දෙදෙනාය, යට ඵලස්ථ තිදෙනාය, මේ පුද්ගලයෝ ලැබෙති. සෝතාපත්ති මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයාද ලැබේ. සංසය ස්වරූප පෙර සේ ලැබේ. අනුලෝම **සන්නිට්ඨාන සංසය** ස්වරූප ද පෙර කියන ලද සංසය ස්වරූපම ලැබේ. **ප්‍රත්‍යනීක** සංසය ''තයො පුග්ගලා'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජනයෝය, අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයෝය, යන මේ පුද්ගලයෝ ලැබෙති.

''**යො** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති, ආමන්තා, **යො වා පන**, සත්ත පුග්ගලා, අට්ඨමකො,'' ප්‍රතිලෝමයෙහි **සන්නිට්ඨාන ස්වරූපාර්ථ**, භව්‍ය පෘථග්ජනයාය, උඩ මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය. මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සෝතාපත්ති මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයා ද ගනු ලැබේ. සංසය ස්වරූප පෙර සේ ලැබේ. අනුලෝම සන්නිට්ඨාන - සංසය ස්වරූපාර්ථ ද කියන ලද සංසය ස්වරූපම ලැබේ. **ප්‍රත්‍යනීක සංසය** ''ද්වෙ පුග්ගලා'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජනයාය, අර්හත් ඵලස්ථ ආයර්‍ය පුද්ගලයාය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියමූලය නිමි

---

## අඤ්ඤින්ද්‍රිය මූලය

''**යො** අඤ්ඤින්ද්‍රියං භාවෙති, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති, ආමන්තා, යො වා පන - පඤ්ච පුග්ගලා, තයො මග්ග සමංගිනො'' ප්‍රතිලෝම **සන්නිට්ඨාන ස්වරූපාර්ථ** භව්‍ය පෘථග්ජනයාය, සෝතාපත්ති මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයාය, යට ඵලස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනාය, යන මේ පුද්ගලයෝ ලැබෙති. උඩ මාර්ගස්ථ ආයර්‍ය පුද්ගලයන් (3) තිදෙනා ද ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. අනුලෝම සන්නිට්ඨාන සංසය ස්වරූප ද කියන ලද සංසය ස්වරූප ම ලැබේ. **ප්‍රත්‍යනීක සංසය** ''ද්වෙ පුග්ගලා'' ස්වරූපාර්ථ - අභව්‍ය පෘථග්ජන යාය, අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝය, මේ පුද්ගලයෝ ලැබෙති.

වර්තමානානාගත වාරය නිමි.

## අතීතානාගත වාරය

# චක්ඛුන්ද්‍රිය මූලය

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො දෙමනස්සින්ද්‍රියං පජහිස්සතීති, නො ''**යො වා පන**, නො,'' අනුලෝම **සන්නිට්ඨාන** අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ගනු ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම **සන්නිට්ඨාන** භව්‍ය පෘථග්ජනයාය. යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය. යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් (2) දෙදෙනාය. මේ පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ස්වරූප නොමැත **ප්‍රත්‍යනීක** සංසය ''චත්තාරො පුග්ගලා'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජනයාය, අනාගාමි මාර්ගස්ථ අනාගාමි ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙස්සතීති, නො, **යො වා පන**, නො,'' අනුලෝම **සන්නිට්ඨාන** අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රතිලෝම සපනිට්ඨාන, භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. **ප්‍රත්‍යනීක සංසයෙහි** ''අට්ඨ පුග්ගලා'' ස්වරූප, අභව්‍ය පෘථග්ජනයාය. අර්හත් ඵලස්ථ **ක්ෂීණාශ්‍රවයන්** වර්ජිත සෙසු ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත්දෙනාය, යන මේ පුද්ගලයෝ ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති, නො, **යො වා පන**, නො,'' අනුලෝම **සන්නිට්ඨානයෙහි**, අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නැත. ප්‍රතිලෝම සන්නිට්ඨානයෙහි, භව්‍ය පෘථග්ජනයාය, යට මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය, යට ඵලස්ථ ආර්‍ය්‍ය පුද්ගලයන් තිදෙනාය, මෙ පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නැත. **ප්‍රත්‍යනීක** සංසයයෙහි ''ද්වෙ පුග්ගලා'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජනයා හා අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයෝ ලැබෙති.

''**යො** චක්ඛුන්ද්‍රියං පරිජානිත්ථ, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති, නො, **යො වා පන**, නො,'' අනුලෝම සන්නිට්ඨාන අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නැත. ප්‍රතිලෝම **සන්නිට්ඨානයෙහි** – භව්‍ය පෘථග්ජනයාය, අර්හත් ඵලස්ථ ක්ෂ්ණාශ්‍රවයන් වර්ජිත ආර්‍ය්‍ය පුද්ගලයන් (7) සත්දෙනා ලැබෙති. සංසය ස්වරූප නැත. **ප්‍රත්‍යනීක සංසයෙහි** ''යෙ පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙ'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති.

චක්ඛුන්ද්‍රිය මූලය නිමි.

## දොමනස්සින්ද්‍රිය මූලය

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහිත්ථ,සො අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවෙස්සතීති, නො, **යො වා පන** නො,'' අනුලෝම සන්නිවධානයෙහි, අනාගාමි ඵලස්ථ අර්හත් මාර්ගස්ථ අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ලැබෙති. සංසයෙහි ස්වරූප නැත. ප්‍රතිලෝමයෙහි **සන්නිවධාන** ස්වරූප, භව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති. සංසය ස්වරූප නොමැත. ප්‍රත්‍යනීක සංසයෙහි ''ඡ පුග්ගලා'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජනයාය. යට මාර්ගස්ථ තිදෙනාය, යට ඵලස්ථ දෙදෙනාය යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති.

''**යො** දෙමනස්සින්ද්‍රියං පජහිත්ථ, සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති, ද්වෙ පුග්ගලා - අනාගාමි , **යො වා පන**, ඡ පුග්ගලා, අනාගාමි.'' අනුලෝම **සන්නිවධාන යෙහි**, අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ලැබෙති. අනාගාමි ඵලස්ථ, ආයති පුද්ගලයෝ ද ලැබෙති. සංසයෙහි ස්වරූප පෙර සේ මය, ප්‍රතිලෝම යෙහි **සන්නිවධාන** භව්‍ය පෘථග්ජනයාය. යට මාර්ගස්ථ තිදෙනාය. යට ඵලස්ථ දෙදෙනාය, මේ පුද්ගලයෝ ගනු ලැබෙති අනාගාමි ඵලස්ථ ආයති පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක** සංසයෙහි ''යෙ පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙ'' ස්වරූපාර්ථ අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ගනු ලැබෙති.

'' **යො** දෙමනස්සින්ද්‍රියං පජහිත්ථ, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතීති, අරහා, ද්වෙ පුග්ගලා, යො වා පන ඡ පුග්ගලා, ද්වෙ පුග්ගලා,''අනුලෝම **සන්නිවධාන යෙහි**, අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. අනාගාමි ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ මය, ප්‍රතිලෝම **සන්නිවධානයෙහි** භව්‍ය පෘථග්ජනයාය, යට මාර්ගස්ථ තිදෙනාය, යට ඵලස්ථ දෙදෙනාය. යන මේ පුද්ගලයෝ ගනු ලැබෙති. අනාගාමි ඵලස්ථ, අර්හත් මාර්ගස්ථ ආයති පුද්ගලයෝ ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක සංසයෙහි** ''යෙ පුථුජ්ජනා මග්ගං න පටිලස්සන්ති තෙ'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති.

දෙමනස්සින්ද්‍රිය මූලය නිමි.

---

## අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය

**යො** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථ,සො අඤ්ඤින්ද්‍රියං භාවෙස්සතීති ද්වෙ පුග්ගලා,'පඤ්ච පුග්ගලා, **යො වා පන** ද්වෙ පුද්ගලා, පඤ්ච පුග්ගලා,''අනුලෝම සන්නිවධානයෙහි - අර්හත් මාර්ගස්ථ, අර්හත් ඵලස්ථ ආයති පුද්ගලයෝ ලැබෙති. මැද මාර්ගස්ථ දෙදෙනා ද යට ඵලස්ථ ආයති පුද්ගලයන් තිදෙනා ද ලැබෙති. සංසය

ස්වරූප පෙර සේ ලැබේ. ප්‍රතිලෝම **සන්නිට්ඨානයෙහි** භව්‍ය පෘථග්ජනයා හා සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයා ලැබේ. මැද මාර්ගස්ථ දෙදෙනා ද, යට ඵලස්ථ ආයඞ් පුද්ගලයන් තිදෙනා ද ගනු ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. **ප්‍රත්‍යනීක සංසයෙහි** ''යෙ පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙ,'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති.

''**යො** අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං භාවිත්ථ,සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතිති, අරහා, ඡ පුග්ගලා, **යො වා පන**, ද්වෙ පුග්ගලා, ඡ පුග්ගලා,'' අනුලෝම සන්නිට්ඨානයෙහි, අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ගැනෙති. උඩ මාර්ගස්ථ (3) තිදෙනාය. යට ඵලස්ථ (3) තිදෙනාය යන ආයඞ් පුද්ගලයන් (6) සය දෙනා ද ලැබෙති. සංසය ස්වරූප පෙර සේ මය. ප්‍රතිලෝම සන්නිට්ඨාන භව්‍ය පෘථග්ජනයා හා සෝතාපත්ති මාර්ගස්ථ ආයඞ් පුද්ගලයා ගනු ලැබේ. මාර්ගස්ථ (3) තිදෙනාය, යට ඵලස්ථ (3) තිදෙනාය යන ආයඞ් පුද්ගලයන් (6) සය දෙනා ද ලැබෙති. සංසය ස්වරූප පෙර සේ ලැබේ. ප්‍රත්‍යනීක සංසයෙහි '' යෙ පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති තෙ,'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මූලය නිමි.

---

## අඤ්ඤින්ද්‍රිය මූලය

''**යො** අඤ්ඤින්ද්‍රියං භාවිත්ථ, සො අඤ්ඤාතාවින්ද්‍රියං සච්ඡිකරිස්සතිති, නො **යො වා පන**, නො,'' අනුලෝම සන්නිට්ඨානයෙහි, අර්හත් ඵලස්ථ ක්ෂීණාශ්‍රවයෝ ලැබෙති. සංසය ස්වරූප නැත. ප්‍රතිලෝම සන්නිට්ඨානයෙහි, භව්‍ය පෘථග්ජනයාය. අර්හත් ඵලස්ථයන් හැර ආයඞ් පුද්ගලයන් (7) සත්දෙනාය. මේ පුද්ගලයෝ ලැබෙති. සංසය ස්වරූප නොමැත. **ප්‍රත්‍යනීක සංසයෙහි**'' යෙ පුථුජ්ජනා මග්ගංන පටිලභිස්සන්ති තෙ'' ස්වරූපාර්ථ, අභව්‍ය පෘථග්ජන පුද්ගලයෝ ලැබෙති.

අඤ්ඤින්ද්‍රිය මූලය නිමි.

අතීතානාගත වාරය නිමි.

බුරුම මණ්ඩලේ නුවර අසෝකාරාමාධිපති අභිධජ මහාරට්ඨ ගුරු සූයඞ්‍ංහිවංශ ෂෙයාඩෝ මාහිමියන් විසින් රචිත ඉන්ද්‍රිය යමක පරිඤ්ඤා වාර අභිනව ස්වරූප කථනය මෙසේ නිමියේය.

# යමක ගැට පදය

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

## මූල යමක ගැට පදය

උද්දේස වාරය

ගන්ථිස්සං යමකෙ ගන්ථෙ - කිඤ්චි නියාම පබ්බකං
ඤාණ වඩ්ඪාය සොතූනං - ජිනං නත්වා භවන්තගුං

කථාවස්තු ප්‍රකරණය දේශනා කොට වදරා ඉන් අනතුරුව යමක ප්‍රකරණය වදාළ සේක. ඒ යමක ප්‍රකරණය ද මූලයමක ඛන්ධයමක - පෙ - ඉන්ද්‍රිය යමක වශයෙන් දශවැදෑරුම් වන්නේය. ඒ යමක දශය අතුරෙන් මූල යමකය පළමු කොට වදාළ සේක.

කථාවස්තු ප්‍රකරණයට අනතුරුව පට්ඨාන ප්‍රකරණය නොවදරා කුමක් හෙයින් යමකප්‍රකරණය වදාළ සේක් ද යත් සර්වඥයන් වහන්සේ වනාහි සන්නිට්ඨාන සංසය ආදී වශයෙන් ඇත්තා වූ නානාප්‍රකාර නය ක්‍රමයන්හි දක්ෂ භාවය පිණිස යමක ප්‍රකරණය වදාළ සේක. නානාප්‍රකාර නය ක්‍රමයන්හි දක්ෂ භාවය ඇත්තේ නම් කුශලාදී ධර්මයන් විපරීත ලෙස ගන්නෙක් නොවන්නේය.

කුසලාදී ධර්මයන් කෙරෙහි අකුශලාදී විපරීත ගැනීම ද කථාවස්තු ප්‍රකරණයෙන් දුරුකරන ලද හේතුඵල සම්බන්ධතා වශයෙන් කථාවස්තු ප්‍රකරණයට අනතුරුව යමක - ප්‍රකරණය වදරා ඇතැයි සැලකිය යුතුය, එසේ දේශනා කිරීමට හේතුව වනාහි,

'' කථාවත්ථුප්පකරණෙන සංඛෙපෙනෙව දෙයිතෙන ධම්මෙසු විපරිතග්ගහණං නිවාරෙත්වා තෙස්වෙව ධම්මේසු ධම්මසඞ්ගහාදිසු පකාසිතෙසු ධම්මා පුග්ගලෝකාසාදි නිස්සයානං සන්නිට්ඨාන සංසයානං . වසෙන නානප්පකාර කොසල්ලත්ථං යමකප්පකරණං ආරද්ධං,'' (ටීකා)

ධර්මයන් කෙරෙහි විපරීතව ගැනීම, සැකෙවින් වදාළ කථාවස්තු ප්‍රකරණයෙන් නිවාරණය කොට, ධම්මසඞ්ගණී ප්‍රකාරණාදියෙහි වදාළ ඒ ධර්මයන් කෙරෙහිම පුද්ගල ඕකාශ නිශ්‍රිත වූ සන්නිට්ඨාන සංසය ආදීන්ගේ වශයෙන් නානාප්‍රකාර කෞශල්‍ය භාවය පිණිස යමක ප්‍රකරණය පටන් ගන්නා ලදී.

''අවිපරීතතො ගහිතෙසු ධම්මෙසු මූලයමකාදි වසෙන පවත්තිය මාතා දෙසනා වෙනෙය්‍යානං නානාප්පකාර කොසල්ලාවහා පරිඤ්ඤාකිච්ච සාධනී ච හොති. නවිපරිතතොති ආහ. විපරීතග්ගහණං - පෙ - ආරද්ධන්ති එතෙන කථාවත්ථුප්පකරණ දේසනානන්තරං යමකප්පකරණ දේසනාය කාරණ මාහ'' (අනුටීකා)-

අවිපරීතව ගන්නාලද ධර්මයන්හි මූලයමකාදී වශයෙන් පවත්වනු ලබන දේශනාව, වෙනෙය්‍ය ජනයාට නානාප්‍රකාර කෞශල්‍යභාවය පිණිස හා පිරිසිඳ අවබොධ කර ගැනීමේ පහසුව පිණිස ද පවතී. එවැනි දේශනාවක් නැති නම් එය නොලැබේ නුයි ''විපරීතග්ගහණං – පෙ – ආරද්ධං'' යනාදිය කියන ලදී. මේ ටීකා වචන වලින් දත හැකිය.

**යමක වචනය** වනාහි. යුගලය යන තේරුම ඇත්තේය. කවර නම් යුගලයක්ද යත්, මූලයමකයෙහි අනුලෝම පුච්ඡා සන්නිට්ඨාන ස්වරූප වශයෙන් කුශල නම් වූ එක් අර්ථයකි. පටිලෝම පුච්ඡා සන්නිට්ඨාන ස්වරූප වශයෙන් කුශලමූල නම් වූ එක් අර්ථයකි. මෙසේ අර්ථ යුගලයකි. තවද, අනුලෝම පුච්ඡා සංසය පදයාගේ ස්වරූපාර්ථ වූ කුශල මූල නම් වූ එක් අර්ථයකි. පටිලෝම පුච්ඡා සංසය පදයාගේ ස්වරූපාර්ථ වූ කුශල නම් වූ එක් අර්ථයකි. මෙසේ ද අර්ථ යුගලයකි.

නොහොත්, අනුලෝම පුච්ඡා – පටිලෝම පුච්ඡා යනුවෙන් පුච්ඡා යුගලයකි. එසේම, අනුලෝම පුච්ඡා පාලි ධර්මය, ප්‍රතිලෝම පුච්ඡා පාලි ධර්මය යනුවෙන් ධර්ම යුගලයකි. ඒකමූල යමකයෙහිද මීට සමානව බෙදනු. සිතනු මේ කියන ලද්ද අට්ඨකථා පාඨයෙන් දත හැකිය.

''කුසලාකුසල මූල සංඛාතානං ද්වින්නං අත්ථානං වසෙන අත්ථ යමකන්තිවා, තෙසංඤ්ඤෙව අත්ථානං වසෙන අනුලෝම පටිලොමතො පවත්ත පාලි ධම්ම වසෙන ධම්මයමකන්තිවා වා, අනුලෝම පටිලොමතො පවත්ත පුච්ඡා වසෙන පුච්ඡා යමකන්ති වා තිධා යමකභාවො වෙදිතබ්බො, සෙසෙසුපි එසෙව නයො'' (අට්ඨකථා)

කුශලාකුශල මූල සංඛ්‍යාත අර්ථ දෙකගේ වශයෙන් අර්ථයමකය යිද, ඒ අර්ථයන්ගේම වශයෙන් අනුලෝම පටිලෝමයෙන් පැවති පාලිධර්ම වශයෙන් ධර්මයමකයැයි ද අනුලෝම පටිලෝම වශයෙන් පැවති පුච්ඡාවන්ගේ වශයෙන් පුච්ඡා යමකයැ යිද යමකය තුන් ආකාරයෙකින් දත යුතුය. සෙස්සෙහි ද මේ නය ක්‍රමයයි.

එසේ නම් මූල – ස්කන්ධ – ආයතන ආදිය යමක නම් නොවෙති. මූලයමක ඒකමූල යමක යනාදියම යමක නම් වේ.

'' යුගල සංඛාතානං යමකානං වසෙන දෙසිත්තතා ඉමෙසු දසසු එකෙකං යමකං නාම,'' (අට්ඨකථා)

යුගල සංඛ්‍යාත යමකයන්ගේ වශයෙන් වදළ බැවින් මේ දශය අතුරෙන් එක එකක් යමක නම්වේ .

සංක්ෂෙප අධිප්‍රාය , සමං – සමව ගෙන, චුණ්ණං – චූර්ණ කොට, කී තැන ගම්මිරිස් කළදැයි, තිප්පිලි කළදැයි මේ දෙක සමව ගෙන චූර්ණ කරන ලද්දේ නම් එයට සමං චුණ්ණං – කියන්නාක් මෙන්, මූල යමකය – ඒක මූලයමකය යනාදීන්ගේ සමූහය වශයෙන් ගෙන මූලයමකය ස්කන්ධ යමකය යනාදියද අවයවූපචාර වශයෙන් ගෙන යමක ව්‍යාවහාරය කරනු ලැබේ. මේ අවයවූපචාරය වනාහි උපචාර දශය කෙරෙන් බාහිරය, එහෙත් විසුද්ධි මග්ග මහාටීකා, නෙත්තිටීකා, අනුටීකා ග්‍රන්ථයන්හි කියා ඇති බැවින් සාර වශයෙන් ගතයුතුව ඇත.

අවයවෙ පවත්තො සො – වොහාරො සමූහෙ කතො,
තං යථා වෙ සමං චුණ්ණං – – සමන්තෙත්ථවයවං මතං, යයි

සද්දසාරත්ථ ජාලිනියෙහි කියා ඇත. ඇතැම් ගුරුවරු, උපචාර දශය අතුරෙන් ඒකදේසූපචාරයට ඇතුලත් යයි කියති. එසේ ගැනීම සද්දසාරත්ථ ජාලිනියෙහි උපචාර දශය කියා වෙනම එකක් සේ දක්වන බැවින් ගත නොහැකිය. එනිසා වෙනම ගැනීම වඩාත් සුදුසුය.

මූලයමක ස්කන්ධයමක ආදීන්ගේ සමූහයට යමකප්‍රකරණයයි කුමක් හෙයින් කියනු ලැබේ ද –

'' ඉමෙසං පන යමකානං සමූහභාවතො
පකරණං යමකන්ති වෙදිතබ්බං .'' (අට්ඨකථා)

මේ යමකයන්ගේ සමූහය බැවින් මේ මුළු ග්‍රන්ථයම යමකප්‍රකරණයැයි දතයුතු.

අධිප්‍රායාර්ථ වනාහි පෙර කියන ලද පරිදි ගතයුතුය. දශ යමකයන් අතුරෙන් කුමක් හෙයින් මූලයමකය පළමු කොට වදළ සේක් ද යත්.

මූලයමකයෙහි වදරා ඇත්තා වූ කුශල අකුශල අව්‍යාකෘත ධර්මයෙන්ම ස්කන්ධාදි වශයෙන් බෙද ස්කන්ධා දි යමක දක්වනු ලැබේ. එනිසා මූලයමකය පළමු කොට වදරණ ලදැයි දතයුතු

'' ඉදනි මූලයමකෙ දෙසිතෙයෙව කුසලාදි ධම්මෙ ඛන්ධවසෙන සංගණ්හිත්වා මූලයමකානන්තරං දෙසිතස්ස ඛංධයමකස්ස වණ්ණනා හොති'' (අට්ඨකථා)

'' දන් මූල යමකයෙහි වදරණ ලද්දවූව කුශලාදි ධර්මයන් ස්කන්ධ වශයෙන් සංග්‍රහ කොට මූලයමකයට අනතුරුව වදරණලද ස්කන්ධ යමකය පිළිබඳ වර්ණනාව වෙයි.'' මේ අට්ඨකථා පාඨයෙන් ඉහත දක්වූ අර්ථය සාමි අර්ථ වශයෙන් දත යුතුය.

ඒ මූලයමකයෙහි ද උද්දේශ නිර්දේශ දෙක අතුරෙන් කුමක් හෙයින් උද්දේශය පළමුකොට වදළ සේක් ද යත්.

'' තෙසු උද්දිට්ඨානුක්කමෙන නිද්දිසිතබ්බත්තා උද්දේසවාරො පඨමො'' (අට්ඨකථා)

ඔවුනතුරෙන් උද්දේශ අනුක්‍රමයෙන් විස්තර කටයුතු බැවින් උද්දේශ වාරය ප්‍රථමයෙන් වදරණ ලදී.

උද්දේශය ද තිකමාතිකා, දුකමාතිකා දෙක අතුරෙන් කුමක් හෙයින් තිකමාතිකාව පළමු කොට වදරණ ලද්දේ ද යත්, ධම්මසංගණී මාතිකාවෙහි පළමු කොට. තිකමාතිකාව වදරා ඇති බැවින් මෙහි ද තිකමාතිකාව පළමු කොට වදරණ ලදි. ධර්ම සංගණියෙහි කුමක් හෙයින් ත්‍රික මාතෘකාව පළමු කොට වදළ සේක් ද යත්,

'' සුඛග්ගහණතො අප්පභෙදතො ච තිකා - එව පඨමං වුත්තා '' (ද්වාර අනුටීකා)

සුවසේ ගත හැකි බැවින් හා ප්‍රභෙද ස්වල්ප බැවින් ද ත්‍රිකයෝම පළමු කොට වදරණ ලදහ.

ඒ ත්‍රිකයන් අතුරෙනුත් කුමක් හෙයින් කුශල ත්‍රිකයම පළමු කොට වදළ සේක්ද,

'' තෙසු පන සබ්බසංගහ අසංකර ආදි කල්‍යාණ භාවෙන පඨමං කුසලත්තිකං වුත්තං '' (ද්වාර අනුටීකා)

ඔවුනතුරෙන් වනාහි සර්වසංග්‍රහ අසංකර ආදි කල්‍යාණ භාවයෙන් කුශලත්‍රිකය පළමු කොට වදළ සේක.

කුශල ත්‍රිකයෙහි ද කුමක් හෙයින් කුශල පදය පළමු කොට වදළ සේක් ද යත්.

''කුසලත්තිකෙපි ච පධාන, පාසංස, ඤාය, හිතභාවතො කුසලා ධම්මා පඨමං වුත්තා.'' (ද්වාර අනුටීකා)

කුශලත්‍රිකයෙහි ද ප්‍රධාන , ප්‍රසංසනීය, න්‍යාය, හිතභාවයෙන් කුශල ධර්මය පළමු කොට වදරණ ලදී.

කුශල පදයට අනතුරුව අව්‍යාකෘත පදය නොවදරා කුමක් හෙයින් අකුශල පදය වදළසේක් ද යත්,

'' තප්පටිපක්ඛත්තා තදනන්තරමකුසලා, තදුභය විපරීත සභාවා තදනන්තර මබ්‍යාකතා ධම්මා වුත්තා,'' (ද්වාර අනුටීකා)

එයට ප්‍රතිපක්ෂ බැවින් ඉන් අනතුරුව, අකුශල ධර්මයෝ ද ඒ දෙකට විපරීත ස්වභාව ඇති බැවින් ඉන් අනතුරුව අව්‍යාකෘත ධර්මයෝ ද වදරණ ලදහ.

ආරොග්‍යෙ කුසලං ඉට්ඨෙ - විපාකෙ කුසලො තථා
අනවජ්ජම්හි ඡෙකෙච - කථිතො වාච්චලිංගිකො

යනුවෙන් කියන ලද කුශල ශබ්දයාගේ අර්ථ සතර අතුරෙන් ''කුසලා ධම්මා'' යන්නෙහි කුශල ශබ්දය කවර අර්ථයක වැටේ ද යත්.

''ස්වායම්ධ ආරොග්‍යෙපි අනවජ්ජෙපි සුඛවිපාකෙපි වට්ටති'' යි යන අට්ඨසාලිනී වචනයට අනුව ආරෝග්‍ය අනවද්‍ය ඉෂ්ඨ විපාක නම් වූ අර්ථ තුනෙක වැටේ.

'' කුසලා ධම්මාති කුසලත්තිකස්ස පදභාජනෙ වුත්ත ලක්ඛණා අනවජ්ජ සුඛ විපාක කුසලසභාවා'' යි කියන ලද **යමක අට්ඨකතා** වචනයට අනුව අනවද්‍ය ඉෂ්ට විපාක නම් වූ අර්ථ දෙකෙහි වැටේ.

මේ **යමක අට්ඨකථාවෙහි** කුසලා - නම් වූ පදය අනවද්‍ය සුඛ විපාකයට කියනු ලැබේ. ධම්මා නම් වූ පදය ස්වභාවයට කියනු ලැබේ. ඒ ස්වභාවය වනාහි කුසල ස්වභාව අකුශල ස්වභාව යනාදී වශයෙන් පොදුවේ බෙදී යන නමුත් මෙහි කුසලා යන පදයට සම්බන්ධ කරනු ලැබේ. එසේ අධිප්‍රාය අර්ථ ගත යුතු. කුසලා යන පදය ම කුශල ස්වභාව නමැයි කියා නොමැත. කුමක් හෙයින් ද යත්, අනවද්‍ය සුඛ විපාකයැයි කුශල ශබ්දයාගේ අර්ථය කියා ඇති බැවින් ද, විස්තර කටයුත්ත කුසලා යන්නම නොගෙන කුසලා ධම්මා යයි ගතයුතු බැවින් ද මේ යයි දතයුතු.

එක් ශබ්දයක් එකම අර්ථයක් කියන්නේ යයි නොකියන ලද්දේ නොවේද? කුමක් හෙයින් යමක අට්ඨකථාවෙහි අනවද්‍ය සුඛ විපාක යන අර්ථ දෙක කියන්නේද යත්, ශබ්ද ප්‍රවෘත්ති නිමිත්ත ගැන නොබලා පොදුවේ සාධාරණ අර්ථ දැක්වීම වශයෙන් කියන ලදී. (තවද) ''කුසලාච කුසලාච කුසලා'' යයි ඒකසේස කොට පූර්ව කුශල ශබ්දය අනවද්‍ය අර්ථය ද පසු කුශල ශබ්දය සුඛ -විපාක අර්ථය ද කියන්නේ යයි ගෙන, ඒකසේස නය වශයෙන් ගෙන කියන ලදී. මේ වනාහි ද්වාරවීකා අදහසයි. කාරක න්‍යාය, සමාස න්‍යාය, අනුව වනාහි, ''සෙතො ධාවති'' කීවාක් මෙන් තන්ත්‍ර නය ද කියනු ලැබේ. ''අකාසි අත්තනො අත්ථං - පරත්ථම්පි ච සො ජිනො.'' කියන ලද්ද සේ දීපක න්‍යාය ද කියන ලද්දේ වේ.

ධම්මො සභාවෙ පරියත්ති පඤ්ඤා
ඤායෙසු සච්චප්පකතිසු පුඤ්ඤෙ,
ඤෙය්‍යෙ ගුණාචාර සමාධිසුපි
නිස්සත්තතාපත්තිසු කාරණාදෙ.

යනුවෙන් සංවර්ණණා කරන ලද ධම්ම ශබ්දයාගේ බොහෝ අර්ථ අතුරෙන් මේ ධම්ම ශබ්දය කවර අර්ථයක වදරා ඇත්තේ ද, ''ස්වායම්ධ නිස්සත්ත නිජ්ජීවතාය මේව වට්ටති.''යන **අට්ඨසාලිනී** අදහසට අනුව නිස්සත්ව නිජ්ජීව අර්ථයෙහි. වැටෙයි. පෙර කියන ලද **යමකට්ඨකථා** අදහසට අනුව ස්වභාව අර්ථයෙහි ඇතුලත්වේ.

පටිසෙධෙ වුද්ධි තබ්භාවෙ - අඤ්ඤත්ථෙ සදිසෙපි ච
විරුද්ධෙ ගරහෙ සුඤ්ඤෙ - අ - කාරො විරහප්පකෙ.

යයි කියන ලද අ - ශබ්දයාගේ අර්ථ අතුරෙන් අකුසල - පදයෙහි අ - ශබ්දය විරුද්ධාර්ථයට කියනු ලැබේ. අබ්‍යාකත - පදයෙහි අ - ශබ්දය අන්‍යාර්ථයට කියනු ලැබේ.

ධම්මසංගණී මාතෘකාවෙහි කුසලත්‍රිකයෙහි පද තුනක්ම වදරණ ලද්දක් මෙන් නොවදරා කුමක් හෙයින් නාමපදය වදළ සේක් ද යත්.

''සබ්බ කුසලාදි සංගණ්හනත්ථමෙව ච නාමපදස්ස වුත්තත්තා'' (ටීකා) පද තුනේම අර්ථය සම්පිණ්ඩණය කොට දැක්වීම පිණිස නාමපදය දේශනා කරන ලදැයි දත යුතු.

මූලං හේතු නිදානඤ්ච - සම්භවො පභවෙන ච
සමුට්ඨානාහාරා රම්මණං - පච්චයො සමුදයෙන ච,

මේ ගාථාව කටපාඩම් කරන්න

## නිද්දේස වාරය

උද්දේසං මූල යමකෙ - වුත්තං නියාම පබ්බකං,
නිද්දේසං දනි වක්ඛාමි - තං නිසා මෙන්තු සොතුනො.

තිණෙව කුසල මූලානි යයි කී බැවින් ද්විහේතුකයෙහි යෙදෙන දෙකක් වූ මූලයන් ඇතුලත් වෙත් ද යත් සමුදය වාක්‍ය නිබ්බත්ති, අවයව වාක්‍ය නිබ්බත්ති දෙක අතුරෙන් අවයව වාක්‍ය නිබ්බත්ති බැවින් අවයවයෙහි ලැබෙන බැවින් ඇතුලත් වෙති.

''අවසේසා කුසලා ධම්මා න කුසල මූලාති අවසේසා ඵස්සාදයො කුසලා ධම්මා කුසල මූලානි නාම, නහොන්ති, අථවා අවසේසා ඵස්සාදයො කුසලා ධම්මායෙව නාම න කුසලමූලානීතිපි අත්ථො,'' (අට්ඨ කථා).

අවසේසා කුසලා ධම්මා න කුසල මූලා යනු අවශේෂ ඵස්සාදි කුශල ධර්මයෝ කුසල මූල නම් නොවෙති. නොහොත් අවශේෂ ඵස්සාදිහු කුශල ධර්ම නම් පමණක් වෙති. කුසල මූල නොවෙති යන අර්ථයි.

අවසේසා යන්න පාඨයක් පාසා මෙසේ යොදන්න. පසුව කී නය ක්‍රමයෙහි අවශේෂ ධර්මයෝ කුශල නම් වෙතැයි කියතහොත්, අකුශල අව්‍යාකෘතයෝ කුශල මූල තුනෙන් අවශේෂ ධර්මයෝම වී කුශල නාම් වූ අර්ථය නොගනිත් ද , ''ථෙරො **අභිධම්මං භාසතු**'' තෙරුන් වහන්සේ අභිධර්මය දේශනා කරන සේක්වායි කීමේ දී

තෙරුන් වහන්සේ යනුවෙන් පොදුවේ කී නමුත් අභිධර්මය නුගත් බුද්ධ පබ්බජිත-යකු නොගත යුතුය. අභිධර්මය මනාව උගත් නුවණැති පණ්ඩිතෝත්තමයකු ගන්නා සේ, අවශේෂ ධර්මයෝ යයි පොදුවේ කී නමුත් අකුශල ,අව්‍යාකෘත නොගත යුතු. කුශල නම් වූ ධර්මයෝම ගතයුතු යයි දත යුතු.

ඒකමූල ප්‍රතිලෝම පුච්ඡාවෙහි කුශල නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවනු ලබන චිත්තජ රූප (17) සතළොස ලැබෙත් යයි ස්වරූප උද්ධරන ලදී. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි චිත්තජරූප (15) පසළොසකැයි කියන ලද්දේ නොවේද? උපචය සන්තති දෙක ඇතුලත් කොට (17) සතළොස ගත යුතුය. එසේ වී නම්,

ජාය මානාදි රූපානං - සභාවත්තා හි කෙවලං,
ලක්ඛණානි න ජායන්ති - කෙහිචීති පකාසිතං.

යයි කියන ලද අභිධර්මාර්ථසංග්‍රහ ආචාර්යයන් වහන්සේගේ කීමෙහි වරදක් ඇත්තේ ද , "යෙ පන කම්මාදීහි නිබ්බත්තන්ති, තෙසං අභිනිබ්බත්ති භාවතො ජාතියා තප්පච්චය භාව වොහාරො අනුමතො, න පන පරමත්ථතො ජාති ජායති." (අට්ඨ සාලිනී) මේ පාඨයෙහි ජාතිය යන පදය තන්ත න්‍යාය අනුව සිතන්න.

"යම් රූප කෙනෙක් කර්මාදි හේතුවෙන් උපදිත්ද, ඔවුන්ගේ පහළවීම බැවින් ජාතියට එයම ප්‍රත්‍ය වන බව ව්‍යවහාර කිරීම අනුමතය. පරමාර්ථ වශයෙන් වනාහි ජාතියගේ ඉපදීමක් නැත."

එසේ වී නම් ජරතා අනිච්චතා දෙකද ලක්ෂණ රූපම බැවින් සමානත්වයෙන් ගෙන ඇතුලත් නොවන්නාහු ද, යත් "තත්ථ සියා යථෙව ජාති තෙසං ධම්මානං අභිනිබ්බත්ති තප්පච්චයභාව වොහාරං අභිනිබ්බත්ති වොහාරඤ්ච ලභති. තථා පාකභෙදපි තෙසං ධම්මානං පාකභෙද තප්පච්චයභාව වොහාරං අභිනිබ්බත්ති වොහාරඤ්ච ලභන්තු, ඉදම්පිද්වයං කම්මාදි සමුට්ඨානමෙවාති වත්තබ්බං භවිස්සතිති, න පාකභෙද තං වොහාරං ලභන්ති, කස්මා ජනකපච්චයානු භාවක්ඛණෙ අභාවතො, ජනකපච්චයානඤ්හි උප්පාදෙතබ්බ ධම්මස්ස උප්පාදක්ඛණෙ යෙව ආනුභාවෙ-න තතො උත්තරි" (එම අට්ඨසාලිනී)

එහි ප්‍රශ්නයක් වියහැකිය. යම් සේ ජාතිය ඒ සමුට්ඨාන ධර්මයන්ගේ අභිනිබ්බ-ත්ති එම ප්‍රත්‍යභාව ව්‍යවහාරයත් අභිනිබ්බත්ති ව්‍යවහාරයත් ලබයිද එසේ නම ඒ ධර්මයන්ගේ ජරාමරණයෙන් පාකභෙද තත්ප්‍රත්‍යභාව ව්‍යවහාරය ද අභිනිබ්බත්ති ව්‍යවහාරය ද ලබත්වා, ජරාමරණය වනාහි එම ව්‍යවහාරය නොලබත්. කුමක් හෙයින් ද යත් ජනක ප්‍රත්‍යයාගෙ ආනුභාවක්ෂණයෙහි නොමැති බැවිනි. උපදවිය යුතු ධර්මයන්ගේ උත්පාදක්ෂණයෙහි පමණක්ම ජනකප්‍රත්‍යයන්ගේ ආනුභාවය ඇත්තේ වේ. ඉන් මත්තෙහි නොමැත.

එසේ වී නම් උපචය සන්තති දෙක කුමක් හෙයින් ගනු ලැබේ ද "තෙහිච අභිනිබ්බත්තික්ඛණස්මිං ජාති පඤ්ඤායමානා තප්පච්චයභාව වොහාරං අභිනිබ්බත්ති වොහාරඤ්ච ලභති. තස්මිං ඛණෙ සබ්භාවතො, න ඉතරද්වයං තස්මිං ඛණෙ අභාවතොති නෙවෙතං ජායතීති වත්තබ්බං" (අට්ඨසාලිනී)

ඒ ජනක ප්‍රත්‍යයන් විසින් උපදවන කෙණෙහිම ජාතිය තත්ප්‍රත්‍යභාව ව්‍යවහාරයත් අභිනිබ්බත්ති ව්‍යවහාරයත් ලබයි. ඒ ක්ෂණයෙහි ඇති බැවිනි. ජරතා අනිච්චතා දෙක නොලබත්, ඒ ක්ෂණයෙහි නොමැති බැවිනි. එහෙයින් ඒ දෙක නූපදිත් යයි කිවයුතු.

එසේ වී නම් සූත්‍රාන්ත පිටකයෙහි ජරාමරණය පටිච්චසමුප්පාද හේතු ප්‍රත්‍යයෙන් හටගත් ධර්ම යයි කීම වැරදි නොවේද? "ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නන්ති. ඈගෙ පන්තා ඉදම්පි ද්වයං ජායතීති වෙ, න පරියාය දෙසිතත්තා, තත්ථහි පටිච්ච සමුප්පන්නානං ධම්මානං ජරාමරණත්තා පරියායෙන තං පටිච්ච සමුප්පන්නන්ති වුත්තං," (අට්ඨසාලිනී)

"මහණෙනි! ජරාමරණය අනිත්‍යය, සංඛතය, පටිච්චසමුත්පන්න යයි ආ බැවින් මෙ දෙක උපදිත් ද යත්, නූපදිත්, පර්‍යාය දේශිතයක් බැවිනි. එහි වනාහි පටිච්ච සමුප්පන්න ධර්මයන්ගේ ජරාමරණය බැවින් පර්‍යායෙන් එය පටිච්ච සමුත්පන්නයයි වදාරණ ලදී.

එසේ වී නම ජරාමරණය හේතු ප්‍රත්‍යයෙන් හට නොගන්නේ නම සස විසාණයක් මෙන් නැති දෙයක් බවට ද යන්නේය. නිර්වාණය මෙන් නිත්‍ය ධර්මයක් බවට ද යන්නේ නොවේ ද,

"යදි ඒවං තයම්පෙතං අජාතත්තා සස විසානං විය නත්ථි, නිබ්බාණං විය වා නිච්චම්ති වෙ, න, නිස්සය පටිබද්ධ වුත්තිතො, පඨවී ආදීනං හි නිස්සයානං භාවෙ ජාති ආදි තයං පඤ්ඤායති, තස්මා න නත්ථි, තෙසඤ්ච අභාවෙ න පඤ්ඤායති තස්මා න නිච්චං" (අට්ඨසාලිනී)

ජාති ආදි තුන නොනිපන් බැවින් සස විසාරණයක් සේ නැත්තේද නිවන මෙන් නිත්‍යද යත්, එසේ නොවේ. නිශ්‍රයට අයත් පැවතුම් ඇති හෙයිනි. පෘථුවි ආදි නිශ්‍රයන් ඇති කල්හි ජාති ආදි තුන පෙනේ. එහෙයින් නැත්තේ නොවේ. ඔවුන්ගේ අභාවයෙහි නොපෙනේ. එහෙයින් නිත්‍ය ද නොවේ.

යම් හෙයකින් ජරාමරණය හේතු ප්‍රත්‍යයෙන් හට නොගන්නේ නම් සූත්‍රාන්ත පිටකයෙහි "ජරාමරණං භික්ඛවේ, පටිච්චසපුප්පන්නං" යනුවෙන් කුමක් හෙයින් වදළ සේක් ද ඒ කිසිවක්ම නොවදළ සේක් නම් යහපත් නොවේ ද, "එතම්පිච අභිනිවෙසං පටිසෙධෙතුමෙව ඉදං වුත්තං ජරාමරණං භික්ඛවේ අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නන්ති" (අට්ඨසාලිනී)

මේ මිථ්‍යා ග්‍රහණය වැළැක්වීම පිණිසම ජරාමරණං භික්ඛවේ අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නං' යන මෙය වදාරණ ලදී.

කුසල නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදනා වූ යයි කී තැන්හි කවරක් සුදුසු පරිදි උපදීද, තනිකර උපදින කල්හි සුද්ධාෂ්ටක රූප කලාපය උපදී, ශරීරාංග චලනය ඇති කල්හි කායවිඤ්ඤත්ති නවක කලාපය උපදී. වචී අංග චලනය ඇති කල්හි වචීවිඤ්ඤත්ති දශක රූපකලාපය උපදී, ධාතුසමකාලයෙහි ලහුතාදේකාදශක කලාපය උපදී. මෙසේ වනාහි සුදුසු පරිදි උපදීයයි දත යුතු. යථාරහ – සුදුසු පරිදි යයි නොකියන ලද්දේ නම් සිතක් පාසා චිත්තජ රූප සතළොස උපදිත් යයි අර්ථ ගතයුතු වෙයි.

චිත්තජ රූප චිත්ත හේතුවෙන්ම උපදින්නාහු ද, චෛතසික හේතුවෙන් නූපදින්නාහු ද, යත්,

'' සබ්බෙපිහි චිත්ත චෙතසිකා එකතො හුත්වා රූපං සමුට්ඨාපෙන්ති'' (පට්ඨානට්ඨකථා) සියලුම චිත්ත චෛතසික එකතු වී රූප උපදවත්.

එසේ වී නම් චිත්ත චෛතසිකජ රූප යයි කිවයුතු නොවේද, කුමක් හෙයින් චිත්තජරූපයයි කියන ලද්දේ ද යත්, ''ලොකිය ධම්ම දේසනායම්පනචිත්තස්ස අධික භාවතො තථාවිධං රූපං චිත්තසමුට්ඨානන්ති වුච්චති,'' (පට්ඨානට්ඨ කථා)

ලෞකික ධර්ම දේශනාවේදී වනාහි චිත්තය ප්‍රධාන බැවින් එවැනි රූපයට චිත්ත සමුට්ඨානික රූපයයි කියනු ලැබේ.

කුසලයට සමාන මුල් ඇත්තේ නුයි එකට ඉපදීම සමාන මුල් ඇත්තේ යැයි කිම? කියනු ලැබේද, ඵලභාවයෙන් සම්බන්ධව උපදනේම සමාන මුල් ඇත්තේයයි කිම? කියනු ලැබේද? එකට ඉපදෙන බැවින් සමාන මුල් ඇත්තේ යයි කියන්නේ නම් කුසල් සමග එකවර උපදින ඍතුජ ආහාරජ රූපයෝ ද ගතයුතු වෙති. හේතුඵල භාවයෙන් සම්බන්ධව උපදනා බැවින් සමාන මුල් ඇත්තේ යයි කියන්නේ නම් කවර හේතුඵල සම්බන්ධය වේ දැයි කිවයුතු. හේතු - ඵල අන්‍යෝන්‍යයන් සම්බන්ධව ඉපදීම ඒකමූල නමින් අදහස් කරනු ලැබේ.

කවර නම් හේතු ඵල වශයෙන් සම්බන්ධ වේද යත්,'' යථෙවහි ඵස්සාදීනං අලොභාදයො හෙතුපච්චයත්තා මූලං, තථා තං සමුට්ඨාන රූපස්ස'' (යමකට්ඨකථා) ''යම් සේ වනාහි ඵස්සාදීන්ට අලෝභාදිය හේතුප්‍රත්‍ය බැවින් මූල නම් වේද, එසේ එයින් හටගන්නා රූපයට ද හේතුප්‍රත්‍ය භාවයෙන් අලෝභාදිය මූල බවට පැමිණේ''

හේතුප්‍රත්‍යයෝත්පන්නය හේතුප්‍රත්‍යශක්තිය සමග සම්බන්ධවූයේ හේතුඵල භාවයෙන් ඔවු නොවුන් සම්බන්ධ වූයේ යයි දතයුතු.

හේතු ප්‍රත්‍ය ශක්තිය යනු කවරක්ද යත්, ''හේතු භාවො පන තෙසං සම්පයුත්තානං සුප්පතිට්ඨිතභාව සාධන සංඛාතො මූලභාවො.'' (විභාවිනී ටීකා) තෙසං, – ඒ අලෝභාදී ධර්මයන්ගේ; හේතුභාවො පන – හේතුප්‍රත්‍ය – ශක්තිය වනාහි; සම්ප යුත්තානං, – සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ, සුප්පතිට්ඨිත භාව සාධන සංඛාතො, – මනාසේ පිහිටි බව සිදු කිරීම නම් වූ, මූලභාවො, - මූලභාව නම් වූ ප්‍රත්‍ය ශක්තියයි, මේ පාඨයෙහි සම්පයුත්තානං යනු උපලක්ෂණ න්‍යායයි. සහේතුක චිත්තජ රූප සහේතුක ප්‍රති සන්ධි කර්මජ රූපයන්ගේ ද සුප්පතිට්ඨිත භාවය සිද්ධයයි කියන ලද්දේම වන්නේය.

''අඤ්ඤ මඤ්ඤ යමකෙ යෙකෙචි කුසලාති අපුච්ඡිත්වා යෙ කේචි කුසලමූලෙන එකමූලාති පුච්ඡා කතා කස්මා,? ඉමිනාපි බ්‍යඤ්ජනෙන තස්සෙවත්ථස්ස සම්භවතො'' (අට්ඨකථා)

අඤ්ඤ මඤ්ඤ යමකෙ,- අඤ්ඤම ඤ්ඤ යමක- යෙහි,යෙකේචි කුසලාති,- යෙකේචි කුසලා - යනුවෙන්; අපුච්ඡිත්වා, - නොවිචාරා; යෙ කේචි කුසල මූලෙන ඒකමූලා යයි, පුච්ඡා කතා, - ප්‍රශ්න කරන ලදී. කස්මා, - කුමක් හෙයින් ද යත්, ඉති වෙ පුච්ඡෙය්‍ය, - ඉදින් මෙසේ විචාරතොත් පිළිතුරු කියන්නෙමි. ඉමිනාපි බ්‍යඤ්ජනෙන, මේ කුශලා - යන ශබ්දයෙන් ද, තස්සේව අත්ථස්ස, - ඒ කුසල මූලෙන එකමූලා - යන ශබ්දයෙන් දක්වන ලද අර්ථයම; සම්භවතො, ලැබෙන බැවින්; කතා, - ප්‍රශ්න කරන ලදී. ඉති, - මෙසේ, - විස්සජ්ජෙතබ්බො, - සවිඳිය යුතු. - කුසලා - යන පදයාගේ අර්ථය කුසලමූලෙන ඒකමූලා - යන පදයාගේ අර්ථයෙහි ඇතුලත් වන බැවින් කුසලමූලෙන ඒකමූලා කියා ප්‍රශ්න නගන ලදුයි දත යුතුය.

යට දැක්වූ අට්ඨකථා පාඨය නුසුදුසු යයි ටීකාචාර්‍යයෝ දෙස් දක්වති. ඉමිනාමි බ්‍යඤ්ජනෙන - යන පාඨයෙන් කුසලමූලෙන ඒකමූලා- යන පදය නොගැලපේ යයි කියති. කුසලා - යන පදය ගතයුතු සුදුසු පදයයි දක්වති. (අනුටීකා - මධුටීකා-බලනු)

යට දැක්වූ පුච්ඡාව පිළිබඳ විස්සර්ජනාවෙහි මූලානි – යානි යයි කියන ලද නම කුසල මූලානි – යි විශේෂ කොට කුමක් හෙයින් කියන ලද්දේ ද, '' කුසලමූලානීති ඉදං පුරිමස්ස විසේසනං – මූලානි යානි එකතො උප්පජ්ජන්තිහි වුත්තං, තානි පන කුසලමූලානිපි හොන්ති අකුසල අබ්‍යාකත මූලානිපි, ඉධ කුසලමූලානීති විසේසන දස්සනත්ථ මිදං වුත්තං'' (එම අට්ඨකථාව)

කුසල මූලානි යනු පූර්ව පදයාගේ විශේෂණයයි , මූලානි යානි එකතො උප්පජ්ජ- න්ති – යනුවෙන් කියා ඇත. ඒවා කුසල මූලයෝද වෙති. අකුශල අව්‍යාකෘත මූලයෝ ද වෙති. මෙහි කුසල මූලානි කියා විශේෂණ දැක්වීම පිණිස කියන ලදී. යනු අර්ථයයි.

නුවණැත්තෙක් නම අට්ඨකථා පාඨය නොබලා වුවත් මේ පිළිතුර දීමට සමත් වේ. ඒ පාඨය පිළිබඳ තේරුම ගැනීම පිණිස මෙසේ ද ලියන ලදී.

''තස්සෙව පටිලොම පුච්ඡාය සබ්බෙ තෙ ධම්මා කුසලමූලෙන එකමූලාති අවත්වා සබ්බෙ තෙ ධම්මා කුසලාති වුත්තං, කස්මා! අත්ථවිසේස භාවතො, කුසල මූලෙන ඒකමූලාතිහි පුච්ඡාය කතාය මූලානි යානි එකතො උප්පජ්ජන්තීති හෙට්ඨා වුත්ත නයෙනෙව විස්සජ්ජනං කාතබ්බං භවෙය්‍ය එවඤ්ච සති අත්ථවිසේසාභාවො හොති,'' (එම අට්ඨකථා)

''එහිම ප්‍රතිලෝම පුච්ඡාවෙහි – සබ්බෙ තෙ ධම්මා කුසලමූලෙන එකමූල යයි නොකියා, සබ්බෙ තෙ ධම්මා කුසලා යයි කියන ලදී. කුමක් හෙයින් ද යත්, අර්ථ විශේෂයක් නැති බැවිනි. කුසලමූලෙන එකමූලා – යයි ප්‍රශ්න කළ කල්හි මූලානි යානි එකතො උප්පජ්ජන්ති – යයි යට කී ක්‍රමයෙන්ම පිළිතුරු දියයුතු වන්නේය. එසේ ඇති කල්හි අර්ථ විශේෂයක් නැත්තේ වෙයි. ''යනු එහි තේරුමය.

මෙහි ආමන්තා කියා දෙන පිළිතුරට මූලානි යානි එකතො උප්පජ්ජන්ති යනාදි වශයෙන් අනුලෝමයෙහි මෙන් විභංගය බෙද අර්ථකථාචාරයයීයන් පිළිතුරු දීම සුදුසු නැතැයි ටීකාචාර්යයෝ සිතත්. ටීකාචාර්යයන්ම නුසුදුසු යයි සිතනවා නොව, නුවණැත්තෝද එය නුසුදුසු යයි සිතති.

ටීකාචාර්යයෝ වනාහි ''අඤ්ඤ මඤ්ඤ මූලත්තෙ පන විනිච්ඡිතෙ එකමූලත්ත සංසයාභාවතො සබ්බෙ තෙ ධම්මා, කුසලමූලෙන එකමූලානි පුච්ඡා න කතාති දට්ඨබ්බා'' යයි කියන ලදී.

''අඤ්ඤමඤ්ඤ මූල බව විනිශ්චය කළ කල්හි වනාහි ඒකමූල බව ගැන සංසය නැති බැවින් සබ්බෙ තෙ ධම්මා කුසල මූලෙන ඒකමූලා – යයි ප්‍රශ්න නොකළ බව දතයුතු'' යනු එහි තේරුමය. එසේ වී නම් මූලයමක එකමූල යමකයන්හි සන්නිට්ඨානය පමණක් මාරු කොට සබ්බෙ තෙ ධම්මා කුසලා – යයි කුමක් හෙයින් වදරණ ලද්දේ ද යත්'' කුසලමූලය කීමත් එකමූලය කීමත් කුසල් බව දක්වීමක් නොවෙයි. කුසලය නැති කල්හි සංසය ලැබෙන බැවින් පළමුවැනි දෙවැනි යමක යන්හි සබ්බෙ තෙ ධම්මා කුසලා – යයි ප්‍රතිලෝම පුච්ඡාව කරන ලදී'' ''කුසලමූල වචනං එකමූල වචනඤ්ච කුසල – භාව දීපකං නහොතීති කුසලභාවෙ සංසය සබ්භාවා පඨම දුතිය යමකෙසු – සබ්බෙතෙ ධම්මා කුසලා – යයි ප්‍රතිලෝම පුච්ඡාව කරන ලදී.'' (ටීකා)

කුසලමූලෙන – කුසල නම් වූ මූලය කරණ කොටගෙන, අඤ්ඤමඤ්ඤ මූලා එකක් අනෙකට උපකාර වන මූලක් ඇත්තේ ද,වා, – නොහොත්, එකක් අනෙකගේ මූලනම් වේදැයි අර්ථ සම්බන්ධය සිතනු කවර අර්ථය වඩාත් සුදුසු වේ ද.

''අඤ්ඤමඤ්ඤස්ස මූලං එතෙසන්තීති අඤ්ඤමඤ්ඤමූලා'' යයි ටීකාවෙහි විග්‍රහ කළ බැවින් පළමුවන අර්ථය සුදුසු වේ. අඤ්ඤමඤ්ඤ මූලත්තෙ පන – යනාදී වචනය ද සංසන්දනය වේ.

මූල ායට වඩා අර්ථ විශේෂයක් නැත්තේ නම් මූලමූලනය වදරණ ලද්දේ කුමක් හෙයින් ද යත්. ''මූලනයෙහි කියන ලද්දවූව අර්ථය කුශල මූල භාවයෙන්ද මූලමූලයට විශේෂණ වූ සමාන මූල භාවයෙන් ද, අන්‍යොන්‍යයෙන්ට මූල වූ මූල යෝග දීපන වශයෙන් දැයි මේ කරුණු වශයෙන් ප්‍රකාශ කිරීමට මූල මූලනය වදරණ ලදී.'' මූලනයෙ වුත්තෙයේව අත්ථෙ කුසල මූල භාවෙන මූලමූලස්ස විසේසනෙන සමානෙන මූලෙන අඤ්ඤමඤ්ඤස්ස ච මූලෙන මූලයොග දීපනෙන චාති ඉමිනා පරියායන්තරෙන පකාසෙතුං මූලමූලනයො වුත්තො'' (එම - ටීකා)

මේ ටීකාපාඨයාගේ අර්ථයද ගැඹුරුය, අධිප්‍රාය ද ගැඹුරුය, මේ ටීකා පාඨයාගේ අර්ථයෝජනාව අනුටීකාචාර්‍ය - පාදයෝ මෙසේ දක්වති. ''කුසලමූල භාවයෙන්, මූලයට විශේෂණත්වයෙන්, මූලයෝග දීපන වශයෙන් ප්‍රකාශ කිරීම පිණිස, කුසල මූලමූලායනු කුසල මූල නම් වූ මූලයෝ කුසල මූල මූලා - කියා සමාන යෝජනාව වේ. මූල - වචනය වනාහි නැවැත්විය යුතු ගතයුතු අර්ථයට සාධාරණ වචනයකි. අකුශල වූ ද අව්‍යාකෘත වූ ද මූලයෝ ඇත්තාහුනුයි කුසල - මූල භාවයෙන් මූල නම් වූවෝ විශේෂිතයහ. මූලය ගැනීමෙන්ම මුල්ඇත්තවුන්ගේ මූලයෝගය දක්වන ලද්දේ වේ නුයි සමාන මුල් ඇත්තවුන් වශයෙන් ද මූල යාගේ විශේෂණ වශයෙන් ද මූලයෝගය දැක්වීම් වශයෙන්ද ප්‍රකාශ කිරීම පිණිස, එකමූලමූලාති අඤ්ඤමඤ්ඤස්ස මූලෙන මූලභාවෙන මූලස්ස විසේසනේන මූලයෝග දීපනේන ච පකාසෙතුං අඤ්ඤමඤ්ඤ මූල මූලායයි මූල මූල නය කියන ලදී.

''කුසලමූල භාවෙන මූලස්ස විසේසනේන මූලයෝග දීපනේන ච පකාසේතු කුසලමූලමූලාති කුසල - මූල භූතා මූලා කුසලමූල මූලාති සමාන යෝජනා; මූල වචනං හි නිවත්තෙතබ්බ ගහෙතබ්බ සාධාරණං, අකුසලා බ්‍යාකතාපි මූල ධම්මා අත්ථීති කුසලමූලභාවෙන මූලධම්මා විසේසිතා, මූලග්ගහණේන ච මූලවන්තානං මූලයොගො දීපිතො හොති. සමානේන මූලෙන මූලස්ස විසේසනෙන මූලයොග දීපනේන ච පකාසෙතුං එකමූලමූලාති අඤ්ඤමඤ්ඤස්ස මූලෙන මූලභාවෙන මූලස්ස විසෙසනෙන මූලයොග දීපනේන ච පකාසෙතුං අඤ්ඤමඤ්ඤ මූල මූලාති මූලමූල නයො වුත්තො'' යි කියන ලදී.

**මධුසාරත්ථදීපනී ආචාර්‍ය** පාදයෝ වනාහි, ''කුසලමූල භාවෙනාති එතං මූලස්ස විසේසනෙනාති එතස්ස විසේසනං, මූලස්ස විසේසනෙන සහ පවත්තෙන කුසල මූල සද්දෙන සමානේන මූලෙන තබ්බිසේසන භූතෙන මූලස්ස විසේසනේන ච මූලයොග දීපනේන ච එකමූල මූල-සද්දෙන, අඤ්ඤමඤ්ඤස්ස මූලෙන තබ්බිසේසන භූතේන මූලස්ස විසේසන්නෙ ච මූලයෝග දීපනෙන ච, අඤ්ඤමඤ්ඤ මූල සද්දෙනාති යෝජනා, අයං පන යෝජනා අනුටීකාය අසමනාපි ගහෙතබ්බාව''යයි විශේෂයෙන් කීහ. ගණ්ඨියෙහි - ද කියන ලද විස්තරයෙන් ගත යුතුය. දූන් අනුටීකා, මධුටීකා පාඨයන් පාඩම් කොට අර්ථ සිතා බලන්න.

අව්‍යාකෘත පද එකමූල යමකයෙහි අනුලෝම ප්‍රවෘත්තියෙහි අහේතුක සිත් (18) අටළොස, ඡන්ද - වර්ජිත අන්‍යසමාන චෛතසික (12) දෙළස, අහේතුක ප්‍රතිසන්ධි (2) දෙක, දෙපස් විඤ්ඤාණ සිත් (10) දශය වර්ජිත අහේතුක විපාක අහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදින අහේතුක චිත්තජ රූප, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූප, බාහිර රූප, ආහාරජ රූප , ඍතුජ රූප, අසංඥසත්ව කර්මජ රූප, ප්‍රවෘත්ති කර්මජ රූප, කුශල අකුශල නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදින සහේතුක චිත්තජ රූප, හා නිර්වාණය ගනු ලැබෙති. සහේතුක විපාක (21) එක්විස්ස, සහේතුක ක්‍රියා (17) සතළොස චෛතසික (38) අටතිස, සහේතුක ප්‍රතිසන්ධි (13) තෙළෙස, අරූප විපාක (4) සතර, අර්හත්ත චුතිය වර්ජිත සහේතුක විපාක ක්‍රියා නාමස්කන්ධයන් නිසා සුදුසු පරිදි උපදින සහේතුක චිත්තජ රූප, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූප යන මොවුහු ද ගනු ලැබෙතියි ස්වරූප උද්ධරනු.

මේ ස්වරූප ඉදිරිමේදී කුමක් හෙයින් අහේතුක ප්‍රතිසන්ධි (2) දෙක අත්හරින ලද්දේද, අභිධර්මාර්ථ - සංග්‍රහාචාර්‍ය පාදයෝ ''අරූප විපාක ද්විපඤ්ච විඤ්ඤාණ වජ්ජිතං'' යි කීවාහු නොවෙත් ද, ''ප්‍රතිසන්ධි චිත්තය හා චුති චිත්තය ද එකුන් විසි භවංගයටම ඇතුලත් බැවින් වෙනත් සිතක් නොවේනුයි එය අත් නොහරින ලදී.' 'පටිසන්ධි චිත්තං පන චුතිචිත්තඤ්ච එකූනවීසති භවංගස්සෙව අන්තොගධත්තා චිත්තන්තරං නාහොතීති, නතස්ස වජ්ජනං කතං'' (විභාවිනි ටීකා) සහේතුක ප්‍රතිසන්ධිය හා අර්හත්ත චුතිය අත්හැරීමෙහිදීද ක්‍රමය මෙසේමය,

රූප ඉපදවීමට අසමත් වූ සිත් කොපමණද, ''සියලු සත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තය, ක්ෂීණාශ්‍රව චුති චිත්තය, දෙපස්විඤ්ඤාණ (10) දශය, අරූප විපාකසිත් සතර යන මේ සත් (16) සොළොස් දෙන රූප නුපදවන්නාහ.'' ''සබ්බසත්තානං හි පටිසන්ධි චිත්තං ඛීණාසවස්ස චුති චිත්තං ද්වෙපඤ්ච විඤ්ඤාණානි. චත්තාරි අරූප විපාකානීති සොළස චිත්තානි රූපං න සමුට්ඨාපෙන්ති,'' **(සම්මොහ විනොදනි)**

**මූල ටීකාචාර්ය පාදයෝ** වනාහි, සියලු සත්වයන්ගේ චුතිචිත්තයෝ ද රූප නුපදවන්නාහු යයි කීහ.

**අනුටීකාචාර්‍ය පාදයෝ** වනාහි, චුති චිත්තයට පූර්ව සතළොස්වැනි චිත්තයාගේ පටන් රූප නුපදවන්නාහ යයි කීහ.

කුමක් හෙයින් ප්‍රතිසන්ධි චිත්තය රූප නුපදවන්නේ ද යත්, ''එහි ප්‍රතිසන්ධි චිත්තය වනාහි වස්තු දුර්වල බැවිනුත්, නොපිහිටි වස්තු ඇති බැවිනුත් ප්‍රත්‍ය විකලතා බැවිනුත් ආගන්තුක බැවිනුත් රූප නුපදවන්නේය'' ''තත්ථ පටිසන්ධි චිත්තං තාව වත්ථුනො දුබ්බලතාය අප්පතිට්ඨිතතාය පච්චය වෙකල්ලතාය ආගන්තුකතාය ච රූපං න සමුට්ඨාපෙති.'' (සම්මොහ විනොදනි)

**පට්ඨාන අට්ඨකථා පාඨයෙහි** වනාහි ''කුමක් හෙයින් වනාහි ප්‍රතිසන්ධික්ෂණයෙහි චිත්තය චිත්තජ රූප ඉපදවීමට නොහැකි වන්නේ ද, කර්මවේගයෙන් ඔසවා දමනලද බැවින් හා නොපිහිටි වස්තු බැවින් දුර්වල බැවින්'' යයි විශේෂයෙන් කියන ලදී,'' ''කස්මා පන පටිසන්ධික්ඛණෙ චිත්තං චිත්තජරූපං ජනෙතුං නසක්කොන්ති කම්මවේගක්ඛිත්තත්තාය චෙව අප්පතිට්ඨිත වත්ථුතාය ච දුබ්බලත්තා'' යි දක්වා ඇත.

ක්ෂීණාශ්‍රවයන්ගේ චුතිචිත්තය රූප නූපදවනුයේ කවර හෙයින් ද යත්, ''ක්ෂීණාශ්‍රවයන්ගේ චුති – චිත්තය වනාහි වට්ටමූලයාගේ සංසිඳුනු බැවින් රූප නූපදවයි. ඛීණාසවස්ස චුතිචිත්තං පන වට්ටමූලස්ස වූපසන්තත්තා රූපං න සමුට්ඨාපෙති.'' (සම්මෝහ විනොදනී).

කුමක් හෙයින් වනාහි දෙපස් විඤ්ඤාණ සිත් දශය රූප නූපදවත්ද, ''දෙපස් විඤ්ඤාණ සිතෙහි වනාහි ධ්‍යානාංග නැත. මාර්ගාංග නැත. හේතු නැත. චිත්තාංග දුබලනුයි චිත්තාංග දුබල බැවින් ඒවා රූප නූපදවන්නාහ.'' ''ද්විපඤ්ච විඤ්ඤාණෙසු පන ඣානංගං නත්ථි, මග්ගංගං නත්ථි, හේතු නත්ථීති. චිත්තංගං දුබ්බලං හොතීති චිත්තංග දුබ්බලතාය නාති රූපං නසමුට්ඨාපෙන්ති.'' (එම සම්මොහ විනොදනී)

අරූප විපාක සිත් සතර රූප නූපදවන්නේ මක්නිසාද යත්, ''සතරක් වූ අරූප විපාක චිත්තයෝ ඒ භවයෙහි රූපකයක් නැති බැවින් රූප නූපදවති.'' ''චත්තාරි අරූප විපාකානි තස්මිං භවෙ රූපස්ස නත්ථිතාය රූපං න සමුට්ඨාපෙන්ති.'' (එම සම්මොහ විනෝදනී).

බාහිර රූපය වනාහි උතුජ රූපම වී උතුජරූප නමින් කොටසක් තිබෙද්දී කුමක් හෙයින් වෙන් කොට කියන ලද්දේද. **පට්ඨාන පාලියෙහි** ''බාහිරං ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං'' යි වෙන් කොට වදරා ඇති බැවින් වෙනම කියන ලදී.

පට්ඨාන පාලියෙහි වනාහි කුමක් හෙයින් වෙන් කොට දේශනා කරන ලද්දේද, අනින්ද්‍රිය බද්ධ රූප වෙන් කොට දේශනා කළයුතු බැවින් එසේ වෙනම වදරණ ලදයි දතයුතු.

සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපය පමණක් ''අබ්‍යාකත මූලෙන ඒකමූලා'' යයි කුමක් හෙයින් කියන ලදද, සහේතුක ප්‍රවෘත්ති කර්මජ රූපය වනාහි කුමක් හෙයින් නොකියන ලද්දේද යත්, ''ප්‍රතිසන්ධියෙහි දී කර්මජ රූපයන්ගේ පැවැත්ම ප්‍රතිසන්ධි චිත්තය හා බැඳී පවතී. ප්‍රවෘත්ති කාලයේදී වනාහි ඒ රූපයන්ගේ පැවැත්ම චිත්තය ඇතත් කර්මය හා බැඳී පවතී, (කර්ම ප්‍රතිබද්ධම වේ.) චිත්ත ප්‍රතිබද්ධ නොවේ. චිත්තය නිරුද්ධ කල්හි නිරෝධ සමාපත්ති සමාපන්නවූන්ටත් කර්මජ රූප උපදිත්ම ය'' ''කස්මා පනායං හේතු පටිසන්ධියමෙව කටත්තාරූපානං හේතුපච්චයො හොති. න පවත්තෙති, පටිසන්ධියං කම්මජ රූපානං චිත්තපටිබද්ධ –

වුත්තිනාය, පවත්තියම්පන තෙසං චිත්තෙ විජ්ජමානෙපි කම්මපටිබද්ධාව පවත්ති, න චිත්තපටිබද්ධා, අවිජ්ජමානෙවාපි චිත්තෙ නිරෝධ සමාපන්නානං උප්පජ්ජන්තියේව,'' **(පට්ඨාන අට්ඨකථා)**

ප්‍රතිසන්ධියෙහි දී පමණක් සිත හා සම්බන්ධ වී ප්‍රවෘත්ති කාලයෙහි සිත හා සම්බන්ධ නොවන්නේ කුමක් හෙයින් ද යත්, ''කෙතත් ජලයත් ඇත්තේ නමුත් සස්‍ය රෝපණයේ දී බීජානුභාවයෙන් අංකුරය හටගන්නා සේ ප්‍රතිසන්ධි චිත්තක්ෂණයෙහි චිත්තානුභාවයෙන් රූපකායයාගේ උප්පත්තිය වේ. අංකුරය නැගී බීජ ඉවත්වූ කල්හි වනාහි පොහොර වතුර හේතුවෙන් අංකුරයාගේ මතු මත්තෙහි පැවැත්ම වන්නාසේ චිත්තයෙන් තොරව ද ප්‍රවෘත්ති කාලයේදී කර්මයෙන්ම කටත්තා රූපයන්ගේ පැවැත්ම වේ යයි දතයුතු. කර්මය ක්ෂෙත්‍රය, විඥානය බීජය, තණ්හාව ජලයයි ද කියන ලද්දේම ය. ''සන්තේපි ඛෙත්තෙ ආපෙච පයමුප්පත්තියං, බීජානුභාවෙන රුක්ඛුප්පත්ති විය පටිසන්ධික්ඛණේ චිත්තානුභාවෙන රූපකායස්ස උප්පත්ති, බීජෙ පන විගතෙපි පඨවි ආපානුභාවෙන රුක්ඛස්ස උපරූපරි පවත්ති විය විනා චිත්තේන කම්මතොව කටත්තා රූපානං පවත්ති හොතීති, වෙදිතබ්බා වුත්තම්පි චෙතං කම්මං ඛෙත්තං විඤ්ඤාණං බීජං තණ්හා ස්නොහොති'' **(එම පට්ඨානට්ඨ කථා)**

චිත්ත චෛතසික නිර්වාණ පමණක් නාම යයි කුමක් හෙයින් කියන ලදද, රූපය පමණක් නාම යයි නොකියන ලද්දේ කුමක් හෙයින් ද යත්, ''නමින් ප්‍රකට වෙයි; නාමයෙන් තොරව ප්‍රකට නොවේනු යි නාමය නම් වේ. රූපයෙන් ප්‍රකට වෙයි, නාමයෙන් තොරව ප්‍රකට වේනුයි රූපය නම්.'' ''නාමයති විනා නාමෙන පාකටං න හොතීති නාමං රූපයති විනා නාමෙන පාකටං හොතීති රූපං '' යයි කියන ලද නික්ඛෙප කාණ්ඩය හා මූලටීකා පාඨය අනුව (සට – පට) කළය වස්ත්‍රය යනාදියෙහි ඇත්තා වූ රූපය නාමයෙන් තොරව ප්‍රකට වන බැවින් නාමයයි නොකියනු ලබයි.

ඒකමූල යමක අනුලෝමයෙහි ''අහේතුකං නාමං නාමමූලෙන න එකමූල යයි නාම ශබ්දය සමග යෙදීම සුදුසු ද, ''අහේතුකං නාමමූලෙන න එකමූලං'' යයි නාම ශබ්දය නැතිව යෙදීම සුදුසු ද, ''යම් පාළියෙක අහේතුකං නාමමූලෙන න එකමූල' සහේතුකං නාමමූලෙන එකමූලං කියා පාඨයක් ආයේද, එහි යෙ කෙචි නාමා ධම්මා යයි නාමයන් වෙන්කළ බැවින්, අහෙතුකං–සහේතුකං යයි කී කල්හි නාමයක්ම යයි මෙය හැඟෙන්නේම වේ යයි නොකියන ලදූයි දතයුතු. යම් තැනක වනාහි අහේතුකං නාමං සහේතුකං නාමං කියා පාඨයක් වේද, එහි මනාව ප්‍රකට වීම පිණිස ''නාමං'' යි කියා ඇත. ''යස්සං පාලියං අහේතුකං නාම මූලෙන න ඒකමූලං, සහේතුකං නාම මූලෙන එකමූලන්ති පාඨො ආගතො, තත්ථ යෙ කෙචි නාමා ධම්මාති නාමානං නිද්ධාරිත්තතා අහේතුකං සහෙතුකන්ති ච වුත්තෙ නාමන්ති ච ඉදං විඤ්ඤායමාන මෙවාති න වුත්තන්ති වෙදිතබ්බං, යත්ථ පන අහේතුකං නාමං සහේතුකං නාමන්තිව පාඨො, තත්ථ සුපාකට භාවත්ථං නාමන්ති වුත්තං,'' (ටීකා)

නාම ශබ්දයෙන් තොරව ඇති තැන කුමක් හෙයින් නාම ශබ්දය නොකියන ලද්දේ දැයි ප්‍රශ්න කළ යුතුය. විසඳුම යට කී ටීකා පාඨයෙහි කියන ලදී. නාම ශබ්දය ඇති තැන කුමක් හෙයින් නාම ශබ්දය කියා ඇත්තේදැයි ප්‍රශ්න කළයුතුය. පිළිතුර යට කී ටීකා පාඨයෙහි කියා ඇත.

මූල යමකයෙහි ගණ්ඨි පද විවරණය නිමි.

---

# ඛන්ධ යමක ගණ්ඨි

## ප්‍රඥප්ති උද්දේශ වාරය

පවුත්තං මූල යමකෙ – කිඤ්චි නියාම පබ්බකං
ඛන්ධෙ දනි පවක්ඛාමි – තම්පි සුණන්තු සොතුනො

මූලයමකයට අනතුරුව ආයතන යමකාදිය නොවදරා කුමක් හෙයින් ස්කන්ධ යමකය වදරණ ලද්දේද යත්, ප්‍රභෙද අඩු බැවිනි. ''අප්පභෙදත්තා'' **(විභංග ටීකා)**

එසේ වී නම් සංස්කාර යමකය දේශනා කිරීමට සුදුසු නොවේ ද? ''නිර්වාණය හැර සියලු ධර්ම මෙහි සංග්‍රහ කළ බැවිනි.'' ''නිබ්බාන වජ්ජානං 'සබ්බධම්මානං සංගහිතත්තා ච'' (එම විභංග ටීකා)

කුමක් හෙයින් චනාහි ස්කන්ධ පසක්ම දේශනා කරන ලද්දේ වේද, ස්කන්ධ සතරක් හෝ හයක් හෝ යනාදී වශයෙන් නොවදළේ මන්ද? ''සියල්ල සංගෘහිත බැවින්ද සභාග ධර්ම එකට සංග්‍රහ වන බැවින් ද ආත්ම ආත්මනිය වශයෙන් ගනු ලබන වස්තු මෙපමණක්ම බැවින් හා අනිකෙක් නැති බැවින් ද ස්කන්ධ (5) පහක් පමණක් වදරණ ලදහ. ''කස්මා පන භගවතා පඤ්චෙව ඛන්ධා වුත්තා අනූනා අනධිකාති, සබ්බසංගහ සභාගෙක සංගහතො අත්තත්තනිය ගාහ වත්ථුස්ස එතපරමතො අඤ්ඤෙසඤ්ච තදවරොධතො.'' (සම්මොහ විනොදනි)

කුමක් හෙයින් රූපස්කන්ධය පළමු කොට වදරණ ලද්ද, රූපස්කන්ධාදීන්ට අනතුරුවත් සඤ්ඤාස්කන්ධාදිය නොවදරා කුමක් හෙයින් වේදනාස්කන්ධය යනාදිය පිළිවෙලින් දේශනා කරන ලද්දේද? ''චක්ෂුරාදීන්ට අරමුණු වූ වර්ණාදී රූපය ඖදරික බැවින් සුවසේ අවබොධ කර ගැනීම පිණිස රූපස්කන්ධය පළමු කොට දක්වනු ලැබේ. ඉෂ්ට අනිෂ්ට ආරම්මණ රස වින්දනය කරන වේදනාව ඉන් අනතුරුව දක්වන ලදී. ''යමක් විඳිද එය හඳුනාගනී'' යයි. එසේ වේදනාවට ගෝචර වූ අරමුණ ගැන ආකාරය ගන්නා වූ සංඥව, සංඥ වශයෙන් සිත සකස් කරන සංස්කාර, ඒ වේදනාදීන්ට නිශ්‍රය වූ අධිපති ද වූ විඤ්ඤාණය පිළිවෙලින් දක්වන ලදහ. ''සුඛග්ගහණත්ථං චක්ඛු ආදීනං විසය භූතං ඔළාරිකං පඨමං රූපක්ඛන්ධං දස්සේති,

තතො ඉට්ඨානිට්ඨ රූපසංවේදිතං වේදනං, යං වේදයති තං සඤ්ජානාතීති ඒවං වේදනා විසයස්ස ආකාරග්ගාහිකං සඤ්ඤං සඤ්ඤා වසෙන අභිසංඛාරකෙ සංඛාරෙ, තෙසං වෙදනාදීනං නිස්සයං අධිපති භූතඤ්ච විඤ්ඤාණං'' **(සම්මොහ විනොදනී)**

ස්කන්ධ ශබ්දය කොපමණ අර්ථයන්හි යෙදේද යත්, ඛන්ධො ගුණෙ ච රාසිම්හි පණ්ණත්තියඤ්ච රූළ්හියං'' දැක්වූ බැවින් ''සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො'' යන තැන්හි ගුණයෙහිද, ''අසංඛෙය්‍යො අප්පමෙය්‍යො මහා උදකක්ඛන්ධොත්වෙව සංඛං ගච්ඡති'' යන තැන්හි රාශියෙහි ද ''අද්දසා ඛො භගවා මහන්තං දරුක්ඛන්ධං ගංගාය නදියා සොතෙන වුය්හමානං'' යන තැන්හි ප්‍රඥප්තියෙහි ද, ''විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධොති'' යන තැන්හි රූළහී අර්ථයෙහි ද යෙදේ.

මෙහි ස්කන්ධ ශබ්දය කවර අර්ථයක් කියන්නේ ද යත්, රාශි අර්ථය කියන්නේය. ''ස්වායම්ධ රාසිතො අධිප්පෙතො'' (සම්මොහ විනොදනී)

පඨවිධාතු ආපොධාතු යනාදිය සමූහ වශයෙන් ගෙන රූපස්කන්ධයයි කියන ලදද, කවර ධර්ම සමූහයකගේ වශයෙන් රූපස්කන්ධයයි කියනු ලැබේද යත්,

අතීතානාගතං රූපං - පච්චුප්පන්න මථාපරං,
අජ්ඣත්තං වා බහිද්ධා වා - සුඛුමොළාරිකං තථා,

හීනං පණීතං යං දූරෙ - සන්තිකෙ වා තදෙකතො
සබ්බං රූපං සමොධාය-රූපක්ඛන්ධොති වුච්චති'ති, (නාමරූප පරිච්ඡෙද)

වෙදනාස්කන්ධාදීයෙහි ද මේ නය ක්‍රමය මැයි.

''අභිඤ්ඤෙය්‍යා කථා හි අභිධම්ම දෙසනා'' යන ඉන්ද්‍රිය විභංග ටීකා පාඨය අනුව අභිධර්ම දේශනාව අභිඤ්ඤෙය්‍යා කථාවක් බැවින් පරිඤ්ඤා වාරයම කීමට සුදුසුය. එසේ නම් පඤ්ඤත්ති වාරය කුමක් හෙයින් වදාරණලදද යත්, ''පරිඤ්ඤාවන් අතුරෙන් තීරණ පරිඤ්ඤාවෙන් තොරව පහාණ පඤ්ඤාවක් නැත. තීරණ පරිඤ්ඤාව ද සම්පූර්ණ නාමරූප පරිග්‍රහණය ඇත්තාහටම ලැබෙන්නේ වේ. කාලපුද්ගල ඕකාස විභාග වශයෙන් ස්කන්ධයන් පිළිබඳ වෙන වෙනමත් එක්වමත් උත්පාද නිරොධ ලක්ෂණ පරිග්‍රහණයෙන්ම සාතිශය වශයෙන් තීරණ පරිඤ්ඤාව ලැබෙයි. නැත් නම් නොලැබේ'' ''පරිඤ්ඤාසු ච න විනා තීරණ පරිඤ්ඤාය පහාණපරිඤ්ඤා, තීරණඤ්ච සම්පුණ්ණ පරිග්ගහස්ස අධිප්පෙතත්තා, කාලපුග්ගලොකාස විභාගමුඛෙන ඛන්ධානං විසුං සහච උප්පාද නිරොධ ලක්ඛණ පරිග්ගහවසේන සාතිසයං සම්භවති න අඤ්ඤථා'' (යමක අනුටීකා)

ඉදින් ප්‍රවෘත්ති වාරය කියන්නේ නම් කුමක් හෙයින් ප්‍රඥප්ති වාරය කියන ලද්දේද යත්, ඉදින් වනාහි ප්‍රඥප්ති වාරය දේශනා කිරීමෙන් ''අභිධර්ම දේශනාව අභිඤ්ඤෙය්‍යා කථාව'' නොවන්නේ ය යන අර්ථයක් නොකිය වෙන්නේ ද යත්,''යම් සේ තීරණ පරිඤ්ඤාව හැර පහානපරිඤ්ඤාව නැත්තේද එසේම තීරණ පරිඤ්ඤාවද

ඤාත පරිඤ්ඤාව හැර නැත්තේ වේ. ඒ ඤාතපරිඤ්ඤාව ද සූතමය ඤාණය මූලිකය දේශනා කුශල වූ ශාස්තෲන් වහන්සේ අන්වය – ව්‍යතිරේක වශයෙන් සමූහය අවයව ප්‍රභෙදදී විභාග දැක්වීම වශයෙන් ස්කන්ධයන්ගේ පරිඤ්ඤා ප්‍රභෙදය ප්‍රකාශකරනු කැමතිව ''පඤ්චක්ඛන්ධා'' යනාදි ක්‍රමයෙන් දේශනාව පටන් ගත්හ.'' ''යථා න තීරණ පරිඤ්ඤාය විනා පහානපරිඤ්ඤා, ඒවං තීරණ පරිඤ්ඤා න විනාඤාතපරිඤ්ඤාය, ඤාව සූතමය ඤාණ මූලිකාති දෙසනා කුසලො සත්ථා අන්වයතො බ්‍යතිරෙකතො ච සමුදයාවයවපදත්තාදි විභාග දසසත මුඛෙන ඛන්ධෙසු පරිඤ්ඤා පභෙදං පකාසෙතුකාමො පඤ්චක්ඛන්ධාති ආදිනා දේසනං ආරභීති.'' **(ඒම යමක අනුටීකා)** ගැඹුරුය සිතාබලනු.

පරිඤ්ඤා තුන මාර්ගක්ෂණයේ දී එකවර ලැබෙති. විදර්ශනා ඥාන නම් වූ පූර්ව භාගයෙහි වෙන වෙනම ලැබෙති. මේ **යමක අනුටීකා** පාඨයෙහි වනාහි පූර්ව භාගය කියන ලදී. පූර්වභාගයෙහි කවර කලක පටන් ලැබේ ද යත්, ''රූපය රුප්පන ලක්ෂණය, ඵස්සය ඵුසන ලක්ෂණය යනාදි වශයෙන් සාමාන්‍ය ලක්ෂණ විශේෂ ලක්ෂණ විදර්ශනා කරන දිට්ඨිවිසුද්ධි කංඛාවිතරණ විසුද්ධි දෙක ඤාතපරිඤ්ඤාවය, එතැන් සිට අනුලෝමය තෙක් තීරණ පරිඤ්ඤාවය. උදව්‍යයානුපස්සනාවේ පටන් මාර්ගය තෙක් පහානපරිඤ්ඤාවය,'''' රුප්පන ලක්ඛණං රූපං, ඵුසන ලක්ඛණො ඵස්සොති ආදිනා සාමඤ්ඤ විසේස ලක්ඛණ පරිග්ගාහිකා දිට්ඨිකංඛාවිතරණ විසුද්ධියො ඤාතපරිඤ්ඤා, තතො පරං යාවානුලොමා තීරණපරිඤ්ඤා උදයබ්බයානුපස්සනතො පට්ඨාය යාවමග්ගා පහානපරිඤ්ඤා'' (ධම්මහදය විභංග ටීකා)

මේ පාඨයෙහි උදයබ්බයානුපස්සනා යනු ''සම්මසනඤාණං, උදයබ්බයඤාණං භංගඤාණං, භයඤාණං, ආදීනව ඤාණං, නිබ්බිදඤාණං, මුඤ්චිතු කම්‍යතා ඤාණං, පටිසංඛා ඤාණං, සංඛාරුපෙක්ඛා ඤාණං, අනුලෝම ඤාණංඤ්චාති දස විපස්සනා ඤාණානි''යි, අභිධර්මාර්ථසංග්‍රහ ආචාර්‍ය්‍ය පාදයන්කියනලද පරිදි විදර්ශනා ඥාන දසයෙකි.

ඉහත දැක්වූ වචන සමූහය පැහැදිළිව දක්වන්නෙමි. අභිධර්ම දේශනාව අභිඤ්ඤෙය්‍ය කථාවක් වේ නම් මූලයමකයෙහි කවර නම් අභිඤ්ඤෙය්‍ය කථාවක්. වේ ද, ''ප්‍රත්‍ය පරිග්‍රහණය අවසන් කොට ඇතියේ ඤාතපරිඤ්ඤාවනුයි ප්‍රත්‍යය දක්වන මූලයමකයෙන්ඤාතපරිඤ්ඤාව විභාවනය කරන ලදී.'''' පච්චය පරිග්ගහපරියොසානා ඤාතපරිඤ්ඤාති පච්චය දීපකෙන මූලයමකෙනඤාත පරිඤ්ඤං – පෙ – විභාවෙත්වා (අනුසය යමක ටීකා)

පරිච්ඡේද වාරය යනු සීමාව නිමාව දක්වන වාරයයි කියනලදී. කවර සීමාවක් වෙන්කොට දක්වන ලද්දේද යත්, ස්කන්ධයෝ පස් දෙනෙක් ඇත. පහට අඩුවෙන් ද නැත. පහට අධිකව ද නැත. මෙසේ අඩු වැඩි බව අත්හැරීම් වශයෙන් සීමාව පරිච්ඡේදය දක්වන ලදී.

පරිච්ඡින්නුද්දේශ වාරය යනු පිරිසිඳින ලද ධර්මයන් සංක්ෂේපයෙන් දක්වන වාරයයි කියනු ලැබේ.

පදසෝධන මූලචක්‍ර වාරයෙහි චක්‍රය යන රවුමක් බැවින් කියන ලද්දේද, කුමක් හෙයින් චක්‍ර නම් වේද යත්, ''රූපං රූපක්ඛන්ධොති – යනාදී ක්‍රමයෙන් මුල්පදය නැබ කොට ඛන්ධා–පදය නේමිය කොට වේදනාක්ඛන්ධො – යනාදිය අරකොට චක්‍ර බව කියන ලදී. මණ්ඩලයක් – රවුමක්ව සම්බන්ධ වන නිසා නොවේ. වේදනා-ස්කන්ධ මූලකාදියෙහිද යට පද ශුද්ධ කොට ම දේශනාව ගමන් කරන ලදී. මණ්ඩල බැඳීමෙන් නොවේ. ''රූපං රූපක්ඛන්ධොති ඒවමාදිකං මූලපදං නාභිංකත්වා ඛන්ධාති ඉදං පදං නෙමිං. වේදනාක්ඛන්ධාති ආදිං අරෙ කත්වා චක්කභාවො වුත්තො,න මණ්ඩල භාවෙන සම්බජ්ඣනතො වේදනාක්ඛන්ධ මූලකාදීසුපිහි හෙට්ඨිමං ධූසාධෙත්වාව පාඨො ගතො න මණ්ඩල සම්බන්ධෙන ''**(ස්කන්ධ යමකටීකා)** රථ චක්‍රයකට සමාන බැවින් චක්‍රයයි කියන ලදී. මණ්ඩලයක් – රවුමක් නිසා කියන ලද්දේ නොවේයයි දතයුතු.

ශුද්ධ ස්කන්ධවාර ප්‍රතිලෝම පුච්ඡාවෙහි අර්ථයෝජනා ක්‍රමය මෙසේය. ''ඛන්ධා රූපං – යනාදියෙහි ඛන්ධා රූපක්ඛන්ධො ඛන්ධා වේදනාක්ඛන්ධො – යනුවෙන් අර්ථ යොදගත යුතුය. කුමක් හෙයින් ද යත්, නිර්දේශ වාරයෙහි මෙසේ බෙද ඇති බැවිනි. ''ඛන්ධා–රූපන්ති ආදීසු ඛන්ධා රූපක්ඛන්ධො ඛන්ධො වේදනාක්ඛන්ධොති අත්ථො ගහෙතබ්බො, කස්මා නිද්දෙස වාරෙ එවං විභජිතත්තා'' **(මේ ස්කන්ධ යමක අට්ඨකථා)**

රූපං කියාම ශබ්දයක් ඇත. ඒ ශබ්දය එකතුකොට රූපක්ඛන්ධා නම් වේදැයි අර්ථ සම්බන්ධය කුමක් හෙයින් කරන ලදද . පැහැදිලි කරුණකි. සම්බන්ධ කළයුතු වූ රූපං යන්නක් පාලියෙහි නැත. රූපක්ඛන්ධො යන අර්ථය වෙන්කොට දක්වන ලදැයි දතයුතු. ''වචන ශෝධනයෙහි මෙන් ම මෙහි වචනය ප්‍රමාණ නොවේ. යම් යම් පරිච්ඡේදයකින් වනාහි ශුද්ධ ස්කන්ධයෝ ලැබෙත් ද, ඒ ඒ පරිච්ඡේදයෙන් අර්ථයට ප්‍රමාණ වේ'' ''වචන සොධනෙ විය හි එත්ථ වචනං න පමාණං, යථා යථා පන සුද්ධ ඛන්ධා ලබ්භන්ති, තථා තථා අත්ථොව පමාණං'' **(එම ස්කන්ධ යමක අට්ඨකථා)**

පාලියෙහි – රූපං – කියා ඇත්තේ නමුත් ශබ්දය ප්‍රමාණ කරනු නොලැබේ. අර්ථය ප්‍රමාණ කොට රූපස්කන්ධය නම් වේ යයි අර්ථය සම්බන්ධය වේ. රූපක්-ඛන්ධො කියා පාලියෙහි ඇති බැවින් සම්බන්ධ නැතැයි දතයුතු.

උද්දේශයෙහි ගැටපද නිමි.

---

## ප්‍රඥප්ති නිර්දේශ වාරය

පියරූප සාතරූපයෙහි රූප අටවිස්ස ඇතුලත් නමුත් න රූපක්ඛන්ධො යයි කුමක් හෙයින් වදරණ ලදද යත්, පියරූපං සාතරූපං යනුවෙන් තෘෂ්ණාවට අරමුණු වූ ත්‍රෛභූමික සියල්ල දතයුතුය. එනිසා පඤ්චස්කන්ධ සමූහය වූ ප්‍රිය වූ මිහිරි වූ යමක් වේ ද එය රූපස්කන්ධය වන්නේ ඒකදේශ මාත්‍රයෙකිනි. එනිසා පියරූපං සාත-

රූපං රූපං න රූපක්ඛන්ධො යයි වදරණ ලදී. ''පියරූපං සාතරූපන්ති - පෙ -තණ්හා භූතං තෙභූමකං වේදිතබ්බං, තස්මා යං පඤ්චක්ඛන්ධ සමුදයභූතං පියරූපං සාතරූපං තං එකදෙසෙන 'රූපක්ඛන්ධො හොතීති ආහ පියරූපං සාතරූපං රූපං නරූපක්ඛන්ධොති.'' **(ටීකා)**.

සමූහ වශයෙන් නොව ඒකදේශයෙන් රූපස්කන්ධ නම් වේ. මේ විකල්පාර්ථයෙහි අරමුණු වන භූතරූප උපා ද රූපම රූපස්කන්ධය වේ. සියලු ස්කන්ධපඤ්චකය ම නොවේ. රූපස්කන්ධයම නොවන බව කියන ලදයි යනු අධිප්‍රායය. ''ඒකදේසෙන රූපක්ඛන්ධො න සමුදය වසෙන, ඉමස්මිං විකප්පෙ විසයභාවං භූතුපාදය රූපංච රූපක්ඛන්ධො න සකලං ඛන්ධපඤ්චකන්ති, න රූපක්ඛධො වුත්තනන්ති අධිප්පායො (මධු සාරත්ථ දීපනී)

තවද තෘෂ්ණාවට අරමුණු වන බැවින් හෝ රූපස්කන්ධය පියරූපයට ඇතුලත් වේ. රුප්පන ස්වභාවයෙන් නොවේ යයි ''පියරූපං සාතරූපං රූපං න රූපක්ඛන්ධො'' යනුවෙන් වදරණ ලදී යනු අධිප්‍රේතාර්ථය, '' පියසභාවතාය වා රූපක්ඛන්ධො පියරූපෙ පවිසති න රුප්පන සභාවෙනාති පියරූපං සාතරූපං රූපං න රූපක්ඛෙන්ධොති වුත්තං''. (ටීකා)

රුප්පනාර්ථයෙන් රූපස්කන්ධයට ඇතුලත් වූ චක්ෂුරාදිය ද තෘෂ්ණාවට ප්‍රිය ස්වභාව මාත්‍රය වශයෙන් ප්‍රිය රූපයටම ඇතුලත් කරනු ලැබේ. රූපස්කන්ධයම නොවේයයි කියන ලදී.'' රුප්පනට්ඨේන රූපක්ඛන්ධ පරියාපන්නම්පි චක්ඛාදි පිය සභාව මත්ත වචනිච්ඡා වසෙන පියරූපමෙව අනුපවිසති, න රූපක්ඛන්ධන්ති ආහ, පියසභාව - පෙ - නරූපක්ඛන්ධාති වුත්තනන්ති.'' **(අනුටීකා)**

තෘෂ්ණාවෙන් අරමුණු කරන කල්හි පමණක්ම ප්‍රියරූප නම් වේද, නැති කල්හි නොවන්නේ ද යත්, අරමුණු නොකරන කල්හිද ඒ නම් ලැබේ. ආහාර අනුභව නොකරන කල්හිද ආහාර පිණිස ගනුලබන ආහාර පානයට භොජනයයි කියන්නාක් මෙන් අරමුණු නොවන කල්හි ද අරමුණු කරනු ලබන්නේ නම් ප්‍රියකටයුතු බැවින් පියරූප යයි කියනු ලැබේ. විමසිය යුතු. (සද්දත්ථ භෙදචින්තා ටීකාව බලනු)

පදශෝධන මූලචක්‍ර වාර ප්‍රතිලෝමයෙහි '' න ඛන්ධා න වේදනාක්ඛන්ධොති ආමන්තා'' යන තැන කෙසේ නම් ස්වරූප ගතයුතුද යත්, නඛන්ධා, න වේදනාක්ඛන්ධො යන මෙහි ප්‍රඥප්ති නිර්වාණ සංඛ්‍යාත ධර්මයෝ ස්කන්ධ නොවෙති. ඔවුහු වේදනා ස්කන්ධ ද නොවෙති, එහෙයින් ආමන්තා,යි කියන ලදී. ''නඛන්ධා නවේදනාක්ඛන්ධොති එත්ථ පඤ්ඤත්ති නිබ්බානසංඛාතා ධම්මා ඛන්ධා නහොන්ති. තෙ යස්මා වේදනාක්ඛන්ධොති පි න හොන්ති, තස්මා ආමන්තාති ආහ.'' (අට්ඨකථා)

න ඛන්ධා න වේදනාක්ඛන්ධොති ආමන්තා, යන මෙහි ස්කන්ධ ශබ්ද පැවැත්ම නැති කල්හි වේදනා - ස්කන්ධ ශබ්ද පැවැත්මක් ද නැත්තේ යයි නාම ශෝධන මාත්‍රයම කරන්නේ යයි දතයුතුය. අන්‍ය ධර්මයක් නොලැබෙන බවම මෙහි

අර්ථයය " න ඛන්ධා න වේදනාක්ඛන්ධොති ආමන්තාති එත්ථ ඒවං ඛන්ධසද්ද පවත්තියා අභාවෙ වේදනාක්ඛන්ධ සද්ද පවත්තියා ච අභාවොති "පණ්ණත්ති සොධන මත්තමේව කරොතීති දට්ඨබ්බං න අඤ්ඤධම්ම සබ්භාවො එවෙත්ථ පමාණං" **(ටීකා)**

මෙහි ශබ්ද ග්‍රහණය ද නාම ප්‍රඥප්තිය ශබ්දය හා බැඳී ඇති බැවිනි. ශබ්දයට සභාග බැවින්ද එසේ ලැබේ. මෙය ප්‍රඥප්ති ශෝධනයය. "පණ්ණත්ති සොධන මත්ත මෙව 'කරොති' යයි එහෙයින් කියන ලදී. එයින් වෙන් කොට දැක්විය යුතු වන අන්‍ය ධර්මයක් නැති බව දක්වයි. "සද්දග්ගහණඤ්චෙත්ථ සද්දනිබන්ධනත්තා පඤ්ඤත්තියා සද්දසභාගතං වා සන්ධාය කතං, පණ්ණත්ති සෝධනං හෙතං තෙනාහ පණ්ණත්තිසෝධන මත්තමෙව කරොතීති, තෙන නිද්ධාරෙතබ්බස්ස ධම්මන්තරස්ස අභාවං දස්සෙති" **(අනුටීකා)**

ශුද්ධ ස්කන්ධවාර – "රූපං ඛන්ධො" යන තැන පියරූප සාතරූප උදුරනු ලැබේද අටවිසි රූපයම උදුරනු ලැබේද යත්, යම් හෙයකින් පියරූප සාතරූප සංඛ්‍යාත රූපය වේවා, භූතෝපාදය රූපය හෝ වේවා, සියල්ල පඤ්චස්කන්ධයෙහි සංග්‍රහයට යන්නේමය එනිසා ආමන්තා කියා පිළිතුරු වේ, "යස්මා පියරූප සාතරූප සංඛාතං වා රූපං හොතු භූතුපාදය රූපං වා සබ්බං පඤ්චසු ඛන්ධෙසු සංගහං ගච්ඡතෙව තස්මා ආමන්තාති පටිජානාති" (අට්ඨකථා) දෙවැනි ක්‍රමය ස්වරූප ගැනීමට සුදුසුය.

ප්‍රඥප්ති වාරයෙහි ගණ්ඨිපද නිමි.

---

## ප්‍රවෘත්ති වාරය

ප්‍රවෘත්ති වාරයෙහි උපදින බැවින්ම නිරුද්ධ වන බැවින් උත්පාද වාරය පළමු කොට වදළහ. ඒ උත්පාදවාරයෙහි වර්තමාන අතීත අනාගත අතුරෙන් වර්තමානය දැනට පවත්නා බැවින් දැනගැනීමට පහසු බැවින් වර්තමානය පළමු කොට වදළහ. ඉන් පසුව අතීත අනාගත දෙක අතුරෙන් අතීත ධර්මයෝ වින්දනය කරන ලද බැවින් අනාගතයට වඩා දැනගැනීමට පහසු බැවින් අතීතය වදළහ. ඉන් අනතුරුව ශුද්ධ වාරය දෙසනු කැමතිව මිශ්‍රකය නොවදරා අනාගත වාරය වදළහ. මිශ්‍රක යෙහි දෙසූ ධර්මය ශුද්ධ වාරය ආශ්‍රය කොට අවබෝධ කරගත හැකිය. කුමක් හෙයින් කාල හයට බෙද වදරණ ලදද. අතීත වර්තමාන – අනාගත වර්තමාන අනාගත අතීත – යන මේ තුන් වාරයන් ඇතුලත් කොට වාර නවයක් දේශනා කරන්නට තිබුණා නොවේද?

මෙහි කාලභෙදයෝ වනාහි සයක් පමණක්ම කියන ලදහ. අතීතය සමග වර්තමානය , අනාගතය සමග වර්තමානය, අනාගතය සමග අතීතය යන මේ වාර තුන වනාහි ඉහත දක්වන ලද මිශ්‍රක කාලභෙදයෝ ම යයි මේ තුන වෙනම

නැති බැවින් නොගන්නා ලදහ. ඒ ඒ තැන්හි ප්‍රතිලෝම පුච්ඡාවෙන් අතීතය සමග වර්තමානාදි කාලභෙද දක්වන ලදහ. "කාලභෙද පනෙත්ථ ජ එව වුත්තා, අතීතෙන පච්චුප්පන්නො අනාගතේන පච්චුප්පන්නො අනාගතේන අතීතොති එතෙ පන තයො යථාදස්සිතා මිස්සකකාලභෙද එව, තයො න විසුං යුජ්ජතීති න ගහිතා තත්ථ තත්ථහි පටිලොම පුච්ඡාහි අතීතෙන පච්චුප්පන්නාදයො කාලභෙද දස්සිතා" **(ටීකා)**

ප්‍රඥප්ති වාරයෙහි වේදනාස්කන්ධ මූලයෙහි රූපස්කන්ධමූලිය සම්බන්ධ කරන ලද්දක් මෙන් ප්‍රවෘත්ති වාරයෙහි වේදනාස්කන්ධ මූලයෙහි රූපස්කන්ධ මූලිය සම්බන්ධ නොකොට කුමක් හෙයින් යමක තුනක් වදාරණ ලද්දහුද, ප්‍රවෘත්ති වාරයෙහි වේදනාස්කන්ධාදි මූලකයන් පසු පදයන් සමග යොද වාර තුන දෙක එක බැගින් යමකයෝ වදාරණ ලදහ. පූර්ව පදය සමග නොවදාරණ ලදහ. කුමක් හෙයින් ද යත්, මිශ්‍රක කාලභෙද වාරයන්හි අර්ථ විශේෂයක් නොලැබෙන බැවිනි. "පවත්ති වාරෙ වේදනාක්ඛන්ධාදි මූලකානි පච්ඡිමෙනෙව සහ යොජෙත්වා තිණි ද්වෙ එකඤ්ච යමකානි වුත්තානි න පුරිමෙන, කස්මා, මිස්සක කාලභෙදෙසු වාරෙසු අත්ථ විසෙසා-භාවතො" **(එම ටීකා)**

එසේ වී නම් ශුද්ධකාලයෙහි අර්ථ විශේෂයක් නැති බැවින් නොදෙසන ලද නම් මිශ්‍රක කාලයෙහි අර්ථ විශේෂයක් ඇති බැවින් දේශනා කිරීමට සුදුසු නොවේද යත්, "පච්ඡින්නත්තා" නිමවූ බැවිනි. ශුද්ධකාලයම දේශනා කොට නිමවූ බැවින් මිශ්‍රක කාලයෙහි දේශනා නොකරන ලදැයි දතයුතු මේ වනාහි **අට්ඨසාලිනියෙහි** විතර්ක නිර්දේශ යෙහි තජ්ජා ශබ්දය නොකියන ලද හේතුව දක්වීම පිණිස කියන ලද වචනයට අනුව කියනු ලැබේ.

ප්‍රවෘත්ති කාලයෙහි ද නාමරූප ධර්මයන්ගේ උත්පාද නිරෝධය ඇති නමුත්, අසඤ්ඤසත්තං උපපජ්ජන්තානං යනාදි වශයෙන් උත්පාද වාරයෙහි ද, අසඤ්ඤසත්තා චවන්තානං යනාදි වශයෙන් නිරෝධ වාරයෙහි ද ප්‍රතිසන්ධි චුති දෙක පමණක් වදාරණ ලද්දේ කුමක් හෙයින් ද යත්.?

මේ සියලුම ස්කන්ධ යමකයෙහි ඒ ඒ තැන උපදින ස්කන්ධයන්ගේ බිඳීම නොක් අප්‍රමාණ උත්පාද නිරෝධයන් ප්‍රවෘත්ති කාලයෙහි ඇති නමුත් වහා පෙරළෙන නාමරූප ධර්මයන්ගේ උත්පාද නිරෝධයන් විනිර්භෝග කොට දක්වීම දුෂ්කර නුයි ප්‍රවෘත්ති කාලයෙහි උත්පාද නිරෝධ නොගෙන, අභිනව විපාකවට්ටය නිපදවන නා නා කර්මයෙන් උපදින ප්‍රතිසන්ධි ස්කන්ධයන්ගේ උත්පාදය දක්වීම පහසු නුයි ප්‍රතිසන්ධි උත්පාද වශයෙන්ම උත්පාද වාරය කියන ලදී. උපන්නා වූ විපාක වට්ටයාගේ අවසන් වීමෙන් නිරෝධය දක්වීමට පහසු නුයි මරණ සමයෙහි නිරෝධය වශයෙන් නිරෝධ වාරය කියන ලදී.

''සකලෙපිහි ඉමස්මිං ඛන්ධයමකෙ තත්ථ තත්ථ උප්පන්නානං පවත්තෙ යාව මරණා ඛන්ධානං අපරියන්තෙසු උප්පාදනිරොධෙසු විජ්ජමානෙසුපි ලහුපරිවත්තානං ධම්මානං විනිබ්භොගං කත්වා උප්පාද නිරොධෙ දස්සෙතුං නසුකරන්ති පවත්තියං උප්පාද නිරොධෙ අනාමසිත්වා අභිනවං විපාකවට්ටං නිප්ඵාදයමානේන නානා කම්මෙන නිබ්බත්තානං පටිසන්ධි ඛන්ධානං උප්පාදං දස්සෙතුං සුඛන්ති පටිසන්ධි උප්පාද වසෙනෙව උප්පාද වාරො කථිතො උප්පන්නස්ස පන විපාක වට්ටස්ස පරියොසානේන නිරොධං දස්සෙතුං සුඛන්ති මරණකාලෙ නිරෝධ වසෙන නිරෝධ වාරො කථිතො'' **(අට්ඨකථා)**

යස්ස රූපක්ඛන්ධො උප්පජ්ජති – යන තැන යමකට්ඨකථාවෙහි උප්පජ්ජති යන්න විශේෂයෙන් නොකියන ලදී. පට්ඨානට්ඨකථාවෙහි වනාහි, උප්පජ්ජති යනු උත්පාදයේ පටන් නිරෝධය තෙක් ඉහලට යයි-නිපදෙයි, යන අර්ථය ලැබේ. උත්පාදදි ක්ෂණත්‍රයටම පැමිණේ යනුවෙන් කියන ලදී. ''උප්පජ්ජතීති උප්පාදතො යාව නිරොධගමනා උද්ධං පජ්ජති නිබ්බත්තතීති අත්ථො ලබ්භති, උප්පාදදයො තයොපි ඛණෙ පාපුණාතීති වුත්තං හොති'' **(පට්ඨානට්ඨකථා)**

එසේ කියන ලද බැවින් ප්‍රථමයෙන් ලැබෙන ජීවිතෂට්ක, ජීවිත නවකයන්ගේ ක්ෂණත්‍රය සමංගී යයි ස්වරූප ගැනීමට සුදුසු නොවේද, කුමක් හෙයින් උත්පාදක්ෂණ සමංගී යයි ස්වරූප උදුරන ලද්දේද යත්, ''යාව නිරොධ ගමනා උද්ධං පජ්ජති යනාදි පට්ඨානට්ඨකථා පාඨය අනුව ක්ෂණත්‍රය සමංගී අනුදන්නා ලද්දක් මෙන් හැඟෙයි එහෙත් එතැන උත්පාදක්ෂණ සමංගී වූවහුම ලැබේ යයි දතයුතු. ''යාව නිරොධ ගමනා උද්ධං පජ්ජතීති ච උප්පාදදයො – පෙ – පාපුණාතීති ච වචනෙහි ඛණත්තය සමංගී ආපජ්ජතීති අනුඤ්ඤාතං විය හොති, උප්පාදක්ඛණ සමංගී යෙව පන ඒවං වුත්තෙනාතිදට්ඨබ්බො'' **(පට්ඨාන ටීකා)**

යට කියන ලද අට්ඨකථා වචනයට අනුව උත්පාදක්ෂණයට පැමිණීමට කීමම සුදුසු නොවේද යත්, අතීත නොවූ අනාගත ද නොවූ **ක්ෂණෛකදේශයක් ක්ෂණත්‍රයයි** කියන ලදී. ''අනතීතං න අනාගතං ඛණෙකදෙසං ඛණත්තයන්ති වුත්තං' **(ටීකාද්වාර)**

ජීවිත ෂට්කය යනු **මූලටීකාචාර්ය** මතයෙන් ගන්ධ, රස, ඕජා තුන හැර රූප සය ගනු ලැබේ. කර්මජ කලාප සතර යන තැන්හි ද **මූලටීකාචාර්‍ය්‍ය** මතය අනුව චක්ඛුසත්තක, සොතසත්තක, වත්ථුසත්තක, ජීවිතඡක්ක යන සතර වෙති **අට්ඨකථාචාර්‍ය්‍ය** මතය අනුව චක්ඛුදසක, සෝතදසක, වත්ථුදසක, ජීවිතනවක කියා සතර වෙති. අතීතාදි එකොළොස් ආකාරයෙන් රූපයන් සම්පිණ්ඩනය කොට රූපස්කන්ධයයි කියනු ලැබේ. මෙහි ජීවිත නවකය ශුද්ධ වර්තමානයෙහි ගනු ලැබේ. අතීත අනාගත නොගනු ලැබේ. කුමක් හෙයින් රූපස්කන්ධයයි කියනු ලැබේද,

වේදනාදී සු පෙකස්මිං – ඛන්ධ සද්දෙ තු රුළ්හියා
සමුද්ද දෙක දෙසෙතු – සමුද්ද දි රවො යථාඃ (සච්ච සංඛෙප)

වේදනා දී එක එකෙක්හි ද රුළ්හී වශයෙන් ස්කන්ධ ශබ්දය වැටේ. මුහුදෙහි ඒක දේශයකට ද සමුද්‍රය යන ව්‍යවහාරය ලැබෙන්නාක් මෙනි.

යත්ථ රූපක්ඛන්ධො නුප්පජ්ජති, යන සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ වශයෙන් අරූප භූමිය ලැබේ. ඒ අරූප භූමියෙහි රූපස්කන්ධයාගේ පහළවීමක් නැත. වේදනාස්කන්ධයාගේ පහළවීමක් ඇති බැවින් තත්ථ වේදනාක්ඛන්ධො නුප්පජ්ජති, යන සංසය පදයාගේ ස්වරූපාර්ථ නොලැබේ. එසේ සන්නිට්ඨාන පදයාගේම ස්වරූපාර්ථ ඇතිව සංසය පදයාගේ ස්වරූපාර්ථ නොලැබෙන බැවින් "යම් භූමියක රූපස්කන්ධයාගේ ඉපදීමක් නැත. ඒ භූමියෙහි වේදනා ස්කන්ධයාගේත් ඉපදීමක් නැත්තේ දැයි කෙසේ කෙසේ ද යන සැකයක් සර්වඥයන් වහන්සේට නැත. වේනෙයාධ්‍යාශය අනුව ප්‍රශ්න ජාති සතර අතුරෙන් පූර්ව කොට්ඨාශයාගේ ස්වරූපාර්ථයට සමානව පුරේ පඤ්හ වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්නයට අනුරූපව රූපස්කන්ධය නුපදින භූමියෙහි වේදනාස්කන්ධය උපදින බැවින් නුප්පජ්ජති යන ප්‍රශ්න පාළියෙහි "න" අකුර ලෝප කොට පාළියට අනුව පිළිතුරු ජාති පස අතුරෙන් උප්පජ්ජති යන පාළිගති විසඳුමෙන් පිළිතුරු කියන ලදි.

පූර්වකොට්ඨාශ ස්වරූපයට සමානයයි කී තැන කවර නම් පූර්වකොට්ඨාශයක් ගනු ලැබේද. ස්වරූප දර්ශන විස්සර්ජනාවගේ පූර්වකොට්ඨාශයයි. (නව ක්‍රමයකි) පරිපූර්ණ ප්‍රශ්නයාගේ පූර්වකොට්ඨාශයයි.

විස්සර්ජනාවගේ පූර්වකොට්ඨාශය සමඟ සමාන අර්ථ බැවින් වනාහි පුරේ පඤ්හා කියාද, පශ්චිම කොට්ඨාශයට සමාන අර්ථ බැවින් පච්ඡා පඤ්හා කියාද ඒ නාමය කියන ලදි. "තං විස්සජ්ජනස්ස පන පුරිමකොට්ඨාසේනස දිසත්ථතාය" පුරෙපඤ්හො, පච්ඡිම කොට්ඨාස සදිසත්ථතාය පච්ඡා පඤ්හොති ච -නාමං වුත්තං (**ටීකා**) එවැනි සවරූප දර්ශනයෙන් විසඳීමහෝ ඒ කියන ලද විසඳුම ඇත්තේ මොහුට නු යි හෝ තං විස්සජ්ජනා නම් වේ." "තං සරූප දස්සසනෙන විස්සජ්ජනං නංවිස්සජ්ජනං, තං වා යථා වුත්ත විස්සජ්ජනං" එතස්සාති තං **විස්සජ්ජනො**." (**අනුටීකා**)

පූර්වකොට්ඨාශය යනු සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථය කියන ලද්දේද, සන්නිට්ඨාන පදයටම හෝ කියන ලද්දේද, "පුරිම කොට්ඨාසෙන යනු පූර්ව වූ උද්දේශ පදයෙනි, "පුරිම කොට්ඨාසේනාති පුරිමෙන උද්දේස පදෙන" (**අනුටීකා**) පූර්වකොට්ඨාශය සමග සමාන වූ ස්වරූප යන තැන කවර නම් සමාන ස්වරූපයක්ද, ස්වරූප ධර්මයෝම සමාන වෙත් ද යත්, "සන්නිට්ඨාන සංසය පද විශේෂ යක් වෙන් නොකොට සමානාර්ථ ඇති බැවින් එක පදයකින් සංග්‍රහ කරන ලද ස්කන්ධයාගේ උත්පාද නිරෝධ ලාභ සමානත්වයෙන් පුරේපඤ්හාව දත යුතුය" "සදිසත්ථතාය සන්නිට්ඨාන සංසය පද විසේසං අවිචාරෙත්වා ඒකේන පදේන සංගහිතස්ස ඛන්ධස්ස උප්පාද නිරෝධ ලාභ සාමඤ්ඤමත්තේන පුරෙපඤ්හා දට්ඨබ්බා." (**ටීකා**)

''යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජිත්ථ තස්ස වේදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථ''යි විදරණ ලද්ද වූ අනුලෝම පුච්ඡාවෙහි අපරිමාණ භවසංසාරයෙහි දී රූපස්කන්ධය නොලැබුණා වූ කෙනෙක් නම් නැත. රූපස්කන්ධය ලැබුවාවූ ම පුද්ගලයෝ ඇත්තාහ. එබැවින් යස්ස රූපක්ඛන්ධො නුප්පජ්ජිත්ථ යන සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ නොමැත. එසේ සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ නැති බැවින් තස්ස වේදනාක්ඛන්ධො නුප්පජ්ජිත්ථ යන සංසය පදයාගේද ස්වරූපාර්ථ නොමැත. එසේ සන්නිට්ඨාන සංසය දෙපදයාගේම ස්වරූපාර්ථ නොමැති බැවින් යම් පුද්ගලයෙකුට රූපස්කන්ධය අතීතයෙහි නූපන්නේ වේද ඒ පුද්ගලයාට වේදනාස්කන්ධය නූපන්නේ දැයි සර්වඥයන් වහන්සේට සැකයෙක් නොමැත. එහෙත් වේනෙයාාධාාශය අනුව ප්‍රශ්න උපදවා එම ප්‍රශ්නයට අනුරූපව ප්‍රශ්න ජාති සතර අතුරෙන් මෝඝ ප්‍රශ්නයාගේ වශයෙන්, අනාදිමත් සංසාරයෙහි දී රූපස්කන්ධය නූපන් පුද්ගලයෙක් නැත. උපන් පුද්ගලයන්ම ඇති බැවින් සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ ප්‍රතික්ෂේප කිරීම් වශයෙන් පිළිතුරු ජාති පස අතුරෙන් ''නත්ථි'' යන ප්‍රතික්ෂේප විස්සර්ජනාවෙන් පිළිතුරු වදළහ.

මේ යමක ප්‍රකරණයෙහි වනාහි තුච්ඡපඤ්හා නමින් ප්‍රශ්න ඇත්තාහ.

ඒවා තුච්ඡ පඤ්හා නම් වනුයේ මක්නිසාද යත්, යට දැක්වූ මෝඝ ප්‍රශ්නම බැවිනි, ''තුච්ඡ පඤ්හොතිපි වුච්චති'' **(අට්ඨකථා)**

යස්ස රූපක්ඛන්ධොඋප්පජ්ජතියන සන්නිට්ඨාන පදයාගේස්වරූපාර්ථ පඤ්චවෝකාරයෙහි ප්‍රථමජීවිත ඡක්ක රූපයන්ගේ උත්පාදක්ෂණ සමංගීවූ අනාගාමී ආර්‍ය්‍ය පුද්ගලයෝ යනු ලැබෙති.ඒ පුද්ගලයන්ට රූපස්කන්ධය උපදිමින් පවතී. වේදනාස්කන්ධය උපදිමින් නොපවත්නා බැවින් තස්ස වේදනාක්ඛන්ධො නිරුජ්ඣති යන සංසය පදයාගේ ස්වරූපාර්ථ නොමැත්තාහ. එසේ සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ ඇතිව සංසය පදයාගේ ස්වරූපාර්ථ නොමැති බැවින් යම් පුද්ගලයකුට රූපස්කන්ධය උපදී. ඔහුට වේදනාස්කන්ධය නිරුද්ධ වේදැයි යන සැකයෙක් සර්වඥයන් වහන්සේට නොමැති නමුත් වේනෙයාාධාාශය වශයෙන් ප්‍රශ්න උපදවා ප්‍රශ්න ජාති සතර අතුරෙන් මෝඝප්‍රශ්නයාගේ වශයෙන් කරන ලද ප්‍රශ්නයට අනුරූපව රූපස්කන්ධය උපදිමින් ඇති පුද්ගලයකුට වේදනාස්කන්ධය නිරුද්ධ නොවන බැවින් පිළිතුරු ජාති පස අතුරෙන් ''නො'' යන ප්‍රතිෂේධ විස්සර්ජනාවෙන් පිළිතුරු වදරණ ලදී.

ප්‍රතික්ෂේප විස්සර්ජනාව හා ප්‍රතිෂේධ විස්සර්ජනාවගේ විශේෂත්වය කෙසේද? ''සන්නිට්ඨානාර්ථ යාගේ ප්‍රතික්ෂිපනය ප්‍රතික්ෂේපයයි. සංසයාර්ථයාගේ වැළැක්මප්‍රතිෂේධයය, මේ වනාහිප්‍රතික්ෂේප ප්‍රතිෂේධයන්ගේ විශේෂත්වයය. ''සන්නිට්ඨානත්ථස්සෙ ව පටික්ඛිපනං පටික්ඛෙපො, සංසයත්ථ නිවාරණං පටිසෙධොති අයං පටික්ඛෙප පටිසේධානං විසේසො'' **(ටීකා)**

පාළිගෙහ විස්සර්ජනාවෙහි ද සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථම ඇතිව සංසය පදයාගේ ස්වරූපාර්ථ නොලැබේ. ප්‍රතිෂේධ විස්සර්ජනාවෙහි ද සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථ ඇතිව සංසය පදයාගේ ස්වරූපාර්ථ නොලැබේ. මෙසේ හෙයින් එක හා සමානය. උත්පත්ති නිරෝධ ප්‍රතිෂේධනයාගේ ප්‍රතිෂේධනය පිණිස පාළිගතියෙන් විසඳුම වේ. උත්පත්ති නිරෝධයන්ගේම ප්‍රතිෂේධනය වැළැක්ම පිණිස ප්‍රතිෂේධන වශයෙන් විසඳුම වේ. ''උප්පත්ති නිරෝධ පටිසේධස්ස පටිසේධනත්ථං පාළිගතියා විස්සජ්ජනං, උප්පත්ති නිරෝධානමේව පටිසෙධනත්ථං පටිසෙධන විස්සජ්ජනං කතන්ති. වෙදිතබ්බං'' **(එම ටීකා)**

පුරේ-පඤ්හ පච්ඡාපඤ්හ යන දෙදෙනාගේ ලක්ෂණයෙන් සමන්විත පරිපූර්ණ ප්‍රශ්නයාගේ වශයෙන් ප්‍රශ්නයට අනුරූපව යයි කී තැන්හි, කුමක් මෙන් පුරේපඤ්හා පච්ඡාපඤ්හා දෙදෙනාගේ ලක්ෂණයෙන් සමන්විත වන්නේද යත්, පූර්වකොට්ඨාශය සමග ස්වරූපාර්ථ සමාන වේ නම් පුරේපඤ්හාවගේ ලක්ෂණයයි පශ්චිම කොට්ඨාශය සමග ස්වරූපාර්ථ සමාන වේ නම් පච්ඡාපඤ්හාවගේ ලක්ෂණයයි.

ප්‍රවෘත්ති වාරය නිමි.

## පරිඤ්ඤා වාරය

පරිඤ්ඤා වාරයෙහි කුමක් හෙයින් ඕකාසවාර, පුද්ගලෝකාස වාරයන් නොවදාරණ ලද්දහුද යත්, පුද්ගලවාරය, ඕකාසවාරය, පුද්ගලෝකාසවාරය යන මේ තුන අතුරෙන් පුද්ගල වාරය පමණක්ම ලැබේ. ඉතිරිවාර දෙක නොලැබෙති. කුමක් නිසාද යත් සමාන විසඳුම් ඇති නිසාය. ''පුග්ගලවාරො ඕකාසවාරෝ පුග්ගලෝකාස වාරෝති ඉමෙසු පන තිසු පුග්ගලවාරෝව ලබ්භති. න ඉතරා ද්වෙති, කිං කාරණා සදිස විස්සජ්ජනතාය'' ( **අට්ඨකථා** )

මේ පරිඤ්ඤා වාරයෙහි ප්‍රවෘත්ති වාරයෙහි මෙන් චුතිප්‍රතිසන්ධිය නොකියා ප්‍රවෘත්ති කාලය පමණක් වදාරණ ලද්දේ කුමක් හෙයින් ද යත්, චුතිප්‍රතිසන්ධික්ෂණයෙහි පරිඤ්ඤා කෘත්‍යය නැති බැවිනි. ''චුතිපටිසන්ධික්ඛණෙ පරිඤ්ඤාකිච්චස්ස අභාවා'' ටීකාවෙහිද, පට්ඨාන නය ක්‍රමයෙන් ''රූපක්ඛන්ධ පරිජානනස්ස අභාවා''යි ද, කියන ලදී.

සච්ච යමකයෙහි අභිසමෙතාවී යන තැන සෝතාපන්න පුද්ගලයාගේ පටන් ආර්‍ය පුද්ගලයෝ ලැබෙති. එනිසා සෝතාපත්ති මාර්ගස්ථයා ද අවබෝධ කරමින් සිටින්නෙකි. එසේ නම් ''යො රූපක්ඛන්ධං පරිජානාති'' යන තැන්හි සෝතාපත්ති මාර්ගස්ථයා නොගෙන අර්හත් මාර්ගස්ථයා පමණක්ම ස්වරූප වශයෙන් ගන්නා ලද්දේ කුමක් හෙයින් ද? පරිජානාති' යන ප්‍රශ්නයෙහි අනුලෝම නයෙහි පරිඥ කෘත්‍යයෙහි මස්තකප්‍රාප්ත වූ අර්හත් මාර්ගස්ථයා සඳහා ආමන්තා යයි කියන ලදුයි දතයුතු. 'පරිජානාතීති පඤ්හෙසු අනුලෝමනයෙ පරිඤ්ඤා කිච්චස්ස මත්ථකප්පත්තං අග්ගමග්ගසමංගිං සන්ධාය ආමන්තාති වුත්තන්ති වෙදිතබ්බං''**(අට්ඨකථා)**

මේ පාඨයෙහි 'මත්ථකප්පත්තං' යන විශේෂණය හේතුමන්ත විශේෂණයයි සිතනු. අධිප්‍රායාර්ථය, ''ධාතූනං කථා ධාතුකථා'' යයි කියන ලද වචනාර්ථය අනුව ස්කන්ධාදි ස්වභාව ධර්මයයි කියන ලද ධාතූන් දේශනා කරන ලද බැවින් ධාතුකථා නමැයි කියන ලද්දේ වේ. ධම්මසංගණී ආදියෙහි ස්කන්ධාදි ස්වභාව ධර්මයන් කියා ඇති බැවින් ධම්මසංගණී ප්‍රකරණ ආදි ග්‍රන්ථයන් ධාතුකථා නමැයි නොකියන ලද්දේ මන්ද යත්, ධම්මසංගණී ආදියෙහි කියා ඇතත් සාතිශය වශයෙන් කියා නැත. ධාතුකථා ප්‍රකරණයෙහි පමණක් සාතිශය වශයෙන් කියා ඇත. එනිසා ඒකම ධාතුකථාප්‍රකරණය පමණක් ධාතුකථා නමැයි කියන්නාක් මෙන්, සෝතාපත්ති මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයා වනාහි අවබෝධ කරන්නේ නමුත් පරිඥාකෘත්‍යය නිමාවට පත් නොකරණ බැවින් සාතිශය වශයෙන් අවබෝධ නොකරයි. අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාම පරිඥාකෘත්‍යය නිමාවට පත්කරන බැවින් සාතිශය වශයෙන් අවබෝධ කරයි. එහෙයින් අර්හත් මාර්ගස්ථ ආර්‍ය්‍ය පුද්ගලයාම අවබෝධ කරන්නේ යයි දතයුතු.

''යේව පුථුජ්ජනා මග්ගං න පටිලභිස්සන්ති'' යන තැන්හි සම්පූර්ණයෙන්ම මාර්ගය නොලබන්නෙකු ගැන මාර්ග නොලබන්නා යයි කියන ලදද, නැතහොත් ආත්මභාව දෙක තුනෙක්හිදී මාර්ගය නොලබන්නකු ගැන මාර්ග නොලබන්නායයි කියන ලද්දේ ද යත් සංසාර වැට කණුවක් නම් වූ මේ සත්වයා පොළොව රකින්නෙකි. බොහෝ සෙයින් මෙවැන්නන්ට භවයෙන් එතෙරවීමක් නොමැත. ''වට්ටඛාණු නාමෙසො සත්තො පඨවී ගොපකො යෙභුය්‍යෙන එවරූපස්ස භවතො වුට්ඨානං නත්ථි'' **(සීලක්ඛන්ධ අට්ඨකථා)**

''වට්ටඛාණු නාමෙසො'' යන වචනය නෙය්‍යාර්ථය, නීතාර්ථ නොවේ.එසේමැයි. පපඤ්ච සූදනියෙහි – ඒ වනාහි නියත වූයේ ඒකම ආත්මභාවයෙක්හි ද නොහොත් අන්‍ය ආත්මභාවයෙක්හි ද ඒකම ආත්මභාවයෙක්හිම නියතය. ආසේවන වශයෙන් වනාහි දිනපතාම මිථ්‍යාදෘෂ්ටිය රුචිකරන්නේ යයි. කියන ලදී. මේ අකුශලය වනාහි අබලය දුබලය, කුශලය මෙන් බල ඇත්තේ නොවෙයි. එහෙයින් ඒකම ආත්මභාවයක දී නියතයයි කියන ලදී. අන් පරිද්දෙකින් වේ නම් සම්මත්ත නියතය මෙන් මිච්ඡත්ත නියතය අත්‍යන්ත නියතයක් වියහැකි බැවිනි. එය අත්‍යන්ත නියතයක් නොවේමය. එසේ නම් වට්ටඛාණු චෝදනාව කෙසේදයි යන්නට ආසේවන වශයෙන් යයි පිළිතුරු කියන ලදී. ඒ එසේමැයි, ''සකිං නිමුග්ගො එස බාලො'' යයි කියන ලද්දේමය, මෙසේ වට්ටඛාණු චෝදනාවෙන් දක්වයි. ප්‍රත්‍යයන් නිසා මේ තෙමේ ඒ ඒ දෘෂ්ටියට බැස ගත්තේ නමුත් කිසියම් කලෙක එයට ප්‍රතිපක්ෂ ප්‍රත්‍යයන් ලැබ එයින් හිස එසවීමෙක් නොවන්නේ යයි නොකිව යුතුය. එහෙයින් මෙවැන්නන්හට බොහෝ සෙයින් භවයෙන් එතරවීමක් නම් නැත්තේ යයි කියන ලදී.

''වට්ටඛාණු නාමෙසොති ඉදං වචනං නෙය්‍යත්ථං, න නීතත්ථං, තථාහි පපඤ්ච සූදනියං – තං පනෙස එකස්මිං යෙව අත්තභාවෙ නියතො, උදාහු අඤ්ඤස්මිංපි, ඒකස්මිං යේව නියතො ආසෙවන වසෙන පන දෙවසිකං දිට්ඨිං රොචෙති ඒවාති

වුත්තං , අකුසලංහි නාමෙතං අබලං දුබ්බලං, න කුසලං විය මහාබලං, තස්මා ඒකස්මිංයේව අත්තභාවෙ නියතොති වුත්තං, අඤ්ඤථා සම්මත්තනියාමෙන විය මිච්ඡත්ත නියාමොපි අච්චන්තිකො සියා, නව අච්චන්තිකො සියා, යදි එවං වට්ටබාණු චෝදනා කරන්ති ආහ. ආසෙවන වසෙනාති, තථාහි, යථා සකිං නිමුග්ගො නිමුග්ගො එස බාලෝති වුත්තං, එවං වට්ටබාණු චෝදනාය දීපෙති, පච්චයෙ පටිච්ච අයං තං තං දස්සනං ඔක්කන්තොපි න කදාචි තප්පටික්ඛෙ පච්චයේ පටිච්ච තෙනොපි සිඛුක්ඛිනමස්ස හෝතිති නවත්තබ්බං, තස්මා ඒවරූපස්සහි යෙභුයොන භවතො වුට්ඨානං නාම නත්ථීති වුත්තං'' **(සීලක්ඛන්ධ ටීකා)**

පරිඤ්ඤා වාර ගණ්ඨි පද නිමි.

---

ස්කන්ධ යනු කුමක් හෙයින් කියන ලද්දේද, **අට්ඨකතා,ටීකා අනුටීකා මධුටීකා** දියෙහි විශේෂයෙක් නොමැත. ජාතිජරා මරණ ආදී සංසාර දුක්ඛයන් විසින් කණු ලැබෙනුයි ස්කන්ධ නම්. ''ජාති ජරා මරණාදීහි සංසාර දුක්ඛෙහි බාදිතබ්බොති ඛන්ධො'' (උණාදිකප්ප) ඛං – ආත්ම නිත්‍යාදි ශුන්‍යතාව ධරත්නුයි ස්කන්ධ නම්. ''ඛං – අත්තනිච්චාදි සුඤ්ඤං ධාරෙන්තීති ඛන්ධා'' (ඒකක්ඛරකොසටීකා) මේ වචනාර්ථය සමග පදාර්ථය වූ රාශ්‍යර්ථය හේතුඵල සම්බන්ධයෙන් නොවන්නේද යත්, ශබ්ද නිෂ්පත්තිය වනාහි කවර හෝ ක්‍රමයකින් සිදුවේ. සංඥ නාමය වනාහි ලෝක ව්‍යවහාරය අනුව ගත යුතුය. ''යථා කථඤ්චිහි බ්‍යුප්පත්ති හෝති, සඤ්ඤාතු ලෝකතො යෙව ගන්තබ්බා'' **(අභිධාන ටීකා)**

ස්කන්ධ යමකයෙහි ගණ්ඨි පද නිමි.

---

**ආයතන යමක ගණ්ඨි පද**

## ප්‍රඥප්ති වාරය

චක්ෂුප්‍රසාදදිය ද ධර්මමැයි, එසේ නම ධම්මායතනය මැයි නොකියා කුමක් හෙයින් ද්වාදසායතනානි යයි කියන ලද්දහු ද යත්, ෂට් විඥාන කයට උත්පත්ති ද්වාර – ආරම්මණ – ව්‍යවස්ථානය වන බැවිනි. ''චක්ඛාදයොපිහි ධම්මා යෙව එවං සති ධම්මායතන මිච්චෙව අවත්වා කස්මා ද්වාදසායතනානි වුත්තානි චෙ, විඤ්ඤාණ කායුප්පත්ති ද්වාරාරම්මණ වවත්ථානතො'' (සම්මොහ විනොදනී)

කුමක් හෙයින් ද්වාර ආරම්මණයන් වෙන් වෙන් කොට දක්වන ලදද, සියල්ල එකතු කොට කියන ලද්දේ නම් යහපත් නොවේද, ආයතන දේශනාව වනාහි ද්වාර ආරම්මණ විභාග දැක්වීම පිණිසයි. ද්වාරාරම්මණ විභාගදස්සනත්ථාහි ආයතන දේසනා'' **(ආයතන විභංග – අනුටීකා)**

කුමක් හෙයින් ආයතන නම් වෙත්ද යත්, චිත්ත චෛතසික ධර්මයෝ මෙ චක්ෂු රූපාදියෙහි වෑයම් කරත් නුයි ආයතන නම් වෙති. ''චිත්ත චෙතසික ධම්මා ආයතන්ති වායමන්ති එත්ථ චක්ඛුරූපාදීසූති ආයතනානි'' (ආ-වි-ටීකා) වෑයම් කිරීම යනු කුමක් ද යත්, වෑයම් කිරීම යනු තමන්ගේ කෘත්‍යය කෙරෙත් යන අර්ථයි, ''වායමන්තීති අත්තනො කිච්චං කරොන්තිච්චෙව අත්ථො'' **(ආයතන විභංග ටීකා)**

තවද, එම ආය නම් වූ චිත්ත චෛතසික ධර්මයන් පළල් කෙරෙත්නුයි ද ආයතන නම් වෙති. ''තේචා ආයභූතෙ ධම්මෙ තනොන්ති විත්ථාරෙන්තීති ආයතනානි,''

තවද දීර්ඝවූ සංසාර දුක්ඛයට පමුණුවත්නුයි ද ආයතන නම්. ''ආයතං වා සංසාර දුක්ඛං නයන්ති පවත්තයන්තීති ආයතනානි.''

තවද,

සඤ්ජාති දෙසෙ හෙතුම්හි – වාසට්ඨානාකරෙසුච,
සමොසරණ ඨානෙ චා – යතනං පද පූරණෙ,

සඤ්ජාති දේස, හේතු, වාසස්ථාන, ආකර සමෝ සරණ ස්ථානය හා පද පූරණ අර්ථයෙහි ද ආයතන ශබ්දය යෙදේ. මේ අභිධාන ගාථාවෙහි එන පද – පූරණාර්ථය හැර සෙසු අර්ථ පඤ්චකයෙහි ද මෙහි ආයතන ශබ්දය ගනු ලැබේ.

කුමක් හෙයින් සඤ්ජාති දේශ නම් වේදයත්, එය ඇසුරු කොට අරමුණු ගැනීම් වශයෙන් එහිම උපදින බැවිනි. ''තන්නිස්සයාරම්මණභාවෙන තත්ථෙව උප්පත්ති තො.'' කුමක් හෙයින් හේතු නම් වේදයත්, ඒවා නැති කල්හි නොලැබෙන බැවිනි. ''තෙසං අභාවෙ අභාවතො'' කුමක් හෙයින් වාසස්ථාන නම් වේදයත්, එයට අයත් පැවතුම් ඇති බැවිනි. ''තදායත්ත වුත්තිතාය'' කුමක් හෙයින් ආකර නම වේද යත්, එය ඇසුරු කොට ඇති බැවින් හා එය අරමුණු කොට ද ඇති බැවිනි. කුමක් හෙයින් සමෝසරණ ස්ථාන නම් වේද යත්, ඒ ඒ තන්හි වස්තු ද්වාර ආරම්මණ වශයෙන් එකතු වන බැවිනි. ''තත්ථ තත්ථ වත්ථුද්වාරාරම්මණ වසෙන සමො සරණතො'' (මේ සාධක පාඨ පස – සම්මොහ විනොදනි)

ආයතන දෙළස අතුරෙන් චක්ඛායතනාදි ආයතන සය කුමක් හෙයින් පළමු කොට වදරණ ලද්දහු ද යත්. ආධ්‍යාත්මික භාවයෙන් හා ගෝචර ගන්නා බැවින් ආධ්‍යාත්මිකයන් පළමු කොට දක්විය යුතුය. එබැවින් ''අජ්ඣත්තික භාවෙනෙවච විසයීභාවෙන ච අජ්ඣත්තිකානං පඨමං අස්සෙතබ්බතං දස්සෙති.'' **(ආයතන විභංග ටීකා)**

අජ්ඣත්තිකායතන සය අතුරෙන් පළමු කොට චක්ඛායතනය දක්වූයේ කුමක් හෙයින් ද යත්, ආධ්‍යාත්මික ආයතන අතුරෙන් චක්ඛායතනය සනිදස්සන සප්පටිඝ ආරම්මණ ඇති බැවින් ප්‍රකටනු යි පළමු කොට කියන ලදී. ඉන් අනතුරුව

අනිදස්සන අප්පටිඝ ආරම්මණ ඇති සෙසු ආයතන කියන ලදහ. ''අජ්ඣත්තිකායතනෙසු සනිදස්සන සපපටිඝාරම්මණත්තා චක්ඛායතනං විභූතන්ති. තං පඨමං වුත්තං තදනන්තරං අනිදස්සන සප්පටිඝාරම්මණානි ඉතරානි.'' (විභාවිනි ටීකා) එහිද අසම්පත්තග්ගාහ සමත්වයෙන් චක්ඛායතනයට අනතුරුව සෝතායතනය කියන ලදි. ''තත්ථාපි අසම්පත්තග්ගාහ සාමඤ්ඤෙන චක්ඛායතනානන්තරං සොතායතනං වුත්තං'' (විභාවිනි ටීකා) සෙසු ආයතන අතුරෙන් වහා අරමුණු ගැනීමට සමත් බැවින් ඝානායතනය පළමුව කියන ලදි. ඉදිරියෙහි තැබූ පමණින්ම භෝජනාදියෙහි සුගන්ධය වාතානුසාරයෙන් ඝානප්‍රසාදයෙහි හැපේ. ''ඉතරේසු සීඝතරං ආරම්මණග්ගහණ සමත්ථත්තා ඝානායතනං පඨමං වුත්තං, පුරතො ඨපිත මත්තස්සපි භෝජනාදිකස්ස ගන්ධා වාතානුසාරේන ඝානෙ පටිහඤ්ඤති.'' **(විභාවිනි ටීකා)**

ඉන් අනතුරුව වනාහි ප්‍රදේශයෙක පැවතීම සමානත්වයෙන් ජිව්හායතනය කියන ලදි. ඉන් අනතුරුව සකල ශරීරයෙහි පැතිර පවත්නා වූ කායායතනයය. ඉන්පසු ආයතන පස් දෙනාගේම ගෝචරය ගැනීමෙහි සමත් වූ මනායතනයය. ''තදනන්තරං පන පදෙස වුත්ති සාමඤ්ඤෙන ජිව්හායතනං වුත්තං, තතො සබ්බට්ඨානිකං කායායතනං තතො පඤ්චන්නම්පි ගෝචරග්ගහණ සමත්ථං මනායතනං'' **(විභාවිනි ටීකා)** බාහිරායතනයෝ ද වනාහි ආධ්‍යාත්මිකායතන අනුරූපව වදරණ ලදහ.

බුද්ධචක්ඛු, සමන්තචක්ඛු, ධම්මචක්ඛු යයි තව චක්ඛු තිදෙනෙක් ඇති නමුත් ඒ තුනම නොකියා දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු යන දෙක පමණක් ස්වරූප වශයෙන් කියන ලද්දේ කුමක් හෙයින් ද යත්, ඉතිරි ඒවා මෙහි සුවිදූර බැවිනි. ''ඉතරෙසං එත්ථ සුවිදූරභාවතො'' මේ වනාහි , දෙකක් පමණක් කියා සෙස්ස කියන ලද්දට පාරිසේස වශයෙන් ගතු ලැබේයයි පිළිතුරු වේ.'' තත්ථ තං වුච්චතෙ, 'අත්ථද්වයමෙව වත්වා පාරිසෙසෙනාති, ඉතරෙසං එත්ථ සුවිදූර භාවතො''යයි කුශලත්‍රික සංවර්ණණාවෙහි පාරිශේෂ වශයෙන් ගන්නා ලද අනුටීකා සාධක පාඨයෙන් මෙය පැහැදිලිවේ.

තණ්හාව ශ්‍රොතයක් යයි කියන ලදි. ශබ්දරම්මණය ශ්‍රෝතායතනයෙන් ගලායන්නේ ද යත්, ශ්‍රෝතායතනයෙන් ගලාබස්නා නිසා ශ්‍රෝතයයි නොකියනු ලැබේ. අරමුණු කිරීම් වශයෙන් භවංගපතනය තෙක් සන්තතිය නොසිඳී පවත්නා බැවින් ශ්‍රෝතායතනය ශ්‍රෝතසයෙක් මෙතැයි කියන ලදි.

සම්මාවාචා ආදී විරති තුන පාණාතිපාතාදියෙන් වැළකීම බැවින් සීලස්කන්ධ යයි කියන ලදි. 'සම්මා වාචාදි තිදෙන සීලයමැයි. එනිසා ඒවා ස්වජාති වශයෙන් සීලස්කන්ධයෙන් සංග්‍රහ කරන ලදහ. ''සම්මාවාචාදයො තයො සීලමෙව, තස්මා තෙ සජාතිතො සීලකඛන්ධෙන සංගහිතා,'' (සම්මොහ විනොදනී)

සම්මා සමාධිය සමාධියම බැවින් සමාධිස්කන්ධයයි කීම සුදුසුය. සම්මා වායාම සම්මා සති දෙක සමාධි ස්කන්ධයයි කීමෙක් ද කීම සුදුසු ද, සම්මා වායාමාදී තුන අතුරෙන් වනාහි සමාධිය ස්වකීය ධර්මතාවෙන් සමථ ආරම්මණයෙහි ඒකාග්‍රභාවයෙන් පිහිටීමට සමත් නොවෙයි. ප්‍රග්‍රහ කෘත්‍යය සිදුකරන වියර්යයෙන් හා උපට්ඨාන

කෘත්‍යය සිදුකරන ස්මෘතියෙන් ද ලැබෙන උපකාර ඇතිව සමාධි වීමට සමර්ථ වෙයි. එසේ හෙයින් සමාධියම මෙහි ස්වජාති වශයෙන් සමාධිස්කන්ධයෙන් සංගෘහිත වෙයි. වායාම — සති දෙදෙන වනාහි ක්‍රියා වශයෙන් සංගෘහිත වෙති. ''සම්මා වායාමාදීසු පන තීසු සමාධි අත්තනො ධම්මතාය ආරම්මණෙ ඒකග්ගභාවෙන අප්පෙතුං නසක්කොති, විරියෙන පග්ගහනකිච්චං සාධෙන්තෙන, සතියා ච අපිලාපන කිච්චං සාධෙන්තියා ලද්ධූපකාරො හුත්වා සක්කොති. තස්මා සමාධියෙවෙත්ථ සජාතිතො සමාධික්ඛන්ධෙන සංගහිතො, වායාම සතියො පන ක්‍රියතො සංගහිතා හොන්ති.'' (සම්මොහ විනොදනී)

ප්‍රඥාස්කන්ධයෙහි ද සම්මාදිට්ඨිය ප්‍රඥාවම වී ප්‍රඥාස්කන්ධයෙන් සංග්‍රහ කිරීම සුදුසුය. සම්මාසංකප්පය ප්‍රඥාස්කන්ධයයි කීම කෙසේ නම් සුදුසු ද යත්, සම්මාදිට්ඨි සම්මාසංකප්පයන් අතුරෙන් ප්‍රඥාව ස්වශක්තියෙන් අනිච්චං දුක්ඛං අනත්තා යයි ආරම්මණ විදර්ශනා කිරීමට සමත් නොවෙයි. විතර්කයෙන් අරමුණට නංවා නංවා දෙන කල්හි සමත් වේ. එහෙයින් මෙහි සම්මාදිට්ඨියම සවජාති වශයෙන් ප්‍රඥාස්කන්ධයෙන් සංගෘහිත වේ. සම්මාසංකල්පය වනාහි ක්‍රියා වශයෙන් සංගෘහිතයි.

''සම්මාදිට්ඨි සම්මාසංකප්පෙසුපි පඤ්ඤා අත්තනො ධම්මතාය අනිච්චං දුක්ඛං අනත්තාති ආරම්මණං නිච්ඡෙතුං නසක්කොති, විතක්කෙ පන ආකොටෙත්වා දෙන්තෙ සක්කොති–පෙ–තස්මා ඉධ සම්මාදිට්ඨියෙව සජාතිතො පඤ්ඤාක්ඛන්ධෙන සංගහිතා, සම්මාසංකප්පො පන ක්‍රියතො සංගහිතො හොති'' (සම්මොහ විනෝදනී)

ගන්ධයක් නොවන සීලාදිය කුමක් හෙයින් ගන්ධයක් යයි. කියන ලද්දේද යත්, සීලගන්ධය යනාදිය විහිදී යන අර්ථයෙන් සීලාදීන්ටම නාමයෝ වෙති. ''සීලගන්ධොති ආදීනි පන වායනට්ඨෙන සීලාදීනංයෙව නාමානි'' **(අට්ඨකථා)** වායනාර්ථය යනු පැතිරීයන ප්‍රකටවන අර්ථයෙන් යයි කියන ලදී. ''වායනට්ඨෙනාති පසාරණට්ඨෙන පාකටභාවට්ඨෙන වා''. **(ටීකා)**

වායනය යනු ස්වකීය විෂය පැතිරගෙන පැවැත්මය, යම් හෙයකින් ස්වකීය විෂය පැතිර ගත්තේ නම් එහි පැතිරගිය බව ප්‍රකට බව වෙයි. එහෙයින් පැතිරෙන ප්‍රකටවන අර්ථයෙන් යයි කියන ලදී. ස්වකීය වස්තුව ගැන කියා පෑම හෝ වායන යයි. ''වායනං සවිසයෙ බ්‍යාපෙත්වා පවත්තනං – පෙ – යස්මා පන සවිසය බ්‍යාපනං, තත්ථ පසටභාවො පාකටභාවො වා හොති, තස්මා පසාරණට්ඨෙන පාකටභාවට්ඨෙන වාති වුත්තං, අත්තනො වත්ථුස්ස සූචනං වා වායනං'' **(අනුටීකා)** ''ගන්ධෙති අත්තනො වත්ථුං සූචෙතීති ගන්ධො'' යනු විග්‍රහයි.

අර්ථරසාදිය පිළිබඳ ස්වරූපාර්ථ අංගුත්තර තිකනිපාතට්ඨකථාව බලා තේරුම් ගතයුතු. අනුභව කළයුතු ආහාරපාන වැනි රසයක් නොවන්නා වූ අර්ථරසාදිය කුමක් හෙයින් රස නමින් කියන ලදද යත්, අර්ථරස යනාදිය සාදුරය මධුරස බැවින් අර්ථාදීන්ටම නමකි. ''අත්ථරසොති ආදීනිපි සාදු මධුරට්ඨෙන අත්ථාදීනඤ්ඤේව නාමානි'' **(අට්ඨකථා)** අධිප්‍රායාර්ථය මෙසේය. අනුභව කරනු ලබන ආහාරපාන රසයම රස නමැයි නොගත යුතුය. සත්වයෝ ඒ ඒ දෙය රසනය – ආස්වාදනය කෙරෙත් – නුයි රස නම්. ''රසන්ති අස්සාදෙන්ති තංතං සත්තාති රසෝ'' යන වචනාර්ථයට අනුව මධුර වූ ධර්මය ද රස නම් අර්ථාදිය ද මධුර වූ ධර්මයෝම වෙති, එනිසා රසයයි කියන ලදැයි දතයුතු.

ප්‍රඥප්ති වාර ගණ්ඨිපද නිමි

---

## ප්‍රවෘත්ති වාරය

චක්ඛායතන මූල සද්දයතන මූලීය ස්වරූප වෙන්කොට කියන ලද්දේද, නොකියන ලද්දේද යත්, නොකියන ලද්දේය. ''චක්ඛායතන මූලකානි ඒකාදස'' යන අට්ඨකථා පාඨය කවර අර්ථයක් කියන්නේද යත්, ප්‍රවෘත්ති වාරයෙහි චක්ඛායතන මූලක එකොළස – යනු ප්‍රතිසන්ධි චුති වශයෙන් උපාදින්න පැවැත්මගේ උත්පාද නිරෝධ වචනයෙහි මෙහි නොලැබෙන විසඳුමෙහි සද්දයතනය සමග යමකය ප්‍රශ්නමාත්‍රයක් ලැබීම් වශයෙන් සංග්‍රහ කොට කියන්නේ යයි දතයුතු' ''පවත්ති වාරෙ චක්ඛායතන මූලකානි එකාදසාති පටිසන්ධි චුතිවසෙන උපාදින්න පවත්තස්ස උප්පාද නිරෝධ වචනෙ එකස්මිං අලබ්භමාන විස්සජ්ජනම්පි සද්දායතනෙන සද්ධිං යමකං පුච්ඡාමත්තලාභෙන සංගණ්හිත්වා වදතීති. දට්ඨබ්බං'' **(ටීකා)** කුමක් හෙයින් සද්දායතන විස්සර්ජනාව නොකියන ලද්දේද, යත්, යට කී ටීකා පාඨයෙන් එය නොකීමේ හේතුව දැනගත යුතුය.

චක්ඛායතනය පමණක් ලබන සෝතායතනය නොලබන්නා වූ ඕපපාතිකයෙහි දුගති අහේතුකයා පමණක් උදුරා සුගති අහේතුකයා නොම උදුරණ ලද්දේ කුමක් හෙයින් ද යත්, සුගතියෙහි මහානුභාව කර්මයෙන් උපදින ඕපපාතිකයන්ගේ ඉන්ද්‍රිය විකලත්වයෙක් නොවන බැවින් චක්ඛු සොත ඝාන නොලැබීම සංසේදජයන්ගේ භාවරූප නොලැබීම ප්‍රථම කල්පික ඕපපාතිකයන්ගේ වශයෙන් සිදුවේ. ''සුගතියං මහානුභාවෙන කම්මුනා නිබ්බත්තමානානං ඕපපාතිකානං ඉන්ද්‍රිය වේකල්ලායොගතො, චක්ඛුසොත ඝානාලාභො සංසේදජානං, භාවාලාභො පඨමකප්පික ඕපපාතිකානං වසෙනපි.'' **(විභාවිනී ටීකා)** මෙහි වනාහි නිබ්බත්තමානානං පදය හේතුමන්ත විශේෂණය වශයෙන් සලකා නිබ්බත්ත මානාන්තා යයි හේතු වශයෙන් දක්වනු.

කුමක් හෙයින් ඕපපාතික නම් වේද යත්, සකලාංග පූර්ණව පහළවීමක් ඇති බැවින් ඕපපාතික නම් වේ. ''උපපාතො හෙසං අත්ථීති ඕපපාතිකා'' **(විභාවිනි ටීකා)** එසේ වී නම් සංසේදජ ගර්භසෙය්‍යක පුද්ගලයෝ සකලාංග පූර්ණව උපදින්නෝ නොවෙත් ද යත්, උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් මෙහි විශේෂත්වයෙන් ඕපපාතිකයා ගන්නා ලදී. ''උක්කංසපරිච්ඡෙද වසෙන චෙත්ථ විසිට්ඨ උපපාතො ගහිතෝ යථා අභිරූපස්ස කඤ්ඤා දාතබ්බාති,'' **(එම විභාවිනි ටීකා)** කුමක් හෙයින් සංසේදජ නම් වේද යත්,පියුම් ගැබ ගැඹමල ආදි තෙතමන ඇති තැන්හි හට ගත්තෝ සංසේදජ නම් වෙති. කමලකුහර ගබ්භමලාදි. සංසෙදට්ඨානේසු ජාතා සංසේදජා'' **(එම විභාවිනි ටීකා)**

ගර්භසෙය්‍යකයා කුමක් හෙයින් ස්වරූප වශයෙන් ගනු ලැබේද යත්, ඒ පුද්ගල යන්ට ප්‍රතිසන්ධික්ෂණයෙහි චක්ඛායතනය නැත්තේද යත්, අද්ධාපච්චුප්පන්නයට ඇතුළත් බැවිනි. ''අද්ධාපච්චුප්පන්නත්තො ගධත්තා'' අද්ධා පච්චුප්පන්න යනු කවරේදයත්,

පච්චුප්පන්නං තිධාවුත්තං - ඛණ සන්තති අද්ධතො
තත්ථහි ඛණ සම්පත්ති - පච්චුප්පන්නං ඛණාදිකං,
එකද්වෙ සන්තති වාර - පරියාපන්නම්පි තම්පන,
සන්තති පච්චුප්පන්නන්ති - ආහු සන්තති කොවිද
ඒකභව පරිච්ඡින්නං - පච්චුප්පන්නන්ති පච්ඡිමං,

**(අභිධම්මාවතාර)**

චක්ඛායතනය පමණක් ලැබ සෝතායතනය ලැබීමට ප්‍රථම චුතවීමට නියතවූ පුද්ගලයන්ගේ ප්‍රතිසන්ධිය සහේතුක නොවෙයි අහේතුක ප්‍රතිසන්ධියක්ම බව කුමක් බලා දතයුතු ද යත්, ගර්භසෙය්‍යකයන්ට චනාහි චක්ෂු රාදිය පහළවීමට පෙර චුතවන්නාවුන්ට අහේතුක ප්‍රතිසන්ධි බව කාමාවචර සහේතුක ප්‍රතිසන්ධික යන්ට නියමයෙන්ම සචක්ඛුකාදි බව දැක්වීමෙන් වෙයි. ''ගබ්භසෙය්‍යකානඤ්ච අනුප්පන්නෙසු චක්ඛාදිසු චවන්තානං අහේතුක පටිසන්ධිකතා සහේතුක පටිසන්ධිකානං කාමාවචරානං නියමතො සචක්ඛුකාදිභාවදස්සනේන දස්සිතා හොති.'' **(ඉන්ද්‍රිය යමක ටීකා)**

සෝතායතනය පහළවීමට පෙර චුතවන්නාවූ පුද්ගලයා කුමක් හෙයින් සහේතුක ප්‍රතිසන්ධිකයෙක් නොවන්නේ ද යත්. අටක් වූ කාමාවචර මහාවිපාක චිත්තයෙන් කාමාවචර දෙවියන් කෙරෙහි ද මනුෂ්‍යයන් කෙරෙහි ද පුණ්‍ය වන්ත යන්ගේ ප්‍රතිසන්ධි ලැබෙයි. ''අට්ඨහි සහේතුක මහාවිපාකෙහි කාමාවචර දෙවෙසු චෙව මනුස්සෙසු ච පුඤ්ඤවන්තානං පටිසන්ධි හොති.'' යන සම්මොහ විනෝදනි

වචනයට අනුව පුණ්‍යවන්ත පුද්ගලයන්ට ම සංහේතුක ප්‍රතිසන්ධිය ලැබෙයි. පුණ්‍යවන්ත පුද්ගලයෝ ද සැපවත් බවට පත්වන බැවින් සෝතායතනය නොලැබී වුතවන්නෙක් නොමැත. එනිසා සෝතායතන නොලබා වුතවන්නා වූ පුද්ගලයෝ සංහේතුක ප්‍රතිසන්ධික නොවෙත් යයි දතයුතු.

සෝතායතනය අඩු පුද්ගලයා අකුසල කර්මයක් ඉදිරිපත් වීමෙන් සෝතායතනය නොලැබුණේද ප්‍රතිසන්ධිය ගෙනදෙන පූර්ව කර්මයම බාධා කිරීමෙන් සෝතායතනය ලැබිය නොහැකිව සෝතායතනය අඩු වූයේ ද යත්.

චක්ෂුර් ප්‍රසාදය පහළවීම වැළැක්වීමට සමත් කර්මයෙන් දෙන ලද ප්‍රතිසන්ධියෙන් හෝ වෙනත් කර්මයකින් හෝ චක්ෂුර් ප්‍රසාදය පහළ නොවනු ලබන සත්වයා ජාත්‍යන්ධයා නම් වේ. ''චක්ඛුප්පත්ති විබන්ධක කම්ම පටිබාහිත සාමත්ථියෙන දින්න පටිසන්ධිනා ඉතරෙනාපි වා කම්මෙන අනුප්පාදෙතබ්බ චක්ඛුකො සත්තො ජච්චන්ධො නාම'' **(විභාවිනී ටීකා)**

ගබ්භසෙය්‍යකයා ස්වරූප වශයෙන් ගැනීමේ දී චනාහි ටීකාචාර්‍යයන් අනුගමනය කොට අද්ධාපච්චුප්පන්න වශයෙන් ස්වරූප ගන්නා ලදී. අර්ථකථා චාර්‍යයෝ චනාහි ක්ෂණ ප්‍රත්‍යුත්පන්නය ගෙන ''සචක්ඛුකානං අසොතකානන්ති අපායෙ ජාතිබධිර ඕපපාතිකං සන්ධාය වුත්තං'' යි. සංවර්ණනා කළහ. මේ අර්ථකථා පාඨයෙහි සංසේදජ පුද්ගලයා ඕපපාතිකයා කෙරෙහි ඇතුළත් වේ. (නොහොත්) අප්‍රධාන බැවින් ස්වරූප වශයෙන් නොගන්නා ලදී. එසේ ස්වරූප වශයෙන් නොගැනීම චනාහි පටිච්ච සමුප්පාද විභංග අනුටීකා ව කියවීමෙන් තේරුම් ගත හැකිවේ.

සානායතන මූලි අනුලෝම සන්නිට්ඨානයෙහි ඕපපාතික පුද්ගලයා කුමක් හෙයින් ස්වරූප වශයෙන් නොගන්නා ලද්දේද යත්.'' කාමධාතුයං පන අඝානකො ඕපපාතිකො නත්ථි'' **(යමක අට්ඨකථා)**

කාමභූමියෙහි චනාහි අඝානක ඕපපාතිකයෙක් නැත. ''දුග්ගතියං පන චක්ඛුසෝත භාවාලාභෝ ද්වින්නම්පි වසෙන ඝානාලාභො සංසෙදජානමෙව වසෙන න ඕපපාතික වසෙනාති දට්ඨබ්බං.'' **(විභාවිනී ටීකා)**. දුගතියෙහි චනාහි චක්ඛුසොත භාව තුන නොලැබීම සංසේදජ ඕපපාතික යන දෙදෙනාගේම වශයෙනි ඝානය නොලැබීම සංසේදජයන්ගේ ම වශයෙනි, ඕපපාතිකයන්ගේ වශයෙන් නොවේ යයි දතයුතුය.

අභිධර්මාර්ථසංග්‍රහාචාර්‍ය පාදයන්වනාහි සංසේදජ ඕපපාතික පුද්ගලයන්ට ඕමක වශයෙන් චක්ඛුසෝත ඝාන භාවයන් නොලැබිය හැකි යයි පොදුවේ කියන ලදී. ඝානය නොලැබීම සංසේදජ පුද්ගලයන්ට මැයි කුමක් හෙයින් වෙන් කොට ගනු ලැබේද යත්, ''ඒකයෝග නිද්දිට්ඨස්සාපි එකදෙසො සම්බන්ධං ලභති'' **(පටිච්ච සමුප්පාද විභංග අනුටීකා)** එකට යොද දක්වන ලද්දගේද එක් දෙසක් සම්බන්ධය ලබයි. සචක්ඛුකානං අඝානකානං යන තැන රූපාවචර පුද්ගලයා ද ගනු ලැබේ.

ඒ රූපාවචර පුද්ගලයන්ට ඝාන නිමිත්තයක්ම නැත්තේ ද යත්, ඝාන නිමිත්ත ඇත. ඝාන ප්‍රසාදයත් ඝාන විඤ්ඤාණයත් නැත. එහෙයින් ගන්ධය නොදනිත්, ''ඝානං අත්ථි,ඝානප්පසාදෙව ඝාන විඤ්ඤාණඤ්ච නත්ථි තස්මා ගන්ධං න ජානාති.' **(ජිනාලංකාර ටීකා)**

ඝාන නිමිත්ත ඇත්තේ නම් ඝානප්‍රසාදය කුමක් හෙයින් නොලැබෙන්නේ ද යත්, බ්‍රහ්මයන්ට ඝානාදි ප්‍රසාද තුන නොමැත. කාමවිරාග භාවනා වසෙන ගන්ධරස ස්පර්ශයන් කෙරෙහි නොඇලුන බැවින් ඒවා ගොදුරු කොට ගන්නා වූ ප්‍රසාදයන් කෙරෙහි ද විරක්ත බැවිනි. ''ඝානාදිත්තයං නත්ථි බ්‍රහ්මානං කාමවිරාග භාවනා වසෙන ගන්ධරස ඵොට්ඨබ්බෙසුපි විරත්තතාය තබ්බිසය පසාදෙසුපි විරාග භාවතො'' **(විභාවිනී ටීකා)**

ගන්ධායතන මූලියෙහි ආමන්තා යයි කියනු ලැබෙද. විභංගය කියනු ලැබෙද යත්, ''අගන්ධකානං අරසකානං අඵොට්ඨබ්බකානන්ති යෝජනා වෙදිතබ්බා'' **(යනු ආයතන යමක අට්ඨකථායි)** එසේ වී නම් රූපාවචර පුද්ගලයන්ට ගන්ධයෙක් නැත්තේමද, මෙහි ගන්ධාදිය ආයතන බවට පත්වූවක්ම අදහස් කරනු ලැබේ එනිසා සරූපකානං සගන්ධායතනන්ති යනුවෙන් ආයතන වශයෙන්ම මෙහි අර්ථ යෝජනාව දතයුතුය. ''ගන්ධාදීනි චෙත්ථ ආයතන භූතානෙව අධිප්පෙතානි, තස්මා සරූපකානං සගන්ධායතනන්ති ආයතනවසෙනෙවෙත්ථ අත්ථො දට්ඨබ්බො'' **(එමඅට්ඨ කථා)** මේ **ආයතන යමක අට්ඨකථාවෙහි** ගන්ධය ඇත. ගන්ධායතනය නැතැයි කියන ලද්දේ වේ. කුමක් හෙයින් ගන්ධය ඇත්තේ නම් ගන්ධායතනය බවට නොයන්නේ ද යත්, යම් හෙයකින් වනාහි රූපාවචර යන් හට ඝානායතනාදිය නොමැති බැවින් ගන්ධායතනාදිය ආයතන කෘත්‍යය සිදු නොකරත්ද, එහෙයින් රූපධාතුවෙහි ෂ ආයතන නවධාතුයො යනාදිය කියන ලදී. ''යස්මා පන රූපධාතු පරියාපන්නානං සත්තානං ඝානායතනාදිනමභාවෙන ගන්ධායතනාදීනි ආයතන කිච්චං න කරොන්ති, තස්මා රූපාධාතුයා ඡආයතනා නවධාතුයොති ආදි වුත්තං'' **(සම්මොහ විනොදනී ධම්මහදය විභංගයෙනි)**

එසේ වී නම් රූපභූමියෙහි ඇත්තා වූ ගන්ධ රස ඵොට්ඨබ්බයො කවර ආයතන බවට යෙත් ද යත්, ධම්මායතනය බවට පැමිණෙති. කුමක් හෙයින් ධම්මායතනය බවට පැමිණෙත් ද යත්, ධර්ම ස්වභාවය නොඉක්මවන බැවින් හා මනොවිඤ්ඤාණ ධාතුවට අරමුණු වන බැවින් ද ධර්මායතනයට ඇතුළත් වූවන් කොට පඤ්චායතනයෝ යැයි පෙළෙහි කියන ලදී. ''ධම්මස්සභාවා නාතිවත්තනතො මනොවිඤ්ඤාණස්ස ච විසයභාවූපගමනතො ධම්මායතනන්තොගධෙ කත්වා පඤ්චායතනානීති පාළියං වුත්තං'' **(පටිච්ච සමුප්පාද විභංග අනුටීකා)**

ඝානායතනමූල ජීවභායතන මූලියෙහි ආමන්තා යයි කිය යුතුද, බෙද කිවයුතු ද යත්, ඔවුන් අතුරෙන් ජිව්හායතන කායායතන යමකයන්හි ප්‍රශ්න තුනකට ආමන්තා කියා විසඳිම විය යුතුය. අන්තිම ප්‍රශ්නයයට ''සකායකානං අඝානකානං උපපජ්ජන්-තානං'' යනාදීන් විසඳිම විය යුතුය.''

''තෙසු හි ජිව්හා කායායතන යමකෙසු තිණ්ණං පුච්ඡානං ආමන්තාති විස්සජ්ජනේන භවිතබ්බං, පච්ඡිම පුච්ඡාය සකායකානං අඝානකානන්ති ආදිනා'' (**ආයතන යමක ටීකා**) ලැබීමට සුදුසු නම් කුමක් හෙයින් විභංගය බෙද නොකියන ලද්දේ ද යත්, යම් සේ රූපභවයෙහි ඝාන ජිව්හා දෙක හැර චක්ඛු සෝත දෙක පවතින්නාහු ද එසේ ඝාන ජිව්හා දෙක ඔවුනොවුන් වෙන්ව නොපවතිත්, ඒ දෙකම රූපභවේ නූපදනා බැවිනි. එසේ වෙන් වෙන්ව කාමභවයෙහි නොපැවතීමෙන් ඔවුන්ගේ එක්ව පවත්නා සහචරිත බව කියන ලදී. ''යථා චක්ඛු සොතානි රූපභවෙ ඝාන ජිව්හාහි විනා පවත්තන්ති. න එවං ඝාන ජිව්හා අඤ්ඤමඤ්ඤං විනා පවත්තන්තිද්වින්නම්පි රූප භවෙ. අනුප්පජ්ජනතෝති එවං විසුං විසුං කාම භවෙ අප්පවත්ති වසෙන තෙසං සහචරිතා වුත්තා, (**විභාවිනි ටීකා**)

ආයතන යමක ගණ්ඨි පද නිමි

---

## ධාතු යමක ගණ්ඨි

ධාතු යන නම කුමක් හෙයින් කියනු ලැබෙද යත්.

> විදහති විධානඤ්ච – ධියතෙ ච විධියතෙ,
> එතාය ධියතෙ එත්ථ – ඉති වා ධාතු සම්මතා
> සරීර සෙලාවයවා – ධාතුයො විය ධාතුයො.
> (විභාවිනි ටීකා – පාඩම් කළ යුතු)

ධාතු ශබ්දයාගෙ අර්ථය වනාහි කෙසේද, ධාත්වර්ථය නම් ස්වභාව අර්ථයයි. ස්වභාවාර්ථය නම් ශූන්‍යතාර්ථයයි, ශූන්‍යතාර්ථය,නම් නිස්සත්වාර්ථයයි,'' ''ධාත්වත්ථො නාම සභාවත්ථො, සභාවත්ථො නාම සුඤ්ඤතත්ථො, සුඤ්ඤතත්ථො නාම නිස්සත්තත්ථො'' (සම්මොහ විනොදනි)

එසේ වුව ද සූත්‍ර අභිධර්ම දේශනාවන්හි ආරම්භධාතු සුතධාතු යනාදී වශයෙන් බොහෝ ධාතු ප්‍රභෙද ඇති නමුත් ධාතු දහඅටෙක් පමණක්ම කුමක් හෙයින් වදාරණ ලදද යත්, ස්වභාවයෙන් විද්‍යමානවන සියලු ධාතූන් ඒ දහඅටට ඇතුලත් වන බැවිනි. ''සභාවතො විජ්ජමානානං, සබ්බධාතූනං තදන්තොගධත්තා'' (සම්මොහ විනොදනි)

චක්ඛු විඤ්ඤාණ ධාතු ආදිය ආරම්මණයන්ගේ වශයෙන් රූපවිඤ්ඤාණධාතුව සද්ද විඤ්ඤාණ ධාතුව යනාදී වශයෙන් නම් නොකොට චක්ඛුවිඤ්ඤාණ ධාතුන් යනාදීන් වස්තූන්ගේ වශයෙන් නම් කොට කියන ලද්දේ කුමක් හෙයින් ද යත් රූපාදීන්ගේ ප්‍රත්‍යය අන්‍යවිඤ්ඤාණ ධාතුන්ට සාධාරණ බැවින්, සාධාරණ නොවූ වස්තු කරණ කොට ගෙන චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ ආදී නම් කියනලදී. ''රූපාදීනං පච්චයානං අඤ්ඤ විඤ්ඤාණ සාධාරණත්තා අසාධාරණෙන වත්ථුනා චක්ඛුවිඤ්ඤාණං සෝතවිඤ්ඤාණන්ති නාමං උද්ධටං'' (ධම්ම සංගණී ටීකා අව්‍යාකෘත පද නිර්දේශයෙනි)

**අනුටීකාචාර්‍ය්‍ය පාදයෝ** එනාහි භෙරීශබ්දය, යවංකුරය යනාදිය මෙන් අසාධාරණ නය ක්‍රමයෙන් නම කියන ලදී. එහෙයින් අසාධාරණ නය අනුව යයි දතයුතු ''අසාධාරණෙන නාමං උද්ධටං, භෙරිසද්දෙ යවංකුරොති යථා''

චක්ඛුපදය හා විඤ්ඤාණ පදය කවර නම් වාක්‍ය විග්‍රහයකට අයත්ද, චක්ඛුස්ස විඤ්ඤාණං චක්ඛු විඤ්ඤාණං යනු විග්‍රහයයි. චක්ඛුස්ස යනු කවර සම්බන්ධයෙක්ද විඤ්ඤාණං යනු කවරක් හා සම්බන්ධි ද, යත්, කාරණ සම්බන්ධ – ඵල– සම්බන්ධ යයි දතයුතු. එහෙයින් අට්ඨසාලිණියෙහි ''චක්ඛු-විඤ්ඤාණං කාරණභූතස්ස චක්ඛුස්ස'' යයි කියන ලදී. චක්ඛු විඤ්ඤාණය කාරණභූත වූ චක්ඛුවගේ යනු අර්ථයි.

තවද, චක්ෂුව කෙරෙන් පහළ වූ විඤ්ඤාණය, චක්ඛුවෙහි නිශ්‍රිත විඤ්ඤාණය චක්ෂු විඤ්ඤාණ නමි.''චක්ඛුතො වා පවත්තං චක්ඛුස්මිං වා නිස්සිතං විඤ්ඤාණන්ති චක්ඛුවිඤ්ඤාණං''(අට්ඨසාලිනී) මන වූයේත් ධාතු වූයේත් ඒම නුයි මනොධාතු නමි. ''මනො එව ධාතු මනොධාතු'' (අට්ඨසාලිනි) අන්‍ය චිත්තයන්ට ද ස්වභාව ශූන්‍යත බව ලැබෙන බැවින් මනොධාතු බව ලැබේ ද යත්, විශේෂයෙන් නොලැබෙයි 'අඤ්ඤෙසං චිත්තානං සභාව සුඤ්ඤත සබ්භාවා මනොධාතු භාවො ආපජ්ජතීති චෙ,න විසෙස සබ්භාවා'' **(මූලටීකා)**

කිනම විශේෂ ස්වභාවයෙක් විද්‍යාමානව ඇත්තේ ද යත්, චක්ඛු විඤ්ඤාණාදිය පිළිබඳව වනාහි චක්ෂුර් වස්තුව ආදිය ඇසුරු කොට ඇති බවද, චක්ෂුරාදිය පිළිබඳව ස්වකීය ගෝචර ආරම්මණයෙහි දර්ශනාදි වශයෙන් පවත්නා බවද විශේෂයි, මනො විඤ්ඤාණය පිළිබඳව වනාහි අනිකක් ඇසුරු නොකරන මනෝ පූර්වාංගමතාවයෙන් ද අනිකක් ඇසුරු කරන විඤ්ඤාණයට අනන්තර ප්‍රත්‍ය ඇති බැවින්ද මනෝද්වාරයෙන් නික්මෙන දෙරටුවක් නොවන බැවින් ද සාතිශය වශයෙන් විජානන කෘත්‍ය ඇති බවද විශේෂයි. ''චක්ඛුවිඤ්ඤාණාදිණං චක්ඛාදි නිස්සිත්තා චක්ඛාදීනං සවිසයෙසු දස්සනාදිපවත්ති භාවතො ච විසෙසො, මනො විඤ්ඤාණස්ස පන අනඤ්ඤනිස්සා මනෝපුබ්බංගමතාය අඤ්ඤනිස්සය විඤ්ඤාණස්ස අනන්තර පච්චයත්තාභාවෙන මනොද්වාර නිග්ගමන මුඛභාවාභාවතො ච සාතිසය විජානන කිච්චතා විසෙසෝ'' **(මූල ටීකා)**

විශේෂ ස්වභාව ඇත්තා වූ ධාතුව මනොධාතුව යයි නොකියා කවර නම් ලක්ෂණ ඇත්තා වූ ධාතුව මනොධාතුව යයි කියනු ලැබේද යත්, එවැනි විශේෂයක් නොමැති බැවින් මන මාත්‍ර ධාතුව මනොධාතුව යයි ත්‍රිවිධ මනොධාතුව පමණක්ම කියනු ලැබේ. විශේෂ මනො නොවෙයි. ''තබ්බිසෙස විරහිතා මනොමත්තං ධාතු මනොධාතුති තිවිධා මනොධාතු එව වුච්චති, නවිසෙස මනො'' **(මූල ටීකා)**

කුමක් හෙයින් වනාහි අතිශය විජානන කෘත්‍යයෙන් වෙන්කර ගනු ලැබේද යත්, මනෝද්වාරයාගේ පිවිසෙන පිටවෙන ද්වාරය බැවින් මනොධාතුව පිළිබඳ විශේෂ විජානනයක් නැති බව දතයුතු. ''මනොද්වාර නිග්ගමන පවෙසන මුඛභාවතො පන මනොධාතුයා විජානන විසේස විරහො දට්ඨබ්බො'' **(මූලටීකා)**

මේ මනොධාතු ත්‍රිකය වනාහි කුමක් හෙයින් මනොවිඤ්ඤාණ ධාතුව යයි නොකියනු ලැබේද යත්, විශේෂ විජානන කෘත්‍යයක් නැති බැවින් ම මනොවිඤ්ඤාණයයි ද නොකියනු ලැබේ. ඒ විඤ්ඤාණය වනාහි මනොද්වාරික වශයෙන් පැවතියේ හෝ එයට ප්‍රත්‍යවූයේ හෝ නොවෙයි. මනොද්වාරික විඤ්ඤාණයෙන් ප්‍රත්‍ය ලබන්නේ හෝ එයින් හටගත්තේ හෝ නොවෙයි. දර්ශනාදියට වනාහි ප්‍රත්‍ය වේ.

''තතො එව මනොවිඤ්ඤාණන්තිපි න වුච්චති, නහි තං විඤ්ඤාණං මනතො පවත්තං මන්සො පච්චයො, නා පි මනසො පච්චය භූතං මනතො පවත්තං දස්සනාදීනං පන පච්චයො.''(මූලටීකා)

මනොවිඤ්ඤාණ ධාතු යයි නොකියන ලද නමුත් අභිධර්මාර්ථ සංග්‍රහයෙහි වීථිකාණ්ඩයෙහි දී ''ඡ විඤ්ඤාණානි'' යි කියන තැන මනොවිඤ්ඤාණයෙන් වෙන් නොකරණ ලද්දේ වෙයි. ඉදින් මනොධාතුව මනොවිඤ්ඤාණ යයි නොකියනු ලැබේ නම්, ඡ විඤ්ඤාණකාය යනාදියෙහි කෙසේ නම් එහි මනොධාතුවගේ සංග්‍රහය වන්නේද, සංග්‍රහ වන්නේමය. පර්‍යාය දේශනාවෙක් බැවිනි. මනන මාත්‍ර විඤ්ඤාණය මනොවිඤ්ඤාණ යයි මෙහි පර්‍යාය ක්‍රමයෙක් ඇත්තේමය. ''යදි මනොධාතු මනො විඤ්ඤාන්ති න වුච්චති. ඡ විඤ්ඤාණකායාදි කථා මනොධාතුයා කත්ථ සංගහොති, සංගහො එව පරියාය දේසනත්තා, අත්ථිහි එස පරියායො, මන්න මත්තං විඤ්ඤාණං මනො විඤ්ඤාණන්ති.'' **(ධම්මසංගණි අනුටීකා)**

ප්‍රධාන වූ මනොවිඤ්ඤාණය වනාහි ''මනොයෙව විසිට්ඨ විජානන කිච්චයොගතො විඤ්ඤාණංමනො විඤ්ඤාණං,මනසො වා විඤ්ඤාණං,මනොවිඤ්ඤාණං,''කියා විග්‍රහ කරනු. **(විභාවිනි ටීකා)** මනොධාතු ත්‍රිකයම මනො යයි කියනු ලැබේ. අවසේස මනො මනො ධාතුව යැයි. කියා ඇති නමුත් මනො එව ධාතු මනොධාතු යයි කියන ලද අට්ඨකථා වචනය අනුව කෙසේ අරුත් යෙදේද යත්, මන වූයේත් ඒය, ධාතු වූයේත් ඒ නුයි මනො ධාතු යයි එව ශබ්දය මාත්‍ර අර්ථ ඇත්තේ යයි දතයුතුය. සෝත විඤ්ඤාණය පිළිබඳ විශේෂණ වළක්වන අර්ථ ඇත්තේය, 'මනො එව ධාතු මනොධාතුති. එවසද්දො මත්තසද්දත්ථො දට්ඨබ්බො, විසේසන නිවත්තනත්ථොහි සෝත විඤ්ඤානස්ස,'' **(ධම්මසංගණී ටීකා)**

ප්‍රවෘත්ති වාරයෙහි සද්දධාතු, චක්ඛු විඤ්ඤාණ ධාතු ආදි සයක් වූ ධාතු ප්‍රතිසන්ධි කාලයෙහි නොලැබෙන බැවින් නොකියන ලදහ. ස්කන්ධ පස යයි කී මෙහි ද කුශල අකුශල අව්‍යාකෘත ධර්ම තිදෙන මැයි. ආයතන දොළස, ධාතු දහඅට යයි කී තැන්හි ද ඒ ධර්ම තුනමය. ඒ ධර්ම නවය වෙන වෙනම ඇත්නම් ස්කන්ධයමක ආදි යමක තුන අතුරෙන් එක එකක් ම නොකියා තුනම සම්පූර්ණයෙන් වදළේ කුමක් හෙයින් ද යත්, ත්‍රිවිධ වෛනෙය්‍ය සත්වයනට අනුග්‍රහ පිණිසය. වෛනෙය්‍ය සත්වයෝ වනාහි නාම සම්මූල්හ. රූපසම්මූල්හ, උභය සම්මූල්හ. වශයෙන් ද, තික්ඛින්ද්‍රිය, නාතික්ඛින්ද්‍රිය, මුදින්ද්‍රිය වශයෙන් ද, සංඛිත්තරුචික, මජ්ඣිම රුචික, විත්ථාර රුචික වශයෙන් ද ත්‍රිවිධ වෙති. ''තිවිධ සත්තානුග්ගහස්ස අධිප්පෙතත්තා, නාම රූප තදුභය සම්මූල්හානං වසෙන හි තික්ඛ නාතිතික්ඛ මුදින්ද්‍රිය වසෙන සංඛිත්ත මජ්ඣිම විත්ථාර වසෙන ච තිවිධා සත්තා.'' **(විභාවිනි ටීකා)**

ධාතු යමක ගණයි නිමි.

# සච්ච යමක ගණ්ඨි

## ප්‍රඥප්ති වාරය

සත්‍යය යනු අවිපරීතාර්ථයැයි කියනු ලැබේ. කවර නම් අවිපරීතාර්ථයක්ද යත්,

නාබාධකං යතො දුක්ඛං - දුක්ඛා අඤ්ඤං නබාධකං
බාධකත්ත නියාමෙන - තතො සච්චමිදං මතං,
තං විනා නාඤ්ඤතො දුක්ඛං - නහෝති නච තං තතො
දුක්ඛ හෙතු නියාමෙන–ඉති සච්චං විසත්තිකා.

නාඤ්ඤා නිබ්බානතො සන්ති - සන්තං නච නතං යතො
සන්තාභාව නියාමෙන - තතො සච්ච මිදං මතං
මග්ගා අඤ්ඤං න නියානං - අනියානො න චාපි සො
තච්ඡ නියාන භාවත්තා - ඉති සො සච්ච සම්මතෝ,

කුමක් හෙයින් චතාහි සත්‍ය සතරක්ම වදරණ ලදද යත්, එයට වැඩි සත්‍යයක් නොලැබෙන බැවින් හා එයින් ඉවත් කළයුතු සත්‍යයෙක් ද නැති බැවිනි. තවද භාග්‍යවතුන් වහන්සේ දුක්ඛයාගේ පැවැත්ම දේශනා කරන සේක් හේතුව සහිතව වදළහ. දුක්ඛයාගේ නැවත්ම දේශනා කරන සේක් උපාය මාර්ගය සහිතව වදළහ· මෙසේ පැවැත්ම හා නැවැත්මත් ඒ දෙකට හේතුවත් යන එපමණක් ම බැවින් සත්‍ය සතරක් පමණක් ම වදරණ ලදහ. ''කස්මා පන චත්තාරෙව අරියසච්චානි වුත්තානි අනූනානි අනධිකානීතිචෙ අඤ්ඤස්සාසම්භවතො,අඤ්ඤතරස්සච අපනෙය්‍යාභවතො අපිච පවත්තිමාචික්ඛන්තො භගවා සහෙතුකං ආචික්ඛී, නිවත්තිඤ්චස උපායං, ඉති පවත්ති නිවත්ති තදුභය හේතූනං එතපරමතො චත්තාරේව වුත්තානි'' **(සම්මොහ විනෝදනි)**

අනාගවූ ද දුකට හේතු ඇතත් කුමක් හෙයින් වනාහි තණ්හාව ම සමුදය යි කියන ලදද යත්, ප්‍රධාන හේතුව බැවිනි. ''කස්මා පන අඤ්ඤෙසුපි දුක්ඛ හේතුසු සන්තෙසු තණ්හායෙව සමුදයෝති වුත්තාති, පධාන කාරණත්තා'' **(විභාවිනි ටීකා)** කුමක් හෙයින් ප්‍රධාන හේතුව නම් වේද යත්, කර්ම විචිත්‍රතා, හේතුභාවයෙන් වනාහි කර්මයට සහාය භාවයට පැමිණීමෙන්ද විචිත්‍ර වූද හේතු වූද තෘෂ්ණාව දුක්ඛයට විශේෂ කාරණයවේ. ''කම්ම විචිත්තතා හේතුභාවෙන හි කම්මස්ස සහාය භාවූපගමනේන ච විචිත්තතා කාරණත්තා තණ්හා දුක්ඛස්ස විසේස කාරණන්ති.'' **(විභාවිනී ටීකා)**

සත්‍යාර්ථ සොළසක් වනුයේ කෙසේද යත්, ''දුක්ඛස්ස පීළනට්ඨො සංඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො, ඉමේ චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා තථා අවිතථා අනඤ්ඤථා, සමුදයස්ස ආයූහනට්ඨො, නිදානට්ඨො,සංයෝගට්ඨො පළිබෝධට්ඨො, -පෙ- නිරෝධස්ස නිස්සරණට්ඨො විවේකට්ඨො අසංඛතට්ඨො අමතට්ඨො -පෙ- මග්ගස්ස නිය්‍යානට්ඨො හෙත්වට්ඨො දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො, ඉමේ චත්තාරෝ මග්ගස්ස මග්ගට්ඨා තථා අවිතථා අනඤ්ඤථා'' **(සම්මොහ විනෝදනි පාඩම් කරන්න)**

චතුරාර්ය සත්‍ය අතුරෙන් කුමක් හෙයින් දුක්ඛ සත්‍යය පළමු කොට වදාරණ ලද්දේද යත්, ඖදාරික බැවින් හා සියලු සත්නට සාධාරණ බැවින් සුවසේ අවබෝධ කළහැකිනුයි දුක්ඛසත්‍යය පළමු කොට වදාරණ ලදී. ඒ දුක්ඛයාගේම හේතු දැක්වීම පිණිස එයට අනතුරුව සමුදය වදාරණ ලදී. හේතු නිරෝධයෙන් ඵලය නිරෝධ වේ යැයි දැක්වීමට ඉන් අනතුරුව නිරෝධසත්‍ය ද එයට පැමිණීමේ උපාය දැක්වීම පිණිස අන්තයෙහි මාර්ගසත්‍යය ද වදාරණ ලදී. ''ඕළාරිකත්තා සබ්බසත්ත සාධාරණත්-තා ච සුවිඤ්ඤෙය්‍යාන්ති දුක්ඛසච්චං පඨමං වුත්තං, තස්සෙව හේතු දස්සනත්ථං තදනන්තරං සමුදය සච්චං, හේතු නිරෝධාඵල නිරෝධොති ඤාපනත්ථං තතො නිරෝධ සච්චං, තදධිගමූපාය දස්සනත්ථං අන්තෙ මග්ගසච්චං'' **(සම්මොහ විනොදනී)**

දුක්ඛ වූයේත් සත්‍ය වූයේත් ඒ නුයි දුක්ඛ සත්‍ය නම් වේ යන වචනාර්ථයාගේ වශයෙන් කායික දුක්ඛ චෛතසික දුක්ඛ හා තණ්හාව ද හැර ත්‍රෛභූමික ධර්මයන් ගෙන වාක්‍ය විග්‍රහ කිරීමේදී දුක්ඛය නම් කොට, අවසේසං දුක්ඛ සච්චං න දුක්ඛං යයි කුමක් හෙයින් වදාරණ ලද්දේද යත්, මෙහි කියියම් හේතුවකින් දුක්ඛ දුක්ඛය, සංඛාර දුක්ඛය විපරිණාම දුක්ඛයයි අර්ථ තුනෙහි දුක්ඛ සබ්දය වැටේ. ජාතිපි දුක්ඛා යනාදීන් ජාති ආදියෙහි ද වැටේ. එය චනාහි දුක්ඛ දුක්ඛයෙන් බැහැර පවතිනුයේ අනෙකක් අපේක්ෂා නොකරමින් නොපවති. මෙහි ශුද්ධ වූ දුක්ඛ පදය අනිකක් නිරපේක්ෂව ගෙන වචනාර්ථ සංශෝධනය කරයි. එයින් නිශ්පර්‍යාය වශයෙන් දුක්ඛ බැවින්ම යමක් දුක්ඛදුක්ඛ නම් වේ ද ඒ දුක්ඛ දුක්ඛයෙහි මේ දුක්ඛශබ්දය වැටේ යයි දතයුතු. ''එත්ථ කිඤ්චාපි දුක්ඛදුක්ඛං සංඛාර දුක්ඛං විපරිණාම දුක්ඛන්ති තිසුපි දුක්ඛ සද්දෙ පවත්තති. ජාතිපි දුක්ඛාති ආදිනා ජාති ආදිසු ච, සො පන දුක්ඛ දුක්ඛතො අඤ්ඤත්ථ පවත්තමානො අඤ්ඤනිරපෙක්ඛො න පවත්තතීති, සුද්ධඤ්චෙත්ථ දුක්ඛපදං අඤ්ඤනිරපෙක්ඛං ගහෙත්වා පණ්ණත්ති සොධනං කරොති. තේන නිප්පරියායතො දුක්ඛ සභාවත්තා එව යං දුක්ඛ දුක්ඛං තස්මිං දුක්ඛ දුක්ඛෙ ඒස දුක්ඛ සද්දෙ.'' **(සච්ච යමක ටීකා)**

මෙහි දී අවසේසං දුක්ඛ සච්චං යන තන්හි ''ඨවුත්තිලා'' සන්න ආදියෙහි ලෞකික චිත්ත චෛතසික හා ඉන්ද්‍රිය බද්ධ රූපයන්ම ස්වරූප වශයෙන් අනින්ද්‍රිය බද්ධ රූප ප්‍රත්‍යනිකයෙහි ඇතුලත් කරති. එසේ ගැනීමේදී'' ඉතිරි ආර්‍ය සත්‍ය ද්වය අනිත්‍ය බැවින් දුක්ඛය, එහෙත් යම් දුකක් පිරිසිඳ අවබෝධ කරගැනීම පිණිස බුදුසස්නෙහි ශාසන බ්‍රහ්මචර්යාව වෙසෙනු ලැබේද එම අර්ථයෙන් දුක්ඛයක් නොවන්-නේය. සර්වාකාරයෙන්ම චනාහි තෘෂ්ණාව හැර උපාදනස්ඛන්ධ පඤ්චකයම දුක්ඛ-යත් ආර්‍ය සත්‍යයත් වන්නේය. මාර්ග සම්ප්‍රයුක්ත ධර්ම හා ඵල චිත්තෝත්පාදයෝ චනාහි යම් දුකෙක් පිරිසිඳ අවබෝධ කිරීම පිණිස බුදුසස්නෙහි ශාසන බ්‍රහ්මචර්‍යාව හැසිරෙනු ලැබේ ද, ඒ අර්ථයෙන් දුක්ඛයක් හෝ ආර්‍යසත්‍යයක් නොවන්නාහ.'' යයි කියන ලද සම්මෝහ විනොදනී අට්ඨකථාවේ කියන ලද චතුෂ්ක විනිශ්චයෙහි අන්තිම පාඨය නුවණින් මෙනෙහි කරමින් විමසන්න.

''ඉතරං පන අරියසච්චද්වයං සියා දුක්ඛං අනිච්චතො න පන යස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති තට්ඨෙන, සබ්බාකාරෙන පන උපාදනක්ඛන්ධ පඤ්චකං දුක්ඛඤ්චෙව අරියසච්චඤ්ච, අඤ්ඤත්‍ර තණ්හාය. මග්ගසම්පයුත්තා ධම්මා සාමඤ්ඤ ඵලානි ච යස්ස පරිඤ්ඤත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සති. තට්ඨෙන නෙව දුක්ඛං න අරියසච්චං'' (**සම්මොහ විනෝදනී**). ටීකා අනුටීකාවන්හි විශේෂ විනිශ්චයක් නොමැත. මේ පාඨය සමග උපාදනස්කන්ධ පඤ්චකය බැලීමේදී ස්වරූප ගැනීමට සුදුසු වන්නාක් මෙන් පෙනෙනු ඇත. මග්ග සපයුත්තා ධම්මා - යන පාඨය බලා ස්වරූප ගත නොහැකි වේ. මේ යමක අට්ඨකථාවෙහි ද, අවසේසං දුක්ඛසච්චං යනු දුක්ඛ වේදනාවෙන් හා තණ්හාවෙන් විනිර්මුක්ත වූ ත්‍රෛභූමික ධර්මයෝ දත යුත්තාහ යයි කියා ඇත. ''අවසේසං දුක්ඛ සච්චන්ති දුක්ඛ වේදනාය චෙව තණ්හාය ච විනිම්මුත්තා තෙභූමක ධම්මා වේදිතබ්බා'' (**යමක අට්ඨකථා**)

එසේ ස්වරූප ඉදිරිමේදී අනින්ද්‍රිය බද්ධ රූප අට විස්ස යයි කීම අයුතුය. අනින්ද්‍රිය බද්ධයෙහි ඍතුජ අෂ්ටක රූපකලාපය හා සද්දනවක කලාපය පමණක්ම ලැබෙන බැවිනි.

මාර්ග චිත්තයන්හි යෙදෙන අංග වැනි ඵල චිත්තයන්හි යෙදෙන ඵලාංගිකයෝ ස්වරූප වශයෙන් ඇතුලත් කරනු ලැබේද නොලැබෙත්ද යත්, මාර්ගයේම ඵලය බැවින් ඵලාංගයන්ට ද මග්ග ශබ්දය වැටේ. මාර්ග කෘත්‍යය සිද්ධකරන බැවින් නොවේ. ඵලාංගයෝ වනාහි හාත්පසින් නිමාවට ගිය නෛර්‍යාණික කෘත්‍ය ඇත්තෝ ය. මෙහි මාර්ග ශබ්දය වනාහි නෛර්‍යාණික අර්ථය කියන්නේය. නෛර්‍යාණික ඵලය කියන්නේ නොවේ. ''මග්ගසද්දෙ ච ඵලං ගේසු මග්ගඵලත්තා පවත්තති. න මග්ග කිච්ච සබ්භාවා,, පරිනිට්ඨිත නියාන කිච්චානිහි තානි. නියානි වාචකො වෙත්ථ මග්ග සද්දෙ. න නියානඵල වාචකො,'' (**සච්ච යමක ටීකා**)

ශුද්ධ සත්‍ය වාරයෙහි ''සමුදයො සච්චන්ති ආමන්තා''යන තැන සමුදය සාමඤ්ඤ සමුදය සත්‍ය දෙකම ස්වරූප වශයෙන් ගනු ලැබෙත් ද, සමුදය සත්‍ය පමණක්ගනු ලැබේ ද යත්,ශුද්ධ සත්‍ය වාරයෙහි සච්චවිභංගයෙහි කියන ලද සමුදය-යන් අතුරෙන් කිසිවක් ඵලධර්මයන්හි නොමැත. ඵලධර්මයන්හි කිසිවක් නිරෝධය නමින් කියනු නොලැබේ. මාර්ග ශබ්දය ද ඵල අංගයන්හි මාර්ගයාගේ ඵලයක් බැවින් වැටේ.මාර්ග කෘත්‍යය ලැබෙන බැවින් නොවේ.ඒ ඵලාංගයෝ වනාහි නිමාවට ගිය නෛර්‍යාණික කෘත්‍යය-ඇත්තෝය.මෙහි මාර්ග ශබ්දය නෛර්‍යාණික වාචකය නෛර්‍යාණික ඵල වාචක නොවේ.එහෙයින් සමුදයෝ සච්චං නිරෝධො සච්චං මග්ගො සච්චං යන මොවුන් ගැන ආමන්තා කියාම විසඳුම කරන ලදී. තවද පදසෝධනයෙන් පද ශෝධිත කල්හි සත්‍ය විශේෂණ වූම දුක්ඛාදී ශබ්දයෝ මෙහි ගන්නා ලදහයි වැටහේ. ඔවුන් ඒකාන්තයෙන් සත්‍ය විශේෂණ බව සත්‍යයන්ගේද ඔවුනට විශේෂණ වීමේ විශේෂය දක්වීමට සුද්ධසත්‍යය වාරය කියන ලද්දේ යයි සත්‍ය විශේෂණ වූ දුක්ඛාදීන්ගේ ඒකාන්ත සත්‍ය බැවින් දුක්ඛංසච්චං,නිරෝධො සච්චං මග්ගො සච්චන්ති ආමන්තා යයි කියන ලදී.මෙහි සේම ස්කන්ධ යමකාදියෙහිද ශුද්ධ ස්කන්ධවාරාදියෙහි ස්කන්ධාදීන්ට විශේෂණ වූ ම රූපා දීන්ගේ ගැනීම කියන ලදී. (**සත්‍ය යමක ටීකා**)

ප්‍රඥප්ති වාරය නිමි.

## ප්‍රවෘත්ති වාරය

ප්‍රවෘත්ති වාරයෙහි කුමක් හෙයින් නිරෝධ සත්‍යය නොවදරණ ලද්දේද යත්, නිරෝධයාගේ උත්පාදයක් හෝ නිරෝධයක් හෝ නොයෙදේ. එහෙයිනි, ''නිරෝධස්ස නෙව උප්පාදො න නිරෝධො යුජ්ජති.'' **(අට්ඨකථා)** දුක්ඛසත්‍ය මූල සමුදය සත්‍ය මූලීයෙහි තණ්හාවිප්පයුත්ත චිත්තස්ස යන තැන චතුවෝකාර පඤ්චවෝකාර දෙකෙහිම ස්වරූප ගනු ලැබේ ද, පඤ්චවෝකාරයෙහි පමණක් ගනු ලැබේද යත්, තණ්හා විප්පයුත්ත චිත්තස්ස යනු මෙය දුක්ඛසත්‍ය සමුදයසත්‍ය දෙක අතුරෙන් එක කොටසක ගේ උත්පත්තිය දැක්වීමට කියන ලදී. එහෙයින් පඤ්චවෝකාර වශයෙන්ම ගත යුතුය. ''තණ්හා විප්පයුත්ත චිත්තස්සාති ඉදං දුක්ඛසච්ච සමුදයසච්චෙසු එකකොට්ඨාසස්ස උප්පත්ති දස්සනත්ථං වුත්තං, තස්මා පඤ්චවොකාර වසෙනෙව ගහෙතබ්බං'' **සච්ච යමක අට්ඨකථා)**

තණ්හා විප්පයුත්ත චිත්තස්ස යන මෙය පඤ්චවෝකාර වශයෙන්ම ගතයුතුයයි කියන ලදී. යස්ස දුක්ඛසච්චං උපපජ්ජති යන මේ සන්නිට්ඨානයෙන් චනාහි උපදිමින් සිටින සියල්ලෝද ප්‍රවෘත්ති කාලයෙහි චතුවෝකාර භූමියෙහි මාර්ගඵල චිත්තයන් හැර අන්‍ය චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූවෝද, පඤ්චවෝකාර භූමියෙහි ද සියලු චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූවෝ ද සංග්‍රහ කරන ලදහ. සන්නිට්ඨානයෙන් ඔවුන් නිශ්චිත කරන ලද බැවින් කිසියම් කෙනෙක් ''ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි'' යන මේ වචනයෙන් දුක්ඛ සමුදය දෙකින් එක කොටසක පැවැත්මෙන් යුක්ත වූවෝ දක්වනු ලැබෙත් යයි සන්නිට්ඨානයෙන් ගන්නා ලද්දහුගේම විභාග දක්වන බැවිනි, එයින් චතුවෝකාර යන්ගේ ද ගැනීම කියන ලද්දේම වේ, ඔවුන් කෙරෙහි මග්ගඵල සමංගී බවක් නොවැටේ. මග්ග ඵල සමංගී වූවන් සන්නිට්ඨානයෙන් නොගන්නා ලද බැවිනි.

''තණ්හා විප්පයුත්ත චිත්තස්සාති ඉදං පඤ්චවොකාර වසෙනෙව ගහෙතබ්බන්ති වුත්තං යස්ස දුක්ඛසච්චං උප්පජ්ජතීති එතෙන පන සන්නිට්ඨානෙන සබ්බෙඋපපජ්ජන්තා පවත්තියං චතුවොකාරෙ මග්ග ඵලතො අඤ්ඤචිත්තානං උප්පාදක්ඛණ සමංගිනො පඤ්චවොකාරෙච සබ්බචිත්තානං උප්පාදක්ඛණ සමංගිනො සංගහිතාති තෙස්වෙච සන්නිට්ඨානෙන නිච්ඡිතෙසු කෙචි පවත්තෙ තණ්හාවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙති එතෙන දුක්ඛසමුදයෙසු එකකොට්ඨාස පවත්ති සමංගිනො දස්සියන්ති, සන්නිට්ඨානෙන ගහිතස්සෙ ව විභාග දස්සනතො තෙන චතුවොකාරානම්පි ගහණං උපපන්නමෙව, නහි තෙසු මග්ගඵලුප්පාද සමංගිසු පසංගතා අත්ථි, තං සමංගීනං තෙසං සන්නිට්ඨානෙන අගහිතත්තා''
**(සච්ච යමක ටීකා)**

තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ප්‍රවෘත්ති ජීවිත ජක්කු ප්‍රවෘත්ති ජීවිත නවකයන්ගේ උත්පාදක්ෂණ සමංගී අසංඥසත්ව පුද්ගලයා ස්වරූප වශයෙන් ඇතුලත් කරනු ලැබේ ද, නොලැබේද යත්, ඔවුන්ගේ ප්‍රවෘත්තියෙහි වනාහි දුක්ඛසත්‍යයාගේ උත්පාදය සැමතැන්හි නොගන්නා ලදී. නිරෝධයත් එසේය "තෙසං පන පවත්තියං දුක්ඛසච්චස්ස උප්පාදෙ සබ්බත්ථ නගහිතො තථා නිරෝධො ච" **(සච්ච යමක ටීකා)**

එම තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයාගේ ස්වරූපාර්ථය ඇතුලත් කොට ගනු ලැබේද, ප්‍රවෘත්ති කාලයෙහි කියන ලද බැවින් ඇතුලත් නොකොට ස්වරූප ගනු ලැබේද යත්, ප්‍රවෘත්ති කාලයෙහි චිත්තයාගේ භංගක්ෂණයෙහි යයි ආ තැන ප්‍රතිසන්ධි චිත්තයාගේ ද භංගක්ෂණය ගන්නා බව දත යුතුය. එසේ ප්‍රවෘත්තියෙහි උත්පාදක්ෂණයෙහි යයි ආ තැන චුති චිත්තයාගේද උත්පාදක්ෂණය ගතයුතුය. මාර්ග විප්‍රයුක්ත චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි යයි කී තැන්හිද මේ නය ක්‍රමය ගත යුතු. "පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙත්ති ආගතට්ඨානෙ පටිසන්ධි චිත්තස්සපි භංගක්ඛණස්ස ගහණං දට්ඨබ්බං, තථා පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙති ආගතට්ඨානෙ චුති චිත්තස්සපි උප්පාදක්ඛණස්ස" **(එම සච්ච යමක ටීකා)**

පුද්ගලෝකාශ වාරයෙහි කවර නම් භූමි නියමයක් වේ ද යත්, "සබ්බෙසං උපපජ්ජන්තානං පවත්තෙ තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ"– යනු ඔවුන්ගේ එහි උත්පත්තික්ෂණයෙහි ද තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තෝත්පත්තික්ෂණයෙහි දූයි. මෙසේ ක්ෂණ වශයෙන් මෙහි ඕකාශය දතයුතුය. මෙබඳු අන්තැන්හිද මේ නය ක්‍රමයයි. "සබ්බෙසං උපපජ්ජන්තානං පවත්තෙ තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථාති තෙසං තස්මිං උප්පත්තික්ඛණෙ ච තණ්හාවිප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණෙ වාති එවමෙත්ථ ඛණවසෙන ඕකාසො වෙදිතබ්බො, අඤ්ඤෙසුපි ඒවරූපෙසු එසේව නයෝ" **(අට්ඨකථා)**

ඔවුන්ට එහි උත්පත්ති ක්ෂණයෙහි ද තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයාගේ උත්පත්තික්ෂණයෙහිදූයි මෙසේ මෙහි ක්ෂණවශයෙන් ඕකාශය දතයුතුයයි කියන ලදී. එසේ ඇති කල්හි "යස්ස යත්ථ දුක්ඛසච්චං උප්පජ්ජති, තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජිස්සති යන මේ පදයාගේ විස්සර්ජනයේදී පශ්චිම කොටසෙහි "ඉතරේසං චතුවොකාරංපඤ්චවොකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථදුක්ඛසච්චඤ්ච උප්පජ්ජති, සමුදය සච්චඤ්ච උප්පජ්ජිස්සති" යන මෙය නොගැලපේ. උත්පත්තික්ෂණයෙහි හා චිත්තුත්පත්තික්ෂණයෙහි ද සමුදය සත්‍ය නොම උපදින්නේ වේ. එසේ හෙයින් උත්පත්තික්ෂණ – තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තුත්පත්තික්ෂණ සමංගී පුද්ගලයන්ට යම් කාමාවචරාදි ඕකාශ භූමියෙක දී ඒ උප්පත්ති චිත්ත ප්‍රවෘත්ති පවත්හි ද, එහි ඔවුන්ගේ ඕකාශ වශයෙන්ම මෙහි "තත්ථ" ශබ්දයාගේ අර්ථය ගැලපේ. එය පුද්ගලෝකාශ වාරය මැයි.

''තෙසං තස්මිං උප්පත්තික්ඛණෙ ච තණ්හාවිප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණේ චාති එවමෙත්ථ ඛණවසේන ඕකාසො වෙදිතබ්බොති වුත්තං, ඒවඤ්ච සති යස්ස යත්ථ දුක්ඛ සච්චං උප්පජ්ජති, තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජිස්සතීති එතස්ස විස්සජ්ජනෙ පච්ඡිම කොට්ඨාසෙ ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ දුක්ඛසච්චඤ්ච උප්පජ්ජති සමුදය සච්චඤ්ච උප්පජ්ජිස්සතීති ඉදං න යුජ්ජෙය්‍ය, නහි උප්පත්තික්ඛණෙ චිත්තුප්පත්තික්ඛණෙ ච සමුදය සච්චං උප්පජ්ජිස්සතීති තස්මා උප්පත්තික්ඛණෙ තණ්හා විප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණ සමංගීනං පුග්ගලානං යස්මිං කාමාවචරාදී ඕකාසෙ සා උප්පත්ති චිත්තුප්පත්ති ච පවත්තමානා, තත්ථ තෙසන්ති ඕකාස වසෙනෙවෙත්ථ තත්ථ සද්දස්ස අත්ථො යුජ්ජති පුග්ගලෝකාස වාරෝ හෙස'' **(ටීකා)**

ප්‍රත්‍යනිකයෙහි ප්‍රවෘත්ති කාලයෙහි සුදුසු පරිදි උපදින චිත්තයන්ගේ භංගක්ෂණයෙහි කර්මජරූප උපදනා බැවින් දුක්ඛසත්‍ය උපදින කෙණෙහි දුක්ඛසච්චඤ්ච නුප්පජ්ජති යයි කුමක් හෙයින් වදරණ ලද්දේ ද යත්, ''සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණේ අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණේ තෙසං සමුදය සච්චඤ්ච නුප්පජ්ජති'' යන මෙහි වනාහි ''පවත්තෙ චිත්තස්ස භංගක්ඛණේ දුක්ඛ සච්චං නුප්පජ්ජති'' කී තැන චිත්තජ රූපම අදහස් කරන ලදී. චිත්ත ප්‍රතිබද්ධ පැවැත්ම ඇති බැවිනි. කර්මජාදි රූප නොවෙති. කර්මජ රූප චිත්තය ගැන නොබලා උපදනා බැවිනි යයි කෙනෙක් කියති. ''යස්ස වා පන සමුදය සච්චං නුප්පජ්ජති'' යන මේ සන්නිට්ඨානයෙන් වනාහි ගන්නා ලද පුද්ගලයා සිත ගැන නොබලා ගන්නා ලදී. මේබඳු ආකාර ඇති යම් කිසිවෙක්ම ගනු ලැබේ. එහෙයින් ''තස්ස දුක්ඛසච්චං නුප්පජ්ජති'' යන මෙයින් චිත්තය අපේක්ෂා නොකරන දුක්ඛ සත්‍යය කියන ලද්දේ වේ. තවද චිත්තයාගේ භංගක්ෂණයෙහි ''දුක්ඛ සච්චං නුප්පජ්ජති'' යන මේ අර්ථය හැඟේ. යමකයෙහි වනාහි බෙදිය යුතුවූ නොබෙදෙන ලද පුච්ඡාවක් නම් නොමැත.

''සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණේ අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණේ තෙසං සමුදය සච්චඤ්ච නුප්පජ්ජති, දුක්ඛසච්චඤ්ච නුප්පජ්ජතීති එත්ථ පන පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ දුක්ඛසච්චං නුප්පජ්ජතීති චිත්තපටිබද්ධ වුත්තිතා චිත්තජරූපමේව ඉධාධිප්පෙතං, න කම්මජාදි රූපං චිත්තං අනපෙක්ඛිත්වාව උප්පජ්ජනතොති කෙචි වදන්ති යස්ස වා පන සමුදයසච්චං නුප්පජ්ජතීති ඒතෙන පන සන්නිට්ඨානේන ගහිතො පුග්ගලො න චිත්තං අපෙක්ඛිත්වාව ගහිතො. අථ ඛො යෝ කොචි ඒවං පකාරො, තස්මා තස්ස දුක්ඛසච්චං නුප්පජ්ජතීති එතේන ච නචිත්තා පෙක්ඛමේව දුක්ඛසච්චං වුත්තං අථ ඛෝ යංකිඤ්චිති චිත්තස්ස භංගක්ඛණේ යංකිඤ්චි දුක්ඛසච්චං නුප්පජ්ජතීති අයමත්ථො විඤ්ඤායතීති, නහි යමකෙ විභජිතබ්බෙ අවිභත්තා පුච්ඡා නාම අත්ථි.'' **(සච්ච යමක ටීකා)**

අනුටීකාචාර්‍ය්‍ය පාදයෝ වනාහි කේචිත් වාදය නොගැළපේයයි කීහ. එසේ වෙතොත් භංගක්ෂණයෙහි උපදින තිජරූපයෝ ඇතුලත් නොකරනු ලැබෙත් ද, භංගක්ෂණයෙහි උපදින තිජරූපයන් අනුලෝමයෙහි ඇතුලත් කොට ස්වරූප ඉදිරිය යුතුයයි කීහ. නොහොත් ඇතුලත් කිරීම සුදුසු වෙයි. කවර හෙයින් ද යත්, ඒ වනාහි යමකයෙහි ප්‍රකෘතියයි. එනම් යථා ලාභ වශයෙන් අර්ථයෙදීමයි කියා වර්ණනා කළහ. ''සෝ හි යමකස්ස පකති, යදිදං යථාලාභ වසෙන යෝජනා.''

ස්කන්ධවිභංග අනුටීකාවෙහි ද ''යස්ස වා පන සමුදය සච්චං නිරුජ්ඣති, තස්ස දුක්ඛසච්චං උප්පජ්ජතීති නො.'' යයි කියන ලද තැන්හි ''අරූප ලෝකය සඳහා චිත්තසමුට්ඨාන රූපය ද නැත්දැයි කිව හැකිය. මේ වනාහි යමක දේශනාවේ ප්‍රකෘතියයි. එනම් ලැබෙන පරිදි අර්ථ යෝජනාවයි. මෙයිනුත් චිත්තසමුට්ඨාන රූපමයයි කියන ලද්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පච්චාසත්ති නය ක්‍රමයට අනුව යම් සමුදය සත්‍යයක් නිරුද්ධ වේද, එයින් යම් දුක්ඛසත්‍යයක් උපදවිය යුතු වේ නම්, චිත්තචෛතසික ප්‍රතිබද්ධ වූ රූප සංඛ්‍යාත ඒ දුක්ඛ සත්‍යයාගේ එකල්හි උත්පත්තියක් නැති බැවින් ''නො'' යයි විසඳීම වේ. යයි අර්ථ කියන ලද්දේ වේ.

අතීතවාර පුද්ගලෝකාශයෙහි දුතියෙ චිත්තෙ - යන්නෙහි කවර නම් සිතක් ගනු ලැබේද යත්, ''සුද්ධාවාසානං දුතියේ චිත්තේ වත්තමානෙ - යනු අන්තිම පරිච්ඡේදයෙන් යමකුට යම් තැනක දුක්ඛසත්‍යයක් උපන්නේ වේද, සමුදය සත්‍යය නූපන්නේ වේද, එය දක්වීම් වශයෙන් කියන ලදී. එය දක්වූ කල්හි වනාහි එයට සමාන ගතික බැවින් දෙවැනි අකුශල චිත්තයාගේ පටන් පූර්ව වූ සියලු චිත්ත-යෙන් සමන්නාගත වූවාහු එයින්ම දක්වන ලද්දාහු වෙති. ''සුද්ධාවාසානං දුතියේ චිත්තේ වත්තමානෙති ඉදං සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන, යස්ස යත්ථ දුක්ඛසච්චං උප්පජ්ජිත්ථ, නො ච සමුදය සච්චං, තං දස්සන වසෙන වුත්තං, තස්මිං පන දස්සිතෙ තේන සමානගතිකත්තා දුතියා කුසලචිත්තතො පුරිම සබ්බචිත්තසමංගිනො නෙනෙව දස්සිතා හොන්ති.'' **(සච්ච යමක ටීකා)**

දුතියේ චිත්තෙ වත්තමානෙ යනු ප්‍රතිසන්ධියෙන් දෙවැනි වූ භවංග චිත්තය පවත්නා කල්හිය. ප්‍රතිසන්ධිය සමග භවංග සිත විපාක වශයෙන් එකක් කොට ගෙන භවනිකන්තික ජවනයට පූර්ව වූ ආවර්ජනා සිත පවත්නා කල්හිය. එය වනාහි ක්‍රියා චිත්තයක් බැවින් අව්‍යාකෘත ජාතියෙහි විපාක චිත්තයට දෙවැනි වූයේ නම් වෙයි. ''දුතියේ චිත්තෙ වත්තමානේති පටිසන්ධිතො දුතියේ භවංගචිත්තෙ වත්තමානෙ, සහ වා පටිසන්ධියා භවංගං විපාක වසෙන එකමෙව කත්වා භවනි-කන්තියා ආවජ්ජන චිත්තෙ, තඤ්හි ක්‍රියා චිත්තත්තා අබ්‍යාකත ජාතියං විපාකතො දුතියං නාම හොති'' **(ධම්ම යමක අට්ඨකථා)**

මාර්ගසත්‍ය මූලියෙහි, සුද්ධාවාසානං දුතියේ චිත්තෙ වත්තමානෙ යයි කුමක් හෙයින් වදාරණ ලද්දේද, තමන් ඉපද සිටින භූමියෙහි ආර්‍ය්‍යසත්‍ය සතර ප්‍රතිවෙධ කිරීමට අසමත් බව අනභිසමෙතාවීනං යන පාඨයෙන් දැනගත හැකි නොවේද, අනභිසමෙතාවීනං යන්නෙන් සැම තන්හි ගන්නා ලද්ද වූ යමෙක් වේ නම් ඔවුහු එහිද අනභිසමෙතාවී වෙති. ''ඔවුනතුරෙන් සුද්ධාවාසකයන්ගේ ගතයුතු කාලය වෙන්කොට දක්වීම පිණිස සුද්ධාවාසානං දුතියේ චිත්තෙ වත්තමානෙ - යයි කියන ලදී. ''අනභිසමෙතාවීනන්ති ගහිතා යෙ සබ්බත්ථ තත්ථව අනභිසමෙතාවිනො, තේසු සුද්ධාවාසානං ගහණ කාල විසේසනත්ථං සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙන්ති වුත්තං'' **(සච්ච යමක ටීකා)**

''යස්ස චිත්තස්ස අනන්තරා අග්ග මග්ගං පටිලභිස්සන්ති''- යන පාඨයෙන් වෝදන චිත්තයාගේ ක්ෂණත්‍රය සමංගී පුද්ගලයා පමණක් ස්වරූප වශයෙන් නොගෙන අන්තිම වූ තෘෂ්ණා සම්ප්‍රයුක්ත සත්වෙනි ජවනය තෙක් ඇත්තා වූ චිත්තයන්ගේ ක්ෂණත්‍රය සමංගී වූ පුද්ගලයන් ස්වරූප වශයෙන් ගත්තේ කුමක් හෙයින් ද, ඒ පුද්ගලයන් ගේ චිත්තය අරහත් මාර්ගයට අනන්තර වන්නේ නැත්තේ නොවේද, ''යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිභිස්සන්ති'' යන මෙයින් වෝදන චිත්ත සමංගී පුද්ගලයා හා සමාන ගතිකයෝ ගනු ලැබෙති. එයට පූර්ව වූ අන්තිම තෘෂ්ණා සම්ප්‍රයුක්ත චිත්ත සමංගී පුද්ගලයා දක්වා සිටින පූර්වානන්තර චිත්ත සමංගී පුද්ගලයෝ ද ගනු ලැබෙති. සෙසු මෙබඳු තැන්හිද මේ ක්‍රමය දතයුතුය.''

''යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්තීති එතේන වොදාන චිත්ත සමංගිනා සමාන ගතිකා, තතො පුරිමතර චිත්තසමංගිනොපි යාව සබ්බන්තිම තණ්හාසම්පයුත්ත චිත්ත සමංගී තාව දස්සිතා ති වෙදිතබ්බා එසනයො අඤ්ඤෙසු එවරූපේසු '' **(සච්ච යමක ටීකා)** මේ පාඨයෙහි සමානගතිකා යන පාඨය හේතු මන්ත විශේෂණය බව සලකා සමානගතිකත්තා යයි හේතු අර්ථය දතයුතු.

යස්ස දුක්ඛසච්චං න නිරුජ්ඣති, තස්ස සමුදය සච්චං න නිරුජ්ඣිස්සති යන මේ පදයාගේ විස්සර්ජනයෙහි කොටස් දෙක්හිම අරූපෙ මග්ගස්සච ඵලස්ස ච භංගක්ඛණෙ - යයි ම කියන ලදී. විශේෂිත නොකරන ලදී. කුමක් හෙයින් ද යත් ඒක්කෙනකු ගේද මාර්ගයාගේ හා ඵලයාගේ භංගක්ෂණ සමංගී තෙමේ දෙකොටස ම භාජනය කරන බැවිනි. යස්ස දුක්ඛසච්චං න නිරුජ්ඣති - යන - සන්නිට්ඨානයෙන් ගන්නා ලද අරූප භූමියෙහි මාර්ගඵල සමංගීන් අතුරෙන් ලෝකෝත්තර ඵල තුනෙකගේ ද මාර්ග දෙකකගේ ද භංගක්ෂණ සමංගී ඇතැමකු අතුරෙන් අතරක් නැර නූපදවා අතරතුර විපස්සනා නිකන්තිය හා භවනිකන්තිය උපදවා යමෙක් මතු මාර්ගය උපදවත් ද, ඔවුන්ට මතු සමුදය සත්‍යය නිරුද්ධ වන්නේය. ඔවුන් අතුරෙන්ම ඇතැම් කෙනෙක් අතරතුර තණ්හාව නූපදවාම උඩමාර්ග උපදවන්නා වූ මාර්ගඵල භංගක්ෂණ සමංගීන් හට සමුදය සත්‍යය නිරුද්ධ නොවන්නේ යයි පොදුවේ කීමෙන් ද පූර්වකොට්ඨාශය කියනු ලබන කල්හි පච්ඡිම කොට්ඨාශය කියයුතු දේ අතහැර ගැනීම වේ යයි මේ නය ක්‍රමය දක්වන්නේය.

''යස්ස දුක්ඛසච්චං න නිරුජ්ඣති, තස්ස සමුදය සච්චං න නිරුජ්ඣිස්සතීති ඒතස්ස විස්සජ්ජනෙ ද්විසුපි කොට්ඨාසේසු අරූපෙ මග්ගස්ස චඵලස්සච භංගක්ඛණෙ ඉච්චෙව වුත්තං, නවිසේසිතං තස්මාඑකස්සාපි මග්ගස්සචඵලස්ස භංගක්ඛණ සමංගිනො උභය කොට්ඨාස භජනතො, යස්ස දුක්ඛ සච්චං න නිරුජ්ඣතීති ඒතෙන සන්නිට්ඨානේන ගහිතේසු හි අරූපෙ මග්ගඵල භංගක්ඛණසමංගිසු කෙසඤ්චි තිණ්ණං ඵලානං ද්වින්නඤ්ච මග්ගානං භංගක්ඛණ සමංගීනං නිරන්තරං අනුප්පාදෙත්වා අන්තරන්තරා විපස්සනානිකන්තිං භවනිකන්තිඤ්ච උප්පාදෙත්වා යෙ උපරිමග්ගෙ උප්පාදෙස්සන්ති, තෙසං සමුදයසච්චං නිරුජ්ඣිස්සති, තෙසං යෙව පන කෙසඤ්චි අන්තරා ඤාණං උප්පාදෙත්වා උපරිමග්ගං උප්පාදෙන්තානං මග්ගඵල භංගක්ඛණ සමංගීනං සමුදය සච්චං න නිරුජ්ඣි ස්සතීති සාමඤ්ඤ වචනාපි ච පුරිමකොට්ඨාසෙ වුච්චමානේන පච්ඡිම කොට්ඨාසේ වක්ඛමානෙ වජ්ජෙත්වා ච ගහණං හොතීති දස්සිතොයං නයොති.'' **(සච්ච යමක ටීකා)**

ප්‍රවෘත්ති වාරය නිමි

---

## පරිඤ්ඤා වාරය

කුමක් හෙයින් වනාහි පරිඤ්ඤාවාරයෙහි නිරෝධ සත්‍යමාර්ග සත්‍යයන් නොවදාරණ ලදද යත්, යම් හෙයකින් වනාහි ලෝකෝත්තර ධර්මයන්හි පරිඥා කෘත්‍යයක් නැත්තේ ද, එහෙයින් මෙහි සත්‍ය දෙකක් පමණක් ගන්නා ලදහ. ''යස්මා ච ලොකුත්තර ධම්මෙසු පරිඤ්ඤානාම නත්ථි, තස්මා ඉධ ද්වෙසච්චානි ගහිතානි' **(අට්ඨ කථා)**

දුක්ඛ සච්චං පරිජානාති, යයි කී තැන පරිඥ තුන අතුරෙන් කවර නම් පරිඥාවෙක් ගනු ලැබේද, දුක්ඛ සත්‍ය පිරිසිඳ දැන ගනී කී තැන ඤාතපරිඥ තීරණපරිඥා වශයෙන් කියන ලදී. ''දුක්ඛ සච්චං පරිජානාතීති ඤාත තීරණ පරිඤ්ඤා වසේන වුත්තං.' **(එම අට්ඨ කථා)**

සමුදය සච්චං පජහති යයි කී - තැන ද පරිඥ තුන අතුරෙන් කවර පරිඥවෙක් ගනු ලැබේ ද, ඤාත පරිඥ පහාණ පරිඥ වශයෙන් ගනු ලැබේ. ''සමුදය සච්චං පජහතීති ඤාත පහාන පරිඤ්ඤා වසේන'' **(එම අට්ඨකථා)**

කුමක් හෙයින් වනාහි දුක්ඛසත්‍යයෙහි පහාණ පරිඥව නොලැබේද, සමුදය සත්‍යයෙහි ද තීරණ පරිඥව නොලැබෙන්නේ කුමක් නිසා ද, දුක්ඛයාගේ පිරිසිඳ අවබෝධයත්, සමුදයාගේ ප්‍රහාණය කිරීමත් පිණිස බුදුසස්නේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව වසනු ලැබෙයි යි ආර්‍ය්‍ය සත්‍ය දේශනාවෙහි පිරිසිඳ දැනගැනීම හා ප්‍රහාණය කිරීම දැක්වීම පිණිස දුක්ඛයෙහි තීරණ පරිඥවම කියන ලදී. ප්‍රහාණ පරිඥාව නොකියන ලදී. සමුදයෙහි ද පහාණ පරිඥව කියන ලදී. තීරණ පරිඥව නොකියන ලදී.

''දුක්ඛස්ස පරික්ඛෙයත්ථං සමුදයස්සච පහාණත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති පරිඤ්ඤාපහානං සච්චෙසු දස්සෙතුං දුක්ඛෙ තීරණ පරිඤ්ඤාව වුත්තා, න පහාන පරිඤ්ඤා සමුදයෙ ච පහාන පරිඤ්ඤා, න තීරණ පරිඤ්ඤා'' **(සච්ච යමක ටීකා)**

ඤාතපරිඤ්ඤාව වනාහි සත්‍ය දෙකෙහිම කුමක් හෙයින් ලැබෙන්නේ ද යත්, මාර්ගඥානය වනාහි දුක්ඛය හා සමුදය සත්‍යයන් විභාවනය කෙරේනුයි ප්‍රකට කෙරේනුයි ඤාතපරිඥාවද වෙයි, ''මග්ග ඤාණඤ්හි දුක්ඛ සමුදයානි විභාවෙතීති ඤාතපරිඤ්ඤා ච හොති'' **(සච්ච යමක ටීකා)**

සත්‍ය යමක ගණ්ඨි පද නිමි

---

# සංඛාර යමක ගණ්ඨි

## පණ්ණත්ති වාරය

සංඛාර යමකයෙහි වනාහි යට කී යමකයන්හි මෙන් පද ශෝධන වාර ආදිය නොවදරා ''අස්සාස-පස්සාසා කාය සංඛාරො'' යනාදි ස්වරූප විභාග වාරය කුමක් හෙයින් වදරණ ලදද යත්, ස්කන්ධාදිය මෙන් කායසංස්කාරාදිය පෙර නොබෙදන ලද බැවින් නොදන්නා ලද බැවින් ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය සංස්කාරයෝයයි යනාදි වශයෙන් සංස්කාර තුනක් බෙද දක්වත්. ''ඛන්ධාදයො විය පුබ්බෙ අවිභත්තා කාය සංඛාරාදයොති තෙසං අවිඤ්ඤාතත්තා අස්සාස පස්සාසා කාය සංඛාරොති ආදිනා තයො සංඛාරෙ විභජන්ති.'' **(සංඛාර යමක ටීකා)**

කුමක් හෙයින් වනාහි කායසංස්කාර නම් වේද යත්, සකස්කරනු ලැබෙනුයි සංස්කාර නම්. කායයාගේ සකස්කිරීම කායසංස්කාර නම වේ. ''සංඛරීයතීති සංඛාරො කායස්ස සංඛාරෝ කායසංඛාරො'' **(අට්ඨ කථා)**

කුමක් හෙයින් වනාහි වචීසංස්කාර නම් වේද යත්. සකස්කෙරේනුයි සංස්කාර නම්. වචනය පිළිබඳ සකස්කිරීම වචීසංස්කාර නම් වේ. ''සංඛරොතීති සංඛාරො වචියා සංඛාරො වචීසංඛාරො'' **(එම අට්ඨකථා)**

කුමක් හෙයින් වනාහි චිත්තසංස්කාර නම් වේද යත්, සකස්කරනු ලැබෙනුයි සංස්කාර නම්. චිත්තය පිළිබඳ සකස්කිරීම චිත්තසංස්කාර නම් වේ. ''සංඛරීයතීති සංඛාරො, චිත්තස්ස සංඛාරො චිත්තසංඛාරො, **(එම අට්ඨකථා)** චිත්තස්ස - චිත්ත යාගේ, සංඛාරො සංස්කාරක තෙමේ, යනුවෙන් අර්ථ කිවයුතු.

එසේ වී නම්, කරණාර්ථයෙහි සාමි වචනයයි කොට චිත්තස්ස සංඛාරො චිත්ත සංඛාරො යයි කියන ලද අට්ඨකථාව හා විරුද්ධ නොවන්නේ ද, චිත්තස්ස සංඛාරො යනු ද කර්තෘ අර්ථයෙහිමය. එය වනාහි කරණවචනයාගේ අර්ථයයි කොට කරණාර්ථ යෙහි සාමි වචනය වශයෙන් කියන ලදී. ''චිත්තස්ස සංඛාරොති ච කත්තු අත්ථෙ-යේව, සො පන කරණවචනස්ස අත්ථොති කත්වා කරණත්ථෙ සාමිවචනං කත්වාති වුත්තං **(ටීකා)**.

කරජකාය යනු කුමක් මෙන් ද යත්, ක, නම ශරීරයෙහි රජස්නුයි කරජ නම්. ඒ කිමෙක් ද, ශුක්‍ර ශ්‍රෝණිතයි. කරජයෙහි පැවති කය කරජකාය නම්, ''කෙ සරීරෙ රජෝති කරජෝ, කින්තං, සුක්ක සෝණිතං, කරජෙ පවත්තො කායො කරජ කායො,'' (**එක්කබර කොස ටීකා**). කරෝති යි යේයි පුත්‍රයන් උපදවානුයි කර නම්. ශුක්‍ර සෝණිතයි. කරයෙන් හටගත්තේනුයි කරජ නම්. කරජ වූයේ ද කය වූයේ ද ඒමනුයි කරජකාය නම්වේ. ''කරොති පුත්තෙ නිබ්බත්තෙ තීති කරො, සුක්ක සෝණිතං කරෙණ ජාතෝ කරජෝ කරජෝ ච සො කායො චාති කරජකායො'' (**මණිදීප ටීකා**)

නාසිකාවෙන් පිටවෙන වාතය ආශ්වාස යයි ද ඇතුල්වන වාතය ප්‍රශ්වාස යයි ගනු ලැබේද, ඇතුල්වන වාතය ආශ්වාස යයි ද, පිටවන වාතය ප්‍රශ්වාස යයි ගනු ලැබේද යත්, ආශ්වාසය යනු පිටවන වාතය ය ප්‍රශ්වාසය යනු ඇතුල්වන වාතයය. ''අස්සා සොති බහිනික්ඛමන වාතො, පස්සාසොති අන්තො පවිසනවාතො'' (**පාරාජිකා අට්ඨකථා**) ආශ්වාස යනු. ඇතුල්වන වාතයය, ප්‍රශ්වාස යනු පිටවන වාතයය. 'අස්සා සෝති අන්තො පවිසන නාසිකා වාතො, පස්සා සොති බහිනික්ඛමන නාසිකා වාතො'' (**දීඝනිකායට්ඨකථා, සම්මොහ විනෝදනි, විසුද්ධි මග්ග**)

එසේ වී නම් වෙනත් අට්ඨකථා අර්ථ විමර්ශනය කළයුතු වේ. කවර අදහස පිළිගත යුතු වේද, මෙහි දී වනාහි ''අස්සාසාදිමජ්ඣ පරියොසානං සතියා අනුගච්ඡතො අජ්ඣත්තං, වික්ඛෙප ගතේන චිත්තේන, කායෝපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතාච-පස්සාසාදි මජ්ඣපරියොසානං සතියා අනුගච්ඡතො බහිද්ධා-වික්ඛෙප ගතේන චිත්තෙන, කායො පි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතා ච'' යන මේ ගාථාවන්ට අනුව සූත්‍රාන්ත නය ක්‍රමයමම සන්සන්දනය වේනුයි ගත යුතුය. (**විමති විනෝදනී - සාරත්ථ දීපනී නය ක්‍රමයද මීට සමානය.**)

එසේ වී නම් **විනයට්ඨකථාවෙහි** අස්සාස පස්සාසයන් කෙසේ විග්‍රහ කොට දක්වත් ද, සූත්‍රාන්ත අට්ඨකථා වන්හි විග්‍රහ කරන්නේ කෙසේද, ආ - සේයි ප්‍රථම යෙන් පිටකරන වාතය ආශ්වාසයයි, ඉන්පසු ඇතුලට ගන්න වාතය ප්‍රශ්වාසයයි විනයට්ඨකථා වෙහි කීහ. **සූත්‍රාන්ත** අට්ඨකථාවන්හි වනාහි ඇද ගැනීම් වශයෙන් ඇතුලට ගන්න වාතය ආශ්වාසය, නැවත පිට කරන වාතය ප්‍රශ්වාසයයි කියන ලදී. ''ආ පඨමං බහි මුඛං සසනං අස්සාසො, තතො අන්තොමුඛං පටිසසනං පස්සාසොති බහිනික්ඛමන වාතොති ආදි. සුත්තන්ත අට්ඨකථාසු පන ආකඩ්ඪන වසෙන අන්තො සසනං අස්සාසො, බහි පටිසසනං පස්සාසොති කත්වා උප්පත්ති පාළියං වුත්තං'' (**විමති විනෝදනී**) සස - ජීවනෙ, යනු ධාතුයි. (**සද්දනීති**)

මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ කවර පුද්ගලයන් හට නැත්තාහු ද, මොවුහු මව්කුස තුල වෙසෙන අයට නැත. දියෙහි යට කිමිදෙන අයට ද නැත. එසේම විසංඥ වූවන්ට, මළවුන්ට, චතුර්ථධ්‍යාන සමාපන්නයන්ට රූප අරූප භවයන්හි උපනුන්ට හා නිරෝධ සමාපන්න යන්ට නොමැත. ''ඉමෙ අන්තො මාතු කුච්ඡියං නත්ථි, උදකේ නිමුග්ගානං නත්ථි, තථා අසඤ්ඤීභූතානං මතානං චතුත්ථජ්ඣානං සමාපන්නානං රූපා රූප-භව සමංගීනං නිරෝධසමාපන්නානන්ති'' (**විනයට්ඨ කථා**), (**විසුද්ධි මග්ගයෙහිද සමානය.**)

මේ පුද්ගලයන් සත් දෙනාට ආශ්වාස ප්‍රශ්වාස නොමැත්තේ කුමක් හෙයින් ද යත්, දියෙහි ගිලුන අයට ආශ්වාස කිරීමේ අවකාශය නොමැති බැවින් ආශ්වාස ප්‍රශ්වාස නොපවත්නා සේ මවුකුස තුළද නොපවතී. ආශ්වාස උපදවන සිතක් නැති බැවින් මළවුන්ට නොමැත්තා සේ විසංඥ වූවන්ට ද නොමැත. නිරෝධ සමාපන්න යන්ට ද එසේයයි ආචාර්‍ය ධම්මපාල හිමියෝ කියති. මහාගණ්ඨි පදයෙහි වනාහි, මූර්ඡා වූවන්ට සිත් පැවැත්ම දුර්වල බැවින් යයි කියන ලදී. චතුර්ථධ්‍යාන සමාපන්න-යන්ට ධර්මතා වශයෙන්ම නූපදී, රූප භව සමංගීන්ට ද එසේය. ඇතැමෙක් වනාහි අනුපිළිවෙළින් සියුම්බවට පැමිණීමෙන් චතුර්ථධ්‍යාන සමාපන්නයාට ද රූපභවයෙහි රූපයන්ගේ ද සියුම් බැවින් රූපභවසමංගීන්ට ද නැතැයි හේතු දක්වත්, '' යථා උදකෙ නිමුග්ගස්ස නිරෝධොකාසත්‍තාය අස්සාස පස්සාසා න පවත්තන්ති, එවං අන්තො මාතුකුච්ඡියං, යථා මතානං සමුට්ඨාපක චිත්තාභාවතො ඒවං අස ඤ්ඤී භූතානං, තථා නිරොධ සමාපන්නානන්ති ආචරිය ධම්මපාලත්ථෙරෙන වුත්තං, මහාගණ්ඨි පදෙ පන මුච්ඡාපරෙතානං චිත්තප්පවත්තියා දුබ්බලභාවතොති වුත්තං, චතුත්ථජ්ඣාන සමා-පන්නානං ධම්මතා වසෙනෙව නෙසං අනුප්පජ්ජනං, තථා රූපභව සමංගීනං, කෙචි පන අනුපුබ්බතො සුඛුමභාවප්පත්තියා චතුත්ථජ්ඣාන සමාපන්නස්ස රූපභවෙ රූපානං සුඛුමභාවතො රූපභව සමංගීනං නත්ථීති කාරණං වදන්ති. '' **(සාරත්ථ දීපනී)**

මවුකුසින් බිහිවන ළදරුවාට පළමුවෙන් හටගන්නේ ආශ්වාස ද ප්‍රශ්වාසය හටගන්නේ ද යත්, ගර්භසායී සියලු දෙනාටම මවුකුසින් නික්මෙන කාලයෙහි පළමු කොට අභ්‍යන්තර වාතය පිටත නික්මෙයි. පසුව බාහිර වාතය සියුම් දූහුවිල්ලත් ගෙන ඇතුලට පිවිසෙනුයේ තල්ලෙහි හැපී නිවීයයි.''සබ්බෙසම්පි ගබ්භසෙය්‍යකානං මාතුකුච්ඡිතො නික්ඛමන කාලෙ පඨමං අබ්භන්තර වාතො බහි නික්ඛමති, පච්ඡා බාහිරවාතො සුඛුමරජං ගහෙත්වා අබ්භන්තරං පවිසන්තො තාලුං ආහච්ච නිබ්බායති.'' **(විනයට්ඨ කථා)** තල්ලෙහි හැපී නිවීයයි යනු තල්ලෙහි හැපී නිරුද්ධවෙයි. එයින් වනාහි එකෙණෙහි උපන් ළදරුවා කිබිසීම කරයි. ''තාලුං ආහච්ච නිබ්බායතීති තාලුං ආහච්ච නිරුජ්ඣති, තේන කිර සම්පති ජාතො බාලකො ඛිපිතං කරෝති.'' **(සාරත්ථ දීපනී)**

මෙ ආශ්වාස ප්‍රශ්වාස දෙදෙනාගේ මුල මැද අග නියමය කෙසේ වේද, පිටත නික්මෙන වාතයාගේ මුල නාභියය, මැද හෘදයය, අග නාසිකාග්‍රය, ඇතුලට පිවිසෙන වාතයාගේ වනාහි මුල නාසිකාග්‍රයය, මැද හෘදයය, අග නාභියය, ''බහිනික්ඛමන වාතස්සහි නාභි ආදි, හදයං මජ්ඣං, නාසිකග්ගං පරියොසානං,

අබ්භන්තරං පවිසන වාතස්ස නාසිකග්ගං ආදි, හදයං මජ්ඣං, නාභි පරියොසානං **(විනියට්ඨ කථා)**

ප්‍රශ්වාස කරන පුද්ගලයාගේ ප්‍රශ්වාස වාතය වනාහි සිරුරෙන් පිටතට ගලායන්නේ නොවේද, කුමක් හෙයින් නාසිකග්ගං පරියොසානං - නාසිකාග්‍රය කෙළවරයයි කියන ලද්දේද යත්, පිටත ගිය ප්‍රශ්වාසය වනාහි ඍතුජ රූපපරම්පරාවකි. සියලුම චිත්තජරූප වනාහි සිරුරෙන් බැහැර නොලැබෙති. එනිසා මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ චිත්ත සමුට්ඨාන රූපම බැවින් බැහැර චිත්ත සමුට්ඨාන රූප නොමැති බැවිනුත් සාරත්ථ දීපනියෙහි මෙසේ කියා ඇත. "සරා හෙතෙ චිත්තසමුට්ඨානා දුතනා, න බහිද්ධා චිත්තසමුට්ඨානානං සමහවො අත්ථි.

ශරීරය අභ්‍යන්තරයෙන් හටගන්න ප්‍රශ්වාසය නාසිකාග්‍රය දක්වා පවත්නේ ද යත්, යම් යම් තැනක උපදිත් ද ඒ ඒ තැනම බිඳෙත්, රූප ධර්මයන්ගේ ගමන් කිරීමෙක් නැති බැවිනි. ප්‍රත්‍ය වූ පරිදි දේශාන්තරෝත්පත්තිය වනාහි ගමන නම් වූ ව්‍යවහාරයට පැමිණේ. "යත්ථ යත්ථ උප්පජ්ජන්ති, තත්ථ තත්ථෙව භිජ්ජන්ති, ධම්මානං සමීරණා භාවතො තථාපච්චයං පන දෙසන්ත රුප්පත්තියං ගතිසමඤ්ඤා" **(සාරත්ථ දීපනි)**

ආශ්වාස ප්‍රශ්වාස දෙක සිත නිසා හටගන්නා බැවින් චිත්තසංඛාරයයි කීමට සුදුසු නොවේද? කුමක් හෙයින් ඒවා කායසංස්කාරයයි කියනු ලැබෙත් ද යත්, ආශ්වාස ප්‍රශ්වාසයෝ යන මොවුහු කායිකයෝය , කය පිළිබඳ වූවෝය. ප්‍රතිසන්ධික්ෂණ යෙහි කර්මජ රූපයන් සිත හා එකට උපදනාක් මෙනි. "අස්සාස පස්සාසං කායිකා එතෙ ධම්මා කායපටිබද්ධා" **(සූත්‍රාන්ත පාළි)**

කුමක් හෙයින් විතර්ක විචාරයෝ වචීසංස්කාර නම් වෙත්ද, විශාඛයෙනි! පළමු කොට විතර්කනය විචාරණය කොට පසුව වචන කථාකරයි. එනිසා විතර්ක විචාරයෝ වචී සංස්කාර නම් වෙති. "පුබ්බෙ ඛො ආවුසො විසාඛ විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති. තස්මා විතක්ක විචාරා වචීසංඛාරො" **(සූත්‍රාන්තපාළි)**

විතර්ක විචාරයෝ ද සිත හා බැඳී උපදින සිතින් හටගත් ධර්ම වෙත් නම් කුමක් හෙයින් චිත්තසංඛාර යයි නොකියන ලද්දේද යත්, විතර්ක විචාරයන් වනාහි වචී සංස්කාර භාවයෙන් වෙනමම ගත් බැවින් විතර්ක විචාරයන් හැර යයි කියන ලදී." විතක්ක විචාරානං පන වචීසංඛාර භාවෙන විසුං ගහිතත්තා ඨපෙත්වා විතක්කවිචාරෙති වුත්තං" **(මෙ යමක අට්ඨකථා)** සාරත්ථදීපනී - විමති විනොදනි ටීකාහි ද මෙසේම "ගො බලිවද්ද පුඤ්ඤ ඤාණසම්භාරාදයො විය දට්ඨබ්බා' යයි කියා ඇත.

සඤ්ඤාව හා වේදනාව කුමක් හෙයින් වෙන්කොට වෙනමම ස්වරූප උදුරාදක්වන ලදද යත්, ඒ ඒ ස්කන්ධාදීන් අතුරෙන් වෙන් කොට ගන්නා ලද බැවින් හා ප්‍රකට බැවින් වෙනමම ස්වරූප උදුරන ලදී. "තත්ථ තත්ථ ඛන්ධාදීසු විසුං ගහිතත්තා පාකටත්තා ච" **(යමකට්ඨ කථා)** කුමක් හෙයින් වනාහි ස්කන්ධාදියෙහි වෙන්කොට කියන ලදද යත්,

වට්ට ධම්මෙසු අස්සාදං - තදස්සා දෙප සේවනං,
විනිභුජ්ජ නිදස්සෙතුං - ඛන්ධද්වය මුදහටං

විවාද මූල සංසාර - කාම හේතු නිදස්සනං,
සන්ධාය වේදනා සඤ්ඤා-කතා නානාති කේචන **(නාමරූප පරිච්ඡේද)**

ලෝක ධර්මයන්හි ආස්වාදය හා එම ආස්වාදය උපසේවනය බෙද දක්වීම පිණිස වේදනා සඤ්ඤා ස්කන්ධ දෙක කියන ලදී.

විවාද මූල හේතුව, සංසාර හේතුව, කාම හේතුව දක්වීම පිණිස වේදනා සඤ්ඤා දෙක වෙන්කරන ලද්දහයි ඇතැමෙක් කියති. ශුද්ධ සංස්කාර වාරයෙහි වනාහි, සුද්ධස්කන්ධ වාරාදියෙහි බෙදන ලද රූපං ඛන්ධො – ඛන්ධො රූපං, චක්ඛු ආයතනං ආයතනා චක්ඛු යනාදී නය ක්‍රමයෙන් යමක කියන ලද්දක් මෙන්, කායො සංඛාරො සංඛාරා කායො යනාදී වශයෙන් නොකියා කායසංඛාරො වචීසංඛාරො වචීසංඛාරො කායසංඛාරො යනාදි නය ක්‍රමයෙන් කායසංස්කාර මූලක දෙකක් හා වචීසංස්කාර මූලක එකක් දැයි අනුලෝම යෙහි තුනක් – ප්‍රතිලෝමයෙහි තුනක් යයි සුද්ධික වාරයෙහි සියලුම යමක සයක් කියන ලදහ. කුමක් හෙයින් ද යත්, හුදු එක එක පදය වශයෙන් අර්ථයක් නොමැති බැවිනි.

''සුද්ධසංඛාර වාරෙපන යථා සුද්ධ ඛන්ධවාරාදීසු රූපං ඛන්ධො, ඛන්ධාරූපං, චක්ඛු ආයතනං, ආයතනා චක්ඛූති ආදිනා නයෙන යමකානි වුත්තානි, එවං කායො සංඛාරො, සංඛාරා කායොති අවත්වා කායසංඛාරො වචීසංඛාරො වචීසංඛාරො කායසංඛාරොති ආදිනා නයෙන කායසංඛාර මූලකානි ද්වේ වචීසංඛාර මූලකානි එකන්ති අනුලොමෙ තීණි, පටිලොමෙ තිණීති සබ්බානිපි සුද්ධික වාරෙ ඡයමකානි වුත්තානි, කිං කාරණා, සුද්ධික එකෙකපද වසෙන අත්ථා භාවතොති.'' **(සංඛාරයමකවණ්ණනා)**

මේ සංඛාර යමකයෙහි සුද්ධසංස්කාර මූලචක්‍රවාරයක් කුමක් හෙයින් නොකියන ලද්දේදයත්, මේ සංඛාර යමකයෙහි වනාහි කායාදි පද සංඛාර පදයට සමානාධිකරණ නොවන බැවින් කායොසංඛාරො, සංඛාරා කායො, යනාදිය කියනුලබන කල්හි අදහස් කරන ලද අර්ථය අතහැරීමත්, අදහස් නොකළ අර්ථයක් ගැනීමත් වන්නේ යයි සලකා සුද්ධසංඛාර මූලචක්‍ර වාරය නොකියන ලදී. ''ඉධ පන සංඛාර යමකෙ කායාදිපදනං සංඛාරපදස්ස අසමානාධිකරණත්තා කායො සංඛාරො සංඛාරා කායොති ආදිමහි වුච්චමානෙ අධිප්පෙතත්ථ පරිච්චාගො අනධිප්පෙතත්ථ පරිග්ගහො ච තතො සියාති සුද්ධසංඛාරානං මූලචක්කවාරා න වුත්තා, **(මේ සංඛාර යමක ටීකා)**

එසේ වී නම් අට්ඨකථාවෙහි සුද්ධසංඛාරවාරෙ යයි කීමක් ඇත්තේ නොවේද, අට්ඨකථාවෙහි වනාහි සුද්ධසංඛාර ස්ථානයෙහි කියනලද බැවින් මේ නය ක්‍රමය සුද්ධසංඛාර වාරයයි කියා ඇත. ''අට්ඨකථායං පන සුද්ධසංඛාරවාරට්ඨානෙ වුත්තත්තා අයං නයො සුද්ධ සංඛාරවාරොති වුත්තො'' **(මේ සංඛාර යමක ටීකා)**

ප්‍රඥප්ති වාරය නිමි.

## ප්‍රවෘත්ති වාරය

ප්‍රවෘත්ති වාර කායසංඛාරමූල වචීසංස්කාර මූලි ප්‍රතිලෝම පූර්වභාගවහි ප්‍රථමධ්‍යානයට සමාපන්න වූ කාමාවචර පුද්ගලයා ආශ්වාස ප්‍රශ්වාසයෙන් තොරවත් සමවතට සමවැදීමට සමත් වේනුයි සන්නිට්ඨානයෙහි ප්‍රථම ධ්‍යානයට සමවන් කාමාවචර පුද්ගලයා දැයි ''වොවුන් තිලා'' නම් වූ සන්නය ආදියෙහි ස්වරූප වශයෙන් ගනු ලැබෙති. එසේ ස්වරූප ගැනීමද ''ආශ්වාස ප්‍රශ්වාසයන්ගෙන් තොරව විතර්ක විචාරයන්ගේ උත්පාදක්ෂණයෙහි'' යයි කියන ලද මෙයින් දක්වන ලද පුද්ගලයෝ ද ප්‍රථමධ්‍යානාවකාශය ද කාමාවචරාදි ඕකාශය ද විශේෂයෙන් ආශ්වාස ප්‍රශ්වාස තොරව ලැබෙන අවස්ථාව දතයුතුය. විනා අස්සාසපස්සාසෙහිවිතක්ක විචාරානං උප්පාදක්ඛණෙති ඒතේන පන දස්සිතා පුග්ගලා පඨමජ්ඣානොකාසා කාමාවචරාදි ඕකාසාච අස්සාසපස්සාස විරහවිසිට්ඨා දට්ඨබ්බා'' යනුවෙන් ටීකාචාර්‍ය්‍ය පාදයෝ ප්‍රථමධ්‍යානාවකාශයෙහි ද ආශ්වාස ප්‍රශ්වාස විරහිත බව විශේෂ කල බැවින් ස්වරූප වශයෙන් ගනු ලැබේ. එසේ ගැනීම සුදුසු නැත. කුමක් හෙයින් ද යත්, ආශ්වාස ප්‍රශ්වාස විරහිත බව විශේෂයෙන් කිම වනාහි කාමභූමි යෙහි ආශ්වාස ප්‍රශ්වාස රහිතව ප්‍රථම ධ්‍යානාවකාශ ඇති බැවින් විශේෂවත් නොකරන ලදී. රූපාවචර අරූපාවචර භූමියෙහි ප්‍රථමධ්‍යානාවකාශය ගනු කැමතිව විශේෂවත් කරන ලදී. එනිසා අනුටීකාචාර්‍ය්‍ය පාදයෝ, මෙහි පළමු කොට ප්‍රථමධ්‍යාන සමංගී රූපාවචර අරූපාවචරයන්ගේ ගැනීම යයි අර්ථ කීහ. ''පඨමඤ්චෙත්ථ පඨමජ්ඣානසමංගීනං රූපාවචරානං ගහණං'' **(අනු ටීකා)** මෙපමණක් ද නොවේ. **අනුටීකාවෙහි,** පඨමජ්ඣානං සමාපන්නානං යනු ධ්‍යානාවකාශ වශයෙන් පුද්ගලයා දක්වයි. කාමාවචරානං යනු භූම්‍යාවකාශ වශයෙනි. දෙයාකාර වූද ඔවුන්ගේ විශේෂත්වය දැක්වීම පිණිස ''අස්සාස පස්සාසානං උප්පාදක්ඛණේ'' යයි කීහ. එයින් රූප භූමියෙහි ප්‍රථමධ්‍යාන සමාපන්නකයන් ද කාමාවචරයෙහි ගර්භගතාදීන් ද නවත්වයි. කියා රූපාවචරයන්ම ටීකාචාර්‍ය්‍යයන් කියන බැවින් කාමභූමියෙහි ප්‍රථමධ්‍යාන ද්විතියධ්‍යාන තෘතියධ්‍යානයන්ට සමාපන්න වූ පුද්ගලයන්ට ආශ්වාස ප්‍රශ්වාස විරහිත බවක් නැතැයි ඒකාන්ත වශයෙන් දත යුතුය. ''පඨමජ්ඣානං සමාපන්නානන්ති ඣානොකාස වසෙන පුග්ගලං දස්සෙති, කාමාවචරානන්ති භූමොකාස වසෙන, ද්විප්පකාරානම්පි පන තෙසං විසේසනත්ථං ආහ අස්සාස පස්සාසානං උප්පාදක්ඛණේති, තෙන රූපාවචරෙ පඨමජ්ඣාන සමාපන්නකෙ කාමාවචරෙ ගබ්භගතාදිකෙ ච නිවත්තෙති,' **(අනුටීකා)**

පඨමජ්ඣානං සමාපන්නානං යන මෙහි කවර නම් ධ්‍යානය ගනු ලැබේ ද යත්, අවිතර්ක විචාරමාත්‍ර ද්විතිය ධ්‍යානය විචාර වශයෙන් ප්‍රථමධ්‍යානයට ඇතුලත් වේයයි දතයුතු. නියත වූ ද්විතියධ්‍යානය ගෙන සෙසු ධ්‍යානය අසංග්‍රහිතයයි හෝ දතයුතු, ''අවිතක්ක විචාරමත්තං දුතියජ්ඣානං විචාරවසෙන පඨමජ්ඣානෙ සංගහං ගච්ඡතීති දට්ඨබ්බං, මුඛ්‍යභූතං දුතියජ්ඣානං ගහෙත්වා ඉතරං අසංගහිතන්ති වා'' **(එම අනුටීකා)**

කුමක් හෙයින් ධ්‍යානය ඕකාස යයි කියන ලද්දේද. ඒ ධ්‍යානය පුද්ගලයාගේ ඇතුලත පිහිටන්නේ නොවේද, සංස්කාරයන්ට ද පුද්ගලයන්ට ද අවකාශ බැවින් ධ්‍යානය ද භූමිය ද වෙනම අවකාශ වශයෙන් ගන්නා ලදහ. ''සංඛාරානං පුග්ගලානඤ්ච ඔකාසත්තා ඣානං භූමි ච විසුං ඔකාසභාවෙන ගහිතා'' **(එම අනුටීකා)** පුද්ගලයා තුල නොපිහිටියේ නමුත් සංස්කාරයන් තුල පිහිටියේ යයි ඕකාශ නමින් කියන ලද බව දතයුතු.

අතීත ප්‍රත්‍යනික වචීසංඛාර මුලියෙහි ප්‍රතිසන්ධිචිත්තය සමග වචීසංඛාර පහළවිය නොහැකි බැවින් සුද්ධාවාසං උපපජ්ජන්තානං – යයි කිම නුසුදුසු ද, කුමක් හෙයින් සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ යි වදරා ඇත්තේ ද යත්, ඒකාන්තයෙන් ඔවුන්ට එහි ප්‍රතිසන්ධි චිත්තය පවත්නා කල්හි ද එය නූපන්නේ මය. යම්තාක් වනාහි අතරක් නැර විපාක චිත්තය පවත්නේ ද ඒතාක් නූපන්නේම යයි දක්වීමට මෙය කියන ලදි. ''කාමඤ්චෙතං පටිසන්ධි චිත්තෙපි වත්තමානෙ තෙසං තත්ථ නුප්පජ්ජිත්ථෙව, යාව පන අබ්බොකිණ්ණං විපාක චිත්තං වත්තති. තාව නුප්පජ්ජිත්ථෙව නාමාති දස්සනත්ථඤ්චෙතං වුත්තං'' **(යමකට්ඨ කථා)**

යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති – යන තැන රහතන් වහන්සේලා ගේ චුතිචිත්තය පමණක්ම කාමභූමියෙන් චුතව රූප අරූප භූමියට පැමිණ පිරිනිවීමට නියත වූ පුද්ගලයන්ගේ චුතිචිත්තය හා සමග රහතන් වහන්සේගේ චුතිචිත්තයම පශ්චිම චිත්තය නම් කියනු ලැබේ. ද යත්, ''ක්ෂීණාශ්‍රවයන්ගේ චුතිචිත්තයයි විශේෂකොට කියා ඇත. කාමාවචරයන්ගේ පශ්චිම චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි යම් චිත්තයකට අනතුරුව කාමාවචරයන්ගේ පශ්චිම චිත්තය උපදින්නේ ද, රූපාවචර අරූපාවචරයෙහි පශ්චිමභවිකයන්ට ද යමෙක් රූපාවචර අරූපාවචරයෙහි ඉපද පිරිනිවෙන්නා හු ද චුතවන්නා වූ ඔවුන්ට ද වචීසංඛාර නිරුද්ධ වන්නේය. ඔවුන්ට කාය සංස්කාර නිරුද්ධ නොවන්නේ යයි කී බැවින් වනාහි අන්‍යයන්ගේ ද චුතිචිත්තය රූප නූපදවන්නේ යයි හැහේ. රූප උපදවන්නාට ගර්භගමනාදී බාධාවක් නොමැති බැවින් කායසංස්කාර උපදවන්නෙක් නොමැත. චුත වූවහුට චිත්තසමුට්ඨාන රූප පවත්නේ යයි කීම ද යුතු නැත. චුති චිත්තය රූප උපදවන්නේ යයි පාලියෙහි ද නොමැති.''

''ඛීණාසවානං චුති චිත්තන්ති විසෙසෙත්වා වුත්තං, කාමාවචරානං පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සතීති රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං යෙව රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං වචීසංඛාරො නිරුජ්ඣිස්සති නො ච තෙසං කායසංඛාරො නිරුජ්ඣිස්සතීති පන වචනතො, අඤ්ඤෙසම්පි චුතිචිත්තං රූපං න සමුට්ඨාපෙතීති විඤ්ඤායති. නහි රූපසමුට්ඨාපකස්ස ගබ්භගමනාදී විනිබද්ධාභාවෙන කායසංඛාර සමුට්ඨාපකං අත්ථි නව යුත්තං චුතො ච චිත්ත සමුට්ඨානඤ්චස්ස පවත්තතීති, නාපි චුතිචිත්තං රූපං සමුට්ඨාපෙතීති පාළි අත්ථි'' **[ධම්ම සංගණී ටීකා චිත්තුප්පාද කාණ්ඩයෙනි.]**

''පශ්චිම චිත්තයැයි අවිශේෂයෙන් චුතිචිත්තය කියන ලදැයි යන අදහසින් අන්‍යයන්ගේ චුතිචිත්තය ද රූපනුපදවන්නේයි හැඟේයයි. කියන ලදී. තවද යමෙක් රූපාවචර අරූපාවචරයෙහි ඉපද පිරිනිවීමට නියත වූවාහු ද චුතවන ඔවුන්ගේ ද වචී සංඛාරය නිරුද්ධ වන්නේය. ඔවුන්ගේ කාය සංස්කාරය නිරුද්ධ නොවන්නේ යයි රූපාරූපභවයන්හි උපදිනවුන්ගේ කාමාවචර චුතිචිත්තය ඇත්තාගේද කායසංස්කාර හටගන්නා බව කීමෙන් ක්ෂීණාශ්‍රවයන්ගෙන් අන්‍යයන්ට ද - පෙ - හැඟේ යයි කියන ලදී. ''පච්ඡිම චිත්තන්ති අවිසෙසෙන චුතිචිත්තං වුත්තනන්ති. අධිප්පායෙන අඤ්ඤෙසම්පි චුතිචිත්තං - පෙ - විඤ්ඤායතීති වුත්තං අථ වා යේච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං වචීසංඛාරො නිරුජ්ඣිස්සති නො ච තෙසං කායසංඛාරො නිරුජ්ඣිස්සතීති. රූපාරූප භවූපපජ්ජනකානංකාමාවචර චුතිචිත්තස්සාපි කායසංඛාර සමුට්ඨාපන වචනේන ඛීණාසවෙහි අඤ්ඤෙසම්පි - පෙ -විඤ්ඤායතීති වුත්තං'' **(ධම්මසංගණි අනුටීකා)**

යම් හෙයකින් වනාහි, යමකුගේ කාය සංස්කාර නිරුද්ධ වෙයි. ඔහුගේ වචී සංස්කාර නිරුද්ධ වන්නේද , ආමන්තා - යයි ද. යමකුගේ කායසංස්කාර නිරුද්ධ වෙයි. ඔහුගේ චිත්තසංස්කාරය නිරුද්ධ වන්නේ ද, ආමන්තා යිද පශ්චිම චිත්තයාගේ භංගක්ෂණයෙහි ඔවුන්ගේ කායසංස්කාරය ද නිරුද්ධ නොවෙයි. චිත්තසංස්කාරය ද නිරුද්ධ නොවන්නේ යයි කියා ඇති බැවින් ද පශ්චිම චිත්තයට පෙර සොළොස්වැනි චිත්තය සමග හෝ ඊට මැත චිත්තය සමග හෝ ආශ්වාස ප්‍රශ්වාස නූපදීත් යැයි කීම සිද්ධය. ඉදින් උපදින්නාහු නම් පශ්චිම චිත්තයාගේ භංගක්ෂණයෙහි ඔවුන්ගේ කායසංස්කාර නිරුද්ධ නොවන්නේයයි නොකියන්නේය. එය කියන ලද්දේ මෙසේය. එහෙයින් යටත් පිරිසෙයින් චුතියට පූර්ව වූ සතළොස්වැනි චිත්තයා සමග උපන්නාවූ ආශ්වාස ප්‍රශ්වාසයෝ චුතියෙන් යට දෙවැනි චිත්තය සමග නිරුද්ධ වන්නාහ. එයින් යම් චිත්තයකට අනතුරුව කාමාවචරයන්ගේ පශ්චිම චිත්තය උපදින්නේ ද චුතිචිත්තයට අනන්තර ප්‍රත්‍ය වූ චිත්තයාගේ ද කායසංස්කාර හට ගන්වන සමත් බවෙක් කියන ලද්දේ වේ.

''යස්මාච යස්ස කායසංඛාරො නිරුජ්ඣති තස්ස වචීසංඛාරො නිරුජ්ඣිස්සතීති ආමන්තාති, යස්ස කායසංඛාරො නිරුජ්ඣති තස්ස චිත්තසංඛාරො නිරුජ්ඣිස්සතීති ආමන්තා තිච, පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේ තෙසං කායසංඛාරො ච න නිරුජ්ඣුති, චිත්තසංඛාරො ච න නිරුජ්ඣිස්සතීති ආදිවචනතො ච පච්ඡිම චිත්තස්ස පුරතො සොළසමෙන චිත්තේන තතො වරිමෙන වා සද්ධිං අස්සාස පස්සාසා න උප්පජ්ජන්තීති සිද්ධං, යදි උප්පජ්ජෙය්‍යුං පච්ඡිම චිත්තස්ස භංගක්ඛණේ තෙසං කායසංඛාරො න නිරුජ්ඣතීති න වදෙය්‍ය වුත්තංචෙතං තස්මා හෙට්ඨිම කොටියා චුතිතො පුරිමේන සත්තරසමේන උප්පන්නා අස්සාස පස්සාසා චුතියා හෙට්ඨා දුතියෙන චිත්තේන සද්ධිං නිරුජ්ජක්ඛන්ති, තෙන යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ජිම චිත්තං උප්පජ්ජිස්සතීති චුතිචිත්තස්ස අනන්තරා පච්චය භූතස්සාපි චිත්තස්ස කායසංඛාර සමුට්ඨාපනතා වුත්තා'' **(ධම්මාසංගණි අනුටීකා)**

තවද, යස්ස චිත්තස්ස යනු යම් චිත්තයකින් සියල්ලන්ට පසු කායසංස්කාර උපදිද , ඒ සිත කියන ලදැයි ගත යුතුයි. පශ්චිම චිත්තයට අනන්තර ප්‍රත්‍ය වූ සිත නොවේ. අනන්තරා යනු කායසංස්කාර උත්පාදන අන්තරය හැර යන තේරුමයි. යම් චිත්තයකින් පසුව කායසංස්කාර උත්පාදනයෙන් අනන්තරහිතව පශ්චිම චිත්තය උපදින්නේ ද ඒ සිතය යන අර්ථයයි. කුමක් හෙයින් වනාහි අන්‍යයන්ට වචී සංස්කාරය ද නිරුද්ධ වන්නේය. කායසංස්කාරය ද නිරුද්ධ වන්නේයයි කී බැවිනි. අන් පරිද්දකින් පශ්චිම චිත්තයෙන් පූර්ව තෘතිය චිත්ත සමංගීන්ගේ කායසංස්කාරය උපදියයි අර්ථ වැටෙන බැවිනි. ''අථවා යස්ස චිත්තස්සාති යෙන චිත්තේන සබ්බපච්ඡිමො කාය සංඛාරො උප්පජ්ජති තං චිත්තං වුත්තන්ති ගහෙතබ්බං, න පච්ඡිමචිත්තස්ස අනන්තරභූතං , අනන්තරාති හි කායසංඛාරුප්පාදනං අන්තරං විනා, යතො පච්ඡා කායසංඛාරුප්පාදනේන අනන්තරහිතං හුත්වා පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සතිති අත්ථො තස්මා ඉතරෙසං වචීසංඛාරො ච නිරුජ්ඣිස්සති, කායසංඛාරො ච නිරුජ්ඣිස්සතීති වුත්තත්තා අඤ්ඤථා පච්ඡිම චිත්තතො පුරිමතතිය චිත්තසමංගීනං කායසංඛාරො උපපජ්ජතීති ආපජ්ජතීති. **(එම ධම්මසංගණී අනුටීකා)**

අනුටීකාචාර්යයන් පාදයන් අර්ථදක්වූ පරිදි පූර්ව නය ක්‍රමයට අනුව ස්වරූප ගන්නේ නම් යේව රූපාවචරං අරූපාවචරං යන තැන විශේෂාර්ථයක් නොමැත. එසේ විශේෂාර්ථයෙක් නොමැති බැවින් කීමට අවශ්‍ය නැත්තේ නොවේද.'' ධර්මනානාත්වයක් නැති කල්හිද පද නානත්වයෙන් දූකන්තරය - දෙකක අතරක් කියනු ලැබේ. ධර්මයන්ගේ නොකියන ලද්ද අපේක්ෂා කොට දූකන්තර වචනයක් නැත්තේය එනිසා ඉහත කියන ලද්දට දෙසක් නැත්තේය.'' ධම්මනානත්තභාවෙපිහි පදනානත්තෙන දූකන්තරං වුච්චති. නහි ධම්මානං අවුත්තතා පෙක්ඛං දූකන්තර වචනන්ති නත්ථි දෙසො'' යන ද්වාරටීකා පාඨයෙන් මෙය තේරුම් ගත හැකිය.

වචීසංඛාර මූලයෙහි, යස්ස චිත්තස්ය අනන්තරා අවිතක්ක අවිචාරං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති තෙසං යන තැන්හි ජවන තදාරම්මණයෙන් පසු චුතවන්නා වූ පුද්ගලයා ස්වරූප වශයෙන් ගනු ලැබේද භවංගයෙන් පසුව චුතවන්නා වූ පුද්ගලයා ස්වරූප වශයෙන් ගනු ලැබේද යත්, ජවනයෙන් පසුව භවංගයට අනතුරුව චුතිය වන්නා වූ පුද්ගලයා ගනු ලැබේ. තදාරම්මණයෙන් පසු චුතිය වන පුද්ගලයා ගනු නො ලැබේ. කවර හේතුවකින් ද යත්, අවිතක්ක අවිචාර පච්ඡිම චිත්ත යනු රූපාවචර පඤ්චමධ්‍යාන විපාක චිත්තය හා අරූප විපාක චිත්තයයි කියනු ලැබෙති, ඒ චිත්තයෝ ද වනාහි රූපභූමි අරූප භූමීන්හිම ලැබෙති. රූප අරූපභූමීන්හි තදාරම්මණ නොලැබෙති. එහෙයින් නොලැබෙන බව දතයුතු.

අනාගත පුද්ගලෝකාසයෙහි පඨමජ්ඣානං සමාපන්නානං - යන තැන ප්‍රථමධ්‍යාන දශයම ගනු ලැබෙත් ද යත්. ගනු ලැබෙති. එසේ වී නම් ''මග්ගාභිඤ්ඤා සකිං මතා''යන වචනය අනුව මාර්ග ප්‍රථමධ්‍යාන සතර එක වරක් පමණක්ම පහළ වන්නාහු නොවෙත්ද එක් වරක්ම පහළ වන්නේ නමුත් විපාකය වූ ඵල ප්‍රථමධ්‍යානය සමග සහචරණ වශයෙන් එයට අනතුරුව ඉපිද ඵලප්‍රථම ධ්‍යානයෙහි පිහිටන බව කියන ලදැයි දතයුතු. එහෙයින් ප්‍රත්‍යනිකයෙහි පඨම,දුතිය තතිය මග්ගජ්ඣාන සමං ගීනංයයි විභාග කොට බෙද දක්වන ලද්දේ වෙයි. මෙපමණක්ම මූලික වශයෙන් කියා ඇත.

යමක සයක් පිළිබඳ ගණ්ඨිය නිමි.

# යමක සම්පිණ්ඩනය

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

## රතනත්තයං අහං වන්දමි

### විභංග සයක් පිළිබඳ යමක සම්පිණ්ඩනය

1 සන්නිට්ඨාන සංසය — දෙකෙහි ප්‍රශ්නය සමවෙයි.
'ආමන්තා'ය විසඳුම — සමවේ නොමැත වෙනසෙක්

2 දෙපදය නොයෙක් විධිනම් — අධිප්‍රා සංසය බහුල වේ.
දතයුතු දේ බොහෝ වෙති — බෙදු දක්විය යුතුවේ
විවිධාකාර වන බැවින් — ආමන්තා කිව යුතු නොවේ.

3 යමක ගත් රුවනෙහි — නය නැත බෝ නොදනහෙන.
සන්නිට්ඨාන නැති නම් — 'නත්ථි' යන පිළිතුරම වේ.

4 සංසයාධිප්‍රා නැති නම් — නැත්ද යන පැන වේ නම්.
එවැනි තැන ''න'' යනු — අතහැර දැමිය යුතුවේ.

5 සංසය ඇතොත් යම් තැන — ''න'' නොගෙනම පැනය වේ.
නොයෙක් දේ ගැන නොසිතා — ''නො'' යන පිළිතුරම දෙනු.
විනේ ජනයා පිණිසම — යමක සයකට කියති නිදසුන්

### ප්‍රශ්නෝත්තර සම්පිණ්ඩනය

6 සන්නිට්ඨානම වෙතොත් — පසුපදය සංසය නැත.
පුරේ පඤ්හා වේ නම් — පාළිගති පිළිතුර වේ.
පුරිම කොටසෙහි වේනම් — කරනු අනුලෝමයෙහි ඇතුලත්.

7 සන්නිට්ඨාන සංසය — මාරුකොට ගෙන පද දෙක.
ප්‍රතිවචන දීමෙහි — කරණු පච්ඡා පඤ්හය.
පශ්චිම කොටස වේ නම් —'ආමන්තා' කියනු නිවරද.

8 සන්නිට්ඨාන වැඩිවේ — සංසය පද අඩුම නම්.
දෙපදය බෙද කීමෙහි — පරිපූණ්ණ පඤ්හා ගතයුතු.

9 සන්නිට්ඨාන නොමැතිව — පිළිතුරු කියන සමයෙහි
අත්හැර ප්‍රතික්ෂේපය — "නත්ථි" යන විසඳුම කියනු

10 පුරිම පශ්චිම දෙපදය — අසමාන නම් හැම විට
ප්‍රතිෂේධයට නියමිත — "නො" යනු කියනු පිළිතුර.

11 මෝස ප්‍රශ්නය එහි ඇත — වෙතොත් කැමතිව මෙ කව
කටපාඩම් කරනු මැන — යමක ගත් රුවනෙහි සමත් වේ.

### ආයතන සම්පිණ්ඩනය

12 බුමාටු දෙවියන් හැර — සෙසු දෙවියෝ ද සියලුම
නිජ්ඣාමතණ්හික නමැති — ප්‍රේතයන් සහ නේරයිකයෝ
ඕපපාතික නම් වූ — එකම යෝනිය ඇත්තෝ.

13 ඉතිරි සැම ප්‍රේතයන් — බුමාටු දෙවියන් සහ
මිනිස්සු ද තිරිසන් — උපදිත් සතර යොන්හිම

14 දුගතියෙහි මිනිස් ලොව — සංසේදජ සතුන් හට
දසක පස් දෙනකුම — අඩුවිය හැකිය කිසිවිට

15 ඕපපාතික දුගතිහි — ඝානය අඩු නොකළයුතු.
ඉතිරි සිවු ගතියෙහි — ඕපපාතික ඝාන අඩු වියහැකි.

16 ඕපපාතික අවසෙස් — මිනිස් ලොව යන තැන්හිද
අඩු නොකළ යුතුමය — ඉහත කී පස් දසකය.

17 ආදි කල්පික මනුලොව — ඕපපාතික මනුනට
අඩු වේ භාව දසකය — බඹලොවට එ සම ගතිකය

18 අණ්ඩජ ජලාබුජ — සංසේදජෝපපාතික
සතුන් උපදින යොන් — සිවු වැදැරුම් වෙත් මැයි.

19 බුමාටු දෙවියන් — මිනිසුන් හා තිරිසනුන්
අවශේෂ ප්‍රේතයන් — අතැර නිජ්ඣාම තණ්හිකයන්.
සිවු යොන්වලම උපදිත් — එසැමහට යොන් සතරම වෙත්.

20 බුමාටු දෙවියන් හැර — සෙසු දෙවියෝ ද දෙවලොව
නිජ්ඣාම ප්‍රේතයන් හැර — සෙසු තුන් ප්‍රේත විසයෙද
එකම උපපාතික — යොනියෙහි උපදිත්මය.

21 හුදු කාම සුගතිහි — ඕපපාතික අය හට
ඉන්ද්‍රිය අඩු බවක් — නැති බව දත මනාමැයි.

22 ආදිකල්පික මනුනට — භාවරූපය අඩුමය.
සංසේදජ පුහුල්හට — ඇස කණ නැහැ අඩු ද විය හැකි.

23 දුගති උපපාතික—සත්නට එහි උපැත්මෙහි.
ඝානය අඩු නොකොට — භාවය ද ගෙන උදුරනු.

24 කියන ලද දුගතිහි — සංසේදජ සතුන්හට
ඇස කණ නැහැදභාවය — අඩුකළ යුතු සුදුසු සේ.
ගත් රූවනෙහි කියනලද — මෙ බස් සස් බස වෙමය.

25 බූමාටු දෙවියන් හැර — දෙව්ලොව ඉතිරි දෙවියෝ
යට නරකයන් හිද — නිජ්ඣාම ප්‍රේතයන් සහ
නිසැකව දනගනුව — උපපාතිකව උපදිති.

26 අවසේස ප්‍රේතයෝ — බූමාටු දෙවියන් සහ,
තිරිසන් සතුන් මිනිසුන් — සතරෙහි පිළිසිඳින්මැයි.

27 කාමාවචර ලෝකයෙහි — ඝාන ජිව්හා දෙයාතන
නියතයෙන් ඇත් ම යැයි — ගත් රූවනෙහි කියා ඇත.

28 යට සැම නරකයෙහි — ඝානය නියතයෙන් ඇත.
කාමයෙහි ඇස කන — කිසිවිට නොමැතිව ද වේ.
මෙ නය පිළිවෙළ ද — නුවණින් පිළිවිසුව මැන.

29 කාමාවර භූමියෙහි — පිළිසිඳගත් සිත සමග
ශබ්දය අඩුම කොට — සෙසු ආයතන ගතයුතු

30 පසළොස් රූප බිම — මන ධම් ආයතනයෝ
රූප ඇස කන ගෙන — ඇතුලත් කොට කියනු මැන.

31 අසඤ්ඤෙහි නාම නැත — ධම්මය රූප පමණෙකි.
අරූපෙහි මන හා — ධම්මා යතන පමණෙකි.
යමකයෙහි මෙ බෙදුම් — තව දුර අසා දත මැන.

### ඉන්ද්‍රිය සම්පිණ්ඩනය

32 සුඛ දුක්ඛ දෙමනස් — තුන් ඉඳුරු ලොවුතුරු හැර
සෙසු බොහෝ ඉඳුරෝ — ප්‍රසාදින්ද්‍රිය මන භාව යන
මේ අට ද සමහින — පිළිසිඳෙහි දනු නියතින්

33 ජීවිත ද සොමනස — උපෙක්ඛාවත් සද්ධා
විරිය සති සමාධිත් — ඇතුලත් කරනු නියතින්

34 ප්‍රභූව ලෞකික — එකෙක් මැයි එම ඉන්ද්‍රිය
පිළිසිඳ චුතිත්ති පව — ඉන්ද්‍රිය දෙසා ඇත මෙසේ

35 ප්‍රසාදය මන මොහු — ගැනීමෙහි නය පෙර සේ
භූමි පුද්ගල සමලෙස — කීමද පහසු බව දනු

36 ඉත්ථි පුම්භාවය — කාම භූමිහි ගතයුතු.
ජීවිත මනින්ද්‍රිය මොහු — සමානව ගතයුතු මැන.

37 ඉන්ද්‍රිය බල පඤ්චකය — නම්කඳු ඇති භූමියෙහි
වදරා ඇති බව දූන — ඉන්ද්‍රිය කියනු උදුරනු

38 සන්ධියෙහි අපාය ද — වේහප්ඵල අරූපය
සුද්ධාවාස බිම්වල — නම හැර ගනු අසඤ්ඤය
භූමියෙහි විභාගය — නුවණින් මෙනෙහි කර ගනු.

39 සොම්නසද අතහැර — සඤ්ඤා ප්‍රතිසන්ධියෙහි
වෙසෙසින් උපෙක්ඛා — ඇතුලත් කළ යුතුම වේ.

40 කම් සුගති පිළිසිඳ — සෝමනස්සය උපෙක්ඛා,
දෙකම උපදින තැන — ස්වරූපය ගනු සුදුසු සේ.

41 වෙහප්ඵලෙන් යට — සියලුම රූප භූමිහි
පිළිසිඳෙහි සොම්නස් — ඉන්ද්‍රිය ගෙනම උදුරනු

---

### බුරුම මහා විසුද්ධාරාමාධිපති මහානායක මාහිමියන් වහන්සේ විසින් රචිත යමක සම්පිණ්ඩණය

1 සන්නිට්ඨාන සංසය — සැම අරුත් සම වේ නම්
පෙර කී අයුරු සේ — පවඡා පඤ්හ නම් දනු
ආමන්තා යනු හෙයින් — පටිවචන පිළිතුර වේ.

2 පෙර පසු කරුණු වැඩි — වේතොත් එය පරිපූර්ණය
ස්වරූප දස්සනා නියෙන් — දිය යුතු එයට පිළිතුරු

3 සන්නිට්ඨාන පස — නැතහොත් අරුත් කිසිවෙක්
මෝසපඤ්හා එබැවින් — නත්ථි යයි පිළිකෙව් එය

4 සංසය පසද කිසි — අරුතක් නැතොත් එයට ද
මෝඝ පඤ්හා එබැවින් — නො — යයි ප්‍රතිෂේධ වේ.

5 ප්‍රශ්නය මෝස වේ නම් — දෙපසෙහි ප්‍රත්‍යනීකය
පුරේ පඤ්හා වන බැවින් — පාලිගති පිළිතුරු වේ.

6 ප්‍රශ්න පද සතරෙකි — පිළිතුරු පද පසෙක් වෙති.
එදෙක ගලපා මෙහි — කරන ලද පද දතයුතු.

---

1 සන්නිට්ඨාන සංසය — දෙක්හිම අරුත් සමවෙත.
පච්ඡා පඤ්හ එබැවින් — ආමන්තා පිළිත වේ.

2 සන්නිට්ඨාන පමණෙක් — නය සම වෙතොත් එයටද
ආමන්තා යනු ම වෙයි — පිළිතුර පටි වචන නම්.

3 සන්නිට්ඨාන වැඩි නම් — පරිපුණ්ණ පඤ්හා නම් වේ.
එහි පිළිතුර මෙයේ — සරූප දස්සන නමින් වේ

4 සන්නිට්ඨාන ස්වරූපය — නොමැති වුවහොත් එයට ද.
මෝස පඤ්හා නම් බැවින් — නත්ථි යයි ප්‍රතික්ෂිප්තය.

5 සංසය අරුත් නැත් නම් — මෝස පඤ්හා නම් එද,
අනුලොම් හි - නො — යනු — ප්‍රතිෂේධ පිළිතුර වේ.

6 ප්‍රත්‍යනීකයෙහි පමණක් — අර්ථ වේ නම් එයට ද
පුරේපඤ්හා එබැවින් — පාලිගති වේ පිළිතුර

7 යමක ගත් දසෙහිම — ප්‍රශ්න සතරෙක් සැමතැන
පිළිතුරු පසක් සමගින් — සවැදරුම් විභංගය
අවබෝධය පිණිස කළ — කිවි පද මෙසේ නිමැවේ.

යමක සම්පිණ්ඩනය නිමි.

# යමක අනුගණ්ඨි පදය

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

සංස ජංගෙහි සොභන්තො — තාරෙතං මුනි නාවිකො
භාසතො'හි ධම්මණ්ණවං — යමකස්සානුගණ්ඨියං.

## මූල යමකය

යමක ගණ්ඨියෙහි විශේෂයෙන් දතයුතු වූ අර්ථ අභිප්‍රාවන් පැහැදිලි කරගැනීම පිණිස සාධක පාළි ඇතුලත් කොට වෙනත් ග්‍රන්ථයන් හා සංසන්දනය කොට ඒ ඒ තැන්හි ප්‍රශ්න උත්තර දීම ස්වරූපයෙන් මේ අනුගණ්ඨිය සකස් කරන ලද්දේ රුන්ගුන් නුවර සුධම්මවතී මුද්‍රණාලයේ පාළි අංශයේ ප්‍රධානාචාර්‍ය ශූ. ජීජ් මහතුන් විසිනි.

[ග්‍රන්ථය විශාලත්වයට පත්වන බියෙන් මාතිකා අනුගණ්ඨි, ධාතුකථා අනුගණ්ඨි මෙන් බොහෝ ප්‍රශ්නෝත්තර ඇතුලත් නොකොට විශේෂාවබෝධය පිණිස අවශ්‍යම වූ ප්‍රශ්නෝත්තර පමණක් ඇතුලත් කරන ලද බව සැලකිය යුතු]

### උද්දේශ වාරය

## ගණ්ඨි වචන ශෝධනය

ප්‍රශ්න:- . කථාවස්තු ප්‍රකරණය දේශනා කොට වදරා ඉන් අනතුරුව පට්ඨාන ප්‍රකරණය නොවදරා කුමක් හෙයින් යමකප්‍රකරණය වදළ සේක්ද යත්.

උත්තර:- කථාවස්තු ප්‍රකරණයෙහි සංක්ෂේපයෙන් වදාරණ ලද ධර්මයන්ගේ සන්නිට්ඨාන සංසය පිළිබඳ විවිධාකාර විශේෂවත් වූ නය ක්‍රමයන්හි කෞශල්‍ය පිණිස පට්ඨානප්‍රකරණය නොවදරා යමක-ප්‍රකරණය වදළ සේක.

[(සැ.යු.) විවිධාකාර නය ක්‍රමයන්හි කෞශල්‍ය ඇත්තා වනාහි කුශලාදී ධර්මයන්හි වැරදි අවබෝධයක් නොගන්නේය. ඒ කුශලාදී ධර්මයන්හි වැරදි අවබෝධය ද කථාවස්තු ප්‍රකරණයෙන් දුරු කරන ලදී. මෙසේ හේතු ඵල සම්බන්ධයෙන් මෙය වදරණ ලදයි දතයුතු.]

කථාවස්තු ප්‍රකරණයෙහි සංක්ෂේපයෙන්ම දක්වන ලද ධර්මයන්හි විපරීත ග්‍රහණය වළකා ඒ ධර්යන්හිම ධර්මසංගණී ආදියෙහි ප්‍රකාශ කරන ලද ධර්ම පුද්ගල අවකාශාදී නිශ්‍රයන්ගේ සන්නිට්ඨාන සංසය වශයෙන් නානාප්‍රකාර කෞශල්‍යභාවය පිණිස යමකප්‍රකරණය පටන් ගන්නා ලදී.

''කථාවත්ථුප්පකරණෙන සංඛෙපෙනෙව දෙසිතෙන ධම්මෙසු විපරීතග්ගහණං නිවාරෙත්වා තෙස්වෙව ධම්මෙසු ධම්මසංගහාදීසු පකාසිතේසු පුග්ගලෝකාසාදි නිස්සයානං සන්නිට්ඨාන සංසයානං වසෙන නානාප්පකාර කොසලලත්ථං යමකප්පකරණං ආරද්ධං'' **යමක මූලටීකා**

සංඛෙපෙනෙව, කෙටියෙන්ම, දෙසිතෙන වදාරණ ලද්දවූ, කථාවත්ථුප්පකරණේන කථාවස්තුප්‍රකරණ ග්‍රන්ථයෙන්, ධම්මෙසු - ස්කන්ධා දී වූද කුශලාදි වූද, ධර්මයන්හි, විපරීතග්ගහණං වැරදි ලෙස අර්ථ ගැනීම, නිවාරෙත්වා - වළකා ධම්ම සංගහාදීසු - ධම්මසංගණී ආදී ප්‍රකරණයන්හි, පකාසිතේසු,- ප්‍රකාශ කරන ලද, තෙස්වෙව ධම්මෙසු,- ඒ ස්කන්ධාදී කුශලාදි ධර්මයන් කෙරෙහිම, ධම්ම පුග්ගලො-කාසාදි නිස්සයානං - ධර්ම පුද්ගල භූමි ආදී නිශ්‍රය ඇත්තා වූ, නොහොත් - ධර්ම පුද්ගල භූමි ආදිය ඇසුරු කොට ඇත්තාවූ, සන්නිට්ඨාන සංසයානං,-සන්නිට්ඨාන සංසය පිළිබඳ, වසෙන- ප්‍රභෙදයෙන්, නානාප්පකාර කොසල්ලත්ථං-විවිධාකාර කෞශල්‍ය භාවය පිණිස, යමකප්පකරණං,- යමක ප්‍රකරණය, ආරද්ධං,- පටන් ගන්නා ලදී.

''අවිපරීතතො ගහිතේසු ධම්මෙසු මූලයමකාදි වසෙන පවත්තියමානා දේසනා වෙනෙයානං නානාප්පකාර කොසල්ලාවහා පරිඤ්ඤාකිච්චසාධනිච හෝති, න විපරීතතෝති ආහ. විපරීතග්ගහණං - පෙ - ආරද්ධන්ති. ඒතේනකථාවත්ථුප්ප-කරණ දේසනානන්තරං යමකප්පකරණ දේසනාය කාරණ මාහ.'' (යමක අනුටීකා)

අවිපරීතතෝ,- අවිපරීත වශයෙන්, ගහිතේසු,- ගන්නා ලද, ධම්මෙසු,- ස්කන්ධාදී කුශලාදි ධර්මයන් කෙරෙහි, මූල යමකාදීවසෙන,- මූල යමකාදී වශයෙන්, පවත්තිය මානා,- පවත්වනු ලබන, දේසනා,- දේශනාව, වෙනෙයානං,- විනේය ජනයාට, නානප්පකාර කොසල්ලාවහා ච,- විවිධාකාර කෞශල්‍ය භාවය ගෙන දෙන්නේ ද, පරිඤ්ඤා කිච්චසාධනී ච,- පරිඥාකෘත්‍ය සිද්ධ කරන්නේ ද, හොති,- වේ, විපරීතතො මෙයින් විපරීත වශයෙන්,නහොති,- නොවේ,ඉති,-මේ කියනලද අර්ථය, මනසිකත්වා, මෙනෙහි කොට, විපරීතග්ගහණං,- පෙ -ආරද්ධං, විපරීතග්ගහණං,- පෙ - ආරද්ධං යනාදි වචනය, ආහ,- කීහ. ඒතේන,- මේ විපරීතග්ගහණං - පෙ - ආරද්ධං යනාදි පාඨයෙන්, කථා වත්ථුප්පකරණ දේසනානන්තරං,-කථාවස්තු ප්‍රකරණ දේශනාවට අනතුරුව යමකප්පකරණ දේසනාය,- යමක ප්‍රකරණය දේශනා කිරීමට, කාරණං ආහ,- හේතුව වදාළහ.

ප්‍ර:- කුමක් හෙයින් යමක ප්‍රකරණය නම් වේද,

උ:- අර්ථ වශයෙන් ද පාළි - ධර්ම වශයෙන් ද යුගල යුගලව වදාරණ ලද ග්‍රන්ථය බැවින් යමකප්‍රකරණය නම් වේ.

ප්‍ර:- කුමක් නම් යුගල යුගලව ලැබෙත් ද,

උ:- මූල යමකයෙහි අනුලෝම පුච්ඡා සන්නිට්ඨාන තැන්හි, කුශල අර්ථය, පටිලෝම පුච්ඡා සන්නිට්ඨාන තන්හි කුශල - මූල අර්ථයයි. එක යුගල යකි. කුශල පාළිධර්ම, කුශල මූල පාළිධර්මයයි එක යුගලයකි. අනුලොම පුච්ඡා සංසය තැන්හි කුශල මූල අර්ථය, පටිලෝම පුච්ඡා සංසය තැන්හි කුශල අර්ථයයි එක යුගලයකි. කුශල මූල පාළිධර්මය, කුශල පාළිධර්මයයි එක යුගලයෙකි. අනුලොම පුච්ඡා අර්ථය, පටිලෝම පුච්ඡා අර්ථයයි එක යුගලයෙකි. පාළිධර්ම යුගල වශයෙන් යුගලයන් ලැබෙති.

[සැ.යු: සන්නිට්ඨාන සංසය වශයෙන්ද පුච්ඡා විසජ්ජනා වශයෙන්ද, අනුලොම පච්චනික වශයෙන්ද යුගල යුගල වැ ලැබෙ. ඒකමූල යමක බන්ධ යමක ආදියෙහි මෙ ක්‍රමයට යුගල ලැබෙන ආකාරය තේරුම ගත හැකි වෙ.]

කුසල කුසල මූල සංඛාතානං ද්වින්නං අත්ථානං වසෙන අත්ථයමකන්ති වා තෙසඤ්ඤෙව අත්ථානං වසෙන අනුලොම පටිලෝමතො පවත්ත පාළිධම්ම වසෙන ධම්ම යමකන්ති වා අනුලෝම පටිලොමතො පවත්ත පුච්ඡා වසෙන පුච්ඡා යමකන්ති වා තිවිධාය යමකභාවො වෙදිතබ්බො, සෙසෙසුපි එසේව නයො, **(යමකට්ඨ කථා)**

කුසල කුසලමූල සංඛාතානං,- කුශල කුශලමූල යයි කියන ලද, ද්වින්නං අත්ථානං දෙකක් වූ අර්ථයන්ගේ, වසෙන,- වශයෙන්, අත්ථයමකන්ති වා,- අර්ථයමකය කියාද , තෙසඤ්ඤෙව අත්ථානං- කුශල කුශලමූල යයි කියන ලද දෙකක් වූ ඒ අර්ථ- යන්ගේම, වසෙන,- වශයෙන්, අනුලෝම පටිලොමතො,- අනුලොම ප්‍රතිලොම වශයෙන්, පවත්ත පාළිධම්ම වසෙන, පැවති පාළිධර්මයාගේ වශයෙන්, ධම්ම- යමකන්ති වා,- ධර්මයමකයයි කියාද,අනුලෝම පටිලෝමතො,- අනුලෝම ප්‍රතිලොම වශයෙන් , පවත්ත පුච්ඡා වසෙන,- පැවති පුච්ඡාවගේ වශයෙන්, පුච්ඡා යමකන්ති වා, - පුච්ඡා යමකයයි කියාද. තිවිධාය,- තෙවැදෑරුම් ව, යමකභාවො, යමකභාවය, වෙදිතබ්බො,- දත යුතුය. සෙසෙසුපි, අවසේස යමකයන්හි ද, එසෙව නයො, මෙසේම නය ක්‍රමය දත යුත්තේය.

ප්‍ර:- එසේ මූල යමක ඒකමූල යමක ආදී වෙන වෙනම ඇත්තා වූ යමකයෝම, යමක නම් වෙත් නම්, මූල බන්ධ ආදී දශයෙක්වූ යමකයන්ට කුමක් හෙයින් යමක යයි කියනු ලැබේද.

උ:- අර්ථ වශයෙන් ද, පාළිධර්ම වශයෙන් ද, යුගල යුගල වූ යමකයන්ගේ වශයෙන් වදරා ඇති බැවින් මූලයමක ඒකමූල යමකය ආදී වෙන වෙනම ලැබෙන යමකයන්ගේ යමක නාමය, සමූහ වූ මූල, බන්ධාදී දශයමකයන් කෙරෙහි ද අවයවූපචාර වශයෙන් පැහැදිලි කොට යමක නමින් දක්වන ලදහ.

[සැ:යු:- අවයවූපචාරයාගේ අධිප්‍රායාර්ථය අප විසින් ලියන ලද මාතිකා අනුගණ්ඨිපද වේදනාත්‍රිකයෙන් තේරුම් කරගන්න.]

යුගල සංඛාතානං යමකානං වසෙන දෙසිතත්තා ඉමෙසු දසසු එකෙකං යමකං නාම. **(යමක අට්ඨකථා)**

යුගල සංඛාතානං,- යුගල යුගල වශයෙන් කියන ලද, යමකානං, - යමකයන්ගේ වසෙන,- වශයෙන් , දේසිතත්තා,- දේශනා කරන ලද බැවින්, දසසු,- දශයක් වූ ඉමේසු,- මේ මූල ඛන්ධ ආදී වූ යමක අතුරෙන්, එකෙකං,- එක එක ග්‍රන්ථය, යමකං නාම,- යමක නම් වේ.

අවයවෙ පවත්තො සො — වොහාරො සමූහෙ කතො,
තං යථා වෙ සමං චුණ්ණං — සමන්තෙත්ථවයවං මතං,

[මේ ගාථාවෙහි තේරුමද ප්‍රථම අනුගණ්ඨියෙහි ලියා ඇත.]

ඉමෙසං පන යමකානං සමූහභාවතො සබ්බම්පෙතං පකරණං යමකන්ති පවුච්චති **(යමකට්ඨ කථා)**

ඉමෙසං යමකානං පන,- මේ මූලයමකය ආදි ග්‍රන්ථයන්ගේ වනාහි, සමූහභාව තෝ,- සමූහය වූ බැවින්, සබ්බම්පි ඒතං පකරණං,- මේ සියලුම ප්‍රකරණය, හෙවත් යමකය, යමකන්ති පවුච්චති,- යමක නමැයි කියනු ලැබේ.

ප්‍ර:- යමක දශයක් ඇති නමුත් ස්කන්ධාදී යමකයක් පළමුකොට නොවදරා කුමක් හෙයින් මූලයමකය පළමුකොට වදරණ ලද්දේද.

උ:- මූලයමකයෙහි වදරා ඇත්තා වූ කුශලාදී ධර්මයෝ ම ස්කන්ධාදී වශයෙන් වෙන් කොට ඛන්ධයමකාදී වශයෙන් වදරා ඇත්තාහ. එනිසා ඛන්ධ යමකාදිය පළමු කොට නොවදරා මූලයමකයම පළමු කොට වදරණ ලදී.

ඉදනි මූලයමකෙ දෙසිතෙයෙව කුසලාදි ධම්මෙ ඛන්ධවසෙන සංගණ්හිත්වා මූලයම්කානන්තරං දෙසිතස්ස ඛන්ධයමකස්ස වණ්ණනාහොති. **(යමකට්ඨ කථා)**

ඉදනි ,- දැන් මූලයමකේ,- මූල යමකයෙහි, දෙසිතෙයේව,- වදරණ ලද්දවූම,- කුසලාදි ධම්මෙ,- කුශලාදී ධර්මයන්, ඛන්ධවසේන,- ස්කන්ධ වශයෙන්, සංගණ්-හිත්වා,- සංග්‍රහ - කොට, මූලයමකානන්තරං,- මූලයමකයට අනතුරුව, දෙසිතස්ස, දේශනා කරන ලද. ඛන්ධයමකස්ස, - ස්කන්ධයමකය පිළිබඳ, වණ්ණනාහොති,- අර්ථකථනය වෙයි.

ප්‍ර:- මූල යමකයෙහි උද්දේශවාර නිද්දේශ වාර දෙකෙක් ඇති තැන නිද්දේශ වාරය පළමු කොට නොදෙසා කුමක් හෙයින් පළමු කොට උද්දේශ වාරය වදරණ ලද්දේද.

උ:- කෙටියෙන් ඇත්තා වූ උද්දේශ වාරය තිබෙද්දී උදෙසීමට අනුව කිව යුතුවූ දීර්ඝ විස්තර ඇත්තා වූ නිද්දේශ වාරය පළමු කොට නොකියනු ලැබේ. උද්දේශ වාරයම පළමු කොට කියනු ලැබේ.

තෙසු උද්දිට්ඨානුක්කමෙන නිද්දිසිතබ්බත්තා උද්දේස වාරො පඨමෝ, **(යමකට්ඨ කථා)**

තේසු,- ඒ වාර දෙක අතුරෙන්, උද්දිට්ඨානුක්කමෙන,- උදෙසන ලද උද්දේශයට අනුව, නිද්දිස්සි තබ්බත්තා,- විස්තර කටයුතු වන බැවින්, උද්දේසවාරො, උද්දේශවාරය, පඨමෝ, පළමු කොට, හෝති,- වේ.

[සැ: යු:- තිකමාතිකාව පළමු කොට වදරණ ලදී. එයින් කුශල ත්‍රිකය පළමු කොට වදළහ. කුසලපද අකුසලපද අව්‍යාකෘත පද පිළිවෙළින් වදරණ ලදහ. වේදනාත්‍රිකය විවරණයද ප්‍රශ්නෝත්තර සමග සාධක සූත්‍ර අර්ථ සියල්ල මාතිකා අනුගණ්ඨියෙහි දක්වන ලදී. එයින් බලාගත යුතු.]

අරෝගෙය්‍ය කුසලං ඉට්ඨ — විපාකෙ කුසලො තථා.
අනවජ්ජමහි ඡෙකේච — කථිතො වාච්ච ලිංගිකෝ.
**(අභිධානප්පදීපිකා)**

කුසලං, - නපුංසක ලිංග කුශල ශබ්දය, ආරොගෙය්‍ය, - නිරෝග අර්ථයෙහි. වත්තති,-වැටේ, තථා, - ඒ හැර, කුසලෝ,-පුල්ලිංගික කුශල ශබ්දය, ඉට්ඨ විපාකෙ,- ඉෂ්ට විපාක අර්ථයෙහි, වත්තති, - වැටේ. වාච්චලිංගිකො, - වාච්‍යයට බඳු ලිඟු ඇත්තා වූ කුශල ශබ්දය,-අනවජ්ජම්හිච, අනවද්‍ය අර්ථයෙහි ද, ඡෙකෙච,- කෞශල්‍ය අර්ථයෙහි ද, කථිතො, - කියන ලද්දේ වෙයි.

ප්‍ර:- ආරොග්‍යාදි කුශල ශබ්දාර්ථ සතරක් තිබෙද්දී කුසලා ධම්මා යන පදයෙහි කුශල ශබ්දය කවර අර්ථයෙක්හි වැටේද.

උ:- ආරෝග්‍ය, ඉෂ්ඨ විපාක, අනවජ්ජ, මේ අර්ථ තුනෙහි වැටේ. [සැ:යු:- ධම්මසංගණී අට්ඨකථාව අනුව ආරෝග්‍ය, ඉට්ඨ විපාක, අනවජ්ජ යන මේ අර්ථ තුනෙහි වැටේ. යමක අට්ඨකථාව අනුව ඉට්ඨවිපාක, අනවජ්ජ යන මේ අර්ථ දෙකෙහි වැටෙන බව මතක තබාගත යුතු.]

ස්වායම්ධ ආරොගෙය්‍යපි අනවජ්ජෙපි සුඛ විපාකේපි වට්ටති. **(ධම්ම සංගණී අට්ඨකථා)**

ස්වායං,- සෝ අයං කුසලසද්දෙ, - ඒ කුශල ශබ්දය තෙමේ, ඉධ,- මේ කුසලා ධම්මා යන පදයෙහි, ආරෝගෙය්‍යපි,- ආරෝග්‍ය අර්ථයෙහිද, අනවජ්ජෙපි, - නිරවද්‍ය අර්ථයෙහිද, සුඛ විපාකේපි, - සැප විපාක අර්ථයෙහි ද, වට්ටති, - වැටේ.

කුසලා ධම්මාති කුසලතිකස්ස පදභාජනෙ,- වුත්තලක්ඛණා අනවජ්ජසුඛ විපාකා කුසල සභාවා, - **(යමක අට්ඨකථා)**

කුසලා ධම්මාති,- කුසලා ධම්මා යනු, කුසලතිකස්ස, - කුශලත්‍රිකයාගේ, පද භාජනේ,- පදභාජනයෙහි, වුත්ත ලක්ඛණා, - කියන ලද ලක්ෂණ ඇත්තා වූ, අනවජ්ජ සුඛ විපාකා, - නිරවද්‍යවූ සැප විපාකයෙන දෙන්නා වූ, කුසල සභාවා,-කුශල ස්වභාව ඇත්තා වූ ධර්මයෝ, හොන්ති,- වෙති.

ධම්මො සභාවෙ පරියත්ති පඤ්ඤා
ඤායෙසු සච්චප්පකතිසු පුඤ්ඤෙ,
ඤෙය්‍යෙ ගුණාචාර සමාධිසුපි
නිස්සත්තතාපත්තිසු කාරණෙ දෙ,

(අභිධාන ප්පදීපිකා)

ධම්මො, - ධම්ම ශබ්දය, - සභාවෙ, - ස්වභාවාර්ථයෙහිද, පරියත්ති පඤ්ඤා ඤායෙසු, - පර්‍ය්‍යාප්ති අර්ථය, ප්‍රඥ අර්ථය, න්‍යාය අර්ථයන්හිද, සච්චප්පකතිසු,- සත්‍යාර්ථ ප්‍රකෘති අර්ථයන්හි ද, පුඤ්ඤෙ,- පුණ්‍යාර්ථයෙහි ද, ගුණාචාර සමාධිසු,- ගුණාර්ථ, ආචාරාර්ථ, සමාධි අර්ථයන්හි ද, නිස්සත්ත තාපත්තිසු, - නිස්සත්වාර්ථ ආපත්ති අර්ථයන්හි ද, කාරණෙදෙ, - හේතු අර්ථ ආදියෙහි ද, සියා, - වැටෙන්නේ වේ.

ප්‍ර: ස්වභාවාර්ථ ආදි වූ ධම්ම ශබ්දයාගේ අර්ථ දහතුනෙක් දක්වා ඇත්තාහ. කුසලා ධම්මා යන පදයෙහි ධම්ම ශබ්දය කවර අර්ථයෙක් හි වැටෙන්නේද,

උ: ධම්මසංගණී අට්ඨකථාව අනුව නිස්සත්ව - නිර්ජීව අර්ථයන්හිද, යමක අට්ඨකථාව අනුව ස්වභාවාර්ථ යෙහි ද වැටෙ.

ස්වායමිධ නිස්සත්ත නිජ්ජීවතාය මෙව වට්ටති.

(ධම්මසංගණී අට්ඨක්ථා)

ස්වායං, - සො අයං ධම්මසද්දෙ, - ඒ ධම්ම ශබ්දය තෙමේ, ඉධාපි,- මේ කුසලා ධම්මා යන පදයෙහිද, නිස්සත්ත නිජ්ජීවතාය මෙව, - සත්ව ජීව ස්වභාවයෙන් තොර වූ යන අර්ථයෙහි ම, වට්ටති,-වැටෙ.

පටිසෙධෙ වුද්ධිතබ්භාවෙ — අඤ්ඤත්ත සදිසෙ පිච,
විරුද්ධෙ ගරහෙ සුඤ්ඤෙ — අකාරො විරහප්පකෙ,

(එකක්ඛර කොස)

අකාරො, - අ- යන අක්ෂරය - පටිසේධෙ, - ප්‍රතිෂේධාර්ථයෙහි ද, වුද්ධි තබ්භාවෙ වෘද්ධි තත්භාව (ප්‍රකෘති) අර්ථයෙහි ද, අඤ්ඤත්ථෙ, - අන්‍යාර්ථයෙහි ද, සදිසෙ- සමානාර්ථයෙහි ද, විරුද්ධෙ, - විරුද්ධාර්ථයෙහිද, ගරහෙ, - ගර්හාර්ථයෙහිද, සුඤ්ඤෙ, - ශූන්‍යාර්ථයෙහි ද, විරහෙ, - විරහාර්ථයෙහිද, අප්පකෙ, - අල්පාර්ථයෙහිද පවත්නති, - වැටේ.

ප්‍ර:- ප්‍රතිෂේධාදි අර්ථ දශයක අ- අක්ෂරය වැටෙන කල්හි, අකුසලයෙහි අ - ශබ්දය, හා අව්‍යාකෘතයෙහි අ- ශබ්දය කවර නම් අර්ථයෙක්හි වැටෙන්නාහුද

උ:- අකුශලයෙහි අ- ශබ්දය විරුද්ධාර්ථයෙහි ද, අව්‍යාකෘත යෙහි අ - ශබ්දය අන්‍යාර්ථයෙහි ද වැටේ.

ප්‍ර:- ධම්මසංගණී ප්‍රකරණයෙහි කුසලත්‍රිකය පද තුනක් ලෙස වදරා ඇති අතර යමක ප්‍රකරණයෙහි නාමපදයට ඇතුලත් කොට කුමක් හෙයින් සතර වැදෑරුම්ව වදරණ ලද්දේද.

උ:- යමකප්‍රකරණයෙහි පද තුනම පිඩුකොට සංග්‍රහ කරනුපිණිස නාමපදයට ඇතුලත් කොට පද සතරක් වශයෙන් වදරා ඇත.

කුසලාදි සංගණ්හත්ථමෙව නාමපදස්ස වුත්තත්තා –
**(යමක මූලටීකා)**

නාම පදස්ස, - නාම පදයාගේ, කුසලාදි සංගණ්හත්ථ මෙව, – කුශල ආදි ධර්මයන් සංග්‍රහ කරනු පිණිසම, වුත්තත්තා, – වදරා ඇති බැවින්, (චතුසු පදේසු වුත්තං)

මූලං හේතු නිදනඤ්ච — සම්භවො පභවෙන ච,
සමුට්ඨානාහාරාරම්මණං — පච්චයො සමුදයෙනච,

මූලං, - මූල වාරය ද, හේතු, - හේතු වාරයද, නිදනඤ්ච,- නිදන වාරයද, සම්භවො,- සම්භව වාරයද, පභවෙන ච,-පභව වාරයද, සමුට්ඨානං, - සමුට්ඨාන වාරය ද, ආහාරෝ, - ආහාර වාරයද, ආරම්මණං, - ආරම්මන වාරයද, පච්චයො, පච්චය වාරයද, සමුදයෙන ච, සමුදය වාරයද, ඉති,- මෙසේ, දස, – දශ යමකය වෙති. (මෙහි වනාහි විභත්ති නොබලා ස්වරූපාර්ථයම බලා අර්ථ කියන ලදී.)

උද්දේශ වාරය නිමි.

---

## නිර්දේශ වාරය

## ගණ්ඨි පද සෝධනය.

ප්‍ර:- තීණෙව කුසලමූලානි යි වදරා ඇති නමුත්, ද්විහේතුක සිතෙහි ඇත්තාවූ මුල් දෙක කවරකට ඇතුලත් වේත්ද,

උ:- ත්‍රිහේතුක සිතෙහි ඇත්තා වූ මූල තුනගේ සමූහය කියන බැවින් ද්විහේතුක-සිතෙහි ඇත්තා වූ මුල්දෙක නම් වූ යුගලය ද ලැබෙන බැවින් ද්විහේතුක යෙහි ඇත්තා වූ හේතු දෙක ද ඇතුලත් වන බව දත යුතුය.

ප්‍ර:- අවසේසා යනාදි පාඨයෙන් අකුසල අබ්‍යාකතයන්හි කුසල මූල තුන හැර අවශේෂ ධර්මයෝ කුශල නම් නොවන්නාහුද, සෝධනය කොට කියනු.

උ:- අකුශල අව්‍යාකෘතයන්හි කුශල මූල තුන හැර සෙසු ධර්ම ඇතත් කුශල නම් නොවෙති . එස්සාදි කුශලය ඇසුරු කොට ඇත්තා වූ ධර්මයෝ පමණක්ම කුසල් නම් වෙති.

[සැ:යු:- ''ථෙරො අභිධම්මං භාසතු'' යයි කී තැන. නුගත් බුඩ්ඪ පබ්බජිත ථෙර කෙනෙක් ඇත්තේ නමුත් අභිධර්මය කට පාඩම් නොකළ බුඩ්ඪ පබ්බජිතයකු නොගත යුතු. අභිධර්මය පාඩම් කළ ව්‍යක්ත ප්‍රතිබල ප්‍රඥාසම්පන්න ස්ථවිර නමක්ම ගන්නාක් මෙන් මේ කාරණය දතයුතු.]

අවසේසා කුසලා ධම්මා න කුසල මූලාති අවසේසා ඵස්සාදයො කුසලා ධම්මා කුසල මූලානි නාම න හොන්ති, අථවා අවසේසා ඵස්සාදයො කුසලා ධම්මා ඒව නාම, න කුසල මූලානීතිපි අත්ථො, **(යමක අට්ඨකථා)**

අවසේසා, - අවශේෂ වූ, කුසලා ධම්මා, - කුශල ධර්මයෝ, න කුසල මූලාති,- න කුසල මූලා යනු, අවසේසා - කුශල මූල තුන හැර, ඵස්සාදයො,- ඵස්ස ආදිකොට ඇත්තා වූ, කුසලා ධම්මා, - කුශල නම් වූ ධර්මයෝ, කුසල මූලානි නාම, – කුසල මූල නම්, න හොන්ති, – නොවෙති. අථවා , – නොහොත්, අවසේසා , – අවසේස වූ ඵස්සාදයො, – ඵස්සාදි ධර්මයෝ, කුසලා ධම්මා යේව නාම, – කුසල ධම්ම නම්, හොන්ති, – වෙති. කුසල මූලානි, - කුසල මූල නම්, න හොන්ති, - නොවෙති, ඉතිපි අත්ථො,- මෙසේද අර්ථය, වෙදිතබ්බො, – දත යුතුය.

ප්‍ර:- අභිධර්මාර්ථ සංග්‍රහවෙහි චිත්තජ රූප පසළොස යයි කියා ඇති නමුත් ඒකමූල ප්‍රතිලෝම පුච්ඡාවෙහි කුශල චිත්තජ රූප ස්වරූප උද්ධරන තැන කුමක් හෙයින් සතළොස කැයි ස්වරූප ගනු ලැබේද?

උ:- අභිධර්මාර්ථ සංග්‍රහවෙහි උපචය – සන්තති දෙක නොගෙන පසළොස ලැබෙති. මෙහි වනාහි උපචය – සන්තති ඇතුලත් කොට සතළොස ගනු ලැබෙති.

ප්‍ර:- උපචය සන්තති ඇතුලත් කොට සතළොස ගනු ලැබෙතොත් (ජායමානාදි රූපානං – පෙ – කෙහි චීති පකාසිතං) යන සංග්‍රහ ග්‍රන්ථයේ ලක්ෂණ රූප න කුතෝ චි සමුට්ඨාන යන වචනය හා සමග එකට එක විරුද්ධ නොවන්නේද, සෝධනය කොට දක්වනු.

උ:- විරුද්ධ නොවේ. උපචය – සන්තති දෙක වනාහි චතු සමුට්ඨානික රූප- යන්ගේ වර්තමාන ප්‍රත්‍යයෙන් උපන් බව සලකා පර්‍යාය වශයෙන් චතු සමුට්ඨානික රූපයට ඇතුලත් කොට සතළොස ගනු ලැබෙති. අභිධර්මාර්ථ සංග්‍රහවෙහි වනාහි ප්‍රධානාර්ථය කියා ඇති බැවින් පණ්ණරසයෙක්ම ගනු ලැබෙති.

යෙ – පන කම්මාදීහි නිබ්බත්තන්ති, තෙසං අභිනිබ්බත්ති භාවතො ජාතියා තප්පච්චයභාව වොහාරො අනුමතො, නා පන පරමත්ථතො ජාති ජායති, **ධම්මසංගණි අට්ඨකථා)**

යෙ ධම්මා, - යම් රූපධර්මකෙනෙක් චතාහි, කම්මාදීහි, - කර්මාදී හේතුවකින් නිබ්බත්තන්ති, - හටගනිත්ද , තෙසං ධම්මානං, ඒ ධර්මයන්ගේ, අභිනිබ්බත්ති භාවතෝ, - පූර්වකර්මප්‍රත්‍යයෙන් උපදින බැවින්, ජාතියා, - ජාති රූපයට, නොහොත් උපචය සන්තති රූපයන්ට, තප්පච්චයභාව වොහාරො, ඒ රූප ධර්මයන්ගේ ඇත්තා වූ හේතුවෙන් උපදින බව කියන ව්‍යවහාරය, නොහොත් චතුසමුට්ඨානික රූපයන්ට හේතුව වූ චතුසමුට්ඨානික යයි නම, අනුමතො, - අනුමත කරන ලදී. තවද, අන්වය තබා ව්‍යතිරේකය ගෙන විස්තර කරන්නෙමි. පරමත්ථතො, - පරමාර්ථ වශයෙන්, නොහොත් මුඛ්‍ය වශයෙන් ජාති-ජාතිරූපය, - ජාති රූපය, හෙවත් උපචය සන්තති රූපය, න ජායති, - නුපදී.

ප්‍ර:- උපචය - සන්තති රූප චතුසමුට්ඨානික වශයෙන් ගනු ලැබෙත් නම් රූප ලක්ෂණ රූපයක් ම වූ ජරතා අනිච්චතා ද චතු සමුට්ඨානික වශයෙන් ගැනීමට සුදුසු නොවේද, පිළිතුරු පැහැදිලි කරන්න.

උ:- ස්වරූප වශයෙන් ගැනීමට සුදුසු නොවේ. උපචය - සන්තති චතාහි චතුසමුට්ඨානික රූපයන්ගේ වර්තමාන ප්‍රත්‍යයෙන් උපන්නක් කොට ජනක ශක්තිය ඇති කල්හිම ලැබෙන බැවින් චතුසමුට්ඨානික නමැයි කිවයුතු නමුත්, ජරතා අනිච්චතා දෙක චතාහි සමුට්ඨානික රූපයන්ගේ ඨිති භංගක්ෂණයෙහි උපදින බැවින් ජනක ශක්ති නැති කල්හි ලැබෙන බැවින් චතුසමුට්ඨානික යයි නම් කිරීමට නුසුදුසු බැවින් ස්වරූප වශයෙන් නොගන්නා ලදහ.

[සැ:යු:- විද්‍යමාන වූ ස්වභාවය පිළිබඳ ස්වරූප ගැනීම සිරිතෙකි. චතු සමුට්ඨානික රූපයන්ගේ වර්තමාන ප්‍රත්‍යයෙන් හටගත් ඨිතියට හා භංගයට ද, පැමිණීමට පෙර ව්‍යාපාර ඇති විට උපදන බැවින් ද, ලක්ෂණ රූප සමාන බැවින් ද, ස්වරූප වශයෙන් ගැනීමට සුදුසු වෙයි.]

තත්ථ සියා යථෙව ජාති යෙසං ධම්මානං අභිනිබ්බත්තිත පච්චය භාව වොහාරං අභිනිබ්බත්තිත වොහාරඤ්ච ලභති, තථා පාකභෙදපි තෙසං ධම්මානං පාකභෙද තප්පච්චයභාව වොහාරං අභිනිබ්බත්ති වොහාරඤ්ච ලභන්තු. ඉදම්පි ද්වයං කම්මාදි සමුට්ඨාන මෙවාති වත්තබ්බං භවිස්සතීති, න පාකභෙද තං වොහාරං ලභන්ති, කස්මා, ජනක පච්චයානුභාවක්ඛණෙ අභාවතො, ජනක පච්චයාන ඤ්හි උප්පාදෙතබ්බ ධම්මස්ස උප්පාදක්ඛණෙ යෙව ආනුභාවො, න තතො උත්තරිං තෙහි ච අභිනිබ්බත්තිත ධම්මක්-ඛණස්මිං ජාති පඤ්ඤායමානා තප්පච්චයභාව වොහාරං අභිනිබ්බත්ති වොහාරඤ්ච ලභති. තස්මිං ඛණෙ සබ්භාවතො, න ඉතරද්වයං, තස්මිං ඛණෙ අභාවතොති නෙවෙතං ජායතීති වත්තබ්බං **(ධම්මසංගණී අට්ඨකථා)**

තත්ථ, – එහි, ජාති, – ජාති රූපය, යෙසං ධම්මානං, – යම් ධර්ම කෙනෙකුන්ගේ, අභිනිබ්බත්ති,–පහළවීම – හොති, – වේද තප්පච්චයභාව වොහාරඤ්ච, ඒ – ධර්මයන්ගේ හේතුව ඇති කල්හි හටගන්නා බව දක්වන ව්‍යවහාරයද අභිනිබ්බත්ති වෝහාරඤ්ච, – විශේෂයෙන් හටගන්නා ලද්දේය යන ව්‍යවහාරය ද ලබතියෙව, ලබන්නේ යම් සේ වේද, තථා,– එසේම , පාක භෙදපි, – මේරීම හා බිඳීමද, යෙසං ධම්මානං, යම් ධර්මකෙනෙකුන්ගේ, පාකභෙද, – මේරීම හා බිඳීම, හුත්වා, – වී, තප්පච්චය භාව වොහාරඤ්ච,–තත්ප්‍රත්‍යභාව ව්‍යවහාරයද, අභිනිබ්බත්ති වොහාරඤ්ච,–අභිනිබ්බත්ති ව්‍යවහාරය ද, ලභන්තු, – ලබත්වා, ඒවං සන්තෙ, – මෙසේ ලැබෙන කල්හි, ඉදං ද්වයම්පි, – මේ ජරතා අනිච්චතා රූප දෙකද කම්මාදි සමුට්ඨාන මේව, – කර්මාදි සමුට්ඨාන ඇති රූපයෝමයයි, ඉති, – මෙසේ, වත්තබ්බං භවිස්සති, – කිවයුතු වන්නේ යයි, ඉති චොදනා, – මෙසේ චෝදනාවෙක්, සියා, – වන්නේය. පාකභෙද, – (පිසීම) මේරීම හා බිඳීම, තංවොහාරං, – ඒ සමුට්ඨාන ව්‍යවහාරය. න ලභන්ති, – නොලබත්, කස්මා, – කුමක් හෙයින් ද යත්, ජනකපච්චයානු භාවක්ඛණේ, – ජනක ප්‍රත්‍යයාගේ ආනුභාව පවත්නා ක්ෂණයෙහි, අභාවතො, – නොලැබෙන බැවින්, න ලභන්ති,– නොලැබෙත්. හි – සච්චං, – සත්‍යයකි. ජනක පච්චයානං, – ජනක ප්‍රත්‍යයන් – ගේ, ආනුභාවො, – ආනුභාවය, උප්පාදේතබ්බ ධම්මස්ස, – ඉපදවියයුතු ධර්මයාගේ, උප්පාදක්ඛණේ යෙව, – උත්පාදක්ෂණයෙහි පමණෙක්, අත්ථි, – ඇත්තේ වේ. තතො උත්තරි, – ඉන් පසු, ආනුභාවො නහොති, – ආනුභාවය නැත. ච, – තවද විස්තර කරන්නෙමි. තෙහි, – ඒ කර්මාදි ජනක ප්‍රත්‍යයෝ වනාහි, අභිනිබ්බත්තිත ධම්මක්ඛණස්මිං, – උපදවනු ලබන ධර්මයන්ගේ උත්පාදක්ෂණයෙහි, ජාති, – ජාති රූපය, පඤ්ඤාය මානා, – ප්‍රකට වන්නේ වී. තප්පච්චයභාව වොහාරඤ්ච, – තත්ප්‍රත්‍යභාව ව්‍යවහාරය ද , අභිනිබ්බත්ති වොහාරඤ්ච, – අභිනිබ්බත්ති ව්‍යවහාරය ද, ලභති, – ලබයි. තස්මිං ඛණේ, ඒ කෙණෙහි, සබ්භාවතො, – ලැබෙන බැවින්, ලභති, – ලබයි, ඉතරද්වයං, – ජාතිරූපය හැර, වා, – නොහොත්, උපචය – සන්තති දෙක හැර ජරතා අනිච්චතා රූප දෙක, තස්මිං ඛණේ,– ඒ ක්ෂණයෙහි, අභාවතො, – නොමැති බැවින්, තත්ප්‍රත්‍යභාව ව්‍යවහාරයත්, අභිනිබ්බත්තිත ව්‍යවහාරයත්, න ලභන්ති,– නොලබති, ඉති තස්මා, – එනිසා, ඒතං රූපද්වයං, – මේ රූප යුගලය හෙවත් මේ ජරතා අනිච්චතා රූප දෙකේ සමූහය, ජායති ඉති, – උපදින්නේ යයි. නෙව වත්තබ්බං, – නොම කිව යුතුයි.

ප්‍ර:- ජරතා අනිච්චතා රූප චතුසමුට්ඨානික රූප නොවෙත් නම්, [ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නං] යනාදීන් වදරා ඇත්තා වූ සූත්‍රාන්ත පාළිය සමග විරුද්ධ නොවන්නේ ද, සෝධනය කොට දක්වන්න.

උ:- විරුද්ධ වන්නේ නැත. සූත්‍රාන්ත පාළියෙහි සංඛත පටිච්ච–සමුප්පන්න වන බැව් ගන්නා බව කියන ලදී. එසේ ගැනීමේදී ජරතා අනිච්චතා දෙක චතුසමුට්ඨානික රූපයන්ගේ දිරීම හා බිඳීම කෙණෙහි ඇති දෙයක් කොට පර්‍යාය වශයෙන් වදරා ඇත. මුඛ්‍ය වශයෙන් වදරා නැත. එනිසා විරුද්ධ නොවේ.

ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නන්ති ආගතත්තා ඉදම්පි ද්වයං ජායතීති වෙ, න, පරියාය දෙසිතත්තා, තත්ථ හි පටිච්ච සමුප්පන්නානං ධම්මානං ජරාමරණත්තා පරියායෙන තං පටිච්ච සමුප්පන්නන්ති වුත්තං. (**ධම්මසංගණී අට්ඨකථා**)

භික්ඛවේ ! මහණෙනි! ජරාමරණං, ජරාව මරණය, අනිච්චං, නිත්‍ය නැත, සංඛතං, හේතුවෙන් හටගත්තෙක, පටිච්චසමුප්පන්නං, හේතු ප්‍රත්‍යයන් නිසා උපන්නේය. ඉති, මෙසේ ආගතත්තා, පැමිණි බැවින්, ඉදම්පි ද්වයං, - මේ ජරතා අනිච්චතා රූප යුගලය ද ජායතීති වෙ, - උපදින්නේ දැයි චෝදනාවකි. ඉදං ද්වයං,- මේ රූප යුගලය, නජායති, - නොම උපදී, කස්මා කුමක් හෙයින් ද යත්, පරියාය දෙසිතත්තා, - පර්‍යාය වශයෙන් වදරා ඇති බැවින්, නජායති, - නොඋපදී, හි සච්චං, - සත්‍යමැයි, තත්ථ, - ඒ ජරා මරණං යනාදි පාඨයෙහි, පටිච්චසමුප්පන්නානං, - හේතු ප්‍රත්‍යයෙන් හටගන්නා වූ, ධම්මානං, - ධර්මයන්ගේ, ජරාමරණත්තා, - ජරාමරණ බැවින්, වා, - නොහොත්, මෙරීම හා බිඳීම බැවින්, පරියායෙන, - පර්‍යාය වශයෙන්, තං රූපද්වයං, - ඒ රූප දෙක, පටිච්ච සමුප්පන්නන්ති, - පටිච්චසමුප්පන්නයයි, වුත්තං, - වදරණ ලදී.

ප්‍ර:- උපචය සන්තති ජරතා අනිච්චතාවෝ ප්‍රධාන වශයෙන් (න කුතෝචි සමුට්ඨාන) කිසි හේතුවකින් හටනොගත්තාහු නම්, සසවිසාණයක් සේ නැති දෙයක් බවට ද, නිර්වාණය මෙන් නිත්‍ය දෙයක් බවට ද පත් වන්නාහු නොවෙත්ද, සෝධනය කරන්න.

උ:- පත් නොවන්නාහ. උපදින ඨිතියට පත්වන බිඳෙන චතුසමුට්ඨානික රූපයන් ඇසුරුකොට පවතින බැවින්, ඔවුන් පැහැදිලිව උපන්නාහු නම් ලක්ෂණ රූපත් පැහැදිලිව උපදින බැවින් සසවිසාණයක් මෙන් නැති දෙයක් හෝ, නිර්වාණය මෙන් නිත්‍ය දෙයක් හෝ නොවන්නාහ.

යදි එවං තයම්පෙතං අජාතත්තා, විය නත්ථි නිබ්බානං විය නිච්චම්ති වෙ, න නිස්සය පටි බද්ධ වුත්තිතො, පඨවි ආදීනංහි නිස්සයානං භාවෙ ජාති ආදිත්තයං පඤ්ඤායති තස්මා න නත්ථි, තෙසඤ්ච අභාවෙ න පඤ්ඤායති, තස්මා න නිච්චං., (ධම්මසංගණී අට්ඨකථා)

යදි, - ඉදින්, පටිච්චසමුප්පන්න යයි වදරා ඇති බැවින්, සියා, - චෝදනාවක් වන්නේය. එවං, - මෙසේ දේශනාවක්, සති, - ඇති නම්, ඒතං තයම්පි, මේ ජාති ජරතා අනිච්චතා යන රූප තුන්දෙනාගේ සමූහය ද, අජාතත්තා, - ඉපදීමක්, නැති බැවින්, සසවිසාණං විය, - සසවිසාණයක් මෙන්, නත්ථි, - නැත, ඉති වා, - මෙසේ ද, නිබ්බානං විය, - නිර්වාණය මෙන්, නිච්චං ,- නිත්‍යය, ඉතිවා, - මෙසේද, වෙ මඤ්ඤෙ, - චෝදනා වන්නේය, නිස්සය පටිබද්ධ වුත්තිතො, - ආශ්‍රය කරණ පඨවි ආදි රූපයන් සම්බන්ධව පැවතුම ඇති බැවින්, න, - සස විසාණයක් මෙන්

නැත්තේ හෝ, නිර්වාණය මෙන් නිත්‍ය හෝ නොවන්නේය, හි සච්චං, - සත්‍ය මැයි; නිස්සයානං, - ඇසුරු කොට ඇත්තා වූ, පඨවි ආදීනං, - පඨවි ආදි රූපයන්ගේ, භාවෙ, - ප්‍රකටව ඇත්තේ නම්, ජාති ආදිත්තයං, - ජාති ආදි රූප තුන පිළිබඳ සමූහය. පඤ්ඤායති, - ප්‍රකට වේ. තස්මා, - එසේහෙයින්, නත්ථි, - නැති බවක්, - න - නොවේ තෙසං, - ඒ පඨවි ආදි නිශ්‍රය රූපයන්ගේ, අභාවෙ, - පහළවීමක්නැති කල්හි, පඤ්ඤායති, - පහළ නොවේ, තස්මා,-එසේ හෙයින්, නිච්චං,-නිත්‍ය වූවක්, නොවේ.

ප්‍ර:- ජරතා අනිච්චතා රූපයන් වෙන වෙනම හේතු ප්‍රත්‍යයෙන් හට නොගන්නා හු නම් (ජරාමරණං භික්ඛවේ) යනාදී වචනය කුමක් හෙයින් පර්‍ය්‍යාය වශයෙන් වදරණ ලද්දේද, නොවදරණ ලද්දේ නම් වඩාත් හොඳ නොවේද,

උ:- නොවදරණ ලද නම් නොමැනවි, නොවදරණ ලද නම් වෛනෙය්‍ය සන්තාන-යන්හි ඒ ධර්ම ගැන (නත්ථිභාව-නිච්චභාව) විපරීත හැඟීම් පහළවීමට ඉඩ ඇත. එවැනි විපරීත අදහස් දුරුකිරීම පිණිස වදරා ඇත.

එතම්පි ච අභිනිවෙසං පටිසෙධෙතුමෙව ඉදං වුත්තං, ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නන්ති, **(ධම්ම සංගණි අට්ඨකථා)**

ච,- ප්‍රතිඵලය කියන්නෙමි, ඒතම්පි අභිනිවෙසං, - මේ ජරතා අනිච්චතා රූප වනාහි නත්ථ - නිච්ච යයි කියන ලද විපරීත ග්‍රහණය ද, පටිසෙධෙතු මේව,-වැළැක්වීම පිණිසම, ජරාමරණං, - පෙ - ඉදං වචනං, ජරාමරණං යන මේ වචනය වුත්තං-වදරණ ලදී.

ප්‍ර:- කුසලපද ඒකමූලයමක ස්වරූප ඉදිරිමෙදි කුශල නාමස්කන්ධයෝ සුදුසු පරිදි උපදවන්නා වූ යයි කී තැන, සුදුසු පරිදි උපදවන ආකාරය පැහැදිලි කරන්න.

උ:- සිත් උපදින කල්හි රූප උපදින්යයි කියේ නමුත්, චිත්තජරූප දහතම එකවර ඉපදිය නොහැකිය. තනිකර උපදින ශුද්ධාෂ්ටක කලාපය, ශරීරාවයව සෙලවෙන කල්හි කායවිඤ්ඤත්ති නවක කලාපය, වචන කථාකරන කල්හි වචීවිඤ්ඤත්ති දශකය, ධාතු සමකල්හි ලහුතාදේකාදශක කලාපය පහළ වේ.

මෙසේ සුදුසු පරිදි ඉපදීම කරණකොට ගෙන යථාරහ යනාදිය කියන ලදී.

ප්‍ර:- චිත්තජරූපයෝ වනාහි සිත හේතුකොට හටගන්නාහුද, නැතහොත් චෛත-සික හේතුකොට හටගන්නා හුද, හටනොගන්නාහුදැයි පැහැදිලි කරනු.

උ:- චිත්තජරූපයෝ වනාහි සිතම හේතු කොට හටගන්නාහුද නොවෙති, චෛත-සිකම හේතු කොට හටගන්නා හු නොවෙති. චෛතසික හේතුකොට හට නොගන්නාහුද නොවෙති. එකට උපදින චිත්ත චෛතසික සමූහයම එකතුව රූප උපදවන බැවින් චිත්ත චෛතසික දෙකම හේතුකොට උපත්දී යයි අවබෝධ කටයුතු.

සබ්බෙපිහි චිත්ත චෙතසිකා එකතොව හුත්වා රූපං සමුට්ඨාපෙන්ති, **(පට්ඨාන අට්ඨකථා)**

හි සච්චං, - සත්‍යයකි, සබ්බෙපි, - සියලුම උපදනා වූ, චිත්ත චෙතසිකා,- චිත්ත චෛතසිකයෝ, එකතො හුත්වාච, - එකතුවී සිටම, රූපං, - චිත්තජ රූපං, සමුට්ඨාපෙන්ති,- උපදවත්,

ප්‍ර:- චිත්ත චෛතසික දෙකම හේතුකොට රූප උපදිත් නම්, චිත්ත චෛතසිකජ රූප යයි නොකියා කුමක් හෙයින් චිත්තජ රූපයයි කියනුලැබේද,

උ:- චිත්ත චෛතසික දෙකම හේතුකොට උපදින බව සත්‍යයකි. එසේ වුවද ලෞකික දේශනාවේදී චිත්තයම ප්‍රධාන හේතුව වන බැවින් චිත්තචෛතසිකජ රූප යයි නොකියා චිත්තජ - රූප යයිම වදරා ඇත.

ලොකිය ධම්මදේසනායං පන චිත්තස්ස අධික භාවතො තථාවිධං රූපං චිත්ත සමුට්ඨානන්ති වුච්චති. **(පට්ඨාන අට්ඨකථා)**

පන, - එසේ සමූහයක් එකතු වී උපදවන්නේ නමුත්, ලොකිය ධම්මදේසනායං, ලෞකික ධර්මදේශනා කරනස්ථානයේ දී, චිත්තස්ස, - චිත්තය, අධික භාවතො,- ප්‍රධාන බැවින්, තථාවිධං, - එබඳු ස්වභාව ඇත්තා වූ, වා, නොහොත්, චිත්ත චෛතසිකයන් විසින් උපදවන්නා වූ, රූපං, රූපය, චිත්ත සමුට්ඨානන්ති, - චිත්ත සමුට්ඨාන රූපයයි, වා, - නොහොත්, චිත්තජ රූපයි කියා, - වුච්චති, - කියනු ලැබේ.

ප්‍ර:- ඒකමූල යමකයෙහි කුශලය හා සමාන මුල් ඇත්තේ යයි කී තැන එකවිට උපදින සමාන මුල් ඇත්තේද, නැතහොත් - හේතුඵල සම්බන්ධව උපදින සමාන මුල් ඇත්තේ ද, එකවිට උපදින සමාන මුල් ඇත්තේ නම්, එකවර උපදින ඍතුජ රූප ආහාරජ රූපත් ගතයුතු නොවේද, සෝධනය කරනු.

උ:- එකවිට උපදින සමාන මුල් ඇත්තේ යයි නොකිය යුතුය. එනිසා එකවිට උපදින ඍතුජරූප ආහාරජ රූපත් නොගත යුතුය. හේතුඵල සම්බන්ධව උපදනා වූ ම සමාන මුල් ඇත්තේ යයි කිවයුතුය.

ප්‍ර:- කවර නම් හේතුඵල සම්බන්ධ වශයෙන් රූප උපදිත් ද ; පැහැදිලි කරනු.

උ:- හේතු ධර්ම සය දෙන වනාහි හේතුප්‍රත්‍ය ඇති ධර්මයෝය චිත්තජ රූපයෝ වනාහි හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝය. මෙසේ හේතු ඵල සම්බන්ධව උපදිනු ලැබේ.

යථෙව හි ඵස්සාදීනං අලොභාදයො හේතුපච්චයත්තා මූලං තථා තං සමුට්ඨාන රූපස්සාපි **(යමට්ඨකථා)**

හි, - ඒ වචනය පැහැදිලි කරන්නෙමි. අලෝභාදයෝ, - අලෝභ ආදි වූ ධර්මයෝ, ඵස්සාදීනං, -- ඵස්ස ආදි ධර්මයන්ට, හේතුප්පච්චයත්තා, - හේතු ප්‍රත්‍යය ඇති බැවින්, මූලං, - මූලය, යථෙව හොන්ති, - යම් සේම වෙත්ද, තථා, - එසේ, තං සමුට්ඨාන රූපස්සාපි, -- ඒ ඵස්සාදි ධර්මයන් නිසා උපදින චිත්තජ රූපයන්ට ද, (හේතු පච්චයත්තා මූලං හොන්ති)

හේතු භාවො පන නෙසං සම්පයුත්තානං සුප්පතිට්ඨිතභාව සාධන සංඛාතො මූලභාවො. **(අභිධම්මත්ථ විභාවිනි ටීකා)**

නෙසං, - ඒ ලෝභාදි ධර්මයන්ගේ, හේතුභාවො පන, - හේතුප්‍රත්‍ය වන බව වනාහි, සම්පයුත්තානං,- සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ, සුප්පතිට්ඨිතභාව සාධන සංඛාතො- මනාව පිහිටි බව සිද්ධ කිරීම නම් වූ, මූලභවො, - මූල හේතු භාවයයි.

ප්‍ර:- අඤ්ඤමඤ්ඤමූල යමකයෙහි යෙ කේචි කුසලා යයි ප්‍රශ්න නොකොට, කුමක්, හෙයින්, යෙ කේචි කුසල මූලේන ඒකමූලා යයි ප්‍රශ්න කරන ලදද.

උ:- කුශල ශබ්දයාගේ අර්ථය, කුශල මූලේන ඒකමූල ශබ්දයාගේ අර්ථයෙහි ඇතුලත් වන බැවින් යෙකේචි කුසලා යයි ප්‍රශ්න නොකොට යේ කේචි කුසල මූලේන ඒකමූලා යයි ප්‍රශ්න කරන ලද්දේ වෙයි.

අඤ්ඤමඤ්ඤ යමකෙ යෙ කේචි කුසලාති අපුච්ඡිත්වා යෙ කේචි කුසලමූලේන ඒකමූලාති පුච්ඡා කතා. කස්මා, ඉමිනාපි බ්‍යඤ්ජනේන තස්සෙවත්ථස්ස සම්භවතො. **(යමක අට්ඨකථා)**

අඤ්ඤමඤ්ඤ යමකෙ,- අඤ්ඤමඤ්ඤ යමකයෙහි, යෙ කේචි කුසලාති,- යෙ කේටි කුසලා යයි අපුච්ඡිත්වා, - නොවිචාරා, යෙ කේටි කුසල මූලේන ඒකමූලාති, - යෙ කේචි කුසලමූලේන ඒකමූලායයි, පුච්ඡාකතා, - ප්‍රශ්න කරන ලදී. කස්මා, - කුමක් හෙයින්ද යත්, ඉමිනාපි බ්‍යඤ්ජනේන, - මේ යෙ කේචි කුසල මූලෙන ඒකමූලා යන ශබ්දයෙන්ද තස්සෙවත්ථස්ස, - ඒ, යෙ කේචි කුසලා යන ශබ්දයාගේ අර්ථයම, සම්භවතො, - ලැබෙන බැවින්,

[සැ:යු:- ඉමිනාපි බ්‍යඤ්ජනෙන - යන පාඨයෙන්, සන්න කාරක ආචාර්‍ය්‍යවරයෝ ක්‍රම දෙකක් දක්වත්, කුශල පදය ඇතුලත් කරති. මූලටීකාවෙහිද බැහැර කෙරෙති. කුසල මූලෙන ඒකමූලා පාඨයාගේ අර්ථයට කුසලා පාඨයාගේ අර්ථය ඇතුලත් නොවේ. කුසලා පාඨයාගේ අර්ථයට කුසල මූලෙන ඒකමූලා පාඨයාගේ අර්ථය ඇතුලත් වන බව සිහි තබාගන්න.]

ප්‍ර:- අඤ්ඤමඤ්ඤ මූලයමකයෙහි අනුලෝම විස්සර්ජනාවෙහි මූලානියානියයි වදරා ඇති අතර කුමක් හෙයින් කුසල මූලානියයි වෙන් කොට නැවත කියන ලද්දේද.

උ: මූලානි යානි යයි කියන ලද වචනයෙහි පොදුවේ ගෙන කුසලමූල අකුශල මූල අව්‍යාකෘත මූලයන් සමග විශේෂ කොට දක්වයි. මෙතැන දී කුසල මූලයම ගන්නා ලදයි අර්ථ සමානත්වය දක්වීම පිණිස කුසල මූලානි යයි නැවත වෙන්කොට කියන ලදී.

කුසලමූලානීති ඉදං පුරිමස්ස විසේසනං මූලානි යානි එකතො උප්පජ්ජන්තීති වුත්තං, තානිපන කුසලමූලානි පි හොන්ති, අකුසල අබ්‍යාකත මූලානි පි ඉධපන කුසල මූලානීති විසේසන දස්සනත්ථ මිදං වුත්තං, **(යමක අට්ඨකථා)**

කුසල මූලානීති ඉදං, - කුසල මූලානි යන මේ පදය, පුරිමස්ස, - පෙර කියන ලද මූලානි යානි - යනාදි පදයාගේ, විසේසණං, - විශේෂණ යයි, හි, - ඒ වචනය පැහැදිලි කරන්නෙමි. මූලානි යානි එකතො උප්පජ්ජන්ති යයි. වුත්තං, - කියන ලදී. පන, එසේම කියන ලද්දේ නමුත්, තානි, ඒ මූලයෝ, කුසල මූලානිපි, - කුසල - මූල නම් ද, හොන්ති, - වෙති. අකුසල අබ්‍යාකත මූලානිපි, - අකුසලමූල අව්‍යාකෘත මූලයෝ ද හොන්ති, - වෙති. ඉධ, - මෙහි, කුසල - මූලානි, - කුශලමූලයෝම වෙති. ඉති,- එහෙයින්, විසේස දස්සනත්ථං, - විශේෂ දැක්වීම පිණිස, ඉදං, - මේ කුසල මූලානි යනාදී වචනය, වුත්තං, - කියන ලදී.

ප්‍ර:- අඤ්ඤමඤ්ඤ යමකෙ ප්‍රතිලෝම පුච්ඡාවෙහි, සබ්බෙ තේ කුසල මූලේන ඒකමූලා - යනුවෙන් නොකියා කුමක් හෙයින් සබ්බෙ තේ ධම්මා කුසලා යයි කියා ඇත්තේද,

උ:- සබ්බෙ තේ කුසල මූලෙන ඒකමූලා - යි. ප්‍රශ්නය පැහැදිලි කරමි. (යට අනුලෝමයෙහි කියන ලද මූලානි යානි - පෙ - යන මූල පිළිතුර දක්වා ඇත. එසේ මූල පිළිතුර දක්වා ඇත්තේ නමුත් අර්ථ විශේෂයක් නොමැත. එසේ අර්ථ විශේෂ යක් නැති බැවින්) ඒ ප්‍රශ්නය නොකියා සබ්බේ තෙ ධම්මා කුසලා යන පුච්ඡාව කරන ලදී. (අට්ඨකථාව අනුවයි.) තවද, සන්නිට්ඨානයෙහි අඤ්ඤමඤ්ඤ මූලය කියන ලද තැන දක්වූ ධර්මයන්හි ඒකමූලය ලැබෙන සංසය නැති බැවින් සබ්බේ තේ කුසල මූලේන ඒකමූලා යයි පුච්ඡාවක් නොදක්වා සබ්බේ තේ ධම්මා කුසලා යයි දක්වන ලදී. (මූල ටීකාව අනුවය.)

[සැ:- යු:- මේ ක්‍රමය ඇසුරු කොට මූල මූල නය අඤ්ඤමඤ්ඤයමක ආදියෙහි පුච්ඡා විශේෂය දැනගත යුතුය.]

තස්සේව පටිලෝම පුච්ඡාය සබ්බේ තෙ ධම්මා කුසල මූලේන ඒකමූලාති අවත්වා සබ්බේ තෙ ධම්මා කුසලාති වුත්තං, කස්මා අත්ථ විසේසා භාවතො, කුසල මූලෙන ඒකමූලා තිහි පුච්ඡාය කතාය මූලානි යානි එකතො උප්පජ්ජන්තීති හෙට්ඨා වුත්ත නයෙනෙව විස්සජ්ජනං කාතබ්බං භවෙයා, එවඤ්ච සති, අත්ථ විසේසාභාවො හොති. **(යමක අට්ඨකථා)**

අඤ්ඤමඤ්ඤ මූලත්තෙ පන නිච්ඡිතෙ ඒකමූලත්ත සංසයා භාවතො,- සබ්බේ තෙ ධම්මා කුසල මූලෙන ඒකමූලාති පුච්ඡා න කතාති දට්ඨබ්බා, **(යමක මූල ටීකා)**

තස්සෙව,- එම අඤ්ඤමඤ්ඤ මූල යමකයාගේ ම, පටිලෝම පුච්ඡාය,- ප්‍රතිලෝම පුච්ඡාවෙහි, සබ්බේ තෙ ධම්මා කුසල මූලෙන ඒකමූලාති, - සබ්බේ - පෙ - ඒකමූලා යයි, අවත්වා, - නොකියා, සබ්බේ තේ ධම්මා කුසලානි, - සබ්බෙ - පෙ - කුසලා යයි, වුත්තං, - කියන ලදී. කස්මා , - කුමක් හෙයින් යත්, අත්ථවිසේසාභාවතො.- අර්ථ විශේෂයක් නොමැති බැවින්, වුත්තං, - කියන ලදී. හි, - ඒ වචනය පැහැදිලි

කරන්නෙමි. කුසල මූලෙන ඒකමූලාති, - කුසලා - පෙ - ඒකමූලා යයි, පුච්ඡාය කතාය, - ප්‍රශ්නය කළ කල්හි, මූලානි යානි එකතො උප්පජ්ජන්ති - යනාදි වශයෙන් තෙවයා වුත්ත නයෙනෙව, - යට කියන ලද ක්‍රමයෙන්ම, විස්සජ්ජනං කාතබ්බං, විසඳුම කළයුතු. භවෙය්‍ය, - වන්නේය. ච, - සැබව, එවං, - මෙසේ මූලානි යානි එකතො උප්පජ්ජන්ති - යනාදි වශයෙන් විසඳුම කළයුතුව, සති, - ඇති කල්හි, අත්ථවිසෙසාභාවෝ, - අර්ථ විශේෂයක් නැති බව, හොති, - වේ.

පන,- අන් අරුතක් කියන්නෙමි, අඤ්ඤමඤ්ඤ මූලත්තෙ, - එකක් තව එකකට මූල භාවයක් ඇති බව, නිච්ඡිතෙ, - විනිශ්චය කළ කල්හි, ඒකමූලත්ත සංසයාභාවතො, - සමාන මුල් ඇතැයි සංසයක් නොලැබෙන බැවින්. සබ්බෙ තෙ ධම්මා කුසල මූලේන ඒකමූලාති - යනුවෙන්, පුච්ඡා න කතා, - ප්‍රශ්න නොකරන ලදී. ඉති දට්ඨබ්බං, - මෙසේ දත යුතුය.

සැ: යු:- සබ්බෙ තෙ ධම්මා කුසල මූලේන ඒකමූලා යයි ප්‍රශ්නය කරන ලද නම මූලානි යානි යනාදි සන්නිට්ඨාන විසඳුම සමග විශේෂවත් අර්ථයක් නොමැති යයි අට්ඨකථා චාය්‍යීයෝ ප්‍රකාශ කළහ. කියන ලද ඒ වචනයෙහි සබ්බෙ තෙ ධම්මා කුසලමූලේන ඒකමූලා යයි ප්‍රශ්නයක් ඇත්තේද, සබ්බෙ තෙ ධම්මා කුසලා යයි ප්‍රශ්නයක් ඇත්තේද, අට්ඨකථා වෙන් මූලානි යානි - යනාදි පිළිතුරු විශේෂයක් නොමැත. ආමන්තා යන්න කීමට සුදුසු නැතැයි මූල ටීකාව අත්හැරිය බැවින්ද, තමන් ද මූලටීකාව අනුවම පිළිගන්නා බව ගණ්ඨි ආචාය්‍යී පාදයෝ කියති. නුවණින් කල්පනා කොට සුදුසු පරිදි තේරුම් ගතයුතුය.

කුසල මූලවචනං ඒකමූල වචනඤ්ච කුසලභාව දීපකං නහොතීති. කුසලභාවෙ සංසය සබ්භාවා පඨම දුතිය යමකේසු සබ්බෙ තේ ධම්මා කුසලාති පටිලෝම පුච්ඡා කතා , **(යමක මූල ටීකා)**

කුසලමූල වචනඤ්ච, - කුශල මූල ශබ්දය ද, ඒකමූල, වචනඤ්ච, - ඒකමූල, වචනයද, කුසලභාව දීපකං, - කුසලයාගේ කුසල ස්වභාව දක්වන්නේ, නහොති,- නොවේ, ඉති කස්මා, - එනිසා, කුසලභාවේ, - කුසල භාවයෙහි, සංසය සබ්භාවා,- සැකයක් පහළවන බැවින්, පඨම දුතිය යමකේසු, - ප්‍රථම ද්විතීය යමකයන්හි, වා,- නොහොත්, මූල යමක ඒකමූල යමකයන්හි, - සබ්බෙ තෙ ධම්මා කුසලාති, - යනුවෙන්, පටිලෝම පුච්ඡා, ප්‍රතිලෝම පුච්ඡාව, කතා, - කරන ලදී.

ප්‍ර:- මූල නය හා මූලමූලනයන්හි අර්ථ විශේෂයක් නැතිව තිබෙද්දී කුමක් හෙයින් මූල නය පමණක් නොදෙසා මූලමූලනය වැඩි කොට දේශනා කරන ලද්දේද.

උ:- පූර්වයේ දක්වූ මූල ශබ්දයාගේම ඒකමූල අඤ්ඤමඤ්ඤමූල අර්ථ ඇති බව ප්‍රකාශ කිරීම පිණිස මූල මූලනය නැවත වදාරණලදී.

මූලනයෙ වුත්තෙව අත්ථෙ කුසලමූලභාවෙන මූල මූලස්ස විසේසනෙන්න, සමානෙන්න මූලේන අඤ්ඤමඤ්ඤස්ස ච මූලේන මූලයෝග දීපනෙන්න චාති ඉමිනා පරියායන්තරේන පකාසේතුං මූලමූලනයෝ වුත්තො, **(යමක මූලටීකා)**

මූලනයෙ, - මූලනයෙහි, වුත්තෙ එව, - කියන ලද්දවූ ම, අත්ථෙ, - අර්ථයන්, මූලස්ස, - මූල ශබ්දයට විසේසනෙන්න, - විසේසන වූ, මූලයෝග දීපනෙන්න, - මූල ශබ්දය හා යෙදුනා වූ බව දැන්වීම් වශයෙන්, කුසල මූල භාවෙනව - කුශල මූල භාවයෙන්ද, මූලස්ස, - මූලයට, විසේසනෙන්න,- විසේසන වූ, මූලයෝග දීපනෙන්න, -මූලයෝග දැක්වීම් වශයෙන්, සමානෙන්න, - සමාන වූ, මූලෙන ච,- මූලයෙන් ද, මූලස්ස,- මූලයාගේ, විසේසනෙන්න, - විසේසන වූ, මූලයෝග දීපනෙන්න, - මූල යෝගය දැක්වීම් වශයෙන්, අඤ්ඤමඤ්ඤස්ස, - අඤ්ඤමඤ්ඤයාගේ, මූලේනව, - මූලයෙන්ද, පකාසේතුං, ප්‍රකාශකිරීමට, මූල මූලනයො, - මූල මූල නය ක්‍රමය, වුත්තො,-කියන ලදී.

කුසලමූල භාවෙන මූලස්ස විසේසනෙන්න මූලයෝග දීපනෙන්න ච පකාසේතුං කුසල මූල මූලාති, කුසල - මූල භූතා මූලා කුසල මූල මූලාති සමාස යෝජනා, - මූලවචනඤ්හි නිවත්තෙතබ්බ ගහෙතබ්බ සාධාරණං, අකුසලා’ බ්‍යාකතා පි මූලධම්මා අත්ථීති කුසල මූල භාවෙන මූල ධම්මා විසෙසිතා, මූලග්ගහණේන ච මූලවන්තානං මූලයෝගො දීපිතො හොති. සමානෙන මූලෙන මූලස්ස විසේසනෙන්න මූලයෝග දීපනෙන්න ච පකාසේතුං ඒකමූල මූලාති, අඤ්ඤමඤ්ඤස්ස මූලෙන මූලභාවෙන මූලස්ස විසේසනෙන්න මූලයෝග දීපනෙන්න ච පකාසේතුං අඤ්ඤමඤ්ඤමූල මූලාති. මූල මූල නයෝ වුත්තොති යෝජනා, **(යමක අනුටීකා)**

මූලස්ස, - මූලයාගේ, විසේසනෙන්න, - විසේසන වූ, මූලයෝගදීපනෙන්න, - මූලය හා යෙදුනු අර්ථ ඇති. කුසල මූල භාවෙන ච, - කුශල මූලයාගේ වශයෙන්ද, පකාසේතුං,-ප්‍රකාශ කිරීමට, කුසලමූල මූලාති,-කුසලමූල මූලායයි, මූල මූලනයෝ,-මූලමූලනය, වුත්තො, - කියන ලදී. කුසල මූල භූතා, - කුසල මූල වූ, මූලා - මූලයෝ කුසල මූල මූලා, - කුසල මූල නම් මූලයෝම වන්නාහු යයි ඉති, - මෙසේ සමාස යෝජනා, - සමාස යෝජනාව වෙයි. හි - සච්චං, - සත්‍යයකි. මූල වචනං, - මූල ශබ්දය, නිවත්තෙතබ්බ ගහෙතබ්බ සාධාරණං, - නැවැත්විය යුතු ගතයුතු අර්ථ සාධාරණ වචනයකි. අකුශලාබ්‍යාකතා, - අකුශල අව්‍යාකෘත වූ මූලධම්මා පි, - මූල ධර්මයෝ ද, අත්ථි, - ඇත්තාහ, ඉති - තස්මා, - එනිසා, කුසලමූලභාවෙන,- කුශල මූල වශයෙන් මූල ධම්මා, - මූල ධර්මයෝ, විසේසිතා, - විශේෂවත් කොට දක්වන ලදහ. මූලග්ගහණේන, - මූලශබ්දය ගැනීමෙන්, මූලවන්තානං, - මූල් ඇත්තා වූ ධර්මයන්ගේ, මූලයොගො, - මූල යෝගය, දීපිතො හොති, - දක්වන ලද්දේ වෙයි. මූලස්ස, - මූලයාගේ, විසේසනෙන්න, - විසේසනවූ, මූලයෝග දීපනෙන්න, - මූල යෝගය දැක්වීමෙන්, සමානෙන්න, - සමාන වූ, මූලේන මූලභාවෙන ච, - මූලයාගේ මූලභාවයෙන් ද, පකාසේතුං, - ප්‍රකාශ කිරීම පිණිස ඒක මූල මූලාති, - ඒකමූල මූලා යයි. (මූල මූල නයෝ වුත්තො) මූලස්ස, - මූලයාගේ විසේසනෙන්න, - විසේසනවූ

මූලයෝග දීපනේන - මූලයෝගය දක්වීමෙන්, අඤ්ඤමඤ්ඤස්ස - එකක් අනෙකට, මූලෙන මූලභාවේන ච, - මූලයාගේ මූලභාවයෙන් ද, පකාසේතුං, - ප්‍රකාශ කිරීම පිණිස , අඤ්ඤමඤ්ඤ මූලානි, - අඤ්ඤමඤ්ඤමූලායයි, මූල මූලනයො, - මූල මූල නය, වුත්තො, - කියන ලද්දේ යයි, ඉති යෝජනා, - මෙසේ අර්ථ යෝජනාව වේ.

කුසල මූල භාවෙනාති ඒතං මූලස්ස විසේසනෙනාති ඒතස්ස විසේසනං, මූලස්ස විසේසනේන සහ පවත්තෙන කුසලමූල සද්දෙන සමානේන මූලෙන තබ්බිසේසන භූතේන මූලස්ස විසේසනේන ච මූලයෝග දීපනේන ච ඒකමූල සද්දේන අඤ්ඤ-මඤ්ඤස්ස මූලේන තබ්බිසේසන භූතේන මූලස්ස විසේසනේන ච මූලයෝග දීපනේන ච අඤ්ඤමඤ්ඤ මූල සද්දේනාති යෝජනා, අයං පන යෝජනා අනුටීකාය අසමානා පි ගහෙතබ්බාව. **(මධුසාරත්ථ දීපනී)**

කුසල මූල භාවෙනාති ඒතං, - කුසල මූල - භාවේන යන මේ පදය, මූලස්ස විසේසනේනාති එතස්ස, - මූලස්ස විසේසනේන යන මේ පදයාගේ, විසෙසනං, විශේෂන පදයයි. මූලස්ස, - මූල ශබ්දයාගේ, විසේසනේන, - විශේෂණ වූ, සහ පවත්තෙන කුසලමූල සද්දෙන, - සමග එකට පවත්නා වූ කුශල මූල ශබ්දය සමග, මූලස්ස, - මූල ශබ්දයාගේ, විසේසනේන ච, - විශේෂණයෙන් ද වූ, මූල යෝග දීප-නේනච, - මූල යෝග දීපනයෙන් ද, එකමූල මූල සද්දෙන, - ඒකමූල මූල ශබ්දයෙන්, අඤ්ඤමඤ්ඤස්ස, එකක් අනෙකට, මූලෙන, - මූල වූ, තබ්බිස්සෙන භූතේන, - එයට විශේෂණ ද වූ, මූලස්ස විසේසනේන, - මූල ශබ්දයාගේ විශේෂණ වූ, මූලයෝග දීපනේන ච,-මූලයෝග දක්වීමෙන් ද, අඤ්ඤමඤ්ඤ මූලසද්දෙන,-අඤ්ඤමඤ්ඤ මූල ශබ්දයෙන්, ඉති, - මෙසේ වනාහි, යෝජනා, - අර්ථ යෝජනාව දතයුතු, පන, - විශේෂයක් කියන්නෙමි, අයං යෝජනා, - මේ අර්ථ යෝජනාව, අනුටීකාය, - අනුටීකාව හා, අසමානා පි, - අසමාන වූ නමුත්, ගහෙතබ්බාව, - ගතයුතු ම වේ, සැ: යු:- ගණ්ඨි අතුරෙන් වනාහි පූර්ව ගණ්ඨියෙහි විස්තර වශයෙන් කියා ඇත. ඒ කියන ලද විස්තර ද බලා පෙර අනුටීකා මධු ටීකාවන් පාඩම් කොට යහපත් කොට තේරුම් ගත යුතුය.]

ප්‍ර:- අව්‍යාකෘත ඒකමූල යමක අනුලෝම සන්නිට්ඨාන ස්වරූප කීමේදී ප්‍රතිසන්ධි චිත්තය හා චුති චිත්තයන් රූප ඉපදවීමෙහි අසමත් බැවින් ඒවා අත්හැර ස්වරූප උදූරන ලද්දේ නම් මැනවි නොවේද, කුමක් හෙයින් අත් නොහැර ස්වරූප උදූරන ලදද.?

උ:- ප්‍රතිසන්ධි චිත්ත චුති චිත්තයෝ වනාහි භවංග චිත්තයෙන් වෙනසක් නැත්-තෝය, ඔවුන්ගේ ප්‍රතිසන්ධි ක්‍ෂණය චුති ක්‍ෂණය ඇති කාලය තුල රූප උපදවීමට අසමත් නමුත් භවංග ක්‍ෂණය ඇති කල්හි ඉපදවීමට සමත් බැවින් අඩු නොකොට ස්වරූප උදූරන ලදී.

[සැ: යු:- මෙහිදී ගණ්ඨි ප්‍රශ්නෝත්තර ස්වරූප ඉහත ''වන්වපෙන්'' ස්වරූප කථනයට අසමානව ප්‍රශ්න කරමින් පිළිතුරු දෙන ලදී. අපි වනාහි වන්වපෙන් ස්වරූප ක්‍රමය කැමති වෙමු. මේ ගැන සිහිකර බලන්න.]

පටිසන්ධි චිත්තං පන චුති චිත්තඤ්ච එකූනවීසති භවංගස්සෙව අන්තොගධත්තා චිත්තන්තරං න හොතීති න තස්ස වජ්ජනං කතං ( අභිධම්මත්ථ විභාවිනි ටීකා)

පන, – අන්‍ය කාරණයක් කියන්නෙමි. පටිසන්ධි චිත්තඤ්ච,– ප්‍රතිසන්ධි චිත්තය ද, චුති චිත්තඤ්ච, – චුති චිත්තය ද, එකූණවීසති, භවංගස්සෙව, – එකුන් විස්සක් වූ භවංග , චිත්තයාට ම, අන්තොගධත්තා, → ඇතුලත් වූ බැවින්, චිත්තන්තරං, – අන්‍ය චිත්තයක්, වා, – නොහොත්, නහොති, – නොවෙයි.ඉති තස්මා, – එනිසා, තස්ස,- ඒ ප්‍රතිසන්ධි චිත්තය හා චුති - චිත්තයාගේ ද, වජ්ජනං, - අත්හැරපීමක්, නකතං,- නොකරන ලදී.

ප්‍ර:- රූප නූපදවන්නා වූ චිත්තයෝ කොපමණ වෙත් ද,

උ:- සියලුම සත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තය, ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ගේ චුති චිත්තය, දෙපස් විඤ්ඤාණ සිත් දසය, අරූප විපාක සතරය යන මේ සිත් දහසය රූප ඉපදවීමට සමත් නොවෙති.

[සැ: යු:- මූල ටීකාචාර්‍ය පාදයො වනාහි, ක්ෂීණාශ්‍රව චුති චිත්තය පමණක් නොව සියලු සත්වයන්ගේ චුති චිත්තයයි ද, අනුටීකාචාර්‍ය පාදයො, සියලු සත්වයන්ගේ චුති චිත්තය පමණක් නොව චුති චිත්තයට පූර්වයෙහි සතළොස්වැනි චිත්තයේ පටන් චුති චිත්තය දක්වා රූප ඉපදවීමට අසමර්ථ යයි කිහ.]

සබ්බසත්තානඤ්හි පටිසන්ධි චිත්තං ඛීණාසවස්ස චුතිචිත්තං ද්වෙපඤ්ච විඤ්ඤාණානි චත්තාරි අරූප විපාකානීති සොළස චිත්තානි රූපං න සමුට්ඨාපෙන්ති. **(විභංග අට්ඨකථා)**

හි - සච්චං, - සත්‍යයකි. සබ්බ සත්තානං, - සියලුම සත්වයන්ගේ, පටිසන්ධි චිත්තං, - ප්‍රතිසන්ධි චිත්තය ද, ඛීණාසවස්ස, – ක්ෂීණාශ්‍රවයන්ගේ; චුතිචිත්තං, --චුති චිත්තය ද, ද්වෙපඤ්ච විඤ්ඤාණානි,–දෙපස් විඤ්ඤාණ සිත් දශය ද, චත්තාරි-සතරක් වූ, අරූප විපාකානි, – අරූප විපාක චිත්තයොද, ඉති, – මෙසේ සොළසචිත්තානි,– දහසයක් වූ චිත්තයො, රූපං, – චිත්තජ රූප, – න සමුට්ඨාපෙන්ති, – නූපදවත්,

ප්‍ර:- ප්‍රතිසන්ධි චිත්තය රූප නූපදවන්නේ කුමක් හෙයින් ද,

උ:- නිශ්‍රය වූ වස්තු රූපය ඉතා දූර්වල බැවින් ද ප්‍රතිෂ්ඨාවක් නැති බැවින්ද ආගන්තුක බැවින් ද ප්‍රතිසන්ධි චිත්තය රූප නූපදවයි. **(විභංගට්ඨ කථාව අනුවයි)**.

තවද:- කර්මවේගයෙන් ඔසවා දමන ලද්දක් බැවින් ද. තමන්ට පිහිටීමට ඉපද ධීතියට පත් වස්තු රූපයක් නොමැති බැවින් ද දූර්වල බැවින් ද ප්‍රතිසන්ධි චිත්තය රූප ඉපදවීමට සමත් නොවේ. **(පට්ඨාන අට්ඨකථාව අනුවය)**

තත්ථ පටිසන්ධි චිත්තං තාව වත්ථුනො දුබ්බලතාය අප්පතිට්ඨිතතාය පච්චය වෙකල්ලතාය ආගන්තුකතාය ච රූපං නසමුට්ඨාපෙති **(විභංගට්ඨ කථා)**

නත්ථි, - ඒ සිත් දහසය අතුරෙන්, පටිසන්ධි චිත්තං, -ප්‍රතිසන්ධි චිත්තය, වත්ථුනො, - නිශ්‍රය ලබන වස්තු රූපයාගේ, දුබ්බලතාය, -දුර්වල බැවින් ද, අප්පතිට්ඨිතතාය ච, ඨිතියට පත්වූ වස්තු රූපයක් නොමැති බැවින් ප්‍රතිෂ්ඨා රහිත බැවින් ද , පච්චය වෙකල්ලතාය ච,- ප්‍රත්‍ය විකලත්වය නිසාද, වා, - නොහොත්, පච්ඡාජාත ප්‍රත්‍ය නොමැති බැවින් ද, ආගන්තුකතාය ච,- අභිනව ආගන්තුක බැවින් ද, රූපං, - චිත්තජ රූප, - නසමුට්ඨාපෙති, - නූපදවයි.

කස්මා පන පටිසන්ධික්ඛණෙ චිත්තං චිත්තජ රූපං ජනෙතුං නසක්කොතීති, කම්මවෙගක්ඛිත්තතාය චෙව අප්පතිට්ඨිත වත්ථුතාය ච දුබ්බලත්තා, (පට්ඨාන අට්ඨකථා).

පන, - දක්වන්නෙමි, කස්මා, කුමක් හෙයින්, පටිසන්ධික්ඛණෙ,- ප්‍රතිසන්ධි ක්ෂණයෙහි, චිත්තං, - සිත, චිත්තජරූපං, - චිත්තජරූපය, ජනේතුං, - ඉපදවීමට, න සක්කොති, - අසමත් වේද , ඉති, - මේ වනාහි ප්‍රශ්නයයි. කම්මවෙගක්ඛිත්තතාය චෙව - කර්මවේගයෙන් ඔසවා දමන ලද බැවින් ද, අප්පතිට්ඨිත වත්ථුතාය ච, - නොපිහිටි වස්තු රූප ඇති බැවින් ද, දුර්වල බැවින්ද, (න සක්කොති) නොසමත් වේ.

[සැ: යු:- ක්ෂීණාශ්‍රවයන් ගේ චුති චිත්තය, දෙපස් විඤ්ඤාණ සිත් දශය, අරූප විපාක සිත් සතර යන මේ චිත්තයන්, රූප නූපදවීමට හේතුව ප්‍රශ්නෝත්තර සාධක පාඨ හා අර්ථානුසාරයෙන් දත යුතුය.]

ඛිණාසවස්ස පන චුති චිත්තං වට්ටමූලස්ස වූපසන්තත්තා රූපං න සමුට්ඨාපෙති, **(විභංග අට්ඨකථා)**

ඛිණාසවස්ස පන, - ක්ෂීණාශ්‍රවයන්ගේ වනාහි, චුතිචිත්තං, - චුති චිත්තය, වට්ටමූලස්ස, - සංසාර වට්ට මූලයාගේ, වූපසන්තත්තා, - සම්පූර්ණයෙන් සංසිඳුන බැවින්, රූපං, - චිත්තජ රූපය, න සමුට්ඨාපෙති, - නූපදවයි.

ද්විපඤ්ච විඤ්ඤාණෙසු ඣානංගං නත්ථි මග්ගංගං නත්ථි හේතු නත්ථීති චිත්තංගං දුබ්බලං හොතීති චිත්තංග දුබ්බලතාය තානි රූපං න සමුට්ඨාපෙන්ති. **(විභංගට්ඨ කථා)**

පන,-අන් කරුණක් දක්වන්නෙමි, ද්විපඤ්ච විඤ්ඤාණෙසු,-දෙපස් විඤ්ඤාණ සිත් දසයෙහි. ඣානංගං නත්ථි, - ධ්‍යානාංගයක් නැත. මග්ගංගං නත්ථි, - මාර්ගාංග නැත. හේතු නත්ථි, - හේතුවක් නැත. ඉති තස්මා, - එනිසා, - චිත්තංගං, - චිත්තාංගය, දුබ්බලං, - දුර්වල, හොති, - වෙයි. ඉති තස්මා චිත්තංග දුබ්බලතාය, - මෙසේ චිත්තාංග දුර්වල බැවින්, තානි, - ඒ දෙපස් විඤ්ඤාණ සිත් දස දෙන, රූපං, - රූපය න සමුට්ඨාපෙන්ති, නූපදවත්,

චත්තාරි අරූප විපාකානි තස්මිං භවෙ රූපස්ස නත්ථිතාය රූපං න සමුට්ඨාපෙන්ති **(විභංග අට්ඨකථා)**

චත්තාරි, – සතරක් වූ, අරූප විපාකානි, – අරූප විපාක චිත්තයෝ, තස්මිං භවේ ඒ අරූප භවයෙහි, රූපස්ස නත්ථිතාය, – රූප නැති බැවින්, රූපං න සමුට්ඨාපෙන්ති, රූප නූපදවත්.

ප්‍ර:– අව්‍යාකෘත මූලයෙන් ඒකමූලයෙහි ප්‍රතිසන්ධිකර්මජ රූප පමණක් ස්වරූප උදුරා කුමක් හෙයින් ප්‍රවෘත්ති කර්මජ රූප ස්වරූප වශයෙන් නොඋදුරන ලදද.?

උ:– ප්‍රතිසන්ධි කර්මජ රූපය වනාහි සිත සමග එකට උපදනා බැවින් ස්වරූප වශයෙන් ලැබේ. ප්‍රවෘත්ති කර්මජ රූප වනාහි සිත ඇත්තේ නමුත් සිත හා එකට නූපදින බැවින් ස්වරූප වශයෙන් නොගන්නා ලදී.

කස්මා පනායං හේතු පටිසන්ධියමේව කටත්තා රූපානං හේතු පච්චයෝ හෝති න පවත්තේති, පටිසන්ධියං කම්මජ රූපානං චිත්තපටිබද්ධ වුත්තිතාය පවත්තියං පන තෙසං චිත්තේ විජ්ජමානෙපි කම්ම පටිබද්ධාව පවත්ති, න චිත්තපටිබද්ධාති අවිජ්ජමානෙවාපි චිත්තේ නිරෝධසමාපන්නානං උප්පජ්ජන්ති යේව, **(පට්ඨාන, අට්ඨකථා)**

පන, – ප්‍රශ්නෝත්තර දක්වන්නෙමි. කස්මා, කුමක් හෙයින්, අයං හේතු, – මේ හේතු ධර්ම සදෙන, – පටිසන්ධියමේව, – ප්‍රතිසන්ධි කාලයෙහි පමණක්ම, කටත්තා රූපානං, – කටත්තා රූපයන්ට, වා, – නොහොත්, කර්මජ රූපයන්ට, හේතුපච්චයො හෝති, – හේතු ප්‍රත්‍ය වේද, පවත්තෙ න හෝති, – ප්‍රවෘත්ති කාලයෙහි නොවෙයි ද, ඉති, – මේ වනාහි ප්‍රශ්නයයි.

පටිසන්ධියං, – ප්‍රතිසන්ධියෙහි, කම්මජ රූපානං, – කර්මජරූපයන්ගේ චිත්ත පටිබද්ධවුත්තිතාය, – චිත්තය හා සම්බන්ධව පැවතුම් ඇති බැවින්, (හෝති න හෝති) පන, – පිළිතුරු දෙන්නෙමි, – පවත්තියං, – ප්‍රවෘත්ති කාලයෙහි, තෙසං, – ඒ කර්මජ රූපයන්ගේ , පවත්ති, – පැවැත්ම, චිත්තෙ විජ්ජමානෙපි, – සිත ඇති කල්හි ද, කම්ම පටිබද්ධාව, – කර්මප්‍රතිබද්ධවම වේ. න චිත්තපටිබද්ධා, – චිත්තප්‍රතිබද්ධ නොවේ චිත්තේ අවිජ්ජමානේපි, – සිත පැහැදිලිව නොපවත්නා කල්හි ද, නිරෝධ සමාපන්නානං, නිරෝධ සමාපන්න ආයඖ පුද්ගලයන්ට, උපපජ්ජන්ති යේව, – ඒ කර්මජරූපයෝ උපදිත්මය.

ප්‍ර:– කර්මජ රූපයෝ කුමක් හෙයින් ප්‍රතිසන්ධි කාලයෙහි සිත හා සමග සම්බන්ධ වෙත්ද, ප්‍රවෘත්ති කාලයෙහි චිත්තපටිබද්ධ නොවෙත් ද.

උ:– ප්‍රථමයෙන් අංකුරය හටගැනීමේ දී කෙතත් ජලයත් ඇති නමුත් බීජයාගේම ආනුභවයෙන් අංකුරය හටගන්නේය. බීජය නැතත් පොහොර ජලය හේතුකොට එම වෘක්ෂය මතු මත්තෙහි වැඩෙන්නේය. එමෙන් ප්‍රතිසන්ධි කාලයෙහි කර්මජ රූපයෝ කර්ම තෘෂ්ණාවන් ඇතත් සිත හා සමග බැඳී උපදිත්, ප්‍රවෘත්ති කාලයෙහි සිත නැතත් කර්මය හා බැඳී හටගනිති.

සන්තේපි ඛෙත්තෙ ආපේ ච පඨමුප්පත්තියං බීජානුභාවේන රුක්ඛුප්පත්ති විය පටිසන්ධික්ඛණේ චිත්තානු භාවේන රූපකායස්ස උප්පත්ති, බීජෙ පන විගතෙපි පඨවි ආපානුභාවෙන රුක්ඛස්ස උපරූපරි පවත්ති විය විනා චිත්තෙන කම්මතෝව කටත්තා රූපානං පවත්ති හොතීති වේදිතබ්බා, වුත්තම්පි චෙතං කම්මං ඛෙත්තං විඤ්ඤාණං බීජං තණ්හා ස්නෙහොති.

ඛෙත්තෙ ච, – කුඹුරත්, ආපෙ ච, – වතුරත්, සන්තෙපි, – ඇත්තේ නමුත්, පඨමුප්පත්තියං, – ප්‍රථම අංකුර උත්පත්තියෙහි දී, බීජානුභාවෙන – බීජයාගේ ශක්තියෙන්, රුක්ඛුප්පත්ති, – වෘක්ෂයාගේ උත්පත්තිය, හොති විය, – වන්නාක් මෙන්, පටිසන්ධික්ඛණේ, – ප්‍රතිසන්ධික්ෂණයෙහි දී, චිත්තානුභාවෙන, – චිත්තයාගේ ආනුභාවයෙන් . රූපකායස්ස, – රූපකායයාගේ, උප්පත්ති, – උත්පත්තිය, හෝති වේ.

පන, – පැහැදිළි කරන්නෙමි. බීජෙ, – බීජය, විගතෙපි, – ශක්තිය නැති වූ කල්හි ද, පඨවි ආපානු භාවේන, – පොහොර ජලය ඇනුභාවයෙන්, රුක්ඛස්ස, – වෘක්ෂයාගේ උපරූපරි, – මතු මත්තෙහි, පවත්ති, – පැවැත්ම හොති විය, – වන්නාක් මෙන් චිත්තෙන විනා, – චිත්තය තොරවත්, කම්මතොව, – කර්මහේතුවෙන්ම, කටත්තා රූපානං කර්මජ රූපයන්ගේ, පවත්ති හෝති,–පැවැත්ම වේ.ඉති,– මෙසේ, වේදිතබ්බා, දතයුතුය, ච - සච්චං, – සත්‍යයකි. ''කම්මං ඛෙත්තං විඤ්ඤාණං බීජං තණ්හා ස්නෙහො'' යයි 'එතම්පි වචනං, – මේ වචනය ද, වුත්තං වදාරණ ලදී. කම්මං, – කර්මය ඛෙත්තං, – කෙතය, විඤ්ඤාණං, – විඤ්ඤාණය, බීජං, – බීජය, තණ්හා,–තෘෂ්ණාව, ස්නෙහො, ජලයයි,

ප්‍ර:- චිත්ත – චෛතසික – නිර්වාණය පමණක් නාම නම් වී කුමක් හෙයින් රූපය නාම නම් නොවන්නේද,?

උ:- චිත්ත චෛතසික නිර්වාණයන් වනාහි නාමයෙන් වෙන්ව පැහැදිළි නොවන බැවින් නාම නම් වෙති. රූපය වනාහි නාමෙන් තොරව ද පැහැදිළි බැවින් නාම නම් නොවේ.

නාමයති විනා නාමෙන පාකටං නහොතීති නාමං, රූපයති විනා නාමෙන පාකටං හෝතීති රූපං, – **(යමක මූල ටීකා)**

නාමෙන, – නාමයෙන්, විනා, – වෙන්ව, පාකටං, – ප්‍රකට වීමක්, නාමයති නහොති, – නොවෙයි, ඉති තස්මා, – එහෙයින්, නාමං, – නාමය නම් වේ. නාමෙන නාමයෙන්, විනා, – වෙන්ව,පාකටං, – ප්‍රකට වීමක්, රූපයති හෝති, – වෙයි, ඉති තස්මා, – එහෙයින්, රූපං, – රූපය නම් වේ.

ප්‍ර:- නාමපද ඒක මූල යමක විස්සර්ජනාවෙහි, අහේතුකං නාමං නාමමූලෙන ඒකමූලං, කියාද, අහේතුකං නාම මූලෙන ඒකමූලං කියාද පාඨ දෙකක් ඇති බැවින් කවර පාඨයක් නිවැරදිද,?

උ:- පාඨ දෙකම නිවැරදිය, නාමං යන පාඨය වඩාත් පැහැදිලි වීම පිණිස සම්බන්ධ කොට කියන ලද්දකි. නාමං යන්න නැති පාඨය යෙ කේචි නාමා ධම්මා යනුවෙන් නාමය උද්ධරන ලද බැවින් වටහා දීම පිණිස නැවත නාමං යයි නොකීවේ ද හැඟෙන බැවිනි.

[සැ: යු:- ගණ්ඨියෙහි ප්‍රශ්නය අවුල් සහිත වුවද ප්‍රධාන අර්ථය ස්වරූප වශයෙන් ගන්නා ලදී. මූල ටීකාවෙහි දෙපදයම කියා ඇති බැවින් සුදුසු අර්ථය ගතයුතු.]

යස්සං පාළියං සහේතුකං නාමං නාම මූලේන ඒකමූලං අහේතුකං නාමමූලෙන ඒකමූලන්ති පාඨො ආගතො, තත්ථ යෙකේචි නාම ධම්මාති නාමානං උද්ධරිතත්තා අහේතුකං සහේතුකන්ති ච වුත්තෙ නාමන්ති ච ඉදං විඤ්ඤායමානමෙවාති වුත්තන්ති වෙදිතබ්බං, යත්ථ පන අහේතුකං නාමං සහේතුකං නාමන්ති ච පාඨො තත්ථ සුපාකට භාවත්ථං නාමන්ති වුත්තන්ති, **(යමක මූල ටීකා)**

යසසං පාළියං, - යම් පාළියෙක්හි, අහේතුකං - පෙ - ඒකමූලන්ති, යනුවෙන්, පාඨො, - පාඨයක්, ආගතො, - ආවේ ද, තත්ථ, - එහි යෙ කේචි නාමා ධම්මාති,- යනුවෙන්, නාමානං, - නාමයන්, උද්ධරිතත්තා,- උද්ධරණය කළ බැවින්, අහේතුකං සහේතුකන්තිච, අහේතුකං සහේතුකං කියා ද, වුත්තෙ, - කී කල්හි. නාමන්ති ච ඉදං, නාමං යන මේ වචනය, විඤ්ඤායමානමෙව, - හැඟෙනුයේම, හෝති, - වෙයි. ඉති තස්මා, - එනිසා' වුත්තං ඉති වෙදිතබ්බං, - කියන ලදැයි දත යුතුය. පන,- පැහැදිලි කර දක්වන්නෙමි. යත්ථ, - යම් පාළියෙක් හි අහේතුකං නාමං සහේතුකං නාමන්ති ච, - අහේතුකං නාමං සහේතුකං නාමං යනුවෙන් ද, පාඨො, - පාඨයක්, ආගතො,- ආයේ ද, තත්ථ, - එහි, සුපාකටභාවත්ථං, - මනාසේ ප්‍රකට වීම පිණිස, නාමන්ති වුත්තං, - නාමං යයි කියන ලදැයි. ඉති වෙදිතබ්බං, - මෙසේ දත යුතු. ඉති, - මේ වනාහි නිගමනයයි.

මූල යමකය නිමි.

# ස්කන්ධ යමකය

## ප්‍රඥප්ති වාරය

## ගණ්ඨි පද ශෝධනය

ප්‍ර: මූලයමකයට අනතුරුව ආයතන යමකාදිය නොදෙසා කුමක් හෙයින් ස්කන්ධ යමකය වදරණ ලද්දේද යත්,

උ:- ආයතන දොළසක් ධාතු දහ අටක් ඇති බැවින් ප්‍රභේද අධික වූ යමක පළමුව නොදෙසන ලදහ. ස්කන්ධ වනාහි පහක්ම බැවින් ප්‍රභේද අඩු බැවින් ස්කන්ධ යමකය ආයතනාදීන්ට පළමුව වදරණ ලදී.

ප්‍ර:- අඩු ප්‍රභෙද ඇති බැවින් ස්කන්ධ පළමුවදේශනා කරන්නේ නම් සංස්කාර යමකය එතැනට දේශනා කිරීමට සුදුසු නේද?

උ:- සුදුසු නොවේ. ස්කන්ධ යමකය වනාහි නිර්වාණය හැර සෙසු සියලු ධර්ම ඇතුලත් බැවින් ස්කන්ධ යමකය ම දේශනාකිරීම සුදුසු වේ. ප්‍රභේද අඩු බැවිනි.

අප්පභෙදත්තා. නිබ්බාන වජ්ජානං සබ්බධම්මානං සංගහිතත්තා ච **(යමක මූලටීකා)**.

අප්පභෙදත්තා, - ප්‍රභේද අඩු බැවින් ද, නිබ්බාන වජ්ජානං, - නිර්වාණය වර්ජිත කොට ඇත්තා වූ, සබ්බධම්මානං, - සර්ව ධර්මයන්, සංගහිතත්තා ච, - ඇතුලත් කොට ගන්නාලද බැවින් ද, කියන ලදී.

ප්‍ර:- ස්කන්ධ සතරක් සයක් යනාදීන් අඩු වැඩි නොකොට කුමක් හෙයින් පහක් ම වදරණ ලද්දේද යත්.

උ:- සියලු සංඛත ධර්මයන් එක්තැන් කොට සංග්‍රහ කරන බැවින් ද, මමය මගේ යයි ගනු ලබන වස්තූන් ස්කන්ධ පඤ්චකයට වඩා වැඩි නොවන බැවින් ද, අන්‍ය ධර්මයන් ද ස්කන්ධ පඤ්චකයෙහි ඇතුලත් වන බැවින් ද, ස්කන්ධ සතරක් සයක් යනාදීන් අඩු වැඩි නොකොට ස්කන්ධ පහක්ම වදරණ ලදී.

කස්මා පන භගවතා පඤ්චෙව ඛන්ධා වුත්තා අනූනා අනධිකාති, සබ්බ සංඛත සභාගෙකසංගහතො අත්තත්තනියගාහ වත්ථුස්ස එත පරමතො අඤ්ඤෙසඤ්ච තදවරොධතො, **(විභංගට්ඨකථා)**

කස්මා පන, - කුමක් හෙයින් වනාහි, භගවතා, - භග්‍යවතුන් වහන්සේ විසින් අනූනා, - අඩුනොවූ, - අනධිකා, - වැඩි නොවූ, පඤ්චෙව, - පසක් ම වූ, ඛන්ධා-ස්කන්ධයෝ, වුත්තා වදරණ ලද්දහු ද, සබ්බ සංඛත සභාගෙකසංගහතො ච, - සියලු සංඛත ධර්මයන් සමානත්වයෙන් ඒක්තැන සංග්‍රහ වන බැවින් ද, අත්තත්තනියගාහ වත්ථුස්ස, - මමය මාගේ යයි ගනු ලබන වස්තූන්ගේ, එතපරමතොව, - මෙ ස්කන්ධ යන් පස්දෙනම පරම කොට ඇති බැවින් ද අඤ්ඤෙසං, - අන්‍යවූ ද, ධර්මයන්, තදව රොධතො ච, - ඒ ස්කන්ධ පඤ්චකයෙහිම ඇතුලත්වන බැවින් ද, (පඤ්චෙව ඛන්ධා වුත්තා)

ප්‍ර:- වේදනාස්කන්ධාදිය පළමු කොට නොවදරා කුමක් හෙයින් රූපස්කන්ධය පළමු කොට වදරණ ලද්දේද,?

උ:- සුවසේ ගැනීම පිණිස චක්ෂුර් විඥානාදීන්ට ආරම්මණ වන්නාවූ ඖදරික රූපස්කන්ධය පළමු කොට වදරණලදී.

[සැ: යු:- වේදනාස්කන්ධාදීන් පෙර පසු අනුපිළිවෙලින් දේශනා කිරීම් හේතුව සාධක පාඨ අනුසාරයෙන් අවබෝධ කළ යුතු.]

සුඛගහණත්ථං චක්ඛුආදීනං විසයභූතං ඔළාරිකං පඨමං රූපක්ඛන්ධං දස්සෙති තතො ඉට්ඨානිට්ඨ රූප සංවේදිතං වේදනං,යං වේදයති තං සඤ්ජානාතීති එවං වේදනා විසයස්ස ආකාරග්ගාහිකං සඤ්ඤං, සඤ්ඤාවසේන අභිසංඛාරකෙ සංඛාරෙ තෙසං වේදනාදීනං නිස්සයං අධිපතිභූතඤ්ච විඤ්ඤාණං, **(විභංගට්ඨකථා)**

සුඛගහණත්ථං,- සුවසේ ගැනීම පිණිස, චක්ඛු ආදීනං,- චක්ඛු විඤ්ඤාණාදීන්ගේ, විසය භූතං, - ආරම්මණය වූ, ඔළාරිකං, - ඖදරික වූ, රූපක්ඛන්ධං, - රූපස්කන්ධය, පඨමං, - ප්‍රථමයෙන්, දස්සෙති, - දක්වයි. තතෝ, - ඉන් පසු, ඉට්ඨානිට්ඨ රූප සංවේදිතං, - ඉෂ්ටාරම්මණ අනිෂ්ටාරම්මණ රස විඳිනය කරන්නා වූ, වේදනං, - වේදනාව දක්වයි, යං, - යම්බඳු ඉෂ්ටානිෂ්ට අරමුණ රසයක්, වේදයති, - විත්දනය කෙරේද, තං, - එය. සඤ්ජානාති, - හඳුනාගනී, ඉති එවං, - මෙසේ, වේදනා විසයස්ස, - වේදනාවට අරමුණුවූ, ආරම්මණයාගේ, ආකාරග්ගා හිකං, - ආකාරය ගන්නා වූ, සඤ්ඤං, - සංඥව දක්වයි. සඤ්ඤා වසෙන, - සංඥවගේ වශයෙන්, අභි-සංඛාරකෙ, - ආත්ම සන්තානය රැස්කරන්නා වූ, සංඛාරෙ, - සංස්කාරයන්, දක්වයි. තෙසං වේදනාදීනං, - ඒ වේදනාදීන්ගේ, නිස්සයඤ්ච,- නිශ්‍රය වූද, අධිපති භූතඤ්ච, අධිපති වූද, විඤ්ඤාණං, - විඤ්ඤාණය දක්වයි.

ප්‍ර:- රූපස්කන්ධයෙහි ස්කන්ධ ශබ්දය කොපමණ අර්ථයෙක්හි වැටේද,?

උ:- ගුණාර්ථය, රාශි අර්ථය, නාමප්‍රඥප්ති අර්ථය, රූළ්හී අර්ථය යන මෙ අර්ථ සතරෙහි ස්කන්ධ ශබ්දය වැටේ.

ඛන්ධො ගුණෙච රාසිම්හි – පණ්ණත්තියඤ්ච රූළ්හියං,
**(අභිධානප්පදීපිකා)**

ඛන්ධො, - ස්කන්ධ ශබ්දය, ගුණෙච, - ගුණාර්ථ යෙහිද, රාසිම්හි, - රාශි අර්ථ යෙහි ද, **පණ්ණත්තියඤ්ච**, - නාම ප්‍රඥප්ති අර්ථයෙහි ද, රුළ්හියං, - රුළ්හි අර්ථ-යෙහි ද, වත්තති, - වැටේ.

සීලක්ඛන්ධො සමාධික්ඛන්ධො,-සීලක්ඛන්ධො,-සීලස්කන්ධය යනු ගුණ අර්ථ-යයි සමාධික්ඛන්ධො,-සමාධිස්කන්ධොයනුද ගුණ අර්ථයයි,,**(ගුණඅර්ථ)** අසංඛෙය්‍යො අප්පමෙය්‍යො මහා උදකක්ඛන්ධොත්වෙව සංඛ්‍යං ගච්ඡති,-අසංඛෙය්‍යො, - සංඛ්‍යා පථය ඉක්ම ගියා වූ, අප්පමෙය්‍යො, - ප්‍රමාණාතික්‍රාන්තවූ, මහා උදකක්ඛන්ධොත්වෙව, මහා උදක රාශියක් ම යැයි, සංඛ්‍යං ගච්ඡති, - සංඛ්‍යාවට යයි. **(රාශිඅර්ථයයි)** අද්දසා ඛො භගවා දරුක්ඛන්ධං ගංගාය නදියා සොතෙන වුය්හමානං, භගවා, - භාග්‍යවතුන් වහන්සේ, ගංගාය නදියා, - ගංගා නම් වූ නදියෙහි, - සොතෙන, - සැඩ දිය පහරින්, වුය්හමානං, - පාවී යන්නා වූ දරුක්ඛන්ධං, - දව කඳක්, අද්දස, - දුටු සේක. **(නාම ප්‍රඥප්ති අර්ථයයි)** විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො, - විඤ්ඤාණං, - විඥනය විඤ්ඤාණක්ඛන්ධො, - විඥනස්කන්ධ නම් වේද, **(රුළ්හි අර්ථයයි)**

ප්‍ර:- රූපක්ඛන්ධො යන්නෙහි ඛන්ධ ශබ්දය කවර අර්ථයක වැටේද,?

උ:- රාශි අර්ථයෙහි වැටේ.

ස්වාය මිධ රාසිතො අධිප්පෙතො - **(විභංග අට්ඨකථා)**

ඉධ, - මෙහිදී, ස්වායං - සො අයං ඛන්ධ සද්දෙ, - මේ ඛන්ධ ශබ්දය, - රාසිතො, සමූහය රාශිය යන අර්ථ වශයෙන්, අධිප්පෙතො, - අදහස් කරනු ලැබේ.

ප්‍ර:- කුමක් හෙයින් ඛන්ධ නම් වේද,?

උ:- ධර්මයන් සමූහ වශයෙන් ඇති බැවින් රාශි අර්ථයෙහි ඛන්ධ නම වැටේ.

ප්‍ර:- කවර නම ධර්ම කෙනෙක් සම්පිණ්ඩනය කොට ඇත්තාහුද,?

උ:- අතීත, අනාගත, වර්තමාන, අජ්ඣත්ත, බහිද්ධ සුඛුම, ඕළාරික, හීන, පණීත, දූරසන්තික වශයෙන් ඇති ධර්මයන් සම්පිණ්ඩනය කොට ඇත්තාහ.

අතීතානාගතං රූපං — පච්චුප්පන්න මථාපරං
අජ්ඣත්තංවා බහිද්ධා වා — සුඛුමොළාරිකං තථා,

හීනං පණීතං යං දූරෙ — සන්තිකෙවා තථෙකතො,
සබ්බං රූපං සමොධාය — රූපක්ඛන්ධොති වුච්චති.

**(නාමරූප පරිච්ඡේද)**

අතීතං , - අතීත වූ, යං රූපං වා, - යම් රූපයක් වේද, අනාගතං, - අනාගත වූ, යං රූපංවා - යම් රූපයක් වේ ද, අථාපරං, නැවතද අන්‍ය වූ පච්චුප්පන්නං - වර්තමාන වූ, යං රූපං වා, - යම් රූපයක් වේ ද, අජ්ඣත්තං, - අධ්‍යාත්මික වූ, යං රූපං වා, - යම් රූපයක් වේද, බහිද්ධා, - බාහිර වූ, යං රූපං වා, යම් රූපයක් වේ ද, සුඛුමං, - සූක්ෂම වූ, - යං රූපං වා, - යම් රූපයක් වේ ද, තථා, එසේම, ඔළාරිකං, - ඖදරික වූ, යං රූපං වා, - යම් රූපයක් වේද, හීනං, - හීනවූ, යං රූපං වා, - යම් රූපයක් වේද, පණීතං, - ප්‍රණීත වූ, යං රූපං වා, - යම් රූපයක් වේද, දූරෙ, - දූර වූ, යං රූපං වා, - යම් රූපයක් වේද, සන්තිකෙ, - සමීපයෙහි වූ, යං රූපං වා, - යම් රූපයක් වේද, සබ්බං තං රූපං, - ඒ සියලු රූපය, සමොධාය, සම්පිණ්ඩනය කොට, රූපක්ඛන්ධොති,-රූපස්කන්ධයයි. වුච්චති, - කියනු ලැබේ. (වේදනාස්ඛන්ධයෙහිද මේ ක්‍රමයයි.)

පරිඤ්ඤාසු වන විනා තීරණ පරිඤ්ඤාය පහාණ පරිඤ්ඤා, තීරණඤ්ච සම්පුණ්ණ පරානුග්ගහස්ස අධිප්පෙතත්තා, කායපුග්ගලෝකාස විභාග මුඛෙන ඛන්ධානං විසුං විසුං සහච උප්පාද නිරෝධ ලක්ඛණ පරිග්ගවසෙන සාතිසයං සම්භවති,න අඤ්ඤථාති ඉමමත්ථං දස්සෙන්තො ඡසු කාලභෙදේසු - පෙ - පරිඤ්ඤා ච වත්තබ්බාති පධානං වත්තබ්බං උද්ධරති. **(යමක අනුටීකා)**

ච,-නැවත කියන්නෙම්,පරිඤ්ඤාසු,-තුනක්වූ පරිඤ්ඤා අතුරෙන්, තීරණ පරිඤ්ඤාය, - තීරණ පරිඤ්ඤාවෙන්, විනා,-වෙන්ව, පහාන පරිඤ්ඤා, - ප්‍රහාන පරිඥාව, න හොති, - නොවෙයි, ච සච්චං, - එද සත්‍යයකි. තීරණං, - තීරණ පරිඤ්ඤාව, සම්පුණ්ණ පරානුග්ගහස්ස, - සම්පූර්ණයෙන් අන්‍යයාට අනුග්‍රහ කිරීම. - අධිප්පෙතත්තා' අදහස් කරන ලද බැවිනි. කාල පුග්ගලෝකාස විභාග මුඛෙන, - කාල පුද්ගල, භූමි විභාග කිරීමේ දෙරවුවෙන්, ඛන්ධානං, ස්කන්ධයන්ගේ, විසුං විසුං ච, - වෙන් වෙන් වද, සහ ච, එක්ව ද, උප්පාද නිරෝධලක්ඛණ පරිග්ගහ වසෙන, - ඇතිවීම නැතිවීම, පිළිබඳ ලක්ෂණ විදර්ශනා කිරීම් වශයෙන්, සාතිසයං, - අතිශයින්, සම්භවති, - ලැබේ. අඤ්ඤථා, - අන්පරිද්දෙකින්, නසම්භවති, - නොලැබේ. ඉති ඉමං අත්ථං, - මෙසේ මේ අර්ථය, දස්සෙන්තො, - දක්වමින්, ඡසු,-සයක් වූ, කාලභෙදේසු, - කාලභෙදයන්හි, - පෙ-පරිඤ්ඤා ච, - පරිඤ්ඤාවෝ ද, වත්තබ්බා ඉති, - කිව යුත්තාහ යයි, පධානං වත්තබ්බං, - ප්‍රධාන වශයෙන් කිවයුතු වූ වචනය, උද්ධරති, - උදුරා දක්වයි.

යථා න තීරණ පරිඤ්ඤාය විනා පහාන පරිඤ්ඤා, එවං තීරණ පරිඤ්ඤා විනා ඤාත පරිඤ්ඤාය සා ච සුතමයඤාණ මූලිකාති දේසනා කුසලෝ සත්ථා අන්වයතො බ්‍යති රෙකතෝ ච සමුදවයවපදත්ථාදි විභාග දස්සන මුඛෙන ඛන්ධෙසු පරිඤ්ඤා පභෙදං පකාසේතු කාමො පඤ්චක්ඛන්ධාති ආදිනා දේසනං ආරභිති. **(යමක අනුටීකා)**

තීරණ පරිඤ්ඤාය, - තීරණ පරිඤ්ඤාවෙන්, - විනා- වෙන්ව, පහාණ පරිඤ්ඤා, පහාන පරිඤ්ඤාව, න හොති යථා, නොවන්නේ යම් සේද, එවං තථා, - එසේම, ඤාත පරිඤ්ඤාය, ඤාය පරිඤාවෙන්, විනා, - වෙන්ව තීරණ පරිඤ්ඤා තීරණ

පරිඤ්ඤාව න හොති නොවෙයි, පැහැදිලි කරන්නෙමි, යා, - ඒ ඤාත පරිඤ්ඤාව සුතමයඤාණ මූලිකා, සුතමය ඤාණය, මුල්කොට ඇත්තීය. ඉති, - මෙසේ, දෙසනාකුසලො සත්ථා, - දේශනා - කුශල ශාස්තෲන් වහන්සේ, අන්වයතො ච, - අන්වය වශයෙන්ද, ඛ්‍යතිරෙකතො ච, - ව්‍යතිරේක වශයෙන් ද, සමුදායාවයව-පදත්ථාදි විභාග දස්සන මුඛෙන, සමුදය අවයව පදර්ථභෙද විභාග දැක්වීම් වශයෙන්, ඛන්ධෙසු, - ස්කන්ධයන් කෙරෙහි, පටිඤ්ඤාපභෙදං, - පරිඥ ප්‍රභෙදය, පකාසෙතුකාමො, - ප්‍රකාශ කරනු කැමැත්තේ, පඤ්චක්ඛන්ධාති ආදිනා, - පඤ්චකඛන්ධා යනාදි වශයෙන්, දේසනං, - දේශනාව, ආරභි, - ආරම්භ කළ සේකැයි, ඉති ආහ, - මෙසේ කීහ.

ප්‍ර:- පරිඤ්ඤා තුන අනුපිළිවෙළින් ලැබෙන සැටි පැහැදිළිව දක්වන්න.

උ:- රූපය රුප්පන ලක්ෂණ ඇත්තේය. ඵස්සය ඵුසන ලක්ෂණ ඇත්තේය. යනාදි වශයෙන් පෞද්ගලික ලක්ෂණ හා පොදු ලක්ෂණ අවබෝධ කර ගන්නාවූ ඤාණය නම් වූ දිට්ඨි කංඛාවිතරණ විසුද්ධිහු ඤාතපරිඤ්ඤාවයි. ඉන් අනතුරුව සත්‍යානුලෝමික ඥනය තෙක් විදර්ශනාඥාන තීරණ පරිඤ්ඤාවය උදයව්‍යායානු පස්සනා ඤාණයේ පටන් මාර්ගය දක්වා ඥන පහාන පරිඤ්ඤාව යැයි දතයුතු.

රුප්පන ලක්ඛණං රූපං ඵුසන ලක්ඛණො ඵස්සොති ආදිනා සාමඤ්ඤ විසේස ලක්ඛණ පරිග්ගාහිකා දිට්ඨි කංඛාවිතරණ විසුද්ධියො ඤාත පරිඤ්ඤා තතොපර යාවානුලොමා තීරණ පරිඤ්ඤා, උදයබ්බයානු පස්සනතො පට්ඨාය යාව මග්ගා පහාන පරිඤ්ඤා **(විභංග මූල ටීකා)**

රූපං, - රූපය, රුප්පන ලක්ඛණං, - රුප්පන ලක්ෂණ ඇත්තේය, ඵස්සො ඵස්සය, ඵුසන ලක්ඛණො, - ඵුසන ලක්ෂණ ඇත්තේය. ඉති ආදිනා,-මෙ ආදි වශයෙන් සාමඤ්ඤ විසේස ලක්ඛණ පරිග්ගාහිකා, -පොදු ලක්ෂණ විශේෂ ලක්ෂණ පරිග්‍රහණය කරන්නා වූ, දිට්ඨි කංඛාවිතරණ විසුද්ධියො, - දිට්ඨි විසුද්ධි කංඛාවිතරණ විසුද්ධිහු ඤාතපරිඤ්ඤා,-ඤාත පරිඥඤාව නම් වේ.තතොපරං,-ඉන්පසු,යාවානුලොමා,සත්‍යානු ලෝම ඤාණය දක්වා, තීරණ පරිඤ්ඤ,-තීරණ පරිඤ්ඤාව නම් වේ. උදයබ්බයානු පස්සනාතො පට්ඨාය, - උදයව්‍යයානුදර්ශනාවේ පටන්, යාවමග්ගා, - මාර්ගඥනය දක්වා, පහාන පටිඤ්ඤා - පහාන පරිඤ්ඤාව නම් වේ.

ප්‍ර:- උදයබ්බයානුපස්සනා යනු කවර ධර්මයකට කියනු ලැබේද.

උ:- දශයක් වූ විපස්සනා ඤාණයට කියනු ලැබේ.

[සැ: යු:- ඤාණ දශය පාළි අර්ථ වශයෙන් සුගමයි.]

ප්‍ර:- අභිධර්ම දේශනාව අභිඤ්ඤෙය්‍ය කථා නම් වන බැවින් මූලයමකයෙහි කවර නම් අභිඤ්ඤෙය්‍ය කථාවක් ලැබේද.

උ:- ප්‍රත්‍යය පරිග්‍රහනය කිරීම නිමකොට ඇති ඤාණය ඤාතපරිඤ්ඤා නම් වන බැවින් හේතුව දක්වන්නා වූ මූල යමකයෙහි ඤාතපරිඤ්ඤාව ලැබේ.

පච්චය පරිග්ගහ පරියොසානා ඤාත පරිඤ්ඤාති පච්චය දීපකේන මූල යමකේන ඤාතපරිඤ්ඤං **(යමක මූලටීකා)**

පච්චය පරිග්ගහ පරියොසානා, ප්‍රත්‍ය පරිග්‍රහණය කිරීම කෙළවර කොට ඇත්තා වූ ඤාණය,ඤාතපරිඤ්ඤා,- ඤාත පරිඤ්ඤාව නම් වේ.ඉති,-මෙසේ, පච්චය දීපකෙන, - ප්‍රත්‍යය දක්වන්නා වූ, මූලයමකේන, - මූල -යමකයෙන්, ඤාතපරිඤ්ඤං ඤාතපරිඤ්ඤාව, (විභාවෙතුං ආරද්ධං)

[සැ: යු:- පරිච්ඡෙද වාරාදීන්ගේ අධිප්‍රායන් පැහැදිළි බැවින් ප්‍රශ්නෝත්තර ඇතුලත් නොකරන ලදී.]

ප්‍ර:- චක්‍රයයි කී තැන මණ්ඩලාකාර බැවින් කියනු ලැබේද.

උ:- මණ්ඩලාකාර බැවින් කියනු නොලැබේ. චක්‍රයකට සමාන බැවින් චක්‍රයයි කියනු ලැබේ.

රූපං රූපක්ඛන්ධොති එවමාදිකං මූලපදං නාභිං කත්වා ඛන්ධොති ඉදං නෙමිං වේදනාක්ඛන්ධොති ආදීනි අරෙ කත්වා චක්කභාවො වුත්තොති වෙදිතබ්බො, න මණ්ඩලභාවෙන සම්බජ්ඣනතො වේදනාක්ඛන්ධ මූලාදීසුපි හි හෙට්ඨිමං සොධෙත්වාව පාථො ආගතෝ, න මණ්ඩලබන්ධනේනාති, (යමක මූල ටීකා)

රූපං රූපක්ඛන්ධාති එවමාදිකං, - රූපං රූපක්ඛන්ධොති මේ ආදිවූ, මූල පදං, මූල පදය, නාභිං කත්වා, නැබ කොට, ඛන්ධාති ඉදං, - ඛන්ධා යන මේ පදය. නෙමිං කත්වා, - නිම් වලල්ලක් කොට, වේදනාක්ඛන්ධොති ආදීනි, - වේදනාක්ඛන්ධොති යනාදිය, අරෙ කත්වා, - අවයව කොට, චක්කභාවො, - චක්‍ර බව, වා, - නොහොත්, චක්‍රයකට සමාන බව, වුත්තො, - කියන ලද්දේ, ඉති වෙදිතබ්බො - මෙසේ දතයුතුය, මණ්ඩලභාවෙන, - මණ්ඩලාකාරයෙන්, - සම්බජ්ඣන තො, - සම්බන්ධ වන බැවින් යයි, න වුත්තො, - නොකියන ලදී. හි සච්චං, - එය සත්‍යයකි. වේදනාස්කන්ධ මූලාදීසුපි, - වේදනාස්කන්ධ මූලාදීයෙහි ද, හෙට්ඨිමං, - යට යට පිහිටි පදය සොධෙත්වාව, - ශුද්ධ කොට ම, පාඨො ආගතො, - පාඨය ආවේය. මණ්ඩල සම්බන්ධෙන, - මණ්ඩල සම්බන්ධ වශයෙන්, න ආගතෝ, - නො ආවේය, (ඉති වෙදිතබ්බො)

ප්‍ර:- ශුද්ධ ස්කන්ධවාර ප්‍රතිලෝමයෙහි ඛන්ධා රූපං - යයි සාමාන්‍ය වශයෙන් ඇතිව, කුමක් හෙයින් රූපං රූපක්ඛන්ධායයි විසේස යෝජනාවක් කරන ලද්දේද.?

උ:- රූපංයනු සාමාන්‍ය යෙදීමක් බව සැබව, නිර්දේශ වාරයෙහි රූපක්ඛන්ධො යනාදී වශයෙන් විශේෂ විභාග ඇති බැවින් රූපක්ඛන්ධා යයි විශේෂ යෝජනාව කරන ලදී.

ඛන්ධා රූපන්ති ආදිසු ඛන්ධා රූපක්ඛන්ධො, ඛන්ධා වේදනාක්ඛන්ධොති අත්ථො ගහෙතබ්බො, කස්මා නිද්දෙස වාරෙ එවං විභජිතත්තා. **(යමක අට්ඨකථා)**

ඛන්ධා රූපන්ති ආදිසු, - ඛන්ධා රූපන්ති යනාදියෙහි, ඛන්ධා - ස්කන්ධ නම වූවෝ. රූපක්ඛන්ධො, රූපස්කන්ධය නම් වේද, ඛන්ධා - ස්කන්ධ නම් වූවෝ, වේදනාක්ඛන්ධො, - වේදනාස්කන්ධය නම් වේද? ඉති අත්ථො මෙසේ අර්ථය, ගහෙතබ්බො, - ගතයුතුය. කස්මා, - කුමක් හේයින් ද නිද්දේසවාරෙ, - නිද්දේශ වාරයෙහි, එවං,-මෙසේ, ඛන්ධා රූපක්ඛන්ධො-ඛන්ධා වේදනාක්ඛන්ධො යනුවෙන් පිළිවෙලින් විභජිතත්තා, - බෙද දක්වන ලද හෙයිනි.

ප්‍ර:- ශබ්ද අනුව යෝජනා නොකොට ශබ්දය අතහැර යෝජනා කිරීම නිසා පාලියෙහි - රූප නැත. රූපස්කන්ධයම ඇතැයි යන අර්ථයට වැටෙන්නේ නොවේද,?

උ:- පාලියෙහි රූපං කියාම ඇත්තේ නමුත්, ශබ්දය ප්‍රමාණ නොකරනු ලැබේ. අර්ථයම ප්‍රමාණ කොට යෝජනා කරනු ලැබේ. පාලියෙහි රූපක්ඛන්ධො යනු ඇතැයි යෝජනාවක් නොමැත.

වචන සොධනෙ විය හි එත්ථ වචනං න පමාණං, යථා යථා පන සුද්ධ ඛන්ධා ලබ්භන්ති, තථා තථා අත්ථොව පමාණං. (යමක අට්ඨකථා)

හි - සච්චං, - සත්‍යයකි. වචන සෝධනේ, - වචන ශෝධනයෙහි, වචනං, ශබ්දය, පමාණං, - ප්‍රමාණ, හොතිවිය, - වන්නාක් මෙන්, එත්ථ, - මේ ශුද්ධ ස්කන්ධ වාරයෙහි, වචනං, - ශබ්දය, පමාණංන හොති, - ප්‍රමාණ නොවේ. පන, - ඒ වනාහි, යථා යථා, - යම් යම් ආකාරයකින්, සුද්ධ ඛන්ධා, - හුදු ස්කන්ධයෝ, ලබ්භන්ති, ලැබෙත්ද, තථා, තථා-ඒ ඒ ආකාරයෙන්, අත්ථොව,-අර්ථයම, පමාණං,-ප්‍රමාණ වේ.

ප්‍ර:- පිය රූප සාත රූප යන තැන රූප අටවිස්සම ලැබෙත් නම් න රූපක්ඛන්ධො යයි කුමක් හෙයින් කියන ලද්දේද,?

උ:- රූප අටවිස්සම කීවේ නමුත්, පියරූප සාතරූප නම් වූ රූප අටවිස්ස පිය වූ ද සාත වූද සමූහය ගෙන රූප නම් වේ. රූප්පන ස්වභාව නැති තැන රූපස්කන්ධය නම් නොලැබේ. ඒ නිසා න රූපස්කන්ධයයි කියන ලදි.

තවද: ප්‍රිය වූද මිහිරි වූ රූප අටවිස්ස ප්‍රිය රූපයට ඇතුලත් වේ. රූප්පන ස්වභාව ඇති රූප අට විස්සට ඇතුලත් නොවේ. ඒ නිසා න රූපක්ඛන්ධො යයි කියන ලදි.

පියරූපං සාතරූපන්ති - පෙ - තණ්හාවත්ථු භූතං තෙභූමකං වේදිතබ්බං තස්මා යං පඤ්චක්ඛන්ධ සමුදය භූතං පියරූපං සාතරූපං තං එකදෙසෙන රූපක්ඛන්ධො හොතීති ආහ - පියරූපං සාතරූපං න රූපක්ඛන්ධොති. **(යමක මූල ටීකා)**

පියරූපං සාතරූපන්ති, - පියරූපං සාතරූපං යනු - පෙ - තණ්හාවත්ථු භූතං, තෘෂ්ණාවට අරමුණු වශයෙන් ඇත්තාවූ, තෙභූමකං, - ත්‍රිවිධ භූමියට අයත් වූ ධර්මයයි, වේදිතබ්බං, - දතයුතුය, තස්මා එහෙයින්, පඤ්චක්ඛන්ධ සමුදය - භූතං, - පඤ්ච ස්කන්ධයාගෙ අවයව වූ, පියරූපං, - ප්‍රිය ස්වභාව ඇත්තා වූ, සාතරූපං, - සාත ස්වභාව ඇත්තා වූ, යං අත්ථි, - යමක් වේ ද, තං, - ඒ ප්‍රිය ස්වභාව සාත ස්වභාවය ඒකදේසෙන, - ඒකදේශයකින්, රූපක්ඛන්ධො හොති, - රූපස්කන්ධය වෙයි. ඉති තස්මා, - එසේ හෙයින්, පියරූපං සාතරූපං න රූපක්ඛන්ධොති, - යයි, ආහ, - කීහ.

ඒකදෙසෙන රූපක්ඛන්ධො, න සමුදය වසෙන, ඉමස්මිං විකප්පෙ පියසභාවං භූතුපාදය රූපඤ්ච රූපක්ඛන්ධෙන සකලං ඛන්ධපඤ්චකන්ති රූපක්ඛන්ධොති වුත්තන්ති අධිප්පායො, (මධු ටීකා).

ඒකදෙසෙන, - ඒකදේශයකින්, රූපක්ඛන්ධො, - රූපස්කන්ධ නම් වේ. සමුදය වසෙන, - සමූහ වශයෙන්, න රූපක්ඛන්ධො, - රූපස්කන්ධ නම් නොවේ. ඉමස්මිං විකප්පෙ, - මේ අර්ථ විකල්පයෙහි, පියසභාවං, - ප්‍රිය ස්වභාව ඇත්තා වූ, භූතුපාදය රූපඤ්ච, - භූතරූප උපාදරූප ද, රූපක්ඛන්ධෙන,- රූපස්කන්ධය සමග, සකලං,- සියලුම, ඛන්ධපඤ්චකඤ්ච,- ස්කන්ධ පඤ්චකය ද, රූපක්ඛන්ධො ඉති,- රූපස්කන්ධය නමැයි. වුත්තං ඉති, - කියන ලදයි, අයං අධිප්පායෝ , - මේ වනාහි අධිප්‍රායාර්ථය යි

පියසභාවතාය වා රූපක්ඛන්ධො පියරූපෙ පවිසති, න රුප්පනසභාවෙනාති පියරූපං සාතරූපං රූපං න රූපක්ඛන්ධොති වුත්තං, **(යමක මූල ටීකා)**

රූපක්ඛන්ධො, - රූපස්කන්ධය, පියසභාව තාය වා, - ප්‍රිය ස්වභාව ඇති බැවින් හෝ, පියරූපෙ, - පියරූපයෙහි, පවිසති, - පිවිසේ. රුප්පන සභාවෙන, - රුප්පන ස්වභාවයෙන්, න පවිසති, - නොපිවිසේ. ඉති. තස්මා, - එසේ හෙයින්, පියරූප සාතරූපං න රූපක්ඛන්ධො යයි, වුත්තං, - කියන ලදී.

රුප්පනට්ඨෙන රූපක්ඛන්ධ පරියාපන්නම්පි චක්ඛාදි පියසභාවමත්තවච— නිච්ඡාවසේස රූපමෙව අනුපවිසති, න රූපක්ඛන්ධන්ති ආහ, පියසභාව - පෙ - රූපක්ඛන්ධොති වුත්තන්ති. **(යමක අනුටීකා)**

රුප්පනට්ඨෙන, - රුප්පනාර්ථයෙන්, රූපක්ඛන්ධ පරියාපන්නම්පි, - රූපස් - කන්ධයට ඇතුලත් ද වූ, චක්ඛාදි පිය සභාව මත්තවචනිච්ඡාවසේස රූපමෙව,— චක්ෂුරාදී වූ ප්‍රියස්වභාවය කියනු කැමති අවසේස රූපයටම, අනුපවිසති, - අනු පිවි- සේයි. රූපක්ඛන්ධං, - රූපස්කන්ධයට න අනුපවිසති, - නොපිවිසෙයි. ඉති තස්මා, එසේ හෙයින්, පිය සභාව - පෙ - න රූපක්ඛන්ධොති වුත්තන්ති, ආහ, - යනුවෙන් කීහ.

[සැ: යු:- පියරූප සාතරූප උද්ධරන තැන රූප අටවිස්ස ඇතුලත් කිරීම සුදුසු නැත මේ ගැන බොහෝ වාද ඇති බැවිනි. මෙහි දී ඉතා කෙටියෙන් කී බැවින් විස්තර කළ නොහැකිය.]

ප්‍ර:- පියරූප සාතරූප කියන තැන තෘෂ්ණාවට අරමුණු වන කාලයෙහි පමණක් කියනු ලැබේ ද , නැතහොත් අරමුණු නොවන කල්හිත් කියනු ලැබේද,

උ:- භෝජනය අනුභව නොකරන කල්හිද, අනුභව කිරීමට සුදුසු දෙයක් බැවින් භෝජනයයි කියන්නාක් මෙන් තෘෂ්ණාවට අරමුණු නොවන කල්හිද, අරමුණු වීමට සුදුසු අර්ථයෙන් පියරූප සාතරූප යයි කියනු ලැබේ.

න ඛන්ධා න වේදනාක්ඛන්ධොති එත්ථ පඤ්ඤත්ති නිබ්බාන සංඛාතා ධම්මා ඛන්ධා නහොන්ති. තෙ යස්මා වේදනාක්ඛන්ධොතිපි න හොන්ති, තස්මා ආමන්තාති ආහ. **(යමක අට්ඨකථා)**

න ඛන්ධා න වේදනාක්ඛන්ධොති එත්ථ,-මෙහි පඤ්ඤත්ති නිබ්බාන සංඛාතා, පඤ්ඤත්ති නිබ්බාන යයි කියන ලද, ධම්මා, - ධර්මයෝ, ඛන්ධා, - ස්කන්ධ නම්, නහොන්ති, - නොවෙත්, තෙ, - ඒ ප්‍රඥප්ති නිර්වාණ ධර්මයෝ, යස්මා, – යම් හෙයකින්, වේදනාක්ඛන්ධොතිපි, – වේදනාස්කන්ධයයි ද, න හොන්ති, – නොවෙත් ද, තස්මා, – එසේ හෙයින්, ආමන්තාති, – ආමන්තා යයි, ආහ, – කීහ.

න ඛන්ධා න වේදනාක්ඛන්ධාති ආමන්තාති ඒවං ඛන්ධසද්දපවත්තියා අභාවෙ වේදනාක්ඛන්ධ සද්දප්වත්තියා ච අභාවොති පණ්ණත්ති සොධන මත්තමෙව කරොතීති දට්ඨබ්බං, න අඤ්ඤධම්ම සබ්භාවො එවෙත්ථ පමාණං, **(යමක මූල ටීකා)**

න ඛන්ධා න වේදනාක්ඛන්ධොති ආමන්තාති එවං,-මෙසේ කියන ලද වචනයෙන්' ඛන්ධ සද්දප්පවත්තියා, – ඛන්ධ ශබ්දයාගේ පැවැත්මක්, අභාවෙ,–නැත්නම්, වේදනාක්ඛන්ධ සද්දපවත්තියා ච, – වේදනාස්කන්ධ ශබ්දයාගේ පැවැත්මේ ද, අභාවො, නැති බව , හොති, – වෙයි. ඉති, – මෙසේ, පණ්ණත්තිසොධන මත්තමේව, – නාම ප්‍රඥප්තියාගේ ශෝධන මාත්‍රය ම, කරොති, - කෙරේ. ඉති දට්ඨබ්බං, - මෙසේ දත යුතු. න අඤ්ඤධම්ම සබ්භාවො ඒව,- ස්කන්ධ නම් වූ ධර්මයෙන් හැර අන්‍ය ධර්මයකගේ ලැබීමක් නැති බවම, එත්ථ, - මෙහි, පමාණං, - ප්‍රමාණ වේ.

සද්දග්ගහණං වෙත්ථ සද්දනිබන්ධනත්තා පඤ්ඤත්තියාසද්දසභාගතං වා සන්ධාය කතං, පණ්ණත්ති සොධනං හෙතං, තෙනාහ පණ්ණත්තිසොධන මත්තමෙව කරොතීති, තේන නිද්ධාරෙතබ්බස්ස ධම්මන්තරස්ස අභාවං දස්සෙති. **(යමක අනුටීකා)**

එත්ථ ච, - මෙහිද වනාහි, න ඛන්ධා න වේදනාක්ඛන්ධො යන වාක්‍යයෙහි, සද්දග්ගහණං, - ඛන්ධ ශබ්දය ගැනීම, පඤ්ඤත්තියා, - නාම ප්‍රඥප්තිය සද්දනිබන්ධනත්තා, - ශබ්දය හා බැඳී පවත්නා බව හෝ. සද්දසභාගතං වා, - ශබ්දය හා සමාන බව හෝ, සන්ධාය, - සඳහා, කතං, - කරන ලදී. හි, - සත්‍යයකි. ඒතං පණ්ණත්ති සෝධනං, – මෙය ප්‍රඥප්ති ශෝධනයයි, තේන, – එහෙයින්, පණ්ණත්තිසෝධන මත්තමේව කරෝති. යයි,ආහ, – කීහ. තේන, – එයින්, නිද්ධාරෙතබ්බස්ස, – වෙන් කොට දක්විය යුතු වූ, ධම්මන්තරස්ස, – අන්‍ය ධර්මයකගේ, අභාවං, – නැති බව දස්සෙති, – දක්වයි.

යස්මා පියරූප සාතරූප සංඛාතං වා රූපං හොතු භූතුපාදය රූපං වා, සබ්බං පඤ්චසු ඛන්ධෙසු සංගහං ගච්ඡතේව, තස්මා ආමන්තාති පටිජානාති. **(යමක අට්ඨකථා)**

යස්මා, - යම් හෙයකින්, පියරූප සාතරූප සංඛාතං, - පියරූප සාතරූප යයි කියන ලද, රූපං වා, - රූපයක් හෝ, හොතු, - වේවා. භූතුපාදය රූපං වා, - භූතෝපාදය රූපයක් හෝ, හෝතු, - වේවා, සබ්බං,-ඒ සියල්ල. පඤ්චසු ඛන්ධෙසු,- පඤ්චස්කන්ධයෙහි, සංගහං, - සංග්‍රහයට, ගච්ඡතෙව, - යන්නේමය, තස්මා, - එහෙයින් ආමන්තාති, - ආමන්තා කියා. පටිජානාති, - ප්‍රතිඥ කරයි.

නාම ප්‍රඥප්ති වාරය නිමි.

---

## ප්‍රවෘත්ති වාරය

## ගණ්ඨිපද ශෝධනය

ප්‍ර:- වර්තමාන වාරය කුමක් හෙයින් පළමු කොට වදරණ ලද්දේද යත්,

උ:- වර්තමාන ධර්මයන් අවබෝධ කරගැනීම පහසු වන බැවින් වර්තමාන වාරය පළමු කොට වදළ සේක.

ප්‍ර:- ඉන්පසු අතීත වාරය වදරණ ලද්දේ කුමක් හෙයින්ද,

උ:- අතීත ධර්ම වින්දනය කොට නිමවූ දේ නිසා අනාගතයට වඩා අවබෝධ කර ගැනීම පහසු වන බැවින් අතීත වාරය වදළහ.

ප්‍ර:- ඉන් පසු කුමක් හෙයින් අනාගත වාරය වදරණ ලද්දේද,

උ:- ශුද්ධ වාර වෙන වෙනම දේශනා කරන ලද බැවින් අනාගත වාරය ඉන්පසු වදළහ. (මිශ්‍රක වාරයන්හි ද මේ ක්‍රමයෙන් දත යුතුය.)

ප්‍ර:- ප්‍රවෘත්ති වාරයෙහි කුමක් හෙයින් කාල ප්‍රභෙද සයක් වදළේ ද. අතීත වර්තමාන, අනාගත වර්තමාන, අනාගත අතීත යන වාර තුනක් ඇතුලත් කොට වාර නවයක් කීමට සුදුසු නැත්ද,

උ:- වර්තමාන, අතීත, අනාගත, වර්තමානාතීත, වර්තමානානාගත,අතීතානාගත, යන කාල සය පමණක් දේශනා කිරීම සුදුසුය. අතීතවර්ත්මාන, අනාගත වර්තමාන, අනාගත අතීත, යන වාර තුන කියනුයේ මිශ්‍රක කාල ප්‍රතිලෝම යට සමාන කීමක් බැවින් ඒවා ඇතුලත් කොට නව වාරයක් කීම සුදුසු නැත.

කාලභෙද පනෙත්ථ ජ එව වුත්තා, අතීතේන පච්චුප්පන්නො, අනාගතේන පච්චුප්පන්නො අනාගතේන අතීතොති ඒතේ පන තයො යථා දස්සිතා, මිස්සක කාලභෙද එව තයෝ න විසුං විජ්ජන්තීති න ගහිතා, තත්ථ තත්ථ හි පටිලොම පුච්ඡාහි අතීතෙන පච්චුප්පන්නාදයො කාලභෙද දස්සිතා. **(යමක මූල ටීකා)**

පන, - තවද පැහැදිලි කරන්නෙමි, එත්ථ, - මේ ප්‍රවෘත්ති වාරයෙහි, කාලභෙද, කාල ප්‍රභෙදයෝ, ඡ ඒව, සයක් පමණක්ම, වුත්තා, - කියන ලදහ. අතීතේන පච්චුප්පන්නො, - එකකි. අනාගතේන පච්චුප්පන්නො - එකකි. අනාගතේන අතීතො එකකි, ඉති එතෙ තයො, - මේ කාලප්‍රභෙද තුන යථා දස්සිතා, - යම් සේ දක්වන ලද්දහුද, තථා දස්සිතා, - එසේ දක්වන ලද කාල ප්‍රභෙද, තයො, - තිදෙන, - මිස්සක කාල භෙද එව, - වර්තමානාතීත, වර්තමානානාගත. අතීතානාගත, යන කාලප්‍රභෙද යෝමය, විසුං න විජ්ජන්ති, වෙනම නොමැත්තාහ, ඉති තස්මා, - එනිසා, නගහිතා, නොගන්නා ලදහ, හි, - පැහැදිලි කරන්නෙමි, තත්ථ තත්ථ, - ඒ ඒ තැන්හි, යමක යන්හි, පටිලොම පුච්ඡාහි, - පටිලොම පුච්ඡාව බැවින් අතීතෙන වර්තමානාදි කාල ප්‍රභෙද, දස්සිතා, - දක්වන ලද්දහ.

ප්‍ර:- ප්‍රඥප්තිවාර වේදනාස්කන්ධ මූලාදියෙහි පූර්ව පූර්ව වූ රූපස්කන්ධාදිය මූලිකොට දේශනා කරන ලද්දක් මෙන් කුමක් හෙයින් ප්‍රවෘත්ති වාරයෙහි පූර්ව පූර්ව වූ ස්කන්ධයන් මූලි කොට නොවදරණ ලද්දේද.

උ:- අමිශ්‍ර වූ කාලභෙදයන් ඇති වාරයන්හි අර්ථ විශේෂයක් නැති බැවින් පූර්ව පූර්ව වූ ස්කන්ධයන් මූලි කොට නොදෙසන ලදී.

පවත්ති වාරෙ වේදනාක්ඛන්ධාදි මූලකානි පච්ඡිමෙනෙව සහ යොජෙත්වා තිණි ද්වෙ එකඤ්ච යමකානි වුත්තානි, න පුරිමෙන, කස්මා, අමිස්සක කාලභෙදෙසු වාරෙසු අත්ථ විසේසාභාවතො, **(යමක මූල අනුටීකා)**

පවත්ති වාරෙ, - ප්‍රවෘත්ති වාරයෙහි, වේදනාක්ඛන්ධාදි මූලකානි වේදනාස්කන්ධ මූල ආදිය. පච්ඡිමෙනෙව, - පසු පසු වූ ස්කන්ධයන් ම සමග, සහ, - එක්ව, යොජෙත්වා, - යොද, යමකානි, - යමකයන් තිණිච, - තුනක් ද, ද්වෙ ච, - දෙකක් ද, ඒකඤ්ච, - එකක් ද, වුත්තානි, - කියන ලද්දහුය, පුරිමෙන,-පූර්ව පූර්වවූ ස්කන්ධ-යන් හා, සහ, - එක්ව, නවුත්තානි, - නොකියන ලදහ. කස්මා, - කුමක් හෙයින් ද, අමිස්සක කාලභෙදේසු, - අමිශ්‍රිත කාලභෙද ඇත්තා වූ, වාරෙසු, - වාරයන්හි, අත්ථ විසේසාභාවතො, අර්ථ විශේෂයක් නොමැති බැවින් (නවුත්තානි)

ප්‍ර:- උත්පාදවාර නිරොධ වාරයන්හි ප්‍රවෘත්ති කාලයෙහි නාමරූපයන්ගේ උත්පාද නිරෝධ ඇතිව තිබෙද්දී උත්පාද නිරෝධ වාර පමණක් දේශනා නොකොට කුමක් හෙයින් ප්‍රතිසන්ධි කාලයෙහි නාමරූපයන්ගේ උත්පාද යන්, චුති කාලයේ දී භංගයම පමණක් වදරණ ලද්දේදයන්,

උ:- ප්‍රවෘත්ති කාලයෙහි නාමරූපයන්ගේ උපදීම, බිඳීම ඇත්තේ නමුත් ඒකක්ෂණයෙහි කෝටි ගණනින් සිත් ඉතා වේගයෙන් ඇතිවන නැතිවන බැවින් බෙද දක්වීමට අපහසුය. එනිසා උත්පාද නිරෝධ දෙකම කීමට අපහසුය. ප්‍රතිසන්ධි කාලයෙහි අභිනවයෙන් උපන් උත්පාදයත්, චුතිකාලයෙහි ඇත්තා වූ නාම රූපයන්ගේ භංගයත් පමණක් දක්වීමට පහසු බැවින් කියන ලද්දවුන්ම උත්පාද නිරෝධ වශයෙන් වදරණ ලදී.

සකලෙපිහි ඉමස්මිං ඛන්ධයමකෙ, තත්ථ තත්ථ උප්පන්නානං පවත්තෙ යාව මරණා ඛන්ධානං අපරියන්තෙසු උප්පාද නිරෝධෙසු විජ්ජමානෙසුපි ලහුපරිවත්තානං ධම්මානං විනිබ්භාගං කත්වා උප්පාදනිරෝධෙ දස්සෙතුං නසුකරන්ති පවත්තියං උප්පාදනිරෝධෙ අනාමසිත්වා අභිනවං විපාකවට්ටං නිප්ඵාදයමානෙන නානාකම්මෙන නිබ්බත්තානං පටිසන්ධිඛන්ධානං උප්පාදං දස්සෙතුං සුඛන්ති පටිසන්ධි උප්පාද වසෙනේව උප්පාදවාරො කථිතො, උප්පන්නස්ස පන විපාක වට්ටස්ස පරියොසානෙන නිරෝධං දස්සෙතුං සුඛන්ති මරණ කාලෙ නිරෝධ වසෙන නිරෝධ වාරො කථිතො, **(යමක අට්ඨකථා)**

හි, - විස්තර කරන්නෙමි. සකලෙපි, - සියලුම, ඉමස්මිං ඛන්ධයමකෙ, - මෙ, ස්කන්ධ යමකයෙහි, තත්ථ තත්ථ, - ඒ ඒ තැන, උප්පන්නානං, - උප්පන්නා වූ පුද්ගලයන්ගේ, පවත්තෙ,- ප්‍රවෘත්ති කාලයෙහි, යාවමරණා,- මරණය තෙක්, ඛන්ධානං, ස්කන්ධයන්ගේ අපරියන්තෙසු, - ප්‍රමාණ රහිතවූ, උප්පාද නිරොධෙසු, - උත්පාද නිරෝධයන්, විජ්ජමානෙසු පි, - විද්‍යමාන කල්හිදු, ලහුපරිවත්තානං, - ලුහුව පෙරළෙන්නා වූ , ධම්මානං, - නාමරූප ධර්මයන්ගේ, විනිබ්භාගං, - විනිර්භෝග, කත්වා කොට, උප්පාද නිරොධෙ, - උත්පාද නිරොධයන්, දස්සෙතුං, - දක්වීමට, න සුකරං, පහසු නොවේ. ඉති තස්මා , - එසේ හෙයින්, පවත්තියං, – ප්‍රවෘත්ති කාලයෙහි උප්පාද - නිරෝධෙ, - උත්පාද නිරෝධයන්, අනාමසිත්වා, - නොගෙන, අභිනවං, අභිනව වූ, විපාකවට්ටං, - විපාකවට්ටය, නිෂ්ඵාදය මානෙන, - නිපදවන්නා වූ, නානාකම්මෙන, – නානා කර්ම හේතුවෙන්, නිබ්බත්තානං, උපන්නා වූ , පටිසන්ධි ඛන්ධානං, - ප්‍රතිසන්ධි ස්කන්ධයන්ගේ, උප්පාදං දස්සෙතුං, – උත්පාදය දක්වීම, සුඛං, - පහසුය. ඉති තස්මා, – එසේ හෙයින්, පටිසන්ධි උප්පාද වසෙනෙව- ප්‍රතිසන්ධි උත්පාදයන්ගේ වශයෙන්ම, උප්පාදවාරො කථිතො, - උත්පාද වාරය කියන ලදී.

පන, - උත්පාද වාරය හැර නිරෝධ වාරය කියන්නෙමි. උප්පන්නස්ස, - උපන්නා වූ, විපාකවට්ටස්ස විපාකවට්ටයාගේ, පරියෝසානේන, - අවසාන වූ චුතියෙන්, නිරෝධං, - නිරෝධය, දස්සෙතුං, - දක්වීම, සුඛං, – පහසුය, ඉති තස්මා, එසේ හෙයින්, මරණ කාලෙ, – චුතිකාලයෙහි, - නිරෝධ වසෙන, - නිරෝධයාගේ වශයෙන්, නිරෝධවාරො, - නිරෝධ වාරය, කථිතො කියන ලදී.

ප්‍ර:- උප්පජ්ජති යන්නෙහි උප්පාදතො යාව නිරෝධ ගමනා ආදී වශයෙන් පට්ඨාන අට්ඨකථාව කියා ඇති බැවින් ක්ෂණත්‍රය සමංගී වූවහු ස්වරූප වශයෙන් ගතයුතුව තිබෙද්දී කුමක් හෙයින් උත්පාදක්ෂණ සමංගී වූවහුම ගන්නා ලද්දේද.

උ:- පට්ඨාන අට්ඨකථා වචනය අනුව ක්ෂණත්‍රය සමංගී වූවහු ස්වරූප වශයෙන් ගත්තාක් මෙන් ඇතත් ගෙන නැත. උත්පාදක්ෂණ සමංගී වූ තැනැත්තාම ගන්නා ලදී. ඔහුම ඇතුලත් කරගන්නා ලද්දේ වේ.

උප්පජ්ජතීති උප්පාදතො යාව නිරෝධ ගමනා 'උද්ධං පජ්ජති නිබ්බත්තතීති අත්ථො, අත්ථානං ලබ්භති. උප්පාදදයො තයො පි ඛණෙ පාපුණාතීති වුත්තං හොති, **(පට්ඨාන අට්ඨකථා)**

උප්පජ්ජතී ති, - උප්පජ්ජති යනු, උප්පාදතො, - උත්පාදයේ පටන්, යාව නිරෝධ ගමනා, - භවංගයට යන තෙක්, උද්ධං, - ඉහලට, පජ්ජති, - පැමිණේ, නිබ්බත්තති, උපදී, ඉති අයං අත්ථො, - මෙසේ මේ අර්ථය යි. (අත්ථානං - අර්ථයන් අතුරෙන්, ලබ්භති - ලැබෙයි.) උප්පාදදයො, - උත්පාදදී වූ, තයො පි ඛණෙ, - ක්ෂණත්‍රයට මද, පාපුණාති, - පැමිණේ. ඉති වුත්තං, - මෙසේ කියන ලදී.

යාව නිරෝධ ගමනා උද්ධං පජ්ජතීති ච උප්පාදදයො - පෙ - පාපුණාති තිච වචනෙහි ඛණත්තය සමංගීනං ආපජ්ජතීති අනුඤ්ඤාතං විය හෝති, උප්පාදක්ඛණ සමංගියේව පන එවං වුත්තොති දට්ඨබ්බො, **(පට්ඨාන මූල ටීකා)**

යාව - පෙ - පජ්ජතීතිච, - උප්පාදදයො - පෙ - පාපුණාතීති ච, - වචනෙහි,- කියන ලද වචනයන්ගෙන්, ඛණත්තය සමංගී, - ක්ෂණත්‍රය සමංගියා වෙත. ආපජ්ජති, පැමිණේ. ඉති අනුඤ්ඤාතංවිය, - මෙසේ අනුදන්නා ලද්දක් මෙන්, හොති, - වේ. පන, - කියන්නෙමි. උප්පාදක්ඛණ සමංගියෙව, - උත්පාදක්ෂණ සමංගී වූවහුම, එවං වුත්තොති, - මෙසේ කියන ලද්දේ, ඉති, - යයි දට්ඨබ්බො, - දතයුතුය.

ප්‍ර:- උත්පාදක්ෂණයම ගතයුතු වේ නම්, උත්පාදක්ඛණං පාපුණාතියි නොකියා තයෝපි ඛණා යයි කීම කෙසේද සුදුසුද,

උ:- අතීත ද නොවූ, අනාගතද නොවූ ක්ෂණඒකදේශය ක්ෂණත්‍රය කීමෙන් කියන ලදුයි දතයුතු.

අනතීතං න අනාගතං ඛණෙකදේසං ඛණත්තයන්ති වුත්තං, - **(ධම්මසංගණී මූලටීකා)**

අනතීතං, - නොම අතීත වූ, න අනාගතං, - නොම අනාගත වූ, ඛණෙකදේසං, ක්ෂණ ඒකදේශයක්, ඛණත්තයන්ති වුත්තං, - ක්ෂණත්‍රයයි කියන ලදී.

ප්‍ර:- ජීවිත ඡක්කයයි කියන ලද තැන වනාහි කවර ධර්ම කෙනෙක් කියන ලදද.

උ:- මූලටීකා අදහස අනුව ජීවිත නවක කලාපයෙන් ගන්ධරස ඕජා තුන අතහැර ජීවිත ඡක්කයයි කියනු ලැබේ.

ප්‍ර:- කර්මජ කලාප සතරයයි කී තැන කවර නම් කලාප කෙනෙක් කියන ලදද.

උ:- මූලටීකා අදහස අනුව චක්ඛුසත්තක, සොතසත්තක, වත්ථු සත්තක, ජීවිත ඡක්ක යන මේ සතර වෙති. අට්ඨකථා අදහස අනුව චක්ඛු සත්තක, සෝතසත්තක, වත්ථුසත්තක හා ජීවිත නවක යන මේ කලාප සතර වෙති.

ප්‍ර:- අතීතාදි එකොළොස් වැදෑරුම් වූ රූප සමූහය රූපස්කන්ධයයි කියනුයේ නම් ජීවිත නවකය වර්තමානම වෙයි. අතීතාදි බවට නොයයි. එසේ නම් කුමක් හෙයින් රූපස්කන්ධ නම් වේද.

උ:- සමුද්ද ශබ්දය ඒකදේශයක් වූ සමුද්‍රයෙහි ද වැටෙන්නා සේ ඛන්ධ ශබ්දය එක එක ස්කන්ධයක් කෙරෙහි ද රූළ්හී වශයෙන් වැටෙන බැවින් රූපස්කන්ධයයි කියනු ලැබේ.

වේදනාදිසු පෙකස්මිං — ඛන්ධ සද්දෙතු රූළ්හියා.
සමුද්ද දෙක දේසෙසු — සමුද්දදි රවො යථා

**(සච්ච සංඛෙප අට්ඨකථා)**

සමුද්දදි රවො – සමුද්‍ර ආදි ශබ්දය, සමුද්දදෙක දෙසෙසු, – සමුද්‍ර රාශියෙන් ඒක දේශයෙක්හි , රූළ්හියා, – රූළ්හී, වශයෙන්, වත්තතියථා, – පවතින්නේ යමසේද, තථා තු, – එසේම, ඛන්ධසද්දෙ,– ඛන්ධ ශබ්දය, වේදනාදිසුපි, – වේදනාදි ස්කන්ධ යන් අතුරෙන්, එකස්මිං, – එක එක ස්කන්ධයෙක් හි, රූළ්හියා, – රූළ්හි වශයෙන්, වත්තති,– වැටේ.

ප්‍ර:- (පූර්ව කොට්ඨාශයේ ස්වරූපයට සමානයයි) කී තැන කවර නම් පූර්ව කොට්ඨාශයක් ලැබේද.

උ:- ස්වරූප දර්ශන විස්සර්ජනාවගේ පූර්ව කොට්ඨාශය ලැබේ, හෙවත්, පරිපූණ්ණ පඤ්හාවගේ පූර්ව කොට්ඨාශය ලැබේ.

තං විස්සජ්ජනස්ස පන පුරිමකොට්ඨාසේන සදිසත්තතාය පුරේ පඤ්හො පච්ඡිම කොට්ඨාස සදිසත්තතාය පච්ඡා පඤ්හොති ච නාමං වුත්තං, **(යමක මූල ටීකා)**

පන – ඒ හැර, තං විස්සජ්ජනස්ස, – ඒ ස්වරූප දර්ශන විස්සර්ජනාවෙන් විසඳන ලද පඤ්හයාගේ, පුරිමකොට්ඨාසේන, – පූර්ව කොට්ඨාශයෙන්, සදිසත්තතාය, සමාන අර්ථ ඇති බැවින්, පුරෙපඤ්හොති ච,– පුරෙපඤ්හ කියාද, පච්ඡිමකොට්ඨාස සදිසත්තතාය,–පශ්චිම කොට්ඨාසය හා සමාන අර්ථ ඇති බැවින්, පච්ඡා පඤ්හොති ච, – පච්ඡාපඤ්හ කියාද , නාමං වුත්තං, – නම කියන ලදී.

තං සරූපදස්සනේන විස්සජ්ජනං තංවිස්සජ්ජනං, තං වා යථා වුත්තං විස්සජ්ජනං ඒතස්සාතිංවිස්සජ්ජනො, **(යමක අනු ටීකා)**

තං සරූප දස්සනෙන, – ඒ ස්වරූප දැක්වීම් වශයෙන්, විස්සජ්ජනං, – විසඳීම, තංවිස්සජ්ජනං, – තංවිස්සජ්ජන නම්. වා, – නොහොත්, එතස්ස, – ඒ ප්‍රශ්නයාගේ යථා වුත්තං, – යම යම පරිද්දකින් කියන ලද්ද වූ, තංසරූප දස්සනං, – ඒ ස්වරූප දර්ශන යයි කියන ලද්දවූ, විස්සජ්ජනං, –විස්සර්ජනාවක්, අත්ථි, – ඇත්තේද, ඉති තස්මා, – ඒ නිසා, සො, – ඒ ප්‍රශ්නය, තංවිස්සජ්ජන නම්.

ප්‍ර:– පුරිමකොට්ඨාසය යනු සන්නිට්ඨාන පදයාගේ ස්වරූපාර්ථයට කියනු ලැබේද, නැතහොත් සන්නිට්ඨාන පදයටම කියනු ලැබේද?

උ:– විස්සර්ජන පදයට නොකියනු ලැබේ. සන්නිට්ඨාන උද්දේශ පදයට කියනු ලැබේ.

පුරිම කොට්ඨාසෙනාති පුරිමෙන උද්දේස පදෙන, **(යමක අනුටීකා)**

පුරිම කොට්ඨාසේනාති, – පුරිම කොට්ඨාසෙන යනු, පුරිමේන, – පූර්ව වූ, උද්දේස පදෙන, – උද්දේස පදයෙනි.

සදිසත්ථතා ච සන්නිට්ඨාන සංසය පදවිසෙසං අවිචාරෙත්වා ඒකෙන පදෙන සංගහිතස්ස ඛන්ධස්ස උප්පාද නිරෝධ ලාභ සාමඤ්ඤමත්තෙන පුරෙපඤ්හා දට්ඨබ්බා **(යමක මූලටීකා)**

ච, – විස්තර කියන්නෙමි, සදිසත්ථතා, – පූර්වකොට්ඨාශය සමග සමාන වූ අර්ථ ඇති බව, සන්නිට්ඨාන සංසය පද විසෙසං, – සන්නිට්ඨාන සංසය පද විශේෂය, අවිචාරෙත්වා, – නොවිමසා, ඒකෙන පදෙන, – එක පදයකින්, ප්‍රධාන අප්‍රධාන එක යමක පදයකින්, සංගහිතස්ස, – සංග්‍රහ කොට ගන්නා ලද්ද වූ, ඛන්ධස්ස, – ස්කන්ධයාගේ , උප්පාද නිරෝධ ලාභ සාමඤ්ඤ මත්තෙන, – උත්පාද – නිරෝධ ලාභ සමාන වූ මාත්‍රයෙන්, පුරෙ පඤ්හා, – පුරේපඤ්හ යයි. දට්ඨබ්බා, – දතයුතුයි.

ප්‍ර:– තුච්ඡ පඤ්හා යනු කිනම් ප්‍රශ්නයකට කියනු ලැබේ ද,

උ:– තුච්ඡ පඤ්හාති පි වුච්චති, යි අට්ඨකථාවෙහි ආ බැවින් මොඝ පඤ්හයට කියනු ලැබේ.

ප්‍ර:– පටික්ඛෙප විස්සජ්ජනය හා පටිසෙධ විස්සජ්ජනය යන දෙකෙහි විශේෂත්වය කුමක් ද,

උ:– සන්නිට්ඨාන පදයාගේ අර්ථය ප්‍රතික්ෂේප කිරීම වනාහි පටික්ඛෙප විස්සජ්ජනාවය. සංසය පදයාගේ අර්ථය වැලකීම පටිසේධ විස්සජ්ජනාවයි. මේ විශේෂයයි.

සන්නිට්ඨානත්ථස්සෙව පටික්ඛිපනං පටික්ඛෙපො, සංසයත්ථ නිවාරණං පටිසේධොති අයං පටික්ඛෙප පටිසේධානං විසේසො, **(යමක මූල ටීකා)**

සන්නිට්ඨානත්ථස්සෙව, - සන්නිට්ඨාන පදයාගේ අර්ථයම, පටික්ඛිපනං,- ප්‍රතික්ෂේප කිරීම, පටික්ඛෙප නම්, සංසය පද නිවාරණං,- සංසය පදයාගේ අර්ථය වැළැක්වීම, පටිසෙධො, - පටිසේධ නම්, ඉති අයං, - මේ වනාහි, පටික්ඛෙප පටිසේධානං, - ප්‍රතික්ෂේප ප්‍රතිශේධයන්ගේ විසෙසො, - විශේෂයයි.

ප්‍ර:- පාළිගති විස්සජ්ජනා, පටිසෙධ විස්සජ්ජනාවෙන් වනාහි සන්නිට්ඨාන තැන්හි ඇතිව, සංසය තැන්හි නොමැති බැවින් සමාන වන්නේ නොවේද?

උ:- නොවන්නේය. ස්කන්ධයන්ගේ උත්පාද නිරෝධ ප්‍රතිෂේධයාගේ ප්‍රතිෂේධය පිණිස 'න' අකුර අතහැර ප්‍රතිෂේධ පාළිගති විසඳුම වේ. ස්කන්ධයන්ගේ උත්පාද නිරෝධ යම වැළකීම පිණිස පටිසේධන නම වූ ප්‍රතිපේධ විසඳුම වේ.

උප්පත්ති නිරෝධ පටිසේධස්ස පටිසේධනත්ථං පාළිගතියා විස්සජ්ජනං, උප්පත්ති නිරෝධානමේව පටිසේධනත්ථං පටිසේධන විස්සජ්ජනං කතන්ති වේදිතබ්බං, **(යමක මූලටීකා)**

උප්පත්ති නිරෝධ පටිසෙධස්ස, - ස්කන්ධයන්ගේ උත්පාද නිරෝධ වැළැක්ම, පටිසේධනත්ථං, - වැළැක්වීම පිණිස, පාළිගතියා, - පාළිගතියෙන්, විස්සජ්ජනං, විසඳුම, කතං, - කරන ලදී. උප්පත්තිනිරොධාන මෙව, - ස්කන්ධයන්ගේ උත්පාද නිරෝධයන්ගේම, පටිසේධනත්ථං, - ප්‍රතිෂේධය පිණිස, පටිසේධෙන, - ප්‍රතිෂේධ වශයෙන්, විස්සජ්ජනං, - විසඳුම, කතං ඉති, - කරන ලදුයි. වේදිතබ්බං, - දතයුතුය.

ප්‍රවෘත්ති වාරය නිමි.

---

## පරිඤ්ඤා වාරය

# ගණ්ඨි පද ශෝධනය

ප්‍ර:- ප්‍රවෘත්ති වාරයෙහි පුද්ගල වාර, ඕකාස වාර, පුද්ගලෝකාස වාර යයි වාර තුනක් වදරා, පරිඤ්ඤා වාරයෙහි කුමක් හෙයින් පුද්ගල වාරය පමණක්ම වදරණ ලද්දේ ද,

උ:- සමාන විසඳුම් ඇති බැවින් වාර තුනක් නොදෙසා පුද්ගලවාරය පමණක් දේශනා කරන ලදී.

තවද:- පරිඤ්ඤා කිස වනාහි පුද්ගලයාට පමණක් ලැබෙ. ඕකාශයට නොලැබෙ එනිසා පුද්ගල වාරය පමණක්ම දේශනා කරන ලදී.

පුග්ගලවාරො ඔකාසවාරො පුග්ගලොකාසවාරොති ඉමෙසු පන තිසු පුග්ගල වාරොව ලබ්භති, න ඉතරෙ ද්වෙ, කිං කාරණා සදිස විස්සජ්ජනතාය. **(යමක අට්ඨකථා)**

පුග්ගල වාරො, - පුද්ගලවාරයද, ඔකාසවාරො, - ඕකාස වාරයද, පුග්ගලොකාස වාරො, - පුද්ගලෝකාශ වාරයද, ඉති ඉමේසු තීසු, - මෙසේ මේ වාර තුන අතුරෙන් පුග්ගලවාරොව, - පුද්ගල වාරයම, ලබ්භති, ලැබේ. ඉතරෙ ද්වෙ, - ඉතිරි දෙක, - නලබ්භන්ති, - නොලැබෙත්, කිං කාරණා,-කවර කරුණකින් ද යත්, **සදිසවිස්සජ්ජනතාය**, - සමාන වූ විසඳුම් ඇති බැවිනි.

ප්‍ර:- පරිඤ්ඤා වාරයෙහි වනාහි ප්‍රවෘත්ති වාරයෙහි මෙන් චුති ප්‍රතිසන්ධි නොදෙසා කුමක් හෙයින් ප්‍රවෘත්තිය පමණක් වදරණ ලදද,

උ:- චුති ප්‍රතිසන්ධි කාලයෙහි පරිඤ්ඤා කිස නැති බැවිනි.නොහොත් නොලැබෙන බැවින් ප්‍රවෘත්ති කාලයෙහි පමණක් වදරණ ලදී.

චුතිපටිසන්ධික්ඛණෙ පරිඤ්ඤා කිච්චස්ස අභාවා, - **(යමක අට්ඨකථා)**

චුතිපටිසන්ධික්ඛණෙ, - චුති ප්‍රතිසන්ධික්ෂණයෙහි, පරිඤ්ඤාකිච්චස්ස, පරිඤ්ඤා කිස, අභාවා, - නැති බැවිනි.

රූපක්ඛන්ධ පරිජානනස්ස, - රූපස්කන්ධයාගේ පිරිසිඳ අවබෝධකිරීමක්, අභාවා, - නැති බැවින්, (ආමන්තා ති ච කතං - ආමන්තා යයි විසඳුම කරන ලදී.)

ප්‍ර:- යො රූපක්ඛන්ධං පරිජානාති. යන තැන යට මාර්ගස්ථයෝ ද රූපස් කන්ධය පිරිසිඳ අවබෝධ කරන නමුත්, ඔවුන් ස්වරූප වශයෙන් නොගෙන කුමක් හෙයින් අර්හත් මාර්ගස්ථයා පමණක් ස්වරූප වශයෙන් ගන්නා ලද්දේද,

උ:- යට මාර්ගස්ථයෝ ද රූපස්කන්ධය පිරිසිඳ අවබෝධ කරති. එය සත්‍යයකි. එසේ නමුත් ඔවුන් වනාහි පරිඤ්ඤා කිස නිම කිරීමට නොසමත් වෙති. මෙහි දී වනාහි පරිඤ්ඤා කිස නිමාවට පත්කරන අර්හත් මාර්ගස්ථයාම කියන ලද බැවින් අර්හත් මාර්ගස්ථයාම සාතිශය නය වශයෙන් ස්වරූප කොට උද්ධරන ලද්දේය.

[සැ: යු:- සාතිශය නය අධිප්‍රාය ධාතුකථා අනුගණ්ඨියෙන් බලාගන්න.]

පරිජානාතීති පඤ්හෙසු අනුලෝම නයෙ පරිඤ්ඤා කිච්චස්ස මත්ථකප්පත්තං අග්ගමග්ග සමංගිං සන්ධාය ආමන්තා ති වුත්තන්ති වෙදිතබ්බං, -

පරිජානාතීති පඤ්හෙසු,-පරිජානාති යන ප්‍රශ්නයන් අතුරෙන්, අනුලොම නයෙ,-අනුලොම නයෙහි, පරිඤ්ඤා කිච්චස්ස, - පරිඤ්ඤා කිස පිළිබඳ, මත්ථකප්පත්තං මස්තක්ප්‍රාප්ත, නිමාවට පත් කළ, අග්ගමග්ග සමංගිං, - අර්හත් මාරගස්ථ ආයර්‍ය පුද්ගලයා, සන්ධාය, - සඳහා, ආමන්තාති, - ආමන්තා යයි, වුත්තං ඉති වෙදිතබ්බං කියන ලදූයි දතයුතු.

ප්‍ර:- යෙ ච පුථුජ්ජනා මග්ගං නපටිලභිස්සන්ති, යන තැන කිසිසේත්ම මාර්ග නොලබන්නෙකු ගැන එසේ කියන ලද්දේද, නැතහොත් ආත්මභාව එකක් දෙකෙක්හි නොලබන්නෙකු ගැනම කියන ලද්දේදැයි පැහැදිලි කරනු.

උ:- ආත්මභාව එකක් දෙකක් නොලබන්නෙකු ගැන කියන ලද්දේ නොවෙයි. බොහෝ සෙයින් කිසි කලෙකත් මාර්ග නොලබන්නා වූ සංසාර ඛාණු නම් වූ සත්වයන් ගැනම කියන ලද්දේ වෙයි.

වට්ටඛාණු නාමෙසො සත්තො පය්‍යවිගොපකො යෙභුය්‍යෙන එවරූපස්ස භවතො වුට්ඨානං නත්ථි, **(දීඝනිකාය සීලක්ඛන්ධ අට්ඨකථා)**

වට්ටඛාණු නාම, – සංසාර කණු නම් වූ, ඒසො සත්තො, – මේ සත්වයා වනාහි, පය්‍යවිගොපකො, – පොළොව වඩන්නේ, යෙභුය්‍යෙන, – බොහෝ සෙයින්, ඒවරූප පස්ස, – මෙබඳු ස්වභාව ඇත්තා වූ සත්වයාට, භවතො, – භවයෙන්, වුට්ඨානං නත්ථි,– එතරවීමක් – නැගිටීමක් නැත.

වට්ටඛාණු නාමෙසොති, ඉදං වචනං නෙය්‍යත්ථං, ននීතත්ථං, තථාහි පපඤ්ච සූදනියං 'තංපනෙස ඒකස්මිං යේව අත්තභාවෙ නියතො,උදාහු අඤ්ඤස්මින්ති,ඒකස්මිං යේව නියතො,ආසේවන වසෙන පන දේවසිකං දිට්ඨිං රොචෙති එවා'ති වුත්තං අකුසලං හිනාමෙතං අබලං දුබ්බලං, න කුසලං විය මහා බලං, තස්මා ඒකස්මිං යේව අත්තභාවෙ නියතොති වුත්තං, අඤ්ඤථා සම්මත්ත නියාමො විය මිච්ඡත්ත නියාමො පි අච්චන්තිකො සියා, න ච අච්චන්තිකො සියා, යදි එවං වට්ටඛාණු චෝදනා කතන්ති ආහ. ආසේවන වසෙනාති, තථා හි යථා සකිං නිමුග්ගො නිමුග්ගො ඒස බාලොති වුත්තං එවං වට්ටඛාණුචොදනාය දීපෙති, පච්චයෙ පටිච්ච අයං තං තං දස්සනං ඔක්කන්තො, පන කදාචි තප්පටිපක්ඛෙ පච්චයෙ පටිච්ච තතොපි සීඝුක්ඛිපනමස්ස හොතීති නචත්තබ්බං, තස්මා ඒවරූපස්සහි යෙභුය්‍යෙන භවතො වුට්ඨානං නාම නත්ථිති වුත්තං,

වට්ටඛාණු නාමෙසොති ඉදං වචනං, – වට්ටඛාණු නාමෙසො යන මේ වචනය, නෙය්‍යත්ථං, – ගෙන හැර දැක්විය යුතු අර්ථ ඇති වචනයකි. ននීතත්ථං, – නීතාර්ථ ඇති වචනයක් නොවේ. තථා හි තතො එව, – එසේ හෙයින්ම, පපඤ්ච සූදනියං, පපඤ්ච සූදනී නම් වූ මජ්ඣිම නිකායට්ඨකථාවෙහි, තං පනේස – පෙ – රොචෙති එවාති, – යනුවෙන්, වුත්තං කියන ලදි, තං, – ඒ වට්ටඛාණු නාමෙසො යන මේ වචනය, ඒස – එසො, – මේ තෙමේ, ඒකස්මිං යේව අත්තභාවේ, – එකම ආත්මභාව යෙක්හි, නියතො, – නියත වූයේ දැයි, ඉති, – මෙසේ ප්‍රශ්නයකි. උදාහු අඤ්ඤස්මින්ති නැතහොත් අන් භවයෙක නියත වේද, ඒකස්මිං යේව , – ඒක ආත්මභාවයෙක්හිම, නියතො, – නියත වේ. පන ;සච්චං, – එය වනාහි සත්‍යයකි.

ආසේවන වසෙන, – ආසේවන වශයෙන්, දේවසිකං, – දිනපතා, දිට්ඨිං, – මිථ්‍යා ලබ්ධිය, රොචෙති ඒව, – රුචිකරන්නේමය, හි, – බෙද දක්වමි, ඒතං අකුසලං නාම, මේ අකුශලය නම් වනාහි, අබලං, – අබලය, දුබ්බලං, – දුබලය, කුසලං, විය. –

කුශලය මෙන්, න මහාබලං, - මහත් බල ඇත්තේ නොවෙයි. තස්මා, - එහෙයින්, ඒකස්මිං යේව අත්තභාවෙ නියතොති, - මෙසේ වුත්තං, - කියන ලදී, අඤ්ඤථා අන් පරිද්දෙකින්, අර්ථ ගන්නා කල්හි, සම්මත්ත නියාමො විය,-සම්මත්ත නියාමය සේ, මිච්ඡත්ත නියාමොපි, - මිච්ඡත්ත නියාමය ද, අච්චන්තිකො සියා, - ඒකාන්ත විය හැකිය, අච්චන්තිකො න සියා, - අච්චන්තික නොවන්නේය. යදි නසියා, ඉදින් නොවන්නෙ නම්, එවංසති, - මෙසේ ඒකාන්තික නොවන්නේ නම්, වට්ටබාණු චොදනා , - වට්ටබාණු චෝදනාව, කථං ඉති, - කෙසේ දැයි මේ ප්‍රශ්නය කල්පනා කොට, ආසේවන වසෙන යයි කීහ. තථා තං වචනං, - එසේ ඒ වචනය, හි සච්චං, ඒකාන්තයෙන් සත්‍යයකි. ඒසබාලො, - මේ බාල පෘථග්ජනයා, සකිං නිමුග්ගො, වරක් ගිලුනේ, නිමුග්ගො, - ගිලුනේමය, ඉති වුත්තං,-යථා, - කියන ලද්දක් මෙන්, ඒවං තථා, - එයට සමානව, වට්ටබාණු චෝදනාය; - වට්ටබාණු චෝදනාවෙන්, දීපෙති, - දක්වයි, අයං, - මේ බාලයා, - පච්චයේ පටිච්ච, - උපකාරක ප්‍රත්‍ය ධර්මයන් නිසා, තංතං දස්සනං, ඒ ඒ මිථ්‍යා දර්ශනයට, - ඔක්කන්තො, - බැසගත්තේ, කදචි, කිසි කලෙක, තප්පටිපක්ඛෙ, - ඒ ලබ්ධියට ප්‍රතිපක්ෂ වූ, පච්චයෙ පටිච්ච, - ප්‍රත්‍ය යන් හේතුකොට, තං තං දස්සනං, - ඒ ඒ දර්ශනයට, ඔක්කන්තො, - බැසගත්තේ, තතොපි, - ඒ තැන් පටන්, අස්ස, - ඔහුට, සිඝුක්ඛිපනං, - හිස එසවීමක්, හොති ඉති, - වේ යයි, න වත්තබ්බං, - නො කිවයුතු, තස්මා, - එහෙයින්, එවරූපස්ස,- මෙබඳු ස්වභාව ඇති බාලයාට, යෙභුය්‍යෙන, - බොහෝ සෙයින්, භවතො, - භව සංසාරයෙන්, වුට්ඨානං නාම, - නැගිටීමක් නම්, නත්ථීති වුත්තං, - නැතැයි කියන ලද්දේ වේ.

ස්කන්ධ යමකය නිමි.

## ආයතන යමකය

### නාම ප්‍රඥප්ති වාරය

# ගණ්ඨි පද ශෝධනය

ප්‍ර:- චක්ඛායතනය ආදීහු ද ධර්මයෝ ම වෙති, එසේ නම ධර්මායතනයම පමණක් දේශනා නොකොට කුමක් හෙයින් ආයතන දොළසක් දේශනා කරන ලද්දහු ද.

උ:- සයක් වූ විඤ්ඤාණයන්ට ලැබෙන ද්වාර ආරම්මණ වෙන් කොට දක්වීම පිණිස ආයතන දොළසක් වදළහ.

චක්ඛාදයොපිහි ධම්මා ඒව, එවං සති ධම්මායතන මිච්චෙව අවත්වා කස්මා ද්වාදසායතනානි වුත්තානීති චෙ, ඡ විඤ්ඤාණකායුප්පත්ති ද්වාරාරම්මණ වවත්ථානතො **(විභංග අට්ඨකථා)**

හි, - පැහැදිලි කරන්නෙමි, චක්ඛාදයොපි, - චක්ෂුරාදී හුද, ධම්මා ඒව, - ධර්මයෝ නම් ම වෙති, එවං සති, - එසේ ඇති කල්හි, ධම්මායතනමිච්චෙව, - ධම්මායතනය ම පමණක්, අවත්වා, - නොකියා, කස්මා, - කුමක් හෙයින්, ද්වාදසායතනානි,- දොළොස් ආයතන කෙනෙක්, වුත්තානි, - කියන ලද්දහුද, ඉති චෙ, - මෙසේ චෝදනාව ශෝධනය කරන්නෙමි. ඡ විඤ්ඤාණ කායුප්පත්ති ද්වාරාරම්මණ වවත්ථානතො, - සවැදෑරුම් විඤ්ඤාණ සමූහයාගේ, උත්පත්ති ස්ථාන ද්වාරා රම්මණ ව්‍යවස්ථා කිරීම වශයෙන් කියන ලද්දහ.

ප්‍ර:- ද්වාර ආරම්මණ එක සමූහයක් වශයෙන් නොකියා කුමක් හෙයින් වෙන් වෙන් කොට වදරණ ලද්දහුද,

උ:- ආයතන දේශනාවේදී ද්වාර ආරම්මණ විභාග දක්වීම පිණිස ද්වාර ආරම්මණ වෙන් වෙන් කොට වදරණ ලදහ.

ද්වාරාලම්බණ විභාග දස්සනත්ථා හි ආයතන දෙසනා. **(විභංග අනුටීකා)**

හි, - ප්‍රතිඵල කියන්නෙමි. ආයතන දේසනා, - ආයතන දේශනාව, ද්වාරාලම්බණ විභාගදස්සනත්තථා, - ද්වාර ආරම්මණයන්ගේ විභාග දක්වීම පිණිසය.

ප්‍ර:- කුමක් හෙයින් ආයතන නම් වෙත් ද,

උ:- චිත්ත චෛතසික ධර්මයෝ උත්සාහ කෙරෙත්නුයි හෝ තමන්ගේ කෘත්‍යය කෙරෙත්නු යි හෝ ආයතන නම් වෙති.

තවද:- ද්වාරාරම්මණ යෙහි ඒ චිත්ත චෛතසික ධර්මයන් පළල් කෙරෙත්නුයි ආයතන නම් වෙති.

තවද:- දීර්ඝතම වූ සංසාර වට්ට දුක්ඛය පවත්වන පමුණුවන බැවින් ද ආයතන නම් වෙති.

චිත්ත චෙතසිකා ධම්මා ආයතන්ති වායමන්ති එත්ථ චක්ඛු රූපාදීසූති ආයතනානි, තෙ වා ආයතූතෙ ධම්මෙ තනොන්ති විත්ථාරෙන්තීති ආයතනානි, ආයතං වා සංසාර දුක්ඛං නයන්ති පවත්තයන්තීති ආයතනානි,

එත්ථ චක්ඛුරූපාදීසු, - මෙ චක්ෂුද්වාර රූපාරම්මණා දීයෙහි, චිත්ත චෙතසිකා ධම්මා, -චිත්ත චෛතසික නම් වූ ධර්මයෝ ආයතන්ති වායමන්ති,-උත්සාහ කෙරෙත්, ඉති තස්මා, - එසේ හෙයින්, ආයතනානි, - ආයතන නම් වෙති, වා, - නොහොත්, ආයතූතේ, - ද්වාරම්මණයන්හි උපන්නා වූ, තෙ ධම්මෙ. - ඒ චිත්ත චෛතසික ධර්මයන්, තානි, - ඒ චක්ෂුද්වාර රූපාරම්මණාදිහු, තනොන්ති විත්ථාරෙන්ති,- පළල් කෙරෙත් නුයි, ඉති තස්මා, - එසේ හෙයින්, ආයතනානි, - ආයතන නම් වෙති. වා, - නොහොත්, ආයතං, - දීර්ඝ වූ, සංසාර දුක්ඛං, - සංසාර දුක්ඛයට, නයන්ති පවත්තයන්ති, - පමුණුවත්නුයි, ඉති තස්මා, - එසේ හෙයින්, ආයතනානි, - ආයතන නම් වෙති.

වායමන්තීති අත්තනො කිච්චං කරොන්තිච්චෙවස්ස අත්ථො, **(විභංග මූලටීකා)**

වායමන්තීති, - වායමන්ති යනු, අත්තනො කිච්චං, - තමන්ගේ කෘත්‍යය, කරොන්ති එව, - කරත්ම නුයි. ඉති අයං අස්ස අත්ථො, - යනු මේ පදයාගේ මේ අර්ථයයි.

තවද:- චිත්ත චෛතසික ධර්මයන්ගේ උත්පත්ති ස්ථාන බැවින්ද, වාසස්ථාන ආකර ස්ථානය බැවින්ද, සමෝසරණ - රැස්වෙන ස්ථාන බැවින්ද, හේතු කරුණු වන බැවින්ද ආයතන නම් වෙති.

සඤ්ජාති දේසෙ හේතුම්හි — වාසට්ඨානාකරෙසුච.
සමෝසරණට්ඨානෙ ච — යතනං පද පූරණෙ.
**(අභිධානප්පදීපිකා)**

ආයතනං, - ආයතන ශබ්දය, සඤ්ජාති දෙසෙ, - උපදින තැන යන අර්ථයෙහි ද, හේතුම්හි, - කාරණය යන අර්ථයෙහි ද, වාසට්ඨානාකරෙසු ච, - වාසස්ථාන, ආකර ස්ථාන යන අර්ථයන්හිද, සමොසරණට්ඨානේච, - රැස්වන ස්ථාන යන අර්ථයෙහිද පද පූරණෙ - පද පූරණාර්ථ යෙහිද, සියා - වන්නේය.

[සැ: යු:- කියන ලද අර්ථ සය අතුරෙන් පද පූරණ අර්ථය නොගෙන, ඉතිරි අර්ථ පසෙහිම වැටෙත් යයි දතයුතු.]

තන්නිස්සයාරම්මණ භාවෙන තත්ථෙව උප්පත්තිතො, **(සඤ්ජාති දේස)** තෙසං අභාවෙ අභාවතො, **(හේතු)** තදයත්ත වුත්තිතාය, - **(වාසට්ඨාන)** තනනිස්සතත්තා තදරම්මණත්තා ච, **(ආකර)** තත්ථ වත්ථුද්වාරාරම්මණවසෙන සමෝසරණතො, **(සමොසරණට්ඨාන)** **(විභංග අට්ඨකථා)**

තන්නිස්සයාරම්මණ භාවෙන, - ඒ චක්ෂුප්‍රසාද ආදිය ඇසුරුකොට ඇති ආරම්මණ ඇති බැවින්, තත්ථෙව, - ඒ චක්ෂුප්‍රසාදදියෙහිම, උප්පත්තිතො,-උපදින බැවින්, තෙසං, - ඒ චක්ෂුරාදීන්ගේ, අභාවෙ, - නැත්තේ නම්, තෙසං, - එම චිත්ත චෛත සිකයන්ගේ, අභාවතො, - නැති බැවින්, තදයත්ත - වුත්තිතාය - ඒ චක්ෂුප්‍රසාදදිය ඇසුරු කොට පවත්නා බැවින්, තන්නිස්සිත්තා ච, - ඒ චක්ෂුප්‍රසාදදිය නිශ්‍රය කොට ඇති බැවින් ද, තදරම්මණත්තා ච, - ඒ චක්ෂු ප්‍රසාදදිය අරමුණුකොට ඇති බැවින්ද තත්ථ තත්ථ, - ඒ ඒ චක්ෂුප්‍රාසාදදියෙහි, වත්ථු ද්වාරාරම්මණ වසෙන,-වස්තු ද්වාර ආරම්මණ වශයෙන්, සමොසරණතො, - එක්රැස්වන බැවින් ද, (ආයතන නම් වෙති)

ප්‍ර:- ආයතන දෙළස අතුරෙන් චක්ෂුප්‍රසාද දි සය කුමක් හෙයින් පළමු කොට වදරණ ලද්දහු ද,

උ:- ආධ්‍යාත්මික බැවින් ද, අරමුණු ගෝචර කොට ඇති බැවින් ද, ආධ්‍යාත්මික ආයතනම පළමු කොට දක්විය යුතු බැවින් එසේ දේශනා කරන ලදහ.

අජ්ඣත්තික භාවෙන ච, විසයීභාවෙන ච අජ්ඣත්තිකානං පඨමං දස්සෙතබ්බතං දස්සෙති, **(විභංග මූලටීකා)**

අජ්ඣත්තික භාවෙන ච, - ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත් බැවින් ද, විසයීභාවෙන ච, - විෂය ආරම්මණයන් ගෝචර කොට ඇති බැවින් ද, අජ්ඣත්තිකානං ආධ්‍යාත්මික ආයතනයන්ගේ, පඨමං, - පළමු කොට, දස්සෙතබ්බතං, - දක්විය යුතු බව, දස්සෙති, - දක්වයි.

ප්‍ර:- ආධ්‍යාත්මික ආයතන සය අතුරෙන් කුමක් හෙයින් චක්ඛායතනය පළමු කොට වදරණ ලද්දේද,

උ:- සනිදස්සන සප්පටිඝ අරමුණ ඇති ආයතනය බැවින් එය වඩාත් ප්‍රකට බැවින් චක්ඛායතනය පළමු කොට වදරණ ලදි.

[සැ: යු:- සෝතායතන ආදියද බාහිරායතන ද අනුපිළිවෙළින් දේශනා කිරීමට හේතුව ප්‍රශ්නෝත්තර සහිත සාධක පාළි පාඨ අර්ථ බලා අවබෝධ කළ යුතුය.]

අජ්ඣත්තිකායතනේසු සනිදස්සන සප්පටිඝාරම්මණත්තා චක්ඛායතනං විභූතත්තිතං පඨමං වුත්තං, තදනන්තරං අනිදස්සන සප්පටිඝාරම්මණානි, තත්ථාපි අසම්පත්-තග්ගාහක සාමඤ්ඤෙන චක්ඛායතනානන්තරං සෝතායතනං වුත්තං, ඉතරේසු

සිඝතරං ආරම්මණග්ගහණ සමත්ථත්තා ඝානායතනං පඨමං වුත්තං, පුරතො ඨපිත මත්තස්සපි භොජනාදිකස්ස ගන්ධො වාතානුසාරෙන ඝානෙ පටිහඤ්ඤති, තදනන්තරං පන පදෙසවුත්ති සාමඤ්ඤෙන ජිව්හායතනං වුත්තං තතො සබ්බට්ඨානික කායායතනං, තතො පඤ්චන්නම්පි ගෝචරග්ගහණ සමත්ථං මනායතනං **(අභි - ධම්මත්ථ විභාවිනි ටීකා)**

අජ්ඣත්තිකායතනෙසු ,- අධ්‍යාත්මික ආයතන සදෙන අතුරෙන්, චක්ඛායතනං චක්ඛායතනය, සනිදස්සන 'සප්පටිඝාරම්මණත්තා,- සනිදස්සන සප්පටිඝ රූපාරම්ම-ණය අරමුණු කොට ඇති බැවින්, විභූතං, - ප්‍රකටය, ඉති තස්මා, - එසේ හෙයින්, තං පඨමං වුත්තං,-එය පළමු කොට වදරණ ලදි. තදනන්තරං, - ඒ චක්ඛායතනයට අනතුරුව, අනිදස්සන සප්පටිඝාරම්මණානි, - අනිදස්සන සප්පටිඝයන් අරමුණු කොට ඇත්තා වූ, ඉතරානි,- මේ හැර ඉතිරි ආයතනයෝ, වුත්තානි, - වදරණ ලදහ.

තත්ථාපි, ඔවුන් අතුරෙන් ද, අසම්පත්තග්ගාහක සාමඤ්ඤෙන,- අසම්ප්‍රාප්ත අරමුණු ගැනීමෙ සමානත්වයෙන්, චක්ඛායතනානන්තරං, - චක්ඛායතනයට අනතුරුව සෝතායතනං වුත්තං, - සෝතායතනය කියන ලදි. ඉතරේසු, ඉතිරි ආයතන අතුරෙන්, සිඝතරං, - ඉතා සිඝ්‍රයෙන්, ආරම්මණග්ගහණ සමත්ථත්තා, - අරමුණු ගැනීමෙහි සමත් බැවින්, ඝානායතනං, - ඝානායතනය, පඨමං වුත්තං, - පළමු කොට වදරණ ලදි. පුරතො ඨපිතස්ස, - ඉදිරිපිට තබන ලද්දවූ, භෝජනාදිකස්ස, භෝජනාදීන්ගේ ගන්ධො, - ගන්ධය, වාතානුසාරෙන, - වාතානු සාරයෙන්, ඝානෙ පටිහඤ්ඤති, - ඝානප්‍රසාදයෙහි හැපේ. හි, - එය සත්‍යයකි.

තදනන්තරං පන, - ඒ ඝානායතනයට අනතුරුව වනාහි, පදෙසවුත්ති සාමඤ්-ඤේන,-ශරීරයෙහි ඒකදේශයක පැවතුම ඇති සමානත්වයෙන්, ජිව්හායතනං වුත්තං, ජිව්හායතනය වදරණ ලදි. තතො, - ඉන්පසු, සබ්බට්ඨානිකං, - සියලු සිරුරෙහි පැතිර පවත්නා වූ, කායායතනං, - කායායතනය, වුත්තං වදරණ ලදි. තතො,- ඉන් පසු, පඤ්චන්නම්පි, - පසක් වූ ප්‍රසාදයන්ගේ ද, ගෝචරග්ගහණ සමත්ථං, - අරමුණ ගැනීමට සමර්ථ වූ, මනායතනං වුත්තං, - මනායතනය වදරණ ලදි.

ප්‍රː- දිබ්බචක්ඛු, පඤ්ඤාචක්ඛු, බුද්ධචක්ඛු, සමන්තචක්ඛු, ධම්මචක්ඛු යනුවෙන් චක්ඛු ජාති පසක් තිබියදී දිබ්බචක්ඛු හා පඤ්ඤාචක්ඛු යන දෙක පමණක් ස්වරූප වශයෙන් ගන්නා ලද්දේ කුමක් හෙයින්ද.

උː- දිබ්බචක්ඛු පඤ්ඤාචක්ඛු දෙක පමණක් සමීප බැවින් වදරණ ලදහ. ඉතිරි තුන ඉතා දූරස්ථ බැවින් නොවදරණ ලදහ.

ඉතරේසං එත්ථ සුවිදූර භාවතො, තත්ථ තං වුච්චතෙ, අත්ථද්වය මෙව වත්වා පාරිසේසෙනාති ඉතරෙසං එත්ථ සුවිදූර භාවතො, **(යමක අනුටීකා)**

එත්ථ, - මේ පස්වැදෑරුම් චක්ෂු අතුරෙන්, ඉතරේසං; - මේ දිව්‍යචක්ෂු ප්‍රඥ චක්ෂු දෙක හැර සෙසු චක්ෂූන්ගේ , සුවිදූර භාවතො, - ඉතාමත් දූරස්ථ බැවින්,

තත්ථ, - ඒ පසක් වූ චක්ෂු අතුරෙන්, පාරිසෙසෙන, - පාරිශේෂ නය වශයෙන්, වත්වා, - කියා. තං අත්ථද්වයමෙව,-දිබ්බචක්ඛු පඤ්ඤාචක්ඛු යයි නම් වූ අර්ථ දෙක පමණක් ම, වුත්තං, - කියන ලදී.

ප්‍ර:- සම්මාවාචා ආදී විරති තුන කුමක් හෙයින් සීලස්කන්ධයයි කියනු ලැබේද.

උ:- සම්මාවාචා ආදී විරති තුන වනාහි, විරති සීල වන බැවින් ස්වජාතික වූ සීලස්කන්ධයෙන් සංග්‍රහ වන බැවින් සීලස්කන්ධයයි කියන ලදහ. සම්මාවාචාදයො තයො සීලමෙව, තස්මා තෙ සජාතිතො සීලක්ඛන්ධෙන සංගහිතා. **(විභංග අට්ඨ කථා)**

සම්මාවාචාදයො, - සම්මාවාචා ආදීවූ, තයො, - තිදෙන, සීලමෙව, - සීලයම වෙති, තස්මා, - එහෙයින්, තෙ, - ඒ සම්මාවාචා ආදීහු, සජාතිතො, - සමාන ජාති ඇති බැවින්, සීලක්ඛන්ධෙන, - සීලස්කන්ධයෙන්, සංගහිතා,-සංග්‍රහ කොට ගන්නා ලදහ.

ප්‍ර:- සම්මා සමාධිය සමාධියම බැවින් සමාධිස්කන්ධයෙන් සංග්‍රහිත වෙයි, සම්මාවායාම සම්මා සති සමාධිස්කන්ධ වශයෙන් සංග්‍රහ කිරීමට සුදුසුද,

උ:- සුදුසුය, සමාධිය වනාහි තමන්ගේම ශක්තියෙන් අරමුණෙහි අර්පණා වශයෙන් ,එකඟවීමට සමර්ථ නොවේ. වීර්‍ය්‍ය යෙන් රුකුල් දීමෙන් ද, සතියෙන් අරමුණු සිහිකර වීමෙන් ද, ලද උපකාර ඇතිව එක් අරමුණක සමාධිය පිහිටීමට සමත් වේ. එනිසා සමාධිය ස්වභාව වශයෙන්ම සමාධි-ස්කන්ධයයි ද විරිය සති දෙක ක්‍රියා වශයෙන් සමාධියට සහාය වීමෙන් ද සමාධිස්කන්ධයට ඇතුලත් වන ,බව කියන ලදී.

සම්මාවායාමාදීසු පන තීසු සමාධි අත්තනො ධම්මතාය ආරම්මණෙ එකග්ගභාවෙන අප්පේතුං න සක්කොති, විරියෙන පග්ගණකිච්චං සාධෙන්තෙන සතියා ච අපිලාපන කිච්චං සාධෙන්තියා ලද්ධූපකාරො හුත්වා සක්කොති, තස්මා සමාධියෙවෙත්ථ සජාතිතො සමාධික්ඛන්ධෙන සංගහිතො, වායාම සතියො පන ක්‍රියතො සංගහිතා හොන්ති, **(විභංගඅට්ඨකථා)**

පන,- තව ,කොටසක් විස්තර දක්වන්නෙමි. සම්මාවායාමාදීසු, - සම්මාවායාම ආදී වූ, තීසු, - මාර්ගාංග තුනෙහි, සමාධි, - සමාධිය, අත්තනො ධම්මතාය, - තමන්ගේ ස්වභාවයෙන්ම, ආරම්මණෙ, - භාවනාරම්මණයෙහි, එකග්ගභාවෙන, - එකාග්‍ර භාවයෙන්, අප්පෙතුං, - අර්පණා වීමට, න සක්කොති, - නොහැකි වෙයි. විරියෙන, වීර්‍ය්‍යයෙන්, පග්ගහණකිච්චං සාධෙන්තෙන, - ප්‍රග්‍රහකෘත්‍ය සිද්ධකිරීමෙන් ද, **සතියා,** සමෘතියෙන්,-අපිලාපන කිච්චං සාධෙන්තියා ච, - නොමුළාවීම් කිස සිද්‍ධ කිරීමෙන්ද

ලද්ධූපකාරො හුත්වා, ලබන ලද උපකාර ඇතිව, සක්කොති, - අර්පණා වීමට සමත් වෙයි. තස්මා, - එහෙයින්, එත්ථ, මේ මාර්ගාංග තුන අතුරෙන්, සමාධියෙව සමාධියම, සජාතිතො, - තමන්ගේ ස්වභාව යෙන්ම, සමාධික්ඛන්ධෙන, - සමාධිස්කන්ධයෙන්, සංගහිතො, - සංග්‍රහ කරන ලද්දේ වේ. වායාම සතියෝ පන, වායාම සති යන දෙක වනාහි ක්‍රියතො, - සමාධියට උපකාර වීමේ ක්‍රියා අර්ථයෙන්, සංගහිතා, - සංගෘහිතා හොන්ති, - වෙති.

ප්‍ර:- ප්‍රඥස්කන්ධයෙහි සම්මාදිට්ඨිය ප්‍රඥවම නිසා ප්‍රඥසකන්ධයයි කියනු ලැබේ. සම්මාසංකප්පය ප්‍රඥාසකන්ධයයි කීම කෙසේද සුදුසුද,

උ:- කීමට සුදුසුය. ප්‍රඥව තමන්ගේම ස්වභාවයෙන් අනිත්‍ය ආදී වශයෙන් අරමුණු නිශ්චය කිරීමට සමර්ථ නොවෙයි. විතර්කය විසින් පෙරළ පෙරළා දෙන කල්හිම සමර්ථ වෙයි. එනිසා සම්මාදිට්ඨිය, ස්වභාවයෙන්ම ප්‍රඥස්කන්ධයය. සම්මාසංකල්පය ප්‍රඥව හා සමාන කෘත්‍යය වශයෙන් ප්‍රඥස්කන්ධයයි කියනු ලැබේ.

සම්මාදිට්ඨි සම්මාසංකප්පෙසුපි පඤ්ඤා අත්තනො ධම්මතාය අනිච්චං දුක්ඛං අනත්තාති ආරම්මණං නිච්ඡෙතුං නසක්කොති, විතක්කෙන පන ආකොටෙත්වා ආකොටෙත්වා දෙන්තෙ සක්කොති, - පෙ - තස්මා ඉධ සම්මා දිට්ඨියේව සජාතිතො පඤ්ඤාක්ඛන්ධෙන සංගහිතා, සම්මාසංකප්පො පන ක්‍රියතො සංගහිතො හොති, **(විභංග අට්ඨකථා)**

සම්මාදිට්ඨි සම්මා සංකප්පේසුපි, - සම්මාදිට්ඨි සම්මාසංකල්පයන් අතුරෙන් ද, පඤ්ඤා, ප්‍රඥව, අත්තනො ධම්මතාය, -තමන්ගේ ස්වභාවයෙන්, අනිච්චං දුක්ඛං අනත්තා ඉති, - අනිත්‍යය දුක්ඛයයි අනාත්මයැයි, ආරම්මණං නිච්ඡෙතුං, - අරමුණු නිශ්චය කිරීමට, න සක්කොති, සමර්ථ නොවෙයි. විතක්කෙන පන, - විතර්ක චෛතසිකය විසින් වනාහි, - ආකොටෙත්වා ආකොටෙත්වා දෙන්තෙ, - නංවා නංවා දෙන කල්හි, සක්කොති, - සමර්ථ වෙයි. තස්මා, - එහෙයින්, ඉධ, - මේ මාර්ගාංග දෙක අතුරෙන්, සම්මාදිට්ඨියෙව, - සම්මාදිට්ඨියම, සජාතිකො, - තමන්ගේ ස්වභාවයෙන්, පරිඤ්ඤාක්ඛන්ධෙන,-ප්‍රඥස්කන්ධයෙන්, සංගහිතා,- සංගෘහිත වේ. සම්මාසංකප්පො පන,-සම්මා සංකල්පය, - වනාහි, - ක්‍රියතො, - ප්‍රඥව හා සමාන ක්‍රියා වශයෙන්, සංගහිතො, - ප්‍රඥස්කධයෙන් සංගෘහිත වේ.

ප්‍ර:- ගන්ධාරම්මණයක් නොවී සීලාදිය කුමක් හෙයින් ගන්ධයයි කියන ලද්දේද,

උ:- ගන්ධාරම්මණයක් නොවූයේ නමුත්, හමායන අර්ථයෙන් ප්‍රකට බැවින් ගන්ධයයි කියන ලදී.

සීලගන්ධොති ආදීනි වායනට්ඨෙන සීලාදීනං යේව නාමානි. **(යමක අට්ඨකථා)**

සීලගන්ධොති ආදීනි, - සීලගන්ධො යනාදිය, වායනට්ඨෙන, - හමායන අර්ථයෙන් - ප්‍රකට වන බැවින්, සීලාදීනං යේව, සීලාදීන්ට ම, නාමානි, - නාමයෝ වෙති,

වායනට්ඨේනාති පසාරණට්ඨේන පාකටභාවට්ඨේන වා. **(යමක අනුටීකා)**

වායනට්ඨේනාති, - වායනට්ඨේන යනු, පසාරණට්ඨේන, - පාකටභාවට්ඨේන වා, - පැතිරෙන අර්ථයෙන් ප්‍රකටවන අර්ථයෙන්, යනු අර්ථයි.

වායනං සවිසයෙ බ්‍යාපෙත්වා පවත්තනං - පෙ - යස්මා පන සවිසයබ්‍යාපනං තත්ථ පසටභාවො පාකට භාවො වා හොති, තස්මා පසාරණට්ඨේන පාකටභාවට්ඨේන වාති වුත්තං, අත්තනො වත්ථුස්ස සූචනං වා වායනං, **(යමක අනුටීකා)**

සවිසයෙ, - තමන්ගේ අරමුණෙහි, බ්‍යාපෙත්වා, - පැතිරගෙන, වායනං පවත්තනං, - හමාෑම පැවැත්වීම - පෙ - ජන, - ශෝධනය කොට දක්වන්නෙමි. යස්මා යම්හෙයකින්, සවිසය බ්‍යාපනං, - තමන්ගේ අරමුණෙහි පැතිරගෙන සිටීම, තත්ථ, ඒ අරමුණෙහි, පසටභාවො වා, - පැතුරුණු බව හෝ, පාකටභාවො වා, - ප්‍රකට වන බව හෝ, හොති, - වේ ද, තස්මා, - එහෙයින්, පසාරණට්ඨේන, - පාකටභාවට්ඨේන වාති, - යයි, වුත්තං, - කියන ලදී. වා, - නොහොත්, අත්තනො, - තමාගේ, වත්ථුස්ස, - වස්තුව, සූචනං, - කියා පෑම, ප්‍රකට කිරීම, වායනං, - වායනය නම් වේ.

ගන්ධෙති අත්තනො වත්ථුං සූචෙතීති ගන්ධො,- අත්තනො වත්ථුං, - තමන්ගේ නිශ්‍රය වස්තුව, ගන්ධෙති, - සූචෙති, - ප්‍රකට කෙරේනුයි. ඉති තස්මා, - එසේ හෙයින් ගන්ධො, - ගන්ධය නම්.

ප්‍ර:- රසාරම්මණයක් නොවන්නේ නමුත් අර්ථරසාදිය කුමක් හෙයින් රසයයි කියනු ලැබේද.

උ:- රසාරම්මණයක් නොවූයේද, සාදු මධුරාර්ථයෙන් අර්ථරසාදිය රසයයි කියනු ලැබේ. අත්ථරසොති ආදිනිපි සාදු මධුරට්ඨේන අත්ථාදීනං යේව නාමානි, **(යමක අට්ඨකථා)**

අත්ථරසොති ආදිනිපි, - අත්ථරසො යනාදීහුද, සාදු මධුරට්ඨේන, - සාදු මධුර අර්ථ ඇති බැවින්, අත්ථාදීනං යෙව , අර්ථ ආදීන්ටම, නාමානි, - නාමයෝ වෙති.

රසන්ති අස්සාදෙන්ති තං තං සත්තාති රසො, සත්තා, - සත්වයෝ, තං තං ඒ ඒ ධර්මය, රසන්ති අස්සාදෙන්ති, - රසනය කෙරෙත්. ආස්වාදනය කෙරෙත්, ඉති තස්මා, - එනිසා, රසො,- රස නම් වේ.

නාම ප්‍රඥප්ති වාරය නිමි

සුගතියං, – සුගති භූමියෙහි, මහානුභාවෙන කම්මුනා, – මහත් ආනුභාව ඇති කර්මයෙන්, නිබ්බත්තමානානං, – උපදින්නා වූ, ඕපපාතිකානං, – ඕපපාතිකයන්ට, ඉන්ද්‍රිය වෙකල්ලායොගතො, – ඉන්ද්‍රිය විකලත්වයක් නොමැති බැවින්, චක්ඛු සොත ඝානාලාභො, – චක්ඛු සෝත ඝාන නොලැබීම, සංසේදජානං, – සංසේදජ සත්වයන්ගේ , වසෙන, – වශයෙන්, හොති, – වෙයි. භාවාලාභො, – භාවය නොලැබීම, පඨමකප්පික ඕපපාතිකානං, – ප්‍රථම කල්පික ඕපපාතිකයන්ගේ, වසෙනපි හොති, – වශයෙන් ද වේ.

[සැ: යු:– ඕපපාතික, සංසේදජ, ගබ්භසෙය්‍යක කියන හේතුව ද , වචනාර්ථ ද , සාධක පාඨ වශයෙන් ද අවබෝධ කටයුතු.]

උපපාතො නෙසං අත්ථීති ඕපපාතිකා (වචනාර්ථයි)

නෙසං, – ඒ පුද්ගලයන්ට, උපපාතො, – පරිපූර්ණ ආත්මභාවය ප්‍රකටව පහළ වීම, අත්ථීති, – ඇති බැවින්, ඕපපාතිකො, – ඕපපාතික නම් වෙති,

උක්කංස පරිච්ඡෙද වසෙන චෙත්ථ විසිට්ඨ ඕපපාතිකො ගහිතො, යථා අභිරූපස්ස කඤ්ඤා දතබ්බාති. **(අභිධම්මත්ථ විභාවිනී ටීකා)**

ච, – පැහැදිලි කරන්නෙමි. එත්ථ, – මෙහි, උක්කංස පරිච්ඡෙදවසෙන, – උත්කෘෂ්ට පරිච්ඡේද වශයෙන්, විසිට්ඨ ඕපපාතිකො, – විශිෂ්ඨ ඕපපාතිකයා, ගහිතො, ගන්නා ලදී. යථා, – කෙසේ ද යත්, අභිරූපස්ස කඤ්ඤාදතබ්බාති, – යනාදියෙහි මෙනි. අභිරූපස්ස, – විශිෂ්ට, රූප ඇත්තෙකුට වා, – නොහොත්, බොහෝ ධන ධාන්‍ය ඥාණ ගුණයෙන් විශේෂ අයෙකුට, කඤ්ඤා, – විශිෂ්ට රූප ඇත්තා වූ, වා– නොහොත්, බොහෝ ධන ධාන්‍යඥාණ ගුණ ඇත්තා වූ කන්‍යාව, දතබ්බා, – දියයුතුයං කිවාක් මෙනි.

කමලකුහර ගබ්භමලාදි සංසේදට්ඨානේසු ජාතා සංසේදජා,
**(අභිධම්මත්ථ විභාවිනී ටීකා)**

කමලකුහර ගබ්භමලාදි සංසෙදට්ඨානේසු, – පියුම් ගැබ ගර්භමල ආදි තෙතමන ඇති තැන්හි, ජාතා, – උපන් සත්වයෝ, සංසේදජා, – සංසේදජ නම් වෙති.

ප්‍ර:– යස්ස චක්ඛායතනං උප්පජ්ජති යනාදියෙහි ගබ්භසෙය්‍යකයා ස්වරූප කොට ගත් නමුත් ඒ පුද්ගලයන්ට ප්‍රතිසන්ධි කාලයෙහි චක්ඛායතනය නොලැබිය හැකි නොවේද. එසේ ගැනීම සුදුසුද.

උ:– ප්‍රතිසන්ධි කාලයෙහි නොමැති බව සත්‍යයකි. එසේ නමුත් පච්චුප්පන්න තුන අතුරෙන්, ඛණපච්චුප්පන්න, සන්තති පච්චුප්පන්නයන් නොගෙන අද්ධාපච්චුප්පන්න ගන්නා ලද බැවින් එසේ සුදුසුය.

## ප්‍රවෘත්ති වාරය

# ගණ්ඨි පද ශෝධනය

ප්‍රː- චක්ඛායතන මූලයෙහි සද්දයතන මූලිය ඇතුලත් කොට කියනු ලැබේද, නොකිය යුතුද, නොකිය යුතු නම් චක්ඛායතනමූලකානි එකාදස යන අට්ඨකථා වචනය කෙසේ ගනු ලැබේද,

උː- කීමට සුදුසු නැත. එහෙත් චුතිප්‍රතිසන්ධීන්ගේ වශයෙන් උපාදින්නක නම් වූ ප්‍රවෘත්තියෙහි උත්පාද නිරෝධ වදරණ ලද ප්‍රවෘත්ති වාරයෙහි සද්දයතනය පිළිබඳ විසඳුමක් නැති නමුත් පුච්ඡාවෙහි ලැබීම සංග්‍රහ කොට කියන ලදැයි දතයුතු.

පවත්ති වාරෙ චක්ඛායතන මූලානි එකාදසාති පටිසන්ධි චුතිවසෙන උපාදින්න පවත්තස්ස උප්පාද නිරොධ වචනෙ ඒකස්මිං ලබ්භමාන විස්සජ්ජනම්පි සද්දයතනේන සද්ධිං යමකං පුච්ඡාමත්තලාභෙන සංගණ්හිත්වා වදතීති දට්ඨබ්බං, **(යමක මූලටීකා)**

පවත්ති වාරෙ, – ප්‍රවෘත්ති වාරයෙහි, චක්ඛායතන මූලානි එකාදසාති, – යනුවෙන් කියන ලද වචනය, චුතිපටිසන්ධිවසෙන, – චුතිපටිසන්ධි වශයෙන්, උපාදින්න පවත්තස්ස, – උපාදින්න නම් වූ ප්‍රවෘත්තියගේ, උප්පාද නිරොධවචනෙ, – උත්පාද නිරෝධ කීමෙහි, ඒකස්මිං, – මේ ප්‍රවෘත්ති වාරයෙහි, අලබ්භමාන විස්සජ්ජනම්පි, නොලැබිය හැකි විසඳුමක් ඇති නමුත්, සද්දයතනේන, – සද්දයතනය හා, සද්ධිංසමග, යමකං, – යමකය, පුච්ඡාමත්ත ලාභෙන, – පුච්ඡා මාත්‍රයක්ම ලැබීම් වශයෙන්, සංගණ්හිත්වා, – සංග්‍රහ කොට, වදති, – ඉති දට්ඨබ්බං, කියන්නේ – යනුවෙන් දතයුතුය.

ප්‍රː- කුමක් හෙයින් සද්දයතනය පිළිබඳ විස්සර්ජනයක් නොකියන ලදද,

උː- ප්‍රතිසන්ධි කාලයෙහි නොලැබෙන බැවින් නොකියන ලදී.

ප්‍රː- චක්ඛායතනය පමණක් ලැබී සෝතායතනය නොලැබිය හැකි වූ ඕපපාතික යෙහි දුගති අහේතුකයා පමණක් ගෙන කුමක් හෙයින් සුගති අහේතුකයා නොගන්නා ලද්දේද,

උː- සුගති භූමියෙහි මහානුභාව සම්පන්න කුශල කර්මයෙන් උපදින ඕපපාතික යන්ට චක්ඛු සොත ආදී ඉන්ද්‍රිය විකලත්වයක් නොමැති බැවින් සුගති අහේතුකයා නොගන්නා ලදී.

සුගතියං මහානුභාවේන කම්මුනා නිබ්බත්තමානානං ඕපපාතිකානං ඉන්ද්‍රිය වෙකල්ලායොගතො චක්ඛුසෝත ඝානාලාභෝ සංසේදජානං, භාවාලාභෝ පඨම කප්පික ඕපපාතිකානං වසෙන පි. **(අභිධම්ම විභාවිනි)**

අද්ධා පච්චුප්පන්නන්තො ගධත්තා -

පච්චුප්පන්නං තිධා වුත්තං — ඛණ සන්තති අද්ධතො,
තත්ථහි ඛණ සම්පත්ති — පච්චුප්පන්න ඛණාදිකං,
එකද්වෙ සන්තති වාර — පරියා පන්නම්පි තං පන
සන්තති පච්චුප්පන්නන්ති — ආහුසන්තති කොවිද
එක භව පරිච්ඡින්නං — පච්චුප්පන්නන්ති පච්ඡිමං.

**(අභිධම්මාවතාර)**

අද්ධා පච්චුප්පන්නන්තොගධත්තා,- අද්ධා පච්චුප්පන්න යෙහි ඇතුලත් වූ බැවිනි.

පච්චුප්පන්නං, - පච්චුප්පන්නය, ඛණ සන්තති අද්ධතො, - ඛණ පච්චුප්පන්න, සන්තති පච්චුප්පන්න - අද්ධාපච්චුප්පන්න වශයෙන්, තිධා, - තෙවැදෑරුම් කොට-වුත්තං, - කියන ලදී. හි, - බෙද දක්වන්නෙමි.

තත්ථ, - ඔවුනතුරෙන්, ඛණ සම්පත්ති, - වර්තමාන ක්ෂණය - පච්චුප්පන්න ඛණාදිකං, - ක්ෂණ පච්චුප්පන්න යයි. වුත්තං, - කියන ලදී. එක ද්වෙ සන්තති වාර පරියාපන්නං, - චිත්තසන්තතිවාර එක දෙකක් තුල කාලය, තං පන, - ඒ පච්චුප්පන්නය වනාහි, - සන්තති කොවිද, - සන්තතියෙහි දක්ෂයෝ, සන්තති පච්චුප්පන්නන්ති, - සන්තති පච්චුප්පන්න යයි ආහු,- කීහ. එකභව පරියාපන්නං,- එක භවයකට ඇතුලත් වූ පච්චුප්පන්නය, පච්ඡිමං පච්චුප්පන්නන්ති, - අවසාන වූ අද්ධා පච්චුප්පන්න යයි, ආහු, - කීහ.

ප්‍ර:- චක්ඛායතනය ම ලැබ සෝතායතනය ලැබීමට ප්‍රථමයෙන් චුතවන්නවුන් සහේතුක ප්‍රතිසන්ධිය නොමැතිව අහේතුක පටිසන්ධිය ලැබෙන බව කොතැනක බලා තේරුම් ගත හැකිද.

උ:- ඉන්ද්‍රිය යමක මූලටීකාව සම්මොහ විනොදනි අට්ඨකථාවන් බලා තේරුම් ගත හැකිය.

ගබ්භ සෙය්‍යකානඤ්ච අනුප්පන්නෙසු චක්ඛාදිසු චවන්තානං අහේතුක පටි-සන්ධිකතා සහේතුක පටිසන්ධිකානංකාමාවචරානං නියමතො සචක්ඛුකාදිභාව දස්සනේන දස්සිතො හොති. (යමක මූල ටීකා)

ච, - නැවත පැහැදිලි කරන්නෙමි. චක්ඛාදිසු, - චක්ෂුරින්ද්‍රිය යනාදිය, අනුප්ප-න්නෙසු, - ඉපදීමට ප්‍රථමයෙන්, චවන්තානං, - චුතවන්නා වූ, ගබ්භසෙය්‍යකානං, ගබ්භසෙය්‍යක සත්වයන්ගේ, අහේතුක පටිසන්ධිකතා, - අහේතුක පටිසන්ධිය ඇති බව, දස්සිතා, - දක්වන ලදී. සහේතුක පටිසන්ධිකානං, - සහේතුක පටිසන්ධි ඇත්තා වූ, කාමාවචරානං - කාමාවචරයන්ට, නියමතො, - නියම වශයෙන්, සචක්ඛුකාදි භාව දස්සනේන, - චක්ෂුරින්ද්‍රිය ඇති බව ආදිය දැක්වීමෙන්, දස්සිතො හොති. - දක්වන ලද්දේ වෙයි.

අට්ඨහි සහේතුක මහා විපාකෙහි කාමාවචර දෙවෙසු චෙව මනුස්සෙසුච පුඤ්ඤ වන්තානං පටිසන්ධි හොති, (විභංග අට්ඨකථා)

අට්ඨහි, - අටක් වූ සහෙතුක මහා විපාකෙහි, - සහේතුක මහා විපාක චිත්තයන්ගෙන්, කාමාවචර දෙවෙසු චෙව, - කාමාවචර දෙවියන් කෙරෙහි ද, මනුස්සෙසු ච, - මනුෂ්‍යයන් කෙරෙහි ද, පුඤ්ඤවන්තානං, - පුණ්‍යවන්තයන්ගේ පටිසන්ධි හොති, - ප්‍රතිසන්ධිය වේ.

චක්ඛුප්පත්ති විබන්ධක කම්ම පටිබාහිත සාමත්ථියෙන දින්නපටිසන්ධිනා ඉතරෙනාපි වා කම්මෙන අනුප්පාදේතබ්බ චක්ඛුකො ජච්චන්ධො නාම, (අභිධම්මත්ථ විභාවිනී ටීකා)

චක්ඛුප්පත්ති විබන්ධක කම්මපටි බාහිත සාමත්ථියෙන, - චක්ෂුරින්ද්‍රිය යාගේ පහළවීමට බාධක වූ කර්මය විසින් ප්‍රතිබාහනය කරන ලද ශක්තිය ඇතිව, දින්න පටිසන්ධිනාපි වා, - දෙන ලද ප්‍රතිසන්ධිය නිසා හෝ, ඉතරෙන කම්මෙනා පි වා, අන්‍ය වූ කර්මයකින් හෝ, අනුප්පාදෙතබ්බ චක්ඛුකො, - චක්ෂුව ඉපදීමට අභව්‍ය වූ පුද්ගලයා, ජච්චන්ධො නාම, - ජාත්‍යන්ධ නම් වේ.

සචක්ඛුකානං අසොතකානන්ති අපායෙ ජාතිබධිර ඔපපාතිකං සන්ධාය වුත්තං, **(යමක අට්ඨකථා)**

සචක්ඛුකානං අසොතකානන්ති, - යනු, අපායෙ, - අපාය භූමියෙහි, ජාතිබධිර ඔපපාතිකං, - ප්‍රතිසන්ධි වශයෙන්ම බිහිරි වූ ඖපපාතික සත්වයා, සන්ධාය, - සඳහා වුත්තං, - කියන ලදී.

ප්‍ර:- ඝානායතන මූලී අනුලෝම සන්නිට්ඨානයෙහි ඖපපාතික පුද්ගලයා, කුමක් හෙයින් නොගන්නා ලද්දේද,

උ:- කාමභූමියෙහි ඝානය අඩු වූ ඖපපාතික පුද්ගල්යෙකු නැති බැවින් නොකියන ලදී.

කාමධාතුයං පන අඝානකො ඔපපාතිකො නත්ථි,

**(යමක අට්ඨකථා)**

පන, - විස්තර කියන්නෙමි, කාමධාතුයං, - කාමභූමියෙහි, අඝානකො, - ඝානය නොමැත්තා වූ, ඔපපාතිකො ඖපපාතිකයෙක්, නත්ථි, - නොමැත,

දුග්ගතියං පන චක්ඛුසොත භාවාලාභො ද්වින්නම්පි වසෙන, ඝානාලාභො සංසෙද්ජානමෙව වසෙන, න ඔපපාතිකානං වසෙනාති දට්ඨබ්බං, **(අභිධම්මත්ථ විභාවිනීටීකා)**

පන, – විස්තර කියන්නෙමි, දුග්ගතියං,–දුගති භූමියෙහි, චක්ඛුසොතභාවාලාභො,– චක්ෂු ශ්‍රෝත්‍රභාවයන් නොලැබීම, ද්වින්නම්පි, – දෙදෙනෙක් වූ සංසේදජ ඕපපාතික යන්ගේද, වසෙන, – වශයෙන්, හොති, – වේ, ඝානාලාභො, – ඝ්‍රාණය නොලැබීම, සංසේදජානමෙව, – සංසේදජයන්ගේම, වසෙන, – වශයෙන්, හොති – වේ. ඕපපාතිකානං, ඕපපාතිකයන්ගේ, වසෙන, – වශයෙන්, න හොති ඉති, – නොවේ යයි, දට්ඨබ්බං, – දතයුතුය.

ප්‍ර:- අභිධර්මාර්ථ සංග්‍රහ ආචාර්ය්‍ය පාදයන්, සංසේදජ ඕපපාතිකයන්ට, ඔමක වශයෙන් චක්ඛු සෝත ඝාන භාවයන් නොලැබෙත් යයි පොදු වශයෙන් කියා ඇති නමුත්, ඝ්‍රාණය නොලැබීම සංසේදජයන්ටම යයි කුමක් හෙයින් වෙන්කොට ගන්නා ලද්දේද.

උ:- එකට සම්පිණ්ඩනය කොට දක්වන ලද්දවුන්ගේ ද, ඒකදේශ වශයෙන් සම්බන්ධ වන බැවින් සංසේදජයන්ට යයි වෙන් කොට ගන්නා ලදී. යථා ලාභ නය වශයෙන් යයි දතයුතු.

එකයොග නිද්දිට්ඨස්සාපි ඒකදෙසො සම්බන්ධං ලභති, **(යමක අනුටීකා)**

එකයොග නිද්දිට්ඨස්සාපි, – සමූහයක් එක්තැන් කොට දක්වන ලද තැන්හි ද, එකදෙසො, – ඒක දේශයක්, සම්බන්ධං, – සම්බන්ධය, ලභති, – ලබයි.

ප්‍ර:- සචක්ඛුක අඝානක ස්වරූප උදුරන ලද තැන, රූපාවචර පුද්ගලයා ස්වරූප ගැනීමේදී ඝ්‍රාණය නැතිවම ගනු ලැබේ ද?

උ:- පිහිටි සණ්ඨාන වශයෙන් ඝ්‍රාණය ඇත. ඝ්‍රාණප්‍රසාදය ඝ්‍රාණ විඥ්ඥාණය නොමැත. ඒ පිළිබඳ ස්වරූප උදුරන ලදී.

ඝානං අත්ථි, ඝානපසාදෙව ඝානවිඤ්ඤාණඤ්ච නත්ථි, තස්මාගන්ධං නජානන්ති,
**(ජිනාලංකාර ටීකා)**

ඝානං අත්ථි, – ඝ්‍රාණ සණ්ඨානය ඇත. ඝාන පසාදෙව, – ඝ්‍රාණප්‍රසාදයත්, ඝාන විඤ්ඤාණඤ්ච, – ඝ්‍රාණ විඥ්ඥාණයත්, නත්ථි,–නැත, තස්මා, – එහෙයින් ගන්ධං න ජානන්ති, – ගන්ධය නොදන ගනිත්.

ප්‍ර:- ඝ්‍රාණ සටහන ඇත්තේ නම කුමක් නිසා ඝ්‍රාණ ප්‍රසාදය නැත්තේ ද,

උ:- බ්‍රහ්මයන්ට ඝ්‍රාණ සටහන ඇති නමුත් කාමවිරාග භාවනාවෙන් ගන්ධං රස ඵොට්ඨබ්බයන් කෙරෙහි ද ආශා රහිත බැවින්, ඒවාට නිශ්‍රය වන ප්‍රසාදයන් කෙරෙහි ද ආශා රහිතම නිසා ඝ්‍රාණ ප්‍රසාදය නොලැබේ.

ඝානාදිත්තයං නත්ථි බ්‍රහ්මානං කාමාවිරාග භාවනා වසෙන ගන්ධරස ඵොට්ඨබ්බෙසුපි විරත්තතාය තබ්බිසය පසාදෙසුපි විරාග භාවතො,
**(අභිධම්මත්ථ විභාවිනි ටීකා)**

බ්‍රහ්මානං, – බ්‍රහ්මයන්ට, කාමවිරාග භාවනා වසෙන,–පඤ්චකාමයන් කෙරෙහි කාමරාග ප්‍රහාණය පිණිස වැඩූ භාවනා වශයෙන්, ගන්ධරස ඵොට්ඨබ්බෙසු පි,– ගන්ධරස ඵොට්ඨබ්බයන් කෙරෙහි ද, විරත්තතාය, – නොඇලුනු බැවින්, තබ්බිසය පසාදෙසු පි, – ඒවා ගෝචර කොට ඇති ප්‍රසාදයන් කෙරෙහි ද, විරාග භාවතො, –විරාගී බැවින්, (ඝානාදිත්තයං නත්ථි).

අගන්ධකානං අරසකානං අඵොට්ඨබ්බකානන්ති යොජනා වේදිතබ්බා.
**(යමක අට්ඨකථා)**

අගන්ධකානං අරසකානං අඵොට්ඨබ්බකානං, යනුවෙන්, යෝජනා, – යෝජනාව, වේදිතබ්බා, – දතයුතුය.

ප්‍ර:– ගන්ධායතන මූලියෙහි අගන්ධකානං යනාදියෙන් විභංගය දක්වූ බැවින් රූපාවචර පුද්ගලයන්ට ගන්ධය නැත්තේද,

උ:– රූපාවචර පුද්ගලයන්ට වනාහි ගන්ධය ඇත්තේය, එහෙත් ඝානායතනය නැතිව ආයතන කෘත්‍යය නොමැති බැවින් ගන්ධය ඇතැයි කීමට නොහැකිය.

ගන්ධාදීනි චෙත්ථ ආයතන භූතානෙව අධිප්පෙතානි, තස්මා සරූපකානං සගන්ධකානන්ති ආයතන වසෙනෙත්ථ අත්ථො දට්ඨබ්බො,

ච, – බෙද දක්වන්නෙමි, එත්ථ, – මේ ගන්ධායතන යමකාදියෙහි, ගන්ධාදීනි,– ගන්ධ ආදීහු, ආයතන භූතානෙව, – ආයතන වූවෝම, අධිප්පෙතානි, – අදහස් කරන ලද්දහ. තස්මා, – එහෙයින්, සරූපකානං, – රූපායතනය සහිත වූ, සගන්ධකානං,– ගන්ධායතනය සහිත වූ, ඉති, – යනුවෙන්, එත්ථ අත්ථො දට්ඨබ්බො, – මෙහි අර්ථය දතයුතුය.

යස්මා පන රූපධාතු පරියාපන්නානං සත්තානං ඝානායතනාදීන මභාවෙන ගන්ධායතනාදීනි ආයතනාදිකිච්චං න කරොන්ති, තස්මා රූපධාතුයා ඡ ආයතනා නව ධාතුයොති ආදි වුත්තං. **(විභංග අට්ඨකථා)**

පන, – බෙද දක්වන්නෙමි, යස්මා, – යම් හෙයකින්, රූපධාතු පරියාපන්නානං, රූපධාතුවට ඇතුලත් වූ, සත්තානං, – රූපාවචර සත්වයන්ට, ඝානායතනාදීනි, ඝානායතනාදීන්ගේ, අභාවෙන, – නැති බැවින්, ගන්ධායතනාදීනි, – ගන්ධායතනාදීහු, ආයතනාදිකිච්චං, – ආයතනාදි කෘත්‍යය, න කරොන්ති, – නොකරත් ද, තස්මා, එසේ හෙයින්, රූපධාතුයා ඡ ආයතනා නව ධාතුයො ඉති, – යනාදිය, වුත්තං, – කියන ලදී.

ප්‍ර:– රූපාවචර භූමියෙහි ඇත්තා වූ ගන්ධ රස ඵොට්ඨබ්බයන් ගන්ධායතන රසායතන ඵොට්ඨබ්බායතන යයි නොකියන්නේ නම් කුමක් හෙයින් ධම්මායතන යයි කියනු ලැබේද.

උ:– ධර්මස්වභාවය නොඉක්මවන බැවින්ද, මනොවිඤ්ඤාණ ධාතුවට අරමුණු බවට යන බැවින්ද ධම්මායතනයෙහි ඇතුලත් කොට ධම්මායතනයයි කියනු ලැබේ. (ධාතුවෙහිද මෙසේමය)

ධම්මසභාවානතිවත්තනතො මනොවිඤ්ඤාණස්ස ච විස්යභාවූප ගමනතො ධම්මායතනන්තොගධෙ කත්වා පඤ්චායතනානීති පාළියං වුත්තං, **(විභංග අනුටීකා)**

ධම්මසභාවානතිවත්තනතොව, – ධර්මසභාවය නොඉක්මවා සිටි බැවින්ද, මනොවිඤ්ඤාණස්ස, – මනො විඤ්ඤාණයාගේ, විසයභාවූපගමනතො, ච, – ආරම්මණ බවට යන බැවින්ද, ධම්මායතනන්තොගධෙ, – ධම්මායතනයට ඇතුලත් වූවන්, කත්වා, – කොට, පඤ්චායතනානීති, – පඤ්චායතන යෝ යැයි, පාළියං වුත්තං,– පෙළෙහි කියන ලදී.

තෙසුහි ජිව්හාකායායතන යමකේසු තිණ්ණං පුච්ඡානං ආමන්තාති විස්සජ්ජනේන භවිතබ්බං, පච්ඡිම පුච්ඡාය සකායකානං අඝානකානං උපපජ්ජන්තානන්ති ආදිනාපි,

**(යමක මූල ටීකා)**

හි, – ඒ වචනය පැහැදිළි කරන්නෙමි. තේසු,–ඒ ඝානායතන මූලක වූ, ජිව්හා – යතන කායායතන යමකේසු, – ජිව්හායතන කායායතන යමකයන්හි, තිණ්ණං පුච්ඡානං, – පුච්ඡා තුනකට, ආමන්තාති විස්සජ්ජනේන, – ආමන්තා යන විසඳුම, භවිතබ්බං, – වියයුතුය. පච්ඡිම පුච්ඡාය, – අන්තිම පුච්ඡාවට, සකායකානං – පෙ- ආදිනා, – ආදී වශයෙන්, විස්සජ්ජනේන, – විසඳුම, භවිතබ්බං ඉති, – වියයුතුය. යනුවෙන් දතයුතු.

යථා චක්ඛු සොතානි රූපභවෙ ඝාන ජිව්හාහි විනා පවත්තන්ති, න එවං ඝාන ජිව්හා අඤ්ඤමඤ්ඤං විනා පවත්තන්ති, ද්වින්නම්පි රූපභවෙ අනුප්පජ්ජනතෝති එවං විසුං විසුං කාමභවෙ අප්පවත්ති වසෙන තෙසං සහචරිතා වුත්තා,

**(අභිධම්මත්ථ විභාවිනී ටීකා)**

චක්ඛුසොතානි, – චක්ඛු සෝතයෝ, රූපභවෙ, – රූපභූමියෙහි, ඝාන ජිව්හාහි, ඝාන ජිව්හාවන්ගෙන්, – විනා, – වෙන්ව, පවත්තන්ති යථා, – පවතින්නාක් මෙන්, එසේම, ඝාන ජිව්හා, – ඝාන ජිව්හා දෙදෙන, අඤ්ඤමඤ්ඤං, – ඔවුනොවුන්, විනා, හැර, න පවත්තන්ති, – නොමපවතිත්, කස්මා, – කුමක් හෙයින්ද යත්, රූපභවෙ, රූපභූමියෙහි, ද්වින්නම්පි,–ඒ දෙදෙනාගේම ද, අනුප්පජ්ජනතො, – නූපදනා බැවිනි. (න පවත්තන්ති) ඉති එවං මෙසේ, විසුං විසුං, – වෙන් වෙන්ව, කාමභවෙ, – කාම භූමියෙහි, අප්පවත්තිවසෙන, – නොපැවතීම වශයෙන්, තෙසං, – ඒ ඝාන ජිව්හා දෙදෙනාගේ, සහ චරිතා වුත්තා, – එක්ව හැසිරෙන බව, කියන ලදී.

ආයතන යමකය නිමි.

## ධාතු යමකය

# ගණ්ඨි පද ශෝධනය

ප්‍ර:- කුමක් හෙයින් ධාතු නම් වේද,

උ:- සංසාර දුක්ඛය විධානය කරන බැවින්ද, සංසාර දුක්ඛය ධරා සිටින බැවින්ද, සංසාරික සත්වයන් විසින් දරණු ලබන බැවින්ද, මේ කරණකොටගෙන සත්වයන් විසින් සංසාර දුක්ඛය වින්දනය කරනු ලැබෙන බැවින්ද, සංසාර දුක්ඛය මොවුන් කෙරෙහි තබනු ලබන බැවින්ද, ශරීර අවයව ධාතුමෙන් ශෛල අවයව ධාතු මෙන් බැවින්ද, ධාතු යයි කියනු ලැබේ.

විදහති විධාන:ඤ්ච — ධීයතෙ ච විධීයතෙ,
එතාය ධීයතෙ එත්ථ — ඉති වා ධාතු සම්මතා
සරීර සෙලාවයවා — ධාතුයො විය ධාතුයො.

**(අභිධම්මත්ථ විභාවිනී ටීකා)**

සංසාර දුක්ඛං, – සංසාර වට්ට දුක්ඛය, විදහති, – සංවිධාන කෙරේ. ඉති තස්මා, එසේ හෙයින්ද, සංසාර දුක්ඛං, – සංසාර දුක්ඛය, විධානඤ්ච, – විධානයත්, හොති, වේ. ඉති තස්මා වා, – එහෙයින් ද, සත්තෙහි, – සත්වයන් විසින්, ධියතෙ, – දරණු ලැබේ. ඉති තස්මා, – එසේ හෙයින් ද, එතාය ධම්මජාතියා, – මේ ධර්මජාතියෙන්, සත්තෙහි, – සත්වයන් විසින්, සංසාර දුක්ඛං, – සංසාර දුක්ඛය, විධියතෙ, – විශේෂ යෙන් දරණු ලැබේ. ඉති තස්මා, – එසේ හෙයින්ද, එත්ථ, – මෙහි, සංසාර දුක්ඛං, සංසාර දුක්ඛය, ධියතෙ, – ධරා සිටී. ඉති තස්මා, – එසේ හෙයින්ද, ධාතු සම්මතා ධාතු නාමැයි සම්මතය, සරීර සෙලාවයවා, – ශරීර ශෛල කොට්ඨාශයන්හි පිහිටියා වූ, ධාතුයො විය, – ධාතු මෙන්ද, ධාතු නම් වෙත්,

ධාත්වත්ථො නාම සභාවත්ථො – සභාවත්ථො නාම සුඤ්ඤතත්ථො සුඤ්ඤ-තත්ථො නාම නිස්සත්තත්ථො, **(විභංගට්ඨ කථා)**

ධාත්වත්ථො නාම, – ධාතු අර්ථය නම්, සභාවත්ථො, – ස්වභාව අර්ථයයි. සභාවත්ථො නාම,–ස්වභාව අර්ථය නම්, සුඤ්ඤතත්ථො,–සුඤ්ඤතාර්ථයයි, සුඤ්ඤ-තත්ථො නාම, – සුඤ්ඤතාර්ථය නම්, නිස්සත්තත්ථො,–සත්ව ජීව නොවන අර්ථයයි

ප්‍ර:- සූත්‍රාන්ත අභිධර්ම දේශනාවන්හි ආරම්භධාතු සූතධාතු ආදී බොහෝ ධාතු දේශනා කර ඇතත් කුමක් හෙයින් දහඅටක් පමණක් දේශනා කරන ලද්දේද.

උ:- දේශනා කරන ලද ධාතු දහඅටෙහි සෙසු සියල්ල ඇතුලත් වන බැවින් ධාතු දහඅටක්ම පමණක් දේශනා කරන ලදහ.

සභාවතො විජ්ජමානානං සබ්බධාතුනං තදන්තොගධත්තා, **(විභංගට්ඨ කථා)**

සභාවතො, – ස්වභාවයෙන්, විජ්ජමානානං, – විද්‍යමාන වන්නා වූ, සබ්බ ධාතූනං,–සියලු ධාතූන්, තදන්තොගධත්තා,–ඒ අටලොස් ධාතූන්ට ඇතුලත් බැවිනි.

ප්‍ර:- චක්ඛුවිඤ්ඤාණ ධාතු යනාදියෙහි ආරම්මණයේ නාමය ගෙන රූපවිඤ්ඤාණ යනාදීන් නොකියා කුමක් හෙයින් වස්තුවගේ නාමය ගෙන චක්ඛු විඤ්ඤාණ ධාතුව යනාදිය කියන ලද්දේද.

උ:- රූපාරම්මණාදිය වනාහි අන්‍ය විඤ්ඤාණයන්ට සාධාරණ බැවින් ආරම්මණ වශයෙන් රූපවිඤ්ඤාණ ධාතු යනාදීන් නොකියනු ලැබේ. චක්ඛුවස්තු ආදිය වනාහි අන්‍ය විඥාන සාධාරණ නොවන බැවින් ඒ අසාධාරණ වස්තුව ගේ වශයෙන් චක්ඛුවිඤ්ඤාණාදිය කියන ලදී.

රූපාදීනං පච්චයානං අඤ්ඤවිඤ්ඤාණ සාධාරණත්තා අසාධාරණේන වත්ථුනා චක්ඛුවිඤ්ඤාණං සෝතවිඤ්ඤාණන්ති නාමං උද්ධටං, **(ධම්මසංගණී මූල ටීකා)**

රූපාදීනං, – රූපාරම්මණාදී වූ, පච්චයානං – ප්‍රත්‍යයන්ගේ, අඤ්ඤවිඤ්ඤාණ සාධාරණත්තා, – අන්‍යවූද විඥානයන් හා සාධාරණතා ඇති බැවින්, අසාධාරණේන, අන්‍ය වූ විඤ්ඤාණයන්ට සාධාරණ නොවූ, වත්ථුනා, – වස්තුවෙන්, චක්ඛුවිඤ්ඤාණං සෝත විඤ්ඤාණං **ඉති**-චක්ඛුවිඤ්ඤාණය සෝත විඤ්ඤාණයයි, නාමං උද්ධටං–නාමය උද්ධරන ලදී.

අසාධාරණේන නාමං උද්ධටං, භෙරි සද්දෙ යවංකුරොති, යථා, **(ධම්මසංගණී අනුටීකා)**

අසාධාරණේන, – අසාධාරණ වූ වස්තු වශයෙන්, නාමං, – නාමය, උද්ධටං, උද්ධරන ලදී. භෙරිසද්දෙ යවංකුරොති යථා, – භෙරිසද්දෙ යවංකුරො යනාදිය මෙනි. භෙරිසද්දෙ, – බෙර ශබ්දය, යවංකුරො, – යව අංකුරය,

චක්ඛුවිඤ්ඤාණන්ති කාරණභූතස්ස චක්ඛුස්ස විඤ්ඤාණං චක්ඛුතො වා පවත්තං චක්ඛුස්මිං වා නිස්සිතං විඤ්ඤාණන්ති චක්ඛු විඤ්ඤාණං. **(ධම්මසංගණී අට්ඨකථා)**

චක්ඛුවිඤ්ඤාණන්ති,–චක්ඛුවිඤ්ඤාණං යනු,කාරණභූතස්ස,–හේතුවවූ, චක්ඛුස්ස, චක්ඛුප්‍රසාදය පිළිබඳ වූ, විඤ්ඤාණං – විඤ්ඤාණයයි, වා – නොහොත්, චක්ඛුතො, චක්ෂුව කෙරෙන්, පවත්තං, – පැවති. විඤ්ඤාණං – විඤ්ඤාණයයි, වා – නොහොත් චක්ඛුසමිං,–චක්ෂු ප්‍රසාදයෙහි නිස්සිතං,–ඇසුරු කොට ඇති, විඤ්ඤාණ,ං – විඤ්ඤාණ යයි, ඉති තස්මා, – එසේ හෙයින්, චක්ඛුවිඤ්ඤාණං,–චක්ඛු විඤ්ඤාණයයි, ඉතිතස්මා, එසේ හෙයින්, චක්ඛුවිඤ්ඤාණං, – චක්ඛු විඤ්ඤාණය නම් වේ.

ප්‍ර:- කුමක් හෙයින් මනොධාතු නම් වේද,

උ:- විශේෂ විජානනයක් නොමැතිව දැනීම් මාත්‍රයක්ම ඇති බැවින් මනොධාතු නම් වේ.

මනොයෙව ධාතු මනොධාතු – **(ධම්මසංගණී අට්ඨකථා)**

මනොයෙව, - අරමුණ මැනගැනීම පමණක්ම වූ, ධාතු, - ධාතුව. මනොධාතු, මනමාත්‍ර ධාතු නම් වේ,

අඤ්ඤෙසං විඤ්ඤාණසභාවසුඤ්ඤතසබ්භාවා මනොධාතුභාවො ආපජ්ජතීති චෙ, න, විසේස සබ්භාවා,

චක්ඛු විඤ්ඤාණාදීනඤ්හි චක්ඛාදි නිස්සයතා චක්ඛාදීනං සවිසයෙසු දස්සනාදි පවත්තිභාවතා ච විසේසො, මනොවිඤ්ඤාණස්ස පන අනඤ්ඤනිස්සය මනොපුබ්බංගමතාය අඤ්ඤ නිස්සය විඤ්ඤාණස්ස අන්නතර පච්චයත්තාභාවෙන මනොද්වාර නිග්ගමනමුඛභාවාභාවතො ච සාතිසය විජානන කිච්චතා විසේසො,

තබ්බිස්සෙ විරහිතා මනොමත්තා ධාතු මනොධාතුති තිවිධා මනොධාතු එව වුච්චති, න විසේස මනො, **(ධම්මසංගණී මූල ටීකා)**

අඤ්ඤෙසං, - මනො ධාතුව හැර අන්‍ය වූ, විඤ්ඤාණං, - විත්තයන්ට, සභාව සුඤ්ඤත සබ්භාවා, - ස්වභාවයෙන් ලැබෙන කාරක, වේදක ආදියෙන් තොර වූ බව ප්‍රකටව තිබෙන බැවින්, මනොධාතු භාවො, - මනොධාතු බව, ආපජ්ජති, - පැමිණේ දැයි, ඉති චෙ,- මෙසේ ප්‍රශ්නයක් ඇත් නම්, න ආපජ්ජති, - නොපැමිණේ. විසේස සබ්භාවා, - විශේෂත්වයක් ඇති බැවිනි.

හි, - බෙද දක්වමි. චක්ඛුවිඤ්ඤාණාදීනං,-චක්ඛුවිඤ්ඤාණාදීන්ගේ, චක්ඛාදි නිස්සයතා ච චක්ෂු වස්තු ආදි වශයෙන් නිශ්‍රය ඇති බැවින් ද, චක්ඛාදීනං, - චක්ෂු වස්තු ආදීන්ගේ, සවිසයෙසු, - ස්වකීය ආරම්මණයන්හි, දස්සනාදි පවත්ති භාවතා ච, - දැකීම ආදි පැවැත්ම ඇති බැවින්ද, විසේසො හොති, - විශේෂ වේ.

පන, - විස්තර දක්වන්නෙමි. මනොවිඤ්ඤාණස්ස, - මනොවිඤ්ඤාණයාගේ, අනඤ්ඤනිස්සය මනොපුබ්බංගමතාය, - අන්‍ය නිශ්‍රිත මනසකට පූර්වාංගම නොවන බැවින්, අඤ්ඤනිස්සය විඤ්ඤාණස්ස,-අන්‍ය නිශ්‍රිත විඤ්ඤාණයකට, අනන්තර පච්චයත්තා, - අනන්තර ප්‍රත්‍ය වන බැවින්, මනොද්වාර නිග්ගමනමුඛභාවාභාවතො ච, - මනොද්වාරයාගේ නික්මෙන ද්වාර බවක් නැති බැවින්ද, සාතිසය විජානන කිච්චතා, - අතිශය විජානන කෘත්‍ය ඇති බව, විසෙසො හොති, - විශේෂ වෙයි.

තබ්බිසේස විරහිතා, - ඒ කියන ලද විශේෂ නොමැති බැවින්, මනොමත්තා, දැනීම් පමණක් වූ, ධාතු, - ධාතුව, මනොධාතු, - මනොධාතු, ඉති, - මෙයින්, තිවිධ මනො ධාතු එව, - ත්‍රිවිධ මනොධාතුවම, වුච්චති, - කියනු ලැබේ. විසේස මනො, විශේෂ මනස, - න වුච්චති, - නොකියනු ලැබේ.

මනොද්වාර නිග්ගමන පවෙසන මුඛභාවතො පන මනොධාතුයා, විජානන විසේස විරහො දට්ඨබ්බො, **(ධම්මසංගනී මූලටීකා)**

පන, – විස්තර දක්වන්නෙමි. මනොද්වාර නිග්ගමන පවෙසන මුඛභාවතො, මනොද්වාරයාගේ බැහැරවෙන පිවිසෙන හේතුව වන බැවින්, මනොධාතුයා, – මනොධාතුවගේ, විජානන විසේස විරහො, – විශේෂ විජානනයක් නැති බව, දට්ඨබ්බො, දත යුතුය.

තතො එව මනො විඤ්ඤාණන්ති පි න වුච්චති, නහි තං විඤ්ඤාණං මනතො පවත්තං මනසො පච්චයො, නාපි මනසො පච්චය භූතං මනතො පවත්තං, දස්සනාදිනං පන පච්චයො, තෙහි ච පවත්තං තෙසං පුරෙචරං අනුචරඤ්චාති, **(ධම්මසංගණි මූල ටීකා)**

තතො එවං,–ඒ විශේෂ විජානන කෘත්‍යයක් නැති බැවින්ම, මනො විඤ්ඤාණන්ති පි, – මනො විඤ්ඤාණයයි කියාද, න වුච්චති, – නොකියනු ලැබේ. හි–යස්මා යම් හෙයකින්, තං විඤ්ඤාණං,–ඒ මනොධාතු නම් වූ විඤ්ඤාණය, මනතො,–සිතින් වා, – නොහොත්, මන හේතුවෙන්, පවත්තං, – පැවතියේ හෝ, මනසො, – සිතට, පච්චයො, – ප්‍රත්‍ය වූයේ, න හොති, – නොවෙයි, මනසො, – සිතට, පච්චයභූතං, ප්‍රත්‍ය වූ, මනතො, – සිතින් හෝ සිත හේතු වෙන්, පවත්තං, – පැවතියේ, න හොති, නොවෙයි. පන, – තවද වනාහි, – දස්සනාදිනං,–චක්ඛුවිඤ්ඤාණාදීන්ට, පච්චයො, ප්‍රත්‍යයද, තේහි, – ඒ චක්ඛුවිඤ්ඤාණාදීන් විසින් පවත්තං,–පවත්වන ලද්දේද, තෙසං, ඒ චක්ඛුවිඤ්ඤාණාදීගේ පුරෙචරං, – පෙරටුව හැසිරෙන්නේ ද, අනුචරඤ්ච,–පසුව හැසිරෙන්නේ ද, හොති, – වෙයි. ඉති තස්මා, – එසේ හෙයින්, (මනො විඤ්ඤාණන්ති පි වුච්චති.)

යදිමනොධාතු මනොවිඤ්ඤාණන්ති න වුච්චති, ඡ විඤ්ඤාණකායාති කථංමනොධාතුයා තත්ථ සංගහොති, සංගහො එව පරියාය දෙසනත්තා, අත්ථිහි ඒස පරියායො, මනමත්තං විඤ්ඤාණං මනො විඤ්ඤාණන්ති, **(ධම්මසංගණි අනුටීකා)**

මනොධාතු, – මනොධාතුව, මනොවිඤ්ඤානන්ති, – මනොවිඤාණයයි, යදින වුච්චති, – ඉදින් නොකියනු ලබන්නේ නම්, එවං සති, – මෙසේ ඇති කල්හි, විඤ්ඤාණ කායා, – විඤ්ඤාණ කායයෝ, ඡ ඉති, – සයක් යයි කිම, කථං, කෙසේ නම්, මනොධාතුයා, – මනොධාතුවගේ, තත්ථ, – ඒ විඤ්ඤාණ කායයෙහි – සංගහො සංග්‍රහවීම, හොති ඉති, – වන්නේ දැයි ප්‍රශ්නයක් වන්නේය. සංගහො එව, – සංග්‍රහ වේමය, කස්මා, – කුමක් හෙයින් ද යත්, පරියාය දෙසනත්තා, – පය්‍යාය දේශනාවක් බැවිනි. හි – සච්චං, – සත්‍යයකි. එස – එසො, – මෙසේ සංග්‍රහ වූ, පරියායො අත්ථි පය්‍යායක් ඇත්මය. මනමත්තං, – දැනීම් පමණක් වූ, විඤ්ඤාණං – විඤ්ඤාණය. මනො විඤ්ඤාණන්ති – මනොවිඤ්ඤාණ යනු මේ වනාහි විසඳුමයි.

මනොයෙව විසිට්ඨ විජානන කිච්ච යොගතො විඤ්ඤාණං, මනසො වා විඤ්ඤාණං මනො විඤ්ඤාණං, (අභිධම්මත්ථ විභාවිනි ටීකා)

මනොයෙව, – දැනීමම, විසිට්ඨ විජානන කිච්චයොගතො, – විශේෂවත් වූ දැනීම් කෘත්‍ය යෙදීමෙන් විඤ්ඤාණං,–විඤ්ඤණ වූයේ, මනො විඤ්ඤාණං,–මනො විඤ්ඤාණ නම් වේ. වා, – නොහොත්, මනසො,–සිත පිළිබඳ වූ, විඤ්ඤාණං,–විඤ්ඤාණය. මනො විඤ්ඤාණං, – මනොවිඤ්ඤාණය නමි.

මනො එව ධාතු මනොධාතූති එව සද්දෙ මත්තසද්දත්ථො දට්ඨබ්බො, විසේස නිවත්තනත්ථොහි සො විඤ්ඤාණස්සාති **(ධම්මසංගනි මූල ටීකා)**

මනො එව ධාතු මනොධාතු – යන මෙහි, එවසද්දෙ, – එව ශබ්දය, මත්තසද්දත්ථො මාත්‍ර ශබ්දයාගේ අර්ථ ඇත්තේ යයි, දට්ඨබ්බො, – දතයුතුය, හි, – පැහැදිලි කරන්නෙමි. සො – ඒ මත්ත ශබ්දය විඤ්ඤාණස්ස – විඤ්ඤාණයාගේ, විසේස නිවත්තනත්ථො විශේෂත්වය වළක්වන අර්ථ ඇත්තේය. ඉති, – මෙසේ දතයුතු.

[සැ: යු:- මෙහි ප්‍රශ්නෝත්තර දීර්ඝ වශයෙන් නොදක්වීම වනාහි, ග්‍රන්ථය අතිශයින් දීර්ඝ නොවනු පිණිසත්, ග්‍රන්ථය කෙටි කළ බැවිනුත් යයි දත යුතු.]

ප්‍ර:- ප්‍රවෘත්ති වාරයෙහි සද්දධාතු චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදී වූ සයක් වූ ධාතු කුමක් හෙයින් නොදෙසන ලද්දහුද.

උ:- සද්දධාතු චක්ඛුවිඤ්ඤාණධාතු ආදී ධාතු සය චුති ප්‍රතිසන්ධි කාලයෙහි නොලැබෙන බැවින් නොදෙසන ලදහ.

තිවිධ සත්තානුග්ගහස්ස අධිප්පෙතත්තා, නාමරූප තදුභය සම්මූළ්හවසෙන හි තික්ඛ නාතිතික්ඛ මුදින්ද්‍රිය වසෙන සංඛිත්ත මජ්ඣිම විත්ථාර රුචි වසෙන ච තිවිධා සත්තා, **(අභිධම්මත්ථ විභාවිනී ටීකා)**

තිවිධසත්තානුග්ගහස්ස, – තුන්වැදෑරුම් වූ සත්වයන්ට අනුග්‍රහ පිණිස, අධිප්පෙතත්තා, – අදහස් කරන ලද බැවින්, හි, – විස්තර දක්වන්නෙමි. නාමරූප තදුභය සම්මූළ්හ වසෙන ච, – නාම සම්මූළ්හ. රූපසම්මූළ්හ, නාමරූප උභය සම්මූළ්හ පුද්ගලයන්ගේ වශයෙන් ද, තික්ඛ නාතිතික්ඛ මුදින්ද්‍රිය වසෙන ච, – තීක්ෂණ ඉන්ද්‍රිය ඇති පුද්ගලයන්, මධ්‍යම ඉන්ද්‍රිය ඇති පුද්ගලයන්, මෘදු ඉන්ද්‍රිය ඇති පුද්ගලයන්ගේ වශයෙන්ද, සංඛිත්ත මජ්ඣිම විත්ථාර රුචිවසෙන ච, – සංක්ෂේප ක්‍රම රුචිකරන පුද්ගලයන්, මධ්‍යම ප්‍රමාණය රුචි කරන පුද්ගලයන්. විස්තාර ක්‍රම රුචි කරන පුද්ගලයන්ගේ වශයෙන්ද, ඉති, – මෙසේ, තිවිධා සත්තා, – වෛනෙය්‍ය පුද්ගලයෝ ත්‍රිවිධ වෙති.

ධාතු යමකය නිමි.

---

## සත්‍ය යමකය

# ගණ්ඨි පද ශෝධනය

ප්‍රː- කුමක් හෙයින් සත්‍ය නම් වේද.

උː- විද්‍යමාන වූ අවිපරීත ස්වභාවය සත්‍ය බැවින් සත්‍ය නම් වේ.

[සැː යුː- සත්‍ය වන ආකාරය වනාහි, දුක්ඛ සත්‍යය සත්වයන් පෙළන බව නියත බැවින් සත්‍යයකි. සමුදය සත්‍යය දුක්ඛයාගේ හේතුව බව නියත බැවින් සත්‍යයකි. නිරෝධ සත්‍ය සංස්කාරයන්ගේ සංසිඳීම බව නියත බැවින් සත්‍යයකි. මාර්ගසත්‍යය සංසාර වට්ට දුක්ඛයෙන් එතර කරන බව නියත බැවින් සත්‍යයකි.]

නාබාධකං යතො දුක්ඛං — දුක්ඛා අඤ්ඤං නබාධකං
බාධකත්ත නියාමෙන — තතො සච්ච මිදං මතං,
තං විනා නාඤ්ඤතො දුක්ඛං — නහොති නච තං තො
දුක්ඛහේතු නියාමෙන — ඉති සච්චං විසත්තිකා
නාඤ්ඤා නිබ්බානතො සන්ති — සන්තං නච තතං යතො
සන්තභාව නියාමෙන — තතො සච්ච මිදං මතං
මග්ගා අඤ්ඤං න නියානං — අනියානො න චාපි සො
තච්ඡ නියානා භාවත්තා — ඉති සො සච්ච සම්මතො
(විභංග අට්ඨකථා)

යතො, – යම් හෙයකින්, දුක්ඛං, – දුක්ඛය, අබාධකං, – නොපෙළන්නෙක්, න හොති, – නොවෙද, දුක්ඛා, – දුක්ඛයෙන්, අඤ්ඤං – අන්‍ය වූ, බාධකං–පෙළන්–නෙක්, න අත්ථි, – නැත්තේද, තතො, – එහෙයින්, බාධකත්තනියාමෙන, – නියතයෙන් පෙළන්නක් බැවින්, ඉදං, – මේ දුක්ඛය, සච්චං, – සත්‍යයකැයි, මතං, – දන්නා ලදී.

තං, – ඒ තණ්හාව, විනා,–හැර, අඤ්ඤතො–අන්‍ය හේතුවකින්, දුක්ඛං,–දුක්ඛයක් න හොති, – නොවේද, තතො, – ඒ තණ්හා හේතුවෙන්, තං, – ඒ දුක්ඛය, නහොති, නොවන්නේ ද, නච, – නොවේ, ඉති තස්මා, – එසේ හෙයින්, දුක්ඛහේතු නියාමෙන, නියමයෙන් දුක්ඛ හේතුව බැවින්, විසත්තිකා, – තණ්හාව, සච්චං මතං, – සත්‍යය කැයි දන්නා ලදී.

නිබ්බාණතො,–නිර්වාණයෙන්, අඤ්ඤා – අන්‍යවූ, සන්ති, – ශාන්තියක්, යතො යම් හෙයකින්, න අත්ථි, – නැත්තේ ද, තං, –ඒ නිර්වාණය, සන්තං, – සංස්කාරයන්ගේ සන්සිඳීමක්, න, – නොවන්නේ, නච, – නොවේද, තතො, – එහෙයින්, සන්තභාව නියාමෙන, – නිමයයෙන් සංස්කාරයන්ගේ සංසිඳීම බැවින්, ඉදං, – මේ නිර්වාණය, සච්චංමතං, – සත්‍යයයි දන්නා ලදී.

මග්ගා – ආර්‍යය මාර්ගයෙන්, අඤ්ඤං – අන්‍ය වූ, නියානං, – සංසාර දුක්ඛයෙන් එතර කරවන ධර්මයක්, යතො, යම් හෙයකින්, න අත්ථි, – නැත්තේද, සො, – ඒ ආර්‍යය මාර්ගය, අනියානො, – සංසාර දුක්ඛයෙන් එතර නොකරන ධර්මයක්, න චාපි, – නොවන්නේ මද, ඉති තස්මා, – එහෙයින්, තච්ඡනියාන භාවත්තා, – සංසාර දුක්ඛයෙන් එතර කරවන නියමය බැවින්, සො, – ඒ ආර්‍යය මාර්ගය, සච්ච සම්මතො, සත්‍යයයි සම්මතය.

ප්‍ර:- ආර්‍යය සත්‍යයන් අඩු වැඩි නැතිව කුමක් හෙයින් සතරක්වම වදාරණ ලද්දහුද,

උ:- සතරකට වඩා ආර්‍යය සත්‍යයන් නැති බැවින් ද, ඒ සතර අතුරෙන් අඩු වැඩි කළයුතු ධර්මයක් නැති බැවින්ද, ආර්‍යය සත්‍යයන් අඩු වැඩි කොට නො වදාරා සතරක්ම දේශනා කරන ලදහ.

තවද:- සංසාර වට්ට දුක්ඛයාගේ ප්‍රවෘත්තිය නම් වූ පවත්තියද, එයට හේතුව වූ පවත්තකය ද, ඔහුගේ සංසිඳීම නම් වූ නිවත්තිය ද, නිවත්තියට හේතු වූ නිවත්තකය ද යන ඵල හේතු සම්බන්ධ කොට දක්වීම පිණිස ආර්‍යය සත්‍ය සතරක් වදාරණ ලදහ.

කස්මා පන චත්තාරේව අරියසච්චානි වුත්තානි අනූනානි අනධිකානි ච අඤ්ඤස්සාසම්භවතො, අඤ්ඤතරස්සච අපනෙය්‍යාභාවතො **(විභංග අට්ඨකථා)**

කස්මා, – කුමක් හෙයින් චතාහි, අනූනානි, – අඩු නොවූ, අනධිකානි, – අධික නොවූ, චත්තාරෙව, – සතරක්වම, අරියසච්චානි, – ආර්‍යයසත්‍යයෝ, වුත්තානි, – වදාරණ ලද්දහුද, ඉති චෙ, – යනු ප්‍රශ්නයකි. – එවං සති එසේ ඇති කල්හි, අඤ්ඤස්ස සතර හැර අන්‍ය සත්‍යයක්, අසම්භවතො ච, – නොලැබෙන බැවින් ද, අඤ්ඤතරස්ස එක්තරා සත්‍යයක්, අපනෙය්‍යාභාවතො ච, – බැහැර කළයුතු නොවන බැවින්ද, (චත්තාරෙව වුත්තානි)

අපි ච පවත්ති මාචික්ඛන්තොභගවා සහේතුකං ආචික්ඛි, නිවත්තිඤ්ච සඋපායං, ඉති පවත්ති නිවත්ති තදුභය හෙතූනං තප්පරමතො චත්තාරෙව වුත්තානි. **(විභංගමූලටීකා)**

අපි ච, –තවද කරුණකි, පවත්තිං, –සංසාර දුක්ඛයාගේ පැවැත්ම, ආචික්ඛන්තො – ප්‍රකාශ කරන්නා වූ, භගවා, – භාග්‍යවතුන් වහන්සේ, සහෙතුකං, – හේතුව සහිතව, ආචික්ඛි, – ප්‍රකාශ කළහ. නිවත්තිඤ්ච, – සංසාර දුක්ඛයාගේ නැවැත්මද, ආචික්ඛන්තො භගවා, – ප්‍රකාශ කරන භාග්‍යවතුන් වහන්සේ, සඋපායං, – හේතු උපාය සහිතව, ආචික්ඛි, – වදාළහ. ඉති, – මෙසේ, පවත්ති නිවත්ති තදුභය හේතූනං, – සංසාර දුක්ඛයාගේ පැවැත්ම ද, නැවැත්මද, ඒ දෙදෙනාගේ හේතූන් ද. තප්පරමතො, එපමණක්ම වන බැවින්, චත්තාරේව, – සතරක්වම, වුත්තානි, – දේශනා කරන ලදහ.

ප්‍ර:- දුක්ඛයට හේතු රාශියක් තිබෙන නමුත් කුමක් හෙයින් සමුදය පමණක්ම හේතුව යයි වදාරණ ලද්දේ ද,

උ:- ප්‍රධාන වූ විශේෂ හේතුව වන බැවින් සමුදය පමණක්ම හේතුව වශයෙන් වදාරණ ලදී.

යස්මා පන අඤ්ඤෙසුපි දුක්ඛහේතුසු සන්තෙසු තණ්හායේව දුක්ඛ සමුදයෝති වුත්තොති, පධාන කාරණත්තා, කම්මවිචිත්තතා හේතුභාවෙන හි කම්මස්ස සහාය භාවූපගමණේන ච විචිත්තතා කාරණත්තා තණ්හා දුක්ඛස්ස විසේස කාරණන්ති, **(අභිධම්මත්ථ විභාවිනි ටීකා)**

පන,– විස්තර කරන්නෙමි. කස්මා,– කුමක් හෙයින්, අඤ්ඤෙසු පි– අන්‍ය වූද දුක්ඛ හේතුසු,– දුක්ඛ හේතූන්, සන්තෙසු,– ඇති කල්හි, තණ්හායෙව,– තෘෂ්ණාව පමණක්ම, දුක්ඛ සමුදයොති, දුක්ඛ හේතුව යයි, වුත්තො,– කියන ලද්දේද, ඉති,– මේ වනාහි ප්‍රශ්නයකි. පධාන කාරණත්තා,– ප්‍රධාන හේතුව වන බැවිනි. හි සච්චං,– සත්‍යයකි. කම්මවිචිත්තතා හේතුභාවෙන,– කර්මවිචිත්‍රතාවට හේතුව බැවින් ද, කම්මස්ස,– කර්මයාගේ, සහායභාවූපගමනේන ච,– සහාය භාවයට පැමිණීමෙන්ද, විචිත්තතා කාරණත්තා,– විචිත්‍ර බැවින් ද, තණ්හා,– තෘෂ්ණාව, දුක්ඛස්ස,– දුක්ඛයාගේ, විසේස කාරණං,– විශේෂ හේතුවය, ඉති,– මෙ වනාහි විසඳුමය.

## සත්‍යාර්ථ සොළස

දුක්ඛස්ස පීළනට්ඨො සංඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො, ඉමෙ චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා තථා අවිතථා අනඤ්ඤථා සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පළිබොධට්ඨො – පෙ – නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසංඛතට්ඨො අමතට්ඨො – පෙ – මග්ගස්ස නිය්‍යානට්ඨො හෙත්වට්ඨො දස්සනට්ඨො, ආධිපතෙය්‍යට්ඨෝ, ඉමෙ චත්තාරො මග්ගස්ස මග්ගට්ඨා තථා අවිතථා අනඤ්ඤථා **(විභංග අට්ඨකථා)**

දුක්ඛස්ස,– දුක්ඛසත්‍යයාගේ, පීළනට්ඨො,– පීළන අර්ථය, සංඛත්ට්ඨො,– හේතු ප්‍රත්‍යයෙන් හටගත් අර්ථය, සන්තාපට්ඨො,– දැවෙන තැවෙන අර්ථය, විපරිණාමට්ඨො,– විවිධාකාර යෙන් පෙරලී යන අර්ථය, ඉති,– මෙසේ, චත්තාරො, – සතරක් වූවාහු, දුක්ඛස්ස, – දුක්ඛ සත්‍යයාගේ, තථා,– සත්‍ය වූ, අවිත්ථා,– අසත්‍ය නොවූ, අනඤ්ඤථා– අන්‍ය ධර්මයක් බවට නොගියාවූ, දුක්ඛට්ඨා,– දුක්ඛාර්ථයෝය,

සමුදයස්ස,– සමුදය සත්‍යයාගේ, ආයූහනට්ඨො,– දුක්ඛ සත්‍යය රැස්කිරීමේ අර්ථය, නිදානට්ඨො, – දුක්ඛයට හේතුව නිදානය වන අර්ථය, සංයෝගට්ඨො,– සංසාර වට්ට දුක්ඛය සමග බැඳ තබන අර්ථය, පළිබෝධට්ඨො,– මාර්ගඵල ලාභයට බාධා කරන අර්ථය.

නිරෝධස්ස,– නිරෝධසත්‍යයාගේ, නිස්සරණට්ඨො,– සංසාර වට්ට දුක්ඛයෙන් නික්මුනා වූ අර්ථය, විවේකට්ඨො,– සංස්කාර ධර්මයන්ගෙන් වෙන් වූ අර්ථය, අසංඛතට්ඨො, – හේතු ප්‍රත්‍ය ධර්මයකින් සකස් නොකරනලද අර්ථය, අමතට්ඨො,– චුතවීමක් නොමැති අර්ථය,

මග්ගස්ස,– මාර්ගසත්‍යයාගේ, නියාානට්ඨො,– සංසාර වට්ට දුක්ඛයෙන් එතර කරවන අර්ථය, හෙත්වට්ඨො,– නිර්වාණයට පැමිණීමට හේතුවන අර්ථය, දස්සනට්ඨො,– නිර්වාණය අරමුණු කිරීම් වශයෙන් දැකීමේ අර්ථය, ආධිපතෙය්‍යට්ඨො,– සම්ප්‍රයුක්ත ධර්මයන්ට ඉසුරුමත් බව යන අර්ථය, ඉති,– මෙසේ, සතරක් වූවාහු. මග්ගස්ස,– මාර්ගය පිළිබඳ තථා,– සත්‍ය වූ, අවිතථා,– අසත්‍ය නොවූ, අනඤ්ඤථා– අන්ධර්මයක් බවට නොගියා වූ, මග්ගට්ඨා, – මාර්ගාර්ථයෝ වෙති.

ඔළාරිකත්තා සබ්බසාධාරණත්තාව සුවිඤ්ඤෙය්‍යත්ති දුක්ඛසච්චං පඨමංවුත්තං තස්සෙව හේතු දස්සනත්ථං තදනන්තරං සමුදය සච්චං, හේතුනිරොධා ඵලනිරොධොති ඤාපනත්ථං තතො නිරොධ සච්චං, තදධිගමූපාය දස්සනත්ථං අන්තෙ මග්ගසච්චං **(විභංග අට්ඨකථා)**.

ඔළාරිකත්තා ච,– ඖදරික බැවින් ද, සබ්බ සාධාරණත්තා ච,– සකල සත්වයන් හට සාධාරණ බැවින් ද, සුවිඤ්ඤෙය්‍යං– සුවසේ අවබොධ කට හැකිය. ඉති තස්මා, එසේ හෙයින්, දුක්ඛ සච්චං, – දුක්ඛ සත්‍යය.පඨමං වුත්තං,– පළමු කොට කියන ලදී. තස්සෙව,– ඒ දුක්ඛසත්‍යයාගේම, හේතු දස්සනත්ථං,– හේතුව දක්වීම පිණිස, තදනන්තරං,– ඒ දුක්ඛ සත්‍යයට අනතුරුව, සමුදය සච්චං, – සමුදය සත්‍යය. වුත්තං, කියන ලදී. හේතු නිරොධා, – හේතුවගේ නිරෝධයෙන්, ඵල නිරොධොති,– ඵලයාගේ නිරෝධය වේ යයි, ඤාපනත්ථං,– අවබොධ කරවීම පිණිස, තතො,– ඉන්පසු, නිරොධ සච්චං,– නිරොධ සත්‍යය, වුත්තං,– කියන ලදී. තදධිගමූපාය දස්සනත්ථං, ඒ නිරොධ සත්‍යයාගේ අවබොධ කිරීමේ හේතු දැක්වීම පිණිස, අන්තෙ,– කෙළවරෙහි. මග්ග සච්චං,– මාර්ග සත්‍යය, වුත්තං,- කියන ලදී.

තත්ථ කිඤ්චාපි දුක්ඛ දුක්ඛං, සංඛාර දුක්ඛං විපරිණාමදුක්ඛන්ති තිසුපි දුක්ඛ සද්දෙ පවත්තති සො පන දුක්ඛදුක්ඛතො අඤ්ඤත්ථ පවත්තමානො අඤ්ඤනිරපෙක්ඛො න පවත්තතීති සුද්ධඤ්චෙත්ථ දුක්ඛ පදං අඤ්ඤ නිරපෙක්ඛං ගහෙත්වා පණ්ණත්ති සොධනං කරොති, තේන නිප්පරියායතො දුක්ඛසභාවත්තා එව, යං දුක්ඛ දුක්ඛං තස්මිං දුක්ඛ දුක්ඛෙ එය දුක්ඛ සද්දෙ, **(විභංග මූල ටීකා)**

දුක්ඛ දුක්ඛං,– දුක්ඛ දුක්ඛයද, සංඛාරදුක්ඛං,– සංඛාර දුක්ඛයද, විපරිණාම දුක්ඛං, විපරිණාම දුක්ඛයද, ඉති තිසු පි,– මෙසේ තුනක් වූ දුක්ඛයන් කෙරෙහි ද, දුක්ඛසද්දෙ කිඤ්චාපි පවත්තති– දුක්ඛ ශබ්දය වැටෙන්නේමය. (ජාතිපි දුක්ඛාති ආදිනා – ජාතිපි දුක්ඛා යනාදී වශයෙන් ද , ජාති ආදිසු,– ජාති දුක්ඛ ආදියෙහි කිඤ්චාපි පවත්තති පවතින්නේමය.) පන,– එසේම වැටෙන්නේ නමුත්, සො, – ඒ දුක්ඛ ශබ්දය, දුක්ඛ දුක්ඛතො,– දුක්ඛ දුක්ඛයෙන් අඤ්ඤත්ථ– අන්‍යදුක්ඛයක් කෙරෙහි, පවත්තමානො,– පවතිනුයේ. අඤ්ඤනිරපෙක්ඛො– සංඛාරාදි අන්‍ය දුක්ඛ පද අත්හැර, න පවත්තති,– නොපවතී. එත්ථ,– මේ නාම ප්‍රඥප්ති වාරයෙහි, සුද්ධං දුක්ඛපදං,– තනිකර දුක්ඛ පදය, අඤ්ඤනිරපෙක්ඛං– සංඛාරාදි අන්‍ය දුක්ඛ පද අත්හැර, ගහෙත්වා,– ගෙන පණ්ණත්ති සොධනං,– ප්‍රඥප්ති ශෝධනය භගවා,– සර්වඥයන් වහන්සේ, කරොති ච,– කෙරෙති, තෙන,– එහෙයින්, නිප්පරියායතො,– නිශ්පර්‍යාය වශයෙන්, දුක්ඛ

සභාවත්තා එව,– දුක්ඛ ස්වභාවම බැවින්, යං දුක්ඛ දුක්ඛං,– යම් දුක්ඛ දුක්ඛයක්, අත්ථි,– ඇත්තේද, තස්මිං දුක්ඛ දුක්ඛෙ එව,– එම දුක්ඛ දුක්ඛයෙහිම, එස දුක්ඛසද්දෙ, මේ දුක්ඛ ශබ්දය. පවත්තති,– වැටේ.

ඉතරම්පන අරියසච්චද්වයං සියා දුක්ඛං අනිච්චතො, න පන යස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති, තත්ථයේන, සබ්බාකාරෙන පන උපාදනක්ඛන්ධ පඤ්චකං දුක්ඛඤ්චෙව අරියසච්චඤ්ච,– අඤ්ඤත්‍ර තණ්හාය මග්ගසම්පයුත්තා ධම්මා සාමඤ්ඤ ඵලානි ච යස්ස පරිඤ් ඤත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සති තත්ථයේන නේව දුක්ඛං න අරියසච්චං, **(විභංග අට්ඨකථා)**

ඉතරං, මෙය හැර ඉතිරි වූ , අරියසච්චද්වයම්පන,– සමුදය සත්‍ය මාර්ගසත්‍ය යන ආර්‍ය සත්‍ය දෙක වනාහි, අනිච්චතො,– අනිත්‍ය බැවින්, දුක්ඛං සියා,– දුක්ඛ නම් විය හැකිය. යස්ස පරිඤ්ඤාය–යම් ආර්‍ය සත්‍යයක් පිරිසිඳ අවබෝධ කර ගැනීම පිණිස, භගවති,– සර්වඥ සාසනයෙහි, බ්‍රහ්මචරියං,– ශාසන බ්‍රහ්මචරියාව, වුස්සති,– හැසිරෙනු ලැබේද, තත්ථයේන පන– ඒ පරිඤ්ඤා කෘත්‍යයාගේ අර්ථයෙන් වනාහි, න අරියසච්චං,– ආර්‍ය සත්‍යය නම් නොවේ. සබ්බාකාරෙන පන, – සර්ව ප්‍රකාරයෙන් වනාහි, තණ්හායඤ්ඤත්‍ර – තණ්හාව හැර, උපාදනක්ඛන්ධ පඤ්චකං, උපාදනස්කන්ධ පඤ්චකය, දුක්ඛඤ්චෙව– දුක්ඛ නම් ද වේ. අරියසච්චඤ්ච– ආර්‍ය සත්‍ය නම් ද වේ. මග්ගසම්පයුත්තා ධම්මා,– මාර්ග සම්ප්‍රයුක්ත ධර්මයෝද සාමඤ්ඤ ඵලානි ච සාමඤ්ඤ ඵලයෝ ද යස්ස පරිඤ්ඤත්ථං යම් ආර්‍ය සත්‍යයක පිරිසිඳ අව බෝධය පිණිස, භගවති,– සර්වඥ ශාසනයෙහි, බ්‍රහ්මචරියං, – ශාසන බ්‍රහ්ම චරියාව, වුස්සති, – හැසිරෙනු ලැබේද, තත්ථයේන– ඒ පරිඤ්ඤා කෘත්‍යයාගේ අර්ථ-යෙන්, නෙව දුක්ඛං,– දුක්ඛය නම් ද නොවේ. න අරියසච්චං,– ආර්‍ය සත්‍ය නම් ද නොවේ.

අවසේසං දුක්ඛසච්චන්ති දුක්ඛ වෙදනාය චෙව තණ්හාය ච විනිම්මුත්තා තෙභූමක ධම්මා වේදිතබ්බා,– ( **යමක අට්ඨකථා**)

අවසේසං දුක්ඛසච්චං,– යනු, දුක්ඛ – වේදනාය චේච,– දුක්ඛ වේදනාව කෙරෙන්ද, තණ්හායච, තණ්හාව කෙරෙන්ද, විනිම්මුත්තා, – වෙන්වූවාවූ, තෙභූමක ධම්මා,– භූමිත්‍රයට අයත් වූ, ධර්මයෝ, වේදිතබ්බා,– දතයුත්තාහ.

මග්ගසද්දෙ ච ඵලඩ්ගෙසු මග්ගඵලත්තා පවත්තති, න මග්ගකිච්ච සබ්භාවා, පරිනිට්ඨිත නියානා කිච්චානිහි තානි, නියානාවාචකො චෙත්ථ මග්ගසද්දෙ, න නියානඵල වාචකො. **(යමක මූල ටීකා)**

මග්ගසද්දෙ ච,– මාර්ග ශබ්දය ද, ඵලඩ්ගෙසු,– සම්මා දිට්ඨි ආදි සාමඤ්ඤඵල අංගයන්හි, මග්ග ඵලත්තා,–මාර්ගයාගේම ඵලය බැවින්, පවත්තති,–වැටෙයි. මග්ග කිච්ච සබ්භාවා,–මාර්ග කෘත්‍යය ලැබෙන බැවින්, න පවත්තති,– නොපවති, හි–සච්චං, සත්‍යයකි, තානි–ඒ සාමඤ්ඵල අංගයෝ පරිනිට්ඨිත නියානා කිච්චානි, – භාත් පසින් නිමවූ සංසාර දුක්ඛයෙන් එතර කිරීමේ කෘත්‍ය ඇත්තා වූ ධර්මයෝ, හොත්ති

වෙති. ච,– පැහැදිලි කරන්නෙමි. එත්ථ,– මේ සත්‍ය යමකයෙහි, මග්ගසද්දෙ,– මාර්ග ශබ්දය, නිය්‍යානවාචකො,– සංසාර දුක්ඛයෙන් එතර කිරීමේ අර්ථය කියන්නේ, හොති,– වේ. නිය්‍යාන ඵල වාචකො,– සංසාර දුක්ඛයෙන් එතර කරවන ධර්මයාගේ ඵලය යන අර්ථය කියන්නේ. න හොති,– නොවෙයි.

සුද්ධ සච්ච වාරෙ සච්චවිභඞ්ගෙ වුත්තෙසු සමුදයේසු කොචි ඵලධම්මෙසු නත්ථි, නව ඵලධම්මේසු කොචි නිරොධොති වුච්චමානො අත්ථි, මග්ගසද්දෙ ච ඵලඞ්ගෙසු මග්ගඵලත්තා පවත්තති, න මග්ගකිච්ච සබ්භාවා, පරිනිට්ඨිත නිය්‍යානික කිච්චානිහි තානි, නිය්‍යාන වාචකො චෙත්ථ මග්ගසද්දෙ න නිය්‍යාන ඵල වාචකො, තස්මා සමුදයො සච්චං නිරොධො සච්චං මග්ගො සච්චන්ති එතේසුපි ආමන්තා ඉච්චෙව විස්සජ්ජනං කතං අථවා පදසොධනේන පදෙසු සොධිතේසු සච්චවිසේසන භූතාඑව දුක්ඛාදි සද්ද ඉධ ගහිතානිවිඤ්ඤායන්ති, තෙසංපන එකන්තෙන සච්චවිසේසන භාවං සච්චානඤ්ච තබ්බිසේසන යෝග විසෙසං දීපෙතුං සුද්ධසච්චවාරො වුත්තොති. සච්චවිසෙසනානං දුක්ඛාදීනං එකන්ත සච්චත්තාදුක්ඛංසච්චංනිරොධො සච්චං මග්ගො සච්චන්ති ආමන්තාති වුත්තං යථා චෙත්ථ එවං ඛන්ධ යමකාදිසු පි සුද්ධ ඛන්ධාදි වාරෙසු ඛන්ධාදි විසෙසන භූතාන මෙව රූපාදීනං ගහණං යුත්තං, **(යමක මූල ටීකා)**

සුද්ධ සච්ච වාරෙ,– සුද්ධ සත්‍ය වාරයෙහි, සච්චවිභඞ්ගෙ – සත්‍ය විභංගයෙහි, වුත්තෙසු,– කියන ලද්දවූ, සමුදයේසු,– සමුදය නම් වූ ධර්මයන් අතුරෙන්, කොචි,– කිසියම් ධර්ම කෙනෙක්, ඵල ධම්මෙසු,– ඵල ස්වභාව ඇති ධර්මයන් කෙරෙහි, නත්ථි නැත්තේය, ඵලධම්මේසු,–ඵල ස්වභාවය ඇති ධර්මයන් කෙරෙහි, නිරොධොති නිරෝධයයි කියා, වුච්චමානො,– කියනු ලබන්නාවූ, කොචි,– කිසිවක්, නත්ථි,– නොමැත. මග්ගසද්දෙ ච–මග්ග ශබ්දය ද, ඵලඞ්ගෙසු – සම්මාදිට්ඨි ආදි සාමඤ්ඤ ඵල අංගයන්හි, මග්ගඵලත්තා,– මාර්ගයාගේ ඵලය බැවින්, පවත්තති,– වැටෙයි. මග්ගකිච්චසබ්භාවා,– මාර්ග කෘත්‍යය ලැබෙන බැවින්, න පවත්තති,–නොවැටෙයි. හි – සච්චං – සත්‍යයකි, තානි – ඒ සාමඤ්ඤඵල, අඞ්ගයෝ පරිනිට්ඨිත නිය්‍යාන කිච්චානි, – නිමාවට ගියා වූ සසර දුකින් එතර කිරීමේ කෘත්‍ය ඇත්තාහු, හොන්ති,– වෙති.

ච,– විස්තර දක්වන්නෙමි. එත්ථ,– මේ සත්‍ය යමකයෙහි, මග්ගසද්දෙ,– මග්ග ශබ්දය, නිය්‍යාන වාචකො,– සංසාර දුක්ඛයෙන් එතර කිරීමේ අර්ථය කියන්නේය. න නිය්‍යාන ඵල වාචකො,– සංසාර දුක්ඛයෙන් එතර කිරීමේ ඵල ධර්ම කියන්නේ නොවේ. තස්මා,– එහෙයින්, සමුදයො සච්චං – පෙ – මග්ගො සච්චන්ති,– සමුදයො සච්චං නිරොධො සච්චං මග්ගො සච්චං යනුවෙන්, කියන ලද, ඒතේසු පි,– මේ සත්‍යයන් හිද, ආමන්තා ඉච්චෙව,– ආමන්තා කියාම, විස්සජ්ජනං,– විසඳුම, කතං,– කරන ලදී.

අථවා,– තවද, පදසොධනේන,– පදශෝධනයෙන්, පදේසු,– පදයන්, සෝධිතේසු,– ශෝධනය කළ කල්හි, සච්චවිසේසන භූතා එව,– සත්‍යයට විශේෂණ වූවාවූම, දුක්ඛාදි සද්ද,–දුක්ඛාදි ශබ්දයෝ, ඉධ, මේ සුද්ධසත්‍යය වාරයෙන්හි, ගහිතානි,

ගන්නා ලදහයි, විඤ්ඤායන්ති – හැඟෙති. පන– එසේ හැඟෙන නමුත්, තෙසං,– ඒ දුක්ඛාදි ශබ්දයන්ගේ, එකන්තෙන,– ඒකාන්තයෙන්, සච්චවිසේසන භාවඤ්ච,– සත්‍ය විශේෂණ බවද, සච්චානං,– සත්‍යයන්ගේ, තබ්බිසේසනයෝග විසේසඤ්ච,– ඒ දුක්ඛාදි විශේෂන යෙදීමේ විශේෂය ද, දීපෙතුං,– දැක්වීම පිණිස, සුද්ධසච්ච වාරො, ශුද්ධ සත්‍ය වාරය, වුත්තො,– කියන ලදී. ඉති තස්මා,– එසේ හෙයින්, සච්චවිසේසනානං,– සත්‍ය විශේෂණවූ, දුක්ඛාදිනං, – දුක්ඛාදීන්– එකන්තසච්චත්තා–ඒකාන්තයෙන් සත්‍ය බැවින්, දුක්ඛං සච්චං නිරොධො සච්චං මග්ගො සච්චං, යනුවෙන්, වුත්තං,– කියන ලදී, ච,– විස්තර කරන්නෙමි, එත්ථ,– මෙහි, සච්චවිසේසන භූතා, සත්‍ය විශේෂණ වූ, දුක්ඛාදයො,– දුක්ඛාදීහු,– ගහිතා යථා,– යම්සේ ගන්නා ලද්දාහුද, එවං,– ඒ සමානව, ඛන්ධයමකාදීසු පි,– ස්කන්ධ යමකාදියෙහි ද, සුද්ධ ඛන්ධාදි වාරෙසු,– සුද්ධ ස්කන්ධාදි වාරයන්හිද, ඛන්ධාදි විසේසන භූතාන මෙව,– ස්කන්ධාදි විශේෂණ වූම, රූපාදීනං,– රූප ආදීන්ගේ, ගහණං,–ගැනීම, යුත්තං හොති,– යුතුවේ.

නාම ප්‍රඥප්ති වාරය නිමි.

---

### පරිඤ්ඤා වාරය

## ගණ්ඨිපද ශොධනය

ප්‍ර:- ප්‍රඥප්ති වාරයෙහි කුමක් හෙයින් නිරෝධවාරය නොවදරණ ලදද?

උ:- නිරෝධ සත්‍යය වනාහි උත්පාද නිරෝධයක් නොමැති බැවින් නොවදරණ ලදී.

නිරොධස්ස නෙව උප්පාදෙ න නිරොධො යුජ්ජති. (යමක අට්ඨකථා)

නිරොධස්ස,– නිරෝධ සත්‍යයේ, උප්පාදෙ,– උත්පාදයක්, නෙව යුජ්ජති,– නොම යෙදේ. නිරොධො,– නිරෝධයක්, න යුජ්ජති, නොම යෙදේ.

තණ්හා විප්පයුත්ත චිත්තස්සාති ඉදං දුක්ඛ සච්ච සමුදය සච්චෙසු එක කොට්ඨාසස්ස උප්පත්ති දස්සනත්ථං වුත්තං, තස්මා පඤ්චවොකාර වසෙනෙව ගහෙතබ්බං. **(යමක අට්ඨකථා)**

තණ්හා විප්පයුත්ත චිත්තස්ස,– ඉති ඉදං,– යන මේ වචනය, දුක්ඛසච්ච සමුදය සච්චෙසු,– දුක්ඛසත්‍යය සමුදය සත්‍ය අතුරෙන්, එක කොට්ඨාසස්ස,– එක කොටසකගේ, උප්පත්ති දස්සනත්ථං,– උත්පත්තිය දැක්වීම පිණිස, වුත්තං,– කියන ලදී. තස්මා,– එහෙයින් පඤ්චවොකාර වසෙනෙව,– පඤ්චවෝකාර භූමි වශයෙන්ම ගහෙතබ්බං ගත යුතුය.

තණ්හා විප්පයුත්ත චිත්තස්සාති ඉදං පඤ්චවොකාර වසෙනෙව ගහෙතබ්බන්ති වුත්තං, යස්ස දුක්ඛසච්චං උප්පජ්ජතීති ඒතේන පන සන්නිට්ඨානේන සබ්බෙ උප්පජ්ජන්තා පවත්තියං චතුවොකාරෙ මග්ගඵලතො අඤ්ඤචිත්තානං උප්පාදක්ඛණ සමංගිනො පඤ්චවොකාරෙ ච සබ්බචිත්තානං උප්පාදක්ඛණ සමංගිනො සංගහිතාති තෙස්වෙවසන්නිට්ඨානේන නිච්ඡිතේසු කෙචි පවත්තෙ තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙති. ඒතේන දුක්ඛසමුදයෙසු එකකොට්ඨාසප්පවත්ති සමංගිනො දස්සි යන්ති. සන්නිට්ඨානේන ගහිතස්සෙ ච විභාග දස්සනතො තෙන චතුවොකාරානම්පි ගහණං උප්පන්න මෙව, නහි තේසු මග්ගඵලුප්පාද සමංගිසු පසංගතා අත්ථි. තං සමංගීනං තෙසං සන්නිට්ඨානේන අග්ගහිතත්තාති, **(යමක් මූල ටීකා)**

තණ්හා විප්පයුත්ත - පෙ - ගහෙතබ්බං - යනුවෙන් අට්ඨකථාවෙහි, වුත්තං, කියන ලදී,- පන,- එසේම කියා ඇත්තේ නමුත්, යස්ස දුක්ඛ සච්චං උප්පජ්ජති යයි කියන ලද, එතෙන සන්නිට්ඨානේන,-මේ සන්නිට්ඨාන පදයෙන්, සබ්බෙ,- සියලුම, උප්පජ්ජන්තා,- ප්‍රතිසන්ධි ගනිමින් සිටින්නා වූ පුද්ගලයෝ ද, පවත්තියං,- ප්‍රවෘත්ති කාලයෙහි චතුවොකාරෙ,- චතුවෝකාර භූමියෙහි, මග්ගඵලතො,- මාර්ග ඵල චිත්තයෙන් අඤ්ඤචිත්තානං - අන්‍ය වූ චිත්තයන්ගේ, උප්පාදක්ඛණ සමංගිනෝ උත්පාදක්ෂණයෙන් යුක්ත වූ පුද්ගලයෝ ද, පඤ්චවොකාරෙ ච,- පඤ්චවෝකාර භූමියෙහි ද, සබ්බ චිත්තානං,- සියලු චිත්තයන්ගේ, උප්පාදක්ඛණ සමංගිනො උත්පාදක්ෂණයෙන් යුක්ත වූ පුද්ගලයෝ ද, සංගහිතා,- සංග්‍රහ කරන ලදහ. ඉති තස්මා,- එසේ හෙයින්, සන්නිට්ඨානේන නිච්ඡිතේසු,- සන්නිට්ඨානයෙන් නිශ්චය කරන ලද, තෙස්වේච,- ඔවුනතුරෙන්ම, කෙචි,- ඇතමෙක්, දුක්ඛ සමුදයේසු,- දුක්ඛ සත්‍ය සමුදය සත්‍ය දෙක අතුරෙන්, එක කොට්ඨාසප්පවත්ති සමංගිනො,- දුක්ඛ සත්‍ය නම් වූ එක කොට්ඨාශය කින් යුක්තවූ පුද්ගලයෝ, පවත්තෙ තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ- යන ඒතෙන,- මේ 'වචනයෙන්, දස්සියන්ති, - දක්වනු ලැබෙත්. කස්මා,- කුමක් හෙයින් ද යත්, සන්නිට්ඨානේන,- සන්නිට්ඨාන පදයෙන්, ගහිතස්සෙව,- ගන්නා ලද්ද වූ අර්ථයාගේම, විභාග දස්සනතො,- විභාග දක්වන බැවිනි. තේන,- එයින්, චතුවොකාරානම්පි,- චතුවොකාර පුද්ගලයන්ගේ ද, ගහණං ගැනීම, උප්පන්නමෙව,- සිද්ධ බවම,- හොති,- වේ.

හි-සච්චං,-සත්‍යයකි,තේසු,-සන්නිට්ඨාන පදයෙන් ගනු ලබන ඒ පුද්ගලයන්, මග්ගඵලුප්පාද සමංගිසු,-මාර්ග -ඵලයන්ගේ උත්පාදක්ෂණයෙන් යුක්ත පුද්ගලයන් කෙරෙහි, පසංගතා, -වැටීමක්, න අත්ථි, - නොමැත. කස්මා,- කුමක් හෙයින්ද, තං සමංගීනං, ඒ මාර්ග ඵල චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමංගී වූ,තෙසං,- ඒ පුද්ගලයන්, සන්නිට්ඨානේන,- සන්නිට්ඨානයෙන්, අග්ගහිතත්තා,- නොගත් බැවිනි. ඉති,- මෙසේ දත යුතුය.

තෙසං පන පවත්තියං දුක්ඛසච්චස්ස උප්පාදෙ සබ්බත්ථ න ගහිතො, තථා නිරොධො ච, **(යමක මූල ටීකා)**

පන,– එක කොටසක් දක්වන්නෙමි. තෙසං,– ඒ අසංඥතල වාසි පුද්ගලයන්ගේ, පවත්තියං,– ප්‍රවෘත්තිකාලයෙහි. දුක්ඛසච්චස්ස,– දුක්ඛ සත්‍යයාගේ, උප්පාදෙ,– උත්පාදය, සබ්බත්ථ,– සියලුම පූර්වකොට්ඨාශ පශ්චිම කොට්ඨාශයන්හි, න ගහිතො,– නොගන්නා ලදී. තථා,– එසේම, නිරොධො ච,– නිරොධය ද, න ගහිතො, නොගන්නා ලදී.

පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙහි ආගතට්ඨානෙ පටිසන්ධි චිත්තස්සපි භංගක්ඛණස්ස ගහණං දට්ඨබ්බං, තථා පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙහි ආගතට්ඨානෙ චුති චිත්තස්ස පි උප්පාදක්ඛණස්ස, **(යමක මූල ටීකා)**

පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ – යනුවෙන්, ආගතට්ඨානෙ,– ආ තැන, පටිසන්ධි චිත්තස්ස පි,– ප්‍රතිසන්ධි චිත්තයාගේ ද, භංගක්ඛණස්ස,– භංගක්ෂණය, ගහණං,– ගැනීම, දට්ඨබ්බං,– දතයුතුය, තථා,– එසේම. පවත්තෙ, චිත්තස්ස උප්පාදක්ඛණෙ යයි, ආගතට්ඨානෙච,– ආ තැන ද, චුති චිත්තස්සපි,– චුති චිත්තයාගේ ද උප්පාදක්ඛණස්ස,– උත්පාදක්ෂණයාගේ, ගහණං,– ගැනීම, දට්ඨබ්බං,– දත යුතුය, (මග්ග විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ– යන තැන්හිද ක්‍රමය මෙසේ මය)

සබ්බෙසං උපපජ්ජන්තානං පවතේත තණ්හා විප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථාති තෙසං තස්මිං උප්පත්තික්ඛණෙ ච තණ්හා විප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණෙ චාති එවමෙත්ථ ඛණ වසෙන ඔකාසො වෙදිතබ්බො අඤ්ඤෙසුපි ඊවරූපේසු එසෙව නයො, **(යමක අට්ඨකථා)**

සබ්බෙසං උපපජ්ජන්තානං පවත්තෙ තණ්හාවිප්පයුත්ත චිත්තස්ස උප්පාදක්ඛෙණ තෙසං තත්ථ – යනුවෙන් කියන ලද වචනයෙහි,තෙසං,–ඒ සියලු ප්‍රතිසන්ධි ගනිමින් සිටින පුද්ගලයන් හා ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයන්ගේ උත්පාදක්ෂණයෙන් යුක්ත වූ පුද්ගලයන්ගේ, තස්මිං උප්පත්තික්ඛණෙ,– ඒ ප්‍රතිසන්ධි ගන්නා ක්ෂණයෙහිද, තස්මිං තණ්හාවිප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණෙ ච,– ඒ තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයන්ගේ උත්පාදක්ෂණයෙහිද, ඉති එවං,–මෙසේ එත්ථ,–මේ පුද්ගලෝකාශ වාරයෙහි, ඛණවසෙන,– ක්ෂණවශයෙන්, ඔකාසො,– අවකාශය. වේදිතබ්බො, දත යුතුය. අඤ්ඤෙසු–, අන්‍ය වූ, එව රූපෙසු,–මෙබඳු යෙදුම් ඇති තැන්හි, එසෙව නයො,– නයක්‍රමය මෙසේමය.

තෙසං තස්මිං උප්පත්තික්ඛණෙ ච තණ්හා විප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණෙ චාති එවමෙත්ථ ඛණවසෙන ඔකාසො වේදිතබ්බොති වුත්තං එවඤ්ච සති යස්ස යත්ථ දුක්ඛ සච්චං උප්පජ්ජති,තස්ස තත්ථ සමුදය සච්චං උප්පජ්ජිස්සතීති ඒතස්ස විස්සජ්ජනෙ පච්ඡිම කොට්ඨාසෙ ඉතරෙසං චතුවොකාරං පඤ්චවොකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ දුක්ඛ සච්චඤ්ච උප්පජ්ජති සමුදය සච්චඤ්ච උප්පජ්ජිස්සතීති ඉදං න යුජ්ජෙය්‍ය, නහි උප්පත්තික්ඛණෙ චිත්තුප්පත්තික්ඛණෙ ච සමුදය සච්චං උප්පජ්ජිස්සතීති, තස්මා උප්පත්තික්ඛණ තණ්හා විප්පයුත්ත

චිත්තුප්පත්තික්ඛණ සමංගීනං පුග්ගලානං යස්මිං කාමාවචරාදි ඔකාසෙ සා උප්පත්ති චිත්ත පවත්ති ච පවත්තමානා තත්ථ තෙසන්ති ඔකාස වසෙනෙවෙත්ථ තත්ථ සද්දස්ස අත්ථො යුජ්ජති, පුග්ගලොකාස වාරො හෙස. **(යමක මූල ටීකා)**

තෙසං තස්මිං උප්පත්තික්ඛණෙ ච තණ්හා විප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණෙ චාති එවමෙත්ථ ඛණ වසෙන ඔකාසො වෙදිතබ්බා, යනුවෙන්, වුත්තං,– කියන ලදී. පැහැදිලි කරන්නෙමි. එවං සති,– මෙසේ ඇති කල්හි, යස්ස යත්ථ දුක්ඛසච්චං උප්පජ්ජති, තස්ස තත්ථ සමුදයසච්චං උප්පජ්ජිස්සති,– යයි කියන ලද, එතස්ස,– මේ පුච්ඡා වගේ, විස්සජ්ජනෙ,– විසඳුමෙහි, පච්ඡිම කොට්ඨාසෙ,– පශ්චිම කොට්ඨාශයෙහි, ඉතරෙසං චතුවොකාරං පඤ්චවෝකාරං උපපජ්ජන්තානං පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං තත්ථ දුක්ඛසච්චඤ්ච උප්පජ්ජති සමුදය සච්චඤ්ච උප්පජ්ජිස්සති යයි කියන ලද. ඉදං ,– මේ විස්සර්ජන වචනය, නයුජ්ජෙය්‍ය,– සුදුසු නොවන්නේය. හි– පැහැදිලි කරන්නෙමි. උප්පත්තික්ඛණෙච, – ප්‍රතිසන්ධි – ක්ෂණයෙහිද, චිත්තුප්පත්තික්ඛණෙ ච,– චිත්තයාගේ උත්පත්තික්ෂණයෙහිද, සමුදය සච්චං,– සමුදය සත්‍යය, න උප්පජ්ජිස්සති,– උපදින්නේ නොවෙයි. ඉති තස්මා,– එසේ හෙයින්, ඉදං,– මේ විස්සර්ජන වචනය, න යුජ්ජෙය්‍ය,– සුදුසු නොවන්නේය. තස්මා,– එහෙයින්, උප්පත්තික්ඛණ තණ්හාවිප්පයුත්ත චිත්තුප්පත්තික්ඛණ සමංගීනං,– ප්‍රතිසන්ධික්ෂණ තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයන්ගේ උත්පාදක්ෂණ සමන්ගී වූ, පුග්ගලානං, පුද්ගලයන්ට,යස්මිං කාමාවචරාදි ඔකාසෙ,යම කාමාවචරාදි භූමියෙක්හි, සා උප්පත්ති ච, ඒ චිත්තයන්ගේ උපැත්මද, පවත්තමානා, – පවතිමින් සිටින්නේ. හොති,– වේද, තත්ථ ඒ කාමාවචරාදි භූමියෙහි, තෙසං,– ඒ පුද්ගලයන්හට, ඉති මෙසේ, ඔකාස වසෙනෙව,– ඒ කාමාවචරාදි භූමි වශයෙන්ම, එත්ථ,– මේ තෙසං තත්ථ– යන පාඨයෙහි, තත්ථ සද්දස්ස,–තත්ථ යන ශබ්දයාගේ, අත්ථො,– අර්ථය, යුජ්ජති,– යෙදේ, හි,– සත්‍යයකි. එස වාරො,– මේ වාරය, පුද්ග්ගලොකාසවාරො,– පුද්ගල අවකාශ වාරයයි.

සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච උප්පාදක්ඛණෙ තෙසං සමුදය සච්චඤ්ච නුප්පජ්ජති දුක්ඛසච්චඤ්ච නුප්පජ්ජතිති එත්ථ පන පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ දුක්ඛසච්චං නුප්පජ්ජතීති චිත්ත පටිබද්ධ වුත්තිතා චිත්තජරූපමෙව ඉධාධිප්පෙතං,න කම්මජාදිරූපං, චිත්තං අනපෙක්ඛිතවාව උප්පජ්ජනතොති කේචි වදන්ති, යස්සවා පන සමුදය සච්චං නුප්පජ්ජතීති එතෙන පන සන්නිට්ඨානේන ගහිතො පුග්ගලො න චිත්තං අපෙක්ඛිත්වාව ගහිතො, අථවා යො කොචි එවං පකාරො, තස්මා තස්ස දුක්ඛ සච්චං නුප්පජ්ජතීති එතෙන ච න චිත්තාපෙක්ඛමෙව දුක්ඛ සච්චං වුත්තං,අථ වා යං කිඤ්චීති චිත්තස්ස භංගක්ඛණෙ යං කිඤ්චි දුක්ඛ සච්චං නුප්පජ්ජතීති අයමත්ථො විඤ්ඤායතීති. නහි යමකෙ විභජිතබ්බෙ අවිභත්තා පුච්ඡා නාම අත්ථීති,

සබ්බෙසං චවන්තානං පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ අරූපෙ මග්ගස්ස ච ඵලස්සච උප්පාදක්ඛණෙ තෙසං සමුදය සච්චඤ්ච නුප්පජ්ජති දුක්ඛ සච්චඤ්ච නුප්පජ්ජති යන, එත්ථ,– මෙහි, පවත්තෙ චිත්තස්ස භංගක්ඛණෙ දුක්ඛ සච්චං නුප්පජ්ජති යන පාඨයෙන් චිත්තපටිබද්ධ වුත්තිතා,– සිත පිළිබඳ පැවැත්ම ඇති බැවින්, චිත්තජ රූපමෙව,– චිත්තජ රූපයම, ඉධ,– මෙහි මේ යමක ප්‍රකරණයෙහි, අධිප්පෙතං,– අදහස් කරන ලදී. කම්මජාදි රූපං,– කර්මජ ආදි රූපය න අධිප්පෙතං,– අදහස් නොකරන ලදී. කස්මා,– කුමක් හෙයින් ද යත්, තස්ස,– ඒ කර්මජාති රූපය, චිත්තං,– චිත්තය, අනපෙක්ඛිත්වාව,–අපෙක්ෂා නොකොට–ම, උප්පජ්ජනතො,–උපදින බැවිනි' ඉති,– මෙසේ, කේචි,–අන්‍ය වූ ධම්මසිරි නමැති (බුරුම) මහතෙර කෙනෙක් වදන්ති, කියති. පන,– එහෙත්, යස්ස වා පන සමුදය සච්චං නුප්පජ්ජති– යනුවෙන් කියනලද ඒතේන සන්නිට්ඨානේන,–මේ සන්නිට්ඨාන පදයෙන්, ගහිතො,–ගන්නා ලද, පුග්ගලො– පුද්ගල තෙම, (සියලුම උපදින පුද්ගලයා, ප්‍රවෘත්ති කාලයෙහි තෘෂ්ණා විප්‍රයුක්ත චිත්තයාගේ භංගක්ෂණ සමංගි පුද්ගලයා) චිත්තං,– චිත්තය, අපෙක්ඛිත්වාව,–අපේක්ෂා කොට ම, ගහිතො,– ගන්නා ලද්දේ, න හොති,– නොවෙයි, අථ ඛො,– වැළිදු වනාහි,– යො කොචි,– යම් කිසි, එවං පකාරො,– මෙබඳු ප්‍රකාර ඇත්තා වූ මේ සමුදය සත්‍ය නූපදින ස්වභාව ඇත්තා වූ පුද්ගල තෙම, ගහිතො,– ගන්නා ලද්දේ, හොති– වෙයි. තස්මා,– එහෙයින්, තස්ස දුක්ඛසච්චං නුප්පජ්ජති – යන, ඒතෙන ච,– මේ වචන යෙන් ද, චිත්තාපෙක්ඛ මෙව,– චිත්තය අපේක්ෂා කොට ගෙනම, දුක්ඛ සච්චං, දුක්ඛසත්‍යය,– නවුත්තං,– නොකියන ලදී. අථ ඛො,– තවද වනාහි,– යංකිඤ්චි– යම්කිසි දුක්ඛ සත්‍යයක්, වුත්තං,– කියන ලදී. ඉති තස්මා,– එසේ හෙයින්, චිත්තස්ස, චිත්තයාගේ, භංගක්ඛණෙ,– භංගක්ෂණයෙහි, යංකිඤ්චි,– යම්කිසි, දුක්ඛ සච්චං,– දුක්ඛ සත්‍යයක්, නුප්පජ්ජති,–නූපදී, ඉති අයං අත්ථො, මෙසේ මේ අර්ථය, විඤ්ඤායති– හැඟේ, හි– යස්මා,– යම් හෙයකින්, යමකෙ,– යමක ප්‍රකරණයෙහි, විභජිතබ්බෙ,– බෙද දැක්විය යුතු තැන්හි, අවිභත්තා,– නො බෙදන ලද්ද වූ, පුච්ඡා නාම,– පුච්ඡා වක් නම්, න අත්ථි,–නො මැත්තේද, ඉති තස්මා,– එසේ හෙයින්, අයං අත්ථො,– මේ අර්ථය, විඤ්ඤායති වැටහේ.

එසා හි යමකස්ස පකති, යදිදං යථා ලාභ වසෙන යෝජනා. **(යමක අනු ටීකා)**

හි– සච්චං,– සත්‍යයකි. යථාලාභවසෙන යථාලාභ නය වශයෙන්, යදිදං එසා යොජනා,– යම් මේ අර්ථ යෝජනාවක්, අත්ථි,– ඇත්තේද, එසා යෝජනා,– මේ අර්ථ යෝජනාව, යමකස්ස පකති,– යමකප්‍රකරණයාගේ ප්‍රකෘතියයි.

අරූප ලොකංහි සන්ධාය චිත්තසමුට්ඨාන රූපං වා නොති සක්කා වත්තුං, අයඤ්හි යමක දේසනාය පකති. යදිදං යථාසම්භව යෝජනා ඒතේන ච, චිත්තසමුට්ඨාන රූප මෙවාති ආදි වචනං පටික්ඛිත්තං දට්ඨබ්බං, අථවා පච්චාසත්ති ඤායෙන යං සමුදය සච්චං 'නිරුජ්ඣති, තෙන යං දුක්ඛසච්චං උප්පාදෙතබ්බං, චිත්ත චෛතසික තප්පටිබද්ධරූපසංඛාතං තස්ස තද උප්පත්ති නත්ථීති නොති විස්සජ්ජනං,

**(විභංග අනුටීකා)**

හි,– කොටසක් දක්වන්නෙමි. අරූප ලොකං,– අරූප ලොකය, වා,– නොහොත්, චිත්ත සමුට්ඨානං රූපං,– චිත්තජ රූපය, සන්ධාය,– සඳහා, නොති,– නො යයි, වත්තුං සක්කා,– කීමට හැකිය, හි සච්චං,– සැබැව, යදිදං – යා එසා යථා සම්භව යෝජනා,– යම් මෙ ලැබෙන පරිදි වූ යෝජනාවක්, අත්ථි,– ඇත්තේ ද, අයං,– මේ ලැබෙන පරිදි වූ යෝජනාව, යමක දේසනාය,– යමක දේශනාවගේ, පකති,– ස්වභාවයයි. ඒතේන,– මේ අරූපලොකං හි, යනාදි වචනයෙන්, චිත්තසමුට්ඨාන රූප මෙවාති ආදි වචනං,– යනාදි වචනය, පටික්ඛිත්තං,– ප්‍රතික්ෂේප කරන ලදයි. දට්ඨබ්බං,– දතයුතුය.

නොහොත්, පච්චාසත්ති ඤායෙන,– පච්චාසත්ති නය ක්‍රමයෙන්, යං සමුදය සච්චං,– යම් සමුදය සත්‍යයක්. නිරුජ්ඣති,– නිරුද්ධවේද, තේන,– එයින්, චිත්ත චෙතසික, තප්පටිබද්ධ රූපසංඛාතං, – චිත්ත චෛතසික, ඒ චිත්ත චෛතසිකයන් හා ප්‍රතිබද්ධ රූප සංඛ්‍යාත වූ, දුක්ඛසච්චං,– දුක්ඛ සත්‍යය, උප්පාදේතබ්බං,– ඉපද විය යුතු. තස්ස,– ඒ දුක්ඛ සත්‍යයාගේ, තද,– ඒ සමුදය සත්‍ය නිරුද්ධ වන ක්ෂණ යෙහි, උප්පත්ති,– උත්පත්තියක් , නත්ථි,– නැති. ඉති තස්මා,– එසේ හෙයින්, නොති,– නොයයි. විස්සජ්ජනං,– විසඳුම, හොති,– වේ.

[සැ: යු:– දුක්ඛමූල මග්ග මූලි, සමුදය මූල මග්ගමූලි වාරයන්හි දුතිය චිත්ත ස්වරූප යෙහි පැහැදිලි කරන ලදී. ප්‍රශ්නෝත්තර දක්වීමට අදහස් නොකරමු.]

සුද්ධාවාසානං දුතියෙ චිතේත වත්තමානෙති ඉදං සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන යස්ස යත්ථ දුක්ඛසච්චං උප්පජ්ජිත්ථ නො ච සමුදයසච්චං තං දස්සනවසෙන වුත්තං, තස්මිං පන දස්සිතෙ තෙන සමානගතිකත්තා දුතියා කුසල චිත්තතො පුරිමසබ්බ චිත්ත සමංගිනො තෙනෙව දස්සිතා හොන්ති, (යමක මූල ටීකා)

සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානේති ඉදං,–මෙ වචනය, සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන,– යටත් පිරිසෙයින්, යස්ස,– යම් පුද්ගලයෙකුට, යත්ථ,– යම් භූමියෙක්හි දුක්ඛසච්චං,– දුක්ඛසත්‍යය, උප්පජ්ජිත්ථ, – උපන්නේද, සමුදය, සච්චං,– සමුදය සත්‍යය, නො ච උප්පජ්ජිත්ථ,– නූපන්නේ වේද, තං දස්සන වසෙන,– ඒ දුක්ඛසත්‍ය උපන්නා වූ සමුදය සත්‍යය නූපන්නා වූ පුද්ගලයා දක්වීම් වශයෙන්, වුත්තං,– කියන ලදී. පන,–එසේ කියන ලද්දේ නමුත්, තස්මිං, – ඒ දුතිය චිත්තය, දස්සිතෙ,–දක් වූ කල්හි, තෙන,– ඒ චිත්තය හා සමග සමාන ගතිකත්තා,– සමාන වූ ගති ඇති බැවින්, දුතියා කුසල චිත්තතො,– භවනිකාන්තික ද්විතීය ජවනයයි කියන ලද අකුශල චිත්ත යෙන්, පුරිම සබ්බ චිත්ත සමංගිනො, පූර්ව වූ සියලු චිත්තයන්ගෙන් යුක්ත වූ අනාගාමි ආයර්‍ය පුද්ගලයෝ, තෙනෙව,– දුතියෙ චිත්තෙ යයි කියන ලද එම පාඨයෙන්ම, දස්සිතා හොන්ති,– දක්වන ලද්දහු වෙති.

දුතියෙ චිත්තෙ වත්තමානේති පටිසන්ධිතො දුතියේ භවංග චිත්තෙ වත්තමානෙ, සහවා පටිසන්ධියා භවංගං විපාකවසෙන එකමෙව කත්වා භවනිකන්තියා ආවජ්ජන චිත්තෙ, තංහි කිරියචිත්තත්තා අබ්‍යාකත ජාතියං විපාකතො දුතියං නාම හොති. **(යමක අට්ඨකථා)**

දුතියෙ චිත්තෙ වත්තමානෙ - යනු වනාහි, පටිසන්ධිතො,- ප්‍රතිසන්ධියෙන්, දුතියෙ භවංග චිත්තෙ,- දෙවැනි වූ භංවංග චිත්තය, වත්තමානෙ,- පවත්නා කල්හි, වා,- නොහොත්, පටිසන්ධියා,- ප්‍රතිසන්ධිය හා - සහ - සමග, භවංගං,- භවංග සිත, විපාක වසෙන,- විපාකයාගෙ වශයෙන්, එකමෙව,- එකක්ම, කත්වා,- කොට, භවනිකන්තියා,- භවනිකන්තික ජවනයාගේ, ආවජ්ජන චිත්තෙ වත්තමානෙ,- ආවර්ජනා සිත පවත්නා කල්හි, හි,- ඒ වචනය පැහැදිළි කරන්නෙමි. තං,- ඒ ආවර්ජනා චිත්තය, ක්‍රියචිත්තත්තා,- ක්‍රියා චිත්තයක් බැවින්, අබ්‍යාකත ජාතියං, අව්‍යාකෘත ජාතියෙහි, විපාකතො,- විපාකය කෙරෙන්, දුතියං නාම හොති,- දුතිය චිත්තය නම වෙයි.

අනභිසමෙතාවිනන්ති ගහිතා යෙ සබ්බත්ථ, තත්ථව අනභිසමෙතාවිනො, තෙසු සුද්ධාවාසානං ගහණ කාල විසෙසනත්ථං සුද්ධාවාසානං දුතියෙ චිත්තේ වත්තමානෙති වුත්තං. **(යමක මූල ටීකා)**

අනභිසමෙතාවිනං,- කියන ලද පදයෙන්, ගහිතා,- ගන්නා ලද, සබ්බත්ථ, සියලු භූමියෙහි, තත්ථ ච,- ඒ තමන් ඉපද සිටින්නා වූ සුද්ධාවාස භූමියෙහි ද, අනභි සමෙතාවිනො,- චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබෝධ නොකරන්නා වූ, යෙ,- යම් පුද්ගල කෙනෙක්, සන්ති වෙත් ද, තේසු, - ඔවුනතුරෙන්, සුද්ධාවාසානං,- සුද්ධා වාස පුද්ගලයන්ගේ, ගහණකාල විසේසනත්ථං,- ගනු ලබන කාලය වෙසෙසා දක්වීම පිණිස, සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ - යයි, වුත්තං,- කියන ලදී.

යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්තීති එතෙන වොදන චිත්ත සමංගිනා සමාන ගතිකා තතො පුරිමතරචිත්තසමංගිනොපි යාව සබ්බන්තිම තණ්හා සම්පයුත්ත චිත්ත සමංගි තාව දස්සිතානි වෙදිතබ්බා එස නයො අඤ්ඤෙසු එවරූපෙසු **(යමක මූල ටීකා)**

යස්ස චිත්තස්ස අනන්තරා 'අග්ගමග්ගං පටිලභිස්සන්ති, යන - එතෙන,- මේ වචනයෙන්, වෝදන- චිත්ත සමංගිනා,- අර්හත් මාර්ගයට පූර්ව වෝදන චිත්තයෙන් යුක්ත වූ පුද්ගලයා සමග, සමාන ගතිකා,- සමාන ගති ඇතිව, තතො,- ඒ වෝදන චිත්තයෙන්, පුරිමතර චිත්ත සමංගිනොපි,- පූර්වතර චිත්තයන්ගෙන් යුක්ත වූ පුද්ගලයෝ ද, යාව,- යම්තාක්, සබ්බන්තිම තණ්හා සම්පයුත්ත චිත්ත සමංගි,- සියල්ලන්ට අන්තිම තෘෂ්ණා සම්ප්‍රයුක්ත චිත්තයෙන් යුක්ත පුද්ගලයෙක්, අත්ථි,- ඇත්තේද, තාව,- ඒතාක්, දස්සිතා,- දක්වන ලද්දහු වෙති. ඉති,- මෙසේ. වෙදිතබ්බා- දතයුත්තාහ. එවරූපෙසු- මෙබඳු, අඤ්ඤෙසුපි- අන්‍ය මූලියන්හි ද, එස නයො,- මේ නය ක්‍රමයම ඇත්තේය.

යස්ස දුක්ඛසච්චං න නිරුජ්ඣති, තස්ස සමුදය සච්චං න නිරුජ්ඣිස්සතීති එතස්ස විස්සජ්ජනෙ ද්විසුපි කොට්ඨාසෙසු අරූපේ මග්ගස්සච ඵලස්ස ච භංගක්ඛණෙ ඉච්චෙව වුත්තං, න විසේසිතං කස්මා ඒකස්සාපි මග්ගස්ස ච ඵලස්ස ච භංගක්ඛණ සමංගිනෝ උභය කොට්ඨාස භජනතො, යස්ස දුක්ඛසච්චං න නිරුජ්ඣතීති ඒතේන සන්නිට්ඨා නෙන ගහිතේසු හි අරූපෙ මග්ගඵල භංගක්ඛණ සමංගීසු කෙසඤ්චි තිණ්ණං ඵලානං ද්වින්නඤ්ච මග්ගානං භංගක්ඛණ සමංගීනං නිරන්තරං අනුප්පාදෙත්වා අන්තරන්තරා විපස්සනා නිකන්තිං භවනිකන්තිඤ්ච උප්පාදෙත්වා යෙ උපරිමග්ගෙ උප්පාදෙස්සන්ති තෙසං සමුදය සච්චං නිරුජ්ඣිස්සති තෙසං යෙව පන කෙසඤ්චි අන්තරා තණ්හං අනුප්පාදෙත්වා උපරිමග්ගං උප්පාදෙන්තානං මග්ගඵල භංගක්ඛණ සමංගීනං සමුදය සච්චං න නිරුජ්ඣිස්සතීති සාමඤ්ඤ වචනේනාපි පුරිම කොට්ඨාසෙ වුච්චමානේන පච්ඡිම කොට්ඨාසෙ වක්ඛමානෙ වජ්ජෙත්වාව ගහණං හොතීති දස්සිතො'යන්ති. **(යමක මූල ටීකා)**

යස්ස දුක්ඛසච්චං න නිරුජ්ඣති, තස්ස සමුදය සච්චං න නිරුජ්ඣති – යනු මෙසේ කියන ලද, ඒතස්ස,– ඒ පුච්ඡාවචනයාගේ, විස්සජ්ජනෙ,– විසඳුමෙහි, ද්විසුපි කොට්ඨාසේසු,– කොට්ඨාශ දෙකෙහිම, අරූපෙ මග්ගස්ස ච ඵලස්ස ච භංගක්ඛණෙ ඉච්චෙව,– යනුවෙන්ම, වුත්තං,– කියන ලදී. න විසෙසිතං,– විශේෂවත් නොකරණ ලදී. කස්මා,– කුමක් හෙයින් ද යත්, ඒකස්සාපි මග්ගස්ස ච,– එක ද මාර්ගයක, ඵලස්සා පි,– එකද ඵලයක, භංගක්ඛණ සමංගිනො,– භංගක්ෂණයෙන් යුක්තවූ. පුද්ගලයන්, උභය කොට්ඨාසභජනතො, – කොට්ඨාශ දෙකම භජනය කරන බැවිනි.

හි,– පැහැදිලි කරන්නෙමි, යස්ස දුක්ඛ සච්චං න නිරුජ්ඣිස්සති – යන, ඒතෙන සන්නිට්ඨානේන,– මේ සන්නිට්ඨාන පදයෙන්, ගහිතේසු, – ගන්නා ලද්ද වූ, අරූපෙ, අරූප භූමියෙහි, මග්ගඵල භංගක්ඛණ සමංගීසු,– මාර්ග ඵලයන්ගේ භංගක්ෂණයෙන් සමන්විත වූ පුද්ගලයන් අතුරෙන්, කෙසඤ්චි,– ඇතැම් කෙනෙකුට, තිණ්ණංඵලානං, තුනක් වූ සොතාපත්ති ඵල සකදගාමි ඵල අනාගාමි ඵලයන්ගේ ද, ද්වින්නං,– දෙකක් වූ මග්ගානඤ්ච,– සකදගාමි මාර්ග අනාගාමි මාර්ගයන්ගේ ද, භංගක්ඛණ සමංගිනං,– භංගක්ෂණ සමංගීන් අතුරෙන්, නිරන්තරං,– අතරක් නැතිව, අනුප්පාදෙත්වා,– නූපදවා, අන්තරන්තරා,– අතරතුර, විපස්සනා නිකන්තිඤ්ච,– විදර්ශනා නිකාන්තිය ද, භවනිකන්තිඤ්ච,– භවනිකාන්තියද, උප්පාදෙත්වා,– උපදවා, යෙ,– යම ආයර්‍ය පුද්ගල කෙනෙක්, උපරි මග්ගේ,– උඩමාර්ගයන්, උප්පාදෙස්සන්ති,– උපදවන්නාහුද, තෙසං,– ඒ ආයර්‍ය පුද්ගලයන්ට, සමුදය සච්චං,– සමුදය සත්‍යය නිරුජ්ඣිස්සති, නිරුද්ධ වන්නේය. පන,– තවද, තෙසං යෙව,– ඒ ආයර්‍ය පුද්ගලයන් අතුරෙන්ම, කෙසඤ්චි,– ඇතමෙකුට, අන්තරා,– මාර්ගයට අතරකදී, තණ්හං අනුප්පාදෙත්වා, තෘෂ්ණාවක් නූපදවා, උපරිමග්ගං,– උඩමාර්ගය, උප්පාදෙන්තානං,– උපදවන්නා වූ ද, මග්ගඵල භංගක්ඛණ සමංගීනංච,– මාර්ග ඵල භංගක්ෂණ සමංගී වූ ද, පුග්ගලානං,– ආර්ය පුද්ගලයන්ට, සමුදය සච්චං,– සමුදය සත්‍යය, න නිරුජ්ඣිස්සති,–නිරුද්ධ

නොවන්නේය. ඉති,– මෙසේ, ච,– වනාහි, පුරිම කොට්ඨාසෙ,– පූර්ව කොට්ඨාශයෙහි, වුච්චමානේන,– කියනු ලබන්නාවූ, සාමඤ්ඤ වචනෙනාපිච–පොදු වචනයෙන් ද, පච්ඡිම කොට්ඨාසෙ වක්ඛමානෙ,– පශ්චිම කොට්ඨාශයෙහි කියනු ලබන්නා වූ පුද්ගලයන්, වජ්ජෙත්වාව, අත්හැරම, ගහණං හොති,– ගැනීම වේ. ඉති,– මෙසේ, අයං නයො,– මේ නය ක්‍රමය, දස්සිතො,– දක්වන ලද්දේ, ඉති,–යනු වනාහි නිගමනයයි.

ප්‍රවෘත්ති වාරය නිමි.

---

## පරිඤ්ඤා වාරය

## ගණ්ඨි පද ශෝධනය

ප්‍ර:- පරිඤ්ඤා වාරයෙහි මාර්ගසත්‍ය හා නිරෝධ සත්‍යයන් දේශනා නොකරන ලද්දේ මක් නිසාද.

උ:- ලෝකොත්තර ධර්මයන් පිළිබඳ පරිඤ්ඤා කිසක් නැති බැවින් නොවදළහ.

ප්‍ර:- දුක්ඛ සච්චං පරිජානාති යන තැන්හි කවර පරිඤ්ඤාවක් ලැබේද,

උ:- ඤාත පරිඤ්ඤා තීරණ පරිඤ්ඤා දෙක ලැබෙති.

ප්‍ර:- සමුදය සච්චං පජහති යන තැන කවර පරිඤ්ඤාවක් ලැබේද,

උ:- ඤාතපරිඤ්ඤා පහාන පරිඤ්ඤා දෙක ලැබෙති.

ප්‍ර:- කුමක් හෙයින් දුක්ඛ සත්‍යයෙහි පහාන පරිඤ්ඤාව හා සමුදය සත්‍යයෙහි තීරණ පරිඤ්ඤාව නොලැබෙත්ද?

උ:- සර්වඥශාසනයෙහි යෝගාවචරයෙක් බ්‍රහමචර්යාවෙහි හැසිරෙනු යේම දුක්ඛසත්‍යය පිරිසිඳ අවබෝධ කිරීම පිණිසත්, සමුදය සත්‍යය ප්‍රහාණය කිරීම පිණිසත් බඹසර හැසිරේ. දුක්ඛසත්‍යයෙහි ප්‍රහාණ කෘත්‍යයක් නැත. සමුදය සත්‍යයෙහි ද තීරණ කෘත්‍යයක් නැත. එහෙයින් නොකියන ලදහ.

යස්මා ච ලොකුත්තර ධම්මේසු පරිඤ්ඤා නාම නත්ථි තස්මා ඉධ ද්වෙ සච්චානි ගහිතානි තත්ථ දුක්ඛසච්චං පරිජානාතීති ඤාතතීරණ පරිඤ්ඤා වසෙන වුත්තං, සමුදය සච්චං පජහතීති ඤාත පහාන පරිඤ්ඤා වසෙන **(යමක අට්ඨ කථා)**

ච,– පැහැදිලි කරමි.යස්මා,–යම් හෙයකින්,ලොකුත්තර ධම්මේසු,–ලෝකෝත්තර ධර්මයන්හි, පරිඤ්ඤා නාම නත්ථි-පරිඤ්ඤාවක් නම් නැත්තේද,තස්මා,–එහෙයින් ඉධ, මේ පරිඤ් ඤා වාරයෙහි ද්වෙ සච්චානි,–දෙකක් වූ නිරොධ සත්‍ය මාර්ග සත්‍යයෝ

නගහිතානි, – නොගන්නා ලදහ. තත්ථ,– ඔවුනතුරෙන්, දුක්ඛසච්චං පරිජානා තීති,– යයි කියන ලද වචනය ඤාත තීරණ පරිඤා වසෙන– ඤාත පරිඤ්ඤා තීරණ පරිඤ්ඤා වන්ගේ වශයෙන්, වුත්තං,– කියන ලදී. සමුදය සච්චං පජහතීති,– යනුවෙන් කියන ලද වචනය, ඤාත පරිඤ්ඤා පහාන පරිඤ්ඤා වශයෙන් වුත්තං,– කියන ලදී.

> දුක්ඛස්ස පරිඤ්ඤෙයායත්ථං සමුදයස්ස ච පහානත්ථං භගවති බ්‍රහමචරියං වුස්සතීති පරිඤ්ඤාපහානං සච්චෙසු දස්සෙතුං දුක්ඛෙ තීරණ පරිඤ්ඤාව වුත්තා. නපහාන පරිඤ්ඤා, සමුදයෙ ච පහාන පරිඤ්ඤා න තීරණ පරිඤ්ඤා, මග්ග දුක්ඛ සමුදයානි විභාවෙතීති ඤාත පරිඤ්ඤා ච හොති **(යමක මූල ටීකා)**

දුක්ඛස්ස,– දුක්ඛසත්‍යයාගේ, පරිඤ්ඤෙයායත්ථං– පිරිසිඳ අවබොධ කිරීම පිණිස සමුදයස්ස ච,– සමුදය සත්‍යයාගේද, පහානත්ථං,– ප්‍රහානය පිණිස, භගවති,– සර්වඥ ශාසනයෙහි, බ්‍රහ්මචරියං,– ශාසන බ්‍රහ්මචයර්‍යාව, වුස්සති, – හැසිරෙනු ලැබෙ.ඉති තස්මා,– එසේ හෙයින්, පරිඤ්ඤා පහානං,–පිරිසිඳ දැනීම හා ප්‍රහාණය කිරීම, සච්චෙසු සත්‍යයන් කෙරෙහි, දස්සෙතුං,– දැක්වීම පිණිස, දුක්ඛෙ,– දුක්ඛ සත්‍යයෙහි, තීරණ පරිඤ්ඤාව– තීරණ පරිඤ්ඤාවම වුත්තා– කියන ලදී. පහාන පරිඤා,– පහාන පරිඤ්ඤාව, න වුත්තා,– නොකියන ලදී. සමුදයෙ ච– සමුදය සත්‍යයෙහි ද, පහාන පරිඤ්ඤාව– පහාන පරිඤ්ඤාවම වුත්තා– කියන ලදී. තීරණ පරිඤ්ඤා– තීරණ පරිඤ්ඤාව, න වුත්තා,– නොකියන ලදී.

හි,– තවද වනාහි, මග්ගඤාණං,– මාර්ගඥානය, දුක්ඛ සමුදයානි,– දුක්ඛ සත්‍යය සමුදය සත්‍යයන්, විභාවෙති,– ප්‍රකට කෙරෙයි, ඉති තස්මා,–එසේ හෙයින්, ඤාත පරිඤ්ඤා ච– ඤාත පරිඤ්ඤා නම ද, හොති– වේ.

සත්‍ය යමකය නිමි

---

## සංඛාර යමකය

# ගණ්ඨි පද ශෝධනය

ප්‍ර:- ස්කන්ධ යමක ආදියෙහි ස්වරූප විභාග වාරය නොදෙසා කුමක් හෙයින් සංඛාර යමකයෙහි පමණක් දේශනා කරන ලදද.

උ:- ස්කන්ධාදීන්ගේ ස්වරූප ස්කන්ධ යමකාදිය දේශනා කිරිමට පූර්වභාගයේදී දක්වා ඇති බැවින් ස්වරූප විභාග වාරයක් දේශනා කිරීමට අවශ්‍ය නැත. සංස්කාර යමකයෙහි වනාහි දේශනාවට පූර්වභාගයේ ස්වරූප දක්වා නැති බැවින් ස්වරූප විභාග වාරය වදරා ඇත.

ඛන්ධාදයො විය පුබ්බෙ අවිභත්තා කායසංඛාරාදයොති තෙසං අවිඤ්ඤාතත්තා අස්සාස පස්සාසා කායසංඛාරොති ආදිනා තයො සංඛාරෙ විභජති, **(යමක මූල ටීකා)**

ඛන්ධාදයො,– ස්කන්ධාදීහු, පුබ්බෙ,– ස්කන්ධයමකාදිය දේශනා කිරීමට පූර්වයෙහි, විභත්තා විය,– බෙදන ලද්දක් මෙන්, කායසංඛාරාදයො,– කායසංස්කාරාදීහු, පුබ්බෙ,– සංඛාර යමකය දේශනා කිරීමට පූර්වයෙහි, අවිභත්තා,– නොබෙදන ලදහ. ඉති තස්මා,– එසේ හෙයින්, තෙසං,– ඒ කායසංස්කාරාදීන්ගේ අවිඤ්ඤාතත්තා නොදත් බැවින්, අස්සාස පස්සාසා කායසංඛාරොති ආදිනා – මේ ආදී වශයෙන්, තයෝ සංඛාරෙ,– තුනක් වූ සංස්කාරයන්, විභජති,– බෙදු දක්වයි.

සංඛරීයතීති සංඛාරො, කායේන සංඛාරෝ කායසංඛාරො, සංඛරොතීති සංඛාරො වචියා සංඛාරො වචීසංඛාරො, සංඛරීයතීති සංඛාරො, චිත්තස්ස සංඛාරො,– චිත්ත සංඛාරො, (යමක අට්ඨකථා)

සංඛරීයති,– සකස්කරනු ලැබේ. ඉති තස්මා,– එසේ හෙයින්, සංඛාරො,– සංස්කාර නම්. කායෙන,– කරජකය විසින්, සංඛාරො,– සකස් කරන ලද්දේ, කාය සංඛාරො,– කරජකය විසින් සකස්කරන ලද, සංඛාරො,– සකස් කිරීම නුයි, ඉති තස්මා,– එසේ හෙයින්, සංඛාරො,– සංස්කාර නම්. වචියා,– වචීභෙදශබ්දය, සංඛාරො, සකස් කරනුයේ, වචීසංඛාරො,– වචී භෙද ශබ්දය සකස්කරන්නාය, සංඛරීයති,– සකස් කරනු ලැබේ. ඉති තස්මා,– එසේ හෙයින්, සංඛාරො,– සංස්කාර නම්, චිත්තස්ස,– සිත පිළිබඳ, සංඛාරො,– සකස් කිරීම, චිත්ත සංඛාරො,– සකස් කරන්නාය.

චිත්තස්ස සංඛාරොති ච කත්තු අත්ථෙයෙව, සො පන කරණ වචනස්ස අත්ථොති කත්වා කරණත්ථෙ සාමිවචනං කත්වාති වුත්තං,– **(යමක මූල ටීකා)**

චිත්තස්ස සංඛාරොති ච,– යන තැන්හි ද, කත්තු අත්ථෙයෙ ච, කර්තෘ අර්ථයෙහිම, සාමි වචනං,– සාමි විභත්ති, හොති,– වේ. පන,– එසේ වුවත්, සො,– ඒ කර්තෘ අර්ථය තෙමේ, කරණ වචනස්ස,– කරණ විභත්තියගේ, අත්ථො,– අර්ථය හොති,– වේ. ඉති කත්වා,– මෙසේ කොට, කරණත්ථෙ සාමිවචනං කත්වාති, යනුවෙන් වුත්තං,– කියන ලදී.

කෙ සරීරෙ රජොති කරජො, කින්තං, සුක්කසොණිතං, කරජෙ පවත්තො කායො කරජ කායො, **(ඒකක්ඛර කොෂ ටීකා)**

කෙ – සරීරෙ,– කයෙහි, රජො,– රජස් නුයි, ඉති තස්මා,– එසේ හෙයින්, කරජෝ කරජ නම්, තං,– ඒ කරජ යනු, කිං,– කවරක් ද, සුක්ක සොණිතං,–ශුක්‍ර ශ්‍රෝණිතයයි. කරජෙ,– ශරීර රජස් කෙ.රෙහි, පවත්තො, පැවතියා වූ, කායො,–කය තෙමේ, කරජ කායො,– කරජකාය නම්

කරොති පුත්තෙ නිබ්බත්තෙතීති කරො, සුක්ක සොණිතං, කරෙන ජාතො කරජෝ, කරජෝ ච සො කායො චාති කරජ කායො, **(මණිදීප)**

පුත්තෙ,– දූ පුතුන්, කරොති නිබ්බත්තෙති,– උපදවන්නේය, ඉති තස්මා– එහෙයින්, කරො,– කර නම්, සුක්ක සොණිතං,– ශුක්‍ර ශ්‍රෝණිතයි, කරෙන,– ශුක්‍ර ශ්‍රෝණිතයෙන්, ජාතො,– උපන්නේ, කරජෝ,– කරජ නම්, කරජෝ ච,– කරජ වූයේත්, සො,– හෙතෙමේය, කායො ච,– කය වූයේත් හෙතෙමෙය, ඉති තස්මා– එහෙයින්, කරජ කායො,– කරජ කාය නම් වේ.

ප්‍ර:– ආශ්වාස ප්‍රශ්වාස දෙක අතුරෙන්, ආශ්වාස යනු කවරක්ද, ප්‍රශ්වාස යනු කුමක්ද?

උ:– ආශ්වාස යනු නාසිකාවෙන් පිටත යන වාතයය, ප්‍රශ්වාස යනු ඇතුලට ගන්න වාතයය, (විනය අට්ඨකථාව අනුවය)
තවද:– නාසිකාවෙන් ඇතුලට ගන්නා වාතය ආශ්වාසයයි, පිටත යන නාසිකා වාතය ප්‍රශ්වාසයයි, (සූත්‍ර අභිධර්ම අට්ඨකථා අනුවය.)

අස්සාසොති බහි නික්ඛමන වාතො. පස්සාසොති අන්තො පවිසන වාතො, **(පාරාජික අට්ඨකථා)**

අස්සාසොති,– ආශ්වාස යනු, බහි නික්ඛමණවාතො,– පිටතට නික්මෙන නාසිකා වාතයය, පස්සාසොති,– ප්‍රශ්වාස යනු, අන්තොපවිසන වාතො,– ඇතුලට ගන්න නාසිකා වාතයය,

අස්සාසොති අන්තො පවිසන නාසිකාවාතො, පස්සාසොති, බහිනික්ඛමන නාසික වාතො, **(දීඝනිකායට්ඨකථා සම්මොහවිනොදනී විසුද්ධි මග්ගට්ඨකථා)**

අස්සාසොති,– ආශ්වාස යනු, අන්තො පවිසන නාසිකාවාතො,– ඇතුලට පිවිසෙන නාසිකා වාතයය, පස්සාසොති,– ප්‍රාශ්වාස යනු, බහිනික්ඛමන නාසිකා වාතො,– පිටතට නික්මෙන නාසිකා වාතයය,

සුත්තන්ත නයො එව චෙත්ථ ''අස්සාසාදිමජ්ඣ පරියොසානං සතියා අනුගච්ඡතො අජ්ඣත්තං, වික්ඛෙපගතෙන චිත්තේන කායොපි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතාච, පස්සාසාදි මජ්ඣ පරියොසානං සතියා අනුගච්ඡතො බහිද්ධා, වික්ඛෙප ගතේන චිත්තෙන – කායො පි චිත්තම්පි සාරද්ධා ච හොන්ති ඉඤ්ජිතා ච ඵන්දිතාචාති,'' ඉමාය පාළියා සමෙතීති ගහෙතබ්බං, **(විමතිවිනෝදනී – සාරත්ථ දීපනී ටීකා)**

ච,– පැහැදිලි කරන්නෙමි. එත්ථ,– මෙහි, සුත් තන්ත නයො එව,– සූත්‍රාන්ත නය ක්‍රමයම, '' අස්සාසාදිමජ්ඣ පරියොසානං– ආශ්වාසයාගේ මූල, මැද, අගට සතියා,– සතියෙන්, අනුගච්ඡතො අජ්ඣත්තං,–ශරීර අභ්‍යන්තරයට අනුව යන්නාවූ

යෝගාවචරයාගේ, වික්ඛෙප ගතේන,-වික්ෂේපයට ගියාවූ, චිත්තෙන, - චිත්තයෙන්, කායොපි,- ශරීරයද, චිත්තම්පි,- චිත්තයද, සාරද්ධා ච,-දරථ සහිත ද වූවාහු. ඉඤ්ජිතා ච,- වෙව්ලන්නාහු ද, ඵන්දිතා ච,- කම්පා වන්නාහු ද, හොන්ති, වෙති, පස්සාසාදි මජ්ඣ පරියොසානං,- ප්‍රශ්වාසයාගේ මුල, මැද, අග ට, සතියා,- සතියෙන්, බහිද්ධා අනුගච්ඡතො,- බැහැරට අනුව යන්නා වූ යෝගාවචරයාගේ, වික්ඛෙප ගතෙන චිත්තේන,- වික්ෂේපයට ගියාවූ සිත කරණකොටගෙන, කායොපි චිත්තම්පි,- කයද සිතද, සාරද්ධා ච, - දරථ- සහිත වූවාහු ද, ඉඤ්ජිතා ච,- වෙව්ලන්නා හුද, ඵන්දිතා ච,- කම්පා වන්නා හුද, හොන්ති,- වෙති. ඉති ඉමාය පාළියා,- මේ පටිසම්භිදමග්ග පාළිය හා සමග, සමේති,- සම වේ. ඉති ගහෙතබ්බං,- මෙසේ ගතයුතුය.

ආ පඨමං බහිමුඛං සසනං අස්සාසො,තතො අන්තොමුඛං, පටිසසනං පස්සාසොති ආහ. අස්සාසොති බහි නික්ඛමන වාතොති ආදි,සුත්තන්ත අට්ඨකථාසු පන ආකඩ්ඪන වසෙන අන්තොසසනං අස්සාසො බහි පටිසසනං පස්සාසොති කත්වා උප්පත්ති පාළියං වුත්තා, (විමති විනොදනී)

ආ පඨමං,- ආදිකොට, පළමුව, බහිමුඛං,- පිටතට, සසනං,- ස්වසනය කිරීම අස්සාසො,- පළමුව පිට කරන ස්වසනය නුයි. ආශ්වාස නම්. තතො,- ඉන් පසු, අන්තොමුඛං,- ඇතුලතට, පටිසසනං,- නැවත ස්වසනය කිරිම, පස්සාසො, නැවත ඇතුලට ස්වසනය කිරීම නම් වූ ප්‍රශ්වාසයයි, ඉති තස්මා,- එසේ හෙයින්, අස්සාසොති බහි නික්ඛමන වාතොති ආදිං,- යනාදි වචනය, ආහ,- කීහ. පන,- තව කොටසක් කියන්නෙමි, සුත්තන්ත අට්ඨකථාසු,-සූත්‍රාන්ත අර්ථකථාවන්හි,ආකඩ්ඪන වසෙන, - ඇදගැනීම් වශයෙන්, අන්තො,- ඇතුලතට, සසනං,- ස්වසනය, අස්සාසො,- ආශ්වාසයය, බහි,- පිටතට, පටිසසනං,- නැවත ස්වසනය, පස්සාසො,- ප්‍රශ්වාසයය, ඉති කත්වා,- මෙසේ කොට, පාළියං,- පාළියෙහි, උප්පත්ති,- උපත, වුත්තා,- කියන ලදී.

ආශ්වාස ප්‍රශ්වාස නොමැති පුද්ගලයෝ.

ඉමෙ අන්තො මාතු කුච්ඡියං නත්ථි, උදකෙ නිමුග්ගානං නත්ථි, තථා අසඤ්ඤි භූතානං මතානං චතුත්ථජ්ඣාන සමාපන්නානං, රූපාරූපභව සමංගීනං නිරොධ සමාපන්නානන්ති, **(පාරාජික කාණ්ඩ අට්ඨකථා)**

ඉමෙ ,- මේ ආශ්වාස ප්‍රශ්වාසයෝ, අන්තො මාතුකුච්ඡියං,- මවුකුසතුල සිටින අයට, නත්ථි,- නොමැත. උදකෙ නිමුග්ගානං,- දියෙහි ගිලී සිටින අයට, නත්ථි,- නොමැත. තථා, - එසේම, අසඤ්ඤිභූතානං, - මූර්ඡාවූවන්ට ද, මතානං, මළවුන්ටද, චතුත්ථජ්ඣානං සමාපන්නානං, - රූපාවචර චතුර්ථධ්‍යානයට සමා-පන්නයන්ටද, රූපා රූප භව සමංගීනං,- රූප භව අරූප භවයන්හි ඉපද සිටින්නවුන්ට ද, නිරෝධ සමාපන්නානං,-නිරෝධ සමාපත්තියට සමාපන්නයන්ට ද, නත්ථි නැත.

යථා උදකෙ නිමුග්ගස්ස නිරොධොකාසතාය අස්සාස පස්සාසා න පවත්තන්ති, එවං අන්තො මාතුකුච්ඡියං, යථා මතානං සමුට්ඨාපක චිත්තාභාවතො, එවං අසඤ්ඤී භූතානං, තථා නිරෝධ සමාපන්නානන්ති ආචරිය ධම්මපාලත්ථෙරෙන වුත්තං, මහා ගණ්ඨි පදෙ පන මුච්ඡාපරෙතානං චිත්තප්පවත්තියා දුබ්බල භාවතොති වුත්තං, චතුත්ථජ්ඣානක්ධාන සමාපන්නානං ධම්මතා වසෙනෙව නෙසං අනුප්පජ්ජනං, තථා රූපභව සමංගීනං, කේචි පන අනුපුබ්බතො සුඛුමභාව පත්තියා චතුත්ථජ්ඣාන සමාපන්නස්ස රූපභවෙන රූපානං තග්ගහණස්ස ච සුඛුමභාවතො රූපභවසමංගීනං නත්ථීති කාරණං වදන්ති, **(සාරත්ථ දීපනී ටීකා)**

උදකෙ, - දියෙහි, නිමුග්ගස්ස, - කිමිදුනු තැනැත්තාට, නිරොධොකාසතාය,- ආශ්වාස කිරීමේ අවකාශය අවහිර වූ බැවින්, අස්සාස පස්සාසා,- ආශ්වාස ප්‍රශ්වාසයෝ, නප්පවත්තන්ති යථා,- යම සේ ආශ්වාස ප්‍රශ්වාස නොපවත්නා හුද, එවං,- එසේම, අන්තො මාතු කුච්ඡියං,- මවුකුසතුල සිටින තැනැත්තාට, (නප්පවත්තන්ති) මතානං,-මළ සත්වයන්ට,ආශ්වාස කිරීමේ සිතක් නැති බැවින්, නප්පවත්තන්ති යථා,- යම සේ නොපවතිත් ද, එවං,-එසේ, අසඤ්ඤීභූතානං,-විසංඥ වූවන්ටද, (නප්පවත්තන්ති.) තථා,- එසේම, නිරෝධ සමාපන්නානං,- නිරොධයට සමාපන්න අයටද, (නප්පවත්තන්ති) ඉති, - මෙසේ, ආචරිය ධම්මපාල ථෙරෙන වුත්තං,- ධම්මපාලාචාර්‍ය්‍ය පාදයන් විසින් කියන ලදී.

පන,- තවද, මහා ගණ්ඨි පදෙ,- මහාගණ්ඨි පදයෙහි. මුච්ඡා පරෙතානං,- සිහිසන් නැතිව මූර්ඡා වූවන්ට, චිත්තප්පවත්තියා,- චිත්තප්‍රවෘත්තියගේ, දුබ්බල භාවතො,- දුර්වල බැවින්, (නප්පවත්තන්ති) ඉති වුත්තං,- මෙසේ කියන ලදී. චතුත්ථජ්ඣානං සමාපන්නානං, චතුර්ථධ්‍යාන සමාපන්නවූ, නෙසං ඒ ධ්‍යාන ලාභීන්හට ධම්මතා වසෙනෙව,- ධර්මතා වශයෙන්ම, අනුප්පජ්ජනං,- නොඉපදීම, හොති,- වෙයි. තථා, - එසේම, රූපසමංගීනං, - රූපභවයෙහි ඉපද සිටින්නන්ට, (නප්පවත්තන්ති.)

පන, - තවද චනාහි, කේචි, - ඇතමෙක්, අනුපුබ්බතො, - අනු පිළිවෙළින්, සුඛුමභාවප්පත්තියා,- සියුම් බවට පැමිණීමෙන්, චතුත්ථජ්ඣානං සමාපන්නස්ස, චතුත්ථජ්ඣාන සමාපන්න යාට, රූපභවෙන,- රූපභවයෙන්, රූපානං,- රූපයන්ගේ තග්ගහණස්ස ච,- ඒ රූප ගැනීමෙන් ද, සුඛුමභාවතො,- සියුම් බැවින්, රූපභව සමංගීනං,- රූපභව සමංගීන්ට, නත්ථි,- නැත. ඉති කාරණං වදන්ති,- මෙසේ කරුණු කියත්.

සබ්බෙසම්පි ගබ්භසෙය්‍යකානං මාතුකුච්ඡිතො නික්ඛමන කාලෙ අබ්භන්තර වාතො බහි නික්ඛමති, පච්ඡා බාහිරවාතො සුඛුමරජං ගහෙත්වා අබ්භන්තරං පවිසන්තො තාලුං ආහච්ච නිබ්බායති. **(පාරාජික කාණ්ඩ අට්ඨකථා)**

සබ්බෙසම්පි ගබ්භසෙය්‍යකානං,– ගර්භසෙය්‍යක සියල්ලන්ගේ, මාතුකුච්ඡිතො, මවුකුසින්, නික්ඛමන කාලෙ,– නික්මෙන කල්හි, පඨමං,– පළමු කොට, අබ්භන්තර වාතො,– ශරීරාභ්‍යන්තර වාතය, නික්ඛමති,– නික්මෙයි. පච්ඡා,– පසුව. බාහිරවාතො, බාහිර වාතය, සුඛුමරජං,– සියුම් දූහුවිල්ල,– ගහෙත්වා,– ගෙන, අබ්භන්තරං පවිසන්තො,– අභ්‍යන්තරයට පිවිසෙන්නේ, තාලුං ආහච්ච,– තල්ලේ හැපී, නිබ්බායති,– නිවියයි.

තාලුං ආහච්ච නිබ්බායතීති තාලුං ආහච්ච නිරුජ්ඣති. තේන කිර සම්පති ජාතො බාලකො ඛිපිතං කරොති, **(සාරත්ථ දීපනී ටීකා)**

තාලුං ආහච්ච නිබ්බායති – යනු,තාලුං,–තල්ලට, ආහච්ච,– හැපී පැමිණ, නිරුජ්ඣති,– නිරුද්ධ වේ. තෙන,– එයින්, සම්පති ජාතො,– එකෙණෙහි උපන්, බාලකො,– ළදරුවා, ඛිපිතං,– කිවිසීම, කරොති කිර,– කරයි කියති,

බහිනික්ඛමන වාතස්ස හි නාභි ආදි, හදයං මජ්ඣං, නාසිකග්ගං පරියොසානං, අබ්භන්තරං පවිසන වාතස්ස නාසිකග්ගං ආදි, හදයං මජ්ඣං, නාභි පරියොසානං, **(පාරාජික කාණ්ඩ අට්ඨකථා)**

හි,– පැහැදිලි කරන්නෙමි, බහිනික්ඛමන වාතස්ස,– පිටත නික්මෙන නාසිකා වාතයට , ආදි නාභි,– මුල නාභියයි, මජ්ඣං හදයං,– මැද හෘදයයි, පරියොසානං නාසිකග්ගං,– අග නාසිකාග්‍රයයි, අබ්භන්තරං,– අභ්‍යන්තරයට, පවිසන වාතස්ස,– පිවිසෙන වාතයට, ආදි නාසිකග්ගං,– මුල නාසිකාග්‍රයයි. මජ්ඣං හදයං,– මැද හෘදයයි, පරියොසානං නාභි,– අග නාභියයි.

යත්ථ යත්ථ උප්පජ්ජන්ති, තත්ථ තත්ථෙව භිජ්ජන්ති,ධම්මානං සමීරණාභාවතො, යථාපච්චයං පන දෙසන්තරුප්පත්තියං ගතිසමඤ්ඤා,– **(සාරත්ථ දීපනී ටීකා)**

යත්ථ යත්ථ,– යම් යම් තැනක, උප්පජ්ජන්ති,– උපදිත් ද, තත්ථ තත්ථෙව,– ඒ ඒ ස්ථානයෙහිම, භිජ්ජන්ති,– බිඳෙත්, කස්මා,– කුමක් හෙයින්ද, ධම්මානං, පරමාර්ථ ධර්මයන්ගේ, සමීරණාභාවතො,– ගමන් කිරීමක් නැති බැවිනි. පන, ඒ වනාහි,– යථා පච්චයං,– ප්‍රත්‍ය වූ පරිදි, දෙසන්තරුප්පත්තියං,– දේශාන්තරෝත්පත්තියට, ගති සමඤ්ඤා,– ගමන නම් වූ සම්මුතිය ලැබේ.

අස්සාස පස්සාසා කායිකා, එතේ ධම්මා කායපටිබද්ධා, **(සූත්‍රාන්ත පාළිය)**

අස්සාස පස්සාසා,– ආශ්වාස ප්‍රශ්වාසයෝ, කායිකා,– කයෙහි වූ වෝය, එතෙ ධම්මා,– මේ ආශ්වාස ප්‍රශ්වාස ධර්මයෝ කායපටිබද්ධා,– කය හා බැඳී පවත්නෝය. කය හා සම්බන්ධ වූවෝය.

පුබ්බෙ බො ආවුසො විසාඛ විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති, තස්මා විතක්ක විචාරා වචී සංඛාරො, **(සූත්‍රාන්ත පාළි)**

ආවුසෝ විසාඛ,– ඇවැත්නි විසාඛයෙනි!, පුබ්බෙ,–වචනය කීමට පෙර, විතක්කෙත්වා,– විතර්කනය කොට, විචාරෙත්වා,– විචාරණය කොට, පච්ඡා,– පසුව වාචං භින්දති,– වචනය බිඳී, තස්මා,– එසේ,හෙයින්, විතක්ක විචාරා,– විතර්ක විචාරයෝ, වචීසංඛාරො,– වචීසංඛාර නමී.

විතක්ක විචාරානං පන වචීසංඛාර භාවෙන විසුං ගහිතත්තා ඨපෙත්වා විතක්ක විචාරෙහීති වුත්තං, **(යමක අට්ඨකථා)**

පන,– එකක් කියන්නෙමි, විතක්ක විචාරානං,– විතර්ක විචාරයන්, වචී සංඛාර භාවෙන,– වචී සංස්කාර වශයෙන්, විසුං ගහිතත්තා,– වෙනම ගන්නා ලද බැවින්, ඨපෙත්වා විතක්ක විචාරෙහීති,– ඨපෙත්වා විතක්ක විචාරෙහි, යයි. වුත්තං,– කියන ලදී.

තත්ථ තත්ථ ඛන්ධාදීසු විසුං ගහිතත්තා පාකටත්තා ච, **(යමක අට්ඨකථා)**

ඛන්ධාදීසු,– ස්කන්ධාදී වූ, තත්ථ තත්ථ,– ඒ ඒ ස්ථාන යන්හි, විසුං ගහිතත්තා ච,– වෙන් වෙන්ව ගන්නා ලද බැවින් ද, පාකටත්තා ච,– ප්‍රකට බැවින් ද,

වට්ට ධම්මෙසු අස්සාදං — තදස්සා දෙප සෙවනං  
විනිභුජ්ජ නිදස්සෙතුං — ඛන්ධ ද්වය මුදහටං–  
විවාද මූල සංසාර — කාම හේතු නිදස්සනං  
සන්ධාය වේදනා සඤ්ඤා —කතා නානාති කෙචන **(නාමරූප පරිච්ඡේදය)**

වට්ට ධම්මෙසු,– සංසාර වට්ට ධර්මයන්හි, අස්සාදං,– ආශ්වාදය ද, තදස්සා දෝප සෙවනං,– ඒ ආශ්වාදයට පැමිණීමද, විනිභුජ්ජ,– වෙන්කොට බෙද, නිදස්සෙතුං, දැක්වීම පිණිස, ඛන්ධද්වයං,– ස්කන්ධ දෙකක්, උදහටං,– දක්වන ලදී. විවාද මූල සංසාර කාමහේතු නිදස්සනං,– සංසාරයෙහි, විවාදයන්ගේ හේතුවද, කාමයන්ගේ හේතුව ද දැක්වීම,– සන්ධාය,– පිණිස, වේදනා සඤ්ඤා,– වේදනා සඤ්ඤාවන්, නානා,වෙන් වෙන්ව, කතා,– කරන ලදහයි, ඉති කේචන, – මෙසේ ඇතැම් කෙනෙක්, වදන්ති කියති.

සුද්ධ සංඛාර වාරෙ පන යථා සුද්ධඛන්ධවාරාදීසු රූපං ඛන්ධා ඛන්ධො රූපං, චක්ඛු ආයතනං, ආයතනා චක්ඛුති ආදිනා නයෙන යමකානි වුත්තානි, එවං කායො සංඛාරො, සංඛාරා කායොති අවත්වා කායසංඛාරො – වචීසංඛාරො – චිත්තසංඛාරොති ආදිනා නයෙන කායසංඛාර මූලකානි ද්වෙ වචී සංඛාර මූලකං එකන්ති අනුලොමෙ තීණි පටිලොමෙතීණීති සබ්බානිපි සුද්ධික වාරෙ ඡ යමකානි වුත්තානි, කිං කාරණා සුද්ධික එකේකපද වසෙන අත්ථාභාවතො. **(යමක අට්ඨකථා)**

පන,– විශේෂයක් කියන්නෙමි. සුද්ධසංඛාර වාරෙ,– සුද්ධසංඛාර වාරයෙහි, සුද්ධ ඛන්ධවාරාදිසු,– සුද්ධ ස්කන්ධ වාරාදියෙහි කියන ලද, රූපං ඛන්ධො,ඛන්ධා රූපං, චක්ඛු ආයතනං ආයතනා චක්ඛු – ඉති ආදිනා,– මේ ආදි වූ, නයෙන,– නය ක්‍රමයෙන්, යමකානි වුත්තානි යථා,– යමකයන් කියන ලද්දක් මෙන්, එවං,– එසේම, කායො සංඛාරො, සංඛාරා කායො,– ඉති අවත්වා,– මෙසේ නොකියා, කායසංඛාරො වචීසංඛාරො චිත්තසංඛාරො – ඉති ආදිනා,– මේ ආදි වූ, නයෙන,– නය ක්‍රමයෙන්' කායසංඛාර මූලකානි,– කාය සංස්කාර මුල්කොට ඇත්තා වූ, ද්වෙ,– යමක දෙකක් ද වචීසංඛාර මූලකං එකං,– වචීසංස්කාර මූලක එකක් ද, ඉති,– මෙසේ, අනුලොමෙ,– අනුලොමයෙහි, තිණි,– තුනක් වූ, යමකානි,– යමකයෝද, පටිලොමෙ,– ප්‍රතිලොම යෙහි, තිණි, තුනක් වූ, යමකානි,– යමකයෝදයි. ඉති සබ්බානිපි,– මෙසේ සියලුම, ඡ යමකානි,– යමක සයක්, සුද්ධික වාරෙ,–සුද්ධික වාරයෙහි, වුත්තානි, – කියන ලද්දහ. කිං කාරණා,– කුමක් හෙයින්, සුද්ධික එකෙක පද වසෙන,– ශුද්ධික එක එක පදයාගේ වශයෙන්, සංස්කාර වූ එක එක පදයාගේ වශයෙන්, අත්ථාභාවතො,– අවබොධ කටයුතු අර්ථයක් නොලැබෙන බැවිනි.

> ඉධ පන සංඛාර යමකෙ කායාදි පදනං සංඛාර පදස්ස ච අසමානාධි–කරණත්තා,කායො සංඛාරො සංඛාරා කායොති ආදිමහි වුච්චමානෙ අධිප්පෙතත්ථ පරිච්චාගො අනධිප්පෙතත්ථ පරිග්ගහො ච කතො සියාති සුද්ධසංඛාරනං මූල චක්කවාරා න වුත්තා. **(යමක මූල ටීකා)**

පන,– තව කොටසක් කියන්නෙමි. ඉධසංඛාර යමකෙ,– මේ සංඛාර යමක යෙහි, කායාදිනං,– කාය ආදි පදයන්ගේද, සංඛාර පදස්ස ච,– සංඛාර පදයාගේ ද, අසමාණාධිකරණත්තා,– සමානාධිකරණ නොවන බැවින්, කායො සංඛාරො සංඛාරා කායො– ඉති ආදිමහි,–මේ ආදි වචනය, වුච්චමානෙ,–කියනු ලබන කල්හි,අධිප්පෙතත්ථ පරිච්චාගො– අදහස් කරන ලද ආශ්වාස ප්‍රශ්වාස ආදී අර්ථ අත්හැරීම ද, අනධිප්පෙ තත්ථ පරිග්ගහො ච,– අදහස් නොකරන ලද චේතනා කාය අභිසංඛරණ සංඛාරාදී අර්ථයන් ගැනීම ද, කතො සියා,– කරණ ලද්දේ වන්නේය. ඉති තස්මා,– එසේ හෙයින්, සුද්ධ සංඛාරනං මූලචක්කවාරා, – සුද්ධසංඛාර බව සහිත මූල චක්‍ර වාරයන් න වුත්තා,– නොකියන ලද්දහ.

> අට්ඨකථායම්පන සුද්ධ සංඛාර වාරට්ඨානෙ වුත්තත්තා අයං නයො සුද්ධ සංඛාර වාරොති වුත්තො, **(යමක මූල ටීකා)**

අට්ඨකථායං පන,– අර්ථකථාවෙහි වනාහි, සුද්ධසංඛාර වාරට්ඨානෙ,– ශුද්ධ සංස්කාර වාරයෙහි , වුත්තත්තා,– කියන ලද බැවින්, අයං නයෝ,– මේ නය ක්‍රමය, හෙවත් මේ වාරය, සුද්ධ සංඛාර වාරො ඉති,– සුද්ධ සංඛාර වාරයයි, වුත්තො,– කියන ලදී.

විනා අස්සාස පස්සාසෙහි විතක්ක විචාරානං උප්පාදක්ඛණෙති ඒතෙන පන දස්සිතා පුග්ගලා පඨමජ්ඣානොකාසා කාමාවචරාදී ඔකාසා ච අස්සාස පස්සාස විරහ විසිට්ඨා දට්ඨබ්බා. **(යමක මූල ටීකා)**

පන,– තවද එකක් කියන්නෙමි. විනා අස්සාස පස්සාසෙහි විතක්ක විචාරානං උප්පාදක්ඛණෙ – ඉති,– යයි කියන ලද, එතෙන,– මේ පාඨයෙන්, දස්සිතා,– දක්වන ලද, පුග්ගලා,– පුද්ගලයෝ, අස්සාස පස්සාස විරහ විසිට්ඨා,– ආශ්වා ප්‍රශ්වාසයෙන් තොරවූ බැවින් විශේෂවත් වූ, පඨමජ්ඣානොකාසා ච, –ප්‍රථමධ්‍යානාවකාශය ඇත්තා වූ පුද්ගලයෝ ද, අස්සාස පස්සාස විරහ විශිෂ්ඨ වූ, කාමාවචරාදී ඔකාසා ච,කාමාවචර යයි කියන ලද අවකාශ ඇත්තා වූ පුද්ගලයෝ ද, දට්ඨබ්බා,– දතයුත්තාහ.

පඨමඤ්චෙත්ථ පඨමජ්ඣාන සමංගිනං රූපාවචරානං ගහණං **(යමක අනුටීකා)**

ච,– පැහැදිලි කරන්නෙමි. එත්ථ,– මෙහි, පඨමං, – ප්‍රථමයෙන්, පඨමජ්ඣාන සමංගිනං,– ප්‍රථමධ්‍යානයට සමවැදුනා වූ, රූපාවචරානං,– රූපාවචර පුද්ගලයන්ගේ, ගහණං හොති, ගැනීම වෙයි.

පඨමජ්ඣානං සමාපන්නානන්ති ඣානොකාස වසෙන පුග්ගලං දස්සෙති,– කාමාවචරානන්ති භුම්මොකාස වසෙන, ද්විප්පකාරානම්පි පන තෙසං විසෙසන ත්ථමාහ අස්සාස පස්සාසානං උප්පාදක්ඛණෙති, තෙන රූපාවචරේ පඨමජ්ඣානං සමාපන්නකෙ කාමාවචරෙ ගබ්භගතාදිකෙ ච නිවත්තේති, **(යමක මූල ටීකා)**

පඨමජ්ඣානං සමාපන්නානන්ති,– යනුවෙන්, ඣානොකාස වසෙන, – ධ්‍යානාව කාශයාගේ වශයෙන්, පුග්ගලං දස්සෙති,– පුද්ගලයා දක්වයි. කාමාවචරානන්ති,– යනු,– භුම්මොකාස වසෙන,– භූම්‍යාවකාශයාගේ වශයෙන්, පුග්ගලං දස්සෙති,– පුද්ගලයා දක්වයි. පන,– ඒ හැර, ද්විප්පකාරානම්පි,– දෙවැදෑරුම වූ ද, තෙසං,– ඒ පුද්ගලයන්, විසෙසනත්ථං,– විශේෂ කොට දැක්වීම පිණිස, අස්සාස පස්සාසානං උප්පාදක්ඛණෙති,– යනුවෙන්, ආහ,– කීහ. තේන ඒ පාඨයෙන්, රූපාවචරෙ,– රූපාවචරයෙහි, පඨමජ්ඣානසමාපන්නකෙ, – ප්‍රථම ධ්‍යානයට සමවැදුනා වූ, පුද්ගලයන් ද, කාමාවචරෙ,– කාමාවචර භූමියෙහි,– ගබ්භගතාදිකේච,– ගර්භගතාදීන් ද, නිවත්තෙති,– ගැනීම වළක්වයි.

අවිතක්ක විචාරමත්තං දුතියජ්ඣානං විචාර වසෙන පඨමජ්ඣානෙ සංගහං ගච්ඡතීති දට්ඨබ්බං, මුද්ධභූතං දුතියජ්ඣානං ගහෙත්වා ඉතරං අසංග හිතන්ති වා, **(යමක මූල ටීකා)**

අවිතක්ක විචාර මත්තං,– අවිතර්ක විචාර මාත්‍ර ඇත්තා වූ, දුතියජ්ඣානං,– ද්විතීය ධ්‍යානය, විචාර වසෙන,– විචාරයාගේ වශයෙන්, පඨමජ්ඣානෙ,– ප්‍රථම ධ්‍යානයෙහි, සංගහං ගච්ඡති, සංග්‍රහයට යයි. ඉති දට්ඨබ්බං,– මෙසේ දතයුතු

නොහොත්, මුද්ධභූතං,-මුදුන් පත්වූ, දුතියජ්ඣානං,-චතුෂ්ක නයෙහි ද්විතිය ධ්‍යානය, ගහෙත්වා,- ගෙන, ඉතරං,- ඉතිරි වූ, පඤ්චක නයෙහි ද්විතියධ්‍යානය, අසංගහිතං, සංග්‍රහ නොකරන ලද්දේ, ඉති දට්ඨබ්බං,- මෙසේ දත යුතුය.

සංඛාරානං පුග්ගලානඤ්ච ඔකාසත්තා ඣානං භූමි ච විසුං ඔකාස භාවෙන ගහිතා. **(යමක මූල ටීකා)**

සංඛාරානඤ්ච,- කායසංඛාරාදීන්ගේ ද, පුග්ගලානඤ්ච,-පුද්ගලයන්ගේද, ඔකාසත්තා,- අවකාශස්ථාන බැවින්, ඣානඤ්ච,- ධ්‍යානයද, භූමි ච,- භූමිය ද විසුං,- වෙනම, ඔකාසභාවෙන,- **අවකාශ** වශයෙන්, ගහිතා,- ගන්නා ලද්දේ, හොති,- වෙයි.

කාමඤ්චෙතං පටිසන්ධි චිත්තෙපි වත්තමානෙ තෙසං තත්ථ නුප්පජ්ජිත්ථෙව යාව පන අඛහොඛිණ්ණං විපාක චිත්තං වත්තති, තාව නුප්පජ්ජිත්ථෙව නාමාති, දස්සනත්ථමෙතං **(යමක අට්ඨකථා)**

ච,- පැහැදිලි කරන්නෙමි. ඒතං,- මේ කායසංඛාර වචීසංඛාර යුගලය. පටිසන්ධි චිත්තෙපි,- ප්‍රතිසන්ධි චිත්තයද, වත්තමානෙ,-පවත්නා කල්හි, තෙසං,- ඒ සුද්ධාවාස පුද්ගලයන්ට, තත්ථ,- ඒ සුද්ධාවාස භූමියෙහි, කාමං නුප්පජ්ජිත්ථෙව,- ඒකාන්තයෙන් නූපන්නේමය. පන,- එසේ නමුත්, යාව,- යම්තාක් කල්, අඛාභොඛිණ්ණං අතරක් නොමැතිව, විපාක චිත්තං,- විපාක චිත්තය, වත්තති,- පවතීද, තාව,- ඒ තාක් කල්, නුප්පජ්ජිත්ථෙව නාම,- නූපන්නේම නම්, හොති,- වෙයි. ඉති දස්සනත්ථං,- මෙසේ අර්ථ දැක්වීම පිණිස, එතං,- මේ සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ යන වචනය, වුත්තං,- කියන ලදී.

ඛීණාසවානං චුතිචිත්තනත්ති විසෙසෙත්ථා වුත්තං, කාමාවචරානං පච්ඡිම චිත්තස්ස උප්පාදක්ඛණෙ යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සති රූපාවචරේ අරූපාවචරෙ පච්ඡිම භවිකානං යෙ ච රූපාවචරං අරූපාවචරං උපපජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං වචීසංඛාරො නිරුජ්ඣිස්සති, නො ච තෙසං කායසංඛාරො නිරුජ්ඣිස්සති. පන වචනතො අඤ්ඤෙසම්පි චුති චිත්තං රූපං න සමුට්ඨාපෙතීති විඤ්ඤායති රූප සමුට්ඨාපක චිත්තස්ස ගබ්භගමනාදි විනිබද්ධාභාවෙන කායසංඛාර සමුට්ඨාපනං අත්ථී න ච යුත්තං, වුතො ච චිත්ත සමුට්ඨානඤ්චස්ස පවත්තතීති නාපි චුති චිත්තං රූපං සමුට්ඨාපෙතීති පාළි අත්ථීති, **(ධම්ම සංගණී මූල ටීකා)**

ඛීණාස්වානං චුති චිත්තං- ඉති යනුවෙන්, විසෙසෙත්වා, - විශේෂ කොට, වුත්තං කියන ලදී. පන,- කොටසක් දක්වන්නෙමි. (කාමාවචරා නං - පෙ - කායසංඛාරො නිරුජ්ඣිස්සති.) යනුවෙන්, වචනතො,- වදරා ඇති බැවින් අඤ්ඤෙසම්පි- ක්ෂිණාශ්‍රවයන් හැර අන්‍ය පුද්ගලයන්ගේ ද, චුති චිත්තං,-චුති චිත්තය, රූපං,- රූපය, නසමුට්ඨාපෙති,- නූපදවයි. ඉති විඤ්ඤායති- මෙසේ අවබොධ වේ. හි- ඛ්‍යතිරේක

දක්වන්නෙමි. රූපසමුට්ඨාපක චිත්තස්ස,– රූප උපදවන චිත්තයාගේ, ගබ්භගමනාදි විනිබද්ධා භාවෙන,– මවුකුසට යාමාදී බාධාවක් නොමැති බැවින්, කායසංඛාර සමුට්ඨාපනං,– කායසංස්කාර ඉපදවීමක්, න අත්ථි,– නොමැත, ච,– පැහැදිලි කරමි– චුතො,– චුත වූයේද, අස්ස,– ඒ චුත වූ පුද්ගලයාට, චිත්ත සමුට්ඨානඤ්ච,– චිත්ත සමුට්ඨාන රූපයද, පවත්තති,–පවතී, ඉති ඉදං වචනං,–යන මේ වචනය, න ච යුත්තං, යුතුද නොවේ, චුති චිත්තං,– චුති චිත්තය, රූපං රූපය, සමුට්ඨාපෙති,– උපදවන්නේ යයි ඉති,– මෙසේ, පාළි,– දේශනා පාළියක්, නා පි අත්ථි,– ඇත්තේ ද නැත. (ඉති විඤ්ඤායති)

පච්ඡිම චිත්තන්ති අවිසේසෙන චුති චිත්තං වුත්තන්ති අධිප්පායෙන අඤ්ඤෙසු සම්පි චුතිචිත්තං–පෙ– විඤ්ඤායතීති වුත්තං, අථවා යෙ ච රූපාවචරං අරූපාවචරං උපප– ජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං වචන්තානං තෙසං වචීසංඛාරො නිරුජ්ඣිස්සති නො ච තෙසං කායසංඛාරො නිරුජ්ඣිස්සති, රූපාරූපභවූපපජ්ජනකානං කාමා වචර චුති චිත්තස්සාපි කායසංඛාර ස මුට්ඨාපන වචනේන ඛීණාසවෙහි, අඤ්ඤෙසම්පි –පෙ– ඤායතීති වුත්තං, **(ධම්ම සංගණී අනුටීකා)**

පච්ඡිම චිත්තන්ති,– යනුවෙන්, අවිසේසෙන,– පොදු වශයෙන්, චුති චිත්තං,– චුති චිත්තය, වුත්තං,–කියන ලදී. ඉති අධිප්පායෙන,–මෙබඳු අදහසින්, අඤ්ඤෙසම්පි– ක්ෂිණාශ්‍රවයන් හැර අන්‍ය වූ ද පුද්ගලයන්ගේ, චුති චිත්තං,– චුති චිත්තය,– පෙ– විඤ්ඤායති,–අවබොධ වේ යයි, ඉති වුත්තං,– මෙසේ කියන ලදී. අථවා,–නොහොත් යෙ ච රූපාවචරං –පෙ– නිරුජ්ඣිස්සති ඉති,– යනුවෙන්, රූපාරූපභවූපපජ්ජනකානං,– රූප භූමි අරූපභූමීන්හි ඉපදීමට නියත වූ පුද්ගලයන්ගේ, කාමාවචර චුතිචිත්තස්සාපි,– කාමාවචර චුති චිත්තයාගේ ද, කායසංඛාර සමුට්ඨාපන වචනේන,–කායසංස්කාර උපදවන්නේ ය යන වචනයෙන්, ඛීණාසවෙහි,–ක්ෂිණාශ්‍රවයන් හැර, අඤ්ඤෙසම්පි– අන්‍යයන්ගේ ද,– පෙ–ඤායති,– අවබෝධ වේයයි, ඉති වුත්තං,– මෙසේ කියනලදී.

යස්මා ච යස්ස කායසංඛාරො නිරුජ්ඣති, තස්ස වචීසංඛාරො නිරුජ්ඣිස්සතීති ආමන්තාති, යස්ස කාය සංඛාරො නිරුජ්ඣති තස්ස චිත්තසංඛාරො නිරුජ්ඣි– ස්සතීති ආමන්තා ති ච පච්ඡිමචිත්තස්ස භංගක්ඛණෙ තෙසං කායසංඛාරො ච න නිරුජ්ඣති, චිත්තසංඛාරො ච න නිරුජ්ඣිස්සතීති ආදි වචනතො ච පච්ඡිම චිත්තස්ස පුරතො සොළසමෙන චිත්තෙන තතො ඕරිමෙන වා සද්ධිං අස්සාස පස්සාසා න උප්පජ්ජන්තීති සිද්ධං යදි උප්පජ්ජෙය්‍යුං, පච්ඡිම චිත්තස්ස භංගක්ඛණෙ තෙසං කායසංඛාරො න නිරුජ්ඣතීති නවදෙය්‍ය, වුත්තඤ්චෙතං තස්මා හෙට්ඨා කොටියා චුතිතො පුරිමෙන සත්තරසමෙන උප්පන්නා අස්සාස පස්සාසා චුතියා හෙට්ඨා දුතියෙන චිත්තෙන සද්ධිං නිරුජ්ඣන්තීති තෙන යස්ස චිත්තස්ස අනන්තරා කාමා වචරානං පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සතීති චුති චිත්තස්ස අනන්තර පච්චය භූතස්සපි චිත්තස්ස කාය සංඛාර සමුට්ඨාපනතා වුත්තා, **(ධම්ම සංගණී අනුටීකා)**

ච,– පැහැදිලි කරන්නෙමි. යස්මා,– යම් හෙයකින්, යස්ස කායසංඛාරො–පෙ ආමන්තා – ඉති ච,– යනුවෙන් ද, යස්ස – පෙ– නිරුජ්ඣිස්සතීති ආමන්තා – ඉති ච– යනු වෙන්ද පච්ඡිම චිත්තස්ස – පෙ – න නිරුජ්ඣිස්සති– ඉති ච,– යනුවෙන් ද, ඉති ආදි වචනතො,– මේ ආදී වශයෙන් වදරා ඇති බැවින්, පච්ඡිම චිත්තස්ස,– පච්ඡිම චිත්තයාට, වා,– නොහොත්, චුතිචිත්තයට, පුරතො,– පූර්වයෙන්, සොළසමෙන චිත්තෙන වා,– දහසය වැනි චිත්තය සමග ද, තතො,– එයින්, ඔරිමෙන වා,– මෑත චිත්තයක් හෝ, සද්ධිං,–සමග, අස්සාස පස්සාසා,– ආශ්වාස ප්‍රශ්වාසයෝ, න උප්පජ්ජන්ති,– නූපදිත්, ඉති අත්ථං,– මෙසේ වූ අර්ථය, සිද්ධං,– සිද්ධය, යදි උප්පජ්ජෙය්‍යුං, ඉදින් උපදින්නාහු නම, පච්ඡිම චිත්තස්ය – පෙ– න නිරුජ්ඣතීති, යනුවෙන්,– නවදෙය්‍ය,– නොකියන්නේය, ච – සච්චං,– සත්‍යයකි, තස්මා – හෙට්ඨිම කොටියා පෙ– සද්ධිං නිරුජ්ඣති, ඉති එතං වචනං,– යන මේ වචනය, වුත්තං,– කියන ලදී. තෙන,– ඒ වචනයෙන්, යස්ස – පෙ– උප්පජ්ජිස්සති, යනුවෙන්, චුති චිත්තස්ස,– චුති චිත්තයට, අනන්තර පච්චය භූතස්ස,– අනන්තර ප්‍රත්‍ය වූ, චිත්තස්සපි,– චිත්තයාගේ ද, කායසංඛාර සමුට්ඨාපනතා,– කායසංස්කාර සමුට්ඨාපනය කරන බව, වුත්තා, කියන ලද්දේ වේ.

අථවා යස්ස චිත්තස්සාති යෙන චිත්තෙන සබ්බපච්ඡිමො කායසංඛාරො උප්පජ්ජති තං චිත්තං වුත්තන්ති ගහෙතබ්බං, න පච්ඡිම චිත්තස්ස අනන්තර පච්චය භූතං, අනන්තරාතිහි කායසංඛාරුප්පාදනං අන්තරං විනා යතො පච්ඡා කායසංඛරුප්පාද නේන අනන්තරහිතං හුත්වා පච්ඡිම චිත්තං උප්පජ්ජිස්සතීති අත්ථො, තස්මා ඉත රෙසං වචීසංඛාරො ච නිරුජ්ඣිස්සති, කායසංඛාරා ච නිරුජ්ඣිස්සතීති වුත්තත්තා අඤ්ඤථා පච්ඡිම චිත්තතො පුරිම තතියචිත්ත සමංගිනං කාය සංඛාරො උප්පජ්ජතීති ආපජ්ජති, **(ධම්ම සංගණි අනුටීකා)**

අථවා,– නොහොත්, යස්ස චිත්තස්ස,– යනු, යෙන චිත්තෙන,– යම් චිත්තයක් කරණ කොට ගෙන, සබ්බපච්ඡිමො,– සියල්ලන්ට අන්තිම වූ, කායසංඛාරො,– කායසංස්කාරය, උප්පජ්ජති,– උපදිද, තං චිත්තං,– ඒ චිත්තය, වුත්තං,– කියනා ලද්දේ, ඉති ගහෙතබ්බං,– මෙසේ ගතයුතුය.

පච්ඡිම චිත්තස්ස,– පශ්චිම චිත්තයට, අනන්තර පච්චය භූතං,– අනන්තර ප්‍රත්‍ය වූ චිත්තය, න ගහෙතබ්බං,– නොගත යුතුය. හි – සච්චං,– සත්‍යයකි. අනන්තරාති, අනන්තරා යනු, කායසංඛාරුප්පාදනං,– කාය සංස්කාර ඉපදීමට, අන්තරං,– අන්තරය, විනා,– හැර, **(ගහෙතබ්බා)**

යතො,– යම් තැනකින්, පච්ඡා පසුව, කායසංඛාරුප්පාදනේන, – කායසංස්කාර උත්පාදනයෙන්, අනන්තරහිතං හුත්වා,– අතරක් නැතිව, පච්ඡිම චිත්තං,– පශ්චිම චිත්තය. උප්පජ්ජිස්සති,– උපදින්නේ ද, ඉති අයං,– යන මේ, අත්ථො,– අර්ථයි

කස්මා,- කුමක් හෙයින් ද, ඉතරෙසං - පෙ- නිරුජ්ඣිස්සති, යනුවෙන්, වුත්තත්තා, වදළ බැවිනි. අඤ්ඤථා,- අන් ක්‍රමයකින්, -අත්රෙ ගයහමානෙ, පච්ඡිම චිත්තතො- පශ්චිම චිත්තයෙන්, පුරිම තතිය චිත්ත සමංගීනං,- පූර්ව වූ තුන්වැනි සිත හා යෙදුනා වූ පුද්ගලයන්ට, කායසංඛාරො,- කායසංස්කාරය, උප්පජ්ජති,- උපදී, ඉති ආපජ්ජ තීති,- මෙසේ පැමිණෙන බැවිනි.

ධම්මනානත්තාභාවෙපි හි පදනානත්තෙ න දුකන්තරං වුච්චති. - පෙ - නහි ධම්මානං අවුත්තතාපෙක්ඛං දුකන්තර වචනම්පි නත්ථි පුනරුත්ති දෙසො,-

(ධම්මසංගණී මූල ටීකා)

හි,- යුතුය, ධම්මනානත්තාභාවෙපි,- ස්වභාව අධිප්‍රාය විශේෂයක් නැත්තේ නමුත්, පදනානත්තෙන,- පදයන්ගේ ශබ්දයන්ගේ විශේෂයක් ඇති බැවින්, දුකන්තරං, අන්‍ය දුක පදයක්, වුච්චති,- කියනු ලැබේ. පෙ- හි සච්චං, - සත්‍යයකි. ධම්මානං, පරමාර්ථ ධර්මයන්ගේ, දුකන්තර වචනං,- අන්‍ය දුක පදයක් කීම, අවුත්තතාපෙක්ඛං, නොකියන ලද බවක් අපේක්ෂා කරන්නේ, න,- නොවේ, ඉති තස්මා,- එසේ හෙයින්, පුනරුත්ති දෙසො,- පුනරුක්ත දෙෂයක්, නත්ථි,- නොමැත.

සංඛාර යමකය නිමි.

---

## නිගමනය

### ගාථාව

අග්ග පණ්ඩිත යූපි පේ — රාජ දත්ති ලඤ්ජිනා
රචිතා අනුගණ්ඨෙසා — තො තො ද්වෙ කම්හි නිට්ඨිතා.

යමක අනු ගණ්ඨි පදය නිමි.

2019 03 26 Paññaprami Na Uyana Free Distribution